

# සූත්‍රසංග්‍රහය

# සූත්‍රසඞ්ග්‍රහව.

වස්කඩුවේ ක්ෂේත්‍රාසන්න විහාරාධිපති

මහාමහෝපාධ්‍යාය

සිරිසුගත ශාසන වංශපාල ගණාචරිය අරියවංශතිලක

මේධාවීතිස්ස මහානායක ස්ථවිරයන් වහන්සේ

විසින්

ලියනලද පදාර්ථ ව්‍යාඛ්‍යාවෙන්

සමුපේතයි.

පොතුවිල කේ. ඇස්. නිශ්ශඞ්ක,

ඇන්. ඇස්. ඩි. සිල්වා

යන අප විසින්

පානදුර යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

2478—1935.

# Suttrasangraha Pali

AND

## SINHALESE PARAPHARASE

BY


The Ven'ble Sri Medhabi Tissa

MAHA NAYAKA THERO

SHSTRASANNA VIHARAYA

WASKADUWA, KALUTARA.



PRINTED AND PUBLISED BY

K. S. NISSANKA

N. S. D. SILVA

POTUWILA.

AT THE PANADURA PRINTING WORKS,

PANADURA.

2478
1935

# සංඥාපනය.

ශ්‍රී ශාක්‍ය ජිනෙන්ද්‍ර වූ අප සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ පය්‍ර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධසඞ්ඛ්‍යාත ත්‍රිවිධශාසනයෙන් පය්‍ර්‍යාප්ති නම් ලද පිටකත්‍රය ධර්‍මයෙන් උපුටා පුරාතන මහාස්ථවිර කෙනකුන් විසින් සඞ්ග්‍රහකරනලද දානකථා, ශීලකථා, ස්වර්‍ගකථා, කාමයන්ගේ ආදීනව යනාදි ක්‍රමයෙන් ඒ ඒ යුක්ත ප්‍රයුක්තාවස්ථාවන්හි දෙශනාකිරීමට අවශ්‍යවූ සූත්‍ර ධර්‍ම අසූපහකින් ප්‍රතිමණ්ඩිතවූ ද පාලිභාෂා විජානනාභිලාෂීන් විසින් බොහෝකලක පටන් හස්තසාර වස්තුවක් මෙන් සලකා පරිශීලනය කරනු ලබන්නාවූ ද උපසපන් භික්ෂූන් වහන්සේලාගේ නිශ්‍රය මුක්තභාවයට (ගුරුආශ්‍රයෙන් තුරන්ව ස්වප්‍රධානව විසීමට) ප්‍රාමාණික වූ ව්‍යක්ත ඉක්ත බහු ශ්‍රැතභාවය පිණිස අර්ථ කථා සහිතව උද්ග්‍රහණ ධාරණයකළ යුතු යයි පිළිගනු ලබන්නාවූ ද සූත්‍ර සඞ්ග්‍රහ නම් වූ ධර්‍ම සඞ්ග්‍රහය සකල ශාසනිකයන් අතුරෙහි චිරරාත්‍ර ප්‍රසිද්ධ හෙයින් තත් සංඥාපනයෙහි ප්‍රපඤ්චකථා ව්‍යර්ථ යයි සිතම්හ.

ඒ මේ ධර්‍ම සඞ්ග්‍රහයට සන්නයක් ලියා ප්‍රසිද්ධකැර වූවොත් එයින් ආධුනික ගිහි පැවිදි බොහෝදෙනාට ඇතිවන විපුල ප්‍රයෝජනය සහ ධර්‍ම ශාස්ත්‍ර සඞ්ග්‍රහය සලකා වලානේ සරණපාල මහා විහාරාධිපති අප හිතවත් විචිත්‍රභාණක සිරිසද්ධම්මාචරිය ධම්මානන්ද මහා ස්ථවිරතුමන් විසින් මීට අවුරුදු විසිපහකට පමණ උඩදී "සූත්‍ර සඞ්ග්‍රහ පෙළට සන්නයක් ලිවිය යුතු ය" යි අපවෙත කළ ආරාධනයත් සලකා එසේ සන්නයක් ලියා ප්‍රසිද්ධකැරවීමෙන් ඇති වියහැකි උභය ලෝකාභිවෘද්ධිය අපටද වැටහී ගියෙන් තිශරණාධ්‍යාශයෙන් මෙම ව්‍යාඛ්‍යානය ලිවීමෙහි ව්‍යාපෘත වීමු.

එසේ සන්නය ලියාගෙන යන අතර ගිහි පැවිදි බොහෝ දෙනාගේ ඕනෑකම පිටත් අපගේ පහසුව සලකාත් මුද්‍රිත පෝර්ම දශයකින් යුත් ඛාණ්ඩ වශයෙන් පොත ඉක්මනින් ප්‍රසිද්ධකරවන්ට පටන්ගත් නමුත් අතුරතුර පැමිණි ස්වාභාවික බාධා හේතුවෙන් අතපසුවූ නමුත් වයොවෘද්ධාවස්ථාවෙහි සිටින අපගේ ආරම්භයෙහි අවශානය දැකීමට අප ශිෂ්‍ය පසියාගල විමලරංසි තැනගේ විශෙෂාධාර හේතුවූ බව කියම්හ.

තවද මෙහි දෙවන තුන්වන කලාප මුද්‍රණය කරවන අවස්ථාවෙහි අප හිතමිත්‍ර වැලිතර විද්‍යාභාෂා පරිවෙණාධිපති යූ. ඒ. ඤාණතිලක නායක ස්ථවිරතුමන්ගෙන්ද, සතරවන කලාපයේ පටන් අවශානය දක්වා මුද්‍රණයකරවන අවස්ථාවෙහි වේලාපුර කළුතර පෞරාණික දීපාරාම දූවේ විහාරාධිවාසී ආචාර්ය බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය ස්ථවිරතුමන්ගෙන්ද බොහෝ ආධාරෝපකාර ලැබුණුබව සහ අප හිතමිත්‍ර කහාවේ සිරිසෝභනාරාමාධිපති අධිකරණ නායක ධූරන්ධර ආභිධම්මික කහාවේ ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේගෙන් විශේෂාධාර ලැබුණුබවත් සඳහන්කරමින් අපගේ අවඞකාදර සතුතිය පුදකරම්හ.

මෙසේ ධර්මශාස්ත්‍ර සඞ්ග්‍රහයම පරමාර්ථකොට අප විසින් ලියන ලද මේ සූත්‍ර සඞ්ග්‍රහ පදාර්ථ ව්‍යාඛ්‍යානය ශාසනාන්තය දක්වා ගිහි පැවිදි ආධුනිකයන්ට වැඩ සිදුකෙරෙමින් පවතිවායි ආශංසනය කරමින් මෙබඳු ව්‍යාඛ්‍යානාදියක් කිරීමෙහිදී ප්‍රමාද භ්‍රමාදි වශයෙන් වන සදෝෂස්ථාන විද්‍යමානතාවය ඊර්ෂ්‍යාපරවශ නොවූ මෙබන්දෙහි කෘතහස්තවූ සකල සාධූන්ම දන්නා බැවින් එබන්දක් විද්‍යමානවත්හොත් ක්ෂමාපර වෙත්වා.

මුද්‍රණයෙහිදී අක්ෂර විපර්‍යාසාදියෙන් වූ දෝෂ ස්ථාන පාලිය හා සන්නය සසඳා බැලීමාදියෙන් නිදොස්කර ගැණීමෙන් අර්ථාවබොධය ම සලකත්වා.

මීට:—

සිරිසුගත ශාසන වංශපාල ගණාචරිය අරියවංශතිලක

මෙධාවීතිස්ස මහා නායක ස්ථවිරයෝ වම්හ.

4–4–1935,

ක්ෂේත්‍රාසන්න විහාරය;

වස්කඩුව.




වස්කඩුවේ ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය පරිවෙණාධිපති මහාමහෝපාධ්‍යාය
සිරිසුගත සාසනවංශපාල ගණාචරිය අරියවංශතිලක
**මේධාවීතිස්ස මහානායක මහහිමියන්වහන්සේ.**

WICKRAMA PRESS, KALUTARA SOUTH.

# සූත්‍ර පටුන.


| | | පිට. |
|---|---|---|
| 1 | කාලදන සූත්‍රය | 12 |
| 2 | සුමනා සූත්‍රය | 26 |
| 3 | සප්පුරිසදන සූත්‍රය | 30 |
| 4 | වෙලාම සූත්‍රය | 44 |
| 5 | දක්ඛිණාවිභඞ්ග සූත්‍රය | 62 |
| 6 | චූළකම්මවිභඞ්ග සූත්‍රය | 86 |
| 7 | මහානාම සූත්‍රය | 90 |
| 8 | උපාසකචණ්ඩාල සූත්‍රය | 91 |
| 9 | උපාසකරතන සූත්‍රය | 92 |
| 10 | වණිජ්ජ සූත්‍රය | 92 |
| 11 | විසාඛුපොසථ සූත්‍රය | 127 |
| 12 | සිගාලොවාද සූත්‍රය | 159 |
| 13 | ධම්මහදයවිභඞ්ග සූත්‍රය | 175 |
| 14 | ඡත්තමානවක විමාන වර්ණනාව | 196 |
| 15 | රේවතීවිමානවර්ණනා | 215 |
| 16 | ගුත්තිල විමාන වර්ණනාව | 241 |
| 17 | අනෙකවණ්ණ විමාන වර්ණනාව | 246 |
| 18 | දෙවදූත සූත්‍රය | 274 |
| 19 | මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය | 300 |
| 20 | අට්ඨිපුඤ්ජ සූත්‍රය | 303 |
| 21 | පාවෙය්‍ය සූත්‍රය | 308 |
| 22 | සූකරපොතිකායවස්තුව | 315 |
| 23 | පරාභව සූත්‍රය | 320 |
| 24 | අග්ගප්පසාද සූත්‍රය | 324 |
| 25 | සබ්‍රහ්මක සූත්‍රය | 326 |
| 26 | නිරයූපපත්ති සූත්‍රය | 327 |
| 27 | සුගතූපපත්ති සූත්‍රය | 329 |
| 28 | දෙවාචවන සූත්‍රය | 332 |
| 29 | පධාන සූත්‍රය | 335 |
| 30 | මාපුඤ්ඤභායී සූත්‍රය | 337 |
| 31 | අප්පමාද සූත්‍රය | 339 |
| 32 | පඨමසතුල්ලපකායික සූත්‍රය | 341 |
| 33 | දුතියසතුල්ලපකායික සූත්‍රය | 345 |
| 34 | ආදිත්ත සූත්‍රය | 347 |
| 35 | මච්ඡර සූත්‍රය | 349 |
| 36 | යාවජරා සූත්‍රය | 350 |
| 37 | පවාසිමිත්ත සූත්‍රය | 351 |
| 38 | මච්චුනාබ්භාහත සූත්‍රය | ,, |
| 39 | සද්ධිබචිත්ත සූත්‍රය | 352 |
| 40 | රූපස්සරණ සූත්‍රය | 353 |
| 41 | පාථෙය්‍ය සූත්‍රය | 354 |
| 42 | ධම්මරථ සූත්‍රය | 356 |
| 43 | නඋස්සුතබ්බ සූත්‍රය | 362 |
| 44 | ජරාමරණ සූත්‍රය | 364 |
| 45 | අත්තප්පිය සූත්‍රය | 367 |
| 46 | පජ්ජොද සූත්‍රය | 369 |
| 47 | අප්පමාද සූත්‍රය | 371 |
| 48 | අපුත්තක සූත්‍රය | 376 |
| 49 | නගොපම සූත්‍රය | 385 |
| 50 | පබ්බතූපම සූත්‍රය | 391 |
| 51 | ලොකානුවිවරණ සූත්‍රය | 398 |
| 52 | සුපුබ්බණ්හ සූත්‍රය | 400 |
| 53 | සල්ල සූත්‍රය | 404 |
| 54 | නඛසිඛා සූත්‍රය | 406 |
| 55 | නිධිකණ්ඩ සූත්‍රය | 409 |
| 56 | වරිමාලොප සූත්‍රය | 413 |
| 57 | බලදන සූත්‍රය | 414 |
| 58 | පුස්සදෙවඩස්ථන සූත්‍රය | 416 |
| 59 | පඤ්චවට්ඨානදන සූත්‍රය | 417 |

| | | පිට. |
|---|---|---|
| 60 | යාගදනානුමෝදනා සූත්‍රය | 419 |
| 61 | වස්සකාරානුමෝදනා සූත්‍රය | 420 |
| 62 | විහාරදනානුමෝදනා සූත්‍රය | 42[illegible] |
| 63 | වේළුවනදනානුමෝදනාව | 428 |
| 64 | ගිහිපටිපදා සූත්‍රය | 430 |
| 65 | මහාසමය සූත්‍රය | 447 |
| 66 | තිරොකුඩ්ඩ සූත්‍රය | 460 |
| 67 | ජානුස්සෝණි සූත්‍රය | 470 |
| 68 | අඬකවින්ද සූත්‍රය | 473 |
| 69 | මහාරාහුලෝවාද සූත්‍රය | 483 |
| 70 | ධම්මවිහාරී සූත්‍රය | 485 |
| 71 | රාහුල සූත්‍රය | 487 |
| 72 | විජය සූත්‍රය | 490 |
| 73 | තුවටක සූත්‍රය | 496 |
| 74 | අනත්තලක්ඛණ සූත්‍රය | 499 |
| 75 | චූලරාහුලෝවාද සූත්‍රය | 503 |
| 76 | අජ්ඣත්තිකාඞ්ග සූත්‍රය | 504 |
| 77 | බාහිරාඞ්ග සූත්‍රය | 505 |
| 78 | පිණ්ඩියාලෝප සූත්‍රය | 507 |
| 79 | ආරද්ධවිරිය සූත්‍රය | 509 |
| 80 | ජාගරණ සූත්‍රය | 511 |
| 81 | සල්ල සූත්‍රය | 513 |
| 82 | හිදුර සූත්‍රය | 514 |
| 83 | දසධම්ම සූත්‍රය | 515 |
| 84 | ආරඤ්ඤිකානාගත භය සූත්‍රය | 518 |
| 85 | දසබල සූත්‍රය | 521 |

# සූත්‍රසංග්‍රහපදාර්ථව්‍යාඛ්‍යානය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

"නිස්සයමුච්චකෙන[1] භික්ඛවෙ භික්ඛුනා පක්ඛදිවසෙසු ධම්මසවණත්ථාය සුත්තන්තතො චත්තාරො භාණවාරා සම්පත්තානං පරිකථාය අන්ධකවින්දමහාරාහුලොවාදඅම්බට්ඨසදිසො එකො කථාමග්ගො සඞ්ඝභත්තමඞ්ගලාමඞ්ගලෙසු අනුමොදනත්ථාය තිස්සො අනුමොදනා උග්ගහෙතබ්බා"ති වචනතො සාසනජොතනත්ථිකානං නිස්සයමුච්චකානං[2] භික්ඛූනං අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භියොභාවාය ධම්මදෙසනත්ථිකානං සුඛා

භික්ඛවෙ, මහණෙනි; නිස්සයමුච්චකෙන, නිසෙන් මිදෙන්නාවූ; භික්ඛුනා, මහණහු විසින්; පක්ඛදිවසෙසු, පක්ෂදිනයන්හි; ධම්මසවණත්ථාය, ධර්මශ්‍රවණය පිණිස; සුත්තන්තතො, සූත්‍ර පිටකයෙන්; චත්තාරො භාණවාරා, සතරබණවරක්ද; සම්පත්තානං, පැමිණියවුන්ට; පරිකථාය, කීම පිණිස; අන්ධකවින්ද මහාරාහුලොවාද අම්බට්ඨසදිසො, අන්ධකවින්ද මහාරාහුලොවාද අම්බට්ඨසූත්‍ර සමානවූ; එකො කථාමග්ගො, එක්කථාමාර්ගයෙක්ද; සඞ්ඝභත්ත මඞ්ගලා මඞ්ගලෙසු, සඞ්ඝභක්ත මඞ්ගලාව මඞ්ගල්‍යයන්හි; අනුමොදනත්ථාය, අනුමෝදනා කිරීම පිණිස; තිස්සො අනුමොදනා ච, ත්‍රිවිධ අනුමෝදනාවෝද; උග්ගහෙතබ්බාති ඉගෙණගත යුක්තාහුයයි; වචනතො, වදාළහෙයින්; සාසනජොතනත්ථිකානං, ශාසනය බබලවනු කැමැත්තාවූ; නිස්සයමුච්චකානං, නිසෙන් මිදෙන්නාවූ; භික්ඛූනං, භික්ෂූන්ටද; අප්පසන්නානං නොපැහැදුන වුන්ගේ පසාදාය වා පැහැදීම පිණිසද; පසන්නානං වා, පැහැදුන වුන්ගේ; භියොභාවාය වා, වැඩියක් පැහැදීම පිණිසද; ධම්මදෙසනත්ථිකානං, ධර්මදෙශනාකරණු කැමැත්තවුන්ට; සුඛාවගාහි, සැපඑළවන්නාවූ; දානසීලාදි පුඤ්ඤ

1 නිස්සයමුත්තකෙන. 2 නිස්සයමුත්තකානං.

වහානි දානසීලාදි පුඤ්ඤකිරියවත්ථූනං සුකොසල්ලාවහානි උප
සක උපාසිකානං පුත්තධීතානං දාසිදාසගහට්ඨපබ්බජිතානං පටි
පත්ති දීපකානි දානකථා සීලකථා සග්ගකථා කාමානං ආදීන
වො නෙක්ඛම්මෙ ආනිසංසොති ඉමිස්සා ආනුපුබ්බිකථාය අනු
කූලානි චතුභාණවාරාධිකානි පඤ්චාසීතිප්පමාණානි සුත්තානි
එවං වෙදිතබ්බානි.

පරෙසඤ්චපන ධම්මදෙසනා න සුකරා; තස්මා පරෙසං ධම්මං
දෙසෙන්තෙන අත්ථකුසලෙන ධම්මකුසලෙන පුබ්බාපරකුසලෙන
කාලඤ්ඤුනා පරිසඤ්ඤුනා බ්‍යඤ්ජනානි අවිනාසෙත්වා විකාරං
අකත්වා සමණසාරුප්පෙන දෙසනාසුවිඤ්ඤෙය්‍යෙන විස්සට්ඨෙන
කණ්ණසුඛෙන පොරියෙන පරිමණ්ඩලලක්ඛණෙන නාතිමන්දෙන

---

කිරිය වත්ථූනං, දානසීලාදී පුණ්‍යක්‍රියා වස්තූන්ගේ; සුකොසල්ලාව
හානි, මනා කෞශල්‍යය එළවන්නාවූ; උපාසක උපාසිකානං, උ
පාසක උපාසිකාවන්ගේද; පුත්තධීතානං, පුත්‍රධීතෘන්ගේද; දාසි
දාස ගහට්ඨ පබ්බජිතානං, දාසිදාස ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ගේද; පටි
පත්තිදීපකානි, ප්‍රතිපත්තිප්‍රකාශකරන්නාවූ; දානකථා, දානකථා
ය; සීලකථා, සීලකථාය; සග්ගකථා, ස්වර්ගකථාය; කාමානං,
පඤ්චකාමයන්ගේ; ආදීනවො, දෝෂය; නෙක්ඛම්මෙ, නෛෂ්ක්‍ර
ම්‍යයෙහි; ආනිසංසො ඉති, ආනිසංසයයි; ඉමිස්සා ආනුපුබ්බිකා
ථාය, මේ පිළිවෙළකථාවට; අනුකූලානි, අනුකූලවූ; චතුභාණවා
රාධිකානි, සතරබණවරකට අධිකවූ; පඤ්චාසීතිප්පමාණානි, අසූ
පහක් පමණවූ; සුත්තානි, සූත්‍රයෝ; එවං, මෙසේ; වෙදිතබ්බානි,
දතයුත්තාහුය.

පරෙසඤ්ච ඛො පන, අනුන්ට වනාහි; ධම්මදෙශනා, දහම්
දෙසීම; නසුකරා, පහසු නොවන්නීය; තස්මා, එහෙයින්; පරෙසං,
අනුන්ට; ධම්මං දෙසෙන්තෙන, ධර්මදෙශනා කරන්නහු; අත්ථකුස
ලෙන, අර්ථයෙහි දක්ෂවූවක්හුද; ධම්මකුසලෙන, ධර්මයෙහි දක්ෂවූව
ක්හුද; පුබ්බාපර කුසලෙන, පූර්වාපර සන්ධිගැළපීමෙහි දක්ෂවූවක්
හුද; කාලඤ්ඤුනා, කල්දන්නක්හුද; පරිසඤ්ඤුනා පිරිසදන්නක්
හුදවී; බ්‍යඤ්ජනානි, දශවිධ ව්‍යඤ්ජනයන්; අවිනාසෙත්වා, නොන
සා; විකාරං අකත්වා, විකාරනොකොට; සමණ සාරුප්පෙන, ශ්‍රමණ
සාරූප්‍යයෙන්; දෙසනා සුවිඤ්ඤෙය්‍යෙන, දෙශනාව මනාව ඇඟ
වීමට යොග්‍යවූ; විස්සට්ඨෙන, පැතුරුනාවූ; කණ්ණසුඛෙන, කණ
ට සැපවූ; පොරියෙන, නුවර උපන් වචනයෙන්; පරිමණ්ඩල

නාතිසීඝෙන සම්පවත්තෙන සරෙන පරිසංඛොභෙත්වා ආකාසගඞ්ගං ඔතාරෙන්තෙන විය උපමාහෙතුදාහරණෙහි විත්ථාරෙත්වා සකටමග්ගෙ ගච්ඡන්තෙන විය කායසීසහත්ථපාදචාලන රහිතෙන බුද්ධලීලාය දෙසෙන්තෙන විය විමුත්තායතනසීසෙ ඨත්වා පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරෙසං ධම්මො දෙසේතබ්බො–වුත්තං හෙතං භගවතා.

‘‘න ඛො ආනන්ද සුකරං පරෙසං ධම්මං දෙසෙතුං, පරෙසං ආනන්ද ධම්මං දෙසෙන්තෙන පඤ්චධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරෙසං ධම්මො දෙසෙතබ්බො–කතමෙ පඤ්ච? ආනුපුබ්බිකථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො පරියායදස්සාවී කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො අනුද්දයතං පටිච්ච කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො

---

ලක්ඛණෙන, පිරිමඬුලු ලකුණෙන්; නාතිමන්දෙන, ඉතා ලස් නොවූ; නාතිසීඝෙන, ඉතා යුහු නොවූ; සම්පවත්තෙන, සමව පැවැත්තාවූ; සරෙන, ස්වරයෙන්; පරිසංඛොභෙත්වා, පිරිස අලළා; ආකාසගඞ්ගං, අහස්ගඟ; ඔතාරෙන්තෙන විය, බස්වන්නක්හු මෙන්; උපමාහෙතුදාහරණෙහි, උපමා හෙතු උදාහරණයන් ගෙන්; විත්ථාරෙත්වා, විස්තර කොට; සකටමග්ගෙ, ගැල්මග; ගච්ඡන්තෙන විය, යන්නක්හු මෙන්; කායසීස හත්ථපාද චාලන රහිතෙන, කය හිස අත් පා සැලීම් රහිතවූවහු; බුද්ධලීලාය, සර්වඥ ලීලාවෙන්; දෙසෙන්තෙන විය. දෙශනා කරන්නකු මෙන්; විමුත්තායතනසීසෙ, ලාභාදිහෙතු නිස්සරණ ශීර්ෂයෙහි; ඨත්වා, සිට; පඤ්චධම්මෙ, කරුණු පසක්; අජ්ඣත්තං, තමා කෙරෙහි; උපට්ඨපෙත්වා, එළවා; පරෙසං, අනුන්ට; ධම්මො, ධර්මය තෙම; දෙසෙතබ්බො, දෙසියයුතුයි; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; එතං, මේය; වුත්තංහි, එහෙයින් වදාරණලද්දේය.

ආනන්ද, ආනන්දය; පරෙසං, අන්‍යයන්ට; ධම්මං, ධර්මය; දෙසෙතුං, දෙශනා කරන්ට; නඛො සුකරං, සුකර නොවේ; (හෙවත්) පහසු නොවේ. ආනන්ද, ආනන්දය; පරෙසං, අනුන්ට; ධම්මං, ධර්මය; දෙසෙන්තෙන, දෙසන්නහු විසින්; පඤ්චධම්මෙ, කරුණු පසක්; අජ්ඣත්තං, තමා තුළ; උපට්ඨපෙත්වා, එළවා; පරෙසං, අනුන්ට; ධම්මො, ධර්මය තෙම; දෙසෙතබ්බො, දෙසියයුත්තේය; කතමෙ පඤ්ච, පස කවරහුදයත්; ආනුපුබ්බිකථං, පිළිවෙළකථාව; කථෙස්සාමි ඉති, කියන්නෙමියි; (සිතතබ්බා) පරෙසං, අනුන්ට; ධම්මො, ධර්මය තෙම; දෙසෙතබ්බො, දෙසිය යුත්තේය; පරියායදස්සාවී, ඒ ඒ අර්ථයන්ට සමානාර්ථ පදයන් දක්නා සීලිව; කථං, කථාව; කථෙස්සාමි ඉති, කියන්නෙමියි; පරෙසං, අනුන්ට;

න ආමිසන්තරො කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො"ති "න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො භාසිතබ්බො"ති ච–

**තත්‍රිමානි සුත්තානි.**

එවමෙමසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ

---

ධම්මො, ධර්මයතෙම; දෙසෙතබ්බො, දෙසිය යුත්තේය. අනුද්දයතං පටිච්ච, අනුකම්පා පිණිස; (හෙවත් මහත් සම්බාධයට පැමිණියාවූ සත්වයන් එයින් මුදන්නෙමි යන අනුකම්පා පිණිස) කථං, කථාව; කථෙස්සාමීති, කියන්නෙමියි පරෙසං, අනුන්ට; ධම්මො දෙසෙතබ්බො, දහම්දෙසිය යුතුය; න ආමිසන්තරො, ආමිස ලාභාපෙක්ෂා රහිතවූයේ; (හෙවත් සිව්පසය ප්‍රාර්ථනා නොකරන්නේ) කථං, කථාව; කථෙස්සාමීති, කියන්නෙමියි; ධම්මො දෙසෙතබ්බො, දහම් දෙසිය යුතුය; අත්තානඤ්ච, තමාද; පරඤ්ච, අන්‍යයාද; අනුපහච්ච, (අත්තුක්කංසන පරවම්භනාදී වසයෙන්) නොගටා; කථං, කථාව; කථෙස්සාමීති, කියන්නෙමියි; පරෙසං, අනුන්ට; ධම්මො දෙසෙතබ්බො ඉති, දහම්දෙසිය යුත්තේයයිද; භික්ඛවෙ, මහණෙනි; ආයතකෙන, මාත්‍රාවයක් ඉක්මවීමෙන් දික්වූ; ගීතස්සරෙන, ගීතස්වරයෙන්; ධම්මො, ධර්මය තෙම; න භාසිතබ්බො ඉතිච, දෙශනා නොකටයුත්තේයයිද යනුයි.

**තත්‍ර, එහි; ඉමානි සුත්තානි, මේ සූත්‍රයෝ වෙත්.**

මෙ, (ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ විශුද්ධබුද්ධීන් ප්‍රසිද්ධ බෞද්ධ විද්වජ්ජන ප්‍රමුඛ සකලශ්‍රොතෘ ජනමනඃප්‍රසාදජනකවූ මේ කාලදක්වා සූත්‍රාන්ත ධර්මදෙශනාව) මා විසින්; එවං, මේ ආකාරයෙන්; සුතං, අසනලදී. (නොහොත්) මෙ, මාගේ: සුතං, ශෘතිය; (ඇසීම) එවං, මෙසේමැයි; එකං සමයං, (ගර්භාවක්‍රාන්ති සමය ජාති සමය සංවෙග සමය අභිනිෂ්ක්‍රමණ සමය දුෂ්කරක්‍රියා සමය මාරවිජය සමය සම්‍යක් සම්බෝධි සමධිගම සමය දෘෂ්ටධර්ම සුඛවිහාරසමය අත්තහිත ප්‍රතිපත්ති සමය පරහිත ප්‍රතිපත්ති සමය දෙශනා සමය පරිනිර්වාණ සමය යනාදී දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ සමයන් අතුරෙන් කරුණාකෘත්‍ය සමය සඞ්ඛ්‍යාතවූ ධර්මදෙශනා කරණ) එක් සමයෙක්හි; භගවා, (ලෞකික ලොකොත්තරහිත සුඛාභිනිෂ්පාදක දාන ශීල

නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥා වීර්‍ය්‍ය ක්‍ෂාන්ති සත්‍ය අධිෂ්ඨාන මෛත්‍රී උපෙක්‍ෂා පාරමී කුශල ධර්‍මයෙහි පාරප්‍රාප්ත භාග්‍යයෙන් යුක්ත බැවින්ද ලෝභ ද්වේෂ මෝහ විපරීත මනස්කාර අහිරික අනොත්තප්ප ක්‍රෝධ උපනාහ මක්ඛපලාස මායා සාඨෙය්‍ය ථම්භ සාරම්භ මාන අතිමාන මද ප්‍රමාද තෘෂ්ණා අවිද්‍යා ලෝභාකුශල මූල ද්වේෂාකුශල මූල මෝහාකුශලමූල කායදුශ්චරිත වාක්දුශ්චරිත මනො දුශ්චරිත තෘෂ්ණාසඞ්කෙලශ දෘෂ්ටිසඞ්කෙලශ මානසඞ්කෙලශ රාගමල ද්වෙෂ මල මෝහමල රාගවිෂ ද්වේෂවිෂ මෝහවිෂ කාමසංඥා භවසංඥා විභවසංඥා කාමවිතර්ක ව්‍යාපාද විතර්ක විහිංසාවිතර්ක තෘෂ්ණාප්‍රපඤ්ච මානප්‍රපඤ්ච දෘෂ්ටිප්‍රපඤ්ච චතුර්විධවිපරීත චතුරාශ්‍රව චතුර්විධ ග්‍රන්ථ චතුරෝඝ චතුයෝග සතරඅගති චතුර්විධ තෘෂ්ණොද්පාද පඤ්චොපාදාන පඤ්චචෙතොඛිල පඤ්චවිනිබන්ධ පඤ්චනිවරණ පඤ්චඅභිනන්දන ෂට්විවාදමූල ෂට්විධ තෘෂ්ණා සප්තානුශය අෂ්ටමිච්ඡත්ත නවතෘෂ්ණොද්පාද දශඅකුශල කර්‍මපථ ද්වාෂෂ්ටි දෘෂ්ටි අෂ්ටොත්තර ශතප්‍රභෙද තෘෂ්ණාය යන සකල සත්ත්වයන්ට දරථපරිදාහකාරීවූ නොයෙක් ලක්‍ෂගණන් හෙවත් ආලම්බනාදී විභාගවශයෙන්ද, ප්‍රවෘත්ති ආකාර විභාගවශයෙන්ද, අනන්ත ප්‍රභෙදවූ ක්ලෙශයන් සංක්‍ෂෙපයෙන් සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් සර්‍වාකාරයෙන් නොපැවැත්ම කිරීමෙන් කෙලශමාරයාද සමුච්ඡෙදප්‍රහාණ පරිඥාවශයෙන් ස්කන්ධමාරයාද තෘෂ්ණා නමැති යහලුවාගේ විකලබව කිරීම්වශයෙන් සර්‍වප්‍රකාරයෙන් නොපැවැත්මවූ කුශලාකුශල සඞ්ඛ්‍යාත අභිසංස්කාර මාරබල විධ්වංශනයද ආඥාචක්‍රය ඉක්මවීම් වසයෙන් දෙවපුත්‍ර මෘත්‍යුමාර දෙදෙනාද යන මේ පස්මරුන් භග්නකළ හෙයින්ද, ඓශ්වර්‍ය්‍ය පුණ්‍ය යසඃ, ශ්‍රීසංකල්ප සිද්ධිප්‍රයත්නය යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්‍ණ හෙයින්ද, කුශලාදී ධර්‍මයන් පඤ්චස්කන්ධ ද්වාදශායතන අෂ්ටා දශ ධාතු චතුස්සත්‍ය ද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශාඞ්ග ප්‍රතීත්‍ය සමුද්පාදසමෘති ප්‍රස්ථාන සම්‍යක්ප්‍රධානාදි වශයෙන් විභාගකළ හෙයින්ද දිව්‍ය බ්‍රහ්මාර්‍ය්‍ය විහාර කාය චිත්තොපධි විවෙක ශූන්‍යතා ප්‍රණිහිතා නිමිත්ත විමොක්‍ෂ පඤ්චාභිඥාදීවූ ලෞකික ලොකොත්තර උත්තරි මනුෂ්‍යධර්‍මයන් භජනය කළ හෙයින්ද, කාමරූපාරූපසඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අභීන් මාර්ගඥාණමුඛයෙන් වාන්ත කළහෙයින්දුයි යනාදී අර්ථයෙන් භාග්‍යවත්නම්වූ සර්‍වඥරාජොත්තමයාණන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ;

ඒනුවරවනාහි මුක්තාමාණික්‍ය වෛදූර්‍ය්‍ය සඞ්ඛශිලා ප්‍රවාල රජත
සුවර්ණ මසාරගල්ල ලොහිතාඞ්කයයි කියනලද දශවිධරත්න
යෙන් සශ්‍රීකවූ හෙයින්ද සවත්ථනම් සෑෂිගට නිවාසස්ථානවූ හෙ
සින්ද නොහොත් අග්‍රශ්‍රීධර ලොකානුනයහිත ලක්ෂිත ක්ෂිතිපාල
සුරක්ෂිත විචක්ෂණ ශිලිමුඛ සුරදෘමොපම හිමාද්‍රි ශිඛරසුධාතිධවල
ප්‍රාකාර මණ්ඩල මන්දිරාලඞ්කෘත ශිශිරකර කිරණ නිකර රුචිර
තර නඛප්‍රභාන්විත දීර්ඝාඞ්ගුලිවරණ මණිනූපුරාලඞ්කෘත පාද
පඞ්කජො පෙත සරකත කෙතකී මකුලලක්ෂ්‍ය විවිධප්‍රභාකදම්බ
ජඞ්ඝායුගලොප සොභිත පෘථුලතර වාරිබුද්බුදකාර ජානුම
ණ්ඩල මණ්ඩිත කණකාරම්භාකාර මනොහරොරු චන්ච මණිමෙ
ඛලානුබද්ධ ජඝනකෘස තනුමධ්‍යදෙශාලඞ්කෘත මනොහර හාරා
භිරාම කාඤ්චන කුම්භාකෘති පීනපයොධර තරුණාභිකමල විනි
ගීත මධුකරරාජි නිර්විශෙෂ රොමාවලී ශ්‍රීධර අශොක පල්ලවා
කාර මෘදුකොමලාලඞ්කෘත කිරණ මණිවලය විරාජිත විලෙ
පනාමොද සුරභිභොගීන්ද්‍රභොග නිර්විශෙෂ තනුතර බාහුලතා
ශොභිත රෙඛාත්‍රයාලඞ්කෘත කම්බුග්‍රීවාභිරාම බන්ධුකපුෂ්ප ප්‍රභා
ධරාධර පල්ලවොප ශොභිත නීලොත්පල පුෂ්පපත්‍ර ප්‍රතිභාග
විශාලායත ලොචනොපෙත මණිකුණ්ඩලමණ්ඩිත ගණ්ඩාන්ත
ඇති කුන්දමුකුල සදෘශ ශතමරීචි නිචයස්ඵුරිත තිලකුසුම මනො
ඥ නාසාපුට ඇති අර්ධචන්ද්‍ර මණ්ඩලාකාර ලලාට තමාලලතාකාර
මෘදුකෙස භාරාභිරාම හාව භාවලීලාවිලාස සුන්දරරූප සෞන්ද
ර්‍ය්‍යාභි සමහාසමාණ විවිධනාරීවරනරාණුචරිත චාරුතරානෙක
භාණ්ඩ ෂණ්ඩ ප්‍රපූර්ණාපන පඞ්ක්ති ශොභිත වීථිපඞ්ක්තියෙන් හා
වීථිසඤ්චරිත වාතකම්පිත වලාහකාකාර හස්ත්‍යශ්ව රථ පදා
ත්‍යාදී නානාප්‍රකාර පරමරමනීය නගරාඞ්ගශ්‍රී සමෘද්ධීන් සම්
පූර්ණ පුරන්දර පුරාකාර කොසලදෙශ තිලකායමානවූ පැවැත්
මෙන්සුත් සැවැත්නුවරට සමීපවූ) ජෙතවනෙ, (ජෙතනම් රාජ
කුමාරයාවිසින් රොපිතසංවර්ධිතවූ විකසිත පඤ්චවිධ පද්මොත්
පල සඤ්ඡන්න මධුරනීර සම්පූර්ණ පුෂ්කරණියෙන් හා සුරභි
මකරන්ද බින්දු සන්දොහ සඤ්චරිත සම්බහුල කොකිලාලාපවාචාල
මන්දාර පුචිමන්ද චන්දන පූග පුන්නාග නාගතාල හින්තාල වකුල
ඛර්ජූරි ක්‍රමුකාම්‍ර ජම්බුජම්බීර පණස පාටල කෙතකාශොක
චම්පකාදි නිත්‍යපුෂ්පයෙන් සඤ්ඡන්නානෙක මහීරුහ සඞ්ඝාත
යෙන් සකලජන මනොනන්දනවූ කෛලාශ ගිරිශිඛර ප්‍රතිභාග
සුධානිධවල ප්‍රාකාර පරික්ෂිප්ත ගොපුරද්වාර විශාල මණ්ඩපයෙන්
හා නෙකශතප්‍රාසාද ශ්‍රෙණීන් විරාජිතවූ මධුමත්තකීර කොකිල

අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි

වන්වාරාවරචිත මන්දගන්ධවාහසන්ධූත සාන්ද්‍රනීලදල පල්ලවාලඞ්කෘත සාලද්‍රුම රාජරාජිත සුරාසුර මනුජ භුජගමනනයන නන්දන කාරණා කාරයෙන් විරාජමාන හෙයින්) ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, (සතත සුචරිත විශද සකරුණා හෘදය පරිහෘත දුරිත සමුදිත සකලගුණනිධි විබුධජන ශකල නිඛිල ජනහිත නිරත නිජදෙහධරවූ සියලු අනාථ යාචක ජනයන්ට සුරභි සුරමිණි සුරතුරු භද්‍රඝටාකාර විතරණයෙන් කැමැති මහරු ඉසුරු සිරිදීමෙන් පරංප්‍රසිද්ධ සංසිද්ධි ශුද්ධබුද්ධි නිධ්‍යන්තර භාෂිත ශ්‍රවණ සංවර්ධිත ශ්‍රද්ධාදි ගුණප්‍රසාදිත සත්වයන් විෂයෙහි ප්‍රකට විශ්වජනාධාර සුදත්ත නම් මහසිටුහු විසින් ත්‍රිභුවනෛක ප්‍රදීපායමානවූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේට වැඩවිසීමට ජෙතනම් රාජකුමාරයාගේ උයන රම්‍යවූසේදැන සත්රුවණින් උයන්බිම වසා භූමිස්වාමියාහට අටලොස්කොළක් වසතුදී උයනගෙණ විහාර කර්මාන්තයට පටන්ගෙණ අනන්තාපර්‍යන්ත බුදුවරයන්ගේ ශාසනස්ථිති ස්ථානවූ සියලු බුදුවරයන් විසින් අවිජහිත භූමියෙහි බුදුරජාණන් වහන්සේට විසිතුරු ගඳකිළියක් හෙවත් විහාරයක් කරවා ඒවට සඞ්ඝාරාම රාත්‍රිස්ථාන දිවාස්ථාන චඞ්ක්‍රමණ මණ්ඩප පුෂ්කරණී විල්පතැස් පුෂ්පාරාම ඵලාරාමාදිවූ සියල්ල විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් නිර්මිතකළාසේ ඉතා මනොහර කොට නිමවා සිසාරාදහසක් රියන් හා උසින් අටලොස්රියන් මහාපව්ර කරවූයේය, එකල ජෙතනම් රාජකුමාර තෙමේද සිටාණෝ කරවන්නාවූ ඒ විහාරකර්මාන්තයෙහි පැහැද සිටක්හුගේ සම්පත් රජක්හට නොනොබිත්මැයි ඔහුදුන්මිල ඔහුගේ විහාරයට පරිත්‍යාග කරමියිසිතා නැගෙණහිරවාසල භූමියෙහි එක්සිය විසිරියනක් අයම්විතර ඇති සත්මාල් මාළිගාවක් සකස්කොට කරවා සෙසු තුන්වාසලද එසේම මනොහරකොට කරවා ඒ බිම විකොටහත් අටලොස් කෙළක් පමණ මසුරන් එමවෙහෙර සතර වාසල් කර්මාන්තයට පරිත්‍යාග කෙළේය ඉක්බිත්තෙන් මහසිටාණෝ මේ සියලු විහාරකර්මාන්ත නිමිකල්හි බුද්ධප්‍රවරා යැව්යේය. එකල බුදුරජාණන් වහන්සේ යොදනින් යොදනට සිටාණන් කරවූ විහාරයෙන් විහාරයෙහි නැවතී නැවතී පන්සාළිස්දවසකින් සැවැත්නුවරට වැඩිසේක. සිටාණෝද ඒ කළ විහාරය මුළුල්ලෙහි ධවජපතාකා පුන්කලස් තබා කොසොල්තොරණින් පිළිතොරණින් දිවඋයනක්සේ සරහා තමන්ගේ පුතනුවන් සහා

භරණයෙන් සරහා පන්සියයක් සිටුකුමරුවන් පරිවාරදී පස්
පැහැයෙන් දිලියෙන පන්සියයක් ධජපෙළ හා බුදුන් වඩනා
පෙරමගට යැවිහ. ඔවුන් පසුපස්සෙහි මහාසුභද්‍රාය චූලසුභද්‍රාය
යන සිටුදූවරු දෙදෙන දෙව්කුමරියන්සේ සරහා සමවයස්
ඇති කුමරියන් පන්සියය පන්සියයක් සමඟ රන් කලස්
රන්පත්දී යැව්යේය. ඊට ඉක්බිතිව සිටාණෝ අග්‍රසිටුදිය
තියන් පන්සියයක් කුලස්ත්‍රීන් හා සර්වාභරණයෙන් සරහා රන්
පත්දී යැව්යේය. ඊට ඉක්බිතිව කොසොල් රජ්ජුරුවන්ගේ
සුමනා නම් රාජකුමාරිකාව පන්සියයක් කුමාරිකාවන් පිරිවරා
සර්වාභරණයෙන් සැරහී සුවඳමල් කරඬුගෙණ නික්මුනාහ. ඊට
ඉක්බිතිව අමාත්‍ය කුමාරිකාවරු පන්සියයක් සර්වාභරණයෙන්
සැරහී මල්කලස්ගෙණ නික්මුනාහ. ඔවුන්ට ඉක්බිතිව නුවර
වැසියෝ නොයෙක් අලඞ්කාරයෙන් සැරහී පූජාභාණ්ඩගෙණ
අප්‍රමාණව නික්මුනාහ. ඔහු හැමදෙනාම ගියකල්හි අනේපිඬු
මහසිටාණෝ පන්සියයක් සිටුවරුන් හා සමඟ සුදුදුවලු පිළිහැද
පූර්ණමගුල් වෙස්ගෙණ සුවඳමල්ගත් අත්ඇතිව පෙරමගට ගොස්
බුදුන් දුටහ. බුදුරජාණන් වහන්සේ මහපිරිස පළමුව පූජාවෙන්
නික්මුනුකල තමන් වහන්සේ විසිදහසක් මහසඟපිරිස පිරිවරා
සවණක් රුසින් දිලිහි දිලිහී මහපෙළහරින් පූජාවිඳවිද අප්‍රමාණ
බුඬශ්‍රීන් ජේතවනාරාමයට වැඩිසේක— ඉක්බිති අනේපිඬු මහ
සිටාණෝ බුදුන්වැද ස්වාමීන් වහන්ස මේ වෙහෙර කෙසේ පිළි
පදිම්දූයි විචාළේය. මහසිටාණෙනි භික්ෂූන්ට සාංඝිකකොට
දෙවයි වදාළසේක, එකෙණෙහි අනේපිඬු මහසිටාණෝ
ස්වර්ණභිංකාරයෙන් පැන්ගෙණ සතර දිගින් වඩිනා බුදු
පාමොක් මහසඟනට මේ වෙහෙර සාංඝිකකොට දිනිම්යි
කියා බුදුන්ගේ ශ්‍රීහස්තයට පැන්වත්කළාහ, එකෙණෙහි ස්වාමි
දරුවෝ දෙව්රම් වෙහෙර පිළිගෙණ සිටාණන් විසින් තමන්
වහන්සේට කරවනලද්දාවූ ධර්මමණ්ඩපයෙහි බුඬාසනයට පැන
නැගී දිලිහි දිලිහී වැඩහිඳ සීතං උණ්හං පටිහන්ති යනාදීන් ආ
වාස දානයෙහි අනුසස් මහපිරිසට දෙශනාකොට බොහෝ සත්ව
යන් වෙහෙර විහාර කරවීමෙහි සමාදන් කරවා චතුරාර්‍ය්‍ය
සත්‍ය දෙශනාවෙන් අමාමහ නිවන්සිරි දෙවා වදාළසේක— ඉක්
බිති අනේපිඬුමහසිටාණෝ මෙසේ බුදුන්ට ජේතවනාරාමය පිළි
ගන්වා දවස දවස පූජාකරන්නේ අටළොස් කෙළක් ධනපරිත්‍යා
ගය කෙළේය, මෙසේ එකම ජේතවනාරාමය උදෙසා විහාර
භූමි ගැණීමට අටළොස්කෙළක් ධනයවිය, සෙනසුන් කරවීමට
අටළොස්කෙළක් ධනයවිය, නවකර්මාසයක් මුලුල්ලෙහි දවස්පතා

අටලොස්කෙළක් ධනයවියයකි මෙසේ සිවුපණස් කෙළක් ධනය වියදම්කොට කරවා පූජාකරණලද්දාවූ) අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි; විහරති, වැඩවාසය කෙරෙයි; (සර්‍වඥතාඥාන නැමැති හස්තයෙන් දෙශනා නැමැති ඛඞ්ගපත්‍රය ගෙණ විනෙය ජන නැමැති මහසෙනගට පීඩාකරන්නාවූ කෙලෙස් නැමැති සතුරන් සාධා තෘෂ්ණා නැමැති බන්ධනයෙන් මුදනලද එම විනෙය ජන නැමැති මහසෙනග පිරිවරා චතුපාරිශුද්ධිශීලනැමැති සුදුවැලිතලා ඇති පසලොස්චරණ ධර්‍මනැමැති මිණිතොරන් පඞ්ක්තිඇති සතර සෘද්ධිපාදනැමැති කප්රුක් සතරක්ඇති සතර සතිපට්ඨාන නැමැති මහපා ඇති කීර්ත්ති නැමැති ධ්වජමාලා ඇති සමාපත්ති නැමැති මහපව්රුඇති කෙලෙස් නැමැති සතුරන්ට වැද්දනොදෙන සතර ආර්‍යමාර්ගී නැමැති සතර වාසල් දොරටු ඇති සතරබ්‍රහ්මවිහාර නැමැති පියුම්විල් සතරක්ඇති සත්තිස් බොධිපාක්ෂික ධර්‍මනැමැති සල්පිල් පඞ්ක්තිඇති සප්තවිධ ආර්‍ය ධනනැමැති රුවන්ගබඩා ඇති අර්හත්ඵල නැමැති මහපහයකින් මුදුන් පැමිණ සිටියාවූ වූපාදිශෙෂ නිර්‍වාණධාතු නැමැති අභය පුරයට පැමිණ ශ්‍රාවක නැමැති සෙවක ජනයන්ට දහම් නැමැති රුවන් බෙදාදී කරුණා මෛත්‍රී නැමැති කාන්තාවන් අග්‍රමහෙෂිකා කොට සකලලොක බුද්ධරාජ්‍යයට පැමිණ ස්ථාන ගමන නිෂද්‍යාදිවූ චතුර්විධ ආර්‍ය ඊර්‍යාපථ බ්‍රහ්ම විහරණයෙන් යුක්තව භගවත් තමන්වහන්සේ විසින් අධිගත සීලසන්දීපක විනයපිටකයද සමාධි සන්දීපක අනෙකසහශ්‍ර නයාලඞ්කෘත සූත්‍රපිටකයද ප්‍රඥාසන්දීපක අනෙක සහශ්‍ර නයාලඞ්කෘත අභිධර්‍මපිටකයද යන පරමගම්භීර ත්‍රිපිටකධර්‍මය දෙශනාකොට සත්ත්වයන් සද්ධර්‍මාමෘත පානයෙන් සන්තොෂකරවමින් පෙරවරු දෙලොස් කෙළසුවහසක් කොට මහකුළුණු සමවත් සම වැදීමෙන්ද පස්වරු දෙලොස් කෙළ සුවහසක්කොට මහකුළුණුසමවත් සමවැදීමෙන්ද දෙලොස් කෙළසුවහසක් කොට රහත්ඵල සමවත් සම වැදීමෙන්ද මෙසේ ලෞකික සමාපත්තියට (අනතුරු) අනතුරුව ශ්‍රොත්‍රභූ ආදිකොට ලොකොත්තරසමාපත්තියටද ඊට අනතුරුව අනුලෝමාදී කොට ඒ ඒ තන්හි භවාඞ්ග අන්තකොට මධ්‍යමයෙහි පැවැති අනන්තාපරිමාණ චිත්තයන් එකිඑකී සමාපත්තිකොට එකෙක දෙකෙක යනාදීන් විසින් ගැණ සූවිසි කෙළසුවහස් මහකුළුණු සමවත් සමවැදීමෙන් යුක්තව සකල විනෙය ජනයන්ට ස්වර්ග මොක්ෂ සැපගෙණදෙමින් වැඩවාසයකර වදාරණසේක.)

තත්‍ර ඛො, (යථොක්තාකාරවූ යම් ශ්‍රාවස්තිනම් පුරප්‍රවරයක්

භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

පඤ්චිමානි භික්ඛවෙ කාලදානානි කතමානි පඤ්ච ආගන්තුකස්ස දානං දෙති ගමිකස්ස දානං දෙති ගිලානස්ස දානං දෙති

---

ගොචරග්‍රාමකොට වදාරණසේක්ද) එකල්හිවනාහි; නොහොත් ඒ දෙව්රම් වෙහෙරෙහිදී වනාහි; භගවා, සකලකුල තාරාපති සනාතිභ ධෞත සඞ්ඛප්‍රක්ෂිප්ත ක්ෂීරසලිලාකාර නිර්මලශාක්‍යවංශොද්භූත අනෙකගුණ භූෂණ භූෂිත අශෙෂජන වන්දනීය ශ්‍රීපාද පාංශුපාවනීකෘතනෙත්‍රතල මෞලිමාලාලලිත චරණ යුගලොප ශොභිතවූ) භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි කියා; භික්ඛූ ආමන්තෙසි, දෘෂ්ටිශීල සාමාන්‍යයෙන් සඞ්ඝටිතවූ තමන්වහන්සේගේ ඖරසපුත්‍ර බවට පැමිණියාවූ)භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක; භදන්තෙති, පින්වතුන් වහන්සැයිකියා; තෙ භික්ඛූ; ඒභික්ෂූහුතුමූ; භගවතො භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන ඇස්වූහ. (හෙවත්) ප්‍රතිවචන දුන්සේක්ලාය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං අවොච, මෙය වදාළසේක; සූර්‍ය්‍යරශ්මිස්පර්ශයෙන් ප්‍රබොධවන පද්මයක්මෙන් තමන්වහන්සේගේ ශ්‍රී මුඛ ගර්භය විවෘතකොට මේ වක්ෂ්‍යමාන වචනයෙන් මෙසේ දෙශනා කළසේක.)

භික්ඛවෙ, මහණෙනි, කාලදානානි, කාලදානයෝ; යුක්තප්‍රාප්තදානයෝහෙවත් සුදුසුදානයෝ) ඉමානි පඤ්ච, මොහු පස්දෙනෙක් වෙත්; පඤ්ච, (ඒ කාලදාන) පස; කතමානි, කවරහුදයත්; ආගන්තුකස්ස, ආගන්තුකයාහට; දානංදෙති, දන්දේද; (යම්හෙයකින් අමුතුවෙන් පැමිණි භික්ෂුතෙම තමන්ගේ ආගන්තුකභාවය හෙතුකොටගෙණ ගොචරග්‍රාමකුශල නොවේද මාර්ගක්ලාන්ත සන්නොසිඳුනේවේද එහෙයින් ඔහට දෙනලද දානය කාලදාන නම්වේ) ගමිකස්ස, ගමිකයාහට; දානංදෙති, දන්දේද; ගම්නට සැරසුනු භික්ෂුතෙමේ ගමේ පිඬුපිණිස හැසිරගියේනම් ඒ ගමන නිෂ්ප්‍රයෝජනවෙයි. කැමැති තැනකට යන්ට නොහැකි හෝ වෙයි. යම්දවසෙක්හි පිඬුපිණිස නොහැසිර උදෑසනම දෙන ලද දනවළඳගියේනම් එකල්හි ඒප්‍රයොජනයෙන් නොපිරිහෙයි. කැමැති තැනට යාහැකිද වෙයි. එහෙයින් ඔහට දෙනලද දානය කාලදානනම්වෙයි.) ගිලානස්ස, ගිලනාහට; දානංදෙති, දන් දේද; (ගිලන් භික්ෂුතෙමේද ජරාරොගාදි ගිලන්බව හෙතුකොට ගෙන පිඬුපිණිස හැසිරෙන්ට නොහැකි බැවින් කඩවූබඩ ඇත්

දුබ්භික්ඛෙ දානං දෙති යානි තානි නවසස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච කාලදානානීති–ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

කාලෙ දදන්ති සප්පඤ්ඤා, වදඤ්ඤූ වීතමච්ඡරා
කාලෙන දින්නං අරියෙසු, උජුභූතෙසු තාදිසු
විප්පසන්නමනා තස්ස, විපුලා හොති දක්ඛිණා.

---

තේවෙයි; පිඬුපිණිස හැසිරෙන්ට හැකිවූයේනමුත් රෝගය හෝ එයින් කිපේද මිශ්‍ර ආහාරයෙහි හෝ නොසැපඹේද එහෙයින් ඔහට දෙනලද දානය කාලදාන නම්වේ. (දුබ්භික්ඛෙ, දුර්භික්ෂකාලයෙහි; දානං දෙති, දන්දේද; (ආහාර දුර්ලභකාලයෙහි මනුෂ්‍යයෝ දුර්භික්ෂ භයින් දන්දෙන්ට නොහැක්සාහුවෙත් භික්ෂූහුද ආහාරයෙන් ක්ලාන්තවෙත්. යමෙක්වනාහි දෙන්ට නොහැකිවූයේ නමුත් හෙතෙම බලවත් ශ්‍රද්ධාව කරණකොටගෙණ මසුරුමල මැඬපවත්වාම දේද එහෙයින් ඒකාලයෙහි දෙනලද දානය කාලදානය නම්වේ) යානි තානි නවසස්සානි නවඵලානි, යම් ඒ අළුත් සශ්‍ය අළුත් ඵලයෝ වෙත්ද; තානි, ඒ සශ්‍ය ඵලයන්; පඨමං, පළමුකොට; සීලවන්තෙසු, සිල්වතුන් කෙරෙහි; පතිට්ඨාපෙති, පිහිටුවාද; භික්ඛවෙ, මහණෙනි; ඉමානි පඤ්චඛො, මේ පස වනාහි; කාලදානානි ඉති, කාලදානයෝයයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මෙය; (කාලදානලක්ෂණය) අවොච, වදාළසේක. ඉදං, මෙය; වත්වා, වදාරා; සුගතො, (ශොභනගති ඇතිහෙයින්) සුගත නම්වූ; සත්ථා, ශාස්තෲන්වහන්සේ; අථාපරං, නැවතද අන්‍යාකාරවූ; එතං, මේ ගාථාබන්ධනය; අවොච, වදාළසේක.

වදඤ්ඤූ, (ප්‍රතිග්‍රාහකයන්ගේ) වචනාධිප්‍රාය දන්නාවූ; වීතමච්ඡරා, (ස්වකීයසම්පත් සැඟවීම් ලක්ෂණවූ) මසුරුමලින් පහවූ; සප්පඤ්ඤා, සප්‍රාඥයෝ; කාලෙ, (සුදුසු) කාලයෙහි; දදන්ති, (දන්) දෙත්; උජුභූතෙසු,(කායවඞ්ක චිත්තවඞ්ක ප්‍රහීණහෙයින්) ඍජුවූ; තාදිසු. (ඉෂ්ටානිෂ්ටයන්හි අනුනය ප්‍රතිඝාභාවයෙන් අවිකාරත්‍වා පතිසඞ්ඛ්‍යාත) තාදිභාවයෙන් යුක්තවූ; අරියෙසු, ආර්‍ය්‍යයන් කෙරෙහි; විප්පසන්න මනා, (පූර්වභාගචෙතනා අපරභාගචෙතනා මුඤ්චන චෙතනා යන සිත්ඇති කල්හි ශ්‍රද්ධාවෙන්) විශෙෂයෙන් ප්‍රසන්නසිතින්; කාලෙන, (සුදුසු) කාලයෙහි; දින්නං, දන්දෙන ලද්දේද; තස්ස,ඒ පුද්ගලයාගේ; දක්ඛිණා,දානචෙතනා තොමෝ; විපුලා හොති, මහත්ඵල දායක වන්නීය—

යෙ තත්ථ අනුමොදන්ති. වෙය්‍යාවච්චං කරොන්ති වා
න තෙන දක්ඛිණා ඌනා, තෙපි පුඤ්ඤස්ස භාගිනො.

තස්මා දදෙ අප්පටිවාණචිත්තො, යත්ථ දින්නං මහප්ඵලං
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## කාලදාන සුත්තං.

එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ

---

තත්ථ, ඒ දානයෙහි; යෙ, යම්කෙණෙක්; අනුමොදන්ති,
(ඊර්ෂ්‍යාමාත්සර්‍ය්‍යාදියෙන් වෙන්වූ ප්‍රසන්න සිතින් යහපත
කියා) පින් අනුමෝදන්වෙද්ද; වෙය්‍යාවච්චං වා කරොන්ති;
වත් පිළිවෙත් හෝ කෙරෙද්ද; තෙන,එයින්; දක්ඛිණා, දක්ෂිණා
තොමෝ; න ඌනා, අඩුනොවන්නීය; තෙපි, ඔහුතුමූද;
පුඤ්ඤස්ස, කුසලයට; භාගිනො, හිමියෝවෙත් යත්ථ, යම් සිල්ව
තෙක් කෙරෙහි; දින්නං, දෙනලද දානය; මහප්ඵලං, මහ
ත් ඵලවේද; තස්මා, එහෙයින්; අප්පටිවාණචිත්තො, ලොභ
මාත්සර්‍ය්‍යාදි මල මැඩපැවැත්වීමෙන් දීමෙහි ඇලුනුසිත්ඇත්තෝ;
දදෙ, දන්දෙන්නේය; පාණීනං, සත්ත්වයන්ට; පුඤ්ඤානි, පුණ්‍ය
යෝ; පරලොකස්මිං, පරලෙව්හි; පතිට්ඨා හොන්තීති, (සම්පත්ති
සුඛඵලවනබැවින් හෙවත් දිව්‍යමනුෂ්‍යාදි සැපසහ නිවන් සැප
ලැබෙන හෙයින්) පිළිසරණ වෙත්යයි ඉදං, මේ දෙශනාව;
භගවා, භාග්‍යවතුන්වහන්සේ; අවොච, වදාළසේක. අත්තමනා,
සතුටුයිත්ඇති, තෙ භික්ඛූ, ඒ භික්ෂූහුතුමූ; භගවතො, භාග්‍යව
තුන්වහන්සේගේ; භාෂිතං, භාෂිතයට; අභිනන්දුං ඉති, විශෙෂ
යෙන් සතුටුවූවාහුය; සාධු සාධු යන වචනයෙන් මස්තකයෙන්
පිළිගත්තාහුය.)

## කාලදාන සුත්‍රාර්ථව්‍යාඛ්‍යානයයි.

මෙ, මාවිසින්; එවං, මෙයාකාරයෙන්; සුතං. අසනලද්දේය;
(නොහොත්) මෙ මාගේ; සුතං, ශෘතිය හෙවත් ඇසීම එවං, මෙ
සේය;එකං සමයං, එක්කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්
සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ ජෙත
වන නම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬු මහසිටුහුගේ; ආරාමෙ,
ආරාමයෙහි; විහරති, වාසයකරණසේක;=

අනාථ පිණ්ඩික ස්ස ආ රා මෙ—අ ථ ඛො සු ම නා රා ජ කු මා රි ප ඤ්ච හි ර ථ ස තෙ හි ප ඤ්ච හි ච කු මා රි ස තෙ හි ප රි වු තා

---

අථ ඛො, ඉක්බිත්තෙන්, පඤ්චහි රථසතෙහි, රථපන්සියයකින් හා; පඤ්චහිච කුමාරිසතෙහි, පන්සියයක් කුමාරිකාවන් විසින්ද; පරිවුතා, පිරිවරණ ලද්දාවූ; සුමනා රාජකුමාරි, සුමනානම්රාජකුමාරිකාතොමෝ; (සුමනා රාජකුමාරිකාවගේ උත්පත්ති කථාව නම්) විපස්සීනම් සම්‍යක් සම්බුද්ධ සර්‍වඥරාජෝත්තමයාණන් වහන්සේ ලොව පහළවී වදාළ කල්හි උන්වහන්සේගේ පියවූ බන්ධුම නීරජ්ජුරුවෝ මාගේ ප්‍රධාන පුත්‍රතෙම ගිහිගෙන් නික්ම ගොස් සකලකෙලශයන් නසා බුදුවූසේක දෙවෙනි පුත්‍රයා උන්වහන්සේ සමීපයෙහි පැවිදිව අග්‍රශ්‍රාවකවූසේක. පුරොහිතයාගේ පුත්‍රයා විතියශ්‍රාවකවූසේක මේ සර්‍වඥයන්වහන්සේ පිරිවරා වැඩඉන්නා අවශෙෂ භික්ෂූන්වහන්සේලාත් ගිහිකල්හිදු මපුතනුවන්ම පිරිවරාගෙන හැසුරුනාහුය. මේසියල්ලෝම පෙරසහ දූනුත් මටම භාරවෙත්. මමම උන්වහන්සේලාට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යයයි කියනලද සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමි අනුන්ට අවකාශයක් නොදෙන්නෙමියි සිතූයේය. තදනන්තරව විහාරදොරටුව පටන් රජගේදොරටුව දක්වා මගදෙපස කිහිරි පවුරක් කරවා වස්ත්‍රවලින් වස්වා උඩුවියන්හි රන්තරුවෙන් විසිතුරු කරණලද මතාව එල්බෙන්නාවූ තල්කඳන් පමණවූ අනෙකප්‍රකාර මල්වැල් කරවා භූමියෙහි විසිතුරු ආස්තරණ අතුරුවා ඇතුළත දෙපාර්ශවයන්හි මල්පුරවනලද පුන්කලස්ද සියලු මාර්‍ගයෙහි සුවඳ විහිදීම පිණිස සුවඳ අතුරෙහි මල්ද මල් අතුරෙහි සුවඳද තබා භාග්‍යවත් සර්‍වඥයන්වහන්සේට කල්දූන් වූයේය. භාග්‍යවත් සර්‍වඥයන්වහන්සේද භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද්දේ තිරයතුලින්ම රජගෙට වැඩමවා ආහාරකෘත්‍යයකොට පසුව විහාරයට වඩනාසේක. අන්කිසිවෙක් සර්‍වඥයන්වහන්සේ දැකීම පවා නොලබයි. මේ ආකාරයෙන් සත් හවුරුදු සත්මසක් ගතවූ කල්හි නුවරවැස්සෝ අදට සර්‍වඥයන් වහන්සේ ලොව පහළවී සත්හවුරුදු සත්මසක් ගතවූවාහුය. මෙපමණකල් උන්වහන්සේ දකින්ට හෝ උන්වහන්සේට දන් දෙන්ට හෝ යම්කිසි පූජාවක් කරන්ට හෝ නොලැබුයෙමු. අපගේ රජ්ජුරුවෝ තමාම සර්‍වඥයන්වහන්සේට උපස්ථාන කෙරෙති. සර්‍වඥයන් වහන්සේත් ලොව පහළවනසේක් දෙවියන් සහිතලොකයාහට හිතවැඩ පිණිස පහළවූසේක. නරකය රජ්ජු

රුවන්ට පමණක්ම උෂ්ණවූයේත් සෙස්සන්ට තිල්උපුල් වැනිවූයේත් නොවෙයි එහෙයින් මේකාරණය රජ්ජුරුවන්ට කියමු ඉදින් අපට සඞ්ඝයන් වහන්සේ දෙන්නේවීනම් මනාවෙයි. ඉදින් නොදෙන්නේවීනම් රජ්ජුරුවන් සමග යුද්ධකොට හෝ සඞ්ඝයාගෙණ දානාදීවූ පුණ්‍යකර්ම කෙරෙමුයයි මෙසේ සිතුවාහුය. මෙසේසිතා යුඬකිරීමනම් තනිනුවර වැස්සන් විසින්ම නොහැකිවෙයි. එබැවින් අපි එක් ප්‍රධාන පුරුෂයක්හුද අපට පක්ෂකර ගනිමුයයි ඒ නුවරවැස්සෝ සෙනාපතියා කරා එළඹ ඕහට මේ කාරණය දැනුම්දී කිමෙක්ද ස්වාමීනි නුබවහන්සේ අපටපක්ෂවනසේක්ද (නොහොත්) රජ්ජුරුවන්ට පක්ෂවනසේක්දැයි සෙනාපතියා අතින් විචාළෝය. එවිට සෙනාපතිතෙම මම තොපට පක්ෂවන්නෙමි එතකුදුවුවත් පළමුදිනය මට දියයුතුයයි කීයේය. මෙසේ කීකල්හි නුවරවැස්සෝ ඔහුගේ වචනය පිළිගත්තාහුය. ඒ සේනාපතිතෙම රජ්ජුරුවන්කරා එළඹ දෙවයන්වහන්ස නුවරවැස්සෝ නුඹවහන්සේට කිපියාහුයයි කීයේය. එවිට රජ්ජුරුවෝ දරුව කවර කාරණයක් නිසා නුවරවැස්සෝ මට කිපියාහුදැයි සෙනාපතියාගෙන් විචාළේය එවිට සේනාපතියා කියන්නේ දෙවයන්වහන්ස නුබවහන්සේම සඞ්ඝයන්වහන්සේට උපස්ථාන කරණසේක අපි උන්වහන්සේට උපස්ථාන කරන්ට නොලබමුයයි නුවරවැස්සෝ කීවාහුය. එහෙයින් දෙවයන් වහන්ස ඉදින් දැන් නමුත් උන්වහන්සේට උපස්ථානකරන්ට ලබත්නම් නුබවහන්සේට නොකිපෙත්. නොලබන්නාහුනම් නුබවහන්සේ සමග යුඬකරණු කැමැත්තාහුයයි කීයේය. එවිට රජ්ජුරුවෝ දරුව මම යුද්ධකරණු මිස භික්ෂුසඞ්ඝයා නොදෙමියි කීකල්හි දේවයන්වහන්ස නුබවහන්සේගේ දාසයෝ නුබවහන්සේසමග යුද්ධකරන්නෙමුයයි කියත්, නුබවහන්සේ කවුරුන් රැගෙණ යුද්ධකරණසේක්දැයි ඇසූවිට සෙනාපතිය තොප නොවේදැයි කීයේය. දෙවයන්වහන්ස මම නුවරවැස්සන්හැර සමර්ථනොවෙමියි කීයේය. ඉක්බිත්තෙන් රජතෙම නුවරවැස්සෝ බලවත්තයෝවෙත්. සෙනාපතියාත් ඔවුන්ටම පක්ෂයයි දැන තවත් සත්හවුරුදු සත්මසක් භික්ෂුසඞ්ඝයා මට දෙත්වයි නුවර වැස්සන්ගෙන් ඉල්වූයේය. නුවර වැස්සෝ පිළිනොගත්තාහුය. එකල්හි රජ්ජුරුවෝ සාවුරුද්දක්කොටද පස් හවුරුද්දක් කොටද සතර හවුරුද්දක් කොටද තුන් හවුරුද්දක් කොටද දැවුරුද්දක් කොටද එක් හවුරුද්දක් කොටද අඩුකළේය. මෙසේ අඩුකරණ කල්හිදු නුවර වැස්සෝ පිළිනොගත්තෝය. එවිට රජ්ජුරුවෝ අන්සක්දිනකට

දෙව්යයි නුවරවැස්සන්ගෙන් ඉල්ලූයේය. එකල්හි නුවරවැස්සෝ දූන් රජ්ජුරුවන් සමඟ ඉතා රලුවූවක් කිරීම නොවටීයයි ඒට අවසර දුන්නෝය, රජ්ජුරුවෝ සත්හවුරුදු සත්මසකට සරසාලද දානවස්තුව සත්දිනකටම වියදම්කොට සදිනෙක්හි කිසිවෙකු නොබලා සිටියදීම දන්දී සත්වන දිනයෙහි නුවර වැස්සන් කැඳවා දරුවෙනී තෙපි මෙසේ දන්දෙන්ට හැකිවන් නෙව්දැයි විචාළේය නුවර වැස්සෝද දෙවයන්වහන්සේට මේ වස්තුව අපනිසාම උපන්නේනොවේදැයි කියා හැකිවන්නෙමුයයි කීවෝය. රජ්ජුරුවෝ පිටිඅතින් කඳුලු පිසදමමින් භාග්‍යවතුන් වහන්සේට නමස්කාරකොට සවාමීනී භාග්‍යවතුන් වහන්ස හැට අට ලක්ෂයක් භික්ෂූන් අනිකෙකුට භාර නොකොට දිවිහිමියෙන් සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමියි සිතුයෙමි දූන් මාවිසින් නුවරවැස්සන්ට අවසරදෙන ලද්දේය, නුවර වැස්සෝ වනාහි අපි දන්දෙන්ට නොලබමුයයි කිපෙත්. සෙට පටන් ඔවුන්ට අනුග්‍රහකළමැනවැයි කීයේය.

ඉක්බිතිව දෙවෙනි දිනයෙහි සෙනාපතිතෙම මහත්වූ දාන වස්තුව සරසා යම්සේ අන්කිසිවෙක් අද එක් ආහාර පිඩකුත් දෙන්ට නොලබාද එපරිද්දෙන් ආරක්ෂාකරව්යයි හාත්පසින් පුරුෂයන් තැබූයේය. එදවස් සිටුභාර්යා තොමෝ හඩමින් සිට පන්සියයක් කුමාරිකාවන් සමග ක්‍රීඩාකොට තමගෙට පැමිණි යාවූ දුවට දියණියෙනි ඉදින් තීගේ පියාණෝ ජීවත්ව සිටියේ නම් අද මම දශබලධාරී සර්වඥයන්වහන්සේ වළඳවන්නෙමියි කීය, ඕතොමෝ කියනුයේ මෑනියෙනි, ශොක නොකරව යම් පරිද්දකින් සර්වඥයන්වහන්සේ ප්‍රධානකොට ඇති භික්ෂු සඞ්ඝයා අපගේ භික්ෂාව වළඳන්නේවේද එපරිද්දෙන් කරන්නෙමියි කීය,මෙසේ කියා කෙළක් අගනා රන්තලියක දිය නුමුසු කිරිබත් පුරවා ගිතෙල් මී සකුරුවලින් සරසා අන්තලියකින්වසා ඒතලිය සමන් මල් ගුලියක බහා සමන්මල් ගුලියක්වැනි කොට භාග්‍යවතුන් වහන්සේ ගමට වැඩමවනකල්හි තමාම තලිය ඔසවාගෙණ දාසි සමූහයා විසින් පිරිවරණලද්දී ගෙයින් නික්මයන්නිය අතරමග දී සෙනාපතියාගේ උපස්ථායකයෝ දූත දියනියෙනි මෙහි නො එවයි කියත්. මහත් පිනැත්තෝනම් ප්‍රියවූ කථා ඇත්තෝවෙත් නැවත නැවත කියන්නාවූ ඔවුන්ගේ කථාතොමෝ ප්‍රතික්ෂෙප කරණු නොහැකිවන්නීය. එහෙයින් ඕතොමෝ සුලුපියාණෙනි මහපියාණෙනි මාමානෙනි තෙපි කවර කාරණයකින් යන්ට නොදෙව්දැයි කීය. නැගනියෙනි අපගේ සෙනාපති සවාමීන්

විසින් අන්කිසිවෙකුට ඛාද්‍යභොජ්‍යාදියක් දෙන්ට අවසර නොදෙව් යයි අපිසිටුවන ලද්දෙවම්හයි කීකල්හි කිමෙක්ද මාඅත ඛාද්‍ය භොජ්‍යාදියක් දකිව්දැයි විචාළාය තැගතියෙනි මල්ගුලියක් දකිමු යයි කීකල්හි කිමෙක්ද තොපගේ සෙනාපතිතෙම මල්පූජාකරන් ටත් නොදේදැයි විචාළාය. තැගතියෙනි මල්පූජාකරන්ට අප සෙනාපතියාගෙන් තහනම් නැතැයි කීවෝය. එසේවීනම් තෙපි ඉවත්වව්යයි ඔවුන් පහකොට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ශතපුණ්‍ය ලක්ෂණොපෙතවූ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස අනු කම්පා පිණිස මාගේ මේ මල්ගුලිය පිළිගන්නාසේක්වයි කීය. භාග්‍යවතුන්වහන්සේ සේනාපතියාගේ එක් උපස්ථායකයෙකු බලා මල්ගුලිය ගැන්වූසේක. ඉක්බිතිව සිටුදූතොමෝ භාග්‍යව තුන්වහන්සේට වැඳ පතනුයේ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස භව යෙහි මාගේ උත්පත්තියක් ඇතිකල්හි තැතිගත්නා ජීවත්වීමක් නම් නොවේවා. මේ සමන්මල්මෙන් උපනුපන් තන්හි සියලු දෙනාටම ප්‍රියවෙම්වා, නම්න්ද සුමනාම වෙම්වයි ප්‍රාර්ථනා කොට සර්වඥයන්වහන්සේ විසින් සැපඇත්තී වේවයි වදාරණු ලබන්නී උන්වහන්සේට වැඳ පැදකුණු කොට ගියාය.

භාග්‍යවතුන් වහන්සේද සෙනාපතියාගේ ගෙට වැඩමවා පණවන ලද බුද්ධාසනයෙහි වැඩඋන් සේක. සෙනාපතිතෙම බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට දක්ෂිණොදකය පිළිගන්වා කැඳගත් අත්ඇත්තේ සර්වඥයන්වහන්සේකරා එළඹියේය. ශාස්තෲන් වහන්සේ ග්‍රහස්ත:යන් පාත්‍රය වැසූසේක. එවිට සෙනාපති තෙම ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස භික්ෂුසඞ්ඝයා වැඩඋන්නේ යයි කීයේය. භාග්‍යවතුන්වහන්සේ සෙනාපතිය අතරමගදී අප විසින් ලබනලද එක්පිණ්ඩපාතයෙක් ඇතැයි වදාළසේක. ඒ මල්ගුලි පහකොට පිණ්ඩපාතය දුටුයේය. ස්වාමීනි මල්දමකැයි කියා මාගමක් මාවඤ්චාකළායයි සුලු උපස්ථායක තෙම කීයේය. කිරිබත භාග්‍යවතුන්වහන්සේ මුල්කොට ඇති සියලු භික්ෂූන්ට සැහුනේය. සෙනාපතියා තමාගේ දෙය්‍යධර්මසඞ්ඛ්‍යාත දානව සතුව පිළිගැන්වූයේය. සර්වඥයන්වහන්සේ බත්කිස නිමකොට මගුල්දම්දෙසා වැඩිසේක. සෙනාපතිතෙම ඒ කාවර තැනැත්ති යක් පිණ්ඩපාතය දුන්නීදැයි විචාළේය. ස්වාමීනි සිටුදූයයි කීයේය. නුවණැති මෙබඳු ස්ත්‍රියක් තමගෙයි වසනකල්හි පුරුෂයාහට සඟසැපනම් දුර්ලභ නොවන්නීයයි මෙනෙහිකොට ඒ සිටුදූ ගෙන් වා ප්‍රධාන භාර්‍ය්‍යාතනතුරෙහි තැබූයේය. සිටුදූතොමෝ තමපියා ගේ ගෙයි වස්තුවත් සෙනාපතියාගේ වස්තුවත් රැගෙණ ආයු

ඇතිතෙක් සර්වඥයන් වහන්සේට දන්දී පින්කොට ඒ ආත්මභාව යෙන් චුතවූවා කාමාවචර දිව්‍යලොකයෙහි උපන්නිය, උපන් කෙණෙහිම දනක්පමණ සියලු දිව්‍යලොකය පුරවමින් සමන්මල් වරුෂාවක් වැස්සේය. ඒ ආශ්චර්‍ය්‍යමත් කාරණය දුටු දිව්‍යපුත්‍ර යෝ මෝතොමෝ තෙමේම තමන්නම රැගෙණ ආවායයි සුමනා දෙවධීතෘයයි මැට නම් කළෝය. ඕතොමෝ ඒකානුකපක් මුලුල් ලෙහි දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි සැරිසරන්නී උපනුපන් තන්හි සුමනා යන නාමය නොහරින ලද්දීමවිය.

මේ කාලයෙහි හෙවත් අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහලවූ පසු සැවැත් නුවර රාජ්‍යය කළාවූ කොසොල් රජහුගේ අගමෙහෙසියගේ කුස පිළිසිඳ ගත්තීය. පිරිවරවූ පන්සියයක් කුමාරිකාවෝද එදවස්ම සැවැත් නුවර ඒ ඒ කුලවල පිළිසිඳගෙණ එකදිනයෙහිම මවුකුසින් බිහිවූවෝය. ඒ ඇසිල්ලෙහිම දනක් පමණින් සමන්මල් වරුෂාවක් වැස්සේය. ඒ ආශ්චර්‍ය්‍යමත් කාර ණය දැක සන්තොෂ භාවයට ප්‍රාප්තවූ කොසොල් රජතෙම මෝ තොමෝ පෙර කරණලද ප්‍රාර්ථනා ඇත්තියක් වන්නියයි සිතා සතුටුසිත් ඇත්තේ මාගේ දූතොමෝ තමාම තමාගේ නම රැ ගෙණ ආවායයි මේ කුමාරිකාවට සුමනාමයයි නම්කොට පුණ්‍ය වන්තවූ මාගේ දූතොමෝ තනිව නූපදින්නීයයි තමාගේ නුවර සොයවන්නේ එදවස්ම ලැදූරියන් පන්සියයක් උපන්නාහුයයි අසා සියල්ලවුන් තමාම පොෂණය කරවූයේය. මසින්මස ගෙණ වුත් මාගේ දියනියන්ට දක්වව්යයි අණකෙළේය, මේ සුමනා නම් රාජකන්‍යා තොමෝ මෙකී පරිද්දෙන් මහත් සත්කාරකොට ප්‍රා ර්ථනාතබාං මෙසේ ලබනලද නම් ඇත්තීයයි දතයුතු, ඒ සුමනා නම් රාජකන්‍යාවට සත්හැවිරිදි වයස් ඇතිකල්හි අනේපිඬු මහ සිටාණන් විසින් ජේතවනාරාමය නිමකරවා සර්වඥයන්වහන්සේ වෙත දූතයන් යවනු ලැබූකල්හි ශාස්තෲන් වහන්සේ භික්ෂුසඞ්ඝ යා පිරිවරකොට ඇත්තේ සැවැත් නුවරට වැඩිසේක. සර්වඥයන් වහන්සේ සැවැත් නුවරට වැඩමවීමට පෙරටුව අනේපිඬුසිටු තෙම කොසොල්රජු වෙතට පැමිණ දෙවයන්වහන්සෑ සර්වඥයන් වහන්සේගේ මේ නුවරට වැඩමවීම නුබවහන්සේටත් අපටත් උතුම් මගුලක්මවෙයි. එබැවින් සුමනා නම් රාජකුමාරිකාව පන් සියයක් කුමාරිකාවන් සමග පුන්කලස් හා සුවඳමල් ආදිය ගන්වා දශබලධාරී සර්වඥයන් වහන්සේ වඩනා පෙරමගට පිටත්කළ මැ ණවැයි කීයේය, කොසොල් රජ්ජුරුවෝද යහපත මහාසිටාණෝ නියි ශිවිස භික්ෂුසඞ්ඝයා පිරිවරා සැවැත් නුවරට වඩනා සර්වඥයන් වහන්සේගේ පෙරමගට පිරිවර සහිත දියනියන් සරහා යැවූහ,

ඒ සුමනා නම් රාජකුමාරී තොමෝද රජ්ජුරුවන් කීපරිද්දෙන් ගොස් සර්වඥයන්වහන්සේට වැඳ සුවඳමල් ආදියෙන් පුදා එකත්පසෙක සිටියාය. ශාස්තෲන්වහන්සේද ධර්මදෙශනා කොටවදාළසේක සුමනා නම් රාජකුමාරී තොමෝ පන්සියයක් කුමාරිකාවන් සමග ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාය. අනිකුදු පන්සියයක් ලඳුරියෝද පන්සියයක් ස්ත්‍රීහුද පන්සියයක් උපාසකයෝද එකෙනෙහිම ශ්‍රොතාපත්තිඵලයට පැමිණියාහුය. මෙසේ එදවස් අතර මගදීම සෝවාන් පුද්ගලයෝ දෙදහසක් ඇතිවූවෝය.) භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියාය; (මේ සුමනා නම් රාජකුමාරී තොමෝ කවරකාරණයකින් සර්වඥයන් වහන්සේ කරා එළඹුනීද? ලදරුවන් දෙදෙනෙකු විසින් කරණුලැබූ ආශ්චර්‍යමත් කථාශබ්දයක් අසා සඤ්ජාත සඞ්කාවිනොදනය කරගැන්ම භාග්‍යවතුන් වහන්සේවෙතින්ම මිස අන්කිසිවෙකු වෙතින් නොහැකියයි සලකා සැක විචාරණ අටියෙන් එළඹියාය. ඒ ලදරුවන් දෙදෙනා පිළිබඳ කථා ප්‍රවෘත්තිය වක්ෂ්‍යමානා කාරයෙන් දතයුතු.

අප සම්‍යක්සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේට පෙරටුව ලොවපහළවී වදාළාවූ විසිදහසක් ආයු ඇති කාශ්‍යප සර්වඥරාජොත්තමයාණන් වහන්සේගේ කාලයෙහි යහලු භික්ෂුහු දෙනමක් වූවෝය, ඒදෙනම අතුරෙන් එක්නමක් සාරාණීයධර්මය පුරණසේක, අනික්නම භක්තාග්‍රවත පුරණසේක, ඉක්බිති සාරාණීය ධර්මය පුරණ මහණතෙම ඇවැත්ති නුදුන්නාහට නම් පරලෙව්හි ඵලරහිතවෙයි, තමා ලද්දෙය පරලොව වැඩපතා අනුන්ට දී වැළඳිම වටීයයි තම යහලුවූ අන්‍ය භික්ෂුහට කීයේය, අන්‍යවූ භක්තාග්‍රවත පුරණ භික්ෂුතෙමේද ඇවැත්ති දියයුතු දෙයතම් විනාශකරන්ට නොවටියි. ඒ බව නොප නොදන්නෙහිය තමා යැපෙන පමණක් ගන්නහු විසින් භක්තාග්‍රවත පුරන්ට වටීයයි සාරාණීය ධර්මය පුරණ භික්ෂුහට කීයේය, මෙසේ උන්වහන්සේලා දෙනම ඔවුනොවුන්ට අවවාද කොළේ නමුත් ඒ දෙදෙනා වහන්සේලා අතුරෙන් එක නමකුත් අනික්නම තමන්ගේ අවවාදයෙහි පිහිටුවන්ට නොහැකිවූයේය, දෙදෙනා වහන්සේලාම තමතමන්ගේ ප්‍රතිපත්තිපුරා ඒ අත්බැවින් චුතවූවාහු කාමාවචර දිව්‍යලොකයෙහි උපන්නෝය. ඒ දෙව්පුත් දෙදෙනා අතුරෙන් සාරාණීය ධර්මය පුරුතැනැත්තෝ අන්‍යවූ භක්තාග්‍රවත පිරූඅය කාරණා

පසකින් මැඩපැවැත් වූයේය. මෙසේ ඒ දෙදෙනා දිව්‍ය මනුෂ්‍ය ලෝක දෙක්හි හැසිරෙන්නාහු එක් බුද්ධාන්තරයක් ගතකොට අප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ශ්‍රාවස්තිපුරයෙහි උපන්නෝය, ඒ දෙදෙනා අතුරෙන් සාරාණීය ධර්‍මය පිරූ තැනැත්තේ කොසොල් රජුනිසා තම අගමෙහෙසියගේ කුස පිළිසිඳ ගත්තේය අනික් භක්තාග්‍රවත පිරූ තැනැත්තේ ඒ අගමෙහෙසිය ගේම උපස්ථායිකාවූ ස්ත්‍රියකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ඒ දෙදෙනම එක දිනයෙහි මව්කුසින් බිහිවූවෝය. ඔවුන්ට නම් තබන දිනයෙහි ඔවුන් දෙදෙන නහවා ශ්‍රියහන් ගබඩාවෙහි සය නය කරවා දෙදෙනාගේම මව්පියෝ ගබඩාවෙන් පිටත මගුල් පිණිස උවමනාවූදෙය විධාන කළෝය. මේ අතරතුරෙහි ඒ ළද රුවන් දෙදෙනා අතුරෙන් සාරාණීය ධර්‍මය පිරූ ළදරුතෙම ඇස් දල්වා විශාලවූ සුදුකුඩයද පණවනලද ශ්‍රියහනද සරහා පිළියෙළ කරණලද ගෙයද දැක එක් රජ පවුලක උපනිමියි දැනගත්තේය. තදනන්තරව ඒළදරුතෙම කිනම් සුචරිතයක් කොට මෙහි උප න්නෙම් දැයි ජාතිය සිහිකරන්නාවූ නුවණින් සලකන්නේ සා රාණීය ධර්‍මය පිරූ කුසලෙනැයි දැන ඒ කාලයේදී මා සමග මිත්‍රව සිටියාවූ මාගේ යහලුතෙම කොයිබදැයි සලකාමින් තමා සමීප යෙහිම කුඩා ඇඳක හොත්තහු දැක මේතැනැත්තේ මම භක්තාග්‍ර වත පුරම්කියා මාගේ ඛිම බාරනොගත්තේය එබැවින් දැන් මො හුට නිග්‍රහකිරීමට හෙතුවූ මේ ස්ථානයේදී නිගාකිරීම වටීයයි සලකා යහලුව තෝ මාගේකීමනොහොළෙහියයි කියේය, ඉක්බිත් තෙන් මිටි ඇඳෙහි උන්නාවූ ඒ ළදරුතෙම තොපට කුමක් හට ගත්තේ දැයි ඔහු අතින් විචාළේය. පින්වත මාගේ සම්පත් බලව සුදුකුඩය යට ශ්‍රියහනෙහි හොත්තේවෙමි තෝවනාහි කුඩාඇඳක තද[illegible] ආස්තරණ මත්තෙහි නිදන්නෙහියයි රාජපුත්‍රතෙම කියේය කිමෙක්ද තෝ මේ සම්පත් නිසා අහඞ්කාර කරන්නෙහිද, හුණදඬුවලුන්කොට වස්ත්‍රයකින් වෙළනලද්දාවූ මේසියල්ල පෘථිවි ධාතුමාත්‍රයක්ම නොවේදැයි උපස්ථායිකාවගේ පුත්‍රතෙම කියේය, කොසොල්රජහුගේ දූවූ සුමනා නම් රාජකුමාරිතොමෝ ඒ ළද රුවන් දෙදෙනාගේ කථාව අසා මාගේ මලනුවන් සමීපයෙහි කිසිවෙක්නැතැයි ඒ ළදරුවන් දෙදෙනාගේ සමීපයට යන්නී දොරකඩදී ධාතුගත වචනය අසා මේ ධාතුගත වචනය සර්‍වඥ ශාසනයෙහිමුත් අන්තැනක නැත්තේය, මාගේ මලනුවෝ දෙදෙන ශ්‍රමණ දිව්‍යපුත්‍රයෝ වන්නාහුයයි තමා නුවණැති බැවින් මෙසේ සිතා ඉදින් මම මේළදරුවෝ දෙදෙන මෙසේ කථාකෙරෙත්යයි

එකමන්තං නිසීදි එකමන්තං නිසින්නා ඛො සුමනා රාජකුමාරී භගවන්තං එතදවොච.

ඉධස්සු භන්තෙ භගවතො ද්වෙ සාවකා සමසද්ධා සමසීලා සමපඤ්ඤා එකො දායකො එකො අදායකො තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජ්‍යුං දෙවභූතානං පන

---

මව්පියන්ට කියන්නෙම් නම් මේලදරුවෝ දෙදෙන අමනුෂ්‍යයෝ යයි බැහැර කරවන්නාහුය එහෙයින් මේ කාරණය අනිකෙකුට නොකියා සඞ්කාච්ඡේදකවූ රනෙහි ගතිදක්නා තරහලුමෙන් පුරිස්ගති දක්නා මාගේ පියවූ මහාගෞතම දශබලධාරිවූ සර්වඥයන් වහන්සේගෙන්ම විචාරන්නෙම්යි සිතා අනුභව කරණලද උදය බත් ඇත්තී තමපියවූ කොසොල් රජුකරා එළඹ දශබලධාරී සර්වඥයන් වහන්සේට උපස්ථානයට යන්නෙම්යි දැනුම්දුන්නීය රජ තෙම රථ පන්සියයක් පිළියෙළ කරවූයේය. "දඹදිව වනාහී කුමාරිකාවරු තුන්දෙනෙක් තමපියන්ගේ සමීපයෙන් රථ පන්සියයක් ලැබුවාහුය, ඒ කවර තුන්දෙනෙක්දයත් බිම්සර රජහුගේ දූවූ චුන්දීනම් රාජකුමාරිකාවද ධනඤ්ජය සිටුහුගේදූවූ විසාඛා නම් මහාඋපාසිකාවද කොසොල් රජහුගේ දූවූ මේ සුමනා නම් රාජකන්‍යාවද යන තුන්දෙනාවෙත්, "ඉක්බිත්ව ඒ සුමනා නම් රාජකුමාරී තොමෝ සුවඳමල් ආදිය ගෙණ රථයකාහිඳ රථපන්සියය පිරිවරාගෙණ මේ ප්‍රශනය භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරන්නෙම්යි සිතා උන්වහන්සේකරා එළඹුනීය.) උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, උන්නීය; එකමන්තං, එකත්පසෙක; නිසින්නාඛො, උන්නාවූම; සුමනා රාජකුමාරී, සුමනා රාජකුමාරී තොමෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය අවොච, කීවාය;

භන්තෙ, ස්වාමීනි; ඉධ, මේ ශාසනයෙහි; භගවතො, භාග්‍යවත්හුගේ; සමසද්ධා, සමාණ ශ්‍රද්ධාඇති; සමසීලා, සමාණසිල්ඇති; සමපඤ්ඤා, සමාණ ප්‍රඥාඇති; ද්වෙසාවකා, ශ්‍රාවකයෝ දෙදෙනෙක් අස්සු, වන්නාහුය; එකො, එකනමක්; දායකො, දෙන්නේ වෙයි; එකො, එකනමක්; අදායකො, නොදෙන්නේවෙයි; තෙ, ඔහු දෙදෙන; කායස්සභෙදා, ශරීරයාගේ බිඳීමෙන්; පරම්මරණා, මරණින්මතු; සුගතිං, ශොභන ගති ඇත්තාවූ; සග්ගං, සැපතින් ආඪ්‍ය; ලොකං, දිව්‍යලෝකයෙහි; උපපජ්ජෙය්‍යුං, උපදින්නාහුය

තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති, සියා සුමනෙති භගවා අවොච.

යො සො සුමනෙ දායකො සො අමුං අදායකං දෙවභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන යො සො සුමනෙ දායකො සො අමුං අදායකං දෙවභූතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාතීති—සචෙ පන තෙ භන්තෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡන්ති මනුස්සභූතානං පන තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති, සියා සුමනෙති භගවා අවොච.

---

භන්තෙ, ස්වාමීනි, දෙවභූතානං, දෙව්වූ තෙසං පන, ඔවුන්ගේ වනාහි; විසෙසො, වෙනසෙක්; සියා වන්නේද; නානාකරණං, නානත්වයෙක්; සියා ඉති, වන්නේදැයි; (විචාළාය)භගවා, භාග්‍යවත්තෙම; සුමනෙ, සුමනාවෙනි; සියාඉති, වන්නේයයි; අවොච, වදාළසේක.

සුමනෙ, සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙනභික්ෂුවක්වේද; සො, හෙතෙම, අමුං අදායකං, ඒ නොදෙනභික්ෂුව; දෙවභූතො සමානො, දෙව්වූයේම; පඤ්චහි ඨානෙහි, කාරණාපසකින්; අධිගණ්හාති, අභිභවනය කෙරෙයි; (කවර කාරණා පසකින්ද යත්?) සුමනෙ, සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙනභික්ෂුවක් වේද; සො, හෙතෙම; දෙවභූතො සමානො, දෙව්වූයේම; අමුං අදායකං, ඒ නොදෙන භික්ෂුව; දිබ්බෙන ආයුනා, දිව්‍යමයවූ ආයුෂයෙන්ද; දිබ්බෙන වණ්ණෙන, දිව්‍යමයවූ වණ්ණයෙන්ද; දිබ්බෙන සුඛෙන, දිව්‍යමයවූ සැපතින්ද; දිබ්බෙන යසෙන, දිව්‍යමයවූ යශසින්ද; දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිව්‍යමයවූ අධිපති භාවයෙන්ද; (යන) ඉමෙහි පඤ්චහි ඨානෙහි, (සෙසු දෙවියන් සක්දෙව්රද මෙන්) මේ කාරණා පසින්; අධිගණ්හාති ඉති, අභිභවනය කෙරේයයි; (ජයගණීයයි වදාළසේක.) භන්තෙ, ස්වාමීනි; සචෙ පන, ඉදින්; තතො, ඒ දිව්‍යලොකයෙන්; චුතා, චුතවූ; තෙ, ඔහුතුමූ; ඉත්ථත්තං, මේ ආත්මභාවයට (මිනිස්බවට) ආගච්ඡන්ති, එද්ද; භන්තෙ, ස්වාමීනි; මනුස්සභූතානං, මනුෂ්‍යවූ; තෙසං පන, ඔවුන්ගේ වනාහි; විසෙසො, වෙනසෙක්; සියා, වන්නේද; නානාකරණං, නානත්වයෙක්; සියාඉති, වන්නේදැයි ඇසීය; භගවා, භාග්‍යවත්තෙම; සුමනෙ, සුමනාවෙනි; සියා ඉති, වන්නේයයි; අවොච්, වදාළසේක.

යො සො සුමනෙ දායකො සො අමුං අදායකං මනුස්සභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති මානුසකෙන ආයුනා මානුසකෙන වණ්ණෙන මානුසකෙන සුඛෙන මානුසකෙන යසෙන මානුසකෙන ආධිපතෙය්‍යෙන යො සො සුමනෙ දායකො සො අමුං අදායකං මනුස්සභූතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාතීති—සචෙ පන භන්තෙ උභො අගාරස්මා අනගාරියං පබ්බජන්ති පබ්බජිතානං පන තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති, සියා සුමනෙති භගවා අවොච.

යො සො සුමනෙ දායකො සො අමුං අදායකං පබ්බජිතො සමානො

---

සුමනෙ, සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙනභික්ෂුවක්වේද; සො, හෙතෙම, මනුස්සභූතො සමානො, මනුෂ්‍යවූයේම; අමුං අදායකං, ඒ නොදෙන භික්ෂුව; පඤ්චහි ඨානෙහි, කාරණාපසකින්; අධිගණ්හාති, අභිභවනය කෙරෙයි; (කවර කාරණාපසකින්දයත්) සුමනෙ, සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙනභික්ෂුවක්වේද; සො, හෙතෙම; මනුස්සභූතොසමානො, මනුෂ්‍යවූයේම;අමුං අදායකං, ඒ නොදෙන භික්ෂුව; මානුසකෙන ආයුනා, (මහාකප්පප් තෙරිඳුමෙන් බක්කුල තෙරිඳු මෙන් අනද තෙරිදු මෙන්) මනුෂ්‍යමය ආයුෂයෙන්ද;මානුසකෙන වණ්ණෙන,(මහාගතිම්බ අභය තෙරිඳු මෙන් භාණ්ඩාගාර ඇමතියන් මෙන්) මනුෂ්‍යමය වර්ණයෙන්ද; මානුසකෙන සුඛෙන, (රට්ඨපාල කුලපුත් මෙන් සොණ සිටුපුත් මෙන් යසදාරකයා මෙන්) මනුෂ්‍යමයවූ සැපයෙන්ද; මානුසකෙන යසෙන, (ධම්මාසොකරජුමෙන්) මනුෂ්‍යමයවූ යශසින්ද; මානුසකෙන ආධිපතෙය්‍යෙන, මනුෂ්‍යමය අධිපති භාවයෙන්ද; (යන) ඉමෙහි පඤ්චහි ඨානෙහි මේ කාරණාපසින්; අධිගණ්හාති ඉති, අභිභවනය කෙරේයයි; (ජයගණියයි වදාළසේක) භන්තෙ. ස්වාමීනි; සචෙපන, ඉදින්; උභො, දෙදෙන; අගාරස්මා,ගිහිගෙන් නික්ම;අනාගාරියං, ශාසනයෙහි;පබ්බජන්ති, පැවිදිවෙද්ද; භන්තෙ, ස්වාමීනි; පබ්බජිතානං, පැවිදිවූ; තෙසං පන, ඔවුන්ගේ වනාහි; විසෙසො, වෙනසෙක්; සියා, වන්නේද; නානාකරණං,නානත්වයෙක්;සියාඉති, වන්නේදැයි ඇසීය;භගවා, භාග්‍යවත්තෙම; සුමනෙ, සුමනාවෙනි; සියාඉති, වන්නේයයි; අවොච, වදාළසේක;

සුමනෙ සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙනභික්ෂුවක්වේද;සො,හෙතෙම; පබ්බජිතො සමානො, පැවිදිවූයේම; අමුං

පඤ්චහි ඨානෙහි අධිගණ්හාති යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජති අප්පං අයාචිතො යාචිතොව බහුලං පිණ්ඩපාතං පරිභුඤ්ජති අප්පං අයාචිතො යාචිතො බහුලං සෙනාසනං පරිභුඤ්ජති අප්පං අයාචිතො යාචිතොව බහුලං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජති අප්පං අයාචිතො යෙහි ඛො සබ්‍රහමචාරිහි විහරති ත්‍යස්ස මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති අප්පං අමනාපෙන මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති අප්පං අමනාපෙන මහාපෙනෙව බහුලං මනොකම්මෙන සමුදා

---

අදායකං, ඒ නොදෙන භික්ෂුව; පඤ්චහි ඨානෙහි, කාරණා පසකින්; අධිගණ්හාති, අභිභවනය කෙරෙයි (කවරකාරණා පසකින්දයත්?) සුමනෙ, සුමනාවෙනි; යො සො, යම්; දායකො, දෙන භික්ෂුවක්වේද; සො, හෙතෙම; පබ්බජිතො සමානො, පැවිදිවූයේම; යාචිතොව;(දායකයන් විසින්)යාඥකරණලද්දේම; බහුලං, බොහෝකොට; චීවරං, සිවුරු; පරිභුඤ්ජති, බක්කුලතෙරිඳු සීවලීතෙරිඳු අනඳතෙරිඳු ආදීන් මෙන්) පරිභොග කෙරෙයි; අයාචිතො (දායකයන් විසින්) යාඥනොකරණලද්දේ; අප්පං, මඳකොට; (පරිභොගකෙරෙයි} යාචිතොව (දායකයන් විසින්) යාඥකරණලද්දේම; පිණ්ඩපාතං, පිණ්ඩපාතය; බහුලං, බොහෝකොට; පරිභුඤ්ජති, පරිභොගකෙරෙයි; අයාචිතො, (දායකයන් විසින්) යාඥ නොකරණ ලද්දේ; අප්පං, මදකොට (පරිභොග කෙරෙයි) යාචිතොව, (දායකයන් විසින්) යාඥකරණලද්දේම; සෙනාසනං, සෙනසුන්; බහුලං, බොහෝකොට; පරිභුඤ්ජති, පරිභොගකෙරෙයි; අයාචිතො (දායකයන් විසින්) යාඥනොකරණ ලද්දේ; අප්පං, මදකොට (පරිභොගකෙරෙයි) යාචිතොව, (දායකයන් විසින්) යාඥකරණ ලද්දේම; ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං, ගිලනුන්ට ප්‍රත්‍යයවූ බෙහෙත් පිරිකර; බහුලං, බොහෝකොට; පරිභුඤ්ජති. පරිභොග කෙරෙයි; අයාචිතො, (දායකයන් විසින්) යාඥනොකරණලද්දේ; අප්පං, මදකොට; (පරිභොග කෙරෙයි)යෙහිබො සබ්‍රහමචාරීහි, යම් සබ්‍රම්සරුන්හා; විහරති, වාසය කෙරේද; තෙ, ඔහු; අස්ස, මොහුට; මනාපෙන එව, මනාපවූම; කාය කම්මෙන, කාය කර්මයෙන්; බහුලං, බොහෝකොට; සමුදාචරන්ති, ව්‍යවහාර කෙරෙත්; අමනාපෙන, අමනාපවූ; කායකර්මයෙන්) අප්පං, මදකොට; (ව්‍යවහාර කෙරෙත්) මනාපෙන එව, මනාපවූම; වචීකම්මෙන, වාක් කර්මයෙන්; බහුලං, බොහෝකොට;සමුදාචරන්ති,ව්‍යවහාර කෙරෙත්; අමනාපෙන, අමනාපවූ; (වචීකර්මයෙන්) අප්පං, මදකොට; (ව්‍යවහාර කෙරෙත්) මනා

චරන්ති අප්පං අමනාපෙන මනාපෙනෙව බහුලං උපහාරං උපහරන්ති අප්පං අමනාපං යො සො සුමනෙ දායකො සො අමුං අදායකං පබ්බජිතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාතීති—සචෙ පන භන්තෙ උභො අරහත්තං පාපුණන්ති අරහත්තප්පත්තානං පන තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති එත්ථ ඛො පනෙසාහං සුමනෙ න කිඤ්චි නානාකරණං වදාමි යදිදං විමුත්තියා විමුත්තින්ති.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාවඤ්චිදං භන්තෙ අලමෙව

---

පෙන එව, මනාපවූම; මනොකාමෙමන, මනොකාම්යෙන්; බහුලං, බොහෝකොට; සමුදාචරන්ති, ව්‍යවහාරකෙරෙත්; අමනාපෙන, අමනාපවූ; (මනොකාම්යෙන්) අප්පං, මදකොට; (ව්‍යවහාර කෙරෙත්) මනාපං එව, මනාපවූම; උපහාරං, තුන්දෙරින් කරණ පූජා; බහුලං, බොහෝකොට; උපහරන්ති. කෙරෙත්; අමනාපං, අමනාපවූ; (උපහාරය) අප්පං, මදකොට (කෙරෙත් යන) ඉමෙහි පඤ්චහි ඨානෙහි මේ කාරණා පසින්; අධිගණ්හාති ඉති අභිභව නය කෙරේයයි (ජයගණියයි වදාළසේක.) භන්තෙ, ස්වාමීනි; සචෙපන, ඉදින්; තෙ උභො, ඒදෙදෙන; අරහත්තං, අර්හත්වයට පාපුණන්ති, පැමිණෙද්ද; භන්තෙ, ස්වාමීනි; අරහත්තප්පත්තානං; අර්හත්වයට පැමිණියාවූ; තෙසංපන, ඔවුන්ගේ වනාහි; විසෙසො, වෙනසෙක්; සියා, වන්නේද; නානාකරණං, නානාත්වයෙක්; සියා ඉති, වන්නේදැයි විචාළාය; සුමනෙ, සුමනාවෙනි; එත්ථඛොපන, මේ කාරණයෙහි; (මේ ප්‍රශ්නයෙහි) එසං, මොවුන් දෙදෙනා සම්බන්ධවූ; යං ඉදං, යම්මේ; විමුත්තියා, (එකෙකුගේ) මිදීමසමග; විමුත්තිං, (අනිකක්හුගේ) මිදීම (අරබයා) කිඤ්චි නානාකරණං, කිසි වෙනසක්; අහං, මම; න වදාමිඉති; නොකියමියි) වදාළේය; (ඒ එසේමය සත්හැවිරිදි ලදරුවෙක් හෝ සියක්හවුරුදු ඇති මහතෙරකෙණෙක් හෝ මහණෙක් හෝ මෙහෙණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ඒ විමුත්තිය ප්‍රතිවෙධකොරේද ප්‍රතිවෙධ කරණලද ඵලාකොත්තර මාර්ගයෙහි වෙනස් බවක් නම් නැත්තේය) දෙවභූතස්ස අපි, දෙවිවූවාහටත්; යත්‍රහිනාම පුඤ්ඤානි, යම් පුණ්‍යයෝ; උපකාරාති; උපකාරවෙද්ද; මනුස්සභූතස්සඅපි, මනුෂ්‍යවූවාහටත්; පුඤ්ඤානි, පුණ්‍යයෝ; උපකාරාති, උපකාරවෙද්ද; පබ්බජිතස්සඅපි, පැවිදිවූවාහටත්; පුඤ්ඤානි, පුණ්‍යයෝ; උපකාරානි,උපකාරවෙද්ද; (එබැවින්) භන්තෙ, ස්වාමීනි; යාවඤ්චි

දානානි දාතුං අලං පුඤ්ඤානි කාතුං යත්‍රහි නාම දෙවභූතස්සපි උපකාරානි පුඤ්ඤානි මනුස්සභූතස්සපි උපකාරානි පුඤ්ඤානි පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානීති- එවමෙතං සුමනෙ එවමෙතං සුමනෙ අලමෙව දානානි දාතුං අලං පුඤ්ඤානි කාතුං දෙවභූතස්සපි උපකාරානි පුඤ්ඤානි මනුස්සභූතස්සපි උපකාරානි පුඤ්ඤානි පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානීති- ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

යථාපි චන්දො විමලො-ගච්ඡං ආකාසධාතුයා
සබ්බෙ තාරාගණෙ ලොකෙ-ආභාය අතිරොචති.

තථෙව සීලසම්පන්නො-සද්ධො පුරිසපුග්ගලො
සබ්බෙ මච්ඡරිනො ලොකෙ-චාගෙන අතිරොචති.

---

දං, අතිශයින්; දානානි, දන්; දාතුං, දීම; අලංඑව, සුදුසුමවේ; පුඤ්ඤානි,පින්; කාතුං,කිරීම; අලං, සුදුසුම්වේ; භන්තෙ, ස්වාමීනි; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යීවෙයි; භන්තෙ, ස්වාමීනි; අබ්භුතං ඉති, පෙරනුවූ දෙයක් වේයයි (කීය), සුමනෙ, සුමනාවෙනි; එතං, මේකාරණය; එවං, එසේවෙයි; සුමනෙ, සුමනාවෙනි; එතං, මේකාරණය; එවං, එසේවෙයි; දානානි, දන්; දාතුං, දීම; අලං එව, සුදුසුමවෙයි; පුඤ්ඤානි, පින්; කාතුං, කිරීම; අලං, සුදුසුම වෙයි; දෙවභූතස්සඅපි, දෙවිවූවාහටද; පුඤ්ඤානි, පුණ්‍යයෝ; උපකාරානි, උපකාරයෝවෙත්; මනුස්සභූතස්සඅපි, මනුෂ්‍යවූවා හටද;පුඤ්ඤානි,පුණ්‍යයෝ;උපකාරානිඉති,උපකාරයෝවෙත්යයි; භගවා, භාග්‍යවත්තෙම; ඉදං, මෙය; අවොච, වදාළසේක; ඉදං, මෙය;වත්වා,වදාරා; සත්ථා,ශාස්තෲවූ;සුගතො,සුගතතෙම; අථාපරං, නැවත අන්‍යවූ; එතං, මේ ගාථාබන්ධනය; අවොච, වදාළසේක.

යථාපි, යම්සේ; ආකාසධාතුයා, අහසින්; ගච්ඡං, යන්නාවූ; විමලො, නිර්මලවූ; චන්දො, චන්ද්‍රතෙම; ලොකෙ, ලොකයෙහි; සබ්බෙ තාරාගණෙ, සියලු තාරකා සමූහයන්; ආභාය, (තමාගේ) ආලොකයෙන්; අතිරොචති, ඉක්මවා බබලාද.

තථා එව,එසේම; සීලසම්පන්නො,සීලයෙන්යුක්තවූ; සද්ධො, ශ්‍රද්ධාඇති; පුරිසපුග්ගලො, සෝවාන් පුද්ගලතෙම; චාගෙන, (තමාගේ) ත්‍යාගය කාරණකොටගෙණ; ලොකෙ, ලොකයෙහි; සබ්බෙ මච්ඡරිනො, සියලු මසුරන්; අතිරොචති, ඉක්මවා බබලයි.

යථාපි මෙඝො ථනයං–විජ්ජුමාලී සතක්කකු
ථලං නින්නඤ්ච පූරෙති–අභිවස්සං වසුන්ධරං.

එවං දස්සනසම්පන්නො–සම්මාසම්බුද්ධසාවකො
මච්ඡරිං අධිගණ්හාති–පඤ්චඨානෙහි පණ්ඩිතො.

ආයුනා යසසා චෙව–වණ්ණෙන ච සුඛෙන ච
සවෙ භොගපරිබ්බූළ්හො–පෙච්ච සග්ගෙ පමොදතීති.

ඉදමවොච භගවා අත්තමනා සුමනා රාජකුමාරී භගවතො භාසිතං අභිනන්දීති.

සුමනාසුත්තං.

---

විජ්ජුමාලී, විදුලිය මාලාකොට ඇත්තාවූ; සතක්කකු, සිය ගණන් මෙඝපටල ඇත්තාවූ; මෙඝො, මෙඝයතෙම; ථනයං, ගර්ජනාකෙරෙමින්; වසුන්ධරං, පෘථිවියෙහි; අභිවස්සං, වස්නේ; ථලං, ගොඩද; නින්නඤ්ච, වළතැන්ද; යථාපි, යම්සේ; පූරෙති, පුරවාද;

එවං, එසේ; දස්සනසම්පන්නො, සෝවාන්වූ; පණ්ඩිතො, පණ්ඩිතවූ; සම්මාසම්බුද්ධ සාවකො, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රාවකතෙම; පඤ්චඨානෙහි, කාරණාපසකින්; මච්ඡරිං, මසුරා; අධිගණ්හාති, මැඩපවත්වයි; (කවරකාරණා පසකින්ද යත්)

ආයුනා, ආයුෂයෙන්ද; යසසා චෙව, යශසින්ද; වණ්ණෙනච, වර්ණයෙන්ද; සුඛෙනච, සැපයෙන්ද; (යන කාරණා පසින්වේ) සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; භොගපරිබ්බූළ්හො, භොගයෙන් වැඩුනේ; පෙච්ච, පරලොකයෙහි; සග්ගෙ, ස්වර්ගයෙහි; පමොදති ඉති, සතුටුවේයයි.

භගවා, භාග්‍යවත්තෙම; ඉදං, මේ සූත්‍රය; අවොච, වදාළසේක; අත්තමනා, සතුටුසිත් ඇති; සුමනාරාජකුමාරී, සුමනාරාජකුමාරී තොමෝ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, දෙශනාව; අභිනන්දීති, සතුටින් පිළිගත්තීය.

සුමනා සූත්‍ර පදවිව්‍යාඛ්‍යායයි.

සාවත්ථිනිදානං—පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි කතමානි පඤ්ච සද්ධාය දානං දෙති සක්කච්චං දානං දෙති කාලෙන දානං දෙති අනග්ගහිතචිත්තො දානං දෙති අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච දානං දෙති.

සද්ධාය ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො අභිරූපො ච හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො.

සක්කච්චං ඛොපන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස

---

සාවත්ථි නිදානං, සැවැත්නුවරෙහි නිදානයවේ;–භික්ඛවෙ,මහණෙනි; සප්පුරිස දානානි, සත්පුරුෂ දානයෝ; ඉමානි පඤ්ච,මොහු පස්දෙනෙක්වෙත්; කතමානි පඤ්ච, කවර පස්දෙනෙක්දයත්?; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; දානං දෙති, දන්දෙයි; සක්කච්චං, සකස් කොට; දානං දෙති, දන්දෙයි; කාලෙන, (සුදුසු) කාලයෙහි; දානං දෙති, දන්දෙයි; අනග්ගහිත චිත්තො, ආසාවෙන් නොමඩනලද සිත්ඇත්තේ; දානං දෙති,දන්දෙයි; අත්තානඤ්ච,තමාද; පරඤ්ච, අන්‍යයාද; අනුපහච්ච, නොපෙළා; දානං දෙති, දන්දෙයි.

භික්ඛවෙ, මහණෙනි; සද්ධාය ඛොපන, ශ්‍රද්ධාවෙන් වනාහි; දානං දත්වා, දන්දී; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො, විපාකයතෙම; නිබ්බත්තති, උපදීද; අඩ්ඪොච හොති,ධනයෙන්සමෘද්ධවූයේද වෙයි;මහද්ධනො,නිධාන්ගත මහද්ධන ඇත්තේද වෙයි; මහාභොගො, මහත් උපභොග පරිභොගසම්පත් ඇත්තේද වෙයි; අභිරූපොච හොති, විශිෂ්ටවූ රූඇත්තේද වෙයි; දස්සනීයො,දැකුම් කටයුත්තේද වෙයි; පාසාදිකො,ප්‍රශාදඑළවන්නේද වෙයි; පරමාය, උතුම්වූ; වණ්ණපොක්ඛරතාය, රූපසෞන්දර්‍ය්‍යයෙන්; සමන්නාගතො,යුක්තවූයේද වෙයි.

භික්ඛවෙ, මහණෙනි; සක්කච්චං ඛොපන, සකස්කොට වනාහි; දානං දත්වා, දන්දී; (සකස්කොට දීමනම් දානවස්තුවෙහි හා පිළිගන්නවුන් කෙරෙහි ගෞරව එළවා දීමයි. ඒ දෙයාකාරයන් අතුරෙන් සුන්සහල් ආදි දොසින් යුක්තවූ ආහාර නොදී ප්‍රණීත වූ ඔජස් ඇතිකොට (දෙන්නේ) දියයුතු දානවස්තුවට සත්කාර කෙරේනම් වෙයි. යම් ඒ තැනක නොහින්දවා වැඩහිඳිනාතැන ගැමද අසුන්පනවා දක්ෂිණාර්හ පුද්ගලයන්තෝරා එහිවැඩහිඳුව,

විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති.

කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො කාලගතා වස්ස අත්ථා පචුරා හොන්ති.

---

දන්දෙන්නේ පුද්ගලයාහට සත්කාර කෙරේනම් වෙයි. මෙබඳු තැනැත්තේ දානපතියා නම්වෙයි. දන්දෙන්නෝ වනාහි දෙයාය ධර්මවශයෙන් දානදාසයාය දානසහායයාය දානපතියායයි ත්‍රිවිධ වෙත්. ඔවුන් අතුරෙන් යමෙක්තෙම තමා මිහිරිකොට අනුභව කෙරේද අනුන්ට මිහිරි නොකොටදේද හෙතෙම දානසඞ්ඛ්‍යාතවූ දියයුතු දෙයට දාසයෙක්වී දෙයි. යම් පුද්ගලයෙක්තෙම තමා යමක් අනුභවකෙරේනම් ඒ දෙයම දේද හෙතෙම දානසඞ්ඛ්‍යාත දියයුතු දෙයට යහලුවී දෙයි. යම් පුද්ගලයෙක්තෙම තමා යම් කිසිවකින් යැපෙන්නේ අනුන්ට මිහිරිකොටදේද ඒ පුද්ගලතෙම දානසඞ්ඛ්‍යාත දියයුතු දෙයට ස්වාමියෙක්වී දෙයි; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො, විපාකය තෙම; නිබ්බත්තති, උපදීද; අඩ්ඪොච හොති, ධනයෙන් සමෘද්ධ වූයේද වෙයි; මහද්ධනො, නිධාන්ගත මහද්ධන ඇත්තේදවෙයි; මහාභොගො, මහත් උපභොග පරිභොග සම්පත් ඇත්තේද වෙයි; අස්ස, මොහුගේ; පුත්තා ඉතිවා, පුත්‍රයෝයයි කියාහෝ; දාරා ඉතිවා, අඹුවෝයයි කියාහෝ; දාසා ඉතිවා, දාසයෝයයි කියාහෝ; පෙස්සා ඉතිවා, පනිවිඩකාරයෝයයි කියාහෝ; කම්මකාරා ඉතිවා, කම්කරුවෝයයි කියාහෝ; යෙපිතෙ, යම් ඒ කෙනෙක්; හොන්ති, වෙද්ද; තෙ අපි, ඔහුතුමූද; සුස්සූසන්ති, මනාව වචනය අසත්; සොතං, කණ; ඔදහන්ති, පිහිටුවත්; අඤ්ඤා, දැනගැනීම පිණිස; චිත්තං, සිත; උපට්ඨපෙන්ති, එළවත් (හෙවත්) එළවා තබත්—

භික්ඛවෙ, මහණෙනි; කාලෙන ඛොපන, (සුදුසු) කාලයෙහි වනාහි; දානං දත්වා, දන්දී; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො, විපාකය; නිබ්බත්තති, උපදීද; අඩ්ඪොච හොති, ධනයෙන් සමෘද්ධවූයේද වෙයි; මහද්ධනො, නිධාන්ගත මහද්ධන ඇත්තේදවෙයි; මහාභොගො, මහත් උපභොග පරිභොග සම්පත් ඇත්තේද වෙයි; අස්ස, මොහුගේ; කාලගතා, සුදුසුකාලයෙහි පැමිණියාවූ; අත්ථාච, ධනයෝද පචුරා හොන්ති, බොහෝවෙත්.

අනග්ගහිතචිත්තො ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො උළාරෙසු ච පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති.

අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො නචස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානීති—

---

භික්ඛවෙ, මහණෙනි; අනග්ගහිත චිත්තො ඛො පන, ආසාවෙන් නොමඩනාලද සිත්ඇත්තේ වනාහි; දානං දත්වා, දන්දී; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො, විපාකය; නිබ්බත්තති. උපදීද; අඩ්ඪොච හොති, ධනයෙන් සමෘධවූයේද වෙයි; මහද්ධනො, නිධාන්ගත මහද්ධන ඇත්තේදවෙයි; මහාභොගො, මහත් උපභොග පරිභොග සම්පත් ඇත්තේදවෙයි; උළාරෙසුච, මහත්වූද; පඤ්චසු කාමගුණෙසු, පඤ්චකාමගුණයන්හි; භොගාය, අනුභවය පිණිස; චිත්තං, සිත; නමති, නැමෙයි.

භික්ඛවෙ, මහණෙනි; අත්තානඤ්ච, තමාද; පරඤ්ච, අන්‍යයාද; අනුපහච්ච ඛොපන, නොපෙළා වනාහි; දානං දත්වා, දන්දී; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො විපාකය; නිබ්බත්තති, උපදීද; අඩ්ඪොච හොති, ධනයෙන් සමෘධවූයේද වෙයි; මහද්ධනො, නිධාන්ගත මහද්ධන ඇත්තේදවෙයි; මහාභොගො, මහත් උපභොග පරිභොග සම්පත් ඇත්තේදවෙයි; අස්ස, මොහුගේ; භොගානං, භොගයන්ගේ; අග්ගිතොවා, ගින්නෙන්හෝ; උදකතොවා, ජලයෙන්හෝ; රාජතොවා, රජුන්ගෙන් හෝ; චොරතොවා, සොරුන්ගෙන් හෝ; අප්පිය දායාදතොවා, අප්‍රිය දායාදයන්කෙරෙන් හෝ; කුතොචි, කිසිවකින්; උපඝාතො, නැසීමෙක්; නච ආගච්ඡති, නොපැමිණෙයි; භික්ඛවෙ, මහණෙනි; ඉමානි ඛො පඤ්ච, මොහු පස්දෙන වනාහි; සප්පුරිස දානානි ඉති, සත්පුරුෂ දානයෝයයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ සූත්‍රය; අවොච, වදාළසේක; අත්තමනා, සතුටුසිත් ඇති; තෙ භික්ඛූ, ඒභික්ෂූහු තුමූ; භගවතො

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

## සප්පුරිස දාන සුත්තං.

“ඉමානි තීණි පඤ්චකඞ්ගුත්තරෙ.”

එවම්මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—අථඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච අපිනු තෙ ගහපති කුලෙ දානං දීයතීති'

---

භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, දෙශනාව; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්තාහුය.

## සත්පුරුෂදාන සූත්‍ර පදාර්ථව්‍යාඛ්‍යානයයි.

මෙ, මාවිසින්; එවං, මෙයාකාරයෙන්; සුතං, අසනලද්දේය; (හෙවත්) මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේමැයි; එකං සමයං, එක්කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬුමහසිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩවාසයකරණසේක;– අථඛො, ඉක්බිති; අනාථපිණ්ඩිකො ගහපති, අනාථපිණ්ඩික ගෘහපතිතෙම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත්පසක; නිසීදි, උන්නේය; එකමන්තං, එකත්පසෙක්හි; නිසින්නං ඛො, උන්නාවූම; අනාථපිණ්ඩිකං ගහපතිං, අනාථපිණ්ඩික ගෘහපතියාහට; භගවා භාග්‍යවත්තෙම; ගහපති, ගෘහපතිය; අපිනු, කිමෙක්ද; තෙ, තාගේ; කුලෙ, කුලයෙහි; දානං දීයති ඉති, දන්දෙනු ලැබේදැයි; එතං, මේ වචනය; අවොච, වදාළසේක; (“අපිනු තෙ ගහපති කුලෙ දානං දීයතීති” යනුවෙන් ලොකස්වාමී භාග්‍යවත් සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ භික්ෂු සඞ්ඝයාට දෙන දානය සඳහා නොවිචාළසේක. අනේපිඬු සිටාණන්ගේ ගෘහයෙහි භික්ෂු සඞ්ඝයාට නිරතුරු ප්‍රණීතව දන්දෙනුලැබේ. එය භාග්‍යවතුන් වහන්සේ දන්නාසේක. ලෞකික මහාජනයාහට දෙනු ලබන දන්ඇත්තේය ඒදානය රූක්ෂවෙයි. අනේපිඬුසිටාණන්ගේ

දීයති මෙ භන්තෙ තඤ්ච ඛො ලූඛං කණාජකං බිලඞ්ග දුතියන්ති.

ලූඛඤ්චෙපි ගහපති දානං දෙති පණීතං වා තඤ්ච අසක්කච්චං දෙති අචිත්තීකත්වා දෙති අසහත්ථා දෙති අපවිද්ධං දෙති අනාගමන දිට්ඨිකො දෙති යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති න උළාරාය භත්තභොගාය චිත්තං නමති න උළාරාය වත්ථභොගාය චිත්තං නමති න උළාරාය යානභොගාය චිත්තං නමති න උළාරෙසුව පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති යෙ පිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි න සුස්සූසන්ති

---

සිත ප්‍රියනොකෙරෙයි. එහෙයින් ඒ දානය ගැණ විචාරා වදාළ සේක.) භන්තෙ, ස්වාමීනි; මෙ, මාවිසින්; දීයති, දෙනුලැබෙයි; තඤ්චඛො, ඒ දීමද; ලූඛං, රූක්‍ෂවෙයි; බිලඞ්ග දුතියං, කාඩි දෙවෙනිකොටඇති; කණාජකං ඉති, නිවුඩුසහලේ බත්; (දෙනු ලැබේයයි සැලකෙළේය.)

ගහපති, ගෘහපතිය; වෙ, ඉදින්; ලූඛං අපි, (යමෙක්තෙම) රූක්‍ෂවූහෝ; පණීතං වා, ප්‍රණීතවූහෝ; දානං, දන්; දෙති, දේද; තඤ්ච, ඒ දීමද; අසක්කච්චං, නොසකස්කොට; (අගෞරව වශයෙන්) දෙති, දේද; අචිත්තීකත්වා, නොසලකා; දෙති, දේද; අසහත්ථා දෙති, සියඅතින් නොදේද; අපවිද්ධං දෙති, පිරිසිදු නොකොට දේද; (ඉවතදමනුකැමැත්තක්හුමෙන් වී තුඹසක බහාලන්නක්හු මෙන් දේය යන අදහසයි.) අනාගමනදිට්ඨිකො, පරලොව වැඩ නොසලකන දෘෂ්ටි ඇත්තේ; (දුන්දෙයෙහි විපාකය කවදා හෝ මතු ලැබෙන්නේයයි මෙසේ ආගමනදෘෂ්ටිය නොවූපදවා) දෙති, දේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒ දානයාගේ; විපාකො, විපාකය; නිබ්බත්තති, උපදීද; උළාරාය, මහත්වූ; භත්තභොගාය, ආහාර අනුභවය පිණිස; චිත්තං, සිත; න නමති, නොනැමෙයි; (නොයෙක් අග්‍රරස ඇත්තාවූ පුරාණ ඇල්සහලේ බත් එළවූකල්හි ඒ අනුභවය පිණිස සිත නොනැමෙයි. මේ ආහාරය පහකරව රොග වැඩෙන්නේයයි කියා යම් ඒ පලාවගීයක් සමග නිවුඩුසහලේ බත් අමෘතය මෙන් ප්‍රිය කෙරෙමින් අනුභව කෙරෙයි) උළාරාය මහත්වූ; වත්ථභොගාය, වස්ත්‍ර පරිභොගය පිණිස; චිත්තං, සිත; න නමති, නොනැමෙයි; උළාරාය, මහත්වූ; යානභොගාය, යානාපරිභොගය පිණිස; චිත්තං, සිත; න නමති, නොනැමෙයි; උළාරෙසුව, මහත්වූද; පඤ්චසු කාමගුණෙසු. පඤ්චකාමගුණයන්හි; භොගාය, පරිභොගය පිණිස; චිත්තං, සිත; න නමති, නොනැමෙයි; අස්ස, මොහු

න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති තං කිස්ස හෙතු එවං හෙතං ගහපති හොති අසක්කච්චකතානං කම්මානං විපාකො

ලූඛඤ්චෙපි ගහපති දානං දෙති පණීතං වා තඤ්ච සක්කච්චං දෙති චිත්තී කත්වා දෙති සහත්ථා දෙති අනපවිද්ධං දෙති ආගමන දිට්ඨිකො දෙති යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති උළාරාය භත්තභොගාය චිත්තං නමති උළාරාය වත්ථභොගාය චිත්තං නමති උළාරාය යානභොගාය චිත්තං නමති උළාරෙසු ච පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති යෙ පිස්ස තෙ හොන්ති පුත්තාති වා

---

ගේ; පුත්තා ඉති වා, පුත්‍රයෝයයි කියාහෝ; දාරා ඉතිවා, අඹුවෝයයි කියාහෝ; දාසා ඉතිවා, දාසයෝයයි කියාහෝ; පෙස්සා ඉතිවා, පතිවිධකාරයෝයයි කියාහෝ; කම්මකරා ඉතිවා, කම්කරුවෝයයි කියාහෝ; යෙපිතෙ, යම් ඒ කෙනෙක්; හොන්ති, වෙද්ද, තෙඅපි, ඔහුතුමූද; න සුස්සූසන්ති, වචනය නොඅසත්; සොතං, (කියනලද වචනයාගේ ඇසීම පිණිස) කණ; න ඔදහන්ති, නොපිහිටුවත්; අඤ්ඤා, දැනගැණීම පිණිස; චිත්තං, සිත; න උපට්ඨපෙන්ති, නොඑළවත් (හෙවත්) එළවා නොතබත්; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද; ගහපති, ගෘහපතිය, එතංහි, මේවනාහි; අසක්කච්ච කතානං, සකස්නොකොට කරණලද්දාවූ; කම්මානං, කර්මයන්ගේ; විපාකො, විපාකයතෙම; එවං හොති, මෙසේවෙයි.

ගහපති, ගෘහපතිය; චෙ, ඉදින්; ලූඛම්පි, රූක්‍ෂවූහෝ; පණීතං වා, ප්‍රණීතවූහෝ; දානං, දන්; දෙති, දේද; තඤ්ච, එයද; සක්කච්චං, සකස්කොට; (ගෞරව වශයෙන්) දෙති, දේද; චිත්තීකත්වා, සලකා; දෙති, දේද; සහත්ථා, සියඅතින්; දෙති, දේද; අනපවිද්ධං, පිරියිදුකොට; දෙති, දේද; ආගමනදිට්ඨිකො, පරලොව වැඩසලකා; දෙති, දේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; තස්ස දානස්ස, ඒදානයාගේ; විපාකො, විපාකය; නිබ්බත්තති, උපදීද; උළාරාය, මහත්වූ; භත්තභොගාය, ආහාර අනුභවය පිණිස; චිත්තං, සිත; නමති, නැමෙයි; උළාරාය, මහත්වූ; වත්ථභොගාය, වස්ත්‍රපරිභොගය පිණිස; චිත්තං, සිත; නමති, නැමෙයි; උළාරාය, මහත්වූ; යානභොගාය, යානාපරිභොගය පිණිස; චිත්තං, සිත; නමති නැමෙයි; උළාරෙසුච, මහත්වූද; පඤ්චසු කාමගුණෙසු, පඤ්චකාම ගුණයන්හි; භොගාය, පරිභොගය පිණිස; චිත්තං, සිත; නමති, නැමෙයි; අස්ස, මොහුගේ; පුත්තා ඉතිවා, පුත්‍රයෝයයි කියාහෝ; දාරා ඉතිවා, අඹුවෝයයි කියාහෝ; දාසා ඉති වා, දාසයෝයයි කියා

දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති තං කිස්ස හෙතු එවං හෙතං ගහපති හොති සක්කච්චකතානං කම්මානං විපාකො.

භූතපුබ්බං ගහපති වේලාමො නාම බ්‍රාහ්මණො අහොසි සො එවරූපං දානං අදාසි මහාදානං චතුරාසීති සුවණ්ණපාති සහස්සා

---

හෝ; පෙස්සා ඉතිවා, පනිවිඩකාරයෝයයි කියාහෝ; කම්මකරා ඉති වා, කම්කරුවෝයයි කියාහෝ; යෙපිතෙ, යම් ඒ කෙනෙක්; හොන්ති, වෙද්ද; තෙ අපි, ඔහුතුමූද; සුස්සූසන්ති, මනාව අසත්; සොතං, (කියනලද වචනය ඇසීමපිණිස) කණ, ඔදහන්ති, පිහිටූවත්; අඤ්ඤා, දැනගැන්ම පිණිස; චිත්තං, සිත; උපට්ඨපෙන්ති. එළවත් (හෙවත්) එළවා තබත්; තං කිස්සහෙතු; ඊට හෙතුකවරේද; ගහපති, ගෘහපතිය; එතංහි, මේවනාහි; සක්කච්චකතානං, සකස් කොට කරණලද්දවූ; කම්මානං, කර්මයන්ගේ; විපාකො, විපාකයතෙම; එවං හොති, මෙබඳුවෙයි.

ගහපති, ගෘහපතිය; භූතපුබ්බං, පෙර; වේලාමො නාම, වේලාමනම්; බ්‍රාහ්මණො, බ්‍රාහ්මණයෙක්; අහොසි, වූයේය. (වේලාම යනු ජාති ගොත්‍ර රූප භොග ශ්‍රද්ධා ප්‍රඥාදියෙන් මරියාද සඞ්ඛ්‍යාත වෙරළ ඉක්මෙව්වාවූ මහත් ගුණවලින් යුක්තවූ හෙයින් මෙසේ ලබනලද නම් ඇත්තෙක් වේ )සො,ඒවේලාමනම් බ්‍රාහ්මණතෙම; මහාදානං,මහාදානයක්වූ; එවරූපං, මෙබඳුවූ; දානං, දනක්; අදාසි, දුන්නේය. "එහි පිළිවෙළකථාව කියනුලැබේ." (ඒවේලාමනම් බමුණුතෙම අතීතකාලයෙහි බරණැස් නුවර පුරොහිතයක්හු නිසා ඔහුගේ භාර්‍ය්‍යාවගේ කුස පිළිසිඳගෙණ දසමසක් ඇවෑමෙන් බිහිවූයේය ඒ කුමාරයාහට නම් තබන දිනයෙහි වේලාම කුමාරයයි නම්කළෝය. ඒ වෙලාම කුමාරයා ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදිකල බරණැස් නුවරවාසී රාජකුමාරයා සමග ශිල්ප ඉගණීම පිණිස තක්සලා නුවරට ගියේය. ඔහු දෙදෙනම දිසාපාමොක් ආචාර්‍ය්‍යයන්ගේ සමීපයෙහි ශිල්ප ඉගණීමට පටන්ගත්තාහුය. එසේම දඹදිව අනිකුත් සුවාසූ දහසක් රාජකුමාරයෝද ශිල්ප ඉගණීම පිණිස එහි පැමිණියාහුය වෙලාම නම් බ්‍රාහ්මණකුමාරව උපන්නාවූ බොධිසත්වතෙම තමා ඉගෙණගත් ගත් ශිල්ප පිටු ඇදුරුවී සුවාසූ දහසක් කුමාරයන්ට ඉගැන්වූයේය. බොධිසත්වයෝද සොළොස් හවුරුද්දකින් ඉගෙණගත යුතුවූ ශිල්ප තුන්හවුරුද්දකින් උගත්තෝය. ආචාර්‍ය්‍යතෙම වෙ

ලාම් කුමාරයාහට ශිල්ප ප්‍රගුණයයි දූත ඒ වෙලාමනම් බ්‍රාහමණ
කුමාරතෙම මාවිසින් දන්නාලද සියලු ශිල්පදනීයි. තොපි යියල්
ලෝම් සම්ගිව ගොස් ඒ වෙලාමකුමාරයාගේ සමීපයෙහි ශිල්ප
උගණිව්යයි සුවාසූ දහසක් කුමාරයන් බොධිසත්වයන්ට පාවාදුන්
නේය. බොධිසත්වතෙම ආචාය්‍යීයා වැද සුවාසූ දහසක් කුමාර
යන් පිරිවරකොට ඇත්තේ නික්මී එක්සමීප නුවරකට පැමිණ
ඒ නුවර අයිනී කුමාරයාට උගන්වා ඔහට ශිල්පප්‍රගුණවූ කල්හි
ඒ රාජකුමාරයා එනුවරම හැවැත්වූයේය මේ උපායෙන් සුවාසූ
දහසක් නගරයන්ට ගොස් රාජකුමාරයන්ට ශිල්ප ප්‍රගුණකොට
ඒ ඒ නුවරං ඒ ඒ රාජකුමාරයා නවත්වා බරණැස්නුවර රාජකුමා
රයාගෙණ බරණැස් නුවරට ගියේය. ඒ නුවරවැසි මනුෂ්‍යයෝ
පිරිසිදුව ඉගෙණගන්නාලද ශිල්පඇති බරණැස් රාජකුමාරයා
රාජ්‍යයෙහි අභිෂෙකකොට වෙලාම බ්‍රාහමණයාහට පුරෝහිත
තනතුර දුන්නාහුය. ඒ සුවාසූදහසක් රාජකුමාරයෝද නම
තමන්ගේ රටවලදී අභිෂෙකයට පැමිණ අවුරුද්දක් පාසා බර
ණැස් රජහට උපස්ථානයට එත්. ඔව්හු බරණැස් රජ්ජු දූක
වෙලාම බ්‍රාහමණයන් සමීපයට ගොස් ආචාය්‍යීයෙනි අපි අපගේ
රාජ්‍යයන්හි පිහිටියම්හ. යම්කිනි නුඹවහන්සේට ප්‍රයොජන
ඇත්තේවීනම් එය අපට කියනසේක්වායි කියා යෙත්. ගැල්
රථ දෙනුන් ගොන් ඌරන් කුකුලන් ආදිය් ගණිමින් ඔවුන්
යන එන කලැ ජනපදය අතිශයින් උපද්‍රැතවූයේ වෙයි. මහා
ජනතෙමේ රැස්වී රජම්දුලෙහි හඬයි. එකල්හි රජතෙම වෙ
ලාම බ්‍රාහමණයාණන් කැඳවා ආචාය්‍යීයෙනි ජනපදයතෙම උප
ද්‍රැතවූයේය. යන එන කල්හි රජහු පැහැරගණිත් මනුෂ්‍යයෝ
ඉවසනු නොහැක්කෝවෙත්. ජනපදයාගේ පීඩාව සන්සිඳවීමෙහි
එක් උපායක් කරණු මැනවැයි කීයේය. යහපත මහරජ්ජුරුවෙනි
උපායක් කරන්නෙමි නුබවහන්සේට යම් පමණ ජනපදයකින්
ප්‍රයොජන ඇත්තේනම් එය පිරිසිඳගන්නාසේක්වායයි කීයේය.
බරණැස් රජතෙමේද එසේ කොළේය. වෙලාම නම් බ්‍රාහමණ
තෙම සුවාසූ දහසක් රජ්ජුන්ට ජනපද තියම කොට සකතැබ දූවි
මේන් රජහුගේ ජනපදයෙහි ඇතුලුන් කොළේය. එවක් පටන්
එන්නාවූද යන්නාවූද ඒ රජහු තමතමන්ගේ ජනපදයෙන්ම
ගමනා ගමනය කෙරෙත්. අපගේ ජනපදයයි කියා පැහැරගැ
න්ම නොකෙරෙත්. රාජගෞරවයෙන් රජහුගේ ජනපදයටද
පීඩා නොකෙරෙත්. සන්සිඳුනාවූ ජනපදවාසීහු නිශ්ශබ්දවූවෝය,
සියලුරජහු සතුටුවූවාහු ආචාර්‍ය්‍යන්වහනාස නුබවහන්සේට යම
කින් ප්‍රයෝජනවේනම් එය අපට කියනසේක්වායි පැවරුවාහුය.

එක් දිනක් වෙලාමනම් බ්‍රාහමණතෙම ස්නානයකොට අවුත් තමාගේ ගෘහයෙහි සත්රුවන් පිරූ ගබඩාවන්ගේ දොරවල් විවෘත කරවා සත්වෙනි කුලපරම්පරාව දක්වා රැස්කරණලද ධනය බලා අය වැයද පරීක්ෂාකොට මාවිසින් සියලු දඹදිව තලඹමින් දන්දෙන්ට වටීයයි රජහට දන්වා ගංතෙර සමීපයෙහි දොළොස් යොදුන්වූ ලිප්පෙළක් කරවා ඒ ඒ තැන ගිතෙල් මී උක්සකුරු හෙල් සහල් ආදිය තැබීම පිණිස මහත් කොටු ගෙවල් පිහිටුවා එක එක තැන මෙතෙක් දෙන සංවිධාන කරවි මනුෂ්‍යයන් විසින් ලැබියයුතු යම්කිසිවක් ඇත්තේවිනම් ඉන් එකකුදු නැතිකල්හි මට කියව්යයි මනුෂ්‍යයන්ට විධානකොට අසවල් දිනයෙහි පටන් වෙලාමනම් බ්‍රාහමණයාගේ දන් අනුභව කෙරේවායි නුවර බෙර හසුරුවා දන්දෙනතැන කටයුතු අවසානයයි දීමෙහි නියුක්තයන් දැන්වූකල්හි වෙලාමනම් බ්‍රාහමණතෙම ලක්ෂයක් අගනා වස්ත්‍රයක්හැඳ පන්සියයක් අගනා වස්ත්‍රයක් ඒකාංශකොට සර්වාභරණයෙන් සැරසුනේ දන් විවසීම පිණිස පළිගුවන් ජලයෙන් රන්කෙණ්ඩිය පුරවා ඉදින් මේ ලෝකයෙහි මේ දානය පිළිගැණීමට සුදුසුවූ දක්ෂිණාහී පුද්ගලයෝ ඇත්තාහුනම් මේ ජලය කෙණ්ඩියෙන් නික්මී පෘථිවියට වැගිරේවා. ඉදින් දක්ෂිණාහී පුද්ගලයෝ නැත්තාහු නම් මෙසේම සිටීවායි සත්‍යක්‍රියා කොට කෙණ්ඩිය යටිකුරු කෙළේය. ජලය ඩබරාවකින් ගත් තාක්මෙන් වූයේය. බෝධිසත්වතෙම එකාන්තයෙන් දඹදිව දක්ෂිණාහීයන්ගෙන් සිස්වූයේවෙයි. දන්පිළිගැණීමට සුදුසුවූ එක් පුද්ගලයෙක්වත් නැතැයි විපිළිසර නොකොට ඉදින් දායකයාගේ වශයෙන් මේ දක්ෂිණාතොමෝ පිරිසිදුවන්නීනම් මේ භාජනයගත ජලය නික්මී පෘථිවිය ස්පර්ශ කෙරේවායි සිතුයේය. පළිඟු වැටියක් වැනිවූ ජලය නික්මී පෘථිවිය ස්පර්ශකෙළේය. දැන් දන් දෙන්නෙමියි දන්දෙන තැනට පැමිණ දානය බලා කැඳ බොනවේලාවෙහි කැඳද කැවිලිකන වේලාවෙහි කැවිලිද ආහාර අනුභව කරණවේලාවෙහි ආහාරද දෙවෙව්වේය. මේ ක්‍රමයෙන්ම දවසක් පාසා දන්දෙනු ලැබෙයි. ඒ දන්දෙන ස්ථානයෙහි මෙනම් දෙය නැතැයි කියයුත්තක් නැත. මේ දානය මෙපමණකින්ම අවසාන නොවන්නේයයි රත්න ස්වර්ණ මැත්කරවා රන්තලියක් කරවා සුවාසූදහසක් රන්තලි පිණිස සුවාසූ දහසක් රජුන්ට හඳුන් යැව්වේය. රජහු එකාන්තයෙන් බොහෝ කලකින් අපගේ ආචාරීන් වහන්සේ විසින් අපි අනුග්‍රහ කරණු ලැබුම්හයි සිතා සියල්ල සම්පාදනයකොට යැව්වාහුය. දන්දෙන කල්හිම සත්හවුරුදු සත්මසක් ඉක්මුනාහුය. ඉක්බිතිව වෙලාමනම් බ්‍රාහමණතෙම රත්‍රන් බෙදවා දන්දෙමියි අදහස් කොට

නි අදාසි රූපියපූරානි චතුරාසීති රූපියපාතිසහස්සානි අදාසි
සුවණ්ණපූරානි චතුරාසීති කංසපාතිසහස්සානි අදාසි හිරඤ්ඤපූ
රානි චතුරාසීති හත්ථි සහස්සානි අදාසි සොවණ්ණාලඞ්කාරානි
සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි චතුරාසීති රථසහ
ස්සානි අදාසි සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්ම
පරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සො
වණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි චතුරාසීතිධෙනුසහස්සානි
අදාසි දුකූලසත්ථරානි කංසූපධාරණානි චතුරාසීති කඤ්ඤා සහ
ස්සානි අදාසි ආමුත්තමණි කුණ්ඩලායො චතුරාසීති පල්ලඞ්ක
සහස්සානි අදාසි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි

---

මහත් අවකාශ ඇති තැනක දන් සරසවා සුවාසූදහසක් රන්ත
ලිය ආදිකොට කෙළවර පටන් මතුකියන පිළිවෙලට දුන්නේය )
රූපිය පූරානි, රිදී තැටි රිදීසැලි රිදීමසු යනමෙයින් පිරූ; චතු
රාසීති සුවණ්ණපාති සහස්සානි, සුවාසූදහසක් රන්තලි; අදාසි
දුන්නේය;) සුවණ්ණපූරානි, රන්තැටි රන්සැලි රන්මසු යනමෙ
යින් පිරූ; චතුරාසීති රූපියපාති සහස්සානි, සුවාසූදහසක් රිදී
තලි; අදාසි, දුන්නේය. හිරඤ්ඤපූරානි, සත්රුවන්පිරූ; චතුරා
සීති කංසපාතිසහස්සානි, සුවාසූදහසක් ලෝතලි; අදාසි, දුන්නේ
ය; සොවණ්ණාලඞ්කාරානි, සවර්ණාලඞ්කාර ඇත්තාවූ; සොවණ්ණ
ධජානි; රන්දද ඇත්තාවූ; හෙමජාල පටිච්ඡන්නානි, රන්දැලින්
වසන ලද්දාවූ; චතුරාසීති හත්ථිසහස්සානි, සුවාසූදහසක් ඇතුන්;
අදාසි, දුන්නේය; සීහචම්මපරිවාරානි, සිංහචර්මයෙන් වලඳනාලද්
දාවූ; ව්‍යග්ඝචම්මපරිවාරානි, ව්‍යාඝ්‍රචර්මයෙන් වලඳනා ලද්දාවූ;
දීපිචම්ම පරිවාරානි, දිවිසමින් වලඳනාලද්දාවූ; පණ්ඩුකම්බල පරි
වාරානි, පාණ්ඩුකම්බලයෙන් වලඳනා ලද්දාවූ; සොවණ්ණාලඞ්කා
රානි, සවර්ණාලඞ්කාර ඇත්තාවූ; සොවණ්ණධජානි, රන්දද ඇත්
තාවූ; හෙමජාල පටිච්ඡන්නානි, රන්දැලින් වසනලද්දාවූ; චතුරා
සීති රථසහස්සානි, සුවාසූදහසක් රථයන්, අදාසි, දුන්නේය.
දුකූලසත්ථරානි, දුහුල්පිළි අතුළාවූ; හෙවත්) පෙරෙව්වාවූ; කං
සූපධාරණානි, කිරිදෝනා රිදීමුවා බඳුන් සහිතවූ; චතුරාසීති
ධෙනුසහස්සානි, සුවාසූදහසක්දෙනුන්; අදාසි, දුන්නේය. ආමු
ත්ත මණිකුණ්ඩලායො, මාණික්‍ය කුණ්ඩලාභරණ බහාලූවාවූ;
චතුරාසීති කඤ්ඤාසහස්සානි, සුවාසූදහසක් කන්‍යාවන්; අදාසි,
දුන්නේය ගොණකත්ථතානි, කොඳුපලස් අතුරණ ලද්දාවූ;
පටිකත්ථතානි, සුදුඑළුලොම් ඇතිරි අතුරණ ලද්දාවූ; පටලි

කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානි උභතො ලොහිතකූපධානානි චතුරාසීති වත්ථකොටි සහස්සානි අදාසි ඛොමසුඛුමානං කොසෙය්‍ය සුඛුමානං කම්බලසුඛුමානං කප්පාසික සුඛුමානං කො පන වාදො අන්නස්ස පානස්ස ඛජ්ජස්ස භොජ්ජස්ස ලෙය්‍යස්ස පෙය්‍යස්ස නජ්ජෝ මඤ්ඤෙ විස්සන්දන්ති.

සියා ඛො පන තෙ ගහපති එවමස්ස අඤ්ඤො නූන තෙන සමයෙන වෙලාමො බ්‍රාහ්මණො අහොසි යො තං දානං අදාසි මහාදානන්ති න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං අහං තෙන සමයෙන වෙලාමො බ්‍රාහ්මණො අහොසිං අහං තං දානං අදාසිං

---

කත්ථතානි, ඝනවූ මල් ඇති ඇතිරි අතුරණලද්දාවූ; කාදලිමිගපවර පච්චත්ථරණානි, කදලිමෘගයන්ගේ උතුම්වූ සම් අතුරණ ලද්දාවූ; සඋත්තරච්ඡදානි, මත්තෙහි බඳනාලද රතුවියන් ඇත්තාවූ උභතො, දෙපාර්ශ්වයෙහි; ලොහිතකූපධානානි, රක්තවර්ණ කොට්ට ඇත්තාවූ; චතුරාසීති පල්ලඞ්කසහස්සානි, සුවාසූදහසක් පර්‍ය්‍යඞ්කයන්; අදාසි, දුන්නේය ඛොමසුඛුමානං, සියුම්වූ කොමුපිළිද; කොසෙය්‍ය සුඛුමානං, සියුම්වූ කෞශෙය වස්ත්‍රයන්ද; කම්බල සුඛුමානං, සියුම්වූ කම්බිළිද; කප්පාසික සුඛුමානං, සියුම්වූ කපුපිළිද; (යනමොවුන් සම්බන්ධවූ) චතුරාසීති වත්ථකොටි සහස්සානි, සුවාසූදහසක් පිළිමිටි; අදාසි, දුන්නේය; අන්නස්ස, ආහාර ද්‍රව්‍යයාගේද; පානස්ස, පානද්‍රව්‍යයාගේද; ඛජ්ජස්ස, කෑයුතු දෑගේද; භොජ්ජස්ස, අනුභවකටයුතු ද්‍රව්‍යයාගේද; ලෙය්‍යස්ස, රසවිඳයුතු ද්‍රව්‍යයාගේද; පෙය්‍යස්ස, පියයුතු ද්‍රව්‍යයාගේද; කොපන වාදො, කියනුම කවරේද? නජ්ජෝ මඤ්ඤෙ විස්සන්දන්ති, නදීන්මෙන්, ගලායෙත්.

ගහපති, ගෘහපතිය; තෙන සමයෙන, එසමයෙහි; යො, යම් බ්‍රාහ්මණයෙක්; මහාදානං, මහාදානයක්වූ; තංදානං, ඒදානය; අදාසි, දුන්නේද; වෙලාමො බ්‍රාහ්මණො, ඒ වෙලාම බ්‍රාහ්මණතෙම; අඤ්ඤොනූන අහොසි, අනිකෙක්වූයේද්‍යෙහෝයි; තෙ, තට, එවං, මෙබඳු අවිනිශ්චිත විතර්කයෙක්; සියා ඛො පන අස්ස, වන්නේද වෙයි; ගහපති, ගෘහපතිය; එතං, මේ කාරණය; එවං, මෙසේ; නඛො පනදට්ඨබ්බං, නොදතයුතු; අහං, මම; තෙන සමයෙන, ඒ කාලයෙහි;වෙලාමො බ්‍රාහ්මණො අහොසිං, වෙලාමනම් බ්‍රාහ්මණවීමි; අහං, මම; මහාදානං, මහාදානයක්වූ; තං දානං, ඒ දානය; අදාසිං, දුනිමි. ගහපති, ගෘගපතිය; තස්මිං ඛො පන දානෙ, ඒ;

මහාදානං තස්මිං ඛො පන ගහපති දානෙ න කොචි දක්ඛිණෙය්‍යො අහොසි න තං කොචි දක්ඛිණං විසොධෙති.

යං ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො එකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං— යඤ්චගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො එකං සකදාගාමිං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං—යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යොච සතං දිට්ඨි

---

දානයෙහි වනාහි; කොචි දක්ඛිණෙය්‍යො, කිසි දක්ෂිණාර්හයෙක්; න අහොසි, නොවූයේය; කොචි; කිසිවෙක්; තං දක්ඛිණා, ඒ දක්ෂිණාව; න විසොධෙති, පිරිසිදු නොකෙරෙයි.

ගහපති, ගෘහපතිය; වෙලාමො බ්‍රාහ්මණො; වෙලාමනම් බ්‍රාහ්මණතෙම; මහාදානං, මහාදානයක්වූ; යං දානං, යම් දානයක්; අදාසි, දුන්නේද; යො, යමෙක්; එකං දිට්ඨිසම්පන්නං, එක් සෝවාන් පුද්ගලයකු; භොජෙය්‍ය,වලඳවන්නේද; ඉදං,මේ වැලඳවීම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්පලවේ.

ගහපති, ගෘහපතිය; වෙලාමො බ්‍රහ්මණො වෙලාමනම් බ්‍රාහ්මණතෙම; මහාදානං, මහාදානයක්වූ; යඤ්චදානං. යම් දානයක්; අදාසි, දුන්නේද; යොච, යමෙක්, එකං දිට්ඨිසම්පන්නං; එක් සෝවාන් පුද්ගලයෙකු; භොජෙය්‍ය, වළඳවන්නේද; යො, යමෙක් තෙමේ; දිට්ඨිසම්පන්නානං සතං, සෝවාන් පුද්ගලයන් සියයක්; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ.

ගහපති, ගෘහපතිය;—පෙ—යො, යමෙක් තෙම; එකං සකදාගාමිං, එක් සකෘදාගාමි පුද්ගලයකු; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහපපලතරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය—පෙ—යො, යමෙක් තෙම; සකදාගාමීනං සතං, සකෘදාගාමී පුද්ගලයන් සියයක්; භොජය්‍ය,

සම්පන්නානං භොජෙය්‍ය යො වෙකං සකදාගාමිං භොජෙය්‍ය යො සතං සකදාගාමිනං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵල තරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහමණො දානං අදාසි මහාදානං යො වෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො වෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමිනං භොජෙය්‍ය යො එකං අනාගාමිං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහමණො දානං අදාසි මහාදානං යො වෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො වෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමිනං භොජෙය්‍ය යො වෙකං අනාගාමිං භොජෙය්‍ය යො සතං අනාගාමීනං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං- යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහමණො දානං අදාසි මහාදානං යො වෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො වෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමිනං භොජෙය්‍ය යො වෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමිනං භොජෙය්‍ය යො එකං අරහන්තං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රහමණො දානං අදාසි මහාදානං යො වෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො වෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච

---

වළඳින්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵල තරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය,—පෙ— යො, යමෙක්තෙම; එකං අනාගාමිං, එක් අනාගාමී පුද්ගලයකු; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය;--පෙ— යො, යමෙක්තෙම; අනාගාමීනං සතං, අනාගාමී පුද්ගලයන් සියයක්; භොජෙය්‍ය, වළඳවන්නේද: ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵල තරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය;—පෙ—යො, යමෙක්තෙමේ; එකං අරහන්තං, එක් රහත් පුද්ගලයකු; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත් ඵලවේ.

ගහපති, ගෘහපතිය,—පෙ—යො, යමෙක්තෙම; අරහන්තානං

සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙතං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො සතං අරහන්තානං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො එකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං

---

සතං, රහත්පුද්ගලයන් සියයක්; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊට වඩා; මහප්ඵල තරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය; —පෙ— යො, යමෙක් තෙම; එකං පච්චෙකබුද්ධං, එක් පසේබුදුවරයකු; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵල තරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය; —පෙ—යො, යමෙක්තෙම; පච්චෙකබුද්ධානං සතං, පසේබුදුවරයන් සියයක්; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵල තරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති, ගෘහපතිය;

පච්චෙක බුද්ධං භොජෙය්‍ය යො තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙක බුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තානං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො ච බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය යො චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච

---

—පෙ— යො, යමෙක්තෙම; තථාගතං, තථාගතවූ; අරහන්තං අර්හත්වූ; සම්මා සම්බුද්ධං, සම්‍යක් සම්බුදුවරයකු; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ.

ගහපති, ගෘහපතිය; —පෙ— යො, යමෙක් තෙම; බුද්ධපමුඛං, බුදුන් ප්‍රධානකොට ඇති; සඞ්ඝං, සඞ්ඝයා; භොජෙය්‍ය, වළඳවන්නේද; ඉදං, මේ වැළඳවීම, තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ; ගහපති, ගෘහපතිය; —පෙ—යො, යමෙක්තෙම; චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස, සිවුදිගවූ සඞ්ඝයා උදෙසා; විහාරං, විහාරයක්; කාරාපෙය්‍ය, කරවන්නේද; ඉදං, මේ විහාරකරණය; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ.

සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො ච බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය යො පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො ච බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය යො ච පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය යො පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියෙය්‍ය පාණාතිපාතා වෙරමණිං අදින්නාදානා වෙරමණිං කාමෙසු මිච්ඡාචාරා වෙරමණිං මුසාවාදා වෙරමණිං සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණිං ඉදං තතො මහප්ඵලතරං.

---

ගහපති, ගෘහපතිය —පෙ— යො, යමෙක් තෙම; පසන්නචිත්තො, ප්‍රසන්න සිත් ඇත්තේ; බුද්ධඤ්ච, බුදුන්ද, ධම්මඤ්ච, ධර්මයද; සඞ්ඝඤ්ච, සඞ්ඝයාද; සරණං ගච්ඡෙය්‍ය, සරණයන්නේද; ඉදං මේ සරණයාම; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵල වේ. ගහපති, ගෘහපතිය; —පෙ— යො, යමෙක්තෙම; පසන්නචිත්තො, ප්‍රසන්නසිත්ඇත්තේ; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; වෙරමණිං, වැලකීමය; අදින්නාදානා, අදත්තාදානයෙන්; වෙරමණිං, වැලකීමය; කාමෙසුමිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්; වෙරමණිං, වැලකීමය; මුසාවාදා, බොරුකීමෙන්; වෙරමණිං, වැලකීමය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මත්වීමට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පානයකිරීමෙන්; වෙරමණිං, වැලකීමය; (යන) සික්ඛාපදානි, සික්ෂාපදයන්; සමාදියෙය්‍ය, සමාදන් වන්නේද;

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො ච බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය යො ච පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය යො ච පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියෙය්‍ය පාණාතිපාතා වෙරමණිං අදින්නාදානා වෙරමණිං කාමෙසුමිච්ඡාචාරා වෙරමණිං මුසාවාදා වෙරමණිං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණිං යො අන්තමසො ගද්දූහනමත්තම්පි මෙත්තචිත්තං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය යො චෙකං අනාගාමිං භොජෙය්‍ය යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය යො චෙකං අරහන්තං භොජෙය්‍ය යො ච සතං අරහන්තානං භොජෙය්‍ය යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය යො ච බුද්ධපමුඛං සඞ්ඝං භොජෙය්‍ය යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය යො ච පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය යො ච පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියෙය්‍ය පාණාතිපාතා වෙරමණිං අදින්නාදානා වෙරමණිං කාමෙසුමිච්ඡාචාරා වෙරමණිං මුසාවාදා වෙරමණිං

---

ඉදං, මේ ශික්ෂාපද සමාදානය; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ; ගහපති, ගෘහපතිය; —පෙ— යො, යමෙක්තෙම; අන්තමසො, යටත් පිරිසෙයින්; ගද්දූහනමත්තං අපි, සුවඳපිඩක් ආඝ්‍රාණය කරණ පමණකුදු කල්; මෙත්තචිත්තං, මෛත්‍රී සිත; භාවෙය්‍ය, වඩන්නේද; ඉදං, මේ මෛත්‍රී භාවනාව; තතො, ඊටවඩා; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලවේ. ගහපති,

සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණිං යො ච අන්තමසො ගද්දූහණමත්තම්පි මෙත්තචිත්තං භාවෙය්‍ය යො අච්ඡරාසඞ්ඝාත මත්තම්පි අනිච්චසඤ්ඤං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරන්ති.

## වෙලාම සුත්තං.

### “නව කඞ්ගුත්තර”

එවමෙම සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිල වත්ථුස්මිං නිග්‍රොධාරාමෙ–අථ ඛො මහාපජාපතී ගොතමී නවං දුස්සයුගං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භග වන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නා

---

ගෘහපතිය; —පෙ— යො, යමෙක් තෙම; අච්ඡරාසඞ්ඝාත මත්තං අපි, අසුරුසැණක් පමණකුදු; අනිච්චසඤ්ඤං, අනිත්‍ය සංඥව; භාවෙය්‍ය, වඩන්නේද; ඉදං, මේ අනිත්‍ය භාවනාව; තතො, ඊට වඩා; මහප්ඵලතරං ඉති, අතිශයින් මහත්ඵලවේයයි(වදාළසේක)

**වෙලාම සූත්‍ර පදාර්ථව්‍යාඛ්‍යානයයි.**

——::——

මෙ, මා විසින්; එවං, මේ ආකාරයෙන්; සුතං, අසන ලද්දේය; (භගවත්) මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේමැයි; එකං සම යං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍යයන්ගේ ජනපදයෙහිවූ; කපිලවත්ථුස්මිං, කිඹුල්වත්පුරයෙ හිවූ; නිග්‍රොධාරාමෙ, නිග්‍රොධාරාමයෙහි; විහරති, (සතර ඉරියව් වෙන් යුක්තව) වැඩවාසයකරවදාරණසේක; අථඛො, (භාග්‍යව තුන් වහන්සේ යම්කාලයෙක්හි කිඹුල්වත්පුරයෙහිවූ නිග්‍රොධා රාමයෙහි වැඩවාසයකර වදාළසේක්ද) එකල්හි; ගොතමී, ගෞ තම ගොත්‍රයෙහි උපන්නාවූ; මහාපජාපතී, මහාප්‍රජාපතී තො මෝ; නවං, අභිනවවූ, දුස්සයුගං, වස්ත්‍රයුග්මයක්; ආදාය, ගෙණ; භගවා, භාග්‍යවත්තෙම; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැ න්හි; උපසඞ්කමි, එළඹියාය; උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත් පසක; නිසීදි, උන්නාය; එකමන්තං, එකත්පසක; නිසින්නා ඛො, උන්නාවූම; ගොතමී, ගෞතම ගොත්‍රයෙහිවූ; මහාපජාපතී, මහාප්‍රජාපතීතොමෝ; භන්තෙ, ස්වාමීනි; මෙ, මාගේ; ඉදං, මේ

---

* ගද්‍රොහණ මත්තම්පි.

බො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච—ඉදං මෙ භන්තෙ නවං දුස්සයුගං භගවන්තං උද්දිස්ස සාමං කන්තං සාමං වායිතං තං මෙ භන්තෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායාති—එවං වුත්තෙ භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච සඞ්ඝෙ ගොතමී දෙහි සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චාති-- දුතියම්පි බො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච ඉදං මෙ භන්තෙ නවං දුස්සයුගං භගවන්තං උද්දිස්ස සාමං කන්තං සාමං වායිතං තං මෙ භන්තෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායාති--දුතියම්පි බො භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච සඞ්ඝෙ ගොතමී දෙහි සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චාති— තතියම්පි

---

නවං, අලුත්වූ; දුස්සයුගං, වස්ත්‍රයුග්මය; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; උද්දිස්ස, උදෙසා; සාමං, තමන්විසින්; කන්තං, කටින ලද්දේය; සාමං, තමන් විසින්; වායිතං, වියනලද්දේය; භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍යවතුන්වහන්ස; තං, ඒ වස්ත්‍රයුග්මය; මෙ, මට; අනුකම්පං උපාදාය, අනුකම්පා පිණිස; පතිගණ්හාතු ඉති, පිළිගන්නාසේක්වායි; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ වචනය; අවොච, සැළකළාය; එවං වුත්තෙ; (ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ මහාප්‍රජාපතී) මෙසේ සැළකලකල්හි; භගවා, භාග්‍යවත්තෙම; ගොතමී, ගෞතමිය; සඞ්ඝෙ, සඞ්ඝයාහට; දෙහි. දෙව; තෙ, තීවිසින්; සඞ්ඝෙ, සඞ්ඝයාහට; දින්නෙ, දුන්කල්හි; අහඤ්චෙව, මමද; පූජිතො භවිස්සාමි, පුදනලද්දේවන්නෙමි; සඞ්ඝොච ඉති, සඞ්ඝතෙමේද පුදනලද්දේවන්නේයයි; මහාපජාපතිං ගොතමිං, මහාප්‍රජාපතිගෞතමියට: එතං, මේ වචනය; අවෝච, වදාළසේක; දුතියම්පිබො, දෙවනුවද; මහාපජාපතීගොතමී; මහාප්‍රජාපතීගෞතමී තොමෝ; භන්තෙ, (මාරතිමිරතිකර දිවාකරවූ ) ස්වාමීනි; මෙ, මාගේ; ඉදං, මේ; නවං, අභිනවවූ; දුස්සයුගං, වස්ත්‍රයුග්මය; භගවන්තං, (ප්‍රවරවිශුද්ධප්‍රඥාගඞ්ගාප්‍රවාහවූ) භාග්‍යවතුන් වහන්සේ; උද්දිස්ස, උදෙසා; සාමං, තමන් විසින්; කන්තං, කටිනලද්දේය; සාමං, තමන් විසින්; වායිතං, වියනලද්දේය; භන්තෙ භගවා, (සකලලෝකානන්ද කරවූ) ස්වාමීනි භාග්‍යවත් බුදුරජානන්වහන්ස; තං, ඒ වස්ත්‍රයුග්මය; මෙ, මට; අනුකම්පං උපාදාය, අනුකම්පාපිණිස; පතිගණ්හාතු ඉති, පිළිගන්නාසේක්වායි; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ වචනය; අවොච, සැළකළාය; දුතියම්පි බො, දෙවනුවද; භගවා, භාග්‍යවත්තෙම; මහාපජාපතිං ගොතමිං, මහාප්‍රජාපතීගෞතමියට; එතං, මෙය; අවොච, වදාළසේක; ගොතමී, ගෞතමිය;

ඛො මහා පජාපතී ගොතමී භගවන්තං එතදවොච ඉදං මෙ භන්තෙ නවං දුස්සයුගං භගවන්තං උද්දිස්ස සාමං කන්තං සාමං වායිතං තං මෙ භන්තෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායාති— තතියම්පි ඛො භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච සඞ්ඝෙ ගොතමි දෙහි සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චාති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච පතිගණ්හාතු භගවා මහාපජාපතියා ගොතමියා නවං දුස්සයුගං බහූප

---

සඞ්ඝෙ, සඞ්ඝයාහට; දෙහි, දෙව; තෙ, තීවිසින්; සඞ්ඝෙ, සඞ්ඝයාහට; දින්නෙ, දුන්කල්හි; අහඤ්චෙව, මමද; පූජිතො භවිස්සාමි, පුදනලද්දේ වන්නෙමි; සඞ්ඝොච ඉති, සඞ්ඝතෙමේද පුදනලද්දේ වන්නේයයි; තතියම්පිඛො, තුන්වෙනුවද; මහා පජාපතී ගොතමී, මහාප්‍රජාපතී ගෞතමී තොමෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; අවොච, කීවාය; භන්තෙ, ( සකල ලොක නායකවූ ) ස්වාමීනි බුදුරජාණන්වහන්ස; මෙ, මාගේ, ඉදං, මේ; නවං, අලුත්වූ; දුස්සයුගං, වස්ත්‍රයුග්මය; භගවන්තං, (අමිතසුරණර මෞලිමණි කිරණ රඤ්ජිත පාද ඇති ) භාග්‍යවතුන්වහන්සේ; උද්දිස්ස, උදෙසා; සාමං, තමන් විසින්; කන්තං, කටනලද්දේය; සාමං, තමන් විසින්; වායිතං, වියන ලද්දේය. භන්තෙ භගවා, (නිඛිලජන ලොචනවූ) ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස; මෙ, මට; අනුකම්පං උපාදාය, අනුකම්පාපිණිස; පතිගණ්හාතු ඉති, පිළිගන්නාසේක්වායි; තතියම්පිඛො, තුන්වෙනුවද; භගවා, (විවිධ විබුධජන පද්මප්‍රබොධ කරවූ) භාග්‍යවතුන් වහන්සේ; මහාපජාපතිං ගොතමිං, මහා ප්‍රජාපතී ගෞතමියට; ගොතමි, ගෞතමිය; සඞ්ඝෙ, සඞ්ඝයාට; දෙහි, දෙව; තෙ, තී විසින්; සඞ්ඝෙ සඞ්ඝයාට; දින්නෙ, දුන්කල්හි; අහඤ්චෙව, මමද, පූජිතො භවිස්සාමි පුදනලද්දේ වන්නෙමි; සඞ්ඝොචාති සඞ්ඝතෙමේද; පුදනලද්දේ වන්නේයයි, එතං, මේ වචනය; අවොච, වදාළසේක.

එවං වුත්තෙ, (භාග්‍යවත් සර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින් මෙසේ වදාරණු ලැබූකල්හී; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ කාරණය; අවොච, සැළකලේය; භගවා භාග්‍යවතුන්වහන්ස; මහාපජාපතියා ගොතමියා, මහා ප්‍රජාපතී ගෞතමියගේ, නවං දුස්සයුගං, අභිනව වස්ත්‍රයුග්මය; පතිගණ්හාතු, පිළිගන්නාසේක්වා; භන්තෙ, ස්වාමීනි; මහාපජාපතීගොතමී, මහාප්‍රජාපතී

කාරා භන්තෙ මහාපජාපතී ගොතමී භගවතො මාතුච්ඡා ආපාදිකා පොසිකා ඛීරස්ස දායිකා භගවන්තං ජනෙත්තියා මාතුයා කාලකතාය ථඤ්ඤං පායෙසි.—භගවාපි භන්තෙ බහූපකාරො මහාපජාපතියා ගොතමියා භගවන්තං භන්තෙ ආගම්ම මහාපජාපතී ගොතමී බුද්ධං සරණං ගතා ධම්මං සරණං ගතා සඞ්ඝං සරණං ගතා– භගවන්තං භන්තෙ ආගම්ම මහාපජාපතීගොතමී පාණාතිපාතා පටිවිරතා අදින්නාදනා පටිවිරතා කාමෙසුමිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා– භගවන්තං භන්තෙ ආගම්ම මහාපජාපතී ගොතමී බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන සම

---

ගෞතමී තොමෝ; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; බහුපකාරා, බොහෝ උපකාර ඇත්තීය; මාතුච්ඡා, කුඩා මව්වන්නිය, ආපාදිකා, අත්පා වැඩීය; පොසිකා, පොෂණයකළාය; ඛීරස්ස දායිකා, කිරිදුන්නීය; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේගේ; ජනෙත්තියා මාතුයා, වැදූමව්; කාලකතාය, (ප්‍රසූතකළ සත් දිනෙන්) කළුරිය කළකල්හි; ථඤ්ඤං, කිරි; පායෙසි, පෙවීය; භන්තෙ, ස්වාමීනි, භගවාපි, භාග්‍යවත්තෙමේද; මහාපජාපතියා ගොතමියා, මහා ප්‍රජාපතී ගෞතමියට; බහූපකාරො, බොහෝ උපකාර ඇතිසේක; භන්තෙ, ස්වාමීනි; මහාපජාපතී ගොතමී, මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ; භගවන්තං ආගම්ම, භාග්‍යවතුන් වහන්සේ නිසා; බුද්ධං සරණං ගතා, බුදුන් සරණ ගියාය; ධම්මං සරණං ගතා, දහම්සරණ ගියාය; සඞ්ඝං සරණං ගතා, සඟ සරණ ගියාය; භන්තෙ, ස්වාමීනි; මහාපජාපතී ගොතමී; මහාප්‍රජාපතීගෞතමී තොමෝ; භගවන්තං ආගම්ම, භාග්‍යවතුන්වහන්සේ නිසා (හෙවත්) වෙත පැමිණ; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතා, වැළකුනීය; අදින්නාදනා, අදත්තාදානයෙන්; පටිවිරතා, වැළකුනීය; කාමෙසුමිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්; පටිවිරතා, වැළකුනීය; මුසාවාදා, මුසාවාදයෙන්; පටිවිරතා, වැළකුනීය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මත්වීමට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පානය කිරීමෙන්; පටිවිරතා, වැළකුනීය; භන්තෙ, ස්වාමීනි; මහාපජාපතීගොතමී, මහාප්‍රජාපතී ගෞතමී තොමෝ; භගවන්තං ආගම්ම, භාග්‍යවතුන් වහන්සේ නිසා; බුද්ධෙ, බුදුන් කෙරෙහි; අවෙච්චප්පසාදෙන, අචලශ්‍රද්ධාවෙන්; සමන්නාගතා, යුක්තවීය; ධම්මෙ, ධර්මය කෙරෙහි; අවෙච්චප්පසාදෙන, අචල ශ්‍රද්ධාවෙන් සමන්නාගතා, යුක්තවීය; සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; අවෙ

න්නාගතා සඞ්ඝ අවෙච්චප්පසාදෙන සමන්නාගතා අරියකන්තෙ හි සීලෙහි සමන්නාගතා– භගවන්තං භන්තෙ ආගම්ම මහාපජාපතී ගොතමී දුක්ඛෙ නික්කඞ්ඛා දුක්ඛසමුදයෙ නික්කඞ්ඛා දුක්ඛනිරොධෙ නික්කඞ්ඛා දුක්ඛනිරොධගාමිනියා පටිපදය නික්කඞ්ඛා භගවාපි භන්තෙ බහූපකාරො මහාපජාපතියා ගොතමියාති.

එව මෙතං ආනන්ද එවමෙතං ආනන්ද යංහානන්ද පුග්ගලො පුග්ගලං ආගම්ම බුද්ධං සරණං ගතො හොති ධම්මං සරණං ගතො හොති සඞ්ඝං සරණං ගතො හොති ඉමස්සානන්ද පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි යදිදං අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චය

---

ච්චප්පසාදෙන, අචලශ්‍රද්ධාවෙන්; සමන්නාගතා, යුක්තවීය; අරියකන්තෙහි, (සුවිශුද්ධබුද්ධ ගුණාලඞ්කෘතවූ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදි) ආය්‍යීයන්වහන්සේලා විසින් කැමැතිවන ලද්දාවූ; සීලෙහි, සුපරිශුද්ධශීලයෙන්; සමන්නාගතා යුක්තවීය; භන්තෙ, ස්වාමීනි; මහාපජාපතී ගොතමී, මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ; භගවන්තං, ආගම්ම, භාග්‍යවතුන් වහන්සේ නිසා; භෙවත් වෙත පැමිණ දුක්ඛෙ නික්කඞ්ඛා, දුක්ඛසත්‍යයෙහි සැකරහිතවීය; දුක්ඛසමුදයෙ නික්ඛඞ්ඛා දුක්ඛ සමුදයසත්‍යයෙහි සැකරහිතවීය;දුක්ඛනිරොධෙ නික්ඛඞ්ඛා දුක්ඛනිරොධ සත්‍යයෙහි සැකරහිතවීය; දුක්ඛනිරොධගාමිනියා පටිපදය, දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදායයි කියන ලද මාර්‍ගසත්‍යයෙහි; නික්කඞ්ඛා, සැකරහිතවීය; භන්තෙ, ස්වාමීනි; භගවාපි, භාග්‍යවත්තෙමේද; මහාපජාපතියා ගොතමියා, මහාප්‍රජාපතී ගෞතමියට; බහුපකාරො, බොහෝ උපකාර ඇත්තේක්යයි.

ආනන්ද, ආනන්දය; එතං, (කියනලද) මේකාරණය; එවං, එසේය ; ආනන්ද, ආනන්දය; එතං, (යථොක්ත) මේ කාරණය; එවං, එසේමවෙයි; ආනන්ද, ආනන්දය; පුග්ගලො, අන්තෙවාසික පුද්ගලයෙක් තෙම; යංහි පුග්ගලං ආගම්ම, යම්ආචාය්‍ය්‍යී පුද්ගලයකු නිසා හෝ වෙතට පැමිණ බුද්ධං සරණං, (අසරණජන සරණවූ) බුදුන්සරණ; ගතොහොති, ගියේවේද; ධම්මං සරණං, (භවත්‍රය වාසී නිඛිලජන අසමාණ ප්‍රතිෂ්ඨාධාරවූ ) දහම්සරණ; ගතොහොති, ගියේවේද; සඞ්ඝංසරණං, (විවිධගුණගණාභරණ විභූෂිතවූ ) සඟසරණ; ගතොහොති, ගියේවේද; ආනන්ද, ආනන්දය; ඉමස්ස පුග්ගලස්ස, මේ ආචාය්‍ය්‍යී පුද්ගලයාහට; ඉමිනා පුග්ගලෙන, මේ අන්තෙවාසික පුද්ගලයා විසින්; යං ඉදං, යම්; අභිවාදන, වැඳීමද; පච්චුට්ඨාන, හුනස්නෙන් නැඟී සිටීමද;

භෙසජ්ජ පරික්ඛාරානුප්පදානෙන-යංහානන්ද පුග්ගලො පුග්ගලං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසුමිච්ඡාචාරා පටිවිරතොහොති මුසාවාද පටි

---

අඤ්ජලිකම්ම, ඇඳිලිකිරීමද; සාමීචිකම්ම, සාමිචිකර්‍මයද; චීවර, සිවුරුද; පිණ්ඩපාත, පිණ්ඩපාතයද; සෙනාසන, සෙනසුන්ද; ගිලානපච්චය; ගිලනුන්ට ප්‍රත්‍යයවූ; භෙසජ්ජ පරික්ඛාර, බෙහෙත් පිරිකරද; (යනමේ ද්‍රව්‍යයන්) අනුප්පදානෙන, දීමෙන්; සුප්පතිකාරං, ප්‍රත්‍යුපකාර සුකරයයි (හෙවත්) පහසුයයි න වදාමි, නොකියමි; (යම් කිසි පුද්ගලයෙක් තමන්ගේ ආචාර්‍ය්‍යයා දුක නමස්කාර කිරීම අභිවාදන නම්වේ. යම් දිසාභාගයක හෝ ආචාර්‍ය්‍ය තෙම වෙසේනම් ඉරියව් කෙරෙමින් ඒ දිසාභාගයට අභිමුඛවූයේ නමස්කාරකොටයේද නමස්කාරකොට සිටීද නමස්කාරකොට හිඳීද නමස්කාරකොට නිද්‍රොපගමනය කෙරේද මෙසේ කිරීම අභිවාදනයයි දතයුතු. තමන්ගේ ආචාර්‍ය්‍යයා දුරදීම දුක හුනස්නෙන් නැගීසිට පෙර ගමන් කිරීම පච්චුට්ඨාන නම්වේ. තමන්ගේ ආචාර්‍ය්‍යයා දුක ඇඳිලිබැඳ උත්තමාඞ්ගයෙහි තබා නමස්කාරකෙරේද යම් දිසාභාගයෙක්හි හෝ වෙසේද ඒ දිශාභාගයට අභිමුඛවූයේ යැම් ඊම් හිඳීම් සිටීම් සැතපීම් යන චතුර්විධ ඊර්‍ය්‍යාපථයෙන් යුක්තවූයේ ඇඳිලිබැඳ නමස්කාරකෙරේද මෙසේ කිරීම අඤ්ජලිකර්‍ම නම්වේ. ආදර සත්කාර ගරුකාරාදියට සුදුසුවූ එකහවූ ක්‍රියාකිරීම සාමීචිකර්‍මනම්වේ. චීවරාදියෙහි ආචාර්‍ය්‍යයාහට සිවුරු දෙන්නේ යම් ඒ නොඅගනා සිවුරක් නොදී මාහැගිවූ සියයක් අගනාහෝ දහසක් අගනාහෝ සිවුරක් දෙයි. පිණ්ඩපාතාදියෙහිද එසේමවෙයි. බොහෝකොට කීමෙන් කවර ප්‍රයෝජනද? යමෙක්තෙම ආචාර්‍ය්‍යයාගේ ගුණ සලකා චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යයයි කියනලද සිව්පසයෙන් සකල චක්‍රවාලාභ්‍යන්තරය පුරා මහාමෙරු පර්‍වතය සමාණ උස්වූ ගොඩක්කොට දෙන්නේ නමුත් තම ආචාර්‍ය්‍යයාහට සුදුසු ප්‍රත්‍යුපකාරයක් කිරීම නොහැකිවේමය.) ආනන්ද, ආනන්දය; පුග්ගලො, අන්තෙවාසික පුද්ගලයෙක්තෙම; යංහි පුග්ගලං ආගම්ම, යම් ආචාර්‍ය්‍ය පුද්ගලයකු නිසා; (හෝ ලඟට එලඹ පාණාතිපාතා, (ජීවිතින්ද්‍රියුපච්ඡේදයයි කියනලද) ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොති, වැලැක්කේවේද; අදින්නාදානා, අන්සතු වස්තුව පැහැරගැන්මයයි කියනලද) අදත්තාදානයෙන්; පටිවිරතො හොති, වැලැක්වේද; කාමෙසු මිච්ඡාචාරා, (කාමයන්හි වරදවා හැසිරීමයයි කියනලද) කාමමිථ්‍යාචාරයෙන්; පටිවිරතො හොති, වැලැක්කේවේද; මුසාවාද, (බොරුකීමයයි කියනලද) මුසා

විරතො හොති සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති
ඉමස්සානන්ද පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පති කාරං
වදාමි යදිදං අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම
චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරා
නුප්පදානෙන–යංහානන්ද පුග්ගලො පුග්ගලං ආගම්ම බුද්ධෙ අවෙ
ච්චප්පසාදෙන සමන්නාගතො හොති ධම්මෙ අවෙච්චප්පසාදෙන
සමන්නාගතො හොති සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො,
හොති අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති ඉමස්සා
නන්ද පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පති කාරං වදාමි යදිදං
අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම චීවර පිණ්ඩ
පාත සෙනාසන ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරානුප්පදානෙන

---

වාදයෙන්; පටිවිරතො හොති, වැළැක්කේවේද: සුරාමෙරය මජ්ජ
පමාදට්ඨානා, මත්වීමට හා ප්‍රමාදයට කාරණවූ රාමෙර පානය
කිරීමෙන්; පටිවිරතො හොති, වැලක්කේවේද; ආනන්ද, ආනන්ද
ය; ඉමස්ස පුග්ගලස්ස, මේ ආචාර්‍ය්‍ය පුද්ගලයාහට; ඉමිනා පුග්ගලෙ
න, මේ අන්තෙවාසික පුද්ගලයා විසින්; යං ඉදං, යම්; අභිවාදන,
වැඳීමය; පච්චුට්ඨාන, දක හුනස්නෙන් නැගීසිටීමය; අඤ්ජලි
කම්ම, ඇඳිලිකිරීමය; සාමීචිකම්ම, සුදුසු ගෞරව කිරීමය; චීවර,
සිවුරුය; පිණ්ඩපාත, පිණ්ඩපාතය; සෙනාසන, සෙනසුන්ය;
ගිලානපච්චය, ගිලනුන්ට ප්‍රත්‍යයවූ; භෙසජ්ජ පරික්ඛාර, බෙ
හෙත් පිරිකරය යනමේ ද්‍රව්‍යයන්; අනුප්පදානෙන, දීමෙන්; සුප්ප
තිකාරං, ප්‍රත්‍යුපකාර සුකරයයි; න වදාමි, නොකියමි; ආනන්ද,
ආනන්දය; පුග්ගලො, අන්තෙවාසික පුද්ගලයෙක්; යංහි පුග්ගලං
ආගම්ම, යම් ආචාර්‍ය්‍ය පුද්ගලයකු නිසා; බුද්ධෙ, බුදුන් කෙරෙහි;
අවෙච්චප්පසාදෙන, අචල ශ්‍රද්ධාවෙන්; සමන්නාගතො හොති,
යුක්තවූයේවේද; ධම්මෙ, ධර්‍මය කෙරෙහි; අවෙච්චප්පසාදෙන,
අචල ශ්‍රද්ධාවෙන්; සමන්නාගතො හොති, යුක්තවූයේ වේද;
සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; අවෙච්චප්පසාදෙන, අචල ශ්‍රද්ධාවෙන්;
සමන්නාගතො හොති, යුක්තවූයේ වේද; අරියකන්තෙහි, ආර්‍ය්‍ය
යන් විසින් කැමැතිවන ලද්දවූ; සීලෙහි, ශීලයෙන්; සමන්නාග
තො හොති, යුක්තවූයේවේද; ආනන්ද, ආනන්දය; ඉමස්ස පුග්ග
ලස්ස, මේ ආචාර්‍ය්‍ය පුද්ගලයාහට; ඉමිනා පුග්ගලෙන, මේ අන්ත
වාසික පුද්ගලයා විසින්; යං ඉදං, යම්; අභිවාදන, වැඳීමය, පච්චු
ට්ඨාන, දක හුනස්නෙන් නැගී සිටීමය; අඤ්ජලිකම්ම, ඇඳිලි කිරී
මය; සාමීචිකම්ම, සුදුසු ගෞරව කිරීමය; චීවර, සිවුරුය; පිණ්ඩ
පාත, පිණ්ඩපාතය; සෙනාසන, සෙනසුන්ය; ගිලානපච්චය, ගිල
නුන්ට ප්‍රත්‍යයවූ; භෙසජ්ජ පරික්ඛාර, බෙහෙත් පිරිකරය යන

යංහානන්ද පුග්ගලො පුග්ගලං ආගම්ම දුක්ඛෙ නික්කඞ්ඛො හොති. දුක්ඛ සමුදයෙ නික්කඞ්ඛො හොති දුක්ඛනිරොධෙ නික්කඞ්ඛො හොති දුක්ඛනිරොධගාමිනියා පටිපදාය නික්කඞ්ඛො හොති ඉමස්සානන්ද පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි යදිදං අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානුප්පදානෙන

චුද්දස ඛො පනිමානන්ද පාටිපුග්ගලිකා දක්ඛිණා තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ දානං දෙති අයං පඨමා පාටිපුග්ගලිකා දක්ඛිණා පච්චෙක බුද්ධෙ දානං දෙති අයං දුතියා පාටිපුග්ගලිකා

---

මේ ද්‍රව්‍යයන්; අනුප්පදානෙන, දීමෙන්; සුප්පතිකාරං, ප්‍රත්‍යුපකාර සුකරයයි; න වදාමි, නොකියමි; ආනන්ද. ආනන්දය; පුග්ගලො, අන්තෙවාසික පුද්ගලයෙක්; යංහි පුග්ගලං ආගම්ම, යම් ආචාර්ය්‍ය පුද්ගලයකු නිසා ලඟට පැමිණ; දුක්ඛෙ, දුඃඛ සත්‍යයෙහි; නික්කඞ්ඛො හොති, සැකනැත්තේවේද; දුක්ඛ සමුදයෙ, දුඃඛසමුදය සත්‍යයෙහි; නික්කඞ්ඛොහොති, සැකනැත්තේ වේද; දුක්ඛනිරොධෙ, දුඃඛ නිරොධසත්‍යයෙහි; නික්කඞ්ඛො හොති, සැකනැත්තේවේද; දුක්ඛනිරොධ ගාමිනියා පටිපදාය, දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපද සත්‍යයෙහි; නික්කඞ්ඛො හොති, සැකනැත්තේ වේද; ආනන්ද, ආනන්දය; ඉමස්ස පුග්ගලස්ස; මේ ආචාර්ය්‍ය පුද්ගලයාහට; ඉමිනා පුග්ගලෙන, මේ අන්තෙවාසික පුද්ගලයා විසින්; යං ඉදං, යම්; අභිවාදන, වැඳීමය; පච්චුට්ඨාන, දැක හුනස්නෙන් නැගී සිටීමය; අඤ්ජලිකම්ම, ඇඳිලිකිරීමය; සාමීචිකම්ම, සුදුසු ගෞරවකිරීමය; චීවර, සිවුරුය; පිණ්ඩපාත, පිණ්ඩපාතය; සෙනාසන, සෙනසුන්ය; ගිලානපච්චය; ගිලනුන්ට ප්‍රත්‍යයවූ; භෙසජ්ජ පරික්ඛාර,බෙහෙත් පිරිකරය යනමේ ද්‍රව්‍යයන්; අනුප්පාදනෙන, දීමෙන්; සුප්පතිකාරං, ප්‍රත්‍යුපකාර සුකරයයි; නවදාමි. නොකියමි.

ආනන්ද, ආනන්දය; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාති පුද්ගලික දක්ෂිණාවෝ; ඉමානි ඛො පන චුද්දස; මොහු තුදුසක්වෙත්; තථාගතෙ, තථාගත නම්වූ; අරහන්තෙ, අර්හත්වූ; සම්මාසම්බුද්ධෙ, සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේට; දානං දෙති, දන්දේද; අයං, මේ දක්ෂිණාතොමෝ; පඨමා, (ගණන වශයෙන් හා ශ්‍රෙෂ්ඨ වශයෙනුත්) පළමුවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිනාව නම් වන්නීය; පච්චෙක බුද්ධෙ, පසේ බුදුවරයන් වහන්සේ නමක්හට; දානං දෙති, දන්දේද;

දක්ඛිණා තථාගත සාවකෙ අරහන්තෙ දානං දෙති අයං තතියා පාටිපුග්ගලිකා දක්ඛිණා අරහත්තඵල සච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති අයං චතුත්ථි පාටිපුග්ගලිකා දක්ඛිණා අනාගාමිස්ස දානං දෙති අයං පඤ්චමී පාටිපුග්ගලිකා දක්ඛිණා අනාගාමිඵල සච්ඡිකිරියා පටිපන්නෙ දානං දෙති අයං ඡට්ඨා පාටිපුග්ගලිකා දක්ඛිණා සකදාගාමිස්ස දානං දෙති අයං සත්තමී පාටිපුග්ගලිකා දක්ඛිණා සකදාගාමිඵල සච්ඡිකිරියාය; පටිපන්නෙ දානං දෙති අයං අට්ඨමී පාටිපුග්ගලිකා දක්ඛිණා සොතාපන්නෙ දානං දෙති අයං නවමී පාටිපුග්ගලිකා දක්ඛිණා සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති අයං දසමී පාටිපුග්ගලිකා දක්ඛිණා

---

අයං, මෝ තොමෝ; දුතියා, දෙවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; තථාගත සාවකෙ, තථාගත ශ්‍රාවකවූ; අරහන්තෙ, රහත්නමක්හට; දානං දෙති, දන් දේද; අයං, මෝතොමෝ; තතියා, තුන්වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාවනම් වන්නීය; අරහත්ත ඵල සච්ඡිකිරියාය, අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂකිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාවූ පුද්ගලයක් හට; දානං දෙති, දන්දේද; අයං, මෝතොමෝ; චතුත්ථී, සතරවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; අනාගාමිස්ස, අනාගාමි පුද්ගලයකු හට; දානං දෙති, දන්දේද; අයං. මෝතොමෝ; පඤ්චමී, පස්වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; අනාගාමිඵල සච්ඡිකිරියාය, අනාගාමිඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස; පටිපන්නෙ පිළිපන්නාවූ පුද්ගලයක්හට; දානං දෙති, දන්දේද; අයං, මෝතොමෝ; ඡට්ඨා, සවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලිකදක්ෂිණාවනම් වන්නීය; සකදාගාමිස්ස, සකෘදාගාමී පුද්ගලයකුහට; දානං දෙති, දන්දේද; අයං, මෝතොමෝ; සත්තමී, සත්වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාවනම් වන්නීය; සකදාගාමිඵල සච්ඡිකිරියාය, සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්‍ෂකිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාවූ පුද්ගලයක්හට; දානං දෙති, දන්දේද; අයං, මෝතොමෝ; අට්ඨමී, අටවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා ප්‍රාති පුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; සොතාපන්නෙ සෝවාන් පුද්ගලයකු හට; දානං දෙති, දන්දේද; අයං, මෝතොමෝ; නවමී, නවවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාවනම් වන්නීය; සොතාපත්ති ඵල සච්ඡිකිරියාය, සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාවූ (යටත් පිරිසයෙන් තිසරණගතයාද සෝ

බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දෙති අයං එකාදසමී පාටිපුග්ගලිකා දක්ඛිණා පුථුජ්ජන සීලවන්තෙ දානං දෙති අයං ද්වාදසමී පාටිපුග්ගලිකා දක්ඛිණා පුථුජ්ජන දුස්සීලෙ දානං දෙති අයං තෙරසමී පාටිපුග්ගලිකා දක්ඛිණා තිරච්ඡානගතෙ දානං දෙති අයං චුද්දසමී පාටිපුග්ගලිකා දක්ඛිණා.

තත්‍රානන්ද තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා

---

වාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නේවෙයි එහෙයින් ඒ) පුද්ගලයාහට; දානං දෙති, දන්දේද; අයං. මේතොමේ; දසමී, දශවෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාති පුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; කාමෙසු වීතරාගෙ, (වස්තුකාම ක්ලේශකාම යයි කියනලද)කාමයන්හිපහවූ ආලය ඇති; බාහිරකෙ, (කම්මවාදි කිරියවාදි ලෞකික පඤ්චාභිඥලාභිවූ) බුද්ධශාසනයෙන් පිටත් තාපසයකුහට; දානං දෙති, දන්දේද; අයං, මේතොමේ; එකාදසමී, එකොළොස්වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාති පුද්ගලික දක්ෂිණාවනම් වන්නීය; පුථුජ්ජන සීලවන්තෙ, (ස්වභාවශීලයෙන් යුක්තවූ මායා කපටකම් නැත්තාවූ අනුන්පෙළා සැපයිම් නැතිව දැහැමින් සෙමින් සීසෑම් වෙළඳාම් ආදියෙන් දිවිරැකීම කරන්නාවූ පුද්ගලයෝ පෘථග්ජන ශීලවන්තයෝවෙත්. එබඳුවූ) පෘථග්ජන ශීලවන්තයෙකුට; දානං දෙති, දන්දේද; අයං, මේ තොමේ; ද්වාදසමී,දෙළොස්වෙනිවූ;පාටිපුග්ගලිකා දක්ඛිණා,ප්‍රාති පුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; පුථුජ්ජන දුස්සීලෙ, (මසුම් මැරීම් ආදී අන්‍යයන්ට පීඩා කිරීමෙන් ජීවිකාව කරණ තැනැත්තෝ පෘථග්ජන දුශ්ශීලයෝ නම්වෙත් එබඳුවූ) පෘථග්ජන දුශ්ශීලයකුට; දානං දෙති, දන්දේද; අයං, මේ තොමේ; තෙරසමී, තෙළෙස්වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; තිරච්ඡානගතෙ, තිරිසන්ගත සත්වයෙකුට; දානං දෙති, දන්දේද; අයං, මේතොමේ; චුද්දසමී, දාහතර වෙනිවූ; පාටිපුග්ගලිකා දක්ඛිණා, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව නම් වන්නීය; (යම් පිඩක් පිඩුබාගයක් පමණ ආහාරයක් ගුණවශයෙන්ද උපකාර වශයෙන්ද පොෂණය කිරීම පිණිස දෙන ලද්දේද ඒ ආහාරය මෙහිදී ගණන් ගණු නොලැබේ. බලු හූරු කුකුල් කවුඩු ආදීන් අතුරෙහි යම්කිසි සත්වයකුට පරලොව වැඩ සඳහා බඩපිරෙන තරම් යම් ආහාරයක් දෙනලද්දේද ඒ දීම සඳහා වදාරණ ලද්දේයයි දතයුතු.)

ආනන්ද, ආනන්දය; තත්‍ර, ඒ තුදුස් පුද්ගලික දාන අතුරෙන්;

පාටිකඞ්ඛිතබ්බා පුථුජ්ජනදුස්සීලෙ දානං දත්වා සහස්සගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා පුථුජ්ජන සීලවන්තෙ දානං දත්වා සතසහස්සගුණා දක්ඛිණා, පාටිකඞ්ඛිතබ්බා බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දත්වා කොටි සතසහස්සගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නෙ දානං දත්වා අසඞ්ඛෙය්‍යා අප්පමෙය්‍යා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා කො පන වාදො සොතාපන්නෙ කො පන වාදො සකදාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්නෙ කොපනවාදො සකදාගාමිස්ස කො පන වාදො අනාගාමිඵල

---

තිරච්ඡානගතෙ, තිරිසන්ගත සත්ත්වයාහට; දානං දත්වා, දන්දී; සතගුණා, සියයක් අනුසස් ඇත්තාවූ; දක්ඛිණා, දානමය පුණ්‍යචෙතනා තොමෝ; පාටිකඞ්ඛිතබ්බා, කැමැතිවිය යුත්තීය; (ඒමෙසේ දතයුතු. ආයු සියයක්ද වර්ණ සියයක්ද සැප සියයක්ද බල සියයක්ද ප්‍රඥා සියයක්දැයි මෙසේ ආනිසංස පන්සියයක් දෙයි. ආත්මභාව සියයක් මුලුල්ලෙහි ආයුසය දෙයි වර්ණය දෙයි සැපය දෙයි බලයදෙයි ප්‍රඥාවදේයයි මේ උපායයෙන් අතිත් දක්ෂිණාවන් ගැණද ක්‍රමය දතයුත්තේය.) පුථුජ්ජන දුස්සීලෙ, පෘථග්ජන දුශ්ශීලයාහට; දානං දත්වා, දන්දී; සහස්සගුණා, දහසක් අනුසස් ඇත්තාවූ; දක්ඛිණා, දානමය පුණ්‍යචේතනා තොමෝ; පාටිකඞ්ඛිතබ්බා, කැමැතිවිය යුත්තීය; පුථුජ්ජන සීලවන්තෙ, පෘථග්ජන ශීලවන්තයාහට; දානංදත්වා, දන්දී; සතසහස්ස ගුණා, ලක්ෂයක් ආනිසංස ඇත්තාවූ; දක්ඛිණා, දානමය පුණ්‍ය චෙතනාතොමෝ; පාටිකඞ්ඛිතබ්බා, කැමැතිවියයුත්තීය; කාමෙසු, කාමයන්හි; වීත්රාගෙ, පහවූ ආසාඇති; බාහිරකෙ, (කම්මවාදී කිරියවාදී ලෞකික පඤ්චාභිඥලාභීවූ) බුද්ධශාසනයෙන් පිටත් තාපසයකුට; දානං දත්වා, දන්දී; කොටිසත සහස්ස ගුණා, කෙළලක්ෂයක් අනුසස් ඇත්තාවූ; දක්ඛිණා, දානමය පුණ්‍යචෙතනා තොමෝ; පාටිකඞ්ඛිතබ්බා, කැමැතීවිය යුත්තීය; සොතාපත්තිඵල සච්ඡිකිරියාය, සෝවාන්ඵලය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාහට; දානං දත්වා, දන්දී; අසඞ්ඛෙය්‍යා, සංඛ්‍යාරහිතවූ; අප්පමෙය්‍යා, ප්‍රමාණාතික්‍රාන්තවූ; දක්ඛිණා, දානමය පුණ්‍යචෙතනා තොමෝ; පාටිකඞ්ඛිතබ්බා, කැමැතිවිය යුත්තීය; සොතාපන්නෙ, සෝවාන් පුද්ගලයක්හට දුන් දානයෙහි ආනිශංස; කො පන වාදො, කියනුම කවරේද; සකදාගාමිඵල සච්ඡිකිරියාය, සකෘදගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාහට දුන් දානයෙහි ආනිශංස; කොපනවාදො, කියනුම කවරේද; සකදාගාමිස්ස, සකෘදාගාමී පුද්ගලයක්හට දුන් දානයෙහි ආනිසංස; කො පන වාදො, කියනුම කවරේද; අනාගාමි ඵල සච්ඡි

සච්ඡිකිරියාය පටිපන්නෙ කො පන වාදෙ අනාගාමිස්ස කො පන වාදෙ අරහත්තඵල සච්ඡිකිරියාය පටිපන්නෙ කො පන වාදෙ අරහන්තෙ කොපන වාදෙ පච්චෙකබුද්ධෙ කො පන වාදෙ තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ.

සත්ත ඛො පනිමානන්ද සඞ්ඝගතා දක්ඛිණා බුද්ධපමුඛෙ උභතො සඞ්ඝෙ දානං දෙති අයං පඨමා සඞ්ඝගතා දක්ඛිණා තථාගතෙ පරිනිබ්බුතෙ උභතො සඞ්ඝෙ දානං දෙති අයං දුතියා සඞ්ඝගතා දක්ඛිණා භික්ඛුසඞ්ඝෙ දානං දෙති අයං තතියා සඞ්ඝගතා දක්ඛිණා භික්ඛුණී සඞ්ඝෙ දානං දෙති අයං චතුත්ථී සඞ්ඝගතා දක්ඛිණා එත්තකා මෙ භික්ඛු භික්ඛුණියො ච සඞ්ඝතො උද්දිස්ස

---

කිරියාය; අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාහට දුන් දානයෙහි; ආනිසංස; කොපනවාදෙ, කියනුම කවරේද? අනාගාමිස්ස, අනාගාමි පුද්ගලයාහට දුන් දානයෙහි ආනිශංස; කොපනවාදෙ, කියනුම කවරේද? අරහත්තඵල සච්ඡිකිරියාය, අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස; පටිපන්නෙ, පිළිපන්නාහට දුන් දානයෙහි ආනිසංස; කොපනවාදෙ, කියනුම කවරේද; අරහන්තෙ, අර්හත් පුද්ගලයාහට දුන් දානයෙහි; ආනිසංස; කොපනවාදෙ, කියනුම කවරේද; පච්චෙක බුද්ධෙ, පසේ බුදුවරයකුහට දුන් දානයෙහි ආනිසංස; කොපනවාදෙ, කියනුම කවරේද; තථාගතෙ, තථාගතවූ; අරහන්තෙ, අර්හත්වූ; සම්මාසම්බුද්ධෙ, සම්‍යක්සම්බුද්ධ සර්වඥයන් වහන්සේට දුන් දානයෙහි ආනිසංස; කොපනවාදෙ, කියනුම කවරේද?

ආනන්ද, ආනන්දය; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාවෝ; ඉමා ඛොපන සත්ත, මොහු සත්දෙනෙක් වෙත්; (කවර සත්දෙනෙක්දයත්) බුද්ධපමුඛෙ, බුද්ධප්‍රමුඛවූ; උභතො සඞ්ඝෙ, භික්ෂු භික්ෂුණී යන උභතො සඞ්ඝයාහට; දානං දෙති, දන්දේද; අයං, මෝ තොමෝ; පඨමා, පළමුවෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය; තථාගතෙ, තථාගතයන්වහන්සේ; පරිනිබ්බුතෙ, පිරිණිවන් පෑ වදාළකල්හි; උභතො සඞ්ඝෙ, භික්ෂු භික්ෂුණීයන උභතො සඞ්ඝයාහට; දානං දෙති, දන්දේද; අයං, මෝ තොමෝ; දුතියා, දෙවෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය; භික්ඛුසඞ්ඝෙ, ගණනින් නොපිරිසිඳින ලද භික්ෂුසඞ්ඝයාහට; දානංදෙති, දන්දේද; අයං, මෝ තොමෝ; තතියා, තුන්වෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය; භික්ඛුණී සඞ්ඝෙ, භික්ෂුණී සඞ්ඝයාට, දානං දෙති, දන්

ථාති දානංදෙති අයං පඤ්චමී සඞ්ඝගතා දක්ඛිණා එත්තකා මෙ භික්ඛූ සඞ්ඝතො උද්දිස්සථාති දානං දෙති අයං ඡට්ඨා සඞ්ඝගතා දක්ඛිණා එත්තකා මෙ භික්ඛුණියො සඞ්ඝතො උද්දිස්සථාති දානං දෙති අයං සත්තමී සඞ්ඝගතා දක්ඛිණා.

---

දේද; අයං මෝතොමෝ; චතුත්ථී, සතරවෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගතදක්ෂිණාව වන්නීය; මෙ, මට; සඞ්ඝතො, භික්ෂු භික්ෂුණී සඞ්ඝයා කෙරෙන්; එත්තකා, මෙතෙක්; භික්ඛූච, භික්ෂූන්ද; භික්ඛුණියොච, භික්ෂුණීන්ද; උද්දිස්සථ ඉති, උදෙසුව මැණවැයි හෙවත් නියමකරණු මැණවැයි; දානංදෙති, දන්දේද; අයං, මෝතොමෝ; පඤ්චමී, පස්වෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය; මෙ, මට; එත්තකා, මෙතෙක්; භික්ඛූ, භික්ෂූන්; සඞ්ඝතො, සඞ්ඝයාකෙරෙන්; උද්දිස්සථ ඉති, උදෙසුව මැණවැයි; දානංදේති, දන්දේද; අයං, මෝතොමෝ; ඡට්ඨා, සවෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය; මෙ, මට; එත්තකා, මෙතෙක්; භික්ඛුණියො, භික්ෂුණීන්; සඞ්ඝතො, සඞ්ඝයාකෙරෙන්; උද්දිස්සථ ඉති, උදෙසුව මැණවැයි; දානංදේති, දන්දේද; අයං, මෝතොමෝ; සත්තමී, සත්වෙනිවූ; සඞ්ඝගතා දක්ඛිණා, සඞ්ඝගත දක්ෂිණාව වන්නීය.

“මින් පළමුවන සඞ්ඝගත දක්ෂිණාව මෙසේ දතයුත්තීය, දකුණුපසින් භික්ෂු සඞ්ඝයාද වම්පසින් භික්ෂුණී සඞ්ඝයාද වඩාහිඳුවා ශාස්තෘන්වහන්සේ මධ්‍යයෙහි වඩාහිඳුවා යම් සඞ්ඝගත දක්ෂිණාවක් දෙනුලැබේද. ඒ පළමුවන සඞ්ඝගත දක්ෂිණාවනම් වේ. මේ දක්ෂිණාවට සමපමණවූ දක්ෂිණාවක් නම් නැත්තීය එහෙයින් මිට පළමුවන සඞ්ඝගත දක්ෂිණාවයයි දක්වන ලදී, තථාගතයන්වහන්සේ පිරිනිවන් පෑ වදාළකල්හි උභතො සඞ්ඝයාගේ ඉදිරියෙහි ධාතු සහිත බුද්ධප්‍රතිමාවක් ආසනයෙහි තබා පාත්‍රය ආධාරයෙහි තබා දක්ෂිණොදකය ආදිකොට සියල්ල ශාස්තෘන් වහන්සේට පළමුකොට පිළිගන්වා උභතො සඞ්ඝයාට දිය යුතුවෙයි. මෙසේ ඇතිකල්හිද බුද්ධප්‍රමුඛවූ උභතො සඞ්ඝයාට දන්දෙනලද්දේනම්වෙයි, ඒ දානයෙහි යමක් ශාස්තෘන් වහන්සේට දෙනලද්දේවේද එය ශාස්තෘන් වහන්සේට උපස්ථාන කරණ භික්ෂුවකට හෝ වතින් සම්පූර්ණ භික්ෂුවක්හට හෝ භික්ෂුසඞ්ඝයාහට හෝ දියයුතුවෙයි ගිතෙල් හා තෙල්ගෙණ පහන් දැල්විය යුත්තාහුය වස්ත්‍රගෙණ කොඩිනැන්විය යුත්තාහුය.

භවිස්සන්ති ඛො පනානන්ද අනාගතමද්ධානං ගොත්‍රභුනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා තෙසු දුස්සීලෙසු සඞ්ඝං උද්දිස්ස දානං දස්සන්ති තදාපහං ආනන්ද සඞ්ඝගතං දක්ඛිණං අසඞ්ඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි නත්වෙවාහං ආනන්ද කෙනචි පරියායෙන සඞ්ඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දක්ඛිණං මහප්ඵලතරං වදාමි·

---

ආනන්ද, ආනන්දය; අනාගත මද්ධානං, අනාගත කාලයෙහි; දුස්සීලා, දුශ්ශීලවූ; පාපධම්මා, ලාමක ස්වභාව ඇත්තාවූ; ගොත්‍රභුනො, ගොත්‍ර වශයෙන් නම්පමණින් ශ්‍රමණවූ; කාසාවකණ්ඨා, කාසාව කණ්ඨකයෝ; භවිස්සන්ති ඛො පන, ඇතිවන්නාහුය, තෙසු දුස්සීලෙසු, ඒ දුශ්ශීලයන් කෙරෙහි; සඞ්ඝං උද්දිස්ස, සඞ්ඝයා උදෙසා; දානං දස්සන්ති, දන්දෙන්නාහුද; ආනන්ද, ආනන්දය; තදා අපි, එකල්හිදු; සඞ්ඝගතං දක්ඛිණං, ඒ සඞ්ඝගත දක්ෂිණාව; අහං, මම; අසඞ්ඛෙය්‍යං, සඞ්ඛ්‍යාතික්‍රාන්තවූ ආනිසංස ඇත්තක්ය සීද; අප්පමෙය්‍යං, ප්‍රමාණාතික්‍රාන්තවූ ආනිසංස ඇත්තක්යයිද; වදාමි, කියමි; ආනන්ද, ආනන්දය; කෙනචි පරියායෙන, කිසි ආකාරයකින්; සඞ්ඝගතාය දක්ඛිණාය, සඞ්ඝගත දක්ෂිණාවට වඩා; පාටිපුග්ගලිකං දක්ඛිණං, ප්‍රාතිපුද්ගලික දක්ෂිණාව; මහප්ඵලතරං, අතිශයින් මහත්ඵලයයි; අහං, මම; නතුඑව වදාමි, නොම කියමි.

මෙහි කාසාවකණ්ඨකයෝ නම් එක් කාසාය වස්ත්‍රකෑබැල්ලක් අතෙහි හෝ බොටුවෙහි හෝ බැඳ හැසිරෙන්නෝය. ඔව්හු ශ්‍රමණ පරම්පරාවෙන් ඇතිවූ හෙයින් ගොත්‍රභූනම්වෙත්, ඔවුන්ගේ ගෘහචාරයෙහි වනාහි අඹුදරුවෝද සීසෑම් වෙළඳම් ආදි ක්‍රියාවෝද ප්‍රකෘතියෙන්ම ඇතිවූවාහු වෙත්. ඒ දුශ්ශීලයන් කෙරෙහි දන්දෙන්නාහුද යනමෙහි දුශ්ශීලතෙම සඞ්ඝයායයි නොකිය යුතුවෙයි, සඞ්ඝතෙම වනාහි දුශ්ශීලනම් නොවෙයි. දුශ්ශීලයෝ වනාහි උපාසකයෝවෙත්, ඒ දුශ්ශීලයන්ට භික්ෂු සඞ්ඝයා උදෙසා සඞ්ඝයාට දෙමුයයි දන්දෙන්නාහුද එකල ඒ දක්ෂිණාව සඞ්ඛ්‍යාරහිතවූ ප්‍රමාණාතික්‍රාන්තවූ ආනිසංස ඇත්තීවෙයි, සඞ්ඝයා උදෙසා දෙන සඞ්ඝගත දක්ෂිණාව නම් සඞ්ඝයා කෙරෙහි සැලකිලි කරන්ට හැකිවන්නාහට වෙයි. සඞ්ඝයාකෙරෙහි වනාහි සැලකිලි කිරීම දුෂ්කරවෙයි, යමෙක් වනාහි සඞ්ඝගත දක්ෂිණාවක් දෙමියි දානවස්තුව පිළියෙළකොට විහාරයට ගොස් ස්වාමීන් වහන්ස සඞ්ඝයා කෙරෙන් උදෙසා එක් තෙරුන් වහන්සේ නමක් දුනමැණවැයි කියාද එකල්හි සඞ්ඝයාකෙරෙන් සාමණේරයන් වහන්සේ නමක්හෝ තෙරුන් වහන්සේ නමක් හෝ ලැබ

චතස්සො ඛො ඉමා ආනන්ද දක්ඛිණා විසුද්ධියො. කතමා චතස්සො අත්ථානන්ද දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහක

---

මා විසින් සාමණේරයන් වහන්සේ නමක් ලබන ලද්දේයයි චේතසකට පැමිණේද, මා විසින් තෙරුන්වහන්සේ නමක් හෝ ලබන ලද්දේයයි සොම්නස් උපදවාද, ඔහුගේ දක්ෂිණාතොමෝ සඞ්ඝගත නොවන්නීය, යමෙක් වනාහි සාමණේරාදීන් අතුරෙහි යම් කිසිවකු සඞ්ඝයාකෙරෙන් ලැබ නොවෙනස් සිත් ඇතිව සඞ්ඝයාට දෙමියි සඞ්ඝයා කෙරෙහි සැලකිලි කරන්ට හැකිවේද ඔහුගේ දක්ෂිණාතොමෝ සඞ්ඝගත නම් වන්නීය.

පරසමුද්‍රවාසීහු මෙසේ කෙරෙත්, එහි වනාහි එක් විහාර ස්වාමි කෙළඹියෙක් සඞ්ඝගත දක්ෂිණාවක් දෙන්නෙමියි සඞ්ඝයා කෙරෙන් උදෙසා එක් භික්ෂූන්වහන්සේ නමක් දුනමැනවැයි ඉල්වූයේය. ඒ කෙළඹිතෙම එක් දුශ්ශීල භික්ෂුවක් ලැබ වැඩහි දිනා තැන පිසදමා අස්නක් පණවා උඩුවියන් බැඳ සුවඳ දුම්හා මල්වලින් පුද පාසෝද තෙල් ගල්වා සඞ්ඝයන් වහන්සේට යටත්ව සැලකිලි කරන්නාක්මෙන් සඞ්ඝයාකෙරෙහි සැලකිල්ලෙන් දනවසතුව දුන්නේය, ඒ භික්ෂුතෙම පස්වරු කාලයෙහි වෙහෙර පිළිදුගුම් පිණිස උදැල්ලක් දෙව්යයි ගෘහවාරයට ආයේය. උපාසක තෙම තමා හුන්නේම උදැල්ල පයින් දමාගණුවයි දුන්නේය. මනුෂ්‍යයෝ ඔහට තොප විසින් උදෑසන මේ භික්ෂුහට කරණලද සැලකිලි කියනු නොහැක්කේය. දැන් උපචාර මාත්‍රයකුදු නැත්තේය මේ කුමක්දැයි කිවෝය, උපාසක තෙමේ ස්වාමිවරුනි ඒ සැලකිලි සඞ්ඝයාට මුත් මොහට නොවේයයි කීයේය. සඞ්ඝයා කෙරෙහි සැලකිලි කරන්ට හැක්කාහට රහතන් වහන්සේ නමකට දෙනලද දානයට වඩා උදෙසාගත් දුශ්ශීලයාට දෙනලද දානය අතිශයින් මහත්ඵලවේමය, සාසාවත ණස් සංඝයාට දෙනලද දක්ෂිණාව වනාහි මහත්ඵලභාවය කිරීමෙන් කවරෙක් පිරිසිඳුකෙරේදයත්? ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදීවූ අසූමහා ශ්‍රාවකයන්වහන්සේලා පිරිසිඳු කෙරෙත්යයි දතයුතු. එතකුදුවුවත් තෙරුන්වහන්සේලා පිරිණිවුනු බොහෝ කල් ඇත්තාහුය. උන්වහන්සේලා මුල් කොට අද දක්වා ජීවමාන ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා පිරිසිඳු කෙ...රත්මය.

ආනන්ද, ආනන්දය; දක්ඛිණා විසුද්ධියො, දක්ෂිණා විසුද්ධීහු, ඉමාඛො චතස්සො, මොහුසතරදෙනෙක් වෙත්; කතමා චතස්සො, කවරසතරදෙනෙක්දයත්; ආනන්ද, ආනන්දය; දායකතො,

නො අත්ථානන්ද දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො අත්ථානන්ද දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො අත්ථානන්ද දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච—

කථඤ්චානන්ද දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො ඉධානන්ද දායකො හොති සීලවා කල්‍යාණධම්මො පටිග්ගාහකා හොන්ති දුස්සීලා පාපධම්මා එවං ඛො ආනන්ද දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො—කථඤ්චානන්ද දක්ඛිණා

---

දායකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදු වන්නාවූ හෙවත් මහත්ඵල වන්නාවූ; නො පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවන්නාවූ හෙවත් මහත්ඵල නොවන්නාවූ; දක්ඛිණා, දක්ෂිණාවක්; අත්ථි, ඇත්තීය; ආනන්ද, ආනන්දය; පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවන්නාවූ හෙවත්මහත්ඵල වන්නාවූ; නො දායකතො, දායකයා කෙරෙන් පිරිසිදු නොවන්නාවූ හෙවත් මහත්ඵල නොවන්නාවූ; දක්ඛිණා, දක්ෂිණාවක්; අත්ථි, ඇත්තීය; ආනන්ද, ආනන්දය; දායකතො, දායකයා කෙරෙන්; නෙව විසුජ්ඣති, පිරිසිදු නොවන්නාවූ හෙවත් මහත්ඵල නොවන්නාවූ; නො පටිග්ගාහකතො ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු නොවන්නාවූ හෙවත් මහත්ඵල නොවන්නාවූ; දක්ඛිණා, දක්ෂිණාවක්; අත්ථි, ඇත්තීය; ආනන්ද, ආනන්දය; දායකතො චෙව, දායකයා කෙරෙනුත්; විසුජ්ඣති, පිරිසිදු වන්නාවූ හෙවත් මහත්ඵල වන්නාවූ; පටිග්ගාහකතො ච, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වන්නාවූ හෙවත් මහත්ඵල වන්නාවූ; දක්ඛිණා, දක්ෂිණාවක්; අත්ථි, ඇත්තීය.

ආනන්ද, ආනන්දය; කථඤ්ච, කෙසේ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දායකතො, දායකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවේද; නො පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ලොකයෙහි; දායකො, දායකතෙම; සීලවා හොති, සිල්වත්වේද; කල්‍යාණ ධම්මො, යහපත් ගුණධර්ම ඇත්තේවේද; පටිග්ගාහකා, ප්‍රතිග්‍රාහකයෝ; දුස්සීලා හොන්ති, දුශ්ශීලයෝ වෙද්ද; පාපධම්මා, ලාමකගුණ ඇත්තාහුවෙද්ද; ආනන්ද, ආනන්දය; එවං ඛො, මෙසේ වනාහි; දක්ඛිණා, දක්ෂිණා තොමෝ; දායකතො, දායකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවේ; නො පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවෙ—ආනන්ද, ආනන්දය; කථඤ්ච, කෙසේ; දක්ඛිණා. දක්ෂිණාතොමෝ; පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවේද; නො

පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො ඉධානන්ද දායකො හොති දුස්සීලො පාපධම්මො පටිග්ගාහකා හොන්ති සීලවන්තො කල්‍යාණධම්මා එවං ඛො ආනන්ද දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො–කථඤ්චානන්ද දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො ඉධානන්ද දායකො ච හොති දුස්සීලො පාපධම්මො පටිග්ගාහකා ච හොන්ති දුස්සීලා පාපධම්මා එවං ඛො ආනන්ද දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො– කථඤ්චානන්ද දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච ඉධානන්ද දායකොච හොති සීලවා කල්‍යාණ ධම්මො පටිග්ගාහකාච හොන්ති සීලවන්තො කල්‍යාණ

---

දායකතො, දායකයා කෙරෙන් පිරිසිදු නොවේද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ලොකයෙහි; දායකො, දායකතෙම; දුස්සීලො හොති, දුශ්ශීලවේද; පාපධම්මො, ලාමකගති ඇත්තේවේද; පටිග්ගාහකා, ප්‍රතිග්‍රාහකයෝ; සීලවන්තො හොන්ති, සිල්වත්වූවාහු වෙද්ද; කල්‍යාණ ධම්මා, යහපත් ගුණධම් ඇත්තාහු වෙද්ද; ආනන්ද, ආනන්දය; එවං ඛො, මෙසේ වනාහී; දක්ඛිණා, දක්ෂිණා තොමෝ, පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදු වේ; නො දායකතො, දායකයා කෙරෙන් පිරිසිදු නොවේ–ආනන්ද, ආනන්දය; කථඤ්ච, කෙසේ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දායකතො, දායකයා කෙරෙන්, නෙව විසුජ්ඣති, නොම පිරිසිදු වෙද නො පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ලොකයෙහි; දායකො, දායකතෙම; දුස්සීලො හොති, දුශ්ශීලවේද; පාපධම්මො, ලාමකගති ඇත්තේ වේද, පටිග්ගාහකාච, ප්‍රතිග්‍රාහකයොත්; දුස්සීලා හොන්ති, දුශ්ශීලයෝවෙද්ද; පාපධම්මා, ලාමකගති ඇත්තාහුවෙද්ද; ආනන්ද, ආනන්දය; එවං ඛො, මෙසේ වනාහි; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දායකතො, දායකයාකොරෙන්; නෙව විසුජ්ඣති, නොම පිරිසිදු වේ; නො පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයාකොරෙන්ද පිරිසිදු නොවේ— ආනන්ද, ආනන්දය; කථඤ්ච, කෙසේ, දක්ඛිණා, දක්ෂිණා තොමෝ; දායකතොචෙව, දායකයා කෙරෙනුත්; විසුජ්ඣති, පිරිසිදුවේද, පටිග්ගාහකතොච, ප්‍රතිග්‍රාහකයා කොරෙනුත් පිරිසිදුවේද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ලොකයෙහි; දායකොච, දායකතෙමේද; සීලවා හොති, සිල්වත් වේද; කල්‍යාණ ධම්මො, යහපත් ගුණධම් ඇත්තේවේද; පටිග්ගාහකාච, ප්‍රතිග්‍රාහකයෝත්; සීලවන්තො හොන්ති, සිල්වත් වූවාහුවෙද්ද; කල්‍යාණ ධම්මා, යහපත් ගුණධම් ඇත්තෝ වෙද්ද; ආනන්ද, ආනන්දය; එවං ඛො, මෙසේ

ධම්මං එවං ඛො ආනන්ද දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච ඉමා ඛො ආනන්ද චතස්සො දක්ඛිණා විසුද්ධියොති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

යො සීලවා දුස්සීලෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුප්පසන්න චිත්තො
අභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා දායකතො විසුජ්ඣති.

යො දුස්සීලො සීලවන්තෙසු දදාති දානං
අධම්මෙන ලද්ධං අප්පසන්න චිත්තො
අනභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති.

---

චතාහි, දක්ඛිණා, දක්ෂිණා තොමෝ; දායකතො චෙව, දායකයා කෙරෙන්ද; විසුජ්ඣති, පිරිසිදුවේ; පටිග්ගාහකතොච, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්ද පිරිසිදුවේ—ආනන්ද, ආනන්දය; ඉමා ඛො, මේ චතාහි; චතස්සො දක්ඛිණා විසුද්ධියොති. දක්ෂිණා විශුද්ධිහු සතර දෙන වෙත් යයි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මේ ධර්‍මදෙශනාව; අවොච, වදාළසේක; ඉදං, මෙය; වත්වා, වදාරා; සුගතො, සොභන ගති ඇත්තාවූ; සත්ථා, ශාස්තෘන්වහන්සේ; අථාපරං, නැවතද; එතං, මේ ගාථා බන්ධනය; අවොච, වදාළසේක.

සීලවා, සිල්වත්වූ; යො, යමෙක්තෙම; පසන්න චිත්තො, ප්‍රසන්න සිත්ඇත්තේ;ධම්මෙන ලද්ධං, දැහැමින් ලැබ; උළාරං, මහත්වූ; කම්මඵලං, කර්‍මඵලය; අභිසද්දහං, අදහමින්; දුස්සීලෙසු, දුශ්ශීලයන් කෙරෙහි; දානං දදාති, දන්දේද; සා දක්ඛිණා, ඒදක්ෂිණා තොමෝ; දායකතො, දායකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවේ.

දුස්සීලො, දුශ්ශීලවූ; යො,යමෙක්තෙම; අප්පසන්න චිත්තො, අප්‍රසන්න සිත් ඇත්තේ; අධම්මෙන ලද්ධං,අධර්‍මයෙන් ලැබ; උළාරං, මහත්වූ; කම්මඵලං, කර්‍මඵලය; අනභි සද්දහං, නො අදහමින්; සීලවන්තෙ, සිල්වතුන්කෙරෙහි; දානං දදාති, දන්දේද; සා දක්ඛිණා, ඒ දක්ෂිණා තොමෝ; පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවේ.

යො දුස්සීලො දුස්සීලෙසු දදාති දානං
අධම්මෙන ලද්ධං අප්පසන්න චිත්තො
අනභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා නෙවුභතො විසුජ්ඣති.*

යො සීලවා සීලවන්තෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුප්පසන්න චිත්තො
අභිසද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං විපුලඵලන්ති බ්‍රෑමි.

යො වීතරාගො වීතරාගෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුප්පසන්න චිත්තො
අභි සද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං ආමිසදානාන මග්ගන්ති.

දක්ඛිණා විභඞ්ගසුත්තං.

" උපරිපණ්ණාසකෙ. "

---

දුස්සීලො, දුස්සීලවූ; යො, යමෙක්තෙම; අප්පසන්න චිත්තො, අප්‍රසන්න සිත් ඇත්තේ; අධම්මෙන ලද්ධං අධර්‍මයෙන් ලැබ; උළාරං, මහත්වූ; කම්මඵලං, කර්‍මඵලය; අනභි සද්දහං, නො අදහමින්; දුස්සීලෙසු, දුශ්ශීලයන් කෙරෙහි; දානං දදාති, දන්දේද; සා දක්ඛිණා, ඒ දක්ෂිණා තොමෝ; උභතො, දෙපක්‍ෂයෙන්; නෙව විසුජ්ඣති, පිරිසිදු නොවේ.

සීලවා, සිල්වත්වූ; යො, යමෙක්තෙම; සුප්පසන්න චිත්තො, අතිශයින් ප්‍රසන්නවූ සිත් ඇත්තේ; ධම්මෙන ලද්ධං, දැහැමින් ලැබ; උළාරං, මහත්වූ; කම්මඵලං, කර්‍මඵලය; අභිසද්දහං, අදහමින්; සීලවන්තෙසු, සිල්වතුන් කෙරෙහි; දානං දදාති, දන්දේද; වෙ, එකාන්තයෙන්; තං දානං, ඒ දානය; විපුල ඵලන්ති, මහත් ඵලයයි; බ්‍රෑමි, කියමි.

වීතරාගො, පහවූ රාගඇති; යො, යම් පුද්ගලයෙක් තෙම; සුප්පසන්න චිත්තො, අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තේ; ධම්මෙන ලද්ධං, දැහැමින් ලැබ; උළාරං, මහත්වූ; කම්මඵලං, කර්‍මඵලය; අභිසද්දහං, අදහමින්; වීතරාගෙසු, වීතරාගී පුද්ගලයන් කෙරෙහි; දානං දදාති, දන්දේද; තං දානං, ඒ දානය; ආමිස දානානං, ආමිසදානයන්ට, අග්ගං ඉති, අග්‍රයයි කියමියි.

දක්ඛිණා විභඞ්ග සූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානය නිමි.

---

* න තං දානං විපුල ඵලන්ති බ්‍රෑමි.

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ— අථඛො සුභො මාණවො තොදෙය්‍ය පුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සමෙමාදි සමෙමාදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සුභො මාණවො තොදෙය්‍ය පුත්තො භගවන්තං එතදවොච.

---

මෙ, මා විසින්; එවං, මෙයාකාරයෙන්; සුතං, අසන ලද්දේය; (නොහොත්) මෙ, මාගේ; සුතං, ඇසීම: එවං, මෙසේය; එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි: විහරති වැඩවාසය කරණසේක—අථ ඛො ඉක්බිත්තෙන්; තොදෙය්‍ය පුත්තො, තොදෙය්‍යනම් බ්‍රාහමණයාගේ පුත්‍රවූ; සුභො මාණවො, සුභනම් මාණවකතෙම, භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ; භගවතා සද්ධිං, භාග්‍යවතුන්වහන්සේ හාසමග; සමෙමාදි, සතුටුවූයේය; සමෙමාදනීයං, සතුටුවිය යුතුවූ; සාරානීයං, සිහිකටයුතුවූ; කථං, කථාව; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, එකත්පසක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත් පසක; නිසින්නො ඛො, උන්නාවූම; තොදෙය්‍ය පුත්තො, තොදෙය්‍ය බ්‍රාහමණයාගේ පුත්‍රවූ; සුභො මාණවො, සුභනම් මාණවක තෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; අවොච, කීයේය.

(මෙහි නිදාන කථාව නම්, ශ්‍රීමත් ශ්‍රීඝන සුගත තථාගත වර ධර්මචක්‍රවර්ති ස්වාමිවූ අප සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ දෙව්රම්නම් මහවෙහෙර වැඩවසන කල්හි සැවැත්නුවරට නුදුරුවූ තුදිනම් ගමෙක් ඇත ඒ ගමට අධිපති බැවින් තොදෙය්‍යනම්වූ බමුණෙක් ඇත, ඒ බමුණුතෙමේද කොසොල් රජ්ජුරුවන්ට අග්‍රප්‍රාහිතවිය. ඒ තෙම සත් අසූකෙළක් ධනය ඇත්තේය. එතකුදුවුවත් තද මසුරුවිය

අඤ්ජනානං ඛයං දිස්වා උපචිකානඤ්ච ආචයං
මධූනඤ්ච සමාහාරං පණ්ඩිතො ඝරමාවසෙ.

ඇස ගාන අඳුන් මදමද ඇසගෑමට ගෑණීමෙන් ක්ෂයවනබවද වේයන්ගේ තුඹස් බැඳීමද මීමැස්සන්ගේ මී බැඳීමද යන මේ කරුණු වස්තු ක්ෂයවීමෙහි හා රැස්කිරීමෙහි උපදෙස්කොටගෙණ

පණ්ඩිත තෙමේ ගිහිගෙයි වසන්නේයයි තම පුතුන් කිසිවක්හට කිසිවක් නොදෙන පරිද්දෙන් හික්මවූයේය. සමීප විහාරයෙහි වැඩවසන්නාවූ සම්‍යක් සම්බුද්ධ රජාණන් වහන්සේට යටත් පිරිසෙයින් කෙණ්ඩස්සක් පමණ කැඳ වේවයි සැන්දක් පමණ බත් වේවයි නොදී ධනලොභයෙන් මියගොස් තිරිසන්ව උපදනා තැනැත්තේ අභිමානයෙන් එමගෙයි බලුව උපන්නේය ඔහුගේ පුත්‍රවූ සුභනම් මානවකතෙම ඒ බල්ලාදැක ඉතා ප්‍රියකෙරෙයි. තමන් අනුභව කරණ සැටියේ රසමසවුලෙන්යුත් ආහාරයම දෙවයි, කසාසඳුන් සුවඳ ආදියෙන් නහවා උතුම් යහනාවක හොවවයි.

එසමයෙහි බුදුරජාණන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදාරණසේක් ඒ බල්ලාදැක තොදෙය්‍යනම් බ්‍රාහ්මණතෙම ධනලොභයෙන් මිය තමාගේගෙයි බලුව උපන්නේය. අද මා එතනට ගියකල්හි මා දැක බුරයි ඕහට මම එක බසක් කියමි එකල බලුතෙම ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ මා හැඳිනිසේකැයි ගොස් ලිප්දොර නිදන්නේය. ඒ කාරණයෙන් සුභනම් මානවකයාගේ මා හා සමග එක්කථාවක් ඇතිවන්නේය. හෙතෙම බණඅසා සරණයෙහි පිහිටන්නේය බලුතෙම මියගොස් නරකයෙහි උපදින්නේයයි සුභනම් මානවකයාගේ මේ සරණයෙහි පිහිටනබැව් දැනවදාරා භාග්‍යවත්වූ බුදුරජතෙම එදවස් කලමනා සියලු දිනචර්‍ය්‍යාව කොටනිමවා එකලාව තුදිනම්ගමට වැද මානවකයා කිසිකාර්‍ය්‍යයක් පිණිස ගමින් බැහැර ගියවේලේ ඔහුගේ ගෙදොරට වැඩිසේක. සුනඛතෙමේද සම්‍යක් සම්බුද්ධ රජාණන් වහන්සේ දැක බුරබුරා සමීපයට ගියේය. භාග්‍යවත්තෙම ඕහට වදාරණසේක්, තොදෙය්‍යය, තෝ පූර්වජන්මයෙහිත් මට හොහෝයනාදීන් පරිභවකොට බලුව උපන්නේය. දැනුදු මට බුරා අවීචි මහානරකයෙහි වැටෙන්නේවේදැයි වදාළසේක. බලුතෙම ඒ අසා ශ්‍රමණ භවත් ගෞතම් තෙමේ මා හඳුනායයි කලකිරීමට පැමිණ ගෙල නමාගෙණගොස් උදුන අතුරේ හළුපිට හොත්තේය. මනුෂ්‍යයෝ උෟ නගා පියා යහනේ හොවවන්ට අසමර්ථවූහ, සුභනම් මානවකයා අවුත් මේ බල්ලා බිම ලූවෝ කව්රුදැයි විචාළේය, මනුෂ්‍යයෝ ඕහට එපවත් කීහ. මානවකයා එබස් අසා මපියාණන් වහන්සේ බ්‍රහ්මලොකයෙහි උපන්නේය තොදෙය්‍යනම් බල්ලෙක් ඇත්තේ නොවෙයි. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මපියාණන් බල්ලකු කෙළේය මේ ශ්‍රමණ භවත් ගෞතමතෙමේ මුඛාරූඪ දෙයක්ම කියන්නෙකැයි කිපී සර්වඥයන් වහන්සේට මුසාවාදයෙන් නිග්‍රහකරණු කැමැතිව විහාරයට ගොස් එපවත් විචාළේය. බුදුරජාණන් වහන්සේ ඕහට තමන් වහන්සේ වදාළ

කො නු බො භො ගොතම හෙතු කො පච්චයො යෙන මනුස්සානං යෙව සතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතා දිස්සන්තීති භො ගොතම මනුස්සා අප්පායුකා දිස්සන්ති දීඝායුකා දිස්ස

---

ලෙසම වදරා තිබොරු පරිදි දක්වනු සඳහා මානවකයා තාගේ පියා තට නොකී ධනය ඇද්දැයි විචාළසේක, ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්ස මපියාණෝ මට නොකී ලක්ෂයක් අගනා රන් මාලාවක්ද ලක්ෂයක් අගනා රන්මිරිවැඩිසහලක්ද ලක්ෂයක් අගනා රන්තලියක්ද ලක්ෂයක් කහවනුද ඇතැයි කීයේය. තොප ගොස් ඒ බල්ලාට කිරිබත් කවා යහනේ හොවා මඳ නින්දක් නිදාගත්කල්හි ඒ නොකීවස්තු විචාරව ඒ බලූ පූර්වජාතියෙහි නොකී ඒ සියලුවස්තුව කියන්නේය. එයින් ඔහු තාගේ පියාබව දැනගනුවයි වදාළසේක, මානවකයා ඉදින් ශ්‍රමණභවත් ගෞතමයාණන්වහන්සේගේ බස් සැබෑවීනම් වස්තු ලබමි. බොරුවීනම් මුසාවාදයෙන් නිග්‍රහකෙරෙමියි දෙකරුණෙන්ම සතුටුව තමාගේ ගෙටගොස් මනාකොට කිරිබත් පිසවා බල්ලාට අනුභව කරවා යහනේ හොවා මඳ නින්දක් නිදන්ටවන් කල්හි පළමු තමාට නොකී ඒ වස්තුවිචාළේය. බලුතෙම තමන් හැඳිනගත්බව දැන හුං හුං යන අනුකරණයෙන් ශබ්දපවත්වා ධනය තිබුනුතැනට ගොස් පසින් බිම කැණ සලකුණු කෙළේය, ඒ ලකුණෙන් මානවකයා බිම කැණ ධනය ගොඩනගාගෙණ මෙබඳුවූ බවයෙන් වැසුනාවූ අති සූක්ෂමවූ ජාත්‍යන්තරයෙහි කාරණයපවා ශ්‍රමණභවත් ගෞතමයාණන් වහන්සේට ප්‍රකාශව දැනෙන්නේය. එසේහෙයින් උන්වහන්සේ ඒකාන්තයෙන් සර්වඥසේකැයි බුදුරජාණන්වහන්සේ කෙරෙහි පැහැද දහම්පඬුරක් ගෙණගොස් ශ්‍රමණභවත් ගෞතමයාණන්වහන්සේගෙන් ප්‍රශ්න විචාරන්ට වුවමැණවැයි දෙවෙනිවර යනගමනේ ප්‍රශ්න තුදුසක් සනිටුහන්කොටගෙණ සර්වඥයන්වහන්සේ කරා එළඹ කථාකොට එකත්පස්ව හිඳ "**කො නු බො භො ගොතම හෙතු කො පච්චයො**" යනාදි පාඨයෙන් ප්‍රශ්න විචාළේය.

භොගොතම, භවත් ගෞතමයාණන් වහන්ස; යෙන, යම් හෙතුවකින්; මනුස්සානං යෙව සතං, මනුෂ්‍යජාති ඇත්තාවූම; මනුස්සභූතානං, මනුෂ්‍යවූවන්ගේ; හීනප්පණීතතා, ලාමක උත්කෘෂ්ට භාවයෝ; දිස්සන්ති, දක්නා ලැබෙත්; කොනු බො හෙතු, ඊට හෙතුකවරේද; කො පච්චයො, ඊට ප්‍රත්‍යය කවරේද; හි, ඒ එසේමැයි; භොගොතම භවත් ගෞතමයාණන් වහන්ස; මනුස්සා, මනුෂ්‍යයෝ; අප්පායුකා, අල්පායුෂ්කාවූවාහු; දිස්සන්ති, දක්නාලැබෙත්; දීඝායුකා, දීර්ඝායුෂ්කාවූවාහු; දිස්සන්ති, දක්නාලැ

න්ති බව්හාබාධා දිස්සන්ති අප්පාබාධා දිස්සන්ති දුබ්බණ්ණා දිස්සන්ති වණ්ණවන්තො දිස්සන්ති අප්පෙසක්ඛා දිස්සන්ති මහෙසක්ඛා දිස්සන්ති අප්පභොගා දිස්සන්ති මහාභොගා දිස්සන්ති නීචාකුලීනා දිස්සන්ති උච්චාකුලීනා දිස්සන්ති දුප්පඤ්ඤා දිස්සන්ති පඤ්ඤවන්තො කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙන මනුස්සානං යෙව සතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතාති-කම්මස්සකා මාණව සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධු කම්මපටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.

න ඛො අහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසි

---

බෙත්; බව්හාබාධා, බොහෝ රොගඇත්තාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; අප්පාබාධා, මඳවූ රොග ඇත්තාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; දුබ්බණ්ණා, දුර්වර්ණවූවාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; වණ්ණවන්තො, වර්ණවත්වූවාහු; දිස්සන්ති; දක්නා ලැබෙත්; අප්පෙසක්ඛා, අල්පෙශාක්‍යවූවාහු (හෙවත්) මඳපිරිවර ඇත්තාහු; දිස්සන්ති, දක්නාලැබෙත්; මහෙසක්ඛා, මහෙශාක්‍යවූවාහු (හෙවත්) මහත් පිරිවර ඇත්තාහු; දිස්සන්ති;දක්නා ලැබෙත්; අප්පභොගා, ස්වල්ප උපභොග පරිභොග වස්තු ඇත්තාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; මහාභොගා, බොහෝ උපභොග පරිභොගවස්තු ඇත්තාහු; දිස්සන්ති, දක්නාලැබෙත්; නීචාකුලීනා, නීචජාති ඇත්තාහු දිස්සන්ති, දක්නාලැබෙත්; උච්චාකුලීනා උසස් ජාති ඇත්තාහු; දිස්සන්ති, දක්නාලැබෙත්; දුප්පඤ්ඤා, නුවණ නැත්තාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; පඤ්ඤවන්තො, නුවණැත්තාහු; දිස්සන්ති, දක්නාලැබෙත්; භොගොතම, භවත් ගෞතමයාණන් වහන්ස; යෙන, යම්හෙතුවකින්; මනුස්සානං යෙවසතං, මනුෂ්‍ය ජාති ඇත්තාවූම; මනුස්සභූතානං, මනුෂ්‍යවූවන්ගේ; හීනප්පණීතතා; ලාමක උත්කෘෂ්ටභාවයෝ; දිස්සන්ති, දක්නාලැබෙත්; කොනුඛො හෙතු, ඊටහෙතුකවරේද; කො පච්චයො ඉති, ඊට ප්‍රත්‍යය කවරේදැයි; එතං, මෙය; අවොච, කීයේය; (හෙවත් විචාළේය)—මාණව මාණවකය; සත්තා, සත්වයෝතුමූ; කම්මස්සකා, කර්මය ස්වකීයකොට ඇත්තාහුය; කම්මදායාදා,කර්මය දායාදකොට ඇත්තාහුය; කම්මයොනී, කර්මය උප්පත්ති කාරණාකොට ඇත්තාහුය; කම්මබන්ධු, කර්මය නෑකොට ඇත්තාහුය; කම්මපටිසරණා, කර්මය පිළිසරණකොට ඇත්තාහුය; කම්මං, කර්මයතෙම; යං ඉදං හීනප්පණීතතාය, මේ හීන ප්‍රණීත භාවයට; විභජති ඉති, බෙදායයි; (වදාළසේක.)

අහං, මම; භොතො ගොතමස්ස, භවත් ගෞතමයාණන් වහන්සේ විසින්; සඞ්ඛිත්තෙන, සංක්ෂෙපයෙන්; භාසිතස්ස, වදා

තස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං අජානාමි සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා අහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති. තෙනහි මානව සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති එවං භොති ඛො සුභො මානවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච–

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදි

---

රණලදුවූ; විත්ථාරෙන, විස්තරයෙන්; අත්ථං, අර්ථය; අවිභත්තස්ස, විභාග නොකරණ ලද්දාවූ; ඉමස්ස, මේ භාෂිතයාගේ; අත්ථං, අර්ථය; විත්ථාරෙන, විස්තරයෙන්; න ඛො ආජානාමි, නොදනිමි; අහං, මම; භොතො ගොතමස්ස, භවත් ගෞතමයාණන් වහන්සේ විසින්; සංඛිත්තෙන සංක්ෂෙපයෙන්; භාසිතස්ස, වදාරණ ලද්දාවූ; විත්ථාරෙන, විස්තරයෙන්; අත්ථං, අර්ථය; අවිභත්තස්ස, විභාග නොකරණ ලද්දාවූ; ඉමස්ස, මේ භාෂිතයාගේ; අත්ථං, අර්ථය; විත්ථාරෙන, විස්තරයෙන්; යථා ආජානෙය්‍යං, යම්සේ දැනගන්නෙම්ද තථා, එපරිද්දෙන්; භවං ගොතමො, භවත් ගෞතමතෙමේ; මෙ, මට; ධම්මං, ධර්මය; දෙසිතු, දෙශනාකරණසේක්වී නම්; සාධු ඉති, මැනවැයි කීයේය; මානව, මානවකය; තෙනහි, එසේවී නම්; සුණාහි, අසව; සාධුකං, මනාකොට; මනසි කරොහි; මෙනෙහි කරව; භාසිස්සාමි ඉති, කියන්නෙමියි; (වදාළසේක) එවං භොති ඛො, එසේය ස්වාමීන්වහන්ස කියා; තොදෙය්‍ය පුත්තො, තොදෙය්‍යනම් බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභො මානවො, සුභනම් මානවකතෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පති අස්සොසි, පිළිවදන් ඇස්වූයේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මේ සූත්‍රය; අවොච, වදාළසේක

මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චා ඉත්ථීවා, සමහර ස්ත්‍රියෙක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; පාණාතිපාතීහොති, ප්‍රාණඝාතකරණ සුළුවේද; ලුද්දො, රෞද්‍රවේද; ලොහිතපාණී, ලේවැකුණු අත්ඇත්තේවේද; හතපහතෙ නිවිට්ඨො, සත්වඝාතනයෙහි යෙදුනේවේද; පාණභූතෙසු, ප්‍රාණීන් කෙරෙහි; අදයාපන්නො, නිෂ්කරුණාවට පැමිණියේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණ කරණලදුවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලදුවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්මයහෙතුකොට ගෙණ; කායස්ස

න්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති අප්පායුකො හොති— අප්පායුක සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති සො

---

භෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන්පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවශව පතිත වන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; කායස්ස භෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවශව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; නොචෙ උපපජ්ජති, ඉදින් නූපදනේවී නම්; සචෙ, ඉදින්; මනුස්සත්තං, මිනිස්බවට; ආගච්ඡති, ඒද; යත්ථයත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; අප්පායුකොහොති, ස්වල්ප ආයුෂ ඇතිවේ; මානව, මානවකය; යං ඉදං, යම් මේ; පාණාතිපාතී හොති, ප්‍රාණඝාත කරණ සුළුවේද; ලුද්දො, රෞද්‍රවේද; ලොහිතපාණී, ලේ වැකුණු අත්ඇත්තේවේද; හතපහතෙ නිවිට්ඨො, සත්වඝාතනයෙහි යෙදුනේවේද; පාණභූතෙසු, ප්‍රාණීන්කෙරෙහි; අදයාපන්නො, නිෂ්කරුණාවට පැමිණියේවේද; (යන) එසා පටිපදා, මේ ප්‍රතිපද තොමෝ; අප්පායුකසංවත්තනිකා, අල්පායුෂකභාවය පිණිස පවත්නීය

මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසොවා, සමහර පුරුෂයෙක් හෝ; පාණාතිපාතං පහාය, ප්‍රාණඝාතයහැර; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොයි, වැළැක්කේවේද; නිහිතදණ්ඩො, බහාතබන ලද දඬුඇත්තේවේද; නිහිතසත්ථො, තබන ලද ශස්ත්‍ර ඇත්තේවේද; ලජ්ජී, (ප්‍රාණඝාතයෙහි) ලජ්ජාඇත්තේවේද; දයාපන්නො, දයාඇත්තේවේද; සබ්බපාණභූතහිතානුකම්පී, සියලු සත්වයන් කෙරෙහි හිත අනුකම්පා ඇතිව; විහරති, වාසය කෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණ කරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වනලද්දාවූ;

තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති දීඝායුකො හොති- දීඝායුක සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිත දණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං විහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං

---

තෙනකම්මෙන, ඒ කුශලකර්මය හේතුකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභණගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි; කායස්සභෙදා ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභන ගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොචෙ උපපජ්ජති, ඉදින් නූපදනේද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යත්වයට; ආගච්ඡති, ඒද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; දීඝායුකො හොති. දීර්ඝායුෂ්ක වේ; මානව, මානවකය; යං ඉදං, යම් මේ, පාණාතිපාතං, ප්‍රාණඝාතය; පහාය, හැර; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොති; වැළැක්කෙක්වේද; නිහිතදණ්ඩො, තබනලද දඬුඇත්තේවේද; නිහිතසත්ථො, තබනලද ශස්ත්‍ර ඇත්තේවේද; ලජ්ජී, (ප්‍රාණඝාත කිරීමෙහි) ලජ්ජා ඇත්තේවේද; දයාපන්නො, දයා ඇත්තේවේද; සබ්බපාණ භූතහිතානු කම්පී, සකල ප්‍රාණීන්කෙරෙහි හිතචිත්තයෙන් අනුකම්පා ඇත්තේ; විහරති, වාසය කෙරේද යන; එසා පටිපදා, මේ ප්‍රතිපදතොමෝ; දීඝායුකසංවත්තනිකා, දීර්ඝායුෂ්කභාවය පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධ පන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියෙක්හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, අතින් හෝ; ලෙඩ්ඩුනාවා, කැටයකින් හෝ; දණ්ඩෙන වා දණ්ඩකින් හෝ; සත්ථෙන වා, ශස්ත්‍රයකින් හෝ; විහෙඨක ජාතිකො හොති, වෙහෙසන සවභාව ඇත්තේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරනලද්දවූ; එවං සමාදින්නෙන, මෙසේ දන්වනලද්දවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්මය හෙතු

නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති බව්හාබාධො හොති බව්හාබාධ සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සත්තානං විහෙඨක ජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

ඉධ පන මානව එකච්චො ඉත්ථි වා පුරිසො වා සත්තානං අවිහෙඨක ජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලො,

---

කොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරු ගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; කායස්ස භෙදා ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, සැපයෙන්පහවූ; දුග්ගතිං, නපුරු ගති ඇත්තාවූ; විනිපාතං, විවසවපතිතවන්නාවූ; නිරයං, නරකයෙහි: නොචෙ උපපජ්ජති, ඉදින් නූපදනේද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභවයට; ආගච්ඡති, ඒද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; බව්හාබාධො හොති, බොහෝරෝග ඇත්තේවේ; මානව, මානවකය; සත්තානං,සත්වයන්ට; පාණිනාවා, අතින් හෝ; ලෙඩ්ඩුනාවා,කැටයකින් හෝ; දණ්ඩෙනවා, දණ්ඩකින් හෝ; සත්ථෙනවා, ශස්ත්‍රයකින්හෝ; යං ඉදං, යම්මේ විහෙඨක ජාතිකොහොති, වෙහෙසන සවභාව ඇත්තේවේද යැ; එසා පටිපදා, මේ ප්‍රතිපදාතොමෝ; බව්හාබාධසංවත්තනිකා,බොහෝරොග ඇතිවීමපිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියෙක් හෝ. පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, අතින් හෝ; ලෙඩ්ඩුනාවා, කැටයකින් හෝ; දණ්ඩෙනවා, දණ්ඩකින්හෝ; සත්ථෙනවා, ශස්ත්‍රයකින් හෝ; අවිහෙඨක ජාතිකො හොති, නොවෙහෙසන සවභාව ඇත්තේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණ ලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වනලද්දාවූ; තෙන කම්මෙන, ඒ කුශලකර්මය හෙතු කොටගෙන; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන් පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභණගතිඇත්තාවූ; සග්ගං, කාම සැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි,

කං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජා යති අප්පාබාධො හොති අප්පාබාධසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සත්තානං අවිහෙඨක ජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡ

---

චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභණගතිඇත්තාවූ; සග්ගං, කාම සැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නො උපපජ්ජති, නූපදනේද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභවයට; ආගච්ඡති, ඒද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි, පච්චාජායති, උපදීද; අප්පා බාධො හොති, ස්වල්පාබාධ ඇත්තේවේ; මානව, මානවකය; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, අතින්හෝ; ලෙඩ්ඩුනාවා, කැටයෙන් හෝ; දණ්ඩෙන වා, දණ්ඩෙන්හෝ; සත්ථෙනවා, ශස්ත්‍ර යෙන් හෝ; යං ඉදං, යම් මේ; අවිහෙඨක ජාතිකොහොති, නො වෙහෙසන ස්වභාව ඇත්තේවේද යන;එසා පටිපදා, මේ ප්‍රතිපදා තොමෝ; අප්පාබාධ සංවත්තනිකා, ස්වල්පබාධ ඇතිවීම පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධපන මේලොකයෙහි වනාහි;එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියෙක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; කොධනොහොති, කිපෙනසුලුවේද; උපායාස බහුලො, බලවත් ආයාස ඇත්තේවේද; අප්පම්පිවුත්තො සමානො, මද කුඩු කියනු ලබන්නේ; අභිසජ්ජති, කෝපයෙන් ගැවේද; කුප්ප ති, කිපේද; ව්‍යාපජ්ජති, පෙරළුනු සිත් ඇත්තේවේද; පතිත්ථී යති, තදබවට පැමිණේද; කොපඤ්ච, කෝපයද; දොසඤ්ච ද්වේෂ යද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද;පාතුකරොති, පහළකෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණ ලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලද්දාවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්මය හේතුකොටගෙණ; කායස්ස භෙදා, ශරී රයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විව ශව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි;චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මර

ති යත්‍ථ යත්‍ථ පච්චාජායති දුබ්බණ්ණො හොති දුබ්බණ්ණසංවත්ත
නිකා එසා මානව පටිපදා යදිදං කොධනො හොති උපායාස
බහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජ
ති පතිට්ඨීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති.

ඉධ පන මානව එකච්චො ඉත්‍ථීවා පුරිසොවා අක්කොධනො
හොති අනුපායාසබහුලො බහුම්පි වුත්තො සමානො නාභිස
ජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති. න පතිට්ඨීයති කොපඤ්ච දො
සඤ්ච අප්පච්චයඤ්ච න පාතුකරොති සො තෙන කම්මෙන එවං
සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුග

---

ණින් මත්තෙහි, අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරු ගැටි
ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ; නිරයං, නරකයෙ
හි; නො උපපජ්ජති, නූපදීද, සචෙ, ඉදින්, මනුස්සත්තං, මනුෂ්‍ය
භවයට; ආගච්ඡති, පැමිණේද; යත්‍ථ යත්‍ථ, යම් යම් තැනෙක්හි;
පච්චාජායති, උපදීද; දුබ්බණ්ණො හොති, දුර්වර්ණ ඇත්තේවේ;
මානව, මානවකය; යං ඉදං, යම්; කොධනො හොති, කිපෙන
සුලුවේද; උපායාස බහුලො, බලවත් ආයාස ඇත්තේවේද; අප්ප
මපිවුත්තො සමානො, මඳකුදු කියනුලබන්නේම; අභිසජ්ජති,
කෝපයෙන් ගැවේද; කුප්පති, කිපේද; ව්‍යාපජ්ජති, පෙරළුනු
සිත් ඇත්තේවේද; පතිට්ඨීයති, තදබවට පැමිණේද; කොපඤ්ච,
කෝපයද; දොසඤ්ච, ද්වෙෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද;
පාතුකරොති, පහළකිරීමක්වේද යන; එසා පටිපදා, මේ ප්‍රතිපදා
තොමෝ; දුබ්බණ්ණසංවත්තනිකා, දුර්වර්ණභාවය පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධපන, මේලොකයෙහි වනාහි; එක
ච්චො ඉත්‍ථීවා, සමහර ස්ත්‍රියෙක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂ
යෙක්හෝ; අක්කොධනො හොති, නොකිපෙන සුලුවේද; අනුපා
යාස බහුලො, බලවත් ආයාස නැත්තේවේද; බහුම්පිවුත්තො
සමානො, බොහෝකොට කියනුලබන්නේ; නාභිසජ්ජති, ක්‍රෝ
ධයෙන් නොගැවේද; නකුප්පති, නොකිපේද; න ව්‍යාපජ්ජති,
නොපෙරළුනු සිත්ඇත්තේවේද; න පතිට්ඨීයති; තදබවට නො
පැමිණේද; කොපඤ්ච, කෝපයද; දොසඤ්ච, ද්වෙෂයද; අප්පච්ච
යඤ්ච, නොසතුටුබවද; න පාතුකරොති, පහළ නොකෙරේද;
සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණ කරණ
ලද්දාවූ, එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලද්දාවූ; තෙන
කම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙණ; කායස්සභෙදා, ශරී
රයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි;

තිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති පාසාදිකො හොති පාසාදිකා සංවත්තනිකා එසා මාණව පටිපදා යදිදං අක්කොධනො හොති අනුපායාස බහුලො බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච න පාතුකරොති.

ඉධ පන මාණව එකච්චො ඉත්ථි වා පුරිසො වා ඉස්සාමනකො හොති පරලාභසක්කාරගරුකාර මානනවන්දනපූජනාදිසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගති

---

සුගතිං, සොභනගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්ස භෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභන ගතිඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නො උපපජ්ජති, නූපදීද; චෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යත්වයට; ආගච්ඡති, ඒද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; පාසාදිකො හොති, ප්‍රසාද එළවන්නෙක්වේ; මාණව, මාණවකය; අක්කොධනො හොති, නොකිපෙන සුලුවේද; අනුපායාසබහුලො, බලවත් ආයාස නැත්තේවේද; බහුම්පි වුත්තො සමානො, බොහෝකොට කියනුලබන්නේම; නාභිසජ්ජති, ක්‍රොධයෙන් නොගැවේද; න කුප්පති, නොකිපේද; න ව්‍යාපජ්ජති, නොපෙරලුනු සිත් ඇත්තේවේද; න පතිත්ථියති, තැතිනොගණීද; කොපඤ්ච; කොපයද; දොසඤ්ච, ද්වෙෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද; න පාතුකරොති, පහළනොකරේද; (යත) යං ඉදං යමක්වේද; එසා පටිපදා, මේ ප්‍රතිපද නොමෝ; පාසාදික සංවත්තනිකා, ප්‍රසාදඑළවීම පිණිස පවත්නීය;

මාණව, මාණවකය; ඉධ පන, මේ ලොකයෙහි වනාහි; එකච්චෙවා ඉත්ථිවා, සමහර ස්ත්‍රියක්හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; ඉස්සාමනකො හොති, ඊර්ෂ්‍යාසම්ප්‍රයුක්ත සිත් ඇත්තේවේද; පරලාභසක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු, අනුන්ගේ ලාභසත්කාර ගරුකාර මානන වන්දන පූජනාදියෙහි; ඉස්සති, ඊර්ෂ්‍යාකෙරේද; උපදුස්සති, ද්වෙෂකෙරේද; ඉස්සං බන්ධති, ඊර්ෂ්‍යාබදීද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණ ලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලද්දාවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්මය හෙතුකොටගෙන;

විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති අප්පෙසක්ඛො හොති අප්පෙසක්ඛසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං ඉස්සාමනකො හොති පරලාභසක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා අනිස්සාමනකො හොති පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා

---

කායස්ස භෙදා, ශරීරයාගේ භේදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවශව පතිත වන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්ස භෙදා, ශරීරයාගේ භේදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවශව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; නො උපපජ්ජති, නූපදීද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභවයට; ආගච්ඡති, පැමිණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; අප්පෙසක්ඛො හොති, අල්පේශාක්‍යවේ; මානව, මානවකය; ඉස්සාමනකොහොති, ඊර්ෂ්‍යා සම්ප්‍රයුක්ත සිත් ඇත්තේවේද; පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු අනුන්ගේ ලාභසත්කාර ගරුසාර මානනවන්දන පූජාදියෙහි; ඉස්සති, ඊර්ෂ්‍යා කෙරේද; උපදුස්සති, දූෂ්‍යකෙරේද; ඉස්සං බන්ධති, ඊර්ෂ්‍යාබඳීද; (යන) යං ඉදං, යමක් වේද; එසාපටිපදා; මේ ප්‍රතිපදාතොමෝ; අප්පෙසක්ඛ සංවත්තනිකා, අල්පේශාක්‍ය භාවය පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධපන, මේලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; අනිස්සාමනකො හොති, ඊර්ෂ්‍යාසම්ප්‍රයුක්ත සිත් නැත්තේවේද; පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු, අනුන්ගේ ලාභසත්කාර ගරුකාර මානන වන්දන පූජාදියෙහි; න ඉස්සති, ඊර්ෂ්‍යානොකෙරේද; න උපදුස්සති, දූෂ්‍ය නොකෙරේද; ඉස්සං, ඊර්ෂ්‍යාව; න බන්ධති, නොබඳීද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණලදාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලදාවූ; තෙන කම්මෙන, ඒ කුශලකර්මය

සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්‍ථ යත්‍ථ පච්චාජායති මහෙසක්ඛො හොති මහෙසක්ඛසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අනිස්සාමනකො හොති පරලාභසක්කාර ගරුකාර මානන වන්දනපූජනාදිසු න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති.

ඉධ පන මානව එකච්චො ඉත්‍ථී වා පුරිසො වා න දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්‍ථං යානං මාලාගන්‍ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං

---

හේතුකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ භේදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභනගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලෝකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේ භේදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභනගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලෝකයෙහි; නො උපපජ්ජති, නුපදීද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභාවයට; ආගච්ඡති, පැමිණේද; යත්‍ථ යත්‍ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; මහෙසක්ඛො හොති; මහේශාක්‍යවේ; මානව, මානවකය; පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාදිසු අනුන්ගේ ලාභසත්කාර ගරුකාර මානන වන්දන පූජාදියෙහි න ඉස්සති, ඊර්ෂ්‍යා නොකෙරේද; න උපදුස්සති, දූෂ්‍ය නොකෙරේද; ඉස්සං, ඊර්ෂ්‍යාව; න බන්ධති, නොබඳීද; (යත) යං ඉදං; යමක්වේද, එසා පටිපදා, ඒ ප්‍රතිපදාතොමෝ; මහෙසක්ඛ සංවත්තනිකා, මහේශාක්‍ය භාවය පිණිස පවත්නිය,

මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්‍ථිවා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; සමණස්සවා, ශ්‍රමණයක්හට හෝ; බ්‍රාහ්මණස්සවා, බ්‍රාහ්මණයක්හට හෝ; අන්නං, ආහාරය; පානං, පාන වර්ගය; වත්‍ථං, වස්ත්‍රය; යානං, යානාය; මාලා; මල්ය; ගන්‍ධ, සුවඳය; විලෙපන; විලවුන්ය; සෙය්‍ය, යහන්ය; ආවසථ, ආවාසය; පදීපෙය්‍යං, ප්‍රදීපොපකරණය (යනමෙය) න දාතාහොති, නොදන්නේවේද; සො, ඒ පුද්ගලතෙම, එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණ කරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වන ලද්දාවූ; තෙන කම්මෙන; ඒ අකුශල කර්මය කාරණකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපා

දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති අප්පභොගො හොති අප්පභොග සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං න දාතා හොති සමණස්ස වා බ්‍රාහමණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං

ඉධ පන මානව එකච්චො ඉත්ථි වා පුරිසො වා දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුග

---

යං, සැපයෙන් පහවූ; දුග්ගතිං නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරු ගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ; නිරයං, නර කයෙහි; නො උපපජ්ජති, නූපදීද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යත්වයට; ආගච්ඡති, පැමිණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; අප්පභොගො හොති, ස්වල්ප භොග සම්පත් ඇත්තේවේ; මානව, මානවකය; සමණස්සවා, ශ්‍රමණයක් හට හෝ; බ්‍රාහ්මණස්සවා, බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, ආහාරය; පානං, පානවර්ගය; වත්ථං, වස්ත්‍රය; යානං, යානාය; මාලා මල්ය; ගන්ධ, සුවඳය, විලෙපනං, විලවුන්ය; සෙය්‍යා, යහන්ය; ආවසථ, ආවාසය; පදීපෙය්‍යං, ප්‍රදීපොපකරණය; (යනමෙය) න දාතාහොති, නොදෙන්නේවේද; (යන) යං ඉදං යමක්වේද; එසාපටිපදා, මේ ප්‍රතිපදාතොමෝ; අප්පභොග සංවත්තනිකා, ස්වල්ප භොගසම්පත් ඇතිවීම පිණිස පවත්නීය.

මානව, මානවකය, ඉධපන, මේලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසො වා, (සමහර) පුරුෂයෙක්හෝ; සමණස්සවා, ශ්‍රමණයක්හට හෝ; බ්‍රාහමණස්ස වා, බ්‍රාහමණයක්හට හෝ; අන්නං, ආහාරය; පානං, පානවර්ගය; වත්ථං, වස්ත්‍රය; යානං, යානාය; මාලා, මල්ය; ගන්ධ, සුවඳය; විලෙපනං, විලවුන්ය; සෙය්‍යා, යහන්ය; ආවසථ, ආවාසය; පදීපෙය්‍යං, ප්‍රදීපොපකරණය; (යනමෙය) දාතාහොති, දෙන්නේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණ ලදාවූ; එවං සමාදින්නෙන. මෙසේ සමාදන්වනලද්දාවූ. තෙන කම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ

තිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති මහාභොගො හොති මහාභොග සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං දාතා හොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා ථද්ධො හොති අතිමානී අභිවාදෙතබ්බං න අභිවාදෙති පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති ආසනාරහස්ස න ආසනං දෙති මග්ගාරහස්ස න මග්ගං දෙති සක්කාතබ්බං න සක්කරොති ගරුකාතබ්බං න ගරු කරො

භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සොභන ගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, සොභනගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නො උපපජ්ජති, නූපදීද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභවයට; ආගච්ඡති, පැමිණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; මහාභොගො හොති, මහත් භොග සම්පත් ඇත්තේවේ; මානව, මානවකය; සමණස්සවා, ශ්‍රමණයක්හට හෝ; බ්‍රාහමණස්සවා, බ්‍රාහමණයක්හටහෝ; අන්නං, ආහාරය; පානං පානවර්ගය; වත්ථං, වස්ත්‍රය; යානං, යානාය; මාලා, මල්ය; ගන්ධ, සුවඳය; විලෙපනං, විලවුන්ය; සෙය්‍ය, යහන්ය; ආවසථ ආවාසය; පදීපෙය්‍ය, පහන් උපකරණය; (යන මෙය) දාතා හොති, දෙන්නේවේද; (යන) යං ඉදං යමක්වේද; එසා පටිපදා, ඒ ප්‍රතිපදාතොමෝ; මහාභොග සංවත්තනිකා, මහත් භොග සම්පත් ඇතිවීම පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථීවා, සමහරස්ත්‍රියක් හෝ; පුරිසො වා, (සමහර) පුරුෂයෙක් හෝ; ථද්ධො හොති, තදගති ඇත්තේවේද; අතිමානී, අධිකමාන ඇත්තේ වේද; අභිවාදෙ තබ්බං, වැන්ද යුත්තා හට; න අභිවාදෙති, නොවඳීද; පච්චුට්ඨා තබ්බං, හුනස්නෙන් නැඟී සිටිය යුත්තාහට; න පච්චුට්ඨෙති, හුනස්නෙන් නැඟීනොසිටීද; ආසනාරහස්ස, ආසනයක්දීමට සුදුස්සාහට; ආසනං න දෙති, ආසනයක් නොදේද; මග්ගාරහස්ස, මාර්ගයදීමට සුදුස්සාහට; මග්ගං න දෙති, මාර්ගය නොදේද; සක්කාතබ්බං, සත්කාර කටයුත්තාහට;

ති මානෙතබ්බං න මානෙති පූජෙතබ්බං න පූජෙති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති නීචකුලීනො හොති නීචකුලීන සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං ථද්ධො හොති අතිමානී අභිවාදෙතබ්බං න අභිවාදෙති පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති ආසනාරහස්ස න ආසනං දෙති මග්ගාරහස්ස න මග්ගං දෙති සක්කාතබ්බං න සක්කරොති ගරුකාතබ්බං න ගරු කරොති මානෙතබ්බං න මානෙති පූජෙතබ්බං න පූජෙති.

---

න සක්කරොති, සත්කාර නොකෙරේද; ගරුකාතබ්බං, ගෞරව කටයුත්තාහට; න ගරුකරොති, ගෞරව නොකෙරේද; මානෙතබ්බං, බුහුමන් කටයුත්තාහට; න මානෙති, බුහුමන් නොකෙරේද; පූජෙතබ්බං, පූජාකටයුත්තාහට; න පූජෙති, පූජානොකෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වනලද්දාවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්මය හෙතුකොටගෙණ; කායස්ස භෙදා, ශරිරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිත වන්නාවූ; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ; නිරයං, නරකයෙහි; නො උපපජ්ජති, නූපදීද; සචෙ, ඉදින් මනුස්සත්තං මනුෂ්‍යත්වයට; ආගච්ඡති, පැමිණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හී; පච්චාජායති, උපදීද නීචකුලීනො හොති, නීචජාතී ඇත්තේවේ; මානව, මානවකය; ථද්ධො හොති, තදසිත් ඇත්තේවේද; අති මානී, අධික මානය ඇත්තේ වේද; අභිවාදෙ තබ්බං, වැන්දයුත්තාහට; න අභිවා දෙති, නොවදීද; පච්චුට්ඨා තබ්බං, හුනස්නෙන් නැගීසිටිය යුත්තාහට; න පච්චුට්ඨෙති, හුනස්නෙන් නැගීනොසිටීද; ආසනාරහස්ස, ආසනයක් දියයුත්තාහට; ආසනං න දෙති, ආසනයක් නොදේද; මග්ගාරහස්ස, මාර්ගයදීමට සුදුස්සාහට; මග්ගං න දෙති, මාර්ගය නොදේද, සක්කාතබ්බං, සත්කාර කටයුත්තාහට; න සක්කරොති, සත්කාර නොකෙරේද; ගරුකාතබ්බං, ගෞරවකටයුත්තාහට; න ගරුකරොති, ගෞරව නොකෙරේද; මානෙතබ්බං, බුහුමන් කටයුත්තාහට; න මානෙති, බුහුමන්නොකෙරේද; පූජෙතබ්බං, පූජාකටයුත්තාහට; න

ඉධ පන මානව එකච්චො ඉත්ථි වා පුරිසොවා අත්ථද්ධො හොති අනතිමානී අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං දෙති මග්ගාරහස්ස මග්ගං දෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති උච්චා කුලීනො හොති උච්චාකුලීන සංවත්තනිකා එසාමානව පටිපදා යදිදං අත්ථද්ධො හොති අනතිමානි

---

පූජෙති, පූජාකොකෙරේද; (යත) යං ඉදං යමක්වේද; එසා පටිපදා. මේ ප්‍රතිපදා තොමෝ; නීචකුලීන සංවත්තනිකා, නිචකුල ඇතිවීම පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධ පන මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසොවා, සමහර) පුරුෂයෙක් හෝ; අත්ථද්ධො හොති,තදසිප් නැත්තේවේද; අනතිමානි, අධිකමානය නැත්තේවේද; අභිවාදෙතබ්බං, වැඳයුත්තාහට; අභිවාදෙති, වදීද; පච්චුට්ඨාතබ්බං, හුනස්නෙන් නැගිසිටිය යුත්තාහට;පච්චුට්ඨෙති, හුනස්නෙන් නැගීසිටීද; ආසනාරහස්ස, ආසනයක්දීමට සුදුස්සාහට; ආසනංදෙති, ආසනයක්දේද; මග්ගාරහස්ස, මාර්ගයදීමට සුදුස්සාහට; මග්ගංදෙති, මාර්ගයදේද; සක්කාතබ්බං, සත්කාරකටයුත්තාහට; සක්කරොති, සත්කාරකෙරේද; ගරුකාතබ්බං, ගෞරවකටයුත්තාහට; ගරුකරොති, ගෞරවකෙරේද; මානෙතබ්බං, බුහුමන්කටයුත්තාහට; මානෙති, බුහුමන් කෙරේද; පූජෙතබ්බං, පූජාකටයුත්තාහට; පූජෙති, පූජාකෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ කුශලකර්මයහෙතුකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්, පරම්මරණා, මරණින්මතොනහි; සුගතිං, සොභනගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි; චෙ, ඉදින්; කායස්සභෙද, ශරිරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මතොනහි; සුගතිං, සොභණගති ඇත්තාවූ; සග්ගං, කාමසැපයෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නූපදිද; සචෙ, ඉදින්; මනුස්සත්තං, මනුෂ්‍යභවයට; ආගච්ඡති, පැමිණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදීද; උච්චාකුලීනොහොති, උසස්

අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං දෙති මග්ගාරහස්ස මග්ගං දෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති.

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා න පරිපුච්ඡිතා හොති කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිං මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති

---

කුල ඇත්තේවේ; මානව, මානවකය; අත්ථද්ධො හොති, තද සිත් නැත්තේවේද; අනතිමානී, අධිකමානය නැත්තේවේද; අභිවාදෙතබ්බං, වැඳියුත්තාහට; අභිවාදෙති, වදීද; පච්චුට්ඨාතබ්බං, හුනස්නෙන් නැගී සිටිය යුත්තාහට; පච්චුට්ඨෙති, හුනස්නෙන් නැඟී සිටීද; ආසනාරහස්ස, ආසනයක් දීමට සුදුස්සාහට; ආසනං දෙති, ආසනයක්දේද; මග්ගාරහස්ස, මාගීය දීමට සුදුස්සාහට; මග්ගං දෙති, මාගීයදේද; සක්කාතබ්බං, සත්කාර කටයුත්තාහට; සක්කරොති, සත්කාරකෙරේද; ගරුකාතබ්බං, ගෞරව කටයුත්තාහට; ගරුකරොති, ගෞරවකෙරේද; මානෙතබ්බං බුහුමන් කටයුත්තාහට; මානෙති, බුහුමන්කෙරේද; පූජෙතබ්බං, පූජාකටයුත්තාහට; පූජෙති, පූජාකෙරේද; යත) යං ඉදං, යමක්වේද; එසා පටිපදා, මේ ප්‍රතිපදතොමෝ; උච්චාකුලීන සංවත්තනිකා, උසස් කුල ඇතිවීම පිණිස පවත්නීය.

මානව, මානවකය; ඉධ පන මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක්හෝ; පුරිසො වා, සමහර) පුරුෂයෙක්හෝ; සමණං වා ශ්‍රමණයක් කරාහෝ; බ්‍රාහ්මණං වා, බ්‍රාහ්මණයන්කරා හෝ; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; කිං කුසලං, කුමක් කුසල්ද; කිං අකුසලං, කුමක් අකුසල්ද; කිං සාවජ්ජං, කුමක්සාවද්‍යද; කිං අනවජ්ජං, කුමක් නිරවද්‍යද; කිං සෙවිතබ්බං, කුමක් සේවනය කටයුතුද; කිං න සෙවිතබ්බං, කුමක් සෙවනයනොකටයුතුද; මෙ, මාවිසින්; කිං, කුමක්; කයිරමානං; කරණුලබන්නේ; දීඝරත්තං, බොහෝ කාලයක්; අහිතාය, අහිතපිණිස; දුක්ඛාය දුක්පිණිස; හොති, වේද, වා, නොහොත්; මෙ, මාවිසින්; කිං පන කයිරමානං, කුමක්කරණු ලබන්නේ; දීඝරත්තං, බොහෝකාලයක්; හිතාය, හිත පිණිස; සුඛාය, සැපපිණිස; හොත්ඉති, වේදැයි; නපරිපුච්ඡිතා හොති,

කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති?
සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කාය
ස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති,
නොචෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිර
යං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති
දුප්පඤ්ඤොහොති දුප්පඤ්ඤසංවත්තනිකා එසා මානව පටිපදා
යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා න පරිපුච්ඡිතා හොති
කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං
සෙවිතබ්බං කිං නසෙවිතබ්බං කිම්මෙ කයිරමානං දීඝරත්තං අහි
තාය දුක්ඛාය හොති කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං
හිතාය සුඛාය හොතීති.

---

නොවිචාරන්නේ වේ ද. සො, ඒ පුද්ගලතෙම; එවං, මෙසේ;
සමත්තෙන, සම්පූර්ණ කරණ ලද්දාවූ. එවං, මෙසේ; සමාදින්නෙන.
සමාදන්වන ලද්දාවූ; තෙන කම්මෙන, ඒ අකුශලකර්ම්ය හෙතු
කොටගෙණ. කායස්සභෙදා, ශරීරයාගේ බිඳීමෙන්, පරම්මරණා,
මරණින් මත්තෙහි; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරු
ගති ඇත්තාවූ; විනිපාතං, විවසව පතිතවන්නාවූ. නිරයං, නරක
යෙහි; උපපජ්ජති, උපදියි: කායස්සභෙදා, ශරීරයාගේ භෙද
යෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, සැපයෙන්
පහවූ. දුග්ගතිං, නපුරුගති ඇත්තාවූ: විනිපාතං, විවසව පතිත
වන්නාවූ, නිරයං, නරකයෙහි; නොචෙ උපපජ්ජති, ඉදින් නූපදනේ
වීනම්; සචෙ, ඉදින්; මනුස්සත්තං, මිනිසත් බවට; ආගච්ඡති, පැමි
ණේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; පච්චාජායති, උපදිද; දුප්ප
ඤ්ඤොහොති, නුවන නැත්තේවෙයි; මානව, මානවකය යං ඉදං
යම්; සමණං වා, ශ්‍රමණයෙක් කරු හෝ; බ්‍රාහ්මණං වා, බ්‍රාහ්මණ
යෙක් කරු හෝ; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; කිං,
කුමක්; කුසලං, කුශල් ද; කිං, කුමක්; අකුසලං, අකුශල් ද; කිං,
කුමක්; සාවජ්ජං, සාවද්‍ය ද; කිං, කුමක්; අනවජ්ජං, නිරවද්‍යද ;කිං,
කුමක්; සෙවිතබ්බං, සේවනය කටයුතු ද; කිං, කුමක්, නසෙවි
තබ්බං, සේවනය නොකටයුතු ද; මෙ, මා විසින්: කයිරමානං,
කරනු ලබන්නා වූ; කිං, කුමක්; දීඝරත්තං, බොහෝ කලක්;
අහිතාය, අහිත පිණිස; දුක්ඛාය, දුක් පිණිස: හොති, වේද; වා,
නොහොත්; මෙ, මා විසින්; කයිරමානං, කරනු ලබන්නාවූ;
කිං පන, කුමක්; හිතාය, හිත පිණිස; සුඛාය, සැප පිණිස;
හොති ඉති, වේ දැයි; න පරිපුච්ඡිතා හොති, නොවිචාරණ ලද්දේවේ

ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා හොති කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිං මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති කිං වා පන මෙ කයිර මානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති මහාපඤ්ඤො.

---

ද යන එසා පටිපදා, මේ ප්‍රතිපදාතොමෝ; දුප්පඤ්ඤසංවත්තනිකා, නුවණ නැති බව පිණිස පවත්නීය;

මානව, මානවකය; ඉධ පන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියෙක් හෝ; පුරිසොවා, (සමහර) පුරුෂයෙක් හෝ; සමණං වා, ශ්‍රමණයෙකු කරා හෝ; බ්‍රාහ්මණං වා, බ්‍රාහ්මණයෙකු කරා හෝ; උපසංකමිත්වා, එළඹ; භන්තෙ, ස්වාමීනි; කිං, කුමක්; කුසලං, කුශල් ද; කිං, කුමක්; අකුසලං, අකුශල් ද; කිං, කුමක්: සාවජ්ජං, සාවද්‍ය ද; කිං, කුමක්; අනවජ්ජං, නිරවද්‍ය ද: කිං, කුමක්; සෙවිතබ්බං, සෙවනය කටයුතු ද; කිං, කුමක්; නසෙවිතබ්බං, සෙවනය නොකටයුතු ද; මෙ, මාවිසින්: කයිරමානං, කරනු ලබන්නාවූ. කිං, කුමක්; දීඝරත්තං, බොහෝ කලක්; අහිතාය, අහිත පිණිස: දුක්ඛාය, දුක් පිණිස හොති, වේද; වා, නොහොත්; මෙ, මා විසින්; කයිරමානං, කරනු ලබන්නාවූ; කිං, පන, කුමක් වනාහි; දීඝරත්තං, බොහෝකලක්; හිතාය, හිතපිණිස; සුඛාය, සැප පිණිස; හොති ඉති, වේදැයි; පරිපුච්ඡිතා හොති, විචාරණ ලද්දේ වේද; සො ඒ පුද්ගල තෙම; එවං, මෙසේ; සමත්තෙන, සම්පූර්ණ කරන ලද්දාවූ; එවං, මෙසේ; සමාදින්නෙන, සමාදන්වන ලද්දාවූ; තෙන කම්මෙන, ඒ (කුශල) කර්මය හෙතුකොටගෙණ; කායස්සභෙදා, ශරීරයාගේ බිඳීමෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, යහපත් ගති ඇත්තාවූ; සග්ගං, කාම සැප යෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදියි; කායස්සභෙදා, ශරීරයාගේ බිඳීමෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, ශොභන ගති ඇත්තාවූ; සග්ගං, කාම සැප යෙන් අග්‍රවූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොචෙ උපපජ්ජති, ඉදින් නූපදනේවීනම්; සචෙ, ඉදින්; මනුස්සත්තං, මිනිස්බවට; ආගච්ඡති, ඒද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හී; පච්චාජායති, උපදීද; මහාප

හොති මහාපඤ්ඤසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා හොති කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිං මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති.

ඉති ඛො මානව අප්පායුකසංවත්තනිකා පටිපදා අප්පායුකත්තං උපනෙති දීඝායුකසංවත්තනිකා පටිපදා දීඝායුකත්තං උපනෙති බව්හාබාධසංවත්තනිකා පටිපදා බව්හාබාධත්තං උපනෙති අප්පාබාධ සංවත්තනිකා පටිපදා අප්පාබාධත්තං උපනෙති දුබ්බණ්ණසංව

---

ඤ්ඤ හොති, මහත්වූ ප්‍රඥ ඇත්තේවෙයි; මානව, මානවකය; යදිදං, යම්; සමණං වා, ශ්‍රමණයෙකු කරා හෝ; බ්‍රාහ්මණං වා, බ්‍රාහ්මණයෙකු කරා හෝ; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; කිං, කුමක්; කුසලං, කුශල් ද; කිං, කුමක්; අකුසලං අකුශල් ද; කිං. කුමක්; සාවජ්ජං, සාවද්‍ය ද; කිං, කුමක්; අනවජ්ජං, නිරවද්‍ය ද; කිං, කුමක්; සෙවිතබ්බං, සෙවනයකටයුතු ද; කිං, කුමක්; නසෙවිතබ්බං, සෙවනය නොකටයුතු ද; මෙ, මා විසින්; කයිරමානං, කරනු ලබන්නාවූ; කිං, කුමක්; දීඝරත්තං, බොහෝ කලක්; අහිතාය, අහිතපිණිස; දුක්ඛාය, දුක්පිණිස; හොති, වේද; වා, නොහොත්; මෙ, මා විසින්; කයිරමානං, කරනු ලබන්නාවූ; කිං, කුමක්; දීඝරත්තං, බොහෝ කලක්; හිතාය, හිත පිණිස; සුඛාය, සැප පිණිස; හොති ඉති, වේදැයි; පරිපුච්ඡිතා හොති, විචාරණලද්දේ වේද යන; එසා පටිපදා, මේ ප්‍රතිපදාතොමෝ; මහා පඤ්ඤසංවත්තනිකා, මහත්වූ ප්‍රඥව ඇතිබව පිණිස පවත්නිය;

මානව, මානවකය; ඉති ඛො, මෙසේ වනාහි; අප්පායුක සංවත්තනිකා, අල්පායුෂ්ක භාවයපිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; අප්පායුකත්තං, අල්පායුෂ්ක භාවයට; උපනෙති, පමුණුවයි; දීඝායුක සංවත්තනිකා, දීර්ඝායුෂ්ක පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; දීඝායුකත්තං, දීර්ඝායුෂ්ක භාවයට; උපනෙති, පමුණුවයි; බව්හාබාධ සංවත්තනිකා, බොහෝ ආබාධ ඇතිබව පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; බව්හාබාධත්තං, බොහෝ ආබාධ ඇතිබවට; උපනෙති, පමුණුවයි; අප්පාබාධසංවත්තනිකා, සවල්පාබාධ ඇතිබව පිණිසපවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; අප්පාබාධත්තං, සවල්පාබාධ ඇතිබවට; උපනෙති, පමුණුවයි; දුබ්බණ්ණසංවත්තනි

ත්තනිකා පටිපදා දුබ්බණ්ණත්තං උපනෙති පාසාදික සංවත්තනිකා පටිපදා පාසාදිකත්තං උපනෙති අප්පෙසක්ඛ සංවත්තනිකා පටිපදා අප්පෙසක්ඛත්තං උපනෙති මහෙසක්ඛ සංවත්තනිකා පටිපදා මහෙසක්ඛත්තං උපනෙති අප්පභොග සංවත්තනිකා පටිපදා අප්පභොගත්තං උපනෙති මහාභොග සංවත්තනිකා පටිපදා මහාභොගත්තං උපනෙති නීචකුලීන සංවත්තනිකා පටිපදා නීචකුලීනත්තං උපනෙති උච්චාකුලීන සංවත්තනිකා පටිපදා උච්චාකුලීනත්තං උපනෙති දුප්පඤ්ඤ සංවත්තනිකා පටිපදා දුප්පඤ්ඤත්තං උපනෙති මහාපඤ්ඤ සංවත්තනිකා පටිපදා මහාපඤ්ඤත්තං උපනෙති කම්මස්සකා මාණව සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මපටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.

---

කා, දුර්වර්ණ භාවය පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදා තොමෝ; දුබ්බණ්ණත්තං, දුර්වර්ණ භාවයට; උපනෙති, පමුණුවයි; පාසාද සංවත්තනිකා, ප්‍රසාද එළවන පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; පාසාදිකත්තං, ප්‍රසාද එළවන බවට; උපනෙති, පමුණුවයි; අප්පෙසක්ඛ සංවත්තනිකා, අල්පේශාක්‍ය භාවය පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදා තොමෝ; අප්පෙසක්ඛත්තං, අල්පේශාක්‍ය භාවයට; උපනෙති, පමුණුවයි; මහෙසක්ඛ සංවත්තනිකා, මහේශාක්‍ය භාවය පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදා තොමෝ; මහෙසක්ඛත්තං, මහේශාක්‍ය භාවයට; උපනෙති, පමුණුවයි; අප්පභොග සංවත්තනිකා, ස්වල්පභොග සම්පත් ඇතිබව පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; අප්පභොගත්තං, ස්වල්පභොග සම්පත් ඇතිබවට; උපනෙති, පමුණුවයි; මහාභොග සංවත්තනිකා, මහත්වූ භොගසම්පත් ඇතිබව පිණිස පවත්නාවූ; පටිපදා ප්‍රතිපදා තොමෝ; මහාභොගත්තං, මහත්වූ භොග සම්පත් ඇතිබවට; උපනෙති පමුණුවයි; නීචකුලීනසංවත්තනිකා, නීචවූ කුලඇතිබව පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදා තොමෝ; නීචකුලීනත්තං, නීචවූ කුලඇති බවට; උපනෙති, පමුණුවයි උච්චාකුලීන සංවත්තනිකා, උසස්වූ කුලඇති බව පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදා තොමෝ; උච්චාකුලීනත්තං, උසස්වූකුල ඇතිබවට; උපනෙති, පමුණුවයි; දුප්පඤ්ඤ සංවත්තනිකා, ප්‍රඥාව නැතිබව පිණිස පවත්නාවූ; පටිපදා ප්‍රතිපදාතොමෝ; දුප්පඤ්ඤත්තං, ප්‍රඥාව නැතිබවට; උපනෙති, පමුණුවයි; මහාපඤ්ඤ සංවත්තනිකා, මහත්වූ ප්‍රඥාව ඇතිබව පිණිස පවත්නාවූ; පටිපදා, ප්‍රතිපදාතොමෝ; මහාපඤ්ඤත්තං, මහත්වූ ප්‍රඥාව ඇති බවට; උපනෙති, පමුණුවයි.

එවං වුත්තෙ සුභො මානවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු සඞ්ඝ

---

මානව, මානවකය. සත්තා, සත්ත්වයෝ තුමූ කම්මස්සකා කර්මය ම ස්වකීය කොට ඇත්තාහුය කම්මදායාදා, කර්මයම හිමිකොට ඇත්තාහුය; කම්මයොනී, කර්මයම කාරණකොට ඇත්තාහුය; කම්මබන්ධූ, කර්මයම නෑ කොට ඇත්තාහුය: කම්මපටිසරණා, කර්මයම පිළිසරණකොට ඇත්තාහුය. කම්මං, කර්මය තෙම; සත්තෙ, සත්ත්වයන්: යදිදං හීනප්පණීතතාය. මෙසේ හීන ප්‍රණීත භාවයෙන්; විභජති ඉති, බෙදන්නේයයි; (වදාළසේක.)

එවං, මෙසේ; වුත්තෙ, වදාළකල්හි; තොදෙය්‍ය පුත්තො, තොදෙය්‍ය නම් බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභො මානවො, සුභනම් මානවකතෙම. භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේය; අවොච, කීයේය; භො ගොතම, භවත් ගෞතමයාණන් වහන්ස; අභික්කන්තං, (නුඹවහන්සේගේ දෙශනාව) ඉතා යහපත; භො ගොතම, භවත් ගෞතමයාණන් වහන්ස; අභික්කන්තං, (නුඹවහන්සේ)ඉතා යහපත; භොගොතම, භවත් ගෞතමයාණන් වහන්ස; සෙය්‍යථාපි, යම්සේ; නික්කුජ්ජිතං, යටිකුරුකොට තබනලද දෙයක්; උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කරන්නේහෝවේ ද; පටිච්ඡන්නං, වසනලද දෙයක්; විවරෙය්‍ය වා, විවෘතකරන්නේහෝ වේද; මූළ්හස්ස, මංමුළාවූ එකෙක්හට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, මග කියන්නේහෝ වේද; චක්ඛුමන්තො, ඇස්ඇත්තාහු; රූපානි, රූපයන්; දක්ඛින්ති ඉති, දකිත්යයි; අන්ධකාරෙ, අන්ධකාර ගෘහයෙක්හි; තෙලපජ්ජොතං, තෙල් පහනක්; ධාරෙය්‍ය වා, දරන්නේ හෝ වේද; එවං එවං, එපරිද්දෙන් ම; භොතා ගොතමෙන, භවත්ගෞතමයාණන් වහන්සේ විසින්; අනෙකපරියායෙන, නොයෙක් ප්‍රකාරයෙන්; ධම්මො, ධර්මය තෙම; පකාසිතො, ප්‍රකාශකරණ ලද්දේය; එසො අහං, මේ} මම; භගවන්තං ගොතමං, භවත් ගෞතමයාණන් වහන්සේ ද; ධම්මඤ්ච, ධර්මය ද; භික්ඛු සඞ්ඝඤ්ච, භික්ෂු සඞ්ඝයා ද; සරණං

ස්ස උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## චූළ කම්ම විභඞ්ග සුත්තං.

### "උපරිපණ්ණාසකෙ"

**ඉමානි ජ සුත්තානි දුතකථාය කොසලලක්ඛං ගහෙතබ්බානි.**

එවමෙම සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිල වත්ථුස්මිං නිග්‍රොධාරාමෙ–අථඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකම න්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච.

---

ගච්ඡාමි, සරණයෙමි; භවං ගොතමො, භවත් ගෞතමයාණන් වහන්සේ, මං, මා. අජ්ජ තගෙග, අද ආදිකොට; පාණුපෙතං, ජීවිතාන්තය දක්වා; සරණං ගතං, සරණ ගියාවූ: උපාසකං, උපාසකයෙක් කොට; ධාරෙතු ඉති, දරණසේක්වායි; (කියේය.)

## චූළ කම්ම විභඞ්ග සුත්තං, චූළකම්ම විභඞ්ගසූත්‍රයයි.

මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසනලදී; (නොහොත්) මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේය; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍යයන් අතුරෙහි හෙවත් ශාක්‍ය ජනපදයෙහිවූ කපිලවත්ථුස්මිං, කපිලවස්තුනුවරසමීපයෙහිවූ; නිග්‍රොධාරාමෙ, නිග්‍රොධාරාමයෙහි; විහරති, වැඩවාසය කරණසේක; අථ ඛො, ඉක්බිත්තෙන්; මහානාමො, මහානාම නම්වූ; සක්කො, ශාක්‍යරාජතෙම භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම්තැනෙක්හි ද; තෙන, එතැන්හි උපසංකමි, එළඹියේය; (දිව්‍ය මනුෂ්‍යයන්ගේ උපාසක භාවයද ඒ උපාසකයාගේ ශීල සම්පත්තියද ශ්‍රද්ධා සම්පත්තියද ත්‍යාග සම්පත්තියද ප්‍රඥා සම්පත්තියද යන පඤ්චප්‍රභෙද ප්‍රශ්නයන්විචාරණු කැමැත්තේඅනුභවකරණලද පෙර බත්ඇති කාලයෙහි සර්වඥයන් වහන්සේගේ සමීපයට ඒ රජතෙම පැමිණියේයි.) උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, වැඳ: එකමන්තං, එකත්පසෙක; නිසීදි, උන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නොඛො, උන්නාවූ, මහානාමො, මහානාම නම්වූ: සක්කො, ශාක්‍යරජතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මෙය; අවොච කියේය;

---

"උපරිපණ්ණාසකෙ, (මැදුම් සඟියෙහි) උපරිපණ්ණාසකයෙහිය;"

---

ඉමානි ජසුත්තානි, මේ සූත්‍රසය; දූතකථාය, දූතකථාවගේ; කොසලලක්ඛං, දක්ෂබව පිණිස; ගහෙ තබ්බානි, ගතයුත්තාහුය..

කිත්තාවතා නුඛො භන්තෙ උපාසකො හොතීති යතො ඛො මහානාම බුද්ධං සරණං ගතො හොති ධම්මං සරණං ගතො හොති සඞ්ඝං සරණං ගතො හොති එත්තාවතා ඛො මහානාම උපාසකො හොතීති.

කිත්තාවතා පන භන්තෙ උපාසකො සීලසම්පන්නො හොතීති යතො ඛො මහානාම උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති එත්තාවතා ඛො මහානාම උපාසකො සීලසම්පන්නො හොතීති.

---

භන්තෙ, ස්වාමීන් වහන්ස; කිත්තාවතානුඛො, කොපමණකින් වනාහි; උපාසකො හොතීති, උපාසකයෙක් වේදැයි (විචාලේය.) මහානාම, මහානාමය; යතො ඛො, යම්තැනක පටන් වනාහි; බුද්ධං සරණං, බුදුන් සරණ; ගතො හොති, ගියේවේද; ධම්මං සරණං, දහම් සරණ; ගතොහොති, ගියේවේ ද; සඞ්ඝං සරණං, සඟසරණ; ගතොහොති, ගියේවේද; මහානාම. මහානාමය; එත්තාවතා ඛො, මෙපමණකින් වනාහි; උපාසකො හොතීති, උපාසකයෙක් වේයයි (වදාළසේක.)

භන්තෙ, ස්වාමීන් වහන්ස; කිත්තාවතා පන, කොපමණකින්; උපාසකො, උපාසක තෙම; සීලසම්පන්නොහොතීති, ශීලයෙන් යුක්තවේදැයි (විචාලේය.)

මහානාම, මහානාමය; යතො ඛො, යම්තැනෙක පටන් උපාසකො, උපාසක තෙම; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොති, වැළැක්කේවේ ද; අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වේද; කාමෙසුමිච්ඡාචාරා, කාම මිථ්‍යාචාරයෙන් පටිවිරතො හොති, වැළැක්කේ වේද; මුසාවාදා, බොරුකීමෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වේද; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදයට හා ප්‍රමාදයට කාරණාවූ සුරාපානයෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වේද, මහානාම, මහානාමය; එත්තාවතා ඛො, මෙපමණකින් වනාහි; උපාසකො, උපාසක තෙම; සීලසම්පන්නො හොති, ශීලයෙන් යුක්තවේයයි (වදාළසේක.)

කිත්තාවතා පන භන්තෙ උපාසකො සද්ධාසම්පන්නො හොතීති· ඉධ මහානාම උපාසකො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති එත්තාවතා ඛො මහානාම උපාසකො සද්ධාසම්පන්නො හොතීති.

---

භන්තෙ, ස්වාමීන්වහන්ස; කිත්තාවතා පන, කොපමණකින් වනාහි; උපාසකො, උපාසකතෙම; සද්ධාසම්පන්නො හොතීති, ශ්‍රද්ධාවෙන් යුක්තවේදැයි; (විචාළේය.) මහානාම, මහානාමය; ඉධ, මේ ලෝකයෙහි; උපාසකො, උපාසකතෙම; සද්ධොහොති, ශ්‍රද්ධාඇත්තේ වේද; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි අරහං, කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින්ද කෙලෙස්නැමති සතුරන් නැසූ හෙයින්ද සංසාර චක්‍රයාගේ අරනැසූ හෙයින්ද පූජාවට සුදුසු හෙයින්ද රහසත් පව් නොකරණ හෙයින්ද යන මේ කාරණයන්ගෙන් අර්හත් නම් වනසේක සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි සම්මාසම්බුද්ධො, චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන් මනාකොට තමන් විසින්ම ස්වයම්භූඥානයෙන් අවබොධ කළහෙයින් සම්‍යක් සම්බුද්ධ නම් වනසේක, සො භගවා, ඒ භාග්‍යවත්තෙම ඉතිපි විජ්ජාචරණ සම්පන්නො, අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන් යුක්තහෙයින් විද්‍යාචරණ සම්පන්න නම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම: ඉතිපි සුගතො, සොභන වූ ගමන් ඇති හෙයින්ද සුන්දරවූ නිර්වාණයට පැමිණිහෙයින්ද සුගත නම් වනසේක. සො භගවා, ඒ භාග්‍යවත්තෙම ඉතිපි ලොකවිදූ, සත්වසංස්කාරාවකාශ යන ත්‍රිවිධලොකයම සර්වප්‍රකාරයෙන් අවබොධ කළ හෙයින් ලොකවිදූ නම් වනසේක සො භගවා ඒ භාග්‍යවත්තෙම ඉතිපි අනුත්තරෙ පුරිසදම්මසාරථි, ශීලසමාධ්‍යාදි ගුණයෙන් සියලු ලොකයාහට නිරුත්තරවන හෙයින්ද මනුෂ්‍යාමනුෂ්‍යතිරශ්චීන පුරුෂයන් දමනයෙහි ලා වැඩෙහි යොදන හෙයින්ද නිරුත්තර වූ පුරිසදම්මසාරථි නම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම: ඉතිපි දෙවමනුස්සානං සත්ථා, සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට සුදුසු සුදුසු පරිද්දෙන් අනුශාසනා කරණහෙයින් ශාස්තෘ නම් වනසේක. සො භගවා, ඒ භාග්‍යවත්තෙම, ඉතිපි බුද්ධො අතීතානාගත වර්තමාන යන කාලත්‍රය වර්තීවූ සර්ව ධර්මයන් සර්වාකාරයෙන් දත්හෙයින් බුද්ධනම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි භගවා. සර්වකුශලාකුශල ධර්මයන් විභාගකළ හෙයින්ද ශීලසමාධ්‍යාදි සියලු ගුණධර්මයන් භාවිතාකළ හෙයින්ද මහත්වූ භාග්‍ය ඇති හෙයින්ද භාග්‍යවත් නම් වනසේක;

කිත්තාවතා පන භන්තෙ උපාසකො චාගසම්පන්නො හොතීති. ඉධ මහානාම උපාසකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො එත්තාවතා ඛො මහානාම උපාසකො චාගසම්පන්නො හොතීති.

කිත්තාවතා පන භන්තෙ උපාසකො පඤ්ඤාසම්පන්නො හොතීති ඉධ මහානාම උපාසකො පඤ්ඤවා හොති උදයබ්බයගාමිනියා පඤ්ඤාය සමන්නාගතො හොති අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා එත්තාවතාඛො මහානාම උපාසකො පඤ්ඤාසම්පන්නො හොතීති.

**මහානාම සුත්තං**
**"මහාවග්ග සංයුත්ත"**

---

කැයි; තථාගතස්ස, තථාගතයාගේ; සම්බොධිං, සම්‍යක් සම්බොධිය; සද්දහති, අදහා ද; මහානාම, මහානාමය; එත්තාවතා ඛො, මෙපමණකින් වනාහි; උපාසකො, උපාසකතෙම; සද්ධාසම්පන්නො හොතීති, ශ්‍රද්ධාවෙන් යුක්තවේ යයි; (වදාළසේක)

භන්තෙ, ස්වාමීන්වහන්ස; කිත්තාවතා පන, කොපමණකින් වනාහි; උපාසකො, උපාසකතෙම; චාගසම්පන්නො හොතීති, ත්‍යාගයෙන් යුක්තවේදැයි (විචාළේය) මහානාම, මහානාමය; ඉධ, මේ ලොකයෙහි; උපාසකො, උපාසකතෙම; විගතමල මච්ඡෙරෙන චෙතසා, පහවූ මසුරුමල ඇති පිරිසිදු සිතින්; අගාරං, ගිහිගෙයි; අජ්ඣාවසති, වාසය කෙරේ ද; මුත්තචාගො, ලොභයෙන් මිදුනු ත්‍යාගසිත් ඇත්තේවේද; පයතපාණී, දීමෙහි සුධකරණ ලද අත් ඇත්තේවේ ද; වොස්සග්ගරතො, ත්‍යාගයෙහි ඇළුනේවේද; යාචයොගො, ඉල්වන්ට සුදුස්සෙක්වේද; දානසංවිභාගරතො, දන්දීමෙහි හා බෙදාදීමෙහි ඇළුනේවේද; මහානාම, මහානාමය; එත්තාවතා ඛො, මෙපමණකින් වනාහි; උපාසකො, උපාසකතෙම; චාගසම්පන්නො හොතීති, ත්‍යාගයෙන් යුක්තවේයයි (වදාළසේක.)

භන්තෙ, ස්වාමීන්වහන්ස; කිත්තාවතා පන, කොපමණකින් වනාහි, උපාසකො, උපාසකතෙම; පඤ්ඤාසම්පන්නො හොතීති, ප්‍රඥාවෙන් යුක්තවේදැයි (විචාළේය.) මහානාම, මහානාමය; ඉධ මේ ලොකයෙහි; උපාසකො, උපාසකතෙම; පඤ්ඤවා හොති, ප්‍රඥාව ඇත්තේවේද; අරියාය, උතුම්වූ; නිබ්බෙධිකාය, නිර්වේදය පිණිස පවත්නාවූ;

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර-ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති උපාසකමලඤ්ච උපාසකපතිකිට්ඨො ච කතමෙහි පඤ්චහි අස්සද්ධො හොති දුස්සීලො හොති කොතූහලමඞ්ගලිකො ච හොති මඞ්ගලං පච්චෙති නො කම්මං ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති තත්ථ ච පුබ්බකාරං කරොති ඉමෙ

---

සම්මාදුක්ඛක්ඛයගාමිනියා, මනාකොට දුඃඛක්ෂය කිරීමට පැමිණියාවූ; උදයබ්බයගාමිණියා, පඤ්චස්කන්ධයන්ගේ පහළවීමද විනාශවීමද පිරිසිඳින්ට සමර්ථවූ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සමන්නාගතො, යුක්තවේද; මහානාම, මහානාමය; එත්තාවතාඛො, මෙපමණකින් වනාහි, උපාසකො, උපාසකතෙම: පඤ්ඤාසම්පන්නො හොතීති, ප්‍රඥාවෙන් යුක්තවේයයි (වදාළසේක.)

## මහානාම සුත්තං, මහානාම සූත්‍රයයි.

---

"මහාවග්ගෙ සංයුත්තෙ, සංයුත්සඟියෙහි මහාවගීයෙහිය"

මෙ, මා විසින්; එවං, මෙසේ, සුතං, අසන ලදී; එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහිවූ; ජේතවනෙ, ජේතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේ පිඬු සිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වාසය කරණසේක; තත්‍රඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනියි කියා; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රනය කළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු තුමූ; භදන්තෙති, පින්වතුන් වහන්සැයි කියා; භගවතො, භාග්‍ය වතුන් වහන්සේට; පච්චස්සොසුං ප්‍රතිවචන ඇස්වූහ; භගවා, භාග්‍ය වතුන් වහන්සේ; එතං, මෙය; අවොච, වදාළසේක; භික්ඛවෙ, මහණෙනි; පඤ්චහි ධම්මෙහි, (අගුණාඞ්ග) ධර්මපසකින්; සමන්නාගතො, යුක්තවූ; උපාසකො, උපාසකතෙම; උපාසක චණ්ඩාලො ච හොති, උපාසක චණ්ඩාලයෙක් ද වෙයි; උපාසකමලං ච, උපාසකමලයක් ද වෙයි; උපාසක පතිකිට්ඨො ච, උපාසක නීචයෙක්ද වෙයි; කතමෙහි පඤ්චහි, කවර (අගුණාඞ්ග) ධර්මපසකින්දයත්; අස්සද්ධොහොති, ශ්‍රද්ධාව නැත්තේවේද; දුස්සීලො හොති, දුශ්ශීලයෙක්වේ ද; කොතූහල මඞ්ගලිකො ච හොති, කුහුල් මගුල් ඇත්තේවේද; මඞ්ගලං, දෘෂ්ටාදී මඞ්ගලයය; පච්චෙති,බලාද; නො කම්මං, කර්මය නොබලාද; ඉතො ච බහිද්ධා, මේ ශාසනයෙන් පිටත්හිද; දක්ඛිණෙය්‍යං, දක්ෂිණාර්හයෙක්;

හි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක චණ්ඩාලො ච හොති උපාසක මලඤ්ච උපාසක පතිකිට්ඨො චාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති,

## උපාසක චණ්ඩාල සුත්තං.

එවමෙම සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොස්සුං භගවා එතදවොච, පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක රතනඤ්ච හොති උපාසක පදුමඤ්ච උපාසක

---

ගවෙසති, සොයාද; තත්‍ර ච, ඒ බාහිර තීර්ථකයන් සොරෙති; පුබ්බකාරං, පූජාදානසත්කාරය; කරොති, කෙරේද; භික්ඛවෙ, මහණෙනි; ඉමෙහි ඛො පංචහි ධම්මෙහි,. මේ අගුණාඞ්ග පංච ධර්මයන්ගෙන්; සමන්නාගතො, යුක්තවූ; උපාසකො, උපාසකතෙමේ උපාසක චණ්ඩාලො ච හොති, උපාසකචණ්ඩාලයෙක්ද වෙයි; උපාසකමලංච උපාසක මලයක් ද වෙයි; උපාසක පතිකිට්ඨො ච ඉති, උපාසක ලාමකයෙක්ද වේයයි. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මෙය: අවොච, වදාළසේක; අත්තමනා, සතුටු සිත් ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහුතුමු; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, භාසිතය; අභිනන්දුන්ති, විශෙෂයෙන් සතුටුවූවාහුය. නොහොත් සතුටින් පිළිගත්හු.

## උපාසක චණ්ඩාල සුත්තං, උපාසක චණ්ඩාල සූත්‍රයයි.

මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසනලද්දේය; එකං සමයං එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි වූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ, අනාථපිණ්ඩිකස්ස, අනේපිඬුසිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති වැඩවාසය කරණසේක. තත්‍රඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනියි කියා; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රනය කළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහුතුමූ; භදන්තෙති, පින්වතුන්වහන්සැයි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොස්සුං, ප්‍රතිවචන ඇස්වූහ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මෙය; අවොච, වදාළේය; භික්ඛවෙ, මහණෙනි; පංචහි ධම්මෙහි, (ගුණාඞ්ග) ධර්ම පසකින්; සමන්නාගතො, යුක්තවූ; උපාසකො, උපාසකතෙම; උපාසකරතනං ච හොති,

පුණ්ඩරීකො ච කතමෙහි පඤ්චහි සද්ධො හොති සීලවා හොති අකොතුහලමඞ්ගලිකො හොති කම්මං පච්චෙති නො මඞ්ගලං න ඉතොච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති ඉධ ච පුබ්බකාරං කරොති ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනඤ්ච හොති උපාසකපදුමඤ්ච උපාසකපුණ්ඩරීකොචාති–ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## උපාසක රතන සුත්තං.

එවම්මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ– තත්‍ර ඛො භගවා භික්ඛූ ආම

---

උපාසකරත්නයක් ද වෙයි; උපාසකපදුමං ච, උපාසකරක්ත පද්ම
යක්ද වෙයි; උපාසක පුණ්ඩරීකො ච, උපාසකහෙලපියුමක්ද වෙයි;
කතමෙහි, පංචහි, කවර(ගුණාඞ්ග) ධර්මපසකින්දයත්; සද්ධො හොති,
ශ්‍රද්ධාව ඇත්තේවේද; සීලවාහොති, සිල් ඇත්තේ වේද; අකොතු
හල මඞ්ගලිකො හොති, කුතුල් මගුල් නැත්තේවේද; කම්මං කර්මය;
පච්චෙති, බලාද; නො මඞ්ගලං, දෘෂ්ටශෘතාදි මඞ්ගල්‍යය නොබලාද;
ඉතො ච බහිද්ධා, මේ ශාසනයෙන් පිටත්හිද; දක්ඛිණෙය්‍යං, දක්ෂිණා
ර්හයෙක්; න ගවෙසති, නොසොයාද; ඉධච, මේ ශාසනයෙහිම; පුබ්බ
කාරං, පූර්වදාන කෘත්‍යය; කරොති, කෙරේද; භික්ඛවෙ, මහණෙනි;
ඉමෙහි ඛො පඤ්චහිධම්මෙහි, මේ (ගුණාඞ්ග) ධර්මපසින්; සමන්නා
ගතො,යුක්තවූ;උපාසකො,උපාසකතෙම; උපාසකරතනං ච හොති,
උපාසක රත්නයක්ද වෙයි; උපාසක පදුමං ච, උපාසකරක්තපද්ම
යක්ද වෙයි; උපාසක පුණ්ඩරීකො ච ඉති, උපාසක හෙලපියුමක්ද
වේයයි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මෙය; අවොච, වදළ
සේක; අත්තමනා, සතුටුසිත් ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු තුමූ;
භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; භාසිතං, භාසිතය; අභි
නන්දුන්ති, සතුටු සිතින් පිළිගත්හු.-

## උපාසක රතන සුත්තං, උපාසක රත්න සූත්‍රයයි.

මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලද්දේය; එකං සමයං, එක්කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වාසය කරණසේක; තත්‍රඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍ය

න්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, පඤ්චිමානි භික්ඛවෙ වණිජ්ජානි උපාසකෙන අකරනීයානි කතමානි පඤ්ච සත්ථවණිජ්ජා සත්තවණිජ්ජා මංසවණිජ්ජා මජ්ජවණිජ්ජා විසවණිජ්ජා ඉමානි ඛො භික්ඛවෙ පඤ්චවණිජ්ජානි උපාසකෙන අකරණීයානීති- ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## වණිජ්ජ සුත්තං .

---

ඉමානි තීනි සුත්තානි පඤ්චකඞ්ගුත්තරෙ.

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බා රාමෙ මිගාරමාතුපාසාදෙ, අථඛො විසාඛා මිගාරමාතා තදහුපො

---

වතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනියි කියා; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රනය කළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂුහු තුමූ; භදන්තෙති, පින්වතුන් වහන්සැයි කියා; භගවතො, භාග්‍ය වතුන් වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන ඇස්වූහ; භගවා, භාග්‍ය වතුන් වහන්සේ; එතං, මෙය; අවොච, වදාළසේක; භික්ඛවෙ, මහණෙනි; උපාසකේන, උපාසකයා විසින්; අකරණීයානි, නො කටයුතුවූ; වණිජ්ජානි, වෙළඳම්; ඉමානි පංච, මොහු පස්දෙනෙක් වෙත්; කතමානි පංච, කවර පස්දෙනෙක් ද යත්; සත්ථවණිජ්ජා, ආයුධ වෙළඳමය; සත්තවණිජ්ජා, මනුෂ්‍ය වෙළඳමය; මංසවණිජ්ජා, මස් පිණිස සතුන් වෙළඳමය; මජ්ජවණිජ්ජා, මත්පැන් වෙළඳමය; විස වනිජ්ජා, විෂවර්‍ග වෙළඳමය; භික්ඛවෙ, මහණෙනි; ඉමානි ඛො පංච වණිජ්ජානි, මේ වෙළඳම්පස; උපාසකෙන, උපාසකයා විසින්; අකරණීයානීති, නොකටයුතුයයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මෙය; අවොච, වදාළසේක; අත්තමනා, සතුටු සිත් ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂුහුතුමූ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, භාසිතයට ;අභිනන්දුන්ති, විශෙෂයෙන් සතුටුවූවාහුය.

## වණිජ්ජ සුත්තං, වණිජ්ජ සූත්‍රයයි.

---

"ඉමානි තීනි සුත්තානි, මේ සූත්‍ර තුන; පඤ්චකඞ්ගුත්තරෙ, අඞ්ගොත්තර සඟියෙහි පස්වන නිපාතයෙහිය."

මෙ, මාවිසින්; එවං, මෙසේ; සුතං, අසනලද්දේය; එකං සමයං, එක්කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහි වූ; මිගාරමාතුපාසාදෙ, මිගාරමාතෘ ප්‍රාසාද නාම්වූ පුබ්බාරාමෙ, පූර්වාරාමයෙහි; විහරති, වැඩවාසය කරණ සේක; අථ ඛො, ඉක්බිත්තෙන්; මිගාරමාතා, මිගාරමාතෘවූ; විසාඛා, විසාඛා තොමෝ; තදහුපොසථෙ, එදවස් පොහෝයෙහි; භගවා, භාග්‍යවතු

සථෙ යෙන භගවා තෙනුපසඞ්කමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච– හන්ද කුතො නු ත්වං විසාඛෙ ආගච්ඡසි දිවාදිවස්සාති උපොසථාහං භන්තෙ අජ්ජ උපවසාමීති. තයො ඛො මෙ විසාඛෙ උපොසථා කතමෙ තයො; ගොපාලකූපොසථො නිගණ්ඨුපොසථො අරියූපොසථො.

කථඤ්ච විසාඛෙ ගොපාලකූපොසථො හොති සෙය්‍යථාපි විසාඛෙ ගොපාලකො සායණ්හසමයං සාමිකානං ගාවො නිය්‍යාදෙත්වා ඉති පටිසඤ්චික්ඛති අජ්ජ ඛො ගාවො අමුකස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ චරිංසු අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ පානියානි අපංසු සෙවදානි ගාවො අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ චරිස්සන්ති අමු

---

න්වහන්සේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹියාය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක්හි; නිසීදි; උන්නාය; එකමන්තං, එකත්පසෙක්හි; නිසින්නං ඛො, උන්නාවූ; මිගාරමාතරං, මිගාරමාතෘවූ; විසාඛං, විසාඛා උපාසිකාවට; භගවා භාග්‍යවතුන් වහන්සේ; එතං, මෙය: අවොච, වදාළේය; විසාඛෙ, විසාඛාව හන්ද, කිමෙක්ද; ත්වං, තී දිවාදිවස්ස, දවසගේ දවල්; කුතොනු, කොහැතකින්; ආගච්ඡසි ඉති, ආයෙහිදැයි; (හෙවත්) කුතොනු ආගච්ඡසි ඉති, කුමක් කරමින් හැසිරෙන්නෙහි දැයි; (විචාළසේක.) භන්තෙ, ස්වාමීන් වහන්ස; අහං, මම; අජ්ජ, අද; උපොසථං, උපොෂිතයට; උපවසාමි, එළඹ වාසය කෙරෙමියි; (කීවාය) විසාඛෙ, විසාඛාව; ඉමෙඛො, තයො; උපොසථා, මේ උපොෂිතයූ තෙක්වෙත්; කතමෙ තයො, කවරතුනෙක්ද යත්; ගොපාලකූපොසථො, ගොපාලක උපොෂිතය; නිගණ්ඨුපොසථො, නිගණ්ඨ උපොෂිතය; අරියූපොසථො, ආර්‍ය්‍ය උපොෂිතය, (යන මොහුය.)

විසාඛෙ, විසාඛාව; ගොපාලකූපොසථො, ගොපාලක උපොෂිතය; කථං ච හොති, කෙසේවේ ද; විසාඛෙ, විසාඛාව; සෙය්‍යථාපි, යම්සේ; ගොපාලකො, ගවපාලතෙම; සායණ්හසමයං, සවස්කාලයෙහි; සාමිකානං, ස්වාමියන්ට; ගාවො, ගවයන්; නිය්‍යාදෙත්වා, පාවාදී; අජ්ජ ඛො, අදවනාහි; ගාවො, ගවයෝ; අමුකස්මිං ච අමුකස්මිං ච පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙසයෙහි; චරිංසු, තෘණ අනුභව කළාහුය; අමුකස්මිං ච අමුකස්මිං ච පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි; පානීයානි, පැන්; අපංසු, පානය කළාහුය; ඉදානි, දැන්; සෙව, සෙට; ගාවො,

කස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ පානීයානි පිවිස්සන්තීති. එවමෙව ඛො විසාඛෙ ඉධෙකච්චො උපොසථිකො ඉති පටිසංචික්ඛති අහං ඛ්වජ්ජ ඉදංචිදංච ඛාදනීයං ඛාදිං ඉදංචිදංච භොජනීයං භුඤ්ජිං ස්වාහං ඉදංචිදංච ඛාදනීයං ඛාදිස්සාමි ඉදංචිදංච භොජනීයං භුඤ්ජිස්සාමීති සො තෙන ලොභෙන අභිජ්ඣාසහගතෙන චෙතසා දිවසං අතිනාමෙති එවං ඛො විසාඛෙ ගොපාලකූපොසථො හොති එවං උපවුත්ථො ඛො විසාඛෙ ගොපාලකූපොසථො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහා විප්ඵාරො.

---

ගවයෝ, අමුකස්මිං ච අමුකස්මිං ච පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි, චරිස්සන්ති, තෘණ අනුභව කරන්නාහුය; අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි; පානීයානි, පැන්; පිවිස්සන්තීති, පානය කරන්නාහුයයි; ඉති, මෙසේ; පටිසංචික්ඛති, කල්පනා කෙරෙයි; විසාඛෙ, විසාඛාව; එවං එව ඛො, එපරිද්දෙන්ම ඉධ, මේ ලොකයෙහි; එකච්චො, සමහර; උපොසථිකො, උපොෂථිකයෙක් තෙම; අජ්ජ, අද; අහං ඛො, මම වනාහි; ඉදංච ඉදංච ඛාදනීයං, මේ මේ කෑයුතුදෙයද; ඛාදිං, කෑවෙමි; ඉදංච ඉදංච භොජනීයං, මේ මේ අනුභව කටයුතු දෙයද; භුඤ්ජිං, අනුභව කෙළෙමි; ඉදානි, දැන්; අහං, මම, ස්වෙ, සෙට; ඉදංච ඉදංච ඛාදනීයං, මේ මේ කෑයුතුදෙය ද; ඛාදිස්සාමි, කන්නෙමි; ඉදංච ඉදංච භොජනීයං, මේ මේ අනුභව කටයුතුදෙය ද, භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමි යි; ඉති පටිසංචික්ඛති, මෙසේ කල්පනා කෙරෙයි; සො, හෙතෙම; තෙන, ඒ; ලොභෙන, ගිජුවීමවූ; අභිජ්ඣාසහගතෙන, අභිධ්‍යාවසමඟ ගියාවූ; චෙතසා, සිතින්; (යුක්තව) දිවසං, දවස; අතිනාමෙති, ඉක්මවයි; විසාඛෙ, විසාඛාව; එවං ඛො, මෙසේ වනාහි; ගොපාලක උපොසථො හොති, ගොපාලක උපොෂිතයවෙයි; විසාඛෙ, විසාඛාව; එවං, මෙසේ; උපවුත්ථො, වැස නිමවන ලද්දාවූ; ගොපාලක උපොසථො ඛො, ගොපාලක උපොෂිතය වනාහි; මහප්ඵලො න හොති, මහත්ඵල නොවෙයි; න මහානිසංසො, මහත් අනුසස් ඇති නොවෙයි; න මහාජුතිකො, මහත් බැබලීම ඇත්තේ නො වෙයි; න මහාවිප්ඵාරො; (විපාකයන්ගේ) මහත් පැතිරීම් ඇත්තේ නොවෙයි; විසාඛෙ, විසාඛාව: නිගණ්ඨ උපොසථො, නිගණ්ඨ උපොෂිතය තෙම; කථංච හොති, කෙසේවේ ද? ; විසාඛෙ, විසාඛාව; නිගණ්ඨා නාම, නිගණ්ඨයෝ නම්; සමණ ජාති, ශ්‍රමණ ජාතියක්; අත්ථි, ඇත්තේය; තෙ, ඔවුහු; සාවකං, (තමන්ගේ) ශ්‍රාවකයා; එවං, මෙසේ; සමාදපෙන්ති, සමාදන්කර

කථං ච විසාඛෙ නිගණ්ඨුපොසථො හොති අත්‍ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාතිකා තෙ තදහුපොසථෙ සාවකං එවං සමාදපෙන්ති එහි ත්‍වං අම්භොපුරිස යෙ පුරත්‍ථිමාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහි යෙ පච්ඡිමාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහි යෙ උත්තරාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහි යෙ දක්ඛිණාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහිති ඉති එකච්චානං පාණානං අනුද්දයාය අනුකම්පාය සමාදපෙන්ති එකච්චානං පාණානං නානුද්දයාය නානුකම්පාය සමාදපෙන්ති තෙ තදහුපොසථෙ සාවකං එවං සමාදපෙන්ති එහි ත්‍වං අම්භො පුරිස සබ්බවෙරාණි නික්ඛිපිත්‍වා එවං වදෙහි නාහං ක්‍වචනි කස්සචි කිංචනං තස්මිං නච මම ක්‍වචනි කත්‍ථචි කිංචන තත්‍ථීති.

---

වත්; අම්භොපුරිස, එම්බල පුරුෂය; ත්‍වං, තෝ; එහි; (මෙහි) එව; පුරත්‍ථිමාය දිසාය, පූර්වදිශාවෙහි; යොජනසතං පරං, යොදුන් සියයකින් ඈත; යෙ පාණා; යම් ප්‍රාණීහු කෙනෙක් ඇත්තාහු ද; තෙසු ඔවුන් කෙරෙහි; දණ්ඩං, දඬුවම නික්ඛිපාහි, නික්ෂෙප කරව; පච්ඡිමාය දිසාය, පශ්චිම දිසාවෙහි; යොජනසතං පරං, යොදුන් සියයකින් ඈත; යෙපාණා යම් සත්‍වකෙනෙක් ඇත්තාහුද; තෙසු, ඒ සත්‍වයන් කෙරෙහි; දණ්ඩං, දඬුවම; නික්ඛිපාහි, බහා තබව; උත්තරාය දිසාය, උතුරු දිසාවෙහි; යොජනසතං පරං, යොදුන් සියයකින් ඈත; යෙ පාණා, යම් ප්‍රාණීහු කෙනෙක් ඇත්තාහු ද; තෙසු, ඒ ප්‍රාණීන් කෙරෙහි; දණ්ඩං, දඬුවම; නික්ඛිපාහි, නික්ෂෙපකරව; දක්ඛිණාය දිසාය, දකුණු දිසාවෙහි; යොජනසතං පරං යොදුන් සියයකින් ඈත; යෙ පාණා, යම් ප්‍රාණීහු ඇත්තාහු ද, තෙසු, ඔවුන් කෙරෙහි; දණ්ඩං, දඬුවම; නික්ඛිපාහි ඉති, තබවයි; ඉති, මෙසේ; එකච්චානං, ඇතැම්; පාණීනං, ප්‍රාණීන්ට; අනුද්දයාය, කරුණාවෙන්; අනුකම්පාය, අනුකම්පාවෙන්; සමාදපෙන්ති, සමාදන් කරවත්; එකච්චානං පාණානං, ඇතැම් ප්‍රාණීන්ට; න අනුද්දයාය, කරුණාව නොමැතිවීමෙන්; න අනුකම්පාය, අනුකම්පා රහිතවීමෙන්; සමාදපෙන්ති, සමාදන් කරවත්; තෙ, ඒ නිගණ්ඨයෝ; තදහුපොසථෙ, ඒ පොහෝ දවසෙහි; සාවකං, (තමාගේ) ශ්‍රාවකයාට; එවං; මෙසේ; සමාදපෙන්ති, සමාදන් කරවත්; (ඒ මෙසේයි) අම්භොපුරිස, බලපුරුෂය; ත්‍වං, තෝ; එහි; මෙහි එව; සබ්බවෙරානි, සියළු අකුසලයන්; නික්ඛිපිත්‍වා, නික්ෂෙප කොට; එවං, මෙසේ; වදෙහි, කියව; අහං, මම; ක්‍වචනි, කිසිතැනෙක්හි; කස්සචි, කිසිවෙක්හටත්; කිංචන, පළිබෝධයෙක් වේ ද; තස්මිං, ඒ පළිබොධයෙහි; න, නොවෙමි; (හෙවත්) නො පවතිමි; මම, මාගේ; ක්‍වචනි, (ඇතුලත පිටත) කිසි

ජානන්ති ඛො පනස්ස මාතාපිතරො අයං අම්හාකං පුත්තොති. සොපි ජානාති ඉමෙ මය්හං මාතාපිතරොති ජානන්ති ඛො පනස්ස පුත්තදාරා අයං අම්හාකං භත්තාති සොපි ජානාති ඉමෙ මය්හං පුත්තදාරාති ජානන්ති ඛො පනස්ස දාසකම්මකරපොරිසා අයං අම්හාකං අය්‍යොති සොපි ජානාති ඉමෙ මය්හං දාස කම්මකරපොරිසාති ඉති යස්මිං සමයෙ සච්චෙ සමාදපෙතබ්බා මුසාවාදෙ තස්මිං සමයෙ සමාදපෙන්ති ඉදමස්ස මුසාවාදස්මිං වදාමි,

සො තස්සා රත්තියා අච්චයෙන තෙ භොගෙ අදින්නං යෙව පරිභුඤ්ජති ඉදමස්ස අදින්නා දානස්මිං වදාමි, එවං ඛො විසාඛෙ.

---

නැහැසත්; කිඤ්චනතා, පලිබොධබවක්; නාචඅත්ථිති, නොමැත්තේ යයි; (යනුයි) අස්ස ඛො පන, ඒ නිගණ්ඨශ්‍රාවකයාගේ වනාහි; මාතාපිතරො, මවුපියෝ; අයං, මේතෙම; අම්හාකං, අපගේ; පුත්තො ඉති, පුත්‍රයයි; ජානන්ති, දනිත්; සො අපි, හේතෙමේද; ඉමෙ මොහුදෙදෙන; මය්හං, මාගේ; මාතා පිතරොඉති, මවුපියෝයයි; ජානාති, දනියි; අස්ස ඛො පන, ඔහුගේ වනාහි; පුත්තදාරා, අඹුදරුවෝ; අයං, මේතෙම; අම්හාකං, අපගේ; භත්තා ඉති, ස්වාමියයි; ජානන්ති, දනිත්; සොපි, හේතෙමේද; ඉමෙ, මොහුනුම්; මය්හං, මාගේ; පුත්තදාරාති, පුත්‍රදාරවෝයයි; ජානාති, දනියි; අස්ස ඛො පන, ඔහුගේ වනාහි; දාසකම්මකරපොරිසා, දස්කම්කරු පුරුෂයෝ; අයං, මේතෙම; අම්හාකං, අපගේ; අය්‍යොති, ස්වාමි යයි; ජානන්ති, දනිත්; සො අපි, හේතෙමේද; ඉමෙ, මොව්හු; මය්හං, මාගේ; දාසකම්මකරපොරිසාති, දස් කම්කරු පුරුෂයෝ යයි; ජානාති, දනියි; ඉති, මෙසේ; යස්මිං සමයෙ, යම්කලෙක්හි; සච්චෙ, සත්‍යයෙහි; සමාදපෙතබ්බා, සමාදන්කරවියයුත්තාහුද; තස්මිං සමයෙ, ඒ කාලයෙහි; මුසාවාදෙ, බොරුකිමෙහි; සමාදපෙන්ති, සමාදන්කරවත්; ඉදං, මේතෙම; අස්ස ඒ නිගණ්ඨශ්‍රාවකයාගේ; මුසාවාදස්මිං, මෘෂාවාදයයි; වදාමි, කියමි;

සො, ඒ (නිගණ්ඨ) ශ්‍රාවක තෙම; තස්සා රත්තියා, ඒ රාත්‍රියගේ; අච්චයෙන, ඇවෑමෙන්; (හෙවත්) රෑපාන්වගිය කල්හි; අදින්නං එව, (කිසිවක්හුවිසින්;) නුදුන්නාවූ ම; තෙ භොගෙ, (ඇඳපුටු කෑදබත් ආදි) ඒ භොගයන්; පරිභුඤ්ජති, (දෙවන දවස්හිගෙණ) අනුභව කරයි; ඉදං, මේතෙම; අස්ස, ඒ නිගණ්ඨශ්‍රාවකයාගේ

නිගණ්ඨුපොසථො හොති එවං උපවුත්ථො ඛො විසාඛෙ නිගණ්ඨුපොසථො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො.

කථඤ්ච විසාඛෙ අරියූපොසථො හොති උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති තස්ස තථාගතං අනුස්සරතො.

---

අදින්නාදානස්මිං, අදත්තාදානයයි; වදමි, කියමි; විසාඛෙ, විශාඛාව; එවං ඛො, මෙසේවනාහි; නිගණ්ඨුපොසථො හොති, නිගණ්ඨ උපෝෂථය වේ; විසාඛෙ, විශාඛාව; එවං උපවුත්ථො ඛො, මෙසේ සමාදන්ව විසූ; නිගණ්ඨුපොසථො, නිගණ්ඨඋපෝෂථය තෙම; න මහප්ඵලො හොති, (විපාකඵලහෙයින්) මහත්ඵල ඇත්තේ නොවේ; න මහානිසංසො, (විපාකානිසංශවශයෙන්) මහත්වූ අනුසස් ඇත්තේ නොවේ; න මහාජුතිකො, (විපාකාලොකහෙයින්) මහත්වූ ආලොක ඇත්තේ නොවෙයි; න මහාවිප්ඵාරො, (විපාකස් ඵරණයෙන්) මහත් පැතිරීම් ඇත්තේ නොවෙයි;

විසාඛෙ විශාඛාව; අරියූපොසථො, ආර්‍ය්‍යඋපෝෂථයතෙම; කථඤ්ච හොති, කෙසේ වේ ද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, (කාමච්ඡන්ද නීවරණාදි පඤ්චා ක්ලේශයන් විසින්) උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, (වෙනවෙනම පැවති පුරුෂ වික්‍රමයෙන් නොහොත් උපායෙන්; පරියොදපනා හොති, පිරිසිදු කිරීම වෙයි; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීමවේ ද; විශාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; තථාගතං අනුස්සරති, (ඉතිපි සො භගවා–පෙ–බුද්ධොභගවා, යී තථාගතයන් වහන්සේගේ (නවඅරහාදි) ගුණසිහිකරයි, (කෙසේද) සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි අරහං, මේ කාරණයෙනුදු අර්හත් නම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි සම්මා සම්බුද්ධො, මේ කාරණයෙන් සම්‍යක්සම්බුද්ධ නම් වනසේක;

චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති කක්කඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති, එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

---

සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි විජ්ජාචරණ සම්පන්නො, මේ කාරණයෙනුදු විජ්ජාචරණ සම්පන්න නම් වන සේක; සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි සුගතො, මේ කාරණයෙනුදු සුගත නම්වනසේක; සො භගවා, ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි ලොකවිදූ, මේ කාරණයෙනුදු; ලොකවිදූ නම් වනසේක; සො භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි මේ කාරණයෙනුදු; අනුත්තරො පුරිසදම්ම සාරථී, නිරුත්තර පුරුෂදම්‍ය සාරථිනම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි සත්ථා දෙවමනුස්සානං, මේ කාරණයෙනුදු දිව්‍යමනුෂ්‍යයන්ට ශාස්තෘනම් වන සේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි බුද්ධො, මේ කාරණයෙනුදු බුද්ධනම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි භගවා, මේ කාරණයෙනුදු; භගවත්නම් වනසේක; එවං, මෙසේ; තථාගතං, තථාගතයන් වහන්සේ; අනුස්සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කෙනෙක් ඇද්ද; තෙ, ඔව්හු; පහීයන්ති ප්‍රහීණවෙත්;

විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස, (රජොජල්ලිකාදීන්) උපක්ලිෂ්ටවූ; සීසස්ස, ශිෂියාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, නිර්මලකිරීමවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; සීසස්ස

තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති, අයං වුච්චති විසාඛෙ අරියසාවකො බ්‍රහ්මුපොසථං උපවසති බ්‍රහ්මුනා සද්ධිං සංවසති බ්‍රහ්මඤ්චස්ස ආරබ්භ චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

ශිෂ්‍යයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ නිර්මලකිරීමවේ ද; විසාඛෙ, විශාඛාව; කක්කඤ්ච පටිච්ච, (නෙල්ලි) කල්කයනිසා ද; මත්තිකඤ්ච පටිච්ච, මැටිනිසා ද; උදකඤ්චපටිච්ච, දියනිසා ද; පුරිසස්ස පුරුෂයාගේ; තජ්ජං වායාමංච පටිච්ච, (මක්ෂණසම්ඣනාදි) ඊට සුදුසු ව්‍යායාමය නිසා ද; උපක්කිලිට්ඨස්ස සීසස්ස, උපක්ලිෂ්ටවූ ශිෂ්‍යයාගේ; උපක්කමෙන, උපායෙන්; එවං ඛො, මෙසේ වනාහි; පරියොදපනා හොති, නිර්මල කිරීමවෙයි; විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන් ම උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන; උපක්‍රමයෙන්; පරියොදපනා හොති, නිර්මල කිරීම වේ; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ නිර්මල කිරීමවේ ද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවක තෙම; තථාගතං, තථාගතයන් වහන්සේ; අනුස්සරති, සිහිකෙරෙයි; (ඒ මෙසේයි ඉතිපි සො භගවා අරහං–පෙ–බුද්ධො භගවාති) තථාගතං, තථාගතයන් වහන්සේ; අනුස්සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, ප්‍රසන්නවෙයි; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, (නීවරණාඛ්‍ය) යම් උපක්ලෙශකෙනෙක් ඇද්ද; තෙ, ඔහුතුමූ; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; අයං අරියසාවකො, මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම; බ්‍රහ්මුපොසථං, (ශ්‍රෙෂ්ඨාර්ථයෙන් බ්‍රහ්මයයි කියනලද බුද්ධගුණස්මරණ වශයෙන්) බ්‍රහ්මඋපෝෂථයට; උපවසති, එළඹ වාසය කෙරෙයි; (කියාද) බ්‍රහ්මුනාසද්ධිං, (උත්තමාර්ථයෙන් බ්‍රහ්මනම්වූ) බුදුරජාණන් වහන්සේ හා සමඟ; සංවසතීති, වාසයකෙරේයයි; (කියාද,) වුච්චති, කියනු ලැබේ;

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති ස්වාඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. තස්ස ධම්මං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති.

---

බ්‍රහ්මංආරබ්භ, සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ අරබයා; අස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති උපදී; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, (නීවරණාඛ්‍ය) යම් උපක්ලේශ කෙනෙක් ඇද්ද; තෙ, ඔහුතුමූ; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව, උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; එවං, මෙසේ; පරියොදපනා හොති, පිරිසිදු කිරීමවෙයි;

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, (පඤ්චනීවරණයන් විසින්) උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, පිරිසිදු කිරීම වෙයි; විසාඛෙ; විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීමවේ ද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; ධම්මං, ධර්මය; අනුස්සරති, සිහිකෙරෙයි; (ඒ කෙසේද) භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; ධම්මො, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මයතෙම; ස්වාඛාතො, මොනවට දෙශනාකරන ලද්දේය; සන්දිට්ඨිකො, තමන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් දතයුතුය; අකාලිකො, තමාගේ ඉපදීමට අනතුරුවම ඵලප්‍රදානය කරන හෙයින් අකාලිකය; එහිපස්සිකො, (ස්වභාවයෙන් විද්‍යමාන හෙයින්ද විශෙෂයෙන් පිරිසිදු හෙයින්ද) වරබල යන මේ විධියට සුදුසුය; ඔපනයිකො, භාවනා වශයෙන් ස්වසන්තානයෙහි ඉපදීමටද ආලම්බණය කරන වශයෙන් සිත) එලවීමටද සුදුසුය; විඤ්ඤූහි, (උද්ඝටිතාදි සියලු) ප්‍රාඥයන් විසින්; පච්චත්තං, වෙන වෙනම; වෙදිතබ්බොති, දතයුත්තේයයි; ධම්මං, (සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර)

සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස, කායස්ස උපක්කමෙන පරියොදපනා හොති සොත්ථිඤ්ච පටිච්ච චුණ්ණඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච, එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙවඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති ස්වාඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපන යිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති, තස්ස ධම්මං අනුස්ස රතො චිත්තං පසීදති පාමුජ්ජං උපපජ්ජති යෙ චිත්තස්ස උපක්කි ලෙසා තෙ පහීයන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො ධම්මු පොසථං උපවසති ධම්මෙන සද්ධිං සංවසති ධම්මඤ්චස්ස ආරබ්භ චිත්තං පසීදති පාමුජ්ජං උපපජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

ශ්‍රීසද්ධර්මය; සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමෝද්‍යය; උපපජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශ කෙණෙක් ඇද්ද; තෙ, ඔව්හු; පහීයන්ති ප්‍රහීණවෙත්;

විසාඛෙ, විශාඛාව, සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; කායස්ස, ශරීරයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, පිරිසිදු කිරීම වේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, (සෙවදජල්ලිකාදීන්) උපක්ලිෂ්ටවූ; කායස්ස, ශරීරයාගේ; උපක්කමෙන, උපායෙන්; කථං පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීම වේද; විසාඛෙ, විශාඛාව; සොත්ථිඤ්ච පටිච්ච, කුරුඳුවැලි නිසාද; උදකඤ්ච පටිච්ච, ජලය නිසාද; පුරිසස්ස, පුරුෂයාගේ; තජ්ජං වායාමඤ්ච පටිච්ච, (ඝර්ෂණාදී) ඊට සුදුසු ව්‍යායාමය නිසාද; උපක්කිලිට්ඨස්ස කායස්ස, උපක්ලිෂ්ටවූ ශරීරයාගේ; උපක්කමෙන, උපායෙන්; එවං පරියොදපනා හොති, මෙසේ නිර්මලකිරීම වෙයි; විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, රාගාදීන්) කෙලෙසුනාවූ, චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; පරියොදපනා හොති, නිර්මලකිරීම වෙයි;

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටි පන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති - තස්ස සඞ්ඝං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති.

---

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීමවේ ද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආය්‍ය්‍යශ්‍රාවකතෙම; සංඝං, සංඝයා; අනුස්සරති, සිහිකෙරේද; (කෙසේද) භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසංඝො, (යාමත්‍රයමුඛයෙන් දෙශනාකරනලද ධර්‍මශ්‍රවණාත්තිජාතවූ හෙයින් ශ්‍රාවකනම්වූ) අෂ්ටාය්‍ය්‍යපුද්ගල සංඝතෙම; සුපටිපන්නො, මනාව පිළිපන්නේය; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසංඝො ශ්‍රාවක සංඝතෙම; උජුපටිපන්නො, (නඞ්ගලවංක අඩ්ඩචන්ද්‍රවංකාදීන් විරහිතව) සෘජුව (මධ්‍යම ප්‍රතිපත්තියෙන්) පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසංඝො, ශ්‍රාවකසංඝතෙම; ඤායපටි පන්නො, නිවන් පිණිස පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසංඝො, ශ්‍රාවකසංඝතෙම; සාමීචිපටිපන්නො, නිර්‍වාණානුකූල ප්‍රතිපත්තියට පිළිපන්නේය; (ඔහු කවරහයත්) යදිදං චත්තාරි පුරිසයුගානි, යම් මේ පුරුෂයුග සතරක් ඇද්ද; (ඔහුනම් සොවාන්මාර්‍ගස්ථවූද, සොවාන්ඵලස්ථවූද; එක් යුගල යෙක සකෘදාගාමි මාර්‍ගස්ථවූද, ඵලස්ථවූද; එකයුගලයෙක අනාගාමි මාර්‍ගස්ථවූද, ඵලස්ථවූද; එක් යුගලයෙක රහත්මාර්‍ගස්ථ වූද, ඵලස්ථවූද; එක් යුගලයෙක යන මොහු සතරපුරුෂ යුගල යෝයි) යදිදං අට්ඨපුරිසපුග්ගලා; යම් මේ අෂ්ටපුරුෂ පුද්ගල කෙණෙක් ඇද්ද; (ඔහුනම්) ශ්‍රොතාපත්ති මාර්‍ගසමංගි එකෙක ඵලයෙහිද පිහිටි එකෙක, යනාදීන් දක්වනලද අෂ්ටාය්‍ය්‍ය පුද්ගල

සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති උසුමඤ්ච පටිච්ච ඛාරඤ්ච පටිච්ච ගොමයඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

කොණෙක් ඇද්ද; භගවතො, බුදුන්ගේ; එසො සාවකසංඝො, මේ ශ්‍රාවකසංඝතෙම; ආහුනෙය්‍යො, දුරිනුදුගෙණ හැර දියයුතුවූ සිවුපස දනයට සුදුසුය; පාහුනෙය්‍යො, අමුතුපඬුරු පිළිගන්ට සුදුසුය; හෙවත් (කම්ඵල අදහා සකස්කොට සරහාදෙන) අමුතු මහදන් පිළිගන්ට සුදුසුය; දක්ඛිණෙය්‍යො (පරලොව අදහා දියයුතු දනප්‍රතිග්‍රහණයට සුදුසුය; අඤ්ජලිකරණීයො, (සියලුලෝවැස්සන් විසින් දෙහොත් මුදුනෙහිතබා කරන) නමස්කාරයට සුදුසුය; ලොකස්ස, (සමස්ත) ලොකයාහට; අනුත්තරං, නිරුත්තරවූ; හෙවත් උතුම්වූ; පුඤ්ඤක්ඛෙත්තං ති, පුණ්‍යක්ෂෙත්‍රයෙකැයි, හෙවත් කුසල්බිජු හටගන්නා කෙතකැයි කියා, සංඝං, අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසංඝයා (ගේගුණ) අනුස්සරති, සිහිකෙරෙයි; සංඝං, සංඝයා (ගේගුණ;) අනුස්සරතො, සිහි කරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයා සම්බන්ධවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කොණෙක් ඇද්ද; තෙ, ඔවුහු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, කෙලසුනු; වත්ථස්ස, වස්ත්‍රයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; සෙය්‍යථාපි, යම්සේ; පරියොදපනා හොති; පිරිසිදු කිරීමවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, කෙලසුනු; වත්ථස්ස, වස්ත්‍රයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ නිෂ්කලංක කිරීමවේද; විසාඛෙ, විශාඛාව; උසුමඤ්ච පටිච්ච, (දෙතුන්වරෙක ග්‍රහණය කරනලද) උෂ්ණයනිසාද; ඛාරඤ්ච පටිච්ච, අළුනිසාද; ගොමයඤ්ච පටිච්ච, ගොමනිසාද නොහොත්, ගොමූත්‍රහා එළබෙටිනිසාද; උදකඤ්ච පටිච්ච, දියනිසාද; පුරිසස්ස, පුරුෂයාගේ; තජ්ජං වායාමඤ්ච පටිච්ච, ඊටසුදුසුවූ ව්‍යායාමය නිසාද; විසාඛෙ විශාඛාව; උපක්කිලිට්ඨස්ස, කෙලෙසුනු; වත්ථස්ස වස්ත්‍රයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; එවං ඛො

එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, ඉධ විසාඛෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති–තස්ස සඞ්ඝං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො සංඝුපොසථං උපවසති සඞ්ඝෙන සද්ධිං සංවසති සඞ්ඝඤ්චස්ස ආරබ්භ චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

පරියොදපනා හොති, මෙසේ පිරිසිදු කිරීමවෙයි විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන් ම; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, පිරිසිදුකිරිම වෙයි; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; කථං, කෙසේ; පරියොදපනා හොති, නිර්මලකිරීම වේද? විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; සංඝං, ආර්‍ය්‍යසංඝයා; අනුස්සරති, සිහිකෙරෙයි; (ඒමෙසේයි.) සුපටිපන්නො භගවතො සාවකසංඝො, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝතෙම මනාව පිළිපන්නේය; යනාදීන් සිහිකෙරේ) සංඝං, සංඝයා (ගේගුණ) අනුස්සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, ප්‍රසන්නවෙයි; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ, යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශකෙනෙක් ඇද්ද; තෙ පහීයන්ති, ඔහු ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; අයං අරියසාවකො, මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; සංඝුපොසථං, සංඝ උපොසථයට; උපවසති, එළඹවාසයකෙරෙයි; සංඝෙන සද්ධිං,

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, ඉධ විසාඛෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි තස්ස සීලං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති-

---

සංඝයා හා; සංවසති, එක්ව වාසයකෙරේයයි; වුච්චති, කියනු ලැබෙයි; සංඝං, සංඝයා (ගේගුණ) ආරබ්භ; අරබයා; අස්සා මොහුගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය, උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයාසම්බන්ධීවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශකෙණෙක් ඇද්ද; තෙ, ඔවුහු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; එවං ඛො, මෙසේ වනාහි; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, පිරිසිදු කිරීම වේ.

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන් පරියොදපනා හොති, නිර්මලකිරීමවේ; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීමවේද? විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම; අත්තනො, තමාගේ; අඛණ්ඩානි, නොකඩවූ; අච්ඡිද්දානි, නොසිදුරුවූ; අසබලානි, බල සහිතනොවූ නොහොත් කබරනොවූ; අකම්මාසානි, කැලලක් නැත්තාවූ; භුජිස්සානි, නිදහස්වූ; විඤ්ඤුප්පසත්ථානි, නුවණැත්තන් විසින් ප්‍රශංසාකරන ලද්දවූ; අපරාමට්ඨානි, තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනා විසින් පරාමර්ශනය නොකරනලද්දවූ; සමාධිසංවත්තනිකානි; සමාධිය පිණිස පවත්නාවූ; සීලානි, සීලයන්; අනුස්සරති, අනුස්මරණයකෙරෙයි; (මෙහි ශීලයෝනම් ගෘහස්ථතෙම ගෘහස්ථ ශීලයන්ද ප්‍රව්‍රජිතතෙමේ ප්‍රව්‍රජිත ශීලයන්ද යන ශීලයෝයි; ඒ ශීලයන්ගේ කඩනොවීමනම් යම් ශීලයක් ආදියෙහි හෝ අන්තයෙහි හෝ බිඳුනේද එසේ නොවීමයි; නොසිදුරුවීම නම් මැදශික්ෂාපද

සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති. තෙලඤ්ච පටිච්ච ඡාරිකඤ්ච පටිච්ච වාලණ්ඩුකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති—එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනාහොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. ඉධ විසාඛෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤූප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි තස්ස සීලං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙචිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො සීලුපොසථං උපවසති සීලෙන සද්ධිං සංවසති සීලඤ්චස්ස ආරබ්භ චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති – එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

නොබිඳීමයි; අසබලවීමනම්, ආදියෙහි හෝ කෙළවර හෝ දෙකක්තුණක් පිළිවෙළින් නොබිඳීමයි; අකම්මාසනම්, අතරින් අතර නොබිඳීමයි) සීලංඅනුස්සරතො, සීලානුස්මරණය කරන්නාවූ; තස්ස, ඒ ආර්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති. උපදී; චිත්තස්ස, සිත සබඳවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශකෙනෙක් ඇද්ද; තෙ, ඔව්හු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; ආදාසස්ස, දර්පණයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; සෙය්‍යථාපි, යම්සේ; පරියොදපනා හොති, නිර්මලකිරීමවේද? විසාඛෙ, විශාඛාව; තෙලඤ්ච පටිච්ච, තෙල් නිසාද; ඡාරිකඤ්ච පටිච්ච, අළුනිසාද; වාලණ්ඩුකඤ්ච පටිච්ච, (අස්වලින් හෝ, නියද ආදියෙන් හෝ කරනලද වාලණ්ඩුක යයි කියනලද) කොස්ස නිසාද; පුරිසස්ස, පුරුෂයාගේ; තජ්ජංවායාමඤ්ච පටිච්ච, මුසණසමර්ණාදි) ඊටසුදුසු ව්‍යායාමය නිසාද; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; ආදාසස්ස, ආදර්ශයාගේ උපක්කමෙන, උපායෙන්; එවං ඛො පරියොදපනා හොති, මෙසේ වනාහි පිරිසිදු කිරීමවෙයි; විසාඛෙ, විශාඛාව; එවං එවඛො,

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො දෙවතා අනුස්සරති සන්ති දෙවා චාතුම්මහාරාජිකා සන්ති දෙවා තාවතිංසා සන්ති දෙවා යාමා සන්ති දෙවා තුසිතා සන්ති දෙවා නිම්මානරතිනො සන්ති දෙවා පරනිම්මිතවසවත්තිනො සන්ති දෙවා බ්‍රහ්මකායිකා සන්ති දෙවා තතුත්තරිං යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො

---

එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; පරියොදපනා හොති, නිර්මලකිරීම වේ; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ චිත්තස්ස; චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; කථං පරියොදපනා හොති; කෙසේ පිරිසිදු කිරීමවේ ද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලොකයෙහි, අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; අත්තනො, තමාගේ; අඛණ්ඩානි, නොකඩවූ —පෙ—සමාධිසංවත්තනිකානි; සමාධියපිණිස පවත්නාවූ, සීලානි, ශීලයන්; අනුස්සරති, සිහිකෙරේ; සීලං, ශීලය; අනුස්සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමුජ්ජං, ප්‍රමොදය; උප්පජ්ජති, උපදී, චිත්තස්ස, සිතසබඳවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශකෙණෙක් ඇද්ද; තෙ, ඔව්හු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; අයං අරියසාවකො, මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; සීලුපොසථං, ශීලඋපොෂථයට; උපවසති, එළඹවාසයකෙරේ; සීලෙන සඞ්ධිං, (තමාගේ) ශීලය හා; සංවසති, එක්වවාසයකෙරේයයි; වුච්චති, කියනුලැබේ; සීලඤ්ච, ශීලයද; ආරබ්භ; අරභයා, අස්ස, ඔහුගේ; චිත්තං, සිත, පසීදති, පහදී; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස; සිතසබඳවූ; යෙ උපක්කිලෙසා, යම් කෙලසිලි කෙණෙක්ඇද්ද; තෙ, ඔවුහු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; එවං පරියොදපනා හොති, මෙසේ නිර්මලකිරීමවෙයි.

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන; උපායෙන්; **හෙවත් වීර්‍ය්‍යයෙන්;** පරියොදපනා හොති, නිර්මලකිරීමවෙයි; විසාඛෙ, විශාඛාව;

චුතා තත්‍රූපපන්නා මයම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති තථා
රූපෙන සීලෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්‍රූ
පපන්නා මයම්පි තථාරූපං සීලං සංවිජ්ජති යථාරූපෙන
සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්‍රූපපන්නා
මයම්පි තථාරූපං සුතං සංවිජ්ජති යථාරූපෙන චාගෙන
සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්‍රූපපන්නා
මයම්පි තථාරූපො චාගො සංවිජ්ජති යථාරූපාය පඤ්ඤාය
සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්‍රූපපන්නා මයම්පි
තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති—තස්ස අත්තනො ච

---

උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ට වූ; චිත්තස්ස, සිතගේ; උපක්ක
මෙන, උපායෙන්; කථං පරියොදනා හොති, කෙසේ නිර්මල
කිරීමවේද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලොකයෙහි; අරිය
සාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; දෙවතා අනුස්සරති, දෙවියන් (සාක්‍ෂි
කොට තමාගේ ශ්‍රද්ධාදිගුණ) සිහිකෙරෙයි; (හේකෙසේද)
චාතුම්මහාරාජිකාදෙවා, චාතුර්මහාරාජිකනම්වූ දෙවිකෙණෙක්;
සන්ති, ඇත්තාහ; තාවතිංසාදෙවා; තාවතිංසනම්වූ දෙවිකෙ
ණෙක්; සන්ති, ඇත්තාහුය; යාමාදෙවා, යාම නම්වූ දෙවිකෙ
ණෙක්, සන්ති, ඇත්තාහ, තුසිතාදෙවා, තුසිතනම්වූ දෙවි
කෙණෙක්; සන්ති, ඇත්තාහ; නිම්මානරතිනො දෙවා, නිර්මාණ
රතීනම්වූ; දෙවිකෙණෙක්; සන්ති, ඇත්තාහ; පරනිම්මිතව
සවත්තිනො දෙවා, පරනිර්මිත වශවර්ත්තිනම්වූ දෙවිකෙණෙක්;
සන්ති, ඇත්තාහ; බ්‍රහ්මකායිකා, බ්‍රහ්මකායිකනම්වූ; දෙවා, දෙවි
කෙණෙක්; සන්ති, ඇත්තාහ; තතො 'උත්තරිං, එයින් මත්තෙහි;
දෙවා, දෙවියෝ; සන්ති, ඇත්තාහ; ඉතො, මේ මනුෂ්‍යාත්ම
භාවයෙන්; චුතා, චුතව; (ඒ චාතුර්මහාරාජිකාදි දිව්‍යලොකවල)
උප්පන්නා, උපන්නාවූ; තා දෙවතා, ඒ දෙවතාවෝ; යථාරූපාය,
යම්බඳුවූ; සද්ධාය, ශ්‍රද්ධාවකින් සමන්නාගතා, යුක්තවූවාහුද; මයම්
පි, මටද, තථාරූපා, එබඳුවූ; සද්ධා, ශ්‍රද්ධාතොමෝ; සංවිජ්ජති,
ඇත්තේය; ඉතොචුතා, මෙයින්චුතව; තත්‍ථ, එහි, උප්පන්නා, උප
න්නාවූ; තා දෙවතා, ඒ දෙවතාවෝ; යථාරූපෙන, යම්බඳුවූ; සීලෙ
න, ශීලයෙන්; සමන්නාගතා, යුක්තයෝද; මයම්පි, මටද; තථා
රූපං, එබඳුවූ; සීලං, ශීලය; සංවිජ්ජති, ඇත්තේය; ඉතොචු
තා; මෙයින්චුතව; තත්‍ථ, ඒදිව්‍යලොකවල; උප්පන්නා, උපන්
නාවූ; තාදෙවතා, ඒ දෙවියෝ; යථාරූපෙන, යම්බඳුවූ; සුතෙන,

තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති—සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති උක්කඤ්ච පටිච්ච ලොණඤ්ච පටිච්ච ගෙරුකඤ්ච පටිච්ච නාළිසණ්ඩාසඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච, එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති—එවමෙවඛො

---

ශ්‍රැතයකින්; සමන්නාගතා, යුක්තයෝද; මය්හම්පි, මටද; තථාරූපං, එබඳුවූ; සුතං, ශ්‍රැතය, සංවිජ්ජති, ඇත්තේය; ඉතො චුතා, මෙයින්චුතව; තත්‍ථ, ඒ දෙව්ලෙව්හි; උප්පන්නා, උපන්නාවූ; තාදෙවතා ඒ දෙවියෝ යථාරූපෙන, යම්බඳුවූ; චාගෙන, ත්‍යාගයෙන්; සමන්නාගතා, යුක්තයෝද; මය්හම්පි, මටද; තථාරූපො, එබඳුවූ; චාගො, ත්‍යාගතෙම; සංවිජ්ජති, ඇත්තේය; ඉතො මේ මිනිස්ලොවින්; චුතා, චුතව; තත්‍ථ, ඒ දෙව්ලෙව්හි; උප්පන්නා, උපන්නාවූ; තාදෙවතා, ඒ දෙවියෝ, යථාරූපාය, යම්බඳුවූ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සමන්නාගතා, යුක්තවූවාහුද; මය්හම්පි, මටද; තථාරූපා, එබඳුවූ; පඤ්ඤා, ප්‍රඥාතොමෝ; සංවිජ්ජති, ඇත්තේයයි; දෙවතා අනුස්සරති, දෙවියන් (සාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදිගුණයිහි) කරයි; අත්තනො ච, තමාගේ ද; තාසං දෙවතානඤ්ච, ඒදෙවියන්ගේ ද; සද්ධඤ්ච, ශ්‍රද්ධාව ද, සීලඤ්ච, ශීලය ද; සුතඤ්ච ශ්‍රැතය ද; චාගඤ්ච, ත්‍යාගය ද; පඤ්ඤඤ්ච, ප්‍රඥාව ද; අනුස්සරතො, සිහිකරන්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තං, සිත, පසීදති, පහදී; පාමුජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, සිතසබඳවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශකෙනෙක් ඇද්ද; තෙ, ඔවුහු; පහීයන්ති, ප්‍රහීණවෙත්.—

විසාඛෙ. විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; ජාතරූපස්ස, සවර්ණයාගේ; උපක්කමෙන; උපක්‍රමයෙන්; පරියොදපනාහොති; නිර්මලකිරීමවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, කිලුටුවූ; ජාතරූපස්ස, සවර්ණයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථඤ්ච පරියොදපනාහොති, කෙසේ පිරිසිදු කිරීමවේද; උක්කඤ්ච පටිච්ච, උඳුනනිසාද; ලොණඤ්ච පටිච්ච

විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති, කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො දෙවතා අනුස්සරති සන්ති දෙවා චාතුම්මහාරාජිකා සන්ති දෙවා තාවතිංසා සන්ති දෙවා යාමා සන්ති දෙවා තුසිතා සන්ති දෙවා නිම්මාණරතිනො සන්ති දෙවා පරනිම්මිත වසවත්තිනො සන්ති දෙවා බ්‍රහ්මකායිකා සන්ති දෙවා තතුත්තරිං යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්‍ථූපපන්නා මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති

---

ලුණු (මැටි) නිසාද; ගෙරුකඤ්ච පටිච්ච, ගෛරිකනිසාද; හෙවත් ගුරුසුණු නිසාද; නාලිසණ්ඩාසඤ්චපටිච්ච, පිඹින නල හා ඔබ්මොබපෙරලන අඬුව නිසාද; පුරිසස්ස, පුරුෂයාගේ, තජ්ජං වායාමඤ්චපටිච්ච, ඊට සුදුසු ව්‍යායාමය නිසාද; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; ජාතරූපස්ස, සවර්ණයාගේ; උපක්කමෙන, . උපක්‍රමයෙන්; එවං පරියොදපනා හොති මෙසේ පිරිසිදු කිරීමවෙයි; විසාඛෙ, විශාඛාව; එවං එවඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස, කිළුටුවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; පරියොදපනා හොති, පිරිසිදුකිරීමවෙයි; විසාඛෙ, විශාඛාව, උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; කථඤ්ච, කෙසේ; පරියොදපනා හොති, නිර්මලකිරීමවේද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; දෙවතාඅනුස්සරති, දෙවියන් (ශාක්ෂිස්ථානයෙහි තබා; තමාගේ ශ්‍රද්ධාදිගුණ) සිහිකෙරෙයි; (හේකෙසේද) චාතුම්මහාරාජිකාදෙවා; චාතුම්මහාරාජික නම් දෙවිකෙනෙක්; සන්ති, ඇත්තාහ—පෙ—තතොඋත්තරිං, එයින්මත්තෙහි; දෙවා, දෙවියෝ; සන්ති, ඇත්තාහ, ඉතො, මේ මිනිස්ලොවින්; චුතා, චුතව; තත්‍ථ, ඒ දෙව්ලෙව්හි; උපපන්නා, උපන්නාවූ; තාදෙවතා, ඒ දෙවියෝ; යථාරූපාය, යම්බඳුවූ; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; සමන්නාගතා, යුක්ත යෝද; මය්හම්පි, මටද; තථාරූපාසද්ධා, එබඳුවූ ශ්‍රද්ධාතොමෝ; සංවිජ්ජති, ඇත්තේය; ඉතොචුතා, මෙයින්චුතව; තත්‍ථ උපපන්නා, ඒ දෙව්ලෙව්හි උපන්නාවූ; තාදෙවතා, ඒ දෙවියෝ; යථා රූපෙන, යම්බඳුවූ; සීලෙන, ශීලයෙන්; සුතෙන, ශ්‍රැතයෙන්; චාගෙන, ත්‍යාගයෙන්; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සමන්නාගතා යුක්තයෝය; මය්හම්පි, මටද; තථාරූපං සීලඤ්ච, එබඳු

යථාරූපෙන සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථූපපන්නා මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති—තස්ස අත්තනො ච තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො දෙවතූපොසථං උපවසති දෙවතාහි සද්ධිං සංවසති දෙවතාචස්ස ආරබ්භ චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති—එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදනා හොති.

---

ශීලයක්ද; සුතඤ්ච, ශ්‍රුතයද; චාගඤ්ච, ත්‍යාගයද; පඤ්ඤඤ්ච ප්‍රඥාවද; සංවිජ්ජති ඉති, ඇත්තේයයි; (දෙවියන් ශාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදිගුණ සිහිකෙරෙයි) අත්තනොච, තමාගේද; තාසං දෙවතානඤ්ච, ඒ දෙවියන්ගේද; සද්ධඤ්ච, ශ්‍රද්ධාවද; සීලඤ්ච, ශීලයද; සුතඤ්ච, ශ්‍රුතයද; චාගඤ්ච, ත්‍යාගයද; පඤ්ඤඤ්ච, ප්‍රඥාවද; අනුස්සරතො, සිහිකරන්නා වූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං, සිත; පසීදති, පහදී; පාමුජ්ජං, ප්‍රමොද්‍යය; උප්පජ්ජති, උපදී; චිත්තස්ස, සිතසබඳවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශකෙනෙක් ඇද්ද; තෙ. ඔව්හු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; අයං අරියසාවකො, මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; දෙවතූපොසථං උපවසති, (දෙවියන් ශාක්ෂිස්ථානයෙහිතබා තමාගේ ගුණසිහිකරන්නහුවිසින්; විසූ බැවින්) දෙවතූපොෂතයට එළඹවසන්නේයයිද; දෙවතාහිසද්ධිං සංවසති, ශ්‍රද්ධාදිගුණයන්ගෙන් සදෘශබැවින් දෙවියන් සමග වෙසේයයිද; වුච්චති, කියනු ලැබෙයි; දෙවතා ආරබ්භ, දෙවියන්ගේ ශ්‍රද්ධාදි ගුණ අරභයා; අස්ස චිත්තං, මොහුගේ සිත, පසීදති, පහදී, පාමොජ්ජං. ප්‍රීතිප්‍රමොද්‍යය, උප්පජ්ජති, උපදී; චිත්තස්ස, චිත්තයා සම්බන්ධීවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශකෙනෙක් ඇද්ද; තෙ, ඔවුහු; පහීයන්ති, ප්‍රහීණවෙත්; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස, උපක්ලිෂ්ටවූ; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; එවංඛො පරියොදපනා හොති, මෙසේ නිර්මලකිරීමවේ.

විසාඛෙ, විශාඛාව; සොඛො අරියසාවකො; ඒ මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; ඉතිපටිසංචික්ඛති, මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරෙයි; එනම්

සචෙ සො විසාඛෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති යාව ජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානු කම්පී විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාති පාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරාමි ඉමිනාපඟං අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

---

අරහන්තො, බුද්ධප්‍රත්‍යෙක බුද්ධාදි රහත්හු; යාවජීවං, ජීවිතාන්තය දක්වා; පාණාතිපාතං, ප්‍රාණඝාතය; පහාය, හැර; පාණාතිපාතා, ප්‍රාණඝාත චෙතනාසංඛ්‍යාත දුශ්ශීල්‍යයෙන්. පටිවිරතා, විශෙෂ යෙන් වැළැක්කාහුය; නිහිතදණ්ඩා, (පරහිංසා පිණිස දඬුමුද්ගුරා දීන්ගෙන නොපවත්නා හෙයින්) බහා තබනලද දඬුමුගුරු ඇත් තාහ; නිහිතසත්ථා, (පරූපඝාතනය පිණිස ඛඩ්ගකුන්තාදි ශස්ත්‍ර යන් ගෙන නොපවත්නා හෙයින්) බහා තබනලද ශස්ත්‍රයන් ඇත් තාහ; ලජ්ජී, (පාපයෙහි ජිගුප්සාකාරයෙන් පවත්නා හෙයින්) ලජ්ජිහ; දයාපන්නා, මෛත්‍රියට පැමිණියාහ; (හෙවත් මෙත් සිත් ඇතිබවට පැමිණියාහ) සබ්බපාණභූත, සියලු ප්‍රාණිවූවන් කෙරෙහි, හිතානුකම්පිනො, හිතචිත්තයෙන් අනුකම්පා කෙරෙමින්; විහ රන්ති, වාසය කෙරෙත්; අහම්පි, මමද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවලද; පාණාතිපාතං පහාය, ප්‍රාණ ඝාත චෙතනා සංඛ්‍යාත දුශ්ශීල්‍යය හැර; පාණාතිපාතා, ප්‍රාණඝාත චෙතනාවෙන්; පටිවිරතො, විශෙෂයෙන් වැළැක්කෙමි, නිහිත දණ්ඩො, (පරහිංසා පිණිස නොගන්නාවූද දණ්ඩමුද්ගරාදීන් ඇති හෙයින්) බහා තබනලද දණ්ඩමුගුරු ඇත්තෙමි; නිහිතසත්ථො, බහා තබනලද ශස්ත්‍ර ඇත්තෙමි; ලජ්ජී, පාපයෙහි ජිගුප්සාකාර යෙන් පවත්නා හෙයින් ලජ්ජා ඇත්තෙමි; දයාපන්නො, කරුණා වට පැමිණියෙමි; සබ්බපාණභූත හිතානුකම්පී, සියලු ප්‍රාණිවූ වන් කෙරෙහි හිතයෙන් අනුකම්පා කෙරෙමින්; විහරාමි, වාසය කෙරෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන් ද; අහං, මම; අරහතං, රහතුන්ට; අනුකරොමි, අනුව ක්‍රියා කෙරෙමි; මෙ, මා විසින්; උපොසථොච, උපොෂථයද; උපවුත්ථො භවිස්සති, වැස නිමවනලද්දේ වන්නේය;

යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා දින්නාදායී දින්නපාටිකංඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්නපාටිකංඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති

යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතා මෙථුනා ගාමධම්මා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති

---

අරහන්තො, බුද්ධාදි රහතන් වහන්සේලා; යාවජීවං, දිවිහිම්යෙන්; අදින්නාදානංපහාය, අදත්තාදානය හැර; අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතා, වැළැක්කාහුය; දින්නාදායී, දුන් දෙයම ගන්නා සුලුය; දින්නපාටිකංඛී, දුන්දෙයම සිතිනුත් කැමතිව ඉවසන සුලුය; අථෙනෙන, වඤ්චාරහිතවූ; සුචිභූතෙන, එහෙයින් පවිත්‍රවූ; අත්තනා, ආත්මභාවයෙන් උපලක්ෂිතව; විහරන්ති, වාසය කෙරෙත්; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්චරත්තිං, මේ රෑය ද; ඉමඤ්ච දිවසං මේ දවල ද; අදින්නාදානං, අදත්තාදානය; පහාය, හැර; අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතො, වැළැක්කේ; දින්නාදායී, දුන්දෙය ගන්නා සුලුවූයෙමි; දින්නපාටිකංඛී, දුන්දෙය සිතින් කැමතිව ඉවසන සුලුවූයෙමි; අථෙනෙන, වඤ්චාරහිතවූ; සුචිභූතෙන, එහෙයින් පවිත්‍රවූ; අත්තනා, ආත්ම භාවයෙන් උපලක්ෂිතව; විහරාමි, වාසය කෙරෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අහං, මම; අරහතං අනුකරොමි, බුද්ධාදි රහතුන්ට අනුව ක්‍රියාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථොච උපවුත්ථො භවිස්සති, පෙහෙවස් වසනලද්දේ වන්නේය;

යාවජීවං, දිවිහිම්යෙන්; අරහන්තො, රහතන් වහන්සේලා; අබ්‍රහ්මචරියං, අබ්‍රහ්මචර්‍ය්‍යාව; පහාය, හැර; බ්‍රහ්මචාරී, ශ්‍රේෂ්ඨ හැසිරීම් ඇත්තාහුය; ආරාචාරී, අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් දුරුවූ මරද හැසිරීම් ඇත්තාහුය; ගාමධම්මා, ගම්වාසීන්ගේ සවභාවක් වූ; මෙථුනා,

යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා සච්චවාදී සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

---

මෛථුනයෙන්; විරතා, වැළක්කාහුය; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවාලද; අබ්‍රහ්මචරියං, අබ්‍රහ්මචර්‍යාව; පහාය, හැර; බ්‍රහ්මචාරී, ශ්‍රෙෂ්ඨචර්‍යායෙහි හැසිරෙණ සුලුවූයෙමි; ආරාචාරී, දුරුවූ චරද හැසිරීම් ඇත්තෙම්; ගාමධම්මා, ගම්වාසීන්ගේ ස්වභාවක්වූ; මෙථුනා, මෛථුනයෙන්; විරතො, වැළැක්කෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අහං, මම; අරහතං, රහතුන් වහන්සේලාට; අනුකරෙමි, අනුව ක්‍රියා කොරෙමි; මෙ, මා විසින්; උපොසථොච, උපොෂතයද; උපවුත්ථො භවිස්සති, වැසනිමවන ලද්දේ වන්නේය;

අරහන්තො, රහතන් වහන්සේලා; යාවජීවං, ජීවිතාන්තය දක්වා; මුසාවාදම්පහාය, බොරුකීම හැර; මුසාවාදා, මෘෂාවාදයෙන්; පටිවිරතා, වැළැක්කාහුය; සච්චවාදී, සත්‍යය කියනසුලුයහ; සච්චසන්ධා, සත්‍යයෙන් සත්‍යය ගළපන්නාහ; ථෙතා, ස්ථිරව පිහිටි කථා ඇත්තාහුය; පච්චයිකා, ඇදහිලි කටයුතු කථා ඇත්තාහුය; ලොකස්ස, ලොකයා සම්බන්ධවූ; අවිසංවාදකා, වඤ්චානොකරන්නාහුය; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවලද; මුසාවාදං පහාය, මෘෂාවාදය හැර; මුසාවාදා, මෘෂාවාදයෙන්; පටිවිරතො, වැළකුනෙමි; සච්චවාදි, සත්‍යයකියන සුලුයෙමි; සච්චසන්ධො, සත්‍යයෙන් සත්‍යය ගළපන්නෙමි. ථෙතො, ස්ථිර කථා ඇත්තෙම්; පච්චයිකො ඇදහිලිකටයුතු කථා ඇත්තෙම්; ලොකස්ස, ලොකයා සම්බන්ධව; අවිසංවාදකො, වඤ්චානො කොරෙමි; ඉමිනාපි අඞ්ගෙන මේ ගුණාඞ්ගයෙන්ද; අහං, මම; අරහතං, රහතන් වහන්සේලාට; අනුකරෙමි, අනුව ක්‍රියාකොරෙමි; මෙ, මා විසින්; උපොසථො ච, උපෝෂථය ද; උපවුත්ථො භවිස්සති, වැස නිමවන ලද්දේ වන්නේය;

යාවජීවං අරහන්තො සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො එකභත්තිකා රත්තූපරතා විරතා විකාලභොජනා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං එකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති

---

අරහන්තො, රහත්හු; යාවජීවං, ජීවිතාන්තය දක්වා; සුරාමෙරය මජ්ජපමාදට්ඨානං, මද්‍යප්‍රමාදයට කාරණවූ රහමෙර පානය; පහාය, හැර; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදප්‍රමාදයට කාරණවූ රහමෙරින්; පටිවිරතා, වැළැක්කාහුය; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවලද; සුරාමෙරය මජ්ජපමාදට්ඨානං, මදප්‍රමාදයට කාරණාවූ රහමෙරපානය; පහාය, හැර; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදප්‍රමාදයට කාරණාවූ රහමෙරින්; පටිවිරතො, වැළැක්කෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ අඞ්ගයෙන් ද; අහං, මම; අරහතං, රහතන් වහන්සේලාට; අනුකරොමි, අනුව ක්‍රියාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථො ච, උපොෂථයද; උපවුත්ථො භවිස්සති වැස නිමවන ලද්දේ වන්නේය;

අරහන්තො, රහත්හු; යාවජීවං, ජීවිතාන්තය දක්වා; එකභත්තිකා, පෙරවරු එක්වේලේ වළඳන බත් ඇත්තාහුය; රත්තූපරතා, රාත්‍රිභොජනයෙන් වැළැක්කාහුය; විකාලභොජනා, විකල් බොජුනෙන්; විරතා, වැළැක්කාහුය; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්චරත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවලද; එකභත්තිකො, පෙරවරු එක්වේලේ වළඳන බත් ඇත්තෙමි; රත්ති උපරතො, රාත්‍රිභොජනයෙන් වැළකුනෙමි; විකාලභොජනා, විකල් බොජුනෙන්; විරතො, විශෙෂයෙන් වැළකුනෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන් ද; අහං, මම; අරහතං, රහතන් වහන්සේලාට; අනුකරොමි, අනුව ක්‍රියාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථොච, උපොෂථයද; උපවුත්ථො භවිස්සති, වැස නිමවන ලද්දේවන්නේය;

යාවජීවං අරහන්තො, නච්චගීතවාදිත විසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණමණ්ඩන විභූසනට්ඨානා පටිවිරතා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං නච්ච ගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා පටිවිරතො ඉමිනා පඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථොච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො උච්චාසයන මහාසයනං පහාය උච්චාසයන මහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති මඤ්චකෙ වා තිණසන්ථරකෙ වා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයන මහාසයනං පහාය උච්චාසයන මහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි මඤ්චකෙ වා තිණසන්ථරකෙ වා ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති, එවං ඛො විසාඛෙ අරියූපොසථො හොති, එවං උපවුත්ථො ඛො විසාඛෙ අරියූපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො.

---

අරහන්තො, රහත්හු; යාවජීවං, පරිච්ඡින්නායුෂය දක්වා; නච්ච, නම්‍ා නැටීමය; ගීත, ගී කීමය; වාදිත, බෙර ආදිය වැයීමය; විසූකදස්සන, විහිලු බැලීමය; මාලා, මල්ය; ගන්ධ, සුවඳය; විලෙපන, විලවුන්ය; (යන මේ සියල්ල) ධාරණ, පැලඳීමෙන් දැරීමය; මණ්ඩන, උණුතැන් පිරවීමෙන් මණ්ඩනය; විභූසන, සුගන්ධ වශයෙන් හා ඡවිරාග වශයෙන් ඉවසා සැරසීමය යන; ඨානා, කාරණයෙන්; පටිවිරතා, වැලැක්කාහුය; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රැයද; ඉමඤ්ච දිවසං, මේ දවලද; නච්ච, නැටීමය; ගීත, ගී කීමය; වාදිත, වැයීමය; විසූකදස්සන, විසුලු බැලීමය; මාල, පුෂ්පය; ගන්ධ, සුවඳය; විලෙපන, විලවුන්ය යන මේ සියල්ල; ධාරණ, දැරීමය; මණ්ඩන. සැරසීමය; විභූසන, අලඞ්කාරවීමය යන; ඨානා, කාරණයෙන්; පටිවිරතො, වැළකුතෙම්; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන් ද; අහං, මම; අරහතං, රහතන් වහන්සේලාට; අනුකරෙමි, අනුව ක්‍රියාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථොචා උපොෂථයද; උපවුත්ථොභවිස්සති, වැසතිමවනලද්දේ වන්නේය;

අරහන්තො, රහතන් වහන්සේලා; යාවජීවං, ජීවිතාන්තය දක්වා; උච්චාසයන මහාසයනං පහාය, (පමණ ඉකුත් දික්සහලා

කීව මහප්ඵලො හොති කීව මහානිසංසො කීව මහාජුතිකො කීව මහාවිප්ඵාරො, සෙය්‍යථාපි විසාඛෙ යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූත සත්ත රතනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය සෙය්‍යථිදං අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතියානං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං, අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එතං කලං නාග්ඝන්ති සොළසිං, තං කිස්ස හෙතු? කපණං විසාඛෙ මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

පුට්ඨ ආදි) උසසුන් හා; (සතරඟුලෙන් දික් ලොම් ඇති කොදුපලස් ආදි) මහ අසුන් හැර; උච්චාසයන මහාසයනා, උසසුන් මහ අස්නෙන්; පටිවිරතා, වැළැක්කාහුය; මඤ්චකෙ වා, මුෂ්ටිගසනප්‍රමාණ පා ඇති කප්පිය මඤ්චකයෙහි හෝ හෙවත් කුරු ඇඳෙහි හෝ; තිණසන්ථාරකෙ වා, තෘණපර්ණපලාලාදීන් අතුට කළ සංස්තරණයෙහි හෝ; නීචසෙය්‍යං කප්පෙන්ති, නීචසෙය්‍යාව කෙරෙත්; අහම්පි, මම ද; අජ්ජ, අද; ඉමඤ්ච රත්තිං, මේ රෑද; ඉමඤ්ච දිවසං, මේ දවලද; උච්චාසයන මහාසයනං, උසසුන හා මහඅස්න; පහාය, හැර; උච්චාසයන මහාසයනා, උසසුනෙන් හා මහඅස්නෙන්; පටිවිරතො, වැළැක්කෙම්; මඤ්චකෙ වා, මිටිඇඳෙක හෝ; තිණසන්ථාරකෙ වා, තෘණඇතිරියක හෝ; නීචසෙය්‍යං කප්පෙමි, නීචසෙය්‍යාව කෙරෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන් ද; අහං, මම; අරහතං, රහතන් වහන්සේලාට; අනුකරොමි, අනුව ක්‍රියා කෙරෙමි; මෙ, මා විසින්; උපොසථො ච, උපොෂථය ද; උපවුත්ථො භවිස්සති, වැසනිමවනලද්දේ වන්නේය; විසාඛෙ, විශාඛාව; එවං ඛො, මෙසේ වනාහි; අරියූපොසථො හොති, ආර්‍ය්‍ය උපොෂථය වෙයි;

විසාඛෙ, විශාඛාව; එවං, මෙසේ; උපවුත්ථො, වැසනිමවනලද්දු; අරියූපොසථො ඛො, ආර්‍ය්‍ය උපොෂථය වනාහි; මහප්ඵලො හොති, මහත්ඵල වෙයි; මහානිසංසො, මහත් ආනිසංස ඇතිවෙයි; මහාජුතිකො, මහත් ආලොක ඇතිවෙයි; මහාවිප්ඵාරො, මහත් පැතිරීම ඇතිවෙයි; කීව මහප්ඵලො හොති, කොපමණ මහත් ඵල වේද; කීව මහානිසංසො, කොපමණ මහානිසංස වේද; කීව මහාජුතිකො, කොපමණ මහත් දීප්ති ඇතිවේද; කීව මහාවිප්ඵාරො,

යානි විසාඛෙ මානුසකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංස රත්තියො මාසො තෙන මාසෙන ද්වාදස මාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

කොපමණ මහත් පැතිරීම් ඇතිවේද; විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ (යමෙක්) පහූතසත්තරතනානං, බොහෝ සත්රුවන් ඇත්තාවූ; ඉමෙසං, මේ; සොළසන්නං මහාජනපදානං, සොළොස් මහා ජනපදයන්ගෙන් අලංකෘතවූ දඹදිව් තෙලෙහි; ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, ඓශ්වර්‍ය්‍යාධි ප්‍රත්‍යයෙන් යුක්තව හෙවත් චක්‍රවර්ත්ති රාජ්‍යය කෙරේද; සෙය්‍යථිදං, ඒ සොළොස්මහා ජනපද කවරේද; අඞ්ගානං, අඟුරටය; මගධානං, මගදරටය; කාසීනං, කසීරටය; කොසලානං, කොසොල්රටය; වජ්ජීනං, වැදූරටය; මල්ලානං, මල්‍යරටය; චෙතියානං, සෑරටය; වඞ්ගානං, වඟුරටය; කුරූනං, කුරුරටය; පඤ්චාලානං, පඤ්චාලදෙසය; මච්ඡානං, මත්ශ්‍යරටය; සුරසෙනානං, සුරසෙනරටය; අස්සකානං, ඇස්සකරටය; අවන්තීනං, අවන්තිරටය; ගන්ධාරානං, ගන්ධාරදෙශය; කම්බොජානං, කාම්බොජදෙශය යන මොවුන්ගේ; (ඓශ්වර්‍ය්‍යය) අට්ඨඞ්ගසමන්නාගතස්ස, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථස්ස, පෙහෙවස් විසීමගේ; (අනුසසිත්) සොළසිං, සොළොස් වනවූ; එකං කලං, එක් භාගයක්; නාග්ඝන්ති, නොඅගිත්; තං කිස්ස හෙතු, ඊට හේතු කවරේ ද? විසාඛෙ, විශාඛාව; මානුසිකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්ත්ති රාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැපය සඳහා; කපණං, ස්වල්ප වන්නේය; හෙවත් දිළිඳුවන්නේය;

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මනුෂ්‍යයන්ට ඇත්තාවූ; යානි පඤ්ඤාසවස්සානි, යම් පණස් අවුරුද්දෙක් ඇද්ද; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙව්ලෝවාසීවූ දෙවියන්ට; එසො, මේ තෙම; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් වන්නේය;

යං විසාඛෙ මානුසකං වස්සසතං තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදස මාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතංවිසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

තාය රත්තියා, ඒ අහො රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දෙලොස් මාසයෙක්; සංවච්ඡරො, හවුරුද්දෙක් වෙයි; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානිපඤ්චවස්සසතානි, දිව්‍යමයවූ වර්‍ෂ පන්සියයෙක්; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දිව්‍ය ලොකයෙහි දෙවියන්ට; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණ වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියෙක් හෝ; එකච්චො පුරිසො වා සමහර පුරුෂයෙක් හෝ; අට්ඨඞ්ග සමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්සභෙදා, ශරීරයාගේ බිඳීමෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙවියන් හා; සහව්‍යතං, එක්වීමට; උපපජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යන; යං, යම් කාරණයක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහි; විජ්ජතිඛො, ඇත්තේ මැ; විසාඛෙ, විශාඛාව; මානුසිකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්ත්තිරාජ්‍යය; දිබ්බංසුඛං උපනිධාය, දිව්‍යසැපය පිණිස; කපණං. දිළිඳුවන්නේය යන; ඉදං ඛො පන, මෙය වනාහි; එතං සන්ධාය භාසිතං, මේ තිසා කියන ලදි;

විසාඛෙ, විශාඛාව; යං මානුසිකං වස්සසතං, යම් මානුසික වර්‍ෂ සියයෙක් ඇද්ද; තාවතිංසානං දෙවානං, තව්තිසාවැසි දෙවියන්ට; එසො එකොරත්තින්දිවො, මේ තෙම එක් රෑ දවලෙක් වන්නේය; තායරත්තියා, ඒ අහො රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වන්නේය; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසි

යානි විසාඛෙ මානුසකානි ද්වෙවස්සසතානි යාමානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදස මාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි ද්වෙවස්සසහස්සානි යාමානං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

යො, දොළොස් මසෙක්; සංවච්ඡරො, හවුරුද්දෙක් වන්නේය; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බං වස්සසහස්සං, දිව්‍ය වර්ෂ සහස්‍රයක්; තාවතිංසානං දෙවානං, තවුතිසාවැසි දෙවියන්ට; ආයුප්පමාණං ආයු ප්‍රමාණය වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්ථී වා, සමහර ස්ත්‍රියෙක් හෝ; පුරිසො වා, පුරුෂයෙක් හෝ; අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථං, උපොෂථයට; උපවසිත්වා, එළඹ වාසය කොට; කායස්ස භෙදා, ශරීරස්ථිතියට කාරණවූ ජීවිතින්ද්‍රියො පරිච්ඡෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; තාවතිංසානං දෙවානං, තවුතිසාවැසි දෙවියන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජෙය්‍ය පැමිණෙන්නේය; (යත) යං, යම් කාරණයෙක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහි; විජ්ජති ඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුෂික රාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැපය පිණිස; කපණං, දිළිඳුවන්නේය; (යත) ඉදං ඛො පන, මේ වනාහි; එතං සන්ධාය, මේ නිසා; භාසිතං, කියනලදී;

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුෂිකවූ; යානි ද්වෙවස්සසතානි, යම් වර්ෂදෙසියයක් ඇද්ද; එසො, මේතෙම; යාමානං දෙවානං, යාමනම් දෙව්ලොව දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රෑ දවලෙක් වෙයි; තාය රත්තියා, ඒ අහොරාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරො අවුරුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි ද්වෙවස්සසහස්සානි, දිව්‍යවර්ෂ දෙදහසෙක්; යාමානං දෙවානං, යාමනම් දෙව්ලොවවැසි

යානි විසාඛෙ මානුසකානි චත්තාරි වස්සසතානි තුසිතානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංස රත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්සසහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහබ්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

දෙවියන්ට; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ මේ ලොකයෙහි; එකච්චා ඉත්ථී වා, සමහර ස්ත්‍රියක් හෝ; පුරිසො වා, පුරුෂයෙක් හෝ; අට්ඨංගසමන්නාගතං, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; යාමානං දෙවානං, යාමනම් දෙව්ලොව දෙවියන් හා; සහබ්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යන; යං, යමක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහී; විජ්ජති ඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුෂිකවූ චක්‍රවර්ති රාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැපය පිණිස; කපණං, සවල්පවන්නේය යන; ඉදං ඛො පන, මේය වනාහී; එතං සන්ධාය, මේ සඳහා; භාසිතං, කියනලදී;

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුෂිකවූ; යානි චත්තාරි වස්සසතානි, යම් හාරසියයක් අවුරුදු වේද්ද; එසො, මේ තෙමේ; තුසිතානං දෙවානං, තුසිත දෙව්ලෝවැසි දෙවියන්ට; එකොරත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තායරත්තියා ඒ රැයින්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරො අවුරුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානිචත්තාරි වස්ස සහස්සානි, දිව්‍යමයවූ අවුරුදු සාරදහසක්; තුසිතානං දෙවානං, තුසිත දෙවියන්ට; (ඇති) ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය වෙයි; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; එකච්චා ඉත්ථී වා පුරිසො වා, ඇතැම් ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ; අට්ඨංග සමන්නාගතං,

යානි විසාඛෙ මානුසකානි අට්ඨවස්සසතානි නිම්මාණරතීනං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨවස්සසහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

---

අෂ්ටාංගයෙන් යුක්තාවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; තුසිත තං දෙවානං, තුෂිත දෙව්ලොව වැසි දෙවියන් හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යන; යං, යමක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහි; විජ්ජති ඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුසිකවූ රාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසුවය පිණිස; කපණං, ස්වල්පවින්නේය (යන) ඉදං ඛො පන, මෙය වනාහි; එතං සන්ධාය, මේ සඳහා; භාසිතං, කියනලදී;

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසිකවූ; යානි අට්ඨවස්සසතානි, යම් අවුරුදු අටසියයක් ඇද්ද; එසො, මේ තෙම; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙව්ලොව දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තායරත්තියා, ඒ රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රෑයෙක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරො, අවුරුද්දෙක; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි අට්ඨවස්සසහස්සානි. දිව්‍යවූ අටදහසක් අවුරුදු; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවියන්ට; ආයුප්පමාණං, ආයු ප්‍රමාණය වෙයි; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්ථී වා පුරිසො වා, ඇතැම් ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ; අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාංගයෙන් යුක්තාවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්ස, ශරීරයාගේ; භෙදා, භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවියන් හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්

යානි විසාඛෙ මානුසකානි සොළසවස්සසතානි පරනිම්මිත වසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළසවස්ස සහස්සානි පරනිම්මිත වසවත්තීනං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිත වසවත්තීනං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධායාති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා,

---

නේය; (යත) යං, යමක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහි, විජ්ජති ඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසිකං රජ්ජං, මනුෂ්‍යමය වූ චක්‍රවර්ති රාජ්‍යය; දිබ්බංසුඛං උපනිධාය; දිව්‍ය සැපය පිණිස; කපණං, ස්වල්ප වන්නේය; (යත) ඉදං ඛො පන, මෙය වනාහි; එතං සන්ධාය, මේ නිසා; භාසිතං, කියනලදි;

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසික වූ; යානි සොළස වස්සසතානි, යම් ෂොඩශ වර්ෂශත කෙනෙක් ඇද්ද; හෙවත් එක් දහස් සසිය අවුරුදු කෙනෙක් ඇද්ද; එසො, මේ තෙම; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දිව්‍යලොකයෙහි දෙවියන්ට; එකොරත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තාය රත්තියා, ඒ රැයින්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මාසයෙක් වෙයි. තෙන මාසෙන, ඒ මසින්; ද්වාදස මාසියො, දොළොස්මස් කෙනෙක්; සංවච්ඡරෙ අවුරුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද් දෙන්; දිබ්බානි සොළසවස්ස සහස්සානි, දිව්‍ය සොළොස් දහසක් අවුරුදු, පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියන්ට; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය වෙයි; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්ථී වා පුරිසො වා, සමහර ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ; අට්ඨංග සමන්නාගතං, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්ස භෙදා, ස්කන්ධ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දෙවියන් හා; සහව්‍යතං, එකීභාවයට; උප්පජ්ජෙය්‍ය, පැමි

පාණං න හානෙ න චාදින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං

මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායංච සයෙථ සන්ථතෙ
එතංහි අට්ඨංගිකමාහුපොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං

---

ණෙන්නේය; (යන) යං, යම් කාරණයක් ඇද්ද; එතං ඨානං පන, මේ කාරණය වනාහි; විජ්ජති නො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව මානුසකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්ති රාජ්‍යය; දිබ්බං සුඛං උප නිධාය; දිව්‍යසැපය පිණිස; කාඝණං සවල්පවන්නේය; (යන) ඉදං බො පන මෙය වනාහි; එතං සන්ධාය, මේ සඳහා; භාසිතං ඉති, කියනලද්දේ යයි වදාළසේක;

භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ ධර්මදෙශනාව; අවොච, වදාළසේක; ඉදං, මේ ධර්මය; වත්වා, වදාරා; අථ, ඉක්බිත්තෙන්; අපරං, අන්‍ය ගාථාබන්ධනයක් වූ; එතං, මේ දෙශනාව; සුගතො, සොභන ගමින් ඇත්තා වූ; සත්ථා ශාස්තෲන් වහන්සේ; අවොච වදාළසේක;

පාණං න හානෙ, ප්‍රාණඝාත නොකරන්නේ ද; අදින්නං, නුදුන් වස්තුව; න ච ආදියෙ, නොම ගන්නේ ද; මුසා න භාසෙ, බොරු නොකියන්නේ ද; න ච මජ්ජපො සියා, මද ප්‍රමාදයට කාරණවූ මද්‍යපානය කරන්නෙක් නොවන්නේ ද; මෙථුනා, මෛථුන යයි කියනලද්දාවූ අබ්‍රහමචරියා, අශ්‍රෙෂ්ඨ චරියාවෙන්; විරමෙය්‍ය, වළකින්නේ ද; රත්තිං, රාත්‍රි භොජනය ද; විකාලභොජනං (දවල්) විකාලභොජනය ද; න භුඤ්ජෙය්‍ය, අනුභව නොකරන්නේ ද;

මාලං, මල්; න ධාරෙ, (පැළඳීම් වශයෙන්) නොදරන්නේ ද; ගන්ධං, සුවඳ; න ච ආචරෙ, දූරීම් වශයෙන් නොහැසිරෙන්නේ ද; මඤ්චෙ වා, මුෂ්ටිහස්තප්‍රමාණ පා ඇති කප්පිය මඤ්චකයෙහි හෝ; ඡමායං වා, සුධාදීන් පිරියම් කරනලද භූමියෙහි හෝ; සන්ථතෙ වා, තෘණපර්ණ පලාලාදීන් අතුට කරනලද සංස්තරණයෙහි හෝ; සයෙථ, සයනය කරන්නේ ද; (යන) එතංහි උපොසථං, මේ (ප්‍රාණ

චන්දෙ ච සුරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසන්ති දිසා විරොචනා.

එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තං මණිං වෙළුරියඤ්ච භද්දකං
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති.

---

ඝාතාදියෙහි නොහැසිරෙන්නාහු විසින් වසනලද උපොෂිත ශීලය වනාහී; අට්ඨංගිකං, අඞ්ග අටකින් යුක්ත යයි; ආහු, කියත්; දුක්ඛන්තගූනා. දුඃඛයාගේ කෙළවරට ගියාවූ; බුද්ධෙන. බුදුන් විසින්; පකාසිතං, ප්‍රකාශකරනලදී;

සුදස්සනා, යහපත් දැකුම් ඇත්තාවූ; තමොනුදා, එකී එකී දිගින් යොදුන් නවලක්ෂයක් නවලක්ෂයක් පමණ තන්හි අඳුරු දුරුකරන්නාවූ; චන්දෙ ච, චන්ද්‍ර තෙමේ ද; සුරියො ච, සූර්‍ය්‍ය තෙමේ ද; (යන) උභො, දෙදෙන; යාවතා, යම් පමණ ප්‍රදෙශයක්; ඔභාසයං, බබුලුවමින්; අනුපරියන්ති, වටඇවිදිද්ද හෙවත් හැසිරෙද්ද; අන්තලික්ඛගා, ආකාසගාමිවූ හෙවත් අහසින් යන්නාවූ; දිසා විරොචනා, පෞරස්ත්‍යාදි සියලු දිශාවෙහි වොරජනා වූ; තෙ පන, ඒ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ වනාහී; නභෙ පභාසන්ති, අහසෙහි දිලියෙද් ද;

එතස්මිං අන්තරෙ, මේ අතුරෙහි හෙවත් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පනස්යොදුන් පමණ වට ඇති චක්‍රවාටාන්තරයෙහි; යං මුත්තං, සමුද්දිකාදි අෂ්ටප්‍රකාර යම් මුතුවර්ගක් ඇද්ද; මණිං, ඉන්ද්‍රනීල මහානීලාදි මැණික්වර්ගයක් ඇද්ද; භද්දකං, ශ්‍රෙෂ්ඨවූ; වෙළුරියඤ්ච, වෛදූර්‍ය්‍යමය වූ මැණික් වර්ගයක් ඇද්ද; සිංගීසුවණ්ණං, ගවශෘංග සදෘශව උපන් හෙයින් ඒ නැමැති ස්වර්ණයද; අථවා අපි, නොහොත්; කඤ්චනං, පර්වතයෙහි හටගත් ස්වර්ණයද; ජාතරූපං, ශාස්තෲවර්ණ ස්වර්ණ යයි කියා ද; හටකන්ති, කුහුඹුවන් විසින් ඇද නිකුත්කළ හෙයින් හටක ස්වර්ණ යයි කියාද; වුච්චති, කියනු ලැබේ ද; (යන) ධනං, වස්තුවෙක්; විජ්ජති, විද්‍යමානවේ ද;

අට්ඨංගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානු භවන්ති සොළසිං
චන්දප්පභා තාරගණාව සබ්බෙ
තස්මා හි නාරී ච නරො ච සීලවා

අට්ඨංගුපෙතං උපවස්සුපොසථං
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි.
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති

ඉදමවොච භගවා අත්තමනා විසාඛා භගවතො
භාසිතං අභිනන්දීති.

විසාඛුපොසථ සුත්තං.
'තිකඞ්ගුත්තරෙ"

---

තෙ, ඒ සියලු වස්තූහු; චන්දප්පභා, චන්ද්‍රාලොකයහට; සබ්බෙ තාරගණාඉව, සියලු තාරකා සමූහයා මෙන්; අට්ඨංගුපෙතස්ස, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථස්ස, (අහො රාත්‍රියෙක්හි රක්‍ෂා කරනලද) උපොෂථයාගේ (පිහෙන්); සොළසිං කලම්පි, සොළොස් වන කොටසට; නානුභවන්ති, නොපැමිණෙත්; තස්මාහි, එහෙයින්; සීලවා, සිල්වත්වූ; නාරී ච, ස්ත්‍රීතොමෝ ද; නරො ච, පුරුෂතෙමේද;

අට්ඨංගුපෙතං අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපවස්සුපොසථං, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට (අනිකුදු) සුඛුද්‍රයානි, සුඛවිපාක දයකවූ හෙවත් සුඛවෙදනීයවූ; පුඤ්ඤානිකත්වාන, (දනාදී) පින් කොට; අනින්දිතා, නින්දිතනොව; සග්ගං ඨානං, ස්වර්ගස්ථානයට; උපෙන්ති, පැමිණෙත් (හෙවත්) දෙව්ලොවෙහි උපදනාහු යයි වදළසේක;

භගවා, භාග්‍යවත් සම්‍යක් සම්බුඩ සර්‍වඥරාජොත්තමයාණන් වහන්සේ; ඉදං, මේ උපොසථ සූත්‍ර දෙශනාව; අවොච, වදළසේක; අත්තමනා, ප්‍රීතියෙන් ඔදවැඩියාවූ සිත්ඇති; විසාඛා, විශාඛා මහා උපාසිකාතොමෝ; භගවතො, භාග්‍යවත් බුදුරජාණන්වහන්සේගේ; භාසිතං උපොෂථ සූත්‍රදෙශනාවට; අභිනන්දි ඉති, සතොෂයෙන් අනුමෝදනාව සාධු සාධු කියා මස්තකයෙන් පිළිගත්තාහුය;

විසාඛුපොසථ සුත්තං, විසාඛුපොසථ සූත්‍රයයි;
තිකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර නිකායෙහි;
තුන්වන නිපාතයෙහි ය;

එවමෙම් සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන සිඟාලකො ගහපති පුත්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං.

අථ ඛො භගවා පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි, අද්දසා ඛො භගවා සිඟාලකං ගහපති පුත්තං කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං දිස්වාන සිඟාලකං ගහපතිපුත්තං එතදවොච කිං නු ඛො ත්වං ගහපතිපුත්ත කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති.

---

මෙ, (ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ) මා විසින්; එවං, මේ ආකාරයෙන්; සුතං, අසනලදී, (නොහොත්) මෙ, මාගේ; සුතං, ඇසීම; එකං සමයං, එක් ධර්මදෙශනා කාලයෙක්හි; භගවා, භාග්‍යවත් නම්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ; රාජගහෙ, රාජගෘහ නම් පුරප්‍රවරස්ථානයෙහිවූ; කලන්දකනිවාපෙ, ලෙහෙනුන්ට බත් වැටූප් දුන් හෙයින් කලන්දකනිවාප නම් වූ; වෙළුවනෙ, හුණවනයකින් පරික්ෂිප්ත හෙයින් වෙළුවන නම් වූ මහා විහාරයෙහි; විහරති, වැඩවාසය කළසේක;

තෙන සමයෙන ඛොපන, ඒ කාලයෙහි වනාහි; සිඟාලකො ගහපති පුත්තො, සිඟාලක නම් වූ ගෘහපති පුත්‍රතෙම; කාලස්සෙව, අලුයම් වේලෙහි ම; වුට්ඨාය, නැගීසිට; රාජගහා, රජගහ නුවරින්; නික්ඛමිත්වා, බහිනිෂ්ක්‍රමණයකොට; අල්ලවත්ථො, තෙත්වූ වස්ත්‍රයෙන් යුක්තවූයේ; අල්ලකෙසො, තෙත්වූ කෙශකලාපයෙන් උපලක්ෂිතවූයේ; පඤ්ජලිකො, දසනඛ සමොධානයෙන් යුක්තව, හස්තපුට මස්තකයෙහි තබතලද්දේ; පුථුද්දිසා, නානාප්‍රකාර දිශාවන්; නමස්සති, නමස්කාර කරයි; (කොබඳු දිශාවෙ වන්දයත්;)

පිතා මං භන්තෙ කාලං කරොන්තො එවං අවච ඡද්දිසා තාත නමස්සෙය්‍යාසීති, සො ඛො අහං භන්තෙ පිතු වචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සාමි පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති න ඛො ගහපතිපුත්ත අරියස්සවිනයෙ එවං ඡද්දිසා නමස්සිතබ්බාති, යථා කථං පන භන්තෙ අරියස්සවිනයෙ ඡද්දිසා නමස්සිතබ්බා, සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු යථා අරියස්සවිනයෙ ඡද්දිසා නමස්සිතබ්බාති

---

පුරත්ථිමං දිසං, පූර්ව දිශාවය; දක්ඛිණං දිසං, දක්ෂිණ දිශාවය; පච්ඡිමං දිසං, පශ්චිම දිශාවය; උත්තරං දිසං, උතුරු දිශාවය; හෙට්ඨිමං දිසං යට දිශාවය; උපරිමං දිසං, උඩ දිශාවය; (යන මොහුයි) අථ ඛො ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳපොරවා; පත්තචීවරං ආදාය, කයින් සිවුර හා අතින් පාත්‍රයගෙණ; රාජගහං, රජගහ නුවරට; පිණ්ඩාය, පිඩු පිණිස; පාවිසි, ප්‍රවිෂ්ටවූ සේක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; කාලස්සෙව, ඉතා අලුයම් වේලෙහි ම; උට්ඨාය, නැගීසිට; රාජගහා, රජගහ නුවරින්; නික්ඛමිත්වා, පිටතට නික්ම; අල්ලවත්ථං, තෙත්වූ වස්ත්‍ර ඇත්තාවූ; අල්ලකෙසං, තෙත්වූ හිසකේ ඇත්තාවූ; පඤ්ජලිකං, ඇඳිලිබැඳීම් ඇත්තාවූ (හෙවත් දසනඛ සමොධානයෙන් යුක්තවූ හස්තපුටය මස්තකයෙහි තබනලද්දාවූ); පුරත්ථිමං දිසං, පෙර දිගය; දක්ඛිණං දිසං, දකුණු දිගය; පච්ඡිමං දිසං, පැළ දිගය; උත්තරං දිසං, උතුරු දිගය; හෙට්ඨිමං දිසං, යට දිශාවය; උපරිමං දිසං, උඩ දිශාවය; (යන) පුථුද්දිසා, බොහෝ දිශාවන්ට; නමස්සන්තං, නමස්කාරකරන්තාවූ; සිගාලකං ගහපතිපුත්තං, සිගාලක නම්වූ ගෘහපති පුත්‍රයා; අද්දසා ඛො, දුටුසේක්මය; දිස්වාන, දැක; සිගාලකං ගහපති පුත්තං, සිගාලක නම්වූ ගෘහපති පුත්‍රයාට; එතං, මේ කරුණ; අවොච, වදාළ සේක.

ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; කාලස්ස එව, ප්‍රාතඃ කාලයෙහිම; උට්ඨාය, නැගීසිට; රාජගහා, රජගහ නුවරින්; නික්ඛමිත්වා, නිෂ්ක්‍රමණය කොට; අල්ලවත්ථො, තෙත්වූ වස්ත්‍ර ඇත්තේ; අල්ල කෙසො, තෙත්වූ හිසකේ ඇත්තේ; පඤ්ජලිකො, ඇඳිලි බැඳීම්

තෙන හි ගහපතිපුත්ත සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති, එවං භන්තෙති ඛො සිඟාලකො ගහපතිපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච, යතො ඛො ගහපතිපුත්ත අරියසාවකස්ස චත්තාරො කම්මකිලෙසා පහීනා හොන්ති චතූහි ඨානෙහි පාපං කම්මං න කරොති ඡ ච භොගානං අපායමුඛානි න සෙවති, සො එවං චුද්දසපාපකාපගතො ඡද්දිසා පටිච්ඡාදී උභොලොකවිජයාය පටිපන්නො හොති තස්ස අයඤ්චෙව ලොකො ආරද්ධො හොති පරො ච ලොකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති

---

ඇත්තේ; පුරත්ථිමං දිසං, පූර්ව දිශාවය; දක්ඛිණං දිසං, දක්ෂිණ දිශාවය; පච්ඡිමං දිසං, පශ්චිම දිශාවය; උත්තරං දිසං, උතුරු දිශාවය; හෙට්ඨිමං දිසං, යට දිශාවය; උපරිමං දිසං, උඩ දිශාවය යන; පුථුද්දිසා, බොහෝ දිශාවන්; ත්වං, තෝ; කිනනු, කවර කාරණය කින්; නමස්සසි ඉති, නමස්කාර කරන්නෙහිදැයි, (විචාරා වදාළ සේක.

භන්තෙ, ස්වාමීන් වහන්ස; කාලං කරොන්තො, කාලක්‍රියා කරන්නාවූ; පිතා, පියතෙම; (කියනුයේ) තාත, පුත්‍රය; දිසා, පුරත්ථිමාදී දිශාවන්ට; නමස්සෙය්‍යාසි ඉති, නමස්කාර කරවයි; මං, මට; එවං අවච, මෙසේ කියේය; (එහෙයින්) භන්තෙ, ස්වාමීනි; සො ඛො අහං, ඒ මම; පිතු, පියාගේ; වචනං, වචනයට; සක්කරොන්තො, සත්කාර කරන්නෙම්; ගරුකරොන්තො, ගරුකාර කරන්නෙම්; මානෙන්තො, සිතින් බුහුමන් කරන්නෙම්; පූජෙන්තො, පූජාකරන්නෙම්; කාලස්සෙව උට්ඨාය, ප්‍රාතඃ කාලයෙහිම නැගීසිට; රාජගහා, රජගහ නුවරින්; නික්ඛමිත්වා, බහි නිෂ්ක්‍රමණයකොට; අල්ලවත්ථො, තෙත්වූ වස්ත්‍ර ඇත්තේ; අල්ලකෙසො, තෙත්වූ හිසකේ ඇත්තේ; පඤ්ජලිකො, ඇඳිලිබැඳීම් ඇත්තේ; පුරත්ථිමං දිසං, පූර්ව දිශාවය; දක්ඛිණං දිසං, දක්ෂිණ දිශාවය; පච්ඡිමං දිසං, පශ්චිම දිශාවය; උත්තරං දිසං, උතුරු දිශාවය; හෙට්ඨිමං දිසං, යට දිශාවය; උපරිමං දිසන්ති, උඩ දිශාවය යන; පුථුද්දිසා, අනෙකප්‍රකාර දිශාවන්; නමස්සාමි, නමස්කාර කරන්නෙමියි; (දැන්වූයේය) ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අරියස්ස විනයෙ, ආර්‍ය්‍යවූ බුදුන්ගේ විනයෙහි; එවං, මෙසේ; ඡද්දිසා (පෞරස්ත්‍යාදී) ෂට්දිශාවෝ; නඛො නමස්සිතබ්බාති, නොම නමස්කාර කටයුත්තාහු යයි (වදාළ සේක)

කතමාස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්ති, පාණාතිපාතො ඛො ගහපතිපුත්ත කම්මකිලොසො අදින්නාදානං කම්මකිලෙසො කාමෙසු මිච්ඡාචාරො කම්මකිලෙසො මුසාවාදො කම්මකිලෙසො ඉමාස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්තීති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

පාණාතිපාතො අදින්නාදානං—මුසාවාදො පවුච්චති
පරදාරගමනඤ්චෙව—නප්පසංසන්ති පණ්ඩිතාති

---

භන්තෙ, ස්වාමීන් වහන්ස; අරියස්ස විනයෙ, ආර්‍යයන්ගේ විනයෙහි; ඡද්දිසා, සදිසාවෝ; යථාකථම්පන නමස්සිතබ්බා, කෙසේ නමස්කාර කටයුතු වේද්ද; භන්තෙ, ස්වාමීන් වහන්ස; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අරියස්ස විනයෙ, ආර්‍යයන් වහන්සේගේ විනයෙහි; ඡද්දිසා, ෂට්දිසාවෝ; යථා නමස්සිතබ්බා, යම්සේ නමස්කාර කටයුතු වේද්ද; (ඒ ප්‍රකාරයෙන්) මෙ, මට; ධම්මං, ධර්‍මය; දෙසෙතු ඉති, දේශනාකර වදාරණසේක්වා නම්; සාධු ඉති, මැනවයි යාඥ කෙළේය;

තෙනහි, එසේ වීනම්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සුණාහි, අසව; සාධුකං, මනාකොට; මනසිකරොහි, අසා දරාගණුව; භාසිස්සාමි ඉති, තට දෙශනා කරන්නෙමි කියා සඳහ පවාරණයෙන් පවරා වදාළසේක; සිගාලකො ගහපතිපුත්තො. සිගාලක නම් ගෘහපති පුත්‍රතෙම; එවං භන්තෙති ඛො, එසේය පින්වතුන් වහන්සැයි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසි, ප්‍රතිවචන දුන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මේ ධර්‍මය (මෙසේ) වදාළසේක; කෙසේද;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අරියසාවකස්ස, ආර්‍ය ශ්‍රාවකයාගේ; චත්තාරො කම්මකිලෙසා, චතුර්විධවූ කර්මක්ලේශයෝ; යතො ඛො, ඛො යනු පදපූරණයෙහි නිපාතයෙකි යම්හෙයකින්; පහීණා හොන්ති, ප්‍රහීණවෙත් ද; චතූහි ඨානෙහි, චතුර්විධ කාරණයකින්; පාපකම්මං, ලාමක ක්‍රියාව; න කරොති, නොකෙරේද; භොගානං, උපභොග පරිභොග වස්තූන්ගේ; අපායමුඛානි, විනාශවීමට කාරණයෝ; ඡ, සදෙනෙක්ද වන්නාහුය;(ඔවුන්) න සෙවති, සෙවනය නොකෙරේද; සො, ඒ ආර්‍යශ්‍රාවකතෙම; එවං, මෙසේ; චුද්දසපාපකාපගතො, තුදුස් ලාමක ධර්‍මයන්ගෙන් පහවූයේ; ඡද්දිසා, ෂට්දිශාවන්; පටිච්ඡාදී, ප්‍රතිච්ඡාදනය කරන්නේ; උභොලොකෙ විජයාය,

කතමෙහි චතූහි ඨානෙහි පාපකම්මං න කරොති, ඡන්දාගතිං ගච්ඡන්තො පාපං කම්මං කරොති දොසාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති භයාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති මොහාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති. යතො ඛො ගහපතිපුත්ත අරියසාවකො නෙව ඡන්දාගතිං ගච්ඡති න දොසාගතිං ගච්ඡති න භයාගතිං ගච්ඡති න මොහාගතිං ගච්ඡති ඉමෙහි චතූහි ඨානෙහි පාපකම්මං න කරොතීති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

ඓහලෞකික පාරලෞකිකාර්ථය ජයගන්නා පිණිස; පටිපන්නො හොති, පිළිපන්නේ වෙයි; තස්ස, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින්; අයං චෙව ලොකො, මෙලොවද; ආරද්ධො හොති, පඤ්චවිධවූ පාපයෙන් විනිර්මුක්ත හෙයින් සතුටුවන ලද්දේවේ; පරොච ලොකො, පර ලොවද; (ආරද්ධො,) පඤ්චප්‍රකාරවූ වෛරීන් කෙරෙන් විනිර්මුක්ත හෙයින් සතුටුවන ලද්දේ (හෙවත්) නිපදවන ලද්දේ; කායස්සභෙදා, කරජකායයාගේ භේදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත් තෙහි; සුගතිං, සොභන කර්මයෙන් යායුතු හෙයින් සුගති නම්වූ; සග්ගං, සියලු පඤ්චකාමසම්පත්තියෙන් සුට්ඨුඅග්‍ර හෙයින් ස්වර්ගනම්වූ ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය;

අස්ස, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ; කතමෙ, කවරනම්වූ; චත්තාරො කම්මකිලෙසා චතුර්විධවූ කර්මක්ලේශයෝ; පහීණා හොන්ති, ප්‍රහීණ වන්නාහු වෙද්ද? ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පාණාතිපාතො ඛො, ප්‍රාණාතිපාත නම්වූ; කම්මකිලෙසො, කර්මක්ලේශයය; අදින්නාදානං, අදත්තාදාන නම්වූ; කම්මකිලෙසො, කර්මක්ලේශයය; කාමෙසු මිච්ඡාචාරො, කාමයන්හී වරදවා හැසිරීමවූ; කම්මකිලෙසො, කර්ම ක්ලේශයය; මුසාවාදො, බොරුකීමවූ; කම්මකිලෙසො, කර්මක්ලේශ යය; (යන) ඉමෙ චත්තාරො කම්මකිලෙසා, මේ චතුර්විධවූ කර්ම ක්ලේශයෝ; අස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; පහීණා හොන්තීති, ප්‍රහීණ වූවාහු වෙත් යන; ඉදං, මේ දෙශනාව; අවොච, වදාළසේක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මෙය; වත්වා, වදාරා; සුගතො, සොභන ගති ඇතිහෙයින් සුගත නම්වූ; සත්ථා, දෙව්මිනිසුන්ට අනුශාසනා කරණ හෙයින් ශාස්තෘ නම්වූ සර්වඥයන් වහන්සේ; අථ, නැවත; අපරං, තදර්ථදීපනය පිණිස අනිකාක්වූ; එතං, මේ වක්ෂ්‍යමාන ගාථාව; අවොච, වදාළසේක; කෙසේද?

ඡන්දා දොසා භයා මොහා-යො ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසො-කාළපක්ඛෙව චන්දිමා
ඡන්දා දොසා භයා මොහා-යො ධම්මං නාතිවත්තති
ආපූරති තස්ස යසො-සුක්කපක්ඛෙව චන්දිමාති.

කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපතිපුත්ත භොගානං අපාය මුඛං විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං ආලස්සානුයොගො භොගානං අපායමුඛං.

---

පාණාතිපාතො, ප්‍රාණඝාතයද; අදින්නාදානං, අදත්තාදානයද; මුසාවාදෙ, මෘෂාවාදයද; පරදාරගමනඤ්ච එව, (එව, යනු පදාලඞ්කාරවූ නිපාත මාත්‍රයක) පරස්ත්‍රීන්කරා එළඹීමද; (යන චතුර්විධ කර්ම ක්ලෙශයන් සෙවනය කිරීම) පණ්ඩිතා, ප්‍රාඥයෝ; නප්පසංසන්ති, ප්‍රශංසා නොකෙරෙත් යයි; පවුච්චති, කියනු ලැබෙයි;

කතමෙහි චතුහිඨානෙහි, කවරප්‍රකාරවූ චතුර්විධ කාරණය කින්; පාපකම්මං න කරොති, ලාමකක්‍රියාව නොකෙරේද; (ඒ මෙසේයි) ඡන්දාගතිං ගච්ඡන්තො, ඡන්දයෙන් අගතියට යන්නේ; පාපකම්මං කරොති, ලාමක ක්‍රියාව කෙරෙයි; දොසාගතිං ගච්ඡන්තො, ද්වේෂයෙන් අගතියට යන්නේ; පාපකම්මං කරොති, ලාමක ක්‍රියාව කෙරෙයි; භයාගතිං ගච්ඡන්තො, භයින් අගතියට යන්නේ; පාපකම්මං කරොති, නීච ක්‍රියාව කෙරෙයි; මොහාගතිං ගච්ඡන්තො, මොහයෙන් අගතියට යන්නේ; පාපකම්මං කරොති, පාපකර්මය කරන්නේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; යතො ඛො, යම් හෙයකින්; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවක තෙම; නෙව ඡන්දාගතිං ගච්ඡති, ඡන්දයෙන් අගතියට නොමයෙයි; න දොසාගතිං ගච්ඡති, ද්වේෂයෙන් අගතියට නොමයෙයි; න භයාගතිං ගච්ඡති, භයින් අගතියට නොමයෙයි; න මොහාගතිං ගච්ඡති, මොහයෙන් අගතියට නොමයෙයි; ඉමෙහි චතූහි ඨානෙහි, මේ කාරණා සතරෙන්; පාපකම්මං නකරොති ඉති, පාපකර්මය නොකෙරෙයි යන; ඉදං, මේ ධර්ම කොට්ඨාසය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළසේක;

ඡ ඛො මෙ ගහපතිපුත්ත ආදීනවා සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගෙ, සන්දිට්ඨිකා ධනජානි කලහප්පවඩ්ඪනී රොගානං ආයතනං අකිත්ති සඤ්ජනනී කොපීනං නිදංසනී පඤ්ඤාය දුබ්බලී කරණී ඡට්ඨං පදං භවති ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගෙ;

ඡ ඛොමෙ ගහපතිපුත්ත ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ අත්තාපිස්ස අගුත්තො අරක්ඛිතො හොති පුත්තදාරොපිස්ස අගුත්තො අරක්ඛිතො හොති සාපතෙය්‍යම්පිස්ස අගුත්තං අරක්ඛිතං හොති සංකියො ච හොති පාපකෙසු ඨානෙසු අභූතං වචනං තස්මිං රූහති බහුන්නඤ්ච දුක්ඛ ධම්මානං පුරක්ඛතො හොති ඉමෙ ඛො ගහපති පුත්ත ඡ ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ.

---

සුගතො, සොභන ගමන් ඇති; සත්ථා, ශාස්තෘන් වහන්සේ; ඉදං, මේ දහම් කොටස; වත්වා, වදාරා; අථාපරං, තදනන්තරයෙහි පණ්ඩිත සේක; කෙසේ ද? අතික්‍රාන්තවූ; ඒතං, මේ වක්ෂ්‍යමාන ගාථාව; අවොච, වදාළසේක; කෙසේ ද?

යො, යම් පුද්ගලයෙක් තෙම; ඡන්ද, ඡන්දගතියෙන් ද; දොසා, ද්වේෂා ගතියෙන් ද; භයා, භයා ගතියෙන් ද; මොහා, මොහා ගති යෙන් ද; ධම්මං, ස්වභාව ධර්මය; අතිවත්තති, ඉක්මවා පවතී ද; තස්ස, ඒ පුද්ගලයාගේ; යසො, කීර්තිප්‍රතාපෛශ්වර්‍ය්‍යය; නිහීයති, පිරිහෙයි; (කුමක්මෙන් ද යත්?) කාලපක්ඛෙ, කෘෂ්ණපක්ෂයෙහි; චන්දිමා ඉව චන්ද්‍රයා මෙනි;

යො, යමෙක් තෙම; ඡන්ද, ඡන්දගතියෙන් ද; දොසා, ද්වේෂා ගතියෙන් ද; භයා, භයා ගතියෙන් ද; මොහ, මොහා ගතියෙන් ද; ධම්මං, ස්වභාව ධර්මය; නාතිවත්තති, ඉක්ම නොපවත්වා ද; තස්ස, ඔහුගේ; යසො, කීර්ති ප්‍රතාපෛශ්වර්‍ය්‍යය; ආපූරති, සම්පූර්ණ වෙයි; හේ කුමක්මෙන්ද? සුක්කපක්ඛෙ, ශුක්ලපක්ෂයෙහි; චන්දිමා ඉව, ෂොඩශ කලාවෙන් සම්පූර්ණවන්නාවූ චන්ද්‍රමණ්ඩලය මෙනැයි වදාළසේක.

භොගානං, වස්තූන්ගේ; අපායමුඛානි, විනාශවීමට කාරණයෝ ඡ, සදෙනෙක් වන්නාහුය; (ඔවුන්) න සෙවති, සෙවනය නොකෙරෙයි; කතමානි ඡ, ඔහු සදෙන නම් කවරහු ද; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; සුරාමෙරය මජ්ජපමා දට්ඨානානු යොගො ඛො,

ඡ ඛොමෙ ගහපතිපුත්ත ආදීනවා සමජ්ජාභිචරණෙ, ක්‍ව නච්චං ක්‍ව ගීතං ක්‍ව වාදිතං ක්‍ව අක්ඛානං ක්‍ව පාණිස්සරං ක්‍ව කුම්භථූනන්ති ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සමජ්ජාභිචරණෙ.

ඡ ඛොමෙ ගහපතිපුත්ත ආදීනවා ජූතප්පමාදට්ඨානානුයොගෙ ජයං වෙරං පසවති පරාජිතො විත්තමනුසොචති සන්දිට්ඨිකා ධනඤ්ජානි සභාගතස්ස වචනං න රූහති මිත්තාමච්චානං පරිභූතො හොති ආවාහවිවාහකානං අපත්ථිතො හොති අක්ඛධුත්තො පුරිසපුග්ගලො නාලං දාරභරණායාති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා ජූතප්පමාදට්ඨානානුයොගෙ.

---

සුරාමෙරය මද්‍යපානයෙහි ප්‍රමාද වශයෙන් නැවත නැවත යෙදීම; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක; විකාලවිසිඛා චරියානුයොගො, නොකල්හි වීථින්හි හැසිරීමද; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක; සමජ්ජාභිචරණං, නෘත්‍යගීතාදිය දශීනය පිණිස හැසිරීමද; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක; ජූතප්පමාදට්ඨානානුයොගො, ජූතක්‍රීඩාවෙහි නැවත නැවත යෙදීමද; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක; පාපමිත්තානුයොගො, පාපමිත්‍රයන් හා යෙදීමද; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක; ආලස්සානුයොගො, ආලශ්‍යභාවයෙන් යුක්තවීමද; භොගානං, වස්තූන්ගේ; අපායමුඛං, විනාශවීමට කාරණයෙක;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ, සුරාමෙරය මද්‍යපානයෙහි ප්‍රමාද වශයෙන් නැවත නැවත යෙදීමෙහි; ආදීනවා, අනර්ථ කාරණයෝ; ඉමෙ ඡ, මොහු සදෙනෙක් වෙත්; (ඔහු කවරහුද;) සන්දිට්ඨිකා, මෙලොව තමා විසින් දක්ක යුතුවූ; ධනජානි, වස්තු පිරිහීමය; කලහප්පවඩ්ඪනී, කලහයාගේ වැඩීමය; රොගානං ආයතනං, අක්ෂිරෝගාදීන්ට හේතුය; අකිත්ති සඤ්ජනනී, අකීර්තිය පහළකරන්නේය; කොපීනං නිදංසනී, හිරි සංඛ්‍යාත ලජ්ජාව නසන්නේය; පඤ්ඤාය දුබ්බලීකරණී, ප්‍රඥාවගේ දුර්බලකිරීම වන්නේය යන; ඡට්ඨංපදං, මේ සවැනි කාරණය වන්නේය; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; සුරාමෙරය මජ්ජපමා දට්ඨා

ඡ ඛොමෙ ගහපතිපුත්ත ආදීනවා පාපමිත්තානුයොගෙ යේ ධුත්තා යෙ සොණ්ඩා යෙ පිපාසා යෙ නෙකතිකා යෙ වඤ්චනිකා යෙ සාහසිකා ත්‍යස්ස මිත්තා හොන්ති තෙ සහායා, ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා පාපමිත්තානුයොගෙ.

ඡ ඛොමෙ ගහපතිපුත්ත ආදීනවා ආලස්සානුයොගෙ අතිසීතන්ති කම්මං න කරොති අතිඋණ්හන්ති කම්මං න කරොති අතිසායන්ති කම්මං න කරොති අතිපාතොති කම්මං න කරොති අතිඡාතොස්මීති කම්මං න කරොති අතිධාතොස්මීති කම්මං න කරොති එවං තස්ස කිච්චාපදෙස බහුලස්ස විහරතො අනුප්පන්නා චෙව භොගා නුප්පජ්ජන්ති උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා ආලස්සානු යොගෙති, ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

නානුයොගෙ, මද්‍ය ප්‍රමාදයට කාරණාවූ රහමෙර පීමෙහි නැවත නැවත යෙදීමෙහි; ආදීනවා, දොෂයෝ; ඉමෙ ඡ, මොහු සදෙනයයි (වදාළසේක;)

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; විකාල විසිඛාචරියානුයොගෙ, නොකල්හි වීථිසඤ්චාරණය කිරීමෙහි; ආදීනවා, දොෂයෝ; ඉමෙඡ, මොහු සදෙනෙක් වන්නාහුය; (ඔහු කවරහු ද?) අස්ස, යමෙක් නොකල්හී වීථිසඤ්චාරණය කරන්නේද ඔහුගේ; අත්තාපි, ආත්ම භාවයද; අගුත්තො, ගුප්තනොවන්නේ; අරක්ඛිතො හොති, රක්ෂා නොවන්නේ වේයි; අස්ස, ඔහුගේ; පුත්තදාරොපි, පුත්‍රදාරවෝ ද; අගුත්තා, ගුප්තනොවන්නේ; අරක්ඛිතො හොති, රක්ෂා නොවන් නේ වෙයි; අස්ස, ඔහුගේ; සාපතෙය්‍යම්පි, සම්පත්තියද; අගුත්තං, ගොපනය නොවන්නේ; අරක්ඛිතං හොති, රක්ෂා නොවන්නේ වෙයි; පාපකෙසු ඨානෙසු, ලාමක කාරණයන්හි; සංකියො ච හොති සැක කටයුත්තේ ද වෙයි; තස්මිං, ඔහු කෙරෙහි; අභූතං වචනං, අභූත වචනද; රූහති, හටගනී; බහූනඤ්ච, බාහුල්‍යවූද; දුක්ඛ ධම්මානං, දුක්ඛදෞර්මනස්‍යයන්ට; පුරක්ඛතො හොති, පෙරටුව යන සුලුවෙයි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; විකාලවිසිඛා චරියානු යොගෙ, නොකල්හි වීථිසංචාරණයෙහි යෙදීමෙහි; ආදීනවා, දොෂ යෝ; ඉමෙ ඡ, මේ සදෙනෙකැයි වදාළසේක;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සමජ්ජාභිචරණෙ, නෘත්‍යගීත දර්ශනාදිය පිණිස රඞ්ගස්ථානයට යාමෙහි; ආදීනවා, දොෂයෝ

ඉමෙඡ, මොහු සදෙනෙකි; ඔහු කවරහුද? ක්ව නච්චං, කොතැන්හි නටන්නේදැයි අසා ඒ ස්ථානයට යායුතුබවය; ක්ව ගීතං, කොතැන්හි ගීතිකා කියන්නාහුදැයි විචාරා ඒ ස්ථානයට යායුතුබවය; ක්ව වාදිතං, කොතැන්හි භෙරි ආදීන් වාද්‍යය කෙරෙද්දැයි විචාරා ඒ ස්ථානයට යායුතු බවය; ක්ව අක්ඛානං, කවර තැනෙක්හි දූකෙළිද්දැයි විචාරා එතැන්හි යායුතුබවය; ක්ව පාණිස්සරං, කවරතැනෙක්හි අත්පොල සන් දීමෙන් ක්‍රීඩා කෙරෙද්දැයි විචාරා එතැන්හි යායුතු බවය; ක්ව කුම්භථූනන්ති, කොතැන්හි කුම්භස්ථූනයන් වයන්නාහු වෙද්දැයි විචාරා එතැන්හි යායුතු බවය; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; සමජ්ජාභිචරණෙ, නෘත්‍යගීතාදිය දර්ශනය පිණිස හැසිරීමෙහි; ආදීනවා, දෙෂයෝ; ඉමෙඡ, මොහු සදෙන යයි වදාළසේක;

ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; ජූතප්පමාදට්ඨානානුයොගෙ, ජූතප්‍රමාදස්ථිමෙන් නැවත නැවත යෙදීමෙහි; ආදීනවා, දෙෂයෝ; ඉමෙඡ, මොහු සදෙනෙක් වෙත්; (ඔහු කවරහු ද?) ජයං, දිනන්නාවූ පුද්ගලතෙම; වෙරං, අනුන් විසින් බඳනාලද වෛරය; පසවති, පහළ කෙරෙයි; ජිතො, අනුන් විසින් දිනනලද්දේ; විත්තමනුසොචති, සිතඅනුව සොක කෙරෙයි; සන්දිට්ඨිකා, ඉහාත්මභාවයෙහි තමා විසින් දැක්කයුතු වූ; ධනජානී, වස්තුන්ගේ පිරිහීම වෙයි; සභාගතස්ස, සභාවට යනලද්දහුගේ; වචනං, වචනය; නරූහති, නොපිහිටයි; මිත්තාමච්චානං, මිත්‍රාමාත්‍යයන්ට; පරිභූතො හොති, අවමාන ප්‍රාප්තවෙයි; අක්ඛධුත්තො පුරිසපුග්ගලො, අක්ෂධූර්තවූ පුරිස පුද්ගල තෙම; දාරාභරණාය, දාරාභරණය පිණිස; නාලන්ති, නුසුදුසු යයි; ආවාහවිවාහකානං, ආවාහ විවාහකයන් විසින්; අපත්ථිතො හොති, නොපතන්නේ වෙයි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ජූතප්පමාදට්ඨානානුයොගෙ, ජූතක්‍රීඩාවෙහි නැවත නැවත යෙදීමෙහි; ආදීනවා, දෙෂයෝ; ඉමෙඡ, මොහු සදෙන යයි වදාළසේක;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පාපමිත්තානු යොගෙ, පවිටු මිත්‍රයන් හා යෙදීමෙහි; ආදීනවා, දෙෂයෝ; ඉමෙඡ, මොහු සදෙනෙක් වන්නාහුය; (ඔහුකවරහුද?) යෙ ධුත්තා, අක්ෂධූර්තවූ යම් පාප මිත්‍රයෝ ඇද්ද; යෙ සොණ්ඩා, ස්ත්‍රී ධූර්තවූ යම් කෙනෙක් ඇද්ද; යෙ පිපාසා, සුරාපානයකරණ යම් කෙනෙක් ඇද්ද; යෙ නෙකතිකා කෛරාටිකවූ යම් කෙනෙක් ඇද්ද; යෙ වඤ්චනිකා, වඤ්චාකරන්නාවූ යම් කෙනෙක් ඇද්ද; යෙ සාහසිකා, බලාත්කාරකම් කරන්

හෝති පානසඛා නාම–හෝති සම්මිය සම්මියෝ
යො ච අත්ථෙසු ජාතෙසු–සහායො හොති සො සඛා

---

නාවූ යම් කෙනෙක් ඇද්ද; තෙ, ඔහුතුමූ; අස්ස, ඕහට; මිත්තා හොන්ති, මිත්‍රයෝ වෙත්; තෙ, ඔහුතුමූ; සහායා, යහළුවෝ වෙත්; (එබඳු පාපමිත්‍රයන් හා මිත්‍රසන්ථවය කිරීමෙන් අනර්ථවන්නේය); ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පාපමිත්තානුයොගෙ පවිටුමිත්‍රයන් හා යෙදීමෙහි; ආදීනවා. දෝෂයෝ; ඉමෙඡ, මේහු සදෙන යයි වදාළසේක.

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ආලස්සානුයොගෙ, අලසභාවයෙන් යුක්තවීමෙහි; ආදීනවා, දෝෂයෝ; ඉමෙඡ බො, මේහු සදෙනෙක් වන්නාහුය: (ඔහු කවරහුද? අතිසීතන්ති කම්මං න කරොති, (ප්‍රාතඃකාලයෙහි අෂ්ටිහිජ්ජන ප්‍රමාණවූ) ඉතා සීතල යයි (වන්ති සන්තාපනයෙන් යුක්තව කර්මාන්ත නොකෙරෙයි; අතිඋණ්හන්ති කම්මං නකරොති, ඉතා උෂ්ණ යයි කර්මාන්තයන් නොකෙරෙයි; අතිසායන්ති කම්මංනකරොති, ඉතා සවස් යයි කර්මාන්ත නොකෙරෙයි; අතිපාතොති කම්මං නකරොති, ඉතා උදෑසන යයි කර්මාන්ත නොකෙරෙයි; අතිඡාතොසම්ති කම්මං නකරොති, ඉතා ක්ෂුධාවෙන් යුක්තවූයෙම් යයි කර්මාන්ත නොකෙරෙයි; අතිධාතොසම්ති කම්මං නකරොති, ඉතා අනුභවකිරීමෙන් බඩබර යයි කර්මාන්ත නොකෙරෙයි; එවං, මේ ප්‍රාකාරයෙන්; කිච්චාපදෙස බහුලස්ස, කෘත්‍ය ප්‍රදෙස බහුලව; විහරතො, වාසය කරන්නාවූ; තස්ස, ඔහුගේ; භොගා, වස්තුහු; නුප්පජ්ජන්ති, නූපදිත්; උප්පන්නා ච, උපන්නාවූද; භොගා, වස්තූහු; පරික්ඛයං ගච්ඡන්ති, ක්ෂයභාවයට පැමිණෙත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ආලස්සානුයොගෙ, ආලසිභාවයෙහි විශෙෂයෙන් යුක්තවීමෙහි; ආදීනවා, දෝෂයෝ; ඉමෙඡ ඉති, මේහු සදෙන යයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ දෙශනා කොටස; අවොච, වදාළසේක; සුගතො, සුගත නම්වූ තථාගත තෙම; ඉදං, මෙය; වත්වා, වදාරා; අථාපරං, නැවත දීපනය පිණිස අන්‍යයක් වූ; එතං, මේ ගාථාබන්ධනය; සත්ථා, ශාස්තෘන් වහන්සේ; අවොච, වදාළසේක; කෙසේද?

පානසඛ නාමහොති, (යමෙක් රාපීමෙහි යහළුවේද) හෙතෙම පානසඛානම් වෙයි; සම්මියසම්මියොහොති, (යමෙක් අභිමුඛයෙහි යහළුව යහළුවයි කියමින් මිත්‍රබව හඟවා පරාන්මුඛයෙහි වෛරීන් හා සදෘශවූයේ රන්ධ්‍රගවෙෂනය කෙරේද; හෙතෙම) සම්මියසම්මිය

උස්සූරසෙය්‍යා පරදාරසෙවනා
වෙරප්පසඞ්ගො ච අනත්ථතා ච

පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති.

පාපමිත්තො පාපසඛො - පාපආචාරගොචරො
අස්මා ලොකා පරම්හා ච - උභයා ධංසතෙ නරො

අක්ඛිත්ථියො වාරුණී නච්චගීතං
දිවාසොප්පං පාරිචරියා අකාලෙ

පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති.

---

නම් වේ; යොච, යමෙක් තෙමේද; අත්ථෙසු ජාතෙසු (තමහට ප්‍රයොජනයක් ඇතිවූ කල්හි; සහායොහොති, යහළුවේද; සො, හෙතෙම්, සඛා, අර්ථප්‍රතිරූපක යහළු නම් වේ.

උස්සූරසෙය්‍යා, සූර්‍ය්‍යෝද්ගමනය දක්වා සයනය කිරීමද; පරදාර සෙවනං, පරස්ත්‍රීන් සෙවනය කිරීමද; වෙරප්පසංගොච, බාහුල්‍යවූ වෛරයෙන් යුක්තවීමද; අනත්ථතා ච, මෙරමාහට අනර්ථ කරණබව ද; පාපාච මිත්තා, පවිටු මිත්‍රයන් ඇතිවීම ද; සුකදරියතා ච, දැඩි මසුරුබව ද; (යන) එතේඡඨානා, මේ කාරණයෝ සදෙන; පුරිසං, පුරුෂයා; ධංසයන්ති විනාශයට පමුණුවත්.

පාපමිත්තො, පවිටු මිත්‍රයන් ඇත්තේ ද; පාපසඛො, පවිටු සබඳුන් ඇත්තේ ද; පාපආචාරගොචරො, නිකෘෂ්ට වූ ආචාරයන් ගොචරකොට ඇත්තේ ද; සො නරො, ඒ සත්වතෙම; අස්මාලොකා, මේ ලොකයෙන් ද; පරම්හාච, පරලොවින් ද; (යන) උභයා, දෙලොවින්; ධංසතෙ, විනාසවේ;

අක්ඛිත්ථියො, අක්ෂධූර්ත ස්ත්‍රීධූර්තවීමද; වාරුණී, සුරාපානය කිරීමද; නච්චගීතං, නෘත්‍යගීතයෙහි ප්‍රමාදභාවය ද; දිවාසොප්පං, දහවල් නිද්‍රාකිරීමද; පාපචරියාඅකාලෙ, නොකල්හී මාර්ගයෙහි පවිටු බොරු හැසිරීම ද; පාපාචමිත්තා, පවිටු මිත්‍රයන් ඇතිබව ද; සුකරිදයතා ච, දැඩි මසුරුබව ද යන; එතෙ ඡ ඨානා, මේ කාරණයෝ සදෙන; පුරිසං, පුරුෂයා; ධංසයන්ති, විනාසයට පමුණුවත්.

අක්ඛෙහි දිබ්බන්ති සුරං පිවන්ති
සන්තිත්ථියො පාණසමා පරෙසං
නිහීනසෙවී නච වුද්ධිසෙවී
නිහීයති කාළපක්ඛෙව චන්දෙ.

යො වාරුණී අධනො අකිඤ්චනො
පිපාසො පිවං පපාගතො
උදකම්ව ඉණං විගාහති
අකුලං කාහති ඛිප්පමත්තනො.

න දිවාසුප්පනසීලෙන–රත්තිනුට්ඨානදස්සිනා
නිච්චං මත්තෙන සොණ්ඩෙන–සක්කා ආවසිතුං ඝරං
අතිසීතං අතිඋණ්හං–අතිසායමිදං අහු
ඉති විස්සට්ඨකම්මන්තෙ–අත්ථා අච්චෙන්ති මාණවෙ.

---

අක්ඛෙහි, පසඇටකරණකොටගෙණ; දිබ්බන්ති, ක්‍රීඩාකෙරෙත් ද; සුරංපිවන්ති, සුරාපානය කෙරෙද් ද; පරෙසං, අනුන්ගේ; පාණසමා, ප්‍රාණය සමානවූ; ඉත්ථියො, ස්ත්‍රීහු; සන්ති, විද්‍යමානවන්නාහු ය; (ඔවුන් සෙවනය කෙරේ ද) නිහීනසෙවී, ප්‍රාණවධාදියෙහි නියුක්තවූ හීනයන් සෙවනය කෙරේ ද; නචවුඩසෙවී, ඥාණවෘද්ධාදී ත්‍රිවිධ වෘද්ධයන් සෙවනය නොකෙරේ ද; තස්ස, ඔහුගේ; (ඓශ්වර්‍ය්‍යය) කාලපක්ඛෙ, කෘෂ්ණපක්ෂයෙහි; චන්දෙ ඉව, චන්ද්‍රමණ්ඩලය මෙන්; නිහීයති, පිරිහෙයි;

අධනො, නිර්ධනවූ; අකිඤ්චනො, කිසි වස්තුවක් නැත්තාවූ; පිපාසො, සුරාපානයෙහි ලොල්වූ; පපාගතො, සුරාපාන ශාලාවට පැමිණියාවූ පුද්ගල තෙම; වාරුණිපිවං, සුරාපානය කරන්නේ; උදකං ඉව, ශෛලතලයෙහි වරුෂා ජලය මෙන්; ඉණං, තමා විසින් ගන්නාලද නය; විගාහති, බහුලවන්නේය; (එහෙයින්) අත්තනො, තමාගේ; ඛිප්පං, වහාම; අකුලං කාහති, කුලය විනාශකෙරෙයි;

දිවාසොප්පනසීලෙන, දහවල් නිද්‍රාකිරීම ස්වභාකොට අත්තහු විසින්ද; රත්තිං, රාත්‍රියෙහි; අනුට්ඨානදස්සිනා, නැගී නොසිටින ස්වභාව ඇත්තහු විසින් ද; නිච්චං, සතතයෙන්; මත්තෙන, සුරාපානයෙන් මත්වූ; සොණ්ඩෙන, ස්ත්‍රීධූර්තයා විසින් ද; ඝරං ආවසිතුං, ගෘහවාසයකරන්නට; නසක්කා, නොහැකි වන්නේය;

අතිසීතං, ඉතා සීත යයි ද; අතිඋණ්හං, ඉතා උෂ්ණ යයි ද; ඉදං, මේ වේලාව; අතිසායං අහු, ඉතා සවස්වූයේ යයි ද; ඉති, මෙසේ; විස්සට්ඨකම්මන්තෙ, හරණලද කර්මාන්තයන් ඇත්තාවූ;

යො ච සීතඤ්ච උණ්හඤ්ච–තිණාභීයො න මඤ්ඤති
කරං පුරිසකිච්චානි–සො සුඛා න විහායතීති.

චත්තාරෙ මෙ ගහපතිපුත්ත අමිත්තා මිත්තපතිරූපකා වෙදිතබ්බා අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො. චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො' වෙදිතබ්බො.

---

මානවෙ, මනුෂ්‍යයන්; අත්ථා, කෘෂිවණිගාදි අර්ථයෝ; අච්චෙන්ති, ඉක්මවත්; යොච, යමෙක් තෙම; සීතඤ්ච, සීතය ද; උණ්හඤ්ච, උෂ්ණය ද; තිණාභීයො, තෘණපතකටත් වඩා; නමඤ්ඤති, නොසිතා ද; පුරිසකිච්චානි, පුරුෂයන් විසින් කටයුතු කෘත්‍යයන්; කරං, කරන්නාවූ; සො, ඒ පුද්ගල තෙම; සුඛා, සැපයෙන්; න විහායතීති, නොපිරිහේ යයි; (වදුළසේක)

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අමිත්තා, අමිත්‍රවූ; මිත්තපතිරූපකා, මිත්‍ර ප්‍රතිරූපකයෝ; ඉමෙ චත්තාරො, මොහු සතරදෙනෙකැයි; වෙදිතබ්බා, දතයුත්තාහුය; අඤ්ඤදත්ථුහරො, තෙමේ සිස්හස්තයෙන් අවුත් ඒකාන්තයෙන් යම්කිසි වස්තුවක් ගෙණ යන්නාවූ; අමිත්තො, අමිත්‍රවූ; මිත්තපතිරූපකො, මිත්‍ර ප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; වචීපරමො, වචනයම උතුම්කොට ඇත්තාවූ; අමිත්තො, අමිත්‍රවූ, මිත්තපතිරූපකො, මිත්‍ර ප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අනුප්පියභාණී, අප්‍රිය වචන කියන්නාවූ; අමිත්තොමිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍රප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අපායසහායො, වස්තු විනාසයට යහළුවූ; අමිත්තොමිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍රප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; චතූහිඨානෙහි, කාරණා සතරකින්; අඤ්ඤදත්ථුහරො, ඒකාන්තයෙන් වස්තූන් ගෙණයන්නාවූ; අමිත්තොමිත්තපතිරූපකො අමිත්‍රවූ මිත්‍ර ප්‍රතිරූපක තෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අඤ්ඤදත්ථුහරො හොති, ඒකාන්තයෙන් වස්තූන් ගෙණයන්නේ වේ ද; අප්පෙනබහු මිච්ඡති, ස්වල්පයක්

අඤ්ඤදත්ථුහරෝ හොති අප්පෙන බහුමිච්ඡති
භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණාති.

ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො අතීතෙන පටිසන්ථරති අනාගතෙන පටිසන්ථරති නිරත්ථකෙන සඞ්ගණ්හාති පච්චුප්පන්නෙසු කිච්චෙසු ව්‍යසනං දස්සෙති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහිඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

---

දීමෙන් බොහෝ වස්තූන් ප්‍රාර්ථනා කෙරේද; භයෙ, (තමහට) භයක් උපන්කල්හී; අස්ස, මිත්‍රයාගේ; කිච්චං කරෙති, ඒ ඒ කෘත්‍යයන් කෙරේද; අත්ථකාරණා, තමහට ප්‍රයොජන ප්‍රාර්ථනා කරමින්; සෙවති, සේවනය කෙරේද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි චතූහි ඨානෙහි, මේ සතර කාරණයෙන්; අඤ්ඤදත්ථුහරො, ඒකාන්තයෙන් වස්තූන් ගෙණයන්නාවූ; අමිත්තො මිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍ර ප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපතී පුත්‍රය; චතූහි ඛො ඨානෙහි, කාරණ සතරකින්; වචීපරමො, වචනයම උතුම්කොට ඇත්තාවූ; අමිත්තො මිත්ත පතිරූපකො, අමිත්‍රවූ මිත්‍රප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අතීතෙන පටිසන්ථරති, අතීතයෙහිවූ දෙයින් සංග්‍රහ කෙරේද; අනාගතෙන පටිසන්ථරති, අනාගතයෙහි ඇතිවන්නාවූ දෙයින් සංග්‍රහ කෙරේද; නිරත්ථකෙන සංගණ්හාති, නිරර්ථක වචනයෙන් සංග්‍රහ කෙරේද; පච්චුප්පන්නෙසු කිච්චෙසු, ප්‍රත්‍යුත්පන්න කෘත්‍යයන්හි; ව්‍යසනං දස්සෙති, ව්‍යසන දක්වාද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො චතූහි ඨානෙහි, මේ චතුර්විධ කාරණයෙන්; වචීපරමො, වචනයම උතුම්කොට ඇත්තාවූ; අමිත්තො මිත්ත පතිරූපකො, අමිත්‍රවූ මිත්‍ර ප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; චතූහි ඛො ඨානෙහි, කාරණා සතරකින්, අනුප්පියභාණී, අප්‍රිය වචන කියන්නාවූ; අමිත්තො මිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍රප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අස්ස, ඒ මිත්‍රයාහට; පාපකම්පි, පව් කිරීමටද; අනුජානාති, අනුදනීද; අස්ස, ඔහට; කල්‍යාණම්පි, කුශල් කිරීමටද;

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො පාපකම්පිස්ස අනුජානාති කල්‍යාණම්පිස්ස නානුජානාති සම්මුඛාස්ස වණ්ණං භාසති පරම්මුඛාස්ස අවණ්ණං භාසති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අපාය සහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගෙ සහායො හොති විකාලවිසිඛා චරියානුයොගෙ සහායො හොති සමජ්ජාභිචරණෙ සහායො හොති ජූතප්පමාදට්ඨානානුයොගෙ සහායො හොති, ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අපාය සහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බොති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

නානුජානාති, අනුනොදනීද; සම්මුඛාස්ස, ඔහුගේ අභිමුඛයෙහි; වණ්ණං භාසති, ගුණ කියාද; පරම්මුඛාස්ස, ඔහුගේ පරාම්මුඛයෙහි; අවණ්ණං භාසති, අගුණ කියාද; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො චතූහි ඨානෙහි, මේ සතර කාරණයෙන්; අනුප්පිය භාණී, අප්‍රිය වචන කියන්නාවූ; අමිත්තො මිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍ර ප්‍රතිරූපක තෙමේ; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; චතූහි ඛො ඨානෙහි, කාරණා සතරකින්; අපායසහායො, අපාය භාක්වීමට සුදුසු ක්‍රියාවන් කෙරෙමින් යහළුවූ; අමිත්තොමිත්තපතිරූපකො, අමිත්‍රවූ මිත්‍ර ප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගෙ, සුරාමෙරය මද්‍යපානයෙහි ප්‍රමාද වශයෙන් නැවත නැවත යෙදීමෙහි; සහායො හොති, යහළුවේද; විකාල විසිඛා චරියානුයොගෙ, නොකල්හි වීථිසඤ්චාරණය කිරීමෙහි; සහායො හොති, යහලුවේද; සමජ්ජාභි චරණෙ, නෘත්‍යගීතාදිය දශීනය පිණිස හැසිරීමෙහි; සහායො හොති, යහලුවේද ජූතප්පමාදට්ඨානානුයොගෙ, ජූතප්‍රමාද ස්ථානයෙහි නැවත නැවත යෙදීමෙහි; සහායො හොති, යහලුවේද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො චතූහි ඨානෙහි, (යන) මේ කාරණා සතරෙන්; අපාය සහායො, අපාය සහායවූ; අමිත්තොමිත්ත පතිරූපකො, අමිත්‍රවූ මිත්‍රප්‍රතිරූපකතෙම; වෙදිතබ්බො ඉති, දතයුත්තේ යයි;

අඤ්ඤදත්ථුහරො මිත්තො–යො ච මිත්තො වචීපරො
අනුප්පියඤ්ච යො ආහ–අපායෙසු ච යො සඛා.

එතෙ අමිත්තෙ චත්තාරො–ඉති විඤ්ඤාය පණ්ඩිතො
ආරකා පරිවජ්ජෙය්‍ය–මග්ගං පටිභයං යථා'ති.

චත්තාරො මෙ ගහපතිපුත්ත මිත්තා සුහදා වෙදිතබ්බා උපකාරො මිත්තො සුහදො වෙදිතබ්බො සමානසුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො

---

භගව, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ කාරණය; අවොච, වදාළසේක; සුගතො, සොභන ගමන් ඇති හෙයින් සුගත නම්වූ තථාගත තෙම; ඉදං, මෙය; වත්වා, වදාරා; සත්ථා, ශාස්තෘන් වහන් සේ; අථාපරං, නැවත තදර්ථදීපනය පිණිස අතිකක්වූ; එතං, මේ ගාථාබන්ධනය; අවොච, වදාළසේක.

අඤ්ඤදත්ථුහරො මිත්තො, එකාන්තයෙන් වස්තු පැහැර ගන්නාවූ අමිත්‍රවූ යම් මිත්‍රයෙක් ඇද්ද; යොච මිත්තො වචීපරො වචනය පමණක් උතුම්කොට ඇත්තාවූ අමිත්‍රවූ යම් මිත්‍රයෙක් ඇද්ද; යො; යමෙක් තෙම; අනුප්පියඤ්ච ආහ, අනනුකූල වචන කියන්නේද; යො; යමෙක්තෙම; අපායෙසුච සඛා; අපායභාක්වීමෙහි යහලුවේද, (යන) එතෙ චත්තාරො අමිත්තෙ, මේ සතර අමිත්‍රයන්; ඉති, මෙසේ; පණ්ඩිතො, පණ්ඩිත තෙම, විඤ්ඤාය, දැන; ආරකා, දුරින්ම; පරිවජ්ජෙය්‍ය, දුරුකරන්නේය; (කුමක්මෙන්ද) පටිභයං, ප්‍රතිභය සහිතවූ; මග්ගං, මාර්ගය; යථා, යම්සේද; (එසේම යයි වදාළසේක).

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සුහදා, සුහෘද්වූ; ඉමෙ චත්තාරො මිත්තා, මේ මිත්‍රයෝ සතරදෙන; වෙදිතබ්බා, දතයුත්තාහුය; උපකාරො, ප්‍රත්‍යුපකාර කරන්නාවූ; සුහදො, යහපත් හෘදය ඇත්තාවූ; මිත්තො, මිත්‍රතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; සමාන සුඛදුක්ඛො, සැප දුක් දෙකෙහි සමවූ; සුහදො, සුහෘද්වූ; මිත්තො, මිත්‍ර තෙම; වෙදිතබ්බො, දතයුත්තේය; අත්ථක්ඛායී, ප්‍රයොජනදේ කියසුලුවූ; සුහදො, සුහෘද්වූ; මිත්තො, මිත්‍රතෙම; වෙදිතබ්බො, දතයුත් තේය; අනුකම්පකො, හිතයෙන් අනුකම්පාකරන්නාවූ; සුහදො, සුහෘද්වූ; මිත්තො, මිත්‍රතෙම; වෙදිතබ්බො, දතයුත්තේය;

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි උපකාරො මිත්තො සුහදො වෙදිතබ්බො පමත්තං රක්ඛති පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති භීතස්ස සරණං හොති උප්පන්නෙසු කිච්චකරණීයෙසු තද්දිගුණං භොගං අනුප්පාදෙති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි උපකාරො මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි සමානසුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො ගුය්හමස්ස ආචික්ඛති ගුය්හමස්ස පරිගූහති ආපදාසු න විජහති ජීවිතම්පිස්ස අත්ථාය පරිච්චත්තං හොති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි සමාන සුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො,

---

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; උපකාරො, උපකාර කරන්නාවූ; සුහදො, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; චතූහි ඨානෙහි ඛො; කාරණා සතරකින්; වෙදිතබ්බො, දතයුත්තේය; පමත්තං, සුරාපානාදියෙන් මත්ව ප්‍රමාදවූවහු; රක්ඛති, රක්‍ෂාකෙරෙයි; පමත්තස්ස, ප්‍රමාදවූවහුගේ; සාපතෙය්‍යං, ධනය; රක්ඛති, රක්‍ෂාකෙරෙයි; භීතෙ, ඒ මිත්‍රයාහට; අස්ස, කිසි භයක් උපන්කල්හි; සරණං හොති, (අස්වැසිලි වචන කියමින්) පිළිසරණ වෙයි; උප්පන්නෙසු කිච්ච කරණීයෙසු, තමා විසින් කටයුතු කෘත්‍යයන් උපන්කල්හි; තද්දිගුණං භොගං අනුප්පාදෙති, තම්ගුණකොට වස්තුව උපදවයි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; උපකාරො, උපකාර කරන්නාවූ; සුහදො, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; ඉමෙහි චතූහි ඨානෙහි ඛො, මේ සතර කාරණයෙන්; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සමානසුඛ දුක්ඛො, දුක් සැප දෙක්හිම සමානවූ; සුහදො, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; චතූහි ඨානෙහි ඛො, චතුර්විධ කාරණයකින්; වෙදිතබ්බො, දතයුත්තේය; ගුය්හං, තමාගේ සැඟවියයුතු රහස; අස්ස, ඒ යහලුවාහට; ආචික්ඛති, කියයි; අස්ස, ඒ යහලුවාගේ; ගුය්හං, රහස; පරිගූහති, විශෙෂයෙන් සඟවයි; ආපදාසු, ආපදාවක් පැමිණිකල්හි; නවිජහති, නොහරී; අස්සඅත්ථාය, ඔහුගේ ප්‍රයොජනය පිණිස; ජීවිතම්පි, ජීවිතයද; පරිච්චත්තං හොති, පරිත්‍යාගකරන ලද්දේ වෙයි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සමානසුඛ දුක්ඛො, දුක් සැප දෙක්හිම සමානවූ; සුහදො, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; ඉමෙහි චතූහි ඨානෙහි ඛො, මේ කාරණ සතරෙන්; වෙදිතබ්බො, දතයුත්තේය;

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො පාපා නිවාරෙති කල්‍යාණෙ නිවෙසෙති අස්සුතං සාවෙති සග්ගස්ස මග්ගං ආචික්ඛති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො අභවෙනස්ස න නන්දති භවෙනස්ස නන්දති අවණ්ණං භණමානං නිවාරෙති වණ්ණං භණමානං පසංසති ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බොති. ඉදමවොච භගවා ඉදං වත්‍වා සුගතො අථාපරං එතදවොච සත්ථා,

---

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අත්ථක්ඛායී, ප්‍රයොජනයේ කියන සුළුවූ; සුහදෙ, සුහෘදවූ; මිත්තො මිත්‍රතෙම; චතූහි ඨානෙහි ඛො, කාරණ සතරකින්; වෙදිතබ්බො, දතයුත්තේය; පාපා, පවෙන්; නිවාරෙති, වළක්වයි; කල්‍යාණෙ, කුශලධර්මයෙහි; නිවෙසෙති, විශෙෂයෙන් යොදවයි; අස්සුතං සාවෙති, පෙර නොඇසූ සූක්ෂ්මාර්ථයන් අසවයි; සග්ගස්ස මග්ගං ආචික්ඛති, (මේ කුශල ක්‍රියාවන්කොට ස්වර්ගයෙහි උපදනෝ යයි) ස්වර්ගයට යායුතු මාර්ගය කියයි; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; අත්ථක්ඛායී, අර්ථයන් කියන සුළුවූ; සුහදෙ, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; ඉමෙහි චතූහි ඨානෙහි ඛො, මේ කාරණ සතරෙන්; වෙදිතබ්බො, දතයුත්තේය;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අනුකම්පකො, හිතයෙන් අනුකම්පා කරන්නාවූ; සුහදෙ, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; චතූහි ඨානෙහි ඛො, කාරණ සතරකින්; වෙදිතබ්බො, දතයුත්තේය; අස්ස, ඒ මිත්‍රයාගේ; අභවෙන, අනභිවෘද්ධියෙන්; න නන්දති, සතුටු නොවෙයි; අස්ස, ඔහුගේ; භවෙන, අභිවෘද්ධියෙන්; නන්දති, සතුටු වෙයි; අවණ්ණං භණමානං, අගුණකියන්නා; නිවාරෙති, වළක්වයි; වණ්ණං භණමානං, ගුණකියන්නහුට; පසංසති, ප්‍රශංසා කෙරෙයි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අනුකම්පකො, හිතයෙන් අනුකම්පා කරන්නාවූ; සුහදෙ, සුහෘදවූ; මිත්තො, මිත්‍රතෙම; ඉමෙහි චතූහි ඨානෙහි ඛො, මේ කාරණ සතරෙන්; වෙදිතබ්බො ඉති' දතයුත්තේයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ කාරණය; අවොච, වදාළසේක; සුගතො, ශොභන ගති ඇති; සත්ථා, ශාස්තෲන් වහන්සේ; අථාපරං, නැවත (තදර්ථදීපනය පිණිස) අනිකක්වූ; එතං, මේ ගාථාබන්ධනය; අවොච, වදාළසේක.

උපකාරො ච යො මිත්තො-යොච මිත්තො සුඛෙ දුඛෙ
අත්ථක්ඛායී ච යො මිත්තො-යො ච මිත්තානුකම්පකො.

එතෙ බො මිත්තෙ චත්තාරෙ-ඉති විඤ්ඤාය පණ්ඩිතො
සක්කච්චං පයිරුපාසෙය්‍ය-මාතා පුත්තංව ඔරසං.

පණ්ඩිතො සීල සම්පන්නො-ජලමග්ගීව භාසති
භොගෙ සංහරමානස්ස-භමරස්සෙව ඉරීයතො.

භොගා සන්නිචයං යන්ති-වම්මිකොවුපචීයති
එවං භොගෙ සමාගන්ත්වා-අලමත්තො කුලෙ ගිහි.

---

යො මිත්තො, යම් මිත්‍රයෙක් තෙම; උපකාරො ච, උපකාර කරන්නේ ද; සුඛෙ දුඛෙ, දුක්සැප දෙකෙහිම්; යොච මිත්තො, (සමානවූ) යම් මිත්‍රයෙක් ඇද්ද; අත්ථක්ඛායී, අභිවෘද්ධි කාරණ කියන්නාවූ; යො මිත්තො ච, යම් මිත්‍රයෙක් ඇද්ද; අනුකම්පකො, හිතයෙන් අනුකම්පා කරන්නාවූ; යො මිත්තො ච, යම් මිත්‍රයෙක් ඇත්තේ ද;

පණ්ඩිතො, පණ්ඩිත පුද්ගල තෙම; එතෙ මිත්තෙ චත්තාරො බො, මේ මිත්‍රයන් සතරදෙන; ඉති, මේ ප්‍රකාරයෙන්; විඤ්ඤාය, දැන; සක්කච්චං, සකස් කොට; පයිරුපාසෙය්‍ය, පයිරුපාසනය කරන්නේය; (හේ කුමක්මෙන්ද ?) මාතා, මව් තොමෝ; ඔරසං පුත්තං ඉව, ඖරස පුත්‍රයා මෙනි;

සීලසම්පන්නො, ශීලයෙන් සමන්විතවූ; පණ්ඩිතො, ප්‍රඥාවන්ත පුද්ගලතෙම; ජලං, (අන්ධකාරයෙහි) දිලියෙන්නාවූ; අග්ගි ඉව, වහ්නිස්කන්ධයක් මෙන්; භාසති, බබලයි; භොගෙසංහරමානස්ස, (ධර්මයෙන්) වස්තු රැස්කරන්නාහට; (වස්තුබාහුල්‍යයට පැමිණෙන්නේය (හේ කුමක්මෙන්දයත්?) භමරස්සෙව ඉරීයතො, පුෂ්පයන්ගේ වර්ණගන්ධයන්ට පීඩානොකොට තුඩින් හා පියාපතින් රජස් ගෙනවුත් පිළිවෙළින් රථචක්‍රප්‍රමාණ මධුපටල කරන්නාවූ භෘඞ්ගය හට මෙනි; භෘඞ්ගයාගේ මධුපටලකිරීම මෙනි;

භොගා සන්නිචයංයන්ති, වස්තූහු රැස්වීමට පැමිණෙත්; (හේ කුමක් මෙන්දයත්?) වම්මිකොවුපචීයති, වේයන් විසින් බඳනාලද්දවූ තුඹස යම්සේ රැස්වේද එමෙනි; එවං, එපරිද්දෙන්; භොගෙ, වස්තූන්; සමාගන්ත්වා, රැස්කොට; කුලෙ ගිහි, ගෘහස්ථතෙම කුල යෙහි; (වාසයකරන්ට) අලමත්තො, සමර්ථවන්නේය;

චතුධා විභජෙ භොගෙ-සවෙ මිත්තානි ගන්ථති,
එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය-ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය-ආපදාසු භවිස්සතීති.

කථඤ්ච ගහපතිපුත්ත අරියසාවකො ඡද්දිසා පටිච්ඡාදී හොති ඡ ඉමා ගහපතිපුත්ත දිසා වෙදිතබ්බා, පුරත්ථිමා දිසා මාතාපිතරො වෙදිතබ්බා දක්ඛිණා දිසා ආචරියා වෙදිතබ්බා, පච්ඡිමා දිසා පුත්ත දරා වෙදිතබ්බා, උත්තරා දිසා මිත්තාමච්චා වෙදිතබ්බා, හෙට්ඨිමා දිසා දසකම්මකරා වෙදිතබ්බා, උපරිමා දිසා සමණබ්‍රාහ්මණා වෙදිතබ්බා,

---

භොගෙ, වස්තූන්; චතුධා, සතර කොටසක් කොට; විභජෙ, බෙදන්නේය; සො, ඒ පුද්ගලතෙම; වෙ, ඒකාන්තයෙන්; මිත්තානි, මිත්‍රයන්; ගන්ථති, නොබිඳෙන්නවුන් කොට පිහිටුවයි; භොගෙ, වස්තූන්; එකෙන, එක් කොටසකින්; භුඤ්ජෙය්‍ය, අනුභවකරන්නේය; ද්වීහි, දෙකොටසකින්; කම්මං, කෘෂිවණිගාදී කර්මාන්තයට; පයොජයෙ, යොදන්නේය; චතුත්ථඤ්ච, සතරවෙනි කොටසද; ආපදාසු භවිස්සතීති, ආපදාවන් පැමිණිකල්හි වන්නේයයි; නිධාපෙය්‍ය, නිධානගත කරන්නේ යයි වදාළසේක;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අරියසාවකො, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම; ඡද්දිසා, සදිසාවන්; කථඤ්ච පටිච්ඡාදී හොති, කෙසේ ප්‍රතිච්ඡාදනය කරන්නේ වේද? ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමා ඡ දිසා, මේ ෂඩ්දිසාවෝ; වෙදිතබ්බා, දතයුත්තාහුය; මාතාපිතරො, මාතෘපිතෘහු, (පූර්වෝපකාරිත්වයෙන්) පුරත්ථිමාදිසා, පූර්වදිසාභාග යයි; වෙදිතබ්බා, දතයුත්තාහුය; ආචරියා, ආචාර්‍ය්‍යවරයෝ: (දක්ෂිණාර්හ බැවින්) දක්ඛිණාදිසා, දක්ෂිණ දිසාභාග යයි; වෙදිතබ්බා දතයුත්තාහුය; පුත්තදරා, පුත්‍රදාරවෝ; (පසුව අනුව පවත්නා හෙයින්) පච්ඡිමාදිසා, පශ්චිම දිසාභාගයයි; වෙදිතබ්බා, දතයුත්තාහුය; මිත්තාමච්චා, මිත්‍රාමාත්‍යයෝ; (ඒ ඒ දුඃඛ විෂයෙන් තමාගේ මිත්‍රයා එතරකරවන හෙයින්) උත්තරාදිසා, උතුරු දිසාභාග යයි; වෙදිතබ්බා, දතයුත්තාහුය; දසකම්මකරා, දැසිදස් කම්කරුවෝ; (ස්වාමිපුරුෂයාට යටත්ව පවත්නා හෙයින්) හෙට්ඨිමාදිසා, යට, දිසාභාග යයි; වෙදිතබ්බා, දතයුත්තාහුය; සමණබ්‍රාහ්මණා, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; (සමිතපාප බාහිතපාප ගුණයෙන් උපරිම භාගයෙහි සිටියාහුනුයි) උපරිමාදිසා, උපරිම දිසාභාග යයි; වෙදිතබ්බා, දතයුත්තාහුය;

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමාදිසා මාතාපිතරො පච්චුපට්ඨාතබ්බා භතො නෙ භරිස්සාමි කිච්චං නෙසං කරිස්සාමි කුලවංසං ඨපෙස්සාමි දායජ්ජං පටිපජ්ජාමි අථ ච පන, පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි, ඉමෙහි ඛො ගහපති පුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතා පිතරො පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති පාපා නිවාරෙන්ති කල්‍යාණෙ නිවෙසෙන්ති සිප්පං සික්ඛාපෙන්ති පතිරූපෙන දාරෙන සංයොජෙන්ති සමයෙ දායජ්ජං නිය්‍යාදෙන්ති, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමාදිසා මාතාපිතරො පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති එවමස්ස එසා පුරත්ථිමාදිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා

---

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පුත්තෙන, පුත්‍රයා විසින්; පුරත්ථිමාදිසා මාතාපිතරො, පූර්වදිසාවයයි කියනලද මාතෘපිතෘහු; පඤ්චහි ඨානෙහි ඛො, කාරණ පසකින්; පච්චුපට්ඨාතබ්බා, උපස්ථාන කට යුත්තාහුය; (ඒ කාරණ පසනම් කවරහුද?) භතො, දෙමව්පියන් විසින් පොෂ්‍යකරනලද මම; නෙ, ඒ දෙමව්පියන්; භරිස්සාමි, පොෂ්‍ය කරන්නෙමි; නෙසං, ඒ දෙමව්පියන්ගේ; කිච්චං, කෘත්‍යය; කරිස්සාමි, කරන්නෙමි; කුලවංසං, කුලවංශය; ඨපෙස්සාමි, තබන්නෙමි; දායජ්ජං, දායාද වස්තුවට; පටිපජ්ජාමි, පිළිපදින්නෙමි; අථ ච ඛො පන, නැවතද; කාලකතානං, කාලක්‍රියා කළාවූ; පෙතානං, පරලොව ගියාවූ මව්පියන් උදෙසා; දක්ඛිණං, දක්ෂිණාව; අනුපදස්සාමි, අනුප්‍රදානය කරන්නෙමි; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පුත්තෙන, පුත්‍රයා විසින්; ඉමෙහි පඤ්චහි ඨානෙහි ඛො, මේ කාරණ පසින්; පුරත්ථිමා දිසා මාතාපිතරො, පූර්වදිසාව යයි කියනලද මාතෘපිතෘහු; පච්චුපට්ඨිතා, උපස්ථානකරන ලද්දාහු; පුත්තං, පුත්‍රයාට; පඤ්චහි ඨානෙහි, කාරණ පසකින්; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; ඒ කාරණ පසනම් කවරේද ? පාපා, පාපයෙන්; නිවාරෙන්ති, වළක්වත්; කල්‍යාණෙ, යහපත් කුශල ක්‍රියාවෙහි; නිවෙසෙන්ති, යොදවත්; සිප්පං, ශිල්පය; සික්ඛාපෙන්ති, උගන්වත්; පතිරූපෙන දාරෙන සංයොජෙන්ති, සුදුසුවූ දරුවක් හා යොදවත්; සමයෙ දායජ්ජං නිය්‍යාදෙන්ති, නිත්‍යසමය කාලසමය යන විප්‍රකාර සමයෙහි තමන් සන්තකවූ හිරණ්‍ය සුවර්ණාදී වස්තූන් දායාදකොට දෙත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; පුත්තං, පුත්‍රයාට; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කරුණු පසින්; අනුකම්පන්ති, අනුකම්පා

**පඤ්චහි ඛො ගහපති පුත්ත ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨාතබ්බා උට්ඨානෙන උපට්ඨානෙන සුස්සූසාය පාරිචරියාය සක්කච්චං සිප්පපටිග්ගහණෙන ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකම්පන්ති සුවිනීතං විනෙන්ති සුග්ගහිතං ගාහාපෙන්ති සබ්බසිප්පසුත සමක්ඛායිනො භවන්ති මිත්තාමච්චෙසු පරිවෙදෙන්ති දිසාසු පරිත්තාණං කරොන්ති ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකම්පන්ති එවමස්ස එසා දක්ඛිණා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.**

---

කෙරෙත්; අස්ස, ඔහට; එවං, උක්තප්‍රකාරයෙන්; ඛෙමා, ක්ෂෙමවූ; අප්පටිභයා, නිර්භයවූ; එසාපුරත්ථිමා දිසා, මාතෘපිතෘ සඞ්ඛ්‍යාත පූර්ව දිශා තොමෝ; පටිච්ඡන්නාහොති, පූර්වදිසාභාගයෙන් යම්හෙයකින් භයක් නොවේද; එපරිද්දෙන් ප්‍රතිච්ඡන්නවූවා යයි වදාළසේක.

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අන්තෙවාසිනා, අතවැසි පුද්ගලයා විසින්; දක්ඛිණා දිසා, දක්ෂිණදිසා සංඛ්‍යාතවූ, ආචරියා, ආචාර්‍ය්‍යවරයෝ; පඤ්චහි ඨානෙහි ඛො කාරණ පසකින් වතාහි; පච්චුපට්ඨාතබ්බා, විශෙෂයෙන් උපස්ථාන කටයුත්තාහුය; (ඒ කාරණ පසනම් කවරේ ද?) උට්ඨානෙන, ශිෂ්‍යතෙම දුරින්ම එන්නාවූ ආචාර්‍ය්‍යයන් වහන්සේ දැක හුනස්නෙන් නැගීසිට හස්තයෙහි තුබූ පරිෂ්කාර භාණ්ඩයන් ග්‍රහණය කොට විජන පාද ධොවනාදිය කිරීමෙන් නැගීසිටීමෙන්ද; උපට්ඨානෙන, දිනයා සම්බන්ධව තුන්වරක් ආචාර්‍ය්‍යයන් වහන්සේ කරා එළඹීමෙන් උපස්ථාන කිරීමෙන්ද; සුස්සූසාය, ඇදහීම් වශයෙන් ශ්‍රවණය කිරීමෙන්ද; පාරිචරියාය, අතවැසි පුරුෂයන් විසින්; මුඛොදක දන්තකාෂ්ඨා, දිය ප්‍රදානය කිරීමෙන් ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර වත් පිළිවෙත් කිරීමෙන්ද; සක්කච්චං, සකස් කොට; සිප්පපටිග්ගහණෙන, (ආචාර්‍ය්‍යයන් වහන්සේගෙන් ස්වල්පයක් කියවාගෙණ; බොහෝ වාරගණන් අභ්‍යාශකිරීම් වශයෙන්) ශිල්පොද්ග්‍රහණය කිරීමෙන් ද; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; අන්තෙවාසිනා, අතවැස්සා විසින්; දක්ඛිණා දිසා, දක්ෂිණදිසා සංඛ්‍යාතවූ; ආචරියා, ආචාර්‍ය්‍යවරයෝ; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කාරණ පසින්; පච්චුපට්ඨාතබ්බා, උපස්ථාන කටයුත්තාහුය; අන්තෙවාසිං, අතවැසියාහට; පඤ්චහි ඨානෙහි, කාරණ පසකින්;

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි සාමිකෙන පච්ඡිමාදිසා භරියා පච්චුපට්ඨාතබ්බා සම්මානනාය අනවමානනාය අනතිචරියාය ඉස්සරියවොස්සග්ගෙන අලඞ්කාරානුප්පදානෙන, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමාදිසා භරියා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පන්ති සුසංවිහිතකම්මන්තා ච හොති සුසඞ්ගහිතපරිජනා ච අනතිචාරිණී ච සම්භතඤ්ච අනුරක්ඛති දක්ඛා ච හොති අනලසා සබ්බකිච්චෙසු, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පන්ති එවමස්ස එසා පච්ඡිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

---

අනුකම්පන්ති, (ආචාර්යවරයෝ) අනුකම්පා කෙරෙත්; (ඒ කාරණ පස කවරේද?) සුවිනීතං විනෙන්ති. (මෙසේ හිඳියුත්තේය මෙසේ අනුභව කටයුත්තේය පාපමිත්‍රයන් හැරියයුත්තේය කල්‍යාණමිත්‍රයන් සෙවනය කටයුත්තේය යනාදි වශයෙන් ආචාර්යයන් අභ්‍යාශකරමින්) යහපත්කොට විනයනය කෙරෙත්; සුග්ගහිතං ගාහාපෙන්ති (යම් ප්‍රකාරයකින් ශිෂ්‍යතෙම යහපත්කොට ශිල්පෝද්ග්‍රහණය කෙරේද එපරිද්දෙන් අර්ථයන් හා ව්‍යඤ්ජනයන් අතිපරිශුද්ධකොට උපදෙශ ප්‍රදානය කිරීමෙන්) යහපත්කොට ශිල්පෝද්ග්‍රහණය කරවත්; සබ්බසිප්පසුතං සමක්ඛායිනො භවන්ති, (පූර්වාචාර්යයන් සමීපයෙහි) ශ්‍රවණයකොට දැනගත් සියලු ශිල්පයන් කියන්නාහු වෙත්; මිත්තාමච්චෙසු පටිවෙදෙන්ති, (අපගේ අතවැසි තෙම ව්‍යක්තය බහුශ්‍රැතය මා හා සමාන යයි ගුණ වර්ණනාකරමින්) මිත්‍රාමාත්‍යයන් කෙරෙහි ප්‍රකාශකරත්; දිසාසු පරිත්තාණං කරොන්ති, සියලු දිසාවන්හි ආරක්ෂාකෙරෙත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අන්තෙවාසිං, අතවැස්සාට; ඉමෙහි පඤ්චහි ඨානෙහි, මේ කාරණා පසින්; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්, අස්ස, ඔහට; එවං, උක්තප්‍රකාරයෙන්; ඛෙමා, ක්ෂෙමවූ; අප්පටිභයා, නිර්භයවූ; එසා දක්ඛිණාදිසා, මේ ආචාර්ය සංඛ්‍යාත දක්ෂිණ දිසාව; පටිච්ඡන්නා හොති, දක්ෂිණා දිසාභාගයෙන් භයක් නොවේද එපරිද්දෙන් ප්‍රතිච්ඡාදනය කරනලද්දී වෙයි;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සාමිකෙන, ස්වාමි පුරුෂයා විසින්; පච්ඡිමා දිසා, පශ්චිම දික් සංඛ්‍යාතවූ; භරියා, භාර්‍ය්‍යාතෙමෝ; පඤ්චහි ඨානෙහි ඛො, කාරණා පසකින්; පච්චුපට්ඨාතබ්බා

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨාතබ්බා දානෙන පෙය්‍යවජ්ජෙන අත්ථචරියාය සමානත්තතාය අවිසංවාදනතාය, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තරාදිසා මිත්තා

---

විශෙෂයෙන් උපස්ථාන කටයුත්තීය; සම්මානනාය, සම්භාවිත වචනයන් කීමෙන්ද; අනවමානනාය, අවමන් නොකිරීමෙන්ද; අනතිචරියාය, තමාගේ ස්ත්‍රිය අතික්‍රමණයකොට අන්‍ය ස්ත්‍රීන් සමග නොහැසිරීමෙන්ද; ඉස්සරිය වොස්සග්ගෙන, සියලු ඓශ්චර්‍ය්‍ය විස්සජ්ජනය කිරීමෙන්ද; අලඞ්කාරානුප්පදානෙන, තමාගේ විභවානුරූපවූ පරිද්දෙන් අලඞ්කාරනු ප්‍රදානය කිරීමෙන්ද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; සාමිකෙන, ස්වාමිපුරුෂයා විසින්; පච්ඡිමාදිසා, පශ්චිම දිසා සංඛ්‍යාතවූ; භරියා, භාර්‍ය්‍යාතොමෝ; ඉමෙහි පඤ්චහි ඨානෙහි මේ කාරණා පසින්; පච්චුපට්ඨිතා, උපස්ථානකරන ලද්දාවූ භාර්‍ය්‍යාතොමෝ; සාමිකං, ස්වාමිපුරුෂයාට; පඤ්චහි ඨානෙහි, කාරණා පසකින්; අනුකම්පන්ති, අනුකම්පා කරන්නීය; (ඒ කාරණා පසනම් කවරහුද?) සුසංවිහිත කම්මන්තා ච හොති, යහපත්කොට කරන ලද්දාවූ කර්මාන්තයන්ද ඇතිවන්නීය; සුසංගහිත පරිජනා ච, සම්භාවිත වචන කීම් ආදියෙන්ද පඬුරු යැවීම් ආදියෙන්ද ස්වාමිපුරුෂයාගේ හා තමාගේද මිත්‍රාකොට සංග්‍රහකරනලද පිරිවර ජනයා ඇත්තිවන්නීය; අනතිචාරිණී ච, තමාගේ ස්වාමිපුරුෂයා හැර අන් පුරුෂයකු මනසින්ද ප්‍රාර්ථනා නොකරන්නීය; සම්භතඤ්ච, ස්වාමිපුරුෂයා විසින් රැස්කරනලද්දාවූ සම්පත් රක්ෂාකරයි; සබ්බකිච්චෙසු, සියලු කෘත්‍යයන්හි; අනලසා, අලසනොවූ; දක්ඛා ච හොති, දක්ෂද වන්නීය; ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; සාමිකං, ස්වාමිපුරුෂයා හට; ඉමෙහි පඤ්චහි ඨානෙහි, මේ කාරණා පසින්; අනුකම්පන්ති, අනුකම්පා කරන්නීය; අස්ස, ඔහට, එවං, මේ ප්‍රකාරයෙන්; ඛෙමං, ක්ෂෙමවූ; අප්පටිභයා, නිර්භයවූ; එසා පච්ඡිමා දිසා, මේ භාර්‍ය්‍යා සංඛ්‍යාත පශ්චිමදිසා තොමෝ; පටිච්ඡන්නා හොති ඉති, වැසෙන ලද්දී වන්නී යයි (වදාළසේක;)

ගහපති පුත්ත, ගෘහපති පුත්‍රය; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; පඤ්චහි ඛො ඨානෙහි, කාරණා පසකින්; උත්තරා දිසා, උත්තරදිසා සංඛ්‍යාත; මිත්තාමච්චා, මිත්‍රාමාත්‍යයෝ; පච්චුපට්ඨාතබ්බා, උපස්ථාන කටයුත්තාහුය; (ඔහු කවුරුදයත්?) දානෙන, (හිරණ්‍ය සුවර්ණාදී වස්තු) දීමෙන්ද; පෙය්‍යවජ්ජෙන, ප්‍රිය වචන කීමෙන්ද; අත්ථචරියාය, වැඩෙහි හැසිරීමෙන්ද; සමානත්තතාය,

මච්චා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති පමත්තං රක්ඛන්ති පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති භීතස්ස සරණං හොන්ති ආපදාසු න විජහන්ති අපරපජඤ්චස්ස පටිපූජෙන්ති, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තර දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි කුලපුත්ත අනුකම්පන්ති එවමස්ස එසා උත්තර දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අයිරකෙන හෙට්ඨිමාදිසා දාසකම්මකරා පච්චුපට්ඨාතබ්බා යථාබලං කම්මන්ත සංවිධානෙන භත්තවෙතනානුප්පදානෙන ගිලානුපට්ඨානෙන අච්ඡරියානං රසානං සංවිභාගෙන සමයෙ වොස්සග්ගෙන, ඉමෙහි ඛො ගහපති පුත්ත පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති පුබ්බුට්ඨායි

---

මිත්‍රාමාත්‍යයන්) තමා සමානකොට සිතීමෙන්ද; අවිසංවාදනතාය, නොසඟවා කීමෙන්ද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කාරණ පසින්; උත්තරදිසා, උතුරුදිසාව යයි කියනලද්දවූ; මිත්තාමච්චා, මිත්‍රාමාත්‍යයෝ; පච්චුපට්ඨිතා, උපස්ථාන කරනු ලබන්නාහු; පඤ්චහි ඨානෙහි, කාරණ පසකින්; කුලපුත්තං, කුලපුත්‍රයාට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; (ඒ කවර කරුණු පසකින්දයත්) පමත්තං රක්ඛන්ති, ප්‍රමාදවූ කුලපුත්‍රයා රක්ෂාකෙරෙත්; පමත්තස්ස ප්‍රමාදවූ කුලපුත්‍රයාගේ; සාපතෙය්‍යං, සම්පත්තිය; රක්ඛන්ති, රක්ෂා කෙරෙත්; භීතස්ස, භයපැමිණි මිත්‍රයාහට; සරණං හොන්ති, පිහිට වෙත්; ආපදාසු, විපත්තීන් පැමිණිකල්හි; න විජහන්ති, (මිත්‍රයා) අත්නොහරිත්; අස්ස, ඒ මිත්‍රයාගේ; අපර පජඤ්ච, අන්‍ය පුත්‍ර දුහිතෘ ආදි ප්‍රජාවටද; පටිපූජෙන්ති, පූජා කෙරෙත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කරුණු පසින්; කුලපුත්තං, කුලපුත්‍රයාට; උත්තරදිසා, උත්තරදිසා සඞ්ඛ්‍යාත; මිත්තාමච්චා, මිත්‍රාමාත්‍යයෝ; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; එවං, මෙසේ; අස්ස, ඕහට; ඛෙමා, නිර්භයවූ; අප්පටිභයා, ප්‍රතිභය රහිතවූ; එසා උත්තරදිසා, මේ උතුරු දිසාතොමෝ; පටිච්ඡන්නා හොති, වැසෙනලද්දී වන්නී යයි වදාළසේක;

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; අයිරකෙන, ස්වාමියා විසින්; හෙට්ඨිමාදිසා, යටදිසාව යයි කියනලද්දවූ; දාසකම්මකරා, දස්කම්

තො ච හොන්ති පච්ඡා නිපාතිනො ච දින්නාදායිනො ච සුකතකම්ම කාරකා ච කිත්තිවණ්ණහරා ච, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨිතා, ඉමෙහි පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති එවමස්ස එසා හෙට්ඨිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා,

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨාතබ්බා මෙත්තෙන කායකම්මෙන මෙත්තෙන වචීකම්මෙන මෙත්තෙන මනොකම්මෙන අනාවටද්වාරතාය ආමිසානුප්පදානෙන, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා

---

කරුවෝ; පඤ්චහි ඛො ඨානෙහි, කරුණු පසකින්; පච්චුපට්ඨාතබ්බා, උපස්ථාන කටයුත්තාහුය; (ඒ පස කවරහුදයත්) යථාබලං කම්මන්තසංවිධානෙන, බලානුරූප වශයෙන් කර්මාන්තකරවීමෙන්ද; භත්තවෙදනානුප්පදානෙන. බත්වියදම් දීමෙන් ද; ගිලානුපට්ඨානෙන, ගිලන්වූ ඔවුන්ට උපස්ථාන කිරීමෙන්ද; අච්ඡරියානං රසානං සංවිභාගෙන, ආශ්චර්ය්‍යවූ මියුරුරසයන් බෙදාදීමෙන්ද, සමයෙ වොස්සග්ගෙන, නිත්‍යකාල සමයෙහි කර්මාන්ත ඇරීමෙන්ද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කාරණ පසින්; අයිරකෙන, ස්වාමියා විසින්; හෙට්ඨිමාදිසා, යටදිසාව යයි කියනලද්දාවූ; දාසකම්මකරා, දස්කම්කරුවෝ; පච්චුපට්ඨිතා, උපස්ථාන කරනු ලබන්නාහු; පඤ්චහි ඨානෙහි, කරුණු පසකින්; අයිරකං, ස්වාමියාට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; (ඒ පස කවුරුදයත්) පුබ්බුට්ඨායිනො ච හොන්ති, හිමියාට පෙරටුව නැඟිටිනසුලුවෙත්; පච්ඡා නිපාතිනො ච, හිමියාටපසු සැතපෙනසුලුවෙත්; දින්නාදායිනො ච, හිමියා විසින් දෙනලද දෙයම ගන්නා සුලුවෙත්; සුකතකම්මකාරකා ච, මනාව කරනලද කර්මාන්ත ඇත්තාහුදවෙත්; කිත්තිවණ්ණහරා ච, කීර්ත්තිගුණ වර්ණනාව එලවන්නාහුදවෙත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කරුණු පසින්; අයිරකං අනුකම්පන්ති, ස්වාමියාට අනුකම්පා කෙරෙත්; එවං, මෙසේ; අස්ස, ඔහට; එසා හෙට්ඨිමාදිසා, මේ යට දිසා තොමෝ; පටිච්ඡන්නා හොති, වැසෙනලද්දී වෙයි; ඛෙමා, නිර්භය වෙයි; අප්පටිභයා, ප්‍රතිභය රහිත වෙයි;

ඡහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති පාපා නිවාරෙන්ති කල්‍යාණෙ නිවෙසෙන්ති කල්‍යාණෙන මනසා අනුකම්පන්ති අස්සුතං සාවෙන්ති සුතං පරියොදපෙන්ති සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා, ඉමෙහි ඡහි කුලපුත්තං අනුකම්පන්ති එවමස්ස එසා උපරිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයාති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; උපරිමා දිසා, උඩදිසාව යයි කියනලද්දවූ; සමණබ්‍රාහ්මණා, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; පඤ්චහි ඨානෙහි, කාරුණ්‍ය පසකින්; පච්චුපට්ඨාතබ්බා, උපස්ථාන කටයුත්තාහුය; (ඒ පස කවුරු ද යත්) මෙත්තෙන කායකම්මෙන, මෛත්‍රියෙන් යුක්තවූ කායකර්මයෙන්ද; මෙත්තෙන වචීකම්මෙන, මෛත්‍රියෙන් යුක්තවූ වාක්කර්මයෙන්ද; මෙත්තෙන මනොකම්මෙන, මෛත්‍රියෙන් යුක්තවූ මනොකර්මයෙන්ද; අනාවටද්වාරතාය, නොවසනලද දොර ඇති බැවින්ද; ආමිසානුප්පදානෙන, ආමිසයන් හෙවත් කෑද බත් ආදිය දීමෙන්ද; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කාරණ පසින්; උපරිමා දිසා, උඩ දිසාවවූ; සමණබ්‍රාහ්මණා, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; පච්චුපට්ඨිතා, උපස්ථාන කරනු ලබන්නාහු; ඡහි ඨානෙහි, කාරුණ්‍ය සයකින්; කුලපුත්තං, කුලපුත්‍රයාට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; (ඒ කාරුණ්‍ය සය කවරහුදයත්) පාපා, ප්‍රාණඝාතාදි පාපයෙන්; නිවාරෙන්ති, වලක්වත්; කල්‍යාණෙ, දානශීලාදි කුශලකර්මයෙහි; නිවෙසෙන්ති, යොදවත්; කල්‍යාණෙන මනසා, යහපත්වූ සිතින්; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; අස්සුතං, නොඅසනලද ධර්මය; සාවෙන්ති, අස්වත්; සුතං, අසනලද ධර්මය; පරියොදපෙන්ති, (නැවත නැවත අස්වා) පිරිසිදුකරවත්: සග්ගස්ස, ස්වර්ගයට; (යන) මග්ගං, මාර්ගය; ආචික්ඛන්ති, කියත්; ගහපතිපුත්ත, ගෘහපති පුත්‍රය; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; ඉමෙහි ඛො පඤ්චහි ඨානෙහි, මේ කාරුණ්‍ය පසින්; පච්චුපට්ඨිතා, උපස්ථාන කරනලද්දවූ; උපරිමා දිසා, උඩ දිසාවවූ; සමණ බ්‍රාහ්මණා, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; ඉමෙහි ඡහි

මාතාපිතා දිසා පුබ්බා-ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා-මිත්තාමච්චා ච උත්තරා.

දාසකම්මකරා හෙට්ඨා-උද්ධං සමණබ්‍රාහ්මණා
එතා දිසා නමස්සෙය්‍ය-අලමත්තො කුලෙ ගිහි.

පණ්ඩිතො සීලසම්පන්නො-සණ්හො ච පටිභාණවා
නිවාතවුත්ති අත්ථද්ධො-තාදිසො ලභතෙ යසං.

---

ඨානෙහි, (යථොක්ත) මේ කාරණ සයෙන්; කුලපුත්තං, කුලපුත්‍ර යාට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; එවං, මෙසේ; (වූකල්හි) අස්ස, ඒ කුලපුත්‍රයාහට; එසා උපරිමා දිසා, මේ උඩදිසා තොමෝ; පටිච්ඡන්නා හොති, වැසෙනලද්දී වන්නීය; ඛෙමා, ආරක්‍ෂා වන් නීය; අප්පටිභයා ඉති, නිර්භය වන්නීයයි (වදාළසේක); භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ දෙශනාව; අවොච, වදාළසේක; ඉදං, මෙය; වත්වා, වදාරා; සුගතො, ශොභන ගමන් ඇති; සත්ථා, ශාස්තෲන් වහන්සේ; අථ, නැවත; අපරං, අන්‍ය ගාථාබන්ධනයක්වූ; එතං, මේ දෙශනාව; අවොච, වදාළසේක;

මාතා පිතා, මව් පිය දෙදෙන; පුබ්බාදිසා, පූර්විදිසාව වන්නීය; ආචරියා, ආචාර්‍ය්‍යවරයෝ; දක්ඛිණාදිසා, දක්‍ෂිණදිසාව වන්නීය; පුත්තදාරා, අඹුදරුවෝ; පච්ඡාදිසා, පශ්චිමදිසාව වන්නීය; මිත්තා මච්චා ච, මිත්‍රාමාත්‍යයෝ ද; උත්තරා දිසා, උතුරු දිසාව වන්නීය;

දාසකම්මකරා, දාසි දස් කම්කරුවෝ; හෙට්ඨා, යට දිශාව වන් නීය; සමණ බ්‍රාහ්මණා, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; උද්ධං, උඩදිසාව වන් නීය; එතාදිසා, මේ සදිසාවන්ට; (පැවතිම් වශයෙන්) නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේවී නම්; ගිහි, ඒ ගෘහස්ථ තෙම; කුලෙ, කුල යෙහි; අලමත්තො, වාසයකරන්ට සමර්ථවන්නේය;

පණ්ඩිතො, පණ්ඩිතවූ; සීලසම්පන්නො, ශීලයෙන් සමන්විතවූ; සණ්හො ච, සූක්‍ෂමාර්ථ දර්ශනය ඇත්තාවූ; පටිභාණ වා, වැටහෙන ලද ප්‍රඥව ඇත්තාවූ; නිවාතවුත්ති, යටත් පැවතුම් ඇත්තාවූ; අත්ථද්ධො, දැඩිමත් නැත්තාවූ; තාදිසො, එබඳුවූ පුද්ගල තෙම; යසං, යසස්; ලභතෙ, ලබයි;

උට්ඨානකො අනලසො-ආපදාසු න වෙධති
අච්ඡිද්දවුත්ති මෙධාවී-තාදිසො ලභතෙ යසං.

සඞ්ගාහකො මිත්තකරො-වදඤ්ඤූ වීතමච්ඡරො
නෙතා විනෙතා අනුනෙතා-තාදිසො ලභතෙ යසං

දානඤ්ච පෙය්‍ය වජ්ජඤ්ච-අත්ථචරියා ච යා ඉධ
සමානත්තතා ච ධම්මෙසු-තත්ථ තත්ථ යථාරහං.

එතෙ ඛො සඞ්ගහා ලොකෙ-රථස්සාණීව යායතො
එතෙ ච සඞ්ගහා නාස්සු-න මාතා පුත්තකාරණා
ලභෙථ මානං පූජං වා-පිතා වා පුත්තකාරණා.

---

උට්ඨානකො, පටන්ගත්තාලද වීර්‍ය්‍ය ඇත්ත වූ; අනලසො, කුසීත නොවන්නාවූ; (යමෙක්තෙම) ආපදාසු, ආපදර්ථයන් අතුරෙහි; න වෙධති, කම්පා නොවේද; අච්ඡිද්දවුත්ති, සිදුරු නොවූ පැවතුම් ඇත්තාවූ; මෙධාවී, ස්ථානොචිත ප්‍රඥාව ඇත්තාවූ; තාදිසො, එබඳු පුද්ගලතෙම; යසං, යසස; ලභතෙ, ලබයි;

සංගාහකො, සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහකරන්නාවූ; මිත්තකරො, මිත්‍රයන් ඇතිකරන්නාවූ; වදඤ්ඤූ, (පූර්වොපකාරීහු විසින් කියනලද වචන දැනගන්නාවූ; වීතමච්ඡරො, පහවූ මසුරුමල ඇත්තාවූ; නෙතා, ඒ ඒ අර්ථ දක්වන්නාවූ ඒ ඒ පුද්ගලයන් කෙරෙහි; විනෙතා, ඒ ඒ අර්ථයන් දක්වමින් නානාප්‍රකාර කාරණයන් ප්‍රකාශකරන්නාවූ; අනුනෙතා, නැවත නැවත හික්මවන්නාවූ; එතාදිසො, එබඳු පුද්ගලතෙම; යසං, යසස; ලභකෙ, ලබයි;

ඉධ, මේ ලොකයෙහි; යථාරහං, සුදුසු පරිද්දෙන්; දානං ච, දන් දීමද; පෙය්‍යවජ්ජං ච, ප්‍රිය වචන කීමද; යා අත්ථචරියා ච, යම් අර්ථ චරියාවක් වේද; එයද (හෙවත්) අනුන්ට වැඩ පිණිස හැසිරීමද; ධම්මෙසු, ධර්මයන්හි; සමානත්තතා ච, සමානාත්මතාවයද; (යන) එතෙ සංගහා ඛො, මේ සතර සංග්‍රහ වස්තු වනාහි; ලොකෙ, සත්ව ලෝකයෙහි; යායතො, යන්නාවූ; රථස්ස, රථයාගේ; ආනී ඉව, ඇනයක් මෙන් (පවත්නාහුය); එතෙච සංගහා, මේ සතර සංග්‍රහ වස්තූහු; න අස්සු, නොවන්නාහු නම්; මාතා, මව්තොමෝ; පුත්තකාරණා, පුත්‍රයා කාරණකොටගෙනද; පිතා වා, පියා හෝ; පුත්තකාරණා පුත්‍රයා කාරණකොටගෙනද; මානං වා, සිතින්බුහුමන්කිරීමක් හෝ; පූජං වා, පූජාකිරීමක් හෝ; න ලභෙථ, නොලබන්නේය;

යස්මා ච සඞ්ගහා එතෙ-සමවෙක්ඛන්ති පණ්ඩිතා
තස්මා මහත්තං පප්පොන්ති-පාසංසා ච භවන්ති තෙති.

එවං වුත්තෙ සිගාලකො ගහපතිපුත්තො භගවන්තං එතදවොච අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---

යස්මා, යම් හෙයකින්; එතෙ සංගහා ච, මේ සංග්‍රහ වස්තූන්; පණ්ඩිතා, පණ්ඩිතයෝ; සමවෙක්ඛන්ති, යහපත් කොට දකිද්ද; තස්මා, එහෙයින්; මහත්තං,(හිරණ්‍යසුවර්ණාදී ඓශ්වර්‍ය්‍යී) මහත්තබයට; පප්පොන්ති, පැමිණෙත්; තෙ, ඔහුතුමූ; පාසංසා ච, ප්‍රශංසාකට යුත්තෝද; භවන්ති ඉති, වෙත් යයි; (වදලසේක)

එවං වුත්තෙ, 'සම්‍යක් සම්බුද්ධ සර්‍වඥරාජොත්තමයන් වහන්සේ ගිහිවිනය) මෙසේ දෙශනාකර වදලකල්හි; සිගාලකො ගහපති පුත්තො, (දෙමව්පියන් විසින් තබනලද නාම වශයෙන්) සිගාලක නම්වූ ගෘහපති පුත්‍රතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේ කාරණය; අවොච, කීයේය; (ඒ කෙසේ ද?) භන්තෙ, ස්වාමින් වහන්ස; අභික්කන්තං, ඉතා යෙහෙක; භන්තෙ, ස්වාමින් වහන්ස; අභික්කන්තං, (නුබවහන්සේගේ ධර්‍මදෙශනාව) ඉතා යහපත් වන්නේය; භන්තෙ, ස්වාමින් වහන්ස; සෙය්‍යථාපි, යම්සේ; නික්කුජ්ජිතං, යටිකුරුකොට තබනලද භාජනයක්; උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරුකොට තබන්නේ ද; පටිච්ඡන්නං, වසනලද දෙයක්; විවරෙය්‍ය වා, විවෘතකොට දක්වන්නේ ද; මූළ්හස්ස, "මංමුළාවූ පුරුෂයෙකුට; මග්ගං, මාර්ගය; ආචික්ඛෙය්‍ය වා, කියන්නේද; චක්ඛුමන්තො, ඇස්ඇත්තෝ; රූපානි, (නීලපීතාදි) රූපයන්; දක්ඛින්ති ඉති, දකිත්වයි; අන්ධකාරෙ, ඝනාන්ධකාරයෙහි; තෙලපජ්ජොතං, තෙල් පහනක්; ධාරෙය්‍ය වා, දරන්නේ ද; එවමෙවං, එපරිද්දෙන්ම; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; අනෙකපරියායෙන, අනෙකප්‍රකාරයෙන්; ධම්මො, පර්‍ය්‍යාප්ති ධර්‍මය තෙම; පකාසිතො, ප්‍රකාශකරන ලද්දේය; භන්තෙ, ස්වාමින් වහන්ස; එසො අහං,

## සිඟාලොවාද සුත්තං.

පාථිකවග්ගො.

ඉමානි ඡ සුත්තානි සීලකථාය කොසල්ලත්ථං ගහෙතබ්බානි.

———— ○÷○ ————

දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා කත්ථ උප්පජ්ජන්ති? දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා අප්පෙකච්චෙ ගහපතිමහාසාලානං සහව්‍යතං උප්පජ්ජන්ති, අප්පෙකච්චෙ බ්‍රාහ්මණ මහාසාලානං සහව්‍යතං උප්පජ්ජන්ති, අප්පෙකච්චෙ ඛත්තිය මහාසාලානං සහව්‍යතං උප්පජ්ජන්ති අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති, අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති, අප්පෙකච්චෙ යාමානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති, අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති.

---

ඒ මම තෙම; භගවන්තං, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ද; ධම්මඤ්ච, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර ධර්මයද; භික්ඛුසඞ්ඝඤ්ච, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල භික්ෂු සඞ්ඝ රත්නයද; සරණං, සරණකොට; ගච්ඡාමි, යෙමි; භගවා, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; මං, මා; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, ජීවිතාන්තය දක්වා; සරණං ගතං, සරණ ගියාවූ; උපාසකං, උපාසකයෙකැයි; ධාරෙතු ඉති, දරණසේක්වයි කියා දැන්වූයේය.

සිඟාලොවාද සුත්තං, සිඟාලොවාද සූත්‍රයයි;

———— ○○ ————

"පාථිකවග්ගෙ, දික්සඟියෙහි පාථික වර්ගයෙහිය;"

ඉමානි ඡ සුත්තානි, මේ සූත්‍ර සය; සීලකථාය, ශීලකථායෙහි; කොසල්ලත්ථං, දක්ෂබව පිණිස; ගහෙතබ්බානි, ඉගෙණගත යුත්තාහුය;

———— ○÷○ ————

"දානංදත්වා" යනාදි තව්තිසා දෙව්ලෝ වාසීවූ දෙවියන් අතුරෙහි පරසතු රුක්මුලැ පඬුඇඹුල් සලස්තෙහි වැඩහුන්න වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දසදහසක් සක්වළින් අවුත් රැස්ව උන්නාවූ දෙවියන්ට අභිධර්මකථාව දෙශනා කරමින් ධම්මහදයවිභඞ්ගය සම්ප්‍රාප්තකල්හි මනුෂ්‍යලොකයෙහිද කාමාවචර දිව්‍යලොකයෙහිද සොළොස් රූපාවචර බ්‍රහ්මලොකයන්හිද සතර අරූපාවචර බ්‍රහ්ම

ලොකයන්හිද යන සත්විසි සුගති භවයන්හි ප්‍රතිසන්ධිජනක කර්‍මයද ඒ මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආයුෂ ප්‍රමාණයද දක්වනුසේක් "දානංදත්වා" යනාදිවූ ධර්‍මදේශනාව පටන්ගත්සේක. දානංදත්වා, දානචේතනාව පිරිසිදුකොට; සීලං, ශීලය; (නිත්‍ය ශීලවශයෙන් පඤ්චශීලය හෝ දසශීලය හෝ අඛණ්ඩාභිප්‍රායෙන්) සමාදියිත්වා, මනාකොට ගෙණ; උපොසථ කම්මං, උපෝෂථ කර්‍මය (පොහො දවස්හි අෂ්ටාඞ්ග සමන්නාගතවූ ශීලය රක්‍ෂාකටයුතු අර්ථයෙන් කර්‍මය) කත්වා, කොට; අප්පෙකච්චෙ, ඇතම් කෙනෙක්; ගහපති මහාසාලානං, ගෘහපති මහාසාලයන්ගේ; සහව්‍යතං, එකිභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; බ්‍රාහ්මණ මහාසාලානං, බ්‍රාහ්මණ මහාසාලයන්ගේ; සහව්‍යතං, එකිභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; ඛත්තිය මහාසාලානං, ක්‍ෂත්‍රිය මහාසාලයන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; (එහි යමෙකුගේ ගෘහයෙහි පශ්චිමාන්තයෙන් සතළිස් කෙළක් ධනය නිධානගතවේද කහවණුද අමුණුපසක් දවස වියදම්යේද මේ ගෘහපති මහාසාල නම්වේ යමෙකුගේ ගෘහයෙහි අන්තිම පරිච්ඡේදයෙන් අසූකෙළක් ධනය නිධානගත වේද කහවණුද අමුණුදසයක් දවස වියදම්යේද මේ බ්‍රාහ්මණ මහාසාල නම්වේ. පශ්චිමාන්තයෙන් කෙළසියයක් ධනය නිධානගත වේද කහවණුද අමුණුවිස්සක් දවස වියදම්යේද මේ ක්‍ෂත්‍රිය මහාසාල නම්වේ. මෙසේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යලොකයෙහි සැපයට හෙතු පුණ්‍යඵලයවූ සුගති භවසම්පත්තියද භොගසම්පත්තියද දක්වා දැන් සදිව්‍ය ලොකයෙහි ඒ භවභොග සම්පත්තිය දක්වන්නේ "අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං" යනාදිය වදාළසේක) අප්පෙකච්චෙ, සමහරු; චාතුම්මහාරාජිකානං, චාතුර්මහාරාජික නම් දෙව්ලෝවාසීවූ; දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්තිවශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; තාවතිංසානං, තව්තිසා දෙව්ලෝ වාසීවූ; දෙවානං; දෙවියන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්තිවශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; යාමානං, යාම දෙව්ලෝවාසීවූ; දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්: අප්පෙකච්චෙ, සමහරු; තුසිතානං, තුසිත දෙව්ලෝ වාසීවූ; දෙවානං, දෙවින්ගේ; සහව්‍යතං,

අප්පෙකච්චෙ නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති

මනුස්සානං කිත්තකං ආයුප්පමාණං වස්සසතං අප්පං වා භිය්‍යො වා, චාතුම්මහාරාජිකානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? යානි මානුසකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංස රත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං මනුස්සානං ගණනාය කිත්තකං හොති නවුතිවස්සසතසහස්සානි.

---

ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; නිම්මාණරතීනං, නිර්මාණරති දෙව්ලෝ වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; පරනිම්මිත වසවත්තීනං, පරනිර්මිත වශවර්ති දෙව්ලෝ වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්;

මනුස්සානං, මිනිසුන්ගේ; ආයුප්පමාණං, ආයුප්‍රමාණය; කිත්තකං, කොපමණවේ ද; වස්සසතං, අවුරුදු සියයෙක්; (ආයුෂ ඇත්තාහු'ය) අප්පං වා, (එයින්) ස්වල්පවූ හෝ; භිය්‍යො වා, බොහොවූ හෝ වේ (නරකාදි සතර අපායගත සත්වයන්ගේ හා මනුෂ්‍යයන්ගේ ආයුෂ පිරිසිඳීමක් නැත්තේය, මහාමන්ධාතු රජකාලයෙහි මනුෂ්‍යයෝ ද සමහර යක්ෂයෝ ද දීඝායුෂ ඇත්තාහු වෙත්, අපායයන්හි වනාහි කර්මයම ප්‍රමාණ වෙයි, එහි උපන්නවුන්ගේ යම්තාක් කර්මය නොගෙවේ ද, එතාක්කල් චුතනොවන හෙයිනි. භූම්‍යස්ථ දෙවියන්ගේද ස්වභාව එසේමය, ඔවුන් අතුරෙහි උපන්නාවූ සමහරු සත් දවසක් කල් සිටිත්, සමහරු කල්පයක් සිටිත්, එසේම මනුෂ්‍යයන්ට කිසිකලෙකත් අසංඛ්‍යායුෂ ඇති හෙයින් ද කිසිකලෙක්හි දස හවුරුදු ආයුෂ ඇති හෙයින් ද මනුෂ්‍යායුෂ පරිච්ඡේදය නියමනැති

තාවතිංසානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? යං මානුසකං වස්සසතං තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං මනුස්සානං ගණනාය කිත්තකං හොති? තිස්සො ච වස්සකොටියො සට්ඨිඤ්ච වස්සසතසහස්සානි.

---

නුමුත් බුදුරජාණන් වහන්සේ වැඩසිටි කාලයෙහි ආයුෂ ප්‍රමාණය මෙහි වදාරණලදි.) චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙව්ලෝ වැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණෙක් (වේ) ද; මානුසකානි, මනුෂ්‍යයන් පිළිබඳවූ; යානි පඤ්ඤාසවස්සානි, යම් අවුරුදු පණසෙක් ඇද්ද; එසො, මේ තෙම; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙව්ලෝ වැසි දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තාය රත්තියා, ඒ අහෝ රාත්‍රියෙන්; තිංසරත්තියො, රෑ තිසක්; මාසො, මාසයෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදස මාසියො, දොළොස් මාසයෙක්; සංවච්ඡරො, හවුරුද්දක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානි, දිව්‍යමයවූ; පඤ්චවස්සසතානි, පන්සියයක් හවුරුදු; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙව්ලෝවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං, මිනිසුන්ගේ; ගණනාය, අවුරුදු ගණනාවෙන්; කිත්තකං හොති, කොපමණ (වේ) ද; නවුතිවස්සසතසහස්සානි, අනූලක්‍ෂයක් වෙත්;

තාවතිංසානං දෙවානං, තව්තිසා දෙව්ලෝවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද? මානුසකං, මනුෂ්‍යයන් පිළිබඳවූ; යං වස්සසතං, යම් හවුරුදු සියයෙක් ඇද්ද; එසො, මේ තෙම; තාවතිංසානං දෙවානං, තව්තිසා දෙව්ලෝවැසි දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තාය රත්තියා; ඒ රෑයින්; තිංසරත්තියො, තිස්රෑයක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදස මාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරො, අවුරුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බං, දිව්‍යමයවූ; වස්සසහස්සං, අවුරුදු දහසක්; තාවතිංසානං දෙවානං, තව්තිසා. දෙව්ලෝවැසි දෙවි

යාමානං දේවානං කිත්තකං ආයුප්පමාණං? යානි මානුසකානි ද්වෙ වස්සසතානි යාමානං දේවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි ද්වෙවස්ස සහස්සානි යාමානං දේවානං ආයුප්පමාණං මනුස්සානං ගණනාය කිත්තකං හොති? චුද්දස වස්සකොටියො චත්තාරීසා ච වස්සසතසහස්සානි.

තුසිතානං දේවානං කිත්තකං ආයුප්පමාණං? යානි මානුසකානි චත්තාරි වස්සසතානි තුසිතානං දේවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන

---

යන්ගේ; ආයුප්පමානං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං, මිනිසුන්ගේ; ගණනාය, අවුරුදු ගණනින්; කිත්තකං හොති, කොපමණ වේද? තිස්සොච වස්සකොටියො, අව්රුදු තුන්කෙළක්ද; සට්ඨිඤ්ච වස්ස සතසහස්සානි, අව්රුදු හැටලක්ෂයක්ද; (වෙත්)

යාමානං, යාම දෙව්ලෝවාසීවූ; දේවානං, දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද; මානුසකානි, මිනිසුන් පිළිබඳවූ; යානි, යම්; ද්වෙවස්ස සතානි, අවුරුදු දෙසියයක් ඇද්ද; යාමානං දේවානං, යාම දෙව්ලෝවැසි දෙවියන්ට; එසො, මේ තෙම; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් වෙයි; තාය රත්තියා, ඒ රැයින්; තිංසරත්තියො, තිස්රැයක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, මාස දොළසෙක්; සංවච්ඡරො, අවුරුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි, දිව්‍යමයවූ; ද්වෙවස්ස සහස්සානි, අව්රුදු දෙදහසක්; යාමානං දේවානං, යාම දෙව්ලෝවැසි දෙවියන්ගේ; ආයුප්පමානං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං, මිනිසුන්ගේ; ගණනාය (අව්රුදු) ගණනින්; කිත්තකං හොති, කොපමණ වේද; චුද්දසවස්ස කොටියො, අව්රුදු තුදුස්කෙළක්ද; චත්තාරීසා ච වස්සසතසහස්සා නි, අවුරුදු හතළිස් ලක්ෂයක් ද; (වෙත්)

තුසිතානං දේවානං, තුසිත දෙව්ලෝවැසි දෙවියන්ගේ; ආයු ප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද; මානුසකානි, මනුෂ්‍යයන් පිළිබඳවූ; යානි චත්තාරි වස්සසතානි, යම් අවු

වාදසමාසියො සංවච්ඡරෙ තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්සසහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං මනුස්සානං ගණනාය කිත්තකං හොති සත්තපඤ්ඤාස වස්සකොටියො සට්ඨිඤ්ච වස්සසතසහස්සානි.

නිම්මාණරතීනං දෙවානං කිත්තකං ආයුප්පමාණං? යානි මානුසකානි අට්ඨවස්සසතානි නිම්මාණරතීනං දෙවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන වාදස මාසියො සංවච්ඡරෙ තෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨවස්ස සහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං, මිනුස්සානං ගණනාය කිත්තකං හොති? වෙ ච වස්සකොටිසතානි තිංසා ච වස්සකොටියො චත්තාරීසා ච වස්සසතසහස්සානි.

---

රුදු හාරසියයක් වේද්ද; එසො, මේ තෙම; තුසිතානං දෙවානං, තුසිත දෙව්ලෝවැසි දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රුදුව ලෙක් වෙයි; තාය රත්තියා, ඒ රැයින්; තිංසරත්තියො, තිස්රැයක්; මාසො, මසෙක් වෙයි; තෙන මාසෙන, ඒ මසින්; වාදස මාසියො, මාස දොළසෙක්; සංවච්ඡරෙ, අව්රුද්දෙක් වෙයි; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි, දිව්‍යමයවූ; චත්තාරි වස්සසහස්සානි, අවුරුදු හාරදහක්; තුසිතානං දෙවානං, තුසිත දෙව්ලොවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං, මිනිසුන්ගේ; ගණනාය, (අව්රුදු) ගණනින්; කිත්තකං හොති, කෙපමණ වේ ද? සත්ත පඤ්ඤාසවස්ස කොටියො, අව්රුදු සත්පනස් කෙළක් ද; සට්ඨිඤ්චවස්ස සතසහස්සානි, අවුරුදු හැටලක්‍ෂයක්. ද; (වෙත්)

නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙව්ලෝවැසි දෙවියන් ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කෙපමණ (වේ) ද; මානුසකානි, මිනිසුන් පිළිබඳවූ; යානි අට්ඨවස්ස සතානි, යම් අට සියයක් අවුරුදු (ඇද්ද); එසො, මේ තෙම; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙව්ලෝ වැසි දෙවියන්ට; එකො රත්තින්දිවො, එක් රුදුවලෙක්; (වෙයි) තාය රත්තියා, ඒ රැයින්; තිංස රත්තියො තිස්රැයක්; මාසො, මසෙක්; (වෙයි) තෙන මාසෙන, ඒ මසින්; වාදස මාසියො, මාස දොළසෙක්; සංවච්ඡරෙ, අවුරුද්දෙක්; (වෙයි) තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි, දිව්‍යමයවූ; අට්ඨ වස්ස සහස්සානි, අවුරුදු අටදහසක්; නිම්මාණරතීනං දෙවානං,

පරනිම්මිත වසවත්තීනං දේවානං කිත්තකං ආයුප්පමාණං? යානි මානුසකානි සොළසවස්සසතානි පරනිම්මිත වසවත්තීනං දේවානං එසො එකො රත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදස මාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළස වස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දේවානං ආයුප්පමාණං, මනුස්සානං ගණනාය කිත්තකං හොති නව ච වස්සකොටිසතානි එකවීසති ච වස්සකොටියො සට්ඨිඤ්ච වස්සසත සහස්සානීති.

ඡ එතෙ කාමාවචරා-සබ්බකාම සමිද්ධිනො
සබ්බෙසං එකසඞ්ඛාතෙ-ආයු භවති කිත්තකො

---

නිර්මාණරතී දෙව්ලොවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං, මිනිසුන්ගේ; ගණනාය, (අවුරුදු) ගණනින්; කිත්තකං හොති, කොපමණවේද? වෙව වස්සකොටිසතානි, අවුරුදු කොටි දෙසියයක්ද; තිංසාච වස්ස කොටියො, අවුරුදු තිස්කොටියක්ද; චත්තාරීසාච වස්ස සතසහස්සානි, අවුරුදු හතළිස් ලක්‍ෂයක්ද (වෙත්); පරනිම්මිත වසවත්තීනං දේවානං, පරනිර්මිත වසවර්ති දෙව්ලෝවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ)ද; මානුසකානි, මිනිසුන් පිළිබඳවූ; යානි, යම්; සොළස වස්සසතානි, සොළොස් සියයක් අවුරුදු (ඇද්ද); එසො, මේ තෙම; එකො රත්තින්දිවො, එක් රෑදවලෙක් (වෙයි); තාය රත්තියා, ඒ රැයින්; තිංසරත්තියො, තිස්රැයක්; මාසො, මසක් (වෙයි); තෙන මාසෙන, ඒ මසින්; ද්වාදස මාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරො, අවුරුද්දෙක; තෙන සංවච්ඡරෙන, ඒ අවුරුද්දෙන්; දිබ්බානි, දිව්‍යමයවූ; සොළසවස්ස සහස්සානි, සොළොස් දහසක් අවුරුදු; පරනිම්මිත වසවත්තීනං දේවානං, පරනිර්මිත වසවර්ති දෙව්ලොවැසි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණයි; මනුස්සානං ගණනාය, මිනිසුන්ගේ (අවුරුදු) ගණනින්; කිත්තකං හොති, කොපමණ වේද; නවච වස්සකොටිසතානි, අවුරුදු කොටි නවසියයක්ද; එකවීසති වස්සකොටියො, අවුරුදු විසිඑක් කොළක්ද; සට්ඨිඤ්ච වස්සසතසහස්සානි ඉති, අවුරුදු හැටලක්‍ෂයක් ඇත්තාහු යයි; (වදාළසේක)

සබ්බකාම සමිද්ධිනො, සියළු කාම (සම්පත්ති) යෙන් සමෘද්ධවූ; එතෙ ඡ කාමාවචරා, මේ ෂට්කාමාවචර (දිව්‍යලොක) යෝ; (වෙත්)

ද්වාදසකොටිසතං තෙසං-අට්ඨවීසා ච කොටියො
පඤ්ඤාස සත සහස්සානි-වස්සගෙනන පකාසිතා.

පඨමං ඣානං පරිත්තං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති? පඨමං ඣානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති තෙසං කිත්තකං ආයුප්පමාණං? කප්පස්ස තතියො, භාගො. පඨමං ඣානං මජ්ඣිමං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති? පඨමං ඣානං මජ්ඣිමං භාවෙත්වා බ්‍රහ්මපුරොහිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං? උපඩ්ඪකප්පෙ

---

සබ්බෙසං, (ඒ) සියල්ලන්ගේ; ආයු, ආයුෂය; * එකාසංඛාතෙ, එක් කොට ගිණූකල්හි; කිත්තකො භවති, කොපමණ වේද? තෙසං, ඔවුන්ගේ; (ඒ දෙවියන්ගේ) වස්සගෙනන, අවුරුදු ගණිතින්; ද්වාදස කොටිසතං, දෙලොස් කෙළ සියයක්ද; අට්ඨවීසාච කොටියො, විසි අට කොටියක්ද; පඤ්ඤාස සත සහස්සානි, පණස් ලක්‍ෂයක්ද; පකාසිතා, ප්‍රකාශකරන ලද්දාහුය;

මෙසේ බුදුරජාණන් වහන්සේ සපතාවිධ කාමසවර්ගයෙහි භව භොග සම්පත් ආයුෂ ප්‍රමාණ දක්වා දැන් බ්‍රහ්මලොකොත්පත්තිය හා ආයුෂ ප්‍රමාණ දක්වන්නේ- 'පඨමංඣානං පරිත්තං භාවෙත්වා' යනාදිය වදාළසේක- පඨමං ඣානං, පළමුවෙනි ධ්‍යානය; පරිත්තං, ගුණ මදකොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උපපජ්ජන්ති, උපදිද්ද; පඨමං ඣානං, පළමුවෙනිවූ ධ්‍යානය; පරිත්තං, මද (ගුණ ඇති) කොට; භාවෙත්වා, වඩා; බ්‍රහ්මපාරිසජ්ජානං, බ්‍රහ්මපාරිසද්‍ය නම්වූ බඹලොව වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (හෙවත් මහාබ්‍රහ්ම යන්ට පරිවාරිකා බැවින් ඒ මහ බඹුන්ගේ පිරිවර බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, (උත්පත්ති වශයෙන්) පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ වේද? කප්පස්ස, (අසංඛ්‍ය) කල්පයාගේ; තතියො, තුන්වැනිවූ; භාගො, කොටසයි; පඨමං ඣානං, පළමුවෙනි ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම ගුණකොට; භාවෙත්වා, වඩා; කත්ථඋපපජ්ජන්ති, කොතැන්හි උපදිද්ද? පඨමං, පළමුවෙනිවූ; ඣානං, ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම (ගුණ ඇති) කොට; භාවෙත්වා, වඩා; බ්‍රහ්මපුරොහිතානං, බ්‍රහ්ම පුරොහිත නම් බඹලෝ වාසීවූ; දෙවානං, දෙවි

---

* එකාසංඛාතෙ, පාළියං, එකාසංඛාතෙ, අට්ඨකථායං

පඨමං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උප්පජ්ජන්ති? පඨමං ඣානං පණීතං භාවෙත්වා මහාබ්‍රහ්මානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං? එකො කප්පො- දුතියං ඣානං පරිත්තං භාවෙත්වා කත්ථ උප්පජ්ජන්ති? දුතියං ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තාභානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං වෙ කප්පා- දුතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා කත්ථ උප්පජ්ජන්ති? දුතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා

---

යන්ගේ; (මහා බ්‍රහ්මයන්ගේ පුරෝහිත ස්ථානයෙහි සිටි බ්‍රහ්මයන් ගේ) සහව්‍යතං, එකී භාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන් ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ වේද? උපඩ්ඪකප්පො, අඩකපයි; (අසංඛ්‍ය කල්පයෙන් දෙකෙන් කොටසයි) පඨමං ඣානං, ප්‍රථමධ්‍යානය; පණීතං, ප්‍රණීතකොට; භාවෙත්වා, වඩා; කත්ථ උප්පජ්ජන්ති, කො තැන්හි උපදිත්ද? පඨමං ඣානං, ප්‍රථමධ්‍යානය; පණීතං, ප්‍රණීත කොට; (සම්පූර්ණ උතුම් ගුණ ඇති කොට) භාවෙත්වා, වඩා; මහා බ්‍රහ්මානං, මහාබ්‍රහ්ම නම් බඹලොව වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (වර්ණවත් බැව්හඳ දීර්ඝායුෂ්කතාදියෙන්ද මහත්වූ මහාබ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, ඒකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ වේද; එකො කප්පො, එක් කපයි; (අසංඛ්‍ය කල්ප එකයි) දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; පරිත්තං, ගුණ මදකොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උප්පජ්ජන්ති, උපදිද්ද; දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; පරිත්තං, ගුණ මදකොට; භාවෙත්වා, වඩා; පරිත්තාභානං, පරිත්තාභ නම්වූ බඹලොව වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (මතොතහි බ්‍රහ්මයන්ට වඩා සවල්ප ශරීර ප්‍රභාව ඇති බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, ඒකීභාවයට; උප්පජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ ද? වෙකප්පා, (මහා කල්පයෝ දෙකයි; දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම ගුණ ඇතිකොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උප්පජ්ජන්ති, උපදිද්ද? දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම ගුණ ඇතිකොට; භාවෙත්වා, වඩා; අප්පමාණාභානං, අප්පමාණාභ නම්

අප්පමාණාභානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං චත්තාරො කප්පා- දුතියං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති? දුතියං ඣානං පණීතං භාවෙත්වා ආභස්සරානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං, අට්ඨකප්පා- තතියං ඣානං පරිත්තං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති? තතියං ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තසුභානං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං? සොළසකප්පා- තතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා

---

බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (අප්‍රමාණ ආලෝකඇති බ්‍රහ්මයන්ගේ) සහබ්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණ කිත්තකං, කොපමණ වේද; චත්තාරො කප්පා, කල්ප සතරයි; දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; පණීතං, උතුම් (ගුණ ඇති) කොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උපපජ්ජන්ති, උපදිද්ද; දුතියං ඣානං, දෙවෙනි ධ්‍යානය; පණීතං, උතුම් (ගුණ ඇති) කොට; භාවෙත්වා, වඩා; ආභස්සරානං, ආභස්සර නම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (මෙඝ වලාහකයෙන් නික්මෙන විදුලි මෙන් තම තමන්ගේ ශරීරවලින් ආලෝක නික්මෙන බ්‍රහ්මයන්ගේ) සහබ්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ වේද; අට්ඨකප්පා, මහාකල්ප අටයි; තතියං ඣානං, තුන්වෙනි ධ්‍යානය; පරිත්තං, ගුණ මද කොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උපපජ්ජන්ති, උපදිත්ද? තතියං ඣානං, තුන්වෙනි ධ්‍යානය; පරිත්තං, ගුණමද කොට; භාවෙත්වා, වඩා; පරිත්තසුභානං, පරිත්තසුභ නම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (මතු බ්‍රහ්මයන් කෙරෙන් ස්වල්පවූ එකඝණ අචල ශරීරාලෝකය ඇති බ්‍රහ්මයන්ගේ) සහබ්‍යතං, ඒකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණද? සොළසකප්පා, මහාකල්ප සොළසයි; තතියං ඣානං, තුන්වෙනි ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම ගුණ ඇතිකොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උපපජ්ජන්ති, උපදිද්ද; තතියං ඣානං, තුන්වෙනි ධ්‍යානය; මජ්ඣිමං, මධ්‍යම ගුණ ඇතිකොට; භාවෙත්වා, වඩා; අප්පමාණසුභානං, අප්පමාණ සුභ

සහව්‍යතං උපපජ්ජන්ති, තතියං ඣානං මජ්ඣිමං භාවෙත්වා අප්පමාණ සුභානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං? බාත්තිංස කප්පා, තතියං ඣානං පණීතං භාවෙත්වා කත්ථ උපපජ්ජන්ති? තතියං ඣානං පණීතං භාවෙත්වා සුභකිණ්ණකානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති, තෙසං කිත්තකං ආයුප්පමාණං? චතුසට්ඨි කප්පා.

චතුත්ථං ඣානං භාවෙත්වා ආරම්මණ නානත්තතා මනසිකාර නානත්තතා ඡන්ද නානත්තතා පණිධි නානත්තතා අධිමොක්ඛ නානත්තතා අභිනීහාර නානත්තතා පඤ්ඤා නානත්තතා අප්පෙකච්චෙ අසඤ්ඤසත්තානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ වෙහප්ඵලානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ අවිහානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ

---

නම් බඹලොව වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (අප්‍රමාණ එකඝන අචල ආලොක ඇති බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකිභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද; බාත්තිංස කප්පා, (මහා) කල්ප තිස්දෙකයි; තතියංඣානං, තුන්වෙනි ධ්‍යානය; පණීතං, උතුම් ගුණඇතිකොට; භාවෙත්වා, වඩා; කත්ථ, කොතැන්හි; උපපජ්ජන්ති, උපදිත් ද? තතියංඣානං, තුන්වෙනි ධ්‍යානය; පණීතං, උතුම් ගුණඇතිකොට; භාවෙත්වා, වඩා; සුභකිණ්ණකානං, සුභකිණ්ණක නම්වූ බඹලොවැ වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (එකඝන අචල ශරීරාලොකයන්ගෙන් ආකීර්ණවූ බ්‍රහ්මයන්ගේ); සහව්‍යතං, එකිභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; තෙසං, ඔවුන්ගේ; ආයුප්පමාණං, ආයුෂප්‍රමාණය; කිත්තකං කොපමණ (වේ) ද? චතුසට්ඨි කප්පා, මහා කල්ප සැටහතරයි;

චතුත්ථං ඣානං, සතරවෙනි ධ්‍යානය; භාවෙත්වා, (මධ්‍යමප්‍රණීත ගුණඇතිකොට) වඩා; ආරම්මණ නානත්තතා, අරමුණෙහි නානත්වයෙන්ද; මනසිකාර නානත්තතා, මනසිකාරයාගේ නානත්වයෙන්ද; ඡන්දනානත්තතා, ඡන්දයාගේ නානත්වයෙන්ද; පණිධි නානත්තතා, ප්‍රණිධියගේ නානත්වයෙන්ද; අධිමොක්ඛ නානත්තතා, අධිමොක්ෂයාගේ නානත්වයෙන්ද; අභිනීහාර නානත්තතා, අභිනීහාරයාගේ නානත්වයෙන්ද; පඤ්ඤා නානත්තතා, සංඥවගේ නානත්වයෙන්ද;

අතප්පානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ සුදස්සානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ සුදස්සීනං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ අකනිට්ඨානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ ආකාසානඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති අප්පෙකච්චෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති,

---

අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; අසඤ්ඤසත්තානං, අසඤ්ඤසත්ත නම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (සංඥාවිරාග භාවනාවෙන් උපන් රූප සන්තති මාත්‍රවූ සංඥාමුඛයෙන් කියනලද වෙදනා සංඥා සංස්කාර විඥාන යන අරූප ස්කන්ධයෝ නැතිව මෙහි යම් ඊර්‍ය්‍යාපථයකින් චුතවේද්ද එම ඉරියව්වෙන් ම ඒ බඹලොව් ඉපදී චිත්‍රකර්මාන්තකළ රූප සදෘශවූ අසංඥ බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; වෙහප්ඵලානං, වෙහප්ඵල නම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (ධ්‍යානප්‍රභාවෙන් උපන් මහත් කුශල ඵල ඇති බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්තිවශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; අවිහානං, අවිහනම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (ස්වල්පවූ කලයකින් තමාගේ ස්ථානය අත්නොහරින සුද්ධාවාස බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; අතප්පානං, අතප්ප නම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; කිසිවකින් නොතැවෙන්නාවූ සුද්ධාවාස බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; සුදස්සානං, සුදස්සනම් බඹලොව් වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (උතුම් සම්පත් රූ ඇති හෙයින් සැපසේ දකින්ට ලැබෙන සුද්ධාවාස බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; සුදස්සීනං, සුදස්සී නම් බඹලොව්වාසීවූ; දෙවානං, දෙවියන්ගේ; (අතිශයෙන් පිරිසිදු

අසඤ්ඤසත්තානඤ්ච වෙහප්ඵලානඤ්ච දේවානං කිත්තකං ආයුප්පමාණං? පඤ්ච කප්පසතානි, අවිහානං දේවානං කිත්තකං ආයුප්පමාණං? කප්පසහස්සං, අතප්පානං දේවානං කිත්තකං ආයුප්පමාණං? ද්වේකප්පසහස්සානි, සුදස්සානං දේවානං කිත්තකං ආයුප්පමාණං? චත්තාරි කප්පසහස්සානි, සුදස්සීනං දේවානං

---

දුක්ඛ ඇතිහෙයින් සැපසේ දකින්ට ලැබෙන සුඛාවාස බ්‍රහ්මයන්ගේ); සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; අකණිට්ඨකානං, අකණිට්ඨක නම් බඹලොව වාසීවූ; දේවානං, දෙවියන්ගේ; (උත්කෘෂ්ට සම්පත් ඇතිහෙයින් කණිෂ්ඨභාවයක් නැති සුඛාවාස බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; ආකාසානඤ්චායතනූපගානං, ආකාසානඤ්චායතන නම් බඹලොවට පැමිණියාවූ; දේවානං, දෙවියන්ගේ; (ප්‍රථම අරූප විපාකවූ වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන සතර අරූපස්කන්ධයන් ඇති අරූපි බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; විඤ්ඤාණඤ්චායතනූපගානං, විඤ්ඤාණඤ්චායතන නම් බඹලොවට පැමිණියාවූ; දේවානං, දෙවියන්ගේ; (දෙවෙනි අරූප විපාකවූ වෙදනාදි ස්කන්ධ සතර ඇති අරූපි බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; ආකිඤ්චඤ්ඤායතනූපගානං, ආකිඤ්චඤ්ඤායතන නම් අරූපි බ්‍රහ්මලොකයට පැමිණියාවූ; දේවානං, දෙවියන්ගේ; (තුන්වෙනි අරූපවිපාකවූ වෙදනාදී ස්කන්ධ සතරඇති අරූපි බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්; අප්පෙකච්චෙ, සමහරු; නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්මලොකයට පැමිණියාවූ; දේවානං, දෙවියන්ගේ; (සතරවෙනි අරූපවිපාකවූ ස්කන්ධ සතරඇති අරූපි බ්‍රහ්මයන්ගේ) සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජන්ති, උත්පත්ති වශයෙන් පැමිණෙත්;

අසඤ්ඤසත්තානඤ්ච, අසංඥසත්ව බඹලොව වාසීවූද; වෙහප්ඵලානඤ්ච, වෙහප්ඵල බඹලොව වාසීවූද; දේවානං, දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ් ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද; පඤ්චකප්පසතානි, පන්සියයක් කල්ප (වෙත්); අවිහානං, අවිහ නම් බඹලොව වාසීවූ; දේවානං, (සුඛාවාස බ්‍රහ්මවූ) දෙවියන්ගේ;

කිත්තකං ආයුප්පමාණං අට්ඨකප්පසහස්සානි, අකණිට්ඨකානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? සොළසකප්පසහස්සානි, ආකාසානඤ්චායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? වීසති කප්ප සහස්සානි, විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? චත්තාරීසකප්පසහස්සානි, ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? සට්ඨිකප්පසහස්සානි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං කිත්තකං ආයුප්පමාණං? චතුරාසීතිකප්පසහස්සානීති.

---

ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද; කප්ප සහස්සං, කල්ප දහසක් (වේ); අතප්පානං, අතප්පනම් බඹලොව වාසිවූ; දෙවානං, (සුද්ධාවාස බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද? වෙකප්ප සහස්සානි, කල්ප දෙදහසෙක් (වෙත්); සුදස්සානං, සුදස්ස නම්වූ සුද්ධාවාස බඹලොව වාසීවූ; දෙවානං, (බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කිත්තකං, කොපමණ (වේ) ද? චත්තාරිකප්ප සහස්සානි, කල්ප සාරදහසෙක් (වෙත්); සුදස්සීනං, සුදස්සී නම් (සුද්ධාවාස බඹලොව වාසීවූ); දෙවානං, (බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද; අට්ඨකප්පසහස්සානි, කල්ප අටදහසෙක් (වෙත්); අකණිට්ඨකානං, අකණිෂ්ඨකනම් (සුද්ධාවාස බඹලොව වාසීවූ); දෙවානං, (බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද? සොළසකප්ප සහස්සානි, සොළොස් දහසක් කල්ප (වෙත්);

ආකාසානඤ්චායතනූපගානං, ආකාසානඤ්චායතනයට පැමිණියාවූ; දෙවානං, (අරූපි බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද; වීසතිකප්පසහස්සානි, කල්ප විසිදහසක් (වෙත්); විඤ්ඤාණඤ්චායතනූපගානං, විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ; දෙවානං, (අරූපි බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද; චත්තාරිකප්පසහස්සානි, කල්ප සතළිස් දහසක් (වෙත්); ආකිඤ්චඤ්ඤායතනූපගානං, ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ (අරූපි බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද? සට්ඨිකප්පසහස්සානි, කල්ප සැටදහසක් (වෙත්); නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියාවූ; දෙවානං, (අරූපි බ්‍රහ්මවූ) දෙවියන්ගේ; ආයුප්ප

උක්ඛිත්තා පුඤ්ඤතේජේන-කාමරූපගතිං ගතා
භවග්ගතම්පි සම්පත්තා-පුනාගච්ඡන්ති දුග්ගතිං.

---

මාණං, ආයු පමණ; කිත්තකං, කොපමණ (වේ) ද? චතුරාසීති කප්පසහස්සානි ඉති, කල්ප අසූහාරදහසක් (වෙත්) යයි; (මෙසේ බ්‍රහ්මපාරිසජ්ජාදි තුන් බ්‍රහ්මලොකයන්ගේ අසංඛ්‍ය කල්ප වශයෙන් ආයුපරිච්ඡේදය දතයුත්තේය, එක කල්පයෙක්හිම ඔවුන්ගේ විනාසය නොවන හෙයිනි. ලොකය වනාහි සත්වරක් ගින්නෙන් නැසෙයි අටවෙනි වාරයෙහි ජලයෙන්ද නැවත සත්වරක් ගින්නෙන්ද අටවෙනිවර ජලයෙන් දැයි මෙසේ අට අට අටක් පරිපූර්ණවූකල්හි පශ්චිමවර වාතයෙන් විනාශ වෙයි, එහි ප්‍රථමධ්‍යානතලය සඳහා ගින්නෙන්ද ද්විතීයධ්‍යාන තලය අල්වා ජලයෙන්ද තෘතීයධ්‍යාන තලය අල්වා වාතයෙන්ද විනාශ වෙයි, එහෙයින් ද්විතීයධ්‍යාන තලයෙහි පටන් පරිපූර්ණ මහාකල්පයාගේ වශයෙන් ආයුපරිච්ඡේදය දතයුත්තේය, අසංඛ්‍ය කල්පය වනාහි මහා කල්පයාගේ සතරෙන් කොටස යයි දතයුත්තේය, එය වනාහි ශස්ත්‍රරොග දුර්භික්ෂයන්ගේ අතරෙන් එක්තරා සංවර්තයකින් සත්වයන් බොහෝසේ විනාශවූ කල්හි ඉතිරි සත්ව සන්තාන ප්‍රවෘත්ත කුශල කර්මානුභාවයෙන් දසඅවුරුද්දෙහි පටන් අනුක්‍රමයෙන් වැඩී අසංඛ්‍යායුෂ ප්‍රමාණවූ සත්වයන් ඇති කල්හි වනාහි අධර්ම සමාදාන වශයෙන් පිරිහී දශඅවුරුදු ආයුෂ ඇතිවූ කල්හි ශස්ත්‍රරොගාදීන් අතරෙන් එක්තරා විනාශයකින් සත්වයන් විනාශ විමෙන් මේ එක අන්තර කල්පයෙක් වෙයි, මෙසේ පිරිසිඳිනලද අන්තර කල්පයාගේ වශයෙන් අන්තර කල්ප හැටහතරක් පමණ යයිද කියත්, මෙපමණකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ දානාදිමයවූ කාමාවචර කුශලයෙන් මිනිස්ලොව හා සදිව්‍යලොකයෙහි උත්පත්තියද චතුර්විධ රූපාවචර කුශලයෙන් සොළොස් රූපාවචර බ්‍රහ්මලොකයන්හිද චතුර්විධවූ අරූපාවචර කුශලයෙන් සතර අරූප භවයන්හිද උත්පත්තිය දක්වයි, මෙසේ දක්වා දැන් ගාථාබන්ධන වශයෙන් කාමයන්ගේ ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දක්වන්නේ "උක්ඛිත්තාපුඤ්ඤතෙජේන" යනාදිය වදාළසේක.

පුඤ්ඤතෙජේන, පුණ්‍ය තෙජසින්; (ත්‍රිවිධවූ පුණ්‍යයන්ගේම බලයෙන්) උක්ඛිත්තා, ඔසවනලද්දාහු; (භොගයසාධිපත්‍යය ආයු වර්ණ සෞඛ්‍යාදි පුණ්‍යඵල විශෙෂ ප්‍රවෘත්තියෙන් උසස්බවට ශ්‍රෙෂ්ඨබවටද ගෘහපති මහාසාලාදි මනුෂ්‍යබවට හා දිව්‍ය බ්‍රහ්මාදිබවටද

තාව දීඝායුකා සත්තා චවන්ති ආයුසඞ්ඛයා
නත්ථි කොචි භවො නිච්චො-ඉති වුත්තං මහෙසිනා.

තස්මාහි ධීරා නිපකා-නිපුණා අත්ථචින්තකා
ජරා මරණමොක්ඛාය-භාවෙන්ති මග්ගමුත්තමං.

---

පමුණුවන ලද්දහු) කාමරූපගතිං, කාමරූප ගතියට; මනුෂ්‍ය ලෝකය හා සදිව්‍යලෝක සංඛ්‍යාත සප්තවිධ කාමසුගති භවයෙහිද ෂොඩශවිධ රූපභවයෙහිද පිළිසිඳ ගැණීම් වශයෙන්) ගතා, පැමිණියාහුද; භවග්ගතම්පි, භවාග්‍රයටද; (සියළු කාම රූප අරූපභවයන්ගේ කෙළවරවූ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන අරූප භවයටද) සම්පත්තා, සම්ප්‍රාප්ත වූවාහුද; පුන, නැවත; දුග්ගතිං, දුගතියට; (දුක්ඛයාගේ පිහිටිමවූ සතර අපාය භූමියට අපරාපරිය වශයෙන් එත්, හෙවත් ඒ සතර අපායෙහි උපදිත්.

තාව, එතාක්; දීඝායුකා, දීර්ඝායුෂ ඇත්තාවූ; සත්තා, සත්වයෝ; ආයු, ආයුෂ්‍යාගේ; ඛයා, ක්ෂයවීමෙන්; චවන්ති, චුතවෙත්; (අසූසාරදහසක්පමණ කල්ප දීර්ඝායුෂඇත්තාහුද මැරෙත් යම් කලෙක්හි ඒ ප්‍රමාණ ආයුෂ ගෙවේද? එකල්හි එයින් චුතව කර්මයවූ පරිද්දෙන් උත්පත්ති වශයෙන් යෙත්) නිච්චො, නිත්‍යවූ; කොචිභවො, කිසි භවයෙක්; නත්ථි, නැත්තේය; (යම්තැනෙක්හි උපන්නාවූ සත්වයෝ අජරාමර වූවාහුද ස්ථිර වූවාහුද ශාස්වත වූවාහුද නොපෙරළෙන ස්වභාව ඇත්තාහුද නැත්තාහුය) ඉති, මෙසේ; මහෙසිනා, මහර්ෂිහු විසින්; වුත්තං, වදාරණලදි; (මහත්වූ ශීලාදි ස්කන්ධයන් තමන් වහන්සේටද අන්‍යයන්ටද සොයන්නාවූ මහත් කරුණාව ඇති භාග්‍යවතුන් වහන්සේ විසින් සංසාරදුඃඛ සම්බාධයට පැමිණියාවූ සත්වයන්දූක කළකිරීමට නොඇලීමට හේතුවූ සංසාරාදීනවය දක්වන්ට මෙය මෙසේ වදාරණලදී)

තස්මාහි, එහෙයින්ම; නිපකා, එළඹසිටි සිහිඇත්තාවූ; නිපුණා, සූක්ෂමාර්ථදැනීමෙහි සමර්ථවූ; අත්ථචින්තකා, අර්ථපරීක්ෂාකරන ශීලිවූ; (මේ ලොක පරලෝකාර්ථයන්ද ස්වකීයාර්ථ පරාර්ථයන්ද ලෞකික ලෝකෝත්තරාර්ථයන්ද සොයනසුලුවූ) ධීරා, ධෛර්‍ය්‍යසම්පන්න ප්‍රඥාවන්තයෝ; ජරාමරණ මොක්ඛාය, ජරාමරණින් මිදීම පිණිස; (නිර්වාණයට පැමිණීම පිණිස) උත්තමං, උතුම්වූ; මග්ගං, මාර්ගය; භාවෙන්ති, වඩත්; (පූර්වභාගයෙන් සප්තවිසුද්ධාතු ක්‍රමයෙන් පූර්වභාග මාර්ගයද විදර්ශනාවඩා ඥානදර්ශන විශුද්ධියවූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික

භාවයිත්වා සුචිං මග්ගං-නිබ්බාණොගධගාමිනං
සබ්බභවෙ පරිඤ්ඤාය-පරිනිබ්බන්ති අනාසවාති.

## ධම්මහදය විභඞ්ග සුත්තං.

———:o:———

“ඉදං සුත්තං ධම්මහදය විභඞ්ග”

---

මාර්ගය වඩත්. ඒ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය නම්:- සම්‍යග් දෘෂ්ටිය හෙවත් මනාකොට නුවණින් -දැක්මය, සම්‍යක් සංකල්පනාවය හෙවත් යහපත්කොට නුවණින් කල්පනාකිරීමය, සම්‍යග් වචනය හෙවත් මනාකොට වචන කීමය, සම්‍යක් කර්මාන්තය හෙවත් මනා කොට කායින් ක්‍රියාකිරීමය, සම්‍යක් ආජීවය හෙවත් ජීවිකාව යහපත්ව පැවැත්වීමය, සම්‍යක් ව්‍යායාමය හෙවත් මනාකොට උත්සාහ කිරීමය, සම්‍යක් සිහිය හෙවත් සිහිමුළා නොකොට මනා කොට සිහිකිරීමය, සම්‍යක් සමාධිය හෙවත් මනාකොට සිත එකඟ කිරීමය යන මේය.)

නිබ්බාණොගධගාමිනං, නිර්වාණයට ඇතුළත්ව පවත්නාවූ; සුචිං, පවිත්‍රවූ; මග්ගං, මාර්ගය; භාවයිත්වා, වඩා; සබ්බභවෙ, සියලු භවයන්; පරිඤ්ඤාය, පිරිසිඳ දැන;. අනාසවා, ආශ්‍රව රහිතවූවාහු; පරිනිබ්බන්ති, පිරිණිවියෙත්; (අජරාමර සංඛ්‍යාත උතුම් නිර්වාණයට ඇතුළත්ව පවත්නාවූ පිරිසිදු නිර්වාණමාර්ගය වඩා කාම භවය රූප භවය අරූප භවය සඤ්ඤ භවය අසඤ්ඤ භවය නෙවසඤ්ඤනාසඤ්ඤ භවය එකවොකාර භවය චතුවොකාර භවය පඤ්චවොකාර භවය යන සියලු නවමහා භවයන් ඥාතපරිඥාතීරණපරිඥාපහාණපරිඥා යන තුන් පරිඥාවන්ගෙන් පිරිසිඳ දැන රහත් මාර්ගයෙන් ප්‍රහීනවූ ආශ්‍රව ඇතිව කෙලශයන් නිවතලද හෙයින් නිර්වාණ යයි දත්තාලද අමෘත මහානිර්වාණපදයට පැමිණෙත් යයි වදාළසේක.—

ධම්මහදය විභඞ්ග සුත්තං, ධම්මහදය විභඞ්ග සූත්‍රයයි;

———:o:———

ඉදං සුත්තං, මේ සූත්‍රය;
ධම්මහදය විභඞ්ග, ධම්මහදය විභඞ්ගයෙහි ය.

———:o:———

යොවදතං පවරො මනුජෙසූති, ඡත්තමාණවකවිමානං, තස්ස කා උප්පත්ති? භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ, තෙන ඛො පන සමයෙන සෙතව්‍යං අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස කිච්ඡාලද්ධො පුත්තො ඡත්තො නාම බ්‍රාහ්මණ මාණවො අහොසි, සො වයප්පත්තො පිතරා පෙසිතො උක්කට්ඨං ගන්ත්වා බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිකස්ස සන්තිකෙ මෙධාවිතාය අනලසතාය ච නචිරෙනෙව මන්තෙ විජ්ජට්ඨානානි ච උග්ගහෙත්වා බ්‍රාහ්මණසිප්පෙ නිප්ඵත්තිං පත්තො ආචරියං අභිවාදෙත්වා ආහ, මයා තුම්හාකං සන්තිකෙ සිප්පං සික්ඛිතං, කිං වො ගුරුදක්ඛිණං දෙමීති, ආචරියො ගුරුදක්ඛිණං නාම අන්තෙවාසිකස්ස විභවානුරූපං, කහාපණසහස්සං ආනෙහීති ආහ.

---

යොවදතං පවරො මනුජෙසු ඉති, යොවදතං පවරො මනුජෙසු යනාදිය; ඡත්තමාණවකවිමානං, ඡත්තමාණවක විමාන යයි; තස්ස, ඒ විමානයාගේ; උප්පත්ති, උත්පත්තිතොමෝ; කා, කවරක්වන්නීද; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනාරාමයෙහි; විහරති, වැඩවාසය කෙරෙයි; තෙන සමයෙන ඛො පන, ඒ කාලයෙහි වනාහි; සෙතව්‍යං, සෙත ව්‍යගමෙහි; අඤ්ඤතරස්ස, එක්තරා; බ්‍රාහ්මණස්ස, බමුණෙකුට; කිච්ඡාලද්ධො, දුකින් ලබනලද්දාවූ; පුත්තො පුත්‍රවූ; ඡත්තො නාම, ඡත්ත නම්වූ; බ්‍රාහ්මණ මාණවො අහොසි, බ්‍රාහ්මණ මාණවකයෙක් වූයේය; සො, හෙතෙම; වයප්පත්තො, වයස්ප්‍රාප්තවූයේ; (වැඩිවය සටපැමිණියේ) පිතරා, පිය (බමුණා) විසින්; පෙසිතො, යවනලද්දේ; උක්කට්ඨං, උක්කට්ඨනම්ගමට; ගන්ත්වාන, ගොස්; බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිකස්ස, පොක්ඛරසාතික බ්‍රාහ්මණයාගේ; සන්තිකෙ, සමීපයෙහි; මෙධාවිතාය, ප්‍රඥාවඇතිබැවිනුද; අනලසතාය ච, අලසනොවන බැවින් ද; නචිරෙනෙව, නොබෝකලකින් ම; මන්තෙ, ත්‍රිවෙදග්‍රන්ථද; විජ්ජට්ඨානානි ච, (හස්තිශිල්පාදී) විද්‍යාස්ථානයන් ද; උග්ගහෙත්වා, ඉගෙණ; බ්‍රාහ්මණසිප්පෙ, බ්‍රාහ්මණ ශිල්පයෙහි; නිප්ඵත්තිං, නිෂ්ප්‍රාප්තියට; පත්තො, පැමිණියේ; ආචරියං, ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණයා; අභිවාදෙත්වා, මනාකොට වැඳ; ආහ, (මෙසේ) කීයේය; මයා, මා විසින්; තුම්හාකං, නුබවහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; සිප්පං, ශිල්පය; සික්ඛිතං, ඉගෙණගන්නා ලද්දේය; වො, නුබවහන්සේට; කිං ගුරුදක්ඛිණං, කවර ගුරුදක්ෂිණාවක්; ගුරුවරයාට පූජාවශයෙන් දියයුතු ධනයක්; දෙමි ඉති, දෙම්දැයි; (විචාළේය) ආචරියො, ආචාර්‍ය්‍යතෙම; ගුරුදක්ඛිණං නාම, ගුරු දක්ෂිණාව නම්; අන්තෙවාසිකස්ස, අතවැස්සාගේ; විභවානුරූපං, සම්පත්තියට සුදුසුවූ; කහාපණසහස්සං, කහවණු දහසක්; ආනෙහීති, ගෙණඑවයි; ආහ, කීයේය;

ජන්තමාණවො ආචරියං අභිවාදෙත්වා සෙතව්‍යං ආගන්ත්වා මාතාපිතරො වන්දිත්වා තෙහි අභිනන්දියමානො කතපටි සන්ථාරො තමත්ථං පිතු ආරොචෙත්වා "දෙථ මෙ දාතබ්බයුත්තකං අජ්ජෙව දත්වා ආගමිස්සාමී" ති ආහ, තං මාතා පිතරො තාත! අජ්ජ විකාලො සෙව ගමිස්සසීති වත්වා කහාපණාදීනි ආහරිත්වා භණ්ඩිකං බන්ධාපෙත්වා ඨපෙසුං චොරා තං පවත්තිං සුත්වා ජන්තමාණවකස්ස ගමනමග්ගෙ අඤ්ඤතරස්මිං වනගහනෙ නිලීනා අට්ඨංසු මාණවකං මාරෙත්වා කහාපණෙ ගණ්හිස්සාමාති.

භගවා පච්චූසසමයෙ මහාකරුණාසමාපත්තිතො වුට්ඨාය ලොකං ඔලොකෙන්තො ජන්තමාණවකස්ස සරණෙසු සීලෙසු පතිට්ඨානං චොරෙහි මාරිතස්ස දෙවලොකෙ නිබ්බත්තනං තතො

---

ජන්තමාණවො, ජන්තමාණවක තෙම; ආචරියං, ආචාර්‍ය්‍යයා; අභිවාදෙත්වා, මනාකොට වැඳ; සෙතව්‍යං, සෙතව්‍යගමට, ආගන්ත්වා අවුත්; මාතාපිතරො, මවුපියන්; වන්දිත්වා, වැඳ; තෙහි, ඒ මවුපියන් විසින්; අභිනන්දියමානො, මනාව සතුටුවනු ලබන්නේ; කතපටි සන්ථාරො, කරනලද පිළිසඳර කථා ඇත්තේ; තං අත්ථං, ඒ කාරණය; පිතු, පියාහට; ආරොචෙත්වා, කියා; මෙ, මට; දාතබ්බයුත්තකං දියයුතු සගරුවක්; දෙථ, දුනමැනව; අජ්ජෙව, අදම; දත්වා, දී; ආගමිස්සාමි ඉති, එන්නෙමියි; ආහ, කීයේය; මාතාපිතරො, මවුපියෝ; තං, ඔහුට; තාත, දරුව; අජ්ජ, අද; විකාලො, නොකල් වූයේය; සෙව, සෙට; ගමිස්සසි ඉති, යන්නෙහි යයි; වත්වා, කියා; කහාපණාදීනි, කහවණු ආදිය; ආහරිත්වා, ගෙණවුත්; භණ්ඩිකං, පොදියක්; බන්ධාපෙත්වා, බඳවා; ඨපෙසුං, තැබූහ; චොරා, සොරු; තං පවත්තිං, ඒ ප්‍රවෘත්තිය; සුත්වා, දැන; ජන්තමාණවකස්ස, ජන්ත මාණවකයාගේ; ගමනමග්ගෙ, යන මාර්‍ගයෙහි; අඤ්ඤතරස්මිං වන ගහනෙ, එක්තරා වන ලැහැබෙක්හි; නිලීනා, සැඟවුනාහු; මාණවකං, මාණවකයා; මාරෙත්වා, මරා; කහාපණෙ, කහවණු; ගණ්හිස්සාම ඉති, ගන්නෙමු යයි; අට්ඨංසු, සිටියාහුය;

භගවා, භාග්‍යවතුන් වහන්සේ; පච්චූස සමයෙ, ප්‍රත්‍යූෂ කාලයෙහි; මහාකරුණා සමාපත්තිතො, මහාකරුණා සමාපත්තියෙන්; වුට්ඨාය, නැගිට; ලොකං, ලොකය; ඔලොකෙන්තො, බලන්නේ; ජන්තමාණවකස්ස, ජන්ත මාණවකයාගේ; සරණෙසු, සරණයන්හි ද; සීලෙසු, (පඤ්ච) ශීලයන්හි ද; පතිට්ඨානං, පිහිටීම ද; චොරෙහි,

සහ විමානෙන ආගතස්ස තත්‍ර සන්නිපතිතපරිසාය ච ධම්මාභිසමයං දිස්වා පඨමතර මෙව ගන්ත්වා මාණවකස්ස ගමනමග්ගෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

මාණවො ආචරියදක්ඛිණං ගහෙත්වා සෙතව්‍යතො උක්කට්ඨාභිමුඛො ගච්ඡන්තො අන්තරාමග්ගෙ භගවන්තං නිසින්නං දිස්වා උපසඞ්කමිත්වා අට්ඨාසි, කුහිං ගමිස්සසීති ච භගවතා වුත්තො උක්කට්ඨං භො ගොතම! ගමිස්සාමි මය්හං ආචරියස්ස පොක්ඛරසාතිකස්ස ගුරුදක්ඛිණං දාතුන්ති ආහ, අථ භගවා ජානාසි පන ත්වං මාණව! තීණි සරණානි පඤ්චසීලානීති වත්වා තෙන නාහං ජානාමි කිමත්ථියානි පන තානි කිදිසානිවානි වුත්තෙන ඉද මීදිසනානි

---

සොරුන් විසින්; මාරිතස්ස, මරණලද්දහුගේ; දෙවලොකෙ, දිව්‍ය ලොකයෙහි; නිබ්බත්තන්තං, ඉපදීම ද; තතො, ඒ දෙව් ලොවින්; විමානෙන සහ, විමානය හා සමග; ආගතස්ස, ආවාහට ද; තත්‍ර, එහි; සන්නිපතිත, රැස්වූ; පරිසාය ච, පිරිසට ද; (වන) ධම්මාභිසමයං, ධර්මාභිසමය ද; දිස්වා, දැක; පඨමතරං එව, (මාණවකයාගේ ගමනට) පළමුකොට ම; ගන්ත්වා, වැඩ; මාණවකස්ස, මාණවකයාගේ; ගමනමග්ගෙ, යන මාර්ගයෙහි; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරු රුක්මූලෙක්හි; නිසීදි, වැඩඋන්සේක;

මාණවො, මාණවක තෙම; ආචරිය දක්ඛිණං, ආචාර්‍ය්‍ය දක්ෂිණාව; ගහෙත්වා, හැරගෙණ; සෙතව්‍යතො, සෙතව්‍ය ගමින්; උක්කට්ඨාභිමුඛො, උක්කට්ඨ නම් ගමට අභිමුඛව; ගච්ඡන්තො, යන්නේ; අන්තරාමග්ගෙ, මාර්ගය අතරෙහි; නිසින්නං, වැඩඋන්නාවූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; දිස්වා, දැක; උපසංකමිත්වා, සමීපයට එළඹ; අට්ඨාසි, සිටියේය; කුහිං, කොතැන්හි; ගමිස්සසි ඉතිච, යන්නෙහිදැයි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; වුත්තො, අසා වදාළ කල්හි; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; උක්කට්ඨං, උක්කට්ඨ නම් ගමට; ගමිස්සාමි, යන්නෙමි; මය්හං, මාගේ; ආචරියස්ස, ආචාර්‍ය්‍යවූ; පොක්ඛරසාතිකස්ස, පොක්ඛරසාතික බ්‍රාහ්මණයාහට; ගුරුදක්ඛිණං, ඇදුරු දැකුම; දාතුං ඉති, දෙන්ට යයි; ආහ, කියේය; අථ, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; මාණව, මාණවකය; ත්වං පන, තෝ වනාහි; තීනි සරණානි, සරණ තුණ ද; පඤ්චසීලානි, පන්සිල් ද; ජානාසි ඉති, දන්නෙහිදැයි; වත්වා, (අසා) වදරු; තෙන, ඔහු විසින්; අහං, මම;

සරණාගමන සීලසමාදානස්ස ච ඵලානිසංසෙ විභාවෙත්වා උග්ගණ්හාහි තාව මාණව! සරණාගමන විධින්ති වත්වා, සාධුකං උග්ගණ්හිස්සාමි කථෙථ භගවා! ති තෙන යාචිතො තස්ස රුචිඅනුරූපං ගාථාබන්ධනවසෙන සරණාගමන විධිං දස්සෙන්තො.

යො වදතං පවරො මනුජෙසු
සක්‍යමුනී භගවා කතකිච්චො
පාරගතො බලවීරියසමඞ්ගි
තං සුගතං සරණත්ථ මුපෙහි.

---

න ජානාමි, නොදනිමි; නානි පන, ඒ සරණශීලයෝ වනාහි; කිමත්ථියානි, කවරක් ප්‍රයොජනකොට ඇත්තාහු ද; කිදිසානිච ඉති, කෙබඳුදැයි; වුත්තෙන, කීකල්හි; ඉදං, මෙය; ඊදිසං ඉති, මෙබඳු යයි; සරණාගමන සීලසමාදාන්සස ච, සරණාගමනයාගේ හා ශීලසමාදානයාගේ ද; ඵලානිසංසෙ, ඵල හා ආනිශංසයන්; විභාවෙත්වා, ප්‍රකාශකොට; මාණව, මාණවකය; තාව, පළමුකොට; සරණාගමන විධිං, සරණාගමන විධිය; උග්ගණ්හාහි ඉති, ඉගෙණ ගණුවයි; වත්වා, වදාරා; භගවා, භාග්‍යවතුන් වහන්ස; සාධුකං, මනාකොට; උග්ගණ්හිස්සාමි, ඉගෙණගන්නෙමි; කථෙථ ඉති, වදාළමැනවැයි; තෙන, ඔහු විසින්; යාචිතො, යාඥකරනලද්දේ තස්ස, ඔහුගේ; රුචිඅනුරූපං, කැමැත්තට සුදුසු පරිද්දෙන්; ගාථාබන්ධනවසෙන, ගාථාබන්ධන වශයෙන්; සරණාගමන විධිං, සරණාගමන විධිය; දස්සෙන්තො, දක්වන්නේ;

මනුජෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; වදතං, කථාකරන්නවුන්ට; යො, යමෙක් තෙම; පවරො, උතුම්වූයේ ද; සක්‍යමුනි, (ශාක්‍යවංශයෙහි උපන් හෙයින් ද කායමොනෙය්‍යාදීන් යුක්තබැවින් ද) ශාක්‍යමුනිවූයේක් ද; භගවා, (භාග්‍යවන්තතාදි කාරණයන්ගෙන්) භගවත් නම් වූසේක් ද; කතකිච්චො, (චතුර්විධ මාර්ගයන්ගෙන් ද) කටයුතුවූ (පරිඥාදි භෙද ඇති සොළොස්විධ) කෘත්‍ය ඇතිසේක් ද; පාරගතො, (සංසාරයාගේ පරතෙරවූ) නිර්වාණයට පැමිණිසේක් ද; බලවීරිය සමංගී, (අසදෘශවූ කායබලයෙන්ද අනන්‍යසාධාරණවූ ඥානබලයෙන්ද චතුර්විධවූ සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන්ද යුක්ත හෙයින්) වීර්‍ය්‍යබලයෙන් යුක්තසේක් ද; තං සුගතං, (යහපත් ගමන් ඇති හෙයින් ද සුන්දරස්ථානයට ගියහෙයින් ද මනාකොට ගියහෙයින් ද) සුගත නම්වූ ඒ සර්වඥයන් වහන්සේ; සරණත්ථං, සරණ පිණිස; උපෙහි, පැමිණෙව,

රාග විරාග මනේජ මසොකං
ධම්ම මසඞ්ඛත මප්පටිකූලං
මධුර මිමං පගුණං සුවිභත්තං
ධම්ම මිමං සරණත්ථ මුපෙහි

යත්ථ ච දින්නමහප්ඵල මාහු
චතූසු සුචීසු පුරිසයුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ
සඞ්ඝ මිමං සරණත්ථ මුපෙහීති.

තිස්සො ගාථායො අභාසි. එවං භගවතා තීහි ගාථාහි සරණ ගුණ සන්දස්සනෙන සද්ධිං සරණාගමන විදිම්හි වුත්තො මාණවො.

---

රාගවිරාගං, රාගය නසන්නාවූ ආර්‍ය්‍යමාර්ගය ද; අනේජං, තෘෂ්ණා රහිතවූ; අසොකං, සොක නැත්තාවූ (හෙවත්) සොක නිමිත්ත ක්ලේශයන් සර්වප්‍රකාරයෙන් නැසුවාවූ ආර්‍ය්‍යඵලය ද; අසඞ්ඛතං, ප්‍රත්‍යයෙන් නොකරණලද්දාවූ නිර්වාණය ද; (යන) ධම්මං, මේ නව ලොකොත්තර ධර්මය ද; අප්පටිකූලං, (ශ්‍රවණය අර්ථපරීක්ෂාකිරීමය පිළිපැදීමය යන සියලුකල්හි) පිළිකුල්නොවූ; මධුරං, මිහිරිවූ; පගුණං, පුහුණු කරණ ලද්දාවූ; සුවිභත්තං, (විභාගකටයුතු අර්ථය ස්කන්ධාදි වශයෙන් ද කුශලාදි වශයෙන් ද උද්දේශාදි වශයෙන් ද) මනාකොට බෙදනලද්දාවූ; ඉමං, මේ පර්‍ය්‍යාප්ති ධර්මය ද; (යන) ඉමං ධම්මං, මේ චතුර්විධ ධර්මය; (නොහොත්) දසවැදෑරුම් ධර්මය; සරණත්ථං, සරණ පිණිස; උපෙහි, පැමිණෙව;

සුචීසු, පවිත්‍රවූ; චතූසුපුරිසයුගෙසු, (සොවාන් මාර්ගඵලාදි වශයෙන්) පුරුෂ යුගල සතරක්වූ; යත්ථච, යම් ආර්‍ය්‍ය සඞ්ඝරත්නයක් කෙරෙහි; දින්නං, පරිත්‍යාග කරන ලද්දාවූ අන්නපානාදි දානය; මහප්ඵලං, මහත් ඵල යයි; ආහු, කියද්ද; ධම්මදසා, (ප්‍රත්‍යක්ෂ වශයෙන් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්ම දක්නාවූ; තෙ පුග්ගලා, ඒ ආර්‍ය්‍ය පුද්ගලයෝ; අට්ඨච, අටදෙනෙක්ම වෙත්; ඉමං සංඝං, මේ (ආර්‍ය්‍ය) සංඝයා සරණත්ථං, සරණ පිණිස; උපෙහි ඉති, පැමිණෙවයි;

තිස්සො ගාථායො, තුන් ගාථාවන්; අභාසි, වදාළසේක; එවං, මෙසේ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; තීහි ගාථාහි, ගාථාතුනකින්; සරණගුණසන්දස්සනෙන සද්ධිං, සරණගුණ දැක්වීම

තං සරණාගමනානුස්සරණමුඛෙන සරණාගමනවිධිනො අත්තනො හදයෙ ඨපිතභාවං විභාවෙන්තො තස්සා තස්සා ගාථාය අනන්තරං "යොවදතං පවරො"ති ආදිනා තං තං ගාථං පච්චනුභාසි, එවං පච්චනුභාසිත්වා ඨිතස්ස පඤ්ච සික්ඛාපදානි සරූපතො ඵලානිසංසතො ච විභාවෙත්වා තෙසං සමාදානවිධිං කථෙසි, සො තම්පි සුට්ඨු උපධාරෙත්වා පසන්නමානසො හන්දාහං භන්තෙ භගවා! ගමිස්සාමීති වත්වා රතනත්තයගුණංයෙව අනුස්සරන්තො තං යෙව මග්ගං පටිපජ්ජි, භගවාපි අලං ඉමස්ස එත්තකං දෙවලොකූපපත්තියාති ජෙතවනමෙව අගමාසි.

---

භා සමග; සරණාගමනවිධිම්හි, සරණාගමන විධිය; වුත්තෙන, වදාළ කල්හි; මාණවො, මාණවක තෙම; තං සරණාගමනානුස්සරණමුඛෙන, ඒ සරණාගමනය සිහිකිරීම් මුඛයෙන්; සරණාගමන විධිනො, සරණාගමන විධිය; අත්තනො, තමාගේ; හදයෙ, හෘදයෙහි; ඨපිතභාවං, තබනලදබව; විභාවෙන්තො, ප්‍රකාශකරන්නේ; තස්සා තස්සා ගාථාය, ඒ ඒ ගාථාවට; අනන්තරං, අනතුරුව; යො වදතං පවරො ඉති, යොවදතංපවරො යන; ආදිනා, (මේ) ආදි වශයෙන්; තං තං ගාථං, ඒ ඒ ගාථාව; පච්චනුභාසි, නැවත නැවත කියේය; එවං, මෙසේ; පච්චනුභාසිත්වා, නැවත නැවත කියා; ඨිතස්ස, සිටියාවූ මාණවකයාහට; පඤ්චසික්ඛාපදානි, ශික්ෂාපද පස; සරූපතො, ස්වරූප වශයෙන් ද; ඵලානිසංසතො ච, ඵල හා ආනිසංස වශයෙන් ද; විභාවෙත්වා, ප්‍රකාශකොට; තෙසං, ඒ ශික්ෂාපදයන්ගේ; සමාදානවිධිං, සමාදන්වන විධිය; කථෙසි, දෙශනාකළසේක; සො, හෙතෙම; තං අපි, ඒ ශීලයද; සුට්ඨු, මනාකොට; උපධාරෙත්වා, වැටහෙන ආකාරයෙන් දරා; පසන්නමානසො, ප්‍රසන්න සිත්ඇත්තේ; භන්තෙ භගවා, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස!; හන්ද, එබැවින්; අහං, මම; ගමිස්සාමිඉති, යන්නෙමියි; වත්වා, කියා; රතනත්තයගුණං එව, රත්නත්‍රයෙහි ගුණයම; අනුස්සරන්තො, අනුව සිහි කරන්නේ; තං මග්ගංයෙව, ඒ මාර්ගයටම; පටිපජ්ජි, පිළිපන්නේය හෙවත් පැමිණියේය; භගවා අපි, භාග්‍යවතුන් වහන්සේ ද; ඉමස්ස, මොහට; දෙවලොකූපපත්තියා, දිව්‍යලොකොත්පත්තිය පිණිස; එත්තකං, මෙපමණෙක්; අලං ඉති, පමණ යයි; ජෙතවනං එව, ජෙතවනාරාමයටම; අගමාසි, වැඩිසේක.

මාණවස්ස පසන්නචිත්තස්ස රතනත්තයගුණ සල්ලක්ඛණ වසෙන සරණං උපෙමීති පවත්තචිත්තුප්පාදත්තා සරණෙසු භගවතා වුත්තනයෙන පඤ්චන්නං සීලානං අධිට්ඨානෙන සීලෙසු ච පතිට්ඨිතස්ස තෙනෙව නයෙන රතනත්තයගුණෙ අනුස්සරන්තස්සෙව ගච්ඡන්තස්ස චොරා මග්ගෙ සුපරිගුට්ඨිංසු සො තෙ අගණෙත්වා රතනත්තයගුණෙ අනුස්සරන්තොයෙව ගච්ඡති, තඤ්ච ඛො චොරෙ ගුම්බන්තරං නිස්සාය නිසීදාපිතෙන සහායකෙන සහසා විජ්ඣිත්වා ජීවිතක්ඛයං පාපෙත්වා කහාපණභණ්ඩිකං ගහෙත්වා අත්තනො සහායෙහි සද්ධිං පක්කමි.

---

මාණවස්ස, මාණවකයා; පසන්නචිත්තස්ස, ප්‍රසන්න සිත්ඇතිව; රතනත්තයගුණ සල්ලක්ඛණවසෙන, රත්නත්‍රයෙහි ගුණ සැලකීම් වශයෙන්; සරණංඋපෙමි ඉති, සරණයට පැමිණියෙමියි; පවත්තචිත්තුප්පාදත්තා, පවත්වනලද චිත්තොත්පාද ඇති බැවින්; සරණෙසු, සරණයන්හිද; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; වුත්තනයෙන, කියනලද ක්‍රමයෙන්; පඤ්චන්නං සීලානං, පඤ්චශීලයන්ගේ; අධිට්ඨානෙන, ඉටීමෙන්; සීලෙසු ච, ශීලයන්හි ද; පතිට්ඨිතස්ස, පිහිටා; තෙනෙව නයෙන, ඒ ක්‍රමයෙන්ම; රතනත්තයගුණෙ, රත්නත්‍රයෙහි ගුණයන්; අනුස්සරන්තස්ස එව, සිහිකරමින්ම; ගච්ඡන්තස්ස, යමින් සිටියදී; මග්ගෙ, මාර්ගයෙහි; චොරා, සොරු; සුපරිගුට්ඨිංසු, හාත්පසින් වටකොට සිටියාහුය; සො, ඒ මාණවක තෙම; තෙ, ඒ සොරුන්; අගණෙත්වා, නොසලකා; රතනත්තය ගුණෙ, රත්නත්‍රයෙහි ගුණ; අනුස්සරන්තොයෙව, සිහිකරමින් ම; ගච්ඡති, යෙයි; තඤ්ච, ඔහුද; එකො චොරො, එක් සොරෙක් තෙම; ගුම්බන්තරංනිස්සාය, පඳුරු අතරක් නිසා; නිසීදාපිතෙන, හිඳුවන ලද්දාවූ; සහායකෙන, යහලුවෙකු කරණකොට ගෙණ; සහසා, වහා; විජ්ඣිත්වා, විද; ජීවිතක්ඛයං, ජීවිතක්ෂයට; පාපෙත්වා, පමුණුවා; කහාපණ භණ්ඩිකං, කහවණු පොදිය; ගහෙත්වා, හැරගෙණ; අත්තනො, තමාගේ; සහායෙහි සද්ධිං, යහළුවන් හා සමග; පක්කමි, ගියේය.

මාණවො පන කාලං කත්වා තාවතිංස භවනෙ තිංස යොජනිකෙ කනකවිමානෙ සුත්තප්පබුද්ධො විය අච්ඡරාසහස්සපරිවුතො සට්ඨිසකට භාරාලඞ්කාරපති මණ්ඩිතත්තභාවො නිබ්බත්ති, තස්ස විමානස්ස ආභා සාතිරෙකානි වීසතියොජනානි ඵරිත්වා තිට්ඨති, අථ මාණවකං කාලකතං දිස්වා සෙතව්‍යගාමවාසිනො මනුස්සා සෙතව්‍යං ගන්ත්වා තස්ස මාතාපිතූනං කථෙසුං, උක්කට්ඨගාමවාසිනො ච උක්කට්ඨං ගන්ත්වා බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිකස්ස කථෙසුං. තං සුත්වා තස්ස මාතාපිතරො ඤාතිමිත්තා ච බ්‍රාහ්මණො ච පොක්ඛරසාතිකො සපරිවාරො අස්සුමුඛා රොදමානා තං පදෙසං අගමංසු යෙ භුය්‍යෙන ච සෙතව්‍ය වාසිනො උක්කට්ඨවාසිනො ච ඉච්ඡානඞ්ගල වාසිනො ච සන්නිපතිංසු මහාසමාගමො අහොසි. අථ මාණවකස්ස මාතාපිතරො මග්ගස්ස අවිදූරෙ චිතකං සජ්ජෙත්වා සරීරසක්කාරඤ්ච කාතුං ආරභිංසු.

---

මාණවො පන, මාණවක තෙම වනාහි; කාලං කත්වා, කළුරිය කොට; තාවතිංස භවනෙ, තව්තිසා භවනයෙහි; තිංස යොජනිකෙ, තිස්යොදුන් ඇති; කනකවිමානෙ, රනවිමනෙක්හි; සුත්තප්පබුද්ධො විය, නිදා පිබිදියාක්මෙන්; අච්ඡරාසහස්ස පරිවුතො, දෙවඟණන් දහසක් විසින් පිරිවරනලද්දේ; සට්ඨිසකට භාරාලඞ්කාරපතිමණ්ඩිතත්තභාවො, සැටගැලෙක (අබරණ) බරඅලංකාරයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ආත්මභාවය ඇතිව; නිබ්බත්ති, උපන්නේය; තස්ස, ඔහුගේ; විමානස්ස, විමානයාගේ; ආභා, රශ්මි තොමෝ; සාතිරෙකානි, අතිරෙක සහිතවූ; වීසතියොජනානි, විසියොදුන්; ඵරිත්වා, පැතිරී; තිට්ඨති, සිටියි; අථ, ඉක්බිත්තෙන්; කාලකතං, කාලක්‍රියාකළාවූ; මාණවකං, මාණවකයා; දිස්වා, දැක; සෙතව්‍යගාමවාසිනො, සෙතව්‍යග්‍රාමවාසීවූ; මනුස්සා, මනුෂ්‍යයෝ; සෙතව්‍යං, සෙතව්‍ය ගමට; ගන්ත්වා, ගොස්; තස්ස, ඔහුගේ; මාතාපිතූනං, මවුපියන්ට; කථෙසුං, කීවාහුය; උක්කට්ඨගාමවාසිනො ච, උක්කට්ඨග්‍රාම වාසීහු ද; උක්කට්ඨං, උක්කට්ඨගමට; ගන්ත්වා, ගොස්; බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිකස්ස, පොක්ඛරසාතික බ්‍රාහ්මණයාහට; කථෙසුං, කීවාහුය; තං සුත්වා, එය අසා; තස්ස, ඔහුගේ; මාතාපිතරො, මවුපියෝ ද; ඤාතිමිත්තා ච, ඤාතිමිත්‍රයෝ ද; සපරිවාරො, පිරිවර සහිතවූ; බ්‍රාහ්මණො ච පොක්ඛරසාතිකො, පොක්ඛරසාතික බ්‍රාහ්මණ තෙමේ ද; අස්සුමුඛා, කඳුළු මුහුණු ඇත්තාහු; රොදමානා, අඬන්නාහු

අථ භගවා චින්තෙසි මයි ගතෙ ඡත්තමාණවො මං වන්දිතුං ආගමිස්සති ආගතස්ස ච තං කතකම්මං කථාපෙන්තො කම්මඵලං පච්චක්ඛං කාරාපෙත්වා ධම්මං දෙසිස්සාමි, එවං මහාජනස්ස ධම්මාභිසමයො භවිස්සතීති චින්තෙත්වා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං තං පදෙසං ගන්ත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි ඡබ්බණ්ණබුද්ධරංසියො විස්සජ්ජෙන්තො.

ඡත්තමාණව දෙවපුත්තොපි අත්තනො සම්පත්තිං පච්චවෙක්ඛිත්වා තස්ස ච කාරණං උපධාරෙන්තො සරණාගමනං සීල

---

තං පදෙසං, ඒ ප්‍රදෙශයට; අගමංසු, ගියාහුය; යෙ භූයෙන ච, බොහෝ සෙයින් ම; සෙතව්‍ය වාසිනො ච, සෙතව්‍ය ගම වාසීහු ද; උක්කට්ඨවාසිනො ච, උක්කට්ඨගම වාසීහු ද; ඉච්ඡානඞ්ගල වාසිනො ච, ඉච්ඡානඞ්ගලගම වාසීහු ද; සන්නිපතිංසු, රැස්වූවාහුය; මහාසමාගමො අහොසි, මහාසමාගමෙක් වූයේය; අථ, ඉක්බිත්තෙන්; මාණවකස්ස, මාණවකයාගේ; මාතාපිතරො, මවුපියෝ; මගස්ස, මාගීයාගේ; අවිදූරෙ, නුදුරු තන්හි; චිතකං, දරසෑයක්; සජ්ජෙත්වා, සදමින්; සරීරසක්කාරඤ්ච, ශරීරසත්කාරය ද; කාතුං, කරන්ට; ආරභිංසු, පටන්ගත්තාහුය.

අථ, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; චින්තෙසි, (මෙසේ) සිතූසේක; මයි, මා; ගතෙ, ගියකල්හි; ඡත්තමාණවො, ඡත්තමාණවක (දිව්‍යපුත්‍ර) තෙම; මං, මා; වන්දිතුං, වඳින්ට; ආගමිස්සති, එන්නේය; ආගතස්ස ච, ආවාවූ ද; තං, ඔහුලවා; කතකම්මං, කරනලද (කුශල) කර්මය; කථාපෙන්තො, කියවමින්; කම්මඵලං, කර්ම ඵලය; පච්චක්ඛං කාරාපෙත්වා, ප්‍රත්‍යක්ෂ කරවා; ධම්මං දෙසිස්සාමි, ධර්මය දෙශනා කරන්නෙමි; එවං, මෙසේ; මහාජනස්ස, මහාජනයාහට; ධම්මාභිසමයො භවිස්සති ඉති, ධර්මාවබොධය වන්නේ යයි; චින්තෙත්වා, සිතා; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහත්වූ භික්ෂුසඞ්ඝයා සමග; තං පදෙසං, ඒ ප්‍රදෙශයට; ගන්ත්වා, වැඩ; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා රුක්මුලෙක්හි; ඡබ්බණ්ණබුද්ධරංසියො විස්සජ්ජෙන්තො, සවණක් (සය) බුදුරැස් විහිදුවමින්; නිසීදි, වැඩඋන්සේක.

ඡත්තමාණව දෙවපුත්තොඅපි, ඡත්තමාණවක දිව්‍යපුත්‍ර තෙමේ ද; අත්තනො, තමාගේ; සම්පත්තිං, සම්පත්තිය; පච්චවෙක්ඛිත්වා,

සමාදානඤ්ච දිස්වා විම්හයජාතො භගවති සඤ්ජාතප්පසාද බහුමානො ඉදානෙවාහං ගන්ත්වා භගවන්තඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච වන්දිත්වා රතනත්තයගුණෙ මහාජනස්ස පාකටෙ කරිස්සාමීති කතඤ්ඤුතං නිස්සාය සකලං තං අරඤ්ඤප්පදෙසං එකාලොකං කරොන්තො සහ විමානෙන ආගන්ත්වා විමානතො ඔරුය්හ මහාපරිවාරෙන සද්ධිං දිස්සමානරූපො උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතන්තො අභිවාදෙත්වා අඤ්ජලිම්පග්ගය්හ එකමන්තං අට්ඨාසි, තං දිස්වා මහාජනො කොනුඛො අයං දෙවො වා බ්‍රහ්මා වාති අච්ඡ

---

ප්‍රත්‍යවෙක්‍ෂාකොට; තඤ්ච කාරණං, ඒ කාරණය ද; උපධාරෙන්තො, සිතින්සලකන්නේ; සරණගමනං, සරණාගමනයද; සීල සමාදානඤ්ච, ශීලසමාදානකොටගැනීමද; දිස්වා, දැක; විම්හයජාතො, විස්මවූයේ; භගවති, භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි; සඤ්ජාතප්පසාදබහුමානො, හටගත්තාවූ ප්‍රසාදබහුමන් ඇත්තේ; ඉදානිඑව, දැන්ම; අහං, මම; ගන්ත්වා, ගොස්; භගවන්තඤ්ච, භාග්‍යවතුන්වහන්සේද; භික්ඛුසංඝඤ්ච, භික්‍ෂුසංඝයාද; වන්දිත්වා, වැඳ; රතනත්තයගුණෙ, රත්නත්‍රයෙහිගුණ; මහාජනස්ස, මහාජනයාහට; පාකටෙකරිස්සාමිඉති, ප්‍රකටකරන්නෙමියි; කතඤ්ඤුතං නිස්සාය, කෘතඥභාවය නිසා; සකලං, සියලු; තං අරඤ්ඤප්පදෙසං, ඒ අරණ්‍ය ප්‍රදෙශය; එකාලොකං කරොන්තො, එකාලොකකරන්නේ; විමානෙන සහ, විමානය හා සමග; ආගන්ත්වා, අවුත්; විමානතො, විමනින්; ඔරුය්හ, බැස; මහාපරිවාරෙනසද්ධිං, මහත් පිරිවරහා සමග; දිස්සමානරූපො, දෘශ්‍යමාන රූප ඇත්තේ; උපසංකමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; පාදෙසු, සිරිපතුල්හි; (ශ්‍රීපාදමූලයෙහි) සිරසා, මස්තකයෙන්; නිපතන්තො, හෙන්නේ; අභිවාදෙත්වා, මනාකොට වැඳ; අඤ්ජලිංපග්ගය්හ, ඇඳිලිබැඳ; (දෙඅත්මුදුනත තබාවැදගෙන) එකමන්තං, එකත්පසෙක; අට්ඨාසි, සිටියේය; තං, ඔහු; දිස්වා, දැක; මහාජනො, මහාජනතෙම; (මහත්සේනාව) අයං, මේතෙම; දෙවො වා, දෙවිවූ හෝ; බ්‍රහ්මා වා, බ්‍රහ්මවූ හෝ; කොනුඛො ඉති, කවරෙක්දෝහෝයි; අච්ඡරියජාතො, විස්මවූයේ; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ

පියජාතො උපසඞ්කමිත්වා භගවන්තං පරිවාරෙසි භගවා තෙන කත පුඤ්ඤකම්මං පාකටං කාතුං

න තථා තපති නභසමිං සුරියො
චන්දො න භාසති න ඵුස්සො
යථාතුලමිදං මහප්පභාසං
කොනු ත්වං තිදිවා මහිං මුපගො.

ඡින්දති ච රංසී පභඞ්කරස්ස
සාධිකා වීසතියොජනානි ආභා
රත්තිමපි යථා දිවං කරෙති
පරිසුද්ධං විමලං සුභං විමානං.

---

පරිවාරෙසි, පිරිවැරූයේය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; තෙන, ඔහු විසින්; කතපුඤ්ඤකම්මං, කරනලද පුණ්‍යකර්මය; පාකටං කාතුං, ප්‍රකටකරන්ට; (ප්‍රසිද්ධකරන්ට මේ ගාථාවලින් අසාවදාළේක.

අතුලං, අසදෘශවූ; ( උපමාරහිතවූ අප්‍රමාණවූ හෝ ) මහප්පභාසං, මහත් ප්‍රභාඇත්තාවූ; ඉදං, මේ; (තාගේ විමානය) යථා, යම්සේද; තථා, එසේ; නභසමිං, අහසෙහි; සුරියො, සූර්‍ය්‍යතෙම; න තපති, දීප්තිමත් නොවේ; චන්දො, චන්ද්‍රතෙම; නභාසති, නොබබලයි; ඵුස්සො, ඵුස්ස නම් තාරකාව; න, නොබබලයි; තිදිවා, දිව්‍ය ලොකයෙන්; මහිඋපගො, ප්‍රථිවියටපැමිණියේ; ත්වං, තෝ; කොනු, කවරෙක්ද?;

පරිසුද්ධං, පිරිසිදුවූ; (ඇතුලතද පිටතද ශුද්ධහෙයින් පරිසුද්ධවූ;) විමලං, නිර්මලවූ; (සර්වප්‍රකාරයෙන් මලරහිතහෙයින් විමලවූ; සුභං, ශොභනවූ, (සෞන්දර්‍ය්‍යබැවින් ශුභවූ) විමානං, මේ විමානයතෙම; පභංකරස්ස, සූර්‍ය්‍යයාගේ; රංසීච, රශ්මින් ද; ඡින්දති, සිඳී; සාධිකා, අධිකසහිතවූ; වීසතියොජනානි, විසියොදුන්; (හාත්පසින් විසිපස් යොදුන් පමණ තැන්හි) ආභා, රශ්මිතොමෝ; දිවංයථා, දහවල් මෙන්; රත්තිමපි, රාත්‍රියද; කරෙති, (එසේ) කරන්නීය-

බහු පදුම විචිත්ත පුණ්ඩරීකං
වොකිණ්ණං කුසුමෙහි නෙකචිත්තං
අරජ විරජහෙමජාලච්ඡන්නං
ආකාසෙ තපති යථා සුරියො.

රත්තම්බරං පීතනිවාසසාහි
අගරුපියඞ්ගු චන්දනුස්සදාහි
කඤ්චන තනු සන්නිභත්තචාහි
පරිපූරං ගගනං ච තාරකාහි.

නරනාරියො බහුකෙත්ථ නෙකවණ්ණා
කුසුම විභූසිතාභරණෙත්ථ සුමනා
අනිලපමුඤ්චිතා පභවන්ති සුරභි
තපනියවිතතා සුවණ්ණච්ඡදනා.

---

බහුපදුමවිචිත්තපුණ්ඩරීකං, බොහෝවූ රක්තපද්ම හා විසිතුරු වර්ණ ඇති සෙවතපද්ම ඇත්තාවූ; කුසුමෙහි, (අන්‍යවූද නානා ප්‍රකාර) පුෂ්පයන්ගෙන්; වොකිණ්ණං, ගැවසීගත්තාවූ; නෙක චිත්තං, (මාලාකර්මලතාකර්මාදී) නොයෙක්විසිතුරුවූ; අරජ, රජස් රහිතවූ; විරජහෙමජාලච්ඡන්නං, නිර්දෝෂවූ රන්දැලින් වැසුනාවූ; (විමානය) ආකාසෙ, අහසෙහි; සුරියො යථා, සූර්‍ය්‍යමෙන්; (එසේ) තපති, බබලයි;

රත්තම්බර පීතනිවාසසාහි, රත්වත්වස්ත්‍රහඳිනපොරවන්නි යන්ගෙන්ද; (එක්දිව්‍යස්ත්‍රියක් රත්වන්දිව්‍යවස්ත්‍රයක්හැඳ රත්වත් දිව්‍යවස්ත්‍රයක් එකාංශකොට පොරවයි; අනික්දිව්‍යස්ත්‍රියක් රත් වන්දිව්‍යවස්ත්‍රයක් හැඳ රත්වත් දිව්‍යවස්ත්‍රයක් එකාංශකොට පොරවයි ඒ සඳහා "රත්තම්බරං" යන ආදිය කීය) අගරුපියඞ්ගු චන්දනුස්සදාහි, අගිල් පුවඟු සඳුන් යන ආදියෙන් උත්සන්නවූවන් ගෙන්ද; (අගිල්සුගන්ධයන්ගෙන්ද පුවඟු මාලාවන්ගෙන්ද සඳුන් සුගන්ධයන්ගෙන්ද උත්සන්න දිව්‍ය අගිල් සුගන්ධාදිය ඇති දිව්‍යස්ත්‍රී පුරුෂයන්ගෙන්ද) කඤ්චන තනුසන්නිභත්තචාහි, ස්වර්ණයවබඳු සියුම්ත්වි ඇත්තාවූන්ගෙන්ද තාරකාහි, තාරකාවන්ගෙන්; ගගණං ඉව, අහසමෙන්; පරිපූරං, සම්පූර්ණය;

එත්ථ, මේ විමානයෙහි; නෙකවණ්ණා, නොයෙක් ස්වරූප ඇත් තාවූ; නරනාරියො, දිව්‍ය පුරුෂ ස්ත්‍රීහු; බහුකා, බොහෝවූය; එත්ථ,

කිස්ස සංදමස්ස අයං විපාකො
කෙනාසි කම්මඵලෙනුපපන්නො
යථාව තෙ අධිගත මිදං විමානං
තදනුරූපං අවචාසි ඉඞ්ඝ පුට්ඨොති.

තං දෙවපුත්තං පරිපුච්ඡි-තතො දෙවපුත්තො ඉමාහි ගාථාහි බ්‍යාකාසි.

යමිධ පථෙ සමෙච්චමාණවෙන
සත්ථා නුසාසි අනුකම්පමානො
තව රතනවරස්ස ධම්මං සුත්වා
කරිස්සාමීති ච බ්‍රවිත්ථ ජන්තො.

---

මේ; විමානයෙහි; කුසුමවිභූසිතාභරණා, පුෂ්පයන්ගෙන් අලංකාර කරනලද ආභරණඇත්තාහු; සුමනා, සතුටුසිත්ඇත්තාහුවූහ; අනිලපමුඤ්චිතා, වාතයෙන් මිදුනාවූ; සුරභි, (පුෂ්පයන්ගේ) සුගන්ධයෝ පහවනතී, වහනයවෙත්; තපනීයවිතානා, ස්වර්ණයෙන් විසිතුරුවූ; සුවණ්ණච්ඡදනා, ස්වර්ණ(ආභරණ)යෙන් වැසුනාවූහ;

අයං, මේ; විපාකො, (තාගේ) විපාකයතෙම; කිස්ස, කොබඳුවූ; සම්දමිස්ස, කායසංයමයක්හුගේ හා ඉන්ද්‍රියදමනයක්හුගේද?; කෙනකම්මඵලෙන, කවරකර්මවිපාකයකින්; ඉධ, මෙහි; උපපන්නාඅසි, උපන්නෙහිද; තෙ, තා විසින්; ඉදං විමානං, මේ විමානයතෙම; යථාව අධිගතං, යම්සේපැමිණෙන ලද්දේද; (එසේ) පුට්ඨො, විචාරණලද්දාවූ තෝ; තදනුරූපං, එයවසුදුසුකොට; ඉංඝ, වහා අවචාසිඉති, කියවයි;

තං දෙවපුත්තං, ඒ දිව්‍යපුත්‍රයා; පරිපුච්ඡි, විචාළේය; තතො, එහෙයින්; දෙවපුත්තො, දිව්‍යපුත්‍රතෙම; ඉමාහි ගාථාහි, මේ ගාථාවලින්; බ්‍යාකාසි, ප්‍රකාශකෙළේය;

ඉධපථෙ, මේ (මහා) මාර්ගයෙහි; මාණවෙන, (බ්‍රාහ්මණ) කුමාරයෙක් හා, සමෙච්ච, එක්ව; සත්ථා, ශාස්තෲන්වහන්සේ; යං, යම් මාණවකයකුට; අනුකම්පමානො, අනුග්‍රහ කරන්නේ; අනුසාසි, (ධර්මයවූපරිද්දෙන්) අනුශාසනාකළසේක්ද? රතනවරස්ස, අග්‍රරත්නවූ; තව, නුඹවහන්සේගේ; ධම්මං, (සරණාගමන ශික්ෂාපද

ජිනවරං පවරං උපෙහි සරණං
ධම්මඤ්චාපි තථෙව භික්ඛුසඞ්ඝං
හොති පඨමං අච්චාහං භණෙත
පච්ඡා තෙ වචනං තථෙව කාසිං,

මා ච පාණවධං විවිධං චරස්සු අසුචිං
නහි පාණෙසු අසඤ්ඤතං අවණ්ණයිංසු (සප්පඤ්ඤා)
හොති පඨමං අච්චාහං භණෙත
පච්ඡා තෙ වචනං තථෙව කාසිං,

---

සීලදීපක) ධම්මය; සුත්වා, අසා; ජනෙතා, ජන්තු; (නම්වූමාණවක) තෙම; කරිස්සාමි ඉති, කරන්නෙමියි; (අනුශාසනාවූ පරිද්දෙන් පිළිපදින්නෙමියි) බෑවිත්, කියේය;

(මෙසේ මිවාළ පරිද්දෙන් කමීය කාරණවශයෙන් දක්වා දැන් එය සවරූප වශයෙන්ද විභාගවශයෙන්ද දක්වන්නේ ශාස්තෘන් වහන්සේ විසින් සමාදන්කරවනලද බවද තමාද පසුව එහි පිහිටි බවද දක්වන්ට ජිනවරං යන ආදිය කිය.)

පවරං, උතුම්වූ; ජිනවරං, සර්වඥශ්‍රෙෂ්ඨයාද; ධම්මඤ්ච අපි, ධර්මයද; තථාඑව, එසේම; භික්ඛු සංඝං, භික්ෂුසංඝයාද; සරණං, සරණකොට; උපෙහි, යවයි; භණෙත, ස්වාමීන්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; හොති ඉති, හොදනිමියි; අචචං, කියෙමි; පච්ඡා, පසුව; තෙ, නුඹවහන්සේගේ; වචනං, වචනය; තථාඑව, එසේම; අකාසිං, කෙළෙමි.

විවිධං, අනෙකප්‍රකාරවූ; (අල්පසාවද්‍යමහාසාවද්‍යවූ) අසුචිං, අපවිත්‍රවූ; (කෙලශමිශ්‍ර හෙයින් සුචිනොවූ) පාණවධඤ්ච, ප්‍රාණවධයද; මා චරස්සු, නොකරව, සප්පඤ්ඤා, සප්‍රාඥයෝ; (පණ්ඩිත යෝ) පාණෙසු, ප්‍රාණීන්අතුරෙහි; අසඤ්ඤතඤ්ච, සංයමනැති බවටද; හෙවත් පාණෙසු අසඤ්ඤතං, ප්‍රාණඝාතයෙන් නොවැළකීම; නහි අවණ්ණයිංසු,* වර්ණනානොකෙරෙත්; (යයි) භණෙත, ස්වාමීන්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; හොති ඉති, හොද නිමියි; අචචං, කීයෙමි; පච්ඡා, පසුව; තෙ, නුඹවහන්සේගේ; වචනං, වචනය; තථා එව, එසේම; අකාසිං, කෙළෙමි;

---

* අවණ්ණයිංසු යනු ප්‍රත්‍යුත්පන්නාර්ථයෙහි අතීත වචනයයි;

මා ච පරජනස්ස රක්ඛිතං
ආදාතබ්බං අමඤ්ඤිත්ථො අදින්නං
නොති පඨමං අවචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙව කාසිං

මා ච පරජනස්ස රක්ඛිතායො
පරදාරියො අගමා අනරිය මෙතං
නොති පඨමං අවචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙව කාසිං

මා ච විතථං අඤ්ඤදතා අභාසි
නහි මුසාවාදං අවණ්ණයිංසු සප්පඤ්ඤා
නොති පඨමං අවචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙව කාසිං.

---

පරජනස්ස, අන්‍යජනයා විසින්; රක්ඛිතං, රක්‍ෂාකරන ලද් දවූ; අදින්නංච, නොදෙන ලද්දෙයද; ආදාතබ්බං, ගතයුතුයයි; මා අමඤ්ඤිත්ථො, නොසිතව (යි;) භන්තෙ, ස්වාමින්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; නොඉති, නොදනිමියි; අවචං, කීයෙමි; පච්ඡා, පසුව; තෙ, තුඹවහන්සේගේ; වචනං, කීම; තථාඑම, එසේම; අකාසිං, කෙළෙමි;

පරජනස්ස, අන්‍යජනයා විසින්, රක්ඛිතායො, රක්‍ෂාකරන ලද්දවූ; පරදාරියොච, පරස්ත්‍රීන්කරාද; මා අගමා, නොයව; එතං, මෙය; අනරියං, ලාමකයයි; භන්තෙ, ස්වාමින්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; නොඉති, නොදනිමියි; අවචං, කීයෙමි; පච්ඡා, පසුව; තෙ, තුඹවහන්සේගේ; වචනං, කීම; තථාඑව, එසේම; අකාසිං, කෙළෙමි;

අඤ්ඤදථා, අන්පරිද්දෙකින්; (මේ බොරුයයි දන්නේ) විථතං ව, බොරුවක්ද; මා අභාසි, නොකීයව; මුසාවාදං, බොරුකීම; සප්පඤ්ඤා, සප්‍රාඥයෝ; නහි අවණ්ණයිංසු, වණ්ණනා නොකෙරෙත් යයි; භන්තෙ, ස්වාමින්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; නොඉති, නොදනිමියි; අවචං, කීයෙමි; පච්ඡා, පසුව; තෙ, තුඹවහන්සේගේ; වචනං, කීම; තථාඑව, එසේම; අකාසිං, කෙළෙමි;

යෙන පුරිසස්ස අපෙති සඤ්ඤා
තං මජ්ජං පරිවජ්ජයස්සු සබ්බං
හොති පඨමං අවචාහං භන්තෙ
පච්ඡා තෙ වචනං තථෙව කාසිං.

ස්වාහං ඉධ කරිත්වා පඤ්ච සික්ඛා
පටිපජ්ජිත්වා තථාගතස්ස ධම්මෙ
වෙපථෙ මගමාසිං චොරමජ්ඣෙ
චොරා තෙ මං තත්ථ වස්සංසු ගහෙතුං.

එත්තකමිදං අනුස්සරාමි කුසලං
තතො පරං න මෙ විජ්ජති අඤ්ඤං
තෙන සුචරිතෙන කම්මුනාහං
උප්පන්නා තිදිවෙසු කාමකාමී.

---

යෙන, යම් සුරාපානයකින්; පුරිසස්ස, පුරුෂයාගේ; සඤ්ඤා, (ධර්මසංඥාලෞකිකසංඥායක) සංඥාව; අපෙති, පහවේද; තං, ඒ; සබ්බං, සියළු; මජ්ජං, මත්වියයුතුදෙය; පරිවජ්ජයස්සු, දුරුකරව; (යි) භන්තෙ, ස්වාමීන්වහන්ස; අහං, මම; පඨමං, පළමුකොට; හොති, නොදනිමිසි; අවචං, කියෙමි; පච්ඡා, පසුව; තෙ, නුඹවහන්සේගේ; වචනං, වචනය; තථාඑව, එසේම; අකාසිං, කෙළෙමි;

සො අහං, ඒ මම; ඉධ, මෙහි; (මේ මාර්ගප්‍රදෙශයෙහි හෝ නුඹවහන්සේගේ මේ ශාසනයෙහි හෝ) පඤ්චසික්ඛා, ශික්ෂාපදපස; කරිත්වා, කොට; (ඉවා) තථාගතස්ස, තථාගතවූ; (නුඹවහන්සේගේ) ධම්මෙ, (අවවාද) ධර්මයෙහි; පටිපජ්ජිත්වා, පිළිපැද; චොරමජ්ඣෙ, සොරුන්ගේමධ්‍යයෙහි; වෙපථං, ගම්දෙකට මැද ගීමාවෙහිවූ මාර්ගයට; අගමාසිං, ගියෙමි; තත්ථ, ඒ මාර්ගයෙහි; තෙ චොරා, ඒ සොරු; මං, මා; ගහෙතුං, අල්වාගන්ට; වස්සංසු, විසූහ;

එත්තකං, මෙපමණක්වූ; ඉදං, මේ; කුසලං, කුශලය; අනුස්සරාමි; සිහිකෙරෙමි; තතො පරං, එයින් මත්තෙහි; අඤ්ඤං, අන්‍යවූ පිනක්; මෙ, මට; නවිජ්ජති, නැත්තේය; අහං, මම; තෙන, ඒ; සුචරිතෙන, යහපත් හැසිරීම්වූ; කම්මුනා, කර්මයෙන්; තිදිවෙසු,

පස්ස ඛණමුහුත්තසඤ්ඤමස්ස
අනුධම්මපටිපත්තියා විපාකං
ජලමිව යසසා පෙක්ඛමානා
බහුකාමා පිහයන්ති හීනකාමා.

පස්ස කතිපයාය දෙසනාය
සුගතිඤ්චම්හි ගතා සුඛඤ්ච පත්තා
යෙ ච තෙ සතතං සුණන්ති ධම්මං
මඤ්ඤෙ තෙ අමතං ඵුසන්ති ඛෙමං

අප්පම්පි කතං මහාවිපාකං
විපුලඵලං හොති තථාගතස්ස ධම්මෙ
පස්සථ කතපුඤ්ඤතාය ජතොතා
ඔභාසෙති පථවිං යථා සුරියො.

---

දිව්‍යලොකයන් හි; කාමී කාමී, කැමති පරිද්දෙන් කාමගුණ යෙන් යුක්තවූයෙමි; උපපන්නා, උපන්නෙමි;

ඛණමුහුත්ත සඤ්ඤමස්ස, ක්ෂණමුහුර්ත මාත්‍රයක් පවත්වනලද ශීලයාගේද; අනුධම්මපටිපත්තියා, ධර්මයට අනුවපිළිපැදීමගේද; ( නුඹවහන්සේගේ අවවාදධර්මයට සුදුසුවූ ධර්මප්‍රතිපත්තියගේද ) විපාකං, විපාකය; පස්ස, බැලුවමැනව; යසසා, ඉඩියෙන් හෝ පරිවාරසම්පත්තියෙන්; ජලංඉව, දිළිසෙන්නක්හු මෙන්; පෙක්ඛමානා, (මාගේසම්පත්) බලන්නාවූ; හීනකාමා, (මාගේසම්පත්ති යෙන්) හීනවූකාමසම්පත් ඇත්තාවූ; බහුකාමී, බොහෝසම්පත් කැමැත්තාහු; පිහයන්ති, (කෙසේවනාහී අපිදුමෙසේ වන්නෙමුදැයි) ප්‍රාර්ථනාකෙරෙත්;

කතිපයාය, ස්වල්පවූ; දෙශනාය, දෙශනාවෙන්; සුගතිඤ්ච, සුගතියටද; ගතොඅම්හි, ගියේවූයෙමි; සුඛඤ්ච, සැපයටද; පත්තා, පැමිණියේවෙමි; පස්ස, බැලුවමැනව; යෙච, යම්කෙනෙ කුන්; තෙ, නුඹවහන්සේගේ; ධම්මං, ධර්මය; සතතං, නිරන්තර යෙන්; සුණන්ති, අසද්ද; තෙ, ඔහුතුමූ; ඛෙමං, නිර්භයවූ; අමතං, අමෘත(මහා නිර්වාණ)ය; ඵුසන්ති, ස්පර්ශකරෙත්යයි; මඤ්ඤෙ, සිතමි;

තථාගතස්ස; තථාගතයන්වහන්සේගේ; ධම්මෙ, අවවාදධර්ම යෙහිසිට; කතං, කරණලද්දාවූ; අප්පං අපි, ස්වල්[illegible] කුශලයද; මහාවි

කිම්දං කුසලං කිමාචරෙම
ඉච්චෙකෙ හි සමෙච්ච මන්තයන්ති
තෙ මයං පුන ලද්ධා මනුස්සත්තං
පටිපන්නා විහරෙමු සීලවන්තා.

බහූපකාරො අනුකම්පකො ච මෙ
සත්ථා ඉති මෙ සති දිවාදිවස්ස
සොහං උපගතොම්හි සච්ච නාමං
අනුකම්පස්සු පුනදෙවපි සුණෙමු ධම්මන්ති.

අථ භගවා දෙවපුත්තස්ස තත්ථ සන්නිපතිතපරිසාය ච අජ්ඣාසයං ඔලොකෙත්වා ආනුපුබ්බිකථං කථෙසි, අථ තෙසං කල්ල

---

පාකං, මහත්විපාකවූ; විපුලඵලං හොති, මහත්ඵලවෙයි; පසත්ථං, බැලුවමැනව; කතපුඤ්ඤතාය, කරණලද පින්ඇති බැවින්; ජනෙතා, ජනනමාණවක දිව්‍යපුත්‍රතෙම; පඨවිං, පෘථිවිය; සූරියො, සූර්‍ය්‍යතෙම; යථා, යම්සේද; (එසේ) ඔභාසෙති, බබලවයි;

ඉදං කුසලං, මේ කුශලය නම්; කිං, කුමක්ද; කිං ආචරෙම, කෙසේ හැසිරෙන්නෙමුද; ඉති, මෙසේ; එකෙහි, සමහරු වනාහි; සමෙච්ච, රැස්ව; මන්තයන්ති, කථාකෙරෙත්; තෙ මයං, ඒ අපි; පුන, නැවත; මනුස්සත්තං, මනුෂ්‍යබව; ලද්ධා, ලැබ; පටිපන්නා, (ධර්‍මයවූ පරිද්දෙන්) පිළිපන්නාවූ; සීලවන්තා, ශීලවන්තයෝව; විහරෙමු, වාසයකරන්නෙමු;

මෙ සති, මා ඇතිකල්හි; (හෙවත් මා මිනිස්ලොවදී හොරුන් විසින් නොනැසූකල්හිම;) සත්ථා, ශාස්තෘන්වහන්සේ; ඉති, මෙසේ, මේ, මට; බහූපකාරො, බොහෝ උපකාර ඇතිවූසේක; අනුකම්පකො ච අනුග්‍රහද කළෝසේක; සො අහං, ඒ මම; දිවාදිවස්ස, දවස සම්බන්ධිවූ දහවල්හි; සච්චනාමං, සත්‍යනම් ඇත්තාහුකරා; (භගවා අරහං සම්මා සම්බුද්ධො යන සත්‍ය නම් ඇති සර්‍වඥයන්වහන්සේකරා) උපගතොඅම්හි, පැමිණියේ වෙමි; පුනදෙව අපි, නැවත ද; ධම්මං, ධර්‍මය; සුණෙමු, අසන්නෙමු; අනුකම්පස්සු ඉති, අනුකම්පාකළ මැනවැයි කීයේය.

අථ, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන්වහන්සේ; දෙවපුත්තස්ස, දිව්‍යපුත්‍රයාගේ ද; තත්ථ, එහි; සන්නිපතිත, රැස්වූ; පරිසාය ච, පිරිසගේ ද; අජ්ඣාසයං, අදහස; ඔලොකෙත්වා, බලා; ආනුපුබ්බිකථං, පිළිවෙළකථාව; කථෙසි, දෙශනාකළසේක; අථ, නැවත; තෙසං, ඔවුන්ගේ කල්ලචිත්තං, (ධර්‍මය පිළිගැනීමට)

චිත්තං ඤත්වා සාමුක්කංසිකං ධම්මදෙසනං පකාසෙසි, දෙසනාපරියොසානෙ දෙවපුත්තො තස්ස මාතාපිතරො ච සොතාපත්තිඵලෙ පතිට්ඨහිංසු, මහන්තො ච ජනකායස්ස ධම්මාභිසමයො අහොසි පඨමඵලෙ පතිට්ඨිතො දෙවපුත්තො උපරිමග්ගෙසු අත්තනො ගරුචිත්තීකාරං තදධිගතස්ස ච මහානිසංසතං විභාවෙන්තො පරියොසාන ගාථ මාහ.

යෙ විධ පජහන්ති කාමරාගං
භවරාගානුසයඤ්ච පහාය මොහං
නච තෙ පුන උපෙන්ති ගබ්භසෙය්‍යං
පරිනිබ්බාණගතා සීතිභූතා ති

---

සමජීවූ සිත; ඤත්වා, දැනවදාරා, සාමුක්කංසිකං ධම්මදෙසනං, සාමුක්කංසික ධර්මදෙශනාව; පකාසෙසි, ප්‍රකාශකළසේක; දෙසනාපරියොසානෙ, දෙශනාවගේ කෙළවරෙහි; දෙවපුත්තො ච, දිව්‍ය පුත්‍රතෙමේ ද; තස්ස, ඔහුගේ; මාතාපිතරො ච, මවුපියෝ ද; සොතාපත්තිඵලෙ, සෝවාන්පෙලෙහි; පතිට්ඨහිංසු, පිහිටියාහුය; මහන්තො ජනකායස්ස ච, මහත්වූ ජනසමූහයාහට ද; ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමයවූයේය; පඨමඵලෙ, පළමුවන ඵලයෙහි; පතිට්ඨිතො, පිහිටියාවූ; දෙවපුත්තො, දිව්‍යපුත්‍රතෙම; උපරි මග්ගෙසු, මතුමාර්ගයන්හි; (සකෘදාගාමි ආදි මාර්ගයන්හි) අත්තනො, තමාගේ; ගරුචිත්තීකාරං, ගුරුවරයා කෙරෙහි කරනලද ආදරයද; තදධිගතස්ස, ඒ සෝවාන්මාර්ගයට පැමිණියහුගේ; මහානිසංසතං ච, මහත් අනුසස්ඇතිබවද; විභාවෙන්තො, ප්‍රකාශකරනසේක්; පරියොසාන ගාථං, කෙළවරගාථාව; ආහ, වදාළසේක;

ඉධ, මේ ශාසනයෙහි; (සිටියාවූ) යෙ, යම්කෙනෙක්; කාමරාගංච, කාමයෙහි ඇලීමද; පජහන්ති, දුරුකෙරෙද්ද; භව රාගානුසයංච, භවරාගානුසයද; මොහං, මෝහයද; පහාය, හැර; (හෙවත් මෝහය සම්ප්‍රකාරයෙන් උපුටා හැර භවරාගානුසය දුරුකෙරෙද්ද) තෙ, ඔහුතුමූ; පුන, නැවත; ගබ්භසෙය්‍යං, ගර්භශය්‍යාවකට; නච උපෙන්ති, (ඔරම්භාගිය සංයොජනයං සිඳිනලද හෙයින්) නොපැමිණෙත්; පරිනිබ්බාණගතා, (ඔවුන් අතුරෙන් උත්තම පුරුෂයෝ

ඉති දෙවපුත්තො අත්තනො අරිය සොතාපත්තිභාවං පවෙදෙන්තො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා දෙසනාය කූටං ගහෙත්වා භගවන්තං වන්දිත්වා පදක්ඛිණං කත්වා භික්ඛු සඞ්ඝස්ස අපචිතිං දස්සෙත්වා මාතාපිතරො ආපුච්ඡිත්වා දෙවලොකමෙව ගතො, සත්ථාපි උට්ඨායාසනා ගන්ත්වා සද්ධිං භික්ඛුසඞ්ඝෙන, මාණවකස්ස මාතාපිතරො බ්‍රාහ්මණො පොක්ඛරසාතිනො ච සබ්බො මහාජනො භගවන්තං අනුගන්ත්වා නිවත්ති භගවා ජෙතවනං ගන්ත්වා සන්නිපතිතාය පරිසාය ඉමං විත්ථාරතො කථෙසි, සා දෙසනා මහාජනස්ස සාත්ථිකා අහොසීති.

## ඡත්තමාණවක විමානං-

---

අනුපාදිශෙෂවූ නිර්වාණධාතුවෙන්) පරිනිර්වාණයට පැමිණියාහුය; සීතිභූතාඉති, (කෙලශ වහ්නියෙන් වෙන්ව) නිහිල්වූවාහුයයි වදාලසේක;

ඉති, මෙසේ; දෙවපුත්තො, දිව්‍යපුත්‍රතෙම; අත්තනො, තමාගේ; අරිය සොතාපත්තිභාවං, ආර්‍ය්‍ය ශ්‍රොතමාර්ගයට පැමුණුනු බව; පවෙදෙන්තො, දන්වන්නේ; අනුපාදිසෙසාය, උපාදිශෙෂ රහිතවූ; නිබ්බානධාතුයා, නිර්වාණධාතුවෙන්; (යුක්තවූ) දෙසනාය, දෙශනාවෙන්; කූටංගහෙත්වා, කූටගෙණ, (මුදුන්පත්කොට) භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; වන්දිත්වා, වැඳ; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණාකොට; භික්ඛු සංඝස්ස, භික්ඛුසංඝයාට; අපචිතිං, පූජා; දස්සෙත්වා, දක්වා; (දී) මාතාපිතරො, මව්පියන්; ආපුච්ඡිත්වා, විචාරා; දෙවලොකං එව, දිව්‍යලොකයටම; ගතො, ගියේය; සත්ථාපි, ශාස්තෘන්වහන්සේද; ආසනා, ආසනයෙන්; උට්ඨාය, නැගිට; භික්ඛුසංඝෙන සද්ධිං, භික්ෂුසංඝයා හා සමග; ගතො, වැඩිසේක; මාණවකස්ස, මාණවකයාගේ; මාතාපිතරෝ, මවුපියෝද; පොක්ඛරසාතිනො, පොෂ්කරසාතිනාමවූ; බ්‍රාහ්මණො ච, බ්‍රාහ්මණතෙමේ ද; සබ්බො මහාජනො, සියලුම මහාජනතෙමේ ද; භගවන්තං අනු, භාග්‍යවතුන්වහන්සේ අනුව; ගන්ත්වා, ගොස්; නිවත්ති, නැවතුනේය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ජෙතවනං, ජෙතවනාරාමයට; ගන්ත්වා, වැඩ; සන්නිපතිතාය, රැස්වූ; පරිසාය,

“උට්ඨෙහි රෙවතෙ සුපාප ධම්මෙ”ති රෙවතිවිමානං, කා උප්පත්ති? භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තෙන ඛො පන සමයෙන බාරාණසියං සද්ධාසම්පන්නස්ස කුලස්ස පුත්තො නන්දියො නාම උපාසකො අහොසි සද්ධො පසන්නො දායකො දානපති සඞ්ඝුපට්ඨාකො, අථස්ස මාතාපිතරො සම්මුඛගෙහතො මාතුලධීතරං රෙවතිං නාම කඤ්ඤං ආනෙතුකාමා අහෙසුං-සා පන අස්සද්ධා අප්පසන්නා අදානසීලා නන්දියො තං න ඉච්ඡති.

---

පිරිසට; ඉමං, මේ වස්තුව; විත්ථාරතො, විස්තරවශයෙන්; කථෙසි, දෙශනාකළසේක; සා දෙසනා, ඒ දෙශනාතොමෝ; මහාජනස්ස, මහාජනයාහට; සාත්ථිකා අහොසි ඉති, අර්ථසහිතවීයයි;

ජනනමාණවක විමානයයි.

---

උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ ඉති, උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ යනු; රෙවතිවිමානං, රෙවතිවිමානයයි; උප්පත්ති; උත්පත්තිතොමෝ; කා, කවරක්වන්නීද? භගවා, භාග්‍යවතුන්වහන්සේ; බාරාණසියං, බරණැස්නුවර සමීපයෙහිවූ; මිගදායෙ, මුවන්ට අභයදානකවූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; විහරති, වැඩවසය කළසේක; තෙනසමයෙන ඛො පන, එසමයෙහි වනාහි; බාරාණසියං, බරණැස්නුවරෙහි; සද්ධාසම්පන්නස්ස, ශ්‍රද්ධාවෙන් යුක්තවූ; කුලස්ස, කුලයක්හුගේ; පුත්තො, පුත්‍රවූ; නන්දියො නාම, නන්දිය නම්වූ; උපාසකො අහොසි, උපාසකයෙක් වූයේය; සද්ධො, ශ්‍රද්ධා ඇත්තෙක; පසන්නො, ප්‍රසන්නවූවෙක; දායකො, දානදෙන්නෙක; දානපති, දානපතියෙක; සංඝුපට්ඨාකො, සංඝයාට උපස්ථාන කරන්නෙක; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඔහුගේ; මාතාපිතරො, මවුපියෝ; සම්මුඛගෙහතො, සම්මුඛ ගෘහයෙන්; මාතුලධීතරං, මයිලනුවණගේ දූහියාවූ; රෙවතිං නාම කඤ්ඤං, රෙවති නම්වූ කන්‍යාවක්; ආනෙතුකාමා අහෙසුං, (ඔහට) ගෙණෙනුකැමැත්තවූවාහුය; සා පන, ඕතොමෝ වනාහී; අස්සද්ධා, ශ්‍රද්ධා නැත්තියෙක; අප්පසන්නා, ප්‍රසන්නනැත්තියෙක; අදානසීලා, නොදෙනසුළු තැනැත්තියෙක; නන්දියො, නන්දියතෙම; තං, ඈ; න ඉච්ඡති, නොකැමැතිවේයි;

තස්ස මාතා රේවතිං ආහ අම්ම! ත්වං ඉමං ගෙහං ආගතාවා භික්ඛුසඞ්ඝස්ස නිසීදනට්ඨානං හරිතෙන ගොමයෙන උපලිම්පිත්වා ආසනානි පඤ්ඤපෙහි ආධාරකෙ ඨපෙත්වා භික්ඛූනං ආගතකාලෙ වන්දිත්වා පත්තං ගහෙත්වා නිසීදාපෙත්වා ධම්මකරණෙන පානීයං පරිස්සාවෙත්වා භුත්තකාලෙ පත්තානිධොව, එවං මෙ පුත්තස්ස ආරාධිකා භවිස්සසීති.

සා තථා අකාසි අථ නං ඔවාදක්ඛමා ජාතාති පුත්තස්ස ආරොචෙත්වා තෙනපි සාධූති සම්පටිච්ඡි තෙ දිවසං ඨපෙත්වා ආවාහ විවාහං කරිංසු, අථ නං නන්දියො ආහ ත්වං සචෙ භික්ඛුසඞ්ඝං මාතාපිතරෙ ච මෙ උපට්ඨහිස්සසි එවං ඉමස්මිං ගෙහෙ වසිතුං ලභිස්සසි අප්පමත්තා හොහීති සා සාධූති සම්පටිච්ඡිත්වා කිඤ්චි

---

තස්ස, ඔහුගේ; මාතා, මවුතොමෝ; රේවතිං, රේවතියට; ආහ, (මෙසේ) කී; අම්ම, දියණිය; ත්වං, තී; ඉමං ගෙහං, මේ ගෘහයට; ආගතාවා, අවුත්; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසංඝයාගේ; නිසීදනට්ඨානං, වැඩහිඳිනතැන; හරිතෙන ගොමයෙන, නිල්ගොමයෙන්; උපලිම්පිත්වා, ආලෙපකොට; ආසනානි, ආසනයන්; පඤ්ඤාපෙහි, පණවව; ආධාරකෙ, ආධාරකයන්; ඨපෙත්වා, තබා; භික්ඛූනං, භික්ෂූන්ට; ආගතකාලෙ, ආකල්හි; වන්දිත්වා, වැඳ; පත්තානි ගහෙත්වා, (උන්වහන්සේලාගේ) පාත්‍රගෙණ; නිසීදාපෙත්වා, වැඩහිඳුවා ධම්මකරණෙන, ඩබරුවකින්; පානීයං පැන්; පරිස්සාවෙත්වා, පෙරා; භුත්තකාලෙ වැළඳූකල්හි; පත්තානිධොව, පාත්‍රධොවනය කරව;.(සෝදව) එවං, එසේ; මෙ, මාගේ; පුත්තස්ස, පුත්‍රයාගේ; ආරාධිකා භවිස්සසි ඉති, සිත්ගත්තීවන්නෙහියයි;

. සා, ඒ රේවතීතොමෝ; තථා අකාසි, එසේ කළාය; අථ, එකල්හි; නං, ඈ; ඔවාදක්ඛමා ජාතාති, අවවාදක්ෂම වූවායයි; පුත්තස්ස, පුත්‍රයාට; ආරොචෙත්වා, කියා; තෙනපි, එසේවීනම්; සාධුඉති, යහපතැයි; සම්පටිච්ඡි, පිළිගත්තේය; තෙ, ඔහුතුමූ; දිවසං, දවසක්; ඨපෙත්වා, (නියමකොට) තබා; අවාහ විවාහං, ආවාහවිවාහය; කරිංසු, කළාහුය; අථ, ඉක්බිත්තෙන්; නන්දියො, නන්දියතෙම; නං, ඇට; ආහ, (මෙසේ) කීයේය; ත්වං, තී; සචෙ, ඉදින්; භික්ඛුසංඝං, භික්ඛුසංඝයාටද; මෙ, මාගේ; මාතාපිතරෙ ච, මවුපියන්ට ද; උපට්ඨහිස්සසි, උපස්ථානකරන්නෙහි නම්; එවං, මෙසේ; ඉමස්මිං ගෙහෙ, මේ ගෘහයෙහි; වසිතුං, වාසයකරන්ට;

කාලං සද්ධා විය හුත්වා භත්තාරං අනුවත්තන්ති වෙ පුත්තෙ විජායි, නන්දියස්ස මාතාපිතරො කාලමකංසු, ගෙහෙ සබ්බිස්සරියං තස්සා යෙව අහොසි නන්දියො මහාදානපති හුත්වා භික්ඛුසඞ්ඝස්ස දානං පට්ඨපෙසි කපණද්ධිකාදීනම්පි ගෙහද්වාරෙ පාකවට්ටං පට්ඨපෙසි, ඉසිපතන මහාවිහාරෙ චතූහි ගබ්භෙහි පතිමණ්ඩිතං චතුස්සාලං කාරාපෙත්වා මඤ්චපීඨාදීනි අත්ථරාපෙත්වා බුද්ධප්පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං දත්වා තථාගතස්ස හත්ථෙ දක්ඛිණොදකං පාතෙත්වා නිය්‍යාදෙසි, සහ දක්ඛිණොදකපාතෙන තාවතිංසභවනෙ ආයාමතො ච විත්ථාරතො ච සමන්තා ද්වාදසයොජනිකො යොජනසතුබ්බෙධො සත්තරතනමයො අච්ඡරාගණසඞ්ඝුට්ඨො දිබ්බපාසාදො උග්ගඤ්ජි.

---

ලභිස්සසි, ලබන්නෙහිය; අප්පමත්තො හොහි ඉති, අප්‍රමාදවේවයි; සා, ඕතොමෝ; සාධු ඉති, යහපතැයි; සම්පටිච්ඡිත්වා, (සතුටින්) පිළිගෙණ; කිඤ්චිකාලං, ස්වල්පකාලයක්; සද්ධාවියහුත්වා, ශ්‍රද්ධා ඇත්තියක්මෙන්ව; භත්තාරං, ස්වාමියා; අනුවත්තන්ති; අනුව පවතින්නී; වෙ පුත්තෙ, පුත්‍රයන් දෙදෙනෙකු; විජායි, වැදුවාය; නන්දියස්ස, නන්දියයාගේ; මාතාපිතරො, මවුපියෝ; කාලමකංසු, කාලක්‍රියාකළාහුය; ගෙහෙ, ගෘහයෙහි; සබ්බිස්සරියං, සියලු ඓශ්වර්‍ය්‍යය; තස්සා එව, ඔහුට ම; අහොසි, වූයේය; නන්දියො, නන්දියතෙම; මහාදානපතිහුත්වා, මහත්දානපතියෙක්ව; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසංඝයාහට; දානං, දන්දීම; පට්ඨපෙසි, අතිශයින් තැබුවේය; (නොහොත් පටන්ගත්තේය) කපණද්ධිකාදීනම්පි, දුගිමගීආදී(යාචකය)න්ටද; ගෙහද්වාරෙ, ගෘහද්වාරයෙහි; පාකවට්ටං, පැසිවැට; (පිසදෙනලද දන්වැට) පට්ඨපෙසි, අතිශයින් තැබුයේය; ඉසිපතන මහාවිහාරෙ, ඉසිපතන මහාවෙහෙරෙහි; චතූහි ගබ්භෙහි, සිව් ගැබකින්; පතිමණ්ඩිතං, ප්‍රතිමණ්ඩිතවූ; චතුස්සාලං, ශාලා සතරක්; කාරාපෙත්වා, කරවා; මඤ්චපීඨාදීනි, ඇඳ පුටු ආදිය; අත්ථරාපෙත්වා, අතුරුවා; බුද්ධප්පමුඛස්ස, බුධප්‍රමුඛවූ; භික්ඛුසංඝස්ස, භික්ෂුසංඝයාහට; මහාදානං, මහත්දානයක්; දත්වා, දී; තථාගතස්ස, තථාගතයන්වහන්සේගේ; හත්ථෙ, අතෙහි; දක්ඛිණොදකං, දක්ෂිණොදකය; පාතෙත්වා, හෙළා; (වත්කොට) නිය්‍යාදෙසි, පාවාදුන්නේය; සහ දක්ඛිණොදකපාතෙන, දක්ෂිණොදකයහෙළීම හා සමග; තාවතිංසභවනෙ, තව්තිසාභවනයෙහි;

අථායස්මා මහාමොග්ගල්ලානො දෙවලොකෙ චාරිකං ගන්ත්වා තං දිස්වා අත්තනො වන්දිතුං ආගතෙ දෙවපුත්තෙ පුච්ඡි කස්සායං පාසාදොති, ඉමස්ස භන්තෙ! පාසාදස්ස සාමිකො මනුස්සලොකෙ බාරාණසියං නන්දියො නාම කුටිම්බියපුත්තො සඞ්ඝස්ස ඉසිපතන මහාවිහාරෙ චතුස්සාලං කාරෙසි තස්සායං නිබ්බත්තො පාසාදොති ආහංසු, පාසාදෙ නිබ්බත්තා දෙවච්ඡරායො පි ථෙරං වන්දිත්වා භන්තෙ! මයං බාරාණසියං නන්දියස්ස නාම උපාසකස්ස පරිචාරිකා භවිතුං ඉධ නිබ්බත්තා තස්ස එවං වදෙථ තුය්හං පරිචාරිකා

---

ආයාමතො ච, දිගින් ද, විත්ථාරතො ච, පුළුලින් ද; සමන්තා, හාත්පසින්; ද්වාදසයොජනිකො, දොළොස්යොදුන් ඇත්තාවූ; යොජනසතුබ්බෙධො, යොදුන් සියයක් උස ඇත්තාවූ; සත්තරතනමයො, සත්රුවන්මයවූ; අච්ඡරාගණසංඝුට්ඨො, දිව්‍යාප්සර සමූහයා විසින් ගිගුම්ගන්නාලද; දිබ්බපාසාදො, දිව්‍යප්‍රාසාදයෙක්තෙම; උග්ගඤ්ජි, උස්වපැනනැංගේය;

අථ, ඉක්බිත්තෙන්; ආයස්මා, ආයුෂ්මත්වූ; මහාමොග්ගල්ලානො, මහාමෞද්ගල්‍යායනස්ථවිරතෙම; දෙවලොකෙ, දිව්‍යලොකයෙහි; චාරිකං, චාරිකාවට; (හැසිරීමට) ගන්ත්වා, වැඩ; තං, ඒ දිව්‍යප්‍රාසාදය; දිස්වා, දැක; අත්තනො, තමන්වහන්සේව; වන්දිතුං, වඳින්ට; ආගතෙ, ආවාවූ; දෙවපුත්තෙ දිව්‍යපුත්‍රයන්; (දෙව්පුතුන් ගෙන්) අයං, මේ; පාසාදො, ප්‍රාසාදයතෙම; කස්සඉති; කවරෙකුගේදැයි; පුච්ඡි, විචාළසේක; භන්තෙ, ස්වාමීන්වහන්ස; ඉමස්ස, මේ; පාසාදස්ස, ප්‍රාසාදයාගේ; සාමිකො, ස්වාමිතෙම; මනුස්සලොකෙ, මනුෂ්‍යලොකයෙහි; බාරාණසියං, බරණැස්නුවරෙහි; නන්දියො නාම, නන්දිය නම්වූ; කුටිම්බියපුත්තො, කෙළඹිපුත්‍රතෙමේ; සඞ්ඝස්ස, සංඝයාහට; ඉසිපතනමහාවිහාරෙ; ඉසිපතනනම්මහවෙහෙරෙහි; චතුස්සාලං, ශාලාසතරක්; කාරෙසි, කරවූයේය; තස්ස, ඔහට; අයං, මේ; පාසාදො, ප්‍රාසාදයතෙම; නිබ්බත්තො ඉති, උපන්නේයයි; ආහංසු, කීවාහුය; පාසාදෙ, ප්‍රාසාදයෙහි; නිබ්බත්තා දෙවච්ඡරායො පි, උපන් දිව්‍යාප්සරාවෝ ද; ථෙරං, (මුගලන් මහ) තෙරුන්නාන්සේට; වන්දිත්වා, වැඳ; භන්තෙ, ස්වාමීන් වහන්ස; මයං, අපි; බාරාණසියං, බරණැස්නුවරෙහි; නන්දියස්ස,

භවිතුං නිබ්බත්තා දෙවතායො තයි චිරායන්තෙ උක්කණ්ඨිතා දෙවලොකසම්පත්ති නාම මත්තිකභාජනං භින්දිත්වා සුවණ්ණභාජනස්ස ගහණං විය අතිමනාපා තාති වත්වා ඉධාගමනත්ථාය වදෙථාති ආහංසු.

ථෙරො සාධූති පටිස්සුණිත්වා සහසා දෙවලොකතො ආගන්ත්වා චතුපරිසමජ්ඣෙ භගවන්තං පුච්ඡි නිබ්බත්තන්ති නු ඛො භන්තෙ කතපුඤ්ඤානං මනුස්සලොකෙ ඨිතානංයෙව දිබ්බසම්පත්තීති— නනු තෙ මොග්ගල්ලාන නන්දිකස්ස දෙවලොකෙ නිබ්බත්තා දිබ්බසම්පත්ති සාමං දිට්ඨා කස්මා මං පුච්ඡසීති, එවං භන්තෙ නිබ්බත්තාති, අථස්ස සත්ථා යථා චිරප්පවාසං

---

නාම, නන්දිකනම්වූ; උපාසකස්ස, උපාසකයාහට; පරිචාරිකා භවිතුං, පරිචාරිකාවන්ට; ඉධ, මෙහි; නිබ්බත්තා, උපන්නෙමු; තස්ස, ඔහට; එවං, මෙසේ; වදෙථ, කියමැනව; තුය්හං, තට; පරිචාරිකා භවිතුං, පරිචාරිකාවන්ට; නිබ්බත්තා, උපන්නාවූ; දෙවතායො, දෙවතාවෝ; තයි, තා; චිරායන්තෙ, බොහෝකල් ඉක්මවනකල්හි; උක්කණ්ඨිතා, උකටලිවූවාහුය; දෙවලොකසම්පත්ති නාම, දිව්‍යලොක සම්පත්තිය නම්; මත්තිකභාජනං, මැටිභාජනයක්; භින්දිත්වා, බිඳ; සුවණ්ණභාජනස්ස, සුවර්ණභාජනයක්හුගේ; ගහණං විය, ගැණිමමෙන්; අතිමනාපං ඉති; ඉතා මනාප යයි; වත්වා, කියා; ඉධ, මෙහි; ආගමනත්ථාය, ඊම පිණිස; වදෙථ ඉති, කියමැනවැයි; ආහංසු, කීවාහුය;

ථෙරො, (මහාමෞද්ගල්‍යායන) ස්ථවිරතෙම; සාධූ ඉති, යහපතැයි; පටිස්සුණිත්වා, පිළිගෙන; සහසා, වහා; දෙවලොකතො, දෙව්ලොවින්; ආගන්ත්වා, අවුත්; චතුපරිසමජ්ඣෙ, සිව්පිරිස් මැද; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; (බුදුන්ගෙන්) භන්තෙ, ස්වාමීන් වහන්ස; කතපුඤ්ඤානං, කරණලද පින්ඇත්තවුන්; මනුස්සලොකෙ, මිනිස්ලොවැ; ඨිතානං එව, සිටියදීම; දිබ්බසම්පත්ති, දිව්‍යසම්පත්තිය; නිබ්බත්තන්ති නු ඛො ඉති, උපදනේදෙහෝයි; (විචාළසේක) මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; තෙ, තා විසින්; දෙවලොකෙ, දෙව්ලොවෙහි; නන්දිකස්ස, නන්දිකයාහට; නිබ්බත්තා, උපන්නාවූ; දිබ්බසම්පත්ති, දිව්‍යසම්පත්තිය; සාමං, තමා විසින්ම; දිට්ඨා නනු, දක්නාලද්දී නොවේද? කස්මා, කුමක් හෙයින්; මං, මා; (මාගෙන්) පුච්ඡසි ඉති, විචා

වසිත්වා ආගතං පුරිසං ඤාතිබන්ධවා අභිනන්දන්ති සම්පටිච්ඡන්ති එවං කතපුඤ්ඤං පුග්ගලං ඉතො පරලොකගතං පුඤ්ඤානි සම්පත්තිගහණෙන සම්පටිච්ඡන්ති පතිගණ්හන්තීති දස්සෙන්තො ගාථමාහ.

චිරප්පවාසිං පුරිසං—දූරතො සොත්ථිමාගතං
ඤාතිමිත්තා සුහජ්ජා ච—අභිනන්දන්ති ආගතං.
තථෙව කතපුඤ්ඤම්පි—අස්මා ලොකා පරං ගතං
පුඤ්ඤානි පතිගණ්හන්ති—පියං ඤාතිංව ආගතන්ති.

නන්දිකො තං සුත්වා භිය්‍යොසොමත්තාය දානානි දෙති

---

ලෙළිදදයි; (ඇසූසේක) භගවතා, ස්වාමීන්වහන්සෙ; එවං, එසේම; නිබ්බත්තොසීති, උපන්නියයි; (කීසේක) අථ, ඉක්බිත්තෙන්; අස්ස, උන්වහන්සේට; සත්ථා, ශාස්තෲන්වහන්සේ; යථා, යම්සේ; චිරප්පවාසං වසිත්වා, බොහෝකල්වෙන්ව වැස; ආගතං, ආවාවූ; පුරිසං, පුරුෂයාට; ඤාතිබන්ධවා, ඤාතියෝද නෑයෝද; අභිනන්දන්ති, විශෙෂයෙන් සතුටුවෙත්ද, සම්පටිච්ඡන්ති, (ඔහු) පිළිගණිත්ද?; එවං, එසේ; ඉතො, මෙලොවින්, පරලොකං, පරලොවට, ගතං, ගියාවූ, කතපුඤ්ඤං, කරනලද පින්ඇත්තාවූ; පුග්ගලං, පුද්ගලයා; පුඤ්ඤානි, පුණ්‍යයෝ; සම්පත්තිගහණෙන, සම්පත් නැමැති අත්ලින්; සම්පටිච්ඡන්ති, සතුටුකෙරෙත්; පතිගණ්හන්තීති, පිළිගණිත්යයි; දස්සෙන්තො, දක්වන්නේ; ගාථං, ගාථාදෙකක්; ආහ, වදාළසේක—

චිරප්පවාසිං, බොහෝකල් වෙන්ව වැස; සොත්ථිමාගතං, සැපබවට පැමිණෙනලද්දාවූ; දූරතො, දුරසිට, ආගතං, ආවාවූ; පුරිසං, පුරුෂයාට; ඤාතිමිත්තා, නෑයෝද, මිත්‍රයෝද, සුහජ්ජාච, යහළුවෝද; අභිනන්දන්ති, විශෙෂයෙන් සතුටුවෙත්ද;—තථා එව, එසේම; කතපුඤ්ඤං අපි, කරනලද පින්ඇත්තාහුද; අස්මා ලොකා, මෙලොවින්; පරං, පරලොවට; ගතං, ගියාහු; ආගතං, ආවාවූ; පියං, ප්‍රියවූ, ඤාතිංඉව, නෑයෙක්මෙන්, පුඤ්ඤානි, පුණ්‍යයෝ; පටිගණ්හන්ති ඉති, පිළිගණිත් යයි; (වදාළසේක)—

නන්දිකො, නන්දිකතෙම; තං, එය; සුත්වා, අසා; භිය්‍යොසොමත්තාය, පමණටවඩා; දානානි, දන්; දෙති, දෙයි; පු

පුඤ්ඤානි කරෝති සො වණිජ්ජාය ගච්ඡන්තො රෙවතිං ආහ භද්දෙ මයා පට්ඨපිතං සඞ්ඝස්ස දානං අනාථානං පාකවට්ටඤ්ච ත්වං අප්පමත්තා පවත්තෙය්‍යාසීති, සා සාධූති පටිස්සුණි—සො පවාසං ගතොපි යත්ථ යත්ථ වාසං කප්පෙති තත්ථ තත්ථ භික්ඛූනං අනාථානඤ්ච යාචකානං යථාවිභවං දානං දෙතියෙව තස්ස අනුකම්පාය ඛීණාසවා දූරතොපි ආගන්ත්වා දානං සම්පටිච්ඡන්ති.

රෙවතී පන තස්මිං ගතෙ කතිපාහමෙව දානං පවත්තෙත්වා අනාථභත්තං උපච්ඡින්දි භික්ඛූනම්පි භත්තං කණාජකං බිලඞ්ගදුතියං අදාසි භික්ඛූනං භුත්තට්ඨානෙ අත්තනාව භුත්තාවසෙසානි සිත්ථානි මච්ඡමංසඛණ්ඩමිස්සකානි චලකට්ඨිකානිච විකිරි

---

පුඤ්ඤානි, පින්; කරෝති, කෙරෙයි, සො, හෙතෙම; වණිජ්ජාය, වෙළඳාම්පිණිස; ගච්ඡන්තො, යන්නේ; රෙවතිං, රෙවතියට; ආහ, (මෙසේ) කීයේය; භද්දෙ, සොඳුර; මයා, මා විසින්; සඞ්ඝස්ස, සංඝයාට; පට්ඨපිතං, තබනලද්දාවූ; දානං, දානයද: අනාථානං, අසරණවූවන්ගේ; පාකවට්ටඤ්ච, පැසිදන් වැටද; ත්වං, නි; අප්පමත්තා, අප්‍රමාදවූවා; පවත්තෙය්‍යාසීති, පවත්වවයි; (කීයේය) සා, ඕතොමෝ; සාධූති, මැනවයි, පටිස්සුණි, පිළිවදන් ඇස්වීය—සො, ඒ (නන්දික) තෙමේ; පවාසං ගතොපි, වෙත්වවාසයට ගියේද; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හී; වාසංකප්පෙති, වාසයකෙරේද; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; භික්ඛූනං, භික්ෂූන්ටද; අනාථානං, අසරණවූ; යාචකානාංච, යාචකයන්ටද; යථාවිභවං, සම්පත්වූපරිද්දෙන්; දානං දෙති එව, දන්දේමය, තස්ස, ඒ (නන්දිකයා) හට, අනුකම්පාය, අනුකම්පාවෙන්. ඛීණාසවා, රහතන්වහන්සේලා; දූරතොඅපි, දුරින්දු ආගන්ත්වා, අවුත්; දානං, දානය; සම්පටිච්ඡන්ති, පිළිගණිත්—

රෙවතිපන, රෙවතීතොමෝවනාහි; තස්මිංගතෙ, ඔහුගියකල්හී, කතිපාහංඑව, ස්වල්පදිනක්ම; දානං, දානය, පවත්තෙත්වා, පවත්වා; අනාථභත්තං, අසරණ(යන්ටදෙන)බත, උපච්ඡින්දි, කඩකෙළේය; භික්ඛූනං අපි, භික්ෂූන්ටද; බිලඞ්ගදුතියං, කාඩිදෙවැනිවූ; කණාජකං, කුඩුසහිතවූ; භත්තං, බත; අදාසි, දුන්නීය; භික්ඛූනං, භික්ෂූන්ගේ; භුත්තට්ඨානෙ, අනුභවකළස්ථානයෙහි, අත්තනා එව, තමාවිසින්ම; භුත්තාවසෙසානි, කාඉතිරිවූ; සිත්ථානි; බත්සුලුද; මච්ඡමංසඛණ්ඩමිස්සකානි, මස්මාංසකැබලි මිශ්‍රවූ; චලකට්ඨිකානිච, ශාඇටද, විකිරිත්වා, විසුරුවා, මනුස්සා

ඤ්ං මනුස්සානං දස්සෙති පස්සථ සමණානං කම්මං සද්ධාදෙය්‍ය නාම එවං ජග්ඝන්තීති—අථ නන්දිකො ලද්ධලාභො අගන්ත්වා තං පවත්තිං සුත්වා රෙවතිං ගෙහතො නීහරිත්වා ගෙහං පාවිසි, දුතියදිවසෙ බුද්ධප්පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං පවත්තෙත්වා නිච්චභත්තං අනාථභත්තඤ්ච සම්මදෙව පවත්තෙතසි අත්තනො සහායෙහි උපනීතං රෙවතිං සාසවජ්ජාදන පරමතාය ඨපෙසි, සො අපරෙන සමයෙන කාලං කත්වා තාවතිංසභවනෙ අත්තනො විමානෙයෙව නිබ්බත්ති—රෙවතී පන සබ්බදානං පච්ඡින්දිත්වා ඉමෙසං වසෙන මය්හං ලාභසක්කාරො පරිහායතීති භික්ඛු අක්කොසන්තී පරිභාසන්තී විචරි.

---

නං, මිනිසුන්ට; දස්සෙති, දක්වයි; සමණානං, ශ්‍රමණයන්ගේ; කම්මං, ක්‍රියාවක්; පස්සථ, බලව්; සද්ධාදෙය්‍යංනාම, ශ්‍රද්ධාවෙන් දියයුතු දෙයනම්; එවං, මෙසේ; ජග්ඝන්ති ඉති දමත්යයි—

අථ, ඉක්බිත්තෙන්; නන්දිකො, නන්දිකතෙම, ලද්ධලාභො, ලබනලද ලාභඇත්තේ; අගන්ත්වා, අවුත්; තංපවත්තිං; ඒ ප්‍රවෘත්තිය, සුත්වා, අසා; රෙවතිං, රේවතිය, ගෙහතො, ගෘහයෙන්, නීහරිත්වා, නෙරපා; ගෙහං, ගෘහයට, පාවිසි, ප්‍රවෙශවූයේය, දුතියදිවසෙ, දෙවනදවසෙහි; බුද්ධප්පමුඛස්ස, බුද්ධප්‍රමුඛවූ; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසංඝයාහට; මහාදානං, මහත්දන්දීමක්; පවත්තෙත්වා, පවත්වා, නිච්චභත්තඤ්ච, නිරන්තරබත්ද, අනාථභත්තඤ්ච, අසරණ (යන්ට දෙන) බත්ද; සම්මාඑව, මනාකොටම; පවත්තෙසි, පැවැත්වූයේය; අත්තනො, තමාගේ; සහායෙහි, යහළුවන්විසින්; උපනීතං, ගෙණඑනලද්දාවූ; රෙවතිං, රේවතිය; සාසවජ්ජාදනපරමතාය, තැම් ඇඳිම් පරමකොට ඇතිබවෙහි, ඨපෙසි, තැබීය; සො, හෙතෙම; අපරෙන සමයෙන, මෑතකාලයෙහි; කාලංකත්වා. කළුරියකොට; තාවතිංසභවනෙ, තව්තිසාභවනෙහි, අත්තනො, තමාගේ, විමානෙඑව, විමානයෙහිම; නිබ්බත්ති, උපන්නේය—රෙවතීපන, රේවතී තොමෝ වනාහි; සබ්බදානං, සියලුදානය; පච්ඡින්දිත්වා, සිඳ, ඉමෙසංවසෙන, මොවුන්ගේවශයෙන්; මය්හං, මාගේ; ලාභසක්කාරො; ලාභසත්කාරයතෙම; පරිහායිස්සති, පිරිහුනේයයි; භික්ඛු, භික්ෂූන්ට, අක්කොසන්ති, ආක්‍රොශකරන්නී; පරිභාසන්ති, පරිභවකරන්නී, විචරි. හැසුරුනීය;—

අථ වෙස්සවණො මෙ යක්ඛෙ ආණාපෙසි, ගච්ඡථ භණෙ
බාරාණසිනගරෙ උග්ඝොසෙථ ඉතො සත්තමෙ දිවසෙ රෙව
තිං ජීවන්තිංයෙව නිරයෙ පක්ඛිපිස්සන්ති, තෙ තථා අකංසු, තං
සුත්වා මහාජනො සංවෙගජාතො භීතතසිතො ච අහොසි,
රෙවතී පන පාසාදං අභිරුහිත්වා ද්වාරං ථකෙත්වා නිසීදි—සත්ත
මෙ දිවසෙ පනස්සා පාපකම්මසඤ්චොදිතෙන වෙස්සවණෙනා
රක්ඛසා ආණත්තා ජලිතකපිලකෙසමස්සුකා විපිටවිරූපනාසිකා
දීඝදාඨා ලොහිතක්ඛා සජලජලධරසමානවණ්ණා අතිවිය භයා
නකරූපා ද්වෙ යක්ඛා උපගන්ත්වා "උට්ඨෙහි රෙවතෙ සුපාප
ධම්මෙ" ති ආදීනි වදන්තා නානාබාහාසු ගහෙත්වා මහාජනො

---

අථ, ඉක්බිත්තෙන්, වෙස්සවණො, වෛශ්‍රවණ වරම්රජතෙ
මේ; මෙ යක්ඛෙ, යක්ෂයන් දෙදෙනකුට; ආණාපෙසි, මෙසේඅණ
කෙළේය, භණෙ, සගයෙනි; ගච්ඡථ, යව්; ඉතො, මෙයින්; සත්ත
මෙදිවසෙ, සත්වෙනිදවසෙහි; රෙවතිං, රෙවතීතොමෝ; ජීව
න්තිංයෙව, ජීවත්වන්නීම; නිරයෙ, නරකයෙහි; පක්ඛිපිස්සන්
ති, දමන්නුලබන්නේයයි; බාරාණසිනගරෙ; බරණැස්නුවරෙහි,
උග්ඝොසෙථ, ඝොෂාකරව්; තෙ, ඔහුදෙදෙන; තථා, එසේ,
අකංසු, කළාහුය; තං, ඒ ඝොෂය, සුත්වා, අසා; මහාජනො,
මහාජනතෙම; සංවෙගජාතො, උපන් සංවෙගඇත්තේ;
භීතතසිතොඑව, භයෙන් ත්‍රස්තවූයේම; අහොසි, වූයේය;
රෙවතීපන, රෙවතීතොමෝවනාහි; පාසාදං, ප්‍රාසාදයට; අභි
රුහිත්වා, නැඟී; ද්වාරං, දොර; ථකෙත්වා, වසා; නිසීදි, උන්නීය;
සත්තමෙදිවසෙපන, සත්වෙනිදවසෙහිවනාහි; අස්සා, ඇගේ
පාපකම්මසඤ්චොදිතෙන, පාපකර්මයෙන් චොදනාකරනලද්දා
වූ; වෙස්සවණෙනරක්ඛසා, වෛශ්‍රවණවරම්රජහුවිසින්, ආණ
ත්තා, අණකරනලද්දාවූ; ජලිත, දිලියෙනලද; කපිලකෙසම
ස්සුකා, කබවූ හිසකේ රැවුල් ඇත්තාවූ; විපිටවිරූපනාසිකා, පැත
ලිවූ විරූපනාසිකාඇති; දීඝදාඨා, දික්වූදළඇති, ලොහිතක්ඛා,
ලේවන්ඇස්ඇති; සජල, ජලසහිතවූ; ජලධර සමානවණ්ණා,
මෙඝයකටබඳුවර්ණඇති; අතිවිය, ඉතාම; භයානකරූපා, භයා
නකරූපඇති; ද්වෙයක්ඛා, යක්ෂයෝදෙදෙන; උපගන්ත්වා, අවුත්;
සුපාපධම්මෙ, අතිසයින්ලාමකස්වභාවඇති; රෙවතෙ, රෙවති
ය; උට්ඨෙහිඉති, නැඟිටුවයි; ආදීනි, මේආදිය; වදන්තා, කියා
න්නාහු, නානාබාහාසු, නොයෙක්අත්වලින්; ගහෙත්වා,(අල්වා)
ගෙණ; මහාජනො, මහාජනතෙම, පස්සතුඉති, බලාවයි;

පෙසෙන්ති සකලනගරෙ විචිනෙත්වා ත්‍යිං, පරිබ්භාවාපෙත්වා අකාසං අබ්භුග්ගන්ත්වා තාවතිංසභවනං නෙත්වා නන්දිකස්සවිමානං සම්පත්තිසුඛස්සා අසෙසෙත්වා තං විලපන්තිංයෙව උස්සදනිරයසමීපං පාපෙසුං තා යමපුරිසා උස්සදනිරයෙ ඛිපිතුකාමා—තෙ නාහංසු.

උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ
අපාරුතද්වාරෙ අදානසීලෙ
නෙස්සාම තං යත්ථ ථුනන්ති දුග්ගතා
සමප්පිතා නෙරයිකා දුක්ඛෙනාති.

ඉච්චෙවං වත්වා යමස්ස දූතා
තෙ ද්වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතිං
පක්කාමයිංසු දෙවගණස්ස සන්තිකෙති.

---

සකලනගරෙ, සියලුනුවරෙහි; විචිනෙත්වා, විචිනෙත්විචිනට; පරිබ්භාවාපෙත්වා, පරිබ්‍රමණයකරවා; අකාසං, අහසට; අබ්භුග්ගන්ත්වා, පැන්නැගී; තාවතිංසභවනං, තව්තිසාභවනට; නෙත්වා, පමුණුවා, නන්දිකස්ස, නන්දිකයාගේ; විමානං, විමානද; සම්පත්තිසුඛ, සම්පතද; අස්සා, ඇට; අසෙසෙත්වා, දක්වා; විලපන්තිංයෙව, විලාපකියන්නිම්ම; තං, ඈ; උස්සදනිරයසමීපං, ඔස්සුපත්නරකයාගේ සමීපයට; පාපෙසුං, පැමිණෙව්වාහුය; තං, ඈ; යමපුරිසා, යමරජුගේ දූරුෂයෝ; උස්සදනිරයෙ, ඔස්සුපත්නරකයෙහි; ඛිපිතුකාමා, දමනු කැමැත්තෝ; (වූවාහුය) තෙන, එහෙයින්; ආහංසු, (සංගීතිකාරක ස්ථවිරයෝ) මෙසේ කිවාහුය—

සුපාපධම්මෙ, අතිශයින් ලාමකස්වභාවඇත්තාවූ; අපාරුතද්වාරෙ, නොවසනලදනිරයමාරඇති, අදානසීලෙ, දන්නොදෙනස්වභාවඇති, රෙවතෙ, රෙවතිය; උට්ඨෙහි, නැගිසිටුව; යත්ථ; යම්තැනෙක්හි; දුග්ගතා, දුකටපැමිණෙනලද්දාහුද; දුක්ඛෙන, දුකින්; සමප්පිතා, යුක්තවූවාහුද; නෙරයිකා, නිරිසත්හු; ථුනන්ති, නිතර තතනද්ද; (එබඳුතැනට) තං, තී; නෙස්සාම, පමුණුවන්නෙමු;—

යමස්ස, යමයාගේ; දූතා, දූතයන්, බඳුවූ ලොහිතක්ඛා, ලෙහෙවන්ඇස්ඇත්තාවූ, බ්‍රහන්තා, මහත්වූ, තෙයක්ඛා, යක්ෂ

ඉදං සඞ්ගීතිකාරකානං වචනං.-- එවං තෙහි යක්ඛෙහි තාවතිංසභවනං නෙත්වා නන්දිකස්ස විමානස්ස අවිදූරෙ ඨපිතා රෙවතී තං සූරියමණ්ඩලසදිසං අතිවියපභස්සරං දිස්වා.

ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
ව්‍යම්හං සුභං කඤ්චනජාලච්ඡන්නං
කස්සෙතමාකිණ්ණජනං විමානං
සූරියස්සරංසී රිව ජොතමානං

නාරිගණා චන්දනසාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති
තං දිස්සති සූරියසමානවණ්ණං
කො මොදති සග්ගපත්තො විමානෙ.

---

යක්ෂදෙදෙන; ඉතිඑවං, මේඋක්තප්‍රකාරයෙන්; වත්වා, කියා; රෙවතිං, රෙවතිය; පච්චෙකබාහාසු, වෙනවෙනමඅත්වලින්; ගහෙත්වාන, (අල්වා) ගෙණ; දෙවගණස්ස, දිව්‍යසමූහයාගේ; සන්තිකෙ, සමීපයට; පක්කාමිංසුඉති, ගෙණගියාහුයි—

ඉදං, මෙය; සංගීතිකාරකානං, සංගායනාකළතෙරුන්ගේ, වචනං, කීමයි—

තෙහියක්ඛෙහි; ඒයක්ෂයන්විසින්; එවං, මෙසේ; තාවතිංසභවනං; තව්තිසාභවනයට, නෙත්වා, ගෙණගොස්, නන්දිකස්ස, නන්දිකනාසම්බන්ධවූ, විමානස්ස, විමානයාගේ, අවිදූරෙ; නුදුරුතැනෙක්හි, ඨපිතා, තබනලද්දීවූ; රෙවතී, රෙවතීනතොමෝ; සූරියමණ්ඩලසදිසං, සූර්‍යමණ්ඩලයසමානවූ; අතිවියපභස්සරං, ඉතාබබලනසුළුවූ; තං, ඒ විමානය, දිස්වා, දැක—

ආදිච්චවණ්ණං, සූර්‍යයාටබඳුවණ්ණඇති; රුචිරං, සිත්කලුවූ; පභස්සරං, ඉතාපැහැවිගිදෙන්නාවූ; ව්‍යම්හං, වාසස්ථානවූ; හෙවත්අහසෙහිගමන්කරන්නාවූ, සුභං; ශොභනවූ; කඤ්චනජාලච්ඡන්නං, රන්රසුදැලින් වැසෙනලද්දාවූ; සූරියස්සරංසීරිව, සූර්‍යරශ්මියමෙන්; ජොතමානං, බබලන්නාවූ; ආකිණ්ණජනං, ගැවසිගන්නාලද; දිව්‍යසමූහයාඇති; එතංවිමානං, මේවිමානය, කස්ස, කවරක්හුගේද!—

චන්දනසාරලිත්තා; සඳුන්හරින් ආලෙපකරනලද්දාවූ, නාරීගණා, දිව්‍ය ස්ත්‍රී සමූහයෝ, උභතො, ඇතුල පිට යන දෙ

තේ යක්ඛ පුට්ඨ තෙපි තස්සා—

බාරාණසියං නන්දියො නාමාසි උපාසකො
අමච්ඡරී දානපතී වදඤ්ඤූ,
තස්සායං ආකිණ්ණජනං විමානං
සූරියස්ස රංසිරිව ජොතමානං.

නාරිගණා චන්දනසාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති
තං දිස්සති සූරියසමානවණ්ණං
සො මොදති සග්ගපත්තො විමානෙති.

ආචික්ඛිංසු අථ රෙවතී—

---

නැත්ගි; විමානං, විමානය; උපසොභයන්ති, බබුළුවත්ද, සූරියසමානවණ්ණං, සූර්‍ය්‍යයාට බඳු වණ්ණ ඇත්තාවූ; තං, ඒ විමානය; දිස්සති, දක්නාලැබෙයි; සග්ගපත්තො, ස්වර්ගයටපැමිණියාවූ; කො, කවරෙක්තෙම; විමානෙ, විමානයෙහි; මොදති ඉති, සතුටුවේදැයි?—

තෙයක්ඛ, ඒ යක්ෂයෝ; පුච්ඡි, විචාළෝය; තෙපි, ඒ යක්ෂයෝ දෙදෙනද; තස්සං, ඇයට; (මෙසේ කීවාහුය)—

බාරාණසියං, බරණැස්නුවරෙහි; නන්දියො නාම, නන්දික නම්වූ, අමච්ඡරී, මසුරුනොවූ; දානපතී, දීමෙහි ස්වාමිවූ, වදඤ්ඤූ ප්‍රතිග්‍රාහකයන්ගේ පමණ දන්නාවූ; උපාසකො උපාසකයෙක්තෙම; ආසි, වූයේය; සූරියස්ස, සූර්‍ය්‍යයාගේ; රංසි ඉව, රශ්මියමෙන්; ජොතමානං, බබලන්නාවූ. ආකිණ්ණජනං, ගැවසීගත්තාලද ජනයා ඇති; එතං, මේ, විමානං, විමානය; කස්ස, කවරෙකුගේද?—

චන්දනසාරලිත්තා, සඳුන්හරින් අලෙපකරනලද්දාවූ; නාරීගණා. දිව්‍යස්ත්‍රී සමූහයෝ; උභතොවිමානං, විමානය ඇතුළපිට යනාදෙකැන්හි; උපසොභයන්ති, බබුලවද්ද; සූරියසමානවණ්ණං, සූර්‍ය්‍යයාට බඳු වණ්ණ ඇත්තාවූ; තං, ඒ විමානය; දිස්සති, දක්නාලැබෙයි; සග්ගපත්තො, ස්වර්ගයට පැමිණියාවූ; සො, ඒ නන්දිකඋපාසකතෙමේ; මොදති ඉති, සතුටුවේයයි—

ආචික්ඛිංසු, කීවාහුය; අථ, ඉක්බිත්තෙන්, රෙවති, රේවතී නොමේ; (මෙසේ කීවාය)—

නන්දිකස්සාහං භරියා
අගාරිනී සබ්බකුලස්ස ඉස්සරා
භත්තුවිමානෙ රමිස්සාමි දානාහං
න පත්ථෙ නිරයදස්සනායාති.

ආහ — එවං වදන්තිමෙව තං පගෙණ්හිවා ත්වං මා වා කිං තව පත්ථනායාති නිරයසම්පං නෙත්වා.

එසො තෙ නිරයො සුපාපධම්ම
පුඤ්ඤං තයා අකතං ජීවලොකෙ
නත්ථි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහබ්‍යතන්ති

ගාථං ආහංසු — එවං පන වත්වා තෙ වෙ යක්ඛා තත්ථෙව අන්තරධායිංසු, තං සදිසා පන වෙ නිරයපාලා සංසවකෙ නාම ගූථනිරයෙ පක්ඛිපිතුං ආකඩ්ඪන්තා ඤා පස්සිත්වා

---

අහං, මම; නන්දිකස්ස, නන්දිකයාගේ; අගාරිනී, ගෘහස්වාමිනිවූ; සබ්බකුලස්ස, සියලුකුලයට; ඉස්සරා, ඉසුරුමත්වූ; භරියා, භාර්‍ය්‍යාවෙමි; ඉදානි, දැන්; භත්තුවිමානෙ, ස්වාමියාගේ විමානයෙහි, රමිස්සාමි, ඇලෙන්නෙමි; නිරයදස්සනාය, නරකයදැක්මට, නපත්ථෙමීති, නොකැමැත්තෙම්යයි—

ආහ, කීවාය; —එවං, මෙසේ; වදන්තී එව, කියන්නීමවූ; තං, ඈ; ත්වං, තී; පගෙණ්හිවා, කැමතිවෙහිගෝ; මාවා, නොකැමැතිවෙහිගෝ; තව, තීගේ; පත්ථනාය, කැමැත්තේන්; කිං, ඉති, කවරප්‍රයෝජනදැයි, නිරයසම්පං, නරකසමීපයට; නෙත්වා, ගෙණගොස්—

සුපාපධම්ම, අතිශයින් ලාමකස්වභාවඇත්තිය; එසොනිරයො, මේනරකයතොම; තෙ; තීගේය; තයා, තිපියින්, ජීවලොකෙ, සත්වලොකයෙහි; පුඤ්ඤං, පිනක්; අකතං, නොකරනලද්දේය; මච්ඡරී, මසුරුවූ, රොසකො, (අනුන්ට) රෝස් ඉපදවීම්ඇත්තාවූ; පාපධම්මො, ලාමක ස්වභාවඇත්තේ, සග්ගූපගානං, ස්වර්ගයට පැමිණියවුන්ගේ, සහබ්‍යතං, එක්වීභාවය; නලභතීති, නොලබයියන—

ගාථං, ගාථාව; අහංසු, කීහුය—එවංපන, මෙසේවනාහි; වත්වා, කියා, තෙ වෙ යක්ඛා, ඒ යක්ෂයෝදෙදෙන, තත්ථෙව, එතැන්හිම; අන්තරධායිංසු. අතුරුදන්වූහුය; තංසදිසා,

කිංනු ගූථඤ්ච මුත්තඤ්ච-අසුචි පටිදිස්සති
දුග්ගන්ධං කිමිදං මීළ්හං-කිමෙතං උපවායතීති.

තං නිරයං පුච්ඡි.

එස සංසවකො නාම-ගම්භීරො සතපොරිසො
යත්ථ වස්සසහස්සානි-තුවං පච්චසි රෙවතෙති;—

තස්මිං කථිතෙ තස්ස අත්තනා නිබ්බත්තිහෙතුභූතං කම්මං පුච්ඡන්ති—

කිංනු කායෙන වාචාය-මනසා දුක්කටං කතං
කෙන සංසවකො ලද්ධො-ගම්භීරො සතපොරිසොති.

ආහ

---

ජීවමානවූ; මෙනිරයපාලාපන, නිරයපාලයෝ දෙදෙනෙක් වනාහි; සංසවකෙනාම, සංසවකනම්වූ; ගූථනිරයෙ, ගූථනරකයෙහි; පක්ඛිපිතුං, දමන්ට; ආකඩ්ඪන්තා; අදින්නාහු; සා, ඕතොමෝ; පස්සිත්වා, (ඒ නරකය) දැක—

කිංනු, කිමෙක්ද; ගූථඤ්ච, මලද, මුත්තඤ්ච, මූත්‍රද; (යන) අසුචි, අපවිත්‍ර; පතිදිස්සති, දක්නාලැබේද; ඉදංමීළ්හං, මේඅපවිත්‍රගූථය; කිං; කිමෙක්ද; එතං, මේ, කිං දුග්ගන්ධං, කවර දුර්ගන්ධයක්, උපවායතීති, හමාදැයි—

තංනිරයං, ඒනරකය; පුච්ඡි, විචාළිය;

රෙවතෙ, රෙවතිය, තුවං, තී, යත්ථ, යම්තැනෙක්හි; වස්සසහස්සානි, අවුරුදු දහස්ගණන්මුළුල්ලෙහි; පච්චයි, පැසෙන්නෙහිද; සතපොරිසො, සියගණන් පුරුෂප්‍රමාණවූ; ගම්භීරො, ගැඹුරුවූ; එසො, මේතෙම; සංසවකොනාම, සංසවකනම්වූ (නරකයවේසි)—

තස්මිං, එය; කථිතෙ, කීකල්හි; තස්ස, ඒහි; අත්තනො, තමාගේ; නිබ්බත්තිහෙතුභූතං. ඉපදීමටහෙතුවූ; කම්මං, කර්මය; පුච්ඡන්ති, විචාරන්නී—

කායෙන, කයින්ද, වාචාය, වචනයෙන්ද, මනසා, සිතින්ද, කිංනුදුක්කටං, කවරදුශ්චරිතයෙක්; කතං, කරනලද්දේද, කෙන, කවරක්කරණකොටගෙණ, සතපොරිසො, සියගණන්පුරුෂප්‍රමාණවූ; ගම්භීරො, ගැඹුරුවූ; සංසවකො, සංසවක

සමණෙ බ්‍රාහ්මණෙ වාපි-අඤ්ඤෙ වාපි වණිබ්බකෙ
මුසාවාදෙන වඤ්චෙසි-තං පාපං පකතං තයාති.

තස්සා තං කම්මං කාරෙත්වා පුන—

තෙන සංසවකො ලද්ධො-ගම්භීරෙ සතපොරිසො.
තත්‍ථ වස්සසහස්සානි-තුවං පච්චසි රෙවතෙති.

අහංපු—න කෙවලං තුය්හං ඉධ සංසවකලාභො එව අථඛො තත්‍ථ අනෙකානි වස්සසහස්සානි පච්චිත්වා උත්තිණ්ණාය ච හත්‍ථච්ඡෙදාදි ලාභොපීති දස්සෙතුං.

---

නම්නරකය; ලභොහූති, ලබනලද්දේදැයි—ආග, (යථොක්තප්‍රකාරයෙන්;) කිවාය—

තයා, තිවිසින්; සමණෙ, ශ්‍රමණයන්ද, බ්‍රාහ්මණෙවා අපි, බ්‍රාහ්මණයන්ද, අඤ්ඤෙ, අන්‍යවූ; වණිබ්බකෙවාඅපි; යාචකයන්ද; මුසාවාදෙන, බොරුකීමෙන්, වඤ්චෙසි, වඤ්චාකෙළෙහිද, තංපාපං, ඒපාපය; කතංහූති, කරනලද්දේයයි—

තංකම්මං, ඒකර්මය; තස්සා, ඈට, කාරෙත්වා, කියා; පුන, නැවත,

රෙවතෙ, රෙවතිය; තුවං, තී; සතපොරිසො, සියගණන් පුරුෂප්‍රමාණඇති; ගම්භීරෙ, ගැඹුරුවූ; සංසවකො, සංසවක නම්නරකය; තෙන; ඒ (අකුශලකර්මය) කාරණකොටගෙණ ලද්ධො, ලබනලද්දේය; තත්‍ථ, එහි, වස්සසහස්සානි, අවුරුදු දහස්ගණන් පච්චසිහූති, පැසෙන්නෙහියයි—

අහංපු, කීවාහුය,—ඉධ; මෙහි; තුය්හං, තිට; කෙවලං, තුදෙක්; සංසවකලාභොඑව, සංසවක නම්නරකය ලැබීම්පමණක්ම, න, නොවන්නේය, අථඛො, නැවතද; තත්‍ථ, එහි; අනෙකානිවස්සසහස්සානි, නොයෙක්අවුරුදු දහස්ගණන් මුලුල්ලෙහි; පච්චිත්වා, පැසී, උත්තිණ්ණාය ච, ගොඩනැගුනලද්දියගේද; හත්‍ථච්ඡෙදාදිලාභොපිහූති; අත්සිඳුම්ආදී ලාභයතෙමේදැයි; දස්සෙතුං, දක්වන්ට—

හත්‍ථෙපි, අත්ද; අථොඅපි, නැවතද; පාදෙ, පාදයන්ද; ඡින්දන්ති, කපත්; කණ්ණෙපි, කණ්ණයන්ද; අථොඅපි, නැවතද,

හත්ථෙපි ඡින්දන්ති අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්ති අථොපි නාසං
අථොපි කාකොලගණා සමෙච්ච
සංගම්ම ඛාදන්ති විප්ඵන්දමානන්ති.

තත්ථ ලද්ධබ්බ කාරණං ආහංසු—පුන සා මනුස්සලොකං පච්චාජාතාය යාචනාදිවසෙන තං තං විප්පලපි.

සාධු ඛො මං පටිනෙථ-කාහාමි කුසලං බහුං
දානෙන සමචරියාය--සඤ්ඤමෙන දමෙන ච
යං කත්වා සුඛිතා හොන්ති--න ච පච්ඡානුතප්පරෙති.

පුනපි යමපාලා—

පුරෙ තුවං පමජ්ජිත්වා--ඉදානි පරිදෙවසි
සයං කතානං කම්මානං--විපාකං අනුභොස්සසීති,

---

නාසං, නාසයද; ඡින්දන්ති, කපත්; අථොපි, නැවතද, කාකොල ගණා, කවුඩුසමූහයෝ, සමෙච්ච, එක්ව; සංගම්ම, රැස්ව; විප්ඵන්දමානං, වෙවුලනුලබන්නිය; ඛාදන්ති, කත්—•

තත්ථ, එහි; ලද්ධබ්බකාරණං, ලැබියයුතුකාරණයද; ආහංසු, කීවාහුය—පුන, නැවත; සා, ඒ ස්ත්‍රී තොමෝ; මනුස්සලොකං, මිනිස්ලොවට; පච්චාජාතාය, පසුවපැමිණීම පිණිස; යාචනාදිවසෙන, යාඥාදිවශයෙන්; තං තං, ඒ ඒ කාරණය, විප්පලපි, කීවාය—

මං, මා; පටිනෙථ, නැවත (මිනිස්ලොවට) පමුණුවවුනා ව; සාධුඛො, මැනවි; බහුං, බොහෝවූ; කුසලං, කුශලය, කාහාමි, කරන්නෙමි; යං, යම්කුශලයක්, කත්වා, කොට, සුඛිතා හොන්ති, සුවපත්වෙද්ද; පච්ඡා, පසුව, නච අනුතප්පරෙ, තැවීමක් නොවෙද්ද; (එබඳුවූ) දානෙන, දීමෙන්ද, සමචරියාය, දශකුශලයෙන්ද, සංයමෙන, කායවාක්සංයමයෙන්ද; දමෙනච, ඉන්ද්‍රියදමනයෙන්ද; බහුං, බොහෝවූ; කුසලං, කුශලය, කාහාමි ඉති, කරන්නෙමියයි (කීවාය)—

පුනපි, නැවතද; යමපාලා, නිරයපාලයෝ (මෙසේකීවාහුය)—

පුරෙ, පූර්වයෙහි; තුවං, තී; පමජ්ජිත්වා, ප්‍රමාදව; ඉදානි, දැන්; පරිදෙවසි, විලාපකියන්නෙහිය; සයංකතානං, තමාවිසි

ආහංසු--පුන සා ආහ.

කො දෙවලොකතො මනුස්සලොකං
ගන්ත්වාන පුට්ඨො මෙ එවං වදෙය්‍ය
නික්ඛිත්තදණ්ඩෙසු දදාථ දානං

අච්ඡාදනං සෙය්‍යවත්ථන්නපානං
නහි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහව්‍යතං.

සාහං නූන ඉතො ගන්ත්වා--යොනිං ලද්ධාන මානුසිං
වදඤ්ඤූ සීලසම්පන්නා--කාහාමි කුසලං බහුං
දානෙන සමචරියාය--සඤ්ඤමෙන දමෙන ච.

---

න්කරනලද්දවූ; කම්මානං, කර්මයන්ගේ, විපාකං, විපාකය; අනුභොස්සිඉති, අනුභවකරන්නෙමියයි—

ආහංසු, කිවාහුය;—පුන, නැවත; සා, ඕතොමෝ; ආහ, (මෙසේ) කීවාය—

දෙවලොකතො, දිව්‍යලොකයෙන්; කො, කවරෙක්තෙම; මනුස්සලොකං, මනුෂ්‍යලොකයට; ගන්ත්වාන, ගොස්; පුට්ඨො, (මාවිසින්) විචාරණලද්දේ; නික්ඛිත්තදණ්ඩෙසු, තබනලද දඬු
වම්ඇත්තවුන්ට; අච්ඡාදනං, හඳිනවස්ත්‍රද; සෙය්‍ය, සයනා
සනද; වත්ථ, වස්ත්‍රද, අන්නපානං, ආහාරපානද, (යන)
දානං, දානය; දදාථ, දෙන්නේද; රොසකො, අනුන්ට රොස්
උපදවන්නාවූ; පාපධම්මො, ලාමකස්වභාවඇත්තාවූ; මච්ඡරී,
මසුරුතෙම; සග්ගූපගානං, ස්වර්ගයට පැමිණියවුන්ගේ; සහව්‍ය
තං, එක්වීනාවය; නහිලභතිඉති, නොලබන්නේයයි; මෙ, මට;
එවංවදෙය්‍ය; මෙසේකියන්නේනම්—

සාඅහං, ඒමම, නූන, ඒකාන්තයෙන්; ඉතො, මෙයින්; ග
න්ත්වා, (උත්පත්තිවශයෙන්) ගොස්, මානුසිං යොනිං, මනු
ෂ්‍යයොනිය; ලද්ධාන, ලදින්, වදඤ්ඤූ, ප්‍රතිග්‍රාහකයන්ගේ වච
නදැනගන්නෙමි; සීලසම්පන්නා, ශීලයෙන් සම්පූර්ණවනලද්
දෙමි; දානෙන, දන්දීමෙන්ද; සමචරියාය, දශකුශලකර්මයෙහි
හැසිරීමෙන්ද; සංයමෙන, කායවාක් සංයමයෙන්ද; දමෙනච,
ඉන්ද්‍රියදමනයෙන්ද; බහුං, බොහෝවූ, කුසලං, කුශලය; කා
හාමි, කරන්නේමි—

ආරාමානි ච රොපිස්සං-දුග්ගෙ සංකමනානි ච
පපඤ්ච උදපානඤ්ච-විප්පසන්නෙන චෙතසා.

චාතුද්දසී පඤ්චදසී—යා ච පක්ඛස්ස අට්ඨමී
පාටිහාරියපක්ඛඤ්ච--අට්ඨඞ්ගසුසමාගතං.

උපොසථං උපවසිස්සං-සදා සීලෙසු සංවුතා
නච දානෙ පමජ්ජිස්සං--සාමං දිට්ඨමිදං මයානි.

ඉච්චෙවං විප්පලපන්තිං-ඵන්දමානං තතො තතො
ඛිපිංසු නිරයෙ ඝොරෙ--උද්ධපාදං අවංසිරන්ති.

ඉදං සඞ්ගීතිකාරකානං වචනං, පුන සා.

---

විප්පසන්නෙන චෙතසා; ප්‍රසන්නවූසිතින්; ආරාමානිච, ආරාමයන්ද; රොපිස්සං, රොපනයකරන්නෙමි; දුග්ගෙ, නපුරුමාර්ගයෙහි; සංකමනානිච, ගේදඬු හා මාර්ගයන්ද; (කරන්නෙමි) පපඤ්ච, පැන්මඬුද; උදපානඤ්ච ළිඳද; (කරන්නෙමි—

පක්ඛස්ස, පක්ෂයාගේ; යාචඅට්ඨමී, යම්අෂ්ටමීපොහොයක් ඇද්ද; චාතුද්දසී, චාතුර්දශීපොහොයක්ඇද්ද; පංචදසී, පඤ්චදසී පොහොයක්ඇද්ද; පාටිහාරිය පක්ඛඤ්ච, ප්‍රාතිහාරිය පක්ෂයක්ඇද්ද; (එසිත්) සුසමාගතං, මනාකොටයුක්තවූ; අට්ඨඞ්ගං, අංගඅටක් ඇත්තාවූ; උපොසථං, උපොෂථයට; උපවසිස්සං, එළඹ වාසයකරන්නෙමි; සදා, සැමකල්හි; සීලෙසු, නිත්‍යශීලයන්හි; සංවුතා, සංවරවනලද්දෙමි; දානෙ, දන්දීමෙහි, නචපමජ්ජිස්සං, ප්‍රමාදනොවන්නෙමි; ඉදං, මේ නරකය; මයා; මාවිසින්; සාමං, සවකීයඇසින්; දිට්ඨංඉති, දක්නාලද්දේයි—

ඉතිඑවං, මේ උක්තප්‍රකාරයෙන්; ඵන්දමානං, වෙව්ලන්නීවූ; විප්පලපන්තිංඑව, විලාපකියන්නියම; ඝොරෙ; දරුණුවූ; නිරයෙ, නරකයෙහි; තතො තතො, ඒ ඒ දිශාවෙන්; උද්ධපාදං, පා උඩුකුරුකොට; අවංසිරං, හිසයටිකුරුකොට, ඛිපිංසුඉති, දැමූවාහුයි—

ඉදං, මෙය; සංගීතිකාරකානං, සංගායනාකළ තෙරුන්වහන්සේලාගේ; වචනං, කීමයි; පුන, නැවත; සා, ඕතොමෝ—

අහං පුරෙ මච්ඡරී අහොසිං
පරිභාසිකා සමණබ්‍රාහ්මණානං
විතථෙන ච සාමිකං වඤ්චයිත්වා
පච්චාහං නිරයෙ ඝොරරූපෙ පතී.

ඔසානගාථමාහ—තත්‍ථ අහං පුරෙ මච්ඡරිනී අයං ගාථා නිරයෙ නිබ්බත්තාය වුත්තා ඉතරා අනිබ්බත්තාය එවාති වෙදිතබ්බා—භික්ඛූ රෙවතියා යක්ඛෙහි ගහෙත්වා නීතභාවං සත්‍ථු ආරොචෙසුං, තං සුත්වා භගවා ආදිතො පට්ඨාය ඉමං පවත්තිං කථෙත්වා උපරි විත්‍ථාරෙන ධම්මං දෙසෙසි, දෙසනාපරියොසානෙ බහූ සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති—කාමදෙවතං රෙවතියා පටිබද්ධාය කථාය යෙභුය්‍යභාවතො රෙවතීවිමානන්ති වොහරීයති.

## රෙවතීවිමානවණ්ණනා—15.

---

පුරෙ, පූර්වයෙහි; අහං, මම; මච්ඡරීඅහොසිං, මසුරි වූයෙමි; සමණබ්‍රාහ්මණානං, ශ්‍රමණබ්‍රාහ්මණයන්ට; පරිභාසිකා, පරිභව කරන්නීයක්වූයෙමි; අහං, මම; සාමිකං, ස්වාමියා; විතථෙනච, බොරුවෙන්ද; වඤ්චයිත්වා, වංචාකොට; ඝොරරූපෙ දරුණුස්වභාවඇති; නිරයෙ, නරකයෙහි, පච්චං ඉති, පැසෙමි යයි—

ඔසානගාථං, අවසානගාථාව, ආහ, කීවාය—තත්‍ථ, එහි; අහං, මම, පුරෙ, පූර්වයෙහි; මච්ඡරීඉති, මසුරියක් වූ යෙමි ඉනාආදිවූ; අයංගාථා, මේගාථාව; නිරයෙ, නරකයෙහි; නිබ්බත්තාය; උපන්නියවිසින්, වුත්තා, කියනලද්දිය; ඉතරා, අනික් ගාථාවෙයි; අනිබ්බත්තාය එවඉති, නූපදිනලද්දියවිසින් මකියනලද්දියයි; වෙදිතබ්බං, දතයුත්තාංහුය; භික්ඛූ, භික්ෂූහු; යක්ඛෙහි, යක්ෂයන්විසින්, රෙවතියා, රෙවතිය; ගහෙත්වා, ගෙණ, නීතභාවං, (නරකයට) පැමිණෙවූබව; සත්‍ථු, ශාස්තෘන්වහන්සේට; ආරොචෙසුං, කීවාහුය; තං, එය; සුත්වා, අසා; භගවා භාග්‍යවතුන්වහන්සේ; ආදිතොපට්ඨාය, මුලපටන්; ඉමංපවත්තිං, මේපුවත්තිය; කථෙත්වා, දෙශනාකොට, උපරි, මත්තෙහි, විත්‍ථාරෙන, විස්තරවශයෙන්; ධම්මංදෙසෙසි; ධර්මදෙ

සත්තතන්තිං සුමධුරන්ති ගුත්තිලවිමානං—කා උප්පත්ති? භගවති රාජගහෙ විහරන්තෙ එකදිවසං ආයස්මතො මහාමොග්ගල්ලානස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො අහොසි එතරහි ඛො මනුස්සා වත්ථුත්තයපටිබද්ධාසය සම්පන්නියා තානි තානි පුඤ්ඤානි කත්වා දෙවලොකෙ නිබ්බත්තා උළාරසම්පත්තිං පච්චනුභොන්ති යන්නූනාහං දෙ

---

ශනාකලසේක; දෙශනාපරියොසානෙ, දෙශනාවගේඅවසානයෙහි; බහූ, බොහෝදෙන; සොතාපත්තිඵලාදීනි, සෝවාන්ඵලාදියට; පාපුණිංසූති, පැමිණියාහුයි—එතං, මෙය; කාමංච, එකාන්තයෙන්ම; රෙවතියා පටිබද්ධ, රේවතියපිළිබඳවූ; කථාය; කථාවගේ; යෙභුය්‍යභාවතො, බොහෝබැවින්; රෙවතී විමානන්ති, රේවතීවිමානයයි; වොහරීයති, ව්‍යවහාර කරනු ලැබේ—

## රෙවතීවිමාන වණ්ණනාවයි

සත්තතන්තිං, සුමධුරංභූති, සත්තතන්තිං සුමධුරංයන අදිය; ගුත්තිලවිමානං, ගුත්තිලවිමානයයි; උප්පත්ති, උත්පත්තියකො මෝ; කා, කවරක්වන්නීද? භගවති, භාග්‍යවතුන්වහන්සේ; රාජගහෙ, රජගහනුවරසමීපයෙහි, විහරන්තෙ, වැඩවසනකල්හි, එකදිවසං, එකදවසක්, රහොගතස්ස, රහසිව ගියාවූ; පටිසල්ලීනස්ස; විවෙකභාවයඇත්තාවූ; ආයස්මතො, ආයුෂ්මත්වූ; මහාමොග්ගල්ලානස්ස, මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේගේ; චෙතසො, සිතට; එවං, මෙසේ, පරිවිතක්කො; පරිවිතර්කයෙක්තෙම, අහොසි, ඇතිවූයේය; එතරහිඛො, මේ කාලයෙහිවනාහි; මනුස්සා, මනුෂ්‍යයෝ; වත්ථුත්තයපටිබද්ධාසය සම්පන්නියා, වස්තුත්‍රයෙහි අධ්‍යාශය සම්පත්තියෙන් යුක්තබැවින්, තානි තානි පුඤ්ඤානි, ඒ ඒ පින්; කත්වා, කොට; දෙවලොකෙ, දිව්‍යලොකයෙහි, උප්පන්නා, උපන්නාහු; උළාරසම්පත්තිං, මහත්සම්පත්තිය, පච්චනුභොන්ති, අනුභවකෙරෙත්; අහං, මම; දෙවලොකෙ, දෙව්ලොවෙහි; චාරිකං, චාරිකා වෙනි; චරන්තො, හැසිරෙන්නෙ; තෙහි, ඒදෙවියන් විසින්; යථාචිතං, රැස්කරනලදපරිදි; පුඤ්ඤං, කුශලයද, යථාධිගතං

වලොකෙ චාරිකං චරන්තො තෙහි යථූපචිතං පුඤ්ඤං. යථාධි ගතඤ්ච පුඤ්ඤඵලං කථාපෙත්වා තමත්ථං භගවතො ආරොචෙය්‍යං, එවං මෙ සත්ථා ගගනතලෙ පුණ්ණචන්දං උට්ඨාපෙන්තො විය මනුස්සානං කම්මඵලං පච්චක්ඛතො දස්සෙන්තො අප්පකානම්පි කාරානං රතනත්තයගතානං සද්ධාය වසෙන උළාරඵලතං විභාවෙන්තො තං තං විමානවත්ථුං අට්ඨුප්පත්තිං කත්වා මහන්තං ධම්මදෙසනං පවත්තිස්සති, සා හොති බහුජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

සො ආසනා උට්ඨහිත්වා භගවන්තං උපසඞ්කමිත්වා අභිවාදෙත්වා එකමන්තං නිසින්නො අත්තනො අධිප්පායං ආරොචෙත්වා භගවතා අනුඤ්ඤාතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා ඉද්ධිබලෙන තඞ්ඛණඤ්ඤෙව තාවතිංසභවනං ගන්ත්වා තත්ථ පටිපාටියා සිනෙරු ජනනිංසාය

---

පැමිණෙනලද පරිදි; පුඤ්ඤඵලඤ්ච, කුශලඵලයද; කථාපෙත්වා, කියවා; තමත්ථං, ඒ අර්ථය; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; ආරොචෙය්‍යං, කියන්නෙම්නම්; යන්නූන, ඉතායෙහෙක; එවං, එසේ, (කීකල්හි) මෙ, මට; සත්ථා, ශාස්තෘන්වහන්සේ; ගගනතලෙ, අහස්තලයෙහි; පුණ්ණචන්දං, පූර්ණචන්ද්‍රයා; උට්ඨාපෙන්තොවිය; නගාසිටුවන්නාක්මෙන්; මනුස්සානං මිනිසුන්ගේ; කම්මඵලං, කර්මඵලය; පච්චක්ඛතො, ප්‍රත්‍යක්ෂයෙන්; දස්සෙන්තො, දක්වමින්; අප්පකානං අපි, ස්වල්පවූද; කාරානං, සත්කාරයන්ගේ; රතනත්තයගතානං; තුණුරුවන් කෙරෙහි පැමිණියාවූ; සද්ධාවසෙන, ශ්‍රද්ධාවගේවශයෙන්; උළාරඵලතං, මහත්ඵලබව; විභාවෙන්තො, ප්‍රකාශකරන්නේ; තං තං, විමානවත්ථුං, ඒ ඒ විමානවස්තුව; අට්ඨුප්පත්තිං කත්වා අර්ථොත්පත්තිය කොට; මහන්තං ධම්මදෙසනං, මහත්වූ ධර්මදෙශනාවක්; පවත්තිස්සති, පවත්වන්නේය; සා, ඒධර්මදෙශනා, තොමෝ; බහුජනස්ස, බොහෝ ජනයාහටද; දෙවමනුස්සානං, දිව්‍යමනුෂ්‍යයන්ටද; අත්ථාය, ප්‍රයොජනපිණිස; හිතාය, හිතපිණිස; සුඛාය, සැපපිණිස; හොතීති, වේයයි—

සො, උන්වහන්සේ, ආසනා, ආසනයෙන්; උට්ඨහිත්වා, නැගිසිට; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේකරා; උපසංකමිත්වා, එළඹ; අභිවාදෙත්වා, මනාකොටවැඳ; එකමන්තං, එකත්පසෙක; නිසින්නො, උන්නේ, අත්තනො අධිප්පායං, තමන්

විමානෙසු ජතතිංස දෙවට්ඨානෙ පච්චෙකං අච්ඡරාසහස්සපරි වාරා මහතිං දිබ්බසම්පත්තිං අනුභවන්තියො දිස්වා තානි පුබ්බෙ කතපුඤ්ඤකම්මානි ඉමාහි ගාථාහි පටිපාටියා පුච්ඡි.

අභික්කන්තෙන වණ්ණෙන-යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්තී දිසා සබ්බා-ඔසධී විය තාරකා.
කෙන තෙතාදිසො වණ්ණො-කෙන තෙ ඉධ මිජ්ඣති
උප්පජ්ජන්ති ච තෙ භොගා-යෙ කෙචි මනසො පියා.

---

වහන්සේගේ අභිප්‍රාය; ආරොචෙත්වා, කියා, භගවතා අනුඤ්ඤාතො; භාග්‍යවතුන්වහන්සේසින් අවසරදෙනලද්දේ; ආසනා; ආසනයෙන්; උට්ඨාය, නැගිට; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනාකොටවැඳ; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණකොට; ඉද්ධිබලෙන, ඍද්ධිබලයෙන්; තාවදෙව, එකෙණෙහිම; තාවතිංසභවනං, තව්තිසාභවනයට; ගන්ත්වා, වැඩ; තත්ථ, එහි; පටිපාටියා, පිළිවෙළින්, ඨිතෙසු; පිහිටියාවූ; ජතතිංසවිමානෙසු, විමන් සතිසක්හී; පච්චෙකං, වෙනවෙනම; අච්ඡරාසහස්ස පරිවාරා, දිව්‍යප්සරාවන් දහස දහස පිරිවර කොටඇතිව, මහතිං දිබ්බසම්පත්තිං, මහත්දිව්‍යසම්පත්තිය; අනුභවන්තියො, අනුභවකරන්නිවූ; ජතති.ස දෙවට්ඨානෙ, දිව්‍යදුහිතෘන් සතිසක්; දිස්වා, දැක, තානි, ඔවුන්විසින්; පුබ්බෙ, පූර්වයෙහි; කතපුඤ්ඤකම්මං, කරනලද පුණ්‍යකර්මය; ඉමාහිගාථාහි, මේගාථාවලින්; පටිපාටියා, පිළිවෙළින්; පුච්ඡි, විචාළසේක—

දෙවතෙ, දිව්‍යදුහිතෘව; යාත්වං, යම්බඳුවූ තී, ඔසධීතාරකාවිය, ඔෂධීතාරකාවමෙන්; සබ්බදිසා, සියලුදිශාවන්; ඔභාසෙන්තී, බබුලුවන්නී, අභික්කන්තෙන වණ්ණෙන, මහත්ශරීරවර්ණයෙන්, තිට්ඨසි, සිටින්නෙහිය තෙ, තිගේ; කෙන, කවරකුශලකර්මයකින්; එතාදිසො, මෙබඳුවූ; වණ්ණො, ශරීරවර්ණයක්ඇතිවූයේද; කෙන, කවර කුශලකර්මයකින්; ඉධ, මෙහි; තේ, තිගේ සම්පත්තිය, ඉජ්ඣති, සමෘද්ධවේද; තෙ, තිගේ, මනසො, සිතට; පියා, ප්‍රියවූ; යෙකෙචිභොගා, යම්කිසිසම්පත්තිහු; උප්පජ්ජන්තිච, (කුමකින්) උපදිද—

පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

සා දෙවතා අත්තමනා
මොග්ගල්ලානෙන පුච්ඡිතා
පඤ්හං පුට්ඨා වියාකාසි
යස්ස කම්මස්සිදං ඵලං.

චතුරුත්තමදායිකා නාරි
පවරා හොති නරෙසු නාරිසු
එවං පියරූපදායිකා මනාපං
දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං.

---

මහානුභාව, මහත්ආනුභාව ඇත්තාවූ; දෙව, දෙවියනි; තං, තී; පුච්ඡාමි, විචාරමි; මනුස්සභූතා, මනුෂ්‍යවූවා; කිං පුඤ්ඤං, කවරපිනක්, අකාසී, කළාද; තෙ, තීගේ, වණ්ණො ච, ශරීරවර්ණයතෙමේද; සබ්බදිසා, සියලුදිශාවන්; පභාසති, එළියකෙරේද; එවං, මෙසේ; කෙන, කවරකුශලකර්මයකින්; ජලිතානුභාවා, දීලියෙන ආනුභාවඇත්තී; අසිඉති, වෙහිදැයි (විචාළසේක)—

මොග්ගල්ලානෙන (මහා) මෞද්ගල්‍යායනස්ථවිරයන්වහන්සේවිසින්; පුච්ඡිතා, විචාරනලද්දාවූ; සා දෙවතා, ඒ දෙවතාතොමෝ; අත්තමනා, සතුටුවූවා, යස්ස කම්මස්ස, යම්කුශලකර්මයක්හුගේ; ඉදං ඵලං, මේවිපාකයයි; පඤ්හං පුට්ඨා ප්‍රශ්නවිචාරණලද්දී; වියාකාසි, ප්‍රකාශකළාද—

චතුරුත්තමදායිකා; උතුම්වස්තුදුන්නාවූ; නාරී, ස්ත්‍රීතොමෝ; නරෙසු, පුරුෂයන්අතුරෙහිද; නාරිසු, ස්ත්‍රීන් අතුරෙහිද; පවරා හොති, උතුම්වේයි, එවං, මෙසේම; පියරූපදායිකා, ප්‍රියස්වභාව ඇති දෙයදෙන්නාවූ; සා, ඕතොමෝ; දිබ්බං ඨානං, දිව්‍යස්ථානයට; උපෙච්ච, පැමිණ; මනාපං, මනවඩනදෙය, ලභතෙ; ලබයි—

තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාමවණ්ණිනීහමස්මි
අච්ඡරාසහස්සානං පවරා
පස්ස පුඤ්ඤානං විපාකං.

තෙන මෙ තාදිසො වණ්ණො
තෙන මෙ ඉධ මිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා
යෙ කෙචි මනසො පියා.

තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

යථා ච එත්ථ එවං උපරි සබ්බවිමානෙසු විත්ථාරෙතබ්බං

---

තස්සාමෙ, ඒමාගේ; විමානං, විමානය; පස්ස, බැලුවමැනව; අහං, මම; අච්ඡරාසහස්සානං, දිව්‍යාප්සරාවන්දහසකට; පවරා; උතුම්වූ, කාමවණ්ණිනී; කාමයෙන්වර්ණනීයවූ; අච්ඡරා අස්මි, දිව්‍යාප්සරාවූයෙමි; පුඤ්ඤානං, පුණ්‍යයන්ගේ; විපාකං, විපාකය; පස්ස, බැලූවමැනව—

තෙන, ඒකරණකොටගෙණ; මෙ, මාගේ; එතාදිසො, මෙබඳුවූ, වණ්ණො, වර්ණයක්ඇතිවූයේය; තෙන, ඒකරණකොටගෙණ; මෙ, මාගේ; මනසො, සිතට; පියා, ප්‍රියවූ; යෙකෙචි භොගා, යම්කිසි සම්පත්තීහු, උප්පජ්ජන්තිච, උපදිද්ද; (එය) මෙ, මට; ඉධ, මෙහි; ඉජ්ඣති, සමෘඬවෙයි—

තෙන, එකාරණකොටගෙණ, මෙ, මාගේ, වණ්ණොච, ශරීරවර්ණයද; සබ්බදිසා, සියලුදිශාවන්; පභාසති, බබුලුව ද; එවං, එබඳුවූ; ජලිතානුභාවා අග්නි ඉගී, දිලිසෙනාලද අනුභාවඇතිවූයෙම්හි—

එත්ථ, මෙහි, යථාච, යම්සේද; එවං, එසේ; උපරි, මත්තෙහි; සබ්බවිමානෙසු, සියලුවිමානයන්හි; විත්ථාරෙතබ්බං, විස්තරකටයුතුයි—

අභික්කන්තෙන වණ්ණෙන-පෙ-
ඔසධී විය තාරකා
කෙන තෙ තාදිසො වණ්ණො — පෙ —
සබ්බදිසා පභාසතීති
සා දෙවතා අත්තමනා — පෙ —
යස්ස කම්මස්සිදං ඵලං.

පුප්ඵුත්තමදායිකා නාරී
පවරා හොති නරෙසු නාරිසු
එවං පියරූපදායිකා මනාපං
දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං

තස්සා මෙ පස්ස විමානං — පෙ —
සබ්බදිසා පභාසතීති.

ගන්ධුත්තමදායිකා නාරී — පෙ —
ඵලුත්තමදායිකා නාරී — පෙ —
රසුත්තමදායිකා නාරී — පෙ —

---

අභික්කන්තෙන වණ්ණෙන, විශිෂ්ට ශරීරවර්ණයෙන් -පෙ— තෙ, තීගේ; කෙන, කවරණම්යක් කරණකොටගෙණ; ඔසධී තාරකාවිය; ඔසධිතාරකාවමෙන්; එතාදිසොවණ්ණො මෙබඳු වර්ණයෙක්තෙම—පෙ—සබ්බදිසා පභාසතීති; (සියලුදිශාවන්) එළියකෙරේදැයි; සාදෙවතා, එදෙවතාතොමෝ; අත්තමනා, සතුටුසිත් ඇතිව—පෙ—ඉදංඵලං, මේවිපාකය; යස්සකම්මස්ස; යම්කුශලකර්මයක්හුගේද—

පුප්ඵුත්තමදායිකා, උතුම් මල්දුන් තාවූ; නාරී, ස්ත්‍රීතොමෝ; නරෙසු, පුරුෂයන් අතුරෙහිද; නාරිසු, ස්ත්‍රීන්අතුරෙහිද, පවරාහොති, උතුම්වෙයි; එවං, එසේ; පියරූපදායිකා, ප්‍රියස්වභාව ඇතිදෙය දෙන්නාවූ; සා, ඕතොමෝ; දිබ්බංඨානං, දිව්‍යස්ථානයට; උපෙච්ච, පැමිණ; මනාපං, මනවඩනදෙය; ලභතෙ, ලබයි—

තස්සාමෙ, ඒමාගේ, විමානං, විමානය; පස්ස, බැලුවමැනව, —පෙ—සබ්බදිසා, සියලුදිශාවන්; පභාසතීති; එළියකෙරේයයි—

ගන්ධුත්තමදායිකා, උතුම්සුවඳදුන්නාවූ; නාරී, ස්ත්‍රීතොමෝ—පෙ-ඵලුත්තමදායිකා, උතුම් ඵලයන් දුන්නාවූ; නාරී, ස්ත්‍රී

ගන්ධපඤ්චඞ්ගුලිකං අහං අදාසිං
කස්සපස්ස භගවතො ථූපම්හි
භික්ඛූ චාහං භික්ඛුනියො ච
අද්දසාසිං පථං පටිපන්නෙ.

තෙසාහං ධම්මං සුත්වාන
එකූපොසථං උපවසිස්සං
උදකත්ථිකස්ස උදකමදාසිං
භික්ඛුනො චිත්තෙන විප්පසන්නෙන;.

සස්සුචාහං සසුරෙ
චණ්ඩිකෙ කොධනෙ ච
ඵරුසෙ ච අනුස්සුයිකා
උපට්ඨාසිං අප්පමත්තා.

සකෙන සීලෙන පරකම්මකාරී
අහොසිං අතන්දිතා දාසී
අකොධනා අනතිමානී
සංවිභාගී සකස්ස භාගස්ස.

---

තොගෙමේ—පෙ—රසුත්තම්දායිකා, උතුම් රසඳුන්නාවූ; නාරී, ස්ත්‍රී
තොගෙමේ-පෙ—කස්සපස්සභගවතො, කාශ්‍යප භාග්‍යවතුන්වහන්
සේගේ, ථූපම්හි, චෛත්‍යයෙහි; (චෛත්‍යරට) ගන්ධපඤ්චඞ්ගුලි
කං, සුවඳ පසඟුලක්; අහං, මම, අදාසිං, දුනිමි—පෙ—පථං;
මාර්ගයට, පටිපන්නෙ, පිළිපන්නාවූ; භික්ඛූච; භික්ෂූන්ද; භික්ඛු
නියොච, භික්ෂුණීන්ද; අහං, මම; අද්දසාසිං. දුටුයෙමි; අහං
මම, තෙසං, ඔවුන්ගේ; (සමීපයෙන්) ධම්මං; ධර්ම; සුත්වාන;
අසා; එකූපොසථං, එකපොහොයක්; උපවසිස්සං, පෙහෙවි
ස්විසුයෙමි,—පෙ—උදකත්ථිකස්ස; දියකැමැතිවූ, භික්ඛුනො, භි
ක්ෂුවක්හට; විප්පසන්නෙන චිත්තෙන, ප්‍රසන්නවූසිතින්, උදකං,
ජලය; අදාසිං; දුනිමි;—පෙ—අහං, මම; චණ්ඩිකෙ, අන්‍යාය
යෙන් චණ්ඩවූද; කොධනෙච, ක්‍රොධසිත්ඇත්තාවූද; ඵරුසෙච,ඵරු
ෂවූද; සස්සුච, නැන්දණියන්ද, සසුරෙ; මයිලන්ද; අනුස්සුයිකා,
ඊර්ෂ්‍යානැත්තෙමි; අප්පමත්තා, ප්‍රමාදනොවූයෙමි; උපට්ඨාසිං, උප
ස්ථානකෙළෙම්—පෙ—සකෙනසීලෙන, ස්වකීය ස්වභාවයෙන්;
පරකම්මකාරී, අනුන්ගේ කර්මාන්තකරන්නිවූ; අත්ථෙන, ප්‍රයො
ජනයකරණකොටගෙණ; අතන්දිතා, අලසනුවූ, අකොධ

ඛීරොදනං අහමදාසිං
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස
තස්ස මෙ පස්ස විමානං—පෙ—
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති

ඵාණිතකං අහමදාසිං—පෙ—
උච්ඡුඛණ්ඩිකං අහමදාසිං—පෙ—
තිම්බරුසකං අහමදාසිං—පෙ—
කක්කාරිකං අහමදාසිං—පෙ—

එළාලුකං අහමදාසිං—පෙ—
වල්ලිඵලං අහමදාසිං—පෙ—
ඵාරුසකං අහමදාසිං—පෙ—
හත්ථප්පතාපකං අහමදාසිං—පෙ—

---

නා, ක්‍රොධනැත්තිවූ; අනතිමානී, අධිකමානනැත්තිවූ; සකස්ස භාගස්සසංවිභාගී, ස්වකීයකොටස බෙදන්නිවූ; දැයිඅහොසිං, දැසිවූයෙමි—පෙ-පිණ්ඩාය, පිඩුපිණිස; චරන්තස්ස, හැසිරෙන්නාවූ; භික්ඛුනො, භික්ෂුවක්හට; ඛීරොදනං, කිරිබතක්; අහං, මම; අදාසිං, දුනිමි; තස්සමෙ, ඒමාගේ; විමානං, විමානය; පස්ස; බැලුවමැනව—පෙ—මෙ, මාගේ; වණ්ණොච, වර්ණයතෙමේද සබ්බදිසා, සියලුදිශාවන්; පභාසති ඉති, බබුලුවායයි—

අහං, මම, ඵාණිතකං, උක්සකුරුපිඩක්, අදාසිං දුනිමි; පෙ—අහං, මම, උච්ඡුඛණ්ඩිකං, උක්දඬුකැබැල්ලක්, අදාසිං, දුනිමි;—පෙ—අහං, මම, තිම්බරුසකං, තිඹිරිඵලයක්; අදාසිං, දුනිමි—පෙ—අහං, මම; කක්කාරිකං, කැකිරිගෙඩියක්; අදාසිං, දුනිමි;—පෙ—අහං, මම; එළාළුකං, මහකැකිරිගෙඩියක්; අදාසිං, දුනිමි;—පෙ—අහං, මම; වල්ලීඵලං, කොමඩුගෙඩියක්, අදාසිං, දුනිමි;—පෙ—අහං, මම; ඵාරුසකං, බොරලුදමනක්, අදාසිං, දුනිමි;—පෙ—හත්ථප්පතාපකං, මතැඹුබිනම් ගිනිකබලක්; අහං, මම, අදාසිං, දුනිමි;—පෙ—අහං, මම; අංගාරකපල්ලං, අඟුරු කබලක්; අදාසිං, දුනිමි—

අඞ්ගාරකපල්ලං අහම්දසිං—පෙ—
සාකමුට්ඨිං අහම්දසිං—පෙ—
භික්ඛුනො පථං පටිපන්නස්ස—පෙ—
හත්ථුප්පජ්ජකමුට්ඨිං අහම්දසිං—පෙ—

මූලකං අහම්දසිං—පෙ—
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස—පෙ—
නිම්බපණ්ණමුට්ඨිං අහම්දසිං—පෙ—
අම්බිලකඤ්ජිකං අහම්දසිං—පෙ—

දෙණ්ණිතිම්මරජ්ජනිං අහම්දසිං—පෙ—
කායබන්ධනං අහම්දසිං—පෙ—
අංසබන්ධනං අහම්දසිං—පෙ—
අයොගපට්ටං අහම්දසිං—පෙ—

විධූපනං අහම්දසිං—පෙ—
තාලවණ්ටං අහම්දසිං—පෙ—
මොරහත්ථං අහම්දසිං—පෙ—
ඡත්තං අහම්දසිං—පෙ—

---

අහං, මම; පථං, මාර්ගයෙහි; පටිපන්නස්ස; පිළිපන්නාවූ; භික්ඛුනො, භික්ෂුවක්හට; සාකමුට්ඨිං, පලාමිටක්; අදසිං, දුටිමි; පෙ—අහං, මම; හත්ථුප්පජ්ජිකමුට්ඨිං, මල්මිටක්, අදසිං, දුටිමි; පෙ—අහං, මම; පිණ්ඩාය, පිඬුපිණිස; චරන්තස්ස, හැසිරෙන්නාවූ; භික්ඛුනො, භික්ෂුක්වක්හට; මූලකං, මුලපලාවක්; අදසිං, දුටිමි,—පෙ—අහං, මම, නිම්බපණ්ණමුට්ඨිං, කොහොඹකොළමිටක්; අදසිං, දුටිමි;—පෙ—අහං, මම; අම්බිලකඤ්ජිකං, ඇඹුල්කැඳක්; අදසිං, දුටිමි;—පෙ—දෙණ්ණිතිම්මරජ්ජනිං, තල්සහිත තලමුරුවටක්, අහං, මම; අදසිං, දුටිමි—පෙ—කායබන්ධනං, පටියක්; අහං, මම; අදසිං, දුටිමි;—පෙ—අංසබන්ධනං, අංසකඩයක්; අහං, මම; අදසිං, දුටිමි—පෙ—* අයොගපත්තං, කළුලොහපාත්‍රයක්; අහං, මම; අදසිං, දුටිමි,—පෙ—විධූපනං, (සතරැස්) විජිනියක්. අහං, මම; අදසිං, දුටිමි;—පෙ—තාලවණ්ටං, තල්පතින්කළ මණ්ඩලවිජිනියක්; අහං, මම; අදසිං; දුටිමි,—පෙ—මොරහත්ථං, මොණරපිලෙන්කළ මකසවිජිනිය

---

* අයොග පට්ටං

උපාහනං අහමදාසිං—පෙ—
පූවං අහමදාසිං—පෙ—
මෝදකං අහමදාසිං—පෙ—
සක්ඛලිං අහමදාසිං—පෙ—
භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස—පෙ—

තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාමවණ්ණිනීහමස්මි
අච්ඡරාසහස්සානං පවරා
පස්ස පුඤ්ඤානං විපාකං

තෙන මෙ තාදිසො වණ්ණො-තෙන මෙ ඉධමිජ්ඣති
උප්පජ්ජන්ති ච මෙ භොගා-යෙ කෙචි මනසො පියා.

තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතීති.

---

ක්; අහං, මම, අදාසිං, දුනිමි;—පෙ—ඡත්තං, ඡත්‍රයක්; අහං, මම; අදාසිං, දුනිමි;—පෙ—උපාහනං, වහන්සගලක්; අහං, මම, අදාසිං, දුනිමි;—පෙ—පූවං, පූපයක්; අහං, මම; අදාසිං, දුනිමි;—පෙ--මෝදකං, එනම් ඛාද්‍යවිශෙෂයක්; අදාසිං, දුනිමි;—පෙ—පිණ්ඩාය, පිඬුපිණිස; චරන්තස්ස, හැසිරෙන්නාවූ; භික්ඛුනො, භික්ෂුවක්හට; සක්ඛලිං, ලාඑවක්; අහං, මම; අදාසිං, දුනිමි;—පෙ—තස්සාමෙ, ඒමාගේ, විමානං, විමානය; පස්ස බැලුවමැනව, අහං, මම; අච්ඡරාසහස්සානං, දිව්‍යප්සරාවන් දහසකට, පවරා, උතුම්වූ; කාමවණ්ණිනී, කාමයෙන්වර්ණනීය වූ; අච්ඡරාඅස්මි, දිව්‍යාප්සරාවූයෙමි; පුඤ්ඤානං, පුණ්‍යයන්ගේ; විපාකං, විපාකය; පස්ස, බැලුවමැනව;—

තෙන, එකුශලයකරණකොටගෙණ; මෙ, මාගේ; එතාදිසො, මෙබඳුවූ; වණ්ණො, ශරීරවර්ණයඇත්තූයේය; මෙ මාගේ; මනසො, සිතට; පියා, ප්‍රියවූ; යෙකෙචිභොගා, යම්කිසිසම්පත්තිහු, උප්පජ්ජන්තිච, උපදිද්ද; තෙන, එකුශලයකරණකොටගෙණ; මෙ, මට; ඉජ්ඣති, සමෘද්ධවෙයි—

මෙ, මාගේ; වණ්ණොච, ශරීරවර්ණයද; සබ්බදිසා, සියලුදිශාවන්; පභාසති, බබුලුවාද; එවං, මෙසේ; ජලිතානුභාවා, දලිසෙහලද අනුභාවඇත්තී; තෙන, ඒකුශලයෙන්; අම්හි, ඇතිවූයෙමි—

තා කිර ඉත්ථියො කස්සපසම්මාසම්බුද්ධස්ස කාලෙ මනුස්ස භාවෙ ඨිතා තං තං පුඤ්ඤං අකරිංසු--තත්‍ථ එකා ඉත්ථී පීත වත්ථං අදාසි, එකා සුමනමාලං, එකා ගන්ධං, එකා උළාරානි ඵලානි, එකා උච්ඡුරසං, එකා භගවතො චෙතියෙ ගන්ධපඤ්චඞ්ගුලිකං අදාසි, එකා උපොසථං උපවසි, එකා උපකට්ඨාය වෙලාය නාවාය ගච්ඡන්තස්ස භික්ඛුනො උදකං අදාසි, එකා කොධනානං සස්සුසසුරානං අක්කොධනා උපට්ඨානං අකාසි, එකා දාසී හුත්වා අතන්දිතාචාරා අහොසි, එකා පිණ්ඩචාරිකස්ස භික්ඛුනො ඛීරභත්තං අදාසි, එකා ඵාණිතකං අදාසි එකා උච්ඡුඛණ්ඩං අදාසි—එකා තිම්බරූසකං අදාසි, එකා තිම්බ ාණ්ණ බුට්ඨිං

---

තාඉත්ථියොකිර, එස්ත්‍රීවරුවනාහි; කස්සපසම්මාසම්බුද්ධස්සකාලෙ, කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ කාලයෙහි; මනුස්සභාවෙ, මනුෂ්‍යත්වභාවයෙහි, ඨිතා, පිහිටියාහු; තං තං පුඤ්ඤං, ඒ ඒ කුසලය; අකරිංසු, කළාහුය, තත්‍ථ, එහි; එකාඉත්ථී, එක්ස්ත්‍රියක් තොමෝ; පීතවත්ථං, රන්වන්වතක්; අදාසි, දුන්නීය; එකා, එක් ස්ත්‍රියක්තොමෝ; සුමනමාලං, සමන්මල්මාලාවක්ද; එකා,එක ස්ත්‍රියක්; ගන්ධං, සුවඳක්ද; එකා, එක් ස්ත්‍රියක්; උළාරානි, මහත්වූ; ඵලානි, ඵලයක්ද; එකා, එක්ස්ත්‍රියක්; උච්ඡුරසං, උක්රසයක්ද; එකා, එක්ස්ත්‍රියක්; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; චෙතියෙ, චෛත්‍යයෙහි; ගන්ධපඤ්චඞ්ගුලිකං, සුවඳපසඟුලක්ද; අදාසි, දුන්නීය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; උපොසථං, උපොසථකර්මයකට; උපවසි; එළඹ වාසයකළාය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; උපකට්ඨායවෙලාය, සවස්වූ වේලාවෙහි, නාවාය, නැවෙහ්නි; ගච්ඡන්තස්ස, අනුභවකරන්නාවූ; භික්ඛුනො, භික්ෂුවක්හට; උදකං, ජලය; අදාසි, දුන්නීය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; කොධනානං, ක්‍රෝධයිනඇත්තාවූ, සස්සු සසුරානං, නැදිමයිලන්ට; අක්කොධනා, ක්‍රෝධනොකිරීමෙන්; උපට්ඨානංඅකාසි, උපස්ථානකළාය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; දාසීහුත්වා, දාසියක් ; අතන්දිතාචාරාඅහොසි, අලස නොවූ හැසිරීම්ඇත්තිවූවාය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; පිණ්ඩචාරිකස්සභික්ඛුනො, පිඬුපිණිස හැසිරෙනභික්ෂුවකට; ඛීරභත්තං, කිරිබතක්; අදාසි, දුන්නීය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; ඵාණිතකං, පැනිතකක්; අදාසි, දුන්නීය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ, උච්ඡුඛණ්ඩං, එක්උක්දඬුකැබැල්ලක්; අදාසි, දුන්නීය; එකා, එක්ස්ත්‍රියක්තොමෝ; තිම්බරූසකං, ඇල්තිඹිරිඵලයක්;

අදාසි, එකා නඛකාරිකං අදාසි, එකා ඵලාඵලකං අදාසි, එකා වල්ලිඵලං අදාසි, එකා ඵාරුසකං අදාසි, එකා අඞ්ගාරකපල්ලං අදාසි එකා සාකමුට්ඨිං අදාසි, එකා පුප්ඵිතමුට්ඨිං අදාසි, එකා මූලකලාපං අදාසි,, එකා තිලපිඤ්ඤාකං අදාසි, එකා කායබන්ධනං අදාසි, එකා අංසබන්ධනං අදාසි, එකා අයොගපට්ටං අදාසි, එකා විධූපනං අදාසි, එකා තාලවණ්ටං අදාසි එකා මොරහත්ථං අදාසි, එකා ඡත්තං, එකා උපාහනං, එකා පූවං, එකා මොදකං, එකා සක්ඛලිකං අදාසි.

---

අදාසි; දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ නිම්බපණ්ණමුට්ඨිං; කොසඹපත්මිටක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ, නඛකාරිකං, නැකිරිඵලයක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ, ඵලාඵලකං, මගකැකිරිඵලයක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ; වල්ලිඵලං, කොම්බුඵලයක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ, ඵාරුසකං, බොරළුම්ගෙඩියක්; අදාසි, දුන්නීය, එකා, එක්සත්‍රියෙක්තොමෝ, අඞ්ගාරකපල්ලං, අඟුරුකබලක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ; සාකමුට්ඨිං, පලාමිටක්, අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්තොමෝ; පුප්ඵිතමුට්ඨිං, මල්මිටක්; අදාසි, දුන්නීය; එකා; එක්සත්‍රියෙක්, මූලකලාපං, මුලපලාවක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්; අම්බිලකඤ්ජිකං, ඇඹුල්කාඩියක්; අදාසි; දුන්නීය; එකා, එක්සත්‍රියෙක්, තිලපිඤ්ඤාකං, තලමුරුවටක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්; කායබන්ධනං, කාබන්ධනක්; අදාසි, දුන්නීය; එකා එක්සත්‍රියෙක්; අංසබන්ධනං, අංසකඩයක්; අදාසි; දුන්නීය; එකා එක්සත්‍රියෙක්, අයොගපට්ටං, කටිලොහපාත්‍රයක්; අදාසි; දුන්නීය; එකා, එක්සත්‍රියෙක්; විධූපනං, සතරැස්වජනියක්; අදාසි; දුන්නීය, එකා, එක්සත්‍රියෙක්; තාලවණ්ටං, තාලපත්‍රවණ්ඩලවිජනියක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්, මොරහත්ථං, මොනරපිල්මය විජනියක්; අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්; ඡත්තං, ඡත්‍රයක්, අදාසි, දුන්නීය; එකා, එක්සත්‍රියෙක්; උපාහනං, වහන්සඟලක්ද; එකා, එක්සත්‍රියෙක්, පූවං, පූපයක්ද; එකා, එක්සත්‍රියෙක්; මොදකං, මොදක නම් කැවුම් ගෙඩියක්, එකා, එක්සත්‍රියෙක්; සක්ඛලිකං, ලාදුරු මිඨායියක්; අදාසි, දුන්නීය—

තා එකෙකා අච්ඡරාසහස්සපරිවාරා තාවතිංසභවනෙ සක්කස්ස දෙවරඤ්ඤො පරිචාරිකා හුත්වා නිබ්බත්තා — අථ ථෙරො තතො මනුස්සලොකං ආගන්ත්වා භගවතො තමත්ථං ආරොචෙසි, තං සුත්වා භගවා මොග්ගල්ලාන න කෙවලං තා දෙවතායො තයා එව පුච්ඡිතා එවං බ්‍යාකරිංසු. අථ ඛො මයාපි පුබ්බෙ පුච්ඡිතා එවමෙව බ්‍යාකරිංසූති වත්වා ථෙරෙන පුච්ඡිතො අත්තනො අතීතං ගුත්තිලවිමානං කථෙසි—

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො ගන්ධබ්බකුලෙ නිබ්බත්තිත්වා ගන්ධබ්බසිප්පෙ පරියොදාතසිප්පතාය සබ්බදිසාසු පාකටො අහොසි නාමෙන

---

තා. ඒස්ත්‍රීහුතුමූ; එකෙකා, එක එකස්ත්‍රී, අච්ඡරාසහස්සපරිවාරා, දිව්‍යප්සරා දහස දහස පිරිවර කොට ඇතිව; තාවතිංසභවනෙ, තව්තිසාභවනෙහි; සක්කස්සදෙවරඤ්ඤො, සක්දෙව්රජහට, පරිචාරිකාහුත්වා, පරිචාරිකාවෝව; නිබ්බත්තා, උපන්නීහුය—අථ, ඉක්බිත්තෙන්, ථෙරො, ස්ථවිරතෙම; තතො, එසින්; මනුස්සලොකං, මිනිස්ලොවට; ආගන්ත්වා, අවුත්; භගවතො, භාග්‍යවතුන්වහන්සේට, තංඅත්ථං, ඒකාරණය, ආරොචෙසි, කීසේක, භගවා, භාග්‍යවතුන්වහන්සේ, තංසුත්වා, එය අසා; මොග්ගල්ලාන, මුගලන; තාදෙවතායො, ඒදිව්‍යප්සරාවෝ; කෙවලං, හුදෙක්; තයාඑව, තාවිසින් පමණක්; පුච්ඡිතා, විචාරනලබන්නීහු, එවං, මෙසේ; නබ්‍යාකරිංසු ප්‍රකාශනොකළහු නොවන්නීයෝය; අථඛො, තවද; පුබ්බෙ; පූර්වයෙහි; මයාඅපි මාවිසිනුදු; පුච්ඡිතා, විචාරනලබන්නීහු; එවංඑව, එපරිද්දෙන්ම; බ්‍යාකරිංසුඉති, ප්‍රකාශකලාහුයයි; වත්වා, වදාරා, ථෙරෙන, මුගලන්තෙරවිසින්; පුච්ඡිතො, විචාරනලද්දේ; අත්තනො, තමන්වහන්සේගේ, අතීතං, ඉකුත්වූ, ගුත්තිලවිමානං, ගුත්තිලබොධිසත්වචරිතය; කථෙසි, දෙශනාකලසේක—

අතීතෙ, ඉකුත්කලැ, බාරාණසියං, බරණැස්නුවරහි; බ්‍රහ්මදත්තෙ, බඹදත්රජහු; රජ්ජං, රාජ්‍යය; කාරෙන්තෙ, කරවනකල්හි; බොධිසත්තො, බෝසත්තෙම; ගන්ධබ්බකුලෙ, ගඳඹකුලයෙහි; නිබ්බත්තිත්වා, ඉපිද; ගන්ධබ්බසිප්පෙ, ගඳඹසිප්හි; පරියොදාතසිප්පතාය; හාත්පස්හ පිරිසිදුශිල්පඇතිබැවින්; සබ්බදිසාසු, සියලුදිසාවන්හි; පාකටො අහොසි, ප්‍රකටවූයේය; නාමෙන, නමින්; ගුත්තිලොනාම, ගුත්තිලනම්වූයේය; සො, ඒ

ගුත්තිලො නාම, සොදුරාභරණං අකත්වා අන්ධෙ ජිණ්ණෙ මාතාපිතරෙ පොසෙසි—තස්ස සිප්පනිප්ඵත්තිං සුත්වා, උජ්ජෙනිවාසී මූසිලො නාම ගන්ධබ්බො උපගන්ත්වා තං වන්දිත්වා එකමන්තං ඨිතො කස්මා ආගතොසීති වුත්තෙ තුම්හාකං සන්තිකෙ සිප්පං උග්ගණ්හිතුන්ති ආහ.

ගුත්තිලාචරියො තං ඔලොකෙත්වා ලක්ඛණකුසලතාය තස්ස අසප්පුරිසභාවං ඤත්වා ගච්ඡතාත තව නත්ථීති පටික්ඛිපි, සො තස්ස මාතාපිතරො පයිරුපාසිත්වා තෙහි යාචාපෙසි, ගුත්තිලාචරියො මාතාපිතූහි නිප්පීළියමානො ගුරුවචනං අලඞ්ඝනීයන්ති තස්ස සිප්පං පට්ඨපෙත්වා විගතමලමච්ඡෙර

---

තෙම, දුරාභරණංඅකත්වා, භාර්‍ය්‍යාවක් පොෂ්‍යනොකොට; අන්ධෙ, ඇස්අන්ධවූ; ජිණ්ණෙ, ජීර්ණවූ; මාතාපිතරෙ, මව්පියන්; පොසෙසි, පොෂ්‍යකෙළේය; තස්ස, ඔහුගේ; සිප්පනිප්ඵත්තිං, සිල්පනිස්පත්තිය; සුත්වා, අසා; උජ්ජෙනිවාසි, උජ්ජෙනිනුවරවාසි වූ; මූසිලොනාම, මූසිලනම්වූ; ගන්ධබ්බො, ගඳඹතෙම; උපගන්ත්වා (ගුත්තිලාචාර්‍ය්‍යන්වහන්සේගේ) සමීපයට පැමිණ; තං, උන්වහන්සේට; වන්දිත්වා, වැඳ; ඨිතො, සිටියේ; කස්මා; කුමක්හෙයින්; ආගතොසීති, ආයෙහිදැයි; වුත්තෙ, ඇසූකල්හි; තුම්හාකං, නුඹවහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; සිප්පං, සිල්පය; උග්ගණ්හිතුන්ති, ඉගෙණගන්ටයයි; ආහ, කීයේය—

ගුත්තිලාචරියො, ගුත්තිලආචාර්‍ය්‍යතෙම; තං, ඔහු; ඔලොකෙත්වා, බලා; ලක්ඛණකුසලතාය, ලක්ෂණදැනීමෙහි දක්ෂබැවින්; තස්ස, ඔහුගේ, අසප්පුරිසභාවං, අසත්පුරුෂබව; ඤත්වා, දැන තාත, දරුව; ගච්ඡ, යව, තව, තට; නත්ථීති, සිල්පනැත්තේයයි; පටික්ඛිපි, ප්‍රතික්ෂේපකළේය; සො, ඒමූසිලතෙම; තස්ස. ඒගුත්තිලාචාර්‍ය්‍යයන්ගේ; මාතාපිතරෙ, මව් පියන්; පයිරුපාසිත්වා; පයිරුපාසනයකොට; තෙහි, ඒමව්පියන් ලවා; යාචාපෙසි, යාඥාකෙරෙව්වේය; ගුත්තිලාචරියො, ගුත්තිලආචාර්‍ය්‍යතෙම; මාතාපිතූහි, මව්පියන්විසින්; නිප්පීළියමානො, අතිශයින් පීඩාකරණු ලබන්නේ; ගුරුවචනං, දෙමව්පියන්ගේ වචනය; අලඞ්ඝනීයන්ති, නොයික්මවියයුතුයයි, තස්ස, ඔහට; සිප්පං, සිල්පය; පට්ඨපෙත්වා, ඉගැන්වීමනබා; විගතමලමච්ඡෙරතාය; පහකරණලද මසුරුමලඇතිබැවින්ද; කාරුඤ්ඤතාය ච; කරුණා

නාය කාරුඤ්ඤතාය ච ආචරිය මුට්ඨිං අකත්වා අනවසෙසතො සිප්පං සික්ඛාපෙසි—සොපි මෙධාවිතාය පුබ්බෙ කතපරිචිතතාය ච අකුසීතතාය ච නචිරස්සෙව පරියොදාතසිප්පො චින්තෙසි ඉදං බාරාණසිනගරං සකලජම්බුදීපෙ අග්ගනගරං යන්නූනාහං ඉධ සරාජිකාය පරිසාය සිප්පං දස්සෙය්‍යං, එවාහං ආචරියතොපි ජම්බුදීපෙ පාකටො භවිස්සාමීති, ආචරියස්ස ආරොචෙසි අහං රඤ්ඤො පුරතො සිප්පං දස්සෙතුකාමො රාජානං මං දස්සෙථාති.

මහාසත්තො අයං මම සන්තිකෙ උග්ගහිතසිප්පො පතිට්ඨං ලභතූති කාරුඤ්ඤමානො තං රඤ්ඤො සන්තිකං නෙත්වා මහාරාජ ඉමස්ස මෙ අන්තෙවාසිකස්ස විඤ්ඤාණ පච්ඡිනං

---

වඇතිබැවින්ද; ආචරියමුට්ඨිං, ඇදුරුමිටක්; අකත්වා, නොකො ට; අනවසෙසතො, ඉතිරිනොකිරීමෙන්; සිප්පං, සිල්පය; සික්ඛා පෙසි. උගැන්වූයේය, සොඅපි, ඒමුස්ලයොමේද; මෙධාවිතාය, නුවණඇතිබැවින්ද; පුබ්බෙකතපරිචයතාය, පූර්වයෙහි කරණලද පුරුදුඇතිබැවින්ද; අකුසීතතාය ච, කුසීතනොවූබැවින්ද; න චිරස්සෙව, නොබෝකලකින්ම; පරියොදාතසිප්පො පිරිසිදුසිප් ඇත්තේ; චින්තෙසි, (මෙසේ) සිතුයේය; ඉදං බාරාණසිනගරං, මේබරණැස්නුවර; සකලජම්බුදීපෙ, සියලුදඹදිවෙහි; අග්ගනග රං, අගනුවරවෙයි; අහං, මම, ඉධ මෙහි; සරාජිකාය, රජසහි තවූ; පරිසාය, පිරිසෙහි; සිප්පං, සිල්පය; දස්සෙය්‍යං, දක්වන් නෙම්නම්; යන්නූන, ඉතායෙහෙක, එවං, එසේ; අහං, මම; ආචරියතොඅපි, ආචාර්‍යයන්ටදවඩා, ජම්බුදීපෙ, දඹදිවැ පාක ටොභවිස්සාමීති, ප්‍රකටවූයේ වන්නෙම්යයි; ආචරියස්ස, ආචාර්‍යයන්වහන්සේට; අහං, මම, රඤ්ඤො, රජහුගේ, පුර තො, ඉදිරියෙහි, සිප්පං, සිල්පය; දස්සෙතුකාමො, දක්වනු කැමැත්තෑත්තෙම්; රාජානං, රජහට; මං, මා; දස්සෙථාති, දක්වවමැනවැයි; ආරොචෙසි, කීයේය—

මහාසත්තො, මහාබෝසත්තෙම; අයං, මේතෙම; මම, මාගේ; සන්තිකෙ, සමීපයෙහි; උග්ගහිතසිප්පො, උගණ්නාලදසිල්පඇත්තේය; පතිට්ඨං, පිහිටක්; ලභතූති, ලබාවායි, කාරුඤ්ඤමානො, කරුණාකරණුලබන්නේ; තං, ඔහු; රඤ්ඤො, රජහුගේ; සන්තිකං, සමීපයට; නෙත්වා, පමුණුවා, මහාරාජ;

පස්සාහි ආහ — රාජා සාධූති පටිස්සුණිත්වා තස්ස වීණාවාදනං සුත්වා පරිතුට්ඨො තං ගන්තුකාමං නිවාරෙත්වා මම සන්තිකෙ ව ආචරියස්ස දිගුණතො උපට්ඨං දස්සාමීති ආහ.

මූසිලො නාම ආචරියතො හායාමි සමමෙව දෙවාති වත්වා රඤ්ඤා මා එවං භණි ආචරියො නාම මහන්තො උපට්ඨාකමෙව තුය්හං දස්සාමීති වුත්තෙ තත මම්පි ආචරියස්ස ච සිප්පං පස්සථාති වත්වා රාජගෙහතො නික්ඛමිත්වා ඉතො සත්තමෙ දිවසෙ මම්පි ගුත්තිලාචරියස්ස ච රාජද්වාරෙ සිප්පදස්සනං භවිස්සති තං පස්සිතුකාමා පස්සන්තූති තත්ථ තත්ථ ආහිණ්ඩන්තො උග්ඝොසෙසි.

---

මහරජ, රජ; මාගේ; ඉමස්සඅන්තෙවාසිකස්ස, මේශිෂ්‍යයාගේ, වීණාය, වීණාශාස්ත්‍රයෙහි; පවීණතං, දක්‍ෂබව; පස්සාහි, බැලූවමැනවයි; ආහ, කීයේය—රාජා, රජතෙම; සාධූති, මැනවයි, පටිස්සුණිත්වා, පිළිවදන්දී; තස්ස, ඔහුගේ; වීණාවාදනං, වීණාගායනාව, සුත්වා අසා; පරිතුට්ඨො, සතුටුවූයේ; ගන්තුකාමං, යනු කැමැත්වූ තං, ඔහු; නිවාරෙත්වා, වළක්වා; මම, මාගේ; සන්තිකෙ, සමීපයෙහි; වස, වාසයකරව; ආචරියස්ස, ආචාර්යයාහට; දිගුණතො, දුන්දෙගුණයකින්; උපට්ඨං, අඩයක්; දස්සාමීති, දෙන්නෙමියයි; ආහ, කීයේය—

මූසිලො, මූසිලතෙම; අහං, මම; ආචරියතො, ආචාර්යයාගෙන් වැඩූපෙත්; න හායාමි, නොපිරිහෙමි; සමං එව. සමවම, දෙවඉති, දූනමැනවයි; වත්වා, කියා; රඤ්ඤා, රජහුවිසින්; එවං, මෙසේ; මාභණි; නොකිය; ආචරියොනාම, ආචාර්යතෙමේනම්; මහන්තො, මහත්වූයේය; තුය්හං, තට; උපට්ඨං එව, අඩයක්ම; දස්සාමීති, දෙන්නෙමියයි; වුත්තෙ තත, කීකල්හි, මම්පි, මාගේද; ආචරියස්ස ච, ආචාර්යයාගේද; සිප්පං, ශිල්පය; පස්සථාති, බැලූවමැනවයි; වත්වා, කියා; රාජගෙහතො, රජගෙයින්, නික්ඛමිත්වා, නික්ම; ඉතො, මෙයින්, සත්තමෙ දිවසෙ, සත්වෙනිදවසෙහි; මම්පි, මාගේද; ගුත්තිලාචරියස්ස ච, ගුත්තිලආචාර්යයාගේද; රාජංගණෙ, රජමිදුලෙහිදී; සිප්පදස්සනං; සිල්පදැක්වීම; භවිස්සති, වන්නේය; තං, එය; පස්සිතුකාමා, දකිනුකැමැත්තාහු; පස්සන්තූති, දකිත්වායි; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි, ආහිණ්ඩන්තො, ඇවිදිත්තේ; උග්ඝොසෙසි ඝොෂාකළේය—

මහාසත්තො තං සුත්වා අයං තරුණො ථාමවා මය්හං සීහෙසො අහං පන ජිණ්ණො දුබ්බලො යදි පන මෙ පරිජයො භවෙය්‍ය මනං මෙ ජීවිතා සෙය්‍යො මතං අරඤ්ඤං පවිසිත්වා ගීවං උබ්බන්ධිත්වා මරිස්සාමීති චින්තෙත්වා අරඤ්ඤං ගතො මරණභයතජ්ජිතො පටිනිවත්තති මරිතුකාමො පුන ගන්ත්වා පුනපි මරණභයෙන පටිනිවත්තති එවං ගමනාගමනං කරොන්තස්සෙව ඡ දිවසා අතික්කන්තා තං ඨානං විගතතිණං අහොසි - තස්මිං ඛණෙ සක්කස්ස භවනං උණ්හාකාරං දස්සෙසි සක්කො ආවජ්ජමානො තං කාරණං ඤත්වා මහාසත්තං උපසඞ්කමිත්වා දිස්සමානරූපො ආකාසෙ ඨත්වා

---

මහාසත්තො, මහබෝසත්තෙම; තං, එය, සුත්වා, අසා; මය්හං, මාගේ; අයංසීහෙසො, මේ සිංහතෙමේ; තරුණො, තරුණවූයේය; ථාමවා, ශක්තිඇත්තේය, අහංපන, මමවනාහි, ජිණ්ණො, ජරාවටපැමිණියෙමි; දුබ්බලො, දුර්වලවූයෙමි; යදිපන, ඉදින්වනාහි; මෙ, මට; පරාජයො භවෙය්‍ය, පැරදීමවන්නේ නම්; මේ, මාගේ; ජීවිතා, ජීවත්වීමටවඩා; මතං, මැරීම; සෙය්‍යො, යහපත්වන්නේය; ඉතො, මෙහෙයින්; අරඤ්ඤං, අරණ්‍යයට; පවිසිත්වා, ප්‍රවිෂ්ටව; ගීවං, ග්‍රීවය; උබ්බන්ධිත්වා, උඩබැඳ; මරිස්සාමීති, මැරෙන්නෙමියි; චින්තෙත්වා, සිතා, අරඤ්ඤං, වනයට; ගතො, ගියේ; මරණභයතජ්ජිතො, මරණභයින් තර්ජනවූයේ; පටිනිවත්තති, නැවතහැරීආයේය, පුන, නැවත; මරිතුකාමො, මැරෙනුකැමැත්තේ; ගන්ත්වා, ගොස්; පුනපි, නැවතද; මරණභයෙන, මරණභයින්; පටිනිවත්තති, හැරීඑයි; එවං, මෙසේ; ගමනාගමනං කරොන්තස්සෙව, ගමන් ආගමන් කරන්නාහටම; ඡදිවසා, දවස්හයක්; අතික්කන්තා, ඉක්මගියාහුය; තං ඨානං, ඒස්ථානය; විගතතිණං අහොසි, පහවූ තෘණඇතිවූයේය—තස්මිං ඛණෙ, එකෙණෙහි, සක්කස්ස, ශක්‍රයාගේ; භවනං, භවනය, උණ්හාකාරං, උෂ්ණාකාරයක්; දස්සෙසි, දැක්වූයේය; සක්කො, ශක්‍රතෙම; ආවජ්ජමානො, ආවර්ජනාකරනුලබන්නේ; තංකාරණං, ඒකරුණ; ඤත්වා, දැන; මහාසත්තං, මහබෝසතාණකරා; උපසංකමිත්වා, එළඹ; දිස්සමානරූපො, දෘශ්‍යමාන ශරීරය ඇත්තේ; ආකාසෙ, අහසෙහි; ඨත්වා, සිට; එවං, මෙසේ; ආහ, ඓවාලේය; ආචරිය, ආචාර්‍යය, කිං,

එවම් හ ආචරිය කිඩකාරායිති මහාසත්තො සක්කස්ස තං කාමං පාකටං කරොන්තො ඉමං ගාථමාහ.

සත්තතන්තිං සුමධුරං—රාමණෙය්‍යං අවාචයිං
සො මං රඞ්ගම්හි අව්හෙති—සරණං මෙ හොහි කොසියාති

තං සුත්වා සක්කො ආචරියං මා භායි අහං තෙ සරණම්පරායනන්ති දස්සෙන්තො ඉමං ගාථමාහ.

අහං තෙ සරණං සම්ම—අහමාචරියපූජකො
න තං ජයිස්සති සිස්සො—සිස්සමාචරියො ජෙස්සතීති.

සක්කස්ස කිර දෙවරඤ්ඤො පුරිමත්තභාවෙ මහාසත්තො

---

කුමක්; කෙරෙයිද්දැයි, කාරන්නෙහිදැයි; මහාසත්තො, මහබෝසත්තෙම; සක්කස්ස. ශක්‍රයාහට; තං කාමං, ඒකාරණය; පාකටං කරොන්තො, ප්‍රකටකරන්නේ; ඉමං ගාථං, මේගාථාව; ආහ, කීයේය—

කොසිය, ශක්‍රය; සත්තතන්තිං, සත්තනක්ඇති; සුමධුරං, ඉතාමිහිරිවූ; රාමණෙය්‍යං, සිත්අලවන්නාවූ; (වීණාශිල්පය) අවාචයිං, (මූසිලයෙක්හට) කියෙවීමිද; (ඉගැන්වූයෙම්ද) සො, ඒමූසිලතෙම; මං, මාව; රංගම්හි, නාට්‍යමණ්ඩලයෙහි; අව්හෙති, (වාදයපිණිස) කැඳවයි; මෙ, මට; සරණං හොහි, පිහිටවෙව්වයි—

සක්කො, ශක්‍රතෙම; තං, එය; සුත්වා, අසා; ආචරියං, ආචාර්යය; මා භායි, භයනොවව; අහං, මම; තෙ, තුබට; සරණං, පිහිටවෙමි; පරායනන්ති, ගතිවශයෙන අධාරවෙම්යි; දස්සෙන්තො, දක්වන්නේ; ඉමං ගාථං, මේගාථාව; ආහ, කීයේය—

සම්ම, යහළුව; (ආචාර්යය) අහං, මම; තෙ, තුබට; සරණං, පිහිටවෙමි; අහං, මම්, තෙ, තුබට, සරණං, පිහිටවෙමි; අහං, මම; ආචරියපූජකො, ආචාර්යපූජකයෙක; සිස්සො, ශිෂ්‍යතෙම; තං, තුබ; න ජයිස්සති; නොදිනන්නේය; ආචරියො, ආචාර්යතෙම; සිස්සං, ශිෂ්‍යයා; ජෙස්සතිඉති, දිනන්නේයයි (කීයේය)—

පුරිමත්තභාවෙ, පළමුආත්මභාවයෙහි; මහාසත්තො, මහාබෝසත්තෙම; සක්කස්සදෙවරඤ්ඤො කිර, සක්දෙව්රජහට;

ආචරියො අහොසි, තෙනාහ අහමාචරියපූජකො'ති, එවඤ්ච පනාචරියා අපිච ත්වං විඤ්ඤූ වාදෙ නෙතා එකං තන්තිං ජිඤ්ඤිත්වා ච වාදෙය්‍යාසි විණාය තෙ පකතිසද්දො භවිස්සති, ඉමිස්සොලාපි තන්තිං ජිඤ්ඤිස්සති අථස්ස විණාය සද්දො න භවිස්සති තස්මිං ඛණෙ සො පරාජයං පාපුණිස්සති.

අථස්ස පරාජයභාවං ඤත්වා දුතියම්පි තතියම්පි චතුත්ථම්පි පඤ්චමම්පි ඡට්ඨම්පි සත්තමම්පි තන්තිං ජිඤ්ඤිත්වා සුද්ධදණ්ඩකෙනෙව වාදෙය්‍යාසි ජින්නතන්තිකොටිතො සරො නික්ඛමිත්වා සකලං ද්වාදසයොජනිකං බාරාණසිනගරං ජාදෙත්වා ඨස්සති ති ආහ—එවඤ්ච පන වත්වා බොධිසත්තස්ස තිසො පාසක

---

වත්‍රාශි; ආචරියොඅහොසි, ආචාර්‍ය්‍යවූයේය; තෙන, එහෙයින්; අහං, මම; ආචරියපූජකොති, ආචාර්‍ය්‍යපූජකයෙකැයි, ආහ, කීයේය; එවඤ්චපනවත්වා, මෙසේදකියා; අපිච, නැවතද; ත්වං, නුඹ; විඤ්ඤූ වාදෙනෙතා, විණා වාදනයකරමින්; එකංතන්තිං, එක් තතක්, ජිඤ්ඤිත්වා, සිඳ; ච, තවද; වාදෙය්‍යාසි, වාදනයකරව; තෙ, නුඹගේ, විණාය, විණාවෙහි; පකතිසද්දො, ප්‍රකෘතිශබ්දය; භවිස්සති, ඇතිවන්නේය; ඉමිස්සොලාපි, ඉම්පිලංතෙහිද, තන්තිං, තතක්; ජිඤ්ඤිස්සති, සිඳින්නේය; අථ, ඉක්බිත්තෙන්; තස්ස, ඔහුගේ; විණාය, විණාවෙහි; සද්දො, ශබ්දයතෙම; නභවිස්සති, නොවන්නේය, තස්මිංඛණෙ, එකෙණෙහි; සො, ඒ මුසිලතෙම; පරාජයං, පරාජයට; පාපුණිස්සති, පැමිණෙන්නේය—

අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඔහුගේ; පරාජයභාවං, පරාද බව; ඤත්වා, දැන; දුතියංඅපි, දෙවෙනිතතද; තතියංඅපි, තුන්වෙනිතතද; චතුත්ථංඅපි, සතරවෙනිතතද; පඤ්චමංඅපි, පස්වෙනිතතද; ඡට්ඨමංඅපි, සවෙනිතතද; සත්තමංඅපි තන්තිං, සත්වෙනිතතද; ජිඤ්ඤිත්වා, සිඳ; සුද්ධදණ්ඩකංඑව, පිරිසිදුවීණාදණ්ඩ පමණක්ම; වාදෙය්‍යාසි, වාදනයකරව; ජින්නතන්තිකොටිතො; සිඳි තත්කොන්වලින්; සරො, වීණාශබ්දයතෙම; නික්ඛමිත්වා, නික්මී; සකලං, සියලු; ද්වාදසයොජනිකං, දොළොස්යොදුනක් ඇති; බාරාණසිනගරං, බරණැස්නුවර; ජාදෙත්වා, ඉගිලගොස්; ඨස්සතීති, සිටින්නේයයි; ආහ, කීයේය—එවඤ්චපනවත්වා, මෙසේදකියා; බොධිසත්තස්ස, බෝධිසත්ත්වයන්ට; තිසොපාසකාගුලිකායො, පාසගුළුතුනක්; දත්වා, දී; එවං, මෙසේ; ආහ, කීයේය;

සචිකායො දත්වා එවමාහ වීණාසඤ්ඤනෙව සකල නගරෙ ජාගිරෙත ඉමෙනා ත්වං එකං පාසකණ්ටිකං ආනායෙස කිම්පෙයාසි, අථ තෙන පුරිසෙනා ඔතරිත්වා තිණි අවජරසතානි නවම් සන්ති තමෙනා ලුනීයම්පි කිම්පෙයාසි, අථාපරානි තිණි අවජරසතානි ඔතරිත්වා තව වීණාය ධුරෙ නවම් සන්ති, තමෙනා තතියම්පි කිම්පෙයාසි අථාපරානි තිණි අවජරසතානි ඔතරිත්වා රඞ්ගමණ්ඩලෙ නවම් සන්ති අහම්පි තෙ සන්තිකං ආගම්සසාමි මා භායී'ති සමස්සාසෙත්වා ගතො

සත්තමෙ දිවසෙ රාජා සපරිවාරො රාජඞ්ගණෙ නිසීදි සබ්බෙ නාගරා සන්නිපතිංසු ගුත්තිලාචරියො ච මූසිලො ච සිප්පදස්සනත්ථං සජ්ජා හුත්වා උපසඞ්කමිත්වා රාජානං වන්දිත්වා

---

වීණාසඤ්ඤනෙව, වීණාශබ්දයෙන්ම; සකලනගරෙ, සියළුනුවර, ජාගිරෙත, පැතිරීගියකල්හි; ත්වං, තුබ; ඉමෙනා, මෙයින්; එකං, පාසකණ්ටිකං; එක්පාසගැටයක්; ආනායෙස, අනයෙහි; කිම්පෙයාසි, දමව; අථ, එකල්හි, තෙන, තුබගේ; පුරිසෙනා, ඉදිරියෙන්; ඔතරිත්වා, බැස; තිණිඅවජරසතානි, තුන්සියයක් අච්චරාවන්; නවම්සන්ති, නටත්තාහුය; තමෙනා, එයින්; (නැවත) ලුනීයංඅපි, දෙවෙනිපාසගැටයද; කිම්පෙයාසි, (අහසෙහි) දමව; අථ, ඉක්බිත්තෙන්, අපරානි, අන්‍යවූ; තිණිඅවජරසතානි, තුන්සියයක්අච්චරාවෝ, ඔතරිත්වා, (අහසින්) බැස, තව, තුබගේ; වීණාය, වීණාවගේ, ධුරෙ, සම්පයෙහි; නවම්සන්ති, නටත්තාහුය; තමෙනා, එයින්; තතියංඅපි, තුන්වෙනිපාසගැටයද, කිම්පෙයාසි, දමව; අථ, ඉක්බිත්තෙන්; අපරානි, අන්‍යවූ; තිණිඅවජරසතානි, තුන්සියයක් අච්චරාවෝ, ඔතරිත්වා, බැස; රඞ්ගමණ්ඩලෙ, නාට්‍යමණ්ඩලයෙහි; නවම්සන්ති, නටත්තාහුය; අහංඅපි, මමද; තෙ, තුබගේ; සන්තිකං, සමීපයට; ආගම්සසාමි, එන්නෙමි; මාභායීති, භයනොවවයි; සමස්සාසෙත්වා, අස්වසා; ගතො, ගියේය,

සත්තමෙදිවසෙ. (ඊට) සත්වෙනිදවසෙහි; සපරිවාරො, පිරිවරසහිතවූ; රාජා, රජතෙම, රාජඞ්ගණං, රාජාඞ්ගණයෙහි; නිසීදි, උන්නේය; සබ්බෙනාගරා, සියළුනුවරවැසියෝ; සන්නිපතිංසු, රැස්වූවාහුය; ගුත්තිලාචරියොච, ගුත්තිලආචාර්‍යතෙමේද; මූසිලොච, මූසිලතෙමේද; සිප්පදස්සනත්ථං. ශිල්පදක්වනපිණිස; සජ්ජාහුත්වා, සැරසුණාහු; උපසඞ්කමිත්වා, (රජසමීපට) එළඹ

අත්තනා ලද්ධාසනෙ නිසීදිත්වා වීණං වාදයිංසු සක්කොච ආගන්ත්වා අන්තලික්ඛෙ අට්ඨාසි, තං මහාසත්තොව පස්සති ඉතරෙ න පස්සන්ති මහාජනො විනාගම්පි සමසමවාදිතෙන තුට්ඨා උක්කුට්ඨිසහස්සානි පවත්තෙන්ති.

අථ බොධිසත්තො සක්කෙන වුත්තනයෙන තන්තියො ඡින්දිත්වා සුද්ධදණ්ඩකං වාදෙසි සද්දො සකල නගරං ඡාදෙත්වා අට්ඨාසි, තතො එකං පාසකඝටිකං ආකාසෙ ඛිපි තීණි අච්ඡරාසතානි ඔතරිත්වා නච්චිංසු එවං දුතියෙව තතියෙ චාති නව අච්ඡරාසතානි ඔතරිත්වා වුත්තනයෙන නච්චිංසු, තං දිස්වා පරිසා හට්ඨතුට්ඨා චෙලුක්ඛෙපෙ කරොන්ති

---

රාජානං, රජහුට; වන්දිත්වා, වැඳ; අත්තනා, තමාවිසින්; ලද්ධ, ලබනලද; ආසනෙ, අස්නෙහි; නිසීදිත්වා, හිඳ; වීණාවාදයිංසු, වීණාවාදනයකළාහුය; සක්කොච, ශක්‍රතෙමේද; ආගන්ත්වා, අවුත්; අන්තලික්ඛෙ, අහසෙහි; අට්ඨාසි, සිටියේය; තං, ඔහු; මහාසත්තංඑව, මහබෝසත්තෙමම; පස්සති, දකී; ඉතරෙ, අනෙයෝ; නපස්සන්ති, නොදකිත්; මහාජනො, මහාජනතෙම; විනාංඅපි, දෙදෙනාගේම; සමසමවාදිතෙන, සම සමව වාදන කිරීමෙන්; තුට්ඨා, සතුටුවූයේ, උක්කුට්ඨිසහස්සානි, දහස්ගණන් ඔල්වරහඬ, පවත්තෙනසි, පැවැත්වූයේය—

අථ, ඉක්බිත්තෙන්; බොධිසත්තො, බෝසත්තෙම; සක්කෙන, ශක්‍රයාවිසින්, වුත්තනයෙන, කියනලදනුමයෙන්; තන්තියො, තත්; ඡින්දිත්වා, සිඳ; සුද්ධදණ්ඩකං, පිරිසිදු වීණාදණ්ඩ; වාදෙසි, වාදනයකෙළේය; සද්දො, ශබ්දයතෙම; සකලනගරං, සියලුනුවර; ඡාදෙත්වා, පැතිරී, අට්ඨාසි, සිටියේය; තතො, එතනා, එකපාසඝටිකං, එක්පාසගැටයක්ගෙණ; ආකාසෙ, අහසෙහි; ඛිපි, දැම්මේය, තීණිඅච්ඡරාසතානි, තුන්සියයක් දිව්‍යප්සරාවෝ; ඔතරිත්වා, බැස; නච්චිංසු, නැටූවාහුය; එවං, මෙසේ; දුතියෙව, දෙවනිපාසගැටය දැමූකල්හිද; තතියෙවඉති, තුන්වෙනිපාසගැටය දැමූකල්හිදුයි; නවඅච්ඡරාසතානි, නවසියයක් දිව්‍යප්සරාවෝ; ඔතරිත්වා, (අහසින්) බැස; වුත්තනයෙනඑව, කියනලදනුමයෙන්ම; නච්චිංසු, නැටූවාහුය; තං, එය; දිස්වා, දැක; හට්ඨතුට්ඨා, තුටුපහටු සිත්ඇත්තාවූ; පරිසා, පිරිසතොමෝ, චෙලුක්ඛෙපෙ කරොන්ති, සළුහිසැරීම් කරත්, ගුත්තිලංවරියෙසු; ගුත්තිල ආචාරියයන්

ගුත්තිලාචරියස්ස සාධුකාරමදාසි; රාජා මූසිලං සභාමජ්ඣා නීහරාපෙසි, මහාජනො තං ලෙඩ්ඩුදණ්ඩාදීහි පහරන්තො තත්ථෙව ජීවිතක්ඛයං පාපෙසි.

සක්කොපි අහං තෙ සහස්සයුත්තං වෙජයන්තරථං පෙසෙස්සාමි ත්වං තං අභිරුහිත්වා දෙවලොකං ආගච්ඡෙය්‍යාසීති වත්වා පක්කාමි, අථ සො ගන්ත්වා නිසින්නො කහං ගතත්ථ මහාරාජාති දෙවධීතාහි පුච්ඡිතො තාසං තං කාරණං විත්ථාරෙන කථෙත්වා බොධිසත්තස්ස සීලාදිව ගුණාදිව වණ්ණෙත්වා තාහි මයම්පි ආචරියං දට්ඨුකාමාති වුත්තෙ වෙජයන්තරථෙන මාතලිං පෙසෙත්වා බොධිසත්තං ආනෙසි, සක්කො

---

වහන්සේට; සාධුකාරං, සාධුකාරය; අදාසි, දුන්නේය; රාජා, රජතෙමේ; මූසිලං, මූසිලයා; සභාතො සභාවෙන්; නීහරාපෙසි; පහකරවූයේය; මහාජනො; මහාජනතෙමේ; තං, ඒ මූසිලයා ව; ලෙඩ්ඩුදණ්ඩාදීහි, ගල්කැටදඬුආදියෙන්; පහරන්තො, ගසන්නේ; තත්ථෙව, එහිම; ජීවිතක්ඛයං, ජීවිතක්ෂයට; පාපෙසි, පැමිණෙව්වේය—

සක්කොඅපි, ශක්‍රතෙමේද; අහං, මම; තෙ, තුබට; සහස්සයුත්තං, දහසක් අසුන්ගෙන්යුත්; වෙජයන්තරථං, වෛජයන්තරථය; පෙසෙස්සාමි, එවන්නෙමි; ත්වං, තුබ; තං, එයට; අභිරුහිත්වා, නැගී; දෙවලොකං, දිව්‍යලොකයට; ආගච්ඡෙය්‍යාසීති, එවයි; වත්වා, කියා; පක්කාමි, ගියේය; අථ, ඉක්බිත්තෙන්; සො, ඒශක්‍රතෙමේ; ගන්ත්වා, (දෙව්ලොවට) ගොස්; නිසින්නො, හුන්නේ; මහාරාජ, මහරජ; කහං, කොතැන්හි; ගතත්ථෙති, ගියහුද්දැයි; දෙවධීතාහි, දිව්‍යදූනියන්විසින්; පුච්ඡිතො, විචාරණලද්දේ; තාසං, ඔවුන්ට; තං කාරණං, ඒකාරණය; විත්ථාරෙන, විස්තරවශයෙන්; කථෙත්වා, කියා; බොධිසත්තස්ස, බෝසත්නුවන්ගේ; සීලාදිව, ශීලාදි; ගුණාදිව, ගුණාදී; වණ්ණෙත්වා, වර්ණනාකොට; තාහි, ඒ දිව්‍යදූනියන්විසින්; මයංඅපි, අපිද; ආචරියං, ආචාර්යයා; දට්ඨුකාමාහු, දකිනුකැමැත්තමෝයයි; වුත්තෙ, කීකල්හි; වෙජයන්තරථෙන; වෛජයන්ත රථයහාසමග; මාතලිං, මාතලිදිව්‍යපුත්‍රයා, පෙසෙත්වා, යවා; බොධිසත්තං, බෝසතාණන්; ආනෙසි, ගෙන්වූයේය; සක්කො, ශක්‍රතෙම; බොධිසත්තාසනා, මහබෝසං

බොධිසත්තෙන සද්ධිං සම්මොදනීයං කත්වා එවමාහ ආචරිය වීණං වාදෙය්‍යාසි දෙවධීතා සොතුකාමාති.

මයං වීණාසිප්පූපජීවිනො වෙතනෙන වීණාසිප්පං දස්සෙස්සාමාති කීදිසං පන වෙතනං ඉච්ඡසීති නාඤ්ඤෙන මෙ වෙතනෙන අත්ථො ඉමාසං පන දෙවධීතානං අත්තනා පුබ්බෙ කතකුසලකම්මකථනමෙව වෙතනං හොතූති අථ නං දෙවධීතරො ආහංසු ගන්ධබ්බං කරොහි ආචරිය මයං පච්ඡා තුට්ඨා අම්හෙහි කතකුසලකම්මං කථෙස්සාමාති බොධිසත්තො සත්තාහං දෙවධීතානං ගන්ධබ්බං කත්වා සත්තමෙ දිවසෙ පාටෙක්කං තාහි ලද්ධසම්පත්තිං කථෙත මූලෙන පුච්ඡන්තො එවමා

---

තානත්ගාසම්ගු; සම්මොදනීයං, සතුටුවිය යුතු කථාව, කත්වා; කොට; ආචරිය, ආචාර්‍ය්‍යයාණෙනි; දෙවධීතරො, දිව්‍යදුහිතෘහු; සොතුකාමා, අසනු කැමැත්තීයෝය; (එහෙයින්) වීණං, වීණාව; වාදෙය්‍යාසීති, වාදනයකරවයි; එවං, මෙසේ; ආහ, කීයේය—

මයං, අපි; වීණාසිප්පූපජීවිනො, වීණාශිල්පයනිසා ජීවත්වූ වොත්තා (වෙමු) වෙතනෙන, වැටුපෙන්, වීණාසිප්පං, වීණාශිල්පය දස්සෙස්සාමිඉති, දක්වන්නෙමුයයි; (කී:ය) කීදිසං, කෙබඳුවූ; වෙතනංපන, වැටුපක්වනාහී; ඉච්ඡසිඉති, කැමැත්තෙහිදැයි; (විචාලේය) මෙ, මට; අඤ්ඤෙන, අන්‍යවූ; වෙතනෙන, වැටුපෙන්; න අත්ථො, ප්‍රයොජනනැත්තේය; ඉමාසං, මේ; දෙවධීතානංපන, දිව්‍යදුහිතෘන්ගේවනාහී; අත්තනා, තමාවිසින්; පුබ්බෙ, පූර්වයෙහි; කතකුසලකම්මකථනංඑව, කරනලද කුශලකර්මය කීමම; වෙතනං, වැටුප; හොතුඉති, වේවයි; (කී:ය) අථ, ඉක්බිත්තෙන්, නං, ඒගුත්තිලඇදුරුහට, දෙවධීතරො, දිව්‍යදුහිතෘහු; ආචරිය, ආචාර්‍ය්‍යයාණෙනි, ගන්ධබ්බංකරොහි, වීණාගායනාකරව; මයං, අපි; පච්ඡා, පසුව; තුට්ඨා, සතුටුවූවාහු; අම්හාකං, අපවිසින්; කතං, කරනලද; කුසලකම්මං, කුශලකර්මය; කථෙස්සාමඉති, කියන්නෙමුයයි, ආහංසු, කීහුය; බොධිසත්තො, බෝසත්තෙම; සත්තාහං, සත්දවසක්; දෙවධීතානං, දිව්‍යදුහිතෘන්ට; ගන්ධබ්බංකත්වා, වීණාගායනාකොට; සත්තමෙ දිවසෙ, සත්වනිදවසෙහි; පාටෙක්කං, වෙනවෙනම, තාහි, ඒදිව්‍යදුහිතෘන්විසින්; ලද්ධසම්පත්තිං, ලබනලදසම්පත්තිය;

ආයස්මා මහාමොග්ගල්ලානොවිය "පුච්ඡිතෙනා" අභික්කන්තෙන
න වණ්ණෙනාති ආදිනා ගාථාය පුච්ඡිතාපි විත්ථාරතම්දායිකා
නාරීති ආදිනා යථා එතරහි ථෙරස්ස එවමෙව; තස්ස බහුකා
රිංසු—එවං සබ්බාපි ගුත්තිලම්මානවත්ථුවසි ! ආනතා ජනිං
ස දෙවනගරෙ යං කත්වා තත්ථ නිබ්බත්තා සබ්බන්තං අත්ත
නො කම්මං බොධිසත්තෙන පුච්ඡිතා තාහි ගාථාහි කථෙසුං
තං සුත්වා බොධිසත්තො ලාභා වත මෙ සුලද්ධං වත මෙ
ත්වාහං ඉධාගන්ත්වා අප්පමත්තකෙනාපි කම්මෙන පටිලද්ධස
ම්පත්තියො අසෙසාසිනති වත්වා ඉමිං උදානං උදානෙසි.

---

කථනමුඛෙන, නිමිවශයෙන්; පුඤ්ඤකම්මං, පුණ්‍යකර්මය; ආය
ස්මා, ආයුෂ්මත්වූ; මහාමොග්ගල්ලානොවිය, මහමුගලන්තෙර
ණුවන්මෙන්; පුච්ඡිතෙනා, විචාරන්නේ; අභික්කන්තෙනවණ්ණ
නාති, විශිෂ්ටවූ ශරීරවර්ණයෙන්යන; ආදිනා, මේආදිවශයෙන්
ගාථාය,ගාථාවෙන්; පුච්ඡිතාපි. විචාරණලද්දාහුද; විත්ථාරමදායිකා
නාරීති, උතුම්වූ වස්ත්‍රදුන් ස්ත්‍රීතොමෝයයි; ආදිනා; මේආදිවශ
යෙන්; එතරහි, මේකාලයෙහි; ථෙරස්ස, (මුගලන්) තෙරුන්
වහන්සේට; යථා, යම්සේ (කීවාහුද) එවංඑව, එපරිද්දෙන්ම;
තස්ස, ඒ ගුත්තිලාචාර්‍යයාහටද; බහුකාරිංසු, ප්‍රකාශකළාහුය—
එවං, මෙසේ; ගුත්තිලවිමාන වත්ථුවසි, ගුත්තිලවිමානවස්තුවෙ
හි; ආනතා, (ප්‍රකාශකිරීම්වශයෙන්) ආවාහු; සබ්බාපි, සියළුම;
ජනිංසදෙවනගරෙ, සතිස් දිව්‍යදුහිතෘහු, යං; යමක්; කත්
වා, කොට; තත්ථ, එහි; නිබ්බත්තා, උපන්නීහු, අත්ත
නො; තමතමාගේ; සබ්බන්තා කම්මං, ඒසියළුකර්මය; බොධිස
ත්තෙන, බෝසතාණන්විසින්; පුච්ඡිතා, විචාරණලද්දාහු; තාහි
ගාථාහි, ඒගාථාවලින්; කථෙසුං, කීවාහුය; තං, එය, බොධිස
ත්තො, බෝසත්තෙම; සුත්වා, අසා; මෙ, මට; වත, එකාන්ත
යෙන්; ලාභා, ලාභවූයේය; මෙ, මාවිසින්; වත, ඒකාන්තයෙන්;
සුලද්ධං, යහපතක්ලබනලද්දේය; සොහං, ඒ මම; ඉධ, මෙහි;
ආගන්ත්වා, අවුත්; අප්පමත්තකෙනාපි. ස්වල්පමාත්‍රවූද; කම්මෙ
න, (කුශල) කර්මයෙන්; පටිලද්ධසම්පත්තියො; පිළි ලබනලද
සම්පත්; අසෙසාසිංඉති; ඇසූයෙමියයි; වත්වා, කියා; ඉමං උදා
නං, මේප්‍රීතිවාක්‍යය; උදානෙසි, පහළකෙළේය

සුආගතං එත්ථ මෙ අජ්ජ-සුප්පභාතං සුහුට්ඨිතං
යං අද්දසාසිං දෙවතායො-අච්ඡරා කාමවණ්ණියො.

ඉමාසං ධම්මං සුත්වාන-කාහාමි කුසලං බහුං
දානෙන සමචරියාය-සඤ්ඤමෙන දමෙනච
සොහං තත්ථ ගමිස්සාමි-යත්ථ ගන්ත්වා න සොචරෙ.

අථ නං සත්තාහච්චයෙන දෙවරාජා රථෙ නිසීදාපෙත්වා බාරාණසිංයෙව පෙසෙසි, සො දෙවලොකෙ අත්තනා දිට්ඨ කාරණං මනුස්සානං ආචික්ඛි, තෙ මනුස්සා පුඤ්ඤානි කාතුං මඤ්ඤිංසු—ඉති සත්ථා ඉමං ධම්මදෙසනං ආහරිත්වා ජාතකං

---

යං, යම්හෙයකින්; අච්ඡරා, දිව්‍යාප්සරාවූ; කාමවණ්ණියො, කාමයත්හෙත් වර්ණනීයාවූ; දෙවතායො, දෙවතාවන්, අද්දසාසිං, දුටුයෙම්ද; මෙ, (මා) මට; එත්ථ, එකාන්තයෙන්, සුආගතං, යහපත් ආගමනක්වූයේය; අජ්ජ, අද (රෑය) සුප්පභාතං, යහපත් පහන්වීමක්වූයේය; සුහුට්ඨිතං, යහපත් උදාවීමක්වූයේය—

ඉමාසං, මේදිව්‍ය ස්ත්‍රීන්ගේ; ධම්මං, (කුශල) ධර්මය; සුත්වාන; අසා; දානෙන, දන්දීමෙන්ද; සමචරියාය, (කෙලෙස්) සංසිඳුවන හැසිරීමෙන්ද, සඤ්ඤමෙන, කායවාක් සංයමයෙන්ද; දමෙනච, ඉන්ද්‍රියදමනයෙන්ද; බහුං, බොහෝවූ; කුසලං, කුශලය; කාහාමි, කරන්නෙමි; යත්ථ, යම්තැනෙකක්හි; ගන්ත්වා, ගොස්; නසොචරෙ, (සත්ත්වයෝ) සොකානොකෙරෙද්ද; සොඅහං, ඒමම; තත්ථ, එහි; ගමිස්සාමිඉති, යන්නෙමියි කියේය—

අථ, ඉක්බිත්තෙන්; දෙවරාජා, සක්දෙව්රජතෙම; සත්තාහච්චයෙන, සත්දවසක්හුගේ ඇවෑමෙන්; නං, ඒ ගුත්තිලාචාර්‍ය්‍යයන්; රථෙ, රථයෙහි; නිසීදාපෙත්වා, ඉඳුවා; බාරාණසිංඑව, බරණැස්නුවරටම; පෙසෙසි, හැරියේය; සො, ඒ ගුත්තිලඇදුරුතෙම; දෙවලොකෙ, දෙව්ලොවෙහිදී, අත්තනා, තමාවිසින්; දිට්ඨකාරණං, දක්නාලදකරුණු; මනුස්සානං, මිනිසුන්ට; ආචික්ඛි, කීයේය; තෙමනුස්සා, ඒමිනිස්සු; පුඤ්ඤානි, පින්; කාතුං, කරනට; මඤ්ඤිංසු, සිතුවාහුය—ඉති, මෙසේ; සත්ථා, ශාස්තෲන්වහන්සේ; ඉමංධම්මදෙසනං, මේ ධර්මදෙශනාව; ආහරිත්වා, ගෙනහැරදක්වා; ජාතකං, ජාතක

සමොධානෙසි, මූසිලො දෙවදත්තො අහොසි අනුරුද්ධො රාජා ආනන්දො, ගුත්තිලාචරියො අහමෙව එවමයං විත්ථාරත මහදීකම්මානාදිවසෙන ඡත්තිංසවිමානසඞ්ගහදෙසනා ගුත්තිලාචරියස්ස විභාවනාවසෙන පවත්තා. තස්මා ගුත්තිලවිමානන්ති එව සඞ්ගහං ආරොපිතා.

තා පන ඉත්ථියො කස්සපදසබලස්ස කාලෙ යථාවුත්තපුඤ්ඤකම්මකරණෙන අපරාපරුප්පන්නචෙතනාවසෙන දුතියත්තභාවෙන පටිසන්ධිය එකං බුද්ධන්තරං දෙවලොකෙ එවං සංසරන්තියො අම්හාකං භගවතො කාලෙ තාවතිංසභවනෙ යෙව නිබ්බත්තිත්වා ආයස්මතා මහාමොග්ගල්ලානෙන පුච්ඡි

---

ය; සමොධානෙසි, ඈතුළත්කළසේක, හෙවත් ගළපාවදාළසේක — මූසිලො, මුසිලතෙම; දෙවදත්තො අහොසි, දෙව්දත් වූයේය; සෙනකො, ශක්‍රදෙව්රජතෙම, අනුරුද්ධො, අනුරුද්ධ ස්ථවිරවූයේය, රාජා, රජතෙම; ආනන්දො, ආනන්දතෙරුවූයේය; ගුත්තිලාචරියො, ගුත්තිලඇදුරුතෙම; අහං එව, මම්මය; එවං, මෙසේ; අයං, මේ; විත්ථාරතමහදීකම්මානාදිවසෙන, විස්තරතමහදීකම්මානාදීවශයෙන්; ඡත්තිංසවිමානසංගහදෙසනා, ෂට්ත්‍රිංශත්විමානසංග්‍රහ දෙශනාතොමෝ, ගුත්තිලාචරියස්ස, ගුත්තිලඇචාර්‍යයන්වහන්සේට; විභාවනාවසෙන, ප්‍රකාශකිරීම් වශයෙන්; පවත්තා, පැවැත්තීය; තස්මා, එහෙයින්; ගුත්තිලවිමානන්ති එව; ගුත්තිලවිමානය කියාම, සංගහං, සංග්‍රහවට, ආරොපිතා, නගනලද්දීය—

තා පන ඉත්ථියො, ඒ ස්ත්‍රීහු; කස්සපදසබලස්ස, කාශ්‍යපදශබලධාරීහුගේ; (බුදුන්ගේ) කාලෙ, කලයෙහි; යථාවුත්තපුඤ්ඤකම්මකරණෙන, කියනලදපරිද්දෙන් පින්කම්කිරීමෙන්; අපරාපරුප්පන්නචෙතනාවසෙන, අපරාපරයෙහි සිහිවූ ඉපදීම්වශයෙන්; දුතියත්තභාවෙන පටිසන්ධිය, දෙවෙනි ආත්මභාවයෙහි පටින්; එකං බුද්ධන්තරං, එක්බුද්ධාන්තරයක්; දෙවලොකෙ එව, දෙව්ලොකයෙහිම; සංසරන්තියො, සැරිසරන්නීහු; අම්හාකං භගවතො කාලෙ, අපගේ භාග්‍යවතුන්වහන්සේගේ කාලයෙහි; තාවතිංසභවනෙ එව, තව්තිසාභවනයෙහිම; නිබ්බත්තිත්වා, ඉපිද; ආයස්මතා, ආයුෂ්මත්වූ; මහාමොග්ගල්ලානෙන, මහමුගලන්තෙරුන්වහන්සේ විසින්; පුච්ඡිතා, විචාරණලද්දීහු; කම්මසරික්ඛනාය

තාකම්මාසරික්ඛතාය ගුත්තිලාචරියෙන පුච්ඡිතකාලෙ විය බ්‍යාකරිංසූති දට්ඨබ්බං.

## ගු ත්ති ල වි මා නං

අනෙකවණ්ණං දරසොකනාසනන්ති අනෙකවණ්ණවිමානං, තස්ස කා උප්පත්ති?-භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ තෙන සමයෙන ආයස්මා මහා මොග්ගල්ලානො හෙට්ඨා වුත්තනයෙන දෙවචාරිකං චරන්තො තාවතිංසභවනං අගමාසි, අථ නං අනෙකවණ්ණො දෙවපුත්තො දිස්වා සඤ්ජාතගාරවබහුමානො උපසංකමිත්වා අඤ්ජලිම්පග්ගය්හ අට්ඨාසි ථෙරො.

---

කම්මය සිහිකිරීම් වශයෙන්; ගුත්තිලාචරියෙන, ගුත්තිලආචාර්‍ය්‍යයාවිසින්; පුච්ඡිතකාලෙවිය, විචාරණලදකාලයෙහිමෙන්; බ්‍යාකරාංසූති, ප්‍රකාශකළාහුයයි; දට්ඨබ්බං, දතයුත්තාහුය—

ගුත්තිලවිමානං, ගුත්තිලවිමානයයි.

අනෙකවණ්ණංදරසොකනාසනං ඉති, අනෙකවණ්ණංදරසොකනාසනං යනාදිය; අනෙකවණ්ණ විමානං, අනෙකවණ්ණවිමානයයි; තස්ස, ඒ විමානයාගේ; උප්පත්ති, උත්පත්තිතොමෝ; කා, කවරිද?—භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවරසමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනාරාමයෙහි; විහරති, වාසයකළසේක; තෙනසමයෙන, ඒකාලයෙහි; ආයස්මාමහාමොග්ගල්ලානො, ආයුෂ්මත්වූ මහාමෞද්ගල්‍යායනස්ථවිරතෙමේ; හෙට්ඨාවුත්තනයෙන, (ගුත්තිලවිමානාදියෙහි) යට කියනලදක්‍රමයෙන්; දෙවචාරිකං චරන්තො දෙව්ලොව සැරිසරණයේක්, තාවතිංසභවනං, තව්තිසාභවනයට; අගමාසි, වැඩිසේක; අථ, ඉක්බිත්තෙන්; නං, උන්වහන්සේ; අනෙකවණ්ණො දෙවපුත්තො, අනෙකවර්ණදිව්‍යපුත්‍රතෙමේ; දිස්වා, දැක, සඤ්ජාතගාරවබහුමානො, හටගත්තාලද, සගෞරවබහුමානො, ගෞරවසහිත බහුමාන්ඇත්තේ, උපසංකමිත්වා, සම්පයටඑළඹ, අඤ්ජලිංපග්ගය්හ, ඇඳිලිබැඳගෙන, අට්ඨාසි, සිටියේය, ථෙරො, මුගලන්හිමි තෙරතෙමේ;

අනෙකවණ්ණං දරසොකනාසනං
විමානමාරුය්හ අනෙකචිත්තං
පරිවාරිතො අච්ඡරාසඞ්ගණෙන
සුනිම්මිතො භූතපතීව මොදසි.

සමසමො නත්ථිකුතො අනුත්තරි
යසෙන පුඤ්ඤෙන ච ඉද්ධියා වා
සබ්බෙ දෙවා තිදසගණා සමෙච්ච
තං ත්වං නමස්සන්ති සසිංවදෙවා.

ඉමා ච තෙ අච්ඡරා සමන්තතො
නච්චන්ති ගායන්ති ච වාදයන්ති
දෙවිද්ධිපත්තොසි මහානුභාව
මනුස්සභූතො කිමකාසිපුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතීති.

---

අනෙකවණ්ණං, නොයෙක්වණ්ණඇත්තාවූ; දරසොකනාසනං, දුකශොකනසන්නාවූ; අනෙකචිත්තං, නොයෙක් විසිතුරුවූ, විමානං, විමානයට; ආරුය්හ, ආරූඪව, අච්ඡරාසංඝෙන; දිව්‍යප්සරාසමූහයාවිසින්; පරිවාරිතො, පිරිවරණලද්දේ; සුනිම්මිතො, සුනිර්මිතවූ; භූතපතීව, සක්දෙව්රජමෙන්; හෙවත් සුනිර්මිතදෙව්රජමෙන්, මොදසි, සතුටුවන්නෙහිය;

සමසමො, සම් සම දෙවියෙක්; නත්ථි, නැත්තේය; යසෙන; යසසින්ද, පුඤ්ඤෙනච, පිනෙන්ද; ඉද්ධියාවා, සෘද්ධියෙන්ද; කුතො, කවරකාරණයකින්; අනුත්තරි, උතුම්දෙවියෙක් වේද; දෙවා, දිව්‍යසම්පත්තියෙන් බබලන්නාවූ; සබ්බෙතිදස ගණා, සියලු දිව්‍යසමූහයෝ සමෙච්ච, එක්ව; දෙවා, දෙව්මිනිස්හු; සසිංඉව, චන්ද්‍රයාටමෙන්; තං, ඒ; ත්වං, තට; නමස්සන්ති, නමස්කාරකෙරෙත —

තෙ, තාගේ; සමන්තතො, හාත්පස්හි; ඉමාචඅච්ඡරා, මේ දිව්‍යප්සරාවෝද; නච්චන්ති, නෘත්‍යකෙරෙත්; ගායන්තිච, ගායනාදකෙරෙත්; වාදයන්ති, වාද්‍යදකෙරෙත්; දෙවිද්ධිපත්තො අසි, දිව්‍යසෘද්ධියට පැමිණියේවූයෙහිය; මහානුභාව, මහත් අනුහස්ඇත්ත; මනුස්සභූතො, මනුෂ්‍යවූයේ; කිං පුඤ්ඤං, කවර පිණක්; අකාසි, කොළෙහිද; තෙ, තාගේ; වණ්ණොච, ශරීරවර්ණයද; සබ්බදිසා, සියලුදිසාවන්; පභාසති, බබුලුවයි; එවං·

අධිගත සම්පත්තිකිත්තනමුඛෙන කතකම්මං පුච්ඡි, තංදස්සෙතුං—

සො දෙවපුත්තො අත්තමනො
මොග්ගල්ලානෙන පුච්ඡිතො
පඤ්හෙ පුට්ඨො වියාකාසි
යස්ස කම්මස්සිදං ඵලගත්වූගතං

සොහං භන්තෙ අහොසිං පුබ්බෙ
සුමෙධනාමස්ස ජිනස්ස සාවකො
පුථුජ්ජනො අනුබොධො හමස්මි
සො සත්තවස්සානි පබ්බජිස්සාහං.

ස්වාහං සුමෙධස්ස ජිනස්ස සත්ථුනො
පරිනිබ්බුතස්සොඝතිණ්ණස්ස තාදිනො
රතනුච්චයං හෙමජාලෙන ඡන්නං
වන්දිත්වා ථූපස්මිං මනං පසාදයං

මෙසේ; කෙන; කවරකුශල කර්මයකින්; ජලිතානුභාවො අසි ඉති, දිලියෙනලද අනුභාවයෑත්තෙහිදැයි—

අධිගත, පැමිණෙනලද, සම්පත්තිකිත්තනමුඛෙන, සම්පත්ති කීර්තනයකරනලදමුඛයෙන්; (ප්‍රකාශකරවීම්වශයෙන්) කතක ම්මං, කරනලදකුශලකර්මය; පුච්ඡි, විචාළසේක; තං, එය; දස්සෙතුං, දක්වන්ට;-මොග්ගල්ලානෙන, මුගලන්මහතෙරුන්වහන් සේවිසින්; පුච්ඡිතො, විචාරණලද්දේ; අත්තමනො, සතුටුසිත්ඇ ත්තාවූ; සො දෙවපුත්තො ඒදෙව්පුත්තෙම; ඉදං ඵලං, මේ පුණ්‍යඵලය, යස්ස කම්මස්ස ඉති, යම් කුශලකර්මයකගේදයි; පු ට්ඨො, (මුගලන්මහතෙර) විචාළසේක්; පඤ්හෙ, ප්‍රශ්ණයන්, ව්‍යාකාසි, (දෙව්පුත්) විසඳකියේය; වුත්තං, කියනලදී—

භන්තෙ, ස්වාමීනි; සොඅහං, ඒ මම; පුබ්බෙ, පූර්වයෙහි, සුමෙ ධනාමස්ස, සුමෙධනාම්වූ; ජිනස්ස, පස්මරුන්දිනූ, බුදුන්ගේ; පු ථුජ්ජනො, පෘථග්ජනවූ; සාවකො, ශ්‍රාවකයෙක * අහොසිං, වූ යෙමි; අහං, මම; අනුබොධොඅස්මි, චතුස්සත්‍යාවබොධයනොකෙ ළේවූයෙමි; සො අහං, ඒ මම, පබ්බජිත්වා, පැවිදිව; සත්තවස්සා නි, සත්අවුරුද්දක්, (වුසුයෙම්)

සො අහං, ඒමම; ජිනස්ස, පස්මරුන්දිනූ; ඔඝතිණ්ණස්ස, චතුර්විධ ඔඝයෙන්එතරවූ, තාදිනො, (අෂ්ටලොකධර්මයෙන්නම්

* අහොසිං මුද්‍රිත පාලියං අහුවාසිං මුද්‍රිතට්ඨකථායං

නාමාසි දානං නවමත්ථි දාතුං
පරෙ ච ඛො තත්ථ සමාදපෙසිං
පූජෙථ නං පූජනෙය්‍යස්ස ධාතුං
එවංකිර සග්ගමිතො ගමිස්සථ

තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කාමං දිබ්බං අනුභොමි
මොදාමහං තිදසගණස්ස මජ්ඣෙ
න තස්ස පුඤ්ඤස්ස ඛයංපි අජ්ඣගාති

කථෙසි—ඉතො කිර තිංසකප්ප සහස්සෙ සුමෙධො නාම සම්මා සම්බුද්ධො ලොකෙ උප්පජ්ජිත්වා සදෙවකං ලොකං

---

පාතෙංවත්නාවූ) තාදිගුණැති; පරිනිබ්බුතස්ස, පිරිනිවියාවූ; සුමෙධස්ස, සුමේධනම්වූ; සත්ථුනො; ශාස්තෘන්වහන්සේගේ; රතනුච්චයං, රත්නයෙන්බඳිනලද්දාවූ; හෙමජාලෙන, රන්දැලින්; ඡන්නං, වසනලද්දාවූ; (චෛත්‍යය) වන්දිත්වා, වැඳ; ථූපස්මිං චෛත්‍යයකෙරෙහි; මනං, සිත, පසාදයිං, පැහැදවූයෙමි;

මෙ, මාවිසින්; (කරනලද) දානං, දීමක්; න ආසි, නූවූයේය; මෙ, මාවිසින්; (පරිග්‍රහකරනලද්දකින්)දාතුං, දෙන්ට, (දෙයක්) නවඅත්ථි, නොමැතිවූයේය; තත්ථ, එහි, පූජනෙය්‍යස්ස, පිදියයුතුවූ; බුදුරජහුගේ, තංධාතුං, ඒධාතූන්වහන්සේට; පූජෙථ, පූජාකරව්, එවංකිර, මෙසේවනාහි; ඉතො, මේ මිණිස්ලොවින්සැව; සග්ගං, ස්වර්ගයට; ගමිස්සථ, පැමිණෙන්නහුයයි, පරෙචඛො, අන්‍යයන්දවනාහි; තත්ථ, එහි; සමාදපෙසිං, සමාදන්කරවූයෙමි;

මයා, මාවිසින්; තංඑවකුසලංකම්මං, ඒකුසලකර්මයම; කතං කරනලද්දේය; අහං, මම; දිබ්බං, දිව්‍යමයවූ; සුඛඤ්ච, පස්කම්සැපද; අනුභොමි, අනුභවකෙළෙමි; අහං, මම; තිදසගණස්ස, දිව්‍යසමූහයාගේ; මජ්ඣෙ, මධ්‍යයෙහි; මොදාමි; සතුටුවෙමි; තස්සපුඤ්ඤස්ස, ඒපුණ්‍යයාගේ; ඛයංපි, ක්ෂයභාවය වනාහි; න අජ්ඣගාඉති, නොපැමිණියේයයි; කථෙසි, කීයේය—

ඉතොමෙතින්; තිංසකප්පසහස්සෙකිර, කල්පතිස්දහසින් මත්තෙහිවනාහි; සුමෙධොනාම, සුමෙධනම්වූ; සම්මාසම්බුද්ධො සම්‍යක්සම්බුදුරජතෙම; ලොකෙ, ලොව්, උප්පජ්ජිත්වා, ඉපිද; සදෙවකං, දෙවියන්සහිතවූ, ලොකං, (ඔකාසලොකය; එකො

එකොභාසං කත්වා කතබුද්ධකිච්චො පරිනිබ්බුතො මනුස්සෙහි ච භගවතො ධාතුං ගහෙත්වා රතනචෙතියෙ කතෙ අඤ්ඤතරො පුරිසො සත්ථුසාසනෙ පබ්බජිත්වා සත්තවස්සානි බ්‍රහ්මචරියං චරිත්වා අනවට්ඨිතචිත්තතාය ලජ්ජී කුක්කුච්චකො හුත්වා උප්පබ්බජිතො ච සංවෙගබහුලතාය ධම්මච්ඡන්දවන්තතාය ච චෙතියඞ්ගණෙ සම්මජ්ජනපරිසම්මජ්ජනාදීනි කරොන්තො නිච්චසීලඋපොසථසීලානි රක්ඛන්තො ධම්මං සුණන්තො අඤ්ඤඤ්ච පුඤ්ඤකිරියාය සමාදපෙන්තො විචරති

සො ආයුපරියොසානෙ කාලංකත්වා තාවතිංසෙසු නිබ්බත්ති සො පුඤ්ඤකම්මස්ස උළාරභාවෙන මහෙසක්ඛො මහානුභාවො සක්කාදීහි දෙවතාහි සක්කතපූජිතො හුත්වා තත්ථ යාව

---

භාසං කත්වා, එකාලෝකකොට, කතබුද්ධකිච්චො, කරනලද බුද්ධකෘත්‍යඇත්තේ; පරිනිබ්බුතො, පිරිනිවීසේක්, මනුස්සෙහිච, මනුෂ්‍යයන්විසින්ද; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ, ධාතුංගහෙත්වා, (ශාරීරික) ධාතුවගෙණ, (කොට) රතනචෙතියෙ, රත්නචෛත්‍යය; කතෙ, කළකල්හි; අඤ්ඤතරොපුරිසො, එක්තරාපුරුෂයෙක්; සත්ථුසාසනෙ, ශාස්තෘන්වහන්සේගේ ශාසනයෙහි; පබ්බජිත්වා, පැවිදිව; සත්තවස්සානි, සත්අවුරුද්දක්; බ්‍රහ්මචරියංචරිත්වා, බ්‍රහ්මචර්‍ය්‍යාවෙහිහැසිර; අනවට්ඨිත, නොවැටහෙන ලද, චිත්තතාය, සිත්ඇතිබැවින්; ලජ්ජී, පවට ලජ්ජාඇත්තේ, කුක්කුච්චකොහුත්වා කුකුස් ඇත්තෙක්ව; උප්පබ්බජිතොච, ගිහිවූයේද; සංවෙගබහුලතාය, කළකිරීම බොහෝකොට ඇතිබැවින්ද; ධම්මච්ඡන්දවන්තතායච, කුශලධර්මයෙහි කැමැත්තඇති බැවින්ද චෙතියඞ්ගණෙ, චෛත්‍යමළුවෙහි; සම්මජ්ජනපරිසම්මජ්ජනාදීනි, ඇමදීම් සුවඳපිරිබඩලීම් ආදිය; කරොන්තො, කරන්නේ; නිච්චසීල උපොසථසීලානි, නිත්‍යශීල උපෝසථශීලයන්; රක්ඛන්තො, රක්ෂාකරන්නේ; ධම්මං සුණන්තො, ධර්මයඅසන්නේ; අඤ්ඤඤ්ච, සෙස්සන්ද, පුඤ්ඤකිරියාය, පුණ්‍යක්‍රියායෙහි සමාදපෙන්තො, සමාදන්කරවමින්; විචරි, හැසුරුනේය;—

සො, හෙතෙම; ආයුපරියොසානෙ, ආයුෂයාගේ; කෙළවරෙහි; කාලංකත්වා, කළුරියකොට; තාවතිංසෙසු, තව්තිසාවැසිදෙවියන් අතුරෙහි, නිබ්බත්ති, උපන්නේය; සො, හෙතෙම, පුඤ්ඤකම්මස්ස, කුශලකර්මයාගේ; උළාරභාවෙන, මහත්බැවින්; මහෙසක්ඛො, මහෙ

යාවතායුකං ඨත්වා තතො චුතො අපරාපරං දෙවමනුස්සෙසු සංසරන්තො ඉමස්මිං බුද්ධුප්පාදෙ තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන තාවතිංසභවනෙ නිබ්බත්ති අනෙක වණ්ණොති චස්ස නාමං දෙවතා සඤ්ජානිංසු, තං සන්ධාය වුත්තං අනෙකවණ්ණො දෙවපුත්තො—පෙ—කාසෙසින්.

## අනෙකවණ්ණවිමානං–17

"ඉමානි පඤ්චසුත්තානි සඞ්ගහකථාය කොසලලසංගහෙත බ්බානි"

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච—

---

ශාක්‍යවූයේ; මහානුභාවො, මහත්අනුභාවඇත්තේ; සබ්බාභිදෙවතානි, ශක්‍රාදිදෙවියන්ගෙන්; සක්කතපූජිතොහුත්වා. සත්කාරපූජාලබන්නෙක්ව; තත්, එතව්තිසාදෙව්ලොවැ; යාවත, යුකං, ආයුෂඇතිතාක්; ඨත්වා, සිට; තතොචුතො, එයින්චුතවූයේ; අපරාපරං, ඔබ්නොබ; දෙවමනුස්සෙසු, දෙව්මිනිසුන්අතුරෙහි, සංසරන්තො, සැරිසරන්නේ; ඉමස්මිං බුද්ධුප්පාදෙ, මේ බුද්ධොත්පාදයෙහි; තස්සෙව කම්මස්ස, ඒ (කුශල) කර්මයේම. විපාකාවසෙසෙන, අවශෙෂ විපාකයෙන්; තාවතිංසභවනෙ, තව්තිසාභවනයෙහි, නිබ්බත්ති, උපන්නේය. තං, ඒ; අනෙකවණ්ණොතිවචනං, අනෙක වණ්ණ යනවචනය; දෙවතා, දෙවතාවෝ; සඤ්ජානිංසු, දැනගත්තාහුය; තංසන්ධාය, ඒසඳහා; අනෙකවණ්ණොදෙවපුත්තො, අනෙකවර්ණදිව්‍යපුත්‍රයයි; වුත්තං, කියනලදී—පෙ—කළේසිඉති, කියේයි—

අනෙකවණ්ණවිමානං, අනෙකවර්ණවිමානයයි—†

මෙ, මාවිසින්; එවං, මේආකාරයෙන්; සුතං, අසනලද්දේය; නොහොත්; මෙ, මාගේ; සුතං, ඇසීම; එවං මෙසේය; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාව

---

† අනෙකවණ්ණ විමානවණ්ණනා මුද්දිකපාලියං—

සෙය්‍යථාපි භික්ඛවෙ ද්වෙ අගාරා සද්වාරා තත්‍ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි අනුසඤ්චරන්තෙපි අනුවිචරන්තෙපි එවමෙව ඛො අහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි, ඉමෙ වත භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී සුචරිතෙන සමන්නාගතා මනො සුචරිතෙන

---

ත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, (දෙව්රම්වෙහෙර යැයි) ජේතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬුසිටුහුගේආරාමයෙහි; විහරති, වැඩවාසයකළසේක—

තත්‍ර ඛො, එකල්හිවනාහි; භගවා, භාග්‍යවත් සර්වඥරාජොත්තමයාණන්වහන්සේ; භික්ඛවොති, මහණෙනි'කියා; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රණයකළසේක; තෙභික්ඛූ, ඒභික්ෂූහු; භදන්තාති, පින්වත් ස්වාමීන්වහන්සැයිකියා; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ වචනයට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්නාහුය; භගවා භාග්‍යවත් බුදුරජානන්වහන්සෙ; එතං, මේවචනය; අවොච, වදාළසේක—

භික්ඛවෙ, මහණෙනි? සෙය්‍යථාපි, යම්සේ, * සංවාරා, සම්මුඛවාරඇතිවූ; ද්වෙඅගාරා ගෘහයෝ දෙදෙනෙක්වෙද්ද; තත්‍ථ එහි, චක්ඛුමා, අප්‍රහාණවූ චක්ෂුස්ප්‍රසාදඇති; පුරිසො, පුරුෂයෙක්, මජ්ඣෙඨිතො, මධ්‍යයෙහි සිටියේ; ගෙහංපවිසන්තෙපි, ගෙටවදනාවූද, නික්ඛමන්තෙපි, ගෙයින්පිටතට යන්නාවූද; අනුසඤ්චරන්තෙපි,අනුසඤ්චාරණයකරන්නාවූද, අනුවිචරන්තෙපි, ඔබ නොබ යන්නාවූද; මනුස්සෙ, මනුෂ්‍යයන්; පස්සෙය්‍ය දක්නේද—

භික්ඛවෙ, මහණෙනි; එවමෙව ඛො, එපරිද්දෙන්ම, අහං, මම; චවමානෙ, චුතවන්නාවූද; උපපජ්ජමානෙ, උපදින්නාවූද; හීනෙ, හීනවූද; පණීතෙ, ප්‍රණීතවූද; සුවණ්ණෙ, යහපත් ශරීරවර්ණඇතිවූද; දුබ්බණ්ණෙ, දුර්වර්ණවූද; සුගතෙ, ස්වර්ගප්‍රාප්තාවූද, දුග්ගතෙ, සංජීවාදි අෂ්ටමහානරකාදියෙහි උපන්නාවූද; යථාකම්මූපගෙ, යම්ප්‍රකාරයකින්; (කුශලකර්මයද,) ඒප්‍රකාර

---

* ප්‍රෙජසි මුද්‍රිත පාලියං—

සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පන්නා-ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උප්පන්නා ඉමෙවත භොන්තො සත්තා කායදුච්චරිතෙන සම

---

යෙන්; උපන්නාවූ, යෙන, සත්වයන්; විසුද්ධෙන, පිරිසිදුවූ; අතික්කන්තමානුසකෙන, මිනුෂ්‍යඇස අතික්‍රාන්තවූ, දිබ්බෙනචක්ඛුනා, දිව්‍යඇසින්, පස්සාමි, දකිම්යිවදාළසේක—

වත, ඒකාන්තයෙන්; ඉමෙභොන්තො සත්තා, පින්වත්වූ මේසත්වයෝ; කායසුචරිතෙන සමන්නාගතා, කායසුචරිතයෙන් යුක්තවූවාහුය, වචීසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතයෙන් යුක්තවූවාහුය; මනොසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතයෙන්යුක්තවූවාහුය; අරියානං අනුපවාදකා, බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකයන්ට; උපක්‍රොශ නොකළාහුය; සම්මාදිට්ඨිකා,සම්‍යක්දෘෂ්ටිකයෝය, සම්මාදිට්ඨි කම්මසමාදානා, සම්‍යක්දෘෂ්ටිකර්මසමාදන්වන ලද්දාහුය; තෙ, ඒසත්වයෝ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්, පරම්මරණා, මරනින්මත්තෙහි; සුගතිං, සුගතිනම්වූ; සග්ගං, ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උප්පන්නා, උපන්නාහුය; යථාකම්මූපගෙ, කර්මයවූපරිද්දෙන් පැමිණියාවූ; සත්තෙපජානාමි, සත්වයන්දනිමියි (වදාළසේක)

වත, ඒකාන්තයෙන්; ඉමෙ භොන්තොසත්තා, මේපින්වත්වූ සත්වයෝකායසුචරිතෙන සමන්නාගතා, කායසුචරිතයෙන් යුක්තවූවෝය, වචීසුචරිතෙන සමන්නාගතා, වාක්සුචරිතයෙන්; යුක්තවූවෝය; මනොසුචරිතෙන සමන්නාගතා, මනෝසුචරිතයෙන් යුක්තවූවෝය, අරියානං අනුපවාදකා; බුද්ධාදී ආර්‍ය්‍යයන්ට උපක්‍රොශ නොකළෝය; සම්මාදිට්ඨිකා, සම්‍යක්දෘෂ්ටිකවූවෝය, සම්මාදිට්ඨිකම්මසමාදානා, සම්‍යක්දෘෂ්ටික කර්මසමාදන්වූවෝය; තෙ, ඒසත්වයෝ කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා මරනින්මත්තෙහි; මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි, උප්පන්නා, උපන්නාහුය;—වත, ඒකාන්තයෙන්;

න්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන
සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨික
ම්මසමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා පෙත්තිවිසයං උ
පපන්නා ඉමෙවාපන භොන්තොසත්තා කායදුච්චරිතෙන සම
න්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනො දුච්චරිතෙ
න සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදි
ට්ඨිකම්මසමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා තිරච්ඡාන
යොනිං උපපන්නා-ඉමෙවාපන භොන්තො සත්තා කායදුච්ච
රිතෙන සමන්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනො

---

ඉමෙභොන්තො සත්තා, මේපින්වත්වූ සත්වයෝ; කාය
දුච්චරිතෙන සමන්නාගතා, කායදුශ්චරිතයෙන් යුක්තවූවෝය;
වචීදුච්චරිතෙන සමන්නාගතා, වාග්දුශ්චරිතයෙන් යුක්තවූවෝ
ය; මනොදුච්චරිතෙනසමන්නාගතා, මනොදුශ්චරිතයෙන් යු
ක්තවූවෝය; අරියානංඋපවාදකා, ආර්‍ය්‍යයන්ට උපක්‍රොශක
ලෝය; මිච්ඡාදිට්ඨිකා, මිථ්‍යාදෘෂ්ටිකවූවෝය, මිච්ඡාදිට්ඨිකම්මස
මාදානා, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන්වූවෝය; තෙ, ඒසත්වයෝ; කාය
ස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්
මත්තෙහි; පෙත්තිවිසයං, ප්‍රෙතලොකයෙහි;උපපන්නා, උප
න්නාහුය;

ඉමෙවාපන භොන්තොසත්තා, මේපින්වත්වූසත්වයෝද; කා
යදුච්චරිතෙනසමන්නාගතා, කායදුශ්චරිතයෙන් යුක්තවූවෝය,
වචීදුච්චරිතෙන සමන්නාගතා, වාග්දුශ්චරිතයෙන් යුක්තවූ
වෝය, මනොදුච්චරිතෙනසමන්නාගතා, මනොදුශ්චරිතයෙ
න් යුක්තවූවෝය; අරියානංඋපවාදකා, ආර්‍ය්‍යයන්ට උපක්‍රොශ
කලෝය; මිච්ඡාදිට්ඨිකා, මිථ්‍යාදෘෂ්ටිකවූවෝය; මිච්ඡාදිට්ඨික
ම්ම සමාදානා, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන්වූවෝය, තෙ, ඒසත්ව
යෝ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා,
මරණින්මත්තෙහි, තිරච්ඡානයොනිං, තිර්‍ය්‍යක්අපායෙහි, උප
න්නා, උපන්නාහුය

ඉමෙවාපනභොන්තො සත්තා, මේ පින්වත්වූ සත්වයෝ තෝ;
කායදුච්චරිතෙනසමන්නාගතා, කායදුශ්චරිතයෙන් යුක්තවූවා
හුය; වචීදුච්චරිතෙනසමන්නාගතා, වාග්දුශ්චරිතයෙන් යුක්තවූ
වාහුය; මනොදුච්චරිතෙනසමන්නාගතා, මනොදුශ්චරිතයෙ

දුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නාති.

තමෙනං භික්ඛවෙ නිරයපාලා නානාබාහාසු ගහෙත්වා යමස්සරඤ්ඤො දස්සෙන්ති තමෙනං භික්ඛවෙ යමො රාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු පඨමං දෙවදූතං පාතුභූතන්ති, සො එවමාහ නාද්දසං භන්තෙති තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානන්ති, — සො එවමාහ අද්දසං භන්තෙති තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භො පුරිස තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි අහම්පි ඛොම්හි ජාතිධම්මො ජාතිං අනතීතො

---

න්වූත්තාවූවාහුය, අරියානංඋපවාදකා, ආර්‍ය්‍යයන්ට උපක්‍රොශක ළාහුය; මිච්ඡාදිට්ඨිකා, මිථ්‍යාදෘෂ්ටිකාවූවාහුය, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන්වූවාහුය; තෙ, ඒසත්වයෝ; කායස්සභෙදා, කාරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, අපායනම්වූ; දුග්ගතිං, දුර්ගතිනම්වූ; විනිපාතං, විනිපාතනම්වූ; නිරයං, නරකයෙහි; උපපන්නාති' උපන්නාහුයයි (වදාළසේක)

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහු; නිරයපාලා, නරකපාලයෝ; නානාබාහාසුගහෙත්වා, අනෙකප්‍රකාර බාහුවලින් අල්වාගෙණ, යමස්සරඤ්ඤො, (ධර්මිෂ්ඨවූ) යමරජහට; දස්සෙන්ති, දක්වත්; භික්ඛවෙ, මහණෙනි; තමෙනං ඔහු; යමො රාජා ධර්මිෂ්ඨවූ යමරජතෙම; පඨමංදෙවදූතං ප්‍රථමදෙවදූතයා; සමනුයුඤ්ජති යොදආකාරයෙනකොට ලබ්ධිය විචාරයි; සමනුගාහති ලබ්ධිය පිහිටුවමින් කාරණය විචාරයි; සමනුභාසති, කාරණයවිචාරමින් කියයි, අම්භොපුරිස, එම්බා පුරුෂය, ත්වං, තෝ; මනුස්සෙසු, මනුෂ්‍යයන්අතුරෙහි; පාතුභූතං, පහළවූ, පඨමංදෙවදූතං පළමුවන දෙවදූතයා; නාද්දසාති, නුඹ දුටුයෙහිදැයි (විචාරයි) සො, හෙතෙම; එවමාහ, මෙසේකියත්තෙය; භන්තෙ, ස්වාමීනි; නාද්දසන්ති, නුදුටිම්යි; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට; යමො රාජා, යමරජතෙම; එව

හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසා'ති සො එවමාහ නාසක්ඛිස්සං භන්තෙ පමාදස්සං භන්තෙ'ති තමෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ අම්භොපුරිස පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා තග්ඝ ත්වං අම්භොපුරිස තථා කරිස්සන්ති යථා තං පමත්තං තං ඛො පනෙ තං පාපකම්මං නෙව මාතරා කතං න පිතරා කතං න

---

මාහ, මෙසේකීයයි; අම්භොපුරිස. එම්බාපුරුෂය; මිත්තං, මිත්‍රවූ; උට්ඨානාසෙය්‍යතං, උඩුකුරුවහොත්තාවූ; සකෙමුත්තකරීසෙ, ස්වකීයවූ මූත්‍රමලයෙහි, පලිපන්නං ලිප්තවූ හෙවත් තැවරුණු ශරීරඇති; සෙමානං, අනාථ අසරණවහොත්තාවූ; දහරංකුමාරං, ලදරුකුමාරයා. (නාද්දසාති,) නුදුටුවෙහිදැයි විචාරයි; සො, හෙතෙම; එවමාහ, මෙසේකීයයි; භන්තෙ, වහන්ස; අද්දසංති, දුටිමියි, භික්ඛවෙ, මහණෙනි, යමොරාජා; යමරජතෙම; තමෙනං, ඔහුට, එවමාහ, මෙසේකීයයි; අම්භොපුරිස, එම්බාපුරුෂය; විඤ්ඤුස්සසතො, කාරණා කාරණා පරිඥානයෙනො විත විසදබුද්ධි විශෙෂසම්පන්නාවූ; මහල්ලකස්ස, මහලුවූ; තස්සතෙ, ඒතාට අහම්පිඛො, මමදවනාහි, ජාතිධම්මො අජිහි, ජාතිය ස්වභාවකොට ඇත්තේවෙමි; ජාතිංඅනතීතො, ජාතිය අනික්මා නොගියෙක්වෙමි. ✓

හන්ද, එබැවින්; කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද, මනසා සිතින්ද; කල්‍යාණං, කුශලය. කරොමිඉති, කෙරෙම්සිතියා; එතං, මේසින; න අද්දසාසි, (නුදුටුයේදැයි විචාරයි) සො, හෙතෙම; භන්තෙ, වහන්ස; නාසක්ඛිස්සං, නොපිළිවන්විමි; භන්තෙ, වහන්ස, පමාදස්සංඉති, පමාවීමියි; එවං, මෙසේ; ආහ, කීයයි; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට, යමොරාජා යමරජතෙම; අම්භොපුරිස, එම්බාපුරුෂය; පමාදවතාය, ප්‍රමාදවූබැවින්; ත්වං, තෝ; කායෙන, කයින්, වාචාය, වචනයෙන්; මනසා, සිතින්, කල්‍යාණං. කුශලය; න අකාසි, නොකෙළෙහිද; අම්භොපුරිස, එම්බාපුරුෂය; පමත්තං, ප්‍රමාදවූවහුට; යථා, යම්සේ (කෙරේද) තං, තට; තථා; එසේ; කරිස්සන්ති (යමපල්ලෝ වදබන්ධනකරන්නාහුයි)ම්; තග්ඝ, ඉතාමය ගොතා; තං, එතංඛොපන, ඒ මේ පාපකර්මයවනාහි; මාතරා, ජනනීමවිසින්; නකතංඑව, නොකරණලද්දේමැ; පිතරා, පියාවිසින් නකතං, නොකරණලද්දේය; භාතරා භ්‍රාතෘව (සහෝ

භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං තයා වෙ තං පාපකම්මං කතං ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසීති

තමෙනං භික්ඛවෙ යමොරාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා දුතියං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු දුතියං දෙවදූතං පාතුභූතන්ති—සොඑවමාහ නාද්දසං භන්තෙති තමෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ අම්භොපුරිස න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ජිණ්ණං ගො

---

දරයා) විසින් නකතං, නොකරනලද්දේය; භගිනියා, බුහුනනිය (සහෝදරිය) විසින්; නකතං, නොකරනලද්දිය; මිත්තාමච්චෙහි, මිත්‍රාමාත්‍යයන්විසින්; නකතං, නොකරණලද්දේය; ඤාතිසාලොහිතෙහි සහලේනෑයන් (ඇවැසාබඤ්ඤන්) විසින්; නකතං, නොකරණලද්දේය; සමණබ්‍රාහ්මණෙහි, ශ්‍රමණ බ්‍රාහ්මණයන්විසින් නකතං, නොකරණලද්දේය;

දෙවතාහි, (ශක්‍රාදි) දෙවියන් විසින්; නකතං, නොකරණලද්දේය; එතංපාපකම්මං, ඒපාපකර්මය; තයාඑව; තාවිසින්ම; කතං, කරණලද්දේය; එතස්ස. ඒපාපකර්මයාගේ; විපාකං, (දුක්) විපාකය; ත්වංඑව, තෝම; පටිසංවෙදිස්සසිඉති, විඳින්නෙහියයි (කියන්නේය] භික්ඛවෙ, මහණෙනි; යමොරාජා යමරජතෙම; තමෙනං, ඔහුට; පඨමං පළමුවෙනි දෙවදූතං දෙවදූතයා; සමනුයුඤ්ජිත්වා, අනුයොගවශයෙන් ආරොපනයකරමින්, විචාරා; සමනුගාහිත්වා ලබ්ධියපිහිටුවා; සමනුභාසිත්වා, කාරුණු විචාරා; දුතියං, දෙවැනිවූ; දෙවදූතං, දෙවිදූතයා; සමනුයුඤ්ජති, අනුයොගවශ අරොපනය කරමින් විචාරයි; සමනුගාහති, ලබ්ධිය පිහිටුවයි; සමනුභාසති. කාරුණුවිචාරයි; අම්භොපුරිස. එම්බාපුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිණිසුන්අතුරෙහි, පාතුභූතං, පහළවූ; දුතියං, දෙවැනිවූ; දෙවදූතං, දෙවදූතයා; න අද්දසඉති, නුදුටුයෙහිදැයි; (විචාරන්නේය) සො, හෙතෙම; භන්තෙ, වහන්ස; න අද්දසංඉති, නුදුටුයෙමියි; එවංආහ, මෙසේකියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට; යමොරාජා, යමරජතෙම; අම්භොපුරිස, එම්බාපුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිනිසුන්අතුරෙහි; ජිණ්ණං, ජරපත්වූ; ගො

පානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායනං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං ඛණ්ඩදන්තං පලිතකෙසං විලූනං ඛලිතං සිරො වලිතං තිලකාහතගත්තන්ති සොඑවමාහ අද්දසං භන්තෙති තමෙනංභික්ඛවෙ යමොරාජා එවමාහ අම්භොපුරිස තස්ස තෙ විඤ්ඤුස්සසතො මහල්ලකස්ස න එතදහොසි අහම්පි ඛොම්හි ජරා ධම්මො ජරං අනතීතො හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති—සො එවමාහ නා සක්ඛිස්සං භන්තෙ පමාදස්සං භන්තෙති තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භොපුරිස පමාදවතාය න කල්‍යාණමකාසි

---

පානසිවංකං, ගොනැස්සක් සේ වක්වූ; භොග්ගං, ප්‍රාග්භාරවූ; (ගෙළවත් මැදින්බිඳී ඉදිරියටනැමුනාවූ; දණ්ඩපරායනං සැරයටි දණ්ඩපිහිටකොටඇත්තාවූ; පවෙධමානං, වෙව්ලනුලබමින්; ගච්ඡන්තං, හැසිරෙන්නාවූ; ආතුරං, ජරාවෙන් ආතුරවූ; ගතයොබ්බනං, ගිය යෞවනය ඇති; ඛණ්ඩදන්තං, දිරාහුණුබැවින් වැටුණු දත්ඇති; පලිතකෙසං, පැසී සුදුවූ හිසකේඇති; විලූනං, ඉස්ලීගියහිසකේඇති. ඛලිතංසිරං, බොහෝසේ ඉගිලීගිය හිසකේඇති; (හිසඇට නාවූ) වලිතං, රැලිනැඟුණුසමඇති; තිලකාහතගත්තං, සුදු කළු තිලකයන්ගෙන්ගැවසීගත්තාවූ ශරීරයඇති, ඉත්ථිංවා, ඉස්ත්‍රියක්හෝ; පුරිසංවා; පුරුෂයෙක්හෝ; නාද්දසඉති. නුදුටුයෙහිදැයි; එවංආහ, මෙසේවිචාරන්නේය;

සො, හෙතෙම; භන්තෙ, වහන්ස; අද්දසංඉති, දුටුයෙමියයි; එවංආහ, මෙසේකියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට, යමොරාජා, යමරජතෙම; අම්භොපුරිස, එම්බාපුරුෂය; විඤ්ඤුස්සසතො, නුවණැතිවූ; මහල්ලකස්ස, මහළුවූ, තස්සතෙ, ඒතට; එතං, මෙසිත; න අහොසි, නොවූයේද; (එනම්) අහංඅපිඛො, මමදවනාහි; ජරාධම්මොඅම්හි, ජරාවස්වභාවකොටඇත්තෙත්වෙමි; ජරං, ජරාව; අනතීතො, නොයික්මවූ යෙමි, හන්ද, එබැවින්; අහං, මම; කායෙන, කයින්ද, වාචාය, වචනයෙන්ද; මනසා, සිතින්ද; කල්‍යාණං, කුශලයක්; කරොමි, කෙරෙමිය, යනුයි; .

සො, හෙතෙම; භන්තෙ, වහන්ස, නාසක්ඛිස්සං, නොහැකිවීමි; භන්තෙ, වහන්ස; පමාදස්සංඉති, පමාවූයෙමියි; එවංආහ, මෙසේකීයේය; භික්ඛවෙ, මහණෙනි, තමෙනං, ඔහුට, යමොරාජා, යමරජතෙම; එවංආහ, මෙසේකියන්නේය,

කායෙන වාචාය මනසා තග්ඝ ත්වං අම්භොපුරිස තථාකරිස්ස න්ති යථා තං පමත්තං තංඛොපනෙතං පාපකම්මං නෙව මා තරාකතං න පිතරා කතං න භාතරාකතං න භගිනියාකතං න මිත්තා මච්චෙහිකතං න ඤාතිසාලොහිතෙහිකතං න සමණ බ්‍රාහ්මණෙහි කතං න දෙවතාහිකතං තයා චෙව තං පාපක ම්මං කතං ත්වඤ්ඤෙවතස්ස විපාකං පටිසං වෙදිස්සසීති

තමෙනං භික්ඛවෙ යමොරාජා දුතියං දෙවදූතං සමනු යු ඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තතියංදෙවදූතං සමනු යුඤ්ජති සමනුගාහති සමනුභාසති අම්භොපුරිස නත්වං අද්ද

---

(ඒමෙස්සි) අම්භොපුරිස, එම්බාපුරුෂය; ත්වං, තෝ; පමාදව තාය, ප්‍රමාදවූබැවින්; කායෙන, කයින්ද, වාචාය, වචන යෙන්ද; මනසා, සිතින්ද, කල්‍යාණං, කුශලයක්; න අකාසි, නොකෙළේය; අම්භොපුරිස එම්බාපුරුෂය; යථා, යම්සේ; ප මත්තං, ප්‍රමාදවූවාහට; (විධකෙරේද) තං, තට තථා, එසේ; කරිස්සන්ති, (යමපල්ලු) වධකරන්නාහුතම්, තග්ඝ, ඒකාංශයෙන්; එතං, මේ (කියනලද) තං පාපකම්මං ඛොපන, (කුශලයටපවාවූ) ඒ පාපකර්මයවනාහි; මාතරා; (තාගේ) මව් විසින්, නකතං, නො කරණලද්දේය; පිතරා, පියාවිසින්, නකතං, නොකරණලද්දේ ය; භාතරා, සොහොයුරුවිසින්; නකතං; නොකරනලද්දේය; භගිනියා, බුහුනන් විසින්, නකතං, නොකරනලද්දේය; මිත්තා මච්චෙහි, මිත්‍රාමාත්‍යයන්විසින් නකතං, නොකරනලද්දේය; ඤා තිසාලොහිතෙහි, සහලේනෑයන්විසින්; නකතං; නොකරණ ල ද්දේය; සමණබ්‍රාහ්මණෙහි, ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින්; නකතං නොකරණලද්දේය, දෙවතාහි දෙවතාවන්විසින්; නකතං නොකරණලද්දේය; එතංපාපකම්මං, මේපාපකර්මය; තයාඑව; තාවිසින්ම, කතං, කරණලද්දේය; එතස්ස, ඒඅකුශලකර්මයා ගේ; විපාකං, විපාකය, ත්වංඑව, තෝම, පටිසංවෙදිස්සසීති, විඳින්නෙහියයි, (යනකියනමනයි)

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමොරාජා, යම රජතෙම; දුතියං, දෙවැනිවූ; දෙවදූතං, දෙව්දූතයා; සමනු යුඤ්ජිත්වා, අනුයොගවත ආරොපනයකරවින්වාරා; සමනුගාහි ත්වා, ලබ්ධිප්‍රතිෂ්ඨාවූවා; (ගෙවත් ලබ්ධියනත්වා) සමනුභාසිත්වා කාරණපවාරා; තතියං, තුන්වැනිවූ; දෙවදූතං, දෙව්දූතයා; සමනුයුඤ්ජති, අනුයොගවත ආරොපනය කරමින්ප්වාරයි;

සමනුස්සෙසු තතියං දෙවදූතං පාතුභූතන්ති — සො එවමාහ නා ද්දසං භන්තෙති තමෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ආබාධිකං දුක්ඛිතං බාල්හගිලානං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානන්ති සො එවමාහ අද්දසං භන්තෙති තමෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ අම්භො පුරිස තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි අහම්පි ඛොම්හි ව්‍යාධිධම්මො ව්‍යාධිං අනතීතො හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති

---

සමනුගාහති, ලබ්ධිය ගත්වයි; සමනුභාසති, කරුණු ප්‍රශ්න විචාරයි; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; පාතුභූතං, පහළවූ; තතියං දෙවදූතං, තෙවෙනි දෙව්දූතයා; න අද්දසඉති, නුදුටුයෙහිදැයි; (විචාරයන්නේය) සො, හෙතෙම; භන්තෙ, වහන්ස; නාඅද්දසං ඉති, නුදුටු වෙමියි, එවංආහ, මෙසේකියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට; යමොරාජා, යමරජතෙම; එවංආහ, මෙසේ කියන්නේය, නොහොත් විචාරන්නේය; ඒ මෙසේයි; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි, ආබාධිකං, ව්‍යාධි ඇත්තාවූ; දුක්ඛිතං, දුඃඛප්‍රාප්තවූ; බාල්හගිලානං, දැඩිගිලන්කම් ඇත්තාවූ, සකෙමුත්තකරීසෙ, ස්වකීයවූ මලමූත්‍රයන්හි; පලිපන්නං, තැවරුනාවූ, සෙමානං, සයනයකරන්නාවූ, අඤ්ඤෙහි, අනුන් විසින් වුට්ඨාපියමානං, නැගිටුවනු ලබන්නාවූ; අඤ්ඤෙහි, අනුන් විසින්, සංවෙසියමානං, හොවනු ලබන්නාවූ; ඉත්ථිංවා, ස්ත්‍රියක් හෝ; පුරිසංවා, පුරුෂයෙක් හෝ; න අද්දසඉති, නුදුටුයෙහිදැයි; (යනුයි)

සො, හෙතෙම; භන්තෙ, වහන්ස; අද්දසංඉති, දුටුයෙමියි; එවංආහ, මෙසේකියන්නේය, භික්ඛවෙ, මහණෙනි, තමෙනං, ඔහුට; යමොරාජා, යමරජතෙම; එවං, මෙසේ; ආහ; කියන්නේය; (කෙසේද) අම්භොපුරිස, එම්බාපුරුෂය; විඤ්ඤුස්ස සතො; නුවණැතිවූ; මහල්ලකස්ස, මහලුවූ; තස්ස. තෙ, ඒ තට, අහංඅපිඛො, මමදු වනාහි; ව්‍යාධි ධම්මොඅම්හි, ව්‍යාධි (රොගය) ස්වභාවකොටඇත්තේවෙමි; ව්‍යාධිං, රොගය; අනතීතො, අනික්‍රාන්ත නොකළෙමි; හන්ද, එබැවින්; අහං, මම; කායෙන වාචාය මනසා, කයින්, වචසින් මනසින්; කල්‍යාණං කුශලයක්; කරොම්ඉති, කෙරෙම්යි; (යනුයි)

සො එවමාහ නා සක්ඛිස්සං භන්තෙ පමාදස්සං භන්තෙති ත මෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ අම්භොපුරිස පමාදව තාය න කල්‍යාණමකාසි කායෙනවාචාය මනසා තග්ඝ ත්වං අම්භොපුරිස තථා කරිස්සන්ති යථා තං පමත්තං තං ඛො ප නෙ තං පාපකම්මං නෙව මාතරා කතං න පිතරා කතං න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං තයාවෙතං පාපකම්මං කතං ත්වඤ්ඤෙව තස්ස විපාකං පටිසංවෙදිස්සසීති

---

සො, හෙතෙම්; භන්තෙ, වහන්ස; නාසක්ඛිස්සං, (පිනස් කරන්ට) නොහැකිවූයෙම්; භන්තෙ, වහන්ස; පමාදස්සං ඉති, ප්‍රමාදවූයෙමියයි එවංආහ, මෙසේකියත්තේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහුට; යමොරාජා, යමරජතෙම; එවං, මෙසේ; ආහ, කියත්තේය; (ඒමෙසේකී) අම්භොපුරිස, එම්බාපුරුෂය, ත්වං, තෝ; පමාදවතාය, ප්‍රමාදවත්වූබැවින්; කායෙන, වාචාය මනසා, කයින් වචසින් මනසින්, කල්‍යාණං යහපතක්, නාකාසි, නොකෙළෙහිය; අම්භොපුරිස, බලපුරුෂය පමත්තං, ප්‍රමාදවූවාහට; යථා, යම්සේ; (වධකෙරෙද්ද) තථා; එසේ; තං, තට; කරිස්සන්ති, (යම්පල්හු) වධකරන්නාහුනම්, තග්ඝ, එකාන්ත, තං, ඒ; එතං, මේ; පාපකම්මංඛොපන, පාපකර්මයතම වනාහි; මාතරා, (තාගේ) මව විසින්; නකතංඑව, නොකරණලද්දේමය; පිතරා, පියාවිසින්, නකතං, නොකරනලද්දේය; භාතරා, සොහොයුරු විසින්; නකතං, නොකරනලද්දේය; භගිනියා, බූනුවන්විසින්; නකතං, නොකරණලද්දේය; මිත්තාමච්චෙහි, මිත්‍රාමාත්‍යයන්විසින් නකතං, නොකරණලද්දේය; ඤාතිසාලොහිතෙහි, සහලේ නෑයන්විසින් න කතං, නොකරනලද්දේය, සමණබ්‍රාහ්මණෙහි, ශ්‍රමණ බ්‍රාහ්මණයන්විසින් නකතං, නොකරණලද්දේය; දෙවතාහි, දෙවතාවන්විසින්; නකතං නොකරණලද්දේය, තයාඑව, තාවිසින්ම; එතංපාපකම්මං, ඒපාපකර්මය; කතං, කරණලද්දේය; ඒතස්ස, ඒපාපකර්මයාගේ; විපාකං, විපාකය; ත්වං එව, තෝම, පටිසංවෙදිස්සසි ඉති, විඳින්නෙහියයි; (යනුයි)

තමෙනං භික්ඛවෙ යමො රාජා තතියං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා චතුත්ථං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති. අම්භො පුරිස න ත්වං අද්දස· මනුස්සෙසු චතුත්ථං දෙවදූතං පාතුභූතන්ති, සො එවමාහ නාද්දසං භන්තෙති;

තමෙනං භික්ඛවෙ යමොරාජා එවමාහ: අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්තෙ: කසාහිපි තාළෙන්තෙ වෙත්තෙහිපි තාළෙන්තෙ අද්ධදණ්ඩකෙහිපි තාළෙන්තෙ හත්ථම්පි ඡින්දන්තෙ පාදම්පි ඡින්දන්තෙ හත්ථපාදම්පි ඡින්දන්තෙ කණ්ණම්පි ඡින්දන්තෙ නාසම්පි ඡින්දන්තෙ කණ්ණනාසම්පි ඡින්දන්තෙ

---

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමො රාජා, යමරජතෙම; තතියං, තුන්වනුවූ; දෙවදූතං, දේවදූතයා; සමනුයුඤ්ජිත්වා, අනුයොගවත ආරොපණයකරමින් විචාරා; සමනුගාහිත්වා, ලබ්ධියෙහි පිහිටුවා; හෙවත් ලබ්ධිගන්වා; සමනුගාභිත්වා, කාරුණුවිචාරා; චතුත්ථං, සතරවනුවූ; දෙවදූතං, දේවදූතයා; සමනුයුඤ්ජති, අනුයොගවත ආරොපණය කරමින් විචාරයි; සමනුගාහති, ලබ්ධිගන්වයි; සමනුභාසති. කාරුණු විචාරයි; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; පාතුභූතං, පහළවූ; චතුත්ථං, සතරවනුවූ; දෙවදූතං, දෙවදූතයා; න අද්දස ඉති, නොදුටුයෙහි දැයි; (විචාරන්නේය.) භන්තෙ, වහන්ස, න අද්දසං, ඉති, නොදුටුයෙමියි එවං, මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය;

භික්ඛුවෙ, මහණෙනි;තමෙනං,ඔහට;යමොරාජා, යමරජතෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; රාජානො, රජදරුවෝ;ආගුචාරිං, අපරාධකළාවූ; චොරං, සොරහු; ගහෙත්වා, අල්වාගෙන; විවිධා කම්මකාරණා, නොයෙක්කම්කටුලු කාරෙන්තෙ කරවත්; (ඒ කම් කටුලු නම්) කසාහිපි තාළෙන්තෙ, කසවලින්ද (රාජපුරුෂයෝ) තළත්; වෙත්තෙහිපි තාළෙන්තෙ, වෙවැල්වලින්ද තළත්; අද්ධදණ්ඩකෙහිපි තාළෙන්තෙ, දෙකට පැලූ සතරරියන් දිග මුගුරුවලින්ද තළත්; හත්ථම්පි ඡින්දන්තෙ, අතද කපත්; පාදම්පි ඡින්දන්තෙ,පයද කපත්; හත්ථපාදම්පි ඡින්දන්තෙ, අත හා පයද කපත්; කණ්ණම්පි ඡින්දන්තෙ, කනද කපත්; නාසම්පි ඡින්දන්තෙ, නාසයද කපත්; කණ්ණනාසම්පි ඡින්දන්තෙ, කනහා නාසයද කපත්.

බිලඞ්ගථාලිකම්පි කරොන්ති සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති රාහුමුඛම්පි කරොන්ති ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පිකරොන්ති එරකවත්තිකම්පි කරොන්ති චීරකවාසිකම්පි කරොන්ති එණෙය්‍යකම්පි කරොන්ති බලිසමංසිකම්පි කරොන්ති කහාපණකම්පි කරොන්ති ඛාරාපතච්ඡිකම්පි කරොන්ති පලිඝපරිවත්තිකම්පි කරොන්ති පලාලපීඨකම්පි කරොන්ති තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති සුනඛෙහිපි ඛාදාපෙන්ති ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති අසිනාපි සීසං ඡින්දන්ති, සො එවමාහ අද්දසං භන්තෙති;

---

බිලඞ්ගථාලිකම්පි කරොන්ති, හිස්කබල ගලවා රත්වූ ලොහෝගුළි බහා කාඩිසැලක් මෙන් කරන වදයද කරත්; සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, හිසෙහි සම ගලවා බොරලූලා සකක්සේ කරන වදයද කරත්; රාහුමුඛම්පි කරොන්ති, මුඛයෙහි තෙල්රෙදි ගල්වා ගිනිදල්වන්නාවූ වදයද කරත්; ජොතිමාලිකම්පි කරොන්ති, සියලුශරීරය තෙල්කඩින් වෙලා ගිනි දල්වන්නාවූ වදයද කරත්; හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, තෙල්කඩින් වෙලා පහනක්මෙන් දල්වන්නාවූ වදයද කරත්; එරකවත්තිකම්පි කරොන්ති, ග්‍රීවයෙහි පටන් සම ගලවා ගොප් ඇටයෙහි හෙලා යොතින්බැඳ අදිමින් තමාගේ සම පාගපාගා වැටෙන්ට හරින්නාවූ වදයද කරත්; චීරකවාසිකම්පි කරොන්ති, ග්‍රීවයෙහි පටන් උකුලදක්වාද උකුලෙහි පටන් ගොප් ඇටය දක්වාද සම ගලවා වැහැරි ඇඳුමක්මෙන් කරන වදයද කරත්; එණෙය්‍යකම්පි කරොන්ති, දෙදන දෙවැලමිටිවල යකඩ ඉදු දමා යවුලෙන් බිම සිටුවා වටකොට ගිනිදල්වන්නාවූ වදයද කරත්; බලිසමංසිකම්පි කරොන්ති, දෙපසින් ඇව්ණෙන තුඩුඇති බිලියෙන් පැහැර ඇඟ සම්මස්නහර උපුටන්නාවූ වදයද කරත්; කහාපණකම්පි කරොන්ති, ශරීරය කහවණු පමණට කොටන වදයද කරත්; ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, සියලු ශරීරය කෝදිලා කොස්සෙන් කාරම් ඉස සම්මස්නහර දියකර හරින්නාවූ වදයද කරත්; පලිඝපරිවත්තිකම්පි කරොන්ති, ඇලයකින් බිම හොවා කන්සිදුරෙන් යවුලක් ගසා දෙපාගෙන චක්‍රමණ්ඩලය හෙලනුවන්සෙයින් කරකවන වදයද කරත්; පලලාපීඨකම්පි කරොන්ති, ඇඟඇට පළා පිදුරු බිස්සක්සේ හකුළුවා දමන්නාවූ වදයද කරත්; තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, කකියවතලද තෙලින්ද ඉසිත්; සුනඛෙහිපි ඛාදාපෙන්ති, ඡාතසුනඛයන්ලවාද කවත්; ජීවන්තම්පි

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: අම්භො පුරිස තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: යෙ කිර භො තෙනා ලොකෙ පාපකානි කම්මානි කරොන්ති තෙ දිට්ඨෙව ධම්මෙ එවරූපා විවිධා කම්මකාරණා කාරෙයපුං කිමඞ්ග පන පරත්ථ, හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති; සො එවමාහ නාසක්ඛිස්සං භන්තෙ පමාදස්සං භන්තෙති,

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භො පුරිස පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා තග්ඝ ත්වං අම්භො පුරිස තථා කරිස්සන්ති යථා තං පමත්තං; තං ඛො පනෙතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං· තයා වෙතං පාපං කම්මං කතං ත්වඤ්ඤෙව තස්ස විපාකං පටිසංවෙදිස්සසීති.

---

සූලෙ උත්තාසෙන්තා, ජීවත්වන්නහුද උල ඉඳුවත්; අසිනාපි සීසං ඡින්දන්තා, කඩුවෙන් හිසද කපත්; ත්වං තෝ; න අද්දස ඉති, (ඒ කම්කටුලු හෝ කම්කටුලුකරන්නවුන්) නොදුටුයෙහි දැයි (විචාරන්නේය.) භන්තෙ, වහන්ස; අද්දසං ඉති, දුටිමියි; එවං, මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය;

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඕහට; යමො රාජා, යමරජ තෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; විඤ්ඤුස්ස සතො, කාරණා අකාරණා දත්තාවූ; මහල්ලකස්ස, මහළුවූ; තස්ස තෙ, ඒතට; භො තෙනා, හවත්නි; යෙ කිර, යම්සෙනෙක්වනාහු; පාපකානි කම්මානි, ලාමකවූ කම්යන්; (අකුසල්) කරොන්ති, කරද්ද; තෙ, ඒ සත්වයෝ; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මභාවයෙහිම; එවරූපා, මෙබඳුවූ; විවිධා කම්මකාරණා, නන්අයුරුකම්කටුළු; කාරෙයපුං (තෙමේ තමහට) කරවන්නාහුය; පරත්ථ, (පරලොවදී) කිමඞ්ගපන, කියනුම කවරේද; හන්ද, එබැවින්; අහං, මම;. කායෙන වාචාය මනසා, කයින් වචසින් මනසින්; කල්‍යාණං, යහපතක්; කරොමි ඉති, කරමිකියා; එතං න අහොසි ඉති, මෙබඳු සිතෙක් නොවූයේදැයි කියා; (විචාරන්නේය.) භන්තෙ, වහන්ස; නාසක්ඛිස්සං, නොහැකිවූයෙමි; භන්තෙ, වහන්ස; පමාදස්සං ඉති, පමාවීමියි එවං මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය;

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඕහට; යමො රාජා, යම රජතෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා

තමෙනං භික්ඛවෙ යමො රාජා චතුත්ථං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා පඤ්චමං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු පඤ්චමං දෙවදූතං පාතුභූතන්ති, සො එවමාහ නාද්දසං භන්තෙති;

---

පුරුෂය; පමාදවතාය ප්‍රමාදබව කාරණකොටගෙන; භගස්ස, ඒකාන්තයෙන්; ත්වං, තෝ; කායෙන වාචාය මනසා, කයින් වචසින් මනසින්; න කල්‍යාණං අකාසි, කුසලක්නොකෙළෙහිය; අම්භො පුරිස, එම්බා පුරුෂය; පමත්තං, පමාවූ (වරදකළ)එකක්හට; යථා, යම් සේනම්; තථා එපරිද්දෙන්; තං, තට; කරිස්සන්ති (තාඩන පීඩන වධ බන්ධනාදිය) කරන්නාහුය; තං ඛො පන එතං පාපං කම්මං, ඒ මේ පාපකර්මය තෙමේ; න එව මාතරා කතං, මෑණියන් විසින් කරන ලද්දකුත් නොවෙයි; න පිතරා කතං, පියාවිසින් කරන ලද්දකුත් නොවෙයි; න භාතරා කතං, භ්‍රාතෘව විසින් කරන ලද්දකුත් නොවෙයි. න භගිනියා කතං, බුහුනණිය විසින් කරනලද්දකුත් නොවෙයි; න මිත්තාමච්චෙහි කතං, මිත්‍රාමාත්‍යයන් විසින් කරනලද්දකුත් නොවෙයි; න ඤාතිසාලොහිතෙහි කතං, අවසෙස බන්ධූන්විසින් කරනලද්දකුත් නොවෙයි. න සමණබ්‍රාහ්මණෙහි කතං, ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින් කරන ලද්දකුත් නොවෙයි; න දෙවතාහි කතං දෙවියන් විසින් කරන ලද්දකුත් නොවෙයි; තයාඑව, තාවිසින්ම; එතං පාපං කම්මං, මේ පාපකර්මය; කතං; කරනලද්දේය; එතස්ස විපාකං, මේ පාප, කර්මයාගේ විපාකය. ත්වංයෙව, තෝම; පටිසංවෙදිස්සසි ඉති විඳින්නෙහියයි (කියන්නේය;)

භික්ඛවෙ, මහණෙනි; තමෙතං, ඕහට; යමො රාජා, යම්රජ තෙම; චතුත්ථං දෙවදූතං, සතරවන දේවදූතයා; සමනුයුඤ්ජිත්වා, අනුයොගවත ආරොපනය කරමින් විචාරා; සමනුගාහිත්වා, ලබ්ධියෙහි පිහිටුවා; හෙවත් ලබ්ධිගන්වා; සමනුභාසිත්වා කරුණු විචාරා; පඤ්චමං දෙවදූතං, පස්වන දෙවදූතයා; සමනුයුඤ්ජති, අනුයොගවත ආරොපණයකරමින් විචාරයි; සමනුගාහති, ලබ්ධිගන්වයි; සමනුභාසති, කරුණුවිචාරයි; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; පාතුභූතං, පහළවූ; පඤ්චමං දෙවදූතං, පස්වන දේවදූතයා; න අද්දසති ඉති, නොදුටුයෙහිදැයි; (විචාරන්නේය) භන්තෙ, වහන්ස; න අද්දසං ඉති, නොදුටුයෙමියි; එවං, මෙසේ; සො, හෙ තෙම; ආහ, කියන්නේය;

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා එකාහමතං වා ද්විහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතන්ති, සො එවමාහ අද්දසං භන්තෙති,

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භො පුරිස තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි, අහම්පි ඛො’ම්හි මරණධම්මො මරණං අනතීතො හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති;සොඑවමාහ නාසක්ඛිස්සං භන්තෙ පමාදස්සං භන්තෙති;

---

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමො රාජා, යමරජ තෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; එකාහමතං වා, මරණයටපැමිණ එකදවසක්ගියාවූ හෝ; ද්විහමතං වා, මරණයට පැමිණ දෙදවසක්ගියාවූ හෝ; තීහමතං වා, මළතුන්දවසක් ගියාවූ හෝ; උද්ධුමාතකං වා ඉදිමීගියාවූ හෝ; විනීලකං වා, නිල්වූහෝ; විපුබ්බකජාතං වා, නවදෙරින් පූයා වැහෙන්නාවූහෝ; ඉත්ථිං වා, ස්ත්‍රියකුහෝ පුරිසං වා, පුරුෂයකුහෝ; ත්වං, තෝ; න අද්දස ඉති,නොදුටුයෙහිදැයි;(විචාරන්නේය)භන්තෙ,වහන්ස; අද්දසං ඉති, දුටිමියි; එවං, මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය;

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමො රාජා, යමරජ තෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; විඤ්ඤුස්සසතො, නුවණැතිවූ; මහල්ලකස්ස, මහලුවූ; තස්ස තෙ, ඒ තට; අහං ඛො, මමවනාහි; මරණධම්මො අම්හි, මරණය ස්වභාවකොටඇත්තෙක්මි; මරණං අනතීතො, මරණය අතික්‍රාන්තනොකෙළෙමි; හන්ද, එබැවින්; අහං, මම; කායෙන වාචාය මනසා, කයින් වචසින් මනසින්; කල්‍යාණං කරොමි ඉති, යහපතක් කරමි යන; එතං, මේසිත; න අහොසි, නොවූයේදැයි විචාරන්නේය; භන්තෙ, වහන්ස; නාසක්ඛිස්සං, නොපිළිවන් විමි; භන්තෙ, වහන්ස; පමාදස්සං ඉති, පමාවීමියි; එවං, මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය;

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ අම්භො පුරිස පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා, තග්ඝ ත්වං අම්භො පුරිස තථා **කරිස්සන්ති** යථා තං පමත්තං, තං ඛො පනෙතං පාපං කම්මං නෙව මාතරා කතං න පිතරා කතං න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං තයාවෙතං පාපං කම්මං කතං ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසීති,

තමෙනං භික්ඛවෙ යමො රාජා පඤ්චමං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තුණ්හී හොති

---

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමො රාජා, යමරජතෙම; එවං ආහ, මෙසේ කියන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; පමාදවතාය, ප්‍රමාදවාසයකරණකොටගෙන; තග්ඝ, ඒකාන්තයෙන්; ත්වං, තෝ; කායෙන වාචාය මනසා, කයින් වචසින් මනසින්; න කල්‍යාණං අකාසි, යහපතක් නොකෙළෙහිය; අම්භො පුරිස, එම්බා පුරුෂය; පමත්තං, පමාවූවකුට; යථා, යම්සේනම්; තථා, එසේ; තං, තට; කරිස්සන්ති, (වධබන්ධන) කරන්නාහුය; තං ඛො පන, එතං පාපං කම්මං, ඒ මේ පාපකර්මයවනාහි; නෙව මාතරා කතං, මවවිසින් කරනලද්දක් නොවෙයි; න, පිතරා කතං, පියාවිසින් කරනලද්දකුත් නොවෙයි; න භාතරා කතං, භ්‍රාතෘවවිසින් කරනලද්දකුත් නොවෙයි; න භගිනියා කතං, බුහුනණියවිසින් කරනලද්දකුත් නොවෙයි; න මිත්තාමච්චෙහි කතං, මිත්‍රාමාත්‍යයන් විසින් කරනලද්දකුත් නොවෙයි; න ඤාතිසාලොහිතෙහි කතං, ඇවෑස්ස බන්ධුන්විසින් කරනලද්දකුත් නොවෙයි; න සමණබ්‍රාහ්මණෙහි කතං, ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින් කරනලද්දකුත් නොවෙයි; න දෙවතාහි කතං, දෙවියන් විසින් කරනලද්දකුත් නොවෙයි; එතං පාපං කම්මං, මේ පාපකර්මය; තයා එව, තාවිසින්ම; කතං, කරනලද්දේය; එතස්ස විපාකං, ඒ මේ පාපකර්මයාගේ විපාකය; ත්වං එව, තෝම; පටිසංවෙදිස්සසීති, විඳින්නෙහියයි කියන්නේය;

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමො රාජා, යමරජතෙම; පඤ්චමං දෙවදූතං, පස්වන දේවදූතයා; සමනුයුඤ්ජිත්වා, අනුයොගවතආරොපණයකරමින් විචාරා; සමනුගාහිත්වා, ලබ්ධියෙහි පිහිටුවා; සමනුභාසිත්වා, කරුණුවිචාරා; තුණ්හී හොති, (මහත් සෝකයට පැමිණ) තුෂ්ණීම්භූතවෙයි.

තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කාරෙන්ති, තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති,

සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලඞ්කරොති, යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති,

තමෙනං භික්ඛවෙ නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි තච්ඡන්ති තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ඨපෙත්වා වාසීහි තච්ඡන්ති,

තමෙනං භික්ඛවෙ නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පඨවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි,

---

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; නිරයපාලා, යම පල්ලෝ; පඤ්චවිධබන්ධනං නාම කාරණං, පස්වැදෑරුම්වූ බන්ධන නම් කම්කටුල්ලක්; කාරෙන්ති, කරත්; (එනම්:-) තත්තං අයොඛිලං, රත්වූ යවුලක්; හත්ථෙ ගමෙන්ති, හස්තයෙහි ප්‍රවෙශකරත් හෙවත් ගසත්; (1) තත්තං අයොඛිලං, රත්වූ යවුලක්; දුතියෙ හත්ථෙ ගමෙන්ති, දෙවන හස්තයෙහි ගසති (2); තත්තං අයොඛිලං, රත්වූ යවුලක්; පාදෙ ගමෙන්ති, පයෙහි ගසති (3); තත්තං අයොඛිලං, රත්වූ යවුලක්; දුතියෙ පාදෙ ගමෙන්ති, දෙවන පයෙහි ගසති (4); තත්තං අයොඛිලං, රත්වූ යවුලක්; මජ්ඣෙ උරස්මිං ගමෙන්ති, හෘදයමධ්‍යයෙහි ගසාබාති (5);

සො, හෙතෙම; තත්ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, නරකදුක්ඛවේදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්තී හොති, කෙළවරනොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාලක්‍රියානොකෙරෙයි;

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගතසත්ත්වයා; සංවෙසෙත්වා, බිම්ගත් යපොළවෙහි හොවා; කුඨාරීහි, එක්පලයක්පමණකුඨාරීන්; තච්ඡන්ති, හසිති;

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, යමපල්ලෝ තමෙනං, ඔහු; උද්ධපාදං, පාඋඩුකුරුකොට; අධොසිරං, හිසයටිකුරුකොට; ඨපෙත්වා, තබා; වාසීහි, කුළුපමණවෑවලින්; තච්ඡන්ති, සිවියෙහි පටන් ඇටදක්වා සසිති.

තමෙනං භික්ඛවෙ නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි,

තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය, සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති සකිම්පි අධො ගච්ඡති සකිම්පි තිරියං ගච්ඡති, සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තිහොති.

---

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගතසත්වයා; රථෙ යොජෙත්වා, (සර්වප්‍රකාරයෙන් දිලියෙන්නාවූ) රථයෙහි යොදා; ආදිත්තාය, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතාය, ප්‍රකර්ෂයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතාය, ගිනිදැල්සහිතවූ; පඨවියා, පොළොවෙහි; සාරෙන්තිපි, ඉදිරියටද ගමන්කරවත්; පච්චාසාරෙන්තිපි, පස්සටද ගමන්කරවත්; භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගතසත්වයා; ආදිත්තං, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතං, සර්වප්‍රකාරයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං, ගිනිදැල් සහිතවූ; මහන්තං, මහත්වූ; අඞ්ගාරපබ්බතං, අඟුරුපර්වතයට; ආරොපෙන්තිපි, යමුගුරෙන් පැහැර පැහැර නැංවීමද කරත්; ඔරොපෙන්තිපි, බැස්වීමද කරත්; භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගතසත්වයා; උද්ධපාදං, පා උඩුකුරුකොට; අධොසිරං, හිසයටිකුරුකොට; ගහෙත්වා, ගෙන; ආදිත්තාය, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතාය, ප්‍රකර්ෂයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතාය, ගිනිදැල්සහිතවූ; ලොහකුම්භියා, ලොහොකුඹුනරකයෙහි; පක්ඛිපන්ති, බහාලත්; සො, හෙතෙම; තත්ථ, එහි; ඵෙණුද්දෙහකං, පෙණනඟමින්; පච්චති, පැසෙයි; සො, හෙතෙම; තත්ථ, එහි; ඵෙණුද්දෙහකං, පෙණ නැඟීම් සහිතව; පච්චමානො, පැසෙන්නේ; සකිං, වරක්; උද්ධම්පි, ගච්ඡති, උඩටත්යයි; සකිං වරක්; අධොපිගච්ඡති; යටටත්යයි; සකිං, වරක්; තිරියම්පි ගච්ඡති, සරසටදයයි; සො, හෙතෙම; තත්ථ, එහි; තිප්පා. තිව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා, වෙදනා, දුඃඛවෙදනාවන්; වෙදෙති. විඳියි; යාව, යම්තාක්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍යන්තී හොති, කෙළවරනොවේද; තාව, ඒ තාක්කල්; නචකාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

තමෙනං භික්ඛවෙ නිරයපාලා මහා නිරයෙ පක්ඛිපන්ති, සො ඛො පන භික්ඛවෙ මහානිරයො.

චතුක්කණ්ණො චතුද්වාරො-විභත්තො භාගසො මිතො
අයොපාකාර පරියන්තො-අයසා පටිකුජ්ජිතො

තස්ස අයොමයා භූමි-ජලිතා තෙජසා යුතා
සමන්තා යොජනසතං-ඵරිත්වා තිට්ඨති සබ්බදා

තස්ස ඛො පන භික්ඛවෙ මහානිරයස්ස පුරත්ථිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පච්ඡිමාය භිත්තියා පටිහඤ්ඤති, පච්ඡිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පුරත්ථිමාය භිත්තියා පටිහඤ්ඤති උත්තරාය භිත්තියා අච්චි උට්ඨහිත්වා දක්ඛිණාය භිත්තියා පටිහඤ්ඤති.

---

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගත සත්වයා; මහානිරයෙ, අවීචිමහානරකයෙහි; පක්ඛිපන්ති, බහාලත්; භික්ඛවෙ, මහණෙනි; සොඛොපන මහානිරයො, ඒ අවීචිමහානරකය වනාහි;

චතුක්කණ්ණො, කොන්සතරක් ඇත්තේය; චතුද්වාරො, දොරටුසතරක් ඇත්තේය; විභත්තො, කොට්ඨාසවසයෙන් බෙදන ලද්දේය; භාගසො, කොටස්වසයෙන්; මිතො, ප්‍රමාණකරන ලද්දේය; අයොපාකාර පරියන්තො, යපව්රකින් වටකරනලද්දේය; අයසා පටිකුජ්ජිතො, යපියනකින් වසනලද්දේය;

තස්ස, ඒ අවීචිමහානරකයාගේ; භූමි, භූමිතොමෝ; අයොමයා, අයොමය වන්නීය; ජලිතා, දිලියෙනලද්දීය; තෙජසායුතා, තෙජසින් යුක්තය; සබ්බදා, සියලුකල්හි; සමන්තා, හාත්පස; යොජනසතං, යොදුන් සියයක්; ඵරිත්වා, පැතිර; තිට්ඨති, සිටියි;

භික්ඛවෙ, මහණෙනි; තස්ස මහානිරයස්ස ඛො පන, ඒ අවීචි මහානරකයෙහි වනාහි; පුරත්ථිමාය භිත්තියා, පූර්වභිත්තියෙන්; අච්චි උට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; පච්ඡිමාය භිත්තියා, පශ්චිම භිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගනී; පච්ඡිමාය භිත්තියා, පශ්චිම භිත්තියෙන්; අච්චි උට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; පුරත්ථිමාය භිත්තියා, පූර්වභිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගනී; උත්තරාය භිත්තියා, උතුරුභිත්තියෙන්; අච්චිඋට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; දක්ඛිණාය භිත්තියා, දකුණුභිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගනී;

දක්ඛිණාය භිත්තියා අච්චි උට්ඨහිත්වා උත්තරාය භිත්තියා පටිහඤ්ඤති, හෙට්ඨා අච්චි උට්ඨහිත්වා උපරි පටිහඤ්ඤති, උපරිතො අච්චි උට්ඨහිත්වා හෙට්ඨා පටිහඤ්ඤති, සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වේදනා වේදෙති නච තාව කාලඞ්කරොති. යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්‍ථිමං ද්වාරං අවාපුරීයති සො තත්‍ථ සීඝෙන ජවෙන ධාවති තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති චම්මම්පි ඩය්හති මංසම්පි ඩය්හති න්හාරුපි ඩය්හති අට්ඨීනිපි සම්පධූපායන්ති, උබ්භතං තාදිසමෙව හොති, යතො ච ඛො සො භික්ඛවෙ බහුසම්පත්තො හොති

---

දක්ඛිණාය භිත්තියා, දකුණු භිත්තියෙන්; අච්චි උට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; උත්තරාය භිත්තියා, උතුරු භිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගනී; හෙට්ඨා, යටදිශාභාගයෙන්; අච්චිඋට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; උපරි, මත්තෙහි; පටිහඤ්ඤති, වැදගනී; උපරිතො, උපරිම දිශාභාගයෙන්; අච්චි උට්ඨහිත්වා, ගිනිදැල් නැඟී; හෙට්ඨා, යට; පටිහඤ්ඤති, වැදගනී; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා, දුඃඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාප කර්මය; නව්‍යන්තීහොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; කදාචිකරහචි, කිසිකලෙක්හි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; තස්ස මහානිරයස්ස, ඒමහානරකයාගේ; පුරත්‍ථිමං ද්වාරං, පූර්වද්වාරය; අවාපුරීයති, විවෘතවේද; සො සමයො, ඒ කාලය; හොති ඛො, ඇත්තේමය; සො, හෙතෙම; තත්‍ථ, ඒ දොරදිසාවට; සීඝෙන ජවෙන ධාවති, ශීඝ්‍රවූ ජවයෙන් දුවයි; සීඝෙන ජවෙන ධාවතො, ශීඝ්‍රවූ ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති; සිවියද දවයි; චම්මම්පි ඩය්හති, සමද දවයි; මංසම්පි ඩය්හති, මස්ද දවයි; න්හාරුපි ඩය්හති, නහරද දවයි; අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද වෙසෙසින් දුමත්; උබ්භතං තාදිසමෙව හොති, නැඟූ පියවර එසේම (නොපිළිස්සුනාක්මෙන්ම) වෙයි;

භික්ඛවෙ, මහණෙනි; යතොචඛො, යම්හෙයකින්; සො, හෙතෙම; බහුසම්පත්තො හොති, අනෙක වර්ෂසහස්‍රයෙන් ගොස් සම්ප්‍රාප්තවේද;

අථ තං වාරං පිපීයති සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදේති න ච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පච්ඡිමං වාරං අවාපුරීයති —පෙ— උත්තරං වාරං අවාපුරීයති —පෙ— දක්ඛිණං වාරං අවාපුරීයති, සො තත්‍ථ සීඝෙන ජවෙන ධාවති තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති චම්මම්පි ඩය්හති, මංසම්පි ඩය්හති නහාරූපි ඩය්හති අට්ඨීනිපි සම්පධූපායන්ති උබ්භතං තාදිසමෙව හොති යතො ච ඛො සො භික්ඛවෙ බහුසම්පත්තො හොති අථ තං වාරං පිපීයති සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති.

---

අථ, එකල්හි; තං වාරං, ඒදොර; පිපීයති, වැසෙයි; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කටුකවූ; වෙදනා, දුක්ඛ වෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්තී හොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; න ච කාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචි කරහචි, කිසිකලෙක්හි; තස්ස මහානිරයස්ස, ඒ මහානරකයාගේ; පච්ඡිමං වාරං, පශ්චිම දොරටුව; අවාපුරීයති, ඇරේද; —පෙ— උත්තරං වාරං, උතුරු දොරටුව; අවාපුරීයති, ඇරේද; —පෙ— දක්ඛිණං වාරං, දකුණු දොරටුව; අවාපුරීයති, ඇරේද; සො සමයො, ඒ කාලය; හොති ඛො, ඇත්තේමය; සො, හෙතෙම; තත්‍ථ, එහි; සීඝෙන ජවෙන; ශීඝ්‍රජවයෙන්; ධාවති, දුවයි; සීඝෙන ජවෙන ධාවතො, ශීඝ්‍රවූ ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, සිවියද දවයි; මංසම්පි ඩය්හති, මස්ද දවයි; නහාරූපි ඩය්හති, නහරද දවයි, අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද වෙසෙසින් දුමත්; උබ්භතං තාදිසමෙව හොති, නැගූ පියවරද එලෙසම වන්නේය; භික්ඛවෙ, මහණෙනි; යතො ච ඛො, යම්හෙයකින්; සො, හෙතෙම; බහුසම්පත්තො හොති, අනෙකවර්ෂසහස්‍රයෙන් ගොස් සම්ප්‍රාප්ත වේද; අථ, එකල්හි; තං වාරං, ඒ වාරය; පිපීයති, වැසෙන්නේය; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කටුකවූ; දුක්ඛා වෙදනා, දුඃඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍යන්තීහොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති; කාලක්‍රියානොකරයි;

හොති බො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්ථිමං ද්වාරං අවාපුරීයති සො තත්ථ සීඝෙන ජවෙන ධාවති තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති චම්මම්පි ඩය්හති මංසම්පි ඩය්හති නහාරුපි ඩය්හති අට්ඨීනිපි සම්පධූපායන්ති, උබ්භතං තාදිසමෙව හොති, සො තෙන ද්වාරෙන නික්ඛමති,

තස්ස බො පන භික්ඛවෙ මහානිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තො ගූථනිරයො, සො තත්ථ පතති තස්මිං බො පන භික්ඛවෙ ගූථනිරයෙ සූචිමුඛා පාණා ඡවිං ඡින්දන්ති ඡවිං ඡෙත්වා චම්මං ඡින්දන්ති, චම්මං ඡෙත්වා මංසං ඡින්දන්ති මංසං ඡෙත්වා නහාරුං ඡින්දන්ති, නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දන්ති අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ඛාදන්ති,

---

භික්ඛවෙ, මහණෙනි; කදාචි කරහචි, කිසිකලෙක්හි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; තස්ස මහානිරයස්ස, ඒ අවීචිමහානරකයාගේ; පුරත්ථිමං ද්වාරං, පූර්වද්වාරය; අවාපුරීයති, ඇරේද; සො සමයො, ඒකාලය; හොති බො, ඇත්තේමය; සො, හෙතෙම; තත්ථ, එහි; සීඝෙන ජවෙන ධාවති, ශීඝ්‍රවූ ජවයෙන් දුවයි; සීඝෙන ජවෙන ධාවතො, ශීඝ්‍රවූ ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, සිවියද දවයි; චම්මම්පි ඩය්හති, සමද දවයි; මංසම්පි ඩය්හති, මස්ද දවයි; නහාරුපි ඩය්හති, නහරද දවයි; අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද වෙසෙසින් දුමත්; උබ්භතං තාදිසමෙව හොති, නැඟූ පියවර එබඳුම වෙයි; සො, හෙතෙම; තෙන ද්වාරෙන, ඒ දොරටුවෙන්; නික්ඛමති, නික්මෙයි;

භික්ඛවෙ, මහණෙනි; තස්ස බො පන මහානිරයස්ස, ඒ අවීචිමහානරකයට; සමනන්තරා, අනතුරුව; මහන්තො, මහත් වූ; ගූථනිරයො, ගූථනරකය; සහිතං එව, එක්වම පිහිටියේය; සො, හෙතම; තත්ථ, එහි; පතති, හෙයි; භික්ඛවෙ, මහණෙනි; තස්මිං බො පන ගූථනිරයෙ, ඒ ගූථනරකයෙහි; සූචිමුඛා පාණා, ඉඳිකටුතුඩු සමාන මුවඇති පණුවෝ; ඡවිං ඡින්දන්ති, සිවිය සිඳිත්; ඡවිං ඡෙත්වා, සිවිය සිඳ; චම්මං ඡින්දන්ති, සමසිඳිත්; චම්මං ඡෙත්වා, සමසිඳ; මංසං ඡින්දන්ති, මස්සිඳිත්; මංසං ඡෙත්වා, මස් සිඳ; නහාරුං ඡින්දන්ති, නහර සිඳිත්; නහාරුං ඡෙත්වා, නහරසිඳ; අට්ඨිං ඡින්දන්ති, ඇටසිඳිත්; අට්ඨිං ඡෙත්වා, ඇට සිඳ; අට්ඨිමිඤ්ජං ඛාදන්ති, ඇටමිදුළු කත්;

සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති නච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මිං ව්‍යන්තී හොති.

තස්ස ඛො පන භික්ඛවෙ ගූථනිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තො කුක්කුළනිරයො, සො තත්‍ථ පතති, සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, නච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මිං ව්‍යන්තී හොති.

තස්ස ඛො පන භික්ඛවෙ කුක්කුළ නිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තං සිම්බලීවනං උද්ධං යොජන සමුග්ගතං සොළසඞ්ගුලකණ්ටකං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, තත්‍ථ ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි, සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති නච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති,

---

සො, හෙතෙම; තත්‍ථ එහි; තිප්පා, තිව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්ති හොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාල ක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; තස්ස ඛො පන ගූථනිරයස්ස, ඒගූථ නරකයට, සමනන්තරා අනතුරුව; මහන්තො, මහත්වූ; කුක්කුළ නිරයො, කුක්කුළනරකය; සහිතං එව, සමඟම පිහිටියේය; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්තී හොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; තස්ස ඛො පන කුක්කුළනිරයස්ස, ඒ කුක්කුළනරකයට; සමනන්තරා, අනතුරුව; උද්ධං යොජනසමුග්ගතං, යොදුන් උස නැංගාවූ; සොළසඞ්ගුලකණ්ටකං, සොළොස් අඟුල් කටුඇති; ආදිත්තං, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතං, ප්‍රකාශයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං, ගිනිදැල් සහිතවූ; මහන්තං, මහත්වූ; සිම්බලීවනං, හිඹුල්වනය; සහිතං එව; සමඟම පිහිටියේය; තත්‍ථ, එහි; ආරොපෙන්තිපි, උඩටද නංවත්; ඔරොපෙන්තිපි, පහතටද බස්වත්; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාප කර්මය; න ව්‍යන්තී හොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

තස්ස ඛො පන භික්ඛවෙ සිම්බලිවනස්ස සමනන්තරා සහිතමෙව මහන්තං අසිපත්තවනං, සො තත්ථ පවිසති, තස්ස වාතෙරිතානි පත්තානි පතිතානි හත්ථම්පි ඡින්දන්ති පාදම්පි ඡින්දන්ති හත්ථපාදම්පි ඡින්දන්ති කණ්ණම්පි ඡින්දන්ති නාසම්පි ඡින්දන්ති කණ්ණනාසම්පි ඡින්දන්ති, සො තත්ථ දුක්ඛා තිබ්බා කටුකා වෙදනා වෙදෙති නච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති.

තස්ස ඛො පන භික්ඛවෙ අසිපත්තවනස්ස සමනන්තරා සහිතමෙව මහතී ඛාරොදිකා නදී. සො තත්ථ පතති, සො තත්ථ අනුසොතම්පි වුය්හති පටිසොතම්පි වුය්හති අනුසොතපටිසොතම්පි වුය්හති,

---

භික්ඛවෙ, මහණෙනි; තස්ස ඛො පන සිම්බලිවනස්ස, ඒ හිඹුල්වනයට; සමනන්තරා අනතුරුව; මහන්තං, මහත්වූ; අසිපත්තවනං, (කඩුපතින් ගැවසීගත්හෙයින්) අසිපත්‍රවන නම් (ඔසුපත්) නරකය; සහිතං එව, එක්වම පිහිටියේය; සො, හෙතෙම; තත්ථ, එහි; පවිසති, ප්‍රවිෂ්ටවෙයි; තස්ස, ඒ අසිපත්‍ර නරකයාගේ, වාතෙරිතානි, වාතයෙන් සැලුණාවූ; පත්තානි, පත්‍රයෝ; පතිතානි, වැටුණාහු; හත්ථම්පි ඡින්දන්ති, අතද සිඳිත්; පාදම්පි ඡින්දන්ති, පයද සිඳිත්; හත්ථපාදම්පි ඡින්දන්ති, හස්තපාදද සිඳිත්; කණ්ණම්පි ඡින්දන්ති, කනද සිඳිත්; නාසම්පි ඡින්දන්ති, නාසයද සිඳිත්; කණ්ණනාසම්පි ඡින්දන්ති; කන හා නාසයද සිඳිත්; සො, හෙතෙම; තත්ථ, එහි; තිබ්බා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්තී හොති, කෙළවර නොවේද; තාව, ඒතාක්කල්; නච කාලං කරොති, කාලක්‍රියා නොකරයි.

භික්ඛවෙ, මහණෙනි; තස්ස ඛො පන අසිපත්තවනස්ස, ඒ අසිපත්‍රවනයට; සමනන්තරා, අනතුරුව; මහතී, මහත්වූ; ඛාරොදිකා නදී, තාම්‍රලොහපරිපූර්ණවූ වෛතරණී නම් නරකය; සහිතං එව, එළඹ සිටියේමය; සො, හෙතෙම; තත්ථ, එහි; පතති, හෙයි; සො, හෙතෙම; තත්ථ, එහි; අනුසොතම්පි වුය්හති, යටිගංබලා යන දියපහරටද ගසාගෙනයයි; පටිසොතම්පි වුය්හති, උඩුගංබලා යන දියපහරටද ගසාගෙනයයි; අනුසොත පටිසොතම්පි වුය්හති, යටිගංබලා යන දියපහරට හා උඩුගංබලා යන දියපහරටද ගසාගෙනයයි;

සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති නච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති,

තමෙනං භික්ඛවෙ නිරයපාලා බලිසෙන උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙත්වා එවමාහංසු අම්භො පුරිස කිං ඉච්ඡසීති, සො එව මාහ ජිඝච්ඡිතොස්මි භන්තෙති, තමෙනං භික්ඛවෙ නිරයපාලා තත්තෙන අයොසඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලි තෙන සජොතිභූතෙන තත්තං ලොහගුළං මුඛෙ පක්ඛිපන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, තස්ස ඔට්ඨම්පි ඩය්හති මුඛ මපි ඩය්හති කණ්ඨම්පි, ඩය්හති උරම්පි ඩය්හති අන්තම්පි ඩය්හති අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමති,

---

සො හෙතෙම; තත්ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛ වෙදනාවන්; වෙදෙති, විඳියි; යාව යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවර, නොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්ක රොති, කාලක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒනරකගත සත්වයා; බලිසෙන, බිලියෙන්; උද්ධරිත්වා, ගොඩනඟා; ථලෙ පතිට්ඨාපෙත්වා, භූමියෙහි සිටුවා; අම්භො පුරිස, එම්බා පුරු ෂය; කිං ඉච්ඡසීති, කුමක් රුචිදැයි; එවමාහංසු, මෙසේ විචාරන් නාහුය; භන්තෙ, වහන්ස; ජිඝච්ඡිතොස්මි ඉති,බඩසාඇත්තෙමියි; එවං, මෙසේ; සො, හෙතෙම; ආහ, කියන්නේය; භික්ඛවෙ, මහ ණෙනි; නිරයපාලා, යමපල්හු; තමෙනං, ඒ නිරිසතාගේ; මුඛං, මුඛය; ආදිත්තෙන, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතෙ, ප්‍රකාශියෙන් දිලියෙන්නාවූ; සජොතිභූතෙන, ගිනිදැල් සහිතවූ; තත්තෙන, රත්වූ; අයොසඞ්කුනා, යගඬුවෙන්; විවරිත්වා, විවෘත කොට ආදිත්තං, ගිනිගෙන ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතං. ප්‍රකාශි යෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං, ගිනිදැල් සහිතවූ; තත්තං, රත්වූ; ලොහගුළං, ලොහොගුළියක්; මුඛෙ, මුඛයෙහි; පක්ඛිපන්ති, බහාලත්; තස්ස, ඔහුගේ; ඔට්ඨම්පි ඩය්හති, තොලද දවයි; මුඛම්පි ඩය්හති, මුඛයද දවයි; කණ්ඨම්පි ඩය්හති, උගුරද දවයි; උරම්පි ඩය්හති, ළයද දවයි; අන්තම්පි ඩය්හති, අතුණුද දවයි, අන්තගුණම්පි ආදාය, අතුණුබහන්ද ගෙන; අධොභාගා නික්ඛ මති, අධොභාගයෙන්; නික්මෙයි;

සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති න ච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති

තමෙනං භික්ඛවෙ නිරයපාලා එවමාහංසු අම්භො පුරිස කිං ඉච්ඡසීති, සො එවමාහ පිපාසිතොස්මි භන්තෙති, තමෙනං භික්ඛවෙ නිරයපාලා තත්තෙන අයොසඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන තත්තං තම්බලොහං මුඛෙ ආසිඤ්චන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, තස්ස ඔට්ඨම්පි ඩය්හති මුඛම්පි ඩය්හති කණ්ඨම්පි ඩය්හති උරම්පි ඩය්හති අන්තම්පි ඩය්හති අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමති සො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති න ච තාව කාලඞ්කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තී හොති තමෙනං භික්ඛවෙ නිරයපාලා පුන මහානිරයෙ පක්ඛිපන්ති,

---

සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි: යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍යන්තීහොති, කෙළවරනොවේද; තාව, ඒතාක්කල්; නච කාලඞ්කරොති, කාලක්‍රියා නොකරයි;

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, ඒ නරකගත සත්වයාට; අම්භො පුරිස, එම්බා පුරුෂය; කිං ඉච්ඡසිති, කුමක්රුචිද්දසි;එවං ආහංසු, මෙසේ කියන්නාහුය; භන්තෙ, වහන්ස; පිපාසිතොස්මි ඉති, පිපාසිතයෙම්යි; එවං, මෙසේ; සො, හෙතෙම්; ආහ, කියන්නේය; භික්ඛවෙ, මහණෙනි ;නිරයපාලා, යම්පල්හු; තමෙනං ඒ නිරිසතාගේ; මුඛං, මුඛය, ආදිත්තෙන, ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතෙන, ප්‍රකාශියෙන් දිලියෙන්නාවූ; සජොතිභූතෙන, ගිනිදල් සහිතවූ; තත්තෙන, ආදීප්තවූ; අයොසඞ්කුනා, යගඩුවෙන්; විවරිත්වා, විවෘතකොට; ආදිත්තං, ආදීප්තවූ; සම්පජ්ජලිතං, ප්‍රකාශියෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං, ගිනිදල් සහිතවූ; තත්තං, ගිනිගෙන දිලියෙන්නාවූ; තම්බලොහං, තාම්බ්‍රලොහොදකය; මුඛෙ, මුඛයෙහි; ආසිඤ්චන්ති, වත්කරත්; තස්ස, ඔහුගේ; ඔට්ඨම්පි ඩය්හති, තොළද දවයි; මුඛම්පි ඩය්හති, මුඛයද දවයි; කණ්ඨම්පි ඩය්හති, උගුරද දවයි; උරම්පි ඩය්හති, ළයද දවයි; අන්තම්පි ඩය්හති, අතුණුද දවයි; අන්තගුණම්පි ආදාය,අතුණුබහන්ද ගෙන; අධොභාගා නික්ඛමති, අධොභාගයෙන් නික්මෙයි; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳියි; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍යන්තී හොති, කෙළවරනොවේද; තාව, ඒතාක්කල්; නච කාලංකරොති, කාලක්‍රියානොකරයි; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහු; නිරයපාලා, යම්පල්හු: පුන, නැවත; මහානිරයෙ, මහානරකයෙහි; පක්ඛිපන්ති, බහාලත්;

භූතපුබ්බං භික්ඛවෙ යමස්ස රඤ්ඤො එතදහොසි: යෙ කිර භො ලොකෙ පාපකානි කම්මානි කරොන්ති තෙ එවරූපා විවිධා කම්මකාරණා කරීයන්ති, අහොවතාහං මනුස්සත්තං ලභෙය්‍යං, තථාගතො ච ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො, තඤ්චාහං භගවන්තං පයිරුපාසෙය්‍යං, සො ච මෙ භගවා ධම්මං දෙසෙය්‍ය, තස්ස චාහං භගවතො ධම්මං ආජානෙය්‍යන්ති; තං ඛොපනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි, අපිච යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තමෙවාහං වදාමීති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොචසත්ථා:-

---

භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙරවූදෙයක් කියමි; යමස්ස රඤ්ඤො, යමරජහට; එතං අහොසි, මෙබඳුසිතක් වූයේය; භො, පින්වත්නි; ලොකෙ, සත්වලොකයෙහි; යෙ කිර, යම්කෙනෙක් වනාහි, පාපකානි කම්මානි, පව්කම්; කරොන්ති, කෙරෙද්ද; තෙ, ඔව්හු; එවරූපා, මෙබඳුවූ; විවිධා කම්මකාරණා, නන්අයුරු කම්කටුළු; කරීයන්ති, කරනුලබත්; අහං, මම; මනුස්සත්තං, මනුෂ්‍යාත්මභාවයක්; ලභෙය්‍යං, ලබන්නෙම් නම්; අරහං, අර්හත්වූ; සම්මාසම්බුද්ධො, සියල්ල දත්හෙයින් සම්‍යක්සම්බුද්ධවූ; තථාගතො, තථාගතත්වාදි කාරණයෙන් යුක්තවූ සර්වඥතෙම; ලොකෙ, ලොකයෙහි; උප්පජ්ජෙය්‍ය, උපන්සේක්නම්; අහං, මම; තඤ්ච භගවන්තං, ඒ භාග්‍යවතුන්වහන්සේත්; පයිරුපාසෙය්‍යං, පයුරුපාසනය කරන්නෙම්නම්; සොච භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේත්; මෙ, මට; ධම්මං, ධර්මය; දෙසෙය්‍ය, දේසනාකරන්නේනම්; තස්ස භගවතො, ඒ භාග්‍යවත්හුගේ; ධම්මං ච, ධර්මයද; අහං, මම; ආජානෙය්‍යං, දැනගන්නෙම් නම්; අහොවතඉති, ඉතා යෙහෙකැයි (කියායි)

භික්ඛවෙ, මහණෙනි; අහං, මම;. තං ඛොපන, ඒකාරනය වනාහි; අඤ්ඤස්ස සමණස්ස වා, අතික් ශ්‍රමණයක්හුගෙන් හෝ; බ්‍රාහ්මණස්ස වා, බ්‍රාහ්මණයක්හුගෙන් හෝ; සුත්වා, අසා; න වදාමි; නොකියමි; අපිච, වැලිදු කෙසේ කියම්දයත්? යං, යම් පමණ අටමගතරකයෙක් ඒසියල්ල; සාමංඑව ඤාතං, තමාවිසින්ම දන්නාලද්දේද; සාමං දිට්ඨං, තමාවිසින්ම දක්නාලද්දේද; සාමංවිදිතං, තමාවිසින්ම, ප්‍රත්‍යක්ෂකරනලද්දේද; තං එව, එයම; අහං, මම, වදාමි ඉති, කියමියි; (වදාළසේක).

භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මේ දේශනාව; අවොච, වදාළසේක; සුගතො, සොභනගති ඇතිහෙයින් සුගතනම්වූ සර්වඥ

චොදිතා දෙවදූතෙහි–යෙ පමජ්ජන්ති මානවා
තෙ දීඝරත්තං සොචන්ති–හීනකායූපගා නරා

යෙ ච ඛො දෙවදූතෙහි–සන්තො සප්පුරිසා ඉධ
චොදිතා නප්පමජ්ජන්ති–අරියධම්මෙ කුදාචනං

උපාදානෙ භයං දිස්වා–ජාති මරණ සම්භවෙ
අනුපාදා විමුච්චන්ති–ජාතිමරණ සඞ්ඛයෙ

තෙ ඛොප්පමත්තා සුඛිනො–දිට්ඨධම්මාභි නිබ්බුතා
සබ්බවෙර භයාතීතා–සබ්බදුක්ඛං උපච්චගුන්ති,

දෙවදූතසුත්තං

යන්වනන්සේ; ඉදං, මේ දේශනාව; වත්වා, වදාරා; අථ, නැවත; සත්ථා, ශාස්තෲන්වහන්සේ; අපරං, අන්‍යවූ; එතං, මේ ගාථා දේශනාව; අවොච, වදාළසේක;

දෙවදූතෙහි, දේවදූතයන් විසින්; චොදිතා, චෝදනාකරන ලද්දාවූ; යෙ මානවා, යම් මනුෂ්‍යකෙනෙක්; පමජ්ජන්ති, ප්‍රමාද වෙත්ද; හීනකායූපගා, හීනකායසඞ්ඛ්‍යාත අපායට පැමිණියාවූ; තෙ නරා, ඒ මනුෂ්‍යයෝ; දීඝරත්තං, බොහෝකාලයක් මුලුල්ලෙහි; සොචන්ති, සෝකකෙරෙත්;

ඉධ,මේලෝකයෙහි; සන්තො,ශාන්තවූ;යෙ ච ඛො සප්පුරිසා, යම් සත්පුරුෂකෙනෙක්; දෙවදූතෙහි, දේවදූතයන් විසින්; චොදිතා, චෝදනාකරනලද්දාහු; අරියධම්මෙ, ආර්‍ය්‍ය ධර්මයෙහි; කුදාචනං, කිසිකලෙකත්; නප්පමජ්ජන්ති, ප්‍රමාදනොවෙත්ද;

ජාතිමරණ සම්භවෙ, ජාතිමරණයන්ට කාරණවූ; උපාදානෙ, තෘෂ්ණාදෘෂ්ටිග්‍රහණයෙහි; භයං දිස්වා, භයදැක; ජාතිමරණසඞ්ඛයෙ, ඉපදීම් මැරීම් ක්‍ෂයකිරීමයයි කියනලද නිර්‍වාණයෙහි; අනුපාදා, උපාදාන රහිතව; විමුච්චන්ති, මිදෙත්;

අප්පමත්තා,කුශල ක්‍රියායෙහි සමාතිවිප්‍රවාසරහිතවූ;තෙ ඛො, ඒ සත්ත්වයෝ වනාහි; සබ්බවෙරභයාතීතා, සියලු අකුසලයන්ගෙන් හා ඒ හේතුයෙන්වන අපායභීතීන්ගෙන්ද ඉක්ම ගියාහු හෙවත් දුරුවූවාහු; සුඛිනො,සුවපත්වූවාහු; දිට්ඨධම්මාභිනිබ්බුතා, ඉහාත්මභාවයෙහිම කෙලශපරිනිර්‍වාණයෙන් පිරිනිවියාහු; සබ්බදුක්ඛං, සියලු සංසාරික දුක; උපච්චගුං, ඉති, අතික්‍රාන්තකළාහුයයි (වදාළසේක.)

දෙවදූතසුත්තං, දේවදූත සූත්‍රයයි;

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: අතිප්පගො ඛො, තාව සාවත්ථිං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමාති. අථ ඛො තෙ භික්ඛූ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිංසු. උපසංකමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු,

---

මෙ, මා විසින්; එවං, මෙසේ. සුතං, අසනලදී; එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬු මහසිටුහු විසින් කරවා පිළිගැන්වූ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩවාසය කරණසේක; අථ ඛො, එකල්හි වනාහි; සම්බහුලා භික්ඛූ, බොහෝ භික්ෂූහු; පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවා; පත්තචීවරං, පාසිවුරු ආදාය, ගෙන; සාවත්ථිං, සැවත්නුවරට; පිණ්ඩාය; පිඬුපිණිස; පවිසිංසු, පිවිසියාහුය; අථ ඛො, එකල්හි වනාහි; තෙසං භික්ඛූනං, ඒ භික්ෂූන්ට; එතං, මේසිත; අහොසි, වූයේය; තාව, මේතාක්; සාවත්ථිං, සැවැත්නුවරෙහි; පිණ්ඩාය, පිඬුපිණිස; චරිතුං, හැසිරෙන්ට; අතිප්පගො ඛො, ඉතා උදසණමය; මයං, අපි; අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, අන්‍යොවූ පිරිවැජ්ජන්ගේ; ආරාමො, ආරාමය; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමෙය්‍යාම, එළඹෙන්නමුනම්; යන්නූන ඉති, යෙහෙකැයි (කියායි); අථ ඛො, එකල්හි වනාහි; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ; ආරාමො, ආරාමය; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසංකමිංසු, එළඹියාහුය; උපසංකමිත්වා, එළඹ; තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං, ඒ අන්‍යතීර්ථක පිරිවැජ්ජන් හා සමඟ; සම්මොදිංසු, සතුටුවූවාහුය; සම්මොදනීයං, සතුටුවියයුතුවූද; සාරාණීයං, සිහිකටයුතුවූද; කථං, කථාවක්; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්නාහුය;

එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං: සමණො ආවුසො ගොතමො කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති, මයම්පි කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙම, සමණො ආවුසො ගොතමො රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති මයම්පි රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙම, සමණො ආවුසො ගොතමො වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති, මයම්පි වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙම, ඉධ නො ආවුසො කොවිසෙසො කො අධිප්පායො කිං නානාකරණං සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති.

---

එකමන්තං, එකත්පසෙක; නිසින්නා ඛො, වැඩඋන්නාවූ; තෙ භික්ඛූ, ඒභික්ෂූන්ට; තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා, ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ; එතං, මේ වචනය; අවොචුං, කිවාහුය; ආවුසො, ඇවැත්නි; සමණො ගොතමො, මහණගොයුම්තෙම; කාමානං, පඤ්චකාමයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිදු; කාමානං, කාමයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය, පඤ්ඤපෙම, පණවමු; ආවුසො, ඇවැත්නි; සමණො ගොතමො, මහණගොයුම්තෙම; රූපානං, රූපයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිදු; රූපානං, රූපයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙම, පණවමු; ආවුසො, ඇවැත්නි; සමණො ගොතමො, මහණගොයුම්තෙම; වෙදනානං, වේදනාවන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිදු; වෙදනානං, වේදනාවන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙම, පණවමු; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ පැණවීමෙහි; සමණස්ස ගොතමස්ස වා, ශ්‍රමණ භවත් ගෞතමයාගේ හෝ; අම්හාකං වා, අපගේ හෝ; ධම්මදෙසනාය, ධර්මදේශනාවහා සමඟ; ධම්මදෙසනං වා, ධර්මදේශනාව අරභයා හෝ; අනුසාසනියා, අනුසාසනාව හා සමඟ; අනුසාසනිං වා, අනුසාසනාව අරභයා හෝ; යං ඉදං, යම් මේ නානාකාරණයක් කියනුලබන්නාහුද; නො, අපදෙපසෙහිවූවන්ගේ; විසෙසො, ඒ වෙනස; කො, කවරේද? අධිප්පායො, ඒ අදහස; කො, කවරේද? නානාකරණං, ඒවෙනස; කිං ඉති, කුමක්දැයි (විචාළාහුය.)

අථඛො තෙ භික්ඛූ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිංසු න පටික්කොසිංසු, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිංසු භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමාති, අථඛො තෙ භික්ඛූ සාවත්ථිං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාත පටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං, ඉධ මයං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිම්හ, තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි

---

අථ ඛො, එකල්හි වනාහි; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ; භාසිතං, වචනය; නෙව අභිනන්දිංසු, පිළිනොගත්තාහුය; නපටික්කොසිංසු, විරුද්ධ කථාත්නොකළාහුය; අනභිනන්දිත්වා, පිළිනොගෙණ; අප්පටික්කොසිත්වා, විරුද්ධ කථානොකොට; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; සන්තිකෙ, සමීපයෙන්; එතස්ස භාසිතස්ස, මේ වචනයාගේ; අත්ථං, අර්ථය; ආජානිස්සාම ඉති, දැනගන්නෙමුයි; ආසනා, ආසනයෙන්; උට්ඨාය, නැගිට; පක්කමිංසු, බැහැරගියාහුය;

අථඛො, එකල්හි වනාහි; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; සාවත්ථිං, සැවැත්නුවරෙහි; පිණ්ඩාය, පිඬුපිණිස; චරිත්වා, හැසිර; පච්ඡාභත්තං, පසුබත්කාලයෙහි; පිණ්ඩපාතපටික්කන්තා, පිණ්ඩපාතයෙන් ඉවත්වූවාහු; භගවා, භාග්‍යවතුන්වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමිංසු, එළඹියාහුය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; අභිවාදෙත්වා, සකසාවැඳ; එකමන්තං, එකත්පසෙක්හි; නිසීදිංසු, හුන්නාහුය; එකමන්තං, එකත්පසෙක්හි; නිසින්නාඛො, හුන්නාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ කාරණය; අවොචුං, සැළකළාහුය; භන්තෙ, ස්වාමීන්වහන්ස!; ඉධ, මේ සැවැත්නුවරෙහි; මයං, අපි; පුබ්බණ්හසමයං, පෙරවරුකාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවගෙන; පත්තචීවරං, පාසිවුරු; ආදාය, ගෙන; සාවත්ථිං, සැවැත්නුවරෙහි; පිණ්ඩාය, පිඬුපිණිස; පවිසිම්හ, පිවිසියෙමු; භන්තෙ, ස්වාමීන්වහන්ස!; තෙසං නො අම්හාකං, ඒ අපට; එතං, මේ සිත; අහොසි, වීය;

අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමාති, අථ ඛො තෙ මයං භන්තෙ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිම්හ, උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිම්හ, සම්මොදනීයං, කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිම්හ, එකමන්තං නිසින්නෙ ඛො භන්තෙ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අම්හෙ එතදවොචුං සමණො ආවුසො ගොතමො කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති, මයම්පි කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙම, සමණො ආවුසො ගොතමො රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති, මයම්පි, රූපානං, පරිඤ්ඤං පඤ්ඤපෙම,

---

තාව, මේතාක්; සාවත්ථිං, සැවැත්නුවරෙහි; පිණ්ඩාය, පිඬු පිණිස; චරිතුං, හැසිරෙන්ට; අතිප්පගොඛො, ඉතා උදෑසනමය; මයං, අපි, අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ; ආරාමො, ආරාමය; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතනට; උපසඞ්කමෙය්‍යාම, එළඹෙන්නමුනම්; යන්නූන ඉති, ඉතායෙහෙකැයි (කියායි); භන්තෙ, ස්වාමීන්වහන්ස!; අථඛො, එකල්හි; තෙමයං, ඒ අපි; අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ; ආරාමො, ආරාමය; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසංකමිම්හ, එළඹියෙමු; උපසංකමිත්වා, එළඹ; තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් හා සමඟ, සම්මොදිම්හ, සතුටුවූයෙමු; සම්මොදනීයං, සතුටුවියයුතුවූ; සාරාණීයං, සිහිකටයුතුවූ; කථං, කථාවක්; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, එකත් පසෙක්හි; නිසීදිම්හ, හුන්නෙමු; භන්තෙ, ස්වාමීන්වහන්ස!; එකමන්තං නිසින්නෙ ඛො, එකත්පසෙක්හි උන්නාවූ; අම්හෙ, අපට; තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ; එතං, මෙ වචනය; අවොචුං, කීවාහුය; ආවුසො, ඇවැත්නි; සමණො ගොතමො, මහණගොයුම්තෙම; කාමානං, කාමයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිදු; කාමානං, කාමයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙම, පණවමු; ආවුසො, ඇවැත්නි; සමණො ගොතමො, මහණගොයුම්තෙම; රූපානං, රූපයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිදු; රූපානං, රූපයන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණීය; පඤ්ඤපෙම, පණවමු;

සමණො ආවුසොගොතමො වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති, මයම්පි වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙම,

ඉධ නො ආවුසො කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්ම දෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති, අථ ඛො මයං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිම්හ, න පටික්කොසිම්හ, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිම්හ, භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමාති, එවං වාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා, එවමස්සු වචනීයා, කො පනාවුසො කාමානං අස්සාදො කො ආදීනවො,

---

ආවුසො, ඇවැත්නි; සමණොගොතමො, මහණගොයුම් තෙම; වෙදනානං, වේදනාවන්ගේ පරිඤ්ඤං, ප්‍රහාණය; පඤ්ඤපෙති, පණවයි; මයම්පි, අපිද; වෙදනානං, වේදනාවන්ගේ; පරිඤ්ඤං, ප්‍රහාණය; පඤ්ඤපෙම, පණවමු;

ආවුසො, ඇවැත්නි; නො, අපගේ; ඉධ, මේ පැණවීමෙහි; සමණස්සගොතමස්සවා, ශ්‍රමණභවත් ගෞතමයාගේ හෝ; අම්හාකං වා, අපගේ හෝ; ධම්මදෙසනාය, ධර්මදේශනාව හා සමඟ; ධම්මදෙසනං වා, ධර්මදේශනාව අරභයා හෝ; අනුසාසනියා, අනුසාසනාවහාසමඟ; අනුසාසනිං වා, අනුසාසනාව අරභයා හෝ; යං ඉදං, යම් මේ වෙනසක් කියනු ලබන්නහුද; කොවිසෙසො, ඒ වෙනස කවරේද?; කො අධිප්පායො, ඒ අධිප්‍රාය කවරේද?; කිං නානාකරණං ඉති, ඒ වෙනස කුමක්දැයි (විචාළාහුය.)

අථ ඛො, එකල්හි වනාහි; භන්තෙ, ස්වාමීන්වහන්ස!; මයං, අපි; තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ; භාසිතං, වචනය; නෙව අභිනන්දිම්හ, පිළිනොගතිමු; න පටික්කොසිම්හ, විරුඬ කථා නොකෙළෙමු; අනභිනන්දිත්වා, පිළිනොගෙන; අප්පටික්කොසිත්වා, විරුඬ කථා නොකොට; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; එතස්ස භාසිතස්ස, මේ වචනයාගේ; අත්ථං, අර්ථය; ආජානිස්සාම ඉති, දැනගන්නමුයි; ආසනා, ආසනයෙන්; උට්ඨාය, නැඟිට; පක්කමිම්හ, බැහැරගියෙමුයි; (සැළකළාහුය.) භික්ඛවෙ, මහණෙනි; එවං වාදිනො, මෙසේ කියනසුළුවූ; අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ; එවං වචනීයා අස්සු, (තොප විසින්) මෙසේ කියයුතු වචන ඇත්තෝ වෙත්; ආවුසො ඇවැත්නි; කාමානං, කාමයන්ගේ; අස්සාදො, රසවිඳගැනීම; කො පන, කවරේද;? කො ආදීනවො, දෝෂය කවරේද;? ා

කිං නිස්සරණං, කො රූපානං අස්සාදෙ, කො ආදීනවො, කිං නිස්සරණං, වෙදනානං අස්සාදෙ කො ආදීනවො කිං නිස්සරණන්ති, එවං පුට්ඨා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න්චෙව සම්පායිස්සන්ති උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති,

තං කිස්ස හෙතු යථා තං භික්ඛවෙ අවිසයස්මිං, නාහන්තං, භික්ඛවෙ පස්සාමි. සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාවකෙන වා ඉතො වා පන සුත්වා, කො ච භික්ඛවෙ කාමානං අස්සාදෙ, පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා කතමෙ පඤ්ච–

---

කිං නිස්සරණං, ප්‍රහාණය කුමක්ද;? රූපානං, රූපයන්ගේ; අස්සාදෙ, රසවිඳගැනීම; කො, කවරේද;? —පෙ— භික්ඛවෙ,මහණෙනි; එවං පුට්ඨා,මෙසේ විචාරණලද්දාවූ; අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ; නච එව සම්පායිස්සන්ති, සම්පූර්ණකොට කියන්ට නොහැකිවන්නාහුය; උත්තරිං ච, මත්තෙහිද; විඝාතං, වෙහෙසට; ආපජ්ජිස්සන්ති, පැමිණෙන්නාහුය;

තං කිස්ස හෙතු, ඊට හේතු කවරේද; භික්ඛවෙ, මහණෙනි; අවිසයස්මිං, විෂයනොවූ කරුණෙහි; යථාතං, යම් හෙයකින් විචාළාහුද එහෙයිනි; භික්ඛවෙ, මහණෙනි; සදෙවකෙ, දෙවියන් සහිතවූ; සමාරකෙ, මරුන්සහිතවූ; සබ්‍රහ්මකෙ, බඹුන්සහිතවූ; ලොකෙ, ලෝකයෙහිද; සස්සමණබ්‍රාහ්මණියා, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ; සදෙවමනුස්සාය, දෙව්මිනිසුන් සහිතවූ; පජාය, ප්‍රජාව අතුරෙහිද; යො, යමෙක්තෙම; ඉමෙසං පඤ්හානං, මේ ප්‍රශ්නයන්ගේ; වෙය්‍යාකරණෙන,විසඳා ප්‍රකාශකිරීමෙන්; චිත්තං, සිත; ආරාධෙය්‍ය, සතුටුකරන්නේද; තං, එබඳු පුද්ගලයකු; අහං, මම; න පස්සාමි, නොදක්නෙමි; තථාගතෙන වා අඤ්ඤත්‍ර, තථාගතයන්වහන්සේ හෝ හැරයි; තථාගතසාවකෙන වා, තථාගත ශ්‍රාවකයකු හෝ හැරයි; ඉතො වා පන සුත්වා, මාගේ සාසනයෙන් අසා (කියන්නෙකු) හෝ හැරයි; භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; අස්සාදෙ, රසවිඳගැනීම; කො ච, කවරේද;? භික්ඛවෙ, මහණෙනි; ඉමෙ කාමගුණාපඤ්ච, මේ කාමබන්ධනයෝ පස්දෙනෙක්වෙත්; පඤ්ච,පස්දෙන; කතමෙ'කවරහුදයත්?;

චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා, ඝාණවිඤ්ඤෙය්‍යා ගන්ධා, ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා, කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා,

යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං කාමානං අස්සාදො, කො ච භික්ඛවෙ කාමානං ආදීනවො, ඉධ භික්ඛවෙ කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති යදි මුද්දාය යදි ගණනාය යදි සඞ්ඛානෙන යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන–

---

ඉට්ඨා, ඉෂ්ටවූ; කන්තා, කාන්තවූ; මනාපා, මනවඩන්නාවූ; පියරූපා, ප්‍රියකරන ස්වභාව ඇත්තාවූ; කාමූපසංහිතා, ක්ලේශකාමයෙන් යුක්තවූ; රජනීයා, ඇලුම්කටයුතුවූ, චක්ඛුවිඤ්ඤෙය්‍යා, චක්ෂුර්විඥානයකාරණකොටගෙන දක්කයුතුවූ; රූපා, රූපයෝය; සොතවිඤ්ඤෙය්‍යා, ශ්‍රොත්‍රවිඥානය කාරණකොටගෙන ඇසියයුතුවූ; සද්දා, ශබ්දයෝය; ඝාණවිඤ්ඤෙය්‍යා, ඝ්‍රාණවිඥානයෙන් දැනගතයුතුවූ; ගන්ධා, ගන්ධයෝය; ජිව්හාවිඤ්ඤෙය්‍යා, ජිහ්වාවිඥානය කාරණකොටගෙන දැනගතයුතුවූ; රසා, රසයෝය; ඉට්ඨා —පෙ— කායවිඤ්ඤෙය්‍යා, කායවිඥානයෙන් දැනගතයුතුවූ; ඵොට්ඨබ්බා, ස්ප්‍රෂ්ටව්‍යයෝය යන (පසයි); භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො පඤ්චකාමගුණා, මේ පස්කම්ගුණයෝ නම්වෙත්;

භික්ඛවෙ, මහණෙනි; ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච, මේ පඤ්චකාමබන්ධනයන්නිසා; යං සුඛං සොමනස්සං, යම්සැපයකුත් යම් සොම්නසකුත්; උප්පජ්ජති, උපදීද; අයං, මේ; කාමානං, කාමයන්ගේ; අස්සාදො; රසවිඳගැන්ම වේ; භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දොෂයතෙම; කො ච, කවරේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලෝකයෙහි; කුලපුත්තො, කුලපුත්‍රතෙම; යෙන සිප්පට්ඨානෙන; යම් ශිල්පහේතුවකින්; (එනම්) යදි මුද්දාය, හස්තමුද්‍රාගණනින් හෝ; යදි ගණනාය, අච්ඡිද්‍රගණනින් හෝ; * යදි සඞ්ඛාය, පිඬුගණනින් හෝ; යදි කසියා, සීසෑමෙන් හෝ; යදි වණිජ්ජාය, වෙළඳාමෙන් හෝ; යදි ගොරක්ඛෙන, ගවයන් රැකීමෙන් හෝ; යදි ඉස්සත්ථෙන, ආවුධ ගෙන (රාජාදීන්ට) උපස්ථාන කිරීමෙන් හෝ; යදි රාජපොරිසෙන, ආවුධයෙන් වෙන්ව රාජකර්මාන්ත කිරීමෙන් හෝ;

---

* සංඛානෙන මුද්‍රිතපාලියං.

යදි සිප්පට්ඨානෙන සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකස වාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො ඛුප්පිපාසාහි මීයමානො, අයං භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

තස්ස වෙ භික්ඛවෙ කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා නාභිනිප්ඵජ්ජන්ති සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති මොඝං වත මෙ උට්ඨානං අඵලො වත මෙ වායාමොති අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

යදිසිප්පට්ඨානෙන; අන්‍යතරශිල්පයකින්හෝ; ජීවිකං කප්පෙති, ජීවිකාව කෙරේද; සීතස්ස, සීතලට; පුරක්ඛතො, පෙරටුවසිටියේ; උණ්හස්ස, උෂ්ණයට; පුරක්ඛතො, පෙරටුවසිටියේ; ඩංස, ඩැහැලේ බොත් මැස්සෝය; මකස, මදුරුවෝය; වාත, සුළඟය; ආතප, අව්වය; සිරිංසප, දීර්ඝජාතිසර්පයෝය යන මොවුන්ගේ; සම්ඵස්සෙහි, ස්පර්ශයන්ගෙන්; රිස්සමානො, ගැටෙනුලබන්නේ; ඛුප්පිපාසාහි, ක්ෂුධාපිපාසයන්ගෙන්; මීයමානො, මැඩෙනු ලබන්නේ (වෙයි;) භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මභාවයෙහි දක්නයුතුවූ; අයං දුක්ඛක්ඛන්ධො, මේ කායකලමථාබාධ සඞ්ඛ්‍යාත දුඃඛරාශිය; කාමහෙතු, කාමය හේතුකොටගෙනවෙයි; කාමනිදානං, කාමය මූල්කොට ඇතිවෙයි; කාමාධිකරණං, කාමය කාරණාකොටගෙනවෙයි; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන් වෙයි.

භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; උට්ඨහතො, ආජීවසමුට්ඨාපක වීර්‍ය්‍යයෙන් උත්සාහකරන්නාවූ; ඝටතො, ක්‍රියාකරන්නාවූ; වායමතො, ව්‍යායාම කරන්නාවූ; තස්ස කුලපුත්තස්ස, ඒ කුලපුත්‍රයාහට; වෙ, ඉදින්; තෙ භොගා, ඒ වස්තූහු; නාභිනිප්ඵජ්ජන්ති, වැඩිකොට නූපදිත්නම්; සො, හෙතෙම; මෙ, මාගේ; උට්ඨානං, උත්සාහය; වත, ඒකාන්තයෙන්; මොඝං, හිස්වූයේය; මෙ, මාගේ; වායාමො, ව්‍යායාමයතෙම; වත, ඒකාන්තයෙන්; අඵලො ඉති, නිෂ්ඵලවූයේයයි; සොචති, සෝකකෙරෙයි; කිලමති, කලාන්තවෙයි; පරිදෙවති, වැලපෙයි; උරත්තාළිං කන්දති, ළයෙහි අතගසා හඩයි; සම්මොහං, සිහිමුළාබවට; ආපජ්ජති, පැමිණෙයි; භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මභාවයෙහි දක්නයුතුවූ; අයං අපි දුක්ඛක්ඛන්ධො, මේ දුක්සමූහයද; කාමහෙතු, කාමය හේතුකොටගෙනවෙයි; කාමනිදානං, කාමය මුල්කොට ඇතිවෙයි; කාමාධිකරණං, කාමය කාරණාකොටගෙනවෙයි; කාමානං, කාමයන්ගේ; හෙතුඑව, ප්‍රත්‍යයෙන්ම වෙයි;

තස්ස චෙ භික්ඛවෙ කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා අභිනිප්ඵජ්ජන්ති සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛදොමනස්සං පටිසංවෙදෙති කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය න අප්පියා දායාද හරෙය්‍යුන්ති, තස්ස එවං ආරක්ඛයතො ගොපයතො තෙ භොගෙ රාජානො වා හරන්ති චොරා වා හරන්ති, අග්ගි වා ඩහති, උදකං වා වහති අප්පියා දායාදවා හරන්ති, සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති යම්පි මෙ අහොසි තම්පි නො නත්ථීති, අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; උට්ඨහතො, උත්සාහ කරන්නාවූ; ඝටතො, ක්‍රියාකරන්නාවූ; වායමතො, ව්‍යායාමකරන්නාවූ; තස්ස කුලපුත්තස්ස, ඒ කුලපුත්‍රයාහට; චෙ, ඉදින්; භොගා, වස්තූහු; අභිනිප්ඵජ්ජන්ති, වඩා උපදිත්නම්; සො, හෙතෙම; කින්ති, කවරඋපායකින්; මෙ, මාගේ; භොගෙ, සම්පත්තීන්; රාජානො, රජවරු; නෙව හරෙය්‍යුං, නොමගන්නාහුද; චොරා, සොරු; නහරෙය්‍යුං, පැහැරනොගන්නාහුද; අග්ගි, ගින්න; න ඩහෙය්‍ය, නොදවන්නේද; උදකං, ජලය; න වහෙය්‍ය, නොම ගලන්නේද; අප්පියා දායාද, අප්‍රියදායාදයෝ; න හරෙය්‍යුං ඉති, හැරනොගන්නාහුදැයි; තෙසං භොගානං, ඒ වස්තූන්ගේ; ආරක්ඛාධිකරණං, ආරක්ෂාකිරීම කාරණාකොට ඇති; දුක්ඛදොමනස්සං, දුක්දොම්නස; පටිසංවෙදෙති; විඳියි;

එවං, මෙසේ; ආරක්ඛයතො, ආරක්ෂාකරන්නාවූ; ගොපයතො, ගොපනයකරන්නාවූ; තස්ස, ඔහුගේ; තෙ භොගෙ, ඒ වස්තූන්; රාජානො වා, රජවරු හෝ; හරන්ති, ගනිත්; චොරා වා, සොරු හෝ; හරන්ති, පැහැරගනිත්; අග්ගි වා, ගින්න හෝ; ඩහති, දවයි; උදකං වා, ජලය හෝ; වහති, ගලායටකෙරෙයි; අප්පියා දායාද වා, අප්‍රිය දායාදයෝ හෝ; හරන්ති, හැරගනිත්; සො, හෙතෙම; මෙ, මට; යං අපි, යමකුත්; අහොසි, ඇතිවූයේද; තං අපි, එයද; නත්ථි නොඉති නැත්තේනොවේදැයි; සොචති, සෝකකෙරෙයි; කිලමති, කලාන්තවෙයි; පරිදෙවති, වැලපෙයි; උරත්තාළිං කන්දති, ළයෙහි අත ගසා හඬයි; සම්මොහං, සිහිමුළා බවට; ආපජ්ජති, පැමිණෙයි; භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ආත්ම භාවයෙහි දක්කයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො, මේ දුඃඛරාශියද; කාම හෙතු, කාමය හේතුකොටගෙනවෙයි; කාමනිදානං, කාමය මුල් කොට ඇතිවෙයි; කාමාධිකරණං, කාමය වැඩිකිරීම හේතුකොට ගෙනවෙයි; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන්වෙයි;

පුනචපරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති, ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති බ්‍රාහමණාපි බ්‍රාහමණෙහි විවදන්ති ගහපතයොපි ගහපතිහි විවදන්ති මාතාපි පුත්තෙන විවදති පුත්තොපි මාතරා විවදති පිතාපි පුත්තෙන විවදති පුත්තොපි පිතරා විවදති භාතාපි භාතරා විවදති භාතාපි භගිනියා විවදති භගිනීපි භාතරා විවදති සහායොපි සහායෙන විවදති තෙ තත්‍ථ කලහවිග්ගහවිවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති ලෙඩ්ඩූහිපි උපක්කමන්ති දණ්ඩෙහිපි උපක්කමන්ති සත්‍ථෙහිපි උපක්කමන්ති තෙ තත්‍ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං,

---

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍යවූ කාමාදීනවයක්; (කියම්) කාමහෙතු, කාමයන් හේතුකොටගෙන; කාමනිදානං, කාමය මුල්හේතුකොට; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙන; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන්; රාජානො අපි, රජහුද; රාජූහි, රජුන් හා; විවදන්ති, විවාදකෙරෙත්; ඛත්තියා අපි, ක්‍ෂත්‍රියයෝද; ඛත්තියෙහි, ක්‍ෂත්‍රියයන් හා; විවදන්ති, විවාදකෙරෙත්; බ්‍රාහමණා අපි, බමුණෝද; බ්‍රාහමණෙහි, බමුණන් හා; විවදන්ති, විවාදකෙරෙත්; ගහපතයො අපි, ගෘහපතිහුද; ගහපතීහි, ගෘහපතීන් හා; විවදන්ති, විවාදකෙරෙත්; මාතාඅපි, මව්තොමෝද; පුත්තෙන, පුත්‍රයා හා; විවදති, විවාදකෙරෙයි; පුත්තො අපි, පුත්‍රතෙමේද; මාතරා, මවහා; විවදති, විවාදකෙරෙයි; පිතා අපි, පිය තෙමේද; පුත්තෙන, පුත්‍රයා හා; විවදති, විවාදකෙරෙයි; පුත්තො අපි; පුත්‍රතෙමේද; පිතරා, පියා හා; විවදති, විවාදකෙරෙයි; භාතා අපි, සොහොයුරුතෙමේද; භාතරා, සොහොයුරා හා; විවදති, විවාදකෙරෙයි; භාතා අපි, භ්‍රාතෘතෙමේද; භගිනියා, බුහුනැණිය සමග; විවදති, විවාදකෙරෙයි; භගිනි අපි, බුහුනැණිතොමෝද; භාතරා, භ්‍රාතෘව හා; විවදති, විවාදකෙරෙයි; සහායොපි, යහලුතෙමේද; සහායෙන, යහලුවා සමඟ; විවදති, විවාදකෙරෙයි; තෙ,ඔව්හුතුමූ; තත්‍ථ, ඒවිවාදස්ථානයෙහි; කලහවිග්ගහවිවාදං, ඩබරයට හා විග්‍රහ විවාදයට; ආපන්නා, පැමිණියාහු; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; පාණීහිපි, අත්වලින්ද; උපක්කමන්ති,පහරත්; ලෙඩ්ඩූහිපි, ගල්කැටවලින්ද; උපක්කමන්ති, පහරත්; දණ්ඩෙහිපි, දඬුවලින්ද; උපක්කමන්ති, පහරත්; සත්‍ථෙහිපි,ශස්ත්‍රවලින්ද; උපක්කමන්ති,=හරත්; තෙ,ඔහුතුමූ; තත්‍ථ, එහි; මරණම්පි, මරණයටද; නිගච්ඡන්ති, පැමිණෙත්; මරණමත්තං, මරණය සමානවූ; දුක්ඛම්පි, දුකවද (පැමිණෙත්.)

අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

පුනචපරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා උභතො බ්‍යූළ්හං සඞ්ගාමං පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානාසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තාසු, තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති සත්තියාපි විජ්ඣන්ති අසිනාපි සීසං ඡින්දන්ති තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං, අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මයෙහි දක්නයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො, මේ දුක්සමූහයද; කාමහෙතු, කාමයන් හේතුකොට ගෙනවෙයි; කාමනිදානං, කාමයන් මුල්කොට ඇතිවෙයි; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙනවෙයි; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන් වෙයි;

භික්ඛවෙ, මහණෙනි; පුනච,නැවතද; පරං, අන්‍යවූ; (කාමාදීනවයක් කියමි) කාමහෙතු, කාමයන් හේතුකොටගෙන; කාමනිදානං, කාමයන් මුල්හේතුකොට; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙන; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන්; උසූසු ඛිප්පමානාසුපි, හී හරිනුලබනකල්හිද; සත්තීසු ඛිප්පමානාසුපි, ශස්ත්‍රයන් හරිනුලබනකල්හිද; අසීසු විජ්ජොතලන්තාසුපි, කඩුපරිවර්තනයකරනුලබන කල්හිද; අසිචම්මං ගහෙත්වා, කඩුව හා පලිහ ගෙන; ධනුකලාපං සන්නය්හිත්වා, දුන්නගෙන ශරකලාපසන්නඬව; උභතොබ්‍යූළ්හං, දෙපක්ෂයෙන් රැස්වූ; සඞ්ගාමං, යුඬස්ථානයට; පක්ඛන්දන්ති, ප්‍රවිෂ්ටවෙත්; තෙ, ඔහුතුමූ; තත්ථ, එහි; උසූහිපි, ඊවලින්ද; විජ්ඣන්ති, විදිත්; සත්තියාපි, ශස්ත්‍රවලින්ද; විජ්ඣන්ති, විදිත්; අසිනාපි, කඩුවෙන්ද; සීසං, හිස; ඡින්දන්ති, සිඳිත්; තෙ, ඔහුතුමූ; තත්ථ, ඒයුඬයෙහි; මරණම්පි, මරණයටද; නිගච්ඡන්ති, පැමිණෙත්; මරණමත්තං, මරණ ප්‍රමාණවූ; දුක්ඛං අපි, දුකටද, (පැමිණෙත්) භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මයෙහි දක්නයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො, මේ දුක්ඛසමූහයද; කාමහෙතු, කාමයන් හේතුකොටගෙන (වෙයි;) කාමනිදානං, කාමයන් මුල්කොටඇතිවෙයි; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙනවෙයි; කාමානං එව, කාමයන්ගේම; හෙතු, ප්‍රත්‍යයෙන් වෙයි;

පුනචපරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා අද්දාවලෙපනා උපකාරියො පක්ඛන්දන්ති, උසූසුපි ඛිප්පමානා සු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජෝතලන්තෙසු.

තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති සත්තියාපි විජ්ඣන්ති පක්කට්ඨියාපි ඔසිඤ්චන්ති අභිවග්ගෙනපි ඔමද්දන්ති අසිනාපි සීසං ඡින්දන්ති තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං, අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍යවූ (කාමාදීනවයක් කියමි.) කාමහෙතු, කාමයන් හේතුකොටගෙන; කාමනිදානං, කාමයන් මුල්හේතුකොට; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙන; කාමානං එව, කාමයන්ගේම; හෙතු, හේතුවෙන්; උසූසුඛිප්පමානාසුපි, හීගරිනුලබන කල්හිද; සත්තීසු ඛිප්පමානාසුපි, ශස්ත්‍රයන් හරිනු ලබන කල්හිද; අසීසු විජ්ජෝතලන්තෙසුපි, කඩුපරිවර්තනය කරන කල්හිද; අසිචම්මං ගහෙත්වා, කඩුව හා පලිහ ගෙන; ධනුකලාපං සන්නය්හිත්වා, දුන්නගෙන ශරකලාපසන්නාහව; අද්දාවලෙපනා, රත්වූකලලින් ආලෙපකරන ලද්දාවූ; උපකාරියො, ප්‍රාකාරපාදයන්ට; පක්ඛන්දන්ති,පනිත්;

තෙ, ඒ යුඬයට පැමිණියාහු; තත්ථ, ඒ යුඬභූමියෙහිදී; උසූහිපි විජ්ඣන්ති, ඊවලින්ද විදිත්; සත්තියාපි විජ්ඣන්ති, ශස්ත්‍රයෙන්ද විදිත්; පක්කට්ඨියාපි; කකියවනලද ගොමෙන්ද; ඔසිඤ්චන්ති, ඉසිත්; අභිවග්ගෙනපි, සියදතින්ද; (හෙවත්) සිදුරැ දතින්ද; ඔමද්දන්ති, මඬිත්; අසිනාපි, කඩුවෙන්ද; සීසං, හිස; ඡින්දන්ති, සිඳිත්; තෙ, ඒ යුඬයට පැමිණියාහු; තත්ථ, ඒ යුඬයෙහිදී; මරණම්පි, මරණයටද; නිගච්ඡන්ති, පැමිණෙත්; මරණමත්තං, මරණප්‍රමාණවූ; දුක්ඛං අපි, දුකටද; (පැමිණෙත්;) භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මභාවයෙහි දක්කයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො, මේ දුක්ඛසමූහයද; කාමහෙතු, කාමයන් හෙතුකොටගෙන, (වෙයි) කාමනිදානං, කාමයන් මූල්හේතුකොට (ඇතිවෙයි) කාමාධිකරණං, කාමයන් කාරණා කොටගෙන (වෙයි) කාමානං එව, කාමයන්ගේම; හෙතු, හේතුවෙන් (වෙයි)

පුනචපරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු සන්ධිම්පි ඡින්දන්ති නිල්ලොපම්පි හරන්ති එකාගාරිකම්පි කරොන්ති පරිපන්ථෙපි තිට්ඨන්ති පරදාරම්පි ගච්ඡන්ති තමෙනං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති කසාහිපි තාළෙන්ති වෙත්තෙහිපි තාළෙන්ති අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති හත්ථම්පි ඡින්දන්ති පාදම්පි ඡින්දන්ති හත්ථපාදම්පි ඡින්දන්ති කණ්ණම්පි ඡින්දන්ති නාසම්පි ඡින්දන්ති කණ්ණනාසම්පි ඡින්දන්ති බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති රාහුමුඛම්පි කරොන්ති. ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති එරකවත්තිකම්පි කරොන්ති චීරකවාසිකම්පි කරොන්ති එණෙය්‍යකම්පි කරොන්ති—

---

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍ය වූ (කාමාදීනවයක් කියමි.) කාමහෙතු, කාමයන් හේතුකොටගෙන; කාමනිදානං, කාමයන් මුල්හේතුකොට; කාමාධිකරණං, කාමයන් කාරණාකොටගෙන; කාමානං එව, කාමයන්ගේම, හෙතු, ප්‍රත්‍යයෙන්; සන්ධිම්පි ඡින්දන්ති, ගෘහසන්ධිද සිඳිත්; නිල්ලොපම්පි හරන්ති, ගම්ද පැහැරගනිත්; එකාගාරිකම්පි කරොන්ති, වටකොට අල්වාගෙන ධනය පැහැරගැනීමද කෙරෙත්; පරිපන්ථෙපි තිට්ඨන්ති, මංපැහැරීමෙහිද සිටිත්; පරදාරම්පි, පරස්ත්‍රියකරාද; ගච්ඡන්ති, පැමිණෙත්; තමෙනං, ඒ තැනැත්තා, රාජානො, රජහු; ගහෙත්වා, අල්වාගෙන; විවිධා කම්මකාරණා, නොයෙක් කම්කටුලු; කාරෙන්ති, කරවත්; කසාහිපි, කසවලින්ද; තාළෙන්ති, (රාජපුරුෂයෝ) තළත්; වෙත්තෙහිපි, වේවැල්වලින්ද; තාළෙන්ති, තළත්; අඩ්ඪදණ්ඩකෙහිපි, දෙකට පැලූ සතර රියන් මුගුරු වලින්ද; තාළෙන්ති, තළත්; හත්ථම්පි, අතද; ඡින්දන්ති, සිඳිත්; පාදම්පි, පයද; ඡින්දන්ති, සිඳිත්; හත්ථපාදම්පි, අත්පාදෙකද; ඡින්දන්ති, සිඳිත්; කණ්ණම්පි, කණද; ඡින්දන්ති, සිඳිත්; නාසම්පි, නාසයද; ඡින්දන්ති, සිඳිත්; කණ්ණනාසම්පි, කන්නාසා දෙකද; ඡින්දන්ති, සිඳිත්; බිලඞ්ගථාලිකම්පි, බිලඞ්ගථාලිකවධයද; කරොන්ති, කෙරෙත්; සඞ්ඛමුණ්ඩිකම්පි, සඞ්ඛමුණ්ඩිකවධයද; කරොන්ති, කෙරෙත්; රාහුමුඛම්පි; රාහුමුඛවධයද; කරොන්ති, කෙරෙත්; ජොතිමාලිකම්පි, ජොතිමාලිකවධයද; කරොන්ති, කෙරෙත්; හත්ථපජ්ජොතිකම්පි, හත්ථපජ්ජොතිකවධයද; කරොන්ති, කෙරෙත්; එරකවත්තිකම්පි, එරකවත්තිකවධයද; කරොන්ති, කෙරෙත්; චීරකවාසිකම්පි, චීරකවාසිකවධයද; කරොන්ති, කෙරෙත්; එණෙය්‍යකම්පි, එණෙය්‍යකවධයද; කරොන්ති, කෙරෙත්;

බලිසමංසිකම්පි කරොන්ති කහාපණකම්පි කරොන්ති. ඛාරාපතච්ඡිකම්පි කරොන්ති පලිඝපරිවත්තිකම්පි කරොන්ති පලාලපීඨකම්පි කරොන්ති තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති සුනඛෙහිපි ඛාදාපෙන්ති ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති අසිනාපි සීසං ඡින්දන්ති, තෙ තත්‍ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං; අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

පුනචපරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙවහෙතු කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති.

---

බලිසමංසිකම්පි, බලිසමංසික වධයද; කරොන්ති, කෙරෙත්; කහාපණකම්පි, කහාපණක වධයද; කරොන්ති, කෙරෙත්; ඛාරාපතච්ඡිකම්පි, ඛාරාපතච්ඡිකවධයද; කරොන්ති, කෙරෙත්; පලිඝ පරිවත්තිකම්පි, පලිඝපරිවත්තික වධයද; කරොන්ති; කෙරෙත්; පලාලපීඨිකම්පි, පලාලපීඨික වධයද; කරොන්ති, කෙරෙත්; තත්තෙනපි තෙලෙන, රත්වූ තෙලින්ද; ඔසිඤ්චන්ති, ඉසිත්; සුනඛෙහිපි, සුනඛයන්ලවාද; ඛාදාපෙන්ති, කවත්; ජීවන්තම්පි, ජීවත්වන්නහුද; සූලෙ, උලෙහි; උත්තාසෙන්ති, හිඳුවත්; අසිනාපි, කඩුවෙන්ද; සීසං, හිස; ඡින්දන්ති, සිඳිත්; තෙ, ඒ අපරාධකාරයෝ, තත්‍ථ, ඒ (වධකරන) ස්ථානයෙහිදී; මරණම්පි, මරණයටද; නිගච්ඡන්ති, පැමිණෙත්; මරණමත්තම්පි දුක්ඛං, මරණ ප්‍රමාණවූ දුකටද; (පැමිණෙත්) භික්ඛවෙ; මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සන්දිට්ඨිකො, ඉහාත්මභාවයෙහි දක්කයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො, මේ දුක්සමූහයද; කාමහෙතු, කාමයන් හේතුකොට ගෙන (වෙයි) කාමනිදානං, කාමයන් මූල්හේතුකොට(ඇතිවෙයි)කාමාධිකරණං, කාමයන් කාරණාකොට ගෙන (වෙයි) කාමානං එව, කාමයන්ගේම, හෙතු, හේතුවෙන් (වෙයි)

භික්ඛවෙ, මහණෙනි; පුන්ච, නැවතද; පරං, අන්‍යවූ කාමාදීනවයක් (කියමි) කාමහෙතු, කාමයන් හේතුකොට ගෙන; කාමනිදානං, කාමයන් මූල්හේතුකොට ගෙන; කාමාධිකරණං, කාමයන් කාරණා කොටගෙන; කාමානං එව, කාමයන්ගේම; හෙතු, හේතුවෙන්; කායෙන, කයින්; දුච්චරිතං, ප්‍රාණඝාතාදී ත්‍රිවිධ දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙත්; වාචාය, වචනයෙන්, දුච්චරිතං, බොරුකීම් ආදී චතුර්විධ දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙත්; මනසා, සිතින්; දුච්චරිතං, අභිධ්‍යාදී ත්‍රිවිධ දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙත්;

තෙ කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

කිඤ්ච භික්ඛවෙ කාමානං නිස්සරණං, යො ච ඛො භික්ඛවෙ කාමෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහාණං ඉදං කාමානං නිස්සරණං

යෙහිකෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං කාමානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදිනවතො නිස්සරණඤ්ච

---

තෙ, ඒ පාපකාරීහු; කායෙන, කයින්; දුච්චරිතං චරිත්වා, දුශ්චරිතයෙහි හැසිර; වාචාය, වචනයෙන්; දුච්චරිතං චරිත්වා, දුශ්චරිතයෙහි හැසිර; මනසා, සිතින්; දුච්චරිතං චරිත්වා, දුශ්චරිතයෙහි හැසිර; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳිමෙන්; මරණා පරං, මරනින්මතු; අපායං, (සැපයෙන් පහවූහෙයින්) අපාය නම්වූ; දුග්ගතිං,(දුක්වූගති ඇතිහෙයින්) දුර්ගතිනම්වූ; විනිපාතං, විවශවපතිතවන්නාවූ; නිරයං, නරකයට; උපපජ්ජන්ති, පැමිනෙත්; භික්ඛවෙ,මහණෙනි; කාමානං, කාමයන්ගේ; ආදීනවො, දෝෂයවූ; සම්පරායිකො, පරලොව වින්දයුතුවූ; අයම්පි දුක්ඛක්ඛන්ධො,(නරකයෙහි ඉපදිමෙන්වන) මේ දුක්සමූහයද; කාමහෙතු, කාමයන් හේතුකොටගෙන(වෙයි); කාමනිදානං, කාමයන් මුල් හේතුකොට (ඇතිවෙයි) කාමාධිකරණං,කාමයන්කාරණකොට ගෙන (වෙයි); කාමානං එව, කාමයන්ගේම; හෙතු, හේතුවෙන් (වෙයි);

භික්ඛවෙ, මහණෙනි; කාමානං, කාමයන්ගේ; නිස්සරණං, දුරුකිරීම; කිඤ්ච, කුමක්ද; භික්ඛවෙ, මහණෙනි; කාමෙසු, කාමයන්හි; යොච ඛො ඡන්දරාගවිනයො, යම් ඡන්දරාගය දුරුකිරීමෙක් ඇද්ද; ඡන්දරාගප්පහාණං,ඡන්දරාගය ප්‍රහීණකිරීමෙක් ඇද්ද; ඉදං, මේ; කාමානං, කාමයන්ගේ; නිස්සරණං, නිස්සරණය හෙවත් නිශ්ශ්‍රාණයවෙයි; භික්ඛවෙ, මහණෙනි; යෙහි කෙචි සමණා වා, යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බ්‍රාහ්මණයෝ හෝ; එවං, මෙසේ; කාමානං, කාමයන්ගේ; අස්සාදඤ්ච, ආස්වාදයද (රසවිඳගැනීමද); අස්සාදතො, ආස්වාදය හෙයින්; ආදීනවඤ්ච, ආදීනවයද; ආදිනවතො,ආදීනවයහෙයින්;නිස්සරණඤ්ච, නිස්සරණයද;

නිස්සරණතො යථාභූතං නප්පජානන්ති, තෙ වත සාමං වා කාමෙ පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථාපටිපන්නො කාමෙ පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං කාමානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති, තෙ වත සාමං වා කාමෙ පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථාපටිපන්නො කාමෙ පරිජානිස්සතීති ඨානමෙතං විජ්ජති.

---

නිස්සරණතො, නිස්සරණය හෙයින්; යථාභූතං, තත්වූ පරිද්දෙන්; නප්පජානන්ති, නොදනිත්නම්; තෙ, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; වත, ඒකාන්තයෙන්; සාමං වා, තුමූ හෝ; කාමෙ, කාමයන්; පරිජානිස්සන්ති, පිරිසිඳ දැනගන්නාහුය; යථා පටිපන්නො, යම්සේ පිළිපදින්නේ; කාමෙ, කාමයන්; පරිජානිස්සති, (ඤාත-පහාණ-තීරණ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ පරිඥාවෙන්) පිරිසිඳ දැන ගන්නේද(එපරිද්දෙන්)පරංවා, අන්‍යයා හෝ;තථත්තාය,ඒ කාම යන් පිරිසිඳ දැනගැනීම පිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන් කරවන්නාහුය යන; එතං ඨානං,මේ කාරණය; නවිජ්ජති, නැත්තේය;

භික්ඛවෙ, මහණෙනි; යෙ ච ඛො කෙචි සමණා වා, යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බමුණෝ හෝ; එවං, මෙසේ; කාමානං, කාමයන්ගේ; අස්සාදඤ්ච, ආස්වාදයද; අස්සාදතො, ආස්වාදහෙයින්; ආදීනවඤ්ච, ආදීනවය (දෝෂය)ද; ආදීනවතො, ආදීනවහෙයින්; නිස්සරණඤ්ච, නිස්සරණයද; නිස්සරණතො, නිස්සරණහෙයින්; යථාභූතං, තත්වූපරිද්දෙන්; නප්පජානන්ති, නොදනිත්නම්; තෙ, ඒ ශ්‍රමණබ්‍රාහ්මණයෝ; වත, ඒකාන්තයෙන්; සාමං වා, තුමූහෝ; කාමෙ,කාමයන්; පරිජානිස්සන්ති, පිරිසිඳ දැනගන්නාහුය; යථා පටිපන්නො, යම්සේ පිළිපදනේ; කාමෙ කාමයන්; පරිජානිස්සති, පිරිසිඳ දැන ගන්නේද; (එපරිද්දෙන්) පරං වා, අන්‍යයා හෝ; තථත්තාය, එසේ කාමයන් පිරිසිඳ දැනගනු පිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන්කරවන්නාහුය යන; එතං ඨානං, මේ කාරණය;විජ්ජති, ඇත්තේය.

කොච භික්ඛවෙ රූපානං අස්සාදො, සෙය්‍යථාපි භික්ඛවෙ ඛත්තියකඤ්ඤා වා බ්‍රාහ්මණකඤ්ඤා වා ගහපතිකඤ්ඤා වා පණ්ණරසවස්සුද්දෙසිකා වා සොළසවස්සුද්දෙසිකා වා නාතිදීඝා නාතිරස්සා නාතිකිසා නාතිථූලා නාතිකාළා නාච්චොදාතා, පරමා සා භික්ඛවෙ තස්මිං සමයෙ සුභා වණ්ණනිභාති, එවං භන්තෙති, යං ඛො භික්ඛවෙ සුභං වණ්ණනිභං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපානං අස්සාදො.

කොච භික්ඛවෙ රූපානං ආදීනවො ඉධ භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය අපරෙන සමයෙන ආසීතිකං වා නාවුතිකං වා වස්සසතිකං වා ජාතියා ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායනං පවෙධමානං ගච්ඡන්තිං ආතුරං ගතයොබ්බනං

---

භික්ඛවෙ මහණෙනි; රූපානං,රූපයන්ගේ; අස්සාදො,ආස්වාදයතෙම; කොච, කවරේද; භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; නාතිදීඝා, ඉතාදිග් (උස්)නොවූ; නාතිරස්සා; ඉතා මිටි නොවූ; නාතිකිසා, ඉතා කෘශනොවූ; නාතිථූලා,ඉතාස්ථූලනොවූ; නාතිකාලා, ඉතා කළුනොවූ; න අතිඔදාතා, ඉතා එලළුනොවූ; පණ්ණරසවස්සුද්දෙසිකා වා,පසළොස්අවුරුදු වයස්ඇත්තාවූහෝ; සොළසවස්සුද්දෙසිකා වා, සොළොස්අවුරුදු වයස්ඇත්තාවූ හෝ; ඛත්තියකඤ්ඤා වා, ක්ෂත්‍රියකන්‍යාවක් හෝ; බ්‍රාහ්මණකඤ්ඤා වා, බ්‍රාහ්මණකන්‍යාවක්හෝ; ගහපතිකඤ්ඤා වා, ගෘහපතිකන්‍යාවක් හෝ; (වේද) භික්ඛවෙ, මහණෙනි; තස්මිං සමයෙ, ඒකාලයෙහි; සා, ඕතොමෝ; පරමා, උතුම්වූ; සුභා, සිත්කළුවූ, වණ්ණනිභා ඉති, ශරීරවර්ණඇත්තියක් (වේදැයි විචාළසේක) භන්තෙ, ස්වාමීන්වහන්ස; එවං ඉති, එසේයයි (කීවාහුය) භික්ඛවෙ,මහණෙනි; සුභං, සිත්කළුවූ; වණ්ණනිභං පටිච්ච,ශරීරවර්ණය නිසා; යං ඛො සුඛං සොමනස්සං,යම් සැපයක් හා සොම්නසක්; උප්පජ්ජති, උපදීද; අයං, මේතෙම; රූපානං, රූපයන්ගේ; අස්සාදො ආස්වාදය (රසවිඳගැනීම වෙයි)

භික්ඛවෙ, මහණෙනි; රූපානං, රූපයන්ගේ; ආදීනවො, දෝෂයතෙම්; කොච, කවරේද;? භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ලෝකයෙහි; අපරෙන සමයෙන, මෑතකාලයෙහි; ජාතියා, ඉපදීමෙන්; ආසීතිකං වා, අසූවයස්වූ හෝ; නාවුතිකං වා, අනූවයස්වූහෝ; වස්සසතිකං වා, සියක්වයස්වූ හෝ; ජිණ්ණං, ජරාවෙන් දිරුණාවූ; ගොපානසිවඞ්කං, ගොනැස්සක්මෙන් වක්වූ; භොග්ගං, මැදින් බිඳුණාවූ; දණ්ඩපරායනං, සැරයටිය පිළිසරණකොට ඇත්තාවූ; පවෙධමානං වෙවුලනුලබමින්; ගච්ඡන්තිං, යන්නාවූ; ආතුරං, ජරාවෙන් ආතුරවූ; ගතයොබ්බනං, ඉක්මගිය යොවුනඇති;

ඛණ්ඩදන්තං පලිතකෙසං විලූනං ඛලිතංසිරො වලිතං තිලකාහතගත්තන්ති, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති. එවං භන්තෙති, අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො

පුනචපරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය ආබාධිකං දුක්ඛිතං බාළ්හගිලානං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානං තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති. එවං භන්තෙති අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

---

ඛණ්ඩදන්තං, කැඩුණු (වැටුණු) දත් ඇත්තීවූ; පලිතකෙසං, පැසුණු (සුදුවූ) හිසකේ ඇත්තීවූ; විලූනං, උදුරාගන්නාලද්දක්මෙන් කෙස්නැති හිසඇත්තීවූ; ඛලිතංසිරො, (ගාත්පසින්) කෙස් රහිත හිස ඇත්තීවූ; වලිතං, හටගත් රැලිසහිත සමඇත්තීවූ; තිලකාහතගත්තං, සෙවතකාලාදිතිලකයන්ගෙන් ගැවසීගත් සිරුර ඇත්තීවූ; තං භගිනිං එව, ඒ බුහුනැණිය (සත්‍රිය)ම; පස්සෙය්‍ය, දක්නේනම්; භික්ඛවෙ, මහණෙනි; තං කිම්මඤ්ඤථ, හේ කුමක්සිතව්ද; පුරිමා, පූර්වයෙහිවූ; සුභා, සිත්කළුවූ; යාවණ්ණනිභා, යම්ශරීරවර්ණකාන්තියෙක්විද; සා, ඒශරීරවර්ණකාන්ති යතොම; අන්තරහිතා, අතුරුදහන්විද; ආදීනවො, දෝෂය; පාතුභූතො ඉති, පහළවූයේදැයි; (විචාළසේක) භන්තෙ, ස්වාමීන් වහන්ස; එවං ඉති, එසේයයි; (කීවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයං අපි, මේද; රූපානං, රූපයන්ගේ; ආදීනවො, දෝෂය(වෙයි);

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්රූපාදීනව යක් කියමි; ආබාධිකං, ආබාධඇත්තාවූ; දුක්ඛිතං, දුකටපැමිණි යාවූ; බාළ්හගිලානං, දැඩි ගිලන්බැව් ඇත්තාවූ; සකෙ මුත්තකරීසෙ, ස්වකීය මලමූත්‍රයෙහි; පලිපන්නං, ගැලුණාවූ; සෙමානං, (එහිම)හොවින්නාවූ; අඤ්ඤෙහි, අන්‍යයන්විසින්; වුට්ඨාපියමානං, නගාසිටුවනු ලබන්නීවූ; අඤ්ඤෙහි, අන්‍යයන්විසින්; සංවෙසියමානං, ගෘහආදියට ප්‍රවිෂ්ටකරවනු ලබන්නීවූ; තං එව භගිනිං, ඒ බුහුනණියම; පස්සෙය්‍ය, දක්නේනම්; තං කිම්මඤ්ඤථ, ඒකුමැයි සිතන්නහුද; භික්ඛවෙ, මහණෙනි; යා පුරිමා සුභා වණ්ණනිභා, පූර්වයෙහි යහපත්වූ යම්ශරීරවර්ණකාන්තියෙක්වීද; සා, ඕතොමෙ! අන්තරහිතා, අතුරුදහන්වූවාද; ආදීනවො, දෝෂයතෙම; පාතුභූතො ඉති, පහළවූයේදැයි; (විචාළසේක) භන්තෙ, ස්වාමීනි; එවං ඉති, එසේයයි; (භික්ෂුහු කීවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයං අපි, මේද; රූපානං, රූපයන්ගේ; ආදීනවො, දෝෂය(වෙයි)

පුනචපරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතං, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති, එවං භන්තෙති, අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

පුනචපරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි ච ඛජ්ජමානං සුනඛෙහි වා ඛජ්ජමානං සිගාලෙහි වා ඛජ්ජමානං විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති, එවං භන්තෙති, අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

---

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං,අන්‍යවූ රූපාදි නවයක්කියමි; සීවථිකාය, අමුසොහොනෙහි; ඡඩ්ඩිතං, දමනලද්දවූ;එකාහමතං වා,මළඑකදවස්වූහෝ; ද්වීහමතංවා,මළදෙදවස්වූ හෝ; තීහමතං වා, මළතුන්දවස්වූ හෝ; උද්ධුමාතකං, ඉදිමූණාවූ; විනීලකං,නිල්වූ; විපුබ්බකජාතං, පූයාහටගත්තාවූ; සරීරං, ශරීරයඇති; තං එවභගිනිං, ඒසත්‍රියම; පස්සෙය්‍ය, දක්නේනම්; තං කිම්මඤ්ඤථ, ඒ කුමැයි සිතන්නහුද; භික්ඛවෙ, මහණෙනි; යා පුරිමා සුභා වණ්ණනිභා, පූර්වයෙහි යහපත්වූ යම් ශරීරවර්ණකාන්තියෙක්විද; සා, ඕතොමෝ; අන්තරහිතා, අතුරුදහන්විද; ආදීනවො, දොෂයතෙම; පාතුභූතො ඉති, පහළවූයේදැයි; (ඒවා ලසේක) භන්තෙ, ස්වාමීනි; එවං ඉති, එසේයයි; (කිවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයම්පි, මේද; රූපානං, රූපයන්ගේ; ආදීනවො, දොෂය(වෙයි)

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං,අන්‍යවූ රූපාදි නවයක්කියමි; සීවථිකාය,සොහොනෙහි; ඡඩ්ඩිතං,දමනලද්දවූ; කාකෙහි වා, කවුඩන් විසින් හෝ; ඛජ්ජමානං, කනුලබන්නීවූ; කුලලෙහි වා, උකුස්සන් විසින් හෝ; ඛජ්ජමානං, කනුලබන්නීවූ; ගිජ්ඣෙහිවා, ගිජුලිහිනියන් විසින් හෝ; ඛජ්ජමානං, කනුලබන්නීවූ; සුනඛෙහි වා, බල්ලන් විසින් හෝ; ඛජ්ජමානං, කනුලබන්නීවූ; සිගාලෙහි වා, සිවලුන් විසින් හෝ, ඛජ්ජමානං, කනුලබන්නීවූ; විවිධෙහිවා පාණකජාතෙහි, නානාප්‍රකාරවූ ප්‍රාණීවූවන් විසින් හෝ; ඛජ්ජමානං, කනුලබන්නීවූ; සරීරං, ශරීරය ඇති; තං එව භගිනිං, ඒ සත්‍රියම; පස්සෙය්‍ය, දක්නේනම්; තං කිම්මඤ්ඤථ, ඒ කුමැයි සිතන්නහුද; භික්ඛවෙ,මහණෙනි; යාපුරිමා සුභා වණ්ණනිභා,පූර්වයෙහි යහපත්වූ යම් ශරීරවර්ණකාන්තියෙක් වීද; සා, ඕතොමෝ; අන්තරහිතා, අතුරුදහන්වූවාද;

පුනච පරං භික්ඛවෙ තඤ්ඤෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං අට්ඨිකසඞ්ඛලිකං නිම්මංසං ලොහිතමක්ඛිතං නහාරුසම්බන්ධං අට්ඨිකසඞ්ඛලිකං අපගතමංසලොහිතං නහාරුසම්බන්ධං

අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසාසු වික්ඛිත්තානි අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං අඤ්ඤෙන කටට්ඨිකං අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං අඤ්ඤෙන සීසකටාහං, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති, එවං භන්තෙති අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

---

ආදීනවො, දෝෂයතෙම; පාතුභූතො ඉති, පහළවූයේදැයි (විචාළ සේක) භන්තෙ, ස්වාමීනි; එවං ඉති, එසේයයි; (කීවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයං අපි, මෙයද; රූපානං, රූපයන්ගේ; ආදීනවො, දෝෂය;(වෙයි)

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍යවූ රූපාදීනවයක් කියමි; සිවථිකාය, සොහොනෙහි; ඡඩ්ඩිතං, දමනලද් දුවූ; සමංසලොහිතං, මස් ලේ සහිතවූ; නහාරුසම්බන්ධං, නහර වැලින් බැඳුණාවූ; අට්ඨිකසඞ්ඛලිකං, ඇටසැකිලිඇත්තාවූ; නිම්මංසං, මස්නැත්තාවූ; ලොහිතමක්ඛිතං, ලෙහෙයෙන් වැකුණාවූ; නහාරුසම්බන්ධං, නහරවලින් බැඳුණාවූ; අට්ඨිකසඞ්ඛලිකං, ඇට සැකිලි ඇත්තාවූ; අපගතමංසලොහිතං, පහවූ මස්ලේඇති; නහාරුසම්බන්ධං, නහරවලින් බැඳුණාවූ;

අපගත සම්බන්ධානි, පහවූ නහර සම්බන්ධ ඇත්තාවූ; දිසා විදිසාසු වික්ඛිත්තානි, දිසානුදිසාවන්හි විසුරුණාවූ; අට්ඨිකානි, ඇට ඇති (වෙත්) අඤ්ඤෙන, අන්‍ය දිසාභාගයකින්; හත්ථට්ඨිකං, අත් ඇට ඇති; අඤ්ඤෙන, අන්දිසාවකින්; පාදට්ඨිකං, පා ඇට ඇති; අඤ්ඤෙන, අන් දිසාවකින්; ජංඝට්ඨිකං, කෙණ්ඩා ඇට ඇති; අඤ්ඤෙන, අන්තැනකින්; ඌරට්ඨිකං, කළවා ඇට ඇති; අඤ්ඤෙන, අන්තැනකින්; කටට්ඨිකං, කටි ඇට ඇති; අඤ්ඤෙන, අන්තැනකින්; පිට්ඨිකණ්ටකං, පිටකටුඇති; අඤ්ඤෙන, අන්තැනකින්; සීසකටාහං, හිස්කබල ඇත්තාවූ; සරීරං, ශරීරය ඇත්තාවූ; තං එවභගිනිං, ඒ ස්ත්‍රියම; පස්සෙය්‍ය, දක්නේනම්; තං කිම්මඤ්ඤථ, ඒ කුමැයි සිතව්ද; භික්ඛවෙ, මහණෙනි; පුරිමා, පළමුවූ; සුභා, යහපත්වූ; යාවණ්ණනිභා, යම් වර්ණකාන්තියෙක්විද; සා,ඕතොමෝ; අන්තරහිතා අතුරුදහන් වූවාද; ආදීනවො දෝෂයතොම; පාතුභූතොඉති, පහළවූයේ දැයි (විචාළසේක) භන්තෙ, ස්වාමීන්වහන්ස; එවං ඉති, එසේයයි; (කීවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයං අපි, මේද; රූපානං, රූප යන්ගේ; ආදීනවො, දෝෂය; (වෙයි)

පුනචපරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති, එවං භන්තෙති, අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

කිඤ්ච භික්ඛවෙ රූපානං නිස්සරණං යො භික්ඛවෙ රූපෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහාණං ඉදං රූපානං නිස්සරණං, යෙහි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නප්පජානන්ති,

---

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍යවූ රූපාදීනවයක් කියමි; සීවථිකාය, සොහොනෙහි; ඡඩ්ඩිතං, දමනලද්දාවූ; සරීරං, ශරීරය ඇති; තං එව භගිනිං, ඒ ස්ත්‍රියම; පස්සෙය්‍ය, දක්නේනම්; සෙතානි; සුදුවූ; සංඛවණ්ණූපනිභානි, සංඛයකට බඳු වණ්ණ ඇත්තාවූ; අට්ඨිකානි, ඇට ඇත්තාහුය; පුඤ්ජකිතානි, සමූහව විසුරුණාවූ; තෙරොවස්සිකානි, අවුරුදු ඉක්මගියාවූ; අට්ඨිකානි, ඇට ඇත්තාහුය; පූතීනි, කුණුවූ; චුණ්ණකජාතානි, සුනුවිසුනුව විසුරුණාවූ; අට්ඨිකානි, ඇට ඇත්තාහුය; භික්ඛවෙ, මහණෙනි; තං කිම්මඤ්ඤථ, ඒ කුමැයි සිතන්නහුද; පුරිමා, පළමුවූ; සුභා, යහපත්වූ; යා වණ්ණනිභා, යම් වණ්ණසානානියෙක්වීද; සා ඕතොමෝ; අන්තරහිතා, අතුරුදහන්වූවාද; ආදීනවො, දෝෂයතෙම; පාතුභූතො ඉති, පහළවූයේ දැයි; (විචාළසේක) භන්තෙ, ස්වාමීන්වහන්ස; එවං ඉති, එසේයයි; (කීවාහුය) භික්ඛවෙ, මහණෙනි; අයං අපි, මේද; රූපානං, රූපයන්ගේ, ආදීනවො, දෝෂය (වෙයි)

භික්ඛවෙ,මහණෙනි; රූපානං,රූපයන්ගේ;නිස්සරණං,නිස්සරණය; කිඤ්ච,කුමක්ද; භික්ඛවෙ,මහණෙනි; රූපෙසු,රූපයන්හි; යො ඡන්දරාගවිනයො, ඡන්දරාගයාගේ යම් දුරුකිරීමෙක් ඇද්ද; ඡන්දරාගප්පහාණං, ඡන්දරාගය ප්‍රහීණකිරීමෙක් ඇද්ද; ඉදං, මේ; රූපානං,රූපයන්ගේ; නිස්සරණං,නිස්සරණය; (වෙයි) භික්ඛවෙ, මහණෙනි; හි,යම්හෙයකින්; යෙ කෙචි සමණා වා,යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බමුණෝ හෝ; එවං, මෙසේ; රූපානං, රූපයන්ගේ; අස්සාදඤ්ච, ආස්වාදය හෙවත් රසවිඳගැණීමද; අස්සාදතො, ආස්වාද (රසවිඳගැනීම) වසයෙන්; ආදීනවඤ්ච, දෝෂයද; ආදීනවතො, දෝෂවසයෙන්; නිස්සරණඤ්ච, (රූපයන්හි ආසාව) දුරුකිරීමද; නිස්සරණතො, නිස්සරණවසයෙන්; යථාභූතං, තත්වූපරිද්දෙන්; නප්පජානන්ති, නොදනිද්ද;

තෙ වත සාමං වා රූපෙ පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථාපටිපන්නො රූපෙ පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති, යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති තෙ වත සාමං වා රූපෙ පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථාපටිපන්නො රූපෙ පරිජානිස්සතීති ඨානමෙතං විජ්ජති,

කතමො ච භික්ඛවෙ වෙදනානං අස්සාදො? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති,

---

තෙ, ඔහුතුමූ; වත, ඒකාන්තයෙන්; සාමං වා, තුමූහෝ; රූපෙ, රූපයන්; පරිජානිස්සන්ති, පිරිසිඳ දන්නාහුය; යථාපටිපන්නො, යම්සේ පිළිපන්නාවූ සත්වයෙක්; රූපෙ, රූපයන්; පරිජානිස්සති, පිරිසිඳ දැනගන්නේද එපරිද්දෙන්; පරං වා, අන්‍යයා හෝ; තථත්තාය, ඒ(දැනීම)පිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන්කරවන්නාහුය යන; එතං ඨානං, මේ කාරණය; න විජ්ජති, විද්‍යමානනොවේ; භික්ඛවෙ, මහණෙනි, යෙච ඛො කෙචි සමණා වා, යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බමුණෝ හෝ; එවං, මෙසේ; රූපානං, රූපයන්ගේ; අස්සාදඤ්ච, ආස්වාදය; (රසවිඳගැනීමද) අස්සාදතො, රසවිඳගැනීම වශයෙන්; ආදීනවඤ්ච, දෝෂයද; ආදීනවතො, දෝෂය වශයෙන්; නිස්සරණඤ්ච, දුරුකිරීමද; නිස්සරණතො, දුරුකිරීම වශයෙන්; යථාභූතං, තත්වූ පරිද්දෙන්, පජානන්ති, දැනගතිද්ද; තෙ, ඔහුතුමූ; වත, ඒකාන්තයෙන්; සාමං වා; තුමූහෝ; රූපෙ, රූපයන්; පරිජානිස්සන්ති, පිරිසිඳ දැනගන්නාහුය; යථාපටිපන්නො, යම්සේ පිළිපන්නාවූ සත්වයෙක්; රූපෙ, රූපයන්; පරිජානිස්සති, පිරිසිඳ දැනගන්නේද (එපරිද්දෙන්) පරංවා, අන්‍යයා හෝ; තථත්තාය, ඒපිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන්කරවන්නාහුය යන; එතං ඨානං, මේ කාරණය; විජ්ජති, විද්‍යමානවේ;

භික්ඛවෙ, මහණෙනි; වෙදනානං, වේදනාවන්ගේ; අස්සාදො, ආස්වාදය; කතමො ච, කවරේද? භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, භික්ෂුතෙම; කාමෙහි, කාමයන්කෙරෙන්; විවිච්චෙව, වෙන්වම; අකුසලෙහි ධම්මෙහි, අකුසලධර්මයන්ගෙන්; විවිච්ච. වෙන්ව; සවිතක්කං, විතර්කසහිතවූ; සවිචාරං, විචාර සහිතවූ; විවෙකජං, විවෙකයෙන් උපන්නාවූ; ප්‍රීතිසුඛං, ප්‍රීතිය හා සැපයඇති; පඨමං ඣානං, ප්‍රථමධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ, විහරති, වාසයකෙරෙයි;

යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති නෙව තස්මිං සමයෙ අත්තබ්‍යාබාධායපි චෙතෙති න පරබ්‍යාබාධායපි චෙතෙති න උභයබ්‍යාබාධායපි චෙතෙති අබ්‍යාපජ්ඣංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති, අබ්‍යාපජ්ඣපරමාහං භික්ඛවෙ වෙදනානං අස්සාදං වදාමි.

පුනචපරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති

---

භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම්කාලෙක්හි; භික්ඛු, මහණතෙම; කාමෙහි, කාමයන්කෙරෙන්; විවිච්චෙව, වෙන්වම; අකුසලෙහි ධම්මෙහි, අකුශලධර්මයන්ගෙන්; විවිච්ච, වෙන්වම; සවිතක්කං, විතර්කසහිතවූ; සවිචාරං, විචාරසහිතවූ; විවෙකජං, විවෙකයෙන් උපන්නාවූ; පීතිසුඛං, ප්‍රීතිය හා සැපයඇති; පඨමං ඣානං, ප්‍රථමධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරේද; තස්මිං සමයෙ, ඒ කාලයෙහි; අත්තබ්‍යාබාධායපි, තමාට දුක්පිණිසද; නෙව චෙතෙති, නොම සිතයි; පරබ්‍යාබාධායපි, අනුන්ට දුක්පිණිසද; න චෙතෙති, නොසිතයි; උභයබ්‍යාබාධායපි, තමාට හා අනුන්ට දුක්පිණිසද; න චෙතෙති, නොසිතයි; තස්මිං සමයෙ, ඒකාලයෙහි; අබ්‍යාපජ්ඣංඑව, නිදුක්වූම; වෙදනං (සැප)වෙදනාව; වෙදෙති, විඳියි; භික්ඛවෙ, මහණෙනි; වෙදනානං, වෙදනාවන්ගේ; අස්සාදං, ආස්වාදය; අබ්‍යාපජ්ඣපරමං, නිදුක් බව පරමකොට ඇත්තේයයි; අහං, මම; වදාමි, කියමි;

භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; පරං, අන්‍යවූ (වේදනාස්වාදයක් කියමි) භික්ඛු, මහණතෙම; විතක්කවිචාරානං, විතර්ක විචාරයන්ගේ; වූපසමා, සංසිඳවීමෙන්; අජ්ඣත්තං සම්පසාදනං, තමාතුල සිතපැහැදීමකරන්නාවූ; චෙතසො, චිත්තයාගේ; එකොදිභාවං, එකාඟබවක්වූ; අවිතක්කං, විතර්ක නැත්තාවූ; අවිචාරං, විචාරනැත්තාවූ; සමාධිජං, (සිත එකඟකිරීමෙන්) සමාධියෙන් උපන්නාවූ; පීතිසුඛං, ප්‍රීතියහා සැපයඇති; දුතියං ඣානං, දෙවන ධ්‍යානයට; උපසම්පජ්ජ, (සන්තානයෙහි ඉපදවීමෙන්) පැමිණ විහරති, වාසයකෙරේද;

යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති,

---

භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම්කලෙක්හි; භික්ඛු, මහණතෙම; විතක්කවිචාරානං, විතර්කවිචාරයන්ගේ; වූපසමා, සංසිඳවීමෙන්; අජ්ඣත්තං සම්පසාදනං, තමාතුල සිතපැහැදීම කරන්නාවූ; චෙතසො, චිත්තයාගේ; එකොදිභාවං, එකඟබවක්වූ; අවිතක්කං, විතර්කනැත්තාවූ; අවිචාරං, විචාරනැත්තාවූ; සමාධිජං, සමාධියෙන් උපන්නාවූ; පීතිසුඛං, ප්‍රීතිය හා සැපයඇති; දුතියං ඣානං, දෙවන ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරේද; භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම්කලෙක්හි; භික්ඛු, මහණතෙම; පීතියා ච, ප්‍රීතියෙහිද; විරාගා, නොඇලීමෙන්; උපෙක්ඛකො ච, මධ්‍යස්ථස්වභාව ඇතිවද; සතො ච, සිහි ඇතිවද; සම්පජානො, නුවණඇතිවද; විහරති, වාසයකෙරේද; සුඛඤ්ච, සුවද; කායෙන, කයින්; පටිසංවෙදෙති, විඳීද; යං තං, යම්බඳුවූ ඒ (තුන්වන ධ්‍යානයෙන් යුක්තවූ) පුද්ගලයා; උපෙක්ඛකො, (පක්ෂපාත නොපැවැත්මෙන්) මධ්‍යස්ථවූයේය; සතිමා, සිහි ඇත්තේය; සුඛවිහාරි ඉති, සැපවිහරණ ඇත්තේයයි; අරියා, ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියත්ද; තං තතියංඣානං, ඒතුන්වන ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසයකෙරේද; භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම්කලෙක්හි; භික්ඛු, මහණතෙම; සුඛස්ස ච පහානා, (කායික හටගන්නා) සැපයාගේ පහකිරීමෙන්ද; දුක්ඛස්ස ච පහානා, දුඃඛයාගේ; පහකිරීමෙන්ද; පුබ්බෙව, පූර්ව(තෘතීයධ්‍යාන)යෙහිම; සොමනස්සදොමනස්සානං, සොම්නස් දොම්නස් දෙදෙනාගේ; අත්ථඞ්ගමා, නැතිකිරීමෙන්; අදුක්ඛං, දුක්නොවූ; අසුඛං, සැපනොවූ; උපෙක්ඛාසතිපාරිසුද්ධිං, උපෙක්ෂාවෙන් ජනිතවූ ස්මෘතිහුගේ පිරිසිදුබැව් ඇත්තාවූ; චතුත්ථං ඣානං, සතරවනධ්‍යාන කුසලචිත්තායට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසයකෙරේද;

නෙව තස්මිං සමයෙ අත්තබ්‍යාබාධායපි චෙතෙති න පරබ්‍යාබාධායපි චෙතෙති න උභයබ්‍යාබාධායපි චෙතෙති අබ්‍යාපජ්ඣංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති අබ්‍යාපජ්ඣපරමාහං භික්ඛවෙ වේදනානං අස්සාදං වදාමි.

කො ච භික්ඛවෙ වෙදනානං ආදීනවො යා භික්ඛවෙ වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං වෙදනානං ආදීනවො.

කිඤ්ච භික්ඛවෙ වෙදනානං නිස්සරණං? යො ච භික්ඛවෙ වෙදනාසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහාණං ඉදං වෙදනානං නිස්සරණං.

යෙහි කෙචි භික්ඛවෙ සමණාවා බ්‍රාහ්මණාවා එවංවෙදනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච

---

තස්මිං සමයෙ, ඒකාලයෙහි; අත්තබ්‍යාබාධායපි, තමාට දුක්පිණිසද; නෙව චෙතෙති, නොම සිතයි; පරබ්‍යාබාධායපි, අනුන්ට දුක්පිණිසද; න චෙතෙති, නොසිතයි; උභයබ්‍යාබාධායපි, තමාට හා අනුන්ට දුක්පිණිසද; න චෙතෙති, නොසිතයි; තස්මිං සමයෙ, ඒකාලයෙහි; අබ්‍යාපජ්ඣංඑව, නිදුක්වූම; වෙදනං, (සැප) වේදනාව; වෙදෙති, විඳියි; භික්ඛවෙ, මහණෙනි; වෙදනානං, වේදනාවන්ගේ; අස්සාදං, ආස්වාදය; අබ්‍යාපජ්ඣපරමං, නිදුක්බව පරමකොට ඇත්තේයයි; අහං, මම; වදාමි, කියමි;

භික්ඛවෙ, මහණෙනි; වෙදනානං, වේදනාවන්ගේ; ආදීනවො, දෝෂයතෙම; කොච, කවරේද; භික්ඛවෙ, මහණෙනි; යා වෙදනා, යම් වේදනාවක්හොම; අනිච්චා, අනිත්‍යවන්නීද; දුක්ඛා, දුක්වන්නීද; විපරිණාමධම්මා, පෙරළෙන සවභාව ඇත්තීද; අයං, මේ; වෙදනානං, වේදනාවන්ගේ; ආදීනවො, දෝෂය වෙයි;

භික්ඛවෙ, මහණෙනි; වෙදනානං, වේදනාවන්ගේ; නිස්සරණං, නිස්සරණය; කිඤ්ච, කුමක්ද; භික්ඛවෙ, මහණෙනි; වෙදනාසු, වේදනාවන්හි; යො ඡන්දරාගවිනයො, ඡන්දරාගයාගේ යම් දුරුකිරීමෙක් ඇද්ද; ඡන්දරාගප්පහාණං, ඡන්දරාගයාගේ ප්‍රහීණකිරීමෙක්ඇද්ද; ඉදං, මේ; වෙදනානං, වේදනාවන්ගේ; නිස්සරණං, නිස්සරණයවෙයි;

භික්ඛවෙ, මහණෙනි; හි, යම්හෙයකින්; යෙ කෙචි සමණා වා, යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බමුණෝ හෝ; එවං, මෙසේ; වෙදනානං, වේදනාවන්ගේ; අස්සාදඤ්ච, ආස්වාදයද; අස්සාදතො, ආස්වාද වශයෙන්; ආදීනවඤ්ච, දෝෂයද; ආදීනවතො, දෝෂවශයෙන්; නිස්සරණඤ්ච, නිස්සරණයද;

නිස්සරණතො යථාභූතං නප්පජානන්ති, තෙ වත සාමං වා වෙදනා පරිජානිස්සන්ති, පරං වා තථත්තාය **සමාදපෙස්සන්ති** යථාපටිපන්නො වෙදනා පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති තෙ වත සාමං වා වෙදනා පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො වෙදනා පරිජානිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**මහාදුක්ඛක්ඛන්ධසුත්තං.**

---

"මූලපණ්ණාසකො"

---

**නිස්සරණතො**, නිස්සරණවශයෙන්; යථාභූතං, තත්වූපරිද්දෙන්; නප්පජානන්ති, නොදනිද්ද; තෙ, ඒ ශ්‍රමණබ්‍රාහ්මණයෝ; වත, ඒකාන්තයෙන්; සාමංවා, තුමූ හෝ; වෙදනා, වෙදනාව; පරිජානිස්සන්ති පිරිසිඳ දැනගන්නාහුය; යථාපටිපන්නො, යම්සේ පිළිපන්සත්ව යෙක්; වෙදනා, වේදනාව; පරිජානිස්සති, පිරිසිඳ දැනගන්නේද (එපරිද්දෙන්) පරං වා, අන්‍යයා හෝ; තථත්තාය, ඒ පිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන්කරවන්නාහුය යන; එතං ඨානං, මේ කාරණය, න විජ්ජති, විද්‍යමානනොවේ;

භික්ඛවෙ, මහණෙනි; යෙ ච ඛො කෙචි සමණා වා, යම්කිසි ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, බමුණෝ හෝ; එවං, මෙසේ; වෙදනානං, වේදනාවන්ගේ; අස්සාදඤ්ච; ආස්වාදයද; අස්සාදතො, ආස්වාදවශයෙන්; ආදීනවඤ්ච, දෝෂයද; ආදීනවතො, දෝෂවශයෙන්; නිස්සරණඤ්ච, නිස්සරණයද; නිස්සරණතො, නිස්සරණවශයෙන්; යථාභූතං, තත්වූපරිද්දෙන්; පජානන්ති, දැනගනිද්ද; තෙ, ඔහුහුමූ; වත, ඒකාන්තයෙන්; සාමං වා, තුමූ හෝ; වෙදනා, වේදනාව; පරිජානිස්සන්ති, පිරිසිඳදැනගන්නාහුය; යථාපටිපන්නො, යම්සේ පිළිපන්නෙක්; වෙදනා, වේදනාව; පරිජානිස්සති, පිරිසිඳ දැනගන්නේද (එපරිද්දෙන්); පරං වා, අන්‍යයා හෝ; තථත්තාය, ඒපිණිස; සමාදපෙස්සන්ති ඉති, සමාදන්කරවන්නාහුය යන; එතං ඨානං, මේ කාරණය; න විජ්ජති ඉති, නැත්තේයයි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මේ දේශනාව; අවොච, වදාළසේක. අත්තමනා, සතුටුසිත්ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; භාසිතං, දේශනාව; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්තාහුයි;

**මහාදුඃඛස්කන්ධ සූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයයි.**

---

එවමෙමසුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං, එකපුග්ගලස්ස භික්ඛවෙ කප්පං සන්ධාවතො සංසරතො සියා එවං මහා අට්ඨිකඞ්කලො අට්ඨිපුඤ්ජො අට්ඨිරාසි යථායං වෙපුල්ලො පබ්බතො සචෙ සංහාරකො අස්ස සම්භතඤ්ච න විනස්සෙය්‍ය, තං කිස්ස හෙතු?

---

මෙ, මාවිසින්; (මේ අට්ඨිපුඤ්ජසූත්‍රාන්ත ධර්මදේශනාව) එවං, මෙසේ; සුතං, අසනලදී; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; රාජගහෙ, රජගහනුවර සමීපයෙහි; ගිජ්ඣකූටෙ පබ්බතෙ, ගිජ්ඣකූටපර්වතයෙහි; විහරති, වැඩවාසය කරනසේක, තත්‍රඛො,එහිදීවනාහි; භගවා,භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රණයකර වදාළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භදන්ත ඉති, පින්වතුන්වහන්සැයි; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්නාහුය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මේ ධර්මදේශනාව; අවොච, වදාළසේක; භික්ඛවෙ, මහණෙනි; අවිජ්ජානීවරණානං, අවිද්‍යාවෙන්මූවාවූ; තණ්හාසංයොජනානං, තෘෂ්ණාවෙන් බැඳුණාවූ; සන්ධාවතං, (භවයෙන්භවයට) නැවත නැවත දිවන්නාවූ; සංසරතං,(භවයෙන්භවයෙහි) නැවත නැවත හැසිරෙන්නාවූ; සත්තානං, සත්වයන්ගේ; සංසාරො, සංසාරයතෙම; හෙවත් ස්කන්ධධාතු ආයතනයන්ගේ පිළිවෙළ නොසිඳී පැවතීම; අනමතග්ගො, (නුවණින්අනුවගොස්) දැන ගතනොහැකි අගඇත්තේය; පුබ්බාකොටි, පූර්වකොළවර; න පඤ්ඤායති, නොපැනෙයි; භික්ඛවෙ, මහණෙනි; කප්පං, අසඞ්ඛ්‍ය කල්පයක් (මුලුල්ලෙහි) සන්ධාවතො, නැවත නැවත දිවන්නාවූ; සංසරතො, නැවත නැවත හැසිරෙන්නාවූ; එකපුග්ගලස්ස, එක් පුද්ගලයකුගේ; සචෙ,ඉදින්; සංහාරකො අස්ස,එකතුකරන්නෙක් ඇත්තේවීනම්; සම්භතඤ්ච, එකතුකරනලද්දත්; න විනස්සෙය්‍ය, විනාසනොවන්නේනම්; අයං, මේ; වෙපුල්ලො පබ්බතො, වෛපුල්ලපර්වතය; යථා යම්සේද; එවං,එපමණවූ; මහාඅට්ඨිකඞ්කලො, මහත් ඇටසැකිල්ලෙක්; අට්ඨිපුඤ්ජො,මහත් ඇටගොඩෙක්;අට්ඨිරාසි, මහත් ඇටරැසෙක්; සියා, වන්නේය; තං කිස්සහෙතු, ඊට හේතු කවරේද;

අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං එවං දීඝරත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං තිප්පං පච්චනුභූතං. බ්‍යසනං පච්චනුභූතං කටසී වඩ්ඪිතා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුන්ති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා—

එකස්සෙකෙන කප්පෙන-පුග්ගලස්සට්ඨිසඤ්චයො
සියා පබ්බතසමො රාසී-ඉති වුත්තං මහෙසිනා

---

භික්ඛවෙ, මහණෙනි; අවිජ්ජානීවරණානං, අවිද්‍යාවෙන් වැසුණාවූ; තණ්හාසංයොජනානං, තෘෂ්ණාවෙන් බැඳුණාවූ; සන්ධාවතං,(භවයෙන්භවයට) නැවතනැවතදිවන්නාවූ; සංසරතං, (භවයෙන්භවයෙහි) නැවත නැවත හැසිරෙන්නාවූ; සත්තානං, සත්වයන්ගේ; සංසාරො, සංසාරයතෙම; අනමතග්ගො, දැනගත නොහැකි අගඇත්තේද; පුබ්බාකොටි, පූර්වකෙළවර; න පඤ්ඤායති, නොපැනේද; (එහෙයිනි) භික්ඛවෙ, මහණෙනි; වො,තොප විසින්; එවං, මෙසේ; දීඝරත්තං, බොහෝකාලයක්මුළුල්ලෙහි; දුක්ඛං, (නරකාදි) දුක; පච්චනුභූතං, අනුභවකරනලද්දේය; තිප්පං, දරුණුවූ දුක පච්චනුභූතං, අනුභවකරන ලද්දේය; බ්‍යසනං, ඥාතිරොගභොගාදිව්‍යසනය; පච්චනුභූතං, අනුභවකරනලද්දේය; කටසී වඩ්ඪිතා, සොහොන්භූමිය වඩනලද්දීය; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් තෘෂ්ණාව විසින් සසරබදින මේ සංස්කාරයෙක් වේද; සබ්බසංඛාරෙසු; ඒ සියලු සංස්කාරයන්කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්ට; අලං, එව, යුතුමය; විරජ්ජිතුං, නොඇලෙන්ට; අලං, යුතුමය; විමුච්චිතුං, විශෙෂයෙන් මිදෙන්ට; අලං ඉති, යුතුයයි (වදාළසේක )

භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මේ ධර්මදෙශනාව; අවොච, වදාළසේක; සුගතො, සොභනගතිඇත්තාවූ; සත්ථා, ශාස්තෲවූ බුදුරජාණන්වහන්සේ; ඉදං,මේදේශනාව; වත්වා,වදාරා; අථ, නැවත; අපරං,අන්‍යගාථාබන්ධනයක්වූ; එතං, මේදම්දෙසීම; අවොච, වදාළසේක;

එකස්ස පුග්ගලස්ස, (සසරසැරිසරන්නාවූ) එක්පුද්ගලයක්හුගේ; අට්ඨිසඤ්චයො, ඇටසමූහයතෙම; එකෙන කප්පෙන, එක් අසංඛ්‍ය කල්පයකින්; පබ්බතසමො, (වෙපුල්ල) පර්වතය සමානවූ; රාසි, රැසෙක්; සියාඉති, වන්නේයයි; මහෙසිනා, මහාර්ෂිවූ බුදුන්විසින්; වුත්තං, වදාරනලදී;

සො ඛො පනායං අක්ඛාතො–වෙපුල්ලො පබ්බතො මහා
උත්තරො ගිජ්ඣකූටස්ස–මගධානං ගිරිබ්බජෙ
යතො අරියසච්චානි–සම්මප්පඤ්ඤාය පස්සති
දුක්ඛං දුක්ඛසමුප්පාදං–දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං–දුක්ඛූපසමගාමිනං
සසත්තක්ඛත්තුං පරමං–සන්ධාවිත්වාන පුග්ගලො
දුක්ඛස්සන්තකරො හොති–සබ්බසංයොජනක්ඛයාති

## අට්ඨිපුඤ්ජසුත්තං.

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො තිංසමත්තා පාවෙය්‍යකා භික්ඛූ සබ්බෙ ආරඤ්ඤිකා සබ්බෙ පිණ්ඩපාතිකා සබ්බෙ පංසුකූලිකා

---

අක්ඛාතො, කියනලද්දවූ; සො ඛො පන අයං. ඒ මේපර්වතය නම්; මගධානං, මගධරටවාසීන්ගේ; ගිරිබ්බජෙ, ගිරිබ්බජපුර නම්වූ රජගහනුවර සමීපයෙහි; ගිජ්ඣකූටස්ස, ගිජුකුළුපව්වට; උත්තරො, උතුරුදිසාභාගයෙහිවූ; මහා, මහත්වූ; වෙපුල්ලො පබ්බතො, වෛපුල්ල පර්වතයයි;

යතො, යම්හෙයකින්; දුක්ඛං, දුඃඛාර්‍ය්‍යසත්‍යයද; දුක්ඛසමුප්පාදං, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයද; දුක්ඛස්ස අතික්කමඤ්ච, දුඃඛයාගේ ඉක්මවීම; (දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය)ද; දුක්ඛූපසමගාමිනං, දුක්සංසිඳවීමට පමුණුවන්නාවූ; අරියං අට්ඨඞ්ගිකං මග්ගං ච, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගසත්‍යයද; (යන) අරියසච්චානි, චතුරාර්‍ය්‍ය සත්‍යයන්; සම්මප්පඤ්ඤාය. සම්‍යක්ප්‍රඥාවෙන් පස්සති, (යමෙක්) දකීද; සො පුග්ගලො, ඒ (සෝවාන්) පුද්ගලතෙම; සත්තක්ඛත්තුං පරමං, සත්වරක් පරමකොට; සන්ධාවිත්වාන, දිව; සබ්බසංයොජනක්ඛයා, සියලු (කාමරාගාදි) සංයොජනයන් ක්‍ෂයකිරීමෙන්; දුක්ඛස්ස, දුඃඛයාගේ; අන්තකරොහොති ඉති, කෙළවර කරන්නෙක්වේයයි වදාළසේක;

## අට්ඨිපුඤ්ජ සූත්‍රපදාර්ථව්‍යාඛ්‍යානයයි.

---

මෙ, මාවිසින්; (මේ ධර්මදේශනාව) එවං සුතං, මෙසේ අසනලදී; (නොහොත්) මෙ, මාගේ; සුතං, ශානිය; (හෙවත්) ඇසීම; එවං, මෙසේය; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහනුවරසමීපයෙහි; කලන්දකනිවාපෙ, (ලෙහෙනුන්ට තබාදෙනලද වැටුප් ඇතිහෙයින්)කලන්දකනිවාප නම්වූ; වෙළුවනෙ, වේළුවනාරාමයෙහි; විහරති, වාසයකරනසේක; අථ ඛො, එකල්හිවනාහී; සබ්බෙ, හැමදෙන; ආරඤ්ඤිකා, ආරණ්‍යකාවූ; සබ්බෙ, සියල්ලෝ; පිණ්ඩපාතිකා, පිණ්ඩපාතිකාවූ; සබ්බෙ, සියල්ලෝ පංසුකූලිකා, පාංසුකූලික අංගඇත්තාවූ;

සබ්බෙ පොචිවරිකා සබ්බෙ සසංයොජනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අථඛො භගවතො එතදහොසි: ඉමෙඛො තිංසමත්තා පාවෙය්‍යකා භික්ඛූ සබ්බෙ ආරඤ්ඤිකා සබ්බෙ පිණ්ඩපාතිකා සබ්බෙ පංසුකූලිකා සබ්බෙ තෙචීවරිකා සබ්බෙ සසංයොජනා යන්නූනාහං ඉමෙසං තථා ධම්මං දෙසෙය්‍යං යථා ඉමෙසං ඉමස්මිං යෙව ආසනෙ අනුපාදාය ආසවෙහි චිත්තානි මුච්චෙය්‍යුන්ති,

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

---

සබ්බෙ, හැමදෙනම; පොචීවරිකා, තෙචීවරිකාඞ්ගඇත්තාවූ; සබ්බෙ, හැමදෙනම, සසංයොජනා, සංයෝජන සහිතවූ; තිංසමත්තා, තිස්නමක්පමණවූ; පාවෙය්‍යකා භික්ඛූ, පාවානුවරවැසි භික්ෂූහු; භගවා, භාග්‍යවතුන්වහන්සේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසංකමිංසු, එළඹුණාහුය; උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනා කොටවැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, උන්නාහුය; අථඛො, එකල්හි වනාහි; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; එතං, මෙබඳු සිතෙක්; අහොසි, පහළවූයේය; (කෙබඳු වූදයත්?) ඉමෙ ඛො තිංසමත්තා පාවෙය්‍යකා භික්ඛූ; මේ පාවානුවරවැසි තිස්නමක් පමණ භික්ෂූහු; සබ්බෙ ආරඤ්ඤිකා, හැමදෙනම ආරණ්‍යකාඞ්ගය ඇත්තෝය; සබ්බෙ පිණ්ඩපාතිකා, හැමදෙනම පිණ්ඩපාතිකාඞ්ගය ඇත්තෝය; සබ්බෙ පංසුකූලිකා, හැම්දෙනම පාංශුකූලඞ්ගය ඇත්තෝය; සබ්බෙ තෙචීවරිකා, හැමදෙනම තෙචීවරිකාඞ්ගය ඇත්තෝය; සබ්බෙ සසංයොජනා, හැමදෙනම සංයොජන (කෙලෙස්) සහිතයෝය; යථා, යම්සේ; ඉමස්මිං ආසනෙ එව, මේ ආසනයෙහිදීම; ආසවෙහි, ආශ්‍රවයන්කෙරෙන්; ඉමෙසං, මොවුන්ගේ; චිත්තානි, චිත්තයෝ; අනුපාදාය, තෘෂ්ණාදෘෂ්ටිවසයෙන් කිසිවක් නොගෙන; මුච්චෙය්‍යුං, මිදෙන්නාහුද; තථා, එසේ; අහං, මම; ඉමෙසං, මොවුන්ට; ධම්මං, ධර්මයක්; දෙසෙය්‍යං, දෙශනාකරන්නෙම් නම්; යන්නූන ඉති, ඉතායෙහෙකැ; (කියායි)

අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, අඞ්ගාවදාළසේක; තෙ භික්ඛූ, ඒභික්ෂූහු; භදන්ත ඉති, පින්වතුන්වහන්සැය; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් ඇස්වූහ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මේ ධර්මදෙශනාව; අවොච, වදාළසේක;

අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං යං චතූසු මහාසමුද්දෙසු උදකන්ති යථා ඛො මයං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාම එතදෙව භන්තෙ බහුතරං යං නො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකන්ති

---

භික්ඛවෙ, මහණෙනි; අවිජ්ජානීවරණානං, අවිද්‍යාවෙන්මුවාවූ; තණ්හාසංයොජනානං, තෘෂ්ණාවෙන් බැඳුණාවූ; සන්ධාවතං, (භවයෙන් භවයට) නැවතනැවතදිවන්නාවූ; සංසරතං, (භවයෙන් භවයෙහි) නැවතනැවත හැසිරෙන්නාවූ; සත්තානං, සත්වයන්ගේ; සංසාරො, සංසාරය; (හෙවත් ස්කන්ධධාතු ආයතනයන්ගේ පිළිවෙළ) නොසිඳපැවතීම; අනමතග්ගො, (නුවණින්අනුවගොස්) දැනගතනොහැකි අගඇත්තේය; පුබ්බාකොටි, පූර්වකෙළවර; න පඤ්ඤායති, නොපැනෙයි; භික්ඛවෙ, මහණෙනි; තං කිං මඤ්ඤථ, ඒ කුමක්සිතව්ද; ඉමිනා දීඝෙන අද්ධුනා, මේ දීර්ඝකාලයක් මුළුල්ලෙහි; සන්ධාවතං, (භවයෙන් භවයට) නැවත නැවත දුවන්නාවූ; සංසරතං, (භවයෙන් භවයෙහි) නැවත නැවත හැසිරෙන්නාවූ; සීසච්ඡින්නානං, හිස්සිඳුම්ලැබුවාවූ; වො, තොපගේ; යං ලොහිතං. යම් ලෙහෙයෙක්; පස්සන්නං, වැහුණේද; පග්ඝරිතං, වැගුරුණේද; චතූසු මහාසමුද්දෙසු, සතරමහාසාගරයෙහි; යං උදකං වා, යම් ජලයෙක් හෝ ඇද්ද; (මෙයින්) කතමං නුඛො, කවරක්නම්; බහුතරං ඉති, අතිසයින් බොහෝ වන්නේදැයි; (විචාළසේක.)

භන්තෙ, ස්වාමීන්වහන්ස; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; දෙසිතං, දේශනාකරනලද්දාවූ; ධම්මං, ධර්මය; මයං, අපි; යථා ඛො, යම්සේ වනාහී; ආජානාම, දනිමුද.(එහෙයින්) භන්තෙ, ස්වාමීන්වහන්ස; ඉමිනා දීඝෙන අද්ධුනා, මේ දීර්ඝකාලයක් මුළුල්ලෙහි; සන්ධාවතං, (භවයෙන් භවයට) නැවත නැවත දිවන්නාවූ; සංසරතං, සැරිසරන්නාවූ; සීසච්ඡින්නානං, හිස්සිඳුම් ලැබුවාවූ; නො, අපගේ; පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; යං ලොහිතං, යම් ලෙහෙයෙක්ඇද්ද; එතං එව, මේ ලෙහෙයම, බහුතරං, අතිශයින් බොහෝවන්නේය; චතූසු මහාසමුද්දෙසු, සතර මහාසාගරයෙහි; උදකං, ජලය; නතුඑව ඉති, බොහෝනොවන්නේමයයි; (කිවුහුය)

සාධු සාධු ඛො තුම්හෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ එතදෙව භික්ඛවෙ බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං, දීඝරත්තං වො භික්ඛවෙ ගුන්නං සතං ගොණභූතානං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං, දීඝරත්තං වො භික්ඛවෙ මහිසානං සතං මහිසභූතානං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං දීඝරත්තං වො භික්ඛවෙ උරබ්භානං සතං උරබ්භභූතානං, අජානං සතං අජභූතානං, මිගානං සතං මිග

---

භික්ඛවෙ, මහණෙනි; සාධු සාධු, යහපත යහපත; දෙසිතං, (මා විසින්) දෙශනාකරනලද; ධම්මං, ධර්මය; තුම්හෙඛො, තෙපිටනාහි; ආජානාථ, දන්නහුය; භික්ඛවෙ, මහණෙනි; ඉමිනා දීඝෙන අද්ධුනා, මේ දිඝීකාලයක්මුළුල්ලෙහි; සන්ධාවතං, සසර දිවත්නාවූ; සංසරතං, සැරිසරන්නාවූ; සීසච්ඡින්නානං, හිස්සිඳුම් ලැබූවාවූ; වො, තොපගේ; පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; යං ලොහිතං, යම් ලෙහෙයෙක්ඇද්ද; එතංඑව, මේ ලෙහෙයම; බහුතරං, අතිශයින් බොහෝවන්නේය; චතූසු මහාසමුද්දෙසු,සතරම්හාසාගරයෙහි; උදකං, ජලය; නතුඑව,බොහෝ නොවන්නේමය–

භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; ගුන්නං සතං, ගවයන්වූ; ගොණභූතානං, ගවයන්ව උපන්නාවූ; සීසච්ඡින්නානං, හිස්සිඳුම් ලැබූවාවූ; වො, තොපගේ; පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; ලොහිතං, ලෙහෙය; (බොහෝවන්නේය) චතූසු මහාසමුද්දෙසු, සතරමහාසාගරයෙහි; උදකං,ජලය; නතුඑව,එසේ බොහෝනොවන්නේමය; භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; මහිසානං සතං, මහිසජාති ඇත්තාවූ; මහිසභූතානං, මීවුව උපන්නාවූ; සීසච්ඡින්නානං, හිස්සිඳුම් ලැබූවාවූ; වො, තොපගේ; පස්සන්නං, ශ්‍යන්දනයවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; ලොහිතං, ලෙහෙය; (අතිසයින් බොහෝය) චතූසු මහාසමුද්දෙසු, සතර මහාසාගරයෙහි; උදකං, ජලය; නතුඑව, එසේ බොහෝනොවන්නේමය; භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; උරබ්භානං සතං, තිරළුවන්වූ; උරබ්භභූතානං, තිරළුවඋපන්නාවූ; වො, තොපගේ; (හිස්සිඳීමෙන් වගුළාවූ ලේද) අජානං සතං, එළුජාතිඇත්තාවූ; අජභූතානං, එළුවඋපන්නාවූ; (තොපගේද) මිගානං සතං, මුවජාතිඇත්තාවූ; මිගභූතානං, මුවවඋපන්නාවූ;

භූතානං සූකරානං සතං සූකරභූතානං කුක්කුටානං සතං කුක්කුටභූතානං දීඝරත්තං වො භික්ඛවෙ චොරා ගාමඝාතිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං දීඝරත්තං වො භික්ඛවෙ චොරා පාරිපන්ථිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං දීඝරත්තං වො භික්ඛවෙ පාරදාරිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතූසු මහාසමුද්දෙසු උදකං තං කිස්ස හෙතු.

අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං

---

(තොපගේද) සූකරානං සතං, ඌරුජාති ඇත්තාවූ; සූකරභූතානං, හූරුව උපන්නාවූ; (තොපගේද) කුක්කුටානං සතං, කුකුළුජාතිඇත්තාවූ; කුක්කුටභූතානං, කුකුළුවඋපන්නාවූ; (තොපගේද හිස්සිඳීමෙන් වැගුළාවූ ලේ බොහෝවන්නේය සතරමහාසාගරජලය එසේ බොහෝනොවන්නේය;) භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; ගාමඝාතිකා, ගම්පහරන්නාවූ; චොරා ඉති, සොරුයයි; ගහෙත්වා, අල්වාගෙන; සීසච්ඡින්නානං, හිස්සිඳුම්ලැබූවාවූ; වො, තොපගේ; (බොටුවෙන්) පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; ලොහිතං, ලෙහෙයද; (සතරමහාසාගරජලයට ඉතා බොහෝවන්නේය) භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං,බොහෝකාලයක්මුළුල්ලෙහි; පාරිපන්ථිකා, මංපහරන්නාවූ; චොරාඉති, සොරුයයි; ගහෙත්වා, අල්වාගෙන; සීසච්ඡින්නානං, හිස්සිඳුම්ලැබූවාවූ; වො,තොපගේ;(බොටුවෙන්) පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; ලොහිතං, ලෙහෙය; (ඉතා බොහෝවන්නේය) චතූසු මහාසමුද්දෙසු, සතරමහාසාගරයෙහි; උදකං, ජලය; නත්වෙව, එසේ බොහෝනොවන්නේමය; භික්ඛවෙ, මහණෙනි; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; පාරදාරිකාති, පරදාරසේවනය කරන්නාහුයයි; ගහෙත්වා, අල්වාගෙන; සීසච්ඡින්නානං, හිස්සිඳුම්ලැබූවාවූ; වො, තොපගේ; (බොටුවෙන්) පස්සන්නං, වැහුණාවූ; පග්ඝරිතං, වැගුරුණාවූ; ලොහිතං, ලෙහෙය; (ඉතා බොහෝවන්නේය) චතූසු මහාසමුද්දෙසු, සතර මහාසාගරයෙහි; උදකං, ජලය; නත්වෙව, එසේ බොහෝ නොවන්නේමය; තං කිස්ස හෙතු, ඊට හේතුකවරේද; භික්ඛවෙ, මහණෙනි; අවිජ්ජානිවරණානං, අවිද්‍යාවෙන් මුවහවූ; තණ්හාසංයොජනානං, තෘෂ්ණාවෙන් බැඳුණාවූ; සන්ධාවතං, භවයෙන්

සන්ධාවතං සංසරතං එවං දීඝරත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං තිප්පං පච්චනුභූතං බ්‍යසනං පච්චනුභූතං කටසී වඩ්ඩිතා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුන්ති ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තිංසමත්තානං පාවෙය්‍යකානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

**පාවෙය්‍යසුත්තං.**

---

“ඉමාති මෙ නිදානවග්ගෙ”

---

භවයට නැවත නැවත දුවන්නාවූ; සංසරතං, භවයෙන් භවයෙහි නැවත නැවත හැසිරෙන්නාවූ; සත්තානං, සත්ත්වයන්ගේ; අයං සංසාරො, මේ සංසාරයතෙම්; අනමතග්ගො, දැනගතනොහැකි අගඇත්තේය; පුබ්බාකොටි, පූර්වකෙළවර; න පඤ්ඤායති, නොපැනෙයි; භික්ඛවෙ, මහණෙනි; වො, තොපවිසින්; දීඝරත්තං, බොහෝකාලයක් මුළුල්ලෙහි; එවං, මෙසේ; දුක්ඛං, දුක; පච්චනුභූතං, අනුභවකරනලද්දේය; තිප්පං, තීව්‍රවූදුක; පච්චනුභූතං, අනුභවකරනලද්දේය; බ්‍යසනං, ඥාතිරොගභොගාදිව්‍යසනයෙක්; පච්චනුභූතං, අනුභවකරනලද්දේය; කටසී වඩ්ඩිතා, කලේබරනික්ෂෙපයෙන් පෘථිවිපස වැඩිකරනලද්දේය; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්ච ඉදං, මේදුක ඇතිතාක්; සබ්බසංඛාරෙසු, (සසරදුකට කාරණවූ, තෘෂ්ණාවට ගොචරවූ) ආධ්‍යාත්මිකබාහිර ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධවූ සියළු සංස්කාරධර්මයන් කෙරෙහි; නිබ්බින්දිතුං,කලකිරෙන්ට; අලංඑව යුතුමය; විරජ්ජිතුං,නොඇලෙන්ට; අලංඑව. යුතුමය; විමුච්චිතුං, මිදෙන්ට; අලංඉති, යුතුවන්නේයි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉදං, මේදෙශනාව; අවොච, වදාළසේක; අත්තමනා, ඊට සතුටුසිත්ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; භාසිතං, දෙශනාව; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්තාහුය; ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං,මේනිර්ගාථකසූත්‍රය,භඤ්ඤමානෙ,දේශනාකරනු ලබනකල්හි; තිංසමත්තානං,තිස්නමක්පමණවූ; පාවෙය්‍යකානං, පාවානුවරවාසීවූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; චිත්තානි, චිත්තයෝ; ආසවෙහි, ආශ්‍රවයන්ගෙන්; අනුපාදාය, අල්වානොගෙන විමුච්චිංසු, විශෙෂයෙන් මිදුණාහුය;

**පාවෙය්‍යසූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානය නිමි.**

---

යථාපිමූලෙති ඉමං ධම්මදෙසනං සත්ථා වෙළුවනෙ විහරන්තො එකං ගුථසූකරපොතිකං ආරබ්භ කථෙසි– එකස්මිං කිර දිවසෙ සත්ථා රාජගහං පවිසන්තො එකං සූකරපොතිකං දිස්වා සිතං පාත්වාකාසි තස්ස සිතං කරොන්තස්ස මුඛවිවරනිග්ගතං දන්තොභාසමණ්ඩලං දිස්වා ආනන්දත්ථෙරො කො නු ඛො භන්තෙ හෙතු සිතපාතුකම්මායාති සිතකාරණං පුච්ඡි අථ නං සත්ථා පස්සසෙතං ආනන්ද සූකරපොතිකන්ති. ආම භන්තෙති එසා කකුසන්ධස්ස භගවතො සාසනෙ එකාය ආසනසාලාය සාමන්තා කුක්කුටී අහොසි සා එකස්ස යොගාවචරස්ස විපස්සනාකම්මට්ඨානං සජ්ඣායන්තස්ස ධම්මඝොසං සුත්වා තතො චුතා රාජකුලෙ

---

යථාපි මූලෙ ඉති; යථාපිමූලෙ යනාදිවූ; ඉමං ධම්මදෙසනං, මේ ධර්මදෙශනාව; සත්ථා, ශාස්තෘන්වහන්සේ; වෙළුවනෙ, වෙළුවනාරාමයෙහි; විහරන්තො, වැඩවාසයකරන්නේක්; එකං ගුථසූකරපොතිකං, එක් අසුචි අනුභවකරන හූරුපැටව්වකු; ආරබ්භ, අරභයා; කථෙසි,වදාළසේක; එකස්මිං කිර දිවසෙ, එක්දවසෙක්හි; සත්ථා, ශාස්තෘන්වහන්සේ; රාජගහං, රජගහනුවරට; පවිසන්තො, ප්‍රවිෂ්ටවනසේක්; එකං සූකරපොතිකං, එක්හූරුපැටවකු; දිස්වා, දැක; සිතං, සිනාගවක්; පාතු අකාසි, පහළකළසේක; සිතං කරොන්තස්ස, සිනාපහළකරන්නාවූ: තස්ස, උන්වහන්සේගේ; මුඛවිවරනිග්ගතං, මුවසිදුරෙන් නික්මුණාවූ; දන්තොභාසමණ්ඩලං, දත්කැලුම්මඬුල්ල; දිස්වා, දැක; ආනන්දත්ථෙරො, අනඳතෙරතෙම; භන්තෙ, ස්වාමීන්වහන්ස; සිතපාතුකම්මාය, සිනාපහළකිරීමට; කො නු ඛො හෙතු ඉති, හෙතුකවරේදැයි; සිතකාරණං, සිනාපහළකළකරුණ; පුච්ඡි, විචාළේය; අථ, ඉක්බිත්තෙන්; සත්ථා, ශාස්තෘන්වහන්සේ; තං, ඒ ආනන්දස්ථවිරයන්වහන්සේඅතින්; ආනන්ද, අනඳය; එතං සූකරපොතිකං, මේ හූරුපැටවා; පස්සසි ඉති, දක්නෙහිදැයි; (විචාළෙය) භන්තෙ, ස්වාමීන්වහන්ස; ආමඉති, එසේයයි; (පිළිවදන්ඇස්වීය) එසා, මේ සූකරපොතිකාතොම; කකුසන්ධස්ස භගවතො, කකුසඳ භගවත්හුගේ; සාසනෙ, සස්නෙහි; එකාය ආසනසාලාය, එක්ආසනසාලාවෙක්හි; සාමන්තා, හාත්පස; (හැසිරෙන) කුක්කුටීඅහොසි; කිකිළියක්වූවාය; සා, ඒ කිකිළිතොම; විපස්සනාකම්මට්ඨානං, විදසුන්කමටහනක්; සජ්ඣායන්තස්ස, හදාරන්නාවූ; එකස්ස යොගාවචරස්ස, එක්යොගාවචරයක්හුගේ; ධම්මඝොසං, දහම්ඝොෂක්; සුත්වා, අසා; තතො චුතා, එයින් චුතවූවා; රාජකුලෙ

නිබ්බත්තිත්වා උපරිනාම රාජධීතා අහොසි සා අපරභාගෙ සරීර වලඤ්ජනට්ඨානෙ පුළවකරාසිං දිස්වා තත්ථ පුළවකසඤ්ඤං උප්පාදෙත්වා පඨමං ඣානං පටිලභි සා තත්ථ යාවතායුකං ඨත්වා තතො චුතා බ්‍රහ්මලොකෙ නිබ්බත්ති. තතො චවිත්වා පන ගතිවසෙන ආලොලමානා ඉදානි සූකරයොනියං නිබ්බත්තා ඉදං කාරණං දිස්වා මයා සිතං පාතු කතන්ති.

තං සුත්වා ආනන්දත්ථෙරපමුඛා භික්ඛූ මහන්තං සංවෙගං පටිලභිංසු සත්ථා තෙසං සංවෙගං උප්පාදෙත්වා භවතණ්හාය ආදීනවං පකාසෙන්තො අන්තරවීථියං ඨිතකොව ඉමා ගාථායො අභාසි.

යථාපිමූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපිරුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

---

නිබ්බත්තිත්වා, රජකුලෙහි ඉපිද; උබ්බරිනාම රාජධීතා අහොසි, උබ්බරිනම් රජදුවක්වූවාය; ඒ (රජදූ) තොම; අපරභාගෙ, මෑත කාලයෙහි; ශරීරවලඤ්ජනට්ඨානෙ, ශරීරවලඤ්ජනස්ථානයෙහි; පුළවකරාසිං, පණුරැසක්; දිස්වා, දැක; තත්ථ, එහි; පුළවකසඤ්ඤං, පුළවකසංඥාව; උප්පාදෙත්වා, උපදවා; පඨමං ඣානං, ප්‍රථමධ්‍යානය; පටිලභි, ලැබුවාය; සා, ඕතොම; තත්ථ, එහි; යාවතායුකං, ආයුඇතිතාක්; ඨත්වා, සිට; තතො චුතා, එයින්චුතවූවා; බ්‍රහ්මලොකෙ, බඹලොව; නිබ්බත්ති, උපන්නාය; තතො චවිත්වා පන, ඒ බඹලොවින් චුතව වනාහී; ගතිවසෙන, උත්පත්තිවසයෙන්; ආලොලමානා, පෙරලෙනුළබන්නී; ඉදානි, දැන්; සූකරයොනියං, සූකරයොනියෙහි; නිබ්බත්තා, උපන්නාය; මයා, මාවිසින්; ඉදං කාරණං දිස්වා, මේ කාරණයදැක; සිතංපාතුකතං ඉති, සිනහ පහළකරනලද්දේයයි; (වදාළසේක) තං, ඒදේශනාව; සුත්වා, අසා; ආනන්දත්ථෙරපමුඛාභික්ඛූ, ආනන්දස්ථවිර ප්‍රමුඛ භික්ෂූහු; මහන්තං සංවෙගං, මහත්වූ සංවෙගයක්; පටිලභිංසු, ලැබුවාහුය; සත්ථා, ශාස්තෲන්වහන්සේ; තෙසං, ඒ භික්ෂූන්ට; සංවෙගං උප්පාදෙත්වා, සංවෙගය උපදවා; භවතණ්හාය, භවතෘෂ්ණාවගේ; ආදීනවං, දෝෂය; පකාසෙන්තො ප්‍රකාශකරනසේක්; අන්තරවීථියං, ඇතුල්වීථියෙහි; ඨිතකොව, වැඩසිටිසේක්ම; ඉමා ගාථායො, මේ ගාථාවන්; අභාසි, වදාළසේක;

යථාපි, යම්සේ; මූලෙ, වෘක්ෂයාගේ පස්මහමුල්; අනුපද්දවෙ, උපද්‍රවයකට නොපැමිණිකල්හි; දළ්හෙ, දැඩිකල්හි; ඡින්නොපි, සින්දැවූද; රුක්ඛො, වෘක්ෂයතොම; පුනඑව, නැවතද; රූහති, ගටගනීද; එවම්පි, එසේම; තණ්හානුසයෙ, කාමරාග භවරාගානුසය; අනූහතෙ, අගින් මාගීඥානයෙන් නොසිඳිකල්හි; ඉදං, දුක්ඛං, මේ දුක; පුනප්පුනං, නැවත නැවත; නිබ්බත්තති, උපදින්නේය;

යස්ස ඡත්තිංසතිසොතා–මනාපස්සවනා භුසා
වාහා වහන්ති දුද්දිට්ඨිං–සඞ්කප්පා රාග නිස්සිතා

සවන්ති සබ්බධී සොතා–ලතා උබ්භිජ්ජ තිට්ඨති .
තඤ්ච දිස්වා ලතං ජාතං–මූලං පඤ්ඤාය ඡින්දථ.

සරිතානි සිනෙහිතානිච–සොමනස්සානි භවන්ති ජන්තුනො
තෙ සාතසිතා සුඛෙසිනො–තෙ වෙ ජාතිජරූපගා නරා

---

යස්ස, යම්පුද්ගලයක්හට; මනාපස්සවනා, මනාපවූ රූපාදි අරමුණෙහි ශ්‍රවත්ව පවත්නාවූ; ඡත්තිංසතිසොතා, චක්ෂුරාදී ආධ්‍යාත්මිකායතනයන් විෂයකොට පවත්නාවූ තෘෂ්ණාවිචරිත අටළොසය රූපාදි බාහිරායතනයන් විෂයකොට පවත්නාවූ තෘෂ්ණාවිචරිත අටළොසය යනමේ තෘෂ්ණාවිචරිතයන්වසයෙන්) සතිස්වැදෑරුම් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ශ්‍රොතස්හු; භුසා, බලවත්ව උපදීද; දුද්දිට්ඨිං, නපුරුදෘෂ්ටිඇති ඒ පුද්ගලයා; රාගනිස්සිතා, (ධ්‍යානවිදර්ශනා ඇසිරුනොකොට) රාගය ඇසුරුකළාවූ; සංක ප්පා, විතර්කයෝ; වාහා, (නැවත නැවත උපදනාබැවින්) බලවත් වූවාහු; වහන්ති, අපායට පමුණුවත්;

සොතා, ශ්‍රොතස්හු; හෙවත් තෘෂ්ණා නැමැති ගඞ්ගාප්‍රවාහයෝ; සබ්බධී, චක්ෂුරාදීන්ගේ වසයෙන් රූපාදි ස අරමුණෙන්ද කාමභවාදි සියළුභවයෙන්ද ශ්‍රවත්වන (වැහෙන) හෙයින් හැම තැන්හිම පවත්නාහු නම්වෙති; ලතා, භවයෙන්භවය වෙළඳනා අර්ථයෙන්ද හිවන (බඳින) අර්ථයෙන්ද ලතානම්වූ ඒ තෘෂ්ණා තොමෝ; උබ්භිජ්ජ, සදෙරින් ඉපිද; තිට්ඨති, සිටිනිය; ජාතං, එසේ උපන්නාවූ; තඤ්චලතං, ඒ තෘෂ්ණාලතාව; දිස්වා, උත්ප ත්තිස්ථාන වසයෙන් දැක; පඤ්ඤාය, මාර්ගප්‍රඥාවෙන්; මූලං, මුල, ඡින්දථ, සිඳිව්;

සරිතානි, රූපාදි අරමුණෙහි විසිර පතළාවූද; සිනෙහි තානිච, උපභොග පරිභොග වස්තුයෙහි පැවැත්නාවූ තෘෂ්ණා සෙනහයෙන් සෙනහිතවූද හෙවත් ගල්වනලද්දාවූ; සොමනස්සා නි, සොම්නස්හු; ජන්තුනො, තෘෂ්ණාවසිකා සත්වයාහට, භවන්ති: වත්නාහ; තෙ, ඒ තෘෂ්ණාවසිකාසත්වයෝ; සාතසිතා, සුඛසොම්නස් ඇසුරුකළාහු; සුඛෙසිනො, සුවසොයන සුළුවෙති; තෙනරා, ඒ සත්වයෝ; වෙ, ඒකාන්තයෙන්; ජාතිජරූපගා, ජාතිජරාව්‍යාධි මරණයට පැමිනෙන්නාහුනම්වෙති;

තසිනාය පුරක්ඛතා පජා–පරිසප්පන්ති සසොව බාධිතො
සංයොජන සඞ්ගසත්තා–දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.

තසිනාය පුරක්ඛතා පජා–පරිසප්පන්ති සසොව බාධිතො
තස්මා තසිනං විනොදයෙ–භික්ඛු ආකඞ්ඛීවිරාග මත්තනොති.

දෙසනාවසානෙ බහු සොතාපත්තිඵලාදීනි පාපුණිංසු, සාපි ඛො සූකරපොතිකා තතො චවිත්වා සුවණ්ණභූමියං රාජකුලෙ නිබ්බත්ති තතො චුතා වනවාසියං තතො චුතා සුප්පාරපට්ටනෙ අස්සවාණිජ ගෙහෙ නිබ්බත්ති

---

තසිනාය, ත්‍රාසය (උද්වේගය කරන අර්ථයෙන් තසිනායයි, කියනලද තෘෂ්ණාවවිසින්; පුරක්ඛතා, පිරිවරනලද්දාවූ; පජා, සත්වයෝ; (සාවැද්දකුවිසින්) බාධිතො, බඳනාලද; සසොඉව, සාවකුමෙන්; පරිසප්පන්ති, සැපෙන්නාහ; (භයපත්වන්නාහ) සංයොජන සඞ්ගසත්තා, දසවිධසංයොජනයෙන්ද රාගසංගාදි සප්තවිධසංගයෙන්ද බැඳුණාහු; චිරාය, බොහෝකාලයක්; පුනප්පුනං, නැවත නැවත; දුක්ඛං, දුකට; උපෙන්ති, පැමිණෙත්;

තසිනාය, තෘෂ්ණාවවිසින්; පුරක්ඛතා, පිරිවරනලද්දාවූ; පජා, සත්වයෝ; බාධිතො, (සාවැද්දකුවිසින්) බඳිනාලද්දාවූ; සසොඉව, සාවකුමෙන්; පරිසප්පන්ති, සැපෙත්; තස්මා, එහෙයින්; අත්තනො, තමාහට; විරාගං, රාගවිනාශ හෙවත් නිර්වාණය; ආකඞ්ඛී, කැමතිවන්නාවූ; භික්ඛු, මහණතෙම; තසිනං, ෂට්ද්වාරික තෘෂ්ණාව; විනොදයෙ ඉති, අග්‍රමාර්ගඥානයෙන් ප්‍රහීණකරන්නේයයි; (වදාළසේක)

දෙසනාවසානෙ, මේදේශනාවගේ අවසානයෙහි; බහු, බොහෝදෙන; සොතාපත්තිඵලාදීනි, සෝවාන්ඵලාදියට; පාපුණිංසු, පැමිණියාහුය; සාපි ඛො සූකරපොතිකා, ඒ සූකරපොතිකාතොමෝද; තතො චවිත්වා, එයින් චුතව; සුවණ්ණභූමියං, සුවර්ණභූමි නම් රටෙහි; රාජකුලෙ, රාජකුලයෙහි; නිබ්බත්ති, උපන්නාය; තතො චුතා, එයින් චුතවූවා; වනවාසියං, වනවාසීනම් ග්‍රාමයෙහිද; තතො චුතා, එයින් චුතවූවා; සුප්පාරපට්ටනෙ සුප්පාරපටුනෙහි; අස්සවාණිජගෙහෙ, අස්වෙළඳගෘහයෙක්හි; නිබ්බත්ති, උපන්නාය;

තතො චුතා කාවීරපට්ටනෙ නාවිකස්ස ගෙහෙ නිබ්බත්ති තතො චුතා අනුරාධපුරෙ ඉස්සරගෙහෙ නිබ්බත්ති තතො චුතා තස්සෙව දක්ඛිණදිසාය සොක්කන්තගාමෙ සුමනස්ස නාම කුටුම්බිකස්ස ධීතා නාමෙන සුමනා එව හුත්වා නිබ්බත්ති අථස්ස පිතා තස්මිං ගාමෙ ඡඩ්ඩිතෙ දීඝවාපිරට්ඨං ගන්ත්වා මහාමුනිගාමෙ නාම වසි. තං ඨානං දුට්ඨගාමිණීරඤ්ඤො අමච්චො ලකුණ්ටක අතිම්බරො නාම කෙනචිදෙව කරණීයෙන ගතො දිස්වා මහන්තං මඞ්ගලං කත්වා ආදාය මහාපුණ්ණගාමං ගතො. අටතිකොටිපබ්බතමහාවිහාරවාසී අනුලත්ථෙරො නාම තත්ථ පිණ්ඩාය චරන්තො තස්සා ගෙහද්වාරෙ ඨිතො දිස්වා භික්ඛූහි සද්ධිං කථෙසි. ආවුසො සූකරපොතිකා නාම ලකුණ්ටක අතිම්බරස්ස මහාමච්චස්ස භරියාභාවං පත්තා අහො අච්ඡරියන්ති.

---

තතොචුතා, එයින් චුතවූවා; කාවීරපට්ටනෙ, කාවීර පටුනෙහි; නාවිකස්සගෙහෙ, නාවිකයකුගේ ගෘහයෙහි; නිබ්බත්ති, උපන්නාය; තතො චුතා, එයින්චුතවූවා; අනුරාධපුරේ,අනුරාධපුරයෙහි; ඉස්සරගෙහෙ, ඓශ්වර්‍ය්‍යඇත්තකුගේ ගෘහයෙහි; නිබ්බත්ති, උපන්නාය; තතොචුතා, එයින්චුතවූවා; තස්ස එව, ඒ අනුරාධපුරයාගේම; දක්ඛිණදිසාය, දක්ෂිණදිශාවෙහිවූ; සොක්කන්තගාමෙ, සොක්කන්තනම්ගමෙහි; සුමනස්සනාම, සුමන නම්වූ; කුටුම්බිකස්ස, කෙළෙඹියාහට; ධීතා, දූවනියව; නාමෙන, නමින්; සුමනාඑවනාමහුත්වා, සුමනානම්වම; නිබ්බත්ති, උපන්නාය; අථ, ඉක්බිත්තෙන්; අස්සා, ඈගේ; පිතා, පියතෙම; තස්මිං ගාමෙ, ඒගම; ඡඩ්ඩිතෙ, හැරදමූකල්හි; දීඝවාපිරට්ඨං, දිග්වැව් රටට; ගන්ත්වා, ගොස්; මහාමුනිගාමෙනාම, මහමුනිනම්ගමෙහි; වසි, විසුයේය; තං ඨානං, ඒ ස්ථානයට; දුට්ඨගාමිණීරඤ්ඤො, දුටුගැමුනුරජහුගේ; ලකුණ්ටක අතිම්බරොනාම, ලකුණ්ටක අතිම්බර (ගොළුඹුම්බර) නම්වූ; අමච්චො, අමාත්‍යතෙම; කෙනචිදෙවකරණීයෙන, කිසියම්කටයුත්තක්නිසා; ගතො,ගියේ; දිස්වා, (ඈ) දැක; මහන්තං මඞ්ගලං කත්වා, මහත්වූ මංගල්‍යකොට; ආදාය,හැරගෙන; මහාපුණ්ණගාමං,මහාපුණ්ණනම්ගමට; ගතො, ගියේය; තත්ථ, එහි; අටතිකොටි පබ්බත මහාවිහාරවාසී, අටතිකොටිපර්වතමහාවිහාරවාසිවූ; අනුලත්ථෙරොනාම, අනුලනම් ස්ථවිරතෙම; පිණ්ඩාය, පිඬුපිණිස; චරන්තො, හැසිරෙන්නේ; තස්සා, ඒසුමනාවගේ; ගෙහද්වාරෙ, ගෘහද්වාරයෙහි; ඨිතො, වැඩ හිටියේ; දිස්වා, (ඈ)දැක; භික්ඛූහිසද්ධිං, භික්ෂූන්හාසමඟ; ආවුසො, ඇවැත්නි; සූකරපොතිකානාම, සූකරපොතිකාවනම්; ලකුණ්ටක අතිම්බරස්ස මහාමච්චස්ස, ලකුණ්ටකඅතිම්බරනම්වූ මහාමාත්‍යයාගේ; භරියාභාවං, භාර්‍ය්‍යාබවට, පත්තා, පැමිණියාය; අහො, විස්මය; අච්ඡරියං ඉති, ආශ්චර්‍ය්‍යයි; කථෙසි, කීසේක;

සා තං කථං සුත්වා අතීතභවෙ උග්ඝාටෙත්වා ජාතිස්සරඤාණං පටිලභි. තං ඛණෙයෙව ච උප්පන්නසංවෙගා සාමිකං යාචිත්වා මහන්තෙන ඉස්සරියෙන පඤ්චඵලකථෙරීනං සන්තිකෙ පබ්බජිත්වා තිස්සමහාවිහාරෙ මහාසතිපට්ඨානසුත්තකථං සුත්වා සොතාපත්තිඵලෙ පතිට්ඨහි. පච්ඡා දමිළමද්දනෙ කතෙ ඤාතීනං වසනට්ඨානං සොක්කන්තගාමමෙව ගන්ත්වා තත්ථ වසන්ති කල්ලකමහාවිහාරෙ ආසිවිසොපමසුත්තං සුත්වා අරහත්තං පාපුණි.

සා පන පරිනිබ්බානදිවසෙ භික්ඛුභික්ඛුණීහි පුච්ඡිතා භික්ඛුණීසඞ්ඝස්ස සබ්බං ඉමං පවත්තිං නිරන්තරං කථෙත්වා සන්නිපතිතස්ස භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ මණ්ඩලාරාමවාසිනා ධම්මපදභාණකමහාතිස්සත්ථෙරෙන සද්ධිං සංසන්දෙත්වා අහං පුබ්බෙ

---

සා, ඒ ස්ත්‍රී තොමෝ; තං කථං, ඒ කථාව; සුත්වා, අසා; අතීතභවෙ, ඉකුත්භවයන්, උග්ඝාටෙත්වා, උදුරා; ජාතිස්සරඤාණං, ජාතිස්මරණඥානය; පටිලභි, පිළිලැබුවාය; තං ඛණෙ එව ච, එකෙණෙහිම; උප්පන්නසංවෙගා උපන් සංවෙග ඇත්තී; සාමිකං, ස්වාමිපුරුෂයාට; යාචිත්වා, යාච්ඤාකොට; මහන්තෙන ඉස්සරියෙන, මහත්වූ ඓශ්වර්‍ය්‍යයෙන් (යුක්තව); පඤ්චඵලකථෙරීනං සන්තිකෙ, පඤ්චඵලකස්ථවිරින්ගේ සමීපයෙහි; පබ්බජිත්වා, පැවිදිව; තිස්සමහාවිහාරෙ, තිස්සමහාවිහාරයෙහි; මහාසතිපට්ඨානසුත්තකථං, මහාසතිපට්ඨාන සූත්‍රදෙශනාකථාව; සුත්වා, අසා; සොතාපත්තිඵලෙ, ශ්‍රොතාපත්තිඵලයෙහි; පතිට්ඨහි, පිහිටියාය; පච්ඡා, පසුව; දමිළමද්දනෙ කතෙ, දෙමළුන්මැඩීම කළකල්හි; ඤාතීනං, නෑයන්ගේ; වසනට්ඨානං, වාසස්ථානයවූ; සොක්කන්තගාමං එව, සොක්කන්ත නම්ගමටම; ගන්ත්වා, ගොස්; තත්ථ, එහි; වසන්ති, වාසයකරන්නී; කල්ලකමහාවිහාරෙ, කල්ලකමහාවිහාරයෙහි; ආසිවිසොපමසුත්තං, ආසිවිසොපමසූත්‍රය; සුත්වා, අසා; අරහත්තං, රහත්බවට; පාපුණි, පැමිණියාය;

සා පන, ඒ ස්ථවිරීන්වහන්සේ වනාහි; පරිනිබ්බානදිවසෙ, පරිනිර්වාණදවසෙහි; භික්ඛුභික්ඛුණීහි, භික්ෂුභික්ෂුණීන්විසින්; පුච්ඡිතා, විචාරනලද්දී; භික්ඛුණීසඞ්ඝස්ස, භික්ෂුණීසංඝයාහට; සබ්බං ඉමං පවත්තිං, මේ සියළු ප්‍රවෘත්තිය; නිරන්තරං, නිරතුරුව; කථෙත්වා, කියා; සන්නිපතිතස්ස, රැස්වූ; භික්ඛුසඞ්ඝස්ස භික්ෂුසංඝයාගේ; මජ්ඣෙ, මධ්‍යයෙහි; මණ්ඩලාරාමවාසිනා, මණ්ඩල නම් ආරාමවාසීවූ; ධම්මපදභාණකමහාතිස්සත්ථෙරෙන සද්ධිං, ධර්මපදභාණකමහාතිස්සස්ථවිරයන්වහන්සේහා සමඟ; සංසන්දෙත්වා, (ප්‍රශ්න විසර්ජනාවසයෙන්) සංසඳනයව; අහං, මම; පුබ්බෙ, පූර්වයෙහි;

මනුස්සයොනිං තතො චුතා කුක්කුටී හුත්වා තත්ථ සෙනස්ස සන්තිකා සීසච්ඡෙදනං පත්වා රාජගෙහෙ නිබ්බත්තා පරිබ්බාජිකාසු පබ්බජිත්වා පඨමජ්ඣානභූමියං නිබ්බත්තා. තතො සෙට්ඨිකුලෙ නිබ්බත්තා. නචිරස්සෙව චවිත්වා සූකරයොනිං ගන්ත්වා තතොචුතා සුවණ්ණභූමිං. තතො චුතා වනවාසිං. තතො චුතා සුප්පාරපට්ට නං තතොචුතා කාවීරපට්ටනං තතොචුතා අනුරාධපුරං. තතො චුතා සොක්කන්තගාමන්ති. එවං සම විසමෙ තෙරස අත්තභාවෙ පත්වා ඉදානි උක්කණ්ඨිතා සබ්බෙපි අප්පමාදෙන සම්පාදෙථාති වත්වා සා පරිසා සංවෙජෙත්වා පරිනිබ්බායි.

**සූකරපොතිකාවත්ථු.**

---

"ධම්මපදෙ"

"ඉමානි පඤ්චසුත්තානි සංසාරාදිසු දුක්ඛාදීනවකාථාය යො සල්ලක්ඛං උග්ගහෙතබ්බානි අත්තනො සන්තිකං ආගතානං ගහට්ඨපරිසානම්පි පටිසන්ථාරො ච කාතබ්බො

---

මනුස්සයොනි, මනුෂ්‍යයොනියෙහි උපන්මි; තතො චුතා, එයින් චුතව; කුක්කුටීහුත්වා, කිකිලියෙක්ව; තත්ථ, එහි; සෙනස්ස, උකුස්සකුගේ; සන්තිකා, සමීපයෙන්; සීසච්ඡෙදනං, හිසසිඳීමට; පත්වා, පැමිණ; රාජගෙහෙ, රාජගෘහ යන්හි; නිබ්බත්තා, උපන්නා; පරිබ්බාජිකාසු, පරිබ්‍රාජිකාවන් අතුරෙහි; පබ්බජිත්වා, පැවිදිව; පඨමජ්ඣානභූමියං, ප්‍රථමධ්‍යානභූමියෙහි; නිබ්බත්තා, උපන්නී; තතො, එයින්; (චුතව) සෙට්ඨිකුලෙ, සිටුකුලයෙක්හි; නිබ්බත්තා, උපන්නා; නචිරස්සෙව, නොබෝකලකින්ම; චවිත්වා, චුතව; සූකරයොනිං, සූකරයොනියට; ගන්ත්වා, ගොස්; තතො චුතා, ඒ හූරුයොනියෙන්චුතව; සුවණ්ණභූමිං, සවර්ණභූමි නම් රටටද; තතොචුතා, එයින්චුතව; වනවාසිං, වනවාසිනම් නුවරටද; තතොචුතා, එයින්චුතව; සුප්පාරපට්ටනං, සුප්පාර නම් පටුනුගමටද; තතොචුතා, එයින්චුතව; කාවීරපට්ටනං, කාවීර නම් පටුනුගමටද; තතොචුතා, එයින්චුතව; අනුරාධපුරං, අනුරාධපුරයටද; තතොචුතා, එයින්චුතව; සොක්කන්තගාමං ඉති, සොක්කන්තනම්ගමටදැයි; එවං, මෙසේ; සමවිසමෙ, සමවිසමවූ; තෙරසඅත්තභාවෙ, තෙලෙස්අත්බැව්වලට; පත්වා, පැමිණ; ඉදානි, දැන්; උක්කණ්ඨිතා, (සියළු සංස්කාරධර්මයන්හි) උකටලීවූවාය; සබ්බෙපි, සියල්ලෝම; අප්පමාදෙන, ප්‍රමාදනොවීමෙන්; සම්පාදෙථ ඉති, ප්‍රතිපත්තිසම්පාදනයකරව්යයි, වත්වා සා පරිසා, සිව්පිරිස; සංවෙජෙත්වා, සංවෙගයට පමුණුවා; පරිනිබ්බායි, පිරිනිවියාය;–

**සූකරපොතිකාවත්ථු, සූකරපොතිකාවගේ වස්තුවයි;**

---

ඉමානි පඤ්චසුත්තානි, මේසූත්‍රපස; සංසාරාදිසු, සංසාරාදියෙහි; දුක්ඛාදීනවකාථාය, දුක්දෙස්කීමෙහි; යොසල්ලක්ඛං, දක්ෂභාවය පිණිස; උග්ගහෙතබ්බානි, ඉගනගතයුත්තාහුය; අත්තනො සන්තිකං, තමාගේ සමීපයට; ආගතානං ගහට්ඨපරිසානං අපි, පැමිණියාහිපිරිසටද; පටිසන්ථාරොච කාතබ්බො, ප්‍රතිසන්ථාරයහෝ

ධම්මකථා වා කාතබ්බා තස්මා ඉමානි සුත්තානි තෙසං පරිච්ඡින්නධම්මකථනත්ථං ගහෙතබ්බානි.”

---

එවමෙමසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

පරාභවන්තං පුරිසං–මයං පුච්ඡාම ගොතමං
භගවන්තං පුට්ඨුමාගම්ම–කිං පරාභවතො මුඛං
සුවිජානො භවංහොති–සුවිජානො පරාභවො
ධම්මකාමො භවං හොති–ධම්මදෙස්සී පරාභවො

---

කටයුතුයි; ධම්මකථා වා කාතබ්බා, ධර්මකථාව හෝ කටයුතුයි; තස්මා ඉමානි සුත්තානි, එහෙයින් මේසූත්‍රයෝ; තෙසං, ඔවුන්ගේ; පරිච්ඡින්නධම්මකථනත්ථං, පිරිසිඳිනලද ධර්මකථනයපිණිස; ගහෙතබ්බානි, ගතයුත්තාහුයි—

මෙ, මාවිසින්; එවං, මෙසේ; සුතං, අසනලදී; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬුමහසිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වාසයකරවදාරනසේක; අථඛො, ඉක්බිත්තෙන්; අඤ්ඤතරා දෙවතා, එක්තරාදෙවතාවෙක් හෙවත් දිව්‍යපුත්‍රයෙක්; අභික්කන්තාය රත්තිය, (ප්‍රථමයාමය) ඉකුත්වූ රාත්‍රියෙහි; අභික්කන්තවණ්ණා, අභිරූපවූ ඡවිවර්ණඇත්තේ; කෙවලකප්පං ජෙතවනං, හාත්පසින් සියළු ජෙතවනය; ඔභාසෙත්වා, බබුළුවා, භගවා, භාග්‍යවතුන්වහන්සේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනාකොටවැඳ; එකමන්තං, එකත්පසෙක; අට්ඨාසි, සිටියේය; එකමන්තං, එකත් පසෙ..; ඨිතාඛො, සිටියාවූ; සා දෙවතා, ඒදිව්‍යපුත්‍රතෙම; භගවන්තං,භාග්‍යවතුන්වහන්සේට; ගාථාය,(පරාභවන්තංයනාදි) ගාථාවෙන්; අජ්ඣභාසි, මෙසේ කීයේය;–

ගොතමං, ගෞතමගොත්‍රොද්භූතවූ භාග්‍යවතුන්වහන්ස ඔබ වෙතින්; මයං, අපි; පරාභවන්තං, පිරිහෙන්නාවූ; පුරිසං, පුරුෂයා; පුච්ඡාම, විචාරම්හ; භගවන්තං භාග්‍යවතුන්වත්සේ; පුට්ඨුං, පුළුවුත්නාපිණිස; ආගම්ම, ආම්හ; පරාභවතො, පිරිහෙන්නාහට; මුඛං, කාරණය; කිං කවරේද;–

භවං, වැඩෙනපුරුෂයා; සුවිජානොහොති, සුවයෙන් දත හැකිවේ; පරාභවො, පිරිහෙන්නේ; සුවිජානො හොති,සුවයෙන් දතහැකිවේ; ධම්මකාමො, කුශලධර්මයට කැමති පුරුෂතෙම; භවං හොති, වැඩෙන්නේ වෙයි; ධම්මදෙස්සී, ධර්මයට වෙෂී වූයේ; පරාභවො, පිරිහෙන්නේවෙයි;–

ඉතිහෙතං විජානාම–පඨමො සො පරාභවො
දුතියං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
අසන්තස්ස පියා හොන්ති–සන්තෙ න කුරුතෙ පියං
අසතං ධම්මං රොචෙති–තං පරාභවතො මුඛං
ඉතිහෙතං විජානාම–දුතියො සො පරාභවො
තතියං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
නිද්දාසීලී සභාසීලී–අනුට්ඨාතා ච යො නරො
අලසො කොධපඤ්ඤාණො–තං පරාභවතො මුඛං
ඉතිහෙතං විජානාම–තතියො සො පරාභවො
චතුත්ථං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
යො මාතරං වා පිතරං වා–ජිණ්ණකං ගතයොබ්බනං
පහුසන්තො න භරති–තං පරාභවතො මුඛං

---

එතං, මේ පරිහානිකාරණය; ඉතිහි, මේ වදාළනියායෙන්ම; විජානාම, දනුම්හ; සො, ඒ ධර්මවේෂීවීම; පඨමො පරාභවො, පළමුවන පිරිහීම වන්නේය දුතියං, දෙවනපරිහානිකාරණය; භගවා, භාග්‍යවතුන්වහන්ස; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද; -

අසස, ඒපිරිහෙනපුද්ගලයාහට; අසන්තො, අසත්පුරුෂයෝ; පියා හොන්ති, ප්‍රියයෝවෙත්; (හෙතෙම) සන්තෙ, සත්පුරුෂයන්; පියං න කුරුතෙ, ප්‍රියනොකෙරෙයි; අසතං ධම්මං, අසත්පුරුෂ ධර්මයට; රොචෙති, රුචිකෙරෙයි; තං, එය; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;—

එතං, මේ පරිහානිකාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දනුම්හ; සො දුතියො පරාභවො, ඒ දෙවන පිරිහිමය; (වන්නේය) භගවා, භාග්‍යවතුන්වහන්ස; තතියං, තුන්වනපරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං කවරේද;—

යො නරො, යම් කිසිසත්වයෙක්තෙම; නිද්දාසීලී, නිදනසුලුද; සභාසීලී, සභාවනිශ්‍රිතස්වභාවයෙක් ඇත්තේද; අනුට්ඨාතා ච, වීය්‍යී තෙජස්නැත්තේද; අලසො, ස්වභාවයෙන් කුසීතද; කොධපඤ්ඤාණො, ක්‍රොධයලකුණුකොට ඇත්තේවේද; තං, එය; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;—

එතං, මේපරිහානිකාරණය; ඉතිහි, මෙසේම; විජානාම; දනගනුම්හ; සො, ඒ නිදනසුළුවීම්ආදිය; තතියො, තුන්වනුවූ, පරාභවො, පිරිහීමය, භගවා, භාග්‍යවතුන්වහන්ස; චතුත්ථං,සතරවන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

යො, යමෙක්තෙම; ජිණ්ණකං, ජරාවෙන් දිරුණු; ගතයොබ්බනං, ඉක්මගිය යෞවනයඇති; මාතරං වා, වැදූමවද; පිතරං වා, පියාද; පහුසන්තො. පොහොසත්වූයේ; න භරති, පොෂණයනොකෙරේද; තං, ඒමව්පියන් නොරැක්ම; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

ඉතිහෙතං විජානාම–චතුත්ථො සො පරාභවො
පඤ්චමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං

යො බ්‍රාහ්මණං වා සමණං වා–අඤ්ඤං වාපි වනිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති–තං පරාභවතො මුඛං

ඉතිහෙතං විජානාම–පඤ්චමො සො පරාභවො
ඡට්ඨමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං

පහූතවිත්තො පුරිසො–සහිරඤ්ඤො සභොජනො
එකො භුඤ්ජති සාදූනි–තං පරාභවතො මුඛං

ඉතිහෙතං විජානාම–ඡට්ඨමො සො පරාභවො
සත්තමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං

ජාතිත්ථද්ධො ධනත්ථද්ධො–ගොත්තත්ථද්ධො ච යො නරො
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති–තං පරාභවතො මුඛං

---

එතං, මේ පරිහානිකාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දැනගනුම්හ; සො, ඒ මව්පියන් නොරැකීම; චතුත්ථො, සතරවනවූ; පරාභවො, පිරිහීමයි; භගවා, භාග්‍යවතුන්වහන්ස; පඤ්චමං, පස්වන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව, පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;-

යො, යමෙක්තෙම; බ්‍රාහ්මණං වා, බාහිතපාපී ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයකු හෝ; සමණං වා, සමිතපාපී ශ්‍රමණයකු හෝ; අපි, නැවත; අඤ්ඤං වනිබ්බකං වා, අන්‍ය යාචකයකු හෝ; මුසාවාදෙන, බොරුකීමෙන්; වඤ්චෙති, වඤ්චා කෙරේද; තං, ඒ වඤ්චා කිරීම; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

එතං, මේ පරිහානිකාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දැනගනුම්හ; සො, ඒ ශ්‍රමණබ්‍රාහ්මණාදීන් රැවටීම; පරාභවො, පිරිහීමයි; භගවා, භාග්‍යවතුන්වහන්ස; ඡට්ඨමං, සවනපරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

සහිරඤ්ඤො, කහවණුසහිතවූ; සභොජනො, බොජුන් සහිතවූ; පහූතවිත්තො, බොහෝවස්තුඇත්තාවූ; පුරිසො, පුරුෂයෙක්තෙම; සාදූනි, මියුරු රසඇති භෝජන; එකො, හුදකලාවම; භුඤ්ජති, අනුභවකෙරේද; තං, ඒ; (මසුරුබව) පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

එතං, මේ සවනපරිහානිකාරණය; ඉතිහි වදාළපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ;– සො, ඒ; ඡට්ඨමො, සවනුවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; සත්තමං, සත්වන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

යො නරො, යම් මනුෂ්‍යයෙක්තෙම; ජාතිත්ථද්ධො, ජාතිය කාරණකොටගෙන තදමන්ඇත්තේද; ධනත්ථද්ධො, ධනයහේතුකොටගෙන තදමන්ඇත්තේද; ගොත්තත්ථද්ධො ච, ගොත්‍රය හේතුකොටගෙන තදමන්ඇත්තේද; සඤ්ඤාතිං, සවකීය නෑයා; අතිමඤ්ඤෙති, පහත්කොටසිතාද; තං, ඒ පහත්කොටසිතා මානකිරීම; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

ඉතිහෙතං විජානාම–සත්තමො සො පරාභවො
අට්ඨමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
ඉත්ථිධුත්තො සුරාධුත්තො–අක්ඛධුත්තො ච යො නරො
ලද්ධං ලද්ධං විනාසෙති–තං පරාභවතො මුඛං
ඉතිහෙතං විජානාම–අට්ඨමො සො පරාභවො
නවමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
සෙහි දාරෙහි සන්තුට්ඨො–වෙසියාසු පදිස්සති
දිස්සති පරදාරෙසු–තං පරාභවතො මුඛං
ඉතිහෙතං විජානාම–නවමො සො පරාභවො
දසමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
අතීතයොබ්බනො පොසො–ආනෙති තිම්බරුත්ථනිං
තස්සා ඉස්සා න සුපති–තං පරාභවතො මුඛං

---

එතං, මේ (සත්වනපරිහානි) කාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දනගතුම්හ; සො, ඒ; සත්තමො, සත්වනුවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; අඨමං, අටවන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

යො නරො, යම් මිනිසෙක්හෙම; ඉත්ථිධුත්තො, ස්ත්‍රීන්විෂයෙහි ඇළුනේද; සුරාධුත්තො, රාබීමෙහි ලොල්වූයේද; අක්ඛධුත්තො ච, දූකෙළියෙහි ඇළුනේද; ලද්ධං ලද්ධං, ලද ලද දෙය; විනාසෙති, නසාද; තං, ඒත්‍රිවිධධූර්ත ස්වභාවය; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

එතං, මේ (අටවනපරිහානි) කාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දනගතුම්හ; සො, ඒ; අට්ඨමො, අටවනවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; නවමං, නවවන පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළමැනා; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

සෙහිදාරෙහි; සියඅඹුවන් හේතුකොටගෙන; අසන්තුට්ඨො, නොසතුටුවූයේ; වෙසියාසු, වෛශ්‍යාවන්කෙරෙහි; පදිස්සති, දක්නාලැබේද; පරදාරෙසු, පරස්ත්‍රීන්කෙරෙහි; දිස්සති, දක්නාලැබේද; තං, ඒ විප්‍රකාරය; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණාවන්නේය;

එතං, මේ (නවවනපරිහානි) කාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දනගතුම්හ;– සො, ඒ; නවමො, නවවනුවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; දසමං, දසවනපරිහානි කාරණය; බ්‍රෑහි, වදාළමැනව; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

අතීතයොබ්බනො, ඉක්මගිය යොවුනඇති; පොසො, පුරුෂයෙක්තෙම, තිම්බරුත්ථනිං, තිඹිරිඵලවැනි තනඇති ළදරියක්; ආනෙති, ගෙනඒද; (ඒහෙම) තස්සා, ඈට; ඉස්සා, ඊර්ෂ්‍යාවෙන්; නසුපති, නොනිදයි; තං, මහළුකල ළදරියක් පාවාගැනීම; පරාභවතො, පිරිහීමට, මුඛං, කාරණයයි;–

ඉතිහෙතං විජානාම–දසමො සො පරාභවො
එකාදසමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
ඉත්ථි සොණ්ඩිං විකරණිං–පුරිසං වාපි තාදිසං
ඉස්සරියස්මිං ඨපාපෙති–තං පරාභවතො මුඛං
ඉතිහෙතං විජානාම–එකාදසමො සො පරාභවො
වාදසමං භගවා බ්‍රෑහි–කිං පරාභවතො මුඛං
අප්පභොගො මහා තණ්හා–ඛත්තියෙ ජායතෙ කුලෙ
සොධ රජ්ජං පත්ථයති–තං පරාභවතො මුඛං
එතෙ පරාභවෙ ලොකෙ–පණ්ඩිතො සමවෙක්ඛිය
අරියො දස්සනසම්පන්නො–සලොකං භජතෙ සිවන්ති.

පරාභවසුත්තං.

---

"සුත්තනිපාතෙ"

---

එතං, මේ (දසවනපරිහානි) කාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දැනගතුම්හ; සො, ඒ; දසමො, දසවනුවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; එකාදසමං, එකොළොස්වන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැන; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;

සොණ්ඩිං, (ලොල්වූ) තෘෂ්ණා ඇති; විකරණිං, සම්පත් විසුරුවනසුළුවූ; ඉත්ථිං වා, ස්ත්‍රියකුහෝ; අපි, තවද; තාදිසං, ඒබඳුවූ; පුරිසංවා, පුරුෂයකුහෝ; ඉස්සරියස්මිං, අධිපතිබැව්හි; ඨපාපෙති, තබාද; තං, ඒ කාරණය; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි:

එතං, මේ (එකොළොස්වන පරිහානි) කාරණය; ඉතිහි, මෙසේම; විජානාම, දැනගතුම්හ; සො,ඒ; එකාදසමො, එකොළොස්වනුවූ; පරාභවො, පිරිහීමය; භගවා, භාග්‍යවතුන්වහන්ස; වාදසමං; දොළොස්වන පරිහානිකාරණය; බ්‍රෑහි, වදාළමැන; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;–

අප්පභොගො, ස්වල්ප උපභොගපරිභොග වස්තුඇති; මහාතණ්හා, මහත්භොගතෘෂ්ණා ඇත්තෙක්; ඛත්තියෙකුලෙ, ක්ෂත්‍රියකුලයෙහි; ජායතෙ, උපදීද; සොව, හෙතෙමේත්; රජ්ජං, රාජ්ජය; පත්ථෙති, පතාද; තං,ඒපැතීම; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණයයි;–

පණ්ඩිතො පණ්ඩිතතෙම; ලොකෙ, සත්වලොකයෙහි; එතෙ පරාභවෙ, මේ (තෙවිස්සක්පමණ) පරිහානිකාරණයන්; සමවෙක්ඛිය, (නුවණින්)පරීක්ෂාකොටදැන; අරියො,(පරිහානිකාරණයන්හි නොපවත්නාහෙයින්) ආර්‍යවූ; දස්සනසම්පන්නො, (පරිහානිකාරණා දුරුකරන) දර්ශනඥානයෙන් යුක්තවූ; සො, ඒ පුද්ගලතෙම; සිවං, ක්ෂෙමවූ; ලොකං, දෙව්ලොව; භජතෙඉති, සේවනයකෙරේයයි; වදාළසේක)—

පරාභවසුත්‍රපදඅර්ථව්‍යාඛ්‍යානයයි.

---

වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙසුතං- තයො මෙ **භික්ඛ**වෙ අග්ගප්පසාදා, කතමෙ තයො? යාවතා **භික්ඛ**වෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙව සඤ්ඤි නාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගම**ක්ඛා**යති යදිදං අරහං සම්මා සම්බුද්ධො, යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා **භික්ඛ**වෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං අග්ගම**ක්ඛා**යති යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං යෙ භික්ඛවෙ විරාගෙ ධම්මෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

---

භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; **එතං**; මේ වක්ෂ්‍යමාන සූත්‍රය; වුත්තං හි, වදාරණලද්දේමය; අරහතා, අර්හත්වූ (සර්වඥයන් වහන්සේ) විසින්; වුත්තං, වදාරණලද්දේය; මෙ, මා විසින්; ඉති, මේ ප්‍රකාරයෙන්; සුතං, අසනලදී;

**භික්ඛ**වෙ, මහණෙනි! අග්ගප්පසාදා, අග්‍රවූ රත්නත්‍රයෙහි ප්‍රසාදයෝ; ඉමෙ තයො, මොහු තුන්දෙනෙක් වෙත්; තයො, තුන් දෙන, කතමෙ, කවරහුදයත්;? භික්ඛවෙ, මහණෙනි! අපදා වා පා නැත්තාවූ හෝ; දිපදා වා, දෙපා ඇත්තාවූ හෝ; චතුප්පදා වා සිව්පා ඇත්තාවූ; බහුප්පාදා වා, බොහෝ පා ඇත්තාවූ; රූපිනො වා, රූ ඇත්තාවූද; අරූපිනො වා, රූ නැත්තාවූද; සඤ්ඤිනො වා, සංඥා ඇත්තාවූ; අසඤ්ඤිනො වා; සංඥා නැත්තාවූ; නෙවසඤ්ඤිනා සඤ්ඤිනො වා, නෙවසඤ්ඤි නාසඤ්ඤිවූ; යාවතා, යම් පමණ; සත්තා, සත්වයෝ ඇත්තාහුද; තෙසං, ඒ සත්වයන් අතුරෙන්; යං ඉදං, යම් මේ; අරහං, අර්හත්වූ; සම්මා සම්බුද්ධො, සම්‍යක් සම්බුද්ධවූ; තථාගතො, තථාගතතෙම; අග්ගො අක්ඛායති, අග්‍රයයි කියනු ලැබේ; **භික්ඛ**වෙ, මහණෙනි! යෙ, යම් කෙනෙක්; බුද්ධෙ; බුදුන් කෙරෙහි; පසන්නා, පැහැදුනාහුද;.තෙ; ඔහු තුමූ; අග්ගෙ, අගතන්හී; පසන්නා, පැහැදුනාහුය; අග්ගෙ, අගතන්හි; පසන්නානං ඛො පන, පැහැදුනවුන්ට වනාහි; අග්ගො විපාකො හොති, අග්‍රවූ විපාකය වෙයි;

භික්ඛවෙ, මහණෙනි! සඞ්ඛතා වා, හේතු ප්‍රත්‍යයන් විසින් කරණ ලද්දවූද; අසඞ්ඛතා වා, හේතු ප්‍රත්‍යයන් විසින් නො කරණලද්දවූද; යාවතා, යම් පමණ; ධම්මා, ස්වභාව ධර්මයෝ;

යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා තථාගත සාවක සඞ්ඝො තෙසං අග්ගමක්ඛායති යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, යෙ භික්ඛවෙ සඞ්ඝෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති. ඉමෙ ඛො භික්ඛවෙ තයො අග්ගප්පසාදාති. එත මත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

---

තෙසං, ඒ ධර්මයන් අතුරෙන්; යං ඉදං, යම් මේ; මදනිම්මදනො, කාම මදාදි සියලු මද නිර්මද කරණු ලබන්නාවූ; පිපාස විනයො, කාම පිපාසාදී පිපාසයන් පහකරන්නාවූ; ආලය සමුග්ඝාතො, කාමාසාදිය නසන්නාවූ; වට්ටුපච්ඡෙදො, කර්මකෙලශ විපාක යන සංසාර වෘත්ත සිඳින්නාවූ; තණ්හක්ඛයො, තෘෂ්ණාව ක්ෂයකරන්නාවූ; විරාගො, රාගය දුරුකරන්නාවූ; නිරොධො, කෙලෙස් නිරුද්ධකරන්නාවූ; නිබ්බාණං, වානසංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මුණාවූ මොක්ෂ ධර්මයක් ඇද්ද; (ඒධර්මයතෙම) අග්ගො අක්ඛායති, අග්‍රයයි කියනු ලැබේ; භික්ඛවෙ, මහණෙනි! යෙ, යම් කෙනෙක්; විරාගෙධම්මෙ, විරාගධර්මයෙහි; පසන්නා පැහැදුනාහුද; තෙ, ඔව්හු; අග්ගෙ, අග තන්හි; පසන්නා, පැහැදුනාහුය; අග්ගෙ, අගතන්හි; පසන්නානං ඛො පන, පැහැදුනවුන්ට වනාහී; අග්ගො විපාකො හොති, අග්‍රවූ විපාකය වෙයි;

භික්ඛවෙ, මහණෙනි! සඞ්ඝා වා, සඞ්ඝවූද; ගණා වා, ගණවූද; යාවතා, යම් පමණ; (ජන සමූහ කෙනෙක් ඇද්ද) තෙසං, ඔවුන් අතුරෙන්; යං ඉදං, යම් මේ; චත්තාරි පුරිස යුගානි, ආර්‍ය්‍ය පුද්ගල යුගල සතරක්වූ; අට්ඨ පුරිස පුග්ගලා, පුරුෂ පුද්ගල අටදෙනෙක් ඇද්ද; එසො, මේතෙම; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; සාවකසඞ්ඝො, ශ්‍රාවකසඞ්ඝ තෙමේ; ආහුණෙය්‍යො, දුරිනුදු ගෙණහැර දියයුතු පසයට සුදුසුය; පාහුණෙය්‍යො, අමුතු පඬුරු පිළිගැණීමට සුදුසුය; දක්ඛිණෙය්‍යො, දක්ෂිණාහීය; අඤ්ජලිකරණීයො, නමස්කාරයට සුදුසුය; ලොකස්ස, ලෝවැස්සාගේ; අනුත්තරං, උතුම්වූ; පුඤ්ඤක්ඛෙත්තං, පින්හටගන්නා කෙතෙකැයි; තථාගත සාවක සඞ්ඝො, තථාගතයන්වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝතෙමේ; අග්ගො අක්ඛායති, අග්‍රයයි කියනුලැබේ; භික්ඛවෙ, මහණෙනි! යෙ, යම්කෙනෙක්, සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; පසන්නා, පැහැදුනාහුද; තෙ, ඔහුතුමූ; අග්ගෙ, අගතන්හි; පසන්නා, පැහැ

අග්ගතො වෙ පසන්නානං— අග්ගං ධම්මං විජානතං
අග්ගෙ බුද්ධෙ පසන්නානං— දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ
අග්ගෙ ධම්මෙ පසන්නානං— විරාගූපසමෙ සුඛෙ
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං— පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ
අග්ගස්මිං දානං දදතං— අග්ගං පුඤ්ඤං පවඩ්ඪති
අග්ගං ආයු ච වණ්ණො ච— යසො කිත්ති සුඛං බලං
අග්ගස්ස දාතා මෙධාවී— අග්ග ධම්ම සමාහිතො
දෙවභූතො මනුස්සො වා— අග්ගප්පත්තො පමොදතී" ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුත්තන්ති.

අග්ගප්පසාද සුත්තං

---

දූතාහුය; අග්ගෙ, අගතන්හි; පසන්නානං බොපන, පැහැදුනවුන්ට වනාහි; අග්ගො විපාකො, අග්‍රවූ විපාකයතෙම; හොති, වෙයි; භික්ඛවෙ, මහණෙනි! ඉමෙ තයො ඛො, මේ තුන වනාහි; අග්ගප්පසාද ඉති, අග්‍රවූ ප්‍රසාදයෝයයි;

භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං අත්ථං, මේ අර්ථය; අවොච, වදාළසේක; තත්ථ, එහි; එතං, මේ අර්ථ ජාතය; ඉති, මෙසේ; වුච්චති, (ගාථාබන්ධනවශයෙන්) කියනුලැබේ;

වෙ, ඒකාන්තයෙන්, අග්ගතො අග්‍රවූ රත්නත්‍රයෙහි; පසන්නානං, පැහැදුනාවූ; අග්ගං ධම්මං, උතුම් සවභාව හෝ ගුණ සවභාවය; විජානතං, දන්නවුන්ට; (අග්‍රවූ විපාකයවේ.) දක්ඛිණෙය්‍යෙ, දක්ෂිණාහීවූ; අනුත්තරෙ, නිරුත්තරවූ; අග්ගෙ, අග්‍රවූ; බුද්ධෙ, බුදුන්කෙරෙහි; පසන්නානං පැහැදුනවුන්ටද; (අග්‍රවූ විපාකයවේ.)

විරාගූපසමෙ, (සියලු කෙලෙස් අතිශයින් සංසිඳුවීමට හේතුවූ; සුඛෙ, (සසරදුක් ක්ෂයකරණ බැවින් හා සංස්කාරයන් සංසිඳුවන බැවින්ද) සැපවූ; ධම්මෙ, ධර්මයකෙරෙහි; පසන්නානං, පැහැදුන වුන්ටද; පුඤ්ඤක්ඛෙත්තෙ, පින්කෙත්වූ; අනුත්තරෙ, නිරුත්තරවූ; අග්ගෙ සඞ්ඝෙ, අග්‍රවූ සඞ්ඝයා කෙරෙහි; පසන්නානං, පැහැදුනවුන්වද; (අග්‍රවූ විපාකවේ.)

අග්ගස්මිං, අග්‍රවූ රත්නත්‍රයෙහි; දානං, දානය; දදතං, දෙන්න වුන්ට, අග්ගං, අග්‍රවූ; පුඤ්ඤං, පින; පවඩ්ඪති, වැඩේ; (එයින්) අග්ගං ආයු ච, අග්‍රවූ ආයුෂයද; වණ්ණො ච, ශරීරවර්ණයද; යසො, පිරිවර සම්පත්තියද; කිත්ති, කීර්තියද; සුඛං, සැපයද; බලං, බලයද; (වැඩෙන්නේය.)

වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං– සබ්‍රහ්ම කානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති සපුබ්බදෙවකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතා පිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති සපුබ්බාචරියකානි භික්ඛවෙ තානිකුලානි යෙසං පුත්තානං මාතා පිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති.

---

අග්ගස්ස, අග්‍රවූ රත්නත්‍රයට; (අග්‍රවූ දෙය්‍ය ධර්මය) දත්වා, දෙන්නාවූ; මෙධාවී, පණ්ඩිත තෙම; අග්ග ධම්ම සමාහිතො, අග්‍රප්‍රසාද ධර්මයෙන් හා අග්‍රදානාදී ධර්මයෙන්ද යුක්තවූයේ; දෙවභූතො, දෙවිවූයේ හෝ; මනුස්සො වා, මිනිස්වූයේ හෝ; අග්ගප්පත්තො, අග්‍රබවට පැමිණියේ; පමොදති ඉති, සතුටුවේයයි;

භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; අයං අත්ථො අපි, මේ අර්ථයද; වුත්තො, වදාරණලද්දේය; මෙ, මාවිසින්; ඉති, මේ ප්‍රකාරයෙන්; සුතං ඉති, අසනලද්දේයි;

**අග්ගප්පසාද සුත්තං,–අග්‍රප්‍රසාදසූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයයි;**

——:◯:——

භගවතා, –පෙ–

**භික්ඛ**වෙ, මහණෙනි! යෙසං පුත්තානං, යම් පුත්‍රකෙනෙකුන් විසින්; මාතා පිතරො, මව්පියෝ; අජ්ඣාගාරෙ, ස්වකීය ගෘහ යෙහි; පූජිතා හොන්ති, පුදනලද්දහු වෙද්ද; තානි කුලානි, ඒ කුලයෝ; සබ්‍රහ්මකානි, බ්‍රහ්මයන් සහිත වූවාහුය; **භික්ඛ**වෙ, මහණෙනි! යෙසං පුත්තානං, යම් පුත්‍රකෙනෙකුන් විසින්; මාතා පිතරො, මව්පියෝ; අජ්ඣාගාරෙ, ස්වකීය ගෘහයෙහි; පූජිතා හොන්ති, පුදනලද්දාහුවෙද්ද; තානි කුලානි, ඒ කුලයෝ; සපුබ්බ දෙවානි, පූර්වදෙවතාවන් සහිතවූවාහුය; **භික්ඛ**වෙ, මහණෙනි! යෙසං පුත්තානං, යම් පුත්‍රකෙනෙකුන් විසින්; මාතා පිතරො, මව්පියෝ; අජ්ඣාගාරෙ, ස්වකීය ගෘහයෙහි; පූජිතා හොන්ති, පුදනලද්දහුවෙද්ද; තානි කුලානි, ඒකුලයෝ; සපුබ්බාචරියකානි, පූර්වාචාර්යයන් සහිතවූවාහුය;

**භික්ඛ**වෙ, මහණෙනි; යෙසං පුත්තානං, යම් පුත්‍රකෙණෙකුන් විසින්; මාතාපිතරො, මව්පියෝ; අජ්ඣාගාරෙ, ස්වකීය ගෘහයෙහි; පූජිතාහොන්ති, පුදනලද්දහුවෙද්ද; තානිකුලානි, ඒකුලයෝ; සාහුණෙය්‍යකානි, දුරිනුදු ගෙනදියයුතු දෙයට සුදුස්සෝ සහිතවූවාහුයි;

බ්‍රහ්මාති භික්ඛවෙ මාතා පිතූනං එතං අධිවචනං, පුබ්බදෙවාති භික්ඛවෙ මාතා පිතූනං එතං අධිවචනං පුබ්බාචරියාති භික්ඛවෙ මාතා පිතූනං එතං අධිවචනං ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතා පිතූනං එතං අධිවචනං, තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

බ්‍රහ්මාති මාතා පිතරො— පුබ්බාචරියාති වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං— පජාය අනුකම්පකා.
තස්මා හි නෙ නමස්සෙය්‍ය— සක්කරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන— වත්ථෙන සයනෙන ච.

---

භික්ඛවෙ, මහණෙනි! මාතා පිතූනං, මවුපියන්ට; බ්‍රහ්මා ඉති, බ්‍රහ්මයෝය යන; එතං අධිවචනං, මේ නමෙක; භික්ඛවෙ, මහණෙනි! මාතා පිතූනං, මවුපියන්ට; පුබ්බදෙවා ඉති, පූර්වදෙවතාවෝය යන; එතං අධිවචනං, මේ නමෙක; භික්ඛවෙ, මහණෙනි! මාතාපිතූනං, මවුපියන්ට; පුබ්බාචරියා ඉති, පූර්ව ආචාර්‍ය්‍යයෝය යන; එතං අධිවචනං, මේ නමෙක; භික්ඛවෙ, මහණෙනි! මාතාපිතූනං, මවුපියන්ට; ආහුණෙය්‍යා ඉති, දුරිදුනු ගෙණ දිය යුතු දෙයට සුදුස්සෝය යන; එතං අධිවචනං, මේ නමෙක; තං කිස්ස හෙතු?, ඊට හේතු කවරේද;?

භික්ඛවෙ, මහණෙනි! පුත්තානං, පුත්‍රයන්ට; මාතාපිතරො, මව්පියෝ; බහූපකාරා, බොහෝ උපකාර ඇත්තෝය; ආපාදකා, දිවි රැක්කෝය; පොසකා, (අත්පා වඩා කිරි පොවා) පෝෂ්‍යය කළෝය; ඉමස්ස ලොකස්ස, මේ ලෝකය සම්බන්ධවූ; (ඉෂ්ටානිෂ්ටාරම්මනයන්) දස්සෙතාරො ඉති, දක්වූවෝයයි; එතං අත්ථං, මේ අර්ථය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; අවොච, වදාළසේක; තත්ථ, එහි, එතං, මේ ගාථා බන්ධනයද; ඉති, මෙසේ; වුච්චති, කියනු ලැබේ;

පජාය, (තමාගේ) පුත්‍ර ප්‍රජාවට; අනුකම්පකා, අනුග්‍රහ කරන්නාවූ; මාතාපිතරො, මවුපියෝ; පුත්තානං, පුත්‍රයන්ට; බ්‍රහ්මා ඉති, බ්‍රහ්මයෝයයිද; පුබ්බාචරියා ඉති, පූර්‍වාචාර්‍ය්‍යයෝයයිද; ආහුණෙය්‍යා ච, දුරිනුදු ගෙණ දියයුතු සත්කාරයට සුදුස්සෝයයිද; වුච්චරෙ, කියනු ලැබෙත්;

තස්මා හි, එහෙයින්ම; පණ්ඩිතො, පණ්ඩිත තෙම; නෙ, ඒ මවුපියන්, නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේය; අථ, නැවත; අන්නෙන, ආහාරයෙන්ද; අථ, නැවත; පානෙන, පානයෙන්ද;

උච්ඡාදනෙන නහාපනෙන— පාදනං ධොවනෙන ච
තායතං පාරිචරියාය— මාතා පිතූසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති— පෙච්ච සග්ගෙ පමොදතී' ති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

සබ්‍රහ්මක සුත්තං.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං– ඉධාහං, **භික්ඛ**වෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි ඉමම්හි චායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ, තං කිස්සහෙතු? චිත්තං හිස්ස **භික්ඛ**වෙ පදුට්ඨං. චෙතො පදොසහෙතු ඛො පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති. එත මත්‍ථං භගවා අවොච, තත්‍ථෙතං ඉති වුච්චති.

---

වත්‍ථෙන, වස්ත්‍රයෙන්ද; සයනෙන ච, සයනයෙන්ද; උච්ඡාදනෙන, ඇඟ ඉලීමෙන්ද; නහාපනෙන; නැහැවීමෙන්ද; පාදනං ධොවනෙන ච, පාසේදවීමෙන්ද; සක්කරෙය්‍ය, සත්කාර කරන්නේය;

මාතා පිතූසු, මවුපියන් කෙරෙහි; තායතං පාරිචරියාය, ඒ අත් පා මෙහෙකිරීමෙන්; නං, ඕහට; පණ්ඩිතා, පණ්ඩිතයෝ; ඉධ එව, මේ ලෝකයෙහිදීම; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්: පෙච්ච, පර ලෙව්හි; සග්ගෙ, ස්වර්ගයෙහි; පමොදති ඉති, සතුටුවේයයි; අයම්පි -පෙ- සුතන්ති.

**සබ්‍රහ්මකසුත්තං, සබ්‍රහ්මකසූත්‍ර පදානු ව්‍යාඛ්‍යානයයි;**

—:—

භගවතා, -පෙ-

භික්ඛවෙ, මහණෙනි! අහං, මම; ඉධ, මේ ලෝකයෙහි; පදුට්ඨචිත්තං, ප්‍රකාරයෙන් දූෂ්‍යවූ සිත් ඇති; එකච්චං පුග්ගලං, ඇතැම් පුද්ගලයකු; එවං, මෙසේ; චෙතසා; (මාගේ) සිතින්; චෙතො, (ඔහුගේ) සිත; පරිච්ච, පිරිසිඳ; පජානාමි, දනිමි; අයං පුග්ගලො, මේ පුද්ගලතෙම; ඉමම්හි ච සමයෙ, මේ කාලයෙහි නෝ; කාලං කරෙය්‍ය, කාලක්‍රියා කරන්නේනම්; ආභතං, ගෙණ එන ලද්දක්; නික්ඛිත්තො, තබනලද්දේ; යථා, යම්සේද; එවං, එසේ; නිරයෙ, නරකයෙහිය; තං කිස්සහෙතු, ඊට හේතු කවරේද;? භික්ඛවෙ, මහණෙනි! හි, යම්හෙයකින්; අස්ස, ඔහුගේ; චිත්තං, සිත;

පදුට්ඨ චිත්තං ඤත්වාන— එකච්චං ඉධ පුග්ගලං
එතමත්ථං ව්‍යාකාසි— බුද්ධො භික්ඛූන සන්තිකෙ

ඉමම්හි චායං සමයෙ— කාලං කයිරාථ පුග්ගලො
නිරයං උපපජ්ජෙය්‍ය— චිත්තං හිස්ස පදූසිතං

යථා හරිත්වා නික්ඛිපෙය්‍ය— එව මෙව තථා විධො
චෙතො පදොස හෙතුහි— සත්තා ගච්ඡන්ති දුග්ගතින්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## නිරයූපපත්ති සුත්තං

---

පදුට්ඨං, ප්‍රකාරයෙන් දූෂ්‍යද; (එහෙයින) භික්ඛවෙ, මහණෙනි! චෙතො පදොස හෙතු බොපන, සිත ප්‍රදූෂ්‍යය හේතුකොටගෙණ වනාහී; එවං, මෙසේ; ඉධ, මේ ලෝකයෙහි; එකච්චෙ සත්තා, ඇතැම් සත්ත්වයෝ; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; මරණා පරං, මරණින්මතු; අපායං, සැපයෙන් පහවූ; දුග්ගතිං, නපුරු ගති ඇති; විනිපාතං, විවසවපතිතවත; නිරයං, නරකයට; උපපජ්ජන්ති ඉති, උත්පත්ති වශයෙන් පැමිණෙත් යන; එතං අත්ථං, මේ අර්ථය; තත්ථ, එහි; එතං, මේ; (සංගීතිකාරයන්ගේ ගාථාවද බුඬදෙශනා ගාථාවද) ඉති, මෙසේ; වුච්චති, කියනු ලැබේ;

බුද්ධො, බුදුරජතෙම; භික්ඛූනං, භික්ෂූන්ගේ; සන්තිකෙ, සමීපයෙහිදී; ඉධ, මේ ලෝකයෙහි; පදුට්ඨ චිත්තං, ප්‍රකාරයෙන් දූෂ්‍යවූ සිත් ඇති; එකච්චං පුග්ගලං, ඇතැම් පුද්ගලයකු; ඤත්වාන දැන; එතං අත්ථං, මේ අර්ථය; ව්‍යාකාසි, ප්‍රකාශකළසේක;

අයං පුග්ගලො, මේ පුද්ගලතෙම; ඉමම්හි ච සමයෙ, මේ කාලයෙහිද; කාලං කයිරාථ, කාලක්‍රියාකළේනම්; නිරයං, නරකට, උපපජ්ජෙය්‍ය, උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය; හි, යම්හෙයකින්; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; පදූසිතං, ප්‍රකාරයෙන් දූෂ්‍යද;

ආහරිත්වා, ගෙණවුත්; යථා, යම්සේ; නික්ඛිපෙය්‍ය, තබන්නේද; තථාවිධො, එබඳු පුද්ගලතෙම; එවං එව, එසේමය; චෙතො පදොස හෙතු හි, සිත ප්‍රකාරයෙන් දූෂ්‍යවීම ගේ හේතුවෙන් වනාහී; සත්තා, සත්ත්වයෝ; දුග්ගතිං, දුගතියට; ගච්ඡන්ති ඉති, යෙත්යයි;

අයම්පි -පෙ- සුතන්ති.

නිරයූපපත්ති සුත්තං, නිරයෝත්පත්තිසූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයයි

——o——

වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං– ඉදාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්න චිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි ඉමම්හි චායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ, තං කිස්ස හෙතු? චිත්තං හිස්ස භික්ඛවෙ පසන්නං. චෙතො පසාද හෙතු බොපන භික්ඛවෙ එව මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තී"ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

පසන්න චිත්තං ඤත්වාන– එකච්චං ඉධ පුග්ගලං
එතමත්ථං වියාකාසි– බුද්ධො භික්ඛූන සන්තිකෙ
ඉමම්හි චායං සමයෙ– කාලං කයිරාථ පුග්ගලො
සුගතිං උපපජ්ජෙය්‍ය– චිත්තං හිස්ස පසාදිතං

---

භගවතා –පෙ–

භික්ඛවෙ, මහණෙනි! අහං, මම; ඉධ, මේ ලෝකයෙහි; පසන්න චිත්තං, ප්‍රසන්න සිත්ඇති; එකච්චං පුග්ගලං, ඇතැම් පුද්ගලයෙකු; එවං මෙසේ; චෙතසා (මාගේ) සිතින්; චෙතො, (ඔහුගේ) සිත; පරිච්ච, පිරිසිඳ; පජානාමි, දනිමි; අයං පුග්ගලො, (මේ ප්‍රසන්න සිත් ඇති) පුද්ගලතෙම; ඉමම්හි ච සමයෙ, මේ කාලයෙහිද; කාලං කරෙය්‍ය, කාලක්‍රියාකරන්නේනම්; ආභතං, ගෙනඑතලද්දක්; යථා, යම්සේද; එවං, එසේ; සග්ගෙ, ස්වර්ගයෙහි; (උපදනේය) තං කිස්ස හෙතු, ඊට හේතු කවරේද;? භික්ඛවෙ, මහණෙනි! හි, යම්හෙයකින්; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; පසන්නං, ප්‍රසන්නය; භික්ඛවෙ, මහණෙනි! චෙතො පසාදහෙතු බොපන, සිත පැහැදීම හේතුකොට ගෙණ වනාහී; එවං, මෙසේ; ඉධ, මේ ලෝකයෙහි; එකච්චෙ සත්තා, ඇතැම් සත්ත්වයෝ; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; පරම්මරණා, මරණින්මතු; සුගතිං, යහපත් ගමන් ඇති; සග්ගං ලොකං, ස්වර්ගලෝකයට; උපපජ්ජන්ති ඉති; උත්පත්ති වශයෙන් පැමිණෙත්යයි; භගවා, –පෙ– වුච්චති,

බුද්ධො, බුදුරජතෙම; භික්ඛූනං, භික්ෂූන්ගේ; සන්තිකෙ; සමීපයෙහි; ඉධ, මේ ලෝකයෙහි; පසන්න චිත්තං, ප්‍රසන්න සිත් ඇති; එකච්චං පුග්ගලං, ඇතැම් පුද්ගලයෙකු; ඤත්වාන, දැන; එතං අත්ථං, මේ අර්ථය; වියාකාසි, ප්‍රකාශකළසේක;

අයං පුග්ගලො, මේ (ප්‍රසන්න) පුද්ගලතෙම; ඉමම්හිච සමයෙ; මේ කාලයෙහිද; කාලං කයිරාථ, කාලක්‍රියාකරා නම්; සුගතිං, සුගතියට; උපපජ්ජෙය්‍ය, උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය; හි, යම්හෙකින්; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; පසාදිතං, පැහැදුනේද; (එහෙයින)

යථා හරිත්වා නික්ඛිපෙය්‍ය — එවමෙව තථාවිධො
චෙතොපසාද හෙතුහි — සත්තා ගච්ඡන්ති සුග්ගතින්ති.
අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

සුගතූපපත්ති සුත්තං.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං- යදා භික්ඛවෙ දෙවො දෙවකායා චවන ධම්මො හොති පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති මාලා මිලායන්ති වත්ථානි කිලිස්සන්ති කච්ඡෙහි සෙදා මුච්චන්ති. කායෙ දුබ්බණ්ණියං ඔක්කමති සකෙ දෙවො සනෙ නාභිරමතීති. තමෙනං භික්ඛවෙ දෙවා චවනධම්මං අයං දෙවපුත්තොති ඉති විදිත්වා තීහි වාචාහි අනුමොදන්ති ඉතො භො සුගතිං ගච්ඡ සුගතිං ගන්ත්වා සුලද්ධලාභං ලභ සුලද්ධලාභං ලභිත්වා සුප්පතිට්ඨිතො භවාහීති.

---

යථා, යම්සේ; ආහරිත්වා, (යමක්) ගෙනවුත්; නික්ඛිපෙය්‍ය, තබන්නේද; තථාවිධො, එබඳු පුද්ගලතෙම; එවං එව, එසේම; (ස්වර්ගයෙහි උපදනේය) චෙතොපසාද හෙතුහි. සිත පැහැදීම් හේතුකොටගෙණ වනාහි; සත්තා, සත්වයෝ; සුගතිං, සුගතියට; ගච්ඡන්ති ඉති, යෙත්යයි; අයම්පි, -පෙ-

**සුගතූපපත්ති සුත්තං, සුගතොපපත්ති සූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයි**

භගවතා -පෙ- **භික්ඛවෙ**, මහණෙනි! යදා, යම් කලෙක්හි; දෙවො, දෙවියෙක්තෙම; දෙවකායා, දිව්‍යලෝකයෙන්; චවන ධම්මො හොති, චුතවන ස්වභාවඇත්තේවේද; අස්ස, ඔහුගේ; මාලා, (පළඳින) මල්; මිලායන්ති, මැලවෙත්; වත්ථානි, (අඳිනා පොරෝනා ලද) වස්ත්‍රයෝ; කිලිස්සන්ති, කිලුටුවෙත්; කච්ඡෙහි, කිසිලිවලින්; සෙදා, ඩහදිය; මුච්චන්ති, වැහෙත්; කායෙ, කයෙහි; දුබ්බණ්ණියං, දුර්වර්ණ බව; ඔක්කමති, පහළවෙයි; සකෙ දෙවාසනෙ; ස්වකීය දිව්‍ය ආසනයෙහි; නාභිරමති, නොඇලෙයි; ඉති, මෙසේ, පුබ්බනිමිත්තානි පඤ්ච, පූර්වනිමිති පසක්; පාතුභවන්ති, පහළවෙත්; **භික්ඛවෙ**, මහණෙනි! දෙවා, (ඒ දෙව්ලොව වැසි) දෙවියෝ; අයං දෙවපුත්තො, මේ දෙව්පුත් තෙම; චවනධම්මො ඉති, චුතවන ස්වභාව ඇත්තේයයි; ඉති, මෙසේ; විදිත්වා, දැන; තීහි වාචාහි, වචන තුනකින්; අනුමොදන්ති, තත්ක්ෂණානුරූපවූ ප්‍රමෝදය උපදවත්; භො, පින්වත; ඉතො, මෙයින්; (චුතව) සුගතිං, සුගතියට; ගච්ඡ, යව; සුගතිං, සුගතියට; ගන්ත්වා, ගොස්; සුලද්ධලාභං, යහපත්කොට ලබනලද ලාභය; ලභ, ලබව; සුලද්ධලාභං, මනාකොට ලබනලද ලාභය; ලභිත්වා, ලබා; සුප්පතිට්ඨිතො භවාහි ඉති, මනාකොට පිහිටියේ වෙවයි; (යන වාක්‍ය තුනෙන් අස්වසත්)

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච. කිත්නු ඛො භන්තෙ දෙවානං සුගතිගමනසඞ්ඛාතං කිඤ්ච භන්තෙ දෙවානං සුලද්ධලාභ සඞ්ඛාතං කිං පන භන්තෙ දෙවානං සුප්පතිට්ඨිත සඞ්ඛාතන්ති.

මනුස්සත්තං ඛො භික්ඛු දෙවානං සුගතිගමනසඞ්ඛාතං යං මනුස්සභූතො සමානො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං පටිලභති. ඉදං ඛො භික්ඛු දෙවානං සුලද්ධ ලාභ සඞ්ඛාතං. සා ඛො පනස්ස සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා දළ්හා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං. ඉදං ඛො භික්ඛු දෙවානං සුප්පතිට්ඨිත සඞ්ඛාතන්ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

---

එවං, මෙසේ; වුත්තෙ, වදාළකල්හි; අඤ්ඤතරො භික්ඛු, එක්තරා භික්ෂුවක්තෙම; භගවන්තං භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ වාක්‍යය; අවොච, කීයේය; භන්තෙ, ස්වාමීන්වහන්ස! දෙවානං, දෙවියන්ගේ; සුගතිගමන සඞ්ඛාතං, සුගතිගමනයයි කියනලද්දේ; කිත්නු ඛො, කිමෙක්ද;? භන්තෙ, ස්වාමීන්වහන්ස! දෙවානං, දෙවියන්ගේ; සුලද්ධ ලාභ සඞ්ඛාතං, යහපත්කොට ලබනලද ලාභයයි කියන ලද්දේ; කිඤ්ච, කුමක්ද;? භන්තෙ, ස්වාමීන්වහන්ස! දෙවානං, දෙවියන්ගේ; සුප්පතිට්ඨිත සඞ්ඛාතං, මනාකොට පිහිටීම යයි කියනලද්දේ; කිං පන ඉති, කිමෙක්දැයි;? (විචාළේය)

භික්ඛු, මහණ! මනුස්සත්තං ඛො, මනුෂ්‍යාත්මය වනාහී; දෙවානං දෙවියන්ගේ; සුගතිගමනසඞ්ඛාතං, සුගතිගමනයයි කියනලද්දේය; මනුස්සභූතො සමානො, මනුෂ්‍යවූයේම; තථාගතප්පවෙදිතෙ, තථාගතයන්වහන්සේ විසින් දෙශනාකරණලද්දාවූ; ධම්මවිනයෙ, ධර්මවිනයෙහි; යං සද්ධං; යම් ශ්‍රද්ධාවක්; පටිලභති, උපදවාද්ද; භික්ඛු, මහණ! ඉදං ඛො, මේ වනාහී; දෙවානං, දෙවියන්ගේ; සුලද්ධලාභ සඞ්ඛාතං, යහපත්කොට ලබනලදලාභයයි කියන ලද්දේය; අස්ස ඛො පන, මොහුගේ වනාහී; සා සද්ධා, ඒ ශ්‍රද්ධාතොම; නිවිට්ඨා, චිත්තසන්තානය අනුව ප්‍රවිෂ්ටවූවා; මූලජාතා, හටගත් මුල්ඇත්තී; පතිට්ඨිතා, පිහිටියා; දළ්හා, දෘඪවූවා; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මරෙකු විසින් හෝ; බ්‍රහ්මුනා වා, බඹෙකු විසින් හෝ; ලොකස්මිං, ලොවැ; කෙනචි වා, කිසිවකු විසින් හෝ; අසංහාරියා, හැරගන්ට නොහැකිවූවා; හොති, වේද; භික්ඛු, මහණ! ඉදං ඛො, මේ වනාහී; දෙවානං, දෙවි

යදා දෙවො දෙවකායා — චවති ආයු සඞ්ඛයා
තයො සද්දා නිච්ඡරන්ති— දෙවානං අනුමොදතං

ඉතො භො සුගතිං ගච්ඡ—මනුස්සානං සහව්‍යතං
මනුස්ස භූතො සද්ධම්මෙ— ලභ සද්ධං අනුත්තරං

සා තෙ සද්ධා නිවිට්ඨාස්ස—මූලජාතා පතිට්ඨිතා
යාවජීවං අසංහීරා—සද්ධම්මෙ සුප්පවෙදිතෙ

කාය දුච්චරිතං හිත්වා—වචී දුච්චරිතානි ච
මනො දුච්චරිතං හිත්වා—යඤ්චඤ්ඤං දොස සඤ්හිතං

---

යන්ගේ; සුප්පතිට්ඨිත සඞ්ඛාතං ඉති, මනාකොට පිහිටීමයයි කියන ලද්දේය; එතං අත්ථං, මේ කාරණය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළසේක; තත්ථ, එහි; එතං, මේ ගාථා බන්ධනය; ඉති, මෙසේ; වුච්චති, කියනු ලැබේ;

යදා, යම්කලෙක්හි; දෙවකායා, දිව්‍යලෝකයෙන්; දෙවො, දෙවියෙක්තෙම; ආයුසංඛයා, ආයුෂ ක්‍ෂයවීමෙන්; චවති, චුතවේද; අනුමොද-ං, අනුමෝදන්කරන්නාවූ; දෙවානං, දෙවියන්ගේ; තයො සද්දා, ශබ්දතුනක්; නිච්ඡරන්ති, නික්මෙත්;

භො, පින්වත! ඉතො, මෙයින්; (චුතව) මනුස්සානං, මිනිසුන්ගේ; සහව්‍යතං, සමානභාවයවූ; සුගතිං, සුගතියට; ගච්ඡ, යව; මනුස්සභූතො, පරමාර්ථ මනුෂ්‍යවූයේ; සද්ධම්මෙ, සද්ධර්මයෙහි; අනුත්තරං, උතුම්වූ; සද්ධං, ශ්‍රද්ධාව; ලභ, ලබව;

තෙ, තාගේ; සුප්පවෙදිතෙ, මනාකොට බුදුන් විසින් දෙශන ලද්දාවූ; සද්ධම්මෙ, සද්ධර්මයෙහි; සා සද්ධා, ඒ ශ්‍රද්ධා තොමෝ; නිවිට්ඨා, චිත්තසන්තානය අනුව ප්‍රවිෂ්ටවූවා; මූලජාතා, හටගත් මුල්ඇත්තී; පතිට්ඨිතා, අකම්පනීය භාවයෙන් පිහිටියා; යාවජීවං, ජීවිතය ඇතිතාක්; අසංහීරා, කිසිවෙකු විසින් පැහැරනොගන්නාලද්දී; අස්ස, වන්නීය;

කාය දුච්චරිතං, කායදුශ්චරිතයද; වචීදුච්චරිතානිච, වාක්දුශ්චරිතයන්ද; මනො දුච්චරිතං, මනොදුශ්චරිතයද; හිත්වා, හැර; අඤ්ඤං, (මේ දුශ්චරිතයන්ගෙන්) අන්‍යවූ; දොස සඤ්හිතං, දොෂ යයි දන්නාලද්දාවූ; (කෙලෙස් දොස් සමග පවතින) යඤ්ච, යමකුත් ඇද්ද; (එයද) හිත්වා, හැර;

කායෙන කුසලං කත්වා — වාචාය කුසලං බහුං
මනසා කුසලං කත්වා — අප්පමාණං නිරූපධිං

තතො ඔපධිකං පුඤ්ඤං — කත්වා දානෙන තං බහුං
අඤ්ඤෙපි මච්චෙ සද්ධම්මෙ — බ්‍රහ්මචරියෙ නිවෙසයෙ

ඉමාය අනුකම්පාය — දෙවා දෙවං යදා විදූ
චවන්තං අනුමොදන්ති — එහි දෙව පුනප්පුනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## දෙවාචවන සුත්තං.

වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං තීණිමානි භික්ඛවෙ සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, කතමානි තීණි පසංසා මෙ ආගච්ඡතූති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, භොගා මෙ උප්පජ්ජන්තූති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජිස්සාමීති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, ඉමානි ඛො භික්ඛවෙ තීණි සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතොති, එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

---

කායෙන, කයින්; කුසලං, කුසලයද; වාචාය, වචනයෙන්; බහුං කුසලං, බොහෝවූ කුසලයද; කත්වා, කොට; මනසා, සිතින්; අප්පමාණං, ප්‍රමාණ රහිතවූ; නිරූපධිං, ක්ලෙශොපධිරහිතවූ; කුසලං, කුසලය; කත්වා, කොට;

තතො, එයින්; දානෙන, (අභය) දානය කාරණකොටගෙණ; තං, ඒ; බහුං, බොහෝවූ; ඔපධිකං, (ආත්මභාව සම්පත්තිය හා භොග සම්පත්තියද) නිපදවීම කරන්නාවූ; පුඤ්ඤං, පින; කත්වා, කොට; අඤ්ඤෙ මච්චෙ අපි, අන්‍ය මනුෂ්‍යයන්ද; සද්ධම්මෙ, ධර්ම්ම දානයෙහිද; බ්‍රහ්මචරියෙ, ශ්‍රෙෂ්ඨහැසිරීමෙහිද; නිවෙසයෙ, පිහිටුවන්නේය;

දෙවා, දෙවියෝ; ඉමාය අනුකම්පාය, මේ අනුකම්පාවෙන්; චවන්තං, චුතවන්නාවූ; දෙවං, දෙවියකු; යදා, යම්කලෙක්හී; විදූ, දනිත්නම්; දෙව, දෙවිය; පුනප්පුනං, නැවත නැවත; එහි ඉති, (මේ දෙව්ලොවට) එවයි; අනුමොදන්ති, සතුටුකරවත්;

අයම්පි -පෙ- සුතන්ති.

**දෙවාචවන සුත්තං, දෙවාචවන සූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයයි;**

---

භගවතා-පෙ- භික්ඛවෙ, මහණෙනි! ඉමානි තීණි සුඛානි, මේ සැපතුන; පත්ථයමානො, පතන්නේ; පණ්ඩිතො, පණ්ඩිතෙම; සීලං, සීලය; රක්ඛෙය්‍ය, රකින්නේය; තීණි, ඒතුන; කතමානි, කවරහුදයත්;? මෙ; මට; පසංසා, ප්‍රශංසාව; ආගච්ඡතු ඉති,

සීලං රක්ඛෙය්‍ය මෙධාවී — පත්ථයානො තයො සුඛෙ
පසංසං විත්ත ලාභඤ්ච — පෙච්ච සග්ගෙ පමොදනං

අකරොන්තොපි චෙ පාපං — කරොන්තමුප සෙවති
සංකියො හොති පාපස්මිං — අවණ්ණො චස්ස රූහති.

යාදිසං කුරුතෙ මිත්තං — යාදිසං චූපසෙවති
සවෙ තාදිසකො හොති — සහවාසොහි තාදිසො

---

පැමිණේවයි; පණ්ඩිතො, පණ්ඩිත තෙම; සීලං, සීලය; රක්ඛෙය්‍ය, රකින්නේය; මෙ මට; භොගා, වස්තූහු, උප්පජ්ජන්තු ඉති, උපදිත්වායි; පණ්ඩිතො, පණ්ඩිතතෙම, සීලං, සීලය; රක්ඛෙය්‍ය, රකින්නේය; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; මරණාපරං, මරණින් මතු; සුගතිං, යහපත් පැමිණීමක්වූ; සග්ගං ලොකං, ස්වර්ග ලෝකයට; උප්පජ්ජිස්සාමි ඉති, උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමියි; පණ්ඩිතො, පණ්ඩිත තෙම; සීලං, සීලය; රක්ඛෙය්‍ය, රකින්නේය; භික්ඛවෙ, මහණෙනි! ඉමානි, මේ; (කියනලද) තීණි සුඛානි ඛො, සැපතුන වනාහි; පත්ථයමානො; පතන්නාවූ; පණ්ඩිතො, පණ්ඩිත තෙම; සීලං, සීලය; රක්ඛෙය්‍ය ඉති, රකින්නේයයි; එතංඅත්ථං, මේ කාරණය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළසේක; තත්ථ-පෙ-

මෙධාවී, පණ්ඩිත තෙම; පසංසං, ප්‍රශංසාවද; විත්ත ලාභඤ්ච, වස්තුලාභයද; පෙච්ච, පරලොවැ; සග්ගෙ, ස්වර්ගයෙහි; පමොදනං, සතුටුවීමද; (යන) තයො සුඛෙ, සැපතුන; පත්ථයානො, ප්‍රාර්ථනා කරමින්; සීලං, සීලය; රක්ඛෙය්‍ය, රකින්නේය;

චෙ, ඉදින්; පාපං, පාපයක්; අකරොන්තොපි, නොකරන්නේද; කරොන්තං, කරන්නෙකු; උපසෙවති, සේවනය කෙරේද; පාපස්මිං, පාපයෙහි; සංකියො හොති, සැකකටයුත්තෝ වෙයි; අස්ස, ඔහට; අවණ්ණොච; අකීර්තියද; රූහති, හටගනී;

යාදිසං, යම්බඳු පුද්ගලයක්හු; මිත්තං කුරුතෙ, මිත්‍රයකු කෙරේද; යාදිසං, යම්බඳු පුද්ගලයක්හු; උපසෙවතිච, සේවනයත් කෙරේද; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; තාදිසකො හොති, (කායවාක් මනොකර්මයන්ගෙන්) එබන්දෙක්වෙයි; සහවාසොහි, එක්ව විසීමතම්; තාදිසො, එබඳුයි;

සෙවමානො සෙවමානං— සම්ඵුට්ඨො සම්ඵුසං පරං
සරොදිද්ධො කලාපංව— අලිත්ත මුපලිම්පති

උපලෙපභයා ධීරො— නෙව පාප සඛා සියා
පූති මච්ඡං කුසග්ගෙන— යො නරො උපනය්හති

කුසා පි පූතිවායන්ති—එවං බාලූප සෙවනා
තගරඤ්ච පලාසෙන —යො නරො උපනය්හති

පත්තාපි සුරභි වායන්ති— එවං ධීරූප සෙවනා
තස්මා පත්ත පුටස්සෙව— ඤත්වා සම්පාක මත්තනො

අසන්තෙ නොප සෙවෙය්‍ය— සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතො
අසන්තො නිරයං නෙන්ති— සන්තො පාපෙන්ති සුගතින්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

පට්ඨාන සුත්තං.

---

සෙවමානං, (කලින්කල තමා) සෙවුනාවූද; සම්ඵුසං, (කලින් කල තමා) ගැටුනාවූද; පරං, අන්‍ය පුද්ගලයා; සෙවමානො, ඔහු විසින් සේවනයකරනු ලබන්නාවූ; සම්ඵුට්ඨො, ඔහු හා ගැටුනාවූ පාපපුද්ගලතෙම; දිද්ධො, විසපොවන ලද්දාවූ; සරො, හීයතෙම; අලිත්තං, විසනො තැවරුණාවූ; කලාපං, (ඊසමූහ සංඛ්‍යාතවූ) ශර කලාපය; උපලිම්පති ඉව, තවරන්නාක්මෙන්වෙයි;

(එහෙයින්) ධීරො, පණ්ඩිතතෙම; උපලෙපභයා, තැවරීමේ භය කරණකොට ගෙණ; පාපසඛො, පවිටුයහලුවන් ඇත්තෙක්; නෙව සියා, නොමවන්නේය; කුසග්ගෙන, කුසතෘණාග්‍රයෙන්; පූති මච්ඡං, කුණුවූමස; යො නරො, යම් මිනිසෙක් තෙම; උපනය්හති, (පුටබන්ධන වශයෙන්) බඳීද; කුසාපි, කුසතෘණයෝද; පූති වායන්ති, කුණුගඳවහනය වෙත්ද; බාලූපසෙවනා, බාලයාසේවනය කිරීම; එවං, එසේය;

යො නරො, යම් මිනිසෙක්තෙම; තගරඤ්ච, තුවරලාද; පලාසෙන, පත්‍රයකින්; උපනය්හති, බඳීද; පත්තාපි, පත්‍රයෝද; සුරභි වායන්ති, සුවඳ වහනය වෙත්ද; ධීරූපසෙවනා, පණ්ඩිත සේවනය, එවං, එසේය; තස්මා, එහෙයින්; පත්තපුටස්ස ඉව, පත්‍රපුටයාගේ දුගඳ සුගඳමෙන්; අත්තනො, තමහට; සම්පාකං, විපාකය; ඤත්වා, දැන; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අසන්තෙ, අසත්පුරුෂයන්; නොප සෙවෙය්‍ය, සේවනය නොකරන්නේය;—

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං-මා **භික්ඛවෙ** පුඤ්ඤානං භායිත්ථ සුඛස්සෙතං භික්ඛවෙ අධිවචනං ඉට්ඨස්ස කන්තස්ස පියස්ස මනාපස්ස යදිදං පුඤ්ඤානීති, අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ දීඝරත්තං කතානං පුඤ්ඤානං දීඝරත්තං ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං සත්ත වස්සානි මෙත්ත චිත්තං භාවෙත්වා සත්ත සංවට්ට විවට්ට කප්පෙ නයිමං ලොකං පුනරාගමාසිං සංවට්ටමානෙ සුදං **භික්ඛවෙ** කප්පෙ ආභස්සරූපගො හොමි විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි.

---

සන්තෙ, සත්පුරුෂයන්; සෙවෙය්‍ය, සේවනය කරන්නේය; අසන්තො, අසත්පුරුෂයෝ තුමූ; නිරයං, නරකයට; නෙන්ති, (ඇසුරුකරන්නහු) පමුණුවත්; සන්තො, සත්පුරුෂයෝ තුමූ; සුගතිං, සුගතියට; පාපෙන්ති, පමුණුවත්;—

අයම්පි-පෙ- සුතන්ති.

**පට්ඨාන සුත්තං— පට්ඨාන සූත්‍ර පදාර්ථ ව්‍යාඛ්‍යානයයි;**

---

භගවතා-පෙ- භික්ඛවෙ, මහණෙනි! පුඤ්ඤානං; පුණ්‍යයන් කෙරෙන්; මා භායිත්ථ, භයනොවව්; **භික්ඛවෙ** මහණෙනි! යං ඉදං, යම් මේ; පුඤ්ඤානි, ත්‍රෛභූමක කුශල ධර්මකෙනෙක් ඇද්ද; ඉට්ඨස්ස, ඉෂ්ට විපාක ඇත්තාවූ; කන්තස්ස, කැමැතිවූ; පියස්ස, ප්‍රියවූ; මනාපස්ස, මනාපවූ; සුඛස්ස, සැපයට; එතං අධිවචනං, මේ නාමෙක; භික්ඛවෙ, මහණෙනි! අහං ඛො පන, මම වනාහි; දීඝරත්තං, බොහෝ කාලයක් මුළුල්ලෙහි; කතානං, (මාවිසින්) කරණලද්දාවූ; පච්චනුභූතං, නැවත නැවත අනුභවකරණලදුවූ; පුඤ්ඤානං කුශලයන් සම්බන්ධිවූ; ඉට්ඨං, ඉෂ්ටවූ; කන්තං, කැමැතිවූ; පියං ප්‍රියවූ; මනාපං, මනාපවූ; විපාකං, සුඛවිපාකය; දීඝරත්තං, බොහෝ කාලයක් මුලුල්ලෙහි; අභිජානාමි; මනාව දනිමි, සත්ත වස්සානි, සත්අවුරුද්දක් මුලුල්ලෙහි; මෙත්ත චිත්තං, මෛත්‍රී සිත; භාවෙත්වා, වඩා; සත්ත සංවට්ට විවට්ටකප්පෙ, සප්ත සංවර්ත විවර්තකල්පයක්; (හෙවත් මහා කල්ප හතක්) ඉමං ලොකං, මේ (කාම) ලෝකයට; පුන, නැවත; න අගමාසිං, නොආයෙමි; භික්ඛවෙ, මහණෙනි! කප්පෙ, කප; (හෙවත් ලොව) සංවට්ටමානෙ සුදං, විනාසවනකල්හි; ආභස්සරූපගො හොමි, ආභස්සර බඹ ලොවට පැමිණියේ වෙමි; කප්පෙ, කල්පය; (හෙවත් ලොව) විවට්ටමානෙ, වැඩෙන කල්හි; සුඤ්ඤං බ්‍රහ්ම විමානං, සූන්‍ය බ්‍රහ්ම විමානයකට; උපපජ්ජාමි, උත්පත්ති වශයෙන් පැමිණියෙමි;

තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා හොමි මහා බ්‍රහ්මා අභිභූ අනභිභූතො, අඤ්ඤදත්ථු දසො වස වත්තී ඡත්තිං සක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො, අනෙක සතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො කො පන වාදො පදෙසරජ්ජස්ස තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි කිස්ස නු ඛො මෙ ඉදං කම්මස්ස ඵලං කිස්ස කම්මස්ස විපාකො යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවොති, තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි තිණ්ණං ඛො මෙ ඉදං කම්මානං ඵලං තිණ්ණං කම්මානං විපාකො යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවො සෙය්‍යථිදං දානස්ස දමස්ස සංයමස්සාති-එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

---

භික්ඛවෙ, මහණෙනි! තත්‍ර සුදං, එහිද; අභිභූ, අනුන් මැඩ පවත්වන්නාවූ; අනභිභූතො, (ඔවුන් විසින් කිසි ගුණයකින්) නොමඩනා ලද්දාවූ; අඤ්ඤදත්ථුදසො, ඒකාන්තයෙන් (අභිඥා ඤාණය කාරණකොට දක්නා සුලුවූ; වසවත්තී; (සෙසු බඹුන් ඉර්ධිපාද භාවනා බලයෙන්) තමා වසඟයෙහි පවත්වන්නාවූ; මහා බ්‍රහ්මා, බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්ම පුරොහිතයන්ට වඩා) මහත් බ්‍රහ්මවූ; බ්‍රහ්මා හොමි, බ්‍රහ්ම වෙමි. භික්ඛවෙ, මහණෙනි! අහං ඛො පන; මම වනාහි; ඡත්තිං සක්ඛත්තුං, සතිස්වරක්; දෙවානං, දෙවියන්ට, ඉන්දො, ඉන්ද්‍රවූ; සක්කො අහොසිං, ශක්‍රවූයෙමි ධම්මිකො, ධර්මයෙන් හැසිරෙන්නාවූ; ධම්මරාජා, දැහැමින්ම රාජ්‍යය ලැබ රජවූ; චාතුරන්තො, චතුස්සාගරය කෙළවරකොට ඇත්තාවූද සතර මහ දිව යිනින් හෙබියාවූද) පෘථිවියට අධිපතිවූ; විජිතාවී, (ආධ්‍යාත්මික) සසමිතුරන් හා බාහිර රජුන්ද ජයගත්තාවූ; ජනපදත්ථාවරියප්පත්තො, ජනපදයෙහි ස්ථිරභාවයට පැමිණියාවූ; සත්තරතන සමන්නාගතො, (චක්‍රරත්නාදී) සප්තවිධ රත්නයන්ගෙන් යුක්තවූ; චක්කවත්ති රාජා අහොසිං, චක්‍රවර්ති රජවූයෙමි; පදෙසරජ්ජස්ස, ප්‍රදේශ රාජ්‍යය සම්බන්ධ සඞ්ඛ්‍යාව; කො පන වාදො, කියනුම කවරේද? භික්ඛවෙ, මහණෙනි! තස්ස මය්හං, ඒ මට; යෙන, යම්කින්; අහං, මම; එතරහි, මේ කාලයෙහි; එවං, මෙසේ; මහිද්ධිකො, මහත් ඉර්ධි ඇත්තේවෙම්ද; එවං, මෙසේ; මහානුභාවො, මහත් ආනුභාව ඇත්තේවෙම්ද; ඉදං ඵලං, මේ විපාකය; මෙ, මාගේ; කිස්ස නු ඛො කම්මස්ස ඵලං, කවරකර්මයක්හුගේ ඵලයක්දෝ; කිස්ස කම්මස්ස, කවරකර්මයක්හුගේ; විපාකො ඉති, විපාකයෙක්

පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය— ආයතග්ගං සුඛුද්‍රියං
දානඤ්ච සමචරියඤ්ච— මෙත්ත චිත්තඤ්ච භාවයෙ

එතෙ ධම්මෙ භාවයිත්වා— තයො සුඛ සමුද්‍රයෙ
අබ්‍යාපජ්ජං සුඛං ලොකෙ— පණ්ඩිතො උපපජ්ජතීති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

මාපුඤ්ඤභායි සුත්තං

---

ද්‍යෝතියි; එතං, මේ සිත; අහොසි, වූයේය; භික්ඛවෙ, මහණෙනි! තස්ස මයහං, ඒමට; යෙන, යමක් කරණකොට ගෙණ, අහං, මම; එතරහි, මේ කාලයෙහි; එවං, මෙසේ; මහිද්ධිකො, මහත් ඉර්ධි ඇත්තේවෙම්ද; එවං, මෙසේ; මහානුභාවො, මහත් ආනුභාව ඇත්තේවෙම්ද; (එය) මෙ, මාගේ; තිණ්ණං කම්මානං, ත්‍රිවිධ කර්මයන්ගේ; (විපාකය) සෙය්‍යථිදං, ඔහු කවරහුදයත්;? දානස්ස, දානයාගේද; දමස්ස, ඉන්‍ද්‍රිය දමනයාගේද;

සංයමස්ස, කායවාක් සංයමයාගේද; (යත) තිණ්ණං කම්මානං බො, ත්‍රිවිධ කර්මයන්ගේ වනාහි; ඉදං, මේ; ඵලං, ඵලයයි; විපාකො, විපාකයයි; එතං, මේ සිත; අහොසි ඉති, වූයේයයි; එතමත්‍ථං- පෙ-

තමහට වැඩ කැමැති යම් කුලපුත්‍රයෙක් ඇද්ද) සො, හෙතෙම; ආයතග්ගං, අනාගතයෙහි උතුම්වූ; සුඛුද්‍රියං, සැප විපාක ඇත්තාවූ; පුඤ්ඤං එව, (ත්‍රිවිධ) කුශලයම; සික්ඛෙය්‍ය, රැස්කරන්නේය; දානඤ්ච, දානයද; සමචරියඤ්ච, සමව හැසිරීමද; මෙත්ත චිත්තඤ්ච, මෛත්‍රී සිතද; භාවයෙ, වඩන්නේය;

සුඛ සමුද්‍රයෙ, සැප අනුසස් ඇත්තාවූ; එතෙ, මේ; තයො ධම්මෙ, කුශල ධර්මත්‍රය; භාවයිත්වා, වඩා; පණ්ඩිතො, පණ්ඩිත තෙම; අබ්‍යාපජ්ජං, නිදුක්වූ; සුඛං, (ධ්‍යාන සමාපත්ති වශයෙන් සැප බහුල බැවින් ඒ කාගත) සැප ඇති; ලොකං, බ්‍රහ්මලෝකය ටට; උපපජ්ජති ඉති, උත්පත්තිවශයෙන් පැමිණේයයි;—
අයම්පි- පෙ- සුතන්ති.

මාපුඤ්ඤභායි සුත්තං,- මාපුඤ්ඤභායි සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.

වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙසුතං එක ධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨ ධම්මි කඤ්චෙව අත්ථං සම්පරායි කඤ්ච,

කතමො එකධම්මො අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨ ධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති- එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

අප්පමාදං පසංසන්ති— පුඤ්ඤකිරියාසු පණ්ඩිතා
අප්පමත්තො උභො අත්ථෙ— අධිගණ්හාති පණ්ඩිතො

---

භගවතා -පෙ- භික්ඛවෙ, මහණෙනි! එක ධම්මො, එකධර්ම යක් තෙම; (යමෙකු විසින්) භාවිතො; වඩනලද්දේද; (නොහොත් උපදවනලද්දේද;) බහුලීකතො, නැවත නැවත කරණලද්දේද; (හෙතෙම) දිට්ඨ ධම්මිකඤ්චෙව එව අත්ථං. ඉහාත්ම භාවයෙහි වන වැඩද; සම්පරායිකඤ්ච, පරලෙව්හි වන වැඩද; (යන) උභො අත්ථෙ, අර්ථදෙක; සමධිගය්හ, මනාකොට අල්වාගෙණ අත්නො හැර; තිට්ඨති, සිටී;

එකධම්මො. (ඒ) එක ධර්මයතෙම; කතමො, කවරේද;? අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු, කුශලධර්මයන්හි ප්‍රමාද නොවීමය; භික්ඛවෙ, මහණෙනි! අයං එකධම්මො ඛො, මේ එකධර්මයතෙම වනාහී; (යමෙකු විසින්) භාවිතො, වඩනලද්දේද; (නොහොත් උපදවනලද්දේද) බහුලීකතො, නැවත නැවත බොහෝකරණලද්දේද; (හෙතෙම) දිට්ඨධම්මිකඤ්ච එව අත්ථං, ඉහාත්ම භාවයෙහි වන වැඩද; සම්පරායිකඤ්ච, පරලෙව්හිවන වැඩද; (යන) උභො අත්ථෙ, අර්ථදෙක; සමධිගය්හ, මනාකොට අල්වාගෙණ; (අත් නොහැර) තිට්ඨති ඉති, සිටීයයි; එතමත්ථං -පෙ-

පණ්ඩිතා, (බුද්ධාදී) පණ්ඩිතයෝ; පුඤ්ඤකිරියාසු, පුණ්‍ය ක්‍රියා වන්හි; අප්පමාදං, ප්‍රමාද නොවීම; පසංසන්ති, ප්‍රසංශා කොරෙත්; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අප්පමත්තො, (කුශල ධර්ම යන්හි ස්මෘති විප්‍රවාසයෙන්) ප්‍රමාදනොවූයේ; උභො අත්ථෙ, (දෘෂ්ටධාර්මික සාම්පරායික) අර්ථදෙක; අධිගණ්හාති, දැඩිකොට ගණී; (ඒ අර්ථදෙක කවරහුදයත්?)

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො— යො චත්ථො සම්පරායිකො
අත්ථාභි සමයා ධීරෝ— පණ්ඩිතොති පවුච්චතීති.
අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති

අප්පමාද සුත්තං

———

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ- අථඛො සම්බහුලා සතුල්ලප කායිකා දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙ නුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

---

දිට්ඨෙව ධම්මෙ, ඉහාත්ම භාවයෙහි; යො අත්ථො, යම් අර්ථ යක්වේද; සම්පරායිකො, පරලෙව්හිවන; යොචත්ථො, යම් අර්ථ යකුත් වේද; (මේ දෙකයි) අත්ථාභි සමයා අර්ථය ලැබීමෙන්; ධීරො, ප්‍රාඥතෙම; පණ්ඩිතො ඉති, පණ්ඩිතයයි, පවුච්චති ඉති, කියනුලැබේයයි; අයම්පි –පෙ–

**අප්පමාද සුත්තං, අප්‍රමාද සූත්‍ර ව්‍යාඛ්‍යානයයි;**

මෙ, මාවිසින්; (මේ සතුල්ලපායික සූත්‍රය) එවං සුතං, මෙසේ අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා; භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි; අනාථපිණ්ඩිකස්ස, අනේපිඩු මහසිටුහුගේ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; ආරාමෙ, විහාරයෙහි; විහරති, වැඩවාසයකර වදාරනසේක;

අථ ඛො, ඉක්බිත්තෙන්; සම්බහුලා, බොහෝවූ; සතුල්ලප කායිකා දෙවතායො, (සත්පුරුෂ ධර්මය සමාදානවශයෙන්. ස්වර්‍ග සවර්ගයෙහි උපන් හෙයින්,) සතුල්ලපකායික නම්වූ දෙවතාවෝ; අභික්කන්තාය රත්තියා, පළමු දසපැය ඉකුත්වූ රාත්‍රියෙහි; අභික්කන්තවණ්ණා, විශිෂ්ටවූ ශරීර වර්ණයෙන්; කෙවල කප්පං ජෙතවනං, හාත්පසින් ජෙතවනය; ඔභාසෙත්වා, බබුලුවා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැනට; උපසංකමිංසු, එළඹුනාහුය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං; භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනා කොට වැඳ; එකමන්තං, එකත්පසෙක; අට්ඨංසු, සිටියාහුය; එකමන්තං, එකත්පසෙක; ඨිතා ඛො, සිටියාමවූ; එකා දෙවතා; **එක් දෙවතාවෙක් තොම; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීවාය;**

සබ්භිරෙව සමාසෙථ— සබ්භිකුබ්බෙථ සන්‍ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය— සෙය්‍යො හොති න පාපියො

අපර දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි

සබ්භිරෙව සමාසෙථ – සබ්භිකුබ්බෙථ සන්‍ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය – පඤ්ඤා ලබ්භති නාඤ්ඤතො

අපර දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:—

සබ්භිරෙව සමාසෙථ– සබ්භි කුබ්බෙථ සන්‍ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය– සොක මජ්ඣෙ න සොචති

අපර දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:—

සබ්භිරෙව සමාසෙථ– සබ්භිකුබ්බෙථ සන්‍ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය– ඤාතිමජ්ඣෙ විරොචති

---

සබ්භි එව, (පණ්ඩිත) සත්පුරුෂයන් සමඟම; සමාසෙථ, එක්ව හිඳින්නේය; (සත්පුරුෂයන් සමඟ සියලු ඉරියව් පවත්වන්නේ යයි සේයි) සබ්භි, (බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ රහත් ශ්‍රාවකාදී) සත්පුරුෂයන් සමග; සන්‍ථවං, මිත්‍රසන්‍ථවය; කුබ්බෙථ, කරන්නේය; (තෘෂ්ණා සන්‍ථවය කිසිවකු සමඟත් නොකටයුතුය) සතං, බුද්ධාදී සත්පුරුෂයන්ගේ; සද්ධම්මං, (පන්සිල් දසසිල් සතරසතිපට්ඨානාදී) සද්ධර්මය; අඤ්ඤාය, දැන; (එසේ පිළිපන්නහුට) සෙය්‍යො හොති, යහපත (අභිවෘද්ධිය) වෙයි; න පාපියො, (කිසි) අයහපතක් (අනභිවෘද්ධියක්) නොවෙයි;

අපර දෙවතා, අන්‍යවූ දෙවතාවෙක් තොම; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; ඉමං ගාථං, මෙ ගාථාව; අභාසි, කීවාය;

සබ්භි එව, සාධූන් සමඟම; සමාසෙථ, එක්ව හිඳීම් ආදිය කරන්නේය; සබ්භි, සත්පුරුෂයන් හා; සන්‍ථවං, මිත්‍රසන්‍ථවය; කුබ්බෙථ, කරන්නේය; සතං, සාධූන්ගේ; සද්ධම්මං, සද්ධර්මය; අඤ්ඤාය, දැන; (පිළිපන්නහුට) පඤ්ඤා, (ලෞකික ලොකොත්තර) ප්‍රඥව; ලබ්භති, ලැබෙයි; අඤ්ඤතො, අඥයා කෙරෙන්; න, ප්‍රඥව නොලැබෙයි;

අපර දෙවතා, අන්‍යවූ දෙවතාවෙක් තොම –පෙ– අභාසි, කීය;

සබ්භි එව, සාධූන් සමඟම; –පෙ– සොක මජ්ඣෙ, සොක වස්තූන් අතුරෙහි හෝ සෝකානුගත සත්වයන් මැද; නසොචති, සොක නොකරයි;

අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:-

සබ්භිරෙව සමාසෙථ— සබ්භි කුබ්බෙථ සන්ථවං
සතං සද්ධම්මමඤ්ඤාය— සත්තා ගච්ඡන්ති සුගතින්ති.

අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:—

සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය- සත්තා තිට්ඨන්ති සාතතන්ති

අථ ඛො අපරා දෙවතා භගවන්තං එතද වොච. කස්ස නුඛො භගවා සුභාසිතන්ති- සබ්බාසං වො සුභාසිතං පරියායෙන අපිච මමම්පි සුණාථ.

සබ්භිරෙව සමාසෙථ- සබ්භිකුබ්බෙථ සන්ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය- සබ්බ දුක්ඛා පමුච්චතීති -

ඉදමවොච භගවා අත්තමනා තා දෙවතායො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු ති.

පඨම සතුල්ලපකායික සුත්තං

—:—

---

අපරා, අන්‍යවූ —පෙ— අභාසි, කීය;

සබ්භි එව, සාධූන් සමහම; -පෙ- ඤාතිමජ්ඣ, නෑ සමූහයා මැද; විරොචති, බබලයි;

අපරා, අන්‍යවූ -පෙ- අභාසි, කීය;

සබ්භි එව, සාධූන් සමහම; -පෙ- සත්තා, සත්වයෝ; සුගතිං, සුගතියට ගච්ඡන්ති, යෙත්;

අපරා, අන්‍යවූ; —පෙ— අභාසි, කීය;

සබ්භි එව, සාධූන් සමහම; -පෙ- සත්තා, සත්වයෝ; සාතතං, බොහෝ කල් සැපසේ; තිට්ඨන්ති, සිටිත්;

අථ ඛො, ඉක්බිති; අපරා දෙවතා, අන්‍යවූ දෙවතාවෙක්තොම්; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේ වචනය; අවොච, කීය; භගවා, භාග්‍යවතුන් වහන්ස! සුභාසිතං, යහපත් භාසිතය; කස්සනු ඛො ඉති කවරක්හුගේදැයි; (යනුයි) පරියායෙන, කාරණාවශයෙන්; සබ්බාසං වො, තොපසියල්ලන්ගේ; සුභාසිතං; යහපත් භාසිතයයි; අපි ච, එතකුදුවුවත්; මම අපි, මාගේ වචනයද; සුණාථ, අසව්;

සබ්භි එව, සාධූන් සමහම; -පෙ- සබ්බ දුක්ඛා, සියලු සංසාර දුකින්; පමුච්චති ඉති, මිදේයයි;

භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ ගාථාධර්මය; අවොච, වදාළසේක; (ඊට) අත්තමනා, සතුටු සිත් ඇත්තාවූ; තා දෙවතායො, ඒ (සතුල්ල පායිකා නම්වූ) දෙවතාවෝ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණාකොට; තත්ථ එව, එහිම; අන්තරධායිංසු ඉති, අන්තර්ධාන වූවාහුයි;

පඨමසතුල්ල පායිකා සුත්තං,

ප්‍රථම සතුල්ල පකායිකා සූත්‍ර ව්‍යාඛ්‍යානයයි;

සාවත්ථි නිදානං—අථ ඛො සම්බහුලා සතුල්ලපකායිකා දෙවතා යො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

මච්ඡෙරා ච පමාදා ච — එවං දානං න දීයති
පුඤ්ඤමාකඞ්ඛමානෙන — දෙය්‍යං හොති විජානතාති

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි

යස්සෙව භීතො න දදාති මච්ඡරී—තදෙවාදදතො භයං
ජිඝච්ඡා ච පිපාසා ච— යස්ස භායති මච්ඡරී
තමෙව බාලං ඵුසති— අස්මිං ලොකෙ පරම්හි ච
තස්මා විනෙය්‍ය මච්ඡෙරං—දජ්ජා දානං මලාභිභූ
පුඤ්ඤානි පරලොකස්මිං—පතිට්ඨා හොන්ති පාණිනන්ති

---

සාවත්ථි නිදානං, අථඛො -පෙ-

මච්ඡෙරා ච, (ස්ව සම්පත් නිගූහණ ලක්‍ෂණවූ) මාත්සර්‍ය්‍ය හෙතු කොටගෙණද; පමාදා ච, (සමෘති විප්‍රවාස ලක්‍ෂණවූ) ප්‍රමාදය හේතු කොටගෙණද; එවං, මෙසේ; (යස සම්පත්ති සුඛ දායකවූ) දානං) දානය; න දීයති, පරිත්‍යාගනොකරනු ලැබෙයි; (දන් නොදෙනු ලැබේ) පුඤ්ඤං, (පූර්වචෙතනාදී භෙදභින්නවූ) පින; ආකඞ්ඛමානෙන, කැමැත්තාවූ; විජානතා, (දන්දීමේ ඵල) දන්නහු විසින්; දෙය්‍යං හොති ඉති, දන්දියයුතු වේයයි කී.

අථ ඛො, ඉක්බිතිව; අපරාදෙවතා, අන්‍ය දෙවතාවෙක් තොම; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කී;

මච්ඡරී, මසුරු පුද්ගලතෙම; යස්ස, ක්‍ෂුධා (පිපාසා සඞ්ඛ්‍යාත) යම් භයකින්; භීතො එව, බියපත්වූයේම; න දදාති, (අනුන්ට කිසිවක්) නොදේද; අදදතො, (එසේ) නොදෙන මසුරුට; තං එවභයං, ඒ (ක්‍ෂුධා පිපාසා සඞ්ඛ්‍යාතවූ) භයම, (පැමිණියේ) වෙයි; මච්ඡරී, මසුරු පුද්ගල තෙම; යස්ස, යම් (ක්‍ෂුධා පිපාසා සඞ්ඛ්‍යාත) භය, කාරණයකින්; භායති, බියවේද; ජිඝච්ඡා ච, (ඒ) ක්‍ෂුධා තොමෝද; පිපාසාව, පවස් තොමෝද; තං එව බාලං, එම බාලයා; අස්මිං ලොකෙ, මේ ලෙව්හිද; පරම්හි ච, පරලොව්හිද; ඵුසති, ස්පර්ශ කොරෙයි; (ලුහුබඳියි)

තස්මා, එහෙයින්; මච්ඡෙරං, මසුරුමල; විනෙය්‍ය, දුරුකොට; මලාභිභූ, මසුරුමල මැඩපවත්වන්නෙක්ව; දානං, දානය; දජ්ජා, දෙන්නේය; පුඤ්ඤානි, පුණ්‍යයෝ; පරලොකස්මිං, පරලෙව්හිදී පාණිනං, සත්ත්වයන්ට; පතිට්ඨා හොන්ති ඉති, පිහිට වෙත් යයි කී;

**අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.**

තෙ මතෙසු නමීයන්ති— පන්ථානංව සහබ්බජං
අප්පස්මිං යෙ පවෙච්ඡන්ති— එස ධම්මො සනන්තනො
අප්ප සෙමකෙ පවෙච්ඡන්ති—බහු තෙකෙ න දිච්ඡරෙ
අප්පස්මා දක්ඛිණා දින්නා—සහස්සෙන සමං මිතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

දුද්දදං දද මානානං-- දුක්කරං කම්ම කුබ්බතං
අසන්තො නානුකුබ්බන්ති—සතං ධම්මො දුරන්නයො
තස්මා සතඤ්ච අසතඤ්ච—නානා හොති ඉතො ගතී
අසන්තො නිරයං යන්ති—සන්තො සග්ග පරායනාති

---

අථඛො, ඉක්ඛිතිව-පෙ-අභාසි, කි; පන්ථානං වජං, කාන්තාර මාර්ගී ප්‍රතිපන්නවූ; යෙ, යම්කෙනෙක්තුමූ; සහඉව, තමන්සමහයන අන් මගීන්ට(ස්වල්පවූදේ නුමුත් බෙදාදෙන්නාක්)මෙන්; අප්පස්මිං, ස්වල්ප දෙයධර්මය ඇතිකල්හිත්; පවෙච්ඡන්ති, සංවිභාගකොට දෙද්ද; තෙ, ඒ දාන සීලි පුද්ගලයෝතුමූ; මතෙසු, (අදානසීලි පුද්ගලයන් අදානසීලතා මරණයෙන්) මළකල්හි; නමීයන්ති, නොමියත්; එසො ධම්මො, මේධර්මයතෙම; සනන්තනො, පෞරාණික ධර්මයයි; නොහොත් සාධූන්ගේ ධර්මයයි.

එකෙ, ඇතැම්කෙණෙක්; අප්පමීං, ස්වල්ප දෙයධර්මයක්ඇති හිදූ, පවෙච්ඡන්ති, (දන්) දෙත්; එකෙ ඇතැම්කෙණෙක්; බහුනා, බොහෝ භොගයෙන් යුක්තවූවාහුද; න දිච්ඡරෙ,(දන්)නොදෙත්; අප්පස්මා, මදදෙයින්; දින්නා දෙනලද්දාවූ; දක්ඛිණා, දක්ෂිණා තොමෝ; සහස්සෙනසමං, දහසක් සමහ; මිතාඉති ප්‍රමාණකරණ ලද්දීය; සහශ්‍රදාන සදෘසයයිකි; අථඛො, -පෙ-අභාසි, කි,

අසන්තො අසත්ජනයෝතුමූ; දදමානානං, (කම්පලඅදහා) දෙන්නාවූ (සත්පුරුෂය)න්ගේ; (දානය) දුද්දදං. දුකසේ දියයුතුය,(හෙවත්) දෙන්ට දුෂ්කරය; (එහෙයින්) දදමානානං, දන් දෙන්නාවූ; දුක්කරං කම්මං (එසේ) දුෂ්කරවූ සුචරිතක්‍රියා; කුබ්බතං, කරන්නාවූ; (සත්පුරුෂයන්ට) නඅනුකුබ්බන්ති, අනුගතක්‍රියා නොකෙරෙත්; සතං, සත්පුරුෂයන්ගේ; ධම්මො, දශකුශලකර්මපථධර්මයතෙම; දුරන්නයො, (අසත්පුරුෂයන්විසින්) අනුව යාහැකිනොවේ; (පිරියහැකිනොවේ)

තස්මා, එහෙයින්; සතඤ්ච, සාධූන්ගේද; අසතඤ්ච, අසාධූන්ගේද; ඉතො, මේ මනුෂ්‍යාත්මභාවයෙන්; ගති, (උත්පත්තිය පිණිස අනන්තරභවයකටවූනව)යාම; නානාහොති, වෙනස්වේ; (කෙසේදයත්) අසන්තො, අසත්පුරුෂයෝ; නිරයං, නරකයට; යන්ති, (උත්පත්තිවශයෙන්) යෙත්; සන්තො, සත්පුරුෂයෝ; සග්ගපරායනා, ස්වර්ගීපරායණවෙත්;

අථඛො අපරා දෙවතා භගවන්තං එතදවොච කස්සනුඛො භගවා සුභාසිතන්ති සබ්බාසං වො සුභාසිතං පරියායෙන අපිච මමම්පි සුණාථ.

ධම්මඤ්චරෙ යොපි සමුඤ්ජකඤ්චරෙ-දාරඤ්ච පොසං දදමප්පකස්මිං සතං සහස්සානං සහස්සයාගිනං— කලම්පිනාග්ඝන්ති තථාවි ධස්ස තෙති

අථ ඛො අපරා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි: –

කෙනෙස යඤ්ඤො විපුලො මහග්ගතො
සමෙන දින්නස්ස න අග්ඝමෙති
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙති.

---

අථඛො, ඉක්බිතිව; අපරා දෙවතා, අන්‍යදෙවතාවෙක්තොම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; භගවා, භාග්‍යවතුන්වහන්සෙ; සුභාසිතං, යහපත් භාසිතය; කස්සනුඛොඉති, කවරෙක්හුගේදැයි; එතං, මෙය; අවොච. කීය; පරියායෙන, කාරණාවශයෙන්; සබ්බාසං වො, තොප සියල්ලන්ගේ; සුභාසිතං, යහපත් භාසිතයි; අපිච, එතකුදුවුවත්; මමං අපි, මාගේ (වචනය)ද; සුණාථ, අසව්;

යො අපි, යමෙක්තමේත්; සමුඤ්ජකඤ්චරෙ, උඤ්ජාචාරි යෙහි හැසිරෙන්නේ, (හෙවත් කලවිටිසුඩකිරිම් බොල් පෙරළීම් ආදීවශයෙන් දුකසේ පවත්වන ජීවිකාවෘත්ති ඇත්තේ) දාරඤ්ච අඹු දරුගණයාද; පොසං, (දුකසේ) පොෂණයකරන්නේ; අප්පකස්මිං, ස්වල්පවූ දෙයධම් (පලාකොල පමණවත්) ඇති කල්හී; දදං, (මහණ බමුණන්ට සංවිභාගකොට) දෙමින්; ධම්මඤ්චරෙ, (දානාදී) කුශලකර්මපථයෙහි හැසිරෙන්නේද; සහස්සයාගිනං, දහසක් භික්ෂූන්ට දුන්දන්ඇති; දෙහෝ නොහොත් කහවනු දහසකින් නිපන්දන්ඇති; සතංසහස්සානං, ලක්ෂයක්දෙනොකුන්ගේ; (හෙවත් භික්ෂූන් දසකෙළකට හෝ කහවනු දසකෙළකින් දුන්නාංවූ) තෙ, ඒ දානයෝතුමූ; තථාවිධස්ස, එබඳුදිළිඳුන්ගේ දානය සම්බන්ධ; කලංඅපි, සියෙන්කොටසකටත්, න අග්ඝන්ති, නොවටිත්;

අථඛො, ඉක්බිතිව; අපරාදෙවතා, අන්‍යදෙවතාවෙක්තොම භගවන්තං භාග්‍යවතුන්වහන්සේට, ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, කී;

අථ ඛො භගවා තං දෙවතං ගාථාය අජ්ඣභාසි:-

දදන්ති හෙකෙ විසමෙ නිවිට්ඨා
ඡෙත්වා වධිත්වා අථ සොචයිත්වා
සා දක්ඛිණා අස්සුමුඛා සදණ්ඩා
සමෙන දින්නස්ස න අග්ඝමෙති
එවං සහස්සානං සහස්ස යාගිනං
කලම්පි නාග්ඝන්ති තථා විධස්ස තෙ-ති.

**දුතිය සතුල්ලප කායික සුත්තං**

---

විපුලො, මහත්වූ; මහග්ගතො, (ප්‍රත්‍යවිශෙෂයෙන්) උළාර බවට පැමිණියාවූ; එසො යඤ්ඤො, මේ(සහස්‍රයාගාදින්ගේ) දානය; සමෙන දින්නස්ස, දැහැමෙන් සෙමින් ලැබ දුන් දානයාගේ; අග්ඝං, ඇගීමට; (වටිනාකමට) කෙන, කවරහෙයකින්; න එති, නො පැමිණේද; සහස්ස යාගිනං, සහස්‍රයාගඇති; සතං සහස්සානං, ලක්‍ෂයක් දෙනාගේ; (හෙවත් දසකෙළක් සම්බන්ධවූ) තෙ, ඒ දානයෝ; තථාවිධස්ස, එබඳුවූ පුරුෂයාගේ; (දානයෙහි) කලම්පි, සියයෙන් කොටසක්වත්; න අග්ඝන්ති, කවරහෙයකින් නො අගිත් ද;

අථ ඛො, ඉක්බිත්තෙන්, භගවා, භාග්‍යවතුන් වහන්සේ; තං දෙවතං, ඒ දේවතාවාට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, (මෙසේ) වදාළසේක.

එකෙ, ඇතැම් කෙනෙක්; විසමෙ නිවිට්ඨා, විෂම වූ කාය වාඞ් මනඃ කර්මයෙහි, අභිනිවිෂ්ඨයෝ ව; (පිහිටියෝව) ඡෙත්වා, අනුන් තළා; වධිත්වා, මෙරමා මරා; අථ, නවද; සොචයිත්වා, (අනුන්) ශෝක්කොට; හි, යම් හෙයකින්; දදන්ති, දන් දෙත් ද;

අස්සු මුඛා, (කඳුළුවැකුණු මුහුණැති කොට අනුන් හඬවා දුන් හෙයින්) අස්සුමුඛනම් වූ; සදණ්ඩා, දණ්ඩන් තර්ජනයකොට පහර දුන් හෙයින් සදණ්ඩනම් වූ; සා දක්ඛිණා, ඒ දක්ෂිණා තොමෝ; සමෙන දින්නස්ස, දැහැමෙන් සෙමෙන් ලැබ දුන් දානයාගේ; අග්ඝං, ඇගීමට, න එති, (එහෙයින්) නොපැමිණේ; එවං, මෙසේ; සහස්සයාගිනං, සහස්‍රයාග ඇති; සතං සහස්සානං, ලක්‍ෂයක් සම්බන්ධවූ; තෙ, ඒ දානයෝ; තථා විධස්ස, එබඳු දැහැමි පුරුෂයාගේ (දාන යෙහි) කලම්පි, සියයෙන් කොටසක්; න අග්ඝන්ති, නොම අගිත්;

**දුතිය සතුල්ලප කායික සුත්තං**

**දෙවන සතුල්ලප කායික සුත්‍ර ව්‍යාඛ්‍යානයයි;**

---

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කෙවලකප්පං ජෙත වනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භග වන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසි.

ආදිත්තස්මිං අගාරස්මිං— යං නීහරති භාජනං
තං තස්ස හොති අත්ථාය— නො ච යං තත්ථ දය්හති.

එවමාදිත්තො ලොකො— ජරාය මරණෙන ච
නීහරෙථෙව දානෙන— දින්නං හොති සුනීහතං

දින්නං සුඛඵලං හොති— නාදින්නං හොති තං තථා.
චොරා හරන්ති රාජානො— අග්ගි දහති නස්සති.

---

මෙ, මාවිසින්-පෙ-අභාසී, කිය.

අගාරස්මිං, ගෙයක්; ආදිත්තස්මිං, (ආදීප්ත) ගිනිගත්කල්හි; යං භාජනං, යම්කිසි බඩුවක්, නීහරති, (ඒ දන ගෙයින් බැහැර කෙරේ ද; තං, ඒ බැහැරකළ බඩුව; තස්ස, ඒ ගෘහ ස්වාමියාට; අත්ථාය, ප්‍රයෝජනය පිණිස; හොති, වේ ද; යං, යමක්; තත්ථ, එහි; දය්හති, දැවේද; (එය) නොව, ප්‍රයෝජන පිණිස නොවේද?

එවං, මෙසේ; ලොකො; සත්වලෝකය තෙම; ජරාය, ජරාව විසින්ද; මරණෙන ච, මරණය විසින්ද; (රාගද්වෙෂ මොහ ජාති ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෞර්මනස්ස උපායාස සංඛ්‍යාත එකොළොස් ගින්නකින්) ආදිත්තො, හාත්පස ඇවිලගන්නා ලද්දේය.; (එහෙයින්) දානෙන, දාන චේතනාවෙන්; නීහරෙථ එව, (තමන් සතුදෙය පරිත්‍යාගකිරීම් වශයෙන්) බැහැරකරන්නේ මය; දින්නං, (එසේ) දෙනලද්ද; සුනීහටං, මොනවට බැහැරකර ගන්නා ලද්දේ වේ;

දින්නං, දෙනලද්දේ; සුඛ ඵලං හොති, සුවපල ඇත්තේ වේ; අදින්නං, නොදෙනලද්දේ; තථා නහොති, එසේ නොවේ; (කුමක් වේදයත්) තං, ඒ නුදුන් සම්පත; චොරා, සොරු; හරන්ති, පැහැර ගණිත්; රාජානො, රජවරු; (ගණිත්) අග්ගි දහති, ගින්න දවයි; නස්සති, තුබූ තන්හි තෙමේමත් නැසෙයි;...

අථ අන්තෙන ජහති— සරීරං සපරිග්ගහං
එත දඤ්ඤාය මෙධාවී— භුඤ්ජෙථ ච දදෙථ ච.
දත්වා ච භුත්වා ච යථානුභාවං— අනින්දිතො සග්ගමුපෙති ඨානන්ති.

## ආදිත්ත සුත්තං

සාවත්ථියං:—
යෙධ මච්ඡරිනො ලොකෙ— කදරියා පරිභාසකා
අඤ්ඤෙසං දදමානානං— අන්තරාය කරා නරා.
කීදිසො තෙසං විපාකො—සම්පරායො ච කීදිසො
භගවන්තං පුට්ඨුමාගම්ම—කථං ජානෙමු තං මයන්ති.

---

අථ, වැලි; සපරිග්ගහං, (චෞරාදීන්ගේ වශයෙන් අවිනෂ්ට) සම්පත් සහිතවූ; සරීරං, සිරුර අන්තෙන, මරණයෙන්; ජහති, හරියි; මෙධාවී, පණ්ඩිතතෙම; එතං, මේ කාරණය; අඤ්ඤාය, දැන; භුඤ්ජෙථ ච, (තමාද) අනුභවකරන්නේය; දදෙථ ච, (අනුන්ටද) දෙන්නේය; දත්වා ච, (තමා සන්තකදෙය) පරිත්‍යාගදකොට; භුත්වා ච, අනුභව ද කොට; අනින්දිතො, (ලෝකවාසීන් විසින්) අවඥ නොකරනලද්දුව; යථානුභාවං, අනුභාව වූ පරිද්දෙන්; (කර්මානුරූපවූ පරිද්දෙන්) සග්ගං ඨානං, ස්වර්ගස්ථානයට; උපෙති ඉති, විශ්‍රවනතර මහාරාජාදීන් මෙන් උත්පත්ති වශයෙන්; පැමිණේ යයි වදාළසේක;

**ආදිත්ත සුත්තං—ආදිත්ත සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.**

—— ० ——

සාවත්ථියං, -පෙ- (දේවතාවෙක් විසින් පිළිවිසිතලද්දේ නම්) ඉධ, මේ ලෝකයෙහි; මච්ඡරිනො, මසුරු බැව් ඇති; කදරියා, තද මසුරුවූ; පරිභාසකා, (නින්ද පිරුළු බසින් භික්ෂූන්ට) නිභා කරන්නාවූ; යෙ ජනා, යම් ජනකෙනෙක්; දදමානානං, දන්දෙන්නාවූ; අඤ්ඤෙසං, අන්‍යයන්ට; (නොහොත් අන්‍යයන්ට දෙන්නවුන්ට) අන්තරායකරා, අන්තරාය කරා වෙත්ද; (දායකයාහට ස්වර්ගාන්තරායද ප්‍රතිග්‍රාහකයාහට ලාභාන්තරායද, ආත්මොපඝාතයදැයි යනමේ අන්තරාය කරන්නාහු වෙත්ද)

තෙසං, ඔවුන්ට; (ඇතිවන) විපාකො, විපාකය; කීදිසො, කෙබඳු ද? සම්පරායො ච, පරලොවද; කීදිසො, කෙබඳු ද?(යනු) භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පුට්ඨුං, විචාරන්ට; ආගම්ම, අවුත් සිටිමු; මයං, අපි; තං, ඒ කාරණය; කථං, කෙසේ; ජානෙමු ඉති, දනිමුදැයි, (විචාළාය.) ඊට භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ප්‍රත්‍යුත්තර වශයෙන් වදාරණසේක්)

යෙ'ධ මච්ඡරිනො ලොකෙ— කදරියා පරිභාසකා
අඤ්ඤෙසං දදමානානං— අන්තරාය කරා නරා.

නිරයං තිරච්ඡාන යොනිං— යමලොකං චූපපජ්ජරෙ
සචෙ එන්ති මනුස්සත්තං—දලිද්දෙ ජායරෙ කුලෙ.
චොළං පිණ්ඩො රතී ඛිඩ්ඩා— යත්ථ කිච්ඡෙන ලබ්භති

පරතො ආසිංසරෙ බාලා— තම්පි තෙසං න ලබ්භති.
දිට්ඨෙව ධම්මෙ ස විපාකො— සම්පරායෙ ච දුග්ගතීති

ඉති හෙතං විජානාම— අඤ්ඤං පුච්ඡාම ගොතම.
යෙ'ධ ලද්ධා මනුස්සත්තං— වදඤ්ඤූ වීතමච්ඡරා
බුද්ධෙ පසන්නා ධම්මෙ ච— සඞ්ඝෙ ච තිබ්බගාරවා

---

යෙ'ධ මච්ඡරිනො ලොකෙ-පෙ-

නිරයං නරකයෙහි ද; තිරච්ඡානයොනිං, තිරිසන් යෝනියෙහිද; යමලොකං ච, යමලෙව්හිද; උපපජ්ජරෙ, උපදිත්; සචෙ, ඉදින්; මනුස්සත්තං, මිනිසත් බවට; එන්ති, (උත්පත්තිවශයෙන්) එත්නම්; දලිද්දෙ, දිළිඳුවූ; කුලෙ, කුලයෙක; ජායරෙ; උපදිත්; (කෙබඳුවූ ද යත්?) යත්ථ, යම් කුලයෙක්හි; චොළං, ඇඳීමය; පිණ්ඩො, කෑමය; රතී, පස්කම්රතියය; ඛිඩ්ඩා, කායිකාදි ක්‍රීඩාය; (යන මේ) කිච්ඡෙන, දුකසේ; ලබ්භති, ලැබේද; (එබඳුවූ දිළිඳු කුලයෙක උපදිත්)

බාලා, ඒ බාලයෝ; පරතො, අන්‍යයාගෙන්; ආසිංසරෙ, යමක් පතත්ද; තං අපි, ඒද; තෙසං, ඔවුන්ට; න ලබ්භති, නොලැබේ; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්ම භාවයෙහිම; එසො විපාකො, මේ විපාකයි; සම්පරායෙ ච, පරලෙව්හිදී ද; දුග්ගති ඉති, (නරකාදි) දුර්ගති වේයයි; (වදාළසේක.)

ගොතම, ගෞතමයන් වහන්ස; එතං, මේ කාරණය; ඉතිහි, මෙසේම, විජානාම, දැනගණිමු; අඤ්ඤං, (මේ ඇර) අනිකක්; පුච්ඡාම, විචාරමු. යෙ, යම් කෙනෙක්; ඉධ, මේලෝකයෙහි; මනුස්සත්තං, මනුෂ්‍යාත්ම භාවය; ලද්ධා, ලැබ; වීතමච්ඡරා, පහවූ මසුරුමල ඇතිව; බුද්ධෙ, බුදුන් කෙරෙහිද; ධම්මෙ ච, ධර්මය කෙරෙහිද; සඞ්ඝෙ ච, සංඝයා කෙරෙහිද; පසන්නා, පහන් සිත් ඇත්තෝව; තිබ්බගාරවා, (තෙරුවන් කෙරෙහි) මහත් ගෞරව ඇත්තෝව, වදඤ්ඤූ; භික්ෂූන්ගේ වචනාභිප්‍රාය දන්නෝ වෙත්ද; එතෙ, ඒ මොව්හු;

කීදිසො තෙසං විපාකො— සම්පරායො ච කීදිසො
භගවන්තං පුට්ඨුමාගම්ම— කථං ජානෙමු තං මයන්ති

යෙධ ලද්ධා මනුස්සත්තං—වදඤ්ඤූ වීත මච්ඡරා
බුද්ධෙ පසන්නා ධම්මෙ ච— සඞ්ඝෙ ච තිබ්බගාරවා
එතෙ සග්ගෙ පකාසෙන්ති— යත්ථ තෙ උපපජ්ජරෙ

සචෙ එන්ති මනුස්සත්තං— අඩ්ඪෙ ආජායරෙ කුලෙ
චොළං පිණ්ඩං රතී ඛිඩ්ඩා— යත්ථා කිච්ඡෙන ලබ්භති

පරසම්භතෙසු භොගෙසු— වසවත්තීව මොදරෙ
දිට්ඨෙච ධම්මෙ සවිපාකො— සම්පරායෙ ච සුග්ගතීති.

මච්ඡෙර සුත්තං.

සාවත්ථියං:—

කිංසු යාව ජරා සාධු- කිංසු සාධු පතිට්ඨිතං
කිංසු නරානං රතනං- කිංසු චොරෙහි දූහරන්ති

සග්ගෙ, ස්වර්ගයෙහි; පකාසෙන්ති, (විමානප්‍රභායෙන්) ප්‍රකාශ වෙත්; (කුමන ස්වර්ගයෙක්හි ද යත්?) තෙ, ඔව්හු තුමූ; යත්ථ, යම් ස්වර්ගයෙක්හි; උප පජ්ජරෙ, උපදිත්නම්; (එහිය)

සචෙ, ඉදින්, මනුස්සත්තං, මිනිසත්බවට; එන්ති, එත්නම්; අඩ්ඪෙ කුලෙ, ආඪ්‍ය කුලයෙක්හි; ආජායරෙ, උපදිත්; (ආඪ්‍ය කුල කොබඳුදයත්?) චොළං, වස්ත්‍රය; පිණ්ඩං, ආහාරය; රති, පස්කම් රතියය; ඛිඩ්ඩා, (කායිකාදි) ක්‍රීඩාය; (යන මේ) යත්ථ, යම් කුලයෙක්හි; අකිච්ඡෙන, නිදුකින්, ලබ්භති, ලබාද; (ඒ ආඪ්‍ය කුලයෙහි උපදියි)

පරසම්භතෙසු, අනුන් විසින් රැස්කරනලද; භොගෙසු, භෝගයන්හි, වසවත්තී ඉව, වසවර්ති දිව්‍ය රාජයාමෙන්; මොද රෙ, සතුටු වෙත්; (පර විසින් තමන්ගේ සිත්වූ පරිද්දෙන් නිර්මිතකරණලද රූපාදියෙහි සුඛානුභවන වශයෙන් සතුටු වන්නාවූ වසවත් රජහුමෙන් සතුටු වෙතියි සේයි) දිට්ඨෙච ධම්මෙ, ඉහාත්මභාවයෙහිම; එසො විපාකො, මේ විපාකයි; සම්පරායෙ ච, පරලෙව්හිද; සුග්ගති ඉති, සුගති වේයයි (නොහොත් සුගතියෙහි උපදිත්යයි වදාළසේක)

මච්ඡෙර සුත්තං, මච්ඡෙර සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.

සීලං යාව ජරා සාධු- සද්ධා සාධු පතිට්ඨිතා
පඤ්ඤා නරානං රතනං- පුඤ්ඤං චොරෙහි දුහරන්ති

**යාව ජරා සුත්තං**

---

**සාවත්ථියං.—**

කිංසු පවසතො මිත්තං- කිංසු මිත්තං සකෙ ඝරෙ
කිං මිත්තං අත්ථ ජාතස්ස- කිං මිත්තං සම්පරායිකන්ති

සත්ථො පවසතො මිත්තං- මාතා මිත්තං සකෙ ඝරෙ
සහායො අත්ථජාතස්ස- හොති මිත්තං පුනප්පුනං
සයං කතානි පුඤ්ඤානි- තං මිත්තං සම්පරායිකන්ති.

**පවාසි මිත්ත සුත්තං**

---

සාවත්ථියං, -පෙ- එක්තරා දෙවතාවෙක් භාග්‍යවතුන් වහන්සේ ගෙන් මෙසේ පිළිවිසී)

කිංසු, කුමක් නම්; යාවජරා, ජරාව දක්වා; සාධු, යහපත්ද? කිංසු, කුමක් නම්; පතිට්ඨිතං, (ස්වසන්තානයෙහි) පිහිටියේ; සාධු; යහපත්ද ? කිංසු, කුමක් නම්; නරානං, මිනිසුන්ට; රතනං; රත්න වේ ද? කිංසු, කුමක් නම්; චොරෙහි, සොරුන් විසින්; දුහරං ඉති, පැහැර ගතනොහැකිවේදැයි; (මෙසේ විචාළකල්හි භාග්‍ය වතුන්වහන්සේ මෙසේ විසඳ වදාළසේක.)

සීලං, සීලය; යාවජරා, ජරාව දක්වා; සාධු, (අභිමතාර්ථය සිඩ කරණහෙයින්) යහපති; (අර්ථකාමීන් විසින් ලැබිය යුතු හෙයින්ද උපසේවිතව්‍ය හෙයින්ද සාධුයයි දතයුතුයි) සද්ධා, ශ්‍රද්ධාතොමෝ; පතිට්ඨිතා, (හස්ථාලවකාදීන්ට මෙන් චිත්ත සන්තානයෙහි ලබ්ධ ප්‍රතිෂ්ඨා ඇතිහෙයින් මාර්ගයෙන් යුක්තව) පිහිටියා; සාධු, යහපති; පඤ්ඤා, ප්‍රඥතොමෝ; නරානං, මිනිසුන්ට; රතනං, දුර්ලභ ප්‍රදුර්භාවාද්‍යර්ථයෙන්) රත්නයි; පුඤ්ඤං, පුණ්‍ය චෙතනාව; චොරෙහි, සොරුන් විසින්; දුහරං ඉති, (අරූපහෙයින්) පැහැර ගතනොහැකිවේයයි; (වදාළසේක.)

**යාව ජරා සුත්තං— යාවජරා සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.**

---

සාවත්ථියං -පෙ-

පවසතො, පිටරට වසන්නාහට; මිත්තං, මිත්‍රයා, කිංසු, කවරේ ද ? සකෙ ඝරෙ, සියගෙදරෙහි; මිත්තං, මිත්‍රයා; කිංසු, කවරේ ද? අත්ථ ජාතස්ස, උපන්කටයුතු ඇත්තකුට; කිං, කවරෙක්; මිත්තං, මිත්‍ර ද? සම්පරායිකං, සාම්පරායිකවූ; මිත්තං, මිත්‍රයා; කිං ඉති, කවරේදැයි; (එක්තරා දේවතාවෙක් විචාළාය. භාග්‍යවත් බුද්ධරාජ ය්ට පිළිතුරු මෙසේ වදාළසේක.)

සාවත්ථියං-

කෙනස්සුබ්භාහතො ලොකො—කෙනස්සු පරිවාරිතො
කෙන සල්ලෙන ඔතිණ්ණො—කිස්ස ධූමායිතො සදාති.
මච්චුනාබ්භාහතො ලොකො—ජරාය පරිවාරිතො
තණ්හා සල්ලෙන ඔතිණ්ණො—ඉච්ඡා ධූමායිතො සදාති.

මච්චුනාබ්භාහත සුත්තං.

පවසතො, විදේශවාසීහට; සත්‍ථෝ, (සමඟ හැසිරෙන) වෙළඳ තෙම, මිත්තං, (රෝගයක් උපන්කල පල්ලැක්කියකින් හෝ අනික් යානාවකින් හෝ ගෙණ ගොස් ක්‍ෂෙමාන්තයට පමුණුවන හෙයින්) මිතුරුවේ; සකෙ ඝරෙ, සියගෙදර; මාතා, මව්තොමෝ, මිත්තං, මිතුරුවේ; (දරුණු රෝගයක් උපන් කල ඔහුගේ අශුචි දරුවෝ ඔහට පිළිකුල්කරන නමුත් මව අශුචි ද සඳුන් මෙන් සලකා කිසිකලෙකත් පිළිකුල් නොකරන හෙයින් මවට වඩා මිතුරෙක් සියගෙදරෙහි නැතැයි සේයි) අත්‍ථෙ ජාතස්ස, උපන් කටයුතු ඇත්තාහට; සහායො, කෘත්‍ය නිස්තරණ වශයෙන් ඒ කටයුත්තෙහි සමග පවත්නා බැවින් යහළුතෙම; පුනප්පුනං, නැවත නැවත; මිත්තං හොති, මිත්‍රවේ; සයං, තමා විසින්; කතානි; කරණලද; පුඤ්ඤානි, (යම්) පුණ්‍යෙචතනා කෙනෙක් වෙද්ද; තං, ඒ සියල්ල; සම්පරායිකං, පරලොවට හිතවූ; මිත්තං ඉති, මිත්‍රයා වෙයි; (වදාළසේක.)

පවාසි මිත්ත සුත්තං-පවාසි මිත්ත සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.

සාවත්ථියං, -පෙ- (එක්තරා දේවතාවෙක් මෙසේ විචාළාය.)

ලොකො, ලෝවැසිතෙම; කෙන, කවරකු විසින්; අබ්භාහතො, අභ්‍යාහතද; (එලවාගෙණෙන ලද්දේද) කෙන, කුමකින් පරි වා රිතො, පිරිවරණ ලද ද; කෙන සල්ලෙන, කිනම් ශල්‍යයකින්; ඔතිණ්ණො, බැසගන්නාලද ද; කිස්ස, කුමකින්; සදා, හැමකල්හි; ධූමායිතො, ආදිප්තද; (ඇවුලුනේද;) (භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු මෙසේ වදාළසේක.)

මච්චුනා, මරුවා විසින්; ලොකො, ලෝවැසිතෙම; අබ්භාහතො, අභිමුඛව එලවාගෙණෙන ලද්දේය; ජරාය, ජරාව විසින්; පරි වා රිතො, පිරිවරන ලද්දේය; තණ්හා සල්ලෙන, තෘෂ්ණා නමැති හුලින්; ඔතිණ්ණො, බැස (වැද) ගන්නාලද්දේය; සදා, හැමකල්හි; ඉච්ඡා, තෘෂ්ණාවෙන්; ධූමායිතො ඉති, ඇවිලගන්නා ලද්දේයයි; වදාළසේක.

මච්චුනාබ්භාහතසුත්තං-මච්චුනාබ්භාහත සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.

සාවත්ථියං—

කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං කිංසු සුචිණ්ණො සුඛමාවහාති
කිංසු හවෙ සාදුතරං රසානං කථං ජීවිං ජීවිත මාහු සෙට්ඨන්ති:
සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
සච්චං හවෙ සාදුතරං රසානං පඤ්ඤා ජීවිං ජීවිත මාහු සෙට්ඨන්ති.

සද්ධීධ විත්ත සුත්තං

—.—

සාවත්ථියං—

කිංසු ජීරති කිංසු න ජීරති– කිංසු උප්පථො'ති වුච්චති
කිංසු ධම්මානං පරිපන්ථො– කිංසු රත්තිං දිවං ඛයො
කිං මලං බ්‍රහ්මචරියස්ස — කිං සිනානමනොදකං
කති ලොකස්මිං ඡිද්දානි– යත්ථ විත්තං න තිට්ඨති
භගවන්තං පුට්ඨුමාගම්ම– කථං ජානෙමු තං මයන්ති.

---

සාවත්ථියං,–පෙ–ඉධ, මේ ලෝකයෙහි; පුරිසස්ස, පුද්ගලයාහට; කිං, කුමක්නම්; සෙට්ඨං විත්තං, ශ්‍රෙෂ්ඨ වස්තුව වේද; කිංසු, කුමක් නම්; සුචිණ්ණො, මොනවට පුරුදුකරනලද්දේ; සුඛං ආවහාති, සැප එළවා ද; රසානං, (ලවණම්බිලාදි) රසයන් අතුරෙන්; කිංසු, කිනම් රසයක්; හවෙ, ඒකාන්තයෙන්; සාදුතරං, ඉතා මිහිරි ද; කථං ජීවිං, කෙසේ ජිවත් වන්නකුගේ; ජීවිතං, ජීවිතය; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨයයි; ආහු, (බුද්ධාදීහු) කියද්ද; ඉති, දේවතාවෙක් තොම) මෙසේ විචාළාය;

(භාග්‍යවතුන් වහන්සේ ඊට ප්‍රත්‍යුත්තර වශයෙන්) ඉධ, මේ ලෙව්හි; පුරිසස්ස, පුද්ගලයාහට; සද්ධා, ශ්‍රද්ධාතොමෝ; සෙට්ඨං විත්තං, ශ්‍රෙෂ්ඨ වස්තුව වේ; ධම්මො, දසකුශලකර්ම පථ ධර්මය තෙම; සුචිණ්ණො, මොනවට පුරුදුකරනලද්දේ; සුඛං, (සියලු) සැප; ආවහාති, එළවයි; රසානං, (සියලු)රසයන් අතුරෙන්; සච්චං, සත්‍යරසය; හවෙ, ඒකාන්තයෙන්; සාදුතරං, ඉතා මිහිරියි; පඤ්ඤා ජීවිං, ප්‍රඥාවෙන් ජිවත්වන්නහුගේ; ජීවිතං,ජීවිතය; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨයයි; ආහු, (ආර්‍ය්‍යයෝ,) කියත්; ඉති, මෙසේ; (වදාළසේක)

**සද්ධීධ විත්ත සුත්තං– සද්ධීධ විත්ත සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.**

සාවත්ථියං, –පෙ– (එක්තරා දෙවතාවෙක්)

කිංසු, කුමක්; ජීරති, දිරා ද? කිංසු, කුමක්; න ජීරති, නොදිරා ද; කිංසු, කවර ධර්මයක්; උප්පථො ඉති, උන්මාර්ගයයි; වුච්චති, කියනු ලැබේද? ධම්මානං, ධර්මයන්ට; පරිපන්ථො; උවදුර; කිංසු, කුමක් ද? කිංසු, කුමක් නම්; රත්තිං දිවං, රෑ දවල්; ඛයං ගෙවේ ද;

රූපං ජීරති මච්චානං—නාම ගොත්තං න ජීරති
රාගො උප්පථොති වුච්චති—ලොභො ධම්මානං පරිපන්ථො
වයො රත්තිං දිවං ඛයො— ඉත්ථිමලං බ්‍රහ්මචරියස්ස
එත්ථායං සජ්ජතෙ පජා.

තපො ච බ්‍රහ්මචරියඤ්ච—තං සිනාන මනොදකං
ඡ ලොකස්මිං ඡිද්දානි—යත්ථ චිත්තං න තිට්ඨති

ආලස්සඤ්ච පමාදො ච—අනුට්ඨානං අසංයමො
නිද්දා තන්දි ච තෙ ඡිද්දෙ—සබ්බසො තං විවජ්ජයෙ'ති

**රූප ජීරණ සුත්තං**

---

බ්‍රහ්මචරියස්ස, බඹසරට; මලං, කිලුට; කිං, කුමක්ද? යත්ථ, යම් තැනෙක්හි; චිත්තං, සිත; න තිට්ඨති, නොපිහිටා නම්; ලොකස්මිං, ලෙව්හී; ඡිද්දානි, (එබඳු) සිදුරු; කානි, කොහෙක්ද? භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පුට්ඨුං, විචාරනු පිණිස; ආගම්ම, අවුත්සිටි තෙමු; තං, එය; මයං, අපි; කථං, කෙසේ; ජානෙමු ඉති, දැනගණිමුදැයි; (විචාළාය)

මච්චානං, සත්‍වයන් ගේ; රූපං, රූපය; ජීරති, දිරයි; නාම ගොත්තං, නාමගොත්‍රය; න ජීරති, නොදිරයි; රාගො, රාගය තෙම; උප්පථො ඉති, උන්මාර්ගයයි; වුච්චති, කියනු ලැබේ; ලොභො, ලොභය තෙම; ධම්මානං, ලොවී ලොවුතුරු ධර්මයන්ට; පරිපන්ථො, උවදුරයි; වයො, වයස තෙම; රත්තිං දිවං ඛයො, රෑ දවල් දෙක්හි ගෙවේ; ඉත්ථි, ස්ත්‍රී තොමෝ; බ්‍රහ්මචරියස්ස, බඹසරට; මලං, කිලුටයි; එත්ථ, මෙහි; අයං පජා, මේ ප්‍රජා තොමෝ; සජ්ජතෙ, ඇලෙයි;

තපො ච, (කෙලශ සන්තාපෝපාය වූ) තපසද; බ්‍රහ්මචරියඤ්ච, බඹසරද; (යන) තං, එය; අනොදකං, නිරුදකවූ; සිනානං, ස්නානයයි; යත්ථ, යම් තැනෙක්හි; චිත්තං, සිත; න තිට්ඨති, නොපිහිටාද? (එබඳුවූ) ඡිද්දානි, සිදුරු; ලොකස්මිං, ලෝකයෙහි; ඡ, සයක්වෙත්; (එනම්)

ආලස්සඤ්ච, අලස බව ද; පමාදො ච, (නිද්‍රාවශයෙන් හෝ කෙලශවශයෙන් හෝ වන) සම්‍යතිවිප්‍රවාසයද; අනුට්ඨානං, (වීර්‍ය කරන්නට යුතු කල්හි) වීර්‍යාභාවය ද; අසඤ්ඤමො, සීලසංයමාභාවයද; (සදාචාර රහිත බවයයි සේයි) නිද්දා, නිද්‍රා බහුල බවද; (යන්නේත් උන්නේත් සිටිනේත් නිදයිසේයි) තන්දි, අධික ක්ෂුධාදියෙන් වූ ආගන්තුක ආලස්‍යයද; (යන ) තෙ ඡිද්දෙ, ඒ සිදුරු සය; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; විවජ්ජයෙ ඉති, දුරුකරන්නේයයි; (වදාළසේක)

**රූප ජීරණ සුත්තං– රූප ජීරණ සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.**

සාවත්ථියං:—

කිංසු බන්ධති පාථෙය්‍යං—කිංසු භොගාන මාසයො
කිංසු නරං පරිකස්සති—කිංසු ලොකස්මිං දුජ්ජහං
කිංසු බද්ධා පුථූ සත්තා—පාසෙන සකුණී යථාති.

සද්ධා බන්ධති පාථෙය්‍යං—සිරි භොගාන මාසයො
ඉච්ඡා නරං පරිකස්සති—ඉච්ඡා ලොකස්මිං දුජ්ජහා
ඉච්ඡා බද්ධා පුථූ සත්තා—පාසෙන සකුණී යථාති.

**පාථෙය්‍ය සුත්තං**

සාවත්ථියං:-

අච්ඡරා ගණ සංඝුට්ඨං—පිසාච ගණ සෙවිතං
වනන්තං මොහනං නාම—කථං යාත්‍රා භවිස්සතීති

---

සාවත්ථියං -පෙ-

කිංසු, කුමක් නම්; පාථෙය්‍යං, මාර්ගෝපකරණයක්කොට; බන්ධති, බඳීද; කිංසු, කවර ධර්මයක් තෙම; භොගානං, භොගයන්ගේ; ආසයො, ආසයස්ථානයද? කිංසු, කවර ධර්මයක් තෙම; නරං, මිනිසා; පරිකස්සති, අදීද? ලොකස්මිං, ලෝකයෙහි; කිංසු, කුමක් නම්; දුජ්ජහං, දුර්ජහද; (දුරලන්ට දුෂ්කරද) පාසෙන, පාශයකින් බැඳුණු; සකුණී යථා, පක්ෂියකු මෙන්; පුථුසත්තා, බොහෝ සත්ව යෝ; කිංසු බද්ධා ඉති, කුමකින් බැඳුණාහු දැයි; (දෙවතාවෙකු මෙසේ විචාළ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක)

සද්ධා; (දාන සීලාදිය ශ්‍රද්ධාතපත්‍රයෙන්ම වේද එහෙයින්) ශ්‍රද්ධා තොමෝ; පාථෙය්‍යං, මාර්ගෝපකරණ; බන්ධති, බඳනේයි; සිරි, ඓශ්වර්‍ය්‍යය; භොගානං, සම්පත්තීන්ට; ආසයො, වාසස්ථාන යි; (ඉසුරු බව හමුවූකල ගොඩිනුත් දියෙනුත් භොගයෝ පැමිණෙත්යයි සේයි) ඉච්ඡා, ඊර්ෂ්‍යාතොමෝ; නරං, මිනිසා; පරිකස්සති, (ඒ ඒ කැමැති අරමුණ කරා) අදියි; ලොකස්මිං, ලෝකයෙහි; ඉච්ඡා, ඊර්ෂ්‍යා තොමෝ; දුජ්ජහා, දුකසේ දුරලිය යුතුය; පාසෙන, පාස බන්ධනයෙන්; බද්ධා, බැඳුණාවූ; සකුණී යථා, පක්ෂියකු මෙන්; පුථු සත්තා, බොහෝවූ සත්වයෝ; ඉච්ඡා බද්ධා ඉති, ඊර්ෂ්‍යාවෙන් බැඳුණාහු වෙත්යයි; (වදාළසේක)

**පාථෙය්‍ය සුත්තං- පාථෙය්‍ය සූත්‍ර ව්‍යාඛ්‍යානයයි.**

---

සාවත්ථියං-පෙ-

(ශ්‍රමණ දේවතා වූ අසමහිතාන ශීලයෙන් යුත් මේ දෙවුපුත් තෙම දිව්‍යප්සරා සමූහයා විසින් පිරිවරනලදුව බුදුරජාණන් වහන්සේගේ සමීපයට පැමිණ මනාකොට වැඳ එකත් පසෙක සිටියේ මේ "අච්ඡරා" යනාදි ගාථාව කීය.)

උජුකො නාම සො මග්ගො—අභයා නාම සා දිසා
රථො අකූජනො නාම—ධම්මචක්කෙහි සංයුතො

හිරි තස්ස අපාලම්බො—සත්‍යස්ස පරිවාරණං
ධම්මාහං සාරථිං බ්‍රෑමි—සම්මාදිට්ඨි පුරෙ ජවං

යස්ස එතාදිසං යානං—ඉත්ථියා පුරිසස්ස වා
ස වෙ එතෙන යානෙන—නිබ්බානස්සෙව සන්තිකෙ'ති

ධම්මරථ සූත්‍රං

---

"ඉමානි එකාදස සූත්‍රානි දෙවතා සංයුත්තකෙ"

---

අච්ඡරා ගණ සංඝුට්ඨං, අප්සරා සමූහයා විසින් ගීත වාදිතාදි ශබ්දයෙන් සුඝොෂිතවූ; පිසාච ගණ සෙවිතං, පිසාච සමූහයා විසින් සෙවුනාලද්දාවූ; (මෙහි දිව්‍යප්සරාවන් ම පිසාච යන් කොට කියති) වනන්තං, (මේ) නන්දන වනය; මොහනං නාම, මොහන නම් වේ; (පැමිණි පැමිණියවුන් රූප ශබ්දාදින් මූළා කරන හෙයින් මොහන නම් වේ.) යාත්‍රා, නික්ම යාම; හෙවත් නිර්වාණය; කථං භවිස්සති ඉති, කෙසේ වන්නේ දැයි; හෙවත් නිර්වාණයට පැමිණීම කෙසේ වන්නේ දැයි (විචාළේය.)

(එසේ විචාළ දේවතාවාට භාග්‍යවතුන් වහන්සේ) සො මග්ගො, ඒ අරි අටැඟි මඟ; උජුකො නාම, (කායවඞ්කාදිය නොමැති හෙයින්) ඍජුක නම් වේ; සා දිසා, ඒ මඟින් යන නිර්වාණ දිශා තොමෝ; අභයා නාම, (එහි ද ඊට පැමිණියන් හට ද කිසි බියක් නොමැති හෙයින්) අභයා නම් වේ; රථො, (ඒ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග සංඛ්‍යාත) රථය තෙම; ධම්මචක්කෙහි, කායික චෛතසික වීර්‍ය්‍ය සංඛ්‍යාත චක්‍රවයෙන්; සංයුතො, මොනවට යොදනලද්දේ; අකූජනො නාම, අකූජන නම් වේ; (ප්‍රකෘති රථය අක්‍ෂයෙහි තෙල් නො ලෑ කල හෝ වැඩි මිනිසුන් නැඟිකල විරාව කරන නුමුත් ඒ මේ ආර්‍ය්‍යමාර්ග රථය තෙම එකවිට ම අසූගාරදහසක් ප්‍රාණීන් නැඟිමේදීත් එසේ විරාව නො කෙරේයයි සේයි)

හිරි (මෙහි "හිරි" යන්න ගැනීමෙන් "ඔත්තප්පය" ද ගන්නාලද මැයි. එහෙයින් පවුකිරීමෙහි ලජ්ජා භය සඞ්ඛ්‍යාතවූ) හිරි ඔතප් දෙක; තස්ස, ඒ මාර්ග රථයාගේ; අපාලම්බො, හාන්සිවන ලෑල්ල හෙවත් හේත්තු වන පුවරුකාඩයි. සති, සමෘති තොමෝ; අස්ස, මේ මාර්ගරථයාගේ; පරිවාරණං, පරිවාරණය (ඇවිරීම) වේ; සම්මාදිට්ඨි පුරෙජවං, විදර්ශනාසම්‍යක්දෘෂ්ටිය පෙරටුව යන්නා කොට ඇති; ධම්මං, ලෝකොත්තරමාර්ගධර්මය; සාරථිං, රථාචාර්‍ය්‍යයා කොට; අහං, මම; බ්‍රෑමි, කියමි;

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: භවම්පි නො ගොතමො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති පටිජානාතීති.

යං හි තං මහාරාජ සම්මා වදමානො වදෙය්‍ය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති මමං තං සම්මා වදමානො වදෙය්‍ය අහං හි මහාරාජ අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති

---

යස්ස, යම්බඳුවූ; පුරිසස්ස වා, පුරුෂයක්හට හෝ; ඉත්ථියා වා, ස්ත්‍රියක්හට හෝ; එතාදිසං, මෙබඳුවූ; යානං, යානාවක්වේද; සො, හෙතෙම; එතෙන යානෙන, මේ මාර්ගරථසංඛ්‍යාත යානාවෙන්; වෙ, ඒකාන්තයෙන්; නිබ්බානස්ස එව සන්තිකෙ ඉති, නිර්වාණයාගේ ම සමීපයෙහි වේයයි; (වදාළසේක.)

ධම්මරථ සුත්තං, ධර්මරථ සූත්‍රව්‍යාඛ්‍යානයයි.

---

ඉමානි එකාදස සුත්තානි, මේ එකොළොස් සූත්‍රයෝ, දෙවතා සංයුත්තකෙ, දෙවතාසංයුක්තකයෙහිය.

---

වෙ -පෙ- අථ ඛො, එ කල්හිදී; පසෙනදි කොසලො රාජා, පසේනදි කොසොල් රජ තෙම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එ තැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ; භගවතා සද්ධිං, භාග්‍යවතුන්වහන්සේ හා සමග; සම්මොදි, සතුටුවූයේය; සම්මොදනීයං, සතුටුවියයුතුවූ; සාරණීයං, සිහිකටයුතුවූ; කථං, කථාව; වීතිසාරෙත්වා, කොටනිමවා; එකමන්තං, එකත්පසෙක; නිසීදි හුන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නො ඛො, හුන්නාවූද; පසෙනදි කොසලො රාජා, පසේනදි කොසොල් රජ තෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේකාරණය; අවොච, කීයේය; (ඒ මෙසේයි) භවං ගොතමො අපි, භවත් ගෞතමයන් වහන්සේද; අනුත්තරං, නිරුත්තරවූ, සම්මා සම්බොධිං, සම්‍යක් සම්බොධිය; අභිසම්බුද්ධො ඉති, මනාව අවබෝධ කෙළෙමියයි; පටිජානාති නො ඉති, ප්‍රතිඥ කෙරේදැයි; (විචාළේය.)

යෙපි තෙ භො ගොතම සමණ බ්‍රාහ්මණා සංඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධු සම්මතා බහුජනස්ස සෙය්‍යථීදං? පූරණො කස්සපො මක්ඛලි ගොසාලො නිගණ්ඨො නාථපුත්තො සඤ්ජයො බෙල්ලට්ඨිපුත්තො පකුධො කච්චායනො අජිතො කෙසකම්බලො, තෙපි මයා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති පුට්ඨා සමානා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති න පටිජානන්ති, කිං පන භවං ගොතමො දහරො චෙව ජාතියා නවො ච පබ්බජ්ජායාති.

---

මහාරාජ, මහරජ; සම්මාවදමානො, මනාකොට කියන්නෙක්; අනුත්තරං, නිරුත්තරවූ; සම්මාසම්බොධිං, සම්‍යක් සම්බොධිය; අභිසම්බුද්ධො ඉති, මනාව අවබොධ කොළේයයි; යං හිතං, ඒ යමෙකුට; නොහොත්: තං, ඒ වචනය; යං හි, යමෙකු සඳහා; වදෙය්‍ය, කියා නම්; සම්මා වදමානො, මනාකොට කියන්නෙක්; මමන්තං, ඒ මට; නොහොත්: තං, ඒ වචනය; මමං, මා සඳහා; වදෙය්‍ය, කියන්නේය; මහාරාජ, මහරජ!; අහංහි, මම ම; අනුත්තරං නිරුත්තරවූ; සම්මා සම්බොධිං, සම්‍යක් සම්බොධිය; අභිසම්බුද්ධො ඉති, අවබොධකොළෙම්; (වදාළසේක.)

භො ගොතම, භවත් ගෞතමයාණන් වහන්ස!; සංඝිනො, පැවිදි සමූහ ඇත්තාවූ; ගණිනො, ශ්‍රමණගණයා ඇත්තාවූ; ගණාචරියා, ශ්‍රමණගණයාට ආචාර්‍ය්‍යවූ; ඤාතා, ප්‍රසිද්ධවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; තිත්ථකරා, දෘෂ්ටිසඞ්ඛ්‍යාත තීර්ථකරන්නාවූ; බහුජනස්ස, බොහෝජනයා විසින්; සාධු සම්මතා, යහපත්යයි සම්මත කරනලද්දාවූ; යෙ අපි තෙ සමණ බ්‍රාහ්මණා, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද; සෙය්‍යථීදං, (ඔහු) කවරහුද? පූරණො කස්සපො, පූරණ කාශ්‍යපය; මක්ඛලි ගොසාලො, මක්ඛලි ගෝශාලය; නිගණ්ඨො නාථපුත්තො, නිගණ්ඨ නාථපුත්‍රය; සඤ්ජයො බෙල්ලට්ඨි පුත්තො, සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍රය; පකුධො කච්චායනො, කකුධ කාත්‍යායනය; අජිතො කෙසකම්බලො, අජිත කෙසකම්බලය; (යන මොහුයි) තෙ අපි, ඔහු තුමූ ද; මයා, මා විසින්; අනුත්තරං, නිරුත්තරවූ; සම්මා සම්බොධිං, සම්‍යක් සම්බොධිය; අභිසම්බුද්ධො ඉයි, (නුඹවහන්සේලා විසින්) මනාව අවබොධ කළාහු දැයි; පුට්ඨා සමානා, විචාරනලද්දාහු; අනුත්තරං සම්මා සම්බොධිං, නිරුත්තර සම්‍යක් සම්බොධිය; අභිසම්බුද්ධො ඉති, මනාව අවබොධ කළෝ වම්හයි; න පටිජානන්ති, (මා ඉදිරියෙහි) ප්‍රතිඥා නොකෙරෙත්; ජාතියා, ඉපදීමෙන්; දහරො චෙව, ළදරුවූ ම; පබ්බජ්ජාය, පැවිදිවීමෙන් ද; නවො, අලුත්වූ; භවං ගොතමො, භවත් ගෞතම තෙම; කිං පන, කිමෙක්ද ප්‍රතිඥාකෙරේද; (ප්‍රතිඥා නොකරව යන අදහසි)

චත්තාරො මෙ මහාරාජ දහරාති න උඤ්ඤාතබ්බා දහරාති න පරිභොතබ්බා; කතමෙ චත්තාරො? ඛත්තියො ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො දහරොති න පරිභොතබ්බො, උරගො ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො දහරොති න පරිභොතබ්බො, අග්ගි ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො දහරොති න පරිභොතබ්බො, භික්ඛු ඛො මහාරාජ දහරොති න උඤ්ඤාතබ්බො දහරොති න පරිභොතබ්බොති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:-

---

මහාරාජ, මහරජ; ඉමෙ ඛො චත්තාරො, මේ සතරදෙනවනාහී; දහර ඉති, ළදරුයයි; න උඤ්ඤාතබ්බා, අවඥ නොකටයුත්තාහුය; දහරා ඉති, ළදරුහයි; න පරිභොතබ්බා, පරිභව නො කට යුත්තාහුය; චත්තාරො, සතරදෙන; කතමෙ, කවරහුද? මහාරාජ, මහරජ; ඛත්තියො ඛො, ක්ෂත්‍රියතෙම වනාහී; දහරො ඉති, ළදරුයයි; න උඤ්ඤාතබ්බො, අවඥ නො කටයුත්තේය; දහරො ඉති, ළදරුයයි; න පරිභොතබ්බො, පරිභව නොකටයුත්තේය; මහාරාජ, මහරජ; උරගො ඛො, සර්පතෙම වනාහී; දහරො ඉති, ළදරුයයි; න උඤ්ඤාතබ්බො, අවඥ නො කටයුත්තේය; දහරො ඉති, ළදරුයයි; න පරිභොතබ්බො, පරිභව නො කට යුත්තේය; මහාරාජ, මහරජ; අග්ගි ඛො, වහ්නිය තෙම වනාහී; දහරො ඉති, (සුළුය) ළදරුයයි; න උඤ්ඤාතබ්බො, අවඥ නොකට යුත්තේය; දහරො ඉති, ළදරුයයි; න පරිභොතබ්බො, පරිභව නො කට යුත්තේය; මහාරාජ, මහරජ; භික්ඛු ඛො, භික්ෂු තෙම වනාහී; දහරො ඉති, ළදරුයයි; න උඤ්ඤාතබ්බො; පහත්කොට නොසිතිය යුතේතය; දහරො ඉති, ළදරුයයි; න පරිභොතබ්බො, (කිනුම් සහිතව) පරිභව නොකටයුත්තේය; මහාරාජ, මහරජ; ඉමෙ ඛො චත්තාරො, මේ සතරදෙන වනාහී; දහර ඉති, ළදරු හයි; න උඤ්ඤාතබ්බා, අවඥනොකටයුත්තාහුය; දහර ඉති, ළදරු හයි; න පරිභොතබ්බා ඉති, පරිභව නොකටයුත්තාහුයයි; (පිරිහෙළා කථානොකටයුත්තාහුයි;) භගවා, භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ; ඉදං, මේ දෙශනාව; අවොච, වදාළසේක; සුගතො, ශොභන ගමන් ඇති; සත්ථා, ශාස්තෘන් වහන්සේ; ඉදං, මේ දේශනාව; වත්වා, වදාරා; අථ, නැවත; අපරං, අන්‍යවූ; එතං, මේ ගාථා බන්ධනය; අවොච, වදාළසේක;

ඛත්තියං ජාතිසම්පන්නං–අභිජාතං යසස්සිනං
දහරොති නාව ජානෙය්‍ය–න තං පරිභවෙ නරො

ඨානං හි සො මනුස්සින්දො–රජ්ජං ලද්ධාන ඛත්තියො
සො කුද්ධො රාජදණ්ඩෙන–තස්මිං පක්කමතෙ භුසං
තස්මා තං පරිවජ්ජෙය්‍ය–රක්ඛං ජීවිත මත්තනො

ගාමෙ වා යදි වා රඤ්ඤෙ–යත්ථ පස්සෙ භුජඞ්ගමං
දහරොති නාව ජානෙය්‍ය–න තං පරිභවෙ නරො
උච්චාවචෙහි වණ්ණෙහි–උරගො චරති තෙජසා

---

ඛත්තියං, (ක්ෂෙත්‍රයන්ට අධිපතිය යන අර්ථයෙන්) ක්ෂත්‍රියවූ; ජාතිසම්පන්නං, (ක්ෂත්‍රියජාතිහෙයින්ම) ජාතිසම්පන්නවූ; අභිජාතං, (බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍ර යන කුල තුන) ඉක්මවා උපන්නාවූ; යසස්සිනං, යසපිරිවර ඇත්තාවූ; (රාජකුමාරයෙකු) දහරො ඉති, ළදරුයයි; න අවජානෙය්‍ය, (පහත්කොට) අවඥනොකරන්නේය; නරො, මනුෂ්‍යතෙම; තං, ඒ ක්ෂත්‍රිය කුමාරයාහට; න පරිභවෙ, නින්දා නො කරන්නේය;

හි, යම්හෙයකින්; සො ඛත්තියො; ඒ කැත්කුමර තෙම; රජ්ජං ලද්ධාන, රාජ්‍යය ලැබගෙන; මනුස්සින්දො, මනුෂ්‍යෙන්ද්‍ර (රජ) වන්නේය යන; ඨානං, කාරණය විද්‍යමානද; (එහෙයින්) කුද්ධො, කිපියාවූ; සො, හෙතෙම; තස්මිං, ඒ තමහට අවමන්කළ පුඟුලාහට; රාජදණ්ඩෙන, රජහුගේ (උදහස්විමෙන් කරනලද දස විසි දහස් පමණ) දඬුවමින්; භුසං, අතිශයින්; පක්කමතෙ, උපක්‍රම කෙරේද; ඨානං, ඒ කරුණ විද්‍යමාන වන්නේය; තස්මා, එහෙයින්; අත්තනො, තමාගේ; ජීවිතං, ජීවිතය; රක්ඛං, රැකගන්නේ; තං, ඒ කැත් කුමරහු; පරිවජ්ජෙය්‍ය, නො ගටන්නේය; (ළදරුයයි නො පිරිහෙළන්නේය)

ගාමෙ වා, ගමෙක වේවයි; යදි, නොහොත්; අරඤ්ඤෙ වා, වනයෙක වේවයි; යත්ථ, යම්තැනෙක්හි; භුජඞ්ගමං, සර්පයකු; පස්සෙ, දක්නේ ද; (ඔහු) දහරෙ ඉති, කුඩා එකෙකැයි; නාවජානෙය්‍ය, අවඥ නො කරන්නේය; නරෙ, නුවණැති ජනතෙම; තං, ඒ ආශිවිෂයා; න පරිභවෙ, නොගටන්නේය; උරගො, සර්පතෙම; උච්චාවචෙහි, නානාවිධවූ; (කුද්‍ර මහත්වූ) වර්ණෙහි, සටහනින්; (වෙශයෙන්) තෙජසා, සියතෙදින් යුතුව; චරති හැසිරෙයි; (යම් යම් විලාසයකින් හැසිරෙන්නේ ගොදුරුලබා ද ඒ ඒ සර්ප විලාසයෙන් හෝ දියබරණ විලාසයෙන් හෝ ධමනි වර්ණයෙන් හෝ යටත්පිරිසෙසින් ලෙහෙනු වර්ණයෙනුත් හැසිරේයයි සේයි)

සො ආසජ්ජ ඩසෙ බාලං–නරං නාරිඤ්ච එකදා
තස්මා තං පරිවජ්ජෙය්‍ය–රක්ඛං ජීවිත මත්තනො

පහුත භක්ඛං ජලිතං—පාවකං කණ්හවත්තනිං
දහරොති නාව ජානෙය්‍ය—න තං පරිභවෙ නරො

ලද්ධා හි සො උපාදානං—මහා හුත්වාන පාවකො
සො ආසජ්ජ ඩසෙ බාලං--නරං නාරිඤ්ච එකදා
තස්මා තං පරි වජ්ජෙය්‍ය--රක්ඛං ජීවිත මත්තනො

වනං යදග්ගි දහති--පාවකො කණ්හ වත්තනි
ජායන්ති තත්ථ පාරොහා---අහොරත්තාන මච්චයෙ .

---

සො, ඒ සර්පතෙම; එකදා, ඇතැම් දිනෙක; බාලං, අඥනවූ; නරං, (තමහට ගැහැටකළ) ඒ මිනිසා කරුද; නාරිඤ්ච, ඒ ස්ත්‍රිය කරුද; ආසජ්ජ, පැමිණ; ඩසෙ, ඩහන්නේය; තස්මා, එහෙයින්; අත්තනො ජීවිතං, ස්වකිය ජීවිතය; රක්ඛං,රක්නේ; තං,ඒ සර්පයා; පරිවජ්ජෙය්‍ය, නො ගටා දුරු කරන්නේය;

පහුත භක්ඛං, බොහෝද බුදින්නාවූ; (අභක්‍ෂ්‍යයක්නම්නැත් නාවූ) ජලිතං, ජ්වාලාවත්වූ; කණ්හවත්තනිං. (ගිය ගිය මඟ කළු වන හෙයින්) කෘෂ්ණවර්තමන් නම් වූ; පාවකං, වහ්නිය; දහ රො ඉති, ස්වල්ප යයි; න අවජානෙය්‍ය, අවඥ නොකරන්නේය; නරො, නුවණැති මිනිස්තෙම; තං, ඒ වහ්නිය; න පරිභවෙ, නො ගටන්නේය;

හි, යම්හෙයකින්; සො පාවකො, ඒ වහ්නිය තෙම; එකදා, ඇතැම් විටෙක; උපාදානං ලද්ධාන, ඇවිලෙන්ට උපකරණ ලැබ; මහා හුත්වාන, මහත් ව; බාලං, අඥන වූ; නරං, ඒ මිනිසා කරු ද; නාරිඤ්ච, ඒ ස්ත්‍රියකරු ද; ආසජ්ජ, පැමිණ; ඩහෙ, දවන් නේද; තස්මා, එහෙයින්; අත්තනො ජීවිතං, තමන්ගේ දිවි; රක්ඛං, රක්‍ෂා කරන්නේ; තං, ඒ වහ්නිය; පරිවජ්ජෙය්‍ය, නොගටා දුරුකරන්නේය.

කණ්හවත්තනි, කෘෂ්ණවර්තමන් නම්වූ; පාවකො, (දවාපිවි තුරුකරන හෙයින්) පාවක නම් වූ; අග්ගි, වහ්නිය තෙම; යං වනං, යම් වනයක්; දහති, දවාද; තත්ථ, ගින්නෙන් දැවූ ඒ වෙනෙහි; අහොරත්තානං, දිවාරාත්‍රින්ගේ; (කාලයක්හුගේ) අච්චයෙ, ඇවෑමෙහි; පාරොහා, තෘණ වෘක්‍ෂාදීහු; ජායන්ති, හටගනිත්; (පැළවෙත්.)

යඤ්ච ඛො සීල සම්පන්නො — භික්ඛු දහති තෙජසා
න තස්ස පුත්තා පසවො — දායාද වින්දරෙ ධනං

අනපච්චා අදායාද — තාලාවත්ථු භවන්ති තෙ
තස්මා හි පණ්ඩිතො පොසො — සම්පස්සං අත්ථ මත්තනො

භුජඞ්ගමං පාවකඤ්ච — ඛත්තියඤ්ච යසස්සිනං
භික්ඛුඤ්ච සීලසම්පන්නං — සම්මදෙව සමාචරෙති.

එවං වුත්තෙ රාජා පසෙනදි කොසලො භගවන්තං එතද වොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය

---

සීලසම්පන්නො, සම්‍යක් ශීල ඇති; භික්ඛු, භික්ෂුතෙම; තෙජසා, ස්වකීය ශීලාදිගුණතෙජසින්; යඤ්චඛො, යමෙකුත්; දහති, දවාද; තස්ස, ඒ සිල්තෙදින් දැවුණු පුද්ගලාහට; පුත්තා, පුත්‍ර දුහිතෘහු ද; පසවො, ගො මහිෂාදි සිව්පාවෝද; න, නැතිවෙති; (වැනසෙතියි සේයි.) දායාද, ඔහුගේ දායාදයෝ; ධනං, ධනය; න වින්දරෙ, නො ලබත්;

තෙ, ඒ භික්ෂු තෙජසින් දැවුණු ජනයෝ; අනපච්චා, දූපුතුන් නැත්තෝ (වඳ) වෙත්; අදායාද, මවු පියන් සතු ධනයට හිමියෝ නොවෙත්; තාලාවත්ථුභවන්ති, මස්තකච්ඡින්න තාලවෘක්ෂයක් මෙන් වෙති; (නැවත හටගැනීමට නුසුදුසු ව සහමුලින් වඳ වෙත්.) තස්මාහි, එහෙයින් ම; පණ්ඩිතො පොසො, නුවණැති පුරුෂ තෙම; අත්තනො, තමහට; අත්ථං, වෘද්ධිය; සම්පස්සං, දක්නේ;

භුජඞ්ගමං, නාගයා කෙරෙහි ද; පාවකඤ්ච, වහ්නිය කෙරෙහි ද; යසස්සිනං, යස පිරිවර ඇති; ඛත්තියඤ්ච, රජකුමාරයා කෙරෙහි ද; සීලසම්පන්නං, සීලයෙන් සමන්විතවූ; භික්ඛුං ච, භික්ෂුව කෙරෙහි ද; සම්මා එව, මනාකොට ම; සමාචරෙ ඉති, හැසිරෙන්නේ යයි වදාළසේක;

එවං, මෙසේ; වුත්තෙ, වදාළ කල්හි; පසෙනදි කොසලො රාජා, පසේනාදි කොසොල්රජතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; අවොච කීයේය; භන්තෙ, ස්වාමීන් වහන්ස! අභික්කන්තං, (දම් දෙසුම) ඉතා යෙහෙක; භන්තෙ, ස්වාමිනි; අභික්කන්තං, ඉතා යෙහෙක; භන්තෙ, ස්වාමීන් වහන්ස! සෙය්‍යථාපි, යම්සේ; නික්කුජ්ජිතං වා, යටිකුරු කරන ලද්දක් හෝ; උක්කුජ්ජෙය්‍ය, උඩුකුරු කරන්නේ ද; පටිච්ඡන්නං වා, ප්‍රතිච්ඡන්නවූවක් හෝ; විවරෙය්‍ය, විවෘත කරන්නේ ද;

මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙල පජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එව මෙවං භගවතා අනෙක පරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## න උපසඤ්ඤත්තබ්බ සුත්තං

සාවත්ථියං-- එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදී කොසලො භගවන්තං එතදවොච අත්ථි නුඛො භන්තෙ ජාතස්ස අඤ්ඤත්‍ර ජරාමරණාති. නත්ථි ඛො මහාරාජ ජාතස්ස අඤ්ඤත්‍ර ජරාමරණා; යෙපි තෙ මහාරාජ ඛත්තියමහාසාළා

---

මූළ්හස්ස වා, මං මූළා වූවකුට හෝ; මග්ගං, මඟ; ආචික්ඛෙය්‍ය, කියන්නේ ද; චක්ඛුමන්තො, ඇස් ඇත්තෝ තුමූ; රූපානි,(නීලාදී) රූපයන්; දක්ඛින්ති ඉති, දකිත් යයි; අන්ධකාරෙ වා, අඳුරෙහි හෝ; තෙලපජ්ජොතං, තෙල් පහනක්; ධාරෙය්‍ය, (දල්වා) දරන්නේ ද; එවං එවං, එ පරිද්දෙන් ම; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; අනෙකපරියායෙන, නොයෙක් ප්‍රකාරයෙන්; ධම්මො, ධර්මය තෙම; පකාසිතො, ප්‍රකාශ කරන ලද්දේය; එසො අහං, මේ මම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ ද; ධම්මඤ්ච, (සපර්‍ය්‍යාප්තික නව ලෝකෝත්තර) ධර්මය ද; භික්ඛු සඞ්ඝඤ්ච, (අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) සංඝයා ද; සරණං ගච්ඡාමි, සරණ යෙමි; භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ, මං, මා; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, ප්‍රාණය ඇති තාක්; සරණං ගතං, සරණ ගියාවූ; උපාසකං, උපාසකයකු කොට; ධාරෙතු ඉති, ධරා ගන්නා සේක්වායි කීයේයි.

### න උපසඤ්ඤත්තබ්බසුත්තං, න උපසඤ්ඤත්තබ්බ සූත්‍රයයි;

සාවත්ථියං-පෙ-එකමන්තං, එකත්පසෙක; නිසින්නො ඛො, උන්නාවූ ද; පසෙනදි කොසලො රාජා, පසෙනදිකොසොල් රජ තෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; භන්තෙ, ස්වාමීනි; ජාතස්ස, උපන් සත්වයාහට; ජරාමරණා අඤ්ඤත්‍ර, ජරාමරණ යෙන් මිදීමෙක් නම්; අත්ථි නුඛො ඉති, ඇත්තේ දැයි; එතං, මේ කාරණය; අවොච, (පිළිවිසීම් වශයෙන්) කීයේය; (එසේ විචාළ රජහට භාග්‍යවතුන් වහන්සේ) මහාරාජ, මහරජ; ජාතස්ස, උපන්නාහට; ජරාමරණා අඤ්ඤත්‍ර, ජරාමරණයෙන් මිදීමෙක්; නත්ථි ඛො, නැත්තේ ම ය; මහාරාජ, මහරජ; යෙපි තෙ ඛත්තිය මහාසාළා, යම් ඒ ක්ෂත්‍රිය මහාසාර කෙනෙකුත්;

අඩ්ඪා මහද්ධනා මහා භොගා පහූත ජාතරූප රජතා පහූත විත්තූපකරණා පහූත ධනධඤ්ඤා, තෙසම්පි ජාතානං නත්ථි අඤ්ඤත්‍ර ජරාමරණා; යෙපි තෙ මහාරාජ බ්‍රාහ්මණමහාසාලා -පෙ- ගහපති මහාසාලා අඩ්ඪා මහද්ධනා මහාභොගා පහූත ජාතරූප රජතා පහූත විත්තූපකරණා පහූත ධනධඤ්ඤා, තෙසම්පි ජාතානං නත්ථි අඤ්ඤත්‍ර ජරාමරණා; යෙපි තෙ මහාරාජ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්ත සදත්ථා පරික්ඛීණ භවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා තෙසම්පායං කායො භෙදන ධම්මො නික්ඛෙපන ධම්මොති

---

අඩ්ඪා, ධනයෙන් ආඪ්‍යයෝ ද; මහද්ධනා, මහත් වස්තු ඇත්තෝ ද, මහාභොගා, මහත් උපභොග පරිභොග වස්තු ඇත්තෝ ද; පහූත ජාත රූප රජතා, බොහෝ රන් රිදී ඇත්තෝ ද; පහූත විත්තූප කරණා, බොහෝ වස්තූපකරණ ඇත්තෝද; පහූත ධන ධඤ්ඤා, බොහෝ ධනධාන්‍ය ඇත්තෝ ද; ජාතානං, උපන්නාවූ; තෙසං අපි, ඒ ක්‍ෂත්‍රිය මහාසාරයන්ට ද; ජරාමරණා අඤ්ඤත්‍ර, ජරා මරණයෙන් මිදීමෙක්; නත්ථි, නැත්තේය; මහාරාජ, මහ රජ; යෙපි තෙ බ්‍රාහ්මණමහාසාලා, යම් ඒ බ්‍රාහ්මණ මහාසාර කෙනෙකුත්; -පෙ- ගහපති මහාසාලා, ගෘහපති මහාසාර කෙනෙකුත්; අඩ්ඪා, ධනයෙන් ආඪ්‍යයෝ ද; මහද්ධනා, මහත් ධන ඇත්තෝ ද; මහාභොගා, මහත් භෝග ඇත්තෝද; පහූත ජාතරූපරජතා, බොහෝ රන් රිදී ඇත්තෝ ද; පහූත විත්තූපකරණා, බොහෝ වස්තූපකරණ ඇත්තෝ ද; පහූත ධනධඤ්ඤා, බොහෝ ධනධාන්‍ය ඇත්තෝ ද; ජාතානං, උපන් නාවූ; තෙසං අපි, ඒ ගෘහපති මහාසාරයන්ට ද; අඤ්ඤත්‍ර ජරාමරණා, ජරාමරණයෙන් මිදීමෙක්; නත්ථි, නැත්තේය; මහාරාජ, මහරජ; යෙපි තෙ භික්ඛූ, යම් ඒ භික්‍ෂූකෙනෙකුත්; අරහන්තො, රහත් වූවාහු ද; ඛීණාසවා, ක්‍ෂය කරනලද ආශ්‍රව ඇත්තාහු ද; වුසිතවන්තො, වැස නිමවනලද මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාහු ද; කතකරණීයා, කොට නිමවනලද ෂොඩශ විධ කෘත්‍යයන් ඇත්තාහුද; ඔහිතභාරා, බහානබන ලද කෙලෙස්බර ඇත්තාහු ද; අනුප්පත්තසදත්ථා, පැමිණෙන ලද ස්වාර්ථ සංඛ්‍යාත රහත්බව ඇත් තාහු ද; පරික්ඛීණභව සංයොජනා, ක්‍ෂයවූ භවබන්ධන ඇත්තාහුද; සම්මදඤ්ඤාවිමුත්තා, මනාකොට දැන මිදුණාහු ද; තෙසං අපි, ඒ භික්‍ෂූන්ගේ ද; අයං කායො, මේ කය; භෙදන ධම්මො, බිඳෙන ස්වභාව ඇත්තේය; නික්ඛෙපන ධම්මො ඉති, නිඃක්‍ෂෙප ස්වභාව ඇත්තේයි;

ජීරන්ති වෙ රාජරථා සුචිත්තා-අථො සරීරම්පි ජරං උපෙති
සතඤ්ච ධම්මො න ජරං උපෙති-සන්තො හවෙ සබ්භි පවෙදයන්තීති

ජරා මරණ සුත්තං.

—=—

සාවත්ථියං- එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි කෙසං නු ඛො පියො අත්තා කෙසං අප්පියො අත්තාති, තස්ස මය්හං භන්තෙ එතදහොසි: යෙ ඛො කෙචි කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති, තෙසං අප්පියො අත්තා; කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං පියො නො අත්තාති අථ ඛො තෙසං අප්පියො අත්තා; තං කිස්සහෙතු? යං හි අප්පියො අප්පියස්ස කරෙය්‍ය තං තෙ අත්තනාව අත්තනො කරොන්ති තස්මා තෙසං අප්පියො අත්තා,

---

සුචිත්තා,(සුවර්ණ රජත මුක්තාමාණික්‍යාදියෙන් හා සෙසුරථාලංකාරාදියෙන්) විසිතුරු කරන ලද්දාවූ; රාජරථා, රජුන්ගේ මඞ්ගලරථයො; වෙ, ඒකාන්තයෙන්; ජීරන්ති, දිරත්; අථො, යළි; සරීරම්පි, (කැවීම් පෙවීම් නැහැවීම් හැඳ පැලඳවීම් ආදියෙන් නොයෙක් ලෙස පරිහරණය කරනලද මේ) ශරීරය ද; ජරං, (ඛණ්ඩිච්චාදිවශයෙන්) දිරීමට; උපෙති, පැමිණෙයි; (මෙබඳු අනුපාදින්නක සාරදාරුමය රාජ රථයන් පවා දිරන කල්හි මේ ආඬ්‍යාත්මිකොපාදින්නකවූ මාංසලොහිතාදිමය ශරීරය කෙරෙහි කියනුම කිම, සිරුරත් දිරීමට යේ ම යයි සේයි.) සතං ධම්මො ච, බුද්ධාදි සත්පුරුෂයන්ගේ (නිර්වාණ) ධර්මය ම; ජරං න උපෙති, ජරාවට නො පැමිනේයි; සන්තො, බුද්ධාදි සජ්ජනයෝ; සබ්භි, සත්පුරුෂයන් සමග; හවෙ, ඒකාන්තයෙන්; පවෙදයන්ති, කථනය කෙරෙත්; ඉති, මෙසේ; (වදාළසේක.)

ජරාමරණ සුත්තං- ජරාමරණ සූත්‍රයයි.

---

සාවත්ථියං -පෙ- එකමන්තං -පෙ- භන්තෙ, ස්වාමීන්වහන්ස! රහො ගතස්ස, රහසිගතවූ; පටිසල්ලීනස්ස, විවේකයට පැමිණියාවූ; ඉධ මය්හං, මේ මාගේ; චෙතසො, සිතෙහි; පරිවිතක්කො, කල්පනාවෙක්; උදපාදි, පහළවූයේය; (එ නම්) අත්තා, තමා; කෙසං නුඛො, කවුරුන්ට තම්; පියො, ප්‍රිය ද; අත්ත, තමා; කෙසං, කවුරුන්ට තම්; අප්පියො ඉති, අප්‍රිය දැයි (කියායි)

භන්තෙ, ස්වාමිනි! තස්ස මය්හං, ඒ මට; එතං, මේ සිත; අහොසි, වූයේය; (එ නම්:-) යෙ ඛො කෙචි, යම්කිසි කෙනෙක්;

යෙ ච ඛො කෙචි කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති තෙසං පියො අත්තා, තං කිස්ස හෙතු? යංහි පියො පියස්ස කරෙය්‍ය තං තෙ අත්තනාව අත්තනො කරොන්ති තස්මා තෙසං පියො අත්තාති.

එවමෙතං මහාරාජ එවමෙතං මහාරාජ, යෙහි කෙචි මහාරාජ කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා

---

කායෙන, කයින්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; වාචාය, වචනයෙන්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; මනසා, සිතින්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, අප්‍රිය ය; කිඤ්චාපි, කිසිසේත්; තෙ, ඔහුතුමු; තො, අපට; අත්තා, ආත්මය; පියො ඉති, ප්‍රිය යයි; වදෙය්‍යුං; කියන්නාහු ද; අථ ඛො, එසේ ද වුවත්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, අප්‍රිය ය; තං කිස්ස හෙතු? ඊට හේතු කවරේද? අප්පියො, අප්‍රිය පුද්ගලයෙක්; අප්පියස්ස, අප්‍රියපුද්ගලයක්හට; යං, යම් අයහපතක්; කරෙය්‍ය, කරන්නේ ද; තං. ඒ අයහපත; තෙ, ඔහුතුමූ; අත්තනා එව, තුමූ ම; අත්තනො, ආත්මයට; කරොන්ති, කෙරෙත්; තස්මා, එහෙයින්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, අප්‍රිය වන්නේය;

යෙ ච ඛො කෙචි, යම්කිසි කෙනෙකුත්; කායෙන, කයින්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; වාචාය, වචනයෙන්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; මනසා, සිතින්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; පියො, ප්‍රියය; තෙ, ඔහු තුමූ; කිඤ්චාපි, කිසිසේත්; නො, අපට; අත්තා, ආත්මය; අප්පියො ඉති, අප්‍රියයයි; එවං, මෙසේ; වදෙය්‍යුං; කියන්නාහුද; අථ ඛො, එසේ ද වුවත්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; පියො, ප්‍රිය වේ; තං කිස්ස හෙතු? ඊට හේතු කවරේද? හි, යම්හෙයකින්; පියො, ප්‍රියපුද්ගලයෙක්තෙම; පියස්ස, ප්‍රියපුද්ගලයක්හට; යං, යම් යහපතක්; කරෙය්‍ය, කරන්නේ නම්; තෙ, ඔහුතුමූ; තං, එය; අත්තනා එව, තුමූම; අත්තනො, ආත්මයට; කරොන්ති, කෙරෙත්; තස්මා, එහෙයින්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; පියො ඉති, ප්‍රිය වන්නේයි; (කියායි)

මහාරාජ, මහරජ! එවං, මේ කාරණය; එවං, එසේය; මහාරාජ, මහරජ! යෙහි කෙචි, යම්කිසි කෙනෙක් වනාහි; කායෙන, කයින්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; වාචාය, වචනයෙන්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; මනසා සිතින්; දුච්චරිතං, දුශ්චරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, අප්‍රිය වන්නේය.

දුච්චරිතං චරන්ති තෙසං අප්පියො අත්තා, කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං පියො නො අත්තාති අථඛො තෙසං අප්පියො අත්තා තං කිස්ස හෙතු? යංහි මහාරාජ අප්පියො අප්පියස්ස කරෙය්‍ය තං තෙ අත්තනාව අත්තනො කරොන්ති තස්මා තෙසං අප්පියො අත්තා, යෙච ඛො කෙචි මහාරාජ කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති තෙසං පියො අත්තා, කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං අප්පියො නො අත්තාති අථ ඛො තෙසං පියො අත්තා; තං කිස්සහෙතු? යංහි මහාරාජ පියො පියස්ස කරෙය්‍ය තං තෙ අත්තනාව අත්තනො කරොන්ති, තස්මා තෙසං පියො අත්තාති, ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:--

---

කිඤ්චාපි, කිසිසේත්; තෙ, ඔහුතුමූ; නො, අපට; අත්තා ආත්මය; පියො ඉති, ප්‍රිය යයි; එවං, මෙසේ; වදෙය්‍යුං, කියන්නාහුද; අථ ඛො, එසේද වුවත්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, ප්‍රිය නොවන්නේය; තං කිස්ස හෙතු, ඊට හේතු කවරේ ද; මහාරාජ, මහරජ; හි, යම් හෙයකින්; අප්පියො, අප්‍රිය පුද්ගලයෙක් තෙම; අප්පියස්ස, අප්‍රිය පුද්ගලයෙක්හට; යං, යමක්; කරෙය්‍ය, කරන්නේ ද; තං, එය; තෙ, ඔහුතුමූ; අත්තනා එව, තුමූම; අත්තනො, ආත්මයට; කරොන්ති, කොරෙත්; තස්මා, එහෙයින්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; අප්පියො, අප්‍රිය වන්නේය; මහාරාජ, මහරජ; යෙ ච ඛො කෙචි, යම් කිසි කෙනෙකුත්; කායෙන, කයින්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; වාචාය, වචනයෙන්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද; මනසා, සිතින්; සුචරිතං, සුචරිතයෙහි; චරන්ති, හැසිරෙද්ද: තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; පියො, ප්‍රිය වෙයි; කිඤ්චාපි, කිසිසේත්; තෙ, ඔහුතුමූ; නො, අපට; අත්තා, ආත්මය; අප්පියො ඉති, අප්‍රිය යයි; එවං, මෙසේ; වදෙය්‍යුං, කියන්නාහුද; අථඛො, එසේද වුවත්, තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය; පියො, ප්‍රියවන්නේය; තං කිස්ස හෙතු, ඊට හේතු කවරේද? මහාරාජ, මහරජ! පියො, ප්‍රිය පුද්ගලයෙක් තෙම; පියස්ස, ප්‍රිය පුද්ගලයක්හට; හි, යම්හෙයකින්; යං, යමක්; කරෙය්‍ය, කරන්නේ ද; තං, එය; තෙ, ඔහුතුමූ; අත්තනා එව, තුමූම; අත්තනො, ආත්මයට; කරොන්ති, කොරෙත්: තස්මා, එහෙයින්; තෙසං, ඔවුන්ට; අත්තා, ආත්මය පියො ඉති, ප්‍රිය යයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ කාරණය; අවොච, වදාළසේක; සුගතො, සොභන ගති ඇත්තාවූ; සත්ථා සංස්තෲන් වහන්සේ; ඉදං, මෙය; වත්වා, වදාරා; අථ, නැවත; අපරං, අන්‍යවූ; එතං, මේ ගාථාබන්ධනය; අවොච, වදාළසේක.

අත්තානඤ්චෙ පියං ජඤ්ඤා—න තං පාපෙන සංයුජෙ
න හි තං සුලභං හොති—සුඛං දුක්කට කාරිනො
අන්තකෙනාධි පන්නස්ස—ජහතො මානුසං භවං
කිං හි තස්ස සකං හොති—කිඤ්ච ආදාය ගච්ඡති
කිඤ්චස්ස අනුගං හොති—ඡායාව අනපායිනී
උභො පුඤ්ඤඤ්ච පාපඤ්ච— යං මච්චො කුරුතෙ ඉධ
තං හි තස්ස සකං හොති—තඤ්ච ආදාය ගච්ඡති
තඤ්චස්ස අනුගං හොති—ඡායාව අනපායිනී
තස්මා කරෙය්‍ය කල්‍යාණං—නිචයං සම්පරායිකං
පුඤ්ඤානි පරලොකස්මිං—පතිට්ඨා හොන්ති පාණිනන්ති

අත්තපපිය සුත්තං

චෙ, ඉදින්; අත්තානං, තමා; පියං ජඤ්ඤා, (තමහට) ප්‍රිය යයි දන්නේ නම්; තං, ඒ තමා; පාපෙන, පාපය හා; න සංයුජෙ, නොයොදන්නේය; (කුසලින් දුරුව දුශ්චරිතයෙහි යෙදුණේ නම් හේ තමා යෙදුවා නම් වේ) තං සුඛං, (සුචරිතයන්ගේ විපාක වශයෙන් ලැබිය යුතු) ඒ සැපය; දුක්කට කාරිනො, දුෂ්කෘතකාරිහට; හෙවත් පවුකරන පුගුලාහට; නහි සුලභං හොති, සුලභ නොවේ; (දුර්ලභ යයි සේයි)

අන්තකෙන, මරහු විසින්; අධිපන්නස්ස, මඩනාලද්දාවූ; (යටත් කොට ගන්නාලද්දාවූ) මානුසං භවං, මනුෂ්‍යාත්ම භාවය; ජහතො, අත්හරින්නාවූ; හෙවත් පරලොව යන්නාවූ; තස්ස, ඒ සත්‍වයාහට; කිං හි සකං හොති, කුමක් නම් සවකීය වේ ද; කිඤ්ච, කුමක් නම්; ආදාය, රැගෙන; ගච්ඡති, යේ ද; අස්ස, මේ පරලොව යන සත්හට; අනපායිනී, අත්නැර නොයන්නාවූ; ඡායා ඉව, සෙවනැල්ල මෙන්; කිං ච අනුගං හොති. කුමක් නම් අනුගාමී (තමා අත්නොහැර කැටුව යන්නේ) වේ ද;

ඉධ, මෙ ලෙව්හි; මච්චො, මනුෂ්‍ය තෙම; යං පුඤ්ඤං ච, යම් පිනක් ද; පාපං ච, යම් පවක්දැයි; උභො, දෙකක්; කුරුතෙ, කොරේ ද; තං හි, ඒ පුණ්‍ය පාප දෙක ම; තස්ස, ඕහට; සකං හොති, සවකීය වේ; තං ච, එය ම; ආදාය, රැගෙන; ගච්ඡති, යෙයි; තං ච, එය ම; අස්ස, ඕහට; අනපායිනී, අත්හැර නොයන්නාවූ; ඡායා ඉව, සෙවනැල්ල මෙන්; අනුගං හොති, අනුව යන්නේ වේ;

තස්මා, එහෙයින්; නිචයං, සුබාර්ත්‍ථීන් විසින් උපචිතව්‍යවූ; සම්පරායිකං, පරලොව හිත සැප නිපදවන්නාවූ; කල්‍යාණං, කුශලය; කරෙය්‍ය, කරන්නේය; පුඤ්ඤානි, පුණ්‍යයෝ; පරලොකස්මිං, පරලෙව්හිදී; පාණිනං, සත්‍වයන්ට; පතිට්ඨා හොන්ති, පිහිට වෙත්;

අත්තපපිය සුත්තං, ආත්ම ප්‍රිය සූත්‍රයයි;

**සාවත්ථියං:-** එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි අප්පකා තෙ සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා නචෙව මජ්ජන්ති න ච පමජ්ජන්ති න ච කාමෙසු ගෙධං ආපජ්ජන්ති න ච සත්තෙසු විප්පටිපජ්ජන්ති, අථ ඛො එතෙව සත්තා බහුතරා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා මජ්ජන්ති චෙව පමජ්ජන්ති කාමෙසු ච ගෙධං ආපජ්ජන්ති සත්තෙසු ච විප්පටිපජ්ජන්තී ති.

එවමෙතං මහාරාජ එවමෙතං මහාරාජ අප්පකා තෙ මහාරාජ සත්තා ලොකස්මිං යෙ උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා න චෙව මජ්ජන්ති න ච පමජ්ජන්ති න ච කාමෙසු ගෙධං ආපජ්ජන්ති න ච සත්තෙසු විප්පටිපජ්ජන්ති

---

සාවත්ථියං -පෙ- උදපාදී, පහළවූයේය;(එනම්:-) යෙ, යම්සත්ත්ව කෙනෙක්; උළාරෙ උළාරෙ, ප්‍රණීත වූ ද බොහෝ වූ ද; භොගෙ, උපභොග පරිභොග වස්තූන්; ලභිත්වා, ලැබ; න චෙව මජ්ජන්ති, මත් නොවෙත්ද; නච පමජ්ජන්ති, ප්‍රමාද නො වෙත් ද; කාමෙසු, කාමයන්හි; ගෙධං, ගිජුබවට; න ච ආපජ්ජන්ති, නො පැමිණෙත් ද; සත්තෙසු, සත්ත්වයන් කෙරෙහි; න ච විප්පටිපජ්ජන්ති, වරදවා නො පිළිපදිත් ද; තෙ සත්තා, ඒ සත්ත්වයෝ; ලොකස්මිං, ලෝකයෙහි; අප්පකා, ස්වල්පයහ; අථ ඛො, හුදෙක්; යෙ. යම් සත්ත්වකෙනෙක්; උළාරෙ උළාරෙ භොගෙ, ප්‍රණීතවූ ද බොහෝවූ ද සම්පත්; ලභිත්වා, ලැබගෙන; මජ්ජන්ති චෙව, මත් වෙත් ද; පමජ්ජන්ති ච, ප්‍රමාද වෙත් ද; කාමෙසු, කාමයන්හි; ගෙධං, ගිජුබවට; ආපජ්ජන්ති, පැමිණෙත් ද; සත්තෙසු ච, අන්‍ය සත්ත්වයන් කෙරෙහිත්; විප්පටිපජ්ජන්ති, වරදවා පිළිපදිත් ද; එතෙව සත්තා, මේ සත්ත්වයෝ ම; ලොකස්මිං ලෝකයෙහි; බහුතරා ඉති, ඉතා බොහෝ වෙත්ය (කියාසි.)

මහාරාජ, මහරජ; එතං, තෙල තොපගේ පරිවිතර්කය: එවං, එසේය; මහාරාජ, මහරජ; ලොකස්මිං, ලෝකයෙහි; යෙ, යම් සත්ත්ව කෙනෙක්; උළාරෙ උළාරෙ භොගෙ, ප්‍රණීත වූ ද බොහෝ වූ ද; සම්පත්; ලභිත්වා, ලැබගෙන; න චෙව මජ්ජන්ති, මත් නො වෙත් ද; න ච පමජ්ජන්ති, ප්‍රමාද නො වෙත් ද; කාමෙසු, කාමයන්හි; ගෙධං, ගිජුබවට; නච ආපජ්ජන්ති, නොපැමිණෙත් ද; සත්තෙසු, සත්ත්වයන් කෙරෙහි; නච විප්පටිපජ්ජන්ති, වරදවා නොපිළිපදිද්ද; තෙ සත්තා, ඒ සත්ත්වයෝ; අප්පකා, ස්වල්පයහ;

අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ ලොකස්මිං උළාරෙ උළාරෙ භොගෙ ලභිත්වා මජ්ජන්ති චෙව පමජ්ජන්ති ච කාමෙසු ච ගෙධං ආපජ්ජන්ති සත්තෙසු ච විප්පටිපජ්ජන්තීති.

සාරත්තා කාමභොගෙසු—ගිද්ධා කාමෙසු මුච්ඡිතා
අතිසාරං න බුජ්ඣන්ති—මිගා කූටංව ඔඩ්ඩිතං
පච්ඡාසං කටුකං හොති—විපාකො හිස්ස පාපකොති

## පමාද සුත්තං

---

**සාවත්ථියං—**

එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: අත්ථිනුඛො භන්තෙ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

---

අථඛො, හුදෙක් ලොකස්මිං, ලෙව්හි; යෙ, යම් සත්වකෙනෙක්; උළාරෙ උළාරෙ, ප්‍රණීතවූද බොහෝ වූ ද; භොගෙ, උපභොග පරිභොග වස්තූන්; ලභිත්වා, ලැබ; මජ්ජන්ති ච එව, මත් වෙත් ද; පමජ්ජන්ති ච, ප්‍රමාද වෙත්ද; කාමෙසු, කාමයන්හි; ගෙධං, ගිජු බවට; ආපජ්ජන්ති ච, පැමිණෙත් ද; සත්තෙසු, සත්වයන් කෙරෙහි; විප්පටිපජ්ජන්ති ච, වරදවා පිළිපදිද්ද; එතෙව සත්තා, මේ සත්වයෝම; බහුතරා ඉති, ඉතා බොහෝ වෙත් යයි; (වදාළසේක)

කාමභොගෙසු, කාමවස්තූන් කෙරෙහි; සාරත්තා, අතිරක්තව ඇලුණාහු; කාමෙසු, කාමයන්හි; ගිද්ධා, (ලොභවශයෙන්) ගිජුවූවාහු; මුච්ඡිතා, අතිශයින් මූළාවට පැමිණියාහු; ඔඩ්ඩිතං, (වැද්දන් විසින්) බහාතැබූ; කූටං, පාශය (නොදන්නාවූ) මිගා ඉව, මුවන් මෙන්; අතිසාරං, (කුශලමර්‍යාදාව) ඉක්මවා යාම; න බුජ්ඣන්ති, නොදනිත්; හි, යම් හෙයකින්; අස්ස, ඒ පාපකර්මියාගේ; විපාකො, විපාකය තෙම; පාපකො, ලාමක ද. (එහෙයින්) පච්ඡා, පසුව; එසං, ඔවුන්ට; කටුකං හොති ඉති, කටුක ඵල වේ යයි (වදාළසේක)

**පමාදසුත්තං, ප්‍රමාදසූත්‍රයයි.**

---

සාවත්ථියං —පෙ— එකමන්තං, එකත්පසෙක —පෙ— අවොච, කියේය; භන්තෙ, ස්වාමීන්වහන්ස! යො, යම් ධර්මයෙක්; දිට්ඨධම්මිකං අත්ථඤ්ච එව, ඉහාත්මයෙහි වූ අර්ථය ද: සම්පරායිකඤ්ච, පරලෙව්හි වන අර්ථයද (යන) උභො අත්ථෙ, අර්ථදෙක; සමධිගය්හ, (තමාට අනුව පැවැත්වීම් වශයෙන්) ගෙන; තිට්ඨති, සිටී ද (එබඳුවූ) එකො ධම්මො, එකධර්මයෙක් අත්ථිනුඛො ඉති, ඇත්දැයි (විචාළේය)

අත්ථි ඛො මහාරාජ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති. කතමො පන භන්තෙ එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති. අප්පමාදො ඛො මහාරාජ එකො ධම්මො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති. සෙය්‍යථාපි මහාරාජ යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො මහාරාජ අප්පමාදො එකො ධම්මො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

---

මහාරාජ, මහරජ; යො, යම් ධර්මයෙක්තෙම; දිට්ඨධම්මිකං ච එව-පෙ- තිට්ඨති, සිටීද; (එබඳුවූ) එකො ධම්මො, එක ධර්මයෙක්; අත්ථි ඛො ඉති, ඇත්තේම යයි (වදාළසේක) භන්තෙ-පෙ-තිට්ඨති; සිටීද; එකො ධම්මො, (ඒ) එක ධර්මය තෙම; කතමො පන ඉති, කවරේදැයි; (විචාළේය.) මහාරාජ, මහරජ; යො එකො ධම්මො, යම් එක ධර්මයෙක්; දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, ඉහාත්මභාවයෙහිවූ අර්ථයද; සම්පරායිකඤ්ච, පරලෙව්හි වන අර්ථයද; (යන) උභො අත්ථෙ, අර්ථ දෙක; සමධිගය්හ, (තමාට අනුව පැවැත්වීම් වශයෙන්) ගෙන; තිට්ඨති, සිටී ද; (ඒ ධර්මය) අප්පමාදො ඛො ඉති, කුශල ධර්මයන්හි සමෘති අවිප්‍රවාස සඞ්ඛ්‍යාතවූ) අප්‍රමාදය නම්;

මහාරාජ, මහරජ; ජඞ්ගමානං, පෘථිවියෙහි හැසිරෙන්නාවූ; පාණානං, ප්‍රාණීන්ගේ; යානි කානිචි පදජාතානි, යම්කිසි පා සමූහ කෙනෙක් ඇද්ද; තානි සබ්බානි, ඒ සියලු පාදයෝ; හත්ථිපදෙ, හස්ති පාදයෙහි; සමොධානං, ඇතුලත්වීමට; සෙය්‍යථාපි, යම්සේ; ගච්ඡන්ති, පැමිණෙත්ද; යං ඉදං, යම්මේ; හත්ථිපදං, හස්තිපාදය; තෙසං, ඒ පා සමූහයන් අතුරෙන්: මහන්තත්තෙන, මහත්බැවින්; අග්ගං අක්ඛායති, අග්‍රයයි කියනු ලැබේද; මහාරාජ, මහරජ; එවං එව, එපරිද්දෙන්ම; අප්පමාදො ඛො, අප්‍රමාද නම්වූ; එකො ධම්මො, එකධර්මයතෙම; දිට්ඨධම්මිකඤ්ච එව අත්ථං, ඉහාත්මභාවයෙහිවූ අර්ථයද; සම්පරායිකඤ්ච, පරලෙව්හි වන අර්ථයද (යන) උභො අත්ථෙ, අර්ථදෙක; සමධිගය්හ, (තමහට අනුව පැවැත්වීම් වශයෙන්) ගෙන; තිට්ඨති ඉති, සිටීයයි (වදාරා):-

ආයුං ආරොගියං වණ්ණං – සග්ගං උච්චාකුලීනතං
රතියො පත්ථයන්තෙන—උළාරා අපරාපරා

අප්පමාදං පසංසන්ති—පුඤ්ඤකිරියාසු පණ්ඩිතා,
අප්පමත්තො උභො අත්ථෙ—අධිගණ්හාති පණ්ඩිතො

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො—යො චත්ථො සම්පරායිකො.
අත්ථාභිසමයා ධීරො—පණ්ඩිතොති පවුච්චතී ති.

අප්පමාද සුත්තං.

---

ආයුං, ආයුෂ ද; ආරොගියං, නිරොගි බව ද; වණ්ණං, ශරීර වර්ණයද; සග්ගං, ස්වර්ගයද; උච්චාකුලීනතං, උසස්කුල ඇතිබවද; උළාරා, ප්‍රණීතවූ; අපරාපරා, (අපරාපර්‍යායෙන් ප්‍රවෘත්තිවශයෙන් හා විශිෂ්ටතර වශයෙනුත්) අන්‍යෝන්‍යවූ; රතියො, දිව්‍ය මානුෂික පඤ්චකාමරතීන් හා ධ්‍යාන විදර්ශනා මාර්ගඵල සමාපත්ති රතීන්ද, පත්ථයන්තෙන;පතන්නහු විසින්;(අප්‍රමාදය ම කටයුතුයි)

පණ්ඩිතා, බුද්ධාදි අග්‍ර පණ්ඩිතයෝ; පුඤ්ඤකිරියාසු, දානාදි පුණ්‍යක්‍රියාවන්හි; අප්පමාදං, ප්‍රමාද නොවීම; පසංසන්ති, ප්‍රශංසා කෙරෙත්.(කුමක්හෙයින්දයත්)අප්පමත්තො, අප්‍රමාදවූ;පණ්ඩිතො පණ්ඩිතතෙම; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මභාවයෙහිම; යො අත්ථො, (යම්කිසි වස්තූපකරණ ආඪ්‍යකුලකර්මාන්තාදි ගෘහස්ථයන් පිළිබඳවූද චතුෂ්ප්‍රත්‍යය ප්‍රතිලාභාදි පැවිද්දන් පිළිබඳවූද)යම් අර්ථයෙක් ඇද්ද; සම්පරායිකො, පාරලෞකික ඵල නිපදවන්නාවූ; යොච අත්ථො, (ධර්මචර්‍යා හා සද්ධර්මශ්‍රවණ යොනිසොමනසිකාරාදි) යම් අර්ථයෙකුත් වේ ද; උභො අත්ථෙ, මෙකී උභයාර්ථයන්; අධිගණ්හාති, (යම් හෙයකින්) සම්පාදනයකරගනීද; (එහෙයින්) අත්ථාභිසමයා, අර්ථප්‍රතිලාභය හේතු කොට ගෙන; (යථොක්ත විවිධාර්ථය හා පරමාර්ථ නිර්වාණයත් ලබනහෙයින්) ධීරො, ධෘතිසම්පන්න ජනතෙම, පණ්ඩිතො ඉති, පණ්ඩිත යයි; පවුච්චති, කියනු ලැබේ;

අප්පමාදසුත්තං, අප්‍රමාද සූත්‍රයයි;

——:||:——

සාවත්ථියං — අථ ඛො රාජා පසෙනදි කොසලො දිවා දිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච හන්ද කුතො නු ත්වං මහාරාජ ආගච්ඡසි දිවා දිවස්සානි. ඉධ භන්තෙ සාවත්ථියං සෙට්ඨි ගහපති කාලකතො තම හං අපුත්තකං සාපතෙය්‍යං රාජන්තෙපුරං අභිහරිත්වා ආගච්ඡාමි සතං භන්තෙ සතසහස්සානං හිරඤ්ඤස්සෙව, කො පන වාදො රූපියස්ස; තස්ස ඛො පන භන්තෙ සෙට්ඨිස්ස ගහපතිස්ස එවරූපො භත්ත භොගො අහොසි කණාජකං භුඤ්ජති බිලඞ්ගදුතියං, එවරූපො වත්ථභොගො අහොසි සාණං ධාරෙති තිපක්ඛවසනං, එවරූපො යානභොගො අහොසි ජජ්ජර රථෙන යාති පණ්ණච්ඡත්තකෙන ධාරිය මානෙනාති

---

සාවත්ථියං-පෙ-

අථ ඛො, ඉක්බිති; පසෙනදි කොසලො රාජා, පසේනාදි කොසොල්රජතෙම්; දිවා දිවස්ස, දවස සම්බන්ධ දවල්(මධ්‍යාහ්නකාල යෙහි;) භගවා, භාග්‍යවතුන්වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, උන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නං, උන්නාවූ; පසෙනදි කොසලං රාජානං ඛො, පසේනාදි කොසොල්රජහට වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; මහාරාජ, මහරජ; ත්වං තුඹ; දිවා දිවස්ස, දවස සම්බන්ධ දවාලෙහි; කුතො, කොතැනකින්; හන්ද, කුමක්කරමින් සිට; ආගච්ඡසි නු ඉති, එන්නෙහි දැයි; එතං, මේ වචනය; අවොච, අසා වදාළසේක;

භන්තෙ, ස්වාමිනි! ඉධසාවත්ථියං, මේ සැවැත්නුවරෙහි; සෙට්ඨි ගහපති, සිටු ගෘහපති තෙම; කාලකතො, කාලක්‍රියා කෙළේය; අහං, මම; අපුත්තකං, පුත්‍රයකු නැත්තාවූ; තං සාපතෙය්‍යං, (ඔහුගේ ඒ සම්පත්තිය; රාජන්තෙපුරං, රාජාන්තඃ පුරයට; අභිහ රිත්වා, ගෙන්වා; (හබා) ආගච්ඡාමි, ආයෙමි; භන්තෙ. ස්වාමිනි! (ඔහුගේ) හිරඤ්ඤස්ස එව, ස්වර්ණයාගේ ම (පමණ); සතසහස්සා නං සතං, සියක් ලක්‍ෂයෙක් වෙයි; රූපියස්ස පන, රිදියගේවනාහි (පමණ); කො පන වාදෙ, කියනුම කවරේද; භන්තෙ, ස්වාමිනි! තස්ස සෙට්ඨිස්ස ගහපතිස්ස ඛො පන, ඒ සිටු ගෘහපතිහුගේ වනාහි; එවරූපො, මෙ බඳුවූ; භත්ත භොගො අහොසි, බත් අනුභව

එවමෙතං මහාරාජ එවමෙතං මහාරාජ භූතපුබ්බං සො මහාරාජ සෙට්ඨි ගහපති තගරසිඛිං නාම පච්චෙකබුද්ධං පිණ්ඩපාතෙන පතිමානෙසි දෙථ සමණස්ස පිණ්ඩපාතන්ති වත්වා උට්ඨායාසනා පක්කාමි, දත්වා ච පන පච්ඡා විප්පටිසාරී අහොසි වරමෙතං පිණ්ඩපාතං දාසා වා කම්මකරා වා භුඤ්ජෙය්‍යුන්ති. භාතු ච පන එකපුත්තකං සාපතෙය්‍යස්ස කාරණා ජීවිතා වොරොපෙසි යං ඛො සො මහාරාජ සෙට්ඨි ගහපති තගරසිඛිං පච්චෙකබුද්ධං පිණ්ඩපාතෙන පතිමානෙසි, තස්ස කම්මස්ස විපාකෙන සත්තක්ඛත්තුං සුගතිං සග්ගං ලොකං උපපජ්ජි; තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන ඉමස්මිංයෙව සාවත්ථියං සත්තක්ඛත්තුං සෙට්ඨිත්තං කාරෙසි.

---

කිරි මෙක් වූයේය; බිලඞ්ගදුතියං, කාඩි දෙවන කොට ඇති; කණාජකං, කුඩු සහිත බත; භුඤ්ජති, අනුභව කෙරෙයි; එවරූපො, මෙ බඳු වූ; වත්ථ භොගො අහොසි, වස්ත්‍ර පරිභොගයෙක් වූයේය; තිපක්ඛවසනං; තුන් කඩක් දෙතැනකින් ගෙත්තම් කොට කරන ලද වස්ත්‍රයක් වූ; සාණං, ගණ වැහැරි වස්ත්‍රයක්; ධාරෙති, දරයි; එවරූපො, මෙ බඳු වූ; යානභොගො අහොසි, යාන පරිභොග යෙක් වූයේය; ජජ්ජර රථෙන, දිරූ රථයකින්; යාති, යෙයි; පණ්ණච්ඡත්තකෙන, පත් කුඩයක්; ධාරියමානෙනාති, දරණු ලැබීමෙනැයි; (කීයේය) මහාරාජ. මහරජ! එතං, මේ කාරණය; එවං, එසේය; මහාරාජ, මහරජ! එතං, මේ කාරණය; එවං, එසේය; මහාරාජ, මහරජ! භූතපුබ්බං, පෙර වූයෙක; සො සෙට්ඨි ගහපති, ඒ සිටු ගෘහපති තෙම; තගරසිඛිං නාම පච්චෙකබුද්ධං, තගර සිඛී නම් පසේබුදුන්; පිණ්ඩපාතෙන පතිමානෙසි, ආහාර යෙන් පූජාකෙළේය; සමණස්ස, ශ්‍රමණයාහට; පිණ්ඩපාතං, පිණ්ඩ පාතය; දෙථ ඉති, දෙව්යයි, වත්වා, කියා; ආසනා, ආසනයෙන්; උට්ඨාය නැගිට; පක්කාමි, ගියේය; දත්වා ච පන, (පිණ්ඩපාතය) දීද වනාහි; පච්ඡා, පසුව; විප්පටිසාරී අහොසි, විපිළිසර වූයේය; එතං පිණ්ඩපාතං, මේ පිණ්ඩපාතය; දාසා වා, දාසයෝ හෝ; කම්ම කරා වා, කම්කරුවෝ හෝ; භුඤ්ජෙය්‍යුං, අනුභවකළා හු නම්; වරං ඉති, උතුම්යයි; විප්පටිසාරී අහොසි, විපිළිසර වූයේය; භාතු, (වැඩිමහලු) සහෝදරයාගේ; එක පුත්තකං ච පන, එක ම පුත්‍රයාත්; සාපතෙය්‍යස්ස කාරණා, වස්තුව හිමිකරගැනීම හේතු කොටගෙන; ජීවිතා වොරොපෙසි, දිවි තොර කෙළේය;

මහාරාජ, මහරජ! යං ඛො, යම් හෙයකින්; සො සෙට්ඨිගහපති, ඒ සිටු ගෘහපතිතෙම; තගර සිඛිං පච්චෙකබුද්ධං, තගර සිඛි පසේබුදුන්; පිණ්ඩපාතෙන, පිණ්ඩපාතයෙන්; පතිමානෙසි, පූජා

යං බො සො මහාරාජ සෙට්ඨි ගහපති දත්වා පච්ඡා විප්පටිසාරී අහොසි වරමෙතං පිණ්ඩපාතං දාසා වා කම්මකරා වා භුඤ්ජෙය්‍යුන්ති. තස්ස කම්මස්ස විපාකෙන නාස්සුළාරාය භත්තභොගාය චිත්තං නමති නාස්සුළාරාය වත්ථභොගාය චිත්තං නමති නාස්සුළාරාය යානභොගාය චිත්තං නමති නාස්සුළාරානං පඤ්චන්නං කාමගුණානං භොගාය චිත්තං නමති.

යං බො සො මහාරාජ සෙට්ඨි ගහපති භාතු ච පන එකපුත්තකං සාපතෙය්‍යස්ස කාරණා ජීවිතා වොරොපෙසි. තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චි තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන ඉදං සත්තමං අපුත්තකං සාපතෙය්‍යං රාජකොසං පවෙසෙති.

---

කොළේද; තස්ස කම්මස්ස, ඒ කුශල කර්මයාගේ; විපාකෙන, විපාකයෙන්; සත්තක්ඛත්තුං, සත්වරක්; සුගතිං, යහපත් ගති ඇත්තාවූ; සග්ගං ලොකං, ස්වර්ගලෝකය කරා; උපපජ්ජි, උත්පත්ති වශයෙන් පැමිණියේය; තස්ස කම්මස්ස එව, - කුශලකර්මයාගේම; විපාකාව සෙසෙන, ඉතිරි වූ විපාකයෙන්; ඉමස්මිං සාවත්ථියං එව, මේ සැවැත් නුවර ම; සත්තක්ඛත්තුං, සත්වරක්; සෙට්ඨිත්තං සිටුබව; කාරෙසි කැරවූයේය;

මහාරාජ, මහරජ! යං ඛො, යම් හෙයකින්; සො සෙට්ඨි ගහපති, ඒ සිටු ගෘහපතිතෙම; දත්වා, දානය දී; පච්ඡා, පසුව; එතං පිණ්ඩපාතං, මේ පිණ්ඩපාතය; දාසා වා, දාසයෝ හෝ; කම්මකරා වා, කර්මකරයෝ හෝ; භුඤ්ජෙය්‍යුං, අනුභව කළාහු නම්; වරං ඉති, උතුමැයි; විප්පටිසාරී අහොසි, විපිළිසරවූයේද; තස්ස කම්මස්ස, ඒ පාපකර්මයාගේ; විපාකෙන, විපාකයෙන්; උළාරාය, ප්‍රණීතවූ; භත්තභොගාය, භත්තානුභවයට; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; න නමති, නො නැමෙයි; උළාරාය, මහත්වූ; වත්ථභොගාය, වස්ත්‍ර පරිභොගයට; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; න නමති, නො නැමෙයි; උළාරාය, මහත්වූ; යානභොගාය, යානපරිභොගයට; අස්ස ඔහුගේ; චිත්තං, සිත; න නමති, නො නැමෙයි; උළාරානං, මහත්වූ; පඤ්චන්නං කාමගුණානං, පඤ්චකාම ගුණයන්ගේ භොගාය, අනුභවය පිණිස; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; න නමති, නොනැමෙයි.

තස්ස ඛො පන මහාරාජ සෙට්ඨිස්ස ගහපතිස්ස පුරාණඤ්ච පුඤ්ඤං පරික්ඛීණං නවඤ්ච පුඤ්ඤං අනුපචිතං අජ්ජ ච පන මහාරාජ සෙට්ඨී ගහපති මහා රොරුවෙ නිරයෙ පච්චතීති. එවං භන්තෙ සෙට්ඨි ගහපති මහා රොරුවෙ නිරයෙ උපපන්නොති එවං මහාරාජ සෙට්ඨි ගහපති මහා රොරුවෙ නිරයෙ උපපන්නොති.

---

මහාරාජ, මහරජ! යං ඛො, යම්හෙයකින්; සො සෙට්ඨිගහපති, ඒ සිටු ගෘහපතිතෙම; භාතු, සහෝදරයාගේ; එකපුත්තකං ච පන, එකම පුත්‍රයාත්; සාපතෙය්‍යස්ස කාරණා, සම්පත්තිය හේතුකොටගෙන; ජීවිතා ජීවිතයෙන්; වොරොරු පෙසි, තොර කෙළේද; තස්ස කම්මස්ස, ඒ පාපකර්මයාගේ; විපාකෙන, විපාකයෙන්; බහූනි, බොහෝවූ: වස්සානි, අවුරුදු ගණන්; බහූනි, බොහෝවූ; වස්ස සතානි, අවුරුදු සියගණන්: බහූනි, බොහෝවූ වස්ස සහස්සානි,අවුරුදු දහස් ගණන්; බහූනි, බොහෝවූ; වස්ස සතසහස්සානි, අවුදුරුදු ලක්‍ෂගණන්; නිරයෙ, නරකයෙහි; පච්චි, පැසුණේය; තස්ස කම්මස්ස එව, එම පාපකර්මයාගේම: විපාකාව සෙසෙන, ඉතිරිවූ විපාකයෙන්; ඉදං, මේ; සත්තමං, සත්වන අත්බැව; අපුත්තකං, සම්පත්‍යනුභවයට හිමි දරුවකු නැත්තාවූ; සාපතෙය්‍යං, වස්තුව; රාජකොසං, රාජකෝෂ්ඨාගාරයට; පවෙසෙති, ප්‍රවේශකරවයි;

මහාරාජ, මහරජ! තස්ස ඛො පන සෙට්ඨිස්ස ගහපතිස්ස, ඒ සිටු ගෘහපතිහු විසින් වනාහි; පුරාණඤ්ච පුඤ්ඤං, (කරනලද) පෞරාණිකවූ පිනද; පරික්ඛීණං, පිරිහිණ; නවඤ්ච පුඤ්ඤං, අභිනවවූ පිනකුත්; අනුපචිතං රැස් නොකරණ ලද්දේය; මහාරාජ, මහරජ! අජ්ජ ඛො පන, අදත්; සෙට්ඨි ගහපති, සිටු ගෘහපති තෙම; මහා රොරුවෙ නිරයෙ, මහා රෞරව නම් නරකයෙහි; පච්චති ඉති, පැසේයයි; (වදාළසේක)

භන්තෙ, ස්වාමීනි! එවං, එසේද; සෙට්ඨි ගහපති, සිටුගෘහපති තෙම, රොරුවෙ මහා නිරයෙ, රෞරව නම් මහානරකයෙහි; උපපන්නො ඉති, උපන්නේද; මහාරාජ, මහරජ! එවං, එසේය; සෙට්ඨි ගහපති, සිටු ගෘහපතිතෙම; රොරුවෙ මහා නිරයෙ, රෞරව නම් මහා නරකයෙහි; උපපන්නො ඉති, උපන්නේ යයි; (වදාළසේක)

ධඤ්ඤං ධනං රජතං ජාතරූපං—පරිග්ගහං වාපි යදත්ථි කිඤ්චි
දාසා කම්ම කරා පෙස්සා—යෙ චස්ස අනුජීවිනො
සබ්බං නාදාය ගන්තබ්බං—සබ්බං නික්ඛිප්ප ගාමිනං

යඤ්ච කරොති කායෙන—වාචාය උද චෙතසා
තං හි තස්ස සකං හොති—තඤ්ච ආදාය ගච්ඡති
තඤ්චස්ස අනුගං හොති—ඡායාව අනපායිනී

තස්මා කරෙය්‍ය කල්‍යාණං—නිචයං|සම්පරායිකං
පුඤ්ඤානි පරලොකස්මිං—පතිට්ඨා හොන්ති පාණිනන්ති

## අපුත්තක සුත්තං

---

පරිග්ගහං, (තමහට) අයිතිවූ; ධඤ්ඤං, ශාලි ව්‍රීහ්‍යාදි ධාන්‍යය; ධනං, මුක්තා මාණික්‍යාදි ධනය; රජතං, රිදිය; ජාතරූපං, රත්රන්ය (යන); යං කිඤ්චි වා පි, යම් කිසි වස්තුව කුත්; අත්ථි, ඇත්තේද; දාසා, දාසයෝය; කම්මකරා, කම් කාරුවෝය; පෙස්සා, පතිවිධ කාරයෝය; (යන); යෙ ච අනුජීවිනො, යම් අනුව ජීවත් වන්නාවූ කෙනෙකුත්; අස්ස, වන්නාහු ද; සබ්බං, (මෙකී) සියල්ල; න ආදාය, නොගෙන; ගන්තබ්බං, යායුතුය; තං සබ්බං, ඒ සියල්ල; නික්ඛිප්පගාමිනං, බහාතබා යන ස්වභා ඇත්තේය;

කායෙන, කයින් ද; වාචාය, වචනයෙන් ද; උද, යලි; චෙතසා, සිතින් ද; යං, යම්කිසි කුශලාකුශල කර්මයක්; කරොති, කෙරේද; තං හි, ඒ කර්මය ම; තස්ස, ඔහුට; සකං හොති, ස්වකිය වස්තුව වෙයි; තං ච, ඒ කර්මය ම; ආදාය, ගෙන; ගච්ඡති, මිය පරලොව යෙයි; තඤ්ච, ඒ කර්මය ම; අනපායිනී, අත්හැර නොයන්නා වූ; ඡායා ඉව, සෙවනැල්ල මෙන්; අස්ස, ඔහුට; අනුගං හොති, අනුව යන්නේ වේ;

තස්මා, එහෙයින්; නිචයං, (සුවකැමැත්තන් විසින් ස්වසන්තානයෙහි රැස්කළයුතුවූ; සම්පරායිකං, පරලොවට හිතවූ; කල්‍යාණං, කුශල කර්මය; කරෙය්‍ය, කරන්නේය; පරලොකස්මිං, පරලෙව්හි දී; පාණිනං, සත්වයන්ට; පුඤ්ඤානි, පින්; පතිට්ඨා හොන්ති ඉති, පිහිට වෙත් යයි;(වදාළසේක)

අපුත්තක සුත්තං, අපුත්‍රක සූත්‍රයයි;

---

සාවත්ථියං– අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච: චත්තාරො මෙ මහාරාජ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො? තමො තම පරායනො, තමො ජොති පරායනො, ජොති තමපරායනො, ජොති ජොති පරායනොති.

කථඤ්ච මහාරාජ පුග්ගලො තමො තමපරායනො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාල කුලෙ වා වෙණකුලෙවා නෙසාද කුලෙ වා රථකාර කුලෙ වා පුක්කුස කුලෙ වා දලිද්දෙ අප්පන්න පාන භොජනෙ කසිර වුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති, සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථ පදීපෙය්‍යස්ස,

---

සාවත්ථියං –පෙ– අථඛො–පෙ–මහාරාජ, මහරජ! ලොකස්මිං, ලෙව්හි; ඉමෙ චත්තාරො පුග්ගලා, මේ පුඟුලෝ සිවු දෙනෙක්; සන්තො, ඇත්තාහු; සංවිජ්ජමානා, විද්‍යමාන වන්නාහුය; කතමෙ චත්තාරො, ඔහු සිවු දෙන කවරහු ද යත්? තමො තමපරායනො, අඳුරෙන් අඳුරට යන පුද්ගලයාය; තමො ජොති පරායනො, අඳුරෙන් එළියට යන පුද්ගලයාය; ජොති තම පරායනො, එළියෙන් අඳුරට යන පුද්ගලයාය; ජොති ජොති පරායනො ඉති, එළියෙන් එළියට යන පුද්ගලයාය; (යන මේ සිවු දෙනයි)

මහාරාජ, මහරජ! පුග්ගලො, පුද්ගල තෙමේ; කථඤ්ච, කෙසේ නම්; තමො තම පරායනො හොති, අඳුරෙන් අඳුරට යන්නේ වේ ද? මහාරාජ, මහරජ! ඉධ, මේ ලෝකයෙහි; එකච්චො පුග්ගලො, ඇතැම් පුද්ගලයෙක් තෙම; යත්ථ, යම් කුලයෙක්හි; කසිරෙන, දුකසේ; ඝාසච්ඡාදො, කෑම ඇඳීම; ලබ්භති, ලැබේද; (එ බඳු වූ) චණ්ඩාල කුලෙ වා, සැඩොල් කුලයෙහි හෝ; වෙණ කුලෙ වා, කුළුපතු කුලයෙහි හෝ; නෙසාද කුලෙ වා, වැදි කුලයෙහි හෝ; රථකාර කුලෙ වා; සොම්මරු කුලයෙහි හෝ; පුක්කුස කුලෙ වා, පුප්සළු කුලයෙහි හෝ; දලිද්දෙ, දිළිඳුවූ; අප්පන්න පාන භොජනෙ, ස්වල්පවූ ආහාර පාන භොජනයන් ඇත්තාවූ; කසිරවුත්තිකෙ, දුකසේ පවත්වන ජීවිකාවෘත්තිඇති; නීචෙ කුලෙ, හීනකුලයෙක්හි; පච්චාජාතො හොති, උපන්නේ වේද; සො ච, ඒ පුද්ගල තෙමේද; දුබ්බණ්ණො, දුර්වර්ණවූ; දුද්ද

සො කායෙන දුච්චරිතං චරති වාචාය දුච්චරිතං චරති මනසා දුච්චරිතං චරති සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. සෙය්‍යථාපි මහාරාජ පුරිසො අන්ධකාරා වා අන්ධකාරං ගච්ඡෙය්‍ය ලොහිතමලා වා ලොහිතමලං ගච්ඡෙය්‍ය, තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි. එවං ඛො මහාරාජ පුග්ගලො තමො තමපරායනො හොති.

---

සිතො, අප්‍රිය දකුම් ඇත්තාවූ; ඔකොටිමකො, ලකුණුටකවූ; බව්හාබාධො, බොහෝ ආබාධ ඇති; කාණොවා, කණෙක් හෝ; කුණී වා, අත් කොරවූවෙක් හෝ; ඛඤ්ජො වා, පා කොරවූවෙක් හෝ; පක්ඛහතො වා, නැසුණු පක්ෂ ඇත්තෙක් හෝ; හොති, වෙයි; අන්නස්ස, ආහාරය; පානස්ස, පැන්ය; වත්ථස්ස, වස්ත්‍රය; යානස්ස, යානාය; මාලාගන්ධ විලෙපනස්ස, මල්ගඳ විලෙවුන්ය; සෙය්‍යා, යහන්ය; ආවසථ, ලැගුම්ය; පදීපෙය්‍යස්ස, ප්‍රදීපොපකරණය; (යන මොවුන්) න ලාභී, නො ලබන සුලු වෙයි;

සො, ඒ (නිච රෝගී දුගී පුද්ගල) තෙම; කායෙන, කයින්; දුච්චරිතං චරති, දුශ්චරිතයෙහි හැසිරෙයි; වාචාය, වචනයෙන්; දුච්චරිතං චරති, දුශ්චරිතයෙහි හැසිරෙයි; මනසා, සිතින්; දුච්චරිතං චරති, දුශ්චරිතයෙහි හැසිරෙයි; සො, හෙතම; කායෙන, කයින්; දුච්චරිතං චරිත්වා, දුශ්චරිතයෙහි හැසිර; වාචාය, වචනයෙන්; දුච්චරිතං චරිත්වා දුශ්චරිතයෙහි හැසිර; මනසා, සිතින්; දුච්චරිතං චරිත්වා, දුශ්චරිතයෙහි හැසිර; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; මරණා පරං, මරණින් මතු; අපායං සැපයෙන් පහවූ; දුග්ගතිං, දුක් වූ ගති ඇති, විනිපාතං, විවශව පතිත වන්නාවූ; නිරයං, නරකයට; උපපජ්ජති, උත්පත්ති වශයෙන්; පැමිණෙයි.

මහාරාජ, මහරජ! සෙය්‍යථාපි, යම්සේ; පුරිසො, පුරුෂයෙක්; අන්ධකාරා; අන්ධකාරයෙන්; අන්ධකාරං වා, අන්ධකාරයට හෝ; ගච්ඡෙය්‍ය, යන්නේද; ලොහිතමලා, ලේ අශුචියෙන්; ලොහිතමලං වා, ලේ අශුචියට හෝ; ගච්ඡෙය්‍ය, යන්නේද; මහාරාජ, මහරජ! අහං, මම; ඉමං පුග්ගලං, මේ දුශ්චරිත සමඞ්ගි පුද්ගලයා; තථා, එසේ; උපමං, උපමා කොට; වදාමි, කියමි; මහාරාජ, මහරජ! එවං ඛො, මෙසේ ම ය; පුග්ගලො, පුද්ගල තෙම; තමො තමපරායනො හොති, අඳුරු වූයේ අඳුරට යන්නේ වෙයි.

කථඤ්ච මහාරාජ පුග්ගලො තමො ජොතිපරායනො හොති, ඉධ මහාරාජ එකච්චො පුග්ගලො නීචෙකුලෙ පච්චාජාතො හොති චණ්ඩාල කුලෙ වා වෙණ කුලෙ වා නෙසාද කුලෙ වා රථකාර කුලෙ වා පුක්කුස කුලෙවා දලිද්දෙ අප්පන්න පාන භොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදෙ ලබ්භති, සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථ පදීපෙය්‍යස්ස, සො කායෙන සුචරිතං චරති වාචාය සුචරිතං චරති මනසා සුචරිතං චරති, සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සෙය්‍යථාපි මහාරාජ පුරිසො පථවියා වා පල්ලඞ්කං ආරොහෙය්‍ය පල්ලඞ්කා වා අස්සපිට්ඨිං ආරොහෙය්‍ය හත්ථික්ඛන්ධා වා පාසාදං ආරොහෙය්‍ය, තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි, එවං ඛො මහාරාජ පුග්ගලො තමො ජොති පරායනො හොති.

---

මහාරාජ, මහරජ! පුග්ගලො, පුද්ගලතෙම කථංච, කෙසේ නම්; තමො ජොතිපරායනො හොති, අඳුරෙන් එළියට යන්නේ වේද; මහාරාජ, මහරජ! ඉධ, මේ ලෝකයෙහි; එකච්චො පුග්ගලො, ඇතැම් පුද්ගලයෙක් තෙම; යත්ථ, යම් කුලයෙක්හි; චණ්ඩාල කුලෙවා, සැඩොල්කුලයෙහි; හෝ–පෙ–සො, ඒ දුගීපුද්ගල තෙම; කායෙන, කයින්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; වාචාය, වචනයෙන්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; මනසා, සිතින්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; සො, හෙතෙම; කායෙන, කයින්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; වාචාය, වචනයෙන්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; මනසා, සිතින්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්; මරණා පරං, මරණින් මතු; සුගතිං, යහපත් ගති ඇත්තාවූ; සග්ගං ලොකං, ස්වර්ගලෝකයට; උපපජ්ජති, උත්පත්ති වශයෙන් පැමිණෙයි; මහාරාජ, මහරජ! සෙය්‍යථාපි, යම්සේ; පුරිසො, පුරුෂයෙක් තෙම; පථවියා, පෘථිවියෙන්; පල්ලඞ්කං වා, පර්‍ය්‍යඞ්කයකට හෝ; ආරොහෙය්‍ය, නැඟෙන්නේද; පල්ලඞ්කා, පර්‍ය්‍යඞ්කයෙකින්; අස්සපිට්ඨිං වා, අස්පිටකට හෝ; ආරොහෙය්‍ය, නැඟෙන්නේද; අස්සපිට්ඨියා, අසකුපිටින්; හත්ථික්ඛන්ධං ඇත්කඳකට හෝ; ආරොහෙය්‍ය, නැඟෙන්නේ ද; හත්ථික්ඛන්ධා, ඇත්කඳකින්; පාසාදං වා, ප්‍රාසාදයකට හෝ; ආරො

කථඤ්ච මහාරාජ පුග්ගලො ජොති තමපරායනො හොති, ඉධ මහාරාජ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තිය මහාසාල කුලෙ වා බ්‍රාහ්මණ මහාසාල කුලෙ වා ගහපති මහාසාල කුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහා භොගෙ පහූත ජාතරූප රජතෙ පහූත විත්තූපකරණෙ පහූත ධන ධඤ්ඤෙ, සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථ පදීපෙය්‍යස්ස, සො කායෙන දුච්චරිතං චරති වාචාය දුච්චරිතං චරති මනසා දුච්චරිතං චරති සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං

---

හෙයද, නැහෙන්නේ ද; මහාරජ, මහරජ! අහං, මම; ඉමං පුග්ගලං, මේ පුද්ගලයා; තථා උපමං, එසේ උපමා කොට; වදාමි, කියමි; මහාරාජ, මහරජ! එවං ඛො, මෙසේ වනාහී: පුග්ගලො, පුද්ගලතෙම; තමො ජොති පරායනො හොති, අඳුරුවූයේ ආලෝකයට පැමිණෙන්නේ වෙයි.

මහාරාජ, මහරජ! පුග්ගලො, පුද්ගලතෙම; කථං ච, කෙසේ නම්: ජොති තමපරායනො හොති, ආලෝක ඇත්තේ අඳුරට යන්නේ වේද; මහාරාජ, මහරජ! ඉධ, මේ ලෝකයෙහි; එකච්චො පුග්ගලො, ඇතැම් පුද්ගලයෙක්තෙම; ඛත්තිය මහාසාල කුලෙ වා, ක්‍ෂත්‍රිය මහාසාර කුලයෙහි හෝ; බ්‍රාහ්මණ මහාසාල කුලෙ වා, බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි හෝ; ගහපති මහාසාල කුලෙවා, ගෘහපති මහාසාර කුලයෙහි හෝ; අඩ්ඪෙ, ධනයෙන් ආඪ්‍යවූ; මහද්ධනෙ, මහත්ධන ඇත්තාවූ; මහාභොගෙ, මහත්භොගසම්පත් ඇත්තාවූ; පහූත ජාතරූප රජතෙ, බොහෝ රන්රිදී ඇත්තාවූ; පහූත විත්තූපකරණෙ. බොහෝ වස්තූපකරණ ඇත්තාවූ; පහූත ධන ධඤ්ඤෙ, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූ; උච්චෙකුලෙ, උසස් කුලයෙක්හි; පච්චාජාතො හොති. උපන්නේවේද; සො ච, හෙතෙමේද; අභිරූපො, මනා රූ ඇත්තාවූ; දස්සනීයො දැකුම් කටයුතුවූ; පාසාදිකො, දුටුවන් පහදවන්නාවූ; පරමාය, උතුම්වූ; වණ්ණපොක්ඛරතාය, වර්ණ සෞන්දර්‍ය්‍යයෙන්; සමන්නාගතොහොති, යුක්තවූයේවේද; අන්නස්ස, ආහාරය; පානස්ස, පැන්ය; වත්ථස්ස, වස්ත්‍රය; යානස්ස, යානවාහනය; මාලාගන්ධවිලෙපනස්ස, මල්ගඳ විලෙවුන්ය; සෙය්‍යා, සයනාසනය; ආවසථ, ගෘහය; පදීපෙය්‍යස්ස, තෙල් පහන්ය;(යන මොවුන්) ලාභී, ලබන සුල්ලෙක්වේද; සො, ඒ උතුම් කුලසම්පත් ඇති පුද්ගලතෙම; කායෙන -පෙ-

චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සෙය්‍යථාපි මහාරාජ පුරිසො පාසාදා වා හත්ථික්ඛන්ධං ඔරොහෙය්‍ය හත්ථික්ඛන්ධා වා අස්සපිට්ඨිං ඔරොහෙය්‍ය අස්සපිට්ඨියා වා පල්ලඞ්කං ඔරොහෙය්‍ය පල්ලඞ්කා වා පඨවිං ඔරොහෙය්‍ය පඨවියා වා අන්ධකාරං පවිසෙය්‍ය, තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි, එවං ඛො මහාරාජ පුග්ගලො ජොති තම පරායනො හොති.

කථඤ්ච මහාරාජ පුග්ගලො ජොති ජොති පරායනො හොති? ඉධ මහාරාජ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තිය මහාසාලකුලෙ වා බ්‍රාහ්මණ මහාසාලකුලෙ වා ගහපති මහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූත විත්තූපකරණෙ පහූත ධනධඤ්ඤෙ

---

මහාරාජ, මහරජ! සෙය්‍යථාපි, යම්සේ; පුරිසො, පුරුෂයෙක්තෙම; පාසාදා, ප්‍රාසාදයෙකින්; හත්ථික්ඛන්ධං වා, ඇතකු පිටට හෝ; ඔරොහෙය්‍ය, බසින්නේද; හත්ථික්ඛන්ධා, ඇතකුපිටින්; අස්සපිට්ඨිං වා, අසකු පිටට හෝ; ඔරොහෙය්‍ය, බසින්නේද; අස්සපිට්ඨියා, අසකුපිටින්; පල්ලඞ්කං වා, පලඟකට හෝ; ඔරොහෙය්‍ය, බසින්නේද; පල්ලඞ්කා, පර්‍ය්‍යඞ්කයෙකින්; පඨවිං වා, පොළොවට හෝ; ඔරොහෙය්‍ය, බසින්නේද; පඨවියා, පොළොවෙන්; අන්ධකාරං වා, අඳුරකට හෝ; පවිසෙය්‍ය, ප්‍රවිෂ්ටවන්නේද; මහාරාජ, මහරජ! අහං, මම; ඉමං පුග්ගලං, මේ පුද්ගලයා; තථූපමං, එසේ උපමා කොට; වදාමි, කියමි; මහාරාජ, මහරජ! එවං ඛො, මෙසේ වනාහි; පුග්ගලො, පුද්ගල තෙම: ජොති තම පරායනො හොති, එළියෙහි සිටියේ අඳුරට යන්නේ වේයි;

මහාරාජ, මහරජ! කථඤ්ච, කෙසේනම්; පුග්ගලො, පුද්ගල තෙම; ජොති ජොති පරායනො හොති, ආලෝකයෙන් ආලෝකයට පැමිණෙන්නේවේද; මහාරාජ, මහරජ; ඉධ, මේ ලොකයෙහි; එකච්චො පුග්ගලො, ඇතැම් පුද්ගලයෙක් තෙම; ඛත්තියමහාසාලකුලෙ වා, ක්‍ෂත්‍රිය මහාසාරකුලයෙහි හෝ;-පෙ-සො, ඒ උතුම් කුලයෙහි උපන් රූ සැප ඇති පුද්ගල තෙම; කායෙන, කයින්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; වාචාය, වචනයෙන්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; මනසා, සිතින්; සුචරිතං චරති, සුචරිතයෙහි හැසිරෙයි; සො, හෙතෙම; කායෙන, කයින්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; වාචාය, වචනයෙන්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; මනසා, සිතින්; සුචරිතං චරිත්වා, සුචරිතයෙහි හැසිර; කායස්ස, ශරීරයාගේ; භෙදා, බිඳීමෙන්;

සො ච හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස සො කායෙන සුචරිතං චරති වාචාය සුචරිතං චරති මනසා සුචරිතං චරති සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සෙය්‍යථාපි මහාරාජ පුරිසො පල්ලඞ්කා වා පල්ලඞ්කං සඞ්කමෙය්‍ය අස්සපිට්ඨියා වා අස්සපිට්ඨිං සඞ්කමෙය්‍ය හත්ථික්ඛන්ධා වා හත්ථික්ඛන්ධං සඞ්කමෙය්‍ය පාසාදා වා පාසාදං සඞ්කමෙය්‍ය තථූපමාහං මහාරාජ ඉමං පුග්ගලං වදාමි එවං ඛො මහාරාජ පුග්ගලො ජොති ජොතිපරායනො හොති ඉමෙ ඛො මහාරාජ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා

දලිද්දො පුරිසො රාජ — අස්සද්ධො හොති මච්ඡරී
කදරියො පාපසඞ්කප්පො — මිච්ඡාදිට්ඨි අනාදරො

---

මරණාපරං, මරණින් මත්තෙහි; සුගතිං, සොභනගමන් ඇත්තාවූ; සග්ගං ලොකං, ස්වර්ගලොකයට; උපපජ්ජති, උත්පත්තිවශයෙන් පැමිණෙයි; මහාරාජ, මහරජ; සෙය්‍යථාපි, යම්සේ; පුරිසො, පුරුෂයෙක් තෙම; පල්ලඞ්කා, පලඟකින්; පල්ලඞ්කං වා, පලඟකට හෝ; සංකමෙය්‍ය, මාරුවන්නේද; අස්සපිට්ඨියා, අසකු පිටින්; අස්සපිට්ඨිං වා, අසකුපිටකට හෝ; සංකමෙය්‍ය, මාරුවන්නේද; හත්ථික්ඛන්ධා, ඇතකුපිටින්; හත්ථික්ඛන්ධං වා, ඇත්කඳකට හෝ; සංකමෙය්‍ය, මාරු වන්නේ ද; පාසාදා, පහයකින්; පාසාදං වා, පහයකට හෝ; සංකමෙය්‍ය, මාරු වන්නේද: මහාරාජ, මහරජ; අහං, මම; ඉමං පුග්ගලං, මේ සුචරිත සමඞ්ගි පුද්ගලයා; තථා, එසේ; උපමං, උපමා කොට; වදාමි, කියමි; මහාරාජ, මහරජ! එවං ඛො, මෙසේ වනාහි; පුග්ගලො, පුද්ගල තෙම; ජොති ජොතිපරායනො හොති, ආලෝකයෙන් ආලොකය පරායනකොට ඇත්තේ වේයයි වදාළසේක; මහාරාජ, මහරජ! ඉමෙ ඛො චත්තාරො පුග්ගලා, මේ සිව්වැදෑරුම් පුද්ගලයෝ; ලොකස්මිං, ලෝකයෙහි; සන්තො, ඇත්තාහු; සංවිජ්ජමානා ඉති, විද්‍යමාන වන්නාහුයයි වදාළසේක.

භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ ධර්මය; අවොච, වදාළසේක; ඉදං, මෙය; වත්වා, වදාරා; අථ, නැවත; සුගතො, සුගත නම්වූ; සත්ථා, ශාස්තෲන් වහන්සේ; අපරං, අන්‍යවූ; එතං, මේ ගාථා ධර්මය; අවොච, වදාළසේක.

සමණෙ බ්‍රාහ්මණෙ වාපි—අඤ්ඤෙ වාපි වනිබ්බකෙ
අක්කොසති පරිභාසති—නත්ථිකො හොති රොසකො
දදමානං නිවාරෙති—යාචමානාන භොජනං
තාදිසො පුරිසො රාජ—මීයමානො ජනාධිප
උපෙති නිරයං ඝොරං—තමො තමපරායනො

දලිද්දො පුරිසො රාජ-සද්ධො හොති අමච්ඡරී
දදාති සෙට්ඨ සඞ්කප්පො - අබ්‍යග්ග මනසො නරො

සමණෙ බ්‍රාහ්මණෙ වාපි - අඤ්ඤෙ වාපි වනිබ්බකෙ
උට්ඨාය අභිවාදෙති - සමචරියාය සික්ඛති
දදමානං නිවාරෙති - යාච මානාන භොජනං

---

රාජ, මහරජ! පුරිසො, පුරුෂයෙක් තෙම; දලිද්දො, දිළිඳුවූයේ; අස්සද්ධො, ශ්‍රද්ධා නැත්තේ; මිච්ඡාදිට්ඨී, මිසදිටුවූයේ: අනාදරෙ, ආදර රහිත වූයේ; හොති, වේද; (ඒ මනුෂ්‍ය තෙම)

සමණෙ, ශ්‍රමණයන්ට ද; බ්‍රාහ්මණෙ වා, බමුණන්ට ද; අපි, යළිදු; අඤ්ඤෙ, අන්‍ය වූ; වනිබ්බකෙ වා අපි, ගුණ කියා ඉල්වන්නන්ට ද; අක්කොසති, ආක්‍රොශ කෙරේ ද; පරිභාසති, පිරිහෙළා කථා කෙරේ ද; නත්ථිකො හොති, යාචකාදීන්ට නැත යන වචනයෙන් යුක්තවේ ද; නොහොත් නාස්තික දෘෂ්ටි ඇත්තේ වේ ද; රොසකො, රොස් කරන්නේ වේ ද; භොජනං, භොජනයක්; යාචමානානං, ඉල්වන්නවුන්ට; දදමානං, දෙන්නහු; නිවාරෙති, වළක්වා ද;

මීයමානො, මැරෙනු ලබන්නේ; ඝොරං, ඝොර වූ; නිරයං, නරකයට; උපෙති, පැමිණේ ද: තාදිසො, එබඳුවූ; පුරිසො, පුරුෂ තෙම; ජනාධිප, ජනයන්ට; අධිපතිවූ; රාජ, මහරජ! තමො තමපරායනො; තමො තමපරායන නම් වෙයි; හෙවත් අඳුරෙන් අඳුරට යන්නේ වෙයි.

රාජ, මහරජ! පුරිසො, පුරුෂයෙක් තෙම; දලිද්දො, දිළිඳුවූයේ; සද්ධො, ශ්‍රද්ධා ඇත්තේ; අමච්ඡරී හොති, නොමසුරු වේද; දදාති, දන්දේද; සෙට්ඨ සඞ්කප්පො, ශ්‍රෙෂ්ඨ සඞ්කල්පනා (කුශල චෙතනා) ඇත්තේ වේද: අව්‍යග්ග මනසො, එකඟ සිත් ඇත්තේ හෙවත් මිථ්‍යාදෘෂ්ටි නැත්තේ (වේද;)නරො, (ඒ) මනුෂ්‍ය තෙම;

සමණෙ, ශ්‍රමණයන් ද; බ්‍රාහ්මණෙ වා, බමුණන් ද; අපි, නොහොත්; අඤ්ඤෙ, අන්‍ය වූ; වනිබ්බකෙ වා අපි, යාචකජනයන්ද; උට්ඨාය, (වෙතට පැමිණීම් ආදියෙන්) උට්ඨාන (වීර්‍ය්‍ය) වත් ව නොහොත් (දූක හුනස්නෙන්) නැඟිට; අභිවාදෙති, මනාකොට

තාදිසො පුරිසො රජ - මීයමානො ජනාධිප
උපෙති තිදිවං ඨානං - තමො ජොති පරායනො

අඩ්ඪො ච පුරිසො රජ - අස්සද්ධො හොති මච්ඡරී
කදරියො පාප සඞ්කප්පො - මිච්ඡාදිට්ඨි අනාදරො

සමණෙ බ්‍රාහ්මණෙ වාපි - අඤ්ඤෙ වාපි වනිබ්බකෙ
අක්කොසති පරිභාසති - නත්ථිකො හොති රොසකො
දදමානං නිවාරෙති - යාචමානාන භොජනං

තාදිසො පුරිසො රජ - මීයමානො ජනාධිප
උපෙති නිරයං ඝොරං - ජොති තම පරායනො

---

වදීද; සමචරියාය, දශ අකුශල කර්මපථ සංඛ්‍යාතවූ විෂමචර්‍ය්‍යාවෙන් දුරු ව දශ කුශලකර්මපථ සංඛ්‍යාතවූ) සමචර්‍ය්‍යායෙහි; සික්ඛති, (කායාදි චාරිත්‍රයෙන්) හික්මේ ද, හොජනං, බොජුනක්; යාචමානානං, ඉල්වන්නවුන්ට; දදමානං, දෙන තැනැත්තහු; න නිවාරෙති, නො වළක්වයි ද;

මීයමානො, මැරෙනුලබන්නේ; තිදිවං ඨානං, ත්‍රිදිවස්ථානයට (දෙව්ලොවට); උපෙති, පැමිණේ ද; ජනාධිප, ජන ධිපතිවූ; රජ, මහරජ; තාදිසො, එබඳුවූ; පුරිසො, පුරුෂතෙම; තමො ජොති පරායනො, තමො ජොතිපරායන නම්; හෙවත් අඳුරෙන් එළියට ගමන් කරන්නේ නම්.

රජ, මහරජ! එව, ඉදින්; පුරිසො, පුරුෂයෙක් තෙම; අඩ්ඪො, ධනයෙන් ආඪ්‍යවූයේ; අස්සද්ධො, ශ්‍රද්ධා නැත්තේ; මච්ඡරී, මසුරුවූයේ; කදරියො, තද මසුරුවූයේ; පාප සඞ්කප්පො, පවිටු කල්පනා ඇත්තේ; මිච්ඡාදිට්ඨි, මිසදිටු වූයේ; අනාදරො, ආදර රහිතවූයේ; හොති වේද, (ඒ මිනිස්තෙම)

සමණෙ, ශ්‍රමණයන්ට ද; බ්‍රාහ්මණෙ වා, බමුණන්ට ද; අපි, නොහොත්; අඤ්ඤෙ, සෙසු; වනිබ්බකෙ වා අපි, යාචකයන්ට ද; අක්කොසති, ආක්‍රොශ කෙරේ ද; පරිභාසති, පිරිහෙළා කථා කෙරේ ද; නත්ථිකො හොති, නැත යන වචනයෙන් යුක්ත වේ ද; රොසකො, රොස් වචන කියන්නේ වේද; භොජනං, භොජනයක්; යාචමානානං, ඉල්වන්නවුන්ට; දදමානං, දෙන්නහු; නිවාරෙති, වළක්වා ද;

මීයමානො, මැරෙනු ලබන්නේ; ඝොරං, දරුණුවූ; නිරයං, නරකයට; උපෙති, පැමිණේද; තාදිසො, එබඳුවූ; පුරිසො, පුරුෂ තෙම; ජනාධිප, ජනයන්ට අධිපතිවූ; රාජ, මහරජ; ජොතිතම පරායනො, ජොති තමපරායන නම්; හෙවත් එළියෙන් අඳුරට යන්නේ නම්.

අඩ්ඪො වෙ පුරිසො රාජ—සද්ධො හොති අමච්ඡරි
දදාති සෙට්ඨසඞ්කප්පො—අබ්‍යග්ග මනසො නරෙ

සමණෙ බ්‍රාහ්මණෙ වාපි—අඤ්ඤෙ වාපි වනිබ්බකෙ
උට්ඨාය අභිවාදෙති—සම්ම චරියාය සික්ඛති

දදමානං න නිවාරෙති—යාචමානානං භොජනං
තාදිසො පුරිසො රාජ—මීයමානො ජනාධිප
උපෙති තිදිවං ඨානං—ජොති ජොති පරායනො

**තමො තම සුත්තං.**

සාවත්ථිනිදානං-අථ ඛො රාජා පසෙනදි කොසලො දිවා දිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච, හන්ද කුතො නු ත්වං මහාරාජ ආගච්ඡසි දිවා දිවස්සාති.

---

රාජ, මහරජ! වෙ, ඉදින්; පුරිසො, පුරුෂයෙක් තෙම; අඩ්ඪො, ධනයෙන් ආඪ්‍යවූයේ; සද්ධො, ශ්‍රද්ධා ඇත්තේ; අමච්ඡරි, නො මසුරුවූයේ; සෙට්ඨසංකප්පො, යහපත් කල්පනා ඇත්තේ; අව්‍යග්ගමනසො, එකඟ සිත් ඇත්තේ; හොති; වේ ද;

නරෙ, (ඒ) මනුෂ්‍යතෙම; සමණෙ, ශ්‍රමණයන් ද; බ්‍රාහ්මණෙ වා, බමුණන්ට ද; අපි, යළිදු; අඤ්ඤෙ, අන්‍ය වූ; වනිබ්බකෙ වා, අපි, යාචකයන්ට ද; දදාති, දන් දේ ද; උට්ඨාය, (දෙමවුපිය ගුරු වරුදි වැඩිහිටියන් දුටුවිට තමාහුන් අස්නෙන්) නැගිසිට; අභිවාදෙති, මනාකොට වඳී ද; සම්මචරියාය, සුචරිතක්‍රියාවෙහි; සික්ඛති, හික්මේ ද; භොජනං, බොජුනක්; යාචමානානං, ඉල්වන්නවුන්ට; දදමානං, දෙන්නහු; න නිවාරෙති, නො වළක්වා ද;

මීයමානො, මැරෙනුලබන්නේ; තිදිවං ඨානං, ත්‍රිදිවස්ථානයට; (දෙව්ලොවට) උපෙති, පැමිණේ ද; තාදිසො, එ බඳුවූ; පුරිසො, පුරුෂතෙම; ජනාධිප, ජනශ්‍රෙෂ්ඨ වූ; රාජ, මහරජ; ජොති ජොති පරායනො ඉති, ජොති ජොති පරායන නමැයි හෙවත් එළියෙන් එළියට යන්නේ නමැයි; වදාළසේක.

**තමො තමසුත්තං, තමො තම සූත්‍රය යි;**

සාවත්ථිනිදානං-පෙ-අථඛො, එකල්හි; පසෙනදි කොසලො රාජා, පසේනදිකොසොල් මහරජතෙම; දිවා දිවස්ස, දහවල් සම්බන්ධ දහවල්හි හෙවත් ඉරමුදුන්වේලෙහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක ද; තෙන, එ තැන්හි; උපසංකමි,

යානි තානි භන්තෙ රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං ඉස්සරියමදමත්තානං කාමගෙධපරියුට්ඨිතානං ජනපදත්ථාවරියප්පත්තානං මහන්තං පථවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසන්තානං රජ්ජකරණීයානි භවන්ති, තෙසවහං එතරහි උස්සුක්කං ආපන්නොති. තං කිං මඤ්ඤසි මහාරාජ ඉධ තෙ පුරිසො ආගච්ඡෙය්‍ය පුරත්ථිමාය දිසාය සද්ධායිකො පච්චායිකො, සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ ජානෙය්‍යාසි අහං ආගච්ඡාමි පුරත්ථිමාය දිසාය තත්ථද්දසං මහන්තං පබ්බතං අබ්භසමං සබ්බෙ පාණෙ නිප්පොථෙන්තො ආගච්ඡති, යං තෙ මහාරාජ කරණීයං තං කරොහීති.

---

එළඹියේය; උපසංකමිත්වා, එළඹ, භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත්පසෙක: නිසින්නං බො, හුන්නාවූ ම; පසෙනදිං කොසලං රාජානං, පසේනදි කොසොල් රජහට; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මෙය; අවොච, වදාළසේක; මහාරාජ, මහරජ! ත්වං, නුඹ; හන්ද, දැන්; දිවසස්ස, දවාල සම්බන්ධ වූ; දිවා, දහවල්හි; කුතො, කොතැන්හි සිට; ආගච්ඡසි නු ඉති, මෙහි එයි ද; (කියායි)

භන්තෙ, ස්වාමීන්වහන්ස; මුද්ධාවසිත්තානං, කරතලද අභිෂෙක ඇත්තාවූ; ඉස්සරිය මද මත්තානං, ඓශ්වර්‍ය්‍ය මදයෙන් මත්වූ; කාමගෙධ පරියුට්ඨිතානං, කාමයෙහි ගිජුවීමෙන් අභිභූත වූ; ජනපදත්ථාවරියප්පත්තානං, ජනපදයෙහි ස්ථිරභාවයට පැමිණියාවූ; මහන්තං පථවිමණ්ඩලං, මහත් වූ පොළෝ මඬල; අභිවිජිය, ජයගෙන; අජ්ඣාවසන්තානං, වාසය කරන්නා වූ; ඛත්තියානං රඤ්ඤං, ක්ෂත්‍රිය වංශෝද්භූත රජුන්ගේ; යානි තානි රජ්ජකරණීයානි, යම් ඒ රාජකෘත්‍යයෝ; භවන්ති, වෙද්ද; තෙසු, ඒ කෘත්‍යයන්හි; අහං, මම; එතරහි, මේ කාලයෙහි; උස්සුක්කං, උත්සාහවත් බවට; ආපන්නො ඉති, පැමිණියෙමියි; (කීයේය.)

මහාරාජ, මහරජ! ඉධ, මෙහි; තෙ, නුඹ විසින්; සද්ධායිකො, ඇදහියයුතු (වචන කියන්නා) වූ; පච්චායිකො, විශ්වාස කටයුතු (වචන කියන්නා)වූ; පුරිසො. පුරුෂයෙක් තෙම; පුරත්ථිමාය දිසාය, පූර්වදිග්භාගයෙන්; ආගච්ඡෙය්‍ය, එන්නේය; සො, ඒ පුරුෂතෙම; තං, නුඹකරා; උපසඞ්කමිත්වා, එළඹ; මහාරාජ, මහරජ! යග්ඝෙ, ඔබට දන්වමි; ජානෙය්‍යාසි, දන්නෙහි ද; අහං, මම; පුරත්ථිමාය දිසාය, පූර්වදිග්භාගයෙන්; ආගච්ඡාමි, එමි; තත්ථ, ඒ දිශාභාගයෙහි; අබ්භසමං, අහස සමවූ; මහන්තං පබ්බතං, මහත් පවුවක්;

අථ දුතියො පුරිසො ආගච්ඡෙය්‍ය දක්ඛිණාය දිසාය-පෙ-අථ තතියො පුරිසො ආගච්ඡෙය්‍ය පච්ඡිමාය දිසාය--පෙ-අථ චතුත්ථො පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාය දිසාය සද්ධායිකො පච්චායිකො, සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ ජානෙය්‍යාසි අහං ආගච්ඡාමි උත්තරාය දිසාය, තත්‍ථද්දසං මහන්තං පබ්බතං අබ්භසමං සබ්බෙ පාණෙ නිප්පොථෙන්තො ආගච්ඡති යං තෙ මහාරාජ කරණීයං තං කරොහීති. එවරූපෙ තෙ මහාරාජ මහති

---

අද්දසං, දුටුයෙමි; (ඒ පවුව) සබ්බෙ පාණෙ, සියලු ප්‍රාණීන්; නිප්පොථෙන්තො, සුනු විසුනු කොරෙමින්; ආගච්ඡති, පෙරළී එයි; මහාරාජ, මහරජ! තෙ, නුඹවහන්සේ විසින්; යං, යමක්; කරණීයං, කටයුතු ද; තං, එය; කරොහි ඉති, කරවයි; එවං, මෙසේ; වදෙය්‍ය, කියන්නේ නම්; තං කිං මඤ්ඤසි, ඒ සඳහා කුමන කටයුත්තක් සිතන්නෙහි ද;

අථ, තදනන්තරව; දක්ඛිණාය දිසාය, දක්ෂිණ දිශා භාගයෙන්; දුතියො, දෙවන වූ; පුරිසො, පුරුෂයෙක් තෙම; ආගච්ඡෙය්‍ය, එන්නේය;-පෙ-අථ, තදනන්තරව; පච්ඡිමාය දිසාය, පශ්චිම දිශා භාගයෙන්; තතියො, තෙවනවූ; පුරිසො, පුරුෂයෙක් තෙම; ආගච්ඡෙය්‍ය, එන්නේය-පෙ-අථ, නැවත; උත්තරාය දිසාය උතුරු දිගින්; සද්ධායිකො, ඇදහියයුතු වචන ඇත්තා වූ; පච්චායිකො, විශ්වාසකටයුතු වචන ඇත්තාවූ; චතුත්ථො පුරිසො, සිවුවන පුරුෂයෙක් තෙම; ආගච්ඡෙය්‍ය, එන්නේය; සො, හෙතෙම; තං, නුඹ කරා; උපසඞ්කමිත්වා, එළඹ; මහාරාජ, මහරජ! යග්ඝෙ, ඔබට දන්වමි; ජානෙය්‍යාසි, දන්නෙහි ද; අහං, මම; උත්තරාය දිසාය, උතුරු දිගින්; ආගච්ඡාමි, එමි; තත්‍ථ, එහි; අබ්භසමං, අහස සම වූ; මහන්තං පබ්බතං, මහත් පවුවක්; අද්දසං, දුටුයෙමි; (ඒ පර්වතය) සබ්බෙ පාණෙ, සියලු ප්‍රාණීන්; නිප්පොථෙන්තො, සුනු විසුනු කොරෙමින්; ආගච්ඡති, එයි; මහාරාජ, මහරජ! තෙ, නුඹවහන්සේ විසින්; යං කරණීයං, යමක් කටයුතු ද; තං, එය, කරොහි ඉති, කරව කියා; එවං, මෙසේ; වදෙය්‍ය, කියන්නේය; මහාරාජ, මහරජ! දුල්ලභෙ, දුර්ලභ වූ; මනුස්සත්තෙ, මනුෂ්‍යාත්ම භාවය ඇතිකල්හි; දාරුණෙ, දරුණු වූ; මනුස්සක්ඛයෙ, මිනිසුන් විනාශ කරන්නාවූ; එවරූපෙ, මෙ බඳු වූ; මහති මහබ්භයෙ, අතිශයින් මහත් වූ භයක්; තෙ, නුඹට; සමුප්පන්නෙ, පැමිණිකල්හි; කිං, කුමක්; කරණීයං අස්ස, කටයුතු වන්නේ ද; (නොහොත්) අස්ස, ඒ පැමිණි බියට; කිං, කුමක්; කරණීයං ඉති, කටයුතුදැයි; (අසා වදාළසේක) භන්තෙ, ස්වාමිනි! දුල්ලභෙ, දුර්ලභ වූ; මනුස්ස

හබ්භයෙ සමුප්පන්නෙ දරුණෙ මනුස්සක්ඛයෙ දුල්ලභෙ මනුස්සත්තෙ කිමස්ස කරණීයන්ති. එවරූපෙ මෙ භන්තෙ මහති මහබ්භයෙ සමුප්පන්නෙ දරුණෙ මනුස්සක්ඛයෙ දුල්ලභෙ මනුස්සත්තෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලචරියාය පුඤ්ඤකිරියායාති.

ආරොචෙමි බො තෙ මහාරාජ පටිවෙදෙමි බො තෙ මහාරාජ අධිවත්තති බො තං මහාරාජ ජරාමරණං අධිවත්තමානෙ ච තෙ මහාරාජ ජරාමරණෙ කිමස්ස කරණීයන්ති. අධිවත්තමානෙ ච මෙ භන්තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලචරියාය පුඤ්ඤකිරියාය, යානි තානි භන්තෙ

---

ත්තෙ, මිනිසත්බව ඇති කල්හි; දරුණෙ, දරුණු වූ; මනුස්සක්ඛයෙ, මිනිසුන් විනාශ කරන්නාවූ; එවරූපෙ, මෙ බඳු වූ; මහති, මහත් වූ; මහබ්භයෙ, මහත්බියක්; මෙ, මට; සමුප්පන්නෙ, එළඹ සිටි කල්හි; අස්ස, ඊට; ධම්මචරියාය අඤ්ඤත්‍ර, කුශල ධර්මයන් කිරීම හැර; සමචරියාය අඤ්ඤත්‍ර, සමචර්‍යාව හැර; කුසලචරියාය අඤ්ඤත්‍ර, කුසලචර්‍යාව හැර; පුඤ්ඤකිරියාය අඤ්ඤත්‍ර, පුණ්‍ය ක්‍රියාව හැර; කිං, කුමක්; කරණීයං ඉති, කටයුතුදැයි; (කීයේය)

මහාරාජ, මහරජ! තෙ, නුඹට; ආරොචෙමි බො, කියන්නෙමි, මහාරාජ, මහරජ! තෙ, නුඹට; පටිවෙදෙමි බො, අවබොධ කරවන්නෙමි; මහාරාජ, මහරජ! ජරාමරණං, ජරාව හා මරණය තෙම; තං, නුඹ; අධිවත්තති, යටත් කෙරෙයි; මහාරාජ, මහරජ! ජරාමරණෙ, ජරාමරණයන් විසින්; අධිවත්තමානෙ, යටත් කරන කල්හි; තෙ, නුඹ විසින්; අස්ස, ඊට; කිං, කුමක්, කරණීයං ඉති, කටයුතු දැ යි; (විචාළසේක) භන්තෙ, ස්වාමිනි! ජරාමරණෙ, ජරාමරණයන්; අධිවත්තමානෙ ච, ඉක්ම පවත්නා කල්හි ද; ධම්මචරියාය අඤ්ඤත්‍ර, කුශලධර්මයෙහි හැසිරීම හැර; සමචරියාය අඤ්ඤත්‍ර, සමචර්‍යාව හැර; කුශලචරියාය අඤ්ඤත්‍ර, කුශලචර්‍යාව හැර; පුඤ්ඤකිරියාය අඤ්ඤත්‍ර, පුණ්‍යක්‍රියාව හැර; මෙ, මා විසින්; කිං, කුමක්: කරණීයං, කටයුතු ද; භන්තෙ; ස්වාමිනි! මුද්ධාවසිත්තානං, ශීර්ෂාභිෂෙක කරන ලද්දවූ; ඉස්සරියමදමත්තානං, ඓශ්වර්‍ය මදයෙන් ප්‍රමාද ව වසන්නාවූ; කාමගෙධපරියුට්ඨිතානං, කාමයෙහි ගිජුවීමෙන් මඩනාලද්දවූ; ජනපදත්ථාවරියප්පත්තානං, ජනපදයෙහි ස්ථිරභාවප්‍රාප්ත වූ; මහන්තං, මහත්වූ; පඨවි මණ්ඩලං, පෘථිවි මණ්ඩලය; අභිවිජිය, ජයගෙන; අජ්ඣාවසන්තානං, අධිපතිව වසන්නාවූ; ඛත්තියානං රඤ්ඤං, ක්ෂත්‍රිය රජුන්ගේ; යානි තානි හත්ථි යුද්ධානි, යම් ඒ

රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං ඉස්සරිය මද මත්තානං කාම ගෙධපරියුට්ඨිතානං ජනපදත්ථාවරියප්පත්තානං මහන්තං පඨවි මණ්ඩලං අභිවිජිය අජ්ඣාවසන්තානං හත්ථි යුද්ධානි භවන්ති තෙසම්පි භන්තෙ හත්ථියුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරමරණෙ යානිපි තානි භන්තෙ රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං ඉස්සරිය මද මත්තානං කාමගෙධ පරියුට්ඨිතානං ජනපදත්ථාවරියප්පත්තානං මහන්තං පඨවි මණ්ඩලං අභිවිජිය අජ්ඣාවසන්තානං අස්සයුද්ධානි භවන්ති-පෙ-රථ යුද්ධානි භවන්ති –පෙ-පත්ති යුද්ධානි භවන්ති, තෙසම්පි භන්තෙ පත්තියුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරමරණෙ

සන්ති ඛො පන භන්තෙ ඉමස්මිං රාජකුලෙ මන්තිනො මහාමත්තා යෙපි තෙ පහොන්ති ආගතෙ පච්චත්ථිකෙ මන්තෙහි භෙදයිතුං තෙසම්පි භන්තෙ මන්තයුද්ධානං නත්ථි ගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරමරණෙ; සංවිජ්ජති ඛො පන භන්තෙ ඉමස්මිං

---

හස්ති යුඬයෝ; භවන්ති, වෙත් ද; භන්තෙ, ස්වාමීනි! ජරමරණෙ, ජරමරණයන් විසින්; අධිවත්තමානෙ, යටත්කොට ගන්නා කල්හි; තෙසම්පි හත්ථියුඬානං, ඒ හස්තියුඬයන්ගේ ද; ගති, නිෂ්පත්තියෙක්: නත්ථි, නැත; විසයො, සමර්ථභාවයෙක්; නත්ථි, නැත, භන්තෙ, ස්වාමීනි! මුඬාවසිත්තානං;-පෙ-අජ්ඣාවසන්තානං, අධිපති ව වසන්නාවූ; ඛත්තියානං රඤ්ඤං, ක්‍ෂත්‍රිය රජුන්ගේ; යානිපි තානි අස්ස යුද්ධානි, යම් ඒ අශ්වයුඬයෝ; භවන්ති, වෙත් ද;-පෙ-රථයුද්ධානිභවන්ති, රථයුඬයෝවෙත් ද;-පෙ-පත්තියුද්ධානි, පාබලසෙනයින් කරන යුඬයෝ; භවන්ති, වෙත් ද; භන්තෙ, ස්වාමීනි! ජරමරණෙ, ජරමරණයන්; අධිවත්තමානෙ, යටත් කොට ගන්නාකල්හි; තෙසම්පි පත්ති යුද්ධානං, ඒ පාබලසේනා යුඬයන්ගේද; ගති, නිෂ්පත්තියෙක්; නත්ථි, නැත; විසයො, සමර්ථභාවයෙක්; නත්ථි, නැත;

භන්තෙ, ස්වාමීනි! යෙපි තෙ, යම් ඒ ඇමැතිකෙනෙක්; ආගතෙ, ආවාවූ; පච්චත්ථිකෙ, සතුරන්: මන්තෙහි, මන්ත්‍රවලින්; භෙදයිතුං, බිඳුවන්ට; පහොන්ති, සමර්ථ වෙත් ද; (එබඳුවූ) මන්තිනො, මන්ත්‍ර දන්නාවූ; මහාමත්තා, මහාමාත්‍යයෝ; සන්ති ඛො පන, ඇත්තාහු ම වෙත්; භන්තෙ, ස්වාමීනි! ජරමරණෙ, ජරමරණයන්; අධිවත්තමානෙ, යටත්කොට ගන්නාකල්හි; තෙසම්පි මන්තයුද්ධානං, ඒ මන්ත්‍ර යුඬයන්ගේ ද; ගති, නිෂ්පත්තියෙක්; නත්ථි, නැත; විසයො, සමර්ථභාවයෙක්; නත්ථි, නැත; භන්තෙ, ස්වාමීනි! යෙන ධනෙන, යම් ධනයකින්; ආගතෙ, ආවාවූ,

රාජකුලෙ පහූතං හිරඤ්ඤසුවණ්ණං භූමිගතං චෙව වෙහාසට්ඨං ච යෙන මයං පහොම ආගතෙ පච්චත්ථිකෙ ධනෙන උපලාපෙතුං තෙසම්පි භන්තෙ ධනයුද්ධානං නත්ථිගති නත්ථි විසයො අධිවත්තමානෙ ජරාමරණෙ. අධිවත්තමානෙ ච මෙ භන්තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලචරියාය පුඤ්ඤකිරියායාති. එවමෙතං මහාරාජ එවමෙතං මහාරාජ! අධිවත්තමානෙ ච තෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලචරියාය පුඤ්ඤකිරියායාති

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:—

යථාපි සෙලා විපුලා—නභං ආහච්ච පබ්බතා,
සමන්තා අනුපරියෙය්‍යුං—නිප්පොථෙන්තා චතුද්දිසා,

---

පච්චත්ථිකෙ, පස මිතුරන්; උපලාපෙතුං, පොළඹවන්නට; මයං අපි; පහොම, සමර්ථ වෙම් ද; (එබඳුවූ;) භූමිගතං ච එව, භූමිගත වූ ද; වෙහාසට්ඨං ච, වෙහාසස්ථ වූ ද: පහූතං හිරඤ්ඤ සුවණ්ණං බොහෝ හිරණ්‍ය සවර්ණ; ඉමස්මිං රාජකුලෙ, මේ රාජකුලයෙහි; සංවිජ්ජති ඛො පන, විද්‍යමාන වේ ම ය; භන්තෙ, ස්වාමීනි! ජරාමරණෙ, ජරාමරණයන්; අධිවත්තමානෙ, යටත්කොට ගන්නාකල්හි, තෙසම්පි ධනයුද්ධානං, ඒ ධනයුද්ධයන්ගේ ද; ගති, ක්‍රියානිෂ්පත්තියෙක්: නත්ථි, නැත; විසයො, සමර්ථභාවයෙක් නත්ථි, නැත; භන්තෙ, ස්වාමීනි! මෙ, මට; ජරාමරණෙ, ජරාමරණයන්; අධිවත්තමානෙ, යටත්කොට ගන්නා කල්හි; ධම්මචරියාය; අඤ්ඤත්‍ර, ධර්මචර්‍ය්‍යාව හැර; සමචරියාය අඤ්ඤත්‍ර, සමචර්‍ය්‍යාව හැර; කුසලචරියාය අඤ්ඤත්‍ර, කුශලචර්‍ය්‍යාව හැර; පුඤ්ඤකිරියාය අඤ්ඤත්‍ර, පුණ්‍යක්‍රියාව හැර; කිං, කුමක්; කරණීයං අස්ස ඉති, කටයුතු වන්නේදැයි; (කියේය)

මහාරාජ, මහරජ! එතං, මේකාරණය; එවං, එසේය; මහාරාජ, මහරජ! එතං, මේ කාරණය; එවං, මෙසේය; මහාරාජ, මහරජ! ජරාමරණෙ, ජරාමරණයන්; අධිවත්තමානෙ, යටත්කොට ගන්නා කල්හී; ධම්මචරියාය අඤ්ඤත්‍ර, ධර්මයෙහි හැසිරීම හැර; සමචරියාය අඤ්ඤත්‍ර, සමචර්‍ය්‍යාව හැර; කුසල චරියාය අඤ්ඤත්‍ර, කුසලචර්‍ය්‍යාව හැර; පුඤ්ඤකිරියාය අඤ්ඤත්‍ර, පුණ්‍යක්‍රියාව හැර; අස්ස, ඊට; කිං, කුමක්; තෙ, තුඹ විසින් කරණීයං ඉති, කටයුතු වන්නේ-ද යන; ඉදං, මේ ධර්මය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළසේක; සුගතො; ශොභන ගමන්ඇති බුදුරජ තෙම; ඉදං, මේ ධර්මය; වත්වා, වදාරා; අථ, අනතුරුව; සත්ථා, ශාස්තෲන් වහන්සේ; අපරං, අන්‍යගාථාබන්ධනය වූ; එතං, මෙය; අවොච, වදාළසේක;

එවං ජරා ච මච්චු ච — අධිවත්තන්ති පාණිනො
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ — සුද්දෙ චණ්ඩාල පුක්කුසෙ
න කිඤ්චි පරිවජ්ජෙති — සබ්බමෙවාභිමද්දති.

න තත්‍ථ හත්‍ථීනං භූමි න රථානං න පත්තියා
න චාපි මන්තයුද්ධෙන — සක්කා ජෙතුං ධනෙන වා

තස්මා හි පණ්ඩිතො පොසො — සම්පස්සං අත්‍ථමත්තනො
බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝෙ ච — ධීරො සද්ධං නිවෙසයෙ
යො ධම්මචාරී කායෙන — වාචාය උද චෙතසා.
ඉධෙව නං පසංසන්ති — පෙච්ච සග්ගෙ පමොදතී ති.

## පබ්බතූපම සුත්තං

"ඉමානි අට්ඨ සුත්තානි කොසලසංයුත්තෙන."

---

විපුලා, මහත් වූ; සෙලා, ශෛලමය වූ; පබ්බතා, පර්වතයෝ; නභං ආහච්ච, අහසපුරා; සමන්තා. හාත්පසින්; චාතුද්දිසා, සතර දිසාවෙන්; නිප්පොථෙන්තා. සුනුවිසුනු කෙරෙමින්; යථාපි, යම් සේ අනුපරියෙය්‍යුං, පෙරළී එත් ද;

එවං, එසේම; ජරා ච, ජරාව ද; මච්චු ච, මරණය ද; පාණිනො. ප්‍රාණීන්; අධිවත්තන්ති, යටත් කොට ගනිත්; ඛත්තියෙ, ක්ෂත්‍රියයන් ද; බ්‍රාහ්මණෙ, බමුණන් ද; වෙස්සෙ, වෛශ්‍යයන් ද; සුද්දෙ, ශූද්‍රයන් ද; චණ්ඩාල පුක්කුසෙ, සැඬොල් පුප්සඬුවන් ද; කිඤ්චි, කිසිවක්; න පරිවජ්ජෙති, අත් නො හරී; සබ්බං එව, සියල්ල ම; අභිමද්දති, අතිශයින් මඩියි;

තත්‍ථ, එහි; හත්‍ථීනං, ඇතුන්ගේ යුධයට ද; න භූමි, භූමි නොවෙයි; න රථානං, රථයන්ගේ යුධයට ද; න භූමි, භූමි නො වෙයි; පත්තියා, පාබලසේනාවගේ යුධයටද; න, ස්ථාන නොවෙයි; මන්තයුද්ධෙන, මන්ත්‍ර යුධයකින් හෝ; ධනෙන වා, ධනයුධයකින් හෝ; ජෙතුං, ජයගන්ට; නච අපි සක්කා, නොම හැක්කේය;

හි, ඒ එසේ මැයි; තස්මා, එහෙයින්; ධීරො, ධෛර්‍යවත් වූ; පණ්ඩිතො පොසො, පණ්ඩිත පුරුෂ තෙම; අත්තනො, තමාගේ; අත්‍ථං, පරමාර්ථය; සම්පස්සං, දක්නේ; බුද්ධෙ, බුදුන් කෙරෙහිද; ධම්මෙ ච, ධර්මය කෙරෙහිද; සඞ්ඝෙ ච, සඞ්ඝයා කෙරෙහිද; සද්ධං, ශ්‍රද්ධාව; නිවෙසයෙ, පිහිටුවන්නේය;

යො, යමෙක් තෙම; කායෙන, කයින් ද; වාචාය, වචනයෙන් ද; උද, යළිත් චෙතසා, සිතින් ද; (යන තුන්දෙරින්) ධම්මචාරී, කුශල ධර්මයෙහි හැසිරෙන්නේද; නං, ඔහුට; ඉධ එව, මෙලොවම. පසංසන්ති, පසසත්; පෙච්ච, පරලොව; සග්ගෙ, ස්වර්ගයෙහි; පමොදති ඉති; ප්‍රමොද වේ යයි; (විපාක මොදනයෙන් විශෙෂයෙන් සතුටු වේ යයි වදාළසේක.)

**පබ්බතූපම සුත්තං-පබ්බතූපම සූත්‍රයයි.**

---

"ඉමානි අට්ඨ සුත්තානි, මේ සූත්‍ර අට: කොසලසංයුත්තෙන, (සංයුත් සඟියෙහි) කොශල සංයුත්තකයෙහි ය"

සාවත්ථියං–අට්ඨමියං **භික්ඛ**වෙ **පක්ඛස්ස** චතුන්නං මහාරාජානං අමච්චා පාරිසජ්ජා ඉමං ලොකං අනුවිචරන්ති කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං පවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තීති චාතුද්දසියං **භික්ඛ**වෙ චතුන්නං මහාරාජානං පුත්තා ඉමං ලොකං අනුවිචරන්ති කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තීති තදහු **භික්ඛ**වෙ උපොසථෙ පණ්ණරසෙ චත්තාරො මහාරාජා සාමංයෙව ඉමං ලොකං අනුවිචරන්ති කච්චි බහු මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තීති.

---

සාවත්ථියං–පෙ– භික්ඛවෙ, මහණෙනි! පක්ඛස්ස, පසළොස් දවසට අයිතිවූ; අට්ඨමියං; අටවක් පොහෝ දිනයෙහි; චතුන්නං මහාරාජානං, සතරවරම් මහරජුන්ගේ; පාරිසජ්ජා අමච්චා, පිරිසෙහිවූ අමාත්‍යයෝ; ඉමං ලොකං අනු, මේ ලොකයෙහි; විචරන්ති, හැසිරෙත්; (කුමක් පිණිසද යත්?) කච්චි, කිමෙක් දෝ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; බහු මනුස්සා, බොහෝ මනුෂ්‍යයෝ; මත්තෙය්‍යා මව කෙරෙහි මනාව පිළිපන්නාහුද; (මෑණියන්ට උපස්ථාන කෙරෙද්ද;) පෙත්තෙය්‍යා, පියාණන්ට උපස්ථාන කෙරෙද්ද. සාමඤ්ඤා, සිල්වත් ශ්‍රමණයන් වහන්සේලාට උපස්ථාන කෙරෙද්ද; බ්‍රහ්මඤ්ඤා, රහතන් වහන්සේලා කෙරෙහි මනාව පිළිපන්නාහුද; කුලෙ, ගෘහයෙහි; ජෙට්ඨාපචායිනො, වැඩිමහල්ලන්ට සැලකිලි කෙරෙද්ද; උපොසථං උපවසන්ති, මසකට අටවරක් උපොසිත ශීලය සමාදන් ව වෙසෙද් ද; පටිජාගරොන්ති, අට පොහොයට පෙරගමන් පසුගමන් වශයෙන් අෂ්ටාඞ්ගශීලය රකිද්ද; පුඤ්ඤානි කරොන්ති ඉති, අතිකුද්‍ර කුශල්කෙරෙද්දැයි; (දැනගන්නා පිණිසයි)

**භික්ඛ**වෙ, මහණෙනි! චාතුද්දසියං, තුදුස්වක් දිනයෙහි; චතුන්නං මහාරාජානං, සතර වරම් දෙව්මහරජුන්ගේ; පුත්තා, පුත්‍රයෝ; ඉමං ලොකං අනු, මේ ලොකයෙහි; විචරන්ති, හැසිරෙත්; (කුමක් පිණිසද යත්) කච්චි, කිමෙක් දෝ; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; බහු මනුස්සා, බොහෝ මනුෂ්‍යයෝ; මත්තෙය්‍යා, මවට උපස්ථාන කෙරෙත්ද; පෙත්තෙය්‍යා. පියාට උපස්ථාන කෙරෙත්ද; සාමඤ්ඤා. සිල්වත් ශ්‍රමණයන්වහන්සේලාට උපස්ථාන කෙරෙත්ද; බ්‍රහ්මඤ්ඤා, රහතන් වහන්සේලා කෙරෙහි මනාව පිළිපන්නාහුද;

සචෙ **භික්ඛ**වෙ අප්පකා හොන්ති මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්ති තමෙනං **භික්ඛ**වෙ චත්තාරො මහාරාජා දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං සන්නිසින්නානං සන්නිපතිතානං ආරොචෙන්ති අප්පකා ඛො මාරිසා මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තීති.

---

**කු**ලෙ, ගෘහයෙහි; ජෙට්ඨාපචායිනො, වැඩිමහල්ලන්ට සැලකිලි කෙරෙත්ද; උපොසථං උපවසන්ති, මසකට අටවරක් උපොෂිත ශීලය සමාදන් ව වෙසෙත් ද; පටිජාගරොන්ති, අටපෝහොයට පෙරගමන් පසුගමන් වශයෙන් අෂ්ටාඞ්ගශීලය රකිත්ද; පුඤ්ඤානි කරොන්ති ඉති, අන්‍යවූ පිනුත් කෙරෙද්දැයි; (දැනගන්නා පිණිසය.)

භික්ඛවෙ, මහණෙනි! පණ්ණරසෙ උපොසථෙ, පසළොස්වක් පොහොය පැමිණි; තදහු, එ දවසෙහි; චත්තාරො මහාරාජානො, සතර වරම් මහ රජවරු; සාමංයෙව, තුමූ ම; ඉමං ලොකං අනු, මේ මනුෂ්‍ය ලොකයෙහි; විචරන්ති. හැසිරෙත්; (කුමක් පිණිස ද යත්) කච්චි, කිමෙක් ද; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; බහු මනුස්සා, බොහෝ මිනිස්සු; මත්තෙය්‍යා, මවට උපස්ථාන කෙරෙත්ද; පෙත්තෙය්‍යා, පියාණන්ට උපස්ථාන කෙරෙත්ද. සාමඤ්ඤා, ශ්‍රමණවරුන්ට උපස්ථාන කෙරෙත්ද; බ්‍රහ්මඤ්ඤා, ක්ෂීණාශ්‍රවයන්ට මනාව පවතිත් ද; කුලෙ, කුලයෙහි; ජෙට්ඨාපචායිනො, වැඩිමහල්ලන්ට සැලකිලි කෙරෙත් ද; උපොසථං උපවසන්ති, මසකට අටවරක් උපොෂිත ශීලය රකිත් ද; පටිජාගරොන්ති, පටිජාගරණ උපොසථය රකිත් ද; පුඤ්ඤානි කරොන්ති ඉති, අන්‍යවූ පින් කෙරෙත් දැයි; (දැනගන්නා පිණිසයි.)

**භික්ඛ**වෙ, මහණෙනි! සචෙ, ඉදින්; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; අප්පකා මනුස්සා, ස්වල්ප වූ මිනිස්සු; මත්තෙය්‍යා, මවට උපස්ථාන කෙරෙත් ද; පෙත්තෙය්‍යා, පියාණන්ට උපස්ථාන කෙරෙත්ද; සාමඤ්ඤා, ශ්‍රමණයන් වහන්සේලාට උපස්ථාන කෙරෙත්ද; බ්‍රහ්මඤ්ඤා, ක්ෂීණාශ්‍රවයන්ට මනාව පවතිත් ද; කුලෙ ජෙට්ඨාපචායිනො, කුලයෙහි වැඩිහිටියන්ට සැලකිලි කෙරෙත් ද; උපොසථං උපවසන්ති, උපොෂිත ශීලයට එළඹ වෙසෙත් ද; පටිජාගරොන්ති, පටිජාගරණ උපොෂිත ශීලය රකිත් ද; පුඤ්ඤානි කරොන්ති, අන්‍යවූ පින් කෙරෙත් ද; භික්ඛවෙ, මහණෙනි! තමෙනං, ඒ ප්‍රවෘත්තිය; චත්තාරො මහාරාජානො, සතරවරම් මහරජවරු; සුධම්මා

තෙන භික්ඛවෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති දිබ්බා වත භො කායා පරිහායිස්සන්ති පරිපූරිස්සන්ති අසුරකායාති.

සචෙ පන භික්ඛවෙ බහූ හොන්ති මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්ති තමෙනං භික්ඛවෙ චත්තාරො මහාරාජා දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං සන්නිසින්නානං සන්නිපතිතානං ආරොචෙන්ති බහූ ඛො මාරිසා මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා

---

යං සභායං, සුධර්මා නම් දිව්‍ය සභාවෙහි; සන්නිසින්නානං සන්නිපතිතානං, රැස්ව උන්නාවූ; තාවතිංසානං දෙවානං, තව්තිසා දෙව්ලෝ වැසි දෙවියන්ට; ආරොචෙන්ති, දැනුම් දෙත්; මාරිසා, නිදුකාණෙනි! මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; අප්පකා මනුස්සා ඛො, මනුෂ්‍යයෝ ස්වල්පදෙනෙක් ම; මත්තෙය්‍යා, මවට උපස්ථාන කෙරෙත්, පෙත්තෙය්‍යා, පියාට උපස්ථාන කෙරෙත්; සාමඤ්ඤා, ශ්‍රමණයන්ට උපස්ථාන කෙරෙත්; බ්‍රහ්මඤ්ඤා, රහතන් වහන්සේලාට මනාව පව තිත්; කුලෙ ජෙට්ඨාපචායිනො, කුලයෙහි වැඩිහිටියන්ට සැලකිලි කෙරෙත්; උපොසථං උපවසන්ති,. මසකට අටවරක් උපොෂිත ශීලය රකිත්; පටිජාගරොන්ති, පටිජාගරණ උපොෂිතය රකිත්. පුඤ්ඤානි කරොන්ති ඉති, අවශෙෂවූ ද පින් කෙරෙත්ය කියායි.

භික්ඛවෙ, මහණෙනි! තෙන, ඒ කාරණයෙන්; තාවතිංසා දෙවා, තව්තිසා දෙව්ලෝවැසි දෙවියෝ; භො, පින්වත්නි! වත, ඒකාන්තයෙන්; දිබ්බා කායා, දිව්‍යසමූහයෝ; පරිහායිස්සන්ති, පිරිහෙන්නාහුය; අසුර කායා, සතරඅපායයෝ; පරිපූරිස්සන්ති ඉති, පිරෙන්නාහුයයි; අත්තමනා හොන්ති, නොසතුටුසිත් ඇත්තෝ වෙත්. භික්ඛවෙ. මහණෙනි! සචෙපන, ඉදින් වනාහි; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; බහූ මනුස්සා, බොහෝමනුෂ්‍යයෝ; මත්තෙය්‍යා හොන්ති, මවට උපස්ථානකරන්නෝ වෙත් ද; පෙත්තෙය්‍යා, පියාණන්ට උපස්ථානකරන්නෝ වෙත්ද; සාමඤ්ඤා, ශ්‍රමණවරුන්ට උපස්ථාන කරන්නෝ වෙත්ද; බ්‍රහ්මඤ්ඤා, බාහිත පාපීන්ට උපස්ථාන කරන්නෝ වෙත්ද; කුලෙ ජෙට්ඨාපචායිනො, කුලයෙහි වැඩිහිටියන්ට උපස්ථාන කරන්නෝ වෙත්ද; උපොසථං උපවසන්ති, මසකට අටවරක් උපොසථශීලය සමාදන් ව වෙසෙත්ද; පටිජාගරොන්ති, පොහොයට පෙරපසුගමන් වශයෙන් උපොෂිත ශීලය සමාදන් වෙත්ද; පුඤ්ඤානි කරොන්ති, අතිකුදු පින් කෙරෙත්ද; භික්ඛවෙ, මහණෙනි! තමෙනං, ඒ ප්‍රවෘත්තිය; චත්තාරො මහාරාජා; සතරවරම් මහරජවරු; තාවතිංසානං දෙවානං,

**සාමඤ්ඤා** බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරෙන්ති පුඤ්ඤානි කරොන්තීති, තෙන භික්ඛවෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති දිබ්බා වත භො කායා පරිපූරිස්සන්ති පරිහායිස්සන්ති අසුරා කායාති.

භූතපුබ්බං **භික්ඛ**වෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ අනුසඤ්ඤායමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි.

චාතුද්දසිං පඤ්චදසිං–යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරිය පක්ඛඤ්ච–අට්ඨඞ්ග සුසමාහිතං
උපොසථං උපවසෙය්‍ය–යො පස්ස මාදිසො නරොති

---

තව්තිසාවැසි දෙවියන්ගේ; සුධම්මායං සභායං, සුධර්මා නම් දිව්‍ය සභාවෙහි: සන්නිසින්නානං, රැස්ව උන්නාවූ; සන්නිපතිතානං, රැස්වූදෙවියන්ට; ආරොචෙන්ති, කියත්; (ඒ කෙසේදයත්) මාරිසා, නිදුකාණෙනි! මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; බහූ මනුස්සා බො, බොහෝ මිනිස්සු වනාහි; මත්තෙය්‍යා, මවට; උපස්ථානකරන්නාහුය; පෙත්තෙය්‍යා, පියාණන්ට උපස්ථාන කරන්නාහුය; සාමඤ්ඤා, ශ්‍රමණවරුන්ට; උපස්ථාන කරන්නාහුය; බ්‍රහ්මඤ්ඤා, බාහිත පාපීන්ට උපස්ථාන කරන්නාහුය; කුලෙ ජෙට්ඨාපචායිනො, කුල යෙහි වැඩිහිටියන්ට උපස්ථාන කරන්නාහුය; උපොසථං උපවසන්ති, මසකට අටවරක් උපොසථ ශිලය සමාදන් ව වසත්: පටිජාගරෙන්ති, පොහොයට පෙරපසුගමින් වශයෙන් උපෙෂිථශිලය සමාදන් වෙත්; පුඤ්ඤානි කරොන්ති ඉති, අවශෙෂවූ කුශල් කෙරෙත්ය කියායි; භික්ඛවෙ, මහණෙනි! තෙන, ඒකාරණයෙන්; තාවතිංසා දෙවා, තව්තිසාවැසි දෙවියෝ; හො, ඉන්වත්ති! වත, ඒකාන්තයෙන්; දිබ්බා කායා, දිව්‍ය සමූහයෝ; පරිපූරිස්සන්ති. සම්පූර්ණ වන්නාහ; අසුරා කායා, සතර අපායයෝ; පරිහායිස්සන්ති ඉති, පිරිහෙන්නාහයි; අත්තමනා හොන්ති, සතුටුසිත් ඇත්තෝ වෙත්.

**භික්ඛවෙ**, මහණෙනි! භූතපුබ්බං, පෙරවූදෙයක් කියමි; සක්කො දෙවානමින්දො, ශක්‍රදේවේන්ද්‍ර තෙම; දෙවෙ තාවතිංසෙ, තව්තිසාදෙව්ලොවැ දෙවියන්ට; අනුසඤ්ඤායමානො, කාරුණ්‍ය දෙනුයේ; තායං වෙලායං, ඒ වේලෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේය.

යො නරො අපි, යම් මනුෂ්‍යයෙක්; මාදිසො අස්ස, මා වැනි වන්නේනම්; හොහොය මා පැමිණි සැපතට පැමිණෙන්ට කැමැති වන්නේනම්; (ගෙහොප) පක්ඛස්ස, පක්ෂයසම්බන්ධි වූ; චාතුද්දසිං, (අවපුර) තුදුස්වක් පොහොයෙහි ද; පඤ්චදසිං, (අවපුර) පස ළොස්වක් පොහොයෙහි ද; යාව අට්ඨමී, යම් (අවපුර) අටවක්

සා බො පනෙසා භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථා දුග්ගීතා න සුගීතා දුබ්භාසිතා න සුභාසිතා, තං කිස්ස හෙතු? සක්කො හි භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො අවීතදොසො අවීතමොහො යො ච බො සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත සදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤාවිමුත්තො තස්ස බො එතං භික්ඛවෙ භික්ඛුනො කල්ලං වචනායාති.

චාතුද්දසිං පඤ්චදසිං—යා ච පක්ඛස්ස අට්ඨමී
පාටිහාරිය පක්ඛඤ්ච—අට්ඨඞ්ග සුසමාහිතං
උපොසථං උපවසෙය්‍ය—යො පස්ස මාදිසො නරො ති.

---

පෝයක් වේ නම්; (ඒ අටවක් හිද) පාටිහාරිය පක්ඛඤ්ච; ඇතුළු වස් තුන්මස හෝ පෙර පසු වස් පවාරණ අතර මස හෝ ප්‍රථමපවාරණ අඩ මස හෝ නිත්‍යශීල වශයෙන් රකින) ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද; අට්ඨඞ්ගසුසමාහිතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපෙසථං, උපෝෂිත ශීලය; උපවසෙය්‍ය, සමාදන් ව වාසය කරන්නේය;

භික්ඛවෙ, මහණෙනි! සා එසා ගාථා බො පන, ඒ මේ ගාථා තොම වනාහි; සක්කෙන දෙවානමින්දෙන, ශක්‍රදේවේන්ද්‍රයා විසින්; දුග්ගීතා, නපුරු කොට ගායනාකරන ලද්දක; න සුගීතා, යහපත් කොට ගායනාකරන ලද්දක් නොවේ; දුබ්භාසිතා, නපුරු කොට කියන ලද්දකි; න සුභාසිතා, යහපත් කොට කියනලද්දක් නොවේ; තං කිස්සහෙතු, එයට කාරණ කවරේදයත්? භික්ඛවෙ, මහණෙනි! හි, යම්හෙයකින්; සක්කො දෙවානමින්දො, ශක්‍රදේවේන්ද්‍රතෙම; අවීතරාගො, පහනොකළ රාගඇත්තේද; අවීතදොසො, පහනොකළ ද්වේෂ ඇත්තේද; අවීතමොහො, පහනොකළ මෝහ ඇත්තේද; (එහෙයිනි) භික්ඛවෙ, මහණෙනි! යො ච බො භික්ඛු, යම් භික්ෂුවක් වනාහි; අරහං, රහත්ද; ඛීණාසවො, ක්ෂයකළ ආශ්‍රවයන් ඇත්තේද; වුසිතවා, වැසනිමවූ දශවිධ ආර්‍ය්‍යවාස ඇත්තේද; කතකරණීයො, සිවුමගින් නොටනිමවූ කෘත්‍ය ඇත්තේද; ඔහිතභාරො, බහා තබන ලද ස්කන්ධක්ලේශ අභිසංස්කාර සඞ්ඛ්‍යාත ත්‍රිවිධ බර ඇත්තේ ද; අනුප්පත්ත සදත්ථො, මාර්ග පිළිවෙළින් පැමිණෙනලද ස්වාර්ථ සඞ්ඛ්‍යාත අර්හත්වය ඇත්තේ ද; පරික්ඛීණ භවසඤ්ඤොජනො, ක්ෂය වූ සංසාර බන්ධන ඇත්තේ ද; සම්මදඤ්ඤා විමුත්තො, මනාකොට දැන කෙලෙසුන්ගෙන් මිදුනේ ද; තස්ස බො භික්ඛුනො, ඒ භික්ෂුහට වනාහි; එතං, (සක්දෙව්රජහුගේ කීමවූ) මේය; වචනාය, කීමට; කල්ලං, සුදුසුයි;

තං කිස්ස හෙතු, සො හි භික්ඛවෙ භික්ඛු වීතරාගො වීතදොසො වීතමොහො හොති.—භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ අනුසඤ්ඤාපයමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි.

චාතුද්දසිං පඤ්චදසිං—යා ච පක්ඛස්ස අට්ඨමී
පාටිහාරියපක්ඛඤ්ච—අට්ඨඞ්ග සුසමාහිතං
උපොසථං උපවසෙය්‍ය—යො පස්ස මාදිසො නරො ති.

සා ඛො පනෙසා භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථා දුග්ගීතා න සුගීතා දුබ්භාසිතා න සුභාසිතා තං, කිස්ස හෙතු? සක්කො භික්ඛවෙ දෙවානමින්දො අපරිමුත්තො ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායා

---

යො අපි නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; මාදිසො අස්ස, මා වැනි වන්නේ නම්; (හෙ තෙමේ ද) පක්ඛස්ස, පසළොස් දවසට අයිති වූ; චාතුද්දසිං, තුදුස්වන දිනයෙහි ද; පඤ්චදසිං, පසළොස්වන දිනයෙහි ද; යා ච අට්ඨමි, යම් අටවක් දිනක් ඇද්ද; (එහි ද) පාටිහාරිය පක්ඛං ච, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද; අට්ඨඞ්ග, සුසමාහිතං, ගුණාඞ්ග අටකින් යුක්ත වූ; උපොසථං, උපොෂිත ශීලය; උපවසෙය්‍ය, සමාදන් ව වාසය කරන්නේය;

තං කිස්ස හෙතු, එසේ කීමට යුක්ති කවරේ ද; භික්ඛවෙ, මහණෙනි! හි, යම් හෙයකින්; සො භික්ඛු, ඒ භික්ෂුතෙම; වීතරාගො, පහවූරාග ඇත්තේ ද; වීතදොසො, පහ වූ වෙෂ ඇත්තේ ද; වීතමොහො ඉති, පහ වූ මෝහ ඇත්තේ ද; එ හෙයිනැයි (වදළසේක.)

භික්ඛවෙ, මහණෙනි! භූතපුබ්බං, (නැවත ද) පෙර වූවක් කියමි; සක්කො දෙවානමින්දො, ශක්‍රදෙවේන්ද්‍රතෙම; තාවතිංසෙ දෙවෙ, තව්තිසා වැසි දෙවියන්ට; අනුසඤ්ඤාපයමානො, කරුණු අවබොධ කරවමින්; තායං වෙලායං, එ වේලෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කියේය;

චාතුද්දසිං-පෙ-

භික්ඛවෙ, මහණෙනි! සක්කෙන දෙවානමින්දෙන, ශක්‍රදෙවේන්ද්‍රයා විසින්: සා ඛො පන එසා ගාථා, ඒ මේ ගාථාතොම; දුග්ගීතා, නපුරු කොට ගායනා කරන ලද්දීය; න සුගීතා, යහපත් කොට ගායනා කරන ලද්දක් නො වේ; දුබ්භාසිතා, නපුරුකොට කියන ලද්දීය; න සුභාසිතා, යහපත් කොට කියන ලද්දක් නො වේ; තං කිස්ස හෙතු, ඊට කාරණ කවරේ ද? භික්ඛවෙ, මහණෙනි! සක්කො දෙවානමින්දො, ශක්‍රදෙවේන්ද්‍රතෙම ජාතියා, ඉපදීමෙන් ද; ජරාය, ජරාවෙන් ද; මරණෙන, මරණ

සෙහි අපරිමුත්තො දුක්ඛස්මාති වදාමි. යො ච ඛො සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරෙ අනුප්පත්ත සදත්ථො පරික්ඛීණ භවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො කල්ලං වචනාය.

චාතුද්දසිං පඤ්චදසිං—යා ච පක්ඛස්ස අට්ඨමී
පාටිහාරිය පක්ඛඤ්ච—අට්ඨඞ්ග සුසමාහිතං
උපොසථං උපවසෙය්‍ය—යො පස්ස මාදිසො නරො ති

තං කිස්ස හෙතු? සො භික්ඛවෙ භික්ඛු පරිමුත්තො ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි පරිමුත්තො දුක්ඛස්මාති වදාමීති.

**ලොකානු විචරණ සුත්තං.**

"තිකඞ්ගුත්තරෙ"

---

යෙන් ද; සොකෙහි, ශොකවලින් ද; පරිදෙවෙහි, විලාපවලින් ද; දුක්ඛෙහි, කායික දුක්වලින් ද; දොමනස්සෙහි, දොම්නස්වලින් ද; උපායාසෙහි, බලවත් වෙහෙසවලින්ද; අපරිමුත්තො, නොමිදුනේය; දුක්ඛස්මා, සසරදුකින්; අපරිමුත්තො ඉති, නොමිදුනේයයි; වදාමි කියමි.

භික්ඛවෙ, මහණෙනි! යො ච ඛො සො භික්ඛු, යම් ඒ භික්ෂුවක් තෙමෙ ම; අරහං, රහත් වූයේ ද; ඛීණාසවො, ක්ෂය කරන ලද කෙලෙස් ඇත්තේද; වුසිතවා, වැස නිම වූ දශවිධ ආර්‍ය්‍යවාස ඇත්තේ ද; කතකරණීයො, සතර මඟින් කරනලද කටයුතු ඇත්තේ ද; ඔහිතභාරො, බහා තුබූ කෙලෙස් බර ඇත්තේ ද; අනුප්පත්තසදත්ථො, මාර්ගපටිපාටියෙන් පැමිණෙන ලද ස්වාර්ථ ඇත්තේද; පරික්ඛීණ භවසංයොජනො, ක්ෂය කරන ලද, භව බන්ධන ඇත්තේ ද; සම්මදඤ්ඤා විමුත්තො, මනාකොට දැන කෙලෙසුන්ගෙන් මිදුනේ ද; තස්ස ඛො, ඒ භික්ෂුහට එතාංහි; එතං මෙය; වචනාය, කීමට; කල්ලං, සුදුසුයි;

චාතුද්දසිං-පෙ- තං කිස්ස හෙතු, එසේ කියන්ට (රහත් භික්ෂුව සුදුසු වීමට) හේතු කවරේද? භික්ඛවෙ, මහණෙනි! සො භික්ඛු, ඒ රහත් භික්ෂුතෙම වනාහී; ජාතියා, ජාතිමූලික දුකෙන්ද; ජරාය, ජරා දුකෙන්ද; මරණෙන, මරණ දුකෙන්ද; සොකෙහි, ශොකයන්ගෙන්ද; පරිදෙවෙහි, වැලපීම් වලින්ද; දුක්ඛෙහි, කායික දුක්ඛයන්ගෙන් ද; දොමනස්සෙහි, දොම්නස් වලින් ද; උපායාසෙහි, දැඩිවෙහෙස වලින් ද; පරිමුත්තො, හාත්පසින් මිදුනේ ද; දුක්ඛස්මා, සංසාර වෘතදුක්ඛයෙන්; පරිමුත්තො ඉති, මිදුනේ ද; (එ හෙයිනැයි) වදාමි ඉති, කියමි යි (වදාළසේක.)

**ලොකානුවිචරණ සුත්තං - ලෝකානුවිචරණ සූත්‍රයයි.**

---

**තිකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර තික නිපාතයෙහිය.**

---

සාවත්ථියං—යෙ භික්ඛවෙ සත්තා පුබ්බණ්හසමයං කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති සුපුබ්බණ්හෝ භික්ඛවෙ තෙසං සත්තානං, යෙ භික්ඛවෙ සත්තා මජ්ඣන්තිකසමයං කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති, සුමජ්ඣන්තිකො භික්ඛවෙ තෙසං සත්තානං, යෙ භික්ඛවෙ සත්තා සායණ්හසමයං කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති, සුසායණ්හෝ භික්ඛවෙ තෙසං සත්තානන්ති.

සුනක්ඛත්තං සුමඞ්ගලං-සුප්පභාතං සුහුට්ඨිතං
සුඛණො සුමුහුත්තො ච-සුයිට්ඨං බ්‍රහ්මචාරිසු.

---

සාවත්ථියං-පෙ-භික්ඛවෙ, මහණෙනි! යෙ සත්තා, යම් සත්ත්වකෙනෙක්; කායෙන, කයින්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; වාචාය, වචනයෙන්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; මනසා, සිතින්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; භික්ඛවෙ, මහණෙනි! තෙසං සත්තානං, ඒ සත්ත්වයන්ට; සුපුබ්බණ්හෝ, යහපත් පූර්වාණ්හ කාලය වෙයි; භික්ඛවෙ, මහණෙනි! යෙ සත්තා, යම් සත්ත්වකෙනෙක්; මජ්ඣන්තික සමයං, මධ්‍යාහ්ණ කාලයෙහි; කායෙන, කයින්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; වාචාය, වචනයෙන්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; මනසා, සිතින්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; භික්ඛවෙ, මහණෙනි! තෙසං සත්තානං, ඒ සත්ත්වයන්ට; සුමජ්ඣන්තිකො, යහපත් මධ්‍යාහ්ණ කාලය වෙයි; භික්ඛවෙ, මහණෙනි! යෙ සත්තා, යම් සත්ත්වකෙනෙක්; සායණ්හ සමයං, සවස් කාලයෙහි; කායෙන, කයින්; සුචරිතං චරන්ති සුචරිතයෙහි හැසිරෙත් ද; වාචාය, වචනයෙන්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත් ද; මනසා, සිතින්; සුචරිතං චරන්ති, සුචරිතයෙහි හැසිරෙත්ද; භික්ඛවෙ, මහණෙනි! තෙසං සත්තානං, ඒ සත්ත්වයන්ට; සුසායණ්හෝ ඉති, යහපත් සවස් කාලය වේ යයි; (වදාළසේක)

සුනක්ඛත්තං, (යම් දිනයෙක සුචරිත ධර්ම පිරුවාහු නම් ඒ දින) යහපත් නැකතක්ද; සුමඞ්ගලං, යහපත් මඟුලක් ද; සුප්පභාතං, යහපත් අලුයමක් ද; සුහුට්ඨිතං, යහපත් නැඟි සිටීමක් ද; සුඛණො, යහපත් ක්‍ෂණයක් ද; සුමුහුත්තො ච, යහපත් මොහොතක් ද; බ්‍රහ්මචාරිසු, බ්‍රහ්මචාරීන් කෙරෙහි; සුයිට්ඨං, (දෙනලද්ද) යහපත් දානයක් ද වෙයි;

පදක්ඛිණං කායකම්මං - වාචා කම්මං පදක්ඛිණං,
පදක්ඛිණං මනොකම්මං - පණිධි තෙ පදක්ඛිණා.

පදක්ඛිණානි කත්වාන - ලභන්තත්ථෙ පදක්ඛිණෙ,
තෙ අත්තලද්ධා සුඛිතා - විරූළ්හා බුද්ධ සාසනෙ,
අරොගා සුඛිතා හොථ - සහ සබ්බෙහි ඤාතිභි ති.

සුපුබ්බණ්හ සුත්තං

"තිකඞ්ගුත්තරෙ"

1 අනිමිත්ත මනඤ්ඤාතං - මච්චානං ඉධ ජීවිතං,
කසිරඤ්ච පරිත්තඤ්ච - තං ච දුක්ඛෙන සඤ්ඤුතං.

2 නහි සො උපක්කමො අත්ථි - යෙන ජාතා න මීයරෙ
ජරම්පි පත්වා මරණං - එවං ධම්මා හි පාණිනො.

---

කායකම්මං, (සුචරිත පූරකයා විසින් එ දවස් කළ) කායකර්මය; පදක්ඛිණං, වෘද්ධි ඇත්තේ වෙයි; වාචාකම්මං, වාක්කර්මය; පදක්ඛිණං, වෘද්ධි ඇත්තේ වෙයි; මනොකම්මං, මනඃකර්මය; පදක්ඛිණං, වෘද්ධි ඇත්තේ වෙයි; තෙ පණිධී; (එ දවස් තුබූ) ඒ ප්‍රණිධීහු; පදක්ඛිණා, වෘද්ධියෙන් යුක්ත වූවාහුය.

එත්ථ, මේ මනුෂ්‍යාත්ම භාවයෙහි; පදක්ඛිණානි, වෘද්ධින් යුක්තකර්මයන්; කත්වාන, කොට; පදක්ඛිණෙ, වෘද්ධින්; (යුක්ත ඵල) ලභන්ති, ලබත්; තෙ, ඒ වෘද්ධිහු; අත්තලද්ධා, තමා විසින් ලද්දාහු; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; විරූළ්හා,(මුල් හටගැනීමෙන්) විශෙෂයෙන් වැඩුණාහු; සුඛිතා, සුවපත් වූවාහු වෙත්; සබ්බෙහි ඤාතීහි සහ, සියලු නෑයන් හා සමඟ; අරොගා හොථ ඉති, නිරෝගි වූවාහු වව් යයි; (වදාළසේක)

සුපුබ්බණ්හ සුත්තං, සුපුබ්බණ්හ සූත්‍රයයි:

---

තිකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර තික නිපාතයෙහි ය.

---

ඉධ, මේ ලෝකයෙහි; මච්චානං, මනුෂ්‍යයන්ගේ; ජීවිතං, ජීවිතය; අනිමිත්තං, ක්‍රියාකරණ නිමිත්ත රහිතය; අනඤ්ඤාතං, ආයුපරිච්ඡේදයක් නො දන්නාලද ය; කසිරඤ්ච, දුකින් යැපෙන්නේ ය; පරිත්තඤ්ච, සවල්ප ද වන්නේ ය; තඤ්ච, ඒ ජීවිතය ද; දුක්ඛෙන, දුකින්; සංයුතං, යුක්ත වන්නේය;

යෙන, යම් උපක්‍රමයකින්; ජාතා, උපන්නාහු; න මීයරෙ, නො මියෙත් ද; සො උපක්කමො, ඵ බඳු උපායෙක්; නහි අත්ථි, නො ම ඇත්තේය; ජරං පත්වා අපි, ජරාවට පැමිණ ද නො පැමිණ ද; මරණං, මරණය වේ; පාණිනො, සත්වයෝ; එවං ධම්මා හි, මෙ බඳු සවභාව ඇත්තාහු ම ය;

3 ඵලාන මිව පක්කානං- පාතො පතනතො භයං
එවං ජාතාන මච්චානං- නිච්චං මරණතො භයං

4 යථාපි කුම්භකාරස්ස- කතා මත්තික භාජනා
සබ්බෙ භෙදන පරියන්තා- එවං මච්චාන ජීවිතං

5 දහරා ච මහන්තා ච- යෙ බාලා යෙ ච පණ්ඩිතා
සබ්බෙ මච්චු වසං යන්ති- සබ්බෙ මච්චු පරායණා

6 තෙසං මච්චු පරෙතානං-ගච්ඡතං පරලොකතො
න පිතා තායතෙ පුත්තං-ඤාති වා පන ඤාතකෙ

7 පෙක්ඛතං යෙව ඤාතීනං-පස්ස ලාලපතං පුථු
එකමෙකොව මච්චානං-ගොවජ්ඣො විය නීයති

---

**පක්කානං**, පැසුණා වූ; ඵලානං, ඵලයන්ගේ; පාතො, උදෑසන; පතනතො, වැටීම හේතු කොට ගෙන; භයං ඉව, (ඵලසවමින්ට යම්සේ) බියෙක් වේ ද, එවං, එසේ; ජාතානං, උපන්නාවූ; මච්චානං, මනුෂ්‍යයන්ට; මරණතො, මරණයෙන්; නිච්චං, නිරන්තරයෙන්; භයං, (ඥාති මිත්‍රාදී ප්‍රියයන්ට) බිය වන්නේය;

යථාපි, යම්සේ; කුම්භකාරස්ස, කුම්භකාරයා විසින්; කතා, කරනලද්දවූ; සබ්බෙ මත්තික භාජනා, සියලු මැටි බඳුන්; භෙදන පරියන්තා, බිඳීම කෙළවර කොට ඇත්තාහු ද; මච්චානං, මනුෂ්‍යයන්ගේ; ජීවිතං, ජීවිතය; එවං, එසේ ය;

යෙ, යම්කෙනෙක්; දහරා ච, ළදරුවූවාහු ද; යෙ, යම් කෙනෙක්; මහන්තා ච, මහත් වූවාහු ද: බාලා ච, නුවණ මඳ වූවාහු ද: පණ්ඩිතා, පැණවත් වූවාහු ද; සබ්බෙ, ඔහු සියල්ලෝ; මච්චුවසං, මරහුගේ වසහයට; යන්ති, පැමිණෙත්; සබ්බෙ, සියල්ලෝ; මච්චු පරායණා, මරණය පිහිටකොට ඇත්තාහු වෙත්;

මච්චුපරෙතානං, මරණය විසින් මඩනා ලද්දවූ; ඉතො, මේ ලෝකයෙන්; පරලොකං, පරලොවට; ගච්ඡතං, ප්‍රතිසන්ධිවශයෙන් යන්නාවූ; තෙසං, ඔවුන්ගේ; පිතා, පියතෙම; පුත්තං, පුත්‍රයා; න තායතෙ, රක්ෂා නො කෙරේ; ඤාති වා පන, නෑතෙමේ ද; ඤාතකෙ, නෑයන් රක්ෂා නො කෙරේ;

ඤාතීනං, නෑයන්; පෙක්ඛතං යෙව, බලා සිටියදී ම; පුථු ලාලපතං, මහත් ව හඬමින් සිටියදී ම; මච්චානං, මනුෂ්‍යයන් අතුරෙහි; එක එකොව, එකෙක් එකෙක් ම; වජ්ඣගො විය, මරණයට නියමවූ ගවයකු මෙන්; (මරහු විසින්) නීයති, ගෙන යනුලබන්නේය; පස්ස, (උපාසකය) බලව;

8 එවමබ්භාහතො ලොකො-මච්චුනා ච ජරාය ච
තස්මා ධීරා න සොචන්ති-විදිත්වා ලොක පරියායං

9 යස්ස මග්ගං න ජානාසි- ආගතස්ස ගතස්ස වා
උභො අන්තෙ අසම්පස්සං-නිරත්ථං පරිදෙවසි

10 පරිදෙවයමානො චෙ-කිඤ්චි දත්ථං උදබ්බහෙ
සම්මූළ්හො හිංසමත්තානං-කයිරා චෙතං විචක්ඛණො

11 නහි රුණ්ණෙන සොකෙන-සන්තිං පප්පොති චෙතසො
භිය්‍යස්සුප්පජ්ජතෙ දුක්ඛං-සරීරං චූපහඤ්ඤති.

12 කිසො විවණ්ණො භවති-හිංස මත්තාන මත්තනා
න තෙන පෙතා පාලෙන්ති-නිරත්ථා පරිදෙවනා

---

ලොකො, ලෝවැසිතෙම; මච්චුනා ච, මරහු විසින් ද; ජරාය ච ජරාව විසින් ද; එවං, මෙසේ; අබ්භාහතො, විශෙෂයෙන් හිංසා කරන ලද්දේය; තස්මා, එහෙයින්; ලොකපරියායං, ලොක ස්වභාවය; විදිත්වා, දැන; ධීරා, පණ්ඩිතයෝ; න සොචන්ති, ශොක නො කෙරෙත්;

ආගතස්ස, (මවුකුසට) ආවාවූ හෝ; ගතස්ස වා, මෙයින් චුතව අන් තැනකට ගියා වූ හෝ; යස්ස, යමක්හුගේ; මග්ගං, (ආ ගිය) මඟ, න ජානාසි, නොදන්නෙහිද; උභො අන්තෙ, (ඒ ආගියදෙ මඟයයි කියනලද) දෙ කෙළවර; අසම්පස්සං, නො දක්නේ; නිරත්ථං, නිෂ්ප්‍රයෝජනයේ; පරිදෙවසි, හඬන්නෙහිය;

චෙ, ඉදින්; සම්මූළ්හො, සිහි මුළා වූයේ; අත්තානං, තමාට; හිංසං, පීඩා කෙරෙමින්; පරිදෙවයමානො, හඬන්නේ; කිඤ්චි අත්ථං, කිසි ප්‍රයෝජනයක්; උදබ්බහෙ, පමුණුවා නම්; නොහොත් උපදවා ගනී නම්; විචක්ඛණො, නුවණැත්තේ; එතං, මේ හැඬීම; කයිරා, කරන්නේය;

රුණ්ණෙන, හැඬීමෙන් ද; සොකෙන, ශොකයෙන් ද; චෙතසො සන්තිං, සිත පිළිබඳ සන්හිඳීමට; නහි පප්පොති, නො පැමිණෙයි; අස්ස, ඔහට; භිය්‍යො, බොහෝ සෙයින්; දුක්ඛං, දුඃඛය; උප්පජ්ජතෙ, උපදී; සරීරං ච, ශරීරයද; උපහඤ්ඤති, පෙළනු ලැබේ.

අත්තනා, තෙමේ; අත්තානං, තමාට; හිංසං, පීඩා කරන්නේ; කිසො, කෘශ වූයේ; විවණ්ණො, විවර්ණ වූයේ; භවති, වේ; තෙන; ඒ ශොක කිරීමෙන්; පෙතා, මළාහු; න පාලෙන්ති, නොරැකෙත් (එහෙයින්) පරිදෙවනා, හැඬීම; නිරත්ථා, ප්‍රයෝජන රහිත වන්නාහුය;

13 සොකමප්පජහං ජන්තු-භීයො දුක්ඛං නිගච්ඡති,
අනුත්ථුනන්තො කාලකතං-සොකස්ස වසමන්වගූ.

14 අඤ්ඤෙපි පස්ස ගමිනො-යථාකම්මූපගෙ නරෙ
මච්චුනො වසමාගම්ම-ඵන්දන්තෙ ඉධ පාණිනො

15 යෙන යෙනහි මඤ්ඤන්ති-තතො තං හොති අඤ්ඤථා
එතාදිසො විනාභාවො-පස්ස ලොකස්ස පරියායං

16 අපි චෙ වස්ස සතං ජීවෙ-භීයො වා පන මානවො
ඤාති සංඝා විනා හොති-ජහාති ඉධ ජීවිතං

17 තස්මා අරහතො සුත්වා-විනෙය්‍ය පරිදෙවිතං
පෙතං කාලකතං දිස්වා-න සො ලබ්භා මයා ඉති

---

සොකං, ශෝකය; අප්පජහං, නො හරණා වූ; ජන්තු, සත්ව තෙම; භීයො, බොහෝසෙයින්; දුක්ඛං, දුකට; නිගච්ඡති, පැමිණේ; කාලකතං, කාලක්‍රියාකළහු; අනුත්ථුනන්තො, අනුව ශොක කරන්නේ; සොකස්ස, ශොකයාගේ; වසං, වසභයට; අන්වගූ, පැමිණියේ වේ;

ඉධ, මේ ලෝකයෙහි; යථා කම්මූපගෙ, කම් වූ පරිද්දෙන් මිය ගියාවූ; නරෙ, මනුෂ්‍යයන් ද: මච්චුනො, මරහුගේ; වසං, වසභයට; ආගම්ම, පැමිණ; ඵන්දන්තෙව, සයින් වෙවුලන්නා වූ ම; ගමිනො; (පරලෝ) ගමනට සැදී සිටිනාවූ; අඤ්ඤෙපි, අනිකුදු; පාණිනො, ප්‍රාණීන්; පස්ස, බලව;

යෙනයෙනහි, යම් යම් ආකාරයකින් ම; මඤ්ඤන්ති, සිතත්ද; තං, එය; තතො, එයාකාරයෙන්; අඤ්ඤථා හොති, අන්පරිද්දෙකින්වේ; එතාදිසො, මෙ බඳු වූ; විනා භාවො, වෙන්වීම වන්නේය; ලොකස්ස, ලෝකයාගේ; පරියායං, මේ ස්වභාවය; පස්ස, බලව;

ඉධ, මේ ලෝකයෙහි; මානවො, මනුෂ්‍යතෙම; චෙ, ඉදින්; වස්සසතං අපි, අවුරුදු සියයක් හෝ; භීයො වා, ඊට වැඩිකල්හෝ; ජීවෙ, ජීවත් වන්නේ නමුත්; ඤාතිසංඝා, නෑසමූහයාගෙන්; විනා හොති, වෙන් වෙයි; ජීවිතං, ජීවිතය, ජහාති, හරී;

තස්මා, එහෙයින්; අරහතො, අර්හත් වූ සර්වඥයන්වහන්සේගේ; (දෙශනාව) සුත්වා, අසා; පෙතං, පරලොව ගියාවූ; කාලකතං, කලුරියකළහු; මයා මාවිසින්; න ලබ්භා ඉති, නො ලැබිය හැක්කේයයි; දිස්වා, දැක; සො, හෙතෙම; පරිදෙවිතං, හැඬීම: විනෙය්‍ය, දුරුකරන්නේයි;

18 යථා සරණමාදිත්තං-වාරිනා පරිනිබ්බයෙ
එවම්පි ධීරො සප්පඤ්ඤො-පණ්ඩිතො කුසලො නරො
ඛිප්පමුප්පතිතං සොකං-වාතො තූලංව ධංසයෙ

19 පරිදෙවං පජප්පඤ්ච-දොමනස්සඤ්ච අත්තනො
අත්තනො සුඛමෙසානො-අබ්බහෙ සල්ලමත්තනො.

20 අබ්බූළ්හසල්ලො අසිතො-සන්තිං පප්පුය්‍ය චෙතසො
සබ්බ සොකං අතික්කන්තො-අසොකො හොති නිබ්බුතොති

සල්ල සුත්තං.

---

සුත්ත නිපාතෙ.

---

සාවත්ථියං- අථඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි, තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු

---

ධීරෙ, ධෛර්‍ය්‍ය ඇත්තාවූ; සප්පඤ්ඤ, ප්‍රඥ සහිතවූ; පණ්ඩිතො, පණ්ඩිතවූ; කුසලො, දක්ෂවූ· නරො, මනුෂ්‍යතෙම; උප්පතිතං, උපන්නාවූ; සොකං, ශෝකය; ආදිත්තං, ගිනිගෙන දිලිහෙන්නාවූ; සරණං, ගෙයක්; වාරිනා, දියෙන්; යථාපරිනිබ්බයෙ, යම්සේ නිවාද; එවං, එසේ; ඛිප්පං, වහා; (නිවන්නේය) අපි, තවද; තූලං, පුලුනක්; (විසුරුවන) වාතොඉව, වාතයමෙන්; ඛිප්පං, වහාම; ධංසයෙ, (ශොකය) දුරුකරන්නේය;

අත්තනො, තමාගේ; පරිදෙවං, හැඬීම ද; පජප්පඤ්ච, තෘෂ්ණාව ද දොමනස්සඤ්ච, දෞර්මනස ද; අත්තනො, තමාගේ; සල්ලං, (හෘදයට වැදීතිබෙන හුල ද; අත්තනො, තමහට; සුඛං, සැපයක්; එසානො, සොයන තැනැත්තේ, අබ්බහෙ, උදුරන්නේය;

අබ්බූළ්හසල්ලො, කරනලද සල්ලොද්ධරණය ඇත්තේ; අසිතො. (තෘෂ්ණා දෘෂ්ටි) නිඃශ්‍රිත නොවූයේ; චෙතසො, චිත්තයාගේ; සන්තිං, ශාන්තියට; පප්පුය්‍ය, පැමිණ; සබ්බසොකං, සියලු ශොකය; අතික්කන්තො, ඉක්මවූයේ; නිබ්බුතො, (රහත්ඵලයට පැමිණීමෙන්) නිවුණේ; අසොකො හොති ඉති, ශොක රහිත වන්නේයයි; (වදාළසේක)

සල්ලසුත්තං, සල්ලසූත්‍රයයි;

---

සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි ය;

—— ෦ ——

සාවත්ථියං-පෙ-අථඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නඛසිඛායං, නියඅගෙහි; පරිත්තං, ස්වල්පවූ; පංසුං, පසක්; ආරොපෙත්වා, නංවා, භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ආමන්ත්‍රණය කළසේක; භික්ඛවෙ, මහණෙනි, තං කිං මඤ්ඤථ,

ඛො බහුතරං යොවායං මයා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො අථායං වා මහාපඨවීති. එතදෙව භන්තෙ බහුතරං යදිදං මහාපඨවි අප්පමත්තකොයං භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතො සඞ්ඛම්පි නඋපෙති උපනිධිම්පි නඋපෙති කලභාගම්පි න උපෙති මහා පඨවිං උපනිධාය භගවතා පරිත්තො නඛසිඛායං පංසු ආරොපිතොති.

එව මෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ මනුස්සෙසු පච්චාජායන්ති අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ අඤ්ඤත්‍ර මනුස්සෙහි පච්චාජායන්ති තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං අප්පමත්තා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

**නඛසිඛා සුත්තං**

---

**නිදාන වග්ග**

---

ඒ කුමක් සිතව් ද? මයා, මා විසින්; නඛසිඛායං, නියඅගෙක්හි; ආරොපිතො, නංවනලද; පරිත්තො, ස්වල්පවූ; යොච අයං පංසු, යම් මේ පසක් වේ ද; අථ, නොහොත්; අයං වා මහාපඨවී, මේ මහා පෘථිවිය පසක්වේද; (මේ දෙකොටසෙන්) කතමං නුඛො, කව රක් නම්; බහුතරං ඉති, ඉතා බොහෝ වේ දැයි; (විචාලසේක) භන්තෙ, ස්වාමින්වහන්ස! යදිදං මහාපඨවී, යම් මේ මහා පෘථිවි පසෙක්වේද; එතං එව, මෙයම, බහුතරං, ඉතා බොහෝය; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; නඛසිඛායං, නිය අගෙක්හි; ආරොපිතො, නංවනලද්දවූ; පරිත්තො, ස්වල්පවූ; අයං පංසු, මේ පස; අප්පමත්තකො, ස්වල්පමාත්‍ර වන්නේය; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; නඛසිඛායං, නිය අගෙක්හි; ආරොපිතො; නංවන ලද්දවූ;පරිත්තො, ස්වල්පවූ; පංසු, පස; මහා පඨවිං උපනිධාය, මහා පෘථිවිය සඳහා; සංඛම්පි, සොළොස් වන භාගයට ද; න උපෙති, නොපැමිණෙයි; උපනිධිම්පි, උපනිධියටද; න උපෙති, නො පැමිණෙයි; කලභාගම්පි, කලභාගයට ද; න උපෙති ඉති, නො පැමිණේයයි; (කීවාහුය)

භික්ඛවෙ, මහණෙනි; එවංඑව ඛො එපරිද්දෙන්ම; යෙ, යම් සත්වකෙනෙක්; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; පච්චාජායන්ති, නැවත උපදිත්ද; තෙ සත්තා, ඒ සත්වයෝ; අප්පකා, ස්වල්ප වන් නාහුය; අථඛො, එතෙකුදුවුවත්; යෙ, යම් සත්වකෙනෙක්; මනුස්සෙහි, මිනිසුන්කෙරෙන්; අඤ්ඤත්‍ර, (අපායආදී) අන්තන්හි; පච්චාජායන්ති, නැවත උපදිත්ද; එතෙ එව සත්තා, මේසත්වයෝම; බහුතරා, අතිශයින් බොහෝ වෙත්; භික්ඛවෙ, මහණෙනි! තස්මා

යා පන සඞ්ඝභත්තාදීසු දානානිසංස පටිසංයුත්තං නිධිකණ්ඩ සුත්තාදිඅනුමොදනං, ගෙහප්පවෙසන මඞ්ගලාදීසු මඞ්ගලසුත්තාදි අනුමොදනං, මතක භත්තාදීසු තිරොකුඩ්ඩාදි අනුමොදනාති විසෙසා අනුමොදනා උග්ගහෙතබ්බාති වුත්තා තා එවං වෙදිතබ්බා

නිධිං නිධෙති පුරිසො – ගම්භීරෙ ඔදකන්තිකෙ
අත්ථෙ කිච්චෙ සමුප්පන්නෙ – අත්ථාය මෙ භවිස්සති
රාජතො වා දුරුත්තස්ස – චොරතො පීළිතස්ස වා
ඉණස්ස වා පමොක්ඛාය – දුබ්භික්ඛෙ ආපදාසු වා
එතදත්ථාය ලොකස්මිං – නිධි නාම නිධීයති

---

එහෙයින්; ඉහ, මෙහි: අප්පමත්තා, අප්‍රමාදව; විහරිස්සාම ඉති, වාසය කරන්නෙමු යි; එවං, මෙසේ; සික්ඛිතබ්බං, හික්මිය යුතුයි; භික්ඛවෙ, මහණෙනි! එවං හි, මෙසේම; වො, තොප: සික්ඛිතබ්බං ඉති, හික්මිය යුතුයයි; (වදළසේක)

**නඛසිඛා සුත්තං, නඛසිඛා සූත්‍රයයි.**

“නිදාන වග්ග, නිදානවග්ගයෙහිය;”

සංඝභත්තාදිසු, සඟබත් ආදියෙහි; දානානිසංසපටිසංයුත්තං, දානානිශංස ප්‍රතිසංයුක්ත වූ; නිධිකණ්ඩ සුත්තාදි අනුමොදනං, නිධිකණ්ඩ සූත්‍රාදි අනුමෝදනාව ද; ගෙහප්පවෙසන මඞ්ගලාදිසු, ගෘහප්‍රවෙශන මංගල්‍යාදියෙහි; මංගලසුත්තාදි අනුමොදනං, මංගලසූත්‍රාදි අනුමොදනාවද; මතකභත්තාදිසු, මතකබත් ආදියෙහි; තිරොකුඩ්ඩාදි අනුමොදනං ඉති, තිරොකුඩ්ඩසූත්‍රාදි අනුමෝදනාව දැයි; යා පන විසෙසා අනුමොදනා, යම් අනුමෝදනා තුනක්; උග්ගහෙතබ්බා ඉති, ඉගෙන ගත යුත්තාහයි; වුත්තා, වදාරනලද් දැහු ද; තා, ඒ අනුමෝදනාවෝ, එවං මෙසේ; වෙදිතබ්බා, දත යුත්තාහු ය;

පුරිසො, පුරුෂතෙම; මෙ, මට; අත්ථෙ කිච්චෙ, අර්ථාවහ වූ කෘත්‍යයක්; සමුප්පන්නෙ, උපන් කල්හි; අත්ථාය, වැඩපිණිස; භවිස්සති, වන්නේ යයි; ඔදකන්තිකෙ, ජලය කෙළවර කොට ඇති; ගම්භීරෙ, ගැඹුරු තැනෙක්හි: නිධිං, නිධානයක්; නිධෙති, පිහිටුවන්නේය;

දුරුත්තස්ස, (සතුරන් විසින් කියනලද) නපුරු වචනයට; රාජතො වා, (දොෂාරොපනය ලැබූ මට) රජුන් කෙරෙන් ද; චොරතො, සොරුන් කෙරෙන්; පීළිතස්ස වා, පීඩිත වූවාහට ද; ඉණස්ස, ණයෙන්; පමොක්ඛාය වා, මිදෙනු පිණිස ද; දුබ්භික්ඛෙ, දුර්භික්ෂ කාලයෙහි හෝ; ආපදාසු වා, ආපදාවක් ඇති කල්හි හෝ; මෙ, මට; අත්ථාය, වැඩපිණිස; භවිස්සති ඉති, වන්නේයයි; එතං අත්ථාය, මොවුන්ගේ නිෂ්පාදනය පිණිස; ලොකස්මිං ලෝකයෙහි; නිධි නාම, නිධානය නම්, නිධීයති, පිහිටුවනුලැබේ;

තාව සුනිහිතො සන්තො - ගම්භීරෙ ඔදකන්තිකෙ
න සබ්බො සබ්බදා එව - තස්ස තං උපකප්පති

නිධි වා ඨානා චවති - සඤ්ඤා වාස්ස විමුය්හති
නාගා වා අපනාමෙන්ති - යක්ඛා වාපි හරන්ති තං

අප්පියා වාපි දායාදා - උද්ධරන්ති අපස්සතො
යදා පුඤ්ඤක්ඛයො හොති - සබ්බ මෙතං විනස්සති

යස්ස දානෙන සීලෙන - සඤ්ඤමෙන දමෙන ච
නිධී සුනිහිතො හොති ඉත්ථියා පුරිසස්ස වා

චෙතියම්හි ච සඞ්ඝෙ වා - පුග්ගලෙ අතිථීසු වා
මාතරි පිතරි වාපි - අථො ජෙට්ඨම්හි භාතරි

---

ඔදකන්තිකෙ, ජලය කෙළවර කොට ඇති; තාව ගම්භීරෙ, එ පමණ ගැඹුරු වළෙක්හී; සුනිහිතො සන්තො, මනාකොට තබන ලද්දේම වේ ද; සබ්බො, ඒ සියලු නිධානය; සබ්බදා, හැම කල්හී; තස්ස, ඕහට; එවං, එසේ; න උපකප්පති, නො පැමිණෙන්නේයි; තං, යනු නිපාත මාත්‍රයි;

නිධි වා, නිධානය හෝ; ඨානා, තුබූ තැනින්; චවති, පහ වෙයි; අස්ස, ඔහුගේ; සඤ්ඤා වා, සංඥව හෝ; විමුය්හති, මූළා වන්නේය; නාගා වා, නාගයෝ හෝ; අපනාමෙන්ති, පහකරන්නාහුය; අපි, තව ද; යක්ඛා වා, යක්ෂයෝ හෝ; තං, ඒ නිධානය; හරන්ති, පැහැරගන්නාහුය;

අප්පියා, අප්‍රිය වූ; දායාද වා අපි, දායාදසඞ්ඛ්‍යාත දූදරු ආදීහු හෝ; අපස්සතො, තමා නො දක්කදී; උද්ධරන්ති, උදුරාගන්නාහුය; යදා, යම්කලෙක්හි; පුඤ්ඤක්ඛයො හොති, පින් ක්ෂයවේද; (එකල්හි) එතං සබ්බං, මේ සියලු නිධානගත ධනය; විනස්සති විනාශ වන්නේය;

ඉත්ථියා වා, (යම්) ස්ත්‍රියක් විසින් හෝ; යස්ස පුරිසස්ස වා, යම් පුරුෂයකු විසින් හෝ: දානෙන, දීමෙන් ද; සීලෙන, සිල්රැකීමෙන් ද; සංයමෙන, ඉන්ද්‍රියසංයමයෙන් ද; දමෙන ච, කෙලෙශ දමනයෙන් ද;

චෙතියම්හි ච, චෛත්‍යයක් කෙරෙහි හෝ; සඞ්ඝෙ වා, සංඝයා කෙරෙහි හෝ; පුග්ගලෙ, පුද්ගලයකු කෙරෙහි හෝ; අතිථීසු වා, ආගන්තුකයන් කෙරෙහි හෝ; අපි, නැවත; ජෙට්ඨම්හි භාතරි, වැඩිමහලු සහෝදර සහෝදරියක් කෙරෙහි හෝ; නිධී සුනිහිතො හොති, පුණ්‍යමය නිධානය මනාකොට කරන ලද්දේ ද වේ;

එසො නිධි සුනිහිතො – අජෙය්‍යො අනුගාමිකො
පහාය ගමනීයෙසු – එතං ආදාය ගච්ඡති

අසාධාරණ මඤ්ඤෙසං – අචොරාහරණො නිධි
කයිරාථ ධීරො පුඤ්ඤානි – යො නිධි අනුගාමිකො

එස දෙව මනුස්සානං – සබ්බ කාම දදො නිධි
යං යදෙවාභි පත්ථෙන්ති – සබ්බ මෙ තෙන ලබ්භති

සුවණ්ණතා සුස්සරතා – සුසණ්ඨාන සුරූපතා
ආධිපච්ච පරිවාරා –සබ්බ මෙතෙන ලබ්භති

පදෙස රජ්ජං ඉස්සරියං – චක්කවත්ති සුඛං පියං
දෙව රජ්ජම්පි දිබ්බෙසු – සබ්බ මෙතෙන ලබ්භති

---

සුනිහිතො, මනාකොට; පිහිටුවනලද; එසො නිධි, මේ පුණ්‍ය කර්‍මනිධානය තෙම, අජෙය්‍යො, (සතුරන් විසින්) පැහැරගත නො හැක්කේය; අනුගාමිකො, තමා අනුව යන්නේය; පහායගමනීයෙසු, මරණකාලයෙහි හැරදමා යායුතු භොගයන් අතුරෙන්; එතං, මේ කුශලනිධානය; ආදාය, හැරගෙන; ගච්ඡති, යන්නේය;

අනුගාමිකො, තමා කැටුව යන්නාවූ; යො නිධි; යම් නිධාන යෙක් ඇද්ද; නිධි, ඒ පුණ්‍යමය නිධානයතෙම; අඤ්ඤෙසං, අනුන්ට; අසාධාරණං, සාධාරණ නො වන්නේය; අචොරාහර ණො, සොරුන් විසින් පැහැර ගත නො හැක්කේය; (එහෙයින්) ධීරො, පණ්ඩිතතෙම, පුඤ්ඤානි, (මේ නිධාන නම් ලද) කුශලකර්‍ම යන්; කයිරාථ, කරන්නේය;

එසො නිධි, මේ (කුශලකර්‍ම නමැති) නිධානයතෙම; දෙව මනුස්සානං, දෙවිමිනිසුන්ට; සබ්බකාමදදො, සියලු කැමැති සම්පත් දෙන්නේය; යං යං එව, යම් යම් සැපතක් ම; අභිපත්ථෙන්ති, ප්‍රාර්‍ථනා කෙරෙත් ද; තං සබ්බං, ඒ සියල්ල; එතෙන, මේ අනුග මික නිධානය හේතුකොටගෙන; ලබ්භති, ලබයි;

සුවණ්ණතා, යහපත් ශරීරවර්‍ණ ඇතිබවය; සුස්සරතා, යහපත් කටහඬ ඇතිබව ය; සුසණ්ඨාන, යහපත් සටහන් ඇතිබවය; සුරූ පතා,යහපත් ශරීර ඇතිබවය; ආධිපච්ච, අධිපතිබව හා, පරිවාරො, පිරිවරය; (යන) සබ්බං, සියල්ල, එතෙන, මේ කුසලනිධානයෙන් ලබ්භති, ලබයි;

පදෙසරජ්ජං, ප්‍රදෙශරාජ්‍යය; ඉස්සරියං, ඓශ්වර්‍ය්‍යය; [මුළුදිව සිතෙහි] රාජ්‍යයද; පියං, පියවූ; චක්කවත්තිසුඛං, සක්විතිසැපතය; අපි, යළි; දිබ්බෙසු, දෙවියන් කෙරෙහි; දෙවරජ්ජං, දිව්‍යරාජ්‍යය; (යන) සබ්බං, සියල්ල; එතෙන, මේ කුශලනිධානයෙන්; ලබ්භති, ලබයි;

මානුසිකා ච සම්පත්ති-දෙවලොකෙ ච යා රති
යා ච නිබ්බානසම්පත්ති-සබ්බමෙතෙන ලබ්භති.

මිත්තසම්පදමාගම්ම-යොනිසො වෙ පයුඤ්ජතො
විජ්ජා විමුත්ති වසීභාවො-සබ්බමෙතෙන ලබ්භති.

පටිසම්භිදා විමොක්ඛා ච-යා ච සාවකපාරමී
පච්චෙකබොධි බුද්ධභූමි-සබ්බමෙතෙන ලබ්භති.

එවං මහිද්ධිකා එසා-යදිදං පුඤ්ඤසම්පදා
තස්මා ධීරා පසංසන්ති-පණ්ඩිතා කතපුඤ්ඤතන්ති.

**නිධිකණ්ඩ සුත්තං.**

"ඛුද්දකපාඨෙ"

---

මානුසිකා, මානුසික වූ; යාච සම්පත්ති, යම් සැපතෙක් ඇද්ද; දෙවලොකෙ, දිව්‍යලොකයෙහි; යාචරති, යම් කාමරතියෙක් ඇද්ද; යාච නිබ්බාන සම්පත්ති, යම් නිර්වාණසම්පත්තියෙක් ඇද්ද; සබ්බං, ඒ සියල්ල; එතෙන, මේ කුශලකර්ම නමැති නිධානයෙන්; ලබ්භති, ලැබෙයි;

මිත්තසම්පදං ආගම්ම, කල්‍යාණ මිත්‍ර සම්පත්තියට පැමිණ; යොනිසො, නුවණින්; පයුඤ්ජතො, වීර්‍යකරන්නාහට; වෙ, එකාන්තයෙන්; විජ්ජා, (දිවඇස පෙරවිසූකඳපිළිවෙළ දැනගැන්මය ආශ්‍රවයන්ගේ නැසීමය) යන ත්‍රිවිද්‍යාවද; විමුත්ති, පංච විමුක්තියද; වසීභාවො, කෙලෙසුන් තමා වසඟකරගැනීමද; (යන) සබ්බං, සියල්ල; එතෙන, මේ කුශල කර්ම නමැති නිධානයෙන්; ලබ්භති, ලැබෙයි;

පටිසම්භිදා, අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන සංඛ්‍යාත සිව්පිළිසිඹියාවද; විමොක්ඛාච, අෂ්ටවිමෝක්ෂද; යාච සාවකපාරමී, යම් ශ්‍රාවක පාරමීඥානයක් වේනම් හෙද; පච්චෙකබොධි, ප්‍රත්‍යෙකබොධියද; බුද්ධභූමි, සර්වඥතාඥානයද; (යන) සබ්බං, සියල්ල; එතෙන, මේකුශල කර්ම නමැති නිධානයෙන්; ලබ්භති, ලැබෙයි;

යං ඉදං පුඤ්ඤසම්පදා, යම් මේ කුශලසම්පත්තියක් ඇද්ද; එසා, මේ කුශලසම්පත්තොමෝ; එවං, මේ ප්‍රකාරයෙන්; මහිද්ධිකා, මහත් ඉර්ධිඇත්තිය; තස්මා, එහෙයින්; ධීරා, ධෛර්‍ය්‍යවන්තවූ; පණ්ඩිතා, බුද්ධාදි පණ්ඩිතයෝ; කතපුඤ්ඤතං, කළපින් ඇතිබව; පසංසන්ති ඉති, ප්‍රශංසා කෙරෙත් යයි; (වදාළසේක)

නිධිකණ්ඩ සුත්තං, නිධිකණ්ඩ සූත්‍රයයි.

——•○——

ඛුද්දකපාඨෙ, ඛුද්දක පාඨයෙහි ය.

ඉදං නිධිකණ්ඩසුත්තං නාම භගවතා අනුමොදනාවසෙන වුත්තං; අයමස්ස අට්ඨුප්පත්ති:-

සාවත්ථියං කිර අඤ්ඤතරො කුටුම්බිකො අඩ්ඪො මහද්ධනො මහාභොගො සද්ධො ච හොති පසන්නො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති; සො එකදිවසං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දානං දෙති තෙන ච සමයෙන රාජා ධනත්ථිකො හොති. සො තස්ස සන්තිකෙ පුරිසං පෙසෙසි ගච්ඡ භණෙ ඉත්ථන්නාමං කුටුම්බිකං ආනෙහීති සො ගන්ත්වා තං කුටුම්බිකං ආහ රාජා තං ගහපති ආමන්තෙතීති.

කුටුම්බිකො සද්ධාදිගුණසමන්නාගතෙන චෙතසා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පරිවිසන්තො ආහ ගච්ඡ භො පුරිස පච්ඡා ආගමිස්සාමි ඉදානි තාවම්හි නිධිං නිධෙන්තො සිතොති. අථ භගවා භුත්තාවී

---

ඉදං නිධිකණ්ඩසුත්තං නාම, මේ නිධිකණ්ඩ සූත්‍රය නම්; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; අනුමොදනාවසෙන, දානානුමෝදනා වශයෙන්; වුත්තං, වදාරනලදී; අස්ස, මේ සූත්‍රදෙශනාවගේ; අයං, මේ; (මතු ප්‍රකාශවන්නී) අට්ඨුප්පත්ති, අර්ථොත්පත්තියයි.

සාවත්ථියං කිර, සැවැත්නුවර වනාහී; අඩ්ඪො, ධනයෙන් ආඪ්‍යවූ ද; මහද්ධනො, මහද් ධනඇත්තාවූ ද; සද්ධොච, ශ්‍රද්ධාවත් වූ ද; අඤ්ඤතරො කුටුම්බිකො, එක්තරා කෙළෙඹියෙක්; හොති, වෙයි; පසන්නො, ප්‍රසන්නවූයේ; විගතමලමච්ඡෙරෙන, පහවූ මසුරුමල ඇත්තා වූ; චෙතසා, සිතින් යුක්තව; අගාරං අජ්ඣාවසති, ගෘහාවාසයෙහි වාසයකෙරෙයි; සො, ඒ කෝළෙඹි තෙම; එකදිවසං, එක් දවසක්; බුඩපමුඛස්ස, බුඩප්‍රමුඛවූ; භික්ඛුසඞ්ඝස්ස, භික්‍ෂු සංඝයාට; දානං දෙති, දානයක් දෙයි; තෙන ච සමයෙන, ඒ කාලයෙහිම; රාජා, රජතෙම; ධනත්ථිකො හොති, ධනයෙන් ප්‍රයෝජන ඇත්තෙක් වූයේය; සො, ඒ රජතෙම; තස්ස සන්තිකෙ, ඔහුගේ සමීපයට; භණෙ, සගය; ගච්ඡ, යව; ඉත්ථං නාමං, අසුවල් නම ඇත්තාවූ; කුටුම්බිකං, කෙළෙඹියා; ආනෙහි ඉති, කැඳවාගෙන එවයි; පුරිසං, පුරුෂයකු; පෙසෙසි, යැව්යේය; සො, ඒ පුරුෂ තෙම; ගන්ත්වා, ගොස්; තං කුටුම්බිකං, ඒ කෙළෙඹියාට; ගහපති, ගෘහපතිය; රාජා, රජතෙම; තං, තා; ආමන්තෙති ඉති, ආමන්ත්‍රණය කෙරේයයි; ආහ, කීයේය; කුටුම්බිකො, කෙළෙඹි තෙම; සඩාදිගුණසමන්නාගතෙන චෙතසා, ශ්‍රඩාදි ගුණයන්ගෙන් යුක්තවූ සිතින්; බුඩපමුඛං, බුද්ධප්‍රමුඛවූ; භික්ඛුසංඝං, භික්‍ෂු සංඝයා; පරිවිසන්තො, වළඳවන්නේ; භො පුරිස, පින්වත් පුරුෂය; තාව, පළමුකොට;

පවාරිතො තමෙව පුඤ්ඤසම්පදං පරමත්ථතො නිධීති දස්සෙන්තො තස්ස කුටුම්බිකස්ස අනුමොදනත්ථං නිධිං නිධෙති පුරිසොති ඉමා ගාථායො අභාසි; දෙසනාවසානෙ සො උපාසකො බහුජනෙන සද්ධිං සොතාපත්තිඵලෙ පතිට්ඨාසි.

රඤ්ඤො ච පසෙනදිකොසලස්ස සන්තිකං ගන්ත්වා එතමත්ථං ආරොචෙසි. රාජා අතිවිය තුට්ඨො හුත්වා සාධු ගහපති සාධු ඛො ත්වං ගහපති මාදිසෙහිපි අහාරණීයං නිධිං නිධෙසීති සංරාධෙත්වා මහතිං පූජමකාසීති.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං– එවං චෙ භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං දාන සංවිභාගස්ස විපාකං යථාහං

---

ගච්ඡ, යව; පච්ඡා, පසුව; ආගමිස්සාමි, එන්නෙමි; ඉදානි, දැන්; නිධිං, නිධානයක්; නිධෙන්තො, නිධාන්කරමින්; සිතො අම්හි ඉති, සිටියේ වෙමියි; ආහ, කීයේය; අථ, නැවත; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භුත්තාවී පවාරිතො, වළඳා අවසන් වූයේ; තං පුඤ්ඤසම්පදං එව, ඒ පුණ්‍යසම්පත්තියම; පරමත්ථතො, පරමාර්ථ වශයෙන්; නිධීති, නිධානයයි; දස්සෙන්තො, දක්වන්නේ; තස්ස කුටුම්බිකස්ස, ඒ කෙලෙඹියාට; අනුමොදනත්ථං, අනුමෝදනා පිණිස; නිධිං නිධෙති පුරිසො ඉති, නිධිං නිධෙති පුරිසො යනාදි වූ; ඉමා ගාථායො, මේ ගාථාවන්; අභාසි, වදාළසේක; දෙසනාවසානෙ, දෙශනාවසානයෙහි; සො උපාසකො, ඒ උපාසකතෙම; බහුජනෙන සද්ධිං, බොහෝ දෙනා සමඟ; සොතාපත්ති ඵලෙ, ශ්‍රොතාපත්ති ඵලයෙහි; පතිට්ඨාසි, පිහිටියේය; පසෙනදිකොසලස්ස රඤ්ඤො ච, එනම් රජහුගේ ද; සන්තිකං, සමීපයට; ගන්ත්වා, ගොස්; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසි, සැලකෙළේය; රාජා, රජතෙම; අතිවිය, ඉතාම; තුට්ඨො හුත්වා, සතුටුව; ගහපති, ගෘහපතිය; සාධු, යහපත; ගහපති, ගෘහපතිය; ත්වං ඛො, තෝ වනාහී; මාදිසෙහි පි, මාවැනි වූ රජුන් විසිනුත්; අහාරණීයං, පැහැරගත නොහැකිවූ; නිධිං, නිධානයක්; නිධෙසි ඉති, නිධාන් කෙළේයයි; සංරාධෙත්වා, සතුටුකරවා; මහතිං, මහත්වූ; පූජං අකාසි ඉති, පූජාවක් කෙළේයි.

——oo——

භගවතා – පෙ— භික්ඛවෙ, මහණෙනි; යථා, යම් ප්‍රකාරයකින්; අහං, මම; දානසංවිභාගස්ස, (අනුකම්පා පූජා චෙතනාවන් අතුරෙන් යම් චෙතනාවකින් ආහාරාදි දෙය්‍යධර්මය පිළිවෙළ කොට අන්‍යයන්ට දීම් සඞ්ඛ්‍යාත) දානයාගේ සහ (තමාගේ පරිභොගයට ගත් දෙයින් කොටසක් බෙදාදීම් සඞ්ඛ්‍යාත) සංවිභාගයාගේ; විපාකං,

ජානාමි න අදත්වා භුඤ්ජෙය්‍යුං න ච නෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය යොපි නෙසං අස්ස චරිමො ආලොපො චරිමං කබලං තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං සචෙ නෙසං පටිග්ගාහකා අස්සු- යස්මා ච ඛො භික්ඛවෙ සත්තා න එවං ජානන්ති දාන සංවිභාගස්ස විපාකං යථාහං ජානාමි තස්මා අදත්වා භුඤ්ජන්ති මච්ඡෙරමලඤ්ච නෙසං චිත්තං පරියාදාය තිට්ඨතීති— එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති

එවං චෙ සත්තා ජානෙය්‍යුං-යථා වුත්තං මහෙසිනා
විපාකං සංවිභාගස්ස-යථා හොති මහප්ඵලං.

---

ඵලය; ජානාමි, දනිමි ද; . එවං, මෙසේ; සත්තා, (අන්‍ය) සත්වයෝ; චෙ, ඉදින්; ජානෙය්‍යුං, දන්නාහු නම්; අදත්වා, නොදී; න භුඤ්ජෙය්‍යුං, අනුභව නොකරන්නාහුය; නෙසං, ඔවුන්ගේ; චිත්තං, සිත; මච්ඡෙර මලං, මසුරු මල; පරියාදාය, හාත්පසින් මැඩගෙන; න ච තිට්ඨෙය්‍ය, නොසිටින්නේය; නෙසං පටිග්ගාහකා අස්සු, ඒ පිළිගන්නෝ වන්නාහු නම්; නෙසං, ඔවුන්ගේ; යොපි චරිමො ආලොපො අස්ස, යම් චරිමා ලොපයෙක් වන්නේ ද; චරිමං කබලං, (අා ආවුන්වදී) ඉතිරිවූ යම් ආහාර පිඩක් වේද; තතො අපි, එයිනුදු; අසංවිභජිත්වා, කොටසක් බෙදා නොදී; න භුඤ්ජෙය්‍යුං, අනුභව නොකරන්නාහු ය; සචෙ, ඉදින්; භික්ඛවෙ, මහණෙනි; යස්මා ච ඛො, යම් හෙයකින් වනාහි; සත්තා, (අන්‍ය) සත්වයෝ; දානසංවිභාගස්ස, දානසංවිභාගය සම්බන්ධි; විපාකං, ඵලය; අහං, මම; යථා ජානාමි, යම් පරිද්දකින් දනිම් ද; එවං, එපරිද්දෙන්; න ජානන්ති, නොදනිත් ද; තස්මා, එහෙයින්; අදත්වා, නොදී; භුඤ්ජන්ති, අනුභවකරත්; (එහෙයින්) මච්ඡෙරමලං ච, මසුරුමල ද; නෙසංචිත්තං, ඔවුන්ගේසිත; පරියාදාය, හාත්පසින් මැඩගෙන; තිට්ඨති ඉති, සිටී යයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අත්ථං, මේ කාරණය; අවොච, වදාළසේක; තත්ථ, එහි; එතං, මේ දෙශනාව; ඉති, මෙසේ; (ගාථාබන්ධන වශයෙන්) වුච්චති, කියනුලැබේ.

මහෙසිනා, මහර්ෂිවූ බුදුන් විසින්; යථා, යම්සේ; වුත්තං, වදාරන ලද ද (එපරිදි); සංවිභාගස්ස, දානසංවිභාගය පිළිබඳ; මහප්ඵලං විපාකං, මහත් ඵලවූ විපාකය; යථා හොති, යම්සේ වේ ද; එවං, එපරිද්දෙන්; සත්තා, අන්‍ය සත්වයෝ; චෙ, ඉදින්; ජානෙය්‍යුං, දන්නාහු නම්.

විනෙය්‍ය මච්ඡෙරමලං-විප්පසන්නෙන චෙතසා
දජ්ජා කාලෙන අරියෙසු-යත්ථ දින්නං මහප්ඵලං.
අන්නඤ්ච දත්වා බහුනො-දක්ඛිණෙය්‍යෙසු දක්ඛිණං
ඉතො චුතා මනුස්සත්තා-සග්ගං ගච්ඡන්ති දායකා.
තෙ ච සග්ගගතා තත්ථ-මොදන්ති කාමකාමිනො
විපාකං සංවිභාගස්ස-අනුභොන්ති අමච්ඡරිනි.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

චරිමාලොප සුත්තං.

"ඉතිවුත්තකෙ"

සාවත්ථියං—අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්ති යා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එක මන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

---

යත්ථ, යම් පුණ්‍යක්ෂෙත්‍රයෙක්හි; දින්නං, දෙනලද සවල්පවූ ද දානවස්තුව; මහප්ඵලං, මහත්ඵලවේ ද; අරියෙසු, (ඒ) ආර්‍ය්‍යයන්ට; මච්ඡෙරමලං, මසුරුමල; විනෙය්‍ය, පහකොට; විප්පසන්නෙන චෙතසා, විශෙෂයෙන් ප්‍රසන්නවූ සිතින් යුක්තව; කාලෙන, සුදුසු කාල යෙහි; දජ්ජා, (දන්) දෙන්නේය.

බහුනො, බොහෝවූ; දක්ඛිණෙය්‍යෙසු, දක්ෂිණාර්හයන් කෙරෙහි; දක්ඛිණං, (පරලොව අදහා දියයුතු) දක්ෂිණාව; නොහොත් බහුනො, බොහෝවූ; අන්නං ච, ආහාරපානාදිය; දත්වා, දී; ඉතො මනුස්සත්තා, මේ මනුෂ්‍යාත්ම භාවයෙන්; චුතා, චුතවූවාහු; දායකා, දායකයෝ; සග්ගං, සවර්ගයට; ගච්ඡන්ති, යෙත්.

අමච්ඡරා, නොමසුරු වූ; තෙ, ඔවුහු; සග්ගගතා, සවර්ගයට පැමිණියාහු; තත්ථ ච, එහි ද; කාම කාමිනො, කැමැති කැමැති කාමගුණයන්ගෙන් යුක්තව; මොදන්ති, සතුටුවෙත්; සංවිභාගස්ස, දානසංවිභාගය සම්බන්ධවූ; විපාකං, ඵලය; අනුභොන්ති, අනුභව කෙරෙත්.

අයම්පි—පෙ—

චරිමාලොප සුත්තං, චරිමාලොප සූත්‍රයයි.

---

"ඉතිවුත්තකෙ, ඉතිවුත්තකයෙහි ය"

සාවත්ථියං අථඛො—පෙ—

කිං දදෙ බලදෙ හොති-කිං දදෙ හොති වණ්ණදෙ
කිං දදෙ සුඛදෙ හොති-කිං දදෙ හොති චක්ඛුදෙ
යො ච සබ්බදදෙ හොති-තමෙම අක්ඛාහි පුච්ඡිතොති.

අන්නදෙ බලදෙ හොති-වත්ථදෙ හොති වණ්ණදෙ
යානදෙ සුඛදෙ හොති-දීපදෙ හොති චක්ඛුදෙ.

සො ච සබ්බදදෙ හොති-යො දදාති උපස්සයං
අමතං දදෙ ච සො හොති-යො ධම්මමනුසාසතීති.

බලදානසුත්තං-57.

සාවත්ථියං—අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

---

කිං දදෙ, කිනම් දෙයක් දෙන්නේ; බලදෙ හොති, ශක්තිය දෙන්නේ වේ ද; කිං දදෙ, කිනම් දෙයක් දෙන්නේ; වණ්ණදෙ හොති, වර්ණ සමපත් දෙන්නේවේ ද; කිං දදෙ, කිනම් දෙයක් දෙන්නේ; සුඛදෙ හොති, සැප දෙන්නේවේ ද; කිං දදෙ, කිනම් දෙයක් දෙන්නේ; චක්ඛුදෙ හොති, ඇස් දෙන්නේවේ ද; යොච, යමෙකුත්; සබ්බ දදෙ හොති, සියල්ල දෙන්නේවේ නම්: තං, එය; මෙ, මා විසින්; පුච්ඡිතො, විචාරන ලද්දේ; අක්ඛාහි, වදාලමැනව.

අන්නදෙ, ආහාරදෙන පුද්ගල තෙම; බලදෙ හොති, ශක්තිය දෙන්නේ වෙයි; වත්ථදෙ, වස්ත්‍රදානය කරන්නේ; වණ්ණදෙ හොති, ශරීරවර්ණය දෙන්නේ වෙයි: යානදෙ, ඡත්‍රොපාහණාදිය දෙන තැනැත්තේ; සුඛදෙ හොති, සැපදෙන්නේ වෙයි; දීපදෙ, ප්‍රදීප දෙන තැනැත්තේ; චක්ඛුදෙ හොති, චක්‍ෂුස දෙන්නේ වෙයි.

යො, යමෙක් තෙම; උපස්සයං, ආවාස; දදාති, දේද; සොච, හෙතෙමේම; සබ්බදදෙ හොති, (යටකී)සියල්ල දෙන්නේ වේ; යො, යමෙක් තෙම; ධම්මං අනුසාසති, ධර්මානුශාසනා කෙරේ ද; සො, හෙතෙම; අමතං දදෙ ච හොති, අමෘතය දෙන්නේත් වෙයි.

බලදාන සුත්තං, බලදාන සූත්‍රය යි.

---

සාවත්ථියං අථඛො—පෙ—

කෙසං දිවා ච රත්තො ච-සදා පුඤ්ඤං පවඩ්ඪති
ධම්මට්ඨා සීලසම්පන්නා-කෙ ජනා සග්ගගාමිනොති.
ආරාම රොපා වනරොපා-යෙ ජනා සෙතුකාරකා
පපඤ්ච උදපානඤ්ච-යෙ දදන්ති උපස්සයං.
තෙසං දිවා ච රත්තො ච-සදා පුඤ්ඤං පවඩ්ඪති
ධම්මට්ඨා සීලසම්පන්නා-තෙ ජනා සග්ගගාමිනොති.

පුඤ්ඤවඩ්ඪන සුත්තං.

"වෙ සගාථක වග්ගො"

———

සාවත්ථියං—තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච

---

දිවා ච, දවල් ද; රත්තො ච, රාත්‍රියෙහි ද; සදා, හැමකල්හි; කෙසං, කවර කෙනකුන්ට; පුඤ්ඤං, පින්; පවඩ්ඪති, වැඩේ ද; කෙ ජනා, කවර ජනකෙනෙක්; ධම්මට්ඨා, ධර්මයෙහි පිහිටියාහු; සීල සම්පන්නා, ශීලයෙන් සමන්විතවූවාහු; (නොහොත් සමෘද්ධ ශීල ඇත්තාහු) සග්ගගාමිනො, ස්වර්ග ගාමීහු වෙත් ද.

යෙ ජනා, යම් ජනයෝ; ආරාමරොපා, පුෂ්පාරාම ඵලාරාම යන් රොපනය කරවා දෙන්නෝ වෙද්ද; වනරොපා, ස්වයං ජාත වන යෙහි චෛත්‍යාදිය කරවන්නාහු වෙත් ද; යෙ, යමෙක් තුමූ; සෙතු කාරකා, (විෂම ස්ථානයන්හි) ඒදඬු පාලම් කරන්නෝ වෙද් ද: යෙ, යමෙක්තුමූ පපං ච, පැන්හල් ද: උදපානං ච, ළිං පොකුණු තළාක ද; උපස්සයං, ආවාස සෙනසුන්ද; දදන්ති, (කරවා) දෙද්ද.

තෙසං, ඔවුන්ට; දිවා ච, දවල් ද: රත්තො ච, රාත්‍රියෙහි දැයි; සදා, හැමකල්හි; පුඤ්ඤං, පින්; පවඩ්ඪති, ප්‍රකාරයෙන් වැඩේ; තෙ ජනා, ඒ ජනයෝ; ධම්මට්ඨා, (ඒ ධර්මයෙහි පිහිටි හෙයින්) ධර්මස්ථවූවාහූ; සීලසම්පන්නා, (ඒ ශීලයෙහි පිහිටි හෙයින්) ශීල සමන්විත වූවාහූ; සග්ග ගාමිනො, (එහෙයින් ම) ස්වර්ගයට යන්නෝ වෙත්.

පුඤ්ඤවඩ්ඪන සුත්තං, පුඤ්ඤවඩ්ඪන සූත්‍රය යි.

——oo——

වෙ සගාථක වග්ගො, මේ සූත්‍රදෙක (සංයුත්සඟියෙහි) සගාථක වර්ගයෙහි ය.

සාවත්ථියං-තත්‍රඛො —පෙ— භික්ඛවෙ, මහණෙනි; දායකො, දායකතෙම; භොජනං, ආහාරය; දදමානො, දෙන්නේ; පටිග්ගාහකානං, ප්‍රතිග්‍රාහකයන්ට; පඤ්චඨානානි, (හිත සැප කරන්නාවූ

භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං පඤ්ච ඨානානි දෙති කතමානි පඤ්ච ආයුං දෙති වණ්ණං දෙති සුඛං දෙති බලං දෙති පටිභානං දෙති.

ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා, වණ්ණං දත්වා වණ්ණස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා, සුඛං දත්වා සුඛස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා බලං දත්වා බලස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා, පටිභාණං දත්වා පටිභාණස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං ඉමානි පඤ්චට්ඨානානි දෙතීති ඉදමවොච භගවා; ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:—

ආයුදො බලදො ධීරො–වණ්ණදො පටිභානදො
සුඛස්ස දාතා මෙධාවී–සුඛං සො අධිගච්ඡති.

---

ආයුෂ ආදි) කරුණු පසක් දෙති, දෙයි; කතමානි පඤ්ච? කවර පසක් ද යත්?; ආයුං දෙති, ආයුෂය දෙයි; වණ්ණං දෙති, (ශරීර) වර්ණය දෙයි; සුඛං දෙති, (කායික චෛතසික) සැපය දෙයි; බලං දෙති, ශරීර ශක්තිය දෙයි; පටිභානං දෙති, නුවණ දෙයි;

ආයුං ඛො පන, ආයුෂය වනාහී; දත්වා, දී; දිබ්බස්ස වා, දිව්‍ය මයවූ හෝ; මානුසස්ස වා, මනුෂ්‍යමය වූ හෝ; ආයුස්ස, ආයුෂයට; භාගීහොති, (ඒකාන්තයෙන්) හිමිවෙයි; වණ්ණං, (ශරීර) වර්ණය; දත්වා, දී; දිබ්බස්ස වා මානුසස්ස වා—පෙ—වණ්ණස්ස, (ශරීර) වර්ණයට; භාගීහොති, (ඒකාන්තයෙන්) හිමිවෙයි; සුඛං, (කායික චෛතසික) සැපය; දත්වා, දී; දිබ්බස්ස වා මානුසස්ස වා —පෙ— සුඛස්ස, කායික චෛතසික සැපයට; භාගීහොති, හිමිවෙයි; බලං, ශරීර බලය; දත්වා, දී; දිබ්බස්ස වා මානුසස්ස වා —පෙ— බලස්ස, ශරීර බලයට; භාගීහොති, (ඒකාන්තයෙන්) හිමිවෙයි; පටිභානං, නුවණ; දත්වා, දී; දිබ්බස්ස වා මානුසස්ස වා —පෙ— පටිභානස්ස, නුවණ ලැබීමට; භාගීහොති, (ඒකාන්තයෙන්) හිමිවෙයි; භික්ඛවෙ, මහණෙනි; දායකො, දායක තෙම; භොජනං, ආහාරය; දදමානො, දෙන්නේ; පටිග්ගාහකානං, ප්‍රතිග්‍රාහකයන්ට; ඉමානි පඤ්ච ඨානානි, මේ අනුසස් කරුණු පස; දෙති ඉති, දේයයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ (සූත්‍රදෙශනාව) අවොච, වදාළසේක; සුගතො—පෙ—

ආයුදො, ආයුෂ දෙන්නාවූ ද; බලදො, බලය දෙන්නාවූ ද; වණ්ණදො, ශරීරවර්ණය දෙන්නාවූ ද; පටිභානදො, ප්‍රඥාව දෙන්නාවූ ද; සුඛස්සදාතා, සැප දෙන්නාවූ ද; මෙධාවී, නුවණැත්තා වූ; සො ධීරො, ඒ පණ්ඩිත තෙම; සුඛං, සැපය; අධිගච්ඡති, ලැබගනියි;

ආයුං දත්වා බලං වණ්ණං–සුඛඤ්ච පටිභාණකං
දීඝායු යසවා හොති–යත්ථ යත්ථූපපජ්ජතීති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

පඤ්චඨානදානසුත්තං.

“පඤ්චකඞ්ගුත්තරෙ”

---

බාරාණසියං–අථඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පහූතාය යාගුයා ච මධුගොළකෙන ච සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං ධොතහත්ථං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො තං බ්‍රාහ්මණං භගවා එතදවොච දස ඉමෙ බ්‍රාහ්මණ ආනිසංසා යාගුයා යාගුං දෙන්තො ආයුං දෙති වණ්ණං දෙති සුඛං දෙති බලං දෙති පටිභාණං දෙති, යාගු

---

ආයුං, ආයුෂ ද; බලං, (ශරීර) බලය ද; වණ්ණං, (ශරීර) වර්ණය ද; සුඛං ච, (කායික චෛතසික වූ) සැපය ද; පටිභාණකං, නුවණ ද; දත්වා, දී; යත්ථ යත්ථ, යම් යම් තැනෙක්හි; උපපජ්ජති, උපදී ද (ඒ ඒ තන්හි); දීඝායු යසවා හොති, දීර්ඝායුෂ හා යශස් ඇත්තේ වෙයි; භගවා —පෙ—

පඤ්චඨාන දාන සුත්තං, පඤ්චඨාන දාන සූත්‍රයයි;

——:o:——

“පඤ්චකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර සඟියෙහි පස්වන නිපාතයෙහිය;”

——:o:——

බාරාණසියං, බරණැස් නුවරෙහිදීය; අථඛො, ඉක්බිති; අඤ්ඤතරො බ්‍රාහ්මණො, එක්තරා බ්‍රාහ්මණයෙක් තෙම; බුද්ධපමුඛං, බුද්ධප්‍රමුඛ වූ; භික්ඛු සඞ්ඝං, භික්ෂු සංඝයා; පහූතාය, බොහෝ වූ; යාගුයා ච, හුළුකැඳින් ද; මධුගොළකෙන ච; මීපිඩුයෙන් ද; සහත්ථා, ස්වහස්තයෙන්; සන්තප්පෙත්වා, සන්තර්පණයකොට; සම්පවාරෙත්වා, පෙරළත්තකොට වළඳවා; ධොතහත්ථං, සෝදනලද අත්ඇත්තා වූ; ඔනීත පත්තපාණිං, පාත්‍රයෙන් ඉවත් කරනලද අත් ඇති; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහි; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නං ඛො, හුන්නාවූ ම; තං බ්‍රාහ්මණං, ඒ බ්‍රාහ්මණයාහට; භගවා, භාග්‍ය වතුන්වහන්සේ; එතං, මේ (වක්ෂ්‍යමාණ සූත්‍රදෙශනාව) අවොච, වදාළසේක;

බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; යාගුයා, හුළුකැන්දීමෙහි; ඉමෙ දස ආනිසංසා, මේ ආනිශංස දසයක් වෙත්; යාගුං දෙන්තො, හුළුකැන්

පීතා ඛුද්දං පටිහනති පිපාසං විනොදෙති වාතං අනුලොමෙති වත්ථිං සොධෙති ආමාවසෙසං පාචෙති ඉමෙ ඛො බ්‍රාහ්මණ දසානිසංසා යාගුයාති.

යො සඤ්ඤතානං පරදත්තභොජිනං
කාලෙන සක්කච්ච දදාති යාගුං
දසස්ස ඨානානි අනුප්පවෙච්ඡති
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච.

පටිභාණමස්ස උපජායතෙ තතො
ඛුද්දං පිපාසං ව්‍යපනෙති වාතං
සොධෙති වත්ථිං පරිණාමෙති භුත්තං
භෙසජ්ජ මෙතං සුගතෙන වණ්ණිතං.

---

දෙන්නේ; ආයුං දෙති, ආයුෂය දෙයි; වණ්ණං දෙති, (ශරීර) වර්ණය දෙයි; සුඛං දෙති, (ශරීර) සැපය දෙයි; බලං දෙති, (ශරීර) බලය දෙයි; පටිභාණං දෙති, නුවණ දෙයි; යාගු පීතා, පානයකළ හුළු කැන; ඛුද්දං, ක්‍ෂුධාව; පටිහනති, නසයි; පිපාසං, පිපාසය; විනොදෙති, දුරුකෙරෙයි; වාතං, වාතය; අනුලොමෙති, අනුලොම් කෙරෙයි; වත්ථිං වස්තිකොෂය; සොධෙති, ශුඩකෙරෙයි; ආමාවසෙසං, ආමාවසෙසය; පාචෙති, පැසවයි; බ්‍රාහ්මණ, බමුණ; යාගුයා, හුළුකැනෙහි; ඉමෙ ඛො දස ආනිසංසා ඉති, මේ ආනෘශංස දශය වෙත් යයි; (වදාළසේක)

සඤ්ඤතානං, කායාදි සංයම සහිත වූ; පරදත්තභොජිනං, අන්‍යයන් විසින් දෙනලද බොජුන් වැළඳීම ප්‍රකෘතිකවූවන් ට; යො, යමෙක්තෙම; කාලෙන, සුදුසු කාලයෙහි; සක්කච්ච, සකස් කොට; යාගුං, කැඳ; දදාති, දේද; (ඒ දායක තෙම) අස්ස, ඒ ප්‍රතිග්‍රාහකයාහට; දස ඨානානි, කරුණුදසයක්; අනුප්පවෙච්ඡති, අනුප්‍රදානයකෙරේ; (ඔහු කවරහු ද?) ආයුං ච, ආයුෂය ද; වණ්ණං ච, (ශරීර) වර්ණය ද; සුඛං, (කායික චෛතසික) සැපය ද; බලං ච, (ශරීර) බලය ද;

පටිභාණං, නුවණද; අස්ස, ඔහට; උපජායතෙ, උපදී; තතො, ඒ හුළුකැතින්; ඛුද්දං, ක්‍ෂුධාව ද; පිපාසං, පිපාසාව ද; වාතං, වාතය ද; ව්‍යපනෙති, පහකෙරෙයි; වත්ථිං, වස්තිය; සොධෙති, ශුඩකෙරෙයි; භුත්තං, අනුභවකරනලද ආහාරය; පරිනාමෙති, පැසවීම කෙරෙයි; එතං භෙසජ්ජං, මේ බෙහෙත; සුගතෙන, සර්වඥයන්වහන්සේ විසින්; වණ්ණිතං, වර්ණනා කරන ලද්දේ ය;

තස්මා හි යාගුං අලමෙව දාතුං
නිච්චං මනුස්සෙන සුඛත්ථිකෙන
දිබ්බානි වා පත්ථයතා සුඛානි
මනුස්සසොභග්‍යතමිච්ඡතා වාති.

ඉමාහි ගාථාහි භගවා බ්‍රාහ්මණං අනුමොදි.

**යාගුදානානුමොදනාසුත්තං.**

---

අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නෙ ඛො සුනිධවස්සකාරෙ මගධමහාමත්තෙ භගවා ඉමාහි ගාථාහි අනුමොදි.

යස්මිං පදෙසෙ කප්පෙති–වාසං පණ්ඩිතජාතිකො
සීලවන්තෙත්ථ භොජෙත්වා–සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො.

---

තස්මා හි, එහෙයින්; මනුස්ස සොභග්‍යතං, මනුෂ්‍ය ශුභගභාවය; ඉච්ඡතා වා, කැමැතිවන්නාවූ හෝ; දිබ්බානි සුඛානි, දිව්‍යමය සැප; පත්ථයතා වා, පතන්නාවූ හෝ; සුඛත්ථිකෙන, සුවකැමැති වූ; මනුස්සෙන, මනුෂ්‍යයා විසින්; නිච්චං, නිරන්තරයෙන්; යාගුං, කැඳ; දාතුං, දෙන්ට; අලං එව, සුදුසු ම ය;

භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉමාහි ගාථාහි, මේ ගාථාවලින්; බ්‍රාහ්මණං, බ්‍රාහ්මණයාට; අනුමොදි, අනුමෝදනා කළසේක;

**යාගුදානානුමොදනා සුත්තං, යාගුදානානුමෝදනා සූත්‍රයයි;**

—— 101 ——

අථ ඛො, ඉක්බිති; සුනිධ වස්සකාරා මගධ මහාමත්තා, සුනිධය වස්සකාරය යන මගධ මහාමාත්‍යයෝ දෙදෙන; බුද්ධපමුඛං, බුදුන් ප්‍රමුඛකොට ඇති; භික්ඛු සඞ්ඝං, භික්ෂු සංඝයා; පණීතෙන, ප්‍රණීත වූ; ඛාදනීයෙන, කැයුතුදෙයින් ද; භොජනීයෙන, බුදියයුතුදෙයින් ද; සහත්ථා —පෙ— නිසින්නෙ ඛො, හුන්නාම වූ; සුනිධවස්සකාරෙ මගධ මහාමත්තෙ, සුනිධය වස්සකාරය යන මගධ මහාමාත්‍යයන් දෙදෙනා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉමාහි ගාථාහි, මේ ගාථා ත්‍රයෙන්; අනුමොදි, (භුක්තානු මෝදනා වශයෙන්) අනුමෝදන් කළසේක;

පණ්ඩිත ජාතිකො, පණ්ඩිත ස්වභාව ඇත්තා වූ සත්වතෙම; යස්මිං පදෙසෙ, යම් ප්‍රදෙශයෙක්හි; වාසං කප්පෙති, වාසය කෙරේ ද; එත්ථ, මෙතැන්හි, (නොහොත්) ඒ ප්‍රඥවත් පුද්ගල

යා තත්ථ දෙවතා ආසුං-තාසං දක්ඛිණමාදිසෙ
තා පූජිතා පූජයන්ති-මානිතා මානයන්ති ච.
තතො නං අනුකම්පන්ති-මාතා පුත්තංව ඔරසං
දෙවතානුකම්පිතො පොසො-සදා භද්‍රානි පස්සතීති.

**වස්සකාරානුමොදනාසුත්තං.**

---

තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛොපන සමයෙන භගවතා භික්ඛූනං සෙනාසනං අපඤ්ඤත්තං හොති. තෙ ච භික්ඛූ තහං තහං විහරන්ති අරඤ්ඤෙ රුක්ඛමූලෙ පබ්බතෙ කන්දරායං ගිරිගුහායං සුසානෙ වනපත්තෙ අබ්භොකාසෙ පලාලපුඤ්ජෙ, තෙ කාල

---

යන්ගේ වාසභවනයෙහිදී; සඤ්ඤතෙ, සංහුන් ඉඳුරන් ඇත්තා වූ; බ්‍රහ්මචාරයො, බ්‍රහ්මචාරී වූ; සීලවන්තෙ, සිල්වතුන්වහන්සේලා; (වඩාහිඳුවා) භොජෙත්වා, ආහාරාදිය වළඳවා;

තත්‍ථ, එතැන්හි: (හෙවත්) තමාගේ වාසභවනාදියෙහි; යා දෙවතා, යම් දෙවතා කෙනෙක්; ආසුං, වූවාහුද; තාසං, ඒ (ගෘහාධිගෘහිත) දෙවතාවන්ට: දක්ඛිණං, දක්ෂිණා ඵලය (පින); ආදිසෙ, පමුණුවන්නේය; (පින් දෙන්නේය) පූජිතා, පුදනු ලැබූ; තා, ඒ දෙවතාවෝ; පූජයන්ති, (ඔවුන්) පුදත්; මානිතා, (කාලානුකාල වශයෙන් බලිකර්මයයි කියතලද දෙවපූජාකරණයෙන්) මානිත දෙවතාවෝ; නං, ඔවුන්; මානයන්ති, බුහුමන් කෙරෙත්;

මාතා, මෑණිතොමෝ; ඔරසං පුත්තං ඉව, (තමාගේ) ඖරස පුත්‍රයාට මෙන්; තතො, ඒ පින් අනුමෝදන්වීමෙන්; නං, ඒ පින් දුන් සත්ත්වයාට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; දෙවතානුකම්පිතො, (මෙසේ, දෙවියන් විසින් අනුකම්පා කරනුලැබූ; පොසො, පුරුෂතෙම; සදා, හැම කල්හි ම; භද්‍රානි, යහපතක්; පස්සති ඉති, දක්නේයයි වදාළසේක;

**වස්සකාරානු මොදනා සුත්තං, වස්සකාරානු මෝදනා සූත්‍රයයි;**

——— ෧෦෧ ———

තෙන ඛො පන සමයෙන, ඒ කාලයෙහිවනාහි; භගවා, භාග්‍යවත්වූ; බුද්ධො බුදුරජතෙම; රාජගහෙ, රජගහනුවර සමීපයෙහි වූ; කලන්දක නිවාපෙ, කලන්දක නිවාප නම් වූ; වෙළුවනෙ, වෙළුවනාරාමයෙහි; විහරති, වැඩවාසයකරනසේක;

සෙව තතො තතො නික්ඛමන්ති පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛූ ඉරියාපථසම්පන්නා.

තෙන ඛො පන සමයෙන රාජගහිකො සෙට්ඨි කාලසෙසව උය්‍යානං ගන්ත්වා තෙ භික්ඛූ දිස්වා පසීදිත්වා තෙ භික්ඛූ උපසඞ්කමිත්වා එතදවොච සචාහං භන්තෙ විහාරෙ කාරාපෙය්‍යං වසෙය්‍යාථ මෙ විහාරෙසූති නඛො ගහපති භගවතා විහාරා අනුඤ්ඤාතාති තෙනහි භන්තෙ භගවන්තං පටිපුච්ඡිත්වා මම ආරොචෙය්‍යාථාති.

---

තෙන ඛො පන සමයෙන, ඒ සමයෙහි වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; භික්ඛූනං, භික්ෂූන්ට; සෙනාසනං, සෙනසුන්; අප්පඤ්ඤත්තං හොති, නො අනුදන්නාලද්දේ වෙයි; තෙ ච භික්ඛූ, ඒ භික්ෂූහු ද; අරඤ්ඤෙ, ආරණ්‍යයෙහි ද; රුක්ඛමූලෙ, වෘක්ෂමූලයෙහි ද; පබ්බතෙ, පර්වතයෙහි ද; කන්දරෙ, කඳුරැළියෙහි ද; ගිරිගුහායං, පර්වතගුහාවෙහි ද; සුසානෙ, සොහොනෙහි ද; වනපත්ථෙ, වනප්‍රාන්තයෙහි ද; අබ්භොකාසෙ, අභ්‍යවකාශයෙහි ද; පලාලපුඤ්ජෙ, පිදුරුගොඩෙහි ද; (යත) තහං තහං, ඒ ඒ තැන්හි; විහරන්ති, වාසය කෙරෙත්; පාසාදිකෙන, පැහැදුම් එළවන්නාවූ; අභික්කන්තෙන, ඉදිරිගමනින්ද; පටික්කන්තෙන, ආපසු ගමනින්ද; ආලොකිතෙන, ඉදිරිබැලීමෙන්ද; විලොකිතෙන, ආපසු බැලීමෙන්ද; සම්මිඤ්ජිතෙන, අත්පා හැකිළීමෙන්ද; පසාරිතෙන, දිගුකිරීමෙන් ද යුක්තවූ; තෙ, උන්වහන්සේලා; ඔක්ඛිත්තචක්ඛූ, යටබලා හෙළනලද ඇස්ඇත්තාහු; ඉරියාපථසම්පන්නා, ඊර්‍ය්‍යාපථයන්ගෙන් යුක්තවූවාහු; කාලස්සෙව, කල්ඇතුව ම, තතො තතො, ඒ ඒ තැනින්; නික්ඛමන්ති, නික්මෙත්;

තෙන ඛො පන සමයෙන, ඒ සමයෙහි වනාහි; රාජගහිකො සෙට්ඨි, රජගහනුවරසිටුතෙම; කාලසෙසව, කල්ඇතුවම; උය්‍යානං, උයනට; ගන්ත්වා, ගොස්; තෙ භික්ඛූ, ඒ භික්ෂූන්; දිස්වා, දැක; පසීදිත්වා, පැහැද; තෙ භික්ඛූ, ඒ භික්ෂූන් කරා; උපසඞ්කමිත්වා, එළඹ, එතං, මේ කාරණය; අවොච, කියේය; සචෙ, ඉදින්; භන්තෙ; ස්වාමීනි; අහං, මම්; විහාරෙ, විහාරයන්; කාරාපෙය්‍යං, කරවන්නෙම්නම්; මෙ, මාගේ; විහාරෙසු, විහාරයන්හි; වසෙය්‍යාථ ඉති. වාසයකරන්නාහු දැයි; (විචාළේය;) ගහපති, ගෘහපතිය; භගවතා භාග්‍යවතුන් වහන්සේ විසින්; විහාරා, විහාරයෝ; නඛොඅනුඤ්ඤාතා ඉති, නොම අනුදන වදළාහුයයි; (කිවාහුය) භන්තෙ, ස්වාමීනි; තෙන හි, එසේවීනම්; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; පටිපුච්ඡිත්වා, විචාරා; මම, මට; ආරොචෙය්‍යාථ ඉති, දන්වනුමැනවැයි; )කීයේය).

අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං භගවා අනුජානාමි භික්ඛවෙ පඤ්ච ලෙණානි: විහාරං අඩ්ඪයොගං පාසාදං හම්මියං ගුහන්ති. අථඛො තෙ භික්ඛූ රාජගහිකං සෙට්ඨිං එතද වොචුං අනුඤ්ඤාතා ඛො ගහපති භගවතා විහාරා යස්සදානි කාලං මඤ්ඤසීති.

අථඛො රාජගහිකො සෙට්ඨි එකාහෙනෙව සට්ඨි විහාරෙ පරියොසාපෙත්වා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං නිමන්තෙත්වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා තෙ සට්ඨිවිහාරෙ ආගතානාගතස්ස චාතුද්දිසස්ස (සඞ්ඝස්ස) පතිට්ඨාපෙසි අථඛො රාජගහිකං සෙට්ඨිං භගවා ඉමාහි ගාථාහි අනුමොදි

සීතං උණ්හං පටිහන්ති-තතො වාළමිගානි ච
සිරිංසපෙ ච මකසෙ-සිසිරෙ චාපි වුට්ඨියො.

---

අථඛො, ඉක්බිති; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; එතං අත්ථං, මේ කාරණය; ආරොචෙසුං, සැලකළාහුය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවෙ, මහණෙනි; විහාරං අඩ්ඪයොගාදියෙන් මිදුනාවූ අවශෙෂ ආවාසය ද; අඩ්ඪයොගං ගරුඩපක්ෂාකාර සෙවෙනි ඇතිගෙය ද; පාසාදං, (සිවුරැස්ගෙය) දීඝප්‍රාසාදයද; හම්මියං, සඳලුසහිතගෙයද; ගුහං, ගල්ලෙන්ද; (යන) පංචලෙනානි, වාසස්ථානපසක්; අනුජානාමි ඉති, අනුදනිමියි (වදාළසේක.) අථඛො, ඉක්බිති, තෙ භික්ඛූ; ඒ භික්ෂූහු; රාජගහිකං සෙට්ඨිං, රජගහනුවර සිටුහට; එතං, මේ කාරණය; අවොචුං, කීවාහුය; ගහපති, ගෘහපතිය; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; විහාරා, විහාරයෝ; අනුඤ්ඤාතා ඛො; අනුදන්නාලද්දාහුමය; යස්ස, යමකට; මඤ්ඤසි, සහතෙහි ද; (ඊට) ඉදානි, දැන්; කාලං ඉති, (සුදුසු) කාලයයි; (කියායි.)

අථඛො, ඉක්බිති; රාජගහිකොසෙට්ඨි, රජගහනුවර සිටුතෙම; එකාහෙනෙව, එකදවසෙන්ම; සට්ඨිවිහාරෙ, විහාරසැටක්; පරියොසාපෙත්වා (කරවා) අවසන්කොට; බුද්ධපමුඛං, —පෙ— තෙ සට්ඨිවිහාරෙ, ඒ විහාරසැට; ආගතානාගතස්ස, ආවාවූ ද නාවාවූ ද; චාතුද්දිසස්ස, සතරදිග වසන; සංඝස්ස,සංඝයාට; පතිට්ඨාපෙසි, පිහිටුවූයේය; අථඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉමාහි ගාථාහි, මේ ගාථාවලින්; රාජගහිකං සෙට්ඨිං, රජගෘහික සිටුහු; අනුමොදි, අනුමොදනා කළසේක;

සීතං, සීතයෙන් වන පීඩා ද; උණ්හං, උෂ්ණයෙන් වන පීඩා ද; තතො, නැවත; වාළමිගානි ච, ව්‍යාලමෘගයන්ගෙන් වන පීඩා ද; සිරිංසපෙ ච,(නයිපොළොංආදි)දීඝජාතීන්ගෙන් වන පීඩාද;

තතො වාතාතපෙ ඝොරෙ-සඤ්ජාතෙ පටිහඤ්ඤති
ලෙනත්ථඤ්ච සුඛත්ථඤ්ච-ඣායිතුඤ්ච විපස්සිතුං.
විහාරදානං සඞ්ඝස්ස-අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මා හි පණ්ඩිතො පොසො-සම්පස්සං අත්ථමත්තනො.
විහාරෙ කාරයෙ රම්මෙ-වාසයෙත්ථ බහුස්සුතෙ
තෙසං අන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානි ච
දදෙය්‍ය උජුභූතෙසු-විප්පසන්නෙන චෙතසා.
තෙ තස්ස ධම්මං දෙසෙන්ති-සබ්බදුක්ඛාපනූදනං
යං සො ධම්මං ඉධඤ්ඤාය-පරිනිබ්බාති අනාසවොති.

විහාරදානානුමොදනාසුත්තං.
“තිණ්බඛකෙ.”

---

මකසෙ, මදුරුවන්ගෙන් වන පීඩා ද; සිසිරෙ, පින්නෙන් වන පීඩා ද; නොහොත් පොදවැස්සෙන් වන පීඩා ද; වුට්ඨියො, ඉදිව වස්නා වැස්සෙන් වන පීඩා ද; පටිහන්ති, නසයි;

තතො, නැවත; සඤ්ජාතෙ, හටගත්තාවූ; ඝොරෙ, ඝොරවූ; වාතාතපෙ, අව්සුළං ද; පටිහඤ්ඤති, නසයි; ලෙනත්ථං ච, ලීණස්ථානය පිණිස ද; සුඛත්ථඤ්ච, සැපවිහරණය පිණිස ද; ඣායිතුං ච, ධ්‍යාන වැඩීම පිණිස ද; විපස්සිතුං, විදර්ශනාවැඩීම පිණිස ද; (සෙනසුන සුදුසු වන්නේය);

සංඝස්ස, සංඝයාට; විහාරදානං, විහාරපූජාකිරීම; අග්ගං, උතුම් යයි; බුද්ධෙන, සර්වඥයන්වහන්සේ විසින්; වණ්ණිතං, වර්ණනාකරන ලද්දේය; තස්මා හි, එහෙයින්; පණ්ඩිතො පොසො, ප්‍රාඥපුරුෂ තෙම; අත්තනො අත්ථං, ආත්මාර්ථය; සම්පස්සං, මනාව බලන්නේ; රම්මෙ, රම්‍යවූ; විහාරෙ, විහාරයන්; කාරයෙ, කරවන්නේය; එත්ථ, මේ විහාරයන්හි; බහුස්සුතෙ, බහුශ්‍රැතභික්ෂූන්; වාසයෙ, වාසය කරවන්නේය;

උජුභූතෙසු, ඍජුප්‍රතිපන්නවූ; තෙසං, ඒ භික්ෂූන්ට; විප්පසන්නෙන, විශෙෂයෙන් ප්‍රසන්න වූ; චෙතසා, සිතින්; අන්නං ච, ආහාර ද; පානං ච, පියයුතුදේ ද; වත්ථසෙනාසනානි ච, වස්ත්‍රසෙනාසනයන් ද; දදෙය්‍ය, දෙන්නේය;

ඉධ, මෙලෙව්හි; යො, යමෙක්තෙම; යං ධම්මං, යම් ධර්මයක්; අඤ්ඤාය, දැන; අනාසවො, ආශ්‍රව රහිතවූයේ; පරිනිබ්බාති, පිරිනිවේ ද; සබ්බදුක්ඛාපනූදනං, සියලු දුක් දුරැකරන්නාවූ; ධම්මං, ඒ ධර්මය; තස්ස, ඔහට; තෙ, ඒ භික්ෂූහු; දෙසෙන්ති, දෙසත්;

විහාරදානානුමොදනා සුත්තං, විහාරදානානුමොදනා සූත්‍රයයි;

භගවා කිර පවත්තිතවරධම්මචක්කො උරුවෙලං ගන්ත්වා උරුවෙලකස්සපාදයො සහස්සජටිලපරිවාරෙ තෙභාතිකජටිලෙ දමෙත්වා එහිභික්ඛුභාවාය පබ්බාජෙත්වා ගයාසීසෙ නිසීදාපෙත්වා ආදිත්තපරියායෙන අරහත්තෙ පතිට්ඨාපෙත්වා තෙන අරහන්තසහස්සෙන පරිවුතො බිම්බිසාරරඤ්ඤො පටිඤ්ඤං මොචෙස්සාමීති රාජගහනගරූපචාරෙ ලට්ඨිවනුය්‍යානං නාම අගමාසි. රාජා බිම්බිසාරො සත්ථා ආගතොති සුත්වා ද්වාදසනහුතෙහි බ්‍රාහ්මණ ගහපතිකෙහි පරිවුතො භගවන්තං උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා එකමන්තං නිසීදි, භගවා තස්මිං සමාගමෙ මහානාරදකස්සපජාතකං කථෙසි, තං සුත්වා රාජාබිම්බිසාරො එකාදසනහුතෙහි සද්ධිං සොතාපත්තිඵලෙ පතිට්ඨාසි, එකනහුතං උපාසකත්තං පවෙදෙසි. රාජා ස්වාතනාය භගවන්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙන නිමන්තෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි, පුනදිවසෙ භගවා භික්ඛුසහස්සපරිවුතො රාජගහං පාවිසි.

---

“තිණි, ඛන්ධකෙ, (මේ සූත්‍ර) තුන (මහවග්ග භෙසජ්ජ) ඛන්ධකයෙහිය,”

භගවා කිර, භාග්‍යවතුන් වහන්සේ වනාහි; පවත්තිතවරධම්මචක්කො, පවත්වනලද උතුම් දම්සක් ඇත්තේ; උරුවෙලං, උරුවෙල් දනව්වට; ගන්ත්වා, ගොස්; උරුවෙලකස්සපාදයො, උරුවෙල් කසුප් ආදිවූ; සහස්සජටිලපරිවාරෙ, දහසක්දූඑල්ලන් පිරිවර කොට ඇති; තෙභාතික ජටිලෙ, තුන්බෑදූඑල්ලන්; දමෙත්වා, දමනයකොට; එහි භික්ඛුභාවතො, ඒහිභික්ෂුභාවයෙන්; පබ්බාජෙත්වා, පැවිදිකරවා; ගයාසීසෙ, ගයාශීර්ෂයෙහි; නිසීදාපෙත්වා, හිඳුවා; ආදිත්තපරියායෙන, ආදිත්තපරියාය සූත්‍රදෙශනාවෙන්; අරහත්තෙ, අර්හත්වයෙහි; පතිට්ඨාපෙත්වා, පිහිටුවා; තෙන අරහන්ත සහස්සෙන, ඒ රහතුන් දහසවිසින්; පරිවුතො, පිරිවරන ලද්දේ; බිම්බිසාරරඤ්ඤො, බිම්සරරජහුගේ; පටිඤ්ඤං ප්‍රතිඥාව; මොචෙස්සාමීති, මුදන්නෙමියි; රාජගහනගරූපචාරෙ, රජගහ නුවරට සමීපයෙහිවූ; ලට්ඨිවනංනාම, ලට්ඨි (වැල්මී) වනනම්වූ; උය්‍යානං, උයනට; අගමාසි, වැඩිසේක; බිම්බිසාරොරාජා, බිම්සර රජතෙම; සත්ථා, ශාස්තෘන්වහන්සේ; ආගතො ඉති, වැඩියේයයි; සුත්වා, අසා; ද්වාදස නහුතෙහි බ්‍රාහ්මණ ගහපතිකෙහි, දොළොස් නහුතයක් බමුණුගෑහැවියන්විසින්; පරිවුතො, පිරිවරනලද්දේ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ කරා; උපසංකමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; පාදෙසු, පාදයන්හි; සිරසා, මස්තකයෙන්; නිපතිත්වා, වැඳවැටී; එකමන්තං, එක්පසෙක; නිසීදී, උන්නේය;

රාජා බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දානං දත්වා භොජනපරියොසානෙ, භගවන්තං එතදවොච අහං භන්තෙ තීණි සරණානි විනා වත්තිතුං න සක්ඛිස්සාමි වේලාය වා අවේලාය වා ආගමිස්සාමි ලට්ඨිවනං අතිදූරං– අම්හාකං ඉදං වෙළුවනං නාම උය්‍යානං නාතිදූරං නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං නිජ්ජනසම්බාධං පවිවෙකසුඛං ඡායූදකසම්පන්නං සිලාතලසමලඞ්කතං රමණීයභූමිභාගං පාසාද හම්මිය විහාරඩ්ඩයොග මණ්ඩපාදීහි පතිමණ්ඩිතං, ඉදං මෙ භගවා පතිගණ්හාතූති සුවණ්ණභිංකාරෙන දසබලස්ස හත්ථෙ උදකං පාතෙත්වා ආරාමං පරිච්චජි තස්මිං ආරාමපටිග්ගහණෙ මහාපඨවි කම්පි සත්ථා විහාරදානානුමොදනමකාසි.

---

භගවා, භාග්‍යවතුන්වහන්සේ; තස්මිං සමාගමෙ, ඒ (බිම්සර) සමාගමයෙහි; මහානාරද කස්සප ජාතකං, මහානාරද කාශ්‍යප ජාතකය; කථෙසි, වදාළසේක; තං සුත්වා, ඒ අසා; බිම්බිසාරො රාජා, බිම්සර රජතෙම; එකාදසනහුතෙහි සද්ධිං, එකොළොස් නහුතයක් පිරිස හා සමඟ; සොතාපත්තිඵලෙ, සෝවාන්පෙළෙහි; පතිට්ඨාසි, පිහිටියේය; එකං නහුතං, එක් නහුතයක්; උපාසකත්තං, උපාසක බව; පවෙදෙසි, දැන්වූයේය;

රාජා, රජතෙම; සවාතනාය, සෙටදවස දන්පිණිස; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛුසංඝෙන සද්ධිං, භික්ෂුසංඝයා හා සමඟ; නිමන්තෙත්වා, නිමන්ත්‍රණය කොට; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; පක්කාමි, ගියේය; පුනදිවසෙ, දෙවන දවසෙහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ, භික්ඛුසඞ්ඝස්ස පරිවුතො, භික්ෂූන් දහසක් විසින් පිරිවරනලද්දේ; රාජගහං, රජගහනුවරට; පාවිසි, පිවිසි සේක; රාජා, රජතෙම; බුද්ධපමුඛස්ස සංඝස්ස, බුද්ධප්‍රමුඛ සංඝයාට; දානං දත්වා, දන් දී; භොජනපරියොසානෙ, වළඳා අවසානයෙහි; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ කාරණය; අවොච, කීයේය; භන්තෙ, ස්වාමීනි; අහං, මම; තීණි සරණානි විනා, ත්‍රිවිධ ශරණයන් හැර; වත්තිතුං, පවත්නට; නසක්ඛිස්සාමි, නොහැකි වන්නෙමි; වේලාය වා, වේලාවෙක්හි හෝ; අවේලාය වා, අවේලාවෙක්හි හෝ; ආගමිස්සාමි, එන්නෙමි; ලට්ඨිවනං, වැල්මිවනය; අති දූරං, ඉතා දුරය; අම්හාකං, අපසතු වූ; වෙළුවනං නාම, වෙළුවන නම් වූ; ඉදං උය්‍යානං පන, මේ උයන වනාහි; නාතිදූරං, ඉතා ද දු රැය; නාච්චාසන්නං, ඉතා ආසන්න ද නොවෙයි; ගමනා ගමන සම්පන්නං, ගමනා ගමනයට යොග්‍යය; නිජ්ජන සම්බාධං, ජනයන් ගෙන් සම්බාධ රහිතය; පවිවෙක සුඛං, විවේක සැප ඇත්තේය; ඡායූදක සම්පන්නං, සෙවනින් හා ජලයෙන් යුක්තය; සිලාතල සමලඞ්කතං, ගල්තලාවෙන් මොනවට අලඞ්කෘතය; රමණීය භූමි

ආවාසදානස්ස පනානිසංසං–කො නාම වත්තුං පුරිසො සමත්ථො
අඤ්ඤත්‍ර බුද්ධා පන ලොකනාථා–යුත්තො මුඛානං නහුතෙන වාපි.
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච-වරං පසත්ථං පටිභාණමෙව
දදාති නාමාති පවුච්චතෙ සො–යො දෙති සඞ්ඝස්ස නරො විහාරං.
දාතා නිවාසස්ස නිවාරණස්ස–සීතාදිනො ජීවිතුපද්දවස්ස
පාලෙති ආයුං පන තස්ස තස්මා–ආයුප්පදො හොති තමාහු සන්තො.
අනුණ්හසීතෙ වසතො නිවාසෙ–බලඤ්ච වණ්ණො පටිභාණ මෙති
තස්මා හි සො දෙති විහාරදාතා බලඤ්ච වණ්ණං පටිභාණමෙව.

---

භාගං, රම්‍යවූ භූමිභාග ඇත්තේය; පාසාද, ප්‍රාසාදය; හම්මිය, සඳලුසහිතගේය; විහාර, විහාරය; අඩ්ඪයොග, අඩ්ඪයෝගය; මණ්ඩපාදීහි, මණ්ඩපය යනාදියෙන්; පතිමණ්ඩිතං, ප්‍රතිමණ්ඩිතය;

භගවා, භාග්‍යවතුන්වහන්සේ; මෙ, මාසනතක වූ; ඉදං, මේ ආරාමය; පතිගණ්හාතු ඉති, පිළිගෙණ වදාරණසේක්වායි; සුවණ්ණභිඞ්ගාරෙන, රන්කෙණ්ඩියෙන්; දසබලස්ස, සර්වඥයන්වහන්සේගේ; හත්ථෙ, අතෙහි; උදකං, ජලය; පාතෙත්වා, වත්කොට; ආරාමං, ආරාමය; පරිච්චජි, පූජාකළේය; තස්මිං ආරාමපටිග්ගහණෙ, ඒ ආරාමය පිළිගැනීමෙහිදී; මහාපථවී, මහාපෘථිවිය; කම්පි, කම්පා වූවාය; සත්ථා, ශාස්තෲන්වහන්සේ; විහාරදානානුමොදනං, විහාර දානානුමොදනාව; අකාසි, කළසේක;

ආවාසදානස්සපන, ආවාසදානයාගේ වනාහි; ආනිස සං, ආනෘශංසය; ලොකනාථා, ලොකනාථවූ; බුද්ධා අඤ්ඤත්‍ර පන, බුදුන්හැර, මුඛානං, මුඛයන් සම්බන්ධ; නහුතෙන, දසදහසකින්; යුත්තොවාපි; යෙදුනාවූ ද; කො නාම පුරිසො, කවර නම් සත්වයෙක්; වත්තුං, කියන්ට; සමත්ථො, සමර්ථ වේ ද; (නො වේමැයි)

යො නරෙ, යම් මනුෂ්‍යයෙක් තෙමේ; සංඝස්ස සංඝයාට; විහාරං, විහාරයක්; දෙති, දේද; සො ඒ විහාරදායකතෙම; ආයුං ච, ආයුෂය ද; වණ්ණං ච,(ශරීර)වර්ණය ද; සුඛං, සැපයද; බලං ච (ශරීර) බලය ද; වරං උතුම් වූ; පසත්ථං, ප්‍රශස්ත වූ; පටිභානං එව, ප්‍රඥාවද; දදාතිනාම ඉති, දෙන්නේ නම් වේයයි; පවුච්චතෙ, කියනුලැබේ;

සීතාදිනො, ශීතාදි වූ; ජීවිතුපද්දවස්ස, ජීවිතොපද්‍රවයාගේ; නිවාරනස්ස, වැලකීමට කාරණ වූ; නිවාසස්ස දාතා, ආවාසයාගේ දායකතෙම; තස්ස, ඒ ප්‍රතිග්‍රාහකයාගේ; ආයුං පන, ආයුෂය ද; පාලෙති, රකී; තස්මා, එහෙයින්; ආයුප්පදෙ හොති, ආයුෂය දෙන්නේ වේයයි; සන්තො, බුද්ධාදී සත්පුරුෂයෝ; ආහු, වර්ණනා කෙරෙත්;

දුක්ඛස්ස සීතුණ්හසිරිංසපාදි-වාතාතපාදිප්පභවස්ස ලොකෙ
නිවාරණා නෙකවිධස්ස නිච්චං-සුඛප්පදෙ හොති විහාරදාතා.

සීතුණ්හවාතාතපඩංසවුට්ඨි-සිරිංසපා වාලමිගාදි දුක්ඛං
යස්මා නිවාරෙති නිවාසදාතා-තස්මා සුඛං වින්දති සො පරත්ථ.

පසන්නචිත්තො භවභොගහෙතුං-මනොභිරම්මං උදිතො විහාරං
යො දෙති සීලාදිගුණොදිතානං-සබ්බං දදෙ නාම පවුච්චතෙ සො.

පහාය මච්ඡෙරමලං සලොභං-ගුණාලයානං නිලයං දදාති
ඛිත්තොව සො තත්ථ පරෙහි සග්ගෙ-යථාභතං ජායති වීතසොකො.

---

හි, යම් හෙයකින්; අනුණ්හසීතෙ, උෂ්ණ සීත නැත්තාවූ; නිවාසෙ, නිවාස ගෘහයෙහි; වසතො, වාසයකරන්නාහට; බලං ච, (ශරීර) බලය ද; වණ්ණො, (ශරීර) වර්ණය ද; පටිභානං, ප්‍රඥාව ද; එති, පැමිණේද; තස්මා, එහෙයින්; සො විහාරදාතා ඒ විහාරදායක තෙම; බලං ච, (ශරීර) බලය ද; වණ්ණං, (ශරීර) වර්ණය ද; පටිභාණං එව, ප්‍රඥාව ද; දෙති දෙයි;

ලොකෙ, ලෝකයෙහි; වාතාතපාදිප්පභවස්ස, අව් සුළං ආදිය ප්‍රභව කොට ඇත්තාවූ ද; සීතුණ්හ සිරිංසපාදි සීත උෂ්ණ (නයි පොළොං ආදි) දීඝජාතීන්ගෙන් වන්නාවූ ද; නෙකවිධස්ස, අනෙක ප්‍රකාරවූ; දුක්ඛස්ස, දුඃඛයාගේ; නිවාරණා, වැළැක්වීමෙන්; විහාරදාතා, විහාරදායකතෙම; නිච්චං, නිරන්තරයෙන්; සුඛප්පදෙ හොති, සැපදෙන්නේ වෙයි;

සීත, ශීතය; උණ්හ, උෂ්ණය; වාත, වාතය; ආතප, අව්වය; ඩංස, ඩැහැලේබොන මැසිය; වුට්ඨි වර්ෂාවය; සිරිංසපා, දීඝජාති සර්පය; වාලමිගාදි, ව්‍යාලමෘගාදිහුය; (යන හේතූන්ගෙන් හටගත්); දුක්ඛං, දුක; යස්මා, යම්හෙයකින්; නිවාසදාතා, නිවාසගෘහ දායකතෙම; නිවාරෙති, වළක්වයිද; තස්මා, එහෙයින්; සො, හෙතෙම; පරත්ථ, පරලොව්හි; සුඛං, සැපය; වින්දති, ලබයි;

යො, යමෙක්තෙම; පසන්නචිත්තො, ප්‍රසන්නසිත් ඇත්තේ; භවභොගහෙතුං, භවභොග සම්පත්තියට හේතුවූ; මනොභිරම්මං, සිත්කළුවූ; විහාරං, විහාරයක්; උදිතො, ප්‍රීතිමත්වූයේ; සීලාදි ගුණොදිතානං, ශීලාදි ගුණයන්ගෙන් උද්ගතවූවන්ට; දෙති, දේද; සො, හෙතෙම; සබ්බං දදෙ නාම, සියල්ල දෙන්නේ නම් වේයයි; පවුච්චතෙ, කියනුලැබේ;

සලොභං, ලොභය සහිතවූ: මච්ඡෙරමලං, මසුරුමලය; පහාය, හැර; ගුණාලයානං, ශීලාදි ගුණයන්ට වාසස්ථානවූවන්ට; නිලයං ගෘහයක්; දදාති, දේද; සො, හෙතෙම; පරෙහි, අන්‍යයන්විසින්

වරෙ වාරුරූපෙ විහාරෙ උළාරෙ-
නරො කාරයෙ වාසයෙ තත්‍ථ භික්ඛූ
දදෙය්‍යන්න පානඤ්ච වත්‍ථඤ්ච තෙසං-
පසන්නෙන චිත්තෙන සක්කච්ච නිච්චං.

තස්මා මහාරාජ භවෙසු භොගෙ-මනොරමෙ පච්චනුභුය්‍ය භීයො
විහාරදානස්ස ඵලෙන සන්තං-සුඛං අසොකං අධිගච්ඡ පච්ඡාති.

ඉති භගවා අනුමොදනං කත්වා වෙළුවනං පාවිසි.

**වෙළුවනදානානුමොදනා.**

"බුද්ධවංසට්ඨකථායං"

---

**සාවත්ථියං-අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා**

---

ආහතං, ගෙනඑනලද; යං, යම් භාණ්ඩයක්; ඛිත්තොඉව, උඩටදමන ලද්දකුමෙන්; සග්ගෙ, ස්වර්ගයෙහි; ජායති, උපදී; තත්‍ථ, එහි; වීත සොකො, පහවූ ශොක ඇත්තේ වෙයි;

නරො, මනුෂ්‍යතෙම; වරෙ, උතුම්වූ; වාරුරූපෙ, මනොඥ ස්වරූප ඇත්තාවූ; උළාරෙ, මහත්වූ; විහාරෙ, විහාරයන්; කාරයෙ කරවන්නේය; තත්‍ථ, එහි; භික්ඛූ, භික්ෂූන්; වාසයෙ, වාසයකරවන්නේය; තෙසං, උන්වහන්සේලාට; පසන්නෙන චිත්තෙන, ප්‍රසන්න සිතින්; නිච්චං, නිරන්තරයෙන්: සක්කච්ච, සකස්කොට; අන්න පානං ච, ආහාර පානවගීද; වත්‍ථං ච, චීවරාදි වස්ත්‍රද; දදෙය්‍ය දෙන්නේය;

මහාරාජ, මහරජ; තස්මා, එහෙයින්; විහාරදානස්ස, විහාරදාන යාගේ; ඵලෙන, ඵලයෙන්; භවෙසු භවයන්හි; මනොරමෙ, සිත් කළුවූ; භොගෙ, භෝගයන්; භීයො බොහෝසෙයින්; පච්චනුභුය්‍ය, අනුභවකොට; පච්ඡා, පසුව; අසොකං, ශොකනැත්තාවූ; සන්තං සුඛං, නිර්වාණසැපය; අධිගච්ඡඉති, ලැබගනුවයි, (වදාළසේක)

භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉති, මෙසේ; අනුමොදනං කත්වා, අනුමෝදනා කොට; වෙළුවනං, වෙළුවනාරාමයට; පාවිසි, පිවිසිසේක;

**වෙළුවන දානානුමොදනා, වෙළුවන දානානුමෝදනාවයි.**

— — ៖o៖ — —

බුද්ධවංසට්ඨකථායං, බුද්ධවංශ අට්ඨකථාවෙහි ය;

---

**සාවත්ථියං,** අථඛො —පෙ— එතදවොච, ගහපති, ගෘහපතිය; චතූහි ධම්මෙහි, ධර්ම සතරකින්; සමන්නාගතො, යුක්තවූ; අරිය

එතද වොච - චතූහි ඛො ගහපති ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ගිහිසාමීචිපටිපදං පටිපන්නො හොති යසපටිලාභිනිං සග්ගසංවත්තනිකං, කතමෙහි චතූහි? ඉධ ගහපති අරියසාවකො භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතො හොති චීවරෙන පච්චුපට්ඨිතො හොති පිණ්ඩපාතෙන පච්චුපට්ඨිතො හොති සෙනාසනෙන පච්චුපට්ඨිතො හොති ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන, ඉමෙහි ඛො ගහපති චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො ගිහිසාමීචිපටිපදං පටිපන්නො හොති යසපටිලාභිනිං සග්ගසංවත්තනිකන්ති.

ගිහිසාමීචිපටිපදං-පටිපජ්ජන්ති පණ්ඩිතා
සම්මග්ගතෙ සීලවන්තෙ-චීවරෙන උපට්ඨිතා.
පිණ්ඩපාතසයනෙන-ගිලානපච්චයෙන ච
තෙසං දිවා ච රත්තො ච-සදා පුඤ්ඤං පවඩ්ඪති
සග්ගං ච කමතිට්ඨානං කම්මං කත්වාන භද්දකන්ති

ගිහිසමීපදසුත්තං.
"චතුක්කඞ්ගුත්තරෙ"

---

සාවකො ඛො ආර්‍යශ්‍රාවකයා වනාහී; යසපටිලාභිනිං යශස් ප්‍රතිලාභය වන්නාවූ; සග්ගසංවත්තනිකං, ස්වර්ගයට පැමිණීම පවත්නාවූ; ගිහිසාමීචිපටිපදං ගිහීන්ට සුදුසු ප්‍රතිපත්තියෙහි; පටිපන්නො හොති, පිළිපන්නේවෙයි; කතමෙහි චතූහි, කවර සතරකින්දයත්; ගහපති ගෘහපතිය; ඉධ, මේ ශාසනයෙහි; අරියසාවකො, ආර්‍ය ශ්‍රාවකතෙම; භික්ඛුසඞ්ඝං, භික්ෂුසංඝයාට; චීවරෙන, සිවුරෙන්; පච්චුපට්ඨිතො හොති, ප්‍රත්‍යුපස්ථිතවේද; (ගෙනවුත් දෙනුකැමැති බැවින් එළඹියේවේද;) පිණ්ඩපාතෙන, පිණ්ඩපාතයෙන්; පච්චුපට්ඨිතො හොති, ප්‍රත්‍යුපස්ථිතවේද; සෙනාසනෙන, සෙනසුනෙන්; පච්චුපට්ඨිතොහොති, ප්‍රත්‍යුපස්ථිතවේද; ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන, ගිලන්පස බෙහෙත් පිරිකරින්; පච්චුපට්ඨිතො හොති, ප්‍රත්‍යුපස්ථිතවේද; ගහපති, ගෘහපතිය; ඉමෙහි චතූහි ධම්මෙහි, මේ ධර්ම සතරින්; සමන්නාගතො, යුක්තවූ; අරියසාවකො ඛො, ආර්‍යශ්‍රාවකයාවනාහී; යසපටිලාභිනිං, යශස් ප්‍රතිලාභයවන්නාවූ; සග්ගසංවත්තනිකං, ස්වර්ගසම්පත්තියපිණිස පවත්නාවූ; ගිහිසාමීචිපටිපදං, ගිහීන්ට සුදුසුප්‍රතිපත්තියෙහි; පටිපන්නොහොති ඉති, පිළිපන්නේවේයයි; (වදාළසේක)

පණ්ඩිතා, පණ්ඩිතයෝ; ගිහිසාමීචිපටිපදං, ගෘහස්ථයන්ට සුදුසුවූ ප්‍රතිපත්තියෙහි; පටිපජ්ජන්ති, පිළිපදිත්; සම්මග්ගතෙ, මනාකොට පිළිපන්නාවූ; සීලවන්තෙ, සිල්වතුන්ට; චීවරෙන, චීවර

"ගෙහප්පවෙසන මඞ්ගලාදීසු මඞ්ගලසුත්තාදි අනුමෝදනා පන, යානි පෝරාණේහි සබ්බමඞ්ගලකරණත්ථං මඞ්ගලසුත්ත රතනසුත්තාදීනි සමුච්චිනිත්වා එකජ්ඣං මහාවිහාරපරිත්තන්ති නාමෙන ඨපිතානි සරණාගමන දසසික්ඛාපදදීනි චතුභාණවාරන්ති තානියෙව ච මහාසමයසුත්තඤ්ච වෙදිතබ්බං තඤ්ච කාරෙන්තෙන පරිත්තවිනිච්ඡය කථාය වුත්තවිධිනා කාතබ්බං මහාසමයසුත්තන්තං පන දෙවතානං පියං මනාපං තස්මා මඞ්ගලං වදන්තෙන අභිනවට්ඨානෙසු වත්තබ්බං."

---

යෙන්ද; පිණ්ඩපාතසයනෙන, පිණ්ඩපාතයෙන් හා සෙනසුනෙන්ද; ගිලානපච්චයෙන ච, ගිලන්පසින්ද; උපට්ඨිතා, උවටැන්කරන්නාහු වෙත්;

තෙසං (යම් කෙනෙක් මෙසේ සිව්පසයෙන් උපස්ථානය කෙරෙත්ද;) ඔවුනට; දිවා ච, දහවල්ද; රත්තො ච, රාත්‍රියෙහිද; සදා සියලුකල්හි; පුඤ්ඤං, පින; පවඩ්ඪති. වැඩේ; (එබඳුවූයේ) තදඞ්ග ; යහපත්වූ; කම්මං කත්වාන, කර්මයකොට; සග්ගං ච ඨානං, දෙව්ලොව වද; කමති, පැමිණේ;

ගිහිපටිපදා සුත්තං, ගිහිප්‍රතිපදා සූත්‍රයයි;

--- ०१० ---

චතුක්කඞ්ගුත්තරෙ, අඞ්ගොත්තරසඞ්ගියෙහි සතරවන නිපාතයෙහිය

---

මඞ්ගලසුත්තාදි අනුමොදනා පන, මංගලසූත්‍රාදි අනුමෝදනා වනාහී; ගෙහප්පවෙසනමඞ්ගලාදිසු; ගෘහප්‍රවෙශන මංගලයාදියෙහිය; පෝරාණෙහි, පෞරාණිකයන් විසින්; යානි මඞ්ගලසුත්ත රතනසුත්තාදීනි, යම් මංගලසූත්‍ර රතන සූත්‍රාදියක්; එකජ්ඣං, එකට; සමුච්චිනිත්වා, එක්කොට; මහාවිහාරපරිත්තං ඉති, මහාවිහාර පිරිතයයි; නාමෙන, නමින්; ඨපිතානි, තබනලද්දාහු ද; සරණාගමන දසසික්ඛාපදදීනි, (යම්) සරණාගමන දශශික්ෂා පදදියක්; (එක්කොට) චතුභාණවාරං ඉති, සතර බණවරයයි; (තබන ලද්දාහුද?) තානි එව ච ඒ මන පිරිත සහ සතරබණවර ද; මහාසමය සුත්තං ච, මහාසමය සූත්‍රය ද; සබ්බ මඞ්ගලකරණත්ථං, සියලු මඞ්ගල ක්‍රියාපිණිස; වෙදිතබ්බං, දතයුතුයි; තං ච, ඒ පිරිත ද; කාරෙන්තෙන, කරන්නහුවිසින්; පරිත්ත විනිච්ඡයකථාය, පිරිත්විනිස කථාවෙහි; වුත්තවිධිනා කියනලද ආකාරයෙන්; කාතබ්බං, කටයුතුයි; මහාසමය සුත්තන්තං පන, මහාසමය සූත්‍රාන්තය වනාහී; දෙවතානං, දේවතාවන්ට; පියං, ප්‍රියය; මනාපං, මනාපය; තස්මා, එහෙයින්; අභිනවට්ඨානෙසු, අභිනව ස්ථානයන්හී; මඞ්ගලං වදන්තෙන, මංගලසූත්‍රය කියන්නහු විසින්; වත්තබ්බං, කියයුතුයි;

එවමෙම සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිල වත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච.

අථ ඛො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතදහොසි අයං ඛො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බ

---

මෙ, මාවිසින්; එවං, මෙසේ; සුතං, අසනලදී; කෙසේද? එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සක්කෙසු, ශාක්‍යයන්ගේ දනව්වෙහි; කපිලවත්ථුස්මිං, කිඹුල්වත්පුරය සමීප යෙහි වූ; මහාවනෙ, මහාවනයෙහි; අරහන්තෙහි, අර්හත්වයට පැමිණියාවූ; සබ්බෙහෙව, සියලුදෙනාවහන්සේගෙන්ම යුක්තවූ; පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි, භික්ෂූන් පන්සියයක් පමණවූ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහත් වූ භික්ෂුසංඝයා සමඟ; විහරති, වැඩ වාසය කරනසේක; දසහි ලොකධාතූහි; දශදහසක් ලෝකධාතු වලින්; දෙවතා ච, දෙවියොත්; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේද; භික්ඛුසඞ්ඝං ච, භික්ෂුසංඝයා ද; දස්සනාය, දැකිම පිණිස; යෙභු ය්‍යෙන, බොහෝසෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්; අථ ඛො, ඉක්බිති; චතුන්නං සුද්ධාවාසකායිකානං, ශුද්ධාවාසබ්‍රහ්ම නිකායට අයත්වූ බ්‍රහ්මරාජයන් සතරදෙනකුට; එතදහොසි, මෙබඳු අදහසෙක් විය; කෙසේ ද? අයං ඛො භගවා, මේ භාග්‍යවතුන් වහන්සේ; කපිලවත්ථුස්මිං, ශාක්‍යයන්ගේ කිඹුල්වත්පුරය සමීප යෙහිවූ; මහාවනෙ, මහාවනයෙහි; අරහන්තෙහි, රහත්වූ; සබ්බෙ හෙව, සියලුදෙනා වහන්සේගෙන්ම යුක්තවූ; පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි, භික්ෂූන් පන්සියයක් පමණවූ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහත්වූ භික්ෂුසංඝයා සමඟ; විහරති, වැඩවාසය කරනසේක; දසහි ලොකධාතූහි, දශදහසක් ලෝකධාතුවලින්; දෙවතා ච, දෙවි යොත්; භගවන්තං, බුදුරජාණන්වහන්සේද; භික්ඛුසඞ්ඝං ච, භික්ෂු සංඝයා ද; දස්සනාය, දැකිමපිණිස; යෙභුය්‍යෙන, බොහෝසෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්;

මයම්පි, අපි ද; භගවා, භාග්‍යවතුන්වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැනට; උපසංකමෙය්‍යාම, එළඹෙන්නෙමු නම්; උපසංකමිත්වා, එළඹ; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි; පච්චෙක ගාථං, එක එක ගාථාව; භාසෙය්‍යාම, කියන්නෙමු නම්; යන්නූන ඉති, ඉතා යෙහෙකැයි

හෙව අරහන්තෙහි දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච යන්නූන මයම්පි යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ පච්චෙක ගාථං භාසෙය්‍යාමාති.

අථඛො තා දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු, අථඛො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි

මහාසමයො පවනස්මිං- දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං–දක්ඛිතායෙ අපරාජිතසඞ්ඝන්ති.

අථඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

---

සිතුහ; අථඛො, ඉක්බිති; තා දෙවතා, ඒ දෙවතාවෝ; සෙය්‍යථාපි නාම, යම්සේ නම්; බලවා පුරිසො, බලවත් පුරුෂයෙක්; සම්මිඤ්ජිතං බාහං වා, හකුළුවනලද අත හෝ; පසාරෙය්‍ය, දිගු කරන්නේ ද; පසාරිතං බාහං වා, දිගු කළ අත හෝ; සම්මිඤ්ජෙය්‍ය, හකුළුවන්නේ ද; එවමෙවං, එපරිද්දෙන්ම; සුද්ධාවාසෙසු දෙවෙසු, සුද්ධාවාස දෙවියන් කෙරෙහි; අන්තරහිතා, අතුරුදන්වූවෝ; භගවතො පුරතො; බුදුන් ඉදිරියෙහි; පාතුරහංසු, පහළවූහ; අථඛො, ඉක්බිති; තා දෙවතා, ඒ දෙවතාවෝ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; අට්ඨංසු, සිටියාහුය; එකමන්තං ඨිතා ඛො, එකත්පසෙක සිටියාම වූ; එකා දෙවතා එක්දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේය,

පවනස්මිං, මේ වන ළැහැබෙහි; මහාසමයො, මහාසමාගමයෙකි; දෙවකායා; දිව්‍යසමූහයෝ; සමාගතා, එක්රැස්වූහ; අපරාජිතසංඝං, කෙලෙස් සතුරන් විසින් නොපරදවනලද ආර්‍ය්‍යසංඝයා; දක්ඛිතායෙ, දක්නාපිණිස; ඉමං ධම්මසමයං, මේ ධර්මසමාගමයට; ආගතා අම්හ ඉති, ආවෝ වමුයි;

අථඛො, ඉක්බිති; අපර දෙවතා, අන්‍යදෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුරජාණන්වහන්සේගේ සමීපයෙහි; ඉමංගාථං, මේ ගාථාව; අභාසි, කීයේය;

තත්‍ර භික්ඛවො සමාදහංසු–චිත්තං අත්තනො උජුකමකංසු
සාරථීව නෙත්තානි ගහෙත්වා-ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

අථඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

ඡෙත්වා ඛීලං ඡෙත්වා පලිඝං-ඉන්දඛීලං ඌහච්ච මනෙජා
තෙ චරන්ති සුද්ධා විමලා–චක්ඛුමතා සුදන්තා සුසූ නාගාති.

අථඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ– න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං–දෙවකායං පරිපූරෙස්සන්තීති.

අථඛො භගවා භික්ඛූ ආමන්තෙසි යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතූසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය භික්ඛුසඞ්ඝං ච, යෙපි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මා

---

තත්‍ර, ඒ සමාගමයෙහි; භික්ඛවො, භික්ෂූහු; අත්තනො චිත්තං, තමන්ගේ සිත; සමාදහංසු, එකඟ කළාහුය; උජුකමකංසු, ඍජු කළාහුය; නෙත්තානි ගහෙත්වා, (සම පමණින් ගමන් ගත් අසුන් ඇතිකල්හි චොදන නිවාරණ රහිතව,) රැහැන්ගෙන (සිටින්නාවූ;) සාරථී ඉව, රථාචාර්‍ය්‍යයන් මෙන්; පණ්ඩිතා, නුවණැත්තෝ; ඉන්ද්‍රියානි, ඉඳුරන්; රක්ඛන්ති, රකිත්; අථ ඛො—පෙ—

ඛිලං, රාගාදිකෙලෙස් නමැති ඛීලය; (කණුව) ඡෙත්වා, සිඳ; පලිඝං, කෙලෙස් නමැති කණයම; ඡෙත්වා, සිඳ; ඉන්දඛිලං, (රාගාදි) ඉන්ද්‍රඛීලය; ඌහච්ච, උදුරා; අනෙජා, ඒජා යයි කියනලද තෘෂ්ණා රහිතවූ; සුද්ධා, එහෙයින්ම පිරිසුදුවූ; විමලා, නිර්මලවූ; චක්ඛුමතා, පසැස්ඇත්තාවූ බුදුන්විසින්; සුදන්තා, මොනවට දමනය කරන ලද්දාවූ; තෙ සුසූනාගා, (අද ම රහත්වූ)ඒ තරුණ රහත්හු; චරන්ති, (සිව්දිගුන්හි අප්‍රතිහත ව) හැසිරෙත්; අථ ඛො —පෙ—

යෙ කෙචි, යම්කිසි කෙනෙක්; බුද්ධං, බුදුන්; සරණං, (නිවේච මතික සරණාගමනයෙන්) සරණ කොට; ගතාසෙ, ගියාහු ද; තෙ, ඔව්හු; අපායං, අපායට; න ගමිස්සන්ති; නොයන්නාහුය; මානුසං දෙහං, මනුෂ්‍ය ශරීරය; පහාය, හැර; දෙවකායං, දිව්‍යකායය; පරිපූරෙස්සන්ති ඉති, සම්පූර්ණ කරන්නාහු යයි;

අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූ, භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රණය කළසේක; භික්ඛවෙ, මහණෙනි; දසසු ලොකධාතූසු දෙවතා, දශ දහසක් සක්වළ දේවතාවෝ; තථාගතං, තථාගතයා ද; භික්ඛුසංඝං ච, භික්ෂුසංඝයා ද; දස්සනාය, දක්නා පිණිස; යෙභුය්‍යෙන, බොහෝසෙයින්; සන්නිපතිතා, රැස්වූහ; භික්ඛවෙ, මහණෙනි; අතීතමද්ධානං, අතීත

සම්බුද්ධා තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි, යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති සෙය්‍යථාපි මය්හං එතරහි, ආචික්ඛිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි කිත්තයිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි දෙසිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි; තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

සිලොකමනුකස්සාමි–යත්ථ භුම්මා තදස්සිතා
යෙ සිතා ගිරිගබ්භරං–පහිතත්තා සමාහිතා.

---

කාලයෙහි; අරහන්තො, අහිත්වූ; යෙපි තෙ සම්මාසම්බුද්ධා, යම් ඒ සම්‍යක්සම්බුද්ධවරයෝ; අහෙසුං, වූවාහුද; තෙසම්පි භගවන්තානං, ඒ භාග්‍යවතුන් වහන්සේලාටද; එතපරමායෙව දෙවතා, මෙපමණ ම දෙවතාවෝ; සන්නිපතිතා අහෙසුං, රැස්වූහ; මය්හං, මට; එතරහි, දැන්; (මේ කාලයෙහි;) සෙය්‍යථාපි, යම්සේ; (දෙවියෝ රැස්වූද) එමෙති;

භික්ඛවෙ, මහණෙනි; අනාගතං අද්ධානං, අනාගත කාලයෙහි; අරහන්තො, අහිත්වූ; යෙපි තෙ සම්මාසම්බුද්ධා, යම් ඒ සම්‍යක්සම්බුද්ධවරයෝ; භවිස්සන්ති, වන්නාහුද; තෙසම්පි භගවන්තානං, ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද; එතපරමායෙව, මෙ පමණ ම; දෙවතා, දෙවතාවෝ; සන්නිපතිතා භවිස්සන්ති, රැස් වන්නාහුය; මය්හං, මට; එතරහි දැන්; සෙය්‍යථාපි, යම්සේ ද එපරිද්දෙනි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, දිව්‍යසමූහයන්ගේ; නාමානි, නාමයන්; ආචික්ඛිස්සාමි, ප්‍රකාශ කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, දිව්‍යසමූහයන්ගේ; නාමානි, නාමයන්; කිත්තයිස්සාමි, පහළකරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, දිව්‍යසමූහයන්ගේ; නාමානි, නාමයන්; දෙසිස්සාමි, දෙශනා කරන්නෙමි; තං, එය; සුණාථ, අසව්; සාධුකං, මනාකොට; මනසිකරොථ, මෙනෙහිකරව්; භාසිස්සාමි ඉති, කියන්නෙමියි; (වදාළසේක) තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; එවංභන්තෙති ඛො, එසේය ස්වාමීන් වහන්සැයි; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන ඇස්වූහ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මේ අක්ෂරපද නියමිත ධර්මය; අවොච, වදාළසේක;

සිලොකමනුකස්සාමි, (අක්ෂරපදනියමිතවචන) ශ්ලෝක බන්ධනය කරන්නෙමි; යත්ථ, යම්තැනෙක්හි; භුම්මා, භූම්‍යස්ථ දෙවියෝ; තදස්සිතා, ඒ ඒ ස්ථානනිඃශ්‍රිත වූවාහු ද; පහිතත්තා, භාවනාවට

පුප්ඵසීහාව සල්ලීනා–ලොමහංසාභිසම්භුනො
ඔදාතමනසා සුද්ධා–විප්පසන්නමනාවිලා
භීය්‍යො පඤ්චසතෙ ඤත්වා–වනෙ කාපිලවත්ථවෙ
තතො ආමන්තයී සත්ථා–සාවකෙ සාසනෙ රතෙ.

දෙවකායා අභික්කන්තා–තෙ විජානාථ භික්ඛවො
තෙ ච ආතප්පමකරුං–සුත්වා බුද්ධස්ස සාසනං.

තෙසං පාතුරහු ඤාණං–අමනුස්සාන දස්සනං
අප්පෙකෙ සතමද්දක්ඛුං–සහස්සං අථ සත්තතිං.
සතං එකෙ සහස්සානං–අමනුස්සානමද්දසුං
අප්පෙකෙ නන්ත මද්දක්ඛුං–දිසා සබ්බා ඵුටා අහු.

මෙහෙයනලද සිත් ඇත්තාවූ; සමාහිතා, එකඟ වූ සිත් ඇත්තා වූ; ලොමහංසාභිසම්භුනො, ලොමු දැහැගැන්ම අභිභවනය කළා වූ; (තිභීයවූ) ඔදාතමනසා, පිරිසුදු සිත්ඇත්තාවූ; සුද්ධා, එහෙයින්ම පිරිසුදුවූ; විප්පසන්නා, ආය්‍ය්‍යීමාර්ගප්‍රසාදයෙන් වෙසෙසින් පහන්වූ; අනාවිලා, සිත කලඹන කෙලෙසුන් පහකළ හෙයින් නොකැලඹුණු සිත්ඇත්තාවූ; සීහාව සල්ලීනා, කෙශරසිංහරාජයන් මෙන් සැඟවුණාවූ; යෙ පුප්ඵ, යම් බොහෝ රහත්හු; ගිරිගබ්භාරං සිතා, පර්‍ව්‍යතගුහා ඇසිරූ කළාහු ද;

තතො, ඉක්බිති; සත්ථා ශාස්තෲන්වහන්සේ; කාපිලවත්ථවෙ, කිඹුල්වත්පුරයට සමීපවූ; වනෙ, මහාවනයෙහිදී; භීය්‍යොපඤ්චසතෙ, (තමන් වහන්සේ සමඟ) පන්සියයකින් වැඩිවූ මේ භික්ෂූහු; ඤත්වා, (දිවැසින් මේදෙවියන් දක්නාහයි) දැන; සාසනෙ, ශික්ෂාත්‍රය සංඛ්‍යාත ශාසනයෙහි; රතෙ, ඇලුණාවූ; සාවකෙ, ශ්‍රාවකයන්, ආමන්තයී, ආමන්ත්‍රණය කළසේක;

භික්ඛවො, මහණෙනි; දෙවකායා, දිව්‍යසමූහයෝ; අභික්කන්තා, රැස්වූවාහුය; තෙ, ඒ දෙවියන්; විජානාථ, දිව්‍යචක්ෂුරභිඥනය මෙහෙයා මනාකොට දැනගනිව්; (යයි වදාළසේක. තෙ ච, ඒ භික්ෂූහු ද; බුඩස්සසාසනං, බුදුන්ගේ වචනය; සුත්වා, අසා; ආතප්පං, ඒ පිණිස ආවර්‍ජනා මාත්‍ර සංඛ්‍යාත වීය්‍ය්‍යීය; අකරුං, කළාහුය;

තෙසං, ඒ භික්ෂූන්ට; අමනුස්සාන දස්සනං, දෙවාදි අමනුෂ්‍යයන්ගේ දැකීම කරන්නාවූ; ඤාණං, දිව්‍යඥනය; පාතුරහු, පහළවිය; අප්පෙකෙ, ඇතැම් රහත්හු; සතං, (අමනුෂ්‍යයන්) සියයක් ද; සහස්සං, (ඇතැම් රහත්හු) දහසක් ද; අථ, නැවත; සත්තතිං, (සහස්සං) (ඇතැම් රහත්හු) හැත්තෑදහසක්ද; අද්දක්ඛුං, දුටහ;

එකෙ, ඇතැම් රහත්හු; අමනුස්සානං, දෙවාදි අමනුෂ්‍යයන්; සතං සහස්සානං, ලක්ෂයක්; අද්දසුං, දුටුවාහුය; අප්පෙකෙ, සමහර

තඤ්ච සබ්බං අභිඤ්ඤාය–වවත්ථිත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා–සාවකෙ සාසනෙ රතෙ.

දෙවකායා අභික්කන්තා–තෙ විජානාථ භික්ඛවො
යෙ වොහං කිත්තයිස්සාමි–ගිරාහි අනුපුබ්බසො.

සත්තසහස්සා යක්ඛා–භුම්මා කාපිලවත්ථවා
ඉද්ධිමන්තො ජුතිමන්තො–වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං–භික්ඛූනං සමිතිං වනං.

ඡසහස්සා හෙමවතා–යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො–වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං–භික්ඛූනං සමිතිං වනං.

---

රහත්හු; අනන්තං, (දිව්‍යබ්‍රහ්මයන්) අප්‍රමාණ කොට; අද්දක්ඛුං, දුටහ; (යම් හෙයකින්) සබ්බා දිසා, සියලු දිසාවෝ; ඵුටා අහු, අවකාශ රහිත වූ ද; (එහෙයිනි.)

චක්ඛුමා, පසැස් ඇත්තා වූ ශාස්තෘන් වහන්සේ; තං ච සබ්බං, ඒ සියල්ල ම; වවත්ථිත්වාන, වෙන් කොට, අභිඤ්ඤාය, විශිෂ්ටඥානයෙන් දැන; තතො, නැවත; සාසනෙ රතෙ, සස්නෙහි ඇලුණාවූ; සාවකෙ, ශ්‍රාවකයන්; ආමන්තයී, ඇමතූසේක;

භික්ඛවො, මහණෙනි; දෙවකායා, දිව්‍ය සමූහයෝ; අභික්කන්තා, රැස්වූහ; අහං, මම; වො, තොපට; යෙ, යම් ඒ දිව්‍යබ්‍රහ්මාදීන්ගේ සඞ්ඛ්‍යා වශයෙන්; ගිරාහි, වචනවලින්; අනුපුබ්බසො, පිළිවෙළින්; කිත්තයිස්සාමි, ප්‍රකාශ කරන්නෙම් ද; තෙ, ඒ දෙවියන්; විජානාථ, දනිව්;

කාපිලවත්ථවා, කිඹුල්වත්පුර වාසී වූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, බැබලීම ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීරවර්ණ ඇත්තාවූ; යසස්සිනො, යශස් ඇත්තාවූ; සත්තසහස්සා, සත්දහසක්; භුම්මා යක්ඛා, භූමි නිශ්‍රිත යක්‍ෂ (දෙවි) යෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්‍ෂු සමූහයා දැකීමට; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහුය;

හෙමවතා, හිමාලය පර්වතයෙහි වාසයකරන්නාවූ; නානත්තවණ්ණිනො, නානාවිධ ප්‍රභා ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, අනුභාවසම්පන්නවූ; වණ්ණවන්තො, දිව්‍යමය ශරීරවර්ණයෙන් යුක්තවූ; යසස්සිනො, යසපිරිවරසම්පත් ඇත්තාවූ; ඡසහස්සා යක්ඛා, සදහසක් යක්‍ෂයෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත්භික්‍ෂූන්ගේ දර්ශනයපිණිස; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහුය;

සාතාගිරා තිසහස්සා-යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

ඉච්චෙතෙ සොළසසහස්සා-යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

වෙස්සාමිත්තා පඤ්චසතා-යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

කුම්භිරො රාජගහිකො-වෙපුල්ලස්ස නිවෙසනං
භීයො නං සත සහස්සං-යක්ඛානං පයිරුපාසති
කුම්භිරො රාජගහිකො-සොපාග සමිතිං වනං.

---

සාතාගිරා, සාත නම් (ගිරි) පර්වතවාසිවූ; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාඇති; ඉද්ධිමන්තො, සෘද්ධිඇත්තාවූ; ජුතිමන්තො, කාන්තිඇත්තාවූ; වණ්ණවන්තො, දිව්‍යමය ශරීරවර්ණ ඇත්තාවූ යසස්සිනො, යසපිරිවරඇත්තාවූ; තිසහස්සා යක්ඛා, තුන්දහසක් යක්ෂයෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂූන්ගේ දර්ශනයට; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහුය;

ඉති, මෙසේ; නානත්තවණ්ණිනො, නානාවිධ ප්‍රභා ඇත්තාවූ; ඉද්ධිමන්තො —පෙ— එතෙ සොළසසහස්සා යක්ඛා, මේ සොළොස් දහසක් යක්ෂයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං සමිතිං, භික්ෂූන්ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහුය;

වෙස්සාමිත්තා, වෙස්සාමිත්ත නම් පර්වතවාසිවූ; නානත්ත වණ්ණිනො —පෙ— පඤ්චසතායක්ඛා, පන්සියයක් යක්ෂයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂුසමූහයා දකිම පිණිස; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහ;

රාජගහිකො, රජගහානුවර උපන්නාවූ; කුම්භිරො, කුම්භීරා නම් යක්සෙනෙවිරත් කෙනෙක් විය; අස්ස, ඔහුගේ; නිවෙසනං නිවාසස්ථානය; වෙපුල්ලං, වෙපුල්ලපර්වතයයි; භීයො, වැඩියක් සහිත; යක්ඛානං සතසහස්සං, යක්ෂයන් සම්බන්ධ ලක්ෂයක්; නං, ඔහු; පයිරුපාසති, ඇසිරු කෙරේ; රාජගහිකො, රජගහා නුවර උපන්; සො කුම්භිරො, ඒ කුම්භීරතෙමේද; සමිතිං, අභීත් භික්ෂු සමූහයා දක්නට; වනං, මහාවනයට; උපාගා, ආයේය;

පුරිමඤ්ච දිසං රාජා-ධතරට්ඨො තං පසාසති
ගන්ධබ්බානං ආධිපති-මහාරාජා යසස්සි සො.
පුත්තාපි තස්ස බහවො-ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතීමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.
දක්ඛිණඤ්ච දිසං රාජා-විරූළ්හො තං පසාසති
කුම්භණ්ඩානං ආධිපතී-මහාරාජා යසස්සි සො.
පුත්තාපි තස්ස බහවො-ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.
පච්ඡිමඤ්ච දිසං රාජා-විරූපක්ඛො තං පසාසති
නාගානං ආධිපතී-මහාරාජා යසස්සි සො.
පුත්තාපි තස්ස බහවො-ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතීමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

---

පුරිමං ච දිසං රාජා, පෙරදිගට රජවූ; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර වරම් රජතෙම; තං පසාසති, ඒ පෙරදිග අනුශාසනාකෙරේ; ගන්ධබ්බානං ආධිපති, ගන්ධර්වයන්ට අධිපතිවූ; යසස්සී, යශස් ඇත්තාවූ; සො මහාරාජා, ඒ ධෘතරාෂ්ට්‍ර වරම්මහ රජතෙමේද; (ආයේය)

තස්ස, ඔහුගේ; පුත්තා, පුත්‍රවූ; මහබ්බලා, මහත්බල ඇත්තාවූ; ඉඩිමන්තො, ඍඬිඇත්තාවූ; ජුතීමන්තො, කාන්තිඇත්තාවූ; වණ්ණවන්තො, නොයෙක් පැහැඇත්තාවූ; යසස්සිනො, යශපිරිවර ඇත්තාවූ; ඉන්දනාමා අපි, ඉන්ද යන නම් ඇති දෙවියෝ ද; මොද මානා සතුටුවෙමින්; භික්ඛූනංසමිතිං, අභීත් භික්‍ෂු සමූහයා දක්නට; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණීයාහ;

දක්ඛිණං ච දිසං රාජා, දකුණුදිගට රජවූ; විරූළ්හා, විරූඪ නම් වරම් රජතෙම; තං පසාසති; ඒදිග අනුශාසනා කෙරේ; කුම්භණ්ඩානං, කුම්භාණ්ඩයන්ට; ආධිපති, අධිපතිවූ; යසස්සී, යසස් ඇත්තාවූ; සො මහාරාජා, ඒ මහරජතෙමේ ද; (ආයේය.)

පුත්තාපි තස්ස —පෙ—

පච්ඡිමං ච දිසං රාජා, පශ්චිමදිසාවෙහි රජවූ; විරූපක්ඛො, විරූපාක්‍ෂ නම් වරම් රජ තෙම; තං පසාසති, ඒ දිග අනුශාසනා කෙරේ; නාගානං ආධිපති, නාගයන්ට අධිපතිවූ; යසස්සී, යශස් ඇති; සො මහාරාජා, ඒ වරම් මහරජතෙමේ ද; (ආයේය)

පුත්තාපි තස්ස —පෙ—

උත්තරඤ්ච දිසං රාජා-කුවෙරො තං පසාසති
යක්ඛානං ආධිපති-මහාරාජා යසස්සි සො.

පුත්තාපි තස්ස බහවො-ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං
පුරිමං දිසං ධතරට්ඨො-දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො-කුවෙරො උත්තරං දිසං.

චත්තාරො තෙ මහාරාජා-සමන්තා චතුරො දිසා
දද්දල්ලමානා අට්ඨංසු-වනෙ කාපිලවත්ථවෙ.

තෙසං මායාවිනො දාසා- ආගු වඤ්චනිකා සඨා
මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු-විටූච විටූඩො සහ.

චන්දනො කාමසෙට්ඨො ච- කින්නිඝණ්ඩු නිඝණ්ඩු ච
පණාදො ඔපමඤ්ඤො ච-දෙවසූතො ච මාතලි.

---

උත්තරං ච දිසං රාජා, උතුරුදිසාවෙහි අධිපති වූ; කුවෙරො, කුවෙර නම් වෛශ්‍රවණරජතෙමේ; තං පසාසති, ඒ දිග අනුශාසනා කෙරේ; යක්ඛානං ආධිපති, යක්ෂයන්ට අධිපතිවූ; යසස්සී, යශස් ඇත්තාවූ; සො මහාරාජා, ඒ මහරජතෙමේ ද; (ආයේය)

පුත්තාපි තස්ස —පෙ—

පුරිමං දිසං, පෙරදිග; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජද; දක්ඛිණෙන, දකුණුදිග; විරූළ්හකො, විරූඪ නම් වරම්රජද; පච්ඡිමෙන, පැසුලුදිග; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම් රජද; උත්තරං දිසං, උතුරුදිග, කුවෙරො, කුවෙර නම් වෛශ්‍රවණ මහරජද;(යන)

තෙ චත්තාරො මහාරාජා, ඒ සතරවරම් මහරජදරුවෝ; කාපිලවත්ථවෙ, කිඹුල්වත්පුරයට සමීපවූ; වනෙ, මහවනයෙහි; සමන්තා, හාත්පසින්; චතුරො දිසා, සිවුදිගුන්; දද්දල්ලමානා, මහත්වූ ආලෝකයෙන් බබුළුවමින්; අට්ඨංසු, සිටියාහුය,

තෙසං, ඒ වරම් මහරජුන්ගේ; මායාවිනො, මායා ඇත්තාවූ; වංචනිකා, වංචා කරන්තාවූ; සඨා, කෛරාටික වූ; දාසා, දාසවූ ද; මායා, මායාකාරවූද; කුටෙණ්ඩු, කුටෙණ්ඩුය; වෙටෙණ්ඩු, වෙටෙණ්ඩුය; විටූච, විටූචය; (යන මොවුහු) ආගු, ආවාහුය; විටූඩො, විටූඩ නම් දාසයා ද: සහ, ඔවුන් සමඟ (ආයේය;)

චන්දනො, චන්දනය; කාමසෙට්ඨො ච, කාමසෙට්ඨය; කින්නිඝණ්ඩු, කින්නිඝණ්ඩුය; නිඝණ්ඩු ච, නිඝණ්ඩුය යන දාසයෝ ද; ආවාහුය; ගන්ධබ්බා, ගන්ධර්වකායිකා වූ; පණාදො, පණාද නම් දිව්‍ය රාජ ද; ඔපමඤ්ඤො ච, ඔපමඤ්ඤ නම් දිව්‍යරාජ ද; දෙවසූතො මාතලිච, ඉන්ද්‍රසාරථිවූ මාතලි නම් දිව්‍යරාජද; චිත්තසෙනොච, චිත්‍රසෙ

චිත්තසෙනො ච ගන්ධබ්බො-නළො රාජා ජනෙසභො
ආග පඤ්චසිඛො චෙව-තිම්බරූ සුරියවච්චසා.

එතෙචඤ්ඤෙ ච රාජානො ගන්ධබ්බා සහ රාජුභි
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

අථාගු නාභසා නාගා-වෙසාලා සහ තච්ඡකා
කම්බලස්සතරා ආගු-පායාගා සහ ඤාතිභි.

යාමුනා ධතරට්ඨා ච-ආගු නාගා යසස්සිනො
එරාවණො මහානාගො-සොපාග සමිතිං වනං.

යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛි විසුද්ධචක්ඛු
වෙහාසයා තෙ වනමජ්ඣපත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමානි.

---

සෙනය, චිත්තසෙනය යන තිදෙනද; නළොරාජා නළකාර නම් දිව්‍යරාජද; ජනෙසභො, ජන වසභ නම් දිව්‍යරාජද; පංචසිඛොචෙව, පංචසිඛ දිව්‍යරාජද; ආග, ආයේය; තිම්බරූ සුරියවච්චසා, තිම්බරූ නම් ගන්ධර්ව දිව්‍යරාජ ද ඔහුගේ දුහිතෘ වූ සුරියවච්චසා නම් දෙව ඟන ද ආවාහුය;

එතෙ ච රාජානො, මේ ගන්ධර්ව රජහු ද; අඤ්ඤෙ ච ගන්ධබ්බා, අන්‍ය ගන්ධර්වයෝ ද; රාජුභි සහ, රජුන් සමඟ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන්ගේ සමිතිය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහුය;

අථ, ඉක්බිති; නාභසානාගා, නාභස නම් නාගයෝ ද; වෙසාලා, විසාලී නාලොව වැසි නාගයෝ ද; තච්ඡකා සහ ආගු, තච්ඡක නම් නාපිරිස සමඟ ආවෝය; කම්බලස්සතරා, කම්බල අස්සතර කුල දෙක්හි නාගයෝ ද; පායාගා, පායාග නම් නාලොවවැසි නාගයෝ ද; ඤාතිභි සහ ආගු, නෑයන් සමඟ ආවෝය; යාමුනා, යමුනා ගඟ වසන්නාවූද; ධතරට්ඨා ච, ධෘතරාෂ්ට්‍රකුලයෙහි උපන්නාවූද; යසස්සිනො, යශස්ඇත්තාවූ; නාගා, නාගයෝ ද; (ආවෝය) සො එරාවණො මහානාගො, එරාවන නම් ඒ මහා නාග තෙමේද; සමිතිං, අර්හත්භික්ෂු සමාගමයවූ; වනං, මහාවනයට; උපාග, ආයේය;

දිබ්බා, දිව්‍යවූ අනුභාවය ඇති; දිජා, ද්විජ නම්වූ; විසුද්ධචක්ඛු, පිරිසුදු ඇස් ඇත්තාවූ; යෙ පක්ඛී, යම් ගරුඩ පක්ෂීහු; නාගරාජෙ සහසා හරන්ති, නාරජුන් වහා ගෙනයෙද්ද; තෙ, ඒ පක්ෂීහු(ද); වෙහාසයා, අහසින්; වනමජ්ඣපත්තා, මහාවනයට පැමිණියාහුය; චිත්‍රාසුපණ්ණාඉති, චිත්‍රාය සුපණ්ණාය යනු; තෙසං නාමානි, ඒ ගරුඩ පක්ෂීන්ගේ නාමයෝයි;

අභයං තදා නාගරාජානමාසි
සුපණ්ණතො ඛෙමමකාසි බුද්ධො
සණ්හාහි වාචාහි උපව්හයන්තා
නාගා සුපණ්ණා සරණමගංසු බුද්ධං.

ජිතා වජිරහත්ථෙන–සමුද්දං අසුරා සිතා
භාතරො වාසවස්සෙතෙ–ඉද්ධිමන්තො යසස්සිනො.

කාලකඤ්ජා මහාභිංසා–අසුරා දානවෙඝසා
වෙපචිත්ති සුචිත්ති ච–පහාරාදො නමුචී සහ.

සතඤ්ච බලිපුත්තානං–සබ්බෙ වෙරොචනාමකා
සන්නය්හිත්වා බලිං සෙනං–රාහුභද්දමුපාගමුං
සමයොදානි භද්දං තෙ–භික්ඛූනං සමිතිං වනං.

---

තදා, එකල්හි; නාගරාජානං, නාරජුන්ට; අභයං ආසි, නිර්භය වූයේය; බුද්ධො, සර්වඥතෙම; සුපණ්ණතො, ගුරුළන් කෙරෙන්; ඛෙම මකාසි, නිර්භය කෙළේය; නාගා, නාගයෝ ද; සුපණ්ණා, ගුරුළෝද; සණ්හාහි වාචාහි, මොළොක් වචනවලින්; උපව්හයන්තා, (ඔවුනොවුන්) කැඳවන්නාහු; බුද්ධං, බුදුන්; සරණං අගංසු, සරණ කොට ගියාහුය;

වජිරහත්ථෙන, විදුරත් නම් ලද සක්දෙව්රජහු විසින්; ජිතා, ජයගන්නා (පරදවන) ලද; සමුද්දං සිතා, මුහුද ඇසුරුකළාවූ; වාසවස්ස භාතරො, සක්දෙව්රජහුට (සුජාතාවන්ගේ සම්බන්ධයෙන්) සහෝදර වූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇති; යසස්සිනො, යශස් ඇති; එතෙ අසුරා, මේ අසුරයෝ ද; (ආවාහුය.)

කාලකඤ්ජා, (ඒ අසුරයන් අතුරෙහි) කාලකඤ්ජා නම් අසුර යෝ; මහාභිංසා, මහත් භයජනක වූ ආත්මභාව මවාගෙන ආවාහුය; දානවෙඝසා අසුරා, දාන වෙඝස නම් අසුරයෝ ද; වෙපචිත්ති සුචිත්ති ච, වෙපචිත්තිය සුචිත්තිය; පහාරාදො; පහාරාද නම් අසුරේන්ද්‍රය යන අසුරයෝ ද; (ආවාහුය) නමුචි සහ, වසවත් මර ද ඔවුන් සමග ආයේය;

සබ්බෙ, සියල්ලෝ; වෙරොචනාමකා, වෙරොච යන නම් ඇති; බලිපුත්තානං, බලිනම් අසුරයාගේ පුත්‍රයන්; සතං ච, සියයක්ද; බලිං සෙනං, බලසෙනග ගෙන; සන්නය්හිත්වා සැරහී; රාහුභද්දමුපාගමුං, රාහුඅසුරේන්ද්‍රයා කරා පැමිණියෝය; තෙ, ඔබවහන්සේට; භද්දං, යහපතක් වේවා; ඉදානි, දැන්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂූන් දක්නට; වනං, මහාවනයට යාමට; සමයො, සුදුසුකාලය වේ;

ආපො ච දෙවා පඨවී ච-තෙජො වායො තදාගමුං
වරුණා වාරුණා දෙවා-සොමො ච යසසා සහ.

මෙත්තා කරුණා කායිකා-ආගු දෙවා යසස්සිනො
දසෙතෙ දසධා කායා-සබ්බෙ නානත්තවණ්ණිනො.

ඉද්ධිමන්තො ජුතීමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

වෙණ්හු ච දෙවා සහලී ච-අසමා ච දුවෙ යමා
චන්දස්සූපනිසා දෙවා-චන්දමාගු පුරක්ඛත්වා.

සූරියස්සූපනිසා දෙවා-සූරියමාගු පුරක්ඛත්වා
නක්ඛත්තානි පුරක්ඛත්වා-ආගු මන්ද වලාහකා.

වසූනං වාසවො සෙට්ඨො-සක්කොපාග පුරින්දදො
දසෙතෙ දසධා කායා-සබ්බෙ නානත්තවණ්ණිනො.

---

ආපොච දෙවා, ආපෝ දෙවතාවෝ ද; පඨවී ච, පෘථිවී දෙවතාවෝ ද; තෙජො. තෙජෝ දෙවතාවෝද; වායො, වායො දෙවතාවෝ ද; වරුණා වාරුණා දෙවා, වරුණය වාරුණය යන දෙවියෝද; සොමො ච, සෝම් නම් දෙවිතෙමේ ද; තදා, එකල්හි; යසසාසහ, යස නම් දෙවියන් සමඟ; ආගමුං, ආවාහුය;

යසස්සිනො, යශස් ඇත්තාවූ; මෙත්තා කරුණා කායිකා, මෙත්තාකායික ය කරුණාකායික ය යන; දෙවා දෙවියෝ ද; ආගු, ආවාහුය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නා නා වර්ණවත්වූ, දසධා කායා, දශවිධ කොට්ඨාසයක් වූ; ඉද්ධිමන්තො —පෙ—එතෙදස, මේ දශප්‍රකාර දිව්‍යසමූහයා; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, මේ අහිත් භික්ෂුසමූහයා දක්නට; වනං, මහාවනයට; අභික්කාමුං, ආවාහුය;

වෙණ්හුච දෙවා, වෙණ්හුනම් දෙවියෝ ද; සහලීචදෙවා සහලී නම් දෙවියෝ ද; අසමා ච දෙවා, අසම නම් දෙවියෝ ද; දුවෙයමා දෙවා, වෙයමක නම් දෙවියෝ ද; චන්දස්සූපනිසා දෙවා, චන්ද්‍ර දිව්‍ය රාජයා පිරිවරා වාසයකරන්නා වූ සියලු දෙවියෝ ද; චන්දං පුරක්ඛත්වා ආගු, චන්ද්‍ර දිව්‍යරාජයා ඉදිරිකොට රැස්වූවාහුය;

සූරියස්සූපනිසා දෙවා, හිරු ඇසිරුකරන දෙවියෝ ද; සූරියමාගු පුරක්ඛත්වා, සූර්‍ය්‍ය දිව්‍යරාජයා පෙරටුකොට ආවාහුය; නක්ඛත්තානි පුරක්ඛත්වා, නැකැත්තරු ඇසිරුකරන දෙවියෝ ද; නක්ෂත්‍රයන් පෙරටුකොට ආවාහුය; මන්දවලාහකා ආගු, මන්දවලාහක නම් දෙවියෝ ද ආවාහුය;

වසූනං, වසුදෙවියන්ට; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨ වූ; වාසවො, වාසව නම් වූද; පුරින්දදො, පුරින්දද නම් වූ සක්කො අපි, සක්දෙව් රජ

ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

අථාගු සහභූ දෙවා-ජලමග්ගිසිඛාරිව
අරිට්ඨකා ච රොජා ච-උම්මා පුප්ඵ නිභාසිනො.

වරුණා සහ ධම්මා ච-අච්චුතා ච අනෙජකා
සූලෙය්‍ය රුචිරා ආගු-ආගු වාසවනෙසිනො.

දසෙතෙ දසධා කායා-සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

සමානා මහාසමානා-මානුසා මානුසුත්තමා
ඛිඩ්ඩාපදූසිකා ආගු-ආගු මනොපදූසිකා.

---

තෙමේද; ආග, ආයේය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො' නානාවර්‍ණ ඇත්තා වූ: ඉඩ්ඩිමන්තො —පෙ— එතෙ දස, මේ දශ දෙන; දසධා කායා, දශපරිද්දක් වූ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං සමිතිං, අහිත් භික්ෂුසමූහයා දක්නට; වනං, මහාවනයට; අභික්කාමුං, ආවාහුය;

අථ, නැවත; සහභූ දෙවා, සහභූ නම් දෙවියෝ ද; අග්ගිසිඛාඉව, ගිනිසිළුමෙන්; ජලං, දිලියෙමින්; නොහොත්: ජලමග්ගිසිඛාරිව, ජලමග්ගිශිඛාරිවය යන නම්ඇති දෙවියෝද; ආගු, ආවෝය; අරිට්ඨකා ච, අරිට්ඨක නම් දෙවියෝ ද; රොජා ච, රොජනම් දෙවියෝ ද; උම්මා පුප්ඵ නිභාසිනො, දියබෙරලිය මල්පැහැයෙන් බබලන හෙයින් උම්මාපුප්ඵ නම් දෙවියෝ ද; (රැස්වූවාහුය.)

වරුණා, වරුණ දෙවියෝ ද; සහධම්මා ච, සහධම්ම දෙවියෝ ද; අච්චුතා ච, අච්චුත දෙවියෝද; අනෙජකා, අනෙජක දෙවියෝ ද; සූලෙය්‍ය, සූලෙය්‍ය දෙවියෝ ද; රුචිරා, රුචිර දෙවියෝද; ආගු, ආවාහුය; වාසවනෙසිනො, වාසවනෙසී නම් දෙවියෝ ද; ආගු, ආවෝය;

සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නානාවර්‍ණවත්වූ; දසධාකායා, දශපරිද්දෙකින්; ඉඩ්ඩිමන්තො —පෙ— එතෙදස, මේ දස දිව්‍ය සමූහයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං සමිතිං, අහිත් භික්ෂූන් දැකිම පිණිස; වනං, මහා වනයට; අභික්කාමිං, ආවාහුය;

සමානා, සමානය; මහාසමානා, මහාසමානය; මානුසා, මානුසය; මානුසුත්තමා, මානුසුත්තමය යන දෙවියෝ; ආගු, ආවාහුය; ඛිඩ්ඩාපදූසිකා, ඛිඩ්ඩාපදූසිකාය; මනොපදූසිකා, මනොපදූසිකාය යන දෙවියෝ ද; ආගු, ආවෝය;

අථාගු හරයො දෙවා-යෙ ච ලොහිත වාසිනො
පාරගා මහාපාරගා-ආගු දෙවා යසස්සිනො.

දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො-වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

සුක්කා කරුමහා අරුණා-ආගු වෙඝනසා සහ
ඔදාතගය්හා පාමොක්ඛා-ආගු දෙවා විචක්ඛණා.

සදාමත්තා හාරගජා-මිස්සකා ච යසස්සිනො
ථනයං ආග පජ්ජුන්නො-යො දිසා අභිවස්සති.

දසෙතෙ දසධා කායා-සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං-භික්ඛූනං සමිතිං වනං.

ඛෙමියා තුසිතා යාමා-කට්ඨකා ච යසස්සිනො
ලම්බිතකා ලාමසෙට්ඨා-ජොතිනාමා ච ආසවා.

---

අථ, නැවත; හරයො දෙවා, හර නම් ඇති දෙවියෝ ද; යෙච ලොහිතවාසිනො, ලොහිතවාසී නම් වූ යම් දෙවිකෙනෙක් වෙත් නම් ඔහුද; ආගු, ආවෝය; යසස්සිනො, යශස් ඇත්තාවූ; පාරගා, පාරග නම් වූ ද; මහාපාරගා, මහාපාරග නම් වූ ද; දෙවා, දෙවියෝ ද; ආගු, ආවාහුය;

දසෙතෙ —පෙ— සුක්කා, සුක්කාය; කරුමහා, කරුමහාය; අරුණා, අරුණාය යන දෙවියෝ ද; සහ, ඔවුන් සමඟ; වෙඝනසා, වෙඝනස නම් දෙවියෝ ද; ආගු, ආවාහුය; ඔදාතගය්හා, ඔදාතගය්හ නම් වූ; පාමොක්ඛා පාමොක්ඛ දේවතාවෝ ද; විචක්ඛණා දෙවා, විචක්ඛණ නම් වූ දෙවියෝ ද; ආගු ආවාහුය;

සදාමත්තා, සදාමත්ත නම් දෙවියෝ ද; හාරගජා, හාරගජ නම් දෙවියෝද; යසස්සිනො, යශස් ඇත්තා වූ; මිස්සකා ච, මිස්සක නම් දෙවියෝ ද; (ආවාහුය) යො, යම් දෙවියෙක්; දිසා, දිගුන්; අභිවස්සති, වර්‍ෂාකෙරේද; පජ්ජුන්නො, (ඒ) ප්‍රද්‍යුන්න නම් දෙවිතෙමේ; ථනයං, මෙඝනාද කොරෙමින්; ආග, ආයේය;

දසෙතෙ —පෙ— ඛෙමියා, ඛෙමිය නම් දෙවියෝද; තුසිතා, තුසිතපුරවාසී දෙවියෝ ද; යාමා, යාම දෙව්ලෝවැසි දෙවියෝද; යසස්සිනො. යශස් ඇත්තාවූ; කට්ඨකාච, කට්ඨක නම් දෙවියෝද; ලම්බිතකා ලම්බිතක නම් දෙවියෝද; ලාමසෙට්ඨා ලාමසෙට්ඨ නම් දෙවියෝ ද; ජොතිනාමාච, ජොති නම් දෙවියෝ ද; ආසවා, ආසව නම් දෙවියෝද; ආගු, ආවාහුය;

නිම්මානරතිනො ආගු - අථාගු පරනිම්මිතා
දසෙතෙ දසධා කායා - සබ්බෙ නානත්තවණ්ණිනො.

ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං.

සට්ඨෙතෙ දෙවනිකායා - සබ්බෙ නානත්තවණ්ණිනො
නාමන්වයෙන ආගඤ්ඡුං - යෙචඤ්ඤෙ සදිසා සහ.

පවුත්ථජාතිං අඛිලං - ඔඝතිණ්ණමනාසවං
දක්ඛෙමොඝතරං නාගං - චන්දංව අසිතාතිගං.

සුබ්‍රහ්මා පරමත්තො ච - පුත්තා ඉද්ධිමතො සහ
සනංකුමාරො තිස්සො ච - සොපාග සමිතිං වනං.

---

නිම්මානරතිනො, නිර්මාණ රතී නම් දෙවියෝද; ආගු, ආවාහුය; අථ, නැවත; පරනිම්මිතා, පරනිර්මිත වශවර්ති දෙවියෝද; ආගු ආවාහුය; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාමත් වූ; දසධා කායා, දශප්‍රකාර වූ; ඉද්ධිමන්තො —පෙ—

එතෙ සට්ඨී දෙවනිකායා, මේ සැටක් දිව්‍යසමූහයෝ; සබ්බෙ; සියල්ලෝ; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාමත් වූවෝ; නාමන්වයෙන, නාමගොත්‍රාස වශයෙන් හෙවත් නම තමන්ගේ නම් ගොත් වශයෙන්; ආගඤ්ඡුං, ආවාහුය; යෙචඤ්ඤෙ, (දසදහසක් ලොකධාතුයෙහි සෙසු චක්‍රවාටයන්හි) යම් අනික් දෙවතා කෙනෙක්; සදිසා, නම් ආදියෙන් ඔවුන් හා සදෘශ වෙත් නම් ඔහු ද; සහ, ඔවුන් සමඟ ආවාහුය;

පවුත්ථජාතිං, වැස නිම වූ ජාතිඇති; අඛිලං, කෙලෙස් උල් රහිතවූ; ඔඝතිණ්ණං, කාමාදි චතුරොඝයන් තරණය කළාවූ; අනාසවං, චතුර්විධ ආශ්‍රව රහිත වූ ආයනී සඞ්ඝයාද; අසිතාතිගං, තෘෂ්ණා භාවය ඉක්ම වූ හෙවත් ෂොඩශ කලාවෙන් සම්පූර්ණ වූ; චන්දංව; චන්ද්‍රයාමෙන් ශොභාසම්පන්නවූ; ඔඝතරං, ඔඝයන් තරණයකළාවූ; නාගං, ආගුසංඛ්‍යාත පාපයන් නොකරන හෙයින් නාගනම් වූ බුදුන් ද; දක්ඛෙම, දක්නෙමු කියා; (ඒ පිණිසය)

ඉද්ධිමතො, සෘද්ධිමත්වූ බුදුන්ගේ; පුත්තා, පුත්‍රවූ; සුබ්‍රහ්මා, සුබ්‍රහ්මය; පරමත්තොච, පරමත්තය; යන ආයනී බ්‍රහ්මයෝද; සහ ඔවුන් සමඟ ආවාහුය; සනං කුමාරො, සනං කුමාරනම් බ්‍රහ්මයාද' සො තිස්සො ච අපි, ප්‍රසිද්ධ වූ තිස්ස නම් මහබඹුද; වනං, මහා වනයෙහි; සමිතිං, මේ මහා සමිතියට; උපාග, (අභීත් භික්ෂුසමූහයා දැකිම පිණිස) ආයේය;

සහස්සං බ්‍රහ්මලොකානං-මහා බ්‍රහ්මාභි තිට්ඨති
උපපන්නො ජුතිමන්තො-භිස්මා කායො යසස්සි සො.

දසෙත්ථ ඉස්සරා ආගු-පච්චෙක වසවත්තිනො
තෙසඤ්ච මජ්ඣතො ආග-හාරිතො පරිවාරිතො.

තෙ ච සබ්බෙ අභික්කන්තෙ සඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ
මාරසෙනා අභික්කාමුං-පස්ස කණ්හස්ස මන්දියං.

එථ ගණ්හථ බන්ධථ-රාගෙන බද්ධමත්ථු වෙ
සමන්තා පරිවාරෙථ-මා වො මුඤ්චිත්ථ කොචි නං.

ඉති තත්ථ මහාසෙනො-කණ්හසෙනං අපෙසයී
පාණිනා තලමාහච්ච-සරං කත්වාන භෙරවං.

---

උපපන්නො, (යම් බඹලොවක උපන්නාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නාවූ; භිස්මාකායො, (දෙතුන්මාගධ ග්‍රාමක්ෂේත්‍රයන් පමණ) මහත් කය ඇත්තාවූ; යසස්සිසො, ආත්මභාව ශ්‍රී සඞ්ඛ්‍යාත යශසින් සමන්නාගත වූ; මහාබ්‍රහ්මා, බ්‍රහ්මරාජයෙක්; අභිතිට්ඨති, (සෙසු බඹුන් තමාගේ ශරීරවර්ණයෙන්) මැඩපවත්වා සිටීද; බ්‍රහ්මලොකානං සහස්සං, (එබඳු) බඹලොව වැසි මහබඹුන් දහසක් (ආයේය;)

එත්ථ, මේ දහසක් බඹපිරිසෙහි; පච්චෙක වසවත්තිනො, වෙන් වෙන් වශයෙන් තමතමා වශභාවට පමුණුවන්නාවූ; දස ඉස්සරා අධිපති වූ බ්‍රහ්මරාජයෝ දශදෙනෙක්; ආගු, ආවෝය; තෙසං ච මජ්ඣතො, ඒ බඹුන් මැද; පරිවාරිතො, ඔවුන් විසින් පිරිවරන ලද; හාරිතො, හාරිත නම් බ්‍රහ්මරාජතෙමේ; ආග, ආයේය;

සඉන්දෙ, සක්දෙව්රජ ප්‍රධානකොට ඇත්තා වූ; දෙවෙ ච, දෙවියන්ද; සබ්‍රහ්මකෙ, හාරිතබ්‍රහ්මරාජයා ප්‍රධානකොට ඇත්තා වූ බඹුන්ද යන; තෙ සබ්බෙ, ඒ සියලුදිව්‍යබ්‍රහ්මයන්; අභික්කන්තෙ, පැමිණිකල්හි; මාරසෙනා, මාරසෙනාවෝ; අභික්කාමුං, පැමිණියාහුය; කණ්හස්ස මන්දියං, මාරයාගේ මූඪභාවයක්; පස්ස, බලව;

එථ, එව්; ගණ්හථ, අල්වාගනිව්; රාගෙන, රාග නමැති පාශයෙන්; බද්ධමත්ථුවේ, මේ සියලු මඬල බඳනාලද්දේ වේවා; සමන්තා, හාත්පසින්; පරිවාරෙථ, පිරිවරා සිටිව්; වො, තොප අතුරෙන්; කොචි, කිසි එකෙකුත්; නං, (ඒ දෙව්පිරිස අතුරෙන්) කිසිවකු; මා මුඤ්චිත්ථ; මුදා නොහරිව්;

ඉති, මෙසේ; තත්ථ, ඒ මහා සමාගමයෙහි; මහාසෙනො, මහත් සේනාඇති මාරතෙම; පාණිනා, අත්ලෙන්; තලං ආහච්ච, පොළෝතලයට ගසා, සවිජ්ජුකො, විදුලිය සහිතවූ; පාවුස්සකො,

යථා පාවුස්සකො මෙඝො-ථනයන්තො සවිජ්ජුකො
තදා සො පච්චුදාවත්ති-සංකුද්ධො අසයං වසී.
තඤ්ච සබ්බං අභිඤ්ඤාය-වවත්ථෙත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා-සාවකෙ සාසනෙ රතෙ.
මාරසෙනා අභික්කන්තා-තෙ විජානාථ භික්ඛවො
තෙ ච ආතප්පමකරුං-සුත්වා බුද්ධස්ස සාසනං.
වීතරාගෙහි පක්කාමුං-න සං ලොමම්පි ඉඤ්ජයුං
සබ්බෙ විජිතසංගාමා-භයාතීතා යසස්සිනො
මොදන්ති සහ භූතෙහි-සාවකා තෙ ජනෙ සුතාති.

මහාසමය සුත්තං.

"දීඝනිකායෙ"

---

වශීකරන්නාවූ; මෙඝො යථා, මෙඝයක් මෙන්; ථනයන්තො, ගර්ජනා කෙරෙමින්; භෙරවං සරං කත්වාන, බිහිසුණු ශබ්දයක් කොට; කණ්හසෙනං, මරසෙනඟ; අපෙසයි, මෙහෙයීය; තදා, එකල්හී; සො, ඒ වශවත්තෙමේ; අසයංවසී; දෙව්පිරිස තමාවසඟ කොට ගතනොහැක්කේ; සංකුද්ධො, අතිශයින් කිපියේ; පච්චුදාවත්ති, ආපසු ගියේය;

චක්ඛුමා, පසැස්ඇත්තාවූ; සත්ථා, ශාස්තෲන්වහන්සේ; තංච සබ්බං, ඒ සියල්ල; අභිඤ්ඤාය, මනාසේ දැන; වවත්ථෙත්වාන, ව්‍යවස්ථා කොට දැන; තතො, ඉක්බිති; සාසනෙරතෙ, සස්නෙහි ඇලුණාවූ; සාවකෙ, ශ්‍රාවකයන්; ආමන්තයී, ඇමතූසේක;

භික්ඛවො, මහණෙනි; මාරසෙනා, මරසෙන්හු; අභික්කන්තා, පැමිණියාහුය; තෙ, ඔවුන්; විජානාථ, දනිව්; තෙච, ඒ භික්ෂූහු ද; බුද්ධස්සසාසනං, බුදුන්ගේ පර්‍ය්‍යාප්ති ශාසනයයි කියනලද ධර්‍මවචනය; සුත්වා, අසා; ආතප්පමකරුං, කෙලෙස් තැවීමට වීර්‍ය්‍යකොළෝ; වීතරාගෙහි, පහවූ රාග ඇති ආර්‍ය්‍යයන් කෙරෙන්; අපක්කාමුං, (මාරයාත් මාරානුචරයෝත්) පහව ගියෝය; නසං ලොමම්පි ඉඤ්ජයුං, (ඒ වීතරාගීන්ගේ) ලෝමයකුදු කම්පා නොකළාහුය;

විජිත සඞ්ගාමා, ජයගත් මාරයුද්ධ ඇති; භයාතීතා, ඉක්මවන ලද බියඇති; යසස්සිනො, යශස් ඇත්තාවූ; ජනෙසුතා, ජනයන් අතුරෙහි ප්‍රකටවූ, තෙ සබ්බෙ සාවකා, ඒ සියලු බුදුසව්වෝ; භූතෙහි සහ, දිව්‍යබ්‍රහ්මාදි ආර්‍ය්‍යශ්‍රාවකයන් සමඟ; මොදන්ති, සතුටුවෙත්;

මහාසමය සුත්තං, මහාසමය සූත්‍රයයි;

——:o:——

"දීඝනිකායෙ, දීඝනිකායෙහි ය;

"මතක භත්තාදිසු තිරොකුඩ්ඩාදි අනුමොදනං"

තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති-සන්ධිසිඞ්ඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති-ආගන්ත්වාන සකං ඝරං.

පහූතෙ අන්නපානම්හි-ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති-සත්තානං කම්මපච්චයා.

එවං දදන්ති ඤාතීනං-යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන-කප්පියං පානභොජනං
ඉදං වො ඤාතීනං හොතු-සුඛිතා හොන්තු ඤාතයො.

තෙ ච තත්ථ සමාගන්ත්වා-ඤාතිපෙතා සමාගතා
පහූතෙ අන්නපානම්හි-සක්කච්චං අනුමොදරෙ

---

මතකභත්තාදිසු, මතකබත් ආදීන්හි; තිරොකුඩ්ඩාදි අනුමොදනං, තිරොකුඩ්ඩ සූත්‍රාදි අනුමෝදනාව කළ යුතුයි;

සකං ඝරං, සවකීය ගෘහයට; ආගන්ත්වාන, (ඥතිප්‍රේතයෝ) අවුත්; තිරොකුඩ්ඩෙසු, පවුරෙන් පිටත්හිද; සන්ධි සිඞ්ඝාටකෙසු ච සතරමංසන්ධි තුන්මංසන්ධි ගෘහ සන්ධි භිත්ති සන්ධි ආලොකසන්ධි සඞ්ඛ්‍යාත සන්ධි ස්ථානයන්හිද; ද්වාරබාහාසු, නගරද්වාර ගෘහ ද්වාර යන්ගේ බා තිස්‍ස ද; තිට්ඨන්ති, සිටිත්;

පහූතේ, බොහෝවූ; අන්නපානම්හි, ආහාරපානද; ඛජ්ජ භොජ්ජෙ, ඛාද්‍යභොජ්‍යයද; උපට්ඨිතෙ, රැස්කොට සිටිකල්හි; තෙසං සත්තානං, (ඒ ප්‍රේතලෝකයෙහි උපන්නාවූ) සත්වයන්ගේ; කම්මපච්චයා, අකුශල කර්මය හේතුකොට ගෙන; කොචි, (මවුපිය ආදි) කිසිවෙක්; න සරති, (ඔවුන්) සිහි නො කෙරෙයි;

යෙ, යම් පුත්‍ර ධීත්‍රෘ ආදිනොතෙක්; ඤාතීනං, ඥති ප්‍රේතයන්ට; අනුකම්පකා හොන්ති, අනුකම්පා ඇත්තානු වෙත්ද; (ඔවුහු) සුචිං, නිර්මලවූ; පණීතං, ප්‍රණීතවූ; කප්පියං, ශ්‍රමණයන්ට කැප සරුප්වූ; පානභොජනං, පාන භොජනාදි දෙය ධර්මය; කාලෙන, (ඥතිප්‍රේතයන් අවුත් තිරොකුඩ්ඩාදිය නිසා සිටි) සුදුසු කල්හි; ඤාතීනං, ඥති ප්‍රේතයන්ට; ඉදං වො හොතු, මේ පින වේවා; ඤාතයො, ඥතිප්‍රේතයෝ; සුඛිතාහොන්තු, සුවපත්වෙත්වා කියා; එවං දදන්ති, මෙ පරිද්දෙන් පමුණුවත්;

තෙ ච ඤාති පෙතා, ඒ ඥතිප්‍රේතයෝද; තත්ථ, ඒ දන්දෙන ස්ථානයට, සමාගන්ත්වා, (නොයෙක් දිගින්) අවුත්; සමාගතා, රැස් වූවාහු; පහූතෙ, බොහෝවූ; අන්නපානම්හි, ආහාර පාන විෂයෙහි; (තමා උදෙසා දෙනු ලබන කල්හි); සක්කච්චං, සකස්කොට; කම් පල සලකා) අනුමොදරෙ, පින් අනුමෝදන් වන්නාහුය;

චිරං ජීවන්තු නො ඤාති-යෙසං හෙතු ලභාමසෙ
අම්හාකඤ්ච කතා පූජා දායකා ච අනිප්ඵලා
නහි තත්ථ කසී අත්ථි-ගොරක්ඛෙත්ථ න විජ්ජති.
වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං
ඉතො දින්නෙන යාපෙන්ති-පෙතා කාලකතා තහිං.
උන්නමෙ උදකං වට්ටං-යථා නින්නං පවත්තති
එවමෙව ඉතො දින්නං-පෙතානං උපකප්පති.
යථා වාරිවහා පූරා-පරිපූරෙන්ති සාගරං
එවමෙව ඉතො දින්නං-පෙතානං උපකප්පති.
අදාසි මෙ අකාසි මෙ-ඤාතිමිත්තා සඛා ච මෙ
පෙතානං දක්ඛිණං දජ්ජා-පුබ්බෙ කතමනුස්සරං.

---

යෙසං හෙතු, යම් කෙනකුන් කාරණකොට ගෙන; ලභාමසෙ, (මේ සම්පත් අපි) ලබමෝද; නො ඤාති, (ඒ) අපගේ නෑයෝ; චිරං ජීවන්තු, බොහෝ කලක් ජීවත් වෙත්වා; අම්හාකං ච, අපට ද; පූජා කතා, (ඔවුන් විසින්) පූජා කළාහුය; දායකා ච, (ඒ කුශලකර්මය කළ) දායකයෝ ද; අනිප්ඵලා, නිෂ්ඵල නොවන්නාහුයයි පසසත්;

තත්ථ, ඒ ප්‍රේත ලෝකයෙහි; කසී, සීසෑමක්; නහි අත්ථි, නැත් තේමය; එත්ථ, මේ ප්‍රේත ලෝකයෙහි; ගොරක්ඛා, ගෙරින් රක්‍ෂා කිරීමෙක් (ද); න විජ්ජති, විද්‍යමාන නොවේ; හිරඤ්ඤෙන, රන්රිදි යෙන්; කයාක්කයං, විකිණීම් ගැනීම් සඞ්ඛ්‍යාත ද්‍රව්‍ය හුවමාරුව කුත් නැත්තේය; තාදිසා වණිජ්ජා, එබඳු අතිත් වෙළෙඳමකුත්; නත්ථි, නැත්තේය; කාලකතා, කාලක්‍රියා කළා වූ; පෙතා, ප්‍රේතයෝ; ඉතො, මේ මනුෂ්‍ය ලෝකයෙන්; දින්නෙන දෙනලද දක්‍ෂිණාව හේතුකොට ගෙන; තහිං, ඒ ප්‍රේත ලෝකයෙහි; යාපෙන්ති, යැපෙත්; (හෙවත් සැප ලබන්නාහයි වදාළසේක )

උන්නමෙ, උස් ප්‍රදෙශයෙහි; වට්ටං, වස්නාලද; උදකං, ජලය; නින්නං, නිම්නස්ථානයට හෙවත් පහත් ප්‍රදෙශයට; යථා, යම්සේ; පවත්තති, වැවේද; (ගලාබසීද) එවං එව, එපරිද්දෙන්ම; ඉතො, මේ මනුෂ්‍ය ලෝකයෙන්; දින්නං, ඤාතිමිත්‍රාදීන් විසින් දෙන ලද දානය; පෙතානං, ප්‍රේතයන්ට; උපකප්පති, පැමිණේ;

පූරා, පිරුණාවූ; වාරිවහා, මහානදීහු; සාගරං, සමුද්‍රය; (කරු ණෙගාස්) යථාපූරෙන්ති, යම්සේ පිරෙද්ද; එවං එව, එපරිද්දෙන්ම; ඉතො දින්නං, මෙ ලෙසින් දෙනලද පුණ්‍යඵය; පෙතානං, ප්‍රේත යන්ට; උපකප්පති, පැමිණෙන්නේයයි; (වදාළසේක )

මෙ, මාගේ; ඤාති, නෑයෝද; මිත්තා, මිත්‍රයෝද; සඛා ච, යහළු වෝද; මෙ, මට; අදාසි (මෙබඳු සම්පත්) දුන්නේයයි කියාද; මෙ,

නහි රුණ්ණං ව සොකො වා–යාවඤ්ඤා පරිදෙවනා
න තං පෙතානමත්ථාය–එවං තිට්ඨන්ති ඤාතයො.

අයං ඛො දක්ඛිණා දින්නා-සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා
දීඝරත්තං හිතායස්ස-ඨානසො උපකප්පති.

සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතානං පූජා ච කතා උළාරා
බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකන්ති

තිරොකුඩ්ඩ සුත්තං.

---

මට; අකාසි, (මෙබඳු කෘත්‍යයක්) කොළේයයි කියාද; පුබ්බෙකතං, පෙර කළාවූ උපකාරය; අනුස්සරං, සිහිකරන්නාවූ කෘතඥ තෙම; පෙතානං, ප්‍රේතයන් උදෙසා; දක්ඛිණං දජ්ජා, දක්ෂිණාව දෙන්නේය;

රුණ්ණං වා, හැඬීම හෝ; සොකො වා, ශෝක කිරීම හෝ; යා ච අඤ්ඤා පරිදෙවනා, යම් අන්‍යවූ වැලපීමක් හෝ; නහි, ප්‍රේතයන්ට හෝ තමහට වැඩක් පිණිස) නොවන්නේමය; ඤාතයො, නෑයෝ; එවං තිට්ඨන්ති, මෙසේ (හැඬීම් ආදිය කෙරෙමින්) සිටිද්ද; තං, ඒ සිටීම; පෙතානං, ප්‍රේතයන්ට; අත්ථාය, වැඩපිණිස; න, නොවේ; (හුදෙක් තමහට පීඩා පිණිසම වේ.)

සංඝම්හි, සංඝයා කෙරෙහි; සුප්පතිට්ඨිතා, මනාකොට පිහිටියාවූ; දින්නා, දෙනලද්දාවූ; අයං ච ඛො දක්ඛිණා, මේ දක්ෂිණාව වනාහී; අස්ස, මේ ප්‍රේත ජනයාහට; දීඝරත්තං, දීර්ඝ කාලයක් මුළුල්ලෙහි; හිතාය, හිත පිණිස; ඨානසො, ස්ථාන වශයෙන්, උපකප්පති, පැමිණෙයි;

සො අයං ඤාතිධම්මො ච, ඒ මේ (මියගිය නෑයන්ට ජීවත් වන නෑයන් විසින් කටයුතු වූ කෘත්‍යය කිරීමෙන්;) ඥාති ධර්මයද; නිදස්සිතො, (දක්ෂිණාව දෙන්නාවූ තොප විසින් මහ ජනයාට) දක්වන ලද්දේය; පෙතානං, ප්‍රේතයන්ට; උළාරා පූජා ච, (දිව්‍ය සම්පත් ලබා දෙන්නහු විසින්) මහත්වූ පූජාවක් ද; කතා, කරන ලදී; භික්ඛූනං, භික්ෂූන්ට; බලං ච, බලයද; අනුප්පදින්නං, අනුප්‍රදානය කරන ලදී; තුම්හෙහි; තොප විසින්; අනප්පකං, ස්වල්ප නොවූ; පුඤ්ඤං, කුශලයක්ද; පසුතං ඉති; රැස්කරන ලද්දේ යයි; (වදාළ සේක.)

තිරොකුඩ්ඩ සුත්තං, තිරොකුඩ්ඩ සූත්‍රයයි;

——:o:——

"ඉදං පන තිරොකුඩ්ඩසුත්තං භගවතා රඤ්ඤො මාගධස්ස පෙතානං උද්දිස්ස දින්නදානානුමොදනත්ථං වුත්තං."

ඉතො කිර ද්වෙනවුතිකප්පෙ කාසී නාම නගරං අහොසි තත්ථ ජයසෙනො නාම රාජා, තස්ස සිරී නාම දෙවී, තස්සා කුච්ඡියං ඵුස්සො නාම බොධිසත්තො නිබ්බත්තිත්වා අනුපුබ්බෙන සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣි, ජයසෙනො නාම රාජා මම පුත්තො අභිනික්ඛමිත්වා බුද්ධො ජාතො මය්හමෙව බුද්ධො මය්හං ධම්මො මය්හං සඞ්ඝොති මමත්තං උප්පාදෙත්වා සබ්බකාලං සයමෙව උපට්ඨහති න අඤ්ඤෙසං ඔකාසං දෙති.

භගවතො කනිට්ඨභාතරො වෙමාතිකා තයො භාතරො චින්තෙසුං බුද්ධා නාම සබ්බලොකහිතාය උප්පජ්ජන්ති න එකස්සෙව අත්ථාය අම්හාකඤ්ච පිතා අඤ්ඤෙසං ඔකාසං න දෙති කථන්නු

---

ඉදං තිරොකුඩ්ඩසුත්තං පන, මේ තිරොකුඩ්ඩ සූත්‍රය වනාහී; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; මාගධස්සරඤ්ඤො, මගධෙශ්වරවූ, බිම්සර රජහුට; පෙතානං උද්දිස්ස, ප්‍රේතයන් උදෙසා; දින්නදානානුමොදනත්ථං, දෙනලද දානානුමෝදනාව පිණිස; වුත්තං, වදාරන ලදී;

ඉතො කිර, මෙයින් වනාහී; ද්වෙනවුතිකප්පෙ, අනූදෙවන කල්පයෙහි; කාසිනාම නගරං අහොසි, කසී නම් නුවරෙක් වූයේය; තත්ථ, එහි; ජයසෙනොනාම, ජයසෙන නම්; රාජා, රජෙක් වූයේය; තස්ස, ඒ රජහුට; සිරීනාම දෙවී, සිරී නම් දේවියක් වූවාය; තස්සා, ඈගේ; කුච්ඡියං, කුසෙහි; ඵුස්සොනාම, ඵුස්ස නම්වූ; බොධිසත්තො, බෝසත් තෙම; නිබ්බත්තිත්වා, ඉපද; අනුපුබ්බෙන, පිළිවෙළින්; සම්මාසම්බොධිං, සම්‍යක්සම්බොධිය; අභිසම්බුජ්ඣි, අවබොධකළේය; ජයසෙනො නාම රාජා, ජයසේන නම් රජ තෙම; මම, මාගේ; පුත්තො, පුත්‍රතෙම; අභිනික්ඛමිත්වා, මහාභිනිෂ්ක්‍රමණය කොට; බුද්ධොජාතො, බුදුවූයේය; බුද්ධො, බුදුරජ තෙම, මය්හං එව, මාගේමය; ධම්මො, ධර්මය තෙම; මය්හං, මාගේමය; සඞ්ඝො, සංඝ තෙම; මය්හං එව ඉති මාගේමයයි; මමත්තං, මමත්වය; උප්පාදෙත්වා, උපදවා; සබ්බකාලං, සියලු කාලයෙහි; සයමෙව, තෙමේම; උපට්ඨහති, උපස්ථානය කෙරෙයි; අඤ්ඤෙසං, අන්‍යයන්ට; ඔකාසං, අවකාශයක්; නදෙති, නො දෙයි; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; කනිට්ඨභාතරො, බාලමලණු වූ; වෙමාතිකා, (දෙවන මහිෂිකාවගේ පුත්‍ර හෙයින්) වෙනස්වූ මව්වරුන් ඇති; තයො භාතරො, සහෝදරයෝ තුන්දෙන; චින්තෙසුං, මෙසේ සිතූවාහුය; බුද්ධා නාම, බුදුවරයෝ නම්; සබ්බලොකහිතාය, සියලු ලෝවැස් සත්ව හිතපිණිස; උප්පජ්ජන්ති, උපදිත්; එකස්සෙව, එකකු හටම;

මයං ලභෙය්‍යාම භගවන්තං උපට්ඨාතුන්ති. තෙසං එතදහොසි හන්ද මයං කිඤ්චි උපායං කරොමාති තෙ පච්චන්තං කුපිතං විය කාරාපෙසුං තතො රාජා පච්චන්තො කුපිතොති සුත්වා තයොපි පුත්තෙ පච්චන්තං වූපසමනත්ථං පෙසෙසි තෙ ගන්ත්වා වූපසමෙත්වා ආගතා, රාජා තුට්ඨො වරං අදාසි යං ඉච්ඡථ තං ගණ්හථාති, තෙ මයං භගවන්තං උපට්ඨාතුං ඉච්ඡාමාති ආහංසු, රාජා එතං ඨපෙත්වා අඤ්ඤං ගණ්හථාති ආහ, තෙ මයං අඤ්ඤෙන අනත්ථිකාති ආහංසු, තෙනහි පරිච්ඡෙදං කත්වා ගණ්හථාති, තෙ සත්තවස්සානි යාචිංසු රාජා න අදාසි, එවං ඡ පඤ්ච චත්තාරි තීණි ද්වෙ එකං සත්තමාසාති

---

නව අර්ථය, ප්‍රයෝජනය පිණිස නොවෙයි; අම්හාකං, අපගේ; පිතා ච, පියතෙමේ ද; අඤ්ඤෙසං, අනුන්ට; ඔකාසං, අවකාශයක්; නදෙති, නොදෙයි; මයං, අපි; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; උපට්ඨාතුං, උපස්ථානය කරන්ට; කථන්නු. කෙසේ නම් ලභෙය්‍යාම ඉති, ලබමුදැයි; හන්ද, එබැවින්; මයං, අපි; කිඤ්චි උපායං, කිසි උපායක්; කරොම ඉති, කරමුයයි; එතං, මේ සිත; තෙසං, ඔවුන්ට; අහොසි, වූයේය; තෙ, ඔව්හු; පච්චන්තං, ප්‍රත්‍යන්ත, වැසියා; කුපිතං විය කාරාපෙසුං, කිපුණාක් මෙන් කෙරෙව්වාහුය; තතො, එහෙයින්; රාජා, රජතෙම; පච්චන්තො ප්‍රත්‍යන්තය තෙම; කුපිතො ඉති, කිපියේ යයි; සුත්වා, අසා; තයොපි පුත්තෙ, පුත්‍රයන් තුන්දෙනාම; පච්චන්ත වූපසමනත්ථං, ප්‍රත්‍යන්ත (කලහ) ව්‍යපසමනය පිණිස; පෙසෙසි, යැව්වේය; තෙ, ඔහු තුමූ; ගන්ත්වා, ගොස්; වූපසමෙත්වා, ව්‍යපසමනය කොට; ආගතා, ආවාහුය; රාජා, රජතෙම; තුට්ඨො, සතුටුවූයේ; යං, යමක්; ඉච්ඡථ, කැමැතිවව් නම්; තං, එය; ගණ්හථ ඉති, ගනිව් යයි; වරං, වරයක්; අදාසි, දුන්නේය; තෙ ඔහුතුමූ; මයං, අපි; භගවන්තං, භාග්‍ය වතුන් වහන්සේට; උපට්ඨාතුං, උපස්ථානය කරන්ට; ඉච්ඡාම ඉති; කැමැත්තෙමු යයි; ආහංසු, කීවාහුය; රාජා, රජතෙම; එතං, මෙය; ඨපෙත්වා, තබා; අඤ්ඤං, අනිකක්; ගණ්හථ ඉති, ගනිව්යයි; ආහ, කීයේය; අඤ්ඤෙන අනිකකින්; අනත්ථිකා ඉති, ප්‍රයෝජන නැත්තෝ වෙමු යයි; ආහංසු, කීවාහුය; තෙනහි, එසේවීනම්; පරිච්ඡෙදං කත්වා, කාලපරිච්ඡෙදයක් කොට; ගණ්හථ ඉති, ගනිව් යයි; (කීයේය.)

තෙ, ඔව්හු; සත්තවස්සානි, සත් අවුරුද්දක්; යාචිංසු, ඉල්ලූවාහුය; රාජා, රජතෙම; න අදාසි, නොදුන්නේය; එවං, මෙසේ; ඡ, සය අවුරුදෙක; පඤ්ච, පස් අවුරුදෙක; චත්තාරි, සතර අවුරුදෙක; තීනි, තුන් අවුරුදෙක; ද්වෙ, දෑඅවුරුදෙක; එකං, එක

ඡ පක්ඛෙ චත්තාරිති යාව තෙ මාසං යාචිංසු රාජා ගණ්හථාති අදාසි- තෙ වරං ලභිත්වා පරමතුට්ඨා භගවන්තං උපසඞ්කමිත්වා වන්දිත්වා ආහංසු ඉච්ඡාම මයං භන්තෙ භගවන්තං තෙමාසං උපට්ඨාතුං අධිවාසෙතු නො භන්තෙ භගවා ඉමං තෙමාසං වස්සාවාසන්ති, අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

තතො තෙ අත්තනො ජනපදෙ නියුත්තකපුරිසස්ස ලෙඛං පෙසෙසුං ඉමං තෙමාසං අම්හෙහි භගවා උපට්ඨාතබ්බො, විහාරාදිං කත්වා සබ්බං භගවතො උපට්ඨානසම්භාරං සම්පාදෙහීති, සො තං සබ්බං සම්පාදෙත්වා පටිනිවෙදෙසි, තෙ කාසාව වත්ථනිවත්ථා හුත්වා අඩ්ඪතෙය්‍යෙහි පුරිසසහස්සෙහි වෙය්‍යාවච්චකරෙහි භගවන්තං සක්කච්චං උපට්ඨහමානා ජනපදං නෙත්වා විහාරං නිය්‍යාදෙත්වා

---

අවුරුද්දෙක; සත්තමාසානි, සත් මසෙක; ඡ, සය මසෙක, පක්ඛෙ, පස්මසෙක; චත්තාරි ඉති, සිව් මසෙකැයි; තෙමාසං යාව, තුන්මස දක්වා; යාචිංසු, ඉල්ලූවාහුය; රාජා, රජතෙම; ගණ්හථ ඉති, (තෙමස) ගනිව්යයි; අදාසි, දුන්නේය; තෙ, ඔව්හු; වරං, වරය; ලභිත්වා, ලැබ; පරමතුට්ඨා, උතුම්සතුට ඇත්තාහු; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ කරා; උපසඞ්කමිත්වා, එළඹ; වන්දිත්වා, වැඳ; ආහංසු, මෙසේ කීවාහුය; භන්තෙ, ස්වාමීනි; මයං, අපි; භගවන්තං, භාග්‍ය වතුන් වහන්සේට; තෙමාසං, තුන්මසක්; උපට්ඨාතුං, උපස්ථානය කරන්ට; ඉච්ඡාම, කැමැත්තෙමු; භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍ය වතුන් වහන්සේ; නො, අපගේ; ඉමං තෙ මාසං වස්සාවාසං, මේ තුන්මස වස්විසීම; අධිවාසෙතු ඉති, ඉවසා වදාළ මැනවැයි; (කීවා හුය) භගවා, භාග්‍යවතුන් වහන්සේ; තුණ්හීභාවෙන, තුෂ්ණීම් භාවයෙන්; අධිවාසෙසි, ඉවසූසේක;

තතො, නැවත; තෙ, ඔව්හු; අත්තනො, තමන්ගේ; ජනපදෙ, ජනපදයෙහි; නියුත්තක පුරිසස්ස, යෙදී සිටි පුරුෂයා හට; ඉමං තෙමාසං, මේ තුන්මස; අම්හෙහි, අප විසින්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; උපට්ඨාතබ්බො, උපස්ථාන කටයුත්තේය; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; විහාරාදිං කත්වා, විහාරාදිය කොට; සබ්බං උපට්ඨානසම්භාරං, සියලු උපස්ථාන සම්භාරය; සම්පාදෙහි ඉති, සම්පාදනය කරවයි; ලෙඛං, ලියුමක්; පෙසෙසුං, යැව්වාහුය; සො, හෙතෙම; තං සබ්බං, ඒ සියල්ල; සම්පාදෙත්වා, සම්පාදනය කොට; පටිනිවෙදෙසි, නැවත දන්වූයේය; තෙ, ඔවුහු; කාසාවවත්ථනිවත්ථා හුත්වා, කාෂායවස්ත්‍ර හැඳ පොරොවන ලද්දෝවූවාහු; වෙය්‍යාවච්චකරෙහි, වතාවත් කරන්නාවූ; අඩ්ඪතෙය්‍යෙහි පුරිසසහස්සෙහි, එක් දහස් පන්සියයක් පුරුෂයන් හා සමඟ; භගවන්තං, භාග්‍ය වතුන් වහන්සේට; සක්කච්චං, සකස්කොට; උපට්ඨහමානා, උප ස්ථාන කරන්නාහු. ජනපදං, ජනපදයට; නෙත්වා, පමුණුවා;

වස්සං වසාපෙසුං, තෙසං භණ්ඩාගාරිකො ගහපතිපුත්තො සපජාපතිකො සද්ධො අහොසි පසන්නො සො බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස දානවට්ටං සක්කච්චං අදාසි ජනපදෙ නියුත්තකපුරිසො තං ගහෙත්වා ජනපදෙහි එකාදස මත්තෙහි පුරිසසහස්සෙහි සද්ධිං සක්කච්චමෙව දානං පවත්තාපෙසි. තත්ථ කෙචි ජනපදා පටිඝතචිත්තා අහෙසුං තෙ දානස්ස අන්තරායං කත්වා දෙය්‍යධම්මං අත්තනාව ඛාදිංසු භත්තසාලඤ්ච අග්ගිනා දහිංසු පවාරිතෙ රාජපුත්තා භගවතො මහන්තං සක්කාරං කත්වා භගවන්තං පුරක්ඛත්වා පිතුනො සකාසමෙව අගමංසු තත්ථ ගන්ත්වා එවං භගවා පරිනිබ්බාසි

රාජා ච රාජපුත්තා ච ජනපදෙ නියුත්තකපුරිසො ච භණ්ඩාගාරිකො ච අනුපුබ්බෙන කාලං කත්වා සද්ධිං පරිසාය සග්ගෙ

---

විහාරං, විහාරය; නීයාදෙත්වා, පාවාදී; වස්සංවාසාපෙසුං, වස්වැසෙව්වාහුය; තෙසං, ඔවුන්ගේ; භණ්ඩාගාරිකො ගහපතිපුත්තො, භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රතෙම; සපජාපතිකො, භාර්‍ය්‍යාව සහිතව; සද්ධො අහොසි, ශ්‍රද්ධා ඇත්තේ වූයේය; පසන්නො, ප්‍රසන්නවූයේය; සො, හෙතෙම; බුද්ධපමුඛස්ස, බුද්ධප්‍රමුඛවූ; සංඝස්ස, සංඝයාට; දානවට්ටං, දන්වැට; සක්කච්චං, සකස්කොට; අදාසි, දුන්නේය; ජනපදෙ, ජනපදයෙහි; නියුත්තක පුරිසො, යෙදී සිටි පුරුෂතෙම; තං, එය; ගහෙත්වා, ගෙන; ජනපදෙහි, ජනපදවාසීවූ; එකාදසමත්තෙහි පුරිස සහස්සෙහි සද්ධිං, එකොළොස් දහසක් පමණ පුරුෂයන් හා සමඟ; සක්කච්චං එව, සකස්කොටම; දානං, දානය; පවත්තාපෙසි, පැවැත්වූයේය; තත්ථ, එහි; ජනපදා, ජනපදවාසීවූ; කෙචි, සමහරු; පටිහතචිත්තා, නැසුණු සැදැහැ සිත් ඇත්තාහු; අහෙසුං, වූවාහුය; තෙ, ඔවුහු; දානස්ස, දානයට; අන්තරායං කත්වා, අන්තරාය කොට; දෙය්‍යධම්මං, දියයුතු දාන වස්තුව; අත්තනාව, තමන් විසින්ම; ඛාදිංසු, කෑවාහුය; භත්තසාලං ච, බත්ගල ද; අග්ගිනා, ගින්නෙන්; දහිංසු, දැව්වාහුය;

පවාරිතෙ, වස් පැවරූ කල්හි; රාජපුත්තා, රාජපුත්‍රයෝ; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; මහන්තං සක්කාරං කත්වා, මහත්වූ පූජාසත්කාරය කොට; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පුරක්ඛත්වා, පෙරටුකොට; පිතුනො, පියරජහුගේ; සකාසමෙව, සමීපයටම; අගමංසු, ගියාහුය; තත්ථ, එහි; ගන්ත්වා, ගොස්; එවං, මෙසේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පරිනිබ්බාසි, පිරිනිවියේය; රාජා ච, රජතෙමේ ද; රාජපුත්තා ච, රාජපුත්‍රයෝ ද; ජනපදෙ, ජනපදයෙහි; නියුත්තක පුරිසොච, යෙදීසිටි පුරුෂ තෙමේ ද; භණ්ඩාගාරිකො ච, භාණ්ඩාගාරික තෙමේ ද; අනුපුබ්බෙන, පිළිවෙළින්; පරිසාය සද්ධිං, පිරිස හා සමඟ; කාලං කත්වා, කළුරියකොට; සග්ගෙ, ස්වර්ගයෙහි;

උප්පජ්ජිංසු පටිහතචිත්තා ජනා නිරයෙසු නිබ්බත්තිංසු එවං තෙසං චිත්තානං ගණ්ණානං සග්ගතො සග්ගං නිරයතො නිරයං උප්පජ්ජන්තානං චෙනවුති කප්පා වීතිවත්තා. අථ ඉමස්මිං භද්දකප්පෙ කස්සපස්ස බුද්ධස්ස කාලෙ තෙ පටිහතචිත්තා ජනා පෙතෙසු උප්පන්නා තදා මනුස්සා අත්තනො ඤාතකානං පෙතානං අත්ථාය දානං දත්වා උද්දිසන්ති අම්හාකං ඤාතීනං හොතූති තෙ සම්පත්තිං ලභන්ති. අථ ඉමෙ පෙතා තං දිස්වා භගවන්තං කස්සපං උපසඞ්කමිත්වා පුච්ඡිංසු. කින්නුඛො භන්තෙ මයම්පි එවරූපං සම්පත්තිං ලභෙය්‍යාමාති, භගවා ආහ ඉදානි න ලභෙථ අපිච ඛො අනාගතෙ ගොතමො නාම බුද්ධො භවිස්සති තස්ස භගවතො කාලෙ බිම්බිසාරො නාම රාජා භවිස්සති සො තුම්හාකං ඉතො චෙ නවුතිකප්පෙ ඤාති අහොසි සො බුද්ධස්ස දානං දත්වා තුම්හාකං උද්දිසිස්සති තදා ලභිස්සථාති එවං වුත්තෙ කිර තෙසං පෙතානං තං වචනං සෙව ලභිස්සථාති වුත්තං විය අහොසි.

---

උප්පජ්ජිංසු, උපන්නාහුය; පටිහතචිත්තාජනා, නැසුණු සැදැහැසිත් ඇති ජනයෝ; නිරයෙසු, නරකයන්හි; නිබ්බත්තිංසු, උපන්නාහුය; එවං, මෙසේ; සග්ගතො, ස්වර්ගයෙන්; සග්ගං. ස්වර්ගයටද; නිරයතො, නරකයෙන්; නිරයං, නරකයටද; උප්පජ්ජන්තානං, උපදින්නාවූ; තෙසං චිත්තානං ගණ්ණානං, ඒ දෙසමූහයාන්ට; චෙනවුති කප්පා. කල්ප අනූදෙකක්; වීතිවත්තා, ඉක්මුණාහුය;

අථ, ඉක්බිති; ඉමස්මිං භද්දකප්පෙ, මේ මහා භද්‍රකල්පයෙහි; කස්සපස්ස බුද්ධස්ස කාලෙ, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි; තෙ පටිහතචිත්තා ජනා, ඒ නැසුණු සැදැහැසිත් ඇති ජනයෝ; පෙතෙසු, ප්‍රේතයන් අතුරෙහි; උප්පන්නා, උපන්නාහුය; තදා, එකල්හි; මනුස්සා, මනුෂ්‍යයෝ; අත්තනො, තමන්ගේ; ඤාතකානං, නෑවූ; පෙතානං අත්ථාය, ප්‍රේතයන් උදෙසා; දානං දත්වා, දන්දී; අම්හාකං, අපගේ; ඤාතීනං, නෑයන්ට; හොතු ඉති, වේවායි; උද්දිසන්ති, උදෙසන්නාහුය; තෙ, ඒ ප්‍රේතයෝ; සම්පත්තිං, සම්පත්තිය; ලභන්ති, ලබත්; අථ, ඉක්බිති; ඉමෙ පෙතා, මේ ප්‍රේතයෝ; තං, එය; දිස්වා, දැක; කස්සපං භගවන්තං, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ කරා; උපසඞ්කමිත්වා, එළඹ; භන්තෙ, ස්වාමිනි; කින්නුඛො, කිමෙක් ද; මයම්පි, අපිද; එවරූපං, මෙබඳු; සම්පත්තිං, සම්පත්තියක්; ලභෙය්‍යාම ඉති, ලබන්නෙමුදැයි; පුච්ඡිංසු, විචාළාහුය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදානි, දැන්; න ලභෙථ, නොලබව්ය; අපිච ඛො, එතකුදුවුවත්; අනාගතෙ, අනාගතයෙහි; ගොතමො නාම, ගෞතම නම්; බුද්ධො, බුදුවරයෙක්තෙම; භවිස්සති, වන්නේය; තස්ස භගවතො කාලෙ, ඒ භාග්‍යවතුන්ගේ කාලයෙහි

අථ එකස්මිං බුද්ධන්තරෙ වීතිවත්තෙ අම්හාකං භගවා ලොකෙ උප්පජ්ජි තෙපි තයො රාජපුත්තා තෙහි අඩ්ඪතෙය්‍යෙහි පුරිස සහස්සෙහි සද්ධිං දෙවලොකා චවිත්වා මගධරට්ඨෙ බ්‍රාහ්මණකුලෙ උප්පජ්ජිත්වා අනුපුබ්බෙන ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා ගයාසීසෙ තයො ජටිලා අහෙසුං- ජනපදෙ නියුත්තපුරිසො රාජා අහොසි බිම්බිසාරො භණ්ඩාගාරිකො ගහපති විසාඛො නාම මහාසෙට්ඨී අහොසි තස්ස පජාපතී ධම්මදින්නා නාම සෙට්ඨිධීතා අහොසි, එවං සෙසාපි අවසෙසපරිසා රඤ්ඤොයෙව පරිවාරා හුත්වා නිබ්බත්තිං, අම්හාකම්පි භගවා ලොකෙ උප්පජ්ජිත්වා සත්තසත්තාහං අතික්කමිත්වා අනුපුබ්බෙන බාරාණසිං ආගම්ම ධම්මචක්කං පවත්තෙත්වා පඤ්චවග්ගියෙ ආදිං කත්වා යාව අඩ්ඪතෙය්‍යසහස්සපරිවාරෙ තයො ජටිලෙ දමෙත්වා රාජගහං අගමාසි තත්‍ර ච තදහුපසංකන්තානංයෙව

---

බිම්බිසාරෙ නාම රාජා, බිම්සර නම්වූ රජෙක්; භවිස්සති වන්නේය; සො, හෙතෙම; ඉතො, මෙයින්; වෙනවුතිකප්පෙ, අනූදෙවන කල්පයෙහි; තුම්හාකං, තොපගේ; ඤාති අහොසි, නෑයෙක් වූයේය; සො, හෙතෙම; බුඩස්ස, බුදුන්ට; දානං දත්වා, දන්දී; තුම්හාකං, තොපට; උද්දිසිස්සති, උද්දෙසන්නේය; තදා, එකල්හි; ලභිස්සථ ඉති, ලබන්නහුයයි; ආහ, වදාළසේක; එවං වුත්තෙ කිර, මෙසේ වදාළ කල්හි; තෙසං පෙතානං, ඒ ප්‍රේතයන්ට; තං වචනං, ඒ වචනය; සෙව, සෙට; ලභිස්සථ ඉති, ලබන්නහුයයි; වුත්තං විය, වදාළාක් මෙන්; අහොසි, වූයේය;

අථ, ඉක්බිති; එකස්මිං බුද්ධන්තරෙ, එක් බුද්ධාන්තරයක්; වීතිවත්තෙ, ඉක්මගිය කල්හි; අම්හාකං, අපගේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ලොකෙ, ලෝකයෙහි; උප්පජ්ජි, උපන්සේක;

තෙ තයො රාජපුත්තා අපි, ඒ රාජ පුත්‍රයෝ තුන්දෙන ද; තෙහි අඩ්ඪතෙය්‍යෙහි පුරිස සහස්සෙහි සද්ධිං, ඒ එක්දහස් පන්සියයක් පුරුෂයන් හා සමඟ; දෙවලොකා, දිව්‍යලෝකයෙන්; චවිත්වා, චුතව; මගධරට්ඨෙ, මගධ රටෙහි; බ්‍රාහ්මණකුලෙ, බමුණුකුලයෙහි; උප්පජ්ජිත්වා, ඉපද; අනුපුබ්බෙන, පිළිවෙළින්; ඉසිපබ්බජ්ජං, ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන්; පබ්බජිත්වා, පැවිදිව; ගයාසීසෙ, ගයා ශීර්ෂයෙහි; තයො ජටිලා අහෙසුං තුන්බෑ දුළුල්ලෝ වූවාහුය; ජනපදෙ, ජනපදයෙහි; නියුත්තපුරිසො, යෙදිසිටි පුරුෂතෙම; බිම්බිසාරෙ රාජා අහොසි, බිම්සර රජවූයේය; භණ්ඩාගාරිකො ගහපති, භාණ්ඩාගාරික ගෘහපති තෙම; විසාඛොනාම මහා සෙට්ඨී අහොසි, විසාඛ නම් මහසිටුවූයේය; තස්ස, ඔහුගේ; පජාපතී භාර්‍ය්‍යාතොම; ධම්මදින්නා නාම, ධම්මදින්නා නම්, සෙට්ඨිධීතා අහොසි, සිටුදූ වූවාය; එවං,

රාජානං බිම්බිසාරං සොතාපත්තිඵලෙ පතිට්ඨාපෙසි එකාදසනහුතෙහි මාගධිකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි සද්ධිං; අථ රඤ්ඤා සවාතනාය සත්ථා නිමන්තිතො අධිවාසෙත්වා දුතිය දිවසෙ සක්කෙන දෙවානමින්දෙන පුරතො ගච්ඡන්තෙන.

දන්තො දන්තෙහි සහ-පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො-රාජගහං පාවිසි භගවාති.

එවමාදීහි ගාථාහි අභිත්ථවියමානො රාජගහං පවිසිත්වා රඤ්ඤො නිවෙසනෙ මහාදානං සම්පටිච්ඡි, තෙ පෙතා ඉදානි රාජා අම්හාකං

---

මෙසේ; සබ්බා අවසෙස පරිසා අපි, සියලු අවශෙෂ පිරිස ද; රඤ්ඤො එව, රජහට ම; පරිවාරා හුත්වා, පිරිවර ව; තිට්ඨන්ති, උපන්නීය; අම්හාකං, අපගේ; භගවා අපි, භාග්‍යවතුන් වහන්සේ ද; ලොකෙ, ලෝකයෙහි; උප්පජ්ජිත්වා, ඉපද; සත්ත සත්තාහං, සත් සතිය; අතික්කමිත්වා, ඉක්මවා; අනුපුබ්බෙන, පිළිවෙළින්; බාරාණසිං, බරණැස් නුවරට; ආගම්ම, පැමිණ; ධම්ම චක්කං, ධර්මචක්‍රය; පවත්තෙත්වා, පවත්වා; පංචවග්ගියාදිං කත්වා, පස්වග භික්ෂූන් ආදිකොට; අඩ්ඪතෙය්‍ය සහස්ස පරිවාරෙ, එක්දහස් පන්සියයක් පිරිස පිරිවරවූ; තයො ජටිලෙ, තුන්බෑදූළන්; දමෙත්වා, දමනය කොට; රාජගහං, රජගහ නුවරට; අගමාසි, වැඩිසේක; තත්‍ර ච, එහි ද; තදුපසංකන්තං යෙව, එදවස් පැමිණියාවූ ම; බිම්බිසාරං රාජානං, බිම්සර රජහු; මාගධිකෙහි, මගධරට වාසීවූ; එකාදසනහුතෙහි බ්‍රාහ්මණ ගහපතිකෙහි සද්ධිං, එකොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතිකයන් හා සමග; සොතාපත්තිඵලෙ, සෝවාන් පෙලෙහි; පතිට්ඨාපෙසි, පිහිටෙව්යේය; අථ, ඉක්බිති; රඤ්ඤා, රජහු විසින්; සවාතනාය, සෙට දවස දන්පිණිස; සත්ථා, ශාස්තෲන් වහන්සේ; නිමන්තිතො, නිමන්ත්‍රණය කරනලද්දේ; අධිවාසෙත්වා, ඉවසා; දුතියදිවසෙ, දෙවනදවසෙහි; පුරතො, ඉදිරියෙන්; ගච්ඡන්තෙන, යන්නාවූ; සක්කෙන දෙවානමින්දෙන, ශක්‍රදෙවේන්ද්‍රයා විසින්;

දන්තො, දැමුණා වූ; විප්පමුත්තො, (කාමාදි කෙලෙසුන් කෙරෙන් මිදුණාවූ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සිඞ්ගිනික්ඛසවණ්ණො, තභාගත් රන්තිකකට බඳු පැහැඇතිසේක්; දන්තෙහි, දැමුණාවූ; විප්පමුත්තෙහි, විශෙෂයෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදුණාවූ; පුරාණ ජටිලෙහි සහ, පුරාණ ජටිලයන් හා සමග; රාජගහං, රජගහනුවරට; පාවිසි, වැඩිසේක;

එවමාදීහි ගාථාහි, මේ ආදි ගාථාවලින්; අභිත්ථවියමානො, ස්තුති කරනු ලබන්නේ; රාජගහං, රජගහ නුවරට; පවිසිත්වා, පිවිස; රඤ්ඤො රජහුගේ; නිවෙසනෙ, ගෘහයෙහිදී; මහාදානං, මහත් දානය; සම්පටිච්ඡි, පිළිගත්සේක; තෙ පෙතා, ඒ ප්‍රේතයෝ;

දානං උද්දිසිස්සතීති ආසාය පරිවාරෙත්වා අට්ඨංසු, රාජා දානං දත්වා කත්ථ නුඛො භගවා විහරෙය්‍යාති භගවතො විහාරට්ඨානමෙව චින්තෙසි න තං දානං කස්සචි උද්දිසි පෙතා ජිඝච්ඡාස හුත්වා රත්තිං රඤ්ඤො නිවෙසනෙ අතිවිය භිංසනකං විස්සරමකංසු රාජා භය සංවෙගසන්තාසමාපජ්ජි තතො පභාතාය රත්තියා භගවතො ආරොචෙසි එවරූපං සද්දමස්සොසිං කින්නුඛො මෙ භන්තෙ භවිස්සතීති.

භගවා ආහ මා භායි මහාරාජ න කිඤ්චි පාපකං භවිස්සති අපිච ඛො තෙ පුරාණඤාතී පෙතෙසු උප්පන්නා සන්ති, තෙ එකං බුද්ධන්තරං තමෙව පච්චාසිංසමානා විචරන්ති බුද්ධස්ස දානං දත්වා අම්හාකං උද්දිසිස්සතීති තං ච ත්වං හීයො න උද්දිසි තෙ ජිඝච්ඡාසා තථාරූපං විස්සරමකංසූති. සො ආහ ඉදානි පන භන්තෙ දින්නෙ ලභෙය්‍යුන්ති ආම මහාරාජාති තෙන හි මෙ භන්තෙ අධිවාසෙතු

---

ඥාති, ඥාත්; රාජා, රජතෙම; අම්හාකං, අපට; දානං, දානය; උද්දිසිස්සති ඉති, උදෙසන්නේයයි; ආසාය, ආසාවෙන්; පරිවාරෙත්වා, පිරිවරා, අට්ඨංසු, සිටියාහුය;

රාජා, රජතෙම; දානං දත්වා, දන් දී; භගවා, භාග්‍යවතුන් වහන්සේ; කත්ථ නුඛො, කොතැන්හි නම්; විහරෙය්‍ය ඉති, වාසය කරන්නේ දැයි; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; විහාරට්ඨානං එව, විහාරස්ථානයම; චින්තෙසි, සිතුයේය; තං දානං, ඒ දානය; කස්සචි, කිසිවකුට; න උද්දිසි, නො උදෙසුයේය; පෙතා, ප්‍රේතයෝ; ජිඝච්ඡාසාහුත්වා, සුත් ආසාඇත්තෝව; රත්තිං, රාත්‍රියෙහි; රඤ්ඤො, රජහුගේ; නිවෙසනෙ, ගෘහයෙහි; අතිවිය, ඉතා ම; භිංසනකං, භයජනකවූ; විස්සරං අකංසු, විශෙෂ ශබ්දයක් කළාහුය; රාජා, රජතෙම; භයසංවෙගසන්තාසං, භයින් කළකිරීමට සහ තැතිගැනීමට; ආපජ්ජි, පැමිණියේය; තතො, ඉක්බිති; පභාතාය රත්තියා, රාත්‍රිය අලුයම්වූ කල්හි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; ආරොචෙසි, කීයේය; එවරූපං, මෙබඳුවූ; සද්දං, ශබ්දයක්; අස්සොසිං, ඇසූයෙමි; භන්තෙ, ස්වාමිනි; මෙ, මට; කින්නුඛො, කුමක් නම්; භවිස්සති ඉති, වන්නේ දැ යි; (කීයායි.)

භගවා, භාග්‍යවතුන් වහන්සේ; මහාරාජ, මහරජ; මා භායි, බියනොවෙව; කිංචි පාපකං, කිසි අයහපතක්; න භවිස්සති, නො වන්නේය; අපිච ඛො, එතෙකුදුවුවත්; පෙතෙසු, ප්‍රේතයන් අතුරෙහි; උප්පන්නා, උපන්නා වූ; තෙ, තාගේ; පුරාණ ඤාතී, පෞරාණික නෑයෝ; සන්ති, ඇත්තාහුය; තෙ, ඔවුහු එකං බුද්ධන්තරං, එක් බුද්ධාන්තරයක්; තං එව, තොපම; පච්චාසිංසමානා, ප්‍රාර්ථනා කරන්නාහු; විචරන්ති, හැසිරෙත්; බුද්ධස්ස, බුදුන්ට; දානං දත්වා

භගවා අජ්ජතනාය දානං තෙසං උද්දිසිස්සාමීති භගවා අධිවාසෙසි රාජා නිවෙසනං ගන්ත්වා මහාදානං සම්පටියාදෙත්වා භගවතො කාලං ආරොචාපෙසි, භගවා රාජන්තෙපුරං ගන්ත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන; තෙ පෙතා අපිනාම අජ්ජ ලභෙය්‍යාමාති ගන්ත්වා තිරොකුඩ්ඩාදිසු අට්ඨංසු භගවා තථා අකාසි යථා තෙ සබ්බෙව රඤ්ඤො පාකටා හොන්ති.

තෙ පන ඉස්සාමච්ඡරතාය ඵලං අනුභවන්ති අප්පෙකච්චෙ දීඝමස්සු කෙසධාරිනෙහි අන්ධකාරමුඛා වෙදනා සිථිලබන්ධන විලම්බමාන කිසඵරුස කාළඞ්ගපච්චඞ්ගා තත්‍ථ තත්‍ථ ඨපිතවනදාහදඩ්ඪ තාලරුක්ඛ සදිසා අප්පෙකච්චෙ ජිඝච්ඡාපිපාසා නිම්මථනෙන උදරතො උට්ඨාය මුඛතො විනිච්ඡරන්තාය අග්ගිජාලාය පරිඩය්හ

---

දන් දී; උද්දිසිස්සති ඉති, උදෙසන්නේය; (කියායි.) තං ච, එයද; ත්වං, නුඹ; හිය්‍යො, ඊයේ; න උද්දිසි, නො උදෙසුයේය; තෙ, ඔවුහු; ඡාතකා, සුන් ආසා ඇත්තාහු; තථාරූපං, එබඳුවූ; විස්සරං; විශෙෂ ශබ්දයක්; අකංසු ඉති, කළාහුයයි; ආහ, වදාළසේක; සො, ඒ රජතෙම; භන්තෙ, ස්වාමීනි; ඉදානි පන, දැන් වනාහි; දින්නෙ, දුන්කල්හී; ලභෙය්‍යුං ඉති, ලබන්නාහුදැයි; ආහ, විචාළේය; මහාරාජ, මහරජ; ආම ඉති, එසේයයි; (වදාළසේක) භන්තෙ, ස්වාමීනි; තෙනහි, එසේවීනම්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අජ්ජතනාය, අද දන්පිණිස; මෙ, මාගේ; දානං, දානය; අධිවාසෙතු, ඉවසාවදාරන සේක්වා; තෙසං, ඔවුන්ට; උද්දිසිස්සාමි ඉති, උදෙසන්නෙමියි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අධිවාසෙසි, ඉවසූසේක; රාජා, රජතෙම; නිවෙසනං, ගෘහයට; ගන්ත්වා, ගොස්; මහාදානං, මහත්වූ දානයක්; සම්පටියාදෙත්වා, මනාව පිළියෙළ කරවා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; කාලං, කාලය; ආරොචාපෙසි, දැන්වූයේය;

භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජන්තෙපුරං, රජහුගේ ඇතුළු නුවරට; ගන්ත්වා, වැඩ; පඤ්ඤත්තෙ, පනවනලද; ආසනෙ, ආසනයෙහි; භික්ඛුසංඝෙන සද්ධිං, භික්ෂුසංඝයා හා සමඟ; නිසීදි, වැඩහුන්සේක;

තෙ පෙතා, ඒ ප්‍රේතයෝ; අජ්ජ, අද; ලභෙය්‍යාම, ලබන්නෙමු නම්; අපිනාම ඉති, මැනවැයි; ගන්ත්වා, ගොස්; තිරොකුඩ්ඩාදිසු, භිත්තිප්‍රාකාරදියෙන් පිටත; අට්ඨංසු, සිටියාහුය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යථා, යම්සේ; තෙ සබ්බෙව, ඒසියල්ලෝම රඤ්ඤො, රජහට; පාකටාහොන්ති ප්‍රකටවෙද්ද; තථාඅකාසි, එසේ කළසේක; තෙපන, ඔවුහු වනාහී; ඉස්සාමච්ඡරතාය, ඊර්ෂ්‍යා මසුරුතාවයෙහි; ඵලං අනුභවන්ති, විපාකය අනුභව කෙරෙත්; අප්පෙකච්චෙ, ඇතමෙක්; දීඝමස්සුකෙසධාරිනෙහි, දික් රැවුලු සහ හිසකෙස් ධරන්නවුන් විසින්; අන්ධකාරමුඛා, අඳුරුවූ මූව ඇත්තාහුය; වෙදනා, දුක් වේදනාවෙන්; සිථිල, බුරුල්වූ; බන්ධන, බැඳීම්

මානසරීරා අප්පෙකච්චෙ සූචිඡිද්දූපමමුඛකණ්ඩිලතාය පබ්බතාකාරකුච්ඡිතාය ච ලද්ධාපි පානභොජනං යාවදත්ථං භුඤ්ජිතුං අසමත්ථතාය ඛුප්පිපාසාපරෙතා අඤ්ඤං රසං අවින්දමානා අප්පෙකච්චෙ අඤ්ඤමඤ්ඤස්ස අඤ්ඤෙසං වා සත්තානං පභින්නගණ්ඩපිළකමුඛා පග්ඝරිතරුධිර පුබ්බලසිකාදීනං ලද්ධං අමතම්ව සායමානා අතිවිය දුද්දසිකවිරූපභයානකසරීරා අහෙසුං. රාජා දක්ඛිණොදකං දෙන්තො ඉදං තෙසං ඤාතීනං හොතූති උද්දිසි තං ඛණඤ්ඤෙව තෙසං පෙතානං පදුම සඤ්ඡන්නා පොක්ඛරණියො නිබ්බත්තිංසු තෙ තත්ථ නහාත්වා ච පීත්වා ච පටිප්පස්සද්ධ දරථ කිලමථ පිපාසා සුවණ්ණවණ්ණා අහෙසුං.

---

ඇතිබැවින්; විලම්බමාන, එල්බෙන්නාවූ; කිස, කෘශවූ; ඵරුසා, පරුෂවූ; කාළ, කළුවූ; අඞ්ගපච්චඞ්ගං, අඞ්ගප්‍රත්‍යඞ්ග ඇත්තාහුය; තත්ථ තත්ථ ඨපිත, ඒ ඒ තන්හි තබනලද; වනදාහදඩ්ඪ, ලැව්ගින් තෙන් දැවුණු; තාලරුක්ඛසදිසා, තල්රුක් සමානවූවාහුය; අප්පෙකච්චෙ, ඇතමෙක්; ජිඝච්ඡාපිපාසා, සාපිපාසයෙන්; නිම්මථනෙන, නිතොර මිරිකීමෙන්; උදරතො උට්ඨාය, උදරයෙන් නැගී; මුඛතො, මුඛයෙන්; විනිච්ඡරන්තාය, නික්මෙන්නාවූ; අග්ගිජාලාය, ගිනිජලාවෙන්; පරිඩය්හමාන සරීරා, හාත්පසින් දැවෙනු ලබන ශරීර ඇත්තාහුය; අප්පෙකච්චෙ සමහරු; සූචිඡිද්දූපමමුඛකණ්ඩිලතාය, ඉඳිකටුමල පමණ ස්වල්පමාත්‍රවූ ගෙලසිදුරුඇති බැවින්ද; පබ්බතාකාර කුච්ඡිතාය ච, පර්වතාකාර කුසඇති බැවින් ද; පාන භොජනං, ආහාරපානය; ලද්ධාපි, ලබනලද්දාහු ද; යාවදත්ථං, කැමැතිතාක්; භුඤ්ජිතුං, අනුභවකරන්ට; අසමත්ථතාය ච, අසමර්ථ බැවින් ද; ඛුප්පිපාසාපරෙතා, සාපිපාසා දෙකින් පීඩිතවූවාහු; අඤ්ඤංරසං, අන්‍යවූ රසයක්; අවින්දමානා, නොවිඳින්නාහුය; අප්පෙකච්චෙ, සමහරු; අඤ්ඤමඤ්ඤස්ස, ඔවුනොවුන්ගේ හෝ; අඤ්ඤෙසං වා සත්තානං, අන්‍යවූ සත්වයන්ගේ හෝ; පභින්න ගණ්ඩපිළකමුඛා, බිඳීගිය ගඩපිළකාමුඛයෙන්; පග්ඝරිතරුධිරපුබ්බලසිකාදීනං, වැගුරුණ ලේ සැරව සඳ මිදුලු ආදිය අතුරෙන්; ලද්ධං, ලබනලද් දක්; අමතම්ව, අමෘතයක් මෙන්; සායමානා, ආශ්වාදනය කරන්නාවූ; අතිවිය, ඉතාම; දුද්දසික, නපුරු දර්ශන ඇත්තාවූ; විරූප, විපර්‍යාසවූ; භයානක ශරීරා අහෙසුං, භයජනක ශරීර ඇත්තෝ වූවාහුය; රාජා, රජතෙම; දක්ඛිණොදකං, දක්ෂිණෝදකය; දෙන්තො, දෙන්නේ; මෙ, මාගේ; ඤාතීනං, නෑයන්ට; ඉදං, මෙය; හොතු ඉති, වේවයි; උද්දිසි, උදෙසුයේය; තං ඛණඤ්ඤෙව, එකෙණෙහිම; තෙසං පෙතානං, ඒ ප්‍රේතයන්ට; පදුමසඤ්ඡන්නා පස්පියුමෙන් ගැවසිගත්තාවූ; පොක්ඛරණියො, පොකුණු; නිබ්බත්තිංසු, පහළවූහ; තෙ, ඒ ප්‍රේතයෝ; තත්ථ, එහි; නහාත්වාච, ස්නානය

රාජා යාගුඛජ්ජකභොජනානි දත්වා උද්දිසි තෙසං තං ඛණඤ්ඤෙව දිබ්බයාගුඛජ්ජකභොජනානි නිබ්බත්තිංසු තෙ තානි පරිභුඤ්ජිත්වා පීණින්ද්‍රියා අහෙසුං, අථ වත්ථසෙනාසනානි දත්වා උද්දිසි තෙසං දිබ්බවත්ථදිබ්බයානදිබ්බපාසාදපච්චත්ථරණසෙය්‍යාදි අලඞ්කාරවිධයො ච නිබ්බත්තිංසු සාපි තෙසං සම්පත්ති යථා සබ්බාව පාකටා හොති තථා භගවා අධිට්ඨාසි රාජා අතිවිය අත්තමනො අහොසි. තතො භගවා භුත්තාවී පවාරිතො රඤ්ඤො මාගධස්ස අනුමොදනත්ථං තිරොකුඩ්ඩෙසු තිට්ඨන්තීති ඉමා ගාථා අභාසි. දෙසනාපරියොසානෙ පෙත්තිවිසයුප්පත්තිආදීනවසංවණ්ණනෙන සංවිග්ගානං යොනිසො පදහතං චතුරාසීතියා පාණසහස්සානං ධම්මා

---

කොටද; පීත්වාච, පානයකොටද; පටිප්පස්සද්ධදරථකිලමථපිපාසා, සංසිඳුණු ශරීරපීඩාය; ක්ලාන්තය, පිපාසාය යන මේ ඇත්තාහු; සුවණ්ණවණ්ණා අහෙසුං, රන්වන් ශරීර ඇතිවූවාහුය; රාජා, රජතෙම; යාගුඛජ්ජක භොජනානි, කැඳ කැවිලි භොජනයන්; දත්වා, දී; උද්දිසි, උදෙසුයේය; තෙසං, ඔවුන්ට; තංඛණඤ්ඤෙව, එකෙණෙහිම; දිබ්බයාගුඛජ්ජකභොජනානි; දිව්‍යමය කැඳකැවිලි භොජනයෝ; නිබ්බත්තිංසු, පහළවූහ; තෙ, ඔවුහු; තානි, ඒ ආහාරපානයන්; පරිභුඤ්ජිත්වා, අනුභව කොට; පීණින්ද්‍රියා අහෙසුං, පිනවන ලද ඉන්ද්‍රියන් ඇත්තෝ වූහ; අථ, ඉක්බිති; වත්ථසෙනාසනානි, වස්ත්‍ර හා සෙනසුන්; දත්වා, දී; උද්දිසි, උදෙසුයේය; තෙසං, ඔවුන්ට; දිබ්බවත්ථ දිබ්බයාන දිබ්බපාසාද පච්චත්ථරණසෙය්‍යාදි අලඞ්කාරවිධයොච, දිව්‍යමයවූ වස්ත්‍ර යාන ප්‍රාසාද පසතුරුණු සයනාදි අලංකාරවිධිහුද; නිබ්බත්තිංසු, පහළවූහ; තෙසං, ඔවුන්ගේ; සා සම්පත්ති අපි, ඒ සම්පත්තියද; යථා, යම්සේ; සබ්බාව, සියල්ලම; පාකටා හොති, ප්‍රකටවේද; භගවා, භාග්‍යවතුන් වහන්සේ; තථා, එසේ; අධිට්ඨාසි, අධිෂ්ඨානය කළසේක, රාජා, රජතෙම; අතිවිය, ඉතාම; අත්තමනො අහොසි, සතුටුසිත් ඇත්තේ විය, තතො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන්වහන්සේ; භුත්තාවී, වළඳ නිමවූයේ; පවාරිතො, ආහාරයෙන් වැළකුණේ; මාගධස්සරඤ්ඤො, මගධ රජහට; අනුමොදනත්ථං, අනුමෝදනා පිණිස; තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති ඉති, තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති යනාදිවූ; ඉමා ගාථා, මේ ගාථාවන්; අභාසි, වදාළසේක; දෙසනාපරියොසානෙ, දෙශනාවගේ අවසානයෙහි; පෙත්තිවිසයුප්පත්ති ආදීනව සංවණ්ණනෙන, ප්‍රේත විෂයෙහි ඉපදීමේ ආදීනව ශ්‍රවණයෙන්; සංවිග්ගානං, කළකිරුණාවූ; යොනිසො පදහතං, නුවණින් වීර්‍ය්‍යකරන්නාවූ; චතුරාසීතියා පාණසහස්සානං, අසූසාරදහසක් ප්‍රාණීන්ට; ධම්මාභිසමයො අහොසි, ධර්මාවබොධය වූයේය; භගවා, භාග්‍යවතුන්

හිසමයො අහොසි, දුතිය දිවසෙපි භගවා දෙවමනුස්සානං ඉදමෙව තිරොකුඩ්ඩසුත්තං දෙසෙසි එවං යාව සත්තමදිවසා තාදිසො එව ධම්මාභිසමයො අහොසීති.

———

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථඛො ජානුස්සොණී බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො ජානුස්සොණී බ්‍රාහ්මණො භග වන්තං එතදවොච මයමස්සු භො ගොතම බ්‍රාහ්මණා නාම දානානි දෙම සද්ධානි කරොම ඉදං දානං පෙතානං ඤාතිසාලොහිතානං උපකප්පතු ඉදං දානං පෙතා ඤාතිසාලොහිතා පරිභුඤ්ජන්තූති

---

වහන්සේ; දුතියදිවසෙපි, දෙවන දවසෙහි ද; දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට; ඉදං තිරොකුඩ්ඩසුත්තං එව, මේ තිරොකුඩ්ඩ සූත්‍රයම; දෙසෙසි, දෙශනාකළසේක; එවං, මෙසේ; සත්තමදිවසායාව, සත්වන දවස දක්වා; තාදිසො එව, එබඳුවූ ම; ධම්මාභිසමයො, ධර්මාවබොධය; අහොසි ඉති, වූයේයි;

———:o:———

එවමෙමසුතං — පෙ — අථඛො, ඉක්බිති; ජානුස්සොණී බ්‍රාහ්මණො, ජානුස්සොණී බ්‍රාහ්මණතෙම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවතා සද්ධිං, භාග්‍යවතුන් වහන්සේ හා සමඟ; සම්මොදි, සතුටුවූයේය; සම්මොදනීයං, සතුටුවියයුතු; සාරාණීයං, සිහිකටයුතු; කථං, කථාව; වීතිසාරෙත්වා, කොටනිමවා; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත් පසෙක; නිසින්නොඛො, හුන්නාවූම; ජානුස්සොණී බ්‍රාහ්මණො, ජානුස්සොණී බ්‍රාහ්මණතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේ කාරණය; අවොච, කීයේය;

භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; බ්‍රාහ්මණා නාම, බමුණෝ නම්වූ; මයං අස්සු. අපි වූකලී; දානානි, දානයන්; දෙම, දෙන්නෙමු; ඤාතිසාලොහිතානං, නෑ සහ ලේ නෑවූ; පෙතානං, ප්‍රේතයන්ට; ඉදං දානං, මේ දානය; උපකප්පතු, පැමිණේවා; ඤාති සාලොහිතා, නෑ සහ ලේනෑවූ; පෙතා, ප්‍රේතයෝ; ඉදං දානං, මේ දානය; පරිභුඤ්ජන්තු ඉති, පරිභොගකෙරෙත්වායි; දානානි, දාන යන්, දෙම, දෙන්නෙමු; සද්ධානි, මතකබත්දීම; කරොම, කරන් නෙමු; භො ගොතම, භවත් ගෞතමයාණෙනි; කච්චි, කිමෙක්ද; තං දානං, ඒ දානය; ඤාතිසාලොහිතානං, නෑ සහ ලේනෑවූ; පෙත

කච්චි තං භො ගොතම දානං පෙතානං ඤාතිසාලොහිතානං උපකප්පති කච්චි තෙ පෙතා ඤාති සාලොහිතා තං දානං පරිභුඤ්ජන්තීති, ඨානෙ ඛො බ්‍රාහ්මණ උපකප්පති නො අට්ඨානෙති. කතමං පන තං භො ගොතම ඨානං කතමං අට්ඨානන්ති.

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති පිසුනාවාචො හොති ඵරුසාවාචො හොති සම්ඵප්පලාපී හොති අභිජ්ඣාලූ හොති බ්‍යාපන්නචිත්තො හොති මිච්ඡාදිට්ඨිකො හොති සො කායස්සභෙදා පරම්මරණා නිරයං උපපජ්ජති යො නෙරයිකානං ආහාරො තෙන සො තත්ථ යාපෙති තෙන සො තත්ථ තිට්ඨති ඉදං ඛො බ්‍රාහ්මණ අට්ඨානං යත්ථ ඨිතස්ස තං දානං න උපකප්පති.

---

නං, ප්‍රේතයන්ට; උපකප්පති, පැමිණේද; කච්චි, කිමෙක්ද; ඤාති සාලොහිතා, නෑ සහ ලේනෑවූ; පෙතා, ප්‍රේතයෝ; තං දානං, ඒ දානය; පරිභුඤ්ජන්ති ඉති, පරිභොග කෙරෙත්දැයි; (විචාළේය) බ්‍රාහ්මණ, බමුණ; ඨානෙ ඛො, අවකාශ ලැබුණු තැනෙහිදී; උපකප්පති, පැමිණෙයි; අට්ඨානෙ, අවකාශ රහිත තැන; නො ඉති, නො පැමිණේ යයි; (වදාළසේක) භො ගොතම, භවත් ගෞතම යන් වහන්ස; තං ඨානං, ඒ අවකාශ ඇති තැන; කතමං පන, කවරේද; අට්ඨානං, අනවකාශතැන; කතමං ඉති, කවරේදැයි; (විචාළේය.)

බ්‍රාහ්මණ, බමුණ; ඉධ, මේ ලෝකයෙහි; එකච්චො, ඇතමෙක්; පාණාතිපාතී හොති, ප්‍රාණඝාතකරන්නේ වෙයි; අදින්නාදායී හොති, නුදුන්දෙය ගන්නේවෙයි; කාමෙසුමිච්ඡාචාරී හොති, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයි; මුසාවාදී හොති, බොරු කියන්නේ වෙයි; පිසුණාවාචොහොති, පෙහෙසුන්බස් කියන්නේ වෙයි; ඵරුෂාවාචොහොති, පරුෂවචන කියන්නේ වෙයි; සම්ඵප්පලාපී හොති, සම්ඵප්‍රලාප කියන්නේ වෙයි; අභිජ්ඣාලු හොති, අධික ලොභ ඇත්තේ වෙයි; බ්‍යාපන්නචිත්තොහොති, ක්‍රොධසිත් ඇත්තේ වෙයි; මිච්ඡාදිට්ඨිකොහොති, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේවෙයි; සො, හෙතෙම; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදියි; නෙරයිකානං, නෛරයික සත්ත්වයන්ට; යො ආහාරො, යම් ආහාරයක් වේද; තෙන, (උපන්නාවූ කර්මයම ආහාරකොට) එයින්; සො, හෙතෙම; තත්ථ, එහි; යාපෙති, යැපෙයි; තෙන, එයින්; සො, හෙතෙම; තත්ථ, එහි; තිට්ඨති, සිටියි; බ්‍රාහ්මණ, බමුණ; යත්ථ, යම් තැනෙක්හි; ඨිතස්ස, සිටියාහට; තං දානං, ඒ දානය; න උපකප්පති, නොපැමිණේ; ඉදං ඛො, මේ වනාහි; අට්ඨානං, (ඒ) අනවකාශ තැනය;

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදනා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාද පටිවිරතො හොති පිසුණාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු හොති අබ්‍යාපන්නචිත්තො හොති සම්මාදිට්ඨිකො හොති සො කායස්සභෙදා පරම්මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති යො මනුස්සානං ආහාරො තෙන සො තත්ථ යාපෙති තෙන සො තත්ථ තිට්ඨති ඉදං ඛො බ්‍රාහ්මණ අට්ඨානං යත්ථ ඨිතස්ස තං දානං න උපකප්පති

---

බ්‍රාහ්මණ, බමුණ; ඉධ, මේ ලෝකයෙහි; එකච්චො, ඇතැම් කෙනෙක්; පාණාතිපාතිහොති —පෙ— තිරච්ඡානයොනිං, තිරිසන් අපායෙහි; උපපජ්ජති, උපදියි; තිරච්ඡානයොනිකානං, තිරිසන් අපායෙහි උපන්නවුන්ට; යො ආහාරො, (තෘණපණ්ණාදි වශයෙන්) යම් ආහාරයෙක් වේද; සො, හෙතෙම; තෙන, එයින්; තත්ථ, එහි; යාපෙති, යැපෙයි; තෙන, එයින්; සො, හෙතෙම; තත්ථ, එහි; තිට්ඨති, සිටියි; බ්‍රාහ්මණ, බමුණ; යත්ථ, යම්තැනෙක්හි; ඨිතස්ස, සිටියාහට; තංදානං, ඒ දානය; න උපකප්පති, නොපැමිණේද; ඉදං ඛො, මේ වනාහි; අට්ඨානං, අනවකාශ තැනෙක් වෙයි;

බ්‍රාහ්මණ, බමුණ; ඉධ, මේලෝකයෙහි; එකච්චො, ඇතැම් කෙනෙක්; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොති, වැළකුණේ වෙයි; අදින්නාදනා, සොරකෑකම් කිරීමෙන්; පටිවිරතොහොති, වැළකුණේ වෙයි; කාමෙසුමිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වෙයි; මුසාවාද, බොරුකීමෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වෙයි; පිසුණාවාචා, කේලාම් කීමෙන්; පටිවිරතො හොති, වැළැක්කේ වෙයි; ඵරුෂාවාච, පරුෂ වචනකීමෙන්; පටිවිරතොහොති වැළැක්කේ වෙයි; සම්ඵප්පලාපා, සම්ඵප්‍රලාපකීමෙන්, පටිවිරතො හොති, වැළැක්කේ වෙයි; අනභිජ්ඣාලු හොති, අධික ලෝභය නැත්තේ වෙයි; අබ්‍යාපන්නචිත්තො හොති, ක්‍රොධ සිත් නැත්තේ වෙයි; සම්මාදිට්ඨිකො හොති, සම්‍යක්දෘෂ්ටික වෙයි; සො, හෙතෙම; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; මනුස්සානං, මිනිසුන්ගේ; සහව්‍යතං, එකී භාවයට; උපපජ්ජති, උත්පත්ති වශයෙන් පැමිණෙයි; මනුස්සානං මිනිසුන්ගේ; යො ආහාරො, (ඔදන කුම්මාසාදි වශයෙන්) යම් ආහාරයෙක් වේද; තෙන, එයින්; සො, හෙතෙම; තත්ථ, එහි; යාපෙති, යැපෙයි; තෙන, එයින්; සො, හෙතෙම; තත්ථ එහි; තිට්ඨති, සිටියි; බ්‍රාහ්මණ, බමුණ; යත්ථ, යම් තැනෙක්හි; ඨිතස්ස, සිටියාහට; තං දානං, ඒ දානය; න උපකප්පති, නො පැමිණේද; ඉදං ඛො, මේ වනාහී; අට්ඨානං, අනවකාශ තැනය;

ඉධ බ්‍රාහමණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මූසාවාදා පටිවිරතො හොති පිසුනාවාචා පටිවිරතො හොති ඵරුෂාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු හොති අබ්‍යාපන්නචිත්තො හොති සම්මා දිට්ඨිකො හොති සො කායස්සභෙදා පරම්මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති යො දෙවානං ආහාරො තෙන සො තත්ථ යාපෙති තෙන සො තත්ථ තිට්ඨති ඉදං ඛො බ්‍රාහමණ අට්ඨානං යත්ථ ඨිතස්ස තං දානං න උපකප්පති.

ඉධ බ්‍රාහමණ එකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති පිසුනාවාචො හොති ඵරුෂාවාචො හොති සම්ඵප්පලාපී හොති අභිජ්ඣාලු හොති බ්‍යාපන්නචිත්තො හොති මිච්ඡාදිට්ඨිකො හොති සො කායස්සභෙදා පරම්මරණා පෙත්තිවිසයං උප්පජ්ජති යො පෙත්තිවිසයිකානං ආහාරො තෙන සො තත්ථ යාපෙති තෙන සො තත්ථ තිට්ඨති යං වා පනස්ස ඉතො අනුප්පවෙච්ඡන්ති මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා තෙන සො තත්ථ යාපෙති තෙන සො තත්ථ තිට්ඨති ඉදං ඛො බ්‍රාහමණ ඨානං යත්ථ ඨිතස්ස තං දානං උපකප්පති.

සචෙ භො ගොතම සො පෙතො ඤාතිසාලොහිතො තං ඨානං අනුප්පත්තො හොති කො තං දානං පරිභුඤ්ජතීති, අඤ්ඤෙපිස්ස බ්‍රාහමණ පෙතා ඤාතිසාලොහිතා තං ඨානං උප්පන්නා හොන්ති තෙ තං දානං පරිභුඤ්ජන්තීති- සචෙ පන භො ගොතම සො චෙව

---

බ්‍රාහමණ —පෙ— දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජති, (උත්පත්ති වශයෙන්) පැමිණෙයි; දෙවානං, දෙවියන්ගේ; යො ආහාරො, (සුධා භොජනාදි වශයෙන්) යම් ආහාරයෙක් වේද; තෙන —පෙ—

බ්‍රාහමණ, —පෙ— පෙත්තිවිසයං, ප්‍රේත විෂයෙහි; උපපජ්ජති, උපදියි; පෙත්තිවිසයිකානං, ප්‍රේත විෂයෙහි උපන්නවුන්ට; යො ආහාරො, (කෙළ සොටු ආදි වූ) යම් ආහාරයෙක්වේද; තෙන —පෙ— අස්ස, ඔහට; මිත්තාමච්චා වා, මිත්‍රාමාත්‍යයෝ හෝ; ඤාති සාලොහිතා වා, නෑ සහලේ නෑයෝ හෝ; ඉතො, මේ මනුෂ්‍ය ලෝකයෙන්; යං වා පන, යමක් වනාහි; අනුප්පවෙච්ඡන්ති, පමුණුවත්ද; තෙන —පෙ— බ්‍රාහමණ, බමුණ; යත්ථ, යම් තැනෙක්හි; ඨිතස්ස, සිටියාහට; තං දානං, ඒ දානය; උපකප්පති, පැමිණේද; ඉදං ඛො, මෙ වනාහී; ඨානං ඉති, අවකාශ තැන යයි; (වදළසේක)

භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; ඤාතිසාලොහිතො, නෑ සහලේ නෑ වූ; සො පෙතො, ඒ ප්‍රේතතෙම; සචෙ, ඉදින්; තං ඨානං, ඒ ස්ථානයෙහි; අනුප්පත්තො හොති, නූපන්නේ

පෙතො ඤාතිසාලොහිතො තං ඨානං අනුපපන්නො හොති අඤ්ඤෙපිස්ස පෙතා ඤාතිසාලොහිතා තං ඨානං අනුපපන්නා හොන්ති කො තං දානං පරිභුඤ්ජතීති. අට්ඨානං ඛො එතං බ්‍රාහ්මණ අනවකාසො යං තං ඨානං රිත්තං අස්ස ඉමිනා දීඝෙන අද්ධුනා යදිදං පෙතෙහි ඤාති සාලොහිතෙහි අපිච බ්‍රාහ්මණ දායකො අනිප්ඵලොති අට්ඨානෙපි භවං ගොතමො පරිකප්පං වදතීති අට්ඨානෙපි ඛො අහං බ්‍රාහ්මණ පරිකප්පං වදාමි.

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති පිසුනාවාචො හොති ඵරුසාවාචො හොති සම්ඵප්පලාපී හොති අභිජ්ඣාලු හොති බ්‍යාපන්න චිත්තො හොති මිච්ඡාදිට්ඨිකො හොති සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලා ගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං සො කායස්සභෙදා පරම්මරණා හත්ථිනං සහව්‍යතං උපපජ්ජති සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලාලඞ්කාරස්ස. යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතී අදින්නාදායී කාමෙසුමිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො තෙන

---

වේ නම්; කො, කවරෙක්; තං දානං, ඒ දානය; පරිභුඤ්ජති ඉති, පරිභොග කෙරේදැයි; (විචාළේ ය) බ්‍රාහ්මණ, බමුණ; තං ඨානං ඒ ස්ථානයෙහි; උපපන්නා, උපන්නාවූ; අඤ්ඤෙපි, අන්‍යවූද; අස්ස ඔහුගේ; -ඤාතිසාලොහිතා, නෑ සහ ලේනෑ වූ; පෙතා, ප්‍රේතයෝ, හොන්ති, වෙත්; තෙ, ඔවුහු; තං දානං, ඒ දානය; පරිභුඤ්ජන්ති ඉති පරිභොග කෙරෙත් යයි; (මදුළේය)

භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; සචෙපන, ඉදින් වනාහි; ඤාතිසාලොහිතො, නෑ සහලේ නෑවූ; සො චෙව පෙතො, ඒ ප්‍රේතතෙමේ ද; තං ඨානං, ඒ ස්ථානයෙහි; අනුපපන්නො හොති, නූපන්නේ වේ ද; අස්ස, ඔහුගේ; අඤ්ඤෙපි, අන්‍යවූ ද; ඤාතිසාලොහිතා, නෑ සහලේනෑ වූ; පෙතා, ප්‍රේතයෝ; තං ඨානං, ඒ ස්ථානයෙහි; අනුපපන්නා හොන්ති, නූපන්නාහු වෙද්ද; කො, කවරෙක්; තං දානං, ඒ දානය; පරිභුඤ්ජති ඉති, පරිභොග කෙරේදැයි; (විචාළේය)

බ්‍රාහ්මණ, බමුණ; ඉමිනා දීඝෙන අද්ධුනා, මේ දීර්ඝකාලයක් ඇවෑමෙන්; අස්ස, ඔහුගේ; ඤාතිසාලොහිතෙහි, නෑ සහලේ නෑ වූ; පෙතෙහි, ප්‍රේතයන්ගෙන්; යං තං ඨානං, යම් ඒ තැනක්; රිත්තං, සිස්වේය යන; යං ඉදං, යම් මේ කාරණයක්වේ ද; එතං අට්ඨානං ඛො, මේ අස්ථානයෙක්මය; අනවකාසො, අවකාශ රහිතය; අපිච, එතකුදුවූවත්; බ්‍රාහ්මණ, බමුණ; දායකො, දායක තෙම; අනිප්ඵලො ඉති, ඵලරහිත නොවේයයි; භවංගොතමො, භවත් ගෞතම

සො කායස්සභෙදා පරම්මරණා හත්ථීනං සහව්‍යතං උපපජ්ජති. යඤ්ච ඛො සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං තෙන සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලාලඞ්කාරස්ස.

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති පිසුනාවාචො හොති ඵරුසාවාචො හොති සම්ඵප්පලාපී හොති අභිජ්ඣාලු හොති බ්‍යාපන්නචිත්තො හොති මිච්ඡාදිට්ඨිකො හොති සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො කායස්සභෙදා පරම්මරණා අස්සානං සහව්‍යතං උපපජ්ජති ගුන්නං සහව්‍යතං උපපජ්ජති කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලාලඞ්කාරස්ස, යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො තෙන සො කායස්සභෙදා පරම්මරණා අස්සානං සහව්‍යතං උපපජ්ජති ගුන්නං සහව්‍යතං උපපජ්ජති කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති යඤ්ච ඛො සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං තෙන සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලාලංකාරස්ස

---

තෙම; අට්ඨානෙපි, ආසථානයෙහිද; පරිකප්පං වදති ඉති, දනයාගේ විපාකය පනවාදූපි; (විචාලේය) බ්‍රාහමණ, බමුණ; අහං, මම; අට්ඨානෙපි ඛො, ආසථානයෙහි ද; පරිකප්පං වදමි, පරිකල්පය කියමි; (හෙවත් දනයාගේ විපාකය කියමියි වදාලසේක)

ඉධ බ්‍රාහමණ, —පෙ— සො, හෙතෙම; සමණස්ස වා, ශ්‍රමණයක් හට හෝ; බ්‍රාහමණස්ස වා, බමුණක් හට හෝ; අන්නං, ආහාරය; පානං, පාන වර්ගය; වත්ථං, වස්ත්‍රය; යානං, යානාය; මාලාගන්ධ විලෙපනං, මල් සුවඳ විලෙවුන්ය; සෙය්‍යාවසථ පදීපෙය්‍යං, සයනාසන ගෙවල් පහන්ය; (යනමේදූ) දතා හොති, දෙන්නේවේ ද; සො, හෙතෙම; කායස්ස භෙදා, කායයාගේ බිඳීමෙන්; මරණා පරං, මරණින් මත්තෙහි; හත්ථීනං, ඇතුන්ගේ; සහව්‍යතං, එකීභාවයට; උපපජ්ජති; (උත්පත්තිවශයෙන්) පැමිණේද; සො, හෙතෙම; තත්ථ ඒ ඇත්යොනියෙහි උපන්නේද; (මඟුලැත් තනතුරට පැමිණ) අන්නස්ස, ආහාරයද; පානස්ස, පානවර්ගයන්ද; මාලාලඞ්කාරස්ස, මල් සුවඳ විලෙවුන් ආදියද; ලාභී හොති, ලබන සුලුවෙයි;

බ්‍රාහමණ, බමුණ; යං ඛො, යම් හෙයකින් වනාහී; ඉධ, මේ ලෝකයෙහි; පාණාතිපාති, —පෙ—

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති පිසුනාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු හොති අබ්‍යාපන්නචිත්තො හොති සම්මාදිට්ඨිකො හොති සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං සො කායස්සභෙදා පරම්මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති සො තත්ථ ලාභී හොති මානුසකානං පඤ්චන්නං කාමගුණානං. යං බො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති පිසුනාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨිකො තෙන සො කායස්සභෙදා පරම්මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති. යඤ්ච බො සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං තෙන සො තත්ථ ලාභී හොති මානුසකානං පඤ්චන්නං කාමගුණානං.

---

ඉධ බ්‍රාහ්මණ, —පෙ— අස්සානං, අශ්වයන්ගේ; සහව්‍යතං, එකී භාවයට; උපපජ්ජති, (උත්පත්ති වශයෙන්) පැමිණේ ද; ගුන්නං, ගොනුන්ගේ; සහව්‍යතං, —පෙ— කුක්කුරානං සුනඛයන්ගේ; සහව්‍යතං, —පෙ— සො, හෙතෙම; තත්ථ, (ඒ ඒ යොනීන්හි උපන්නේද; (එහි;) අන්නස්ස, ආහාරය; පානස්ස, පානවර්ගය; මාලාලඞ්කාරස්ස, මල් සුවඳ විලෙවුන්ය; (යන මේ දෑ) ලාභීහොති, ලබනසුලු වෙයි; යං බො බ්‍රාහ්මණ, —පෙ—

ඉධ බ්‍රාහ්මණ, —පෙ— මනුස්සානං, මිනිසුන්ගේ; සහව්‍යතං, එකී භාවයට; උපපජ්ජති, (උත්පත්ති වශයෙන්) පැමිණේද; සො, හෙතෙම, තත්ථ, එහි; මානුසකානං, මිනිසුන්ට අයත්වූ පඤ්චන්නං කාමගුණානං; පස්කම් ගුණයන්; ලාභී හොති, ලබන සුලුවේ ද; යං බො බ්‍රාහ්මණ,—පෙ—තෙන, එයින්; සො, —පෙ— ලාභී හොති, ලබන සුලු වෙයි;

ඉධ බ්‍රාහ්මණ —පෙ— දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, —පෙ— සො, හෙතෙම; දිබ්බානං, දෙවියන්ගේ; පඤ්චන්නං, —පෙ— යං බො බ්‍රාහ්මණ, —පෙ— බ්‍රාහ්මණ, බමුණ; අපිච බො, එතකුදුවුවත්; දායකොපි, දායක තෙමේද; අතිපඵලො ඉති, ඵල රහිත නොවේයයි; (මදුළසේක)

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති පිසුණාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු හොති අබ්‍යාපන්නචිත්තො හොති සම්මාදිට්ඨිකො හොති සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, සො කායස්සභෙදා පරම්මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති සො ලාභී හොති දිබ්බානං පඤ්චන්නං කාමගුණානං, යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති පිසුණාවාචා පටිවිරතො හොති ඵරුසාවාචා පටිවිරතො හොති සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨිකො තෙන සො කායස්ස භෙදා පරම්මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති. යඤ්ච ඛො සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං තෙන සො තත්ථලාභී හොති දිබ්බානං පඤ්චන්නං කාමගුණානං අපිච ඛො බ්‍රාහ්මණ දායකොපි අතිපඵලොති.

අච්ඡරියං භො ගොතම අබ්භුතං භො ගොතම යාවඤ්චිදං භො ගොතම අලමෙව දානානි දාතුං අලමෙව සද්ධානි කාතුං යත්‍ර හි නාම දායකොපි අතිපඵලොති, එවමෙතං බ්‍රාහ්මණ එවමෙතං බ්‍රාහ්මණ දායකොපි හි බ්‍රාහ්මණ අතිපඵලොති. අභික්කන්තං භො

---

භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අබ්භුතං, අද්භූතය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; යාවඤ්ච ඉදං, යම්තාක්; දානානි, දන්; දාතුං, දෙන්ට; අලං එව, සුදුසුමය; සද්ධානි, ශ්‍රාද්ධයන්; (මතක බත්දීම්) කාතුං, කරන්ට; අලං එව ඉති, සුදුසුම්ය; යත්‍රහි නාම, යම්හෙයකින්; දායකොපි; දායක තෙමේද; අතිපඵලො, ඵලරහිත නොවේද; (එහෙයිනි) බ්‍රාහ්මණ, බමුණ; එතං, මේ කාරණය; එවං, එසේය; බ්‍රාහ්මණ, බමුණ; එතං, මේ කාරණය; එවං, එසේය, බ්‍රාහ්මණ, බමුණ; දායකොපිහි, දායක තෙමේද; අතිපඵලො ඉති, නිෂ්ඵල නොවේ යයි; (වදාළ සේක) භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, ඉතා මැනවි; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, ඉතා මැනවි; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; සෙය්‍යථාපි, යම්සේ; නික්කුජ්ජිතං, මූවයටිකුරුකොට තබන ලද්දක්; උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කරන්නේ ද; පටිච්ඡ

ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ජානුස්සොණි සුත්තං.
"දසකඞ්ගුත්තරෙ"

"තිරෙකුඩ්ඩාදිසු අනුමොදනාය සම්පත්තානං පරිකථනත්ථාය අන්ධකවින්ද මහාරාහුලොවාද අම්බට්ඨසදිසො එකො කථාමග්ගොති වුත්ත සුත්තෙසු ඉදං තාව අන්ධකවින්දසුත්තං"

---

ත්තං, (තෘණ ආදියෙන්) වසනලද්දක්; විවරෙය්‍ය වා, විවෘත කරන්නේ ද, මූළ්හස්ස, මං මූළා වූවකුට; මග්ගං, මඟ; ආචික්ඛෙය්‍ය වා, කියන්නේ ද; චක්ඛුමන්තො, ඇස් ඇත්තාහු; රූපානි, රූපයන්; දක්ඛින්ති ඉති, දකින්නාහුයයි; අන්ධකාරෙ, ගනඳුරෙහි; තෙලපජ්ජොතං, තෙල් පහනක්; ධාරෙය්‍ය වා, දරන්නේද; එවං එව එපරිද්දෙන්ම; භොතාගොතමෙන, භවත් ගෞතමයන් වහන්සේ විසින්; අනෙකපරියායෙන, නොයෙක් ක්‍රමයෙන්; ධම්මො, ධර්මය තෙම; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය; එසො අහං, මේ මම; භවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේද; ධම්මං ච, ධර්මයද; භික්ඛුසංඝං ච, භික්ෂුසංඝයා ද; සරණංගච්ඡාමි, සරණකොට යෙමි; භවං ගොතමො, භවත් ගෞතම තෙමේ; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, දිවිහිමිකොට; සරණං ගතං, සරණගියාවූ. උපාසකං, උපාසකයකු කොට; මං, මා; ධාරෙතු ඉති, දරණසේක්වායි; සැලකෙලේය)

ජානුස්සොණි සුත්තං, ජානුස්සොණි සූත්‍රයයි;

—:o:—

දසකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර නිකායෙහි දසවන නිපාතයෙහි ය

—o—

තිරෙකුඩ්ඩාදිසු තිරෙකුඩ්ඩ සූත්‍රාදීන් අතුරෙහි; සම්පත්තානං, පැමිණියවුන්ට; අනුමොදනාය, අනුමොදනාව පිණිසද; පරිකථාය, පරිකථනය පිණිසද; අන්ධකවින්ද මහාරාහුලොවාද අම්බට්ඨසදිසො, අන්ධකවින්ද, මහාරාහුලොවාද, අම්බට්ඨසූත්‍ර සමානවූ; එකො කථාමග්ගො ඉති, එක් කථා මාර්ගයෙක් යයි; වුත්තසුත්තෙසු, (ආරම්භයෙහි) කියනලද සූත්‍රයන් අතුරෙහි; තාව, පළමුකොට; ඉදං අන්ධකවින්ද සුත්තං; මේ අන්ධකවින්ද සූත්‍රය දක්වනු ලැබේ;

එවමෙමි සුතං එකං සමයං භගවා මගධෙසු විහරති අන්ධකවින්දෙ අථඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච - යෙ තෙ ආනන්ද භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං තෙ වො ආනන්ද භික්ඛූ පඤ්චසු ධම්මෙසු සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා; කතමෙසු පඤ්චසු? එථ තුම්හෙ ආවුසො සීලවා හොථ පාතිමොක්ඛසංවර සංවුතා විහරථ ආචාරගොචර සම්පන්නා අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනො සමාදාය සික්ඛථ සික්ඛාපදෙසූති, ඉති පාතිමොක්ඛසංවරෙ සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා- එථ තුම්හෙ ආවුසො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරථ ආරක්ඛසතිනො නෙපක්කසතිනො සාරක්ඛිතමානසා

---

මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසනලදී; එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; මගධෙසු, මගධ ජනපදයෙහි; අන්ධකවින්දෙ, අන්ධකවින්ද වනයෙහි; විහරති, වැඩවාසය කරනසේක, අථඛො, එකල්හි; ආයස්මා ආයුෂ්මත්වූ; ආනන්දො, ආනන්දස්ථවිරතෙම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නං ඛො, හුන්නාවූ ම; ආයස්මන්තං, ආයුෂ්මත්වූ, ආනන්දං, ආනන්දස්ථවිරයන් වහන්සේට; භගවා, භාග්‍යවතුනවහන්සේ; එතං, මෙය; අවොච, වදාළසේක; ආනන්ද; ආනන්දය; යෙ තෙ භික්ඛූ, යම් ඒ භික්ෂූහු; නවා, නවක යෝ ද; අචිරපබ්බජිතා, පැවිදිවූ නොබෝකල් ඇත්තෝ ද; ඉමං, ධම්මවිනයං, මේ ධර්මවිනය සඞ්ඛ්‍යාත ශාසනයට; අධුනාගතා, අලුත පැමිණියාහුද; ආනන්ද, ආනන්දය; වො, තොප විසින්; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; පඤ්චසු ධම්මෙසු, පංච ධර්මයන්හි; සමාදපෙතබ්බා, සමාදන් කටයුත්තාහුය; නිවෙසෙතබ්බා, වාසයකරවිය යුත්තාහුය; පතිට්ඨාපෙතබ්බා, පිහිටවිය යුත්තාහුය; කතමෙසු පඤ්චසු, කවර ධර්මපසෙක්හි ද යත්; ආවුසො, ඇවැත්නි; තුම්හෙ, තෙපි; එථ, (මෙහි) එව්; සීලවාහොථ, සිල්වත්වෙව්; පාතිමොක්ඛසංවරසංවුතා, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් සංවෘතවූවාහු; විහරථ, වාසය කරව්; ආචාරගොචරසම්පන්නා, ආචාරගොචරයන්ගෙන් සමන්විතවූවාහු;; අනුමත්තෙසු, ස්වල්පමාත්‍රවූ, වජ්ජෙසු, වද්‍යයන්හි; භයදස්සාවිනො, භය දක්නා සුලුවූවාහු; සමාදාය, සමාදන්ව; සික්ඛාපදෙසු, ශික්ෂාපදයන්හි; සික්ඛථ ඉති, හික්මෙව්යයි; ඉති, මෙසේ

සතාරක්ඛෙන චෙතසා සමන්නාගතාති, ඉතිඉන්ද්‍රිය සංවරෙ සමාද
පෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා- එථ තුමෙහ ආවුසො
අප්පභස්සා හොථ භස්ස පරියන්තකාරිනොති, ඉති භස්සපරි
යන්තෙ සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා- එථ
තුමෙහ ආවුසො ආරඤ්ඤිකා හොථ අරඤ්ඤ වනපත්ථානි පන්තානි
සෙනාසනානි පටිසෙවථාති ඉති කායවූපකාසෙ සමාදපෙතබ්බා
නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා- එථ තුමෙහ ආවුසො සම්මාදිට්ඨි
කා හොථ සම්මාදස්සනෙන සමන්නාගතාති, ඉති සම්මාදස්සනෙ
සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා- යෙ තෙ
ආනන්ද භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං

---

පාතිමොක්ඛසංවරෙ, ප්‍රාතිමොක්‍ෂසංවර ශීලයෙහි; සමාදපෙතබ්බා,
සමාදන්කරවිය යුත්තාහුය; නිවෙසෙතබ්බා, වාසය කරවියයුත්තා
හුය; පතිට්ඨාපෙතබ්බා, පිහිටවිය යුත්තාහුය; ආවුසො, ඇවැත්නි;
තුමෙහ තෙපි; එථ, (මෙහි) එව්; ඉන්ද්‍රියෙසු, චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන්හි;
ගුත්තද්වාරා, වසනලද දොර ඇත්තාහු; ආරක්ඛසතිනො, කායද්වාර
දිය රක්‍ෂාකරන සිහිය ඇත්තාහු; නෙපක්කසතිනො, කායද්වාරාදිය
රක්‍ෂාකරන ඥානයෙන් යුක්තවූ සිහි ඇත්තාහු; සාරක්ඛිතමානසා,
මනාකොට රක්‍ෂාකර ගන්නලද සිත් ඇත්තාහු; සතාරක්ඛෙන චෙතසා,
සිහිය ආරක්‍ෂාකරන්නාවූ සිතින්; සමන්නාගතා, යුක්තවූවාහු; විහ
රථ ඉති, වාසයකරව්යයි; ඉති, මෙසේ; ඉන්ද්‍රියසංවරෙ, ඉන්ද්‍රියසංවර
ශීලයෙහි; සමාදපෙතබ්බා, —පෙ— ආවුසො, ඇවැත්නි; තුමෙහ,
තෙපි, එථ, (මෙහි) එව්; අප්පභස්සාහොථ, ස්වල්පවූ කථා ඇත්තෝ
වව්; භස්ස, කථාවෙහි; පරියන්තකාරිනො ඉති, කෙළවර කරන්
නෝ වව්යයි; ඉති, මෙසේ; භස්සපරියන්තෙ, කථා කෙළවරකිරී
මෙහි; සමාදපෙතබ්බා—පෙ—ආවුසො ඇවැත්නි; එථ, (මෙහි)එව්;
තුමෙහ, තෙපි; ආරඤ්ඤිකා හොථ, ආරණ්‍යකයෝවව්; අරඤ්ඤ,
ආරණ්‍යයෙහි; වනපත්ථානි, (මනුෂ්‍යොපචාරය ඉක්මවා පැවැති
වනයෙහි) වානප්‍රස්ථවූ; පන්තානි සෙනාසනානි; ඉතා දුර පිහිටි
සෙනාසනය: පටිසෙවථ ඉති, සේවනය කරව්යයි; ඉති, මෙසේ;
කායවූපකාසෙ, කායවිවේකයෙහි; සමාදපෙතබ්බා —පෙ— ආවු
සො, ඇවැත්නි; තුමෙහ, තෙපි; එථ, (මෙහි) එව්; සම්මා
දස්සනෙන සමන්නාගතා, සම්‍යග්දර්ශනයෙන් යුක්තවූවාහු: සම්මා
දිට්ඨිකා හොථ ඉති, කම්මස්සකත, ධ්‍යාන, විදර්ශනා, මාර්ග, ඵල
වශයෙන් පස්වැදෑරුම් සම්‍යග් දෘෂ්ටිඇත්තෝ වව්යයි; ඉති, මෙසේ;
සම්මාදස්සනෙ, මනාදර්ශනයෙහි; සමාදපෙතබ්බා —පෙ— ආනන්ද,
ආනන්දය; නවා, නවකවූ; අචිරපබ්බජිතා, පැවිදිවූ නොබෝ කල්
ඇත්තාවූ; ඉමං ධම්මවිනයං, මේ ධර්මවිනය සඞ්ඛ්‍යාත ශාසනයට;

තෙ වො ආනන්ද භික්ඛූ ඉමෙසු පඤ්චසු ධම්මෙසු සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බාති, ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

## අන්ධකවින්ද සුත්තං

—— ෦ ——

“පඤ්චකනිපාතඅඞ්ගුත්තරෙ සඞ්ගීතිසමාරූළ්හං”

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ — අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි ආයස්මාපි ඛො රාහුලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි, අථ ඛො භගවා අපලොකෙත්වා ආයස්මන්තං රාහුලං ආමන්තෙසි.

---

අධුනාගතා, අළුත පැමිණියාවූ; යෙ තෙ භික්ඛූ යම් ඒ භික්ෂූහු වෙද්ද; ආනන්ද, ආනන්දය; වො, තොප විසින්; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; ඉමෙසු පඤ්චසු ධම්මෙසු මේ ධර්මපසෙහි; සමාදපෙතබ්බා -පෙ- ඉදං, මේ දෙශනාව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළ සේක; අත්තමනො, සතුටු සිත්ඇත්තාවූ; ආයස්මා ආනන්දො, ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරතෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, දෙශනාව; අභිනන්දීති, සතුටින් පිළිගත්තේයි.

අන්ධකවින්ද සුත්තං, අන්ධකවින්ද සූත්‍රයයි;

—— 101 ——

පඤ්චක නිපාත අඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයෙහි; සංගීති සමාරූළ්හං, සංගායනාවට ආරොපිතවිය;

—— 102 ——

එවං මෙ සුතං, —පෙ— අථ ඛො එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවා; පත්තචීවරං, පාසිවුරු; ආදාය, ගෙන; සාවත්ථියං, සැවැත් නුවරට; පිණ්ඩාය, පිඬුපිණිස; පාවිසි, පිවිසිසේක; ආයස්මා, ආයුෂ්මත්වූ; රාහුලොපි ඛො, රාහුල ස්ථවිර තෙමේද; පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවා; පත්තචීවරං, පාසිවුරු; ආදාය, ගෙන; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පිට්ඨිතො පිට්ඨිතො, පිටිපසින් පිටිපසින්; අනුබන්ධි, ලුහුබැන්දේය; අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආයස්මන්තං රාහුලං, රාහුල ආයුෂ්මතුන්; අපලොකෙත්වා, බලා; ආමන්තෙසි, ඇමතූසේක;

යං කිඤ්චි රාහුල රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බන්ති, රූපමෙව නු ඛො භගවා රූපමෙව නු ඛො සුගතාති, රූපම්පි රාහුල වෙදනාපි රාහුල සඤ්ඤාපි රාහුල සඞ්ඛාරාපි රාහුල විඤ්ඤාණම්පි රාහුලාති, අථ ඛො ආයස්මා රාහුලො කො නුජ්ජ භගවතා සම්මුඛා ඔවාදෙන ඔවදිතො ගාමං පිණ්ඩාය පවිසිස්සතීති තතො පටිනිවත්තිත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

---

රාහුල, රාහුලය; අතීතානාගතපච්චුප්පන්නං, අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නාවූ; අජ්ඣත්තං වා, ආධ්‍යාත්මිකවූ හෝ; බහිද්ධා වා, බාහිරවූ හෝ; ඔළාරිකං වා, ඖළාරිකවූ හෝ; සුඛුමං වා, සියුම්වූ හෝ; හීනං වා, හීනවූ හෝ; පණීතං වා, ප්‍රණීතවූ හෝ; යං කිඤ්චි රූපං, යම්කිසි රූපයක් වේ ද; දූරෙවා, දූරෙහි වූ හෝ; සන්තිකෙ වා, සමීපයෙහි වූ හෝ; යං, යම් කිසි රූපයක් වේ ද; සබ්බං රූපං, ඒ සියලු රූපය; එතං, මේ රූපය; මම, මාගේ; න නොවේය; එසො, මේ රූපය; න අහං අස්මි, මම නොවෙමි; මෙ, මාගේ; එසො අත්තා, මේ ආත්මය; මෙ න ඉති, මාගේ නොවෙයි, එතං, මේ කාරණය; එවං ඉති, මෙසේ යයි; යථාභූතං, තතුයේ; සම්මප්පඤ්ඤාය, සම්‍යක් ප්‍රඥාවෙන්; දට්ඨබ්බං ඉති, දතයුතුයයි; (වදාළසේක) භගවා, භාග්‍යවතුන් වහන්ස; රූපං එව නු ඛො, (එසේ දතයුතු) රූපය පමණක්මද; සුගත, සුගතයන් වහන්ස; රූපං එව නු ඛො ඉති, (එසේ දතයුතු) රූපය පමණක්මදැයි; (විචාළේය) රාහුල, රාහුලය; රූපම්පි, රූපයද; රාහුල, රාහුලය; වෙදනාපි, වෙදනාවද; රාහුල, රාහුලය; සඤ්ඤාපි, සංඥාවද; රාහුල, රාහුලය; සංඛාරාපි, සංස්කාරයෝද; රාහුල, රාහුලය; විඤ්ඤාණම්පි ඉති, විඤ්ඤාණයද එසේ දතයුතුයයි (වදාළසේක)

අථ ඛො, ඉක්බිති; ආයස්මා, ආයුෂ්මත්වූ; රාහුලො රාහුල නම්; භගවතො භාග්‍යවතුන් වහන්සේගේ; සම්මුඛා ඔවාදෙන, සම්මුඛවූ අවවාදයෙන්; (ජීවමාන බුදුන්ගේ අවවාදයෙන්) ඔවදිතො, අවවාද ලද්දේ; ගාමං ගමට; පිණ්ඩාය, පිඩු පිණිස; අජ්ජ, අද; කො නු, කවරෙක් නම්; පවිසිස්සති ඉති, පිවිසෙන්නේදැයි; තතො, එයින්; පටිනිවත්තිත්වා, ඉවත්ව; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා වෘක්ෂ මූලයෙක්හි; පල්ලඞ්කං, පලඟක්; ආභුජිත්වා බැඳ; කායං, කය; උජුං, ඍජුව; පණිධාය, පිහිටුවා; සතිං, සිහිය; පරිමුඛං, අභිමුඛ කොට; උපට්ඨපෙත්වා, පිහිටුවාගෙන; නිසීදි, හුන්නේය;

අද්දසා ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං රාහුලං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා දිස්වාන ආයස්මන්තං රාහුලං ආමන්තෙසි ආනාපානසතිං රාහුල භාවනං භාවෙහි ආනාපානසති රාහුල භාවනා භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා ති අථ ඛො ආයස්මා රාහුලො සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච කථං භාවිතා නු ඛො භන්තෙ ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා ති.

---

ආයස්මා, ආයුෂ්මත්වූ; සාරිපුත්තො, ශාරිපුත්‍ර ස්ථවිර තෙම; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා වෘක්ෂමූලයෙක්හි; පල්ලඞ්කං, පර්‍ය්‍යඞ්කයක්; ආභුජිත්වා, බැඳ; කායං, කය; උජුං, ඍජුව; පණිධාය, පිහිටුවාගෙන; සතිං, සිහිය; පරිමුඛං, අභිමුඛකොට; උපට්ඨපෙත්වා, පිහිටුවාගෙන; නිසින්නං, හුන්නාවූ; ආයස්මන්තං රාහුලං, ආයුෂ්මත්වූ රාහුලයා; අද්දසා ඛො, දුටුයේමය; දිස්වාන, දැක; ආයස්මන්තං රාහුලං, ආයුෂ්මත්වූ රාහුලයා; ආමන්තෙසි, ඇමතූයේය; රාහුල, රාහුලය; ආනාපානසතිංභාවනං, ආනාපානසති භාවනාව; භාවෙහි, වඩව; රාහුල, රාහුලය; ආනාපානසති භාවනා, ආනාපානසති භාවනා තොමෝ; භාවිතා, වඩනලද්දී; බහුලීකතා, බහුලවශයෙන් කරනලද්දී; මහප්ඵලා හොති. මහත්ඵල වෙයි; මහානිසංසා ඉති, මහත් ආනෘශංස වේ යයි; (කීයේය)

අථ ඛො, ඉක්බිති; ආයස්මා රාහුලො, ආයුෂ්මත්වූ රාහුලතෙම: සායණ්හසමයං, සවස්වේලෙහි පතිසල්ලානා, විවේකයෙන්; වුට්ඨිතො, නැගිටියේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ: භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේය; එකමන්තං, එකත්පසෙක; නිසින්නො ඛො, හුන්නාම වූ; ආයස්මා රාහුලො, ආයුෂ්මත් රාහුලතෙම; භගවන්තං භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; අවොච, කීයේය; භන්තෙ, ස්වාමිනි; ආනාපානසති, ආනාපානසති තොමෝ; කථං, කෙසේ; භාවිතා නු ඛො, වඩනලද්දී; කථං, කෙසේ; බහුලීකතා බහුලවශයෙන් කරනලද්දී; මහප්ඵලා හොති, මහත්ඵලවේද; මහානිසංසා ඉති, මහත් ආනෘශංස වේදැයි; (විචාළේය)

යං කිඤ්චි රාහුල අජ්ඣත්තං පච්චත්තං කක්ඛලං ඛරිගතං උපාදින්නං, සෙය්‍යථීදං කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං කක්ඛලං ඛරිගතං උපාදින්නං අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා පඨවිධාතු, යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු පඨවිධාතුරෙවෙසා තං නෙතං මම නෙසො හමස්මි න මෙ සො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති පඨවිධාතුයා චිත්තං විරාජෙති.

---

රාහුල, රාහුලය; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; පච්චත්තං, ස්ව සන්තානය නිසා පැවැත්තාවූ; කක්ඛළං, කර්කශවූ; ඛරිගතං, පරුෂවූ; යං කිඤ්චි උපාදින්නං, ශරීරස්ථවශයෙන් එක්ව ගන්නාලද යමක් වේද; සෙය්‍යථිදං, හේ කවරේදයත්; කෙසා, කෙස්ය; ලොමා, ලොම්ය; නඛා, නියය; දන්තා, දත්ය; තචො, සිවියය; මංසං, මස්ය; නහාරු, නහරය; අට්ඨි, ඇටය; අට්ඨිමිඤ්ජා, ඇටමිදුලුය; වක්කං, වකුගඩුවය; හදයං හෘදයමාංසය; යකනං, අක්මාවය; කිලොමකං, දලබුවය; පිහකං, බඩදිවය; පප්ඵාසං, පපුමසය; අන්තං, අතුණුය; අන්තගුණං, අතුණුබහනය; උදරියං, උදරකොෂයය; කරීසං, අශුචිය; (යන මොවුහුද)

රාහුල, රාහුලය; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; පච්චත්තං, තම තුළ පිහිටි; කක්ඛළං, තදවූ; ඛරිගතං, පරුෂවූ; අඤ්ඤං අපි, අන්‍යවූ ත්‍රිවිධ ධාතූන් හා අනුශයගත; යං වා පන කිඤ්චි, යම් කිසි; උපාදින්නං, ශරීරස්ථවශයෙන් එක්ව ගන්නාලද්දක්වේද: අයං, මේ; අජ්ඣත්තිකා, ආධ්‍යාත්මිකවූ; පඨවී ධාතු වුච්චති, පෘථිවී ධාතු යයි කියනු ලැබේ; අජ්ඣත්තිකා, ආධ්‍යාත්මිකවූ; යාචෙව ඛො පන පඨවීධාතු, යම් බඳු පෘථිවි ධාතුවක්වේද; බාහිරා, බාහිරවූ; යාච, යම් බඳු පෘථිවී ධාතුවක්වේද; එසා, මෝතොම; පඨවීධාතුඑව, පෘථිවීධාතුමය; තං එතං, ඒ මේ (දෙවැදෑරුම්වූවාවූ පෘථිවී ධාතු තොමෝ); මම, මාගේ න, නොවේය; එසො, මේ රූපය; න අහං අස්මි, මම නොවෙමි; එසො අත්තා, මේ ආත්මය; මෙ, මාගේ; න ඉති, නොවේයයි; එවං, මෙසේ; එතං, මේ කාරණය; යථාභූතං, තත්වූ පරිදි; සම්මප්පඤ්ඤාය, විදර්ශනා ඥානයෙන්; දට්ඨබ්බං, දතයුතුයි; එවං, මෙසේ; එතං මේ කාරණය; යථාභූතං, තත්වූ පරිදි; සම්මප්පඤ්ඤාය විදර්ශනා ඥානයෙන්; දිස්වා, දැක; පඨවීධාතුයා, පෘථිවීධාතුව කෙරෙහි; නිබ්බින්දති කළකිරෙයි; පඨවීධාතුයා, පෘථිවීධාතුවෙහි; චිත්තං, සිත; විරාජෙති, නොඇලවයි;

කතමා ච රාහුල ආපොධාතු, ආපොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා, කතමා ච රාහුල අජ්ඣත්තිකා ආපොධාතු, යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං සෙය්‍යථීදං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා ආපොධාතු, යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආපොධාතු යා ච බාහිරා ආපොධාතු ආපොධාතුරෙවෙසා තං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආපොධාතුයා නිබ්බින්දති ආපොධාතුයා චිත්තං විරාජෙති.

කතමා ච රාහුල තෙජොධාතු? තෙජොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා, කතමා ච රාහුල අජ්ඣත්තිකා තෙජොධාතු. යං අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං, සෙය්‍යථීදං යෙන ච සන්තප්පති යෙන ච ජීරති යෙන ච පරිඩය්හති යෙන ච අසිත පීත ඛායිත සායිතං සම්මා පරිණාමං ගච්ඡති යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා තෙජොධාතු, යා චෙව ඛො පන අජ්ඣත්තිකා තෙජොධාතු යා ච බාහිරා තෙජොධාතු තෙජොධාතුරෙවෙසා තං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා තෙජොධාතුයා නිබ්බින්දති තෙජොධාතුයා චිත්තං විරාජෙති.

---

රාහුල, රාහුලය; ආපොධාතු ආපොධාතු තොම; කතමා ච, කවරී ද; අජ්ඣත්තිකා, ආධ්‍යාත්මික වූ; ආපොධාතු සියා, ආපො ධාතු වන්නීය; බාහිරා, බාහිරවූ (ආපොධාතු); සියා, වන්නීය; රාහුල, රාහුලය; අජ්ඣත්තිකා, ආධ්‍යාත්මිකවූ; ආපොධාතු, ආපො ධාතු තොම; කතමා ච, කවරීද; අජ්ඣත්තං,—පෙ— ආපො, වැගිරෙන ස්වභාව ඇති; ආපොගතං, වැගිරෙන ස්වභාවයට ගියාවූ; යං උපාදින්නං, ශරීරයෙහි වශයෙන් එක්වගන්නාලද යමක්වේද; සෙය්‍යථීදං හේ කවරේද; පිත්තං, පිතය; සෙම්හං සෙමය; පුබ්බො, සැරවය, ලොහිතං, ලේය; සෙදො, ඩහදියය; මෙදො, මේදතෙලය; අස්සු, කඳුළය; වසා මස් තෙලය; ඛෙළො, කෙළය; සිඞ්ඝාණිකා, සොටුය; ලසිකා, සඳමිදුලු ය; මුත්තං, මූත්‍ර ය; (යන මොව්හු ද) අජ්ඣත්තං —පෙ— විරාජෙති —පෙ—

කතමා ච රාහුල වායොධාතු වායොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා, කතමා ච රාහුල අජ්ඣත්තිකා වායොධාතු යං අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං සෙය්‍යථීදං උද්ධඞ්ගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨාසයා වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා අස්සාසො පස්සාසොති යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා වායොධාතු යා චෙව ඛො පන අජ්ඣත්තිකා වායොධාතු යා ච බාහිරා වායොධාතු වායොධාතුරෙවෙසා තං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති වායොධාතුයා චිත්තං විරාජෙති.

---

තෙජොධාතු, උෂ්ණ ස්වභාවඇති තෙජොධාතු තොම; —පෙ— සෙය්‍යථිදං, හේ කවරේද; යෙනච සන්තප්පති, යම් තෙජසකින් (මේ සිරුර) තැවේද; යෙනච ජීරති යම් තෙජොගුණයකින් දිරාද; යෙන ච පරිඩය්හති, යම් තෙජොගුණයකින් දැවේද; යෙනච, යම් තෙජො ගුණයකින්; අසිත, වළඳනාලද; පීත, පානය කරනලද; ඛායිත, කඩාකනලද; සායිතං, රසවිඳ ගන්නාලද (දෑ); සම්මාපරිනාමං ගච්ඡති, මනාකොට පැසවීමට යේද; (යන මොහුද) යංවාපන —පෙ— විරාජෙති —පෙ— වායොධාතු, විසර්ජනය ස්වභාවඇති වායොධාතු තොම; —පෙ - උපාදින්නං —පෙ— සෙය්‍යථිදං, හේ කවරේදයත්; උද්ධඞ්ගමා වාතා, වමන හික්කාදිය පවත්වන්නාවූ උද්ධඞ්ගම වාතයෝය; අධොගමා වාතා උච්චාරපස්සාවාදිය බැහැර (කිරීමෙහිවූ) අධොගම වාතයෝය; කුච්ඡිසයා වාතා, බඩවැල පිටත හැසිරෙන කුක්ෂිගත වාතයෝය; කොට්ඨාසයා වාතා, බඩවැල ඇතුළෙහි හැසිරෙන වාතයෝය; අඞ්ගමඞ්ගානුසාරිනො වාතා, ධමනි අනුසාරයෙන් සියලු සිරුර හැසිරෙන සම්මිඤ්ජන පසාරණාදිය නිපදවන්නාවූ අඞ්ගමඞ්ගානුසාරී වාතයෝය; අස්සාසො, සිරුර තුළට වදනා නාසිකා වාතය; පස්සාසො ඉති, පිටතට නික්මෙන නාසිකා වාතය (යන මොව්හුද) යංවා —පෙ - විරාජෙති—

ආකාසධාතු, ආකාශධාතුතොම; —පෙ— අඝං, නොගැටීම් ස්වභාවඇති; අඝගතං, නොගැටීම් ස්වභාවයට ගියාවූ; විවරං අතර ඇති; විවරගතං, අන්තර ස්වභාවගතවූ; මංසලොහිතෙහි, මස්ලේ ආදියෙන්; අසම්ඵුට්ඨං, ස්පර්ශනොකරනලද; යං උපාදින්නං, -සෙ- කණ්ණච්ඡිද්දං, මස් ලේ ආදියෙන් ස්පර්ශනොකරනලද කන්සිදුරුය; නාසච්ඡිද්දං නාසිකා සිදුරුය; මුඛද්වාරං, මුවදොරය; යෙනච, යම් සිදුරකින්; අසිත -පෙ- අජ්ඣොහරති, ඇතුලට ප්‍රවේශකරවාද; යත්ථච, යම් සිදුරෙක්හි, අසිත -පෙ- සන්තිට්ඨති, පිහිටුවාද; යෙනච, -පෙ- අධොභාගා, යටභාගයෙන්; නික්ඛමති, බැහැරලාද; යංවා —පෙ—

කතමා ච රාහුල ආකාසධාතු ආකාසධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා, කතමා ච රාහුල අජ්ඣත්තිකා ආකාසධාතු යං අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං අඝං අඝගතං විවරං විවරගතං අසම්ඵුට්ඨං මංසලොහිතෙහි උපාදින්නං සෙය්‍යථිදං කණ්ණච්ඡිද්දං නාසච්ඡිද්දං මුඛද්වාරං යෙන ච අසිත පීත ඛායිත සායිතං අජ්ඣොහරති යත්ථ ච අසිතපීතඛායිතසායිතං සන්තිට්ඨති යෙන ච අසිතපීත ඛායිතසායිතං අධොභාගා නික්ඛමති යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං අඝං අඝගතං විවරං විවරගතං අසම්ඵුට්ඨං මංසලොහිතෙහි උපාදින්නං අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා ආකාසධාතු යාචෙව ඛො පන අජ්ඣත්තිකා ආකාසධාතු යා ච බාහිරා ආකාසධාතු ආකාසධාතුරෙවෙසා තං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආකාසධාතුයා නිබ්බින්දති ආකාසධාතුයා චිත්තං විරාජෙති.

පඨවීසමං රාහුල භාවනං භාවෙහි පඨවීසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා මනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති සෙය්‍යථාපි රාහුල පඨවියා සුචිම්පි නික්ඛිපන්ති අසුචිම්පි නික්ඛිපන්ති ගූථගතම්පි නික්ඛිපන්ති මුත්තගතම්පි නික්ඛිපන්ති ඛෙළගතම්පි නික්ඛිපන්ති පුබ්බගතම්පි නික්ඛිපන්ති ලොහිතගතම්පි නික්ඛිපන්ති න ච තෙන පඨවී අට්ටියති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො ත්වං රාහුල පඨවීසමං භාවනං භාවෙහි පඨවීසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා මනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති

---

රාහුල, රාහුලය; පඨවිසමං, පෘථිවිය හා සමවූ. භාවනං, භාවනාව භාවෙහි, වඩව; රාහුල, රාහුලය; හි, යම්හෙයකින්; පඨවිසමං, පෘථිවිය සමවූ; භාවනං, භාවනාව භාවයතො, වඩන්නාවූ; තෙ, ඔබට; උප්පන්නා, උපන්නාවූ; මනාපා මනාපා, සොම්නස් දොම්නස් සහගියාවූ; ඵස්සා, ස්පර්ශයෝ; චිත්තං, සිත; පරියාදාය, හාත්පසින් මැඩගෙන; න ඨස්සන්ති, නොසිටින්නාහ;

රාහුල, රාහුලය; සෙය්‍යථාපි, යම්සේ; පඨවියා, පෘථිවියෙහි; සුචිම්පි, පවිත්‍රවූ දෑයද; නික්ඛිපන්ති, බහාලද්ද; අසුචිං අපි, අසූචියද; නික්ඛිපන්ති, බහාලද්ද; ගූථගතං අපි, ගූථගතවූව ද; නික්ඛිපන්ති, බහාලද්ද; මුත්තගතං අපි, මූත්‍රගතවූව ද; නික්ඛිපන්ති බහාලත්ද; ඛෙළං අපි, කෙළද; -පෙ— පුබ්බගතං අපි; සැරවද; ලොහිතගතං අපි, ලෙහෙද; නික්ඛිපන්ති, බහාලත්ද; තෙන, එයින්; පඨවී, පෘථිවිතොම; නවා අට්ටියති, පීඩා හෝ නොවේද; නවා හරායති, ලජ්ජා හෝ නොවේද; නවා ජිගුච්ඡති, පිළිකුල් හෝ නොකෙරේද;

ආපොසමං රාහුල භාවනං භාවෙහි ආපොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති සෙය්‍යථාපි රාහුල ආපස්මිං සුචිම්පි ධොවන්ති අසුචිම්පි ධොවන්ති ගූථගතම්පි ධොවන්ති මුත්තගතම්පි ධොවන්ති ඛෙළගතම්පි ධොවන්ති පුබ්බගතම්පි ධොවන්ති ලොහිත ගතම්පි ධොවන්ති න ච තෙන ආපොධාතු අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො ත්වං රාහුල ආපොසමං භාවනං භාවෙහි ආපොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති

තෙජොසමං රාහුල භාවනං භාවෙහි තෙජොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති සෙය්‍යථාපි රාහුල තෙජො සුචිම්පි ඩහති අසුචිම්පි ඩහති ගූථගතම්පි ඩහති මුත්තගතම්පි ඩහති ඛෙළගතම්පි ඩහති පුබ්බගතම්පි ඩහති ලොහිතගතම්පි ඩහති න ච තෙන තෙජො අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො ත්වං රාහුල තෙජොසමං භාවනං භාවෙහි තෙජොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති.

වායොසමං රාහුල භාවනං භාවෙහි වායොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති සෙය්‍යථාපි රාහුල වායො සුචිම්පි උපවායති අසුචිම්පි උපවායති ගූථගතම්පි උපවායති මුත්තගතම්පි උපවායති ඛෙලගතම්පි උපවායති පුබ්බගතම්පි උපවායති ලොහිතගතම්පි උපවායති න ච තෙන වායො අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො ත්වං රාහුල වායොසමං භාවනං භාවෙහි වායොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති.

ආකාසසමං රාහුල භාවනං භාවෙහි ආකාසසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති සෙය්‍යථාපි රාහුල ආකාසො න කත්ථචි පතිට්ඨිතො එවමෙව ඛො ත්වං රාහුල ආකාසසමං භාවනං භාවෙහි ආකාසසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදාය ඨස්සන්ති

---

රාහුල, රාහුලය; එවං එව ඛො, එපරිද්දෙන්ම; ත්වං, ඔබ; පඨවිසමං, —පෙ— ධොවන්ති, ධෝවනයකරත්; —පෙ— ආපොසමං —පෙ— තෙජො —පෙ— වායො —පෙ— උපවායති, හමායයි; ආකාසසමං පෙ මෙත්තං —පෙ— යො බ්‍යාපාදො, යම් ව්‍යාපාදයෙක් වේ ද; සො, ඒ ව්‍යාපාදය; පහීයිස්සති, පහව යන්නේය;

මෙත්තං රාහුල භාවනං භාවෙහි මෙත්තං හි තෙ රාහුල භාවනං භාවයතො යො බ්‍යාපාදෙ සො පහීයිස්සති, කරුණං රාහුල භාවනං භාවෙහි කරුණං හි තෙ රාහුල භාවනං භාවයතො යා විහෙසා සා පහීයිස්සති මුදිතං රාහුල භාවනං භාවෙහි මුදිතං හි තෙ රාහුල භාවනං භාවයතො යා අරති සා පහීයිස්සති, උපෙක්ඛං රාහුල භාවනං භාවෙහි උපෙක්ඛං හි තෙ රාහුල භාවනං භාවයතො යො පටිඝො සො පහීයිස්සති, අසුභං රාහුල භාවනං භාවෙහි අසුභං හි තෙ රාහුල භාවනං භාවයතො යො රාගො සො පහීයිස්සති, අනිච්චසඤ්ඤං රාහුල භාවනං භාවෙහි අනිච්චසඤ්ඤං හි තෙ රාහුල භාවනං භාවයතො යො අස්මිමානො සො පහීයිස්සති, ආනාපානසතිං රාහුල භාවනං භාවෙහි ආනාපානසති හි තෙ රාහුල භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා කථංභාවිතා රාහුල ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා.

ඉධ රාහුල භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සො සතොව අස්සසති සතො පස්සසති. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති සබ්බකාය

---

කරුණං —පෙ— යා විහෙසා, යම් විහිංසාවක් වේ ද; සා, ඕතොම, පහීයිස්සති, ප්‍රහීණවන්නීය; මුදිතං, මුදිතාව; පෙ— යා අරති, (ප්‍රාන්තසේනාසනයන්හි හා අධි කුශල ධර්මයන්හි) යම් නලකිරීමක් වේ ද; —පෙ— උපෙක්ඛං, උපෙක්ෂාව; —පෙ— යො පටිඝො, යම් ප්‍රතිඝයෙක් වේ ද; —පෙ— අසුභං, අසුභය; —පෙ— යොරාගො, යම් රාගයෙක් වේ ද; -පෙ- අනිච්චසඤ්ඤං, අනිත්‍ය සංඥාව -පෙ- යො අස්මිමානො, රූපාදීන්හි මමය යන මානය; –පෙ— ආනාපානසතිං, ආනාපානසතිය; —පෙ—

රාහුල, රාහුලය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, ආරණ්‍යයට ගියේ හෝ; රුක්ඛමූල ගතො වා, වෘක්ෂමූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, ශූන්‍ය ගෘහයකට ගියේ හෝ; පල්ලඞ්කං ආභුජිත්වා, පර්‍ය්‍යඞ්කාභොගය කොට; කායං, කය; උජුං පණිධාය, ඍජුකොට පිහිටුවා; සතිං, සිහිය; පරිමුඛං උපට්ඨපෙත්වා, ඉදිරියෙහි පිහිටුවා; නිසීදති, (භාවනාවට යොග්‍යාකාරයෙන්) හිඳියි; සො, හෙතෙම; සතොව, සිහිඇතිවම; අස්සසති, ආශ්වාස කරයි; සතො, සමෘතිමත් වූයේ; පස්සසති, ප්‍රශ්වාසකරයි;

පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති— අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති එවං භාවිතා ඛො රාහුල ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා එවං භාවිතාය ඛො රාහුල ආනාපානසතියා එවං බහුලීකතාය

---

දීඝං, දිඝීකොට; අස්සසන්තො වා, ආශ්වාස කරන්නේ හෝ; දීඝං, දීඝීකොට; අස්සාමීති, ආශ්වාසකරමියි; පජානාති, දනියි; දීඝං, දීඝීකොට; පස්සසන්තො වා, ප්‍රශ්වාස කරන්නේ හෝ; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරමියි; පජානාති, දනියි; රස්සං වා, හ්‍රස්වකොට හෝ -පෙ- සබ්බකායපටිසංවෙදී, සියලු ආශ්වාස ප්‍රශ්වාසකය දන්නේ; අස්සසිස්සාමීති, ආශ්වාසකරමියි; සික්ඛති, හික්මෙයි; —පෙ— කායසඞ්ඛාරං, කායසංස්කාරය; පස්සම්භයං, මැඩලමින්; අස්ස —පෙ— පීතිපටිසංවෙදී, සියලු ආශ්වාස ප්‍රශ්වාසය දන්නේ; —පෙ— සුඛපටිසංවෙදී, සුවය දන්නේ; —පෙ— චිත්තසඞ්ඛාරපටිසංවෙදී, චිත්තසංස්කාරය දන්නේ; —පෙ— චිත්තං, සිත; සමාදහං, එකාග්‍රකරමින්; චිත්තං, සිත; විමොචයං, කෙලෙසුන් කෙරෙන් මුදමින්; —පෙ— අනිච්චානුපස්සී, අනිත්‍යානුදර්ශීව;—පෙ—විරාගානුපස්සී, විරාගානුදර්ශීව; —පෙ— නිරොධානුපස්සී, නිරොධය අනුව දක්නේ; -පෙ- පටිනිස්සග්ගානුපස්සී, මිදීම අනුව දක්නේ; —පෙ— තෙ, තාගේ; චරිමකා, පශ්චිමකාවූ; යෙපි අස්සාසපස්සාසා, යම් ආශ්වාස ප්‍රශ්වාසයෝ වෙද්ද; තෙපි, ඔව්හුද; විදිතාව, දන්නා ලද්දෝම;

යෙපි තෙ චරිමකා අස්සාසපස්සාසා තෙපි විදිතාව නිරුජ්ඣන්ති නො අවිදිතාති— ඉදමවොච භගවා අත්තමනො ආයස්මා රාහුලො භගවතො භාසිතං අභිනන්දීති.

## මහාරාහුලොවාද සුත්තං.

“මජ්ඣිමපණ්ණාසකෙ”

---

සාවත්ථියං— අථඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච — ධම්ම විහාරී ධම්ම විහාරීති භන්තෙ වුච්චති කිත්තාවතා නුඛො භන්තෙ භික්ඛු ධම්මවිහාරී හොතීති, ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තංගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුත ධම්මං වෙදල්ලං සො තාය ධම්මපරියත්තියා දිවසං අතිනාමෙති රිඤ්චති පටිසල්ලානං නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පරියත්තිබහුලො නො ධම්ම විහාරී.

---

නිරුජ්ඣන්ති, නිරුධවෙත්; අවිදිතා, නොදත්තෝ; නො ඉති, නොවෙත් යයි; භගවා, භාග්‍යවත්තෙම; ඉදං, මේ සූත්‍රය; අවොච, වදාළසේක; අත්තමනො. සතුටු සිත්ඇති; ආයස්මා රාහුලො, ආයුෂ්මත් රාහුලතෙමේ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, භාසිතය; අභිනන්දි ඉති, සතුටින් පිළිගත්තේයි.

මහා රාහුලොවාද සුත්තං, මහාරාහුලොවාද සූත්‍රයයි;
මජ්ඣිම පණ්ණාසකෙ, (මැදුම්සගියෙහි) මධ්‍යම පණ්ණසක යෙහිය.

-o:o-

සාවත්ථියං --පෙ— එතදවොච; භන්තෙ, ස්වාමීනි (භාග්‍යවතුන් වහන්ස;) ධම්මවිහාරී ධම්මවිහාරී ඉති, ධම්මවිහාරි ධම්මවිහාරී යයි; වුච්චති, කියනු ලැබේ; භන්තෙ, ස්වාමීනි; භික්ඛු, මහණ තෙම; කිත්තාවතානු ඛො, කොපමණකින් නම්; ධම්මවිහාරී හොති ඉති, ධර්මයෙන් යුක්තව වසනසුලු වේදැයි; (විචාළේය) භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; සුත්තං, සූත්‍රය; ගෙය්‍යං, ගෙය්‍ය නම්වූ සගාථක සූත්‍රය; වෙය්‍යාකරණං, වෙය්‍යාකරණ නම්වූ (අභිධර්මපිටක ගාථාරහිත සූත්‍රාදිහුය;) ගාථං, ගාථා නම්වූ (ධම්මපදාදි සූත්‍රසඞ්ග නොවූවය;) උදානං, උදාන නම්වූ (ප්‍රීතිවේගයෙන් ප්‍රකාශිත සගාථක සූත්‍රය;) ඉතිවුත්තකං, ඉතිවුත්තක නම්වූ (බුදුන් විසින් මෙය වදාරන ලදැයි යනාදින් පවත්නා සූත්‍රය;) ජාතකං, අපණ්ණකාදි ජාතකය; අබ්භුතධම්මං, ආශ්චර්ය්‍ය අද්භූත ධර්‍ම

පුනචපරං භික්ඛවෙ භික්ඛු යථා සුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති සො තාය ධම්මසඤ්ඤත්තියා දිවසං අතිනාමෙති රිඤ්චති පටිසල්ලාණං නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සඤ්ඤත්තිබහුලො නො ධම්මවිහාරි. පුනචපරං භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති සො තෙන සජ්ඣායෙන දිවසං අතිනාමෙති රිඤ්චති පටිසල්ලාණං නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සජ්ඣායබහුලො නො ධම්මවිහාරී පුනචපරං භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති සො තෙහි ධම්මවිතක්කෙහි දිවසං අතිනාමෙති රිඤ්චති පටිසල්ලාණං නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථා අයං වුච්චති භික්ඛවෙ භික්ඛු විතක්කබහුලො නො ධම්මවිහාරී. ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං සො තාය ධම්මපරියත්තියා න දිවසං අතිනාමෙති න රිඤ්චති පටිසල්ලාණං අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං එවං භික්ඛවෙ භික්ඛු ධම්මවිහාරීති

---

ප්‍රවෘත්ති සංයුක්ත සූත්‍ර ධර්මය; වෙදල්ලං, චූල්ල වෙදල්ල මහා වෙදල්ලාදි සූත්‍රය; (යන මේ නවාඞ්ග ශාස්තෘ ශාසන සංඛ්‍යාත;) ධම්මං, ධර්මය; පරියාපුණාති, පුහුණු කරයිද; සො, හෙතෙම; තාය ධම්මපරියත්තියා, ඒ ධර්මපර්‍ය්‍යාප්තියෙන්; දිවසං, දවස; අතිනාමෙති, ඉක්මවයිද; පටිසල්ලීනං, විවේකාග්‍රතාව; රිඤ්චති, විසර්ජනය කරයිද; අජ්ඣත්තං, ආධ්‍යාත්මයෙහි; චෙතොසමථං, චිත්තසමාධිය හෙවත් සමථ කර්මස්ථානය; නානුයුඤ්ජති, නොයොදයිද; භික්ඛවෙ, මහණෙනි; අයං භික්ඛු, මේ මහණ තෙම; පරියත්ති බහුලො, පර්‍ය්‍යාප්තිය බහුලකොට ඇත්තේය; නො ධම්මවිහාරී, ධර්මවිහාරි නොවේ; භික්ඛවෙ, මහණෙනි; පුනචපරං, නැවතද; භික්ඛු, මහණතෙම; සුතං, ඇසීම; යථා, යම්සේද; පරියත්තිං, පර්‍ය්‍යාප්තිය; යථා, යම්සේද; (එසේ) ධම්මං, ධර්මය; විත්ථාරෙන, විස්තර වශයෙන්; පරෙසං, මෙරමාහට; දෙසෙති, දෙශනා කෙරේද; සො, හෙතෙම; තාය ධම්ම සඤ්ඤත්තියා, ඒ ධර්මසංඥප්තියෙන්, දිවසං, —පෙ— සඤ්ඤත්තිබහුලො, සංඥප්තිය බහුලකොට ඇත්තේය; —පෙ— පුනචපරං -පෙ- සජ්ඣායංකරොති, හැදෑරීම කෙරේද; —පෙ— ධම්මං, ධර්මය; චෙතසා සිතින්; අනුවිතක්කෙති, විතර්කනය කෙරෙයිද; අනුවිචාරෙති, අනු විචාරනය කෙරෙයිද; මනසා, සිතින්; අනුපෙක්ඛති, අනු දකීද; සො, හෙතෙම; තෙහි ධම්මවිතක්කෙහි, ඒ ධර්ම විතර්කයන්ගෙන්; දිවසං —පෙ— න අතිනාමෙති, නොයික්මවාද; පටිසල්ලීනං, එකී

ඉති ඛො භික්ඛවෙ භික්ඛු දෙසිතො මයා පරියත්තිබහුලො දෙසිතො සඤ්ඤත්තිබහුලො දෙසිතො සජ්ඣායබහුලො දෙසිතො විතක්කබහුලො දෙසිතො ධම්මවිහාරී යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය කතං වො තං මයා එතානි භික්ඛවෙ රුක්ඛමූලානි එතානි සුඤ්ඤාගාරානි ඣායථ මා පමාදත්ථ මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ අයං වො අම්හාකං අනුසාසනීති.

ධම්මවිහාරි සුත්තං.

“පඤ්චකඞ්ගුත්තරෙ”

---

කච්චි අභිණ්හසංවාසා - නාවජානාසි පණ්ඩිතං
උක්කාධාරො මනුස්සානං - කච්චි අපචිතො තයා.

---

හාවය; නරිඤ්චති, සිස්තොතෙරේද; —පෙ— භික්ඛවෙ, මහණෙනි; ඉති ඛො, මෙසේ වනාහි; මයා, මා විසින්; පරියත්තිබහුලො, පර්‍ය්‍යාප්තිය බහුලකොට ඇති; භික්ඛු, මහණතෙම; දෙසිතො, දෙශනා කරන ලද්දේය; සඤ්ඤත්තිබහුලො, සංඥප්තිය බහුලකොට ඇත්තේ;— සජ්ඣායබහුලො, හැදෑරීම් බහුලකොට ඇත්තේ; – විතක්කබහුලො, විතර්ක බහුලකොට ඇත්තේ; – ධම්මවිහාරී, ධර්මවිහරන ඇත්තේ; – භික්ඛවෙ, මහණෙනි; සාවකානං, ශ්‍රාවකයන්ට; හිතෙසිනා, හිතෙසිවූ; අනුකම්පකෙන, අනුකම්පා ඇත්තාවූ; සත්ථාරා, ශාස්ත්‍රෘවක්හු විසින්; යං කරණීයං, යමක් කටයුතුද; තං, එය; මයා, මා විසින්; වො, තොපට; අනුකම්පං උපාදාය, අනුකම්පා සඳහා; කතං, කරනලද්දේය; භික්ඛවෙ, මහණෙනි; එතානි රුක්ඛමූලානි, මොහු වෘක්ෂමූල සේනාසනයෝය; එතානි සුඤ්ඤාගාරානි, මොහු සූන්‍යගෘහ සේනාසනයෝය; ඣායථ, ධ්‍යානකරව්; මාපමාදත්ථ, ප්‍රමාද නොවව්; පච්ඡා, පසුව; මාවිප්පටිසාරිනොඅහුවත්ථ, විපිළිසර වූවාහු නොවව්; අයං, මේ; වො, තොපට; අම්හාකං, අප්ගේ; අනුසාසනී ඉති, අනුශාසනාව වේ යයි (වදාළසේක.)

ධම්මවිහාරී සුත්තං, ධම්මවිහාරී සූත්‍ර යයි;

—— o:o ——

පඤ්චකඞ්ගුත්තරෙ, (අඞ්ගුත්තර සඟියෙහි) පඤ්චක නිපාතයෙහිය.

—— o:o ——

අභිණ්හ සංවාසා, නිරතුරු සංවාසයෙන්; කච්චි, කවර නම්; පණ්ඩිතං, පණ්ඩිතයකු; නඅවජානාසි, (ජාත්‍යාදීන්) අවඥනොකරන් නෙහිද; මනුස්සානං, මිනිසුන් අතුරෙන්; උක්කාධාරො, ඥාන ධර්මදෙශනා ප්‍රදීපයන් ධාරනය කරන හෙයින් උක්කාධාරනම්වූ; කච්චි කවරක්; තයා, තා විසින්; අපචිතො, පුදනලද්දේද;

නාහං අභිණ්හසංවාසා-අවජානාමි පණ්ඩිතං
උක්කාධාරො මනුස්සානං-නිච්චං අපචිතො මයා.

පඤ්චකාමගුණෙ හිත්වා-පියරූපෙ මනොරමෙ
සද්ධාය ඝරා නික්ඛම්ම-දුක්ඛස්සන්තකරො භව.

මිත්තෙ භජස්සු කල්‍යාණෙ-පන්තඤ්ච සයනාසනං
විවිත්තං අප්පනිග්ඝොසං-මත්තඤ්ඤූ හොහි භොජනෙ.

චීවරෙ පිණ්ඩපාතෙ ච=පච්චයෙ සයනාසනෙ
එතෙසු තණ්හං මා කාසි-මා ලොකං පුනරාගමි.

සංවුතො පාතිමොක්ඛස්මිං-ඉන්ද්‍රියෙසු ච පඤ්චසු
සති කායගතාත්‍යත්ථු-නිබ්බිදාබහුලො භව.

---

අහං, මම; අභිණ්හසංවාසා, නිරතුරු සංවාසයෙන්; පණ්ඩිතං, පණ්ඩිතවූ (සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ;) න අවජානාමි, (ජාත්‍යාදියෙන්) අවඥ නොකෙරෙමි; මනුස්සානං, මිනිසුන් අතුරෙන්; උක්කාධාරො, ඥනධර්ම දෙශනා ප්‍රදීපයන් ධරන හෙයින් උක්කාධාර නම්වූ (සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ;) නිච්චං, නිත්‍යයෙන්; මයා, මා විසින්; අපචිතො, පුදනලද්දේයයි;

පියරූපෙ, (සත්වයන්ට) පියරූපවූ; මනොරමෙ, සිත්කළුවූ; පඤ්චකාමගුණෙ, පඤ්චකාමයන්; හිත්වා, හැර; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; ඝරා, ගිහිගෙයින්; නික්ඛම්ම, නික්ම; දුක්ඛස්ස අන්තකරො භව, දුක් කෙළවර කරන්නේ වෙව;

කල්‍යාණෙ, යහපත්වූ; මිත්තෙ, මිතුරන් ද; පන්තං, ප්‍රාන්තවූ; විවිත්තං, ජනවිවිත්තවූ; අප්පනිග්ඝොසං, ඝොෂා රහිතවූ; සෙනාසනඤ්ච, සෙනසුන් ද; භජස්සු, භජනය කරව; භොජනෙ, භොජනයෙහි; මත්තඤ්ඤූ හොහි, පමණ දන්නේ වෙව;

චීවරෙ ච, චීවර ප්‍රත්‍යයෙහි ද; පිණ්ඩපාතෙච, පිණ්ඩපාතයෙහි ද; පච්චයෙ ච, ගිලාන ප්‍රත්‍යයෙහි ද; සයනාසනෙ ච, සෙනසුනෙහි ද; (යන) එතෙසු, චීවරාදි මේ සිව්පසයෙහි; තණ්හං, තෘෂ්ණාව; මාකාසි නොකරව (එසේ කළකල්හි; ඔබ) ලොකං, (මේ) ලොකයට; මාපුන ආගමි, නැවත නොඑන්නේය;

පාතිමොක්ඛස්මිං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙහි ද; පඤ්චසු ඉන්ද්‍රියෙසු, පඤ්චෙන්ද්‍රියයන්හි ද; හෙවත් ඉන්ද්‍රිය සංවර ශීලයෙහි ද; සංවුතො භව, සංවර ඇත්තෙක් වෙව; තෙ, නුඹට; කායගතා සති අත්‍ථු, කායගතාසතිය භාවනාවශයෙන් වේවා; නිබ්බිදාබහුලො භව, (සංසාර වෘත්තයෙහි) කළකිරීම් බහුලකොට ඇත්තෙක් වෙව;

නිමිත්තං පරිවජ්ජේහි-සුභං රාගූපසංහිතං
අසුභාය චිත්තං භාවේහි-එකග්ගං සුසමාහිතං.
අනිමිත්තඤ්ච භාවේහි-මානානුසයමුජ්ජහ
තතො මානාභිසමයා-උපසන්තො චරිස්සසීති.

ඉත්ථං සුදං භගවා ආයස්මන්තං රාහුලං ඉමාහි ගාථාහි අභිණ්හං ඔවදතීති.

රාහුල සුත්තං.
"සුත්තනිපාතෙ"

---

චරං වා යදි වා තිට්ඨං-නිසින්නො උද වා සයං
සම්මිඤ්ජෙති පසාරෙති-එසා කායස්ස ඉඤ්ජනා.

---

රාගූපසංහිතං, රාගෝත්පත්තියට හෙතුවූ; සුභං නිමිත්තං, ශුභ නිමිත්ත; පරිවජ්ජේහි, දුරුකරව; අසුභාය, අශුභ භාවනාවෙහි; එකග්ගං, එකාග්‍ර කොට; සුසමාහිතං, මොනවට සමාධිගතකොට; චිත්තං, සිත; භාවෙහි, වඩව;

අනිමිත්තඤ්ච, නිර්වේදභාගීවූ සමාධියෙන් එකහවූ සිත් ඇත්තේ; භාවෙහි, (විදර්ශනා) වඩව; මානානුසයං, මානය අනුසය (යන මොහු) උජ්ජහ, දුරුකරව; තතො, එහෙයින්; මානාභිසමයා, මානය දුරුකිරීමෙන්; උපසන්තො, සංහිඳුනේ; චරිස්සසි ඉති, හැසිරෙන්නේ යයි;

භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉමාහි ගාථාහි, මේ ගාථාවන් ගෙන්; අභිණ්හං, නිරතුරු; ආයස්මන්තං, ආයුෂ්මත් වූ; රාහුලං, රාහුල ස්ථවිරයන් වහන්සේට; ඉත්ථං සුදං, මේ අර්ථයෙන්; ඔවදති ඉති, අවවාද කෙරේ යයි කීහු.

රාහුල සුත්තං, රාහුල සූත්‍ර යයි;

——०:०——

"සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි ය;"

——०:०——

චරං වා, (සියලු රූපකායයාගේ යායුතුදිගට අභිමුඛව පැමිණවීම් වශයෙන්) යන්නේ හෝ වේද; යදි, ඉදින්; තිට්ඨං වා, (එහි රඳා සිටීම් භාවයෙන්) සිටින්නේ හෝ වේද; නිසින්නො වා, (එම රූප කායයාගේ යටභාගය හකුළුවා උඩභාගය කෙළින් සිටුවන බැවින්) හිඳිනේ හෝ වේද: උදවා, නවද; සයං, (සරස දිගුකිරීම් භාවයෙන්) හෝනේ හෝ වේද; සම්මිඤ්ජති වා, (හස්තපාදාදීන්) හකුළුවන්නේ හෝ වේද; පසාරෙති වා, දිගුකරන්නේ හෝ වේද, එසා, මේ තොමෝ; කායස්ස, (සම්භාරයුක්ත) ශරීරයාගේ; ඉඤ්ජනා, සැලීමය නොහොත් පැතිරීමය;

අට්ඨිනහාරු සංයුත්තො-තචමංසාව ලෙපනො
ඡවියා කායො පටිච්ඡන්නො-යථාභූතං න දිස්සති.

අන්තපූරොදරපූරො-යකපෙළස්ස වත්ථිනො
හදයස්ස පප්ඵාසස්ස-වක්කස්ස පිහකස්ස ච.

සිඞ්ඝාණිකාය ඛෙළස්ස-සෙදස්ස මෙදස්ස ච
ලොහිතස්ස ලසිකාය-පිත්තස්ස ච වසාය ච.

අථස්ස නවහි සොතෙහි-අසුචී සවති සබ්බදා
අක්ඛිම්හා අක්ඛිගූථකො-කණ්ණම්හා කණ්ණගූථකො.

සිඞ්ඝාණිකා ච නාසාතො-මුඛෙන වමතෙකදා
පිත්තං සෙම්හඤ්ච වමති-කායම්හා සෙදජල්ලිකා.

---

කායො (ඒ මේ) ශරීරය තෙම; අට්ඨිනහාරුසඤ්ඤුත්තො ඇටවලින් සහ නහරවලින් ගැළපී බැඳීසිටියේය; තච මංස අවලෙපනො, සමයෙන් සහ මාංසයෙන් තැවරුනේය; ඡවියා, (මතුපිට සියුම්) සිවියෙන්; පටිච්ඡන්නො, වැසුනේය; (එහෙයින්) යථාභූතං, තත්වූ පරිද්දෙන්; න දිස්සති, නොදක්නා ලැබේ;

අන්තපූරෙ, (මේ කය) බඩවැලෙන් පිරුනේය; උදරපූරො (එසේම) උදරපටලයෙන් පිරුනේය; යකපෙළස්ස, යකනමාංසයෙන් (පිරුනේය;) වත්ථිනො, වස්තිකොෂයෙන් ද (පිරුනේය;) හදයස්ස, හෘදයමාංසයෙන් ද; පප්ඵාසස්ස, පපුමාංසයෙන් ද; වක්කස්ස, වකුගඩු මංසයෙන් ද; පිහකස්සච, පිහක මාංසයෙන් ද; (පිරුනේය)

සිංඝානිකාය, (මේ ශරීරය තෙම) සොටු කොටසෙන්ද; ඛෙළස්ස, කෙළයෙන් ද; සෙදස්ස ච, සෝදියෙන් ද; මෙදස්ස ච, මේද තෙලින් ද; ලොහිතස්ස ච, ලෙයින් ද; ලසිකාය ච, සඳමිදුලින් ද; පිත්තස්ස ච, පිතින් ද; වසාය ච, වුරුණුතෙලින් ද; (පිරුනේය)

අථ, තවද; සබ්බදා, හැමකල්හි; අස්ස, මේ ශරීරයාගේ; නවහි සොතෙහි, නවවාරවලින්; අසුචි, ගූථය; සවති, ශ්‍යන්දනය (හෙවත්) වැගිරීම් වෙයි; අක්ඛිම්හා, ඇසින්; අක්ඛිගූථකො, අක්ෂිගූථය ද; (හෙවත්) කබද; කණ්ණම්හා, කනින්; කණ්ණගූථකො, කර්ණගූථයද; (හෙවත්) කනින් කැදුරුද; (ශ්‍යන්දනය වෙයි) (හෙවත්) වැගිරෙයි;

නාසාතො, නාසිකාවෙන්; සිංඝානිකා ච, සොටුද; වමති, වමාරයි; එකදා, එක්කලෙක; පිත්තං ච, පිත ද; සෙම්හං ච, සෙම ද; මුඛෙන, මුඛයෙන්; වමති, වමාරයි; කායම්හා, කයින්; සෙදජල්ලිකා, ඩහදියමල ද; (ශ්‍යන්දනය වෙයි)

අථස්ස සුසිරං සීසං-මත්ථලුඞ්ගස්ස පූරිතං
සුභතො නං මඤ්ඤති බාලො-අවිජ්ජාය පුරක්ඛතො.

යදා ච සො මතො සෙති-උද්ධුමාතො විනීලකො
අපවිද්ධො සුසානස්මිං-අනපෙක්ඛා හොන්ති ඤාතයො.

ඛාදන්ති නං සුවානා ච-සිගාලා ච වකා කිමී
කාකා ගිජ්ඣා ච ඛාදන්ති-යෙ චඤ්ඤෙ සන්ති පාණිනො.

සුත්වාන බුද්ධවචනං-භික්ඛු පඤ්ඤාණවා ඉධ
සො ඛො නං පරිජානාති-යථාභූතං හි පස්සති.

යථා ඉදං තථා එතං-යථා එතං තථා ඉදං
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච-කායෙ ඡන්දං විරාජයෙ

---

අථ තවද; අස්ස, මේ ශරීරයාගේ; සුසිරං, බිලයවූ; සීසං, හිස; මත්ථලුඞ්ගස්ස, හිස්මිදුළු සංඛ්‍යාත මත්ථලුඞ්ගයෙන්; පූරිතං, පිරිම වූයේය; අවිජ්ජාය, මෝහකමින්; පුරක්ඛතො, පෙරදැරිවූ (හෙවත්) චොදිතවූ; බාලො, අඥානතෙම; නං,(යථොක්තාදීනවඇති) ඒ කය; සුභතො, ශුභ වශයෙන්; මඤ්ඤති, හඟී; (සුභ සුචි සාර මමත්වාදීන් වරදවා ගනියි වදාළසේක)

සො ච, ඒ කය ද; යදා, යම් කලෙක්හි; මතො, මැරුණේ ද; තදා, එකල්හි; උද්ධුමාතො, ඉදිමුණේ; විනීලකො, නිල්වූයේ; සුසානස්මිං, සොහොනෙහි; අපවිද්ධො, දමනලදුයේ; සෙති, ශයනය කෙරේ ද; (එකල්හි) ඤාතයො, (පුත්‍රදාරාදි) නෑයෝ ද; අනපෙක්ඛා හොන්ති, (කැත පිළිකුල් භයානකත්වයෙන්) නිරපේක්‍ෂාව නොබලන්නාහු වෙත්;

නං, ඒ මෘතශරීරය; සුවානා ච, බල්ලෝ ද; සිගාලා ච, සිවල්ලු ද; වකා, කොක්නාවෝ ද; කිමී, ක්‍රිමිහු ද; කාකා කපුටුවෝ ද; ගිජ්ඣා ච, ගිජුලිහිණියෝ ද; ඛාදන්ති, කත්; යෙ චඤ්ඤෙ, (එයින් අන්‍යවූද) පාණයො, (කුණුකන) ප්‍රාණීහු; සන්ති, ඇත්තාහු ද; තෙච, ඒ ප්‍රාණීහු ද; ඛාදන්ති, ඒ (මෘතශරීරය) කන්නාහු යයි; (වදාළසේක)

ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; බුද්ධවචනං, බුදු වචනය; සුත්වාන, අසා; පඤ්ඤාණවා, (විදර්ශනා ඥානයෙන් අනිත්‍යාදි ප්‍රකාරයන් දක්නා හෙයින්) ප්‍රඥාවෙන් යුක්තවූ; සොඛො, ඒ මේ මහණතෙම; නං, ඒ කය; පරිජානාති, (ත්‍රිවිධ පරිඥාවෙන්) පිරිසිඳ දනී ද; හි, එහෙයින්; යථාභූතං, (අනිත්‍ය දුඃඛ අනාත්මාදි ධර්මයන්) ඇතිලෙසින්; පස්සති, දකියි (වදාළසේක);

ඉදං, මේ; (නොමළාවූ සත්වයන්ගේ කාය සංඛ්‍යාත සවිඤ්ඤාණක අශුභය තෙම) යථා, (ඊර්‍ය්‍යාපථාදිය) යම්සේ පවත්වයි ද; එතං, මේ (සොහොන වගුළ අවිඤ්ඤාණකවූ අශුභය) තෙමේ ද; තථා,(පෙර ජීවිතය පැවතුණු කල) එබඳුවෙයි; එතං, මේ; (අවිඤ්ඤාණක අශුභය) තෙම; යථා, (ඉරියව් පැවත්වීමාදිය නැතිව උද්ධුමාත

ඡන්දරාගවිරත්තො සො-භික්ඛු පඤ්ඤාණවා ඉධ
අජ්ඣගා අමතං සන්තිං-නිබ්බාණං පදමච්චුතං.

දිපාදකොයං අසුචි-දුග්ගන්ධො පරිහීරති
නානා කුණපපරිපූරො-විස්සවන්තො තතො තතො.

එතාදිසෙන කායෙන-යො මඤ්ඤෙ උන්නමෙතවෙ
පරං වා අවජානෙය්‍ය-කිමඤ්ඤත්‍ර අදස්සනාති.

විජය සුත්තං.

"සුත්තනිපාතෙ"

---

කාදි භාවය) යම්සේ වේද; ඉදං, මේ; (සවිඤ්ඤාණක අශුභය) තෙ මේද; තථා, එබදු ම යයි (ප්‍රත්‍යක්‍ෂව දුන); අජ්ඣත්තඤ්ච, ආධ්‍යාත්මිකවූ තමන්ගේ කයෙහිද; බහිද්ධාච, බාහිරවූ අනුන්ගේ කයෙහිද; ඡන්දං, ආලය; විරාජයෙ, දුරුකරන්නේය;

ඉධ, මේ ශාසනයෙහි; පඤ්ඤාණවා, රහත්මග නුවණින් යුක්තවූ; ඡන්දරාගවිරත්තො, (ආධ්‍යාත්මික බාහිරවූ සියලු ශරීරයන්හි) ඡන්දරාගය දුරුකළාවූ; සො භික්ඛු, ඒ මහණතෙම; අමතං,(මැරීමක් නැති හෙයින්) අමෘත නම්වූ; සන්තං, (රාගාදි කෙලශ පරිලාහනිවූ හෙයින්) ශාන්තවූ; නිබ්බාණං, වාණසංඛ්‍යාතවූ තෘෂ්ණාවෙන් වෙන්වූ හෙයින්) නිර්වාණ නම්වූද; අච්චුතං පදං, (චුති රහිතවූ) නිර්වාණ පදය; අජ්ඣගා, ලැබගත්තේ යයි; (වදාලසේක)

දුග්ගන්ධො, (නානා ප්‍රකාර වූ) දුර්ගන්ධයන් වහනය වන්නාවූ; නානා කුණප පරිපූරො, නානා ප්‍රකාරවූ කුණප සමූහයෙන් පිරීසිටියාවූ; තතො තතො, (නවවාර නමැති) ඒ ඒ දිශාභාගයෙන්; විස්සවන්තො, කැත පිළිකුල් අශුචි වැහෙන්නාවූ; දිපාදකො, පාදෙකක් ඇත්තාවූ; අයං අසුචි, මේ කය නමැති අසුචිපිඩ; පරිහීරති, (සුවඳ විලෙවුන් ආදියෙන් අභිසංස්කරණය කොට) පරිහරණය කරනු ලැබෙයි;

එතාදිසෙන, මෙබඳුවූ; කායෙන, කයින් යුක්තව; යො, යම් පුරුෂයෙක් හෝ ස්ත්‍රියක්; උන්නමෙතවෙ, (තෘෂ්ණා දෘෂ්ටි මාන මඤ්ඤනා වශයෙන් මමය මාගේය නිත්‍යය යනාදි ක්‍රමයෙන්) උඩඟුවීමට; මඤ්ඤෙ, සිතන්නේ ද; පරං, (තමන් ජාත්‍යාදියෙන් උවඩස්ථානයෙහි තබමින්)අන්‍යයා; අවජානෙය්‍යවා, අවමන් කරන්නේ ද; අදස්සනා අඤ්ඤත්‍ර, (ආර්‍ය්‍යමාර්ග පිළිවෙළින් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්) නොදැකීම හැර; කිං,(උන්නමාවජානනයට) කුමක්කරුණු වන්නේ ද; (නොදැකීම ම කරුණු වන්නේ යයි සේයි.)

විජය සුත්තං, විජය සූත්‍ර යයි;

—o:o—

සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි ය;

පුච්ඡාමි තං ආදිච්චබන්ධුං-විවෙකං සන්තිපදඤ්ච මහෙසිං
කථං දිස්වා නිබ්බාති භික්ඛු-අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

මූලං පපඤ්චසංඛායාති භගවා-මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ
යා කාචි තණ්හා අජ්ඣත්තං-තාසං විනයාය සදා සතො සික්ඛෙ.

යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා-අජ්ඣත්තං අථවාපි බහිද්ධා
න තෙන මානං කුබ්බෙථ-නහි සා නිබ්බුති සතං වුත්තා.

---

ආදිච්චබන්ධුං, (ආදිත්‍යගොත්‍ර වශයෙන්) සූර්‍ය්‍යයා නෑකොට ඇත්තාවූ; මහෙසිං, මහර්ෂිවූ; තං, නුඹවහන්සේ; පුච්ඡාමි, විචාරමි; භික්ඛු, (යොගාවචර) මහණතෙමේ; විවෙකං, (කායචිත්තොපධි යන ත්‍රිවිධ) විවේකයද; සන්තිපදං, ශාන්තිපදය හෙවත් නිර්වාණයට පැමිණීමට උපායවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මයද; කථං, කෙසේ; දිස්වා, දැක; ලොකස්මිං, ස්කන්ධාදි ලොකයෙහි; කිඤ්චි, (රූපාදීන් අතුරෙන්) කිසි සංස්කාරයක්; අනුපාදියානො, (චතුර්විධ උපාදානයෙන් ආමර්ශනය නොකරන්නේ) අල්වා නොගන්නේ; නිබ්බාති, සකල ක්ලෙශයන් සන්හිඳුවාද;

පපංච සඞ්ඛාය,(සත්වයා සසර නැවත නැවත චුති ප්‍රතිසන්ධි වශයෙන් පමා කරවන හෙයින්) ප්‍රපඤ්ච යයි කියනලද තෘෂ්ණා දෘෂ්ටීන්ගේ; මූලං, (අවිද්‍යා, අයොනිසො මනස්කාර, අස්මිමාන, අහිරික, අනොත්තප්ප, ඖද්ධත්‍ය සඞ්ඛ්‍යාත) මූලද; අස්මීති, (අහංඛත්තියො අස්මි, යනාදි වශයෙන් පවත්නා) අස්මිමානයද යන; සබ්බං, සියල්ල; මන්තාය, ප්‍රඥාවෙන්; උපරුන්ධෙ, වළකන්නේය; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකව උපදනාවූ; යා කාචි තණ්හා, රූපතෘෂ්ණාදි යම් කිසි තෘෂ්ණාවෝ; (උපදිද්ද) තාසං, ඒ තෘෂ්ණාවන්ගේ; විනයාය, දුරුකිරීම පිණිස; සතො, ස්මෘති ඇත්තේ; සදා, (ප්‍රථම වයසාදි) සියලු කල්හි; සික්ඛෙ, ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කරන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉති, මෙසේ වදාළසේක.

අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ ද; අථවා, නොහොත්; බහිද්ධා අපි, බාහිරවූ ද; යං කිඤ්චි ධම්මං,(කුසලාකුසලාදිවූ හෝ උච්චාකුලීනතාදිවූ) යම් ගුණයක්: අභිජඤ්ඤා, දක්නේද; තෙන, ඒ උච්චාකුලීනතාදි භාවයෙන්, මානං, මාන්නය; න කුබ්බෙථ, නොකරන්නේය; (කුමක් හෙයින් ද යත්) සා, ඒ උන්නතිය; සතං, බුද්ධාදි සත්පුරුෂයන් විසින්; නහි නිබ්බුති වුත්තා, ක්ලෙශොපසම සඞ්ඛ්‍යාත නිර්වෘති යයි නොකියනලද්දී ද (එහෙයිනි;)

සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය-නීචෙය්‍යො අථවාපි සරික්ඛො
ඵුට්ඨො අනෙකරූපෙහි-නාතුමානං විකප්පයං තිට්ඨෙ.

අජ්ඣත්තමෙව උපසමෙ-නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය
අජ්ඣත්තං උපසන්තස්ස-නත්ථි අත්තා කුතො නිරත්තං වා.

මජ්ඣෙ යථා සමුද්දස්ස-ඌමි නො ජායති ඨිතො'ව සො හොති
එවං ඨිතො අනෙජස්ස-උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

අකිත්තයී විවටචක්ඛු-සක්ඛිධම්මං පරිස්සය විනයං
පටිපදං වදෙහි භද්දන්තෙ-පාතිමොක්ඛං අථවාපි සමාධිං.

---

තෙන, ඒ ජාත්‍යාදි මාන්නය කරණකොටගෙන; (නොහොත්) ඒ ආධ්‍යාත්මික බාහ්‍ය ගුණය කරණකොට ගෙන; සෙය්‍යො (මම) ශ්‍රෙෂ්ඨයෙක්මියි; නමඤ්ඤෙය්‍ය, නොසිතන්නේය; නීචෙය්‍යො, අතිශයින් නීචයෙක්මි; (යිද නොසිතන්නේය) අථවා, නොහොත්; සරික්ඛො අපි, (උතුමන්ට) සමානයෙක්මියිද (නොසිතන්නේය;) අනෙක රූපෙහි, උච්චාකුලීනභාවාදි නොයෙක් කාරණයෙන්; ඵුට්ඨො, ස්පර්ශකරනලද්දේ; (හෙවත්) යුක්තවූයේ; ආතුමානං, තමන්; විකප්පයං, (මම උසස් කුලයෙන් පැවිදිවීමියි යනාදි ක්‍රම යෙන්) කල්පනා කරමින්; නතිට්ඨෙ, නොසිටින්නේය;

භික්ඛු, (නිවන් සොයන) මහණ තෙම; අජ්ඣත්තං එව, තමා කෙරෙහිවූම; (රාගාදි සියලු) කෙලෙසුන්; උපසමෙ, සන්හිඳුවන්නේය; අඤ්ඤතො, (සම්‍යක් ප්‍රස්ථානාදිය හැර) අන්‍ය උපායකින්; (මිථ්‍යා ප්‍රතිපදායෙන්) සන්තිං, නිවන්; න එසෙය්‍ය, නොසොයන්නේය; අජ්ඣත්තං, තමා කෙරෙහිවූ කෙලෙසුන්; උපසන්තස්ස, ව්‍යපසමනයකළ මහණහට; අත්තා, ආත්ම; (ශාස්වත) දෘෂ්ටියක් හෝ; නත්ථි, නැත්තේය; නිරත්තං වා, උච්ඡෙද දෘෂ්ටියක් හෝ; කුතො, කොයින් ද;

සමුද්දස්ස, මහාසමුද්‍රයාගේ; මජ්ඣෙ, මධ්‍යයෙහි හෝ සත්කුල පර්වතන්ගේ මධ්‍යයෙහි; ඌමි, රළ; යථා නොජායති, යම්සේ නොවූපදී ද; ඨිතො හොති, නිශ්චලව සිටියේවේද; එවං, එපරිද්දෙන්ම; අනෙජො, තෘෂ්ණාරහිතවූ ක්ෂීණාශ්‍රවතෙම: ඨිතොඅස්ස (අෂ්ටලොක ධර්මයෙන් අකම්පිතව නිශ්චලව) සිටියේ වේ; භික්ඛු, එබඳු රහත් භික්ෂුතෙමේ; කුහිඤ්චි, (ආධ්‍යාත්මික බාහ්‍ය) කිසිවක් කෙරෙහි; උස්සදං (රාග ද්වෙෂ මොහ මාන දෘෂ්ටි කෙලශ කර්ම ප්‍රභෙද) උත්සදය; න කරෙය්‍ය, නොකරන්නේ යයි; (මෙසේ වදාළහේක)

විවටචක්ඛු, ආවරණ රහිතවූ; (පසැසින්යුත් සර්වඥයන් වහන්සේ; පරිස්සයවිනයං, (ප්‍රකට ප්‍රතිච්ඡන්න) උපද්‍රවයන් දුරලන්නාවූ; සක්ඛිධම්මං, තමන් වහන්සේ දැනගත් (ස්වයම් ප්‍රත්‍යක්ෂ) නිර්වාණ

චක්ඛූහි නෙව ලොලස්ස-ගාමකථාය ආවරයෙ සොතං
රසෙසු නානුගිජ්ඣෙය්‍ය-න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

ඵස්සෙන යදා ඵුට්ඨස්ස-පරිදෙවං භික්ඛු න කරෙය්‍ය
භවඤ්ච නාභිජප්පෙය්‍ය-භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

අන්නානමථො පානානං-ඛාදනීයානං අථොපි වත්ථානං
ලද්ධා න සන්නිධිං කයිරා-න ච පරිත්තසෙ තානි අලභමානො.

ඣායී න පාදලොලස්ස-විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍ය
අථ ආසනෙසු සයනෙසු-අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

---

ධර්මය; අකිත්තයී, වදාළසේක; (එහෙයින්) තෙ, නුඹවහන්සේට; භද්දං, යහපතක් වේවා: පටිපදං, (ඉන්ද්‍රිය සංවරාදි) සම්‍යක් ප්‍රතිපත්ති මාර්ගයද; පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂ සංවරයද; වදෙහි, වදාළ මැනව; අථවා, නොහොත්; සමාධිං අපි, සමාධියද (වදාළමැනව)

චක්ඛූහි, චක්ෂුරින්ද්‍රියයන් කරණකොට ගෙණ; නෙව ලොලොඅස්ස, (නොදක්නාලද්ද දක්කයුතු යයි යනාදියෙන් රූපාරම්මණාස්වාදයෙහි) ලොල්වූයෙක් නොවන්නේය; ගාමකථාය, දෙතිස් තිරිසන් කථායෙන්; සොතං, ශ්‍රොත්‍රෙන්ද්‍රියය; (කන) ආවරයෙ, වළකන්නේය; රසෙ ච, (මූලාදි) රසයෙහිද; නඅනුගිජ්ඣෙය්‍ය, (ජීව්හාලොලයෙන්) ගිජු නොවන්නේය; ලොකස්මිං, සකන්ධාදි ලොකයෙහි; කිඤ්චි, කිසි සංස්කාරයක්; න ච මමායෙථ, (තෘෂ්ණාදෘෂ්ටි) මමත්වයෙන් නොගන්නේය;

භික්ඛු, (යොගාවචර) මහණතෙම; යදා, යම්කලෙක්හි; ඵස්සෙන, (චක්ෂුරාදි රෝග) ස්පර්ශයෙන්; ඵුට්ඨාඅස්ස. ස්පර්ශිකරන ලද්දේ වන්නේද; (එකල්හී) කුහිඤ්චි, ආධ්‍යාත්මික බාහ්‍ය කිසිවක් කෙරෙහි; පරිදෙවං, හැඬීම හෝ; න කරෙය්‍ය, නොකරන්නේය; භවඤ්ච, කාමාදි භවය ද; නාභිජප්පෙය්‍ය, (උවදුරු නැසීම පිණිස) නොපතන්නේය; භෙරවෙසු ච, (ඒ රෙග ස්පර්ශයට ප්‍රත්‍යවූ සිංහ, වලස් ආදි) භෛරවයන් නිමිත්ත කොටගෙන; න සම්පවෙධෙය්‍ය (බියෙන්) කම්පා නොවන්නේය;

අන්නානං, ආහාරයන් ද; අථො, යළි; පානානං, (අෂ්ටවිධ පානාදි) පානයන් ද; ඛාදනීයානං, ඛාද්‍යයන් ද; අථො, නවද; වත්ථානං අපි, වස්ත්‍රයන් ද; ලද්ධා, ලැබ; න සන්නිධිං කයිරා, සන්නිධිය (රැස්කිරීම) නොකරන්නේය; තානි අලභමානො, ඒ ආහාරාදින් නොලබන්නේ; න ච පරිත්තසෙ, නොතැවෙන්නේය;

ඣායී, ධ්‍යානයෙහි ඇලුණේ; න පාදලොලොඅස්ස, පාදලෝලතාවයෙන් යුක්තනොවන්නේය; කුක්කුච්චං, (හස්තපාදාදි) කෞකෘත්‍යයද කැපෙහි අකැප යනාදි වශයෙන් උපදනා චෛතසික

න නිද්දං බහුලී කරෙය්‍ය - ජාගරියං භජෙය්‍ය ආතාපී
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං - මෙථුනං විප්පජහෙ සවිභූසං.

ආථබ්බණං සුපිනං ලක්ඛණං - නො විදහෙ අථොපි නක්ඛත්තං
විරුතඤ්ච ගබ්භකරණං - තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

නින්දාය නප්පවෙධෙය්‍ය - න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු
ලොභං සහ මච්ඡරියෙන - කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය.

---

කෞක්‍රත්‍යයද; විරමෙ දුරුකරන්නේය; න පමජ්ජෙය්‍ය. (ධ්‍යාන විදර්ශනාදිය ලැබීමට) පමා නොවන්නේය; අථ, වැලිදු; භික්ඛු, එබඳු මහණතෙම; අප්පසද්දෙසු, දශවිධ ශබ්දයෙන් වෙන්වූ; ආසනෙසු, ආසන ස්ථානයන්හිද; සයනෙසු ශයන ස්ථානයන්හි ද; විහරෙය්‍ය, (ප්‍රධන්වීර්‍ය්‍යයෙන් යුක්තව) වාසය කරන්නේය;

ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍යයෙන් යුත් මහණතෙම; නිද්දං, නිදීම; න බහුලී කරෙය්‍ය, බහුල නොකරන්නේය; ජාගරියං, (නිසද්‍ය චඞ්කමනාදියෙන් දක්වන) ජාගර්‍ය්‍ය ප්‍රතිපදාව; භජෙය්‍ය, භජනය කරන්නේය; තන්දිං, අලසකම්ද; මායං, කළ දෙස් වසන මායාවද; හස්සං (සීමා ඉක්මවා දත්නෙරවා) සිනාසීමද; ඛිඩ්ඩං, (කායවාක්) ක්‍රීඩාවද; මෙථුනං, (ග්‍රාම්‍යධර්මයවූ) මෛථුනයද; සවිභූසං, (චීවරමණ්ඩනාදි) අලඞ්කාරය සමග; විප්පජහෙ, විශෙෂයෙන් හරණේය;

මාමකො, තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති බුදුසව්තෙම; ආථබ්බණං, ආථර්වණික මන්ත්‍ර ප්‍රයොගයද; සුපිනං, සුපින ශාස්ත්‍රයද; ලක්ඛණං, මණිලක්ෂණාදි ශාස්ත්‍රයද; නො විදහෙ, නොකරන්නේය; අථො, නැවත; නක්ඛත්තං අපි, නක්ෂත්‍ර ප්‍රයොග ශාස්ත්‍රයද; විරුතං ච, (මෘගාදීන්ගේ ශබ්ද දන්නා) විරුත ශාස්ත්‍රයද; ගබ්භකරණං, ගර්භස්ථාපන කිරීමද; තිකිච්ඡං, ශාලක්‍යාදි පඤ්චවිධ චිකිත්සාවද; (වෙදකමද) න සෙවෙය්‍ය, (ග්‍රහණ ධාරණ වශයෙන්) සේවනය නොකරන්නේය;

භික්ඛු (නිවන් පිණිස පිළිවෙත් පුරන) මහණතෙම; නින්දායං, (ජාති ගොත්‍රාදියෙන්) නින්දාකිරීමෙහි; නප්පවෙධෙය්‍ය, ත්‍රස්ත නොවන්නේය: (බියනොවන්නේය) පසංසිතො, (ජාතිගොත්‍රාදියෙන්) පසස්නු ලබන්නේ; න උණ්ණමෙය්‍ය, තමන් උසස් නොකරන්නේය; සහමච්ඡරියෙන (ආවාස මාත්සර්‍ය්‍යාදි පඤ්චවිධ) මාත්සර්‍ය්‍යය සමග; ලොභං, ලෝභයද; කොධං, ක්‍රොධයද; පෙසුණියං ච, (ප්‍රිය කැමතිබව බිඳිනා අදහසින්) පිසුණු ගෙනයාමද; පනුදෙය්‍ය, හරින්නේය;

කයවික්කයෙ න තිට්ඨෙය්‍ය-උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය-ලාභකම්‍යා ජනං න ලාපයෙය්‍ය.

න විකත්ථිකො සියා භික්ඛු-නච වාචං පයුතං භාසෙය්‍ය
පාගබ්භියං න සික්ඛෙය්‍ය-කථං විග්ගාහිකං න කථෙය්‍ය.

මොසවජ්ජෙ න නීයෙථ-සම්පජානො සඨානි න කයිරා
අථ ජීවිතෙන පඤ්ඤාය-සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

සුත්වා දූසිතො බහුං වාචං-සමණානං වා පුථුජනානං වා
ඵරුසෙන නප්පතිවජ්ජා-නහි සන්තො පටිසෙනිං කරොන්ති.

---

භික්ඛු, (නිවන් සොයන)මහණතෙම; කයවික්කයෙ, (පා සිවුරු ආදිය ගනුදෙනු කිරීම යයි කියනලද) ක්‍රයවික්‍රයෙහි; න තිට්ඨෙය්‍ය, නොපිහිටන්නේය; කුහිඤ්චි, (ආධ්‍යාත්මික බාහ්‍ය වූ උපවාද කට යුතු) කිසි කෙලෙශයක් නිමිත්තකොටගෙන; උපවාදං, උපවාදයක්; න කරෙය්‍ය, නොකරන්නේය; ගාමෙ ච ගමෙහි හෝ ගම්වැසි කුලයාකෙරෙහි හෝ; නාභිසජ්ජෙය්‍ය, (රඤ්ජන වශයෙන්) නොඇලෙන්නේය; ලාභකම්‍යා, ලාභ ලබනු කැමැති භාවයෙන්; ජනං, ජනයාට; න ලාපයෙය්‍ය, තමන් නීචකොට හෝ උසස්කොට හෝ කථා නො කරන්නේය;

භික්ඛු, මහණතෙම; න විකත්ථිකො සියා, ගොත්‍රාදියෙන් පස සන්නෙක් නොවන්නේය; පයුතං, (චීවරාදි ප්‍රත්‍යය පිළිබඳ කථා යෙන්)යොදන ලද; වාචං, වචනයක්; නච භාසෙය්‍ය, නොකියන් නේය; පාගබ්භියං, කාය වාක් මනඃ ප්‍රගල්භයෙහි; න සික්ඛෙය්‍ය, නොහැසිරෙන්නේය; විග්ගාහිකං කථං, විවාදයට හේතු කථාවක්; න කථෙය්‍ය, නොකියන්නේය;

සම්පජානො, සම්ප්‍රජන්‍යයෙන්; (අර්ථානර්ථ සලකන නුවණින්) යුත් මහණතෙම; මොසවජ්ජෙ, මුසාවාදයෙහි; න නියෙථ, නොප මුණුවන්නේය; සඨානි, (නැතිගුණ පහළකරන) කෛරාටික කම්; න කයිරා, නොකරන්නේය; අථ, නැවත; ජීවිතෙන, රූක්ෂප්‍රණීත ජීවිකාවෙන්ද; පඤ්ඤාය, ප්‍රඥවෙන්ද; සීලබ්බතෙන, ශීලව්‍රතයෙන් ද; අඤ්ඤං, මෙරමා; (අතික් තෙනෙක්) න අතිමඤ්ඤෙ, ඉක්මවා නොසිතන්නේය;

පුථුජනානං වා, නානාවිධ ගෘහස්ථ ජනයන්ගේ හෝ; සමණා නං වා, ශ්‍රමණයන්ගේ හෝ; බහුං වාචං, බොහෝ අනිටු වචන; සුත්වා, අසා; දූසිතො, වෛෂ වශයෙන් දූසිතවූයේ; ඵරුසෙන, පරුෂ වචනයෙන්; තෙ, ඔවුන්ට; න පතිවජ්ජා, පිළිවදන් නොකියන් නේය; (කුමක් හෙයිනයත්) සන්තො, (රාගාදිය සන්සිඳවූ බුද්ධාදි) සත්පුරුෂයෝ; පටිසෙනිං, ප්‍රතිපක්ෂතාවයක්; නහිකරොන්ති, නො කරත්ද; (එහෙයිනි)

එතඤ්ච ධම්මමඤ්ඤාය-විචිනං භික්ඛු සදා සතො සිකෙඛ
සන්තීති නිබ්බුතිං ඤත්වා-සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.
අභිභූ හි සො අනභිභූතො-සක්ඛිධම්මං අනීතිහමද්දසී
තස්මා හි තස්ස භගවතො සාසනෙ-අප්පමත්තො සදා
[නමස්සමනුසිකෙඛ'ති භගවාති.

තුවටක සුත්තං.

"සුත්තනිපාතෙ"

---

එවං මෙ සුතං එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ. තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, රූපං භික්ඛවෙ අනත්තා රූපඤ්චහිදං භික්ඛවෙ අත්තා

---

සතො, සමෘති ප්‍රසථානයෙන් යුක්තවූ; විචිනං, (සර්වසංස්කාර යෝ අනිත්‍යහයි යනාදි වශයෙන් ධර්මය) සොයන්නාවූ; භික්ඛු, මහණතෙම; එතඤ්ච ධම්මං, යටකී සියලු ප්‍රතිපදා ධර්මය; අඤ්ඤාය, දැන; සදා සියලු කල්හි; සිකෙඛ, හික්මෙන්නේය; නිබ්බුතිං, රාගාදීන්ගේ නිර්වාණය; සන්ති ඉති, ශාන්ත යයි; ඤත්වා, දැන; ගොතමස්ස සාසනෙ, ගෞතම බුදුන්ගේ සස්නෙහි; නප්පමජ්ජෙය්‍ය, පමා නොවන්නේය;

සො, ඒ භාග්‍යවතුන් වහන්සේ; අභිභූහි, (කෙලශොත්පත්ති රහිත හෙයින් රූපශබ්දාදිය) අභිභවනය කළසේක් ම ය; අනභිභූතො, (කෙලෙසුන් විසින්) නොමඩනා ලද්දේය; අනීතිහං, විතර්ක රහිතවූ; සක්ඛිධම්මං, ස්වයම් ප්‍රත්‍යක්ෂ ධර්මය; අද්දසී, ප්‍රකාශ කළසේක; තස්මාහි, එහෙයින්ම; තස්ස භගවතො සාසනෙ, ඒ බුදුන්ගේ සසුන්හි; අප්පමත්තො, අප්‍රමාදවූයේ; සදා, හැම කල්හී; නමස්සං, (ඒ බුදුන්ට) නමස්කාර කරමින්; අනුසිකෙඛ, හික්මෙන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉති, මෙසේ; (ප්‍රශ්න විසර්ජනයෙන් දෙශනාව නිමකොට වදාළසේක.)

තුවටක සුත්තං, තුවටක සූත්‍රයයි;

—— o:o ——

"සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි ය."

—— o:o ——

එවං මෙ සුතං බාරාණසියං —පෙ— එතදවොච, භික්ඛවෙ, මහණෙනි; රූපං, රූපය; අනත්තා, අනාත්මය; භික්ඛවෙ, මහණෙනි; ඉදං රූපඤ්ච, මේ රූපයද; අත්තා අභවිස්ස, ආත්මය වන්නේ නම්; ඉදංරූපං, මේ රූපය; ආබාධාය, ආබාධය පිණිස; න සංවත්තෙය්‍ය, නොපවත්නේය; මෙ, මාගේ; රූපං, රූපය; එවං හොතු, මෙසේ

අභවිස්ස නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච රූපෙ එවං මෙ රූපං හොතු එවං මෙ රූපං මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ රූපං අනත්තා තස්මා රූපං ආබාධාය සංවත්තති න ච ලබ්භති රූපෙ එවං මෙ රූපං හොතු එවං මෙ රූපං මා අහොසීති.

වෙදනා භික්ඛවෙ අනත්තා වෙදනා ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස නයිදං වෙදනා ආබාධාය සංවත්තෙය්‍ය ලබ්භෙථ ච වෙදනාය එවං මෙ වෙදනා හොතු එවං මෙ වෙදනා මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ වෙදනා අනත්තා තස්මා වෙදනා ආබාධාය සංවත්තති න ච ලබ්භති වෙදනාය එවං මෙ වෙදනා හොතු එවං මෙ වෙදනා මා අහොසීති.

සඤ්ඤා භික්ඛවෙ අනත්තා, සඞ්ඛාරා භික්ඛවෙ අනත්තා සඞ්ඛාරා ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්සංසු නයිදං සඞ්ඛාරා ආබාධාය සංවත්තෙය්‍යුං ලබ්භෙථ ච සඞ්ඛාරෙසු එවං මෙ සඞ්ඛාරා හොන්තු එවං මෙ සඞ්ඛාරා මා අහෙසුන්ති. යස්මා ච ඛො භික්ඛවෙ සඞ්ඛාරා අනත්තා තස්මා සඞ්ඛාරා ආබාධාය සංවත්තන්ති න ච ලබ්භති සඞ්ඛාරෙසු එවං මෙ සඞ්ඛාරා හොන්තු එවං මෙ සඞ්ඛාරා මා අහෙසුන්ති.

විඤ්ඤාණං භික්ඛවෙ අනත්තා විඤ්ඤාණඤ්ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස නයිදං විඤ්ඤාණං ආබාධාය සංවත්තෙය්‍ය ලබ්භෙථ ච විඤ්ඤාණෙ එවං මෙ විඤ්ඤාණං හොතු එවං මෙ විඤ්ඤාණං මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ විඤ්ඤාණං අනත්තා තස්මා විඤ්ඤාණං ආබාධාය සංවත්තති න ච ලබ්භති විඤ්ඤාණෙ එවං මෙ විඤ්ඤාණං හොතු එවං මෙ විඤ්ඤාණං මා අහොසීති.

---

වේවා; මේ, මාගේ; රූපං, රූපය; එවං, මෙසේ; මා අහොසි ඉති, නොවේවායි; රූපෙ, රූපයෙහි; ලබ්භෙථ ච, (වශවර්තනාකාරය) ලබන්නාහුද වෙති; භික්ඛවෙ, මහණෙනි; යස්මා ච ඛො, යම් හෙයකින් වනාහි; රූපං, රූපය; අනත්තා, අනාත්මද; තස්මා, එහෙයින්; රූපං, රූපය; ආබාධාය, ආබාධය පිණිස; සංවත්තති, පවතී; මෙ, මාගේ; රූපං, රූපය; එවංහොතු මෙසේ වේවා; මෙ, මාගේ; රූපං, රූපය; එවං, මෙසේ; මා අහොසි ඉති, නොවේවායි; රූපෙ, රූපයෙහි ආත්ම සාරත්වයක්; න ච ලබ්භති, නොලැබෙයි; වෙදනා, -පෙ- සඤ්ඤා, සංඥා තොම -පෙ- සංඛාරා, සංස්කාරයෝ; -පෙ- මා අහෙසුං ඉති, නොවෙත්වායි; -පෙ- විඤ්ඤාණං, විඥානය, -පෙ- භික්ඛවෙ, මහණෙනි; තං කිං මඤ්ඤථ, ඒ කුමකැයි සිතන්නහුද; රූපං, රූපය; නිච්චං වා, නිත්‍ය හෝ; අනිච්චං වා ඉති අනිත්‍ය හෝ වේදැයි; භන්තෙ, ස්වාමීනි; අනිච්චං, අනිත්‍යය; යං පන, යමක් වනාහි; අනිච්චං, අනිත්‍යවේද; තං, එය; දුක්ඛං වා, දුක් හෝ වේද; සුඛං වා

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ රූපං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

වෙදනා - සඤ්ඤා- සඞ්ඛාරා- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙ තං භන්තෙ.

තස්මාතිහ භික්ඛවෙ යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, යා කාචි වෙදනා, යා කාචි සඤ්ඤා, යෙකෙචි සඞ්ඛාරා, යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

---

ඉති, සැප හෝ වේදැයි; භන්තෙ, ස්වාමිනි; දුක්ඛං, දුකය; යං පනා යමක් වනාහි; අනිච්චං, අනිත්‍යද; දුක්ඛං, දුකද; විපරිනාමධම්මං, පෙරළෙන සවභාව වේද; තං, එය; එතං, මේ රූපය; මම, මාගේය; එසො මේ තෙම; අහං අස්මි, මම වෙමිය; එසො, මේ තෙම; මෙ, මාගේ; අත්තාඉති, ආත්ම යයි; සමනුපස්සිතුං, දක්නට; කල්ලං නු, යුතුවන්නේද; භන්තෙ, ස්වාමිනි; එතං, මේ කාරණය; නොහි, නො වේමය; වෙදනා -පෙ- භික්ඛවෙ, මහණෙනි; තස්මා, එහෙයින්; ඉහ, මෙහි; අතීතානාගතපච්චුප්පන්නං, අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ හෝ; අජ්ඣත්තං වා, ආධ්‍යාත්මිකවූ හෝ; බහිද්ධා වා, බාහිරවූ හෝ: ඔළාරිකං වා, ඔළාරිකවූ හෝ; සුඛුමං වා, සියුම්වූ හෝ; හීනං වා, හීනවූ හෝ; පණීතං වා, ප්‍රණීතවූ හෝ; යං කිඤ්චිරූපං, යම්කිසි රූපයක් වේද; දූරෙ වා, දූරෙහිවූ හෝ; සන්තිකෙ වා, සමීපයෙහිවූ හෝ; යං රූපං, යම් රූපයක්වේද; එතං සබ්බං, මේසියල්ල; මම, මාගේ; න, -පෙ- එවං, මෙසේ; එතං, මේ කාරණය; යථාභූතං, තතු සේ; සම්මප්පඤ්ඤාය, යහපත් නුවණින්; දට්ඨබ්බං, දතයුතුයි; යාකාචි වෙදනා, යම්කිසි වේදනාවක්වේද; -පෙ- යෙකෙචිසංඛාරා, යම්කිසි සංස්කාරයෝ වෙද්ද; —පෙ— යංකිංචි විඤ්ඤාණං, යම්කිසි

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති වෙදනායපි නිබ්බින්දති සඤ්ඤායපි නිබ්බින්දති සඞ්ඛාරෙසු නිබ්බින්දති විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති-ඉදමවොච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්-ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ පඤ්චවග්ගියානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

අනත්තලක්ඛණ සුත්තං.

"ඛන්ධවග්ගො."

විඤ්ඤාණයක් වේද; —පෙ— දට්ඨබ්බං, භික්ඛවෙ, මහණෙනි; එවං පස්සං, මෙසේ දක්නාවූ; සුතවා අරියසාවකො, ශ්‍රැතිසම්පන්නවූ හෙවත් ආගම අධිගම දෙකින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ; රූපස්මිං අපි, රූපයෙහි ද; නිබ්බින්දති, කලකිරෙයි; වෙදනායපි, වේදනාවෙහි ද; —පෙ— නිබ්බින්දති, නිබ්බින්දං, කලකිරෙන්නේ; විරජ්ජති, නොඇලෙයි; විරාගා, නොඇල්මෙන්; විමුච්චති, විශෙෂයෙන් මිදෙයි; විමුත්තස්මිං, විශෙෂයෙන් මිදුණු කල්හි; විමුත්තං ඉති, විශෙෂයෙන් මිදුණේ යයි; ඤාණං හොති, (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය වෙයි; ජාති, ජාතිතොම; ඛීණා, ක්ෂයවූවාය; බ්‍රහ්මචරියං, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව; වුසිතං, වැස නිමවනලදී; කරණීයං, සතර ආර්‍ය්‍යමාර්ගයෙන් කටයුතු කෘත්‍යය; කතං, කොට නිමවනලදී; ඉත්ථත්තාය, මතු අත් බැව් පිණිස; නාපරං ඉති, අනික් නැත්තේ යයි; පජානාති ඉති, ප්‍රකර්ෂයෙන් දැනගණී යයි; ඉදමවොච —පෙ— ඉමස්මිංච පන වෙය්‍යාකරණස්මිං, මේ නිර්ගාථක සූත්‍රාන්ත ධර්මදෙශනාව; භඤ්ඤමානෙ, දෙශනාකරනු ලබනකල්හි; පඤ්චවග්ගියානං භික්ඛූනං, පංචවර්ගික භික්ෂූන්ගේ; චිත්තානි, සිත්; අනුපාදාය, උපාදාන ග්‍රහණය නොකොට; ආසවෙහි, ආශ්‍රවයන් කෙරෙන්; විමුච්චිංසු ඉති, විශෙෂයෙන් මිදුණාහු යයි;

අනත්තලක්ඛණ සුත්තං, අනාත්මලක්ෂණ සූත්‍රයයි;

—o÷o—

"ඛන්ධවග්ගො, ඛන්ධවර්ගයෙහි ය;"

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි පරිපක්කා ඛො රාහුලස්ස විමුත්ති පරිපාචනීයා ධම්මා යන්නූනාහං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ පටිවිනෙය්‍යන්ති, අථඛො භගවා පුබ්බණ්හසමය- නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං රාහුලං ආමන්තෙසි ගණ්හාහි රාහුල නිසීදනං යෙන අන්ධවනං තෙනු පසඞ්කමිස්සාමි දිවාවිහාරායාති.

එවං භන්තෙති ඛො ආයස්මා රාහුලො භගවතො පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි තෙන ඛො පන සමයෙන අනෙකානි දෙවතා සහස්සානි භගවන්තං අනුබන්ධානි හොන්ති අජ්ජ භගවා ආයස්මන්තං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙස්සතීති අථඛො භගවා අන්ධවනං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, ආයස්මාපි ඛො රාහුලො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාහුලං භගවා එතදවොච.

---

එවංමෙසුතං — පෙ— අථඛො, එකල්හි වනාහි; රහොගතස්ස රහසිගතවූ; පතිසල්ලීනස්ස, විවෙකාග්‍රතායෙහි යෙදුණාවූ; භගවතො, භාග්‍යවත්හට; එවං, මෙසේ; චෙතසො, සිත පිළිබඳ; පරිවිතක්කො, පරිවිතර්කයෙක්; උදපාදි, පහළවූසේක; රාහුලස්සඛො, රාහුලයාගේ වනාහි; විමුත්ති පරිපාචනීයා, විමුක්තිය පිණිස මුහුකළ යුතු. ධම්මා, ධර්මයෝ; පරිපක්කා, මුහුකළාහුය; අහං, මම; රාහුලං, රාහුලයා; උත්තරිං, මත්තෙහි; ආසවානං, ආශ්‍රවයන්ගේ; ඛයෙ, ක්‍ෂයයෙහි; පටිවිනෙය්‍යං, හික්මවන්නෙම් නම්; යන්නූන ඉති, ඉතා යෙහෙකැයි කියායි; අථඛො. එකල්හි වනාහි; භගවා, භාග්‍යවත් තෙම; පුබ්බණ්හසමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවා, පත්තචීවරමාදාය, පාසිවුරු ගෙන; සාවත්ථිං, සැවතට; පිණ්ඩාය, පිඬු පිණිස; පාවිසි, පිවිසීසේක; සාවත්ථියං, සැවතෙහි; පිණ්ඩාය, පිඬු පිණිස; චරිත්වා, හැසිර; පිණ්ඩපාත පටික්කන්තො, පිණ්ඩපාතයෙන් වැළකුණේ; පච්ඡාභත්තං, පසුබත්කාලයෙහි; ආයස්මන්තං, ආයුෂ්මත්; රාහුලං, රාහුලයාහට; ආමන්තෙසි, ඇමතූසේක; රාහුල, රාහුලය; නිසීදනං, නිසීදනය; ගණ්හ, ගනුව; අන්ධවනං, එනම් වනය; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; දිවාවිහාරාය, දිවා විහරණය පිණිස; උපසඞ්කමිස්සාමි ඉති, එළඹෙන්නෙමියි වදාළසේක; ආයස්මා රාහුලො, ආයුෂ්මත් රාහුල තෙමේ; භන්තෙ, ස්වාමිනි; එවං ඉති ඛො, එසේ යයි කියා; භගවතො, භාග්‍යවත්හට;

තං කිම්මඤ්ඤසි රාහුල චක්ඛුං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ

තං කිම්මඤ්ඤසි රාහුල රූපං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ

තං කිම්මඤ්ඤසි රාහුල චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති, අනිච්චො භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං, සඤ්ඤාගතං, සඞ්ඛාරගතං, විඤ්ඤාණගතං, තම්පි නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ

---

පටිස්සුනිත්වා, පිළිවදන් අසවා; නිසීදතං, නිසිදනය; ආදාය, ගෙන; පිට්ඨිතො පිට්ඨිතො, පිටිපසින් පිටිපසින්; භගවන්තං, භාග්‍යවතුන්; අනුබන්ධි, ලුහුබැන්දේය; තෙන ඛොපන සමයෙන; එසමයෙහි වනාහි; අනෙකානි දෙවතා සහස්සානි, නොයෙක් දහස් ගණන් දෙවතාවෝ; භගවන්තං, භාග්‍යවතුන්; අනුබන්ධානි හොන්ති, ලුහුබැඳුනු වෙත්; අජ්ජ, අද; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආයස්මන්තං රාහුලං, රාහුල ආයුෂ්මතුන්; උත්තරිං, මත්තෙහි; ආසවානං, ආශ්‍රවයන්ගේ; ඛයෙ, ක්ෂය (අභාව) යෙහි; විනෙස්සති ඉති, හික්මවන්නේ යයි කියායි; අථ ඛො, එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අන්ධවනං, අන්ධවනයට; අජ්ඣොගහෙත්වා, බැසගෙන; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා වෘක්ෂමූලයෙක්හි; පඤ්ඤත්තෙ ආසනෙ, පනවනලද අස්නෙහි; නිසීදි, වැඩහුන්සේක; ආයස්මාපි ඛො රාහුලො, —පෙ— එතදවොච;

තං කිම්මඤ්ඤසි රාහුල සොතං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, ඝාණං නිච්චං වා අනිච්චං වාති අනිච්චං භන්තෙ, ජිව්හා නිච්චා වා අනිච්චා වාති, අනිච්චා භන්තෙ, කායො නිච්චො වා අනිච්චො වාති, අනිච්චො භන්තෙ, මනො නිච්චො වා අනිච්චො වාති අනිච්චො භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල ධම්මා නිච්චා වා අනිච්චා වාති අනිච්චා භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චංවාති අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල මනොසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති, අනිච්චො භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි රාහුල යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං, සඤ්ඤාගතං, සඞ්ඛාරගතං, විඤ්ඤාණගතං, තං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසොහමස්මි එසො මෙ අත්තාති, නොහෙතං භන්තෙ.

---

රාහුල, රාහුලය; තං කිං මඤ්ඤසි, ඒ කුමක්හැයි හඟනෙහි ද; චක්ඛුං, ඇස; නිච්චං වා —පෙ— රූපං, චක්ඛුවිඤ්ඤාණං, චක්ෂුර්විඥානය; —පෙ— චක්ඛුසම්ඵස්සො, චක්ෂුස්පර්ශය; —පෙ— රාහුල, රාහුලය; චක්ඛුසම්ඵස්සපච්චයා, චක්ෂුස්ප්‍රෂ්ටව්‍ය ප්‍රත්‍යයෙන්; වෙදනාගතං, වෙදනා සහගතවූ; යං ඉදං, මේ යමක්; උප්පජ්ජති, උපදී ද; තං කිම්මඤ්ඤසි, ඒ කුමක්හැයි සිතනෙහිද; සඤ්ඤාගතං, සංඥාසහගතවූද; සඞ්ඛාරගතං, සංස්කාර සහ ගියාවූද; විඤ්ඤාණගතං, විඥාණ සහ

එවං පස්සං රාහුල සුතවා අරියසාවකො චක්ඛුස්මිං නිබ්බින්දති රූපෙසු නිබ්බින්දති චක්ඛුවිඤ්ඤාණෙ නිබ්බින්දති චක්ඛුසම්ඵස්සෙ නිබ්බින්දති යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තස්මිම්පි නිබ්බින්දති, සොතස්මිං නිබ්බින්දති- සද්දෙසු නිබ්බින්දති- ඝාණස්මිං නිබ්බින්දති- ගන්ධෙසු නිබ්බින්දති- ජිව්හාය නිබ්බින්දති- රසෙසු නිබ්බින්දති- කායස්මිං නිබ්බින්දති- ඵොට්ඨබ්බෙසු නිබ්බින්දති- මනස්මිං නිබ්බින්දති- ධම්මෙසු නිබ්බින්දති- මනොවිඤ්ඤාණෙ නිබ්බින්දති- මනොසම්ඵස්සෙ නිබ්බින්දති- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං, සඤ්ඤාගතං, සඞ්ඛාරගතං, විඤ්ඤාණගතං, තස්මිම්පි නිබ්බින්දති- නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති- ඉදමවොච භගවා අත්තමනො ආයස්මා රාහුලො, භගවතො භාසිතං අභිනන්දීති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො රාහුලස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි, තාසඤ්ච අනෙකානං දෙවතාසහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

චූලරාහුලොවාද සුත්තං.

---

"උපරිපණ්ණාසකෙ."

---

ගියාවූද; තම්පි —පෙ— සොතං,- ඝානං,- ජිව්හා,- කායො,- තං කිම්මඤ්ඤසි- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සො -පෙ- තාසං අනෙකානං දෙවතා සහස්සානං ච, ඒ බොහෝ දහස්ගණන් දෙවතාවන්ටද; විරජං, පහවූ රාගාදි රජස් ඇති; වීතමලං, පහවූ රාගාදි මල ඇති; ධම්මචක්ඛුං, සතර මාර්ගඵල ඥානසංඛ්‍යාත ධර්මචක්ෂුස; උදපාදි, පහළවූයේය; යංකිඤ්චි සමුදයධම්මං, හේතුප්‍රත්‍ය සමවායෙන් හට ගන්නාවූ; යම්කිසි සවභාව ධර්මයෙක්වේද; තං සබ්බං, ඒ සියල්ල; නිරොධධම්මං ඉති, නිරුද්ධවන සවභාව ඇත්තේ යයි; (කියායි)

චූලරාහුලොවාද සුත්තං, චූලරාහුලොවාද සූත්‍රයයි;

—— ෴ ——

'උපරිපණ්ණාසකෙ, (මැදුම්සඟියෙහි) උපරිපණ්ණාසකයෙහිය,"

—— ෴ ——

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො අජ්ඣත්තිකං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහුපකාරං යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො යොනිසො භික්ඛවෙ භික්ඛු මනසිකරොන්තො අකුසලං පජහති කුසලං භාවෙතීති. එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉතිවුච්චති.

යොනිසො මනසිකාරො–ධම්මො සෙඛස්ස භික්ඛුනො
නත්ථඤ්ඤො එවං බහුකාරො–උත්තමත්ථස්ස පත්තියා
යොනිසො පදහං භික්ඛු–ඛයං දුක්ඛස්ස පාපුණෙති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති
අජ්ඣත්තිකඞ්ග සුත්තං.

---

වුත්තං හෙතං —පෙ— භික්ඛවෙ, මහණෙනි; අනුත්තරං, නිරුත්තරවූ; යොගක්ඛෙමං, අර්හත්වය; පත්ථයමානස්ස, පතන්නාවූ; අප්පත්තමානසස්ස, නොපැමිණි අර්හත්වය ඇති; විහරතො, (අප්‍රමාදව) වාසයකරන්නාවූ. සෙඛස්ස භික්ඛුනො, ශෛක්ෂභික්ෂුවහට; අජ්ඣත්තිකං, ආධ්‍යාත්මිකවූ; අඞ්ගංඉති කරිත්වා, කාරණයක්කොට (මෙසේ කියමි) භික්ඛවෙ, මහණෙනි; ඉදං යොනිසො මනසිකාරො, මේ නුවණින් මෙනෙහිකිරීම; යථා, යම්සේ ද; එවං, එසේ; බහුපකාරං, බොහෝ උපකාරවූ; අඤ්ඤං එකඞ්ගං අපි, අන්‍යවූ එකම කාරණය කුදු; න සමනුපස්සාමි, නුවණැසින් නොම දකිමි;

භික්ඛවෙ, මහණෙනි; යොනිසො නුවණින්; මනසිකරොන්තො, මෙනෙහිකරන්නාවූ; භික්ඛු, මහණතෙම; අකුසලං, අකුසලය; පජහති, දුරුකෙරෙයි; කුසලං, කුශලය; භාවෙති, වඩායයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අත්ථං, මේ අර්ථය; අවොච, වදාළසේක; තත්ථ එහි; එතං, මේ කාරණය; ඉතිවුච්චති, මෙසේ කියනුලැබේ;

සෙඛස්ස භික්ඛුනො, ශෛක්ෂ භික්ෂුවහට; උත්තමත්ථස්ස, අර්හත්වයාගේ; පත්තියා, අධිගමය පිණිස; යොනිසො මනසිකාරො, නුවණින් මෙනෙහිකිරීම; බහුකාරො, බොහෝ උපකාරය; එවං, මෙසේ (උපකාරවූ) අඤ්ඤො ධම්මො, අන්‍යවූ ධර්මයෙක්; නත්ථි, නැත්තේය; යොනිසො, නුවණින්; පදහං, වීර්‍ය්‍යකරන්නාවූ; භික්ඛු මහණ; දුක්ඛස්ස, වෘත්ත දුඃඛයාගේ; ඛයං, ක්ෂයයට; පාපුණෙ ඉති, පැමිණෙන්නේ යයි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; අයං අත්ථො අපි, මේ අර්ථයද; වුත්තො, වදාරනලද්දේය; මෙ, මා විසින්; ඉති, මේ ආකාරයෙන්; සුතං ඉති, අසනලද්දේ යයි;

අජ්ඣත්තිකඞ්ග සුත්තං, අධ්‍යාත්මිකාඞ්ග සූත්‍රයයි;

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො බාහිරං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහූපකාරං යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා කල්‍යාණමිත්තො භික්ඛවෙ භික්ඛු අකුසලං පජහති කුසලං භාවෙතීති එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

කල්‍යාණමිත්තො යො භික්ඛු-සප්පතිස්සො සගාරවො
කරං මිත්තාන වචනං-සම්පජානො පතිස්සතො
පාපුණෙ අනුපුබ්බෙන-සබ්බසඤ්ඤොජනක්ඛයන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## බාහිරඞ්ග සුත්තං.

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, අන්තමිදං භික්ඛවෙ ජීවිතානං යදිදං පිණ්ඩොල්‍යං අභිසාපොයං භික්ඛවෙ ලොකස්මිං පිණ්ඩොලො විචරසි පත්තපාණීති තඤ්ච ඛො එතං භික්ඛවෙ කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා අත්ථවසං පටිච්ච නෙව රාජාභිනීතා න චොරාභිනීතා න ඉණට්ටා න භයට්ටා න ආජීවිකාපකතා අපිච ඛො ඔතිණ්ණම්හා ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති

---

වුත්තං — පෙ — කල්‍යාණමිත්තතා, කලණමිතුරන් ඇතිබවක් වේද; කල්‍යාණමිත්තො — පෙ — වුච්චති, කියනුලැබේ;

කල්‍යාණමිත්තො, කලණමිතුරන්ඇත්තාවූ; සප්පතිස්සො, සුවචවූ; සගාරවො, ගාරව සහිතවූ; සම්පජානො, සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූ; පතිස්සතො, කර්මස්ථානය සිහිකරන්ට සමර්ථවූ; යො භික්ඛු, යම් භික්ෂුවක්වේද; (හෙතෙම) මිත්තානවචනං, කලණ මිතුරන්ගේ අවවාදය (පරිදි); කරං, කරන්නේ (හෙවත් පිළිපදින්නේ) අනුපුබ්බෙන, ශීලවිශුද්ධ්‍යාදි පිළිවෙළින්; සබ්බසඤ්ඤොජනක්ඛයං, සියලු සංයෝජනයන්ගේ ක්ෂයයට; පාපුණෙ, පැමිණෙන්නේය; අයම්පි — පෙ — සුත්තන්ති;

බාහිරඞ්ග සුත්තං, බාහිරඞ්ග සූත්‍ර යයි;

—— o÷c ——

වුත්තං -පෙ- භික්ඛවෙ, මහණෙනි; යං ඉදං, යම් මේ; පිණ්ඩොල්‍යං, පිඩුසිඟීමෙන් ජීවිකාව කරන්නහුගේ ජීවිතයක් වේ ද; එතං, මේ ජීවිතය; ජීවිතානං, ජීවිතයන් අතුරෙන්; අන්තං, ලාමකයි; භික්ඛවෙ, මහණෙනි; පත්තපාණි, පාත්‍රාගත් අත්ඇත්තේ; පිණ්ඩොලො, පිඩුසෙවීම ඇසිරූකෙළේ; විචරසි ඉති, හැසිරෙහි යයි;

එවං පබ්බජිතොවායං භික්ඛවෙ කුලපුත්තො හොති අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසංකප්පො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො සෙය්‍යථාපි භික්ඛවෙ ඡවාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං ඵරති න අරඤ්ඤෙ, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදමි ගිහිභොගා ච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච න පරිපූරෙතීති එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

---

ලොකස්මිං, ලෝකයෙහි; අයං, මේ; අභිසාපො, ආක්‍රොශයෙක; භික්ඛවෙ, මහණෙනි; තඤ්චඛො එතං, ඒ මේ අභිසාප ඇති; පිණ්ඩොල්‍යං, (පිඬුසිඟීමෙන් කරන ජීවිකාවට); අත්ථවසිකා, අර්ථවශිකවූ; කුලපුත්තා, කුලපුත්‍රයෝ; අත්ථවසං පටිච්ච, කරුණක් නිසා; උපෙන්ති, එළඹෙත්; රාජාභිනීතා, රජුන් විසින් එළවනලද්දාහු; න එව, නො වෙත් මය; චොරාභිනීතා, සොරුන් විසින් නෙරපනලද්දාහුද; න, නොවෙත්; ඉණට්ටා, ණය දී ගත නොහැකිව පෙළුණාහු ද; න නොවෙත්; න භයට්ටා, බියෙන් පෙළුණාහුද නොවෙත්; න ආජීවිකපකතා, ජීවිකාව ප්‍රකෘතිකොට ඇත්තාහුද නොවෙත්; අපිච ඛො යළිදු; ජාතියා, ජාතියෙන් ද; ජරාය, ජරාවෙන් ද; මරණෙන, මරණයෙන් ද; සොකෙහි, ශොකයන්ගෙන් ද; පරිදෙවෙහි, පරිදෙවයන්ගෙන් ද; දුක්ඛෙහි, කායික චෛතසික දුඃඛයන්ගෙන් ද; දොමනස්සෙහි, දෞර්මනස්‍යයන්ගෙන් ද; උපායාසෙහි උපායාසයන්ගෙන් ද; ඔතිණ්ණා අම්හා, අවතීර්ණයෝ (ගැවසිගත්තෝ) වමු. දුක්ඛොතිණ්ණා, ජාත්‍යාදි දුඃඛයන්ට බැසගත්තෝ වමු; දුක්ඛපරෙතා, දුකින් පෙළෙන ලද්දෝවමූ; ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ සියලු දුක්රාශියගේ; අන්තකිරියා, කෙළවර කිරීමක්; පඤ්ඤායෙථ, දක්නේ නම්; අප්පෙවනාම ඉති, ඉතා යෙහෙකැයි කියායි; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; පබ්බජිතො ච, පැවිදිවූ ද; අයං කුලපුත්තො, මේ කුලපුත්‍ර තෙමේ; අභිජ්ඣාලු, අභිධ්‍යාව බහුලකොට ඇත්තේ වේද; කාමෙසු, වස්තුකාම ක්ලෙශකාමයන්හි; තිබ්බසාරාගො, තීව්‍රවූ රාගය ඇත්තේ; පදුට්ඨමනසංකප්පො, ප්‍රදුෂ්‍යවූ සිත් ඇත්තේ; මුට්ඨස්සති, මුළා සිහි ඇත්තේ; අසම්පජානො, සම්‍යක්ප්‍රඥාරහිතවූයේ; අසමාහිතො, එකඟනොවූ සිත් ඇත්තේ; විබ්භන්තචිත්තො, විශෙෂයෙන් භ්‍රාන්තවූ සිත් ඇත්තේ; පාකතින්ද්‍රියො, ප්‍රකෘති ඉඳුරන් ඇත්තේ වේද; භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; උභතොපදිත්තං, දෙපසින් ගිනිඇවිල ගත්තාවූ; මජ්ඣෙ, මැදින්; ගූථගතං, අසුචි තැවරුණාවූ; ඡවාලාතං, සොහොන් ගිනිපෙනෙල්ල; ගාමෙ, ගමෙහි; කට්ඨත්ථං, කාෂ්ඨය (දරකඩ) කින් ගන්නා අර්ථය; නෙව ඵරති, සිඬනොකෙරේ ද; අරඤ්ඤෙ, ආරණ්‍යයෙහි වූ; (කාෂ්ඨාර්

ගිහීභොගා ච පරිහීනො–සාමඤ්ඤත්ථං න පූරයෙ දුභතො
පරිධංසමානො පකිරෙති–ඡවාලාතංව නස්සති.
සෙය්‍යො අයො ගුළො භුත්තො–තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො–රට්ඨපිණ්ඩං අසඤ්ඤතොති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## පිණ්ඩියාලොප සුත්තං.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ඛ්‍යාපාද විතක්කො වා විහිංසාවිතක්කො වා තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න ඛ්‍යන්තීකරොති න අනභාවං ගමෙති චරම්පි භික්ඛවෙ භික්ඛු එවං භූතො අනාතාපි අනොත්තාපි

---

යද) න, සිඩනොකෙරේද; භික්ඛවෙ, මහණෙනි; අහං, මම; ඉමං පුග්ගලං, මේපුද්ගලයා; තථා උපමං එසේ උපමාකොට; වදාමි, කියමි; ගිහිභොගාව, ගිහින් විසින් පරිභොගකටයුතුවූ කාමසම්පත්තීන්; පරිහීනො, පිරිහුනේ; සාමඤ්ඤත්ථඤ්ච, අර්හත්ඵල සඞ්ඛ්‍යාත ශ්‍රාමණ්‍යාර්ථයද; න පරිපූරෙති ඉති, සම්පූර්ණ නොකෙරේ යසි; භගවා, භාග්‍යවත් තෙමේ; එතං අත්ථං, මේ කාරණය; අවොච, වදාළසේක; තත්ථ එහි; එතං, මේ අර්ථය; ඉති, මෙසේ; වුච්චති, කියනුලැබේ.

ගිහිභොගා ච, ගිහින් විසින් පරිභොග කටයුතුවූ කාම සැප තින්ද; පරිහීනො, පිරිහුනේ; සාමඤ්ඤත්ථඤ්ච, අර්හත්ඵල සඞ්ඛ්‍යාත ශ්‍රාමණ්‍යාර්ථයද; න පූරයෙ, සම්පූර්ණ නොකරන්නේය; උභතො, දෙපසින්; පරිධංසමානො හාත්පසින් පරිබාහිරවූයේ; පකිරෙති, අසංවර භාවයෙන් ශිලාදිය ඉක්මවමින් හැසිරෙයි; ඡවාලාතං ඉව, සොහොන් පෙනෙල්ලක් මෙන්; නස්සති, නැසෙයි;

චෙ, ඉදින්; අසඤ්ඤතො, සංයම රහිතවූ; දුස්සීලො, දුසිල් මහණතෙම; යං රට්ඨ පිණ්ඩං, රටවැසියා විසින් දෙනලද යම් ආහාර යක්; භුඤ්ජෙය්‍ය, වළඳන්නේද; (ඊට වඩා) තත්තො, රත්වූ; අග්ගිසිඛූපමො, ගිනිසිළුකට උපමා ඇති; අයොගුළො, ලෝගුළියක්; භුත්තො, අනුභව කෙළේ; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨවන්නේය;

පිණ්ඩියාලොප සුත්තං, පිණ්ඩියාලොප සූත්‍ර යසි;

---

වුත්තං —පෙ— භික්ඛවෙ, මහණෙනි; චරතො ච අපි, හැසි රෙන්නාවූද; භික්ඛුනො, භික්ෂුවට; කාමවිතක්කො වා, කාමවිතර්ක යක් හෝ; විහිංසාවිතක්කො වා, විහිංසා විතර්කයක් හෝ; උප්පජ්ජති, උපදීද; භික්ඛවෙ, මහණෙනි; චෙ, ඉදින්; තං, ඒ විතර්කය; භික්ඛු, මහණ; අධිවාසෙති, ඉවසා ද; නප්පජහති, දුරුනොකෙරේද; න විනොදෙති, විනොදය නොකෙරේද; න ඛ්‍යන්තීකරොති, බැහැර

සතතං සමිතං කුසීතො හීනවිරියොති වුච්චති. ඨිතස්ස චෙපි භික්ඛ
වෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා බ්‍යාපාදවිතක්කො වා
විහිංසා විතක්කො වා තංචෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති
න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති ඨිතොපි
භික්ඛවෙ භික්ඛු එවංභූතො අනාතාපී අනොත්තාපී සතතං සමිතං
කුසීතො හීනවිරියොති වුච්චති

නිසින්නස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිත
ක්කො වා බ්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛ
වෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති
න අනභාවං ගමෙති නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවං භූතො අනා
තාපී අනොත්තාපී සතතං සමිතං කුසීතො හීනවිරියොති වුච්චති.
සයානස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිත
ක්කො වා බ්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛ
වෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති
න අනභාවං ගමෙති සයානොවාපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවං
භූතො අනාතාපි අනොත්තාපි සතතං සමිතං කුසීතො හීනවිරි
යොති වුච්චති.

චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො
වා බ්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛවෙ
භික්ඛු න අධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං
ගමෙති චරම්පි භික්ඛවෙ භික්ඛු එවං භූතො ආතාපී ඔත්තාපී සතතං
සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති- ඨිතස්ස චෙපි භික්ඛවෙ
භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා බ්‍යාපාදවිතක්කො වා
විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛවෙ භික්ඛු න අධිවාසෙති පජහති
විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති ඨිතොපි භික්ඛවෙ
භික්ඛු එවං භූතො ආතාපි ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො

---

නොකෙරේ ද; අනභාවං, නැවත නොඉපදීමට; නගමෙති, නො
පමුණුවා ද; භික්ඛවෙ, මහණෙනි; චරම්පි, හැසිරෙන්නාවූ ද; එවං
භූතො භික්ඛු, මෙබඳුවූ මහණ; අනාතාපී, කෙලෙස්තවන වීර්‍ය්‍ය
නැත්තේ යයි ද; අනොත්තාපී පාපයෙහි භයනැත්තේ යයි ද;
සතතං සමිතං, නිරතුරු; කුසීතො, කුසීතවූයේ යයි ද; හීනවිරියො
ඉති, පහවූ වීර්‍ය්‍ය ඇත්තේ යයි ද; වුච්චති, කියනු ලැබේ; භික්ඛවෙ,
මහණෙනි; චෙ ඉදින්; ඨිතස්ස අපි, සිටියාවූද; භික්ඛුනො, භික්ෂුවට;
කාමවිතක්කො වා, කාමවිතර්කයක් හෝ —පෙ— නිසින්නස්ස, අපි,
උන්නාවූ ද; —පෙ— සයානස්ස අපි, ශයනය කරන්නාවූ ද; ජාග
රස්ස, (ශයන ඊර්‍ය්‍යාපථයෙන්) නිදිවර්ජිතකළාවූ; —පෙ— චරතො
—පෙ— න අධිවාසෙති, නොඉවසා ද; පජහති, දුරුකෙරේ ද; විනො
දෙති, විනොදනය කෙරේද; බ්‍යන්තීකරොති, පහකෙරේද; අනභා

පහිතත්තොති වුච්චති. නිසින්නස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා බ්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛවෙ භික්ඛු න අධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරෙති අනභාවං ගමෙති නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවං භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති සයානස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා බ්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා තං චෙ භික්ඛවෙ භික්ඛු න අධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරෙති අනභාවං ගමෙති සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවං භූතො ආතාපී ඔත්තාපී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

චරං වා යදි වා තිට්ඨං-නිසින්නො උද වා සයං
යො විතක්කං විතක්කෙති-පාපකං ගෙහනිස්සිතං.

කුම්මග්ගං පටිපන්නො සො-මොහනීයෙසු මුච්ඡිතො
අභබ්බො තාදිසො භික්ඛු-ඵුට්ඨුං සම්බොධිමුත්තමං

යො චරං වා තිට්ඨං වා-නිසින්නො උද වා සයං
විතක්කං සමයිත්වාන-විතක්කූපසමෙ රතො
භබ්බො සො තාදිසො භික්ඛු-ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

ආරද්ධවිරිය සුත්තං.

---

වං ගමෙති, නැවත නොඉපදීමට පමුණුවා ද; භික්ඛවෙ —පෙ— ආතාපී, කෙලෙස්තවන වීර්‍ය්‍ය ඇත්තේ යයි ද; ඔත්තාපී, පාපයෙහි භය ඇත්තේ යයිද; සතතං සමිතං, නිරතුරු; ආරද්ධවිරියො, පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ යයි ද; පහිතත්තො ඉති, හරනලද ආත්ම ස්නෙහ ඇත්තේ යයි ද; වුච්චති —පෙ—

චරං වා, හැසිරෙන්නාවූ ද; යදි, ඉදින්; තිට්ඨං වා, සිටින්නාවූ ද; නිසින්නො, හුන්නාවූ ද; උද වා යළිත්; සයංවා, ශයනය කරන්නාවූ ද; යො, යම් භික්ෂුවක් තෙම; ගෙහනිස්සිතං, කාමවිතර්කාදි ගෘහනිශ්‍රිතවූ; පාපකං, ලාමකවූ; විතක්කං, විතර්කයක්; විතක්කෙති, විතර්කනය කෙරේද;

මොහනීයෙසු, මොහසංවර්තනික රූපාදීන් කෙරෙහි; මුච්ඡිතො, මුළාවූ; කුම්මග්ගං, කාමවිතර්කාදි නපුරු මාර්ගයට; පටිපන්නො, පිළිපන්නාවූ; සො තාදිසො භික්ඛු, ඒ එබඳු මහණ; උත්තමං, උතුම්වූ; සම්බොධිං, සම්බොධිය හෙවත් අර්හත්මාර්ග ඥානය; ඵුට්ඨුං, ස්පර්ශකරන්ට; අභබ්බො, අභව්‍යවේ හෙවත් සුදුසු නොවේ;

චරං වා, හැසිරෙන්නාවූ ද; තිට්ඨං වා, සිටින්නාවූ ද; නිසින්නො වා, හුන්නාවූ ද; උද වා, යළිත්; සයං වා, ශයනය කරන්නාවූ ද; යො, යම් මහණෙක්; විතක්කං, කාමාදි ත්‍රිවිධ විතර්කය; සමයිත්වාන,

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, ජාගරො චස්ස භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සතො සම්පජානො සමාහිතො පමුදිතො විප්පසන්නො තත්‍ථ කාලවිපස්සී ච කුසලෙසු ධම්මෙසු, ජාගරස්ස භික්ඛවෙ භික්ඛුනො විහරතො සතස්ස සම්පජානස්ස සමාහිතස්ස පමුදිතස්ස විප්පසන්නස්ස තත්‍ථ කාලවිපස්සිනො කුසලෙසු ධම්මෙසු ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසෙසෙ අනාගාමිතාති. එතමත්‍ථං භගවා අවොච තත්‍ථෙතං ඉති වුච්චති.

ජාගරන්තා සුණාථෙතං-යෙ සුත්තා තෙ පබුජ්ඣථ
සුත්තා ජාගරියං සෙය්‍යො-නත්‍ථි ජාගරතො භයං

යො ජාගරො ච සතිමා සම්පජානො
සමාහිතො මුදිතො විප්පසන්නො ච
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො.

---

සංහිඳුවාගෙන; විතක්කොපසමෙ, විතර්කෝප සමයෙහි; හෙවත් කෙලෙස් සංහිඳවීමෙහි; රතො, ඇලුණේද; සො තාදිසො භික්ඛු, ඒ එබඳු මහණ තෙම; උත්තමං, උතුම්වූ; සංබොධිං, අර්හත්මාර්ග ඥානය; ඵුට්ඨුං, ස්පර්ශ කරන්ට; භබ්බො ඉති, භව්‍යවේ යයි වදාළසේක; අයම්පි —පෙ— සුතන්ති;

ආරද්ධවිරිය සුත්තං, ආරද්ධවිරිය සූත්‍ර යයි;

—— : ÷ : ——

වුත්තං —පෙ— භික්ඛවෙ, භික්ඛු, මහණතෙම: ජාගරො ච, නිදිවර්ජිත කරන්නෙක් ද; සතො, සිහි ඇත්තෙක් ද; සම්පජානො, සම්‍යක්ප්‍රඥ ඇත්තෙක් ද; සමාහිතො, එකඟවූ සිත්ඇත්තෙක් ද; පමුදිතො, ප්‍රමුදිත වූවෙක් ද; විප්පසන්නො, විප්‍රසන්න වූවෙක් ද; තත්‍ථ, ඒ කාලයෙහි; කුසලෙසු ධම්මෙසු කුශල ධර්මයන්හි; කාලවිපස්සිච, කාලානුරූපව දක්නාසුළුවූයේ ද; විහරෙය්‍ය අස්ස, වාසය කරන්නේ වන්නේය; භික්ඛවෙ, මහණෙනි; ජාගරස්ස, නිදිවර්ජිත කරන්නාවූ සතස්ස, සිහිඇත්තාවූ; සම්පජානස්ස, සම්‍යක්ප්‍රඥ ඇත්තාවූ; සමාහිතස්ස, එකඟ සිත්ඇත්තාවූ; පමුදිතස්ස, ප්‍රමුදිත සිත් ඇත්තාවූ; විප්පසන්නස්ස, විශෙෂයෙන් ප්‍රසන්න සිත්ඇත්තාවූ; තත්‍ථ, ඒ කාලයෙහි; කුසලෙසු ධම්මෙසු, කුශල ධර්මයන්හි; කාලවිපස්සිනො, කාලානුරූපව විශෙෂයෙන් දක්නාසුළුවූ; විහරතො, වාසය කරන්නාවූ; භික්ඛුනො, භික්ෂුවට; ද්වින්නං ඵලානං, අනාගාමි අර්හත් යන දෙවදෑරුම් ඵලයන් අතුරෙන්; අඤ්ඤතරං ඵලං, එක්තරා ඵලයක්; පාටිකඞ්ඛං, කැමතිවිය යුතුයි; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මයෙහි ම; අඤ්ඤා වා, අර්හත්වය අවබොධකරගැනීම හෝ; උපාදිසෙසෙ

තස්මා හවෙ ජාගරියං භජෙථ
ආතාපී භික්ඛු නිපකො ඣානලාභී
සංයොජනං ජාතිජරාය ඡෙත්වා
ඉධෙව සම්බොධිමනුත්තරං ඵුසෙති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

ජාගරණ සුත්තං.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා කතමා තිස්සො සුඛා වෙදනා දුක්ඛා වෙදනා

---

සති, කෙලශොපධීන් ඇතිකල්හී; අනාගාමිතා වා ඉති, අනාගාමි බව හෝ යන දෙකයි;

ජාගරන්තා, නිදිවර්ජිතකිරීමෙහි යෙදුණාහු; එතං, (මාගේ) මේ වචනය; සුණාථ, අසව්; යෙ, යමෙක්තුමූ; සුත්තා, (ප්‍රමාද නිද්‍රාවෙන්) ශයනය කළාහුද; තෙ, ඔව්හු; පබුජ්ඣථ, (අප්‍රමාද ප්‍රතිපත්තියෙන්) පිබිදෙව්; සුත්තා, (ප්‍රමාද නිද්‍රාවෙන්) ශයනයකිරීමට (වඩා ජාගරියං, (අප්‍රමාද ප්‍රතිපත්තියෙන්) නිදිවර්ජිතකිරීම; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨවේ; ජාගරතො, නිදිවර්ජිතකරන්නාහට භයං, බියක්; නත්ථි, නැත්තේය;

යො, යම් මහණෙක්; ජාගරො ච, නිදිවර්ජිත කෙළේද; සතිමා ච, සිහිඇත්තේ ද; සම්පජානො ච, සම්‍යක්ප්‍රඥ ඇත්තේ ද; සමාහිතො, එකග සිත්ඇත්තේ ද; මුදිතො ච, ප්‍රමුදිත සිත්ඇත්තේ ද; විප්පසන්නො, විප්‍රසන්න සිත්ඇත්තේ ද; කාලෙන, ආවාස සප්‍රායාදිය ලත් කාලයෙහි; (සො, යනු නිපාත මාත්‍රයකි) සම්මා, මනා නුවණින්; ධම්මං, ත්‍රෛභූමික ස සංස්කාර ධර්මය; පරිවීමංසමානො, හාත්පසින් විමංසනය කරමින්; එකොදිභූතො, එකඟවූ සිත්ඇත්තේ ද; සො, ඒ මහණ; තමං, අවිද්‍යාන්ධකාරය; විහනෙ, අනවශෙෂ වශයෙන් නසන්නේය;

තස්මා, එහෙයින්; හවෙ, ඒකාන්තයෙන්; භික්ඛු, මහණතෙම; ජාගරියං, නිදිවර්ජිත කිරීම; භජෙථ, භජනයකරන්නේය; ආතාපී, කෙලෙස්තවන වීර්‍ය්‍ය ඇත්තේ; ඣානලාභී, ධ්‍යානලාභීවූයේ; නිපකො, නෛපක්ක ප්‍රඥවෙන් යුක්තවූයේ; ජාතිජරාය, ජාතියට හා ජරාවට හේතුවූ; සංයොජනං, දශවිධ සංයොජනය; ඡෙත්වා සිඳ; ඉධ එව, මෙහිදීම; අනුත්තරං, නිරුත්තර වූ; සම්බොධිං, අර්හත්ඵල සංඛ්‍යාත සම්බොධිය; ඵුසෙති, ප්‍රත්‍යක්ෂකරන්නේ යයි වදාළසේක;

ජාගරණ සුත්තං, ජාගරණ සූත්‍ර යයි;

—0:0—

වුත්තඤ්හි — පෙ — භික්ඛවෙ, මහණෙනි; ඉමා තිස්සො වෙදනා, මේ වේදනාවෝ තුන්දෙනෙක් වෙත්; තිස්සො, තුන්දෙන; කතමාච, කවරීදයත්; සුඛා වෙදනා, ඉෂ්ටානුභවන ලක්ෂණවූ සැපවේදනාවය;

අදුක්ඛම් සුඛා වෙදනා, සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා, දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා අදුක්ඛ මසුඛා වෙදනා අනිච්ච තො දට්ඨබ්බා,

යතො ඛො භික්ඛවෙ සුඛා වෙදනා දුක්ඛතො දිට්ඨා හොති දුක්ඛා වෙදනා සල්ලතො දිට්ඨා හොති අදුක්ඛ මසුඛා වෙදනා අනි ච්චතො දිට්ඨා හොති.

අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරියො සම්මද්දසො අච්ඡෙජ්ජි තණ්හං විවට්ටයි සංයොජනං සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති, එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

යො සුඛං දුක්ඛතොඅද්දක්ඛි-දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං- අද්දක්ඛි නං අනිච්චතො

---

දුක්ඛාවෙදනා, අනිෂ්ටානුභවන ලක්ෂණවූ දුඃඛවෙදනාවය; අදුක්ඛ මසුඛාවෙදනා, උභය විපරීතානුභවන ලක්ෂණවූ අදුඃඛ මසුඛ වේද නාවය; යන තිවේදන වෙත්; භික්ඛවෙ, මහණෙනි; සුඛා වෙදනා, සැපවූ වේදනා තොම; දුක්ඛතො, දුඃඛවශයෙන්; දට්ඨබ්බා, දත යුත්තිය; දුක්ඛා වෙදනා, දුඃඛවෙදනා තොම; සල්ලතො, සල්‍යවශ යෙන්; දට්ඨබ්බා, දතයුත්තිය; අදුක්ඛ මසුඛා වෙදනා, අදුඃඛ මසුඛ වෙදනා තොම; අනිච්චතො, අනිත්‍ය වශයෙන්; දට්ඨබ්බා, දතයුත් තිය; භික්ඛවෙ, මහණෙනි; යතො ඛො, යම්හෙයකින් වනාහි; සුඛාවෙදනා, සැප වේදනා තොම; දුක්ඛතො, දුක් වශයෙන්; දිට්ඨා හොති, දක්නාලද්දී වේ ද; දුක්ඛා —පෙ— භික්ඛවෙ, මහණෙනි; අයං භික්ඛු, මේ මහණ; අරියො, කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ආර්‍ය්‍යයයි ද; සම්මද්දසො, සියලු වෙදනාවන් හෝ චතුස්ස ත්‍යයන් අවිපරීතව දක්නාසුළුවූයේ යයි ද; තණ්හං, වේදනා මූලක තෘෂ්ණාව; අච්ඡෙජ්ජි, අග්‍රමාර්ග ඥානයෙන් අනවශෙෂ වශයෙන් සින්දේයයි ද; සංයොජනං, දසවිධ සංයොජනය; විවට්ටයි, පරිවර්‍ත්‍ත නය (හෙවත්) දුබ්ලකෙළේ යයි ද; සම්මා, මනාකොට; මානාභි සමයා, මානයාගේ දර්‍ශනාභි සමයෙන් හෝ ප්‍රහාණාභි සමයෙන්; දුක්ඛස්ස, සියලු දුඃඛයාගේ; අන්තං අකාසි ඉති, කෙළෙවර කෙළේ යයි ද; වුච්චති, කියනු ලැබේ; එතං — පෙ -

යො, යමෙක්; සුඛං, සුව වේදනාව; දුක්ඛතො දුක් වශයෙන්; අද්දක්ඛි, දුටුයේ ද; දුක්ඛං, දුක; සල්ලතො, සල්‍යවශයෙන්; අද්දක්ඛි, දුටුයේ ද; සන්තං, සාන්තවූ; නං, ඒ; අදුක්ඛං අසුඛං, නොදුක් නොසැප වේදනාව; අනිච්චතො, අනිත්‍ය හෙයින්; අද්දක්ඛි, දුටු යේද; යතො, යම්හෙයකින්; තත්‍ර, එහි; හෙවත් වේදනා ප්‍රතිබද්ධ ඡන්දරාග ප්‍රහාණයෙන්; විමුච්චති,විශෙෂයෙන් මිදුනේද;(එහෙයින්)

සවෙ සච්චද්දසො භික්ඛු-යතො තත්‍ථ විමුච්චති
අභිඤ්ඤා වොසිතො සන්තො-සවෙ සඞ්ගාතිගො මුනීති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## සලල සුත්තං.

---

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං. භිදුරො යං භික්ඛවෙ කායො විඤ්ඤාණං විරාගධම්මං සබ්බෙ උපධී අනිච්චා, දුක්ඛා විපරිනාම ධම්මාති. එතමත්‍ථං භගවා අවොච තත්‍ථෙතං ඉති වුච්චති.

කායඤ්ච භින්දනං ඤත්වා-විඤ්ඤාණඤ්ච විරාගිකං
උපධීසු භයං දිස්වා-ජාතිමරණ මච්චගො
සම්පත්වා පරමං සන්තිං-කාලං කඞ්ඛති භාවිතත්තොති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## භිදුර සුත්තං.

“සත්තිමාති සුත්තානි ඉතිවුත්තකෙ.”

---

සො භික්ඛු, ඒ මහණතෙම; වෙ, එකාන්තයෙන්; සච්චද්දසො, සියලු වේදනාවන් හෝ චතුස්සත්‍යයන් දක්නේය; අභිඤ්ඤාය, විශිෂ්ට ඥානයෙන් දැන; වොසිතො, නිමවූ කෘත්‍යයන් ඇත්තේය; සන්තො, ශාන්ත ස්වභාව ඇත්තේය; වෙ, ඒකාන්තයෙන්; සො ඒ මහණතෙම; සඞ්ගාතිගො, කාමාදි සඞ්ගයන් ඉක්මවූ; මුනී ඉති, අභීත් සංඛ්‍යාත මුනි වේ යයි (වදාළසේක) අයම්පි —පෙ—

සලල සුත්තං, සලල සූත්‍ර යයි;

——o:o——

වුත්තං -පෙ- භික්ඛවෙ, මහණෙනි; අයං, කායො; මේ, චාතුර් මහාභූතික රූපකායය; භිදුරෙ, බිඳෙන ස්වභාව ඇත්තේය; විඤ්ඤාණං, විඥානය; විරාගධම්මං, නැසෙන ස්වභාව ඇත්තේය; සබ්බෙ, සියලු; උපධී, උපාධීහු; අනිච්චා, අනිත්‍යයහ; දුක්ඛා, දුඃඛයහ; විපරිනාම ධම්මා ඉති, පෙරළීම ස්වභාවකොට ඇත්තාහුය; එත -පෙ-

කායං, චාතුර්මහාභූතික රූපකායය; භින්දනං ච, හෙදන ස්වභාව යයිද; විඤ්ඤාණං, විඥානය; විරාගිකං ච, විරාග ස්වභාව යයිද; ඤත්වා, දැන; උපධීසු, උපධීන්හි; භයංච, බියද; දිස්වා, දැක; ජාතිමරණං, ජාතිය හා මරණය; අච්චගො, ඉක්මවූයේ; පරමංසන්තිං, උතුම් ශාන්තියට; සම්පත්වා, පැමිණ; භාවිතත්තො, වඩනලද කාය ශීලචිත්ත ප්‍රඥා ඇත්තේ; කාලං, කාලය හෙවත් තමාගේ ස්කන්ධ පරිනිර්වාණ කාලය; කඞ්ඛති ඉති, බලාපොරොත්තුවන්නේ යයි; -පෙ-

භිදුර සුත්තං, භිදුර සූත්‍ර යයි;

——o:o——

(සත්තිමාති සුත්තානි, මේ සූත්‍ර සත; ඉතිවුත්තකෙ, ඉතිවුත්තකයෙහි යි;)

එවමෙම්ම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච. දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා; කතමෙ දස? වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, පරපටිබද්ධා මෙ ජීවිකාති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කච්චි නුඛො මෙ අත්තා සීලතො න උපවදතීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, කච්චිනුඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

---

එවං–පෙ–එතදවොච, භික්ඛවෙ, මහණෙනි; පබ්බජිතෙන, ප්‍රව්‍රජිතයා විසින්; ඉමෙ දස ධම්මා, මේ ධර්මයෝ දසදෙනෙක්; අභිණ්හං, නිරතුරු; පච්චවෙක්ඛිතබ්බා, ප්‍රත්‍යවේක්‍ෂා කටයුත්තාහ; කතමෙ දස, දසදෙන කවරහුද යත්; වෙවණ්ණියං, දෙවැදෑරුම් විවර්ණභාව යට; අජ්ඣුපගතො අම්හි ඉති, පැමිණියේ වෙමියි; අභිණ්හං, එක්වත්; පච්චවෙක්ඛිතබ්බං, සලකා බැලිය යුතුයි; මෙ, මාගේ; ජීවිකා, ජීවිකාව; පරපටිබද්ධා ඉති, අනුන් පිළිබඳව යයි; පබ්බ – පෙ මෙ, මා විසින්; අඤ්ඤො අන්‍යවූ; ආකප්පො, ආකල්පයෙක්; කරණීයො ඉති, කටයුතු යයි; පබ්බ —පෙ– කච්චිනුඛො, කිමෙක්ද‍ෙ; අත්තා, තෙමේ; සීලතො, සීලයෙන්; මෙ, මට; න උපවදතීති, උපවාද නොකෙරේදැයි; පබ්බ –පෙ– විඤ්ඤූ පණ්ඩිතවූ; සබ්‍රහ්මචාරී, සබ්‍රහ්මචාරීහු; මං, මා, අනුවිච්ච, දැන; කච්චිනුඛො, කිමෙක් දෙ; සීලතො, සීලයෙන්; න උපවදන්තීති, උපවාද නොකෙරෙද්දැයි; පබ්බ –පෙ– පියෙහි ප්‍රියවූ; මනාපෙහි, මනවඩන්නාවූ; සබ්බෙහි, සියල්ලන් කෙරෙන්; මෙ, මාගේ; නානාභාවො, ජාතියෙන් වෙනවීමෙක්ඇත; විනාභාවො ඉති, මරණයෙන් වෙන්වීමෙක් ඇතැයි; පබ්බ —පෙ— කම්මස්සකොම්හි, කර්මය ස්වකීයකොට ඇත්තෙමි; කම්මදායාදො, කර්මය දායාදකොට ඇත්තෙමි; කම්මයොනි, කර්මය කාරණකොට ඇත්තෙමි; කම්මබන්ධු, කර්මය නෑකොට ඇත්තෙමි; කම්මපටිසරණො, කර්මය පිහිටකොට ඇත්තෙමි; කල්‍යාණංවා, යහපත්වූ හෝ; පාපකංවා, අයහපත්වූ හෝ; යං කම්මං, යම් කර්මයක්; කරිස්සාමි, කෙරෙම්ද; තස්ස, ඒ කර්මයාගේ; දායාදො භවිස්සාමි ඉති, දායාදයෙක් වන්නෙමියි; පබ්බ —පෙ—

කථම්භූතස්ස මෙ රත්තිං දිවා වීතිපතන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කච්චි නු බො'හං සුඤ්ඤාගාරෙ අභිරමාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං- අත්ථි නු ඛො මෙ උත්තරි මනුස්ස ධම්මා අලමරිය ඤාණදස්සන විසෙසො අධිගතො සොහං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මඞ්කු භවිස්සාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං— ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති, ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## දසධම්ම සුත්තං.

“දසකඞ්ගුත්තරෙ.”

---

සාවත්ථිනිදානං— තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතද වොච පඤ්චිමානි භික්ඛවෙ අනාගතභයානි සම්පස්සමානෙන අල මෙව ආරඤ්ඤිකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිත තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

---

කථම්භූතස්ස, කෙසේවූ; මෙ, මට; රත්තින්දිවා, රෑ දවල්හු; වීතිපතන්ති ඉති, ඉක්මෙද්දෝ හෝයි; පබ්බ -පෙ- අහං, මම; සුඤ්ඤ, ජනශූන්‍යවූ; අගාරෙ, ගෘහයෙක්හි; අභිරමාමි ඉති, සිත්අලවා වසන් නෙම්දැයි; පබ්බ -පෙ- අධිගතො, ලැබගත්තාවූ; උත්තරිමනුස්ස ධම්මා, මනුෂ්‍යධර්ම (දශකුශල) යෙන් මත්තෙහිවූ: අලමරියඤාණ දස්සනවිසෙසො ආර්‍ය්‍යභාවයට සුදුසුවූ ඥානදර්ශන විශෙෂයෙක්; මෙ, මාගේ සන්තානයෙහි; අත්ථිනුඛො ඉති, ඇත්තේදෝ හෝ; සො අහං, ඒ මම; පච්ඡිමෙකාලෙ, මරණමඤ්චකයෙහි හොත්කල්හි; සබ්‍රහමචාරීහි, සබ්‍රම්සරුම් විසින්; පුට්ඨො, විචාරණලද්දේ; න මඞ්කු භවිස්සාමි ඉති, මකු නොවන්නෙම්යි; පබ්බ — පෙ— ති;

දස ධම්ම සුත්තං, දස ධම්ම සූත්‍ර යයි;

(දසකඞ්ගුත්තරෙ අඞ්ගුත්තර සඞ්ගියෙහි දසකනිපාතයෙහිය;)

---

සාවත්ථි නිදානං —පෙ— භික්ඛවෙ, මහණෙනි; ඉමානි පඤ්ච, අනාගතභයානි, අනාගතයෙහි බියඑළවන්නාවූ මොහු පස්දෙනෙක්; සම්පස්සමානෙන, දක්නාවූ; ආරඤ්ඤිකෙන භික්ඛුනා, ආරණ්‍යයෙහි වසන්නාවූ භික්ෂුව විසින්; අප්පත්තස්ස, නොපැමිණියාවූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලාදි විශෙෂයාගේ; පත්තියා, පැමිණීම පිණිසද; අනධිගතස්ස, අනධිගතවූ ධර්මයාගේ; අධිගමාය, අධිගමය පිණිසද; අසච්ඡිකතස්ස, ප්‍රත්‍යක්ෂ නොකරණලද ධර්මයාගේ; සච්ඡි

කතමානි පඤ්ච ඉධ භික්ඛවෙ ආරඤ්ඤිකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි එකකං ඛො පන මං අරඤ්ඤෙ විහරන්තං අහි වා මං ඩංසෙය්‍ය විච්ඡිකො වා මං ඩංසෙය්‍ය සතපදී වා මං ඩංසෙය්‍ය තෙන මෙ අස්ස කාලකිරියා සො මමස්ස අන්තරායො හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං භික්ඛවෙ පඨමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤිකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනචපරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි එකකො ඛො පනාහං අරඤ්ඤෙ විහරන්තො උපක්ඛලිත්වා වා පපතෙය්‍යං භත්තං වා මෙ භුත්තං ව්‍යාපජ්ජෙය්‍ය පිත්තං වා මෙ කුප්පෙය්‍ය සෙම්හං වා මෙ කුප්පෙය්‍ය සත්ථකා වා මෙ වාතා කුප්පෙය්‍යුං තෙන මෙ අස්ස කාලකිරියා සො මමස්ස අන්තරායො හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං භික්ඛවෙ දුතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤිකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය,

---

කිරියාය, සාක්ෂාත් කිරීම පිණිසද; අප්පමත්තෙන, අප්‍රමාදවත්වූ; ආතාපිනා, කෙලෙස්තවන වීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යවත්වූ; පහිතත්තෙන, හරනලද ආත්ම ස්නෙහයෙන් යුක්තවූ; විහරිතුං, වාසයකරන්ට; අලංඑව, සුදුසුමය; පඤ්ච, පස; කතමානි, කවරහුද යත්;

භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; ආරඤ්ඤිකො, ආරණ්‍යකවූ; භික්ඛු, මහණතෙම; ඉතිපටිසංචික්ඛති, මෙසේ කල්පනා කරයි; අහං ඛො, මම වනාහී; එතරහි, දැන් මේකාලයෙහි; එකකො, හුදකලාවූයේ; අරඤ්ඤෙ, වනයෙහි; විහරාමි, වාසය කරමි; එකකං ඛො පන, හුදකලාවූ; අරඤ්ඤෙ, වනයෙහි; විහරන්තං, වාසයකරන්නාවූ; මං, මා; අහි වා, සර්පයෙක් හෝ; ඩංසෙය්‍ය, දෂ්ටකරන්නේය; මං, මා; විච්ඡිකො වා, ගෝනුස්සෙක් හෝ; ඩංසෙය්‍ය, දෂ්ටකරන්නේය; මං, මා; සතපදී වා, සියපාසතෙක් හෝ; ඩංසෙය්‍ය, දෂ්ට කරන්නේය; තෙන, එහෙයින්; මෙ, මාගේ; කාලකිරියා අස්ස, කාලක්‍රියාව වන්නේය; මම, මට; සොඅන්තරායො අස්ස, එය ජීවිත අන්තරාය ද බ්‍රහ්මචර්‍ය්‍යා අන්තරාය ද ස්වර්ගාන්තරාය ද වන්නේය; අහං, මම; අප්පත්තස්ස, —පෙ— හන්ද, එකාන්තයෙන්; විරියං ආරභාමි, දෙව්දුරුම් වීර්‍ය්‍යාරම්භය කරමි; -පෙ- පඨමං, අනාගතභයං,

පුනචපරං භික්ඛවෙ ආරඤ්ඤිකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති අහං බො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි එකකො බො පනාහං අරඤ්ඤෙ විහරන්තො වාළෙහි සමාගච්ඡෙය්‍යං සීහෙන වා ව්‍යග්ඝෙන වා දීපිනා වා අච්ඡෙන වා තරච්ඡෙන වා තෙපි මං ජීවිතා වොරොපෙය්‍යුං තෙන මෙ අස්ස කාලකිරියා සො මමස්ස අන්තරායො හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ තතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤිකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනචපරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති අහං බො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි එකකො බො පනාහං අරඤ්ඤෙ විහරන්තො මාණවෙහි සමාගච්ඡෙය්‍යං කතකම්මෙහි වා අකතකම්මෙහි වා තෙපි මං ජීවිතා වොරොපෙය්‍යුං තෙන මෙ අස්ස කාලකිරියා සො මමස්ස අන්තරායො හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ චතුත්ථං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනචපරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති අහං බො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි සන්ති බො පන අරඤ්ඤෙ වාළාමනුස්සා තෙපි මං ජීවිතා වොරොපෙය්‍යුං තෙන මෙ අස්ස කාලකිරියා සො මමස්ස අන්තරායො හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ පඤ්චමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහි

---

පළමුවන අනාගතභය —පෙ— පුනචපරං —පෙ— විහරන්තො— උපක්ඛලිත්වා, පැකිළී හෝ; පපතෙය්‍යං, වැටෙන්නෙමි; මෙ, මා විසින්; භුත්තං, අනුභව කරනලද; භත්තං වා, බත හෝ; ව්‍යාපජ්ජෙය්‍ය, මනාකොට පැසවීමට නොයන්නේය; මෙ, මාගේ; පිත්තං වා, බඩාබඩපිත හෝ; කුප්පෙය්‍ය, කිපෙන්නේය; සෙම්හං වා, සෙම හෝ -පෙ- සත්ථකා වාතා වා, ශස්ත්‍රකවාතයෝ හෝ; කුප්පෙය්‍යුං, කිපෙන්නාහුය; තෙන -පෙ- වාළෙහි, ව්‍යාලමෘගයන් සමග හෝ; සමාගච්ඡෙය්‍යං, මුණ ගැසෙන්නෙමි; සීහෙන වා, සිංහයකු සමග හෝ; ව්‍යග්ඝෙන වා, ව්‍යාඝ්‍රයකු සමග හෝ; දීපිනා වා, දිවියකු සමග හෝ;

ත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අනාගතභයානි සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආරඤ්ඤිකානාගතභය සුත්තං.

"පඤ්චකඞ්ගුත්තරෙ."

---

සාවත්ථිනිදානං— දසබලසමන්නාගතො භික්ඛවෙ තථාගතො චතූහි වෙසාරජ්ජෙහි සමන්නාගතො ආසභණ්ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තෙති ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථඞ්ගමො ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො ඉති වෙදනාය අත්ථඞ්ගමො ඉති සඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයො ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො ඉති සංඛාරා ඉති සංඛාරානං සමුදයො ඉති සංඛාරානං අත්ථඞ්ගමො ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො, ඉති ඉමස්මිං සති ඉදං හොති ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා

---

අවෙර්ජන වා, වලසකු සමග හෝ; (මූණගැසෙන්නෙමි;) තෙපි, ඔව්හුද; මං, මා; ජීවිතා ජීවිතයෙන්; වොරොපෙය්‍යුං, තොරකරන්නාහුය; තෙන —පෙ— කතකම්මෙහි, කරනලද සොරකම් ඇත්තාවූ හෝ; අකතකම්මෙහි, නොකරනලද සොරකම් ඇත්තාවූ හෝ; මානවෙහි, සොරුන් සමග හෝ; සමාගච්ඡෙය්‍යං, මූණගැසෙන්නෙමි; තෙපි – පෙ— අරඤ්ඤෙ, වනයෙහි; වාලාමනුස්සා, කකීශවූ අමනුෂ්‍යයෝ; සනාතිබොපන, ඇත්තාහුමය; තෙපි — පෙ —

ආරඤ්ඤිකානාගතභය සුත්තං,

ආරඤ්ඤිකානාගතභය සූත්‍ර යයි;

(පඤ්චකඞ්ගුත්තරෙ, අඞ්ගුත්තර පංචක නිපාතයෙහි ය;)

———o÷o———

සාවත්ථිනිදානං, —පෙ— භික්ඛවෙ, මහණෙනි; දසබලසමන්නාගතො, දසබලයකින් යුක්තවූ; චතූහි වෙසාරජ්ජෙහි, චතුර්විධ වෛශාරද්‍ය ඥනයෙන්; සමන්නාගතො යුක්තවූ; තථාගතො, තථාගත තෙම; ආසභණ්ඨානං, ශ්‍රෙෂ්ඨ තාදය; පටිජානාති, පිළිදනී හෙවත් ප්‍රතිඥ කෙරෙයි; පරිසාසු අටපිරිස්හි; සීහනාදං නදති, අභීතනාදය කෙරෙයි; බ්‍රහමචක්කං, ශ්‍රෙෂ්ඨවූ ධර්මචක්‍රය; පවත්තෙති පවත්වයි; රූපං, රූපය; ඉති, මෙසේය; රූප සමුදයො, රූපයාගේ සමුදය; ඉති, මෙසේය; රූපස්ස, රූපයාගේ; අත්ථගමො, නැසීම; ඉති, මෙසේය; වෙදනා, වේදනා තොම; ඉති, මෙසේය; වෙදනාය

ඉදං නිරුජ්ඣති යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදන උපාදනපච්චයා භවො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදෙමනස්සු පාය° සා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාරනිරොධො සංඛාර නිරොධා විඤ්ඤාණනිරොධො විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො නාමරූපනිරොධා සළායතනනිරොධො සළායතනනිරොධා ඵස්ස නිරොධො ඵස්සනිරොධා වෙදනානිරොධො වෙදනානිරොධා තණ්හා නිරොධො තණ්හානිරොධා උපාදනනිරොධො උපාදනනිරොධා භවනිරොධො භවනිරොධා ජාතිනිරොධො ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො එවං ස්වාක්ඛාතෙ ඛො භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ අලමෙව සද්ධාපබ්බජිතෙන

---

වේදනාවගේ; සමුදයො, සමුදය; ඉති, මෙසේය;-සඤ්ඤ- සඞ්ඛාර-විඤ්ඤාණස්ස, විඥානයාගේ; ඉති, මෙසේ; ඉමස්මිං සති, මේ හේතුව ඇතිකල්හි; ඉදං හොති, මේ ඵලය වේ; ඉමස්ස උප්පාද, මේ හේතුහුගේ ඉපදීමෙන්; ඉදං උප්පජ්ජති, මේ ඵලය උපදී; ඉමස්මිං අසති, මේ හේතුව නැතිකල්හී; ඉදං නහොති, මේ ඵලය නොවේ; ඉමස්ස නිරොධා, මේ හේතුහුගේ නිරුද්ධයෙන්; —පෙ— යදිදං, එනම්; අවිජ්ජාපච්චයා, අවිද්‍යා ප්‍රත්‍යයෙන්; සඞ්ඛාරා, සංස්කාරයෝ වෙත්; සඞ්ඛාරපච්චයා, සංස්කාර ප්‍රත්‍යයෙන්; විඤ්ඤාණං, විඥානය වේ; -පෙ- භික්ඛවෙ, මහණෙනි; මයා, මා විසින්; එවං, මෙසේ; ධම්මො, පඤ්ච සකන්ධ ප්‍රත්‍යයාකාර ධර්මය; ස්වාක්ඛාතො, මනාකොට ප්‍රකාශක න ලද්දේය; උත්තානො, ප්‍රකටකරනලද්දේය; විවටො, විවෘතකරන ලද්දේය; පකාසිතො, ප්‍රකාශකරන ලද්දේය; ඡින්නපිලොතිකො, සිඳිනලද පිලොතිකා (සිඳබිඳීගිය මහලුරෙද්කඩ) ඇත්තක් හෙවත් හඳනාලද පිරිසුදු මහාවස්ත්‍ර ඇත්තක් කෙළේය නොහොත සිඳින ලද ශ්‍රමණ කසළ ඇත්තක් කෙළේය; භික්ඛවෙ, මහණෙනි; මයා, මා විසින්; එවං, මෙසේ; උත්තානෙ, ප්‍රකටකළාවූ; විවටෙ, විවෘත් කළාවූ; පකාසිතෙ, ප්‍රකාශ කළාවූ; ඡින්නපිලොතිකෙ, සිඳිනලද පිලොතික කළාවූ; ස්වාක්ඛාතෙ, මනාකොට ප්‍රකාශකරණ ලද්දාවූ;

කුලපුත්තෙන විරියං ආරභිතුං කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං යන්තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති.

දුක්ඛං භික්ඛවෙ කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි මහන්තඤ්ච සදත්ථං පරිහාපෙති ආරද්ධවිරියො ච ඛො භික්ඛවෙ සුඛං විහරති පවිවිත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි මහන්තඤ්ච සදත්ථං පරිපූරෙති න භික්ඛවෙ හීනෙන අග්ගස්ස පත්ති හොති අග්ගෙන ච ඛො අග්ගස්ස පත්ති හොති මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං සත්ථා සම්මුඛීභූතො තස්මාතිහ භික්ඛවෙ විරියං ආරභථ අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය එවං නො අම්හාකං පබ්බජ්ජා

---

ධම්මෙ, ධම්මවිනය සංඛ්‍යාත ශාසනයෙහි; සද්ධාපබ්බජිතෙන, සැදැහැයෙන් පැවිදිවූ; කුලපුත්තෙන, කුලපුත්‍රයා විසින්; විරියංආරභිතුං, දෙවදූරුම් වීර්‍ය්‍යකරන්ට; අලංඑව, සුදුසුමය; කාමං, ඒකාන්තයෙන්; සරීරෙ, සිරුරෙහි; තචොච, සමද; නහාරුච, නහරද; අවසිස්සතු, ඉතිරි වේවා; මංසලොහිතං, මස හා ලේ; උපසුස්සතු, වියලේවා; පුරිස ථාමෙන, පුරුෂ ථාමයෙන් ද; පුරිස විරියෙන, පුරුෂ වීර්‍ය්‍යයෙන් ද; පුරිසපරක්කමෙන, පුරුෂ පරාක්‍රමයෙන් ද; යං තං, යම් ඒ අභීෂ්ටයක්; පත්තබ්බං, ලැබගත යුතුද; (ඒ අභීෂ්ටය) අපාපුණිත්වා, ලැබ නොගෙන; විරියස්ස, වීර්‍ය්‍යයාගේ; සණ්ඨානං, සංස්ථානය; හෙවත් නැවැත්ම; නභවිස්සති ඉති, නොවන්නේ යයි; භික්ඛවෙ, මහණෙනි; කුසීතො, කුසීත පුද්ගල තෙම; පාපකෙහි, ලාමකවූ; අකුසලෙහි ධම්මෙහි, අකුශල ධර්මයන්ගෙන්; වොකිණ්ණො, මිශ්‍රවූයේ; දුක්ඛං, දුකසේ; විහරති, වෙසෙයි; මහන්තං, මහත්වූ; සදත්ථංච, ශොභනවූ හෝ ස්වකීයවූ අර්ථයද හෙවත් අභීෂ්ටය; පරිහාපෙති, පිරිහෙළයි නොහොත් නොපැමිණෙයි; භික්ඛවෙ, මහණෙනි; ආරද්ධ විරියො, පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇති පුද්ගල තෙමේ වනාහී; පාපකෙහි අකුසලෙහි ධම්මෙහි, ලාමකවූ අකුශල ධර්මයන්ගෙන්; පවිවිත්තො, වෙන්වූයේ; සුඛං සැපසේ; විහරති, වාසය කෙරෙයි; මහන්තං, මහත්වූ; සදත්ථංච, අභීෂ්ටය ද; පරිපූරෙති, සම්පූර්ණ කෙරෙයි; භික්ඛවෙ, මහණෙනි; හීනෙන, හීනවූ ශ්‍රද්ධාදියෙන් කළ ප්‍රතිපත්තියෙන්; අග්ගස්ස, අභීෂ්ටයට; පත්ති, පැමිණීම; න හොති නොවේ; අග්ගෙනච ඛො, අග්‍රවූ ශ්‍රද්ධාදියෙන්කළ ප්‍රතිපත්තියෙන්ම; අග්ගස්ස, අග්‍රවූ රහත්බවට; පත්තිහොති, පැමිණීම වේ; භික්ඛවෙ, මහණෙනි; ඉදං බ්‍රහ්මචරියං, මේ බ්‍රහ්මචර්‍ය්‍යය; මණ්ඩපෙය්‍යං, ප්‍රසන්

අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයා යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවර පිණ්ඩපාතසෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙ තෙසං තෙ කාරා අමෙහසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං අත්තත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, පරත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, උභයත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුන්ති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

දසබල සුත්තං.

—

“නිදානවග්ගො.”

---

නව පාඨයකාටයුත්තේය; සත්ථුසම්මුඛීභූතො, ශාස්තෲන් වහන්සේ සම්මුඛවූයේ ද; එහෙයිනි; භික්ඛවෙ, මහණෙනි; තස්මා, එහෙයින්; ඉධ, මේ ශාසනයෙහි; විරියං ආරභථ, වීර්‍ය්‍යකරව්; අප්පත්ත–පෙ–අම්හාකං, අපගේ; පබ්බජ්ජා, ප්‍රව්‍රජ්‍යාව; අවඤ්ඣා, නිෂ්ඵල විරහිත වූවා; සඵලා, ආනිසංස සහිතවූවා; සඋද්‍රයා, සවෘද්ධිකවූවා; භවිස්සති, වන්නේය; මයං, අපි; යෙසඤ්ච, යම් කෙනෙකුන් පිළිබඳවූද; චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය භෙසජ්ජ පරික්ඛාරෙ, චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර; පරිභුඤ්ජාම, වළඳමුද; අමෙහසු, අප කෙරෙහි, තෙසං, ඒ මිනිසුන්ගේ; තෙ කාරා, ඒ සත්කාරයෝ; මහප්ඵලා භවිස්සන්ති, මහත්ඵල වන්නාහ; මහානිසංසා ඉති, මහත් ආනිසංස වන්නාහයි කියායි; භික්ඛවෙ, මහණෙනි; වො, තොප විසින්; එවංහි, මෙසේම; සික්ඛිතබ්බං, හික්මිය යුතුයි; භික්ඛවෙ, මහණෙනි; අත්තත්ථං වා, ආත්මාර්ථය හෝ; සම්පස්සමානෙන, දක්නාහු විසින්; අප්පමාදෙන, අප්‍රමාදයෙන්; සම්පාදෙතුං, සම්පාදනය කරන්ට; අලංඑවහි, සුදුසුමය; පරත්ථං වා, පරාර්ථය හෝ; සම්පස්සමානෙන, දක්නහු විසින්; අප්පමාදෙන, අප්‍රමාදයෙන්; සම්පාදෙතුං, සපයන්ට; අලංඑවහි, සුදුසුමය; උභයත්ථංවා, උභයාර්ථය හෝ —පෙ— අභිනන්දුන්ති;

දසබල සුත්තං, දසබල සූත්‍ර යයි;

—•═•—

ඉමස්මිඤ්ච පන සමූහතෙ කාලදානං සුමනා සප්පුරිසදානං වෙලාමො දක්ඛිණාවිභඞ්ගො චූළකම්මවිභඞ්ගොති ඡ සුත්තානි දානකථා පටිසංයුත්තානි, මහානාමො උපාසකචණ්ඩාලො උපාසකරතනං වණිජ්ජා විසාඛුපොසථො සිගාලොවාදොති ඡ සුත්තානි සීලකථා පටිසංයුත්තානි, ධම්මහදයං ජනනමාණවො රෙවතී ගුත්තිලො අනෙකවණ්ණොති පඤ්චසුත්තානි සග්ගකථාපටිසංයුත්තානි, දෙවදූතො මහාදුක්ඛක්ඛන්ධො අට්ඨිපුඤ්ජො පාවෙය්‍යකො සූකරපොතිකාති පඤ්චසුත්තානි කාමාදීනවපටිස යුත්තානි, පරාභවො අග්ගප්පසාදො සබ්‍රහ්මකං නිරයුප්පත්ති සුගතුප්පත්ති දෙවාවචනං පට්ඨානං මාපුඤ්ඤභායී අප්පමාදො සබ්භිසභාවො සතුල්ලපකායිකං ආදිත්ත..රං

---

ඉමස්මිං සමූහතෙ ච පන, මේ සංග්‍රහයෙහි වනාහි; සුමනා, සුමනා සූත්‍රය; සප්පුරිසදානං, සප්පුරිසදාන සූත්‍රය; වෙලාමො, වෙලාම සූත්‍රය; දක්ඛිණාවිභඞ්ගො, දක්ඛිණාවිභඞ්ග සූත්‍රය; චූළකම්ම විභඞ්ගො ඉති, චූළකම්මවිභඞ්ගය ද යන; ඡ සුත්තානි, සව් සූත්‍රයෝ; දානකථා පටිස යුත්තානි, දානකථා ප්‍රතිසංයුක්තයෝ වෙත්;

මහානාමො, මහානාම සූත්‍රය; උපාසකචණ්ඩාලො, උපාසක චණ්ඩාලය; උපාසකරතනං, උපාසකරතනය; වණිජ්ජා වණිජ්ජාය; විසාඛුපොසථො, විශාඛොපොසථය; සිගාලොවාදො ඉති, සිගාලොවාදය යන; ඡ සුත්තානී, සූත්‍ර සය; සීලකථා පටිසංයුත්තානි, සීලකථා ප්‍රතිසංයුක්තයෝ වෙත්;

ධම්මහදයං, ධම්මහදය සූත්‍රය; ජනනමාණවක, ජනනමාණවකය; රෙවති, රෙවතීය; ගුත්තිලො, ගුත්තිලය; අනෙකවණ්ණො ඉති, අනෙකවණ්ණය යන; පඤ්චසුත්තානි, සූත්‍ර පස; සග්ගකථා පටිසංයුත්තානි, සවගීකථා ප්‍රතිසංයුක්තයෝ වෙත්;

දෙවදූතො, දෙවදූත සූත්‍රය; මහාදුක්ඛක්ඛන්ධො, මහාදුක්ඛක්ඛන්ධය; අට්ඨිපුඤ්ජො, අට්ඨිපුඤ්ජය; පාවෙය්‍යකො, පාවෙය්‍යකය; සූකරපොතිකා ඉති, සූකරපොතිකාය යන; පඤ්ච සුත්තානි, සූත්‍ර පස; කාමාදීනව පටිසංයුත්තානි, කාමයන්ගේ ආදීනව ප්‍රතිසංයුක්තයෝ වෙත්;

පරාභවො, පරාභව සූත්‍රය; අග්ගප්පසාදො, අග්ගප්පසාදය; සබ්‍රහ්මකං, සබ්‍රහ්මකය; නිරයුප්පත්ති, නිරයුප්පත්තිය; සුගතුප්පත්ති, සුගතුප්පත්තිය; දෙවාවචනං, දෙවාවචනය; පට්ඨානං, පට්ඨානය; මාපුඤ්ඤභායී, මාපුඤ්ඤභායීය; අප්පමාදො, අප්පමාදය; සබ්භිසභාවො, සබ්භිසභාවය; සතුල්ලපකායිකං, සතුල්ලපකායිකය; ආදිත්තසරං, ආදිත්තසරය; මවෙජරං, මවෙජරය; කිංසු

මචෙජරං කිංසුයාවජරා කිංසුමිත්තං අබ්භාහතො කිංසුවිත්තං කිංසු ජීරති පාථෙය්‍යකො ධම්මරථො න උස්සුතබ්බෝ ජරමරණං අත්ත පපියං පමාදෙ අප්පමාදෙ අපුත්තකො තමොතමපරායණො පබ්බතූ පමො ලොකානුවිවරණං සුපුබ්බණ්හා සල්ලං නබසිබාති චත්තිංස සුත්තානි ගහට්ඨානං පරිකථාපටිසංයුත්තානි, නිධිකණ්ඩං චරිමා ලොපො පඤ්චවට්ඨානදනං බලදනං පුඤ්ඤවඩ්ඪනං යාගුදනං දෙව තානුකම්පං රාජගහසෙට්ඨි වෙළුවනදනං ගිහිපටිපද මහාසමයො තිරොකුඩ්ඩං ජානුසොණිති තෙරසසුත්තානි අනුමොදනාපටිසං යුත්තානි, අඞ්කවිඡෙද මහාරාහුලොවාදෙ ධම්මවිහාරි රාහුලො

---

යාවජරා, කිංසු යාව ජරා ය; කිංසුමිත්තං, කිංසුමිත්තය; අබ්භාහතො, අබ්භාහතය; කිංසුවිත්තං, කිංසු විත්තය; කිංසුජීරති, කිංසුජීරතිය; පාථෙය්‍යකො, පාථෙය්‍යක ය; ධම්මරථො, ධම්ම රථ ය; නඋස්සුතබ්බෝ, නඋස්සුතබ්බ ය; ජරමරණං, ජරමර ණය; අත්තපපියං, අත්තපපිය ය; පමාදෙ, පමාදය; අප්පමාදෙ, අප්පමාද ය; අපුත්තකො, අපුත්තක ය; තමොතමපරායනො, තමොතමපරායන ය; පබ්බතූපමො, පබ්බතූපම ය; ලොකානුවිව රනං, ලොකානුවිවරණ ය; සුපුබ්බණ්හා, සුපුබ්බණ්හ ය; සල්ලං, සල්ල ය; නබසිබා ඉති, නබසිබා සූත්‍රය යන; චත්තිංස සුත්තානි, සූත්‍ර දෙතිස; ගහට්ඨානං, ගෘහස්ථයන්ට; පරිකථාපටිසංයුත්තානි, පරිකථා ප්‍රතිසංයුක්තයෝ වේත්;

නිධිකණ්ඩො, නිධිකණ්ඩය; චරිමාලොපං, චරිමාලොපය; පඤ්චවට්ඨානදනං, පඤ්චවට්ඨානදනය; බලදනං, බලදනය; පුඤ්ඤවඩ්ඪනං, පුඤ්ඤවඩ්ඪනය; යාගුදනං, යාගුදනය; දෙවතානුකම්පං, දෙවතා නුකම්පය; රාජගහසෙට්ඨි, රාජගහසෙට්ඨිය; වෙළුවනදනං, වෙළු වනදනය; ගිහිපටිපද, ගිහිපටිපදවය; මහාසමයො, මහාසමයය; තිරොකුඩ්ඩං, තිරොකුඩ්ඩය; ජානුසොණි, ජානුසොණිය; ඉති, යන; තෙරසසුත්තානි, සූත්‍රතෙළෙස; අනුමොදනා පටිසංයුත්තානි, අනු මොදනා ප්‍රතිසංයුක්තයෝ වේත්;

අඞ්කවිඡෙද, අඞ්කවිඡෙද සූත්‍රය; මහාරාහුලොවාදෙ, මහාරාහු ලොවාදය; විජයො, විජයය; තුවටකො, තුවටකය; අනත්තා, අනත්තය; චූලරාහුලොවාදෙ, චූලරාහුලොවාදය; අජ්ඣත්තික

විජයො තුවට්ටකො අනත්තලක්ඛණං චූලරාහුලොවාදෙ අජ්ඣත්තිකඛන්ධා බාහිරඛන්ධා පුණ්ඩියාලොපො ආරද්ධවිරියො ජගරණං දුක්ඛසල්ලො භිදුරො දසධම්මො ආරක්ඛදිකො දසබලොති අට්ඨාරසසුත්තානි පබ්බජිතානං පටිපත්තිසංයුත්තානි, සබ්බානෙතානි පඤ්චාසීතිප්පමාණානි හොන්තීති.

සුත්තසඞ්ගහො සමත්තො.

---

ඛන්ධා, අජ්ඣත්තිකඛන්ධය; බාහිරඛන්ධා, බාහිරඛන්ධය; පිණ්ඩියාලොපො, පිණ්ඩියාලොපය; ආරද්ධවිරියො, ආරද්ධවිරියය; ජගරණං ජගරණය; දුක්ඛසල්ල, දුක්ඛසල්ලය; භිදුරෙ, භිදුරය; දසධම්මො, දසධම්මය; ආරක්ඛදිකො, ආරක්ඛදිකය; දසබලො, දසබලය; ඉති, යන; අට්ඨාරස සුත්තානි, සූත්‍ර අටළොස; පබ්බජිතානං, ප්‍රව්‍රජිතයන්ගේ; පටිපත්ති සංයුත්තානි, ප්‍රතිපත්ති සංයුක්තයෝ වෙත්; ඉති එතානි සුත්තානි, මේ සියලු සූත්‍රයෝ; පඤ්චාසීතිප්පමාණානි හොන්ති, පස්අසූවක් පමණවූවාහු වෙත්.

සූත්‍ර සංග්‍රහ පදාර්ථ ව්‍යාඛ්‍යානය

සමාප්තයි.

## සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු